පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ
භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා
http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# ඛුද්දක නිකාය

# 6

12. පටිසම්භිදාමග්ග.
13. අපදාන පාළි.

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# අනුශාසක මණ්ඩලය

පෑලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

අම්බලම්ගොඩ මහා විහාරස්ථ විද්‍යාලොක විද්‍යාලයාධිපති ශ්‍රී සද්ධර්මභාරතීශ්වර පණ්ඩිතාචාර්ය විලේගොඩ ශ්‍රී ධර්මානන්ද මහාස්ථවිරපාදයන් වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්‍ය්‍ය ආර්‍ය්‍යරත්න රේරුකාන මහතා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පටුන



# ඛුද්දක නිකාය

# 6

12. පටිසම්භිදාමග්ග.
13. අපදාන පාළි.

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.
http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1956
දෙවැනි මුද්‍රණය - 2014

**ත්‍රිපිටකය**

**ඛුද්දක නිකාය 6**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනයː
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනයː
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණයː
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත් යොමු

කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාලි පොත් සමාගම පාලි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මඟ පෙන්වූ

මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඤාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2014 පෙබරවාරි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සංඥාපනය

සූත්‍ර පිටකයේ පස්වෙනි නිකායවූ ඛුද්දක නිකාය කාණ්ඩ පසළොසකින් යුක්තයි. මේ නිකායේ ජාතක කථා ආදී ධර්ම රස ඇතිකරන කථා රාශියක් අන්තර්ගත කර තිබේ. කාව්‍ය රසය දක්වන පද්‍ය රචනා බොහෝ වෙත්. මේ පොතට ඛුද්දක නිකායේ පටිසම්භිදා මග්ගයෙහි ආණාපාණ කථාවෙහි සිට අවසානය දක්වාද අපදානයෙහි 21 වෙනි කණිකාර පුප්ඵිය වග්ග අවසානය දක්වා ඇතුළත් කළෙමි.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම්වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයඹරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයඹරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රත්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, තලල්ලේ පණ්ඩිත ධම්මානන්ද ස්ථවිරයන් වහන්සේ ද, ඇල්. ජී. පෙරේරා මහතාද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

10 - 11 - 56.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

*x*

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන

පිට

12 පටිසම්භිදාමග්ග පාළි
1. මහාවග්ග
3. ආනාපාන කථා 2367
4. ඉන්ද්‍රිය කථා 2420
5. විමොක්ඛ කථා 2458
6. ගති කථා 2490
7. කම්ම කථා 2494
8. විපල්ලාස කථා 2495
9. මග්ග කථා 2497
10. මණ්ඩපෙය්‍ය කථා 2499
2. යුගනන්ධ වග්ග
11. යුගනන්ද කථා 2505
12. සච්ච කථා 2521
13. බොජ්ඣංග කථා 2534
14. මෛත්‍රී කථා 2555
15. විරාග කථා 2568
16. ප්‍රතිසම්භිදා කථා 2576
17. ධම්ම චක්ක කථා 2592
18. ලොකුත්තර කථා 2598
19. බල කථා 2600
20. සුඤ්ඤත කථා 2612
3. පඤ්ඤා වග්ග
21. පඤ්ඤා කථා 2622
22. ඉද්ධි කථා 2648
23. අභිසමය කථා 2659
24. විවේක කථා 2666

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

25. චර්‍යා කථා 2674
26. ප්‍රාතිහාර්‍ය කථා 2675
27. සම්සීය කථා 2679
28. සතිපට්ඨාන කථා 2681
29. විදර්ශනා කථා 2686
30. මාතිකා කථා 2692
13 අපදාන පාළිය
1. ථේරාපදානය
1. බුද්ධ වග්ගය 2699
2. සිහාසනදායක වග්ග 2764
3. සුභූති වග්ග 2776
4. කුණ්ඩධාන වග්ග 2793
5. උපාලි වග්ග 2803
6. විජිනි වග්ග 2816
7. සකචින්තනිය වග්ග 2824
8. නාගසමාල වග්ග 2830
9. තිමිරපුප්ඵිය වග්ග 2835
10. සුධා පිණ්ඩිය වග්ග 2840
11. භික්ඛාදායි වග්ග 2844
12. මහා පරිවාර වග්ග 2849
13. සෙරෙය්‍ය වග්ග 2857
14. සොභිත වග්ග 2864
15. ඡත්ත වග්ග 2870
16. බන්ධු ජීවක වග්ග 2874
17. සුපාරිචරිය වග්ග 2878
18. කුමුද වග්ග 2882
19. කුටජ පුප්ඵිය වග්ග 2885
20. තමාල පුප්ඵිය වග්ග 2890
21. කණිකාර පුප්ඵිය වග්ග 2894

# ඛුද්දක නිකාය

## 12. පටිසම්භිදා මග්ග පාළි

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

## මහා වග්ග

### 3. ආනාපාන කථා

1. සොළොස් වස්තුවක් ඇත්තාවූ ආනාපාන සති සමාධිය වඩන්නහුට දෙසීයයකට අධිකවූ ඥාණ උපදිත්. වැළැක්මෙහි ඥාණ අටක්ද උපකාරයෙහි ඥාණ අටක්ද කිලුටු කිරීමෙහි ඥාණ අටළොසක්ද පිරිසිදුවීමෙහි ඥාණ තෙළසක්ද සිහියෙන් යුක්තව මෙනෙහි කරන්නහුගේ ඥාණ දෙතිසකි. සමාධි වශයෙන් පවත්නා ඥාණ සූවිස්සකි. විදර්ශනා වශයෙන් පවත්නා ඥාණ දෙසැත්තෑවකි. නිබ්බිදා ඥාණ අටකි. නිබ්බිදානුලොම අටකි. නිබ්බිදා පටිප්පස්සද්ධි ඥාණ අටකි. විමුක්ති සුඛයෙහි ඥාණ එක් විස්සකි.

2. වැළැක්මෙහි ඥාණ අටද උපකාරයෙහි ඥාණ අටද කවරහුද? කාමච්ඡන්දය සමාධියගේ වැළැක්මය. නෛෂ්ක්‍රම්‍යය සමාධියගේ උපකාරයය ව්‍යාපාද සමාධියගේ වැළැක්මය. අව්‍යාපාදය සමාධියගේ උපකාරයය. ථිනමිද්ධය සමාධියගේ වැළැක්මය. ආලොකසඤ්ඤාව සමාධියගේ උපකාරයය. උද්ධච්චය සමාධියගේ වැළැක්මය. නොවිසිරයාම සමාධියගේ උපකාරයය, විචිකිච්ඡාව සමාධියගේ වැළැක්මය. ධර්මයන් පිරිසිඳ දැනීම සමාධියගේ උපකාරයය. අවිද්‍යාව සමාධියගේ වැළැක්මය. ඥාණය සමාධියගේ උපකාරයය. අරතිය සමාධියගේ වැළැක්මය. සතුට සමාධියගේ උපකාරයය. සියලු අකුශල ධර්මයෝ සමාධියගේ වැළකුමය. සියලු කුශල ධර්මයෝ සමාධියගේ උපකාරයෝය. මේ අට වැළැක්මෙහි ඥාණද මේ අට උපකාරයෙහි ඥාණද වෙත්. මේ සොළොස් ආකාරයෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

පුරුදු කළ මනාව පුරුදු කළ සිත එකඟ බවෙහි පිහිටයි. නීවරණයන් කෙරෙන් පිරිසිදුවෙයි. ඒ එකඟ භාවයෝ නම් කවරහුද? නෛෂ්ක්‍රම්‍යය එකඟ බවකි. අව්‍යාපාදය එකඟ බවකි. ආලොක සඤ්ඤාව එකඟ බවකි, නොවිසිරයාම එකඟ බවකි. ධර්මයන් පිරිසිඳ දැනීම එකඟ කමකි. ඤාණය එකඟ කමකි. ප්‍රමොද්‍යය එකඟ කමකි, සියලු අකුශල ධර්මයෝ එකත්වයෝය.

3. නීවරණ යන මෙහි කිනම් ධර්මයෝ නීවරණ වෙත්ද? කාමච්ඡන්දය නීවරණයකි. ව්‍යාපාදය නීවරණයකි. ථීන මිද්ධය නීවරණයකි. උද්ධච්ච කුක්කුච්චය නීවරණයකි. විචිකිච්ඡාව නීවරණයකි. අවිද්‍යාව නීවරණයකි. අරතිය නීවරණයකි. සියලු අකුශල ධර්ම නීවරණයෝ වෙති.

4. නීවරණ යනු කිනම් අර්ථයකින් නීවරණ නම් වෙත්ද? මාර්ගය අවුරන හෙයින් නීවරණ නම් වෙත්. ඒ මාර්ගයෝ කවරහුද? නෛෂ්ක්‍රම්‍යය ආර්යයන්ගේ මාර්ගයවේ. ඒ නෛෂ්ක්‍රම්‍යයෙන් ආර්යයෝ (නිවණට) පැමිණෙත්. කාමච්ඡන්දය මාර්ගය ඇවිරීමකි. ඒ කාමච්ඡන්දයෙන් අවුරනලද හෙයින් නෛෂ්ක්‍රම්‍යය ආර්යයන්ගේ මාර්ගයයි. නොදනිනුයි කාමච්ඡන්දය මාර්ගය ඇවිරීමය අව්‍යාපාදය ආර්යයන්ගේ මාර්ගයවෙයි. ඒ අව්‍යාපාදයෙන් ආර්යයෝ (නිවණට) පැමිණෙත්. ව්‍යාපාදය මාර්ගය ඇවිරීමකි. ඒ ව්‍යාපාදයෙන් අවුරනලද හෙයින් අව්‍යාපාදය ආර්යයන්ගේ මාර්ගයයි නොදනීනුයි ව්‍යාපාදය මාර්ගය ඇවිරීමය. ආලෝක සඤ්ඤාව ආර්යයන්ගේ මාර්ගය වෙයි. ඒ (නිවණට) ආලොක සඤ්ඤාවෙන් ආර්යයෝ පැමිණෙත්. ථීනමිද්ධය මාර්ගය ඇවිරීමකි. ඒ ථීනමිද්ධයෙන් අවුරන ලද හෙයින් ආලොක සඤ්ඤාව ආර්යයන්ගේ මාර්ගයයි. නොදනීනුයි. ථීනමිද්ධය මාර්ගය ඇවිරීම වෙයි. සිතේ නොවිසිරයාම ආර්යයන්ගේ මාර්ගය වෙයි. එම නොවිසිර යාමෙන් ආර්යයෝ නිවණට පැමිණෙත්. උද්ධච්චය මාර්ගය ඇවිරීමකි. එම උද්ධච්චයෙන් අවුරනලද හෙයින් නොවිසිරයාම ආර්යයන්ගේ මාර්ගයයි නොදනීනුයි. උද්ධච්චය මාර්ගය ඇවිරීමවෙයි ධර්මයන් පිරිසිඳ දැනීම ආර්යයන්ගේ මාර්ගය වෙයි. එම ධර්මයන් පිරිසිඳ දැනීමෙන් ආර්යයෝ නිවණට

පැමිණෙත් විචිකිච්ඡාව මාර්ගය ඇවිරීමකි. එම විචිකිච්ඡාවෙන් අවුරන ලද හෙයින් ධර්මයන් පිරිසිඳ දැනීම ආර්යයන්ගේ මාර්ගයයි නොදනීනුයි, විචිකිච්ඡාව මාර්ගය ඇවිරීම වෙයි. ඥාණය ආර්යයන්ගේ මාර්ගය වෙයි. එම ඥාණයෙන් ආර්යයෝ නිවණට පැමිණෙත්. අවිද්‍යාව මාර්ගය ඇවිරීමකි. එම අවිද්‍යාවෙන් අවුරන ලද හෙයින් ඥාණය ආර්යයන්ගේ මාර්ගයයි නොදනිනුයි අවිද්‍යාව මාර්ගය ඇවිරීමවෙයි. ප්‍රමොද්‍යය (සතුට) ආර්යයන්ගේ මාර්ගය වෙයි. එම සතුටින් ආර්යයෝ නිවනට පැමිණෙත්. අරතිය (නොඇල්ම) මාර්ගය ඇවිරීමය එම නොඇල්මෙන් අවුරනලද හෙයින් සතුට ආර්යයන්ගේ මාර්ගයයි නොදනිනුයි. නොඇල්ම මාර්ගය ඇවිරීම වෙයි. සියලු කුශල ධර්මයෝ ආර්යයන්ගේ මාර්ගය වෙයි. ඒ අකුශල ධර්මයන්ගෙන් අවුරනලද හෙයින් කුශල ධර්මයන් ආර්යයන්ගේ මාර්ගයයි නොදනිනුයි. සියලු අකුශල ධර්මයෝ මාර්ගය ඇවුරුම්හු වෙත්. මේ නීවරණයන්ගෙන් පිරිසිදුවූ සිත් ඇති සොළොස් වස්තුවක් ඇති ආනාපානාසති සමාධිය වඩන්නහුට ක්ෂණික පරම්පරා වශයෙන් ක්ලේශයෝ උපදිත්.

5. කිනම් අටළොස් උපක්ලේශ කෙනෙක් උපදිත්ද? ආශ්වාසයාගේ මුල මැද අග සිහියෙන් අනුව යන්නාවූ පුද්ගලයාගේ ඇතුළත විසිර යන්නාවූ සිත සමාධියට බාධකයකි. ප්‍රශ්වාසයාගේ මුල මැද අග සිහියෙන් අනුව යන්නාවූ පුද්ගලයාගේ පිටත විසිර යන්නාවූ සිත සමාධියට බාධකයකි. ආශ්වාසය කැමති වන්නාවූ ආශාව තෘෂ්ණාවගේ පැවැත්ම සමාධියට බාධකයකි. ප්‍රශ්වාසය කැමති වන්නාවූ ආශාව තෘෂ්ණාවගේ පැවැත්ම සමාධියට බාධකයකි. ආශ්වාසයෙන් වෙහෙසට පත්වූවහුගේ ප්‍රශ්වාසයෙහි ඇලීම සමාධියට බාධකයකි. ප්‍රශ්වාසයෙන් වෙහෙසට පත්වූවහුගේ ආශ්වාසයෙහි ඇලීම සමාධියට බාධකයෙකි

"ආශ්වාසය අනුව යන්නාවූ සතියද ප්‍රශ්වාසය අනුව යන්නාවූ සතියද ඇතුළත සිත වික්ෂෙප කරන්නා ආශ්වාසය කැමතිවීමද පිටත සිත වික්ෂෙප කරන්නාවූ ප්‍රශ්වාසය කැමතිවීමද,

"ආශ්වාසයෙන් වෙහෙසට පැමිණියහුගේ ප්‍රශ්වාසයට කැමතිවීමද ප්‍රශ්වාසයෙන් වෙහෙසට පැමිණියහුගේ ආශ්වාසය කැමතිවීමද,

"යම් උපක්ලේශ ධර්මයන් හේතුකොටගෙන වික්ෂෙප වන්නාවූ පුද්ගලයාගේ සිත විරුද්ධ ධර්මයන්ගෙන් නොමිදෙයිද, මිදීම නොදන්නාවූ ඒ පුද්ගලයෝ අනෙක් හේතුවක් පතන්නෝ වෙත්ද, ආනාපාන සමාධියගේ උපක්ලේශ වන්නාවූ ඒ ධර්ම සයකි."

**6.** නිමිත්ත ආවර්ජනය කරන්නාගේ සිත ආශ්වාසයෙහි කම්පා වෙයි. සමාධියට බාධා වෙයි. ආශ්වාසය ආවර්ජනය කරන්නහුගේ සිත නිමිත්තෙහි කම්පා වෙයි. සමාධියට බාධාවෙයි. නිමිත්ත ආවර්ජනය කරන්නහුගේ සිත ප්‍රශ්වාසයෙහි කම්පා වෙයි. සමාධියට බාධා වෙයි. ප්‍රශ්වාසය ආවර්ජනය කරන්නහුගේ සිත නිමිත්තෙහි කම්පාවෙයි. සමාධියට බාධාවෙයි. ආශ්වාසය ආවර්ජනය කරන්නහුගේ සිත ප්‍රශ්වාසයෙහි කම්පාවෙයි. සමාධියට බාධාවකි. ප්‍රශ්වාසය ආවර්ජනය කරන්නහුගේ සිත ආශ්වාසයෙහි කම්පා වෙයි සමාධියට බාධාවෙයි.

"නිමිත්ත මෙනෙහි කරන්නහුගේ සිත ආශ්වාසයෙහි වික්ෂිප්ත වෙයි ආශ්වාසය මෙනෙහි කරන්නහුගේ සිත නිමිත්තෙහි වික්ෂිප්ත වෙයි.

"නිමිත්ත මෙනෙහි කරන්නහුගේ සිත ප්‍රශ්වාසයෙහි වික්ෂිප්ත වෙයි. ප්‍රශ්වාසය මෙනෙහි කරන්නහුගේ සිත නිමිත්තෙහි වික්ෂිප්ත වෙයි.

"ආශ්වාසය මෙනෙහි කරන්නහුගේ සිත ප්‍රශ්වාසයෙහි වික්ෂිප්ත වෙයි. ප්‍රශ්වාසය මෙනෙහි කරන්නහුගේ සිත ආශ්වාසයෙහි වික්ෂිප්ත වෙයි.

"යම් උපක්ලේශ ධර්මයන් හේතුකොටගෙන සිත විරුද්ධ ධර්මයන්ගෙන් නොමිදෙයිද මිදීම නොදන්නාවූ ඔව්හු අනික් මගක් ඇදහීමට පැමිණෙත්ද මේ සය ඒ උපක්ලේශ ධර්මයෝ වෙත්."

7. ස්පර්ශ වන ස්ථානය ඉක්ම ගියාවූ වික්ෂෙපයෙහි ගැටුණාවූ සිත සමාධියට බාධාවකි. ස්පර්ශවන ස්ථානයට නොපැමිණියාවූ ආශ්වාසය හෝ ප්‍රශ්වාසය බලාපොරොත්තු වන්නාවූ කම්පාවූ සිත සමාධියට බාධාවකි. කුසීත බවෙහි වැටුණාවූ හැකුළුණාවූ සිත සමාධියට බාධාවකි. වීර්ය වැඩිවූ උද්ධච්චයෙහි වැටුණාවූ සිත සමාධියට බාධාවකි. ඇලීමෙන් රාගයෙහි වැටුණාවූ සිත සමාධියට බාධාවකි. නොඇලීමෙන් ව්‍යාපාදයෙහි වැටුණාවූ සිත සමාධියට බාධාවකි.

"ස්පර්ශවන ස්ථානය ඉක්ම යන්නාවූ සිතද ස්පර්ශ වන ස්ථානයට නොපැමුණුනාවූ ආශ්වාස ප්‍රශ්වාසයන් අපෙක්ෂා කරන්නාවූ සිතද හැකුළුණාවූ සිතද වීර්ය වැඩිවූ සිතද ඇලුණාවූ සිතද ඇලීමෙන් ඉවත්වූ (දොම්නස් සහගත) සිතද සමාධියට නොපැමිණෙයි.

"මේ සය ආනාපාන සතිසමාධියගේ උපක්ලේශ ධර්මයෝය. ඒ උපක්ලේශයන්ගෙන් කිලුටුවූ සිත් ඇත්තේ බලවත් සමාධිය දැන නොගනියි."

8. ආශ්වාසයාගේ මුල මැද අග සතියෙන් අනුව යන්නහුගේ ඇතුළත වික්ෂෙපවූ සිත කරණකොටගෙන කයද සිතද දැඩිද වෙත්. කම්පාද වෙත්. සැලෙන්නාහුද වෙත්. ප්‍රශ්වාසයාගේ මුල මැද අග සතියෙන් අනුව යන්නහුගේ පිටත්හි වික්ෂෙපවූ සිත කරණකොටගෙන කයද සිතද දැඩිද වෙත්. කම්පාද වෙත්. සැලෙන්නාහුද වෙත්. ආශ්වාසය කැමතිවන්නාවූ නිකන්තියයි කියනලද තෘෂ්ණාවගේ පැවැත්මෙන් කයද සිතද දැඩිද වෙත්. කම්පාද වෙත්. සැලෙන්නාහුද වෙත්. ප්‍රශ්වාසය කැමති වන්නාවූ නිකන්තියයි කියනලද තෘෂ්ණාවගේ පැවැත්මෙන් කයද සිතද දැඩිද වෙත්. කම්පාද වෙත්. සැලෙන්නාහුද වෙත්. ආශ්වාසයෙන් වෙහෙසට පත් වූවහුගේ ප්‍රශ්වාසය ලැබීමෙහි ආශාව හේතුකොටගෙන කයද සිතද දැඩිද වෙත්. කම්පාද වෙත්. සැලෙන්නාහුද වෙත්. ප්‍රශ්වාසයෙන් වෙහෙසට පත්වූවහුගේ ආශ්වාසය ලැබීමෙහි ආශාව හේතුකොටගෙන කයද සිතද දැඩිද වෙත්. කම්පාද වෙත්. සැලෙන්නාහුද වෙත්. නිමිත්ත

මෙනෙහි කරන්නහුගේ ආශ්වාසයෙහි සිතකම්පාවන හෙයින් කයද සිතද දැඩිදවෙත්. කම්පාද වෙත්. සැලෙන්නාහුද වෙත්. ආශ්වාසය මෙනෙහි කරන්නහුගේ සිත නිමිත්තෙහි කම්පාවන හෙයින් කයද සිතද දැඩිද වෙත්. කම්පාද වෙත්. සැලෙන්නාහුද වෙත්. නිමිත්ත මෙනෙහිකරන්නහුගේ සිත ප්‍රශ්වාසයෙහි කම්පාවන හෙයින් කයද සිතද දැඩිද වෙත්. කම්පාදවෙත්. සැලෙන්නාහුද වෙත්. ප්‍රශ්වාසය මෙනෙහි කරන්නහුගේ සිත නිමිත්තෙහි කම්පාවන හෙයින් කයද සිතද දැඩිද වෙත්. කම්පාද වෙත්. සැලෙන්නාහුද වෙත්. ආශ්වාසය මෙනෙහි කරන්නහුගේ සිත ප්‍රශ්වාසයෙහි කම්පාවන හෙයින් කයද සිතද දැඩිද වෙත්. කම්පාද වෙත්. සැලෙන්නාහුද වෙත්. ප්‍රශ්වාසය මෙනෙහි කරන්නහුගේ සිත ආශ්වාසයෙහි කම්පාවන හෙයින් කයද සිතද දැඩිද වෙත්, කම්පාද වෙත්. සැලෙන්නාහුද වෙත්. නිමිත්ත ඉක්මවා යාමෙන් වික්ෂෙපයට පැමිණියාවූ සිතින් කයද සිතද දැඩිද වෙත්. කම්පාදවෙත්. සැලෙන්නාහුද වෙත්. නිමිත්තට නොපැමිණියාවූ ආශ්වාස ප්‍රශ්වාසයන් කැමති වන්නාවූ කම්පාවූ සිතින් කයද සිතද දැඩිද වෙත්, කම්පාද වෙත්. සැලෙන්නාහුද හැකුළුණාවූ කුසීත බැව්හි වැටුණාවූ සිතින් කයද සිතද දැඩිද වෙත්. කම්පාද වෙත්, සැලෙන්නාහුද වෙත්. වීර්ය අධිකවූ උද්ධච්චයෙහි වැටුණාවූ සිතින් කයද සිතද දැඩිද වෙත්. කම්පාද වෙත් සැලෙන්නාහුද වෙත්. රාගයෙහි ඇලුණාවූ සිතින් කයද සිතද දැඩිද වෙත්. කම්පාද වෙත්. සැලෙන්නාහුද වෙත්. ව්‍යාපාදයෙහි වැටුණාවූ ඇලීමෙන් පහවූ සිතින් කයද සිතද දැඩිද වෙත්, කම්පාද වෙත්, සැලෙන්නාහුද වෙත්.

"යමකු විසින් ආනාපානසතිය සම්පූර්ණ කොට නොවඩන ලද්දීද ඔහුගේ කයද කම්පිත වූයේවෙයි. සිතද කම්පිත වූයේවෙයි. කයද සැලුණේ වෙයි. සිතද සැලුණේ වෙයි.

"යමකු විසින් ආනාපාන සතිය සම්පූර්ණ කොට වඩන ලද්දීද ඔහුගේ කයද කම්පා නොවූයේවෙයි. සිතද කම්පා නොවූයේවෙයි. කයද නොසැලුණේ වෙයි. සිතද නොසැලුණේ වෙයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඒ නීවරණයන්ගෙන් පිරිසිදුවූ සිත් ඇති සොළොස් වස්තුවක් ඇති ආනාපාන සති සමාධිය වඩන්නහුට ක්ෂණයන්හි රැස්වන ක්ලේශයක් වශයෙන් මේ අටලොස් උපක්ලේශයෝ උපදිත්.

**9.** පිරිසිදුවීමෙහි තෙළෙස් ඥානයෝ කවරහුද? නිමිත්ත ඉක්මවා ගිය සිත වික්ෂේපයෙහි වැටුණේ වෙයි. ඒ සිත අත්හැර එක් අරමුණක පිහිටුවයි. මෙසේද සිත වික්ෂේපයට නොයයි. නිමිත්තට නොපැමුණුණාවූ ආශ්වාස ප්‍රශ්වාසයන් කැමතිවන්නාවූ සිත කම්පා වූයේවෙයි. එය අත්හැර ඒ අරමුණෙහිම පිහිටුවයි. මෙසේද සිත වික්ෂේපයට නොයයි. හැකුළුණාවූ සිත කුසීත බැව්හි වැටෙයි. එය වීර්යයෙන් ඔසවා කුසීත බව දුරුකරයි. මෙසේද සිත වික්ෂේපයට නොයයි. වීර්යයෙන් වඩා ඔසවන ලද සිත උද්ධච්චයෙහි වැටෙයි. එය නිශ්‍රිත කොට උද්ධච්චය දුරුකරයි. මෙසේද සිත වික්ෂේපයට නොයයි. ඇලුණාවූ සිත රාගයෙහි වැටෙයි. එය නුවණින් දැන ඒ රාගය දුරුකරයි. මෙසේද සිත වික්ෂේපයට නොයයි. ඇලීමෙන් ඉවත්වූ සිත ව්‍යාපාදයෙහි වැටෙයි. එය නුවණින් දැන ව්‍යාපාදය දුරුකරයි. මෙසේද සිත වික්ෂේපයට නොයයි. මේ සය කරුණෙන් පිරිසිදුවූ හාත්පස පිරිසිදුවූ සිත එකඟ බවට පැමිණියේ වෙයි.

**10.** ඒ එකඟබවට පැමිණීම් කවරහුද? දානවස්තු පරිත්‍යාගය වැටහීමෙහි එකඟබවද, සමථ නිමිති වැටහීමෙහි එකඟබවද, වය ලක්ෂණ වැටහීමෙහි එකඟබවද, නිරොධය වැටහීමෙහි එකඟබවද වෙත්. දීමෙහි කැමැත්ත ඇති යොගීන්හට දාන වස්තු පරිත්‍යාගය වැටහීමෙහි එකඟබවද, විදර්ශනාපාදක සමාධියෙහි යෙදී සිටින්නහුට සමථ නිමිත්ත වැටහීමෙහි එකඟබවද, විදර්ශකයන්හට වයලක්ෂණය වැටහීමෙහි එකඟකමද, ආර්ය පුද්ගලයන් හට නිරොධය වැටහීමෙහි එකඟ බවද වෙත්. මේ සතර ආකාරයෙන් එකඟ බවට ගියාවූ සිත පටිපදා විසුද්ධියට පැමිණියේද, උපෙක්ෂාවෙන් වඩන ලද්දේද, ඥානයෙන් පිරිසිදු කරන ලද්දේද වෙයි.

**11.** ප්‍රථමධ්‍යානයාගේ මුල කිමෙක්ද, මැද කිමෙක්ද, අග කිමෙක්ද, (ii) පටිපදා විසුද්ධිය ප්‍රථමධ්‍යානයාගේ මුලය

උපෙක්ෂාවගේ වැඩීම මැදය, පිරිසිදුවීම අගය, පටිපදා විසුද්ධිය ප්‍රථම ධ්‍යානයාගේ ආදියයි (මුලයි) ආදියාගේ ලක්ෂණ කෙතෙක්ද? ආදියගේ ලක්ෂණ තුනකි. යමක් ප්‍රථමධ්‍යානයාගේ වැළැක්ම වෙයිද, එයින් සිත පිරිසිදු වෙයි. සිත පිරිසිදුවූ හෙයින් මධ්‍යම සමථ නිමිත්තට පැමිණෙයි. පැමිණි හෙයින් එම අරමුණෙහි සිත බැසගනියි. යම් සිතක් වැළැක්මෙන් පිරිසිදු වෙයිද, යම් සිතක් පිරිසිදුවූ හෙයින් මධ්‍යම සමථ නිමිත්තට පැමිණෙයිද, යම් සිතක් පැමිණිහෙයින් යම් සිතක් එම අරමුණෙහි බැසගනියිද, පටිපදා විසුද්ධිය ප්‍රථමධ්‍යානයාගේ ආදිය යන මෙහි ආදියගේ මේ ලක්ෂණ තුන වෙත්. (iii) එහෙයින් ප්‍රථමධ්‍යානය ආදී කල්‍යාණවූයේද ලක්ෂණසම්පන්නවූයේයයිද කියනු ලැබේ.

12. උපෙක්ෂාවගේ වැඩීම ප්‍රථමධ්‍යානයාගේ මැදය, මධ්‍යයාගේ ලක්ෂණ කෙතෙක්ද? මධ්‍යයාගේ ලක්ෂණ තුනකි. පිරිසිදුවූ සිත මැදහත්වෙයි. සමථයට පිළිපන් සිත මැදහත් වෙයි. එකඟබව වැටහුණු සිත මැදහත්වෙයි. පිරිසිදුවූ යම් සිතක් මැදහත්වෙයිද, සමථයට පිළිපන් යම් සිතක් මැදහත් වෙයිද, එකඟබව වැටහුණු යම් සිතක් මැදහත්වෙයිද, උපෙක්ෂාව ප්‍රථමධ්‍යානයාගේ මැදය යන මෙහි මධ්‍යයාගේ මේ ලක්ෂණ තුන වෙත්. එහෙයින් ප්‍රථමධ්‍යානය මජ්ඣෙ කල්‍යාණ වූයේද, ලක්ෂණසම්පන්න වූයේයයිද කියනු ලැබේ. ප්‍රථමධ්‍යානයාගේ ඥානයෙන් පිරිසිදුවීම අවසානයයි. අවසානයාගේ ලක්ෂණ කෙතෙක්ද? අවසානයාගේ ලක්ෂණ සතරකි. ඒ ප්‍රථමධ්‍යානයෙහි හටගත් ධර්මයන් නොඉක්මවීම ස්වභාවයෙන් පිරිසිදුවීම ඉන්ද්‍රිය ධර්මයන්ගේ සමාන කෘත්‍ය ඇති ස්වභාවයෙන් පිරිසිදුවීම ඊට අනුකූල වීර්යයෙන් ඉසිලීම් ස්වභාවයෙන් පිරිසිදුවීම නැවත නැවත සෙවනය කිරීමෙන් පිරිසිදුවීම යන මොහුයි. ප්‍රථමධ්‍යානයාගේ පිරිසිදුවීම අවසාන යයි යන මෙහි අවසානයාගේ මේ ලක්ෂණ සතරවෙති. එහෙයින් ප්‍රථම ධ්‍යානය පරියොසාන කල්‍යාණද වෙයි. ලක්ෂණ සම්පන්නවේයයි කියනු ලැබේ. මෙසේ ත්‍රිවිධ ස්වභාවයෙන් යුත් ප්‍රථමධ්‍යාන සිත ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්තවූයේද, දසලක්ෂණයෙන් යුක්තවූයේද,

විතර්කයෙන් සමන්විතවූයේද විචාරයෙන් සමන්විතවූයේද විරතියෙන් සමන්විතවූයේද, සැපයෙන් සමන්විත වූයේද චිත්තයාගේ ස්ථානයෙන් සමන්විතවීමද ශ්‍රද්ධාවෙන් සමන්විතවීමද, වීර්යයෙන් සමන්විත වීමද, සතියෙන් සමන්විතවීමද, සමාධියෙන් සමන්විතවීමද, ප්‍රඥාවෙන් සමන්විතවීමද වෙයි.

13. ද්විතීය ධ්‍යානයාගේ ආදිය (මුල) කුමක්ද, මැද කුමක්ද, අවසානය කුමක්ද? ප්‍රතිපදා විශුද්ධිය, ද්විතීයධ්‍යාන ආදිය වෙයි උපෙක්ෂාවගේ වැඩීම මැද වෙයි. පිරිසිදුවීම අවසානය වෙයි. (11 ඡේදයේ (ii) ප්‍රථමධ්‍යානය යනු ද්විතීය ධ්‍යානයයි වෙනස්කොට යොදන්න) මෙසේ ත්‍රිවිධ ස්වභාවයෙන් යුත් ද්විතීයධ්‍යාන සිත ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්ත වූයේද, දශලක්ෂණයෙන් යුක්තවූයේද, ප්‍රීතියෙන් යුක්තවූයේද, චිත්තයාගේ අධිෂ්ඨානයෙන් යුක්තවීමද, ශ්‍රද්ධාවෙන් යුක්තවීමද, වීර්යයෙන් යුක්තවීමද, සතියෙන් යුක්ත වීමද, සමාජයෙන් යුක්තවීමද, ප්‍රඥාවෙන් යුක්තවීමද වෙයි.

14. තෘතීය ධ්‍යානයාගේ ආදිය කුමක්ද, මැද කුමක්ද අවසානය කුමක්ද? (11 ඡේදයේ (ii) ප්‍රථමධ්‍යානය යනු තෘතීයධ්‍යානයයි වෙනස්කොට යොදන්න) මෙසේ ත්‍රිවිධ ආකාරයෙන් යුත් තෘතීයධ්‍යාන සිත ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්තවූයේද, දශලක්ෂණයෙන් යුක්තවූයේද, සුඛයෙන් යුක්තවූයේද, චිත්තයාගේ අධිෂ්ඨානයෙන් යුක්තවීමද, ශ්‍රද්ධාවෙන් යුක්තවීමද, වීර්යයෙන් යුක්තවීමද, සමාධියෙන් යුක්තවීමද, ප්‍රඥාවෙන් යුක්තවීමද වෙයි.

15. චතුර්ථධ්‍යානයාගේ ආදිය කුමක්ද, මැද කුමක්ද, අවසානය කුමක්ද? (11 ඡේදයේ (ii) ප්‍රථමධ්‍යානය යනු චතුර්ථධ්‍යානයයි වෙනස්කොට යොදන්න) මෙසේ ත්‍රිවිධ ස්වභාවයෙන් යුත් චතුර්ථධ්‍යාන සිත ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්තවූයේද, දශලක්ෂණයෙන් යුක්තවූයේද, උපෙක්ෂාවෙන් යුක්තවූයේද, චිත්තයාගේ අධිෂ්ඨානයෙන් යුක්තවීමද (ii) ශ්‍රද්ධාවෙන් යුක්තවීමද, වීර්යයෙන් යුක්තවීමද, සතියෙන් යුක්තවීමද සමාධියෙන් යුක්තවීමද, ප්‍රඥාවෙන් යුක්තවීමද වෙයි.

16.ආකාසානඤ්චායතන සමාපත්තියෙන් විඤ්ඤාණඤ්චායතන සමාපත්තියගේ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියාගේ නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියගේ ආදිය කුමක්ද, මැද කුමක්ද, අවසානය කුමක්ද? (11 ඡේදයේ (ii) ප්‍රථමධ්‍යානය යනු ආකාසඤ්චායතන සමාපත්තියයි වෙනස්කොට යොදන්න) මෙසේ තුන් ස්වභාවයක් ඇති නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සිත ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්තවූයේද, දශ ලක්ෂණයෙන් යුක්තවූයේද, චිත්තයාගේ අධිෂ්ඨානයෙන් යුක්තවීමද (15 ඡේදයේ (ii) යොදන්න.)

17. අනිච්චානුපස්සනාවගේ ආදිය කුමක්ද? මැද කුමක්ද, අවසානය කුමක්ද? (මෙහි 11 ඡේදයේ (ii) ප්‍රථම ධ්‍යානය යනු අනිච්චානුපස්සනාවයයි වෙනස් කොට යොදන්න.) මෙසේ තුන් ආකාරයෙන් යුත් අනිච්චානුපස්සනා සිත ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්තවූයේද දශලක්ෂණයෙන් යුක්තවූයේද විතර්කයෙන් යුක්තවූයේද විචාරයෙන් යුක්තවූයේද ප්‍රීතියෙන් යුක්තවූයේද සුඛයෙන් යුක්තවූයේද චිත්තයාගේ අධිෂ්ඨානයෙන් යුක්තවීමද ශ්‍රද්ධාවෙන් යුක්තවීමද වීර්යයෙන් යුක්තවීමද සතියෙන් යුක්තවීමද සමාධියෙන් යුක්තවීමද ප්‍රඥාවෙන් යුක්තවීමද වෙයි.

18. දුක්ඛානුපස්සනාවගේ ආදිය කුමක්ද? මැද කුමක්ද? අවසානය කුමක්ද? (මෙහි ඡේදයේ 11 (ii) ප්‍රථම ධ්‍යානය යනු දුක්ඛානුපස්සනාවයයි වෙනස් කොට යොදන්න) අනත්තානුපස්සනාවගේ නිබ්බිදානුපස්සනාවගේ විරාගානුපස්සනාවගේ නිරොධානුපස්සනාවගේ පටිනිස්සග්ගානුපස්සනාවගේ ඛයානුපස්සනාවගේ වයානුපස්සනාවගේ විපරිණාමානුපස්සනාවගේ අනිමිත්තානුපස්සනාවගේ අප්පණිහිතානුපස්සනාවගේ සුඤ්ඤතානුපස්සනාවගේ අධිපඤ්ඤා ධම්මවිපස්සනාවගේ යථාභූත ඥාන දර්ශනයාගේ ආදීනවානුපස්සනාවගේ පටිසංඛානුපස්සනාවගේ විවට්ටානුපස්සනාවගේ සොතාපත්ති මාර්ගයාගේ සකෘදාගාමි මාර්ගයාගේ අනාගාමි මාර්ගයාගේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

අර්හත් මාර්ගයාගේ ආදිය කුමක්ද මැද කුමක්ද අවසානය කුමක්ද?

පටිපදාවිසුද්ධිය අර්හත් මාර්ගයාගේ ආදියයි. උපෙක්ෂාවගේ වැඩීම මැදයි පිරිසිදුවීම අවසානයයි. පටිපදා විසුද්ධිය අර්හත් මාර්ගයාගේ ආදිය යන මෙහි ආදියගේ ලක්ෂණ කෙතෙක්ද? ආදියගේ ලක්ෂණ තුනකි. ඒ අර්හත් මාර්ගයාගේ යම් බාධකයක් වෙයිද එයින් සිත පිරිසිදුවෙයි. පිරිසිදුවූ හෙයින් මධ්‍යම සමථ නිමිත්තට පැමිණෙයි. පැමිණි හෙයින් එහි සිත බැස ගනියි. බාධකයන් කෙරෙන් සිත යම් පිරිසිදුවීමක් වෙයිද, පිරිසිදුවූ හෙයින් යම් සිත යම් මධ්‍යම සමථ නිමිත්තකට පැමිණීමක් වෙයිද පැමිණි හෙයින් එහි සිත බැස ගැනීමක් වෙයිද, පටිපදා විසුද්ධිය අර්හත් මාර්ගයාගේ ආදිය යන මෙහි ආදියගේ මේ තුන් ලක්ෂණයෝ වෙත්. එහෙයින් අර්හත් මාර්ගය ආදී කල්‍යාණද ලක්ෂණ සම්පන්නද වේයයි කියනු ලැබේ.

**19.** උපෙක්ෂාව වැඩීම අර්හත් මාර්ගයාගේ මැදයි මධ්‍යයාගේ ලක්ෂණ කෙතෙක්ද? මධ්‍යයාගේ ලක්ෂණ තුනකි. පිරිසිදුවූ සිත මැදහත්වද කිසි සමථයට පැමිණි සිත මැදහත්වද කිසි එකඟ බැව් වැටහුණු සිත මැදහත්වද කිසි පිරිසිදු සිතින් යම් මැදහත්ව බැලීමක් වෙයිද, සමථයට පැමිණි සිතින් යම් මැදහත්ව බැලීමක් වෙයිද, එකඟ බැව් වැටහුණු සිතින් යම් මැදහත්ව බැලීමක් වෙයිද එයින් අර්හත් මාර්ගය මජ්කේධ කල්‍යාණයෙන් යුක්තයයි ලක්ෂණයන්ගෙන් යුක්ත යයිද කියනු ලැබේ. අර්හත් මාර්ගයාගේ පිරිසිදුවීම අවසාන නම් අවසානයාගේ ලක්ෂණ කෙතෙක්ද අවසානයාගේ ලක්ෂණ සතරකි. එම අර්හත් මාර්ගයෙහි පහළවූ ධර්මයන් නොඉක්මවීම් වශයෙන් පිරිසිදුවීම සමාන කෘත්‍ය වශයෙන් ඉන්ද්‍රියයන්ගේ පිරිසිදුවීම ඊට අනුකූල වශයෙන් වීර්යයෙන් ඉසිලීම් වශයෙන් පිරිසිදුවීම නැවත නැවත සෙවනය කිරීම වශයෙන් පිරිසිදුවීම යන සතරයි. අර්හත් මාර්ගයාගේ පිරිසිදුවීම අවසානය නම්. අවසානයාගේ මේ ලක්ෂණ සතරවෙත්. එහෙයින් අර්හත් මාර්ගය පරියොසන කල්‍යාණයෙන් යුක්තවූයේද, ලක්ෂණයන්ගෙන් යුක්තවූයේද, වේයයි කියනු ලැබේ. මෙසේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ත්‍රිවිධ ස්වභාවයෙන් යුත් අර්හත් මාර්ග සිත ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්තවූයේද දශ ලක්ෂණයෙන් යුක්තවූයේද විතර්කයෙන් යුක්තවූයේද විචාරයෙන් යුක්තවූයේද ප්‍රීතියෙන් යුක්තවූයේද සුඛයෙන් යුක්තවූයේද වෙයි. චිත්තයාගේ අධිෂ්ඨානයෙන් යුක්තවීමද ශ්‍රද්ධාවෙන් යුක්තවීමද වීර්යයෙන් යුක්තවීමද සතියෙන් යුක්තවීමද සමාධියෙන් යුක්තවීමද ප්‍රඥාවෙන් යුක්තවීමද වෙයි.

"නිමිත්තද ආශ්වාස ප්‍රශ්වාසයෝද එක් සිතක්හුගේ අරමුණ නොවෙත්. නොදත් පුද්ගලයාහට ධර්ම තුනෙහි භාවනාව නොලැබෙයි.

"නිමිත්තද ආශ්වාස ප්‍රශ්වාසයෝද එක් සිතක්හුගේ අරමුණ නොවෙත් දන්නාවූ පුද්ගලයාට ධර්ම තුනෙහි භාවනාව ලැබෙයි.

**20.** කෙසේ නම් මේ ධර්මයෝ තිදෙන එක් සිතක්හුගේ ආරම්මණයෝ නොවෙත්ද? මේ ධර්මයෝ තිදෙන ප්‍රකට නොවන්නාහුද, නොවෙත්ද? සිත වික්ෂෙපයටද නොපැමිණෙයිද? වීර්ය කිරීමද පෙණෙයිද? අරමුණට එළඹ බැලීමද සිද්ධකරයිද? විශේෂයට පැමිණෙයිද?

යම්සේ සමවූ භූමිභාගයක තබන ලද්දාවූ රුකක්වෙයිද, පුරුෂයෙක් ඒ රුක කියතකින් කපන්නේය. පුරුෂයාගේ සිහිය කඥ්දේ වදින තන්හි පිහිටියේ වෙයි. පැමිණියාවූද, නොපැමිණියාවූද කියත් දැති මෙනෙහි නොකරයි. පැමිණියාවූද නොපැමිණියාවූද කියත් දැති ප්‍රකට නොවන්නේද නොවෙත්, වීර්යයද පෙනෙයි ක්‍රියාවද සිදුවෙයි. සමවූ භූමි භාගයක තබන ලද රුක්කඳ යම්සේද සිහිය පිහිටුවන්නාවූ නිමිත්ත එසේය. කියත් දැති යම්සේද ආශ්වාස ප්‍රශ්වාසයෝ එසේය. යම්සේ පුරුෂයාගේ සිහිය කඳෙහි වදින්නාවූ දැතිවල පිහිටියේ වෙයිද, පැමිණියාවූද නොපැමිණියාවූද කියත් දැති ප්‍රකට නොවන්නේ නොවෙත්ද වීර්යයද පෙනෙයිද ක්‍රියාවද සිදුවෙයිද, එසේම මහණහු විසින් නාසිකාග්‍රයෙහි හෝ මුඛ නිමිත්තෙහි හෝ සිහිය පිහිටුවා හිඳින්නේ වෙයි. පැමිණියාවූද නොපැමිණියාවූද ආශ්වාස ප්‍රශ්වාසයන් මෙනෙහි නොකරයි. වීර්යයද පෙනෙයි,

සමාධියද සිදුවෙයි. ප්‍රධානය (වීර්යය) විශෙෂයටද පැමිණෙයි. ප්‍රධාන යන නම් කවරේද? පටන් ගත් වීර්ය ඇති පුද්ගලයාගේ කයද සිතද කර්මන්‍ය වෙයි. මෙය ප්‍රධානයයි ප්‍රයොගය (ක්‍රියාව) කුමක්ද? පටන් ගන්නා ලද වීර්ය ඇති පුද්ගලයාගේ උප ක්ලේශයෝ පහවෙත්. විතර්කයෝ සංසිඳෙත්. මේ ප්‍රයොග වෙයි. විශෙෂය කුමක්ද? පටන්ගත් වීර්ය ඇති පුද්ගලයාගේ සංයෝජනයෝ පහ වෙත්. අනුසයයෝ නැති වෙත්. මෙය විශෙෂයයි මෙසේ මේ ධර්ම තුන එක් සිතට අරමුණු නොවෙත්. මේ ධර්ම තුන ප්‍රකට නොවන්නාහුද නොවෙත්. සිත වික්ෂේපයටද නොපැමිණෙයි. ප්‍රධානය (වීර්යයද) පෙනෙයි. ප්‍රයොගයද සිදුවෙයි. විශෙෂයටද පැමිණෙයි.

> **21.** "යමෙකු විසින් ආනාපාන සතිය සම්පූර්ණ කොට වඩනා ලද්දීද, බුදුරදුන් විසින් දෙශනා කළ පරිදි පිළිවෙළින් පුරුදු කරණ ලද්දීද හෙතෙම වළාකුළින් මිදුණ චන්ද්‍රයාමෙන් මේ ලොකය බබළ වන්නේය."

**22.** ආනා යනු ආශ්වාසයයි අපාන යනු ප්‍රශ්වාසයයි. ආශ්වාසයාගේ වශයෙන් එළඹ සිටීම් සතියයි. ප්‍රශ්වාස වශයෙන් එළඹ සිටීම සතියයි. යමෙක් ආශ්වාස කරයිද, ඔහුට එළඹ සිටියි. යමෙක් ප්‍රශ්වාස කරයිද, ඔහුට එළඹ සිටියි. සම්පූර්ණව යන මෙහි වැළඳ ගැනීම අර්ථයෙන් සම්පූර්ණවීමද පිරිවැරීම අර්ථයෙන් සම්පූර්ණවීමද පිරීම් අර්ථයෙන් සම්පූර්ණ වීමද වෙයි. මනාකොට වඩනු ලැබීම යන මෙහි වැඩීම සතරකි. එහි පහළවූ ධර්මයන් නොයික්මවීම අර්ථයෙන් වැඩීමද ඉන්ද්‍රියයන්ගේ සමාන කෘත්‍යය ස්වාභාවයෙන් වැඩීමද, ඊට අනුකූල වීර්යයෙන් ඉසිලීම ස්වභාවයෙන් වැඩීමද, නැවත නැවත සෙවනය කිරීම් ස්වභාවයෙන් වැඩීමද වෙත්. ඒ භාවනාවගේ මේ භාවනාර්ථ සතරක් වෙත්, යානාවක් මෙන් කරන ලද්දාහු වෙත්. වස්තුවක් මෙන් කරණ ලද්දාහු වෙත්. එළඹ සිටියාහු වෙත්. හාත්පස රැස් කරන ලද්දාහු වෙත්. මනාකොට කරන ලද්දාහු වෙත්. යම් යම් ධ්‍යානයන්හි විදර්ශනාවන්හි කැමති වෙයිද, ඒ ඒ ධ්‍යාන විදර්ශනාවන්හි වසඟ බවට පැමිණියේ වෙයි. බලයට පැමිණියේ වෙයි. විශාරද බවට පැමිණියේ වෙයි. ඔහුට සමථ විදර්ශනා

ධර්මයෝ ආවර්ජනයට අනුව පැවතුම් ඇත්තාහ. කැමැත්තට අනුව පැවතුම් ඇත්තාහ. මෙනෙහි කිරීමට අනුව පැවතුම් ඇත්තාහ. චිත්තොත්පාදයට අනුව පැවතුම් ඇත්තාහ. එහෙයින් යානාවක් මෙන් කරන ලදැයි කියනු ලැබේ. වස්තුවක් මෙන් කරන ලදී යන මෙහි සොළොස් වස්තු අතුරෙන් යම්කිසි වස්තුවෙක්හි සිත මනාව පිහිටුවන ලද්දේ වෙයිද, ඒ ඒ වස්තුවෙහි සිහිය මනාව පිහිටුවන ලද්දී වෙයි. යම් යම් වස්තුවෙක්හි සිහිය මනාව පිහිටුවන ලද්දී වෙයි. යම් යම් වස්තුවෙක්හි සිහිය මනාව පිහිටුවන ලද්දී වෙයිද, ඒ ඒ වස්තුවෙහි සිත මනාව පිහිටුවන ලද්දේ වෙයි. එහෙයින් වස්තුවක් මෙන් කරන ලදැයි කියනු ලැබේ. එළඹ සිටියේ වෙයි. යනු යම් යම් ආකාරයකින් සිත එළවයිද, ඒ ඒ ආකාරයෙන් සිත පවතියි. යම් යම් ආකාරයකින් සිත පවතියිද ඒ ඒ ආකාරයෙන් සිත එළවයි. එහෙයින් එළඹ සිටියේයයි කියනු ලැබේ. පුරුදු කරණ ලදී යනු පිරිසිඳ ගැනීම් ස්වභාවයෙන් පුරුදු කරන ලදී. පිරිවැරීම් වශයෙන් පුරුදු කරන ලදී. සම්පූර්ණ කිරීම වශයෙන් පුරුදු කරන ලදී. සිහියෙන් පිරිසිඳ ගැනීමෙන් ලාමක අකුශල ධර්මයන් දිනීම් වශයෙන් පුරුදු කරන ලදී.

23. මනාකොට කරනලදී. යනු මනාකොට කිරීම් සතරකි. එහි හටගත් ධර්මයන් නොයික්මවීම් ස්වභාවයෙන් මනාව කරන ලද බව ඉන්ද්‍රියයන්ගේ සමාන කෘත්‍ය ස්වභාවයෙන් මනාව කරන ලද බව ඊට අනුකූල වීර්යයෙන් ඉසිලීම් ස්වභාවයෙන් මනාව කරන ලද බව ඊට විරුද්ධ ක්ලේශයන් මනාකොට නසනලද හෙයින් මනාව කරන ලද බව යන මොහුය. සුසම (මනාව) යන මෙහි සම නම් ධර්මයක්ද ඇත. සුසාම නම් ධර්මක්ද ඇත. සමානමවූ ධර්මය කුමක්ද? එහි හටගත්තාවූ යම් නිරවද්‍යවූ කුශලවූ බොධිපාක්ෂික ධර්ම කෙනෙක් වෙත්ද, මෙය සමාධි නම් සුසම ධර්මය නම් කුමක්ද? ඒ ඒ ධර්මයන්ගේ ආරම්මණයවූ නිරොධයක් නිර්වාණයක් වෙයිද, මෙය සුසම නමි. මෙසේ මේ සමයද සුසමයද දන්නා ලද්දේ වෙයි, දක්නා ලද්දේ වෙයි. ප්‍රත්‍යක්‍ෂ කරන ලද්දේ වෙයි. ප්‍රඥාවෙන් ස්පර්ශ කරන ලද්දේ වෙයි. නොහැකිලෙන්නාවූ වීර්ය ආරම්භ කරන

ලද්දේ වෙයි. නුමුළාවූ සිහිය එළඹ සිටියා වෙයි. කය නොදැඩිව සංසිඳුණේ වෙයි සිත එකඟව සමාධිගතවූයේ වෙයි. එහෙයින් මනාකොට කරන ලදැයි කිනු ලැබේ.

**24.** අනුව පුරුදු කරන යනු දීර්ඝව ආස්වාස කිරීම් වශයෙන් පළමු පළමු පුරුදු කිරීම පරිචිත නම්. පසු පසුව පුරුදු කිරීම අනු පරිචිත (අනුව පුරුදු කිරීම) නම්. දීර්ඝව ප්‍රස්වාස කිරීම වශයෙන් පළමු පළමු පුරුදු කිරීම පරිචිත නම්. පසු පසුව පුරුදුකිරීම අනුපරිචිත නම්. හ්‍රස්වව ආස්වාස කිරීම් වශයෙන් පළමු පළමු පුරුදු කිරීම් පරිචිත නම්. පසු පසුව පුරුදු කිරීම අනුපරිචිත නම්. හ්‍රස්වව ප්‍රශ්වාස කිරීම් වශයෙන් පළමු පළමු පුරුදු කිරීම පරිචිත නම්. පසු පසුව පුරුදු කිරීම අනුපරිචිත නම්. ස්කන්ධයන්ගේ අත් හැරීම බලමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් පළමු පළමු පුරුදු කිරීම් පරිචිත නම්. පසු පසු පුරුදු කරීම අනු පරිචිත නම්. ස්කන්ධයන්ගේ අත්හැරීම බලමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් පළමු පළමු පුරුදු කිරීම පරිචිත නම්. පසු පසුව පුරුදුකිරීම අනුපරිචිත නම්. සොළොස් වස්තුක සියලු ආනාපාන සතිහු ඔවුනොවුන් පරිචිතද වෙත්. අනුපරිචිතද වෙත්. එහෙයින් අනුව පුරුදු කරන ලද්දාහු යයි කියනු ලැබේ. යථා (යම්සේ) යන මෙහි අර්ථ දසයකි. ආත්ම දමනාර්ථය යථාර්ථයකි. ආත්ම සමනය කිරීම් අර්ථය යථාර්ථයකි. ක්ලේශයන් නිවීම් අර්ථය යථාර්ථයකි. විශෙෂයෙන් දැනීම් අර්ථය යථාර්ථයකි. පිරිසිඳ දැනීම් අර්ථය යථාර්ථයකි. ප්‍රහාණය කිරීම් අර්ථය යථාර්ථයකි. ප්‍රත්‍යක්ෂ කිරීම් අර්ථය යථාර්ථයකි. සත්‍යයන් අවබොධ කිරීම් අර්ථය යථාර්ථයකි. නිර්වාණයෙහි පිහිටුවීම් අර්ථය යථාර්ථයකි. මේ දසය යථාර්ථවෙති.

**25.** බුද්ධ යන මෙහි යමෙක් තම නුවණින්ම ආචාර්යයකු නැතිව පෙර නොඇසූ විරූ ධර්මයන්හි තෙමේම චතුස්සත්‍යයන් අවබොධ කෙළේ ද ඒ චතුස්සත්‍යයෙහි සර්වඥ බවට පැමිණියේද තථාගත බලයන්හි වසී බවට පැමිණියේද ඒ භාග්‍යවත් තෙමේ බුද්ධ නම්.

**26.** බුද්ධ යන මෙහි කිනම් අර්ථයකින් බුද්ධ නම් වෙයිද? චතුස්සත්‍යයන් අවබොධ කළ හෙයින් බුද්ධ නම්. සත්වයන්ට

අවබොධ කරවන හෙයින් බුද්ධ නමි. සර්වඥවූ හෙයින් බුද්ධ නමි. සියල්ල දැක වදාළ හෙයින් බුද්ධ නමි. අනිකෙකු විසින් අවබොධ නොකළ යුතු හෙයින් බුද්ධ නමි. ගුණ වැස්සෙන හෙයින් බුද්ධ නමි. ක්ෂය කරනලද ආශ්‍රමයන් ඇති හෙයින් බුද්ධ නමි. ඇලීම් නැති බැවින් බුද්ධ නමි. එකාන්තයෙන් පහකළ රාගය ඇති හෙයින් බුද්ධ නමි. ඒකාන්තයෙන් පහකළ දොසය ඇති හෙයින් බුද්ධ නමි. එකාන්තයෙන් පහකළ මොහය ඇති හෙයින් බුද්ධ නමි.

27. එකාන්තයෙන් කෙලෙස් රහිතවූ බැවින් බුද්ධ නමි. එකායන මාර්ගයෙහි ගිය හෙයින් බුද්ධ නමි. තනිවම නිරුත්තර සම්‍යක් සම්බොධිය අවබොධ කළ හෙයින් බුද්ධ නමි. අවිද්‍යාව දුරුකොට ප්‍රඥාව ලැබූ හෙයින් බුද්ධ නමි. බුද්ධ යන මේ නම මව විසින් නොකරන ලදී. පියා විසින් නොකරන ලදී. සහෝදරයා විසින් නොකරන ලදී. සහෝදරිය විසින් නොකරන ලදී. මිත්‍රයන් දාසි දාසයන් විසින් නොකරන ලදී. මව්පිය දෙපසෙහි නෑයන් විසින් නොකරන ලදී. මහණ බමුණන් විසින් නොකරන ලදී. දෙවියන් විසින් නොකරන ලදී.

බුද්ධ යන මේ නම අර්හත් මාර්ගයාගේ කෙළවර අර්හත් ඵලයේදී ලබන නමකි. භාග්‍යවත් බුදුවරයන් වහන්සේලාගේ බොධිමූලයෙහි සර්වඥතාඥානය ලැබීම හා සමග චතුස්සත්‍ය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් වූ නමකි.

28. දෙසනා කරන ලදී යනු ආත්මදමනාර්ථ සංඛ්‍යාත යථාර්ථය (ii) යම් ආකාරයකින් බුදුන් විසින් දෙශනාකරනලද්දේද (iii) ආත්ම සමනාර්ථ සංඛ්‍යාත යථාර්ථය (මෙහි (ii) යොදන්න) තම කෙලෙස් නිවීම් සංඛ්‍යාත යථාර්ථය (මෙහි (ii) විශෙෂයෙන් දැනීම් අර්ථය (මෙහි (ii) පිරිසිඳ දැනීම් අර්ථය (මෙහි (ii) ප්‍රහාණය කිරීම් අර්ථය (මෙහි (ii) ප්‍රත්‍යක්ෂ කිරීම අර්ථය (ii) සත්‍යයන් අවබොධ කිරීම් අර්ථය (ii) නිර්වාණයෙහි පිහිටුවීම් සංඛ්‍යාත යථාර්ථය යම් ආකාරයකින් බුදුන් විසින් දෙශනා කරන ලද්දේද,

29. හෙතෙම යනු ගිහියෙක් හෝ වෙයි. පැවිද්දෙක් හෝ වෙයි. ලොක යනු ස්කන්ධ ලොකයද ධාතු ලොකයද ආයතන

ලොකයද විපත්ති භව ලොකයද විපත්ති සම්භව ලොකයද සම්පත්ති භව ලොකයද සම්පත්ති සම්භව ලොකයද සියලු සත්වයෝ ආහාරය හෙතුකොට ගෙන පවත්නාහ. යන එක් ලොකයද (මෙහි දිට්ඨි කථාවල 228 ඡේදයේ මුල සිට දහඅටක් යන තැනට යෙදිය යුතුයි) අටළොස් ලොක අටළොස් ධාතූහුය.

30. ආලොක කෙරෙහි යන මෙහි ආත්මදමනය සංඛ්‍යාත යථාර්ථය (ii) අවබොධකළ හෙයින් හෙතෙම මේ ලොකය ආලොක කරයි, බබලවයි, දීප්තිමත් කරයි. ආත්මසමනය සංඛ්‍යාත යථාර්ථය අවබොධ කළහෙයින් හෙතෙම මේ ලොකය ආලොක කරයි. බබලවයි, දීප්තිමත් කරයි. තම කෙලෙසුන් පිරිනිවීම් සංඛ්‍යාත යථාර්ථය අවබොධ කළ හෙයින් හෙතෙම මේ ලොකය ආලොක කරයි, බබලවයි, දීප්තිමත් කරයි. (iii) ආත්ම දමනාර්ථය (මෙහි (ii) ආත්ම සමනය කිරීම් අර්ථය (මෙහි (ii) ක්ලෙශයන් නිවීම් අර්ථය (මෙහි (ii) විශේෂයෙන් දැනීම් අර්ථය (මෙහි (ii) පිරිසිඳ දැනීම් අර්ථය (මෙහි (ii) ප්‍රහාණය කිරීම් අර්ථය (මෙහි (ii) ප්‍රත්‍යක්ෂ කිරීම් අර්ථය (මෙහි (ii) සත්‍යයන් අවබොධ කිරීම් අර්ථය (මෙහි (ii) නිර්වාණයෙහි පිහිටුවීම් සංඛ්‍යාත යථාර්ථය අවබොධ කළ හෙයින් හෙතෙම මේ ලෝකය ආලොක කරයි, බබලවයි, දීප්තිමත් කරයි. වළාකුළින් මිදුණ චන්ද්‍රයා මෙන් යන මෙහි වළාකුළු යම්සේද ක්ලේශයෝ එසේය. චන්ද්‍රයා යම්සේද මාර්ග ඥානය එසේය. චන්ද්‍ර දිව්‍ය පුත්‍රයා යම්සේද භික්ෂුව එසේය. වළාකුළින් මිදුණා වූද හිමෙන් මිදුණාවූද දුමෙන් හා රජසින් මිදුණාවූද රාහු අල්වා ගැනීමෙන් මිදුණාවූද චන්ද්‍රයා යම්සේ ආලොක කරන්නේද දිළිසෙන්නේද බබලන්නේද එසේම සියලු කෙලෙසුන්ගෙන් මිදුණාවූ භික්ෂුවද ආලොක කරන්නේද දිළිසෙන්නේද බබලන්නේද වෙයි. එහෙයින් වළාකුළින් මිදුණාවූ සඳ මෙන් යයි කියනු ලැබේ. මේ තෙළස (දහතුන) පිරිසිදුවීමෙහි ඥාණයෝයි.

31. සිහියෙන් යුක්තව කළයුතු දෙතිසක් ඥාණයෝ කවරහුද? මෙහි මහණතෙම අරණ්‍යයට පැමිණියේ හෝ වෘක්ෂමූලයකට පැමිණියේ හෝ සුන්‍යාගාරයකට පැමිණියේ හෝ කය ඍජු කොට සිහිය අභිමුඛ කොට තබා පර්යංකයෙන්

හිඳින්නේ වෙයිද, හෙතෙම සිහි ඇතිවම ආශ්වාසකරයි. සිහි ඇතිවම ප්‍රශ්වාස කරයි. දීර්ඝව ආශ්වාස කරන්නේ හෝ දීර්ඝව ආශ්වාස කරන්නෙමියි දැනගනියි. හ්‍රස්වව ආශ්වාස කරන්නේ හෝ හ්‍රස්වව ආශ්වාස කරන්නෙමියි දැනගනියි. දීර්ඝව ප්‍රශ්වාස කරන්නේ හෝ දීර්ඝව ප්‍රශ්වාස කරන්නෙමියි දැනගනියි. හ්‍රස්වව ප්‍රශ්වාස කරන්නේ හෝ හ්‍රස්වව ප්‍රශ්වාස කරන්නෙමියි දැනගනියි. (ii) සියලු ආශ්වාස කය දැන ගනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සියලු ප්‍රශ්වාස කය දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. කාය සංඛාර සංසිඳවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි කාය සංඛාර සංසිඳවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය දැනගනිමින්, සුඛය දැනගනිමින්, චිත්ත සංඛාරය දැනගනිමින්, චිත්ත සංඛාරය සංසිඳවමින්, සිත දැනගනිමින්, සිත සතුටු කරමින්, සිත ධ්‍යාන අරමුණෙහි පිහිටුවමින්, සිත නීවරණයන් කෙරෙන් මුදවමින්, අනිත්‍යය බලමින්, විරාගය බලමින්, නිරොධය බලමින්, අත්හැරීම බලමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. අත්හැරීම බලමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

32. මෙහි යනු මේ දෘෂ්ටියෙහි මේ කැමැත්තෙහි මේ රුචියෙහි මේ ගැනීමෙහි මේ ධර්මයෙහි මේ විනයෙහි මේ ධර්ම විනයෙහි මේ දෙශනාවෙහි මේ බ්‍රහ්මචර්යාවෙහි මේ ශාස්තෘ ශාසනයෙහි යන තේරුමෙන් මෙහියයි කියනු ලැබේ.

භික්ෂුතෙම යන මෙහි භික්ෂුව නම් කල්‍යාණ පෘථග්ජනවූ හෝ ශෛක්ෂවූ හෝ වෙනස් නොවන ධර්මය ඇත්තාවූ අර්හත්වූ හෝ පුද්ගලයා වෙයි.

අරණ්‍යයෙහිඃ- යනු ඉන්ද්‍රඛීලයෙන් (ගමෙහි දොරකණුවෙන්) පිටත නික්ම සියල්ල අරණ්‍යවෙයි.

වෘක්ෂමූලයඃ- යනු යම් තැනෙක්හි භික්ෂූන්ගේ ඇඳ හෝ පුටුව හෝ බුදිරිය හෝ පැදුර හෝ සම්කඩ හෝ තෘණ ඇතිරිය හෝ කොළ ඇතිරිය හෝ පිදුරු ඇතිරිය හෝ ආසන පනවන ලද්දේ වෙයිද ඒ ස්ථානයෙහි භික්ෂූහු සක්මන් කරන්නේ හෝ වෙයි, සිටින්නේ හෝ වෙයි, හිඳින්නේ හෝ වෙයි, සයනය කරන්නේ හෝ වෙයි.

සුනාය:- යනු ගිහියන්ගෙන් හෝ පැවිද්දන්ගෙන් හෝ කිසිවෙකුගෙන් ගැවසී නොගත් තැන යනුයි.

ගෙය:- යනු විහාරයක් හෝ ගුරුළුපත් හැඩය ඇති ගෙය හෝ ප්‍රාසාදය හෝ සඳලු සහිත ගෙය හෝ ගුහාව හෝ වෙයි.

පළඟ බැඳ හිඳ යනු පළඟ බැඳ හිඳගත්තේ වෙයි

කය කෙළින් තබා යනු මනාව පිහිටුවන ලද කය නොඇදව කෙලින් සිටියේ වෙයි.

සිහිය පරිමුඛකොට තබා:- යනු මෙහි පරි යනු දැඩිකොට ගැනීම් අර්ථ ඇත්තේය. මුඛ යනු එතෙරවීමට ප්‍රමුඛවීම යන අර්ථය ඇත්තේය. සති යනු එළඹ සිටීම අර්ථ කොට ඇත්තේය. එයින් සිහිය නිවනට පමුණුවන්නාවූ ධර්මය වශයෙන් දැඩිව ගෙන පිහිටුවායි කියනු ලැබේ.

33. සිහි ඇතිව ආශ්වාස කරයි. සිහි ඇතිව ප්‍රශ්වාසකරයි. යන මෙහි දෙතිස් ආකාරයකින් සිහිය කරන (උපදවන) සුලුවූයේ වෙයි. දීර්ඝව ආශ්වාස කිරීම් වශයෙන් සිතේ එකඟබව නොවිසිරයාම දැනගන්නාවූ යොගාවචරයාහට සිහිය එළඹ සිටියේ වෙයි. ඒ සිහියෙන් ඒ ඥාණයෙන් සිහිය ඇති කරන සුලුවූයේ වෙයි. දීර්ඝව ප්‍රශ්වාස කිරීම් වශයෙන් සිතේ එකඟ බව නොවිසිරයාම දැනගන්නහුට සිහිය එළඹ සිටියේ වෙයි. ඒ සතියෙන් ඒ ඥාණයෙන් සිහිය ඇති කරන්නේ වෙයි. හ්‍රස්වව ආශ්වාස කිරීම් වශයෙන් සිතේ එකඟ බව නොවිසිරයාම දන්නහුට සිහිය එළඹ සිටියේ වෙයි. එම සිහියෙන් එම ඥාණයෙන් සිහිය ඇති කරන්නේ වෙයි. හ්‍රස්වව ප්‍රශ්වාස කිරීම් වශයෙන් සිතේ එකඟ බව නොවිසිර යාම දන්නහුට සිහිය එළඹ සිටියේ වෙයි. ඒ සිහියෙන් ඒ ඥාණයෙන් සිහිය ඇතිකරන්නේ වෙයි. (31 ඡේදයේ (ii) සියලු ආශ්වාස කය දැනගනිමින් යනාදී මුල්පද පමණක් යොදා ගත යුතුය.) අත්හැරීම බලමින් ආශ්වාස කිරීම් වශයෙන් අත්හැරීම බලමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් සිතේ එකඟ බව නොවිසිරයාම දැනගන්නාහට සිහිය එළඹ සිටියේ වෙයි. ඒ සිහියෙන් ඒ ඥාණයෙන් සිහිය ඇති කරන්නේ වෙයි.

**34.** කෙසේ නම් දීර්ඝව ආශ්වාස කරන්නේ දීර්ඝව ආශ්වාස කරන්නෙමියි දනීද දීර්ඝව ප්‍රශ්වාස කරන්නේ දීර්ඝව ප්‍රශ්වාස කරන්නෙමියි දනීද? දීර්ඝ ආශ්වාසය දීර්ඝ කාලයෙහි ආශ්වාස කරයි. දීර්ඝ ප්‍රශ්වාසය දීර්ඝ කාලයෙහි ප්‍රශ්වාස කරයි. දීර්ඝ ආශ්වාස ප්‍රශ්වාසය දීර්ඝ කාලයෙහි ආශ්වාස ප්‍රශ්වාස කරයි. දීර්ඝ ආශ්වාස ප්‍රශ්වාසය දීර්ඝ කාලයෙහි ආශ්වාස කරන්නහුටද ප්‍රශ්වාස කරන්නහුටද ඡන්දය (කැමැත්ත) උපදියි. ඡන්දයාගේ වශයෙන් ඊටද වඩා සියුම්වූ දීර්ඝවූ ආශ්වාසය දීර්ඝවූ කාලයෙහි ආශ්වාසයකරයි. ඡන්දයාගේ වශයෙන් ඊටද වඩා සියුම්වූ ප්‍රශ්වාසය දීර්ඝවූ කාලයෙහි ප්‍රශ්වාස කරයි. ඡන්දයාගේ වශයෙන් ඊට වඩා සියුම්වූ ආශ්වාස ප්‍රශ්වාසය දීර්ඝවූ කාලයෙහි ආශ්වාස කරන්නහුටද ප්‍රශ්වාස කරන්නහුටද ප්‍රමොද්‍යය (සතුට) උපදියි. ප්‍රමොද්‍යයාගේ වශයෙන් ඊට වඩා සියුම්වූ ආශ්වාසය දීර්ඝ කාලයෙහි ආශ්වාස කරයි. ප්‍රමෝද්‍යයාගේ වශයෙන් ඊට වඩා සියුම්වූ ප්‍රශ්වාසය දීර්ඝ කාලයෙහි ප්‍රශ්වාස කරයි. ප්‍රමොද්‍යයාගේ වශයෙන් ඊට වඩා සියුම් ආශ්වාස ප්‍රශ්වාසය දීර්ඝ කාලයෙහි ආශ්වාසයද කරයි. ප්‍රශ්වාසද කරයි. ප්‍රමොද්‍යයාගේ වශයෙන් ඊට වඩා සියුම්වූ ආශ්වාස ප්‍රශ්වාසය දීර්ඝ කාලයෙහි ආශ්වාස කරන්නාහටද ප්‍රශ්වාස කරන්නාහටද (ප්‍රතිභාග නිමිත්ත ඉපදීමෙන් ප්‍රකෘති ආශ්වාස ප්‍රශ්වාසයෙන්) සිත නවතියි. උපෙක්ෂාව පිහිටයි. මේ නව ආකාරයෙන් දීර්ඝවූ ආශ්වාස ප්‍රශ්වාසයෝ කාය නම්. අරමුණට එළඹ සිටීම සති නම්. නැවත නැවත බැලීම අනුපස්සනා නම්. කය උපට්ඨානය (එළඹ සිටීමට ස්ථානය) වෙයි. සතිය නොවෙයි. සතිය උපට්ඨානයද වෙයි සතියද වෙයි. එම සිහියෙන් එම ඥාණයෙන් එම කය නැවත නැවත බලන්නේය. එහෙයින් කයෙහි කය නැවත නැවත බලන්නාවූ සතිපට්ඨාන භාවනායි කියනු ලැබේ.

**35.** නැවත නැවත බලයි යන මෙහි ඒ කය කෙසේ නැවත නැවත බලයිද අනිත්‍ය වශයෙන් බලයි. නිත්‍ය වශයෙන් නොබලයි. දුක් වශයෙන් බලයි සැප වශයෙන් නොවේ. අනාත්ම වශයෙන් බලයි ආත්ම වශයෙන් නොබලයි. කලකිරෙයි, සතුටු නොවෙයි, වෙන්වෙයි, නොඇලෙයි, නිරුද්ධ කරයි, නූපදවයි,

අත්හරියි, අල්වානොගනියි, අනිත්‍ය වශයෙන් බලයි. නිත්‍ය සංඥාව දුරුකරයි. දුක් වශයෙන් බලන්නේ සුඛ සංඥාව දුරුකරයි. අනාත්ම වශයෙන් බලන්නේ ආත්ම සංඥාව දුරුකරයි. කලකිරෙන්නේ තෘෂ්ණා සහගත සතුට දුරුකරයි. වෙන්වන්නේ ඇලීම දුරුකරයි. නිරුද්ධ කරන්නේ පහළවීමේ හෙතුව දුරුකරයි. අත්හරින්නේ අල්වාගැනීම දුරුකරයි. මෙසේ කය නැවත නැවත බලයි.

**36.** (i) භාවනා යන මෙහි භාවනා සතරකි. එහි පහළවන ධර්මයන් නොඉක්මවීම් අර්ථයෙන් භාවනාව ඉන්ද්‍රියන්ගේ සමාන කෘත්‍ය ඇති අර්ථයෙන් භාවනාව ඊට අනුකූල වීර්යයෙන් හා ඉසිලීම් අර්ථයෙන් භාවනාව යන මේ සතරය.

(ii) දීර්ඝව ආශ්වාස කිරීම් වශයෙන් සිතේ එකඟබව නොවිසිරයාම දැනගන්නහුට ප්‍රකටවූ වේදනා උපදිත්. (ii) ප්‍රකටවූ වේදනා වැටහෙත්, ප්‍රකටවූ වේදනා විනාශයට යෙත්. ප්‍රකටවූ සංඥාවෝ උපදිත්. ප්‍රකටවූ සංඥාවෝ වැටහෙත්. ප්‍රකටවූ සංඥාවෝ විනාශයට යත්. ප්‍රකටවූ විතර්කයෝ උපදිත්, ප්‍රකටවූ විතර්කයෝ වැටහෙත්. ප්‍රකටවූ විතර්කයෝ විනාශයට යෙත්.

**37.** වේදනාවගේ ඉපදීම කෙසේ ප්‍රකට වේද, අවිද්‍යාවගේ පහළවීම හෙතුකොට ගෙන වේදනාවගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළවීම් අර්ථයෙන් වේදනාවගේ ඉපදීම ප්‍රකට වූයේ වෙයි. තෘෂ්ණාවගේ පහළවීම් හෙතුකොට ගෙන වේදනාවගේ පහළවීම වෙයි. කර්මයාගේ පහළවීම හෙතුකොට ගෙන වේදනාවගේ පහළවීම වෙයි. ඵස්සයාගේ පහළවීම හෙතුකොට ගෙන වේදනාවගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළවීම් අර්ථයෙන් වේදනාවගේ ඉපදීම ප්‍රකටවූයේ වෙයි. ඉපදීම් ලක්ෂණය දක්නාහටද වේදනාවගේ ඉපදීම ප්‍රකටවූයේ වෙයි. මෙසේ වේදනාවගේ ඉපදීම ප්‍රකට වෙයි.

**38.** (i) කෙසේ වේදනාවගේ වැටහීම ප්‍රකටවෙයිද? අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට ක්ෂය වශයෙන් වැටහීම ප්‍රකට වෙයි. දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට භය වශයෙන් වැටහීම ප්‍රකට වෙයි. අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට සුන්‍ය වශයෙන් වැටහීම ප්‍රකට වෙයි. මෙසේ වේදනාවගේ වැටහීම ප්‍රකට වෙයි.

**39.** කෙසේ වේදනාවගේ විනාශය ප්‍රකට වෙයිද අවිද්‍යාව නිරුද්ධවීම හෙතුකොට ගෙන වේදනාව නිරුද්ධවේයයි ප්‍රත්‍යයාගේ නිරුද්ධවීම් අර්ථයෙන් වේදනාවගේ විනාශය ප්‍රකට වූයේ වෙයි. තෘෂ්ණාව නිරුද්ධවීම හෙතුකොටගෙන වේදනාව නිරුද්ධ වේයයි කර්මය නිරුද්ධවීම හෙතුකොට ගෙන වේදනාව නිරුද්ධ වේයයි ඵස්සය නිරුද්ධවීම හෙතුකොට ගෙන වේදනාව නිරුද්ධවේයයි ප්‍රත්‍යය නිරුද්ධවීම් අර්ථයෙන් වේදනාවගේ විනාශය ප්‍රකටවූයේ වෙයි. විපරිණාම ලක්ෂණය දක්නා හටද වේදනාවගේ විනාශය ප්‍රකටවූයේ වෙයි. මෙසේ වේදනාවගේ විනාශය ප්‍රකටවූයේ වෙයි. මෙසේ ප්‍රකටවූ වේදනාවෝ උපදිත්, ප්‍රකටවූ වේදනාවෝ වැටහෙත්, ප්‍රකටවූ වේදනාවෝ විනාශ වෙත්.

**40.** කෙසේ ප්‍රකටවූ සංඥාවෝ උපදිත්ද ප්‍රකටවූ සංඥාවෝ වැටහෙත්ද ප්‍රකටවූ සංඥවෝ විනාශ වෙත්ද? කෙසේ සංඥාවගේ ඉපදීම ප්‍රකට වෙයිද? අවිද්‍යාවගේ ඉපදීම හෙතුකොට ගෙන සඤ්ඤාවගේ ඉපදීම වේයයි ප්‍රත්‍යයාගේ පහළවීම් අර්ථයෙන් සඤ්ඤාවගේ ඉපදීම ප්‍රකටවෙයි. තෘෂ්ණාවගේ ඉපදීම හෙතුකොට ගෙන සඤ්ඤාවගේ ඉපදීම වේයයි කර්මයාගේ ඉපදීම හෙතුකොට ගෙන සඤ්ඤාවගේ ඉපදීම වේයයි ඵස්සයාගේ ඉපදීම හෙතුකොට ගෙන සඤ්ඤාවගේ ඉපදීම වේයයි ප්‍රත්‍යයාගේ ඉපදීම් අර්ථයෙන් සඤ්ඤාවගේ ප්‍රකටවෙයි. ඉපදීම් ලක්ෂණය දක්නාහටද සඤ්ඤාවගේ ඉපදීම ප්‍රකටවෙයි. මෙසේ සඤ්ඤාවගේ ඉපදීම ප්‍රකට වෙයි.

**41.** කෙසේ සංඥාවගේ වැටහීම ප්‍රකට වෙයිද? අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නහුට ක්ෂය වශයෙන් වැටහීම ප්‍රකට වෙයි. දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට භය වශයෙන් ප්‍රකට වෙයි. අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට සුන්‍ය වශයෙන් වැටහීම ප්‍රකට වෙයි. මෙසේ සඤ්ඤාවගේ වැටහීම ප්‍රකට වෙයි.

**42.** කෙසේ සඤ්ඤාවගේ විනාශය ප්‍රකට වෙයිද? අවිද්‍යාවගේ නිරුද්ධවීම හෙතුකොට ගෙන සඤ්ඤාව නිරුද්ධ වේයයි ප්‍රත්‍යය නිරුද්ධවීම් අර්ථයෙන් සඤ්ඤාවගේ විනාශය ප්‍රකටවෙයි. තෘෂ්ණාව නිරුද්ධවීම හෙතුකොට ගෙන සඤ්ඤාව

නිරුද්ධ වේයයි කර්මය නිරුද්ධවීම හෙතුකොට ගෙන සඞ්ඛාව නිරුද්ධ වේයයි ඵස්සය නිරුද්ධවීම හෙතුකොට ගෙන සඞ්ඛාව නිරුද්ධ වේයයි ප්‍රත්‍යය නිරුද්ධවීම් අර්ථයෙන් සඞ්ඛාවගේ විනාශය ප්‍රකටවෙයි. විපරිනාම ලක්ෂණය දක්නාහටද සඞ්ඛාවගේ විනාශය ප්‍රකට වෙයි. මෙසේ සඞ්ඛාවගේ විනාශය ප්‍රකටවූයේ වෙයි. මෙසේ ප්‍රකටවූ සඞ්ඛාවෝ උපදිත්. ප්‍රකටවූ සඞ්ඛාවෝ වැටහෙත්. ප්‍රකටවූ සඞ්ඛාවෝ විනාශයට පැමිණෙත්.

43. කෙසේ ප්‍රකටවූ විතර්කයෝ උපදිත්ද ප්‍රකටවූ විතර්කයෝ වැටහෙත්ද ප්‍රකටවූ විතර්කයෝ විනාශයට යෙද්ද?

කෙසේ විතර්කයන්ගේ ඉපදීම ප්‍රකට වෙයිද? අවිද්‍යාව (ii) පහළවීම හෙතුකොට ගෙන විතර්කයාගේ පහළවීම වේයයි ප්‍රත්‍යයාගේ පහළවීම් අර්ථයෙන් විතර්කයන්ගේ ඉපදීම ප්‍රකට වෙයි. (iii) තෘෂ්ණාව (මෙහි (ii) කර්මයාගේ (මෙහි ii) සඞ්ඛාවගේ (මෙහි ii) ප්‍රත්‍යයාගේ පහළවීම් අර්ථයෙන් විතර්කයන්ගේ ඉපදීම ප්‍රකට වෙයි. ඉපදීම් ලක්ෂණය දක්නහුටද විතර්කයන්ගේ ඉපදීම ප්‍රකට වෙයි. මෙසේ විතර්කයන්ගේ ඉපදීම ප්‍රකට වෙයි.

44. කෙසේ විතර්කයන්ගේ වැටහීම ප්‍රකටවෙයිද? අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට ක්ෂය වශයෙන් වැටහීම ප්‍රකට වෙයි. දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට භය වශයෙන් වැටහීම ප්‍රකට වෙයි. අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට ශූන්‍ය වශයෙන් වැටහීම ප්‍රකට වෙයි. මෙසේ විතර්කයන්ගේ වැටහීම ප්‍රකට වෙයි.

45. කෙසේ විතර්කයන්ගේ විනාශය ප්‍රකට වේද? අවිද්‍යාව නිරුද්ධවීම හෙතුකොට ගෙන විතර්කයාගේ නිරොධය වේයයි ප්‍රත්‍යයාගේ නිරුද්ධවීම් අර්ථයෙන් විතර්කයන්ගේ විනාශය ප්‍රකට වෙයි. තෘෂ්ණාව (ii) නිරුද්ධවීම හෙතුකොට ගෙන විතර්කයාගේ නිරොධය වේයයි (iii) කර්මය (මෙහි (ii) සඞ්ඛාව (මෙහි ii) ප්‍රත්‍යයාගේ නිරුද්ධවීම් අර්ථයෙන් විතර්කයන්ගේ විනාශය ප්‍රකට වෙයි. විපරිනාම ලක්ෂණය දක්නහුටද විතර්කයන්ගේ විනාශය ප්‍රකට වෙයි. මෙසේ

විතර්කයන්ගේ විනාශය ප්‍රකට වෙයි. මෙසේ ප්‍රකටවූ විතර්කයෝ උපදිත්. ප්‍රකටවූ විතර්කයෝ වැටහෙත්, ප්‍රකටවූ විතර්කයෝ විනාශයට යත්.

**46.** දීර්ඝව කරන්නාවූ ආශ්වාස ප්‍රශ්වාසයාගේ වශයෙන් (ii) චිත්තයාගේ එකඟ බව නොවිසිර ගිය බව දන්නාවූ යොගාවචර තෙම ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයි. ගොචරයද දැනගනියි. සම බව හා අර්ථයද ප්‍රතිවෙධ කරයි. (iii) හ්‍රස්වව කරන්නාවූ ආශ්වාස ප්‍රශ්වාසයාගේ වශයෙන් (මෙහි (ii) යොදන්න.)

**47.** ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයි යන මෙහි කෙසේ ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයිද? (ii) ස්ථිරව ඇදහීම් අර්ථයෙන් සද්ධින්ද්‍රිය අරමුණෙහි පිහිටුවයි. එසවීම් අර්ථයෙන් විරියින්ද්‍රිය අරමුණෙහි පිහිටුවයි. එළඹ සිටීම් අර්ථයෙන් සතින්ද්‍රිය අරමුණෙහි පිහිටුවයි. නොවිසිරයාම අර්ථයෙන් සමාධින්ද්‍රිය අරමුණෙහි පිහිටුවයි. දැකීම් අර්ථයෙන් ඍඤ්ඤින්ද්‍රිය අරමුණෙහි පිහිටුවයි. මේ පුද්ගල තෙමේ මේ ඉන්ද්‍රියයන් මේ අරමුණෙහි පිහිටුවයි. එහෙයින් ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයි යනු කියනු ලැබේ.

**48.** ගොචරයද දැනගනියි යන මෙහි යමක් ඔහුගේ අරමුණද එය ඔහුගේ ගොචර නම්. යමක් ඔහුගේ ගොචරයද එය ඔහුගේ අරමුණ වෙයි. දැනගනියි යනු පුද්ගලයා දැනගනියි. දැනීම ප්‍රඥාවයි.

(ii) ‘සම’ යනු ආරම්මණයාගේ වැටහීම ‘සම’ නමි. චිත්තයාගේ නොවිසිරයාම සම නමි. චිත්තයාගේ අධිෂ්ඨානය සම නමි. චිත්තයාගේ පිරිසිදුවීම සම නමි. ‘අර්ථය’ යනු වරද නැති බව යන අර්ථය කෙලෙස් නැති බව යන අර්ථය උතුම් අර්ථය යන අර්ථයි. ‘ප්‍රතිවෙධ කරයි’ යනු ආරම්මණයාගේ එලඹ සිටීම් අර්ථය ප්‍රතිවෙධ කරයි. චිත්තයාගේ අධිෂ්ඨානාර්ථය ප්‍රතිවෙධ කරයි. චිත්තයාගේ වේදානාර්ථය ප්‍රතිවෙධ කරයි. එහෙයින් සම බව හා අර්ථය ප්‍රතිවෙධ කරන්නේයයි කියනු ලැබේ.

**49.** 'බලයන්' අරමුණෙහි පිහිටුවයි, යන මෙහි කෙසේ බලයන් අරමුණෙහි පිහිටුවයිද? අශ්‍රද්ධාවෙන් කම්පා නොකළ හැකි ස්වභාවයෙන් ශ්‍රද්ධා බලය පිහිටුවයි. කුසීතකමින් කම්පා නොකළ හැකි ස්වභාවයෙන් වීර්යබලය පිහිටුවයි. ප්‍රමාදයෙන් කම්පා නොකළ හැකි ස්වභාවයෙන් සතිබලය පිහිටුවයි. උද්ධච්චයෙන් කම්පානොකළ හැකි ස්වභාවයෙන් සමාධිබලය පිහිටුවයි. අවිද්‍යාවෙන් කම්පා නොකළ හැකි ස්වභාවයෙන් ප්‍රඥාබලය පිහිටුවයි. මේ පුද්ගලතෙම මේ බලයන් මේ ආරම්මණයෙහි පිහිටුවයි. එහෙයින් බලයන් පිහිටුවන්නේයයි කියනු ලැබේ.

ගොචරයද දනියි යනු (මෙහි 48 (ii) ඡේදය යොදන්න.) එහෙයින් සමබවද අර්ථයද ප්‍රතිවෙධ කරන්නේ යයි කියනු ලැබේ.

**50.** බොධ්‍යංගයන් පිහිටුවයි යන මෙහි කෙසේ බොධ්‍යංගයන් පිහිටුවයිද? එළඹ සිටීම් අර්ථයෙන් සති සම්බොජ්ඣඞගය පිහිටුවයි. ධර්මයන් සෙවීම් අර්ථයෙන් ධම්මවිචය සම්බොජ්ඣඞගය පිහිටුවයි. එසවීම් අර්ථයෙන් වීරිය සම්බොජ්ඣඞගය පිහිටුවයි. පැතිරීම් අර්ථයෙන් පීති සම්බොජ්ඣඞගය පිහිටුවයි. සංසිඳීම් අර්ථයෙන් පස්සද්ධි සම්බොජ්ඣඞගය පිහිටුවයි. නොවිසිරයාම් අර්ථයෙන් සමාධි සම්බොජ්ඣඞගය පිහිටුවයි, මැදහත්වීම් අර්ථයෙන් උපෙක්ඛා සම්බොජ්ඣඞගය පිහිටුවයි. මේ පුද්ගල තෙම මේ බොධ්‍යංගයන් මේ ආරම්මණයෙහි පිහිටුවයි. එහෙයින් බොධ්‍යංගයන් පිහිටුවන්නේ යයි කියනු ලැබේ. ගොචරයද දැනගනියි යනු (මෙහි 48 (ii) ඡේදය යොදන්න) එහෙයින් සම බව හා අර්ථයද ප්‍රතිවෙධ කරන්නේයයි කියනු ලැබේ.

**51.** මාර්ගය පිහිටුවයි යන මෙහි කෙසේ මාර්ගය පිහිටුවයිද? දැකීම් අර්ථයෙන් සම්මාදිට්ඨිය පිහිටුවයි. අරමුණට නැංවීම් අර්ථයෙන් සම්මා සංකප්පය පිහිටුවයි, වැළඳ ගැනීම් අර්ථයෙන් සම්‍යක් වචනය පිහිටුවයි. මනාව පිහිටීම් අර්ථයෙන් සම්‍යක් කර්මාන්තය පිහිටුවයි. පිරිසිදුවීම් අර්ථයෙන් සම්‍යක් ආජීවය පිහිටුවයි, එසවීම් අර්ථයෙන් සම්‍යක් ව්‍යායාමය පිහිටුවයි. එළඹ

සිටීම් අර්ථයෙන් සම්මා සතිය පිහිටුවයි. නොවිසිර යාම් අර්ථයෙන් සම්මා සමාධිය පිහිටුවයි. මේ පුද්ගලතෙම මේ මාර්ගය මේ අරමුණෙහි පිහිටුවයි. එහෙයින් මාර්ගය පිහිටුවන්නේයයි කියනු ලැබේ.

'ගොචරයද දනියි' යනු (මෙහි 48 (ii) ඡෙදය යොදන්න.) එහෙයින් සම බවද අර්ථයද ප්‍රතිවෙධ කෙරේයයි කියනු ලැබේ.

**52.** ධර්මයන් පිහිටුවයි යන මෙහි කෙසේ ධර්මයන් පිහිටුවයිද? අධිපති අර්ථයෙන් ඉන්ද්‍රියයන් පිහිටුවයි. කම්පා නොකළ හැකි අර්ථයෙන් බලයන් පිහිටුවයි. එතරකිරීම් අර්ථයෙන් බොධ්‍යංගයන් පිහිටුවයි. හෙතු අර්ථයෙන් මාර්ගය පිහිටුවයි. එළඹ සිටීම් අර්ථයෙන් සතිපට්ඨානයන් පිහිටුවයි. උත්සාහ කිරීම් අර්ථයෙන් සම්‍යක් ප්‍රධානයන් පිහිටුවයි. සමෘද්ධවීම් අර්ථයෙන් ඍද්ධිපාදය පිහිටුවයි. විද්‍යාමානාර්ථයෙන් සත්‍යය පිහිටුවයි. නොවිසිරයාම් අර්ථයෙන් සමථය පිහිටුවයි. නැවත නැවත බැලීම් අර්ථයෙන් විදර්ශනා පිහිටුවයි. සමාන කෘත්‍ය ඇති අර්ථයෙන් සමථ විදර්ශනා පිහිටුවයි. ඔවුනොවුන් නොඉක්මවීම් අර්ථයෙන් යුගනන්ධය පිහිටුවයි. සංවර අර්ථයෙන් සීල විසුද්ධිය පිහිටුවයි. නොවිසිරයාම් අර්ථයෙන් චිත්ත විසුද්ධිය පිහිටුවයි. දැකීම් අර්ථයෙන් දිට්ඨි විසුද්ධිය පිහිටුවයි. මිදීම් අර්ථයෙන් විමොක්ෂය පිහිටුවයි. ප්‍රතිවෙධ කිරීම් අර්ථයෙන් විද්‍යාව පිහිටුවයි. අත්හැරීම් අර්ථයෙන් විමුක්තිය පිහිටුවයි. මුල් සිඳීම් අර්ථයෙන් ක්ෂය කිරීමෙහි ඥාණය පිහිටුවයි. සංසිඳීම් අර්ථයෙන් අනුත්පාදයෙහි ඥාණය පිහිටුවයි. ඡන්දය මුල්වීම් අර්ථයෙන් පිහිටුවයි. මනසිකාරය පහළකිරීමේ හෙතු අර්ථයෙන් පිහිටුවයි. ඵස්සය පිහිටුවීම් අර්ථයෙන් පිහිටුවයි. වේදනාව එක්වීම් අර්ථයෙන් පිහිටුවයි. සමාධිය ප්‍රමුඛ අර්ථයෙන් පිහිටුවයි. සතිය අධිපති අර්ථයෙන් පිහිටුවයි. ප්‍රඥාව ඒ ඒ ධර්මයන්ට උතුම් අර්ථයෙන් පිහිටුවයි. විමුක්තිය සාර අර්ථයෙන් පිහිටුවයි. අමෘතයට අයත් නිර්වාණය අවසානාර්ථයෙන් පිහිටුවයි. මේ පුද්ගල තෙම මේ ධර්මයන් මේ අරමුණෙහි පිහිටුවයි. එහෙයින් ධර්මයන් පිහිටුවන්නේයයි කියනු ලැබේ. 'සම' යනු ආරම්මණයාගේ එළඹ සිටීම් සම නමි. චිත්තයාගේ

නොවිසිරයාම සම නමි. චිත්ත අධිෂ්ඨානය සම නමි. චිත්තයාගේ පිරිසිදු බව සම නමි. 'අර්ථය' යනු නිවරද බව යන අර්ථයද කෙලෙස් රහිත බව යන අර්ථයද පිරිසිදු බව යන අර්ථයද වෙත්. 'ප්‍රතිවෙධ කරයි' යනු ආරම්මණයාගේ එළඹ සිටීම් අර්ථය ප්‍රතිවේධ කරයි. චිත්තයාගේ නොවිසිරයාම් අර්ථය ප්‍රතිවෙධ කරයි. චිත්තයාගේ අධිෂ්ඨානාර්ථය ප්‍රතිවේධ කරයි. චිත්තයාගේ පිරිසිදුවීම් අර්ථය පිරිසිදු කරයි. එහෙයින් සම බවද අර්ථයද ප්‍රතිවෙධ කරන්නේයයි කියනු ලැබේ.

**53.** කෙසේ හ්‍රස්ව කොට ආශ්වාස කරන්නේ හ්‍රස්වකොට ආශ්වාස කරන්නෙමියි දැනගනීද? හ්‍රස්වකොට ප්‍රශ්වාස කරන්නේ හ්‍රස්වකොට ප්‍රශ්වාස කරන්නෙමියි දැනගනීද? හ්‍රස්ව ආශ්වාසය කොට කාලයෙහි ආශ්වාස කරයි. හ්‍රස්ව ප්‍රශ්වාසය කොට කාලයෙහි ප්‍රශ්වාස කරයි. හ්‍රස්ව ආශ්වාස ප්‍රශ්වාසය කොට කාලයෙහි ආශ්වාස කරන්නේද වෙයි. ප්‍රශ්වාස කරන්නේද වෙයි. හ්‍රස්ව ආශ්වාස ප්‍රශ්වාසය කොට කාලයෙහි ආශ්වාස කරන්නාහටද ප්‍රශ්වාස කරන්නාහටද ඡන්දය (කැමැත්ත) උපදියි. ඡන්දයාගේ වශයෙන් ඊට වඩා සියුම්වූ කොට ආශ්වාසය කොට කාලයෙහි ආශ්වාස කරයි. ඡන්දයාගේ වශයෙන් ඊට වඩා සියුම්වූ කොට ප්‍රශ්වාසය කොට කාලයෙහි ප්‍රශ්වාස කරයි. ඡන්දයාගේ වශයෙන් ඊට වඩා සියුම්වූ හ්‍රස්ව ආශ්වාස ප්‍රශ්වාසය කෙටි කාලයෙහි ආශ්වාසයද කරයි. ප්‍රශ්වාසයද කරයි. ඡන්දයාගේ වශයෙන් ඊට වඩා සියුම්වූ හ්‍රස්ව ආශ්වාස ප්‍රශ්වාසය කොට කාලයෙහි ආශ්වාස කරන්නා හටද ප්‍රශ්වාස කරන්නාහටද ප්‍රමොද්‍යය (සතුට) උපදියි. ප්‍රමොද්‍යයාගේ වශයෙන් ඊට වඩා සියුම්වූ හ්‍රස්ව ආශ්වාසය කෙටි කාලයෙහි ආශ්වාස කරයි. ප්‍රමොද්‍යයාගේ වශයෙන් ඊට වඩා සියුම්වූ හ්‍රස්ව ප්‍රශ්වාසය කෙටි කාලයෙහි ප්‍රශ්වාස කරයි. ප්‍රමොද්‍යයාගේ වශයෙන් ඊට වඩා සියුම්වූ හ්‍රස්ව ආශ්වාස ප්‍රශ්වාසය කෙටි කාලයෙහි ආශ්වාසයද කරයි. ප්‍රශ්වාසද කරයි. ප්‍රමොද්‍යයාගේ වශයෙන් ඊට වඩා සියුම්වූ හ්‍රස්ව ආශ්වාස ප්‍රශ්වාසය කෙටි කාලයෙහි ආශ්වාස කරන්නාහටද ප්‍රශ්වාස කරන්නාහටද හ්‍රස්ව ආශ්වාස ප්‍රශ්වාසයන් කෙරෙන් සිත නවතියි. උපෙක්ෂාව පිහිටයි. මේ

නව ආකාරයෙන් හ්‍රස්ව ආශ්වාස ප්‍රශ්වාසයෝ කාය නමි. සතිය උපට්ඨාන නමි. ඤාණය අනුපස්සනා නමි. කය උපට්ඨානය වෙයි. සතිය නොවෙයි. සතිය උපට්ඨානයද වෙයි, සතියද වෙයි, එම සිහියෙන්ද එම ඤාණයෙන්ද කය නැවත නැවත බලන්නේය. එහෙයින් කයෙහි ආශ්වාස ප්‍රශ්වාස කය නැවත නැවත බලන්නාවූ සතිපට්ඨාන භාවනායි කියනු ලැබේ.

**54.** අනුපස්සති යන මෙහි කෙසේ එම කය බලන්නේද? (මෙහි 35 ඡේදය යොදන්න) මෙසේ ඒ කය බලයි. භාවනා යනු මෙහි භාවනා සතරකි. (මෙහි 36 ඡේදයේ (ii) යොදන්න) නැවත නැවත සෙවනය කිරීම් අර්ථයෙන් භාවනා නමි. හ්‍රස්ව ආශ්වාස ප්‍රශ්වාස වශයෙන් චිත්තයාගේ එකග්‍ර බව නොවිසිරයාම දැනගන්නාවූ යොගාවචරයාහට ප්‍රකටවූ වේදනා උපදිත්. හ්‍රස්ව ආශ්වාස ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකග්‍ර බව නොවිසිරයාම දැනගන්නා යොගාවචරතෙම ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයි. (මෙහි 46 ඡේදයේ ඉන්ද්‍රියයන් යන තැන සිට යොදන්න) එහෙයින් සම බවද අර්ථයද ප්‍රතිවෙධ කෙරේයයි කියනු ලැබේ.

කෙසේ සියලු කය දැනගනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයිද සියලු කය දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද?

**55.** කය යන මෙහි කාය දෙකකි. නාම කයද රූප කයද වෙයි. නාම කය කවරේද? වේදනාවද සඤ්ඤාවද චෙතනාවද ඵස්සයද මනසිකාරයද නාමයද නාම ධර්ම සමූහයද යම් ධර්ම කෙනෙක් චිත්ත සංඛාරයෝයයි කියනු ලැබෙද්ද මේ නාම කය නම් වෙයි.

රූප කය නම් කවරේද? සතර මහා භූතයෝද සතර මහා භූතයන් නිසා පවත්නා රූපයද ආශ්වාස ප්‍රශ්වාසයද නිමිත්තවූ ආශ්වාස ප්‍රශ්වාසයන් ස්පර්ශ වන තැනද යම් ධර්ම කෙනෙක් කාය සංඛාරයෝයයි කියනු ලැබෙද්ද මෙය රූප කය නමි.

**56.** ඒ කායයෝ කෙසේ ප්‍රකට කරනලද්දාහු වෙද්ද දීර්ඝව ආශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකග්‍ර බව නොවිසිර යාම දැනගන්නාහට සිහිය එළඹ සිටියා වෙයි. ඒ සිහියෙන් ඒ

ඤාණයෙන් ඒ කායයෝ ප්‍රකට කරන ලද්දාහු වෙත්. දීර්ඝව ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දැනගන්නාහට සිහිය එළඹ සිටියා වෙයි, එම සිහියෙන් එම ඤාණයෙන් ඒ කායයෝ ප්‍රකට කරන ලද්දාහු වෙත්.

හ්‍රස්ව ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දැනගන්නාහට (ii) සිහිය එළඹ සිටියා වෙයි, ඒ සතියෙන් ඒ ඤාණයෙන් ඒ කායයෝ ප්‍රකට කරනු ලද්දාහු වෙත්. (iii) හ්‍රස්වව ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දැනගන්නාහට සිහිය එළඹ සිටියා වෙයි. එම සිහියෙන් (මෙහි (ii) යොදන්න.)

මේ ඡෙදයේ ඒ ඒ වාක්‍ය අගට (ii) ඒ කායයෝ ප්‍රකට වෙත් යන්න යෙදිය යුතුයි.)

**57.** ආවර්ජනය කරන්නාහට (ii) ඒ කායයෝ ප්‍රකටවෙත්. (iii) දැනගන්නාහට- ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට- සිත අධිෂ්ඨාන කරන්නාහට- ශ්‍රද්ධාවෙන් දැඩිව බැසගන්නාහට- වීර්යයෙන් ඔසවන්නාහට- සිහිය එළවන්නාහට- සිත එකඟ කරන්නාහට- සඤ්ඤාවෙන් දැනගන්නාහට- දතයුතු ධර්මය දැනගන්නාහට- පිරිසිඳ දැනගතයුත්ත පිරිසිඳ දැනගන්නාහට- පහකළ යුත්ත පහකරන්නාහට- වැඩියයුත්ත වඩන්නාහට- ප්‍රත්‍යක්ෂ කළ යුත්ත ප්‍රත්‍යක්ෂ කරන්නාහට- මෙසේ ඒ කායයෝ ප්‍රකට වෙත්. සියලු කායයන් දැනගන්නාවූ ආශ්වාස ප්‍රශ්වාසයෝ කාය නම්. සතිය උපට්ඨාන නම්. ඤාණය අනුපස්සනා නම්. කය උපට්ඨානය වෙයි. සතිය නොවෙයි. සතිය උපට්ඨානයද වෙයි. සතිය වෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් ඒ කය නැවත නැවත බලයි. එහෙයින් කයෙහි කය නැවත නැවත බලන්නාවූ සතිපට්ඨාන භාවනායි කියනු ලැබේ.

**58.** නැවත නැවත බලයි යනු කෙසේ ඒ කය නැවත නැවත බලයිද (මෙහි 35 ඡෙදය යොදන්න) මෙසේ ඒ කය නැවත නැවත බලයි. භාවනාවෙහි භාවනා සතරකි, (මෙහි 36 ඡෙදයේ (ii) යොදන්න) සේවනය කිරීම් අර්ථයෙන් භාවනා නම්.

**59.** සියලු කය දැනගනිමින් කරන්නාවූ ආශ්වාස ප්‍රශ්වාසයන්ගෙන් උපන් සීලය සංවරවීම් අර්ථයෙන් සීල විසුද්ධි

නමි, සමාධිය නොවිසිරයාම් අර්ථයෙන් චිත්ත විසුද්ධිය නමි. ප්‍රඥාව දැකීම් අර්ථයෙන් දිට්ඨි විසුද්ධි නමි. එහි යම් සංවර ස්වභාවයක් ඇද්ද එය අධිශීල ශික්ෂා නමි. එහි යම් නොවිසිරයාම් ස්වභාවයක් වේද එය අධිචිත්ත ශික්ෂා නමි. එහි යම් දැකීම් ස්වභාවයක් වෙයිද එය අධිප්‍රඥා ශික්ෂා නමි. මේ ත්‍රිවිධ ශික්ෂාවන් ආවර්ජනය කරමින් හික්මෙයි. දැනගනිමින් හික්මෙයි, දකිමින් හික්මෙයි, ප්‍රත්‍යවෙක්ෂා කරමින් හික්මෙයි, සිත පිහිටුවමින් හික්මෙයි, ශ්‍රද්ධාවෙන් බැසගනිමින් හික්මෙයි, වීර්යය ඔසවමින් හික්මෙයි, සිහිය එළවමින් හික්මෙයි, සිත එකඟ කරමින් හික්මෙයි, ප්‍රඥාවෙන් දැනගනිමින් හික්මෙයි, දත යුත්ත දැනගනිමින් හික්මෙයි, පිරිසිඳ දතයුත්ත පිරිසිඳ දැනගනිමින් හික්මෙයි. පහකළ යුත්ත පහකරමින් හික්මෙයි, වැඩියයුත්ත වඩමින් හික්මෙයි, ප්‍රත්‍යක්ෂ කළයුත්ත ප්‍රත්‍යක්ෂ කරමින් හික්මෙයි. සියලු කය දැනගනිමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දන්නාවූ යොගාවචරයාහට ප්‍රකටවූ වේදනා උපදිත්. (මෙහි 38 ඡේදය යොදන්න) සියලු කය දැනගනිමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දැනගන්නාවූ යොගාවචරතෙම ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයි. (මෙහි 46 ඡේදයේ ඉන්ද්‍රියයන් යන තැන සිට යොදන්න) එහෙයින් සම බවද අර්ථයද ප්‍රතිවෙධකෙරේයයි කියනු ලැබේ.

**60.** කෙසේ කාය සංඛාරය සංසිඳවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයිද, කාය සංඛාරය සංසිඳවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද, කාය සංඛාරය නම් කවරේද? දීර්ඝ ආශ්වාසයෝ කයින් හටගත්තාහුය. ඒ ධර්මයෝ කය ඇසුරු කොට ඇති කාය සංඛාරයෝ වෙත්. ඒ කාය සංඛාරයන් සංසිඳුවමින් නිරුද්ධ කරමින් ශාන්ත බවට පමුණුවමින් හික්මෙයි. දීර්ඝ ප්‍රශ්වාසයෝ කයින් හටගත්තාහුය. ඒ ධර්මයෝ කය ඇසුරුකොට පවත්නා කාය සංඛාරයෝ වෙත්. ඒ කාය සංඛාරයන් සංසිඳුවමින් නිරුද්ධ කරමින් ශාන්ත බවට පමුණුවමින් හික්මෙයි.

**61.** හ්‍රස්ව ආශ්වාසයෝ- හ්‍රස්ව ප්‍රශ්වාසයෝ සියලු කය දැනගනිමින් කරන්නාවූ ආශ්වාසයෝ සියලු කය දැනගනිමින්

කරන්නාවූ ප්‍රශ්වාසයෝ කයින් හටගත්තාහුය. ඒ ධර්මයෝ කය ඇසුරුකොට ඇත්තාවූ කාය සංඛාරයෝ වෙත්. ඒ කාය සංඛාරයන් සංසිඳුවමින් නිරුද්ධ කරමින් ශාන්ත බවට පමුණුවමින් හික්මෙයි. යම්බඳුවූ කාය සංඛාරයන් කරණකොට ගෙන ශරීරයාගේ පිටුපසට නැමීමක් ඇලයට නැමීමක් ඉදිරියට නැමීමක් කම්පනයක් මඳ සෙලවීමක් අධික සෙලවීමක් අධික කම්පනයක් වේද, එම කාය සංඛාරයන් සංසිඳවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. එම කාය සංඛාරයන් සංසිඳවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

**62.** යම්බඳුවූ කාය සංඛාරයන් කරණකොටගෙන ශරීරයේ පිටුපසම යම් නොනැමීමක් වේද, යම් ඇලයට නොනැමීමක් වේද යම් ඉදිරියට නොනැමීමක් වේද කම්පා නොවීමක් වේද මඳ සෙලවීමක් නොවේද අධික සෙලවීමක් නොවේද එසේ සියුම්වූ කාය සංඛාර සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සියුම් කාය සංඛාර සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. මෙසේ සියුම් කාය සංඛාර සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි නම් සියුම් කාය සංඛාර සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි නම් එසේ ඇති කල්හි ආශ්වාස ප්‍රශ්වාස වාතය අරමුණුකොට ඇති විඤ්ඤාණයාගේ වැඩීමක්ද නොවන්නේය. ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ වැඩීමක්ද නොවන්නේය. ආනාපාන සතියගේ වැඩීමක්ද නොවන්නේය. ආනාපාන සති සමාධියගේ වැඩීමක්ද නොවන්නේය. එම සමාපත්තියට පණ්ඩිතයෝ සමවදින්නාහුද නොවෙත්. එයින් නැගිටින්නාහුද නොවෙත්.

**63.** එසේ සියුම් කාය සංඛාර සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේමය. සියුම් කාය සංඛාර සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය. එසේ ඇති කල්හි ආශ්වාස ප්‍රශ්වාස වාතය අරමුණුකොට පවත්නා විඤ්ඤාණයාගේ වැඩීමද වෙයි. ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ වැඩීමද වෙයි. ආනාපාන සතියගේ වැඩීමද වෙයි. ආනාපාන සති සමාධියගේ වැඩීමද වෙයි. එම සමාපත්තියට පණ්ඩිතයෝ සමවදින්නාහුද වෙත්. එයින් නැගිටින්නාහුද වෙත්. කුමක්

මෙන්ද යත්, යම්සේ රන් තැටියට ගැසූකල පළමුව මහත් ශබ්දයෝ නගිත්ද, මහත් ශබ්දයන්ගේ ආකාරය මනාකොට ගන්නා ලද හෙයින් මනාකොට මෙනෙහි කරන ලද හෙයින් මනා කොට සිත්හි තබන ලද හෙයින් මහත් ශබ්ද නැතිව ගිය කල්හි ඉන්පසු සියුම් ශබ්ද පවතිත්ද ඒ සියුම් ශබ්දයන්ගේ ආකාරය මනාකොට ගත්හෙයින් මනාකොට මෙනෙහි කළ හෙයින් මනාකොට සිත්හි පැවැත්වූ හෙයින් සියුම් ශබ්දයන් නිරුද්ධවූ පසුත් වඩා සියුම් ශබ්දයන් අරමුණුකොට ඇති ස්වභාවයෙන් සිත පවතියි. එසේම පළමුව ඖළාරික ආශ්වාස ප්‍රශ්වාසයෝ පවතිත්. ඖළාරික ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ ආකාරය මනාකොට ගත් බැවින් මනාකොට මෙනෙහි කළ හෙයින් මනාකොට සිත්හි තබන ලද හෙයින් ඖළාරික ආශ්වාස ප්‍රශ්වාසයන් නිරුද්ධවූ කල්හිද ඉන්පසු සියුම් ආශ්වාස ප්‍රශ්වාසයෝ පවතිත්. සියුම් ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ ආකාරය මනාකොට ගත්හෙයින් මනාකොට මෙනෙහි කළ හෙයින් මනාකොට සිත්හි තබන ලද හෙයින් සියුම් ආශ්වාස ප්‍රශ්වාසයන් නිරුද්ධවූ කල්හිද ඉන්පසු වඩා සියුම්වූ ආශ්වාස ප්‍රශ්වාසයන් අරමුණු කොට ඇති ස්වභාවයෙන් පවත්නා සිත වික්ෂේපයට නොයයි. මෙසේ ඇති කල්හි ආශ්වාස ප්‍රශ්වාස වාතය අරමුණු කොට ඇති චිත්තයාගේ වැඩීමද වෙයි. ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ වැඩීමද වෙයි. ආනාපාන සතියගේ වැඩීමද වෙයි. ආනාපාන සති සමාධියගේ වැඩීමද වෙයි. එම සමාපත්තියට පණ්ඩිතයෝ සමවදින්නාහුද වෙත්. එයින් නැගිටින්නාහුද වෙත්.

**64.** කාය සංඛාරය සංසිඳුවමින් කරන්නාවූ ආශ්වාස ප්‍රශ්වාසයෝ කාය නම්. සතිය උපට්ඨාන නම්. ඤාණය අනුපස්සනා නම්. කය උපට්ඨානය වෙයි, සතිය නොවෙයි. සතිය උපට්ඨානයද වෙයි, සතියද වෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් ඒ කය නැවත නැවත බලයි. එහෙයින් කයෙහි කය අනුවබලන සතිපට්ඨාන භාවනායි කියනු ලැබේ.

නැවත නැවත බලයි යන මෙහි කෙසේ එම කය නැවත නැවත බලයිද (35 ඡේදයේ අනිත්‍ය වශයෙන් බලයි යන තැන සිට ඡේදය අවසානය තෙක් යොදන්න) මෙසේ ඒ කය නැවත

නැවත බලයි. භාවනා යන මෙහි භාවනා සතරකි. (36 ඡේදයේ (ii) භාවනා යන තැන සිට යන මේ සතරයි යන තැනට යොදන්න) සේවනය කිරීම අර්ථයෙන් භාවනා නම්.

**65.** කාය සංඛාරය සංසිඳුවමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් පවත්නා සීලය සංවරාර්ථයෙන් සීල විසුද්ධි නම්. සමාධිය නොවිසිරයාම් අර්ථයෙන් චිත්ත විසුද්ධි නම්. ප්‍රඥාව දැකීම් අර්ථයෙන් දිට්ඨි විසුද්ධි නම්. එහි යම් සංවර ස්වභාවයක් වේද එය අධි ශීල ශික්ෂා නම්. එහි යම් නොවිසිර යම් ස්වභාවයක් වේද එය අධිචිත්ත ශික්ෂා නම්. එහි යම් දැකීම් ස්වභාවයක් වේද එය අධි ප්‍රඥා ශික්ෂා නම්. මේ ත්‍රිවිධ ශික්ෂාවන් ආවර්ජනය කරමින් හික්මෙයි. ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්මය ප්‍රත්‍යක්ෂ කරමින් හික්මෙයි.

**66.** කාය සංඛාර සංසිඳුවමින් කරන්නාවූ ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දන්නාහට ප්‍රකටවූ වෙදනා උපදිත්. කාය සංඛාර සංසිඳුවමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දැනගන්නේ ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයි. එහෙයින් සම බවද අර්ථයද ප්‍රතිවෙධ කෙරේයයි කියනු ලැබේ.

කයෙහි කය අනුව බැලීමෙහි අනුපස්සනා ඤාණ අටද සති එළඹ සිටීම් අටක්ද සූත්‍රයෙහි වදාළ වස්තු සතරද මෙසේ දත යුතුය.

(බණවර නිමි.)

---

**67.** කෙසේ ප්‍රීතිය විඳිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයිද ප්‍රීතිය විඳිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද? ප්‍රීතිය නම් කුමක්ද? දීර්ඝ ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දන්නාහට ප්‍රීතිය ප්‍රමොද්‍යය උපදියි. (ii) යම් ප්‍රීතියක් යම් ප්‍රමොද්‍යයක් තුටුවන ස්වභාවයක් ප්‍රමුදිත වන ස්වභාවයක් සතුටුවීමක් පහටුවීමක් ධනය ලැබීමට සමාන වීමක් ඔදවැඩි බවක් චිත්තයාගේ සතුටු බවක් වෙයිද, එය ප්‍රීතියයි. (iii) දීර්ඝව ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දැනගන්නහුට ප්‍රීතිය ප්‍රමොද්‍යය උපදියි. (මෙහි

(ii) යොදන්න) හ්‍රස්වව ආශ්වාස කිරීම් වශයෙන් හ්‍රස්වව ප්‍රශ්වාස කිරීම් වශයෙන් සියලු කය දැනගනිමින් ආශ්වාසකිරීම් වශයෙන් සියලු කය දැනගනිමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් කාය සංඛාර සංසිඳුවමින් ආශ්වාස කිරීම් වශයෙන් කාය සංඛාර සංසිඳුවමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දැනගන්නාවූ යොගාවචරයා හට ප්‍රීතිය ප්‍රමොද්‍යය උපදියි. යම් ප්‍රීතියක් ප්‍රමොද්‍යයක් තුටු බවක් පහටු බවක් ධනය ලැබීමට සමාන බවක් ඔද වැඩි බවක් චිත්තයාගේ සතුටු බවක් වෙයි නම් මෙය ප්‍රීතියයි.

68. ඒ ප්‍රීතිය කෙසේ විදිනලද්දී වෙයිද? දීර්ඝව ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දැනගන්නහුට සතිය එළඹ සිටියා වෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් ඒ ප්‍රීතිය විදිනලද්දී වෙයි. දීර්ඝව ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දැනගන්නහුට සිහිය එළඹ සිටියා වෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් ඒ ප්‍රීතිය විදිනලද්දී වෙයි. හ්‍රස්වකොට ආශ්වාස කිරීම් වශයෙන්- හ්‍රස්වකොට ප්‍රශ්වාස කිරීම් වශයෙන්- සියලු කය දැනගනිමින් ආශ්වාස කිරීම් වශයෙන්- සියලු කය දැනගනිමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන්- කාය සංඛාර සංසිඳුවමින් ආශ්වාස කිරීම් වශයෙන්- කාය සංඛාර සංසිඳුවමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟබව නොවිසිරයාම දැනගන්නහුට ඒ ප්‍රීතිය විඳිනලද්දී වෙයි. ආවර්ජනය කරන්නහුට ඒ ප්‍රීතිය ප්‍රකටවූවා වෙයි. (ii) දැනගන්නාහට දක්නා හට ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට සිත පිහිටුවන්නාහට ශ්‍රද්ධාවෙන් බැසගන්නාහට වීර්යය ඔසවන්නාහට සතිය එළවන්නාහට සිත එකඟ කරන්නාහට ප්‍රඥාවෙන් දැනගන්නාහට දත යුත්ත දැනගන්නාහට පිරිසිඳ දතයුත්ත පිරිසිඳ දැනගන්නා හට පහකළ යුත්ත පහකරන්නාහට වැඩිය යුත්ත වඩන්නා හට (ii) ප්‍රත්‍යක්ෂ කළයුත්ත ප්‍රත්‍යක්ෂ කරන්නාහට ඒ ප්‍රීතිය ප්‍රකටවූවා වෙයි. මෙසේ ඒ ප්‍රීතිය ප්‍රකටවූවා වෙයි.

69. ප්‍රීතිය විඳිමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් පවත්නා වෙදනා නමි. සතිය උපට්ඨාන නමි. ඤාණය

අනුපස්සනා නම්. වේදනාව උපට්ඨානය වෙයි. සතිය නොවෙයි. සතිය උපට්ඨානයද වෙයි. සතියද වෙයි. ඒ සතියෙන් ඒ ඥාණයෙන් ඒ වේදනාව නැවත නැවත බලයි. එහෙයින් වේදනාවන්හි වේදනා සතිපට්ඨාන භාවනායි කියනු ලැබේ.

නැවත නැවත බලයි යනු මෙහි කෙසේ ඒ වේදනාව නැවත නැවත බලයිද? අනිත්‍ය වශයෙන් බලයි. (35 ඡේදයේ අනිත්‍ය වශයෙන් බලයි යන තැන සිට ඡේදය අවසානය දක්වා යොදන්න) මෙසේ ඒ වේදනාව බලයි. භාවනා යන භාවනා සතරකි. (36 ඡේදයේ භාවනා යන තැන සිට යන මේ සතරයි යන තැනට යොදන්න) සේවනය කිරීම් අර්ථයෙන් භාවනා නම්. ප්‍රීතිය විඳිමින් කරන ආශ්වාස ප්‍රශ්වාසයාගේ වශයෙන් පවත්නා සීලය සංවරාර්ථයෙන් සීල විසුද්ධි නම්. ප්‍රීතිය විඳිමින් කරන ආශ්වාස ප්‍රශ්වාසයාගේ චිත්තයාගේ එකඟ බව විසිරයාම දැනගන්නහුට සිහිය එළඹ නොසිටින බව දැනගන්නා යොගාවචරතෙම ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයි. එහෙයින් සම බවද අර්ථයද ප්‍රතිවෙධ කෙරේයයි කියනු ලැබේ.

**70.** කෙසේ සුඛය ප්‍රකටව දැනගනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයිද? සුඛය ප්‍රකටව දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද? සුඛ යන මෙහි සුඛ දෙකකි. කායික සුඛයද චෛතසික සුඛයද වෙත්. කායික සුඛය කවරේද? යම් කායිකවූ මිහිරි බවක් වෙයිද, කායික සැපයක් වෙයිද, කාය සම්ඵස්සයෙන් උපදනා යම් මිහිරිවූ සැපවූ විඳීම් ආකාරයක් වෙයිද, කාය සම්ඵස්සයෙන් උපදනා මිහිරිවූ සැපවූ යම් වේදනාවක් වෙයිද, මෙය කායික සුඛය නම්.

71. චෛතසික සුඛය කවරේද? සිතෙහිවූ යම් මිහිරි බවක් සිතෙහිවූ සැපයක් මනොසම්ඵස්සයෙන් උපදනා මිහිරිවූ සැපවූ විඳීම් ආකාරයක් මනො සම්ඵස්සයෙන් උපදනා මිහිරිවූ සැපවූ යම් වේදනාවක් වෙයිද මෙය චෛතසික සුඛය නම්.

කෙසේ ඒ සුඛයෝ ප්‍රකටව දැනගන්නා ලද්දාහු වෙත්ද, දීර්ඝ ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දැනගන්නහුට සතිය එළඹ සිටියා වෙයි. ඒ සතියෙන් ඒ ඥාණයෙන් ඒ සුඛයෝ ප්‍රකටව දැනගන්නා ලද්දාහු

වෙත්. දීර්ඝ ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දැනගන්නහුට සතිය එළඹ සිටියා වෙයි. ඒ සතියෙන් ඒ ඥාණයෙන් ඒ සුඛයෝ ප්‍රකට දැනගන්නා ලද්දා වෙත්. ප්‍රත්‍යක්ෂ කළයුත්ත ප්‍රත්‍යක්ෂ කරන්නාහට ඒ සුඛයෝ ප්‍රකටව දැනගන්නා ලද්දාහු වෙත්. මෙසේ ඒ සුඛයෝ ප්‍රකටව දැනගන්නා ලද්දාහු වෙත්.

සුඛය දැනගනිමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් වේදනා නම්. (ii) සතිය උපට්ඨාන නම්. ඥාණය අනුපස්සනා නම්. වේදනාව උපට්ඨානය වෙයි. සතිය නොවෙයි, සතියද උපට්ඨානයද වෙයි. සතියද වෙයි. ඒ සතියෙන් ඒ ඥාණයෙන් ඒ වේදනාව නැවත නැවත බලයි. එහෙයින් වේදනාවන්හි වේදනානුපස්සනා සතිපට්ඨාන භාවනායි කියනු ලැබේ.

72. නැවත නැවත බලයි යන මෙහි ඒ වේදනාව කෙසේ බලයිද? අනිත්‍ය වශයෙන් බලයි, දුක් වශයෙන් බලයි, අනාත්ම වශයෙන් බලයි. මෙසේ ඒ වේදනාව නැවත නැවත බලයි භාවනා යන මෙහි භාවනා සතරකි. (36 ඡේදයේ භාවනා යන තැන සිට යන මේ සතරයි, යන තැනට යොදන්න) සෙවනය කිරීම් අර්ථයෙන් භාවනා නම්.

සුඛය දැනගනිමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් පවත්නා සීලය සංවරාර්ථයෙන් සීල විසුද්ධි නම්. සුඛය දැනගනිමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දැනගන්නහුට සිහිය එළඹ සිටියා වෙයි. ඒ සිහියෙන් ඒ ඥාණයෙන් සුඛයෝ ප්‍රකටකොට දැනගන්නේ ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයි එහෙයින් සම බවද අර්ථයද ප්‍රතිවෙධ කෙරේයයි කියනු ලැබේ.

73. කෙසේ චිත්තසංඛාරයන් දැනගනිමින් ආශ්වාසකරන්නෙමියි හික්මෙයිද චිත්ත සංඛාරය දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද? චිත්ත සංඛාරය යනු කවරේද? දීර්ඝව ආශ්වාස කිරීම් වශයෙන් සඤ්ඥාවද වේදනාවද සිතෙහි පහළ වෙත්. ඒ ධර්මයෝ සිත පිළිබඳ කොට ඇත්තාහු වෙත්. චිත්ත සංඛාරයෝ වෙත්. දීර්ඝව ප්‍රශ්වාස කිරීම් වශයෙන් (ii) සඤ්ඥාවද වේදනාවද සිත්හි පහළ වෙත්. ඒ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

ධර්මයෝ සිත පිළිබඳ වූවාහු වෙත්. චිත්ත සංඛාරයෝ වෙත් (iii) හ්‍රස්වව ආශ්වාස කිරීම් වශයෙන් (මෙහි (ii) හ්‍රස්වව ආශ්වාස කිරීම් වශයෙන් මෙහි (ii) සුඛය දැනගනිමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් සුඛය දැනගනිමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් සඤ්ඤාවද වේදනාවද සිත්හි පහළ වෙත්. ඒ ධර්මයෝ සිත පිළිබඳ කොට ඇත්තාහු වෙත්. චිත්ත සංඛාරයෝ වෙත්. මෙය චිත්ත සංඛාර නම්.

**74.** කෙසේ ඒ චිත්ත සංඛාරයෝ දැනගන්නා ලද්දාහු වෙත්ද? දීර්ඝ ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දැනගන්නාහට සිහිය එළඹ සිටියා වෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් චිත්ත සංඛාරයෝ දැනගන්නා ලද්දාහු වෙත්. දීර්ඝ ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දන්නහුට සතිය එළඹ සිටියා වෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් චිත්ත සංඛාරයෝ දැනගන්නා ලද්දාහු වෙත්. ප්‍රත්‍යක්ෂ කළයුත්ත ප්‍රත්‍යක්ෂ කරන්නාහට ඒ චිත්ත සංඛාරයෝ දැනගන්නා ලද්දාහු වෙත්. මෙසේ ඒ චිත්ත සංඛාරයෝ දැනගන්නා ලද්දාහු වෙත්.

**75.** චිත්ත සංඛාරය දැනගනිමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් වේදනාව වෙයි. සතිය උපට්ඨාන නම්. ඤාණය අනුපස්සනා නම්. වේදනාව උපට්ඨානය වෙයි. සතිය නොවෙයි සතිය උපට්ඨානයද වෙයි සතිය වෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් ඒ වේදනාව නැවත නැවත බලයි. එහෙයින් වේදනාවන්හි වේදනානු පස්සනා සතිපට්ඨාන භාවනායි කියනු ලැබේ. නැවත නැවත බලයි යන මෙහි කෙසේ නැවත නැවත බලයිද? අනිත්‍ය වශයෙන් බලයි. දුක් වශයෙන් බලයි, අනාත්ම වශයෙන් බලයි. මෙසේ ඒ වේදනාව නැවත නැවත බලයි. භාවනා යන මෙහි භාවනා සතරකි. (36 ඡේදයේ භාවනා යන තැන සිට යන මේ සතරයි යන තැනට යොදන්න) සෙවනය කිරීම් අර්ථයෙන් භාවනා නම්. චිත්ත සංඛාරය දැනගනිමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් පවත්නා සීලය සංවරාර්ථයෙන් සීල විසුද්ධි නම්. චිත්ත සංඛාරය දැනගනිමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දන්නහුට

සිහිය එළඹ සිටියා වෙයි, ඒ සතියෙන් ඒ ඤාණයෙන් චිත්ත සංඛාරයන් දැනගන්නේ ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයි. එහෙයින් සම බවද අර්ථයද ප්‍රතිවෙධ කෙරේයයි කියනු ලැබේ.

**76.** කෙසේ චිත්ත සංඛාරය සංසිඳවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයිද, චිත්ත සංඛාර සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද? චිත්ත සංඛාරය කවරේද? දීර්ඝව ආශ්වාස කිරීම් වශයෙන් (ii) සඤ්ඤාවද වේදනාවද සිත්හි උපදනාහ. ඒ ධර්මයෝ සිත පිළිබඳ වූවාහු වෙත්. චිත්ත සංඛාරයෝ වෙත්. ඒ චිත්ත සංඛාරයන් සංසිඳුවමින් නිරුද්ධ කරමින් සමනය කරමින් හික්මෙයි. (iii) දීර්ඝ ප්‍රශ්වාසයාගේ වශයෙන් සඤ්ඤාවද වේදනාවද සිත්හි උපදනාහු වෙත්. ඒ ධර්මයෝ සිත පිළිබඳ වූවාහු වෙත්. චිත්ත සංඛාරයෝ වෙත්. ඒ චිත්ත සංඛාරයන් සංසිඳුවමින් නිරුද්ධ කරමින් සමනය කරමින් හික්මෙයි. හ්‍රස්වව ආශ්වාසයාගේ වශයෙන් (මෙහි (ii) හ්‍රස්වව ප්‍රශ්වාසයාගේ වශයෙන් (මෙහි (ii) චිත්ත සංඛාර දැනගනිමින් ආශ්වාස කිරීම් වශයෙන් චිත්ත සංඛාර දැනගනිමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් සඤ්ඤාවද වේදනාවද සිත්හි උපදනාහු වෙත්. ඒ ධර්මයෝ සිත පිළිබඳ වූවාහු වෙත්. චිත්ත සංඛාරයෝ වෙත්, ඒ චිත්ත සංඛාරයන් සංසිඳුවමින් නිරුද්ධ කරමින් සමනය කරමින් හික්මෙයි.

චිත්ත සංඛාරයන් සංසිඳුවමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් වේදනාව වෙයි. සතිය උපට්ඨාන නම්. ඤාණය අනුපස්සනා නම්. වේදනාව උපට්ඨානය වෙයි. සතිය නොවෙයි සතිය උපට්ඨානයද වෙයි, සතියද වෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් ඒ වේදනාව නැවත නැවත බලයි. එහෙයින් වේදනාවන්හි වේදනාව අනුව බලන සතිපට්ඨාන භාවනායි කියනු ලැබේ.

නැවත නැවත බලයි යන මෙහි කෙසේ ඒ වේදනාව නැවත නැවත බලයිද (35 ඡේදයේ අනිත්‍යවශයෙන් බලයි යන තැන සිට ඡේදය අවසානය තෙක් යොදන්න) මෙසේ ඒ වේදනාව නැවත නැවත බලයි. භාවනා යන මෙහි භාවනා සතරකි. ඡේදයේ භාවනා යන තැන සිට යන මේ සතරයි යන

තැනට යොදන්න) සේවනය කිරීම් අර්ථයෙන් භාවනා නම්. චිත්ත සංඛාර සංසිඳුවමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් පවත්නා සීලය සීල විසුද්ධි නම්. චිත්ත සංඛාරයන් සංසිඳුවමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දැනගන්නහුට සිහිය එළඹ සිටියා වෙයි. ඒ සතියෙන් ඒ ඥාණයෙන් චිත්ත සංඛාරයන් දැනගන්නේ ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයි. එහෙයින් සම බවද අර්ථයද ප්‍රතිවෙධ කෙරේයයි කියනු ලැබේ.

වෙදනාවන්හි වේදනාව අනුව බැලීමෙහි අනුපස්සනා ඥාණ අටද උපට්ඨානානුස්සති අටද සූත්‍රාන්තික වස්තු සතරද මෙසේ දතයුතුය.

77. කෙසේ සිත දැනගනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයිද සිත දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද? සිත යනු කුමක්ද? දීර්ඝව ආශ්වාස කිරීම් වශයෙන් (ii) පවත්නා විඤ්ඤාණය සිත නම්. යම් සිතක් වෙයිද යම් මනසක් වෙයිද යම් හෘදයෙහි පවත්නක් වෙයිද යම් පිරිසිඳුවූවක් වෙයිද මන නම්වූ මනායතනයක් වේද මනින්ද්‍රියක් වේද විඤ්ඤාණයක්වේද විඤ්ඤාණස්කන්ධයක් වේද ඊට අනුකූලවූ මනො විඤ්ඤාණ ධාතුවක් වෙයිද (iii) දීර්ඝව ප්‍රශ්වාස කිරීම් වශයෙන් (මෙහි (ii) හ්‍රස්වව ආශ්වාස කිරීම් වශයෙන් මෙහි (ii) හ්‍රස්වව ප්‍රශ්වාස කිරීම් වශයෙන් මෙහි (ii) චිත්ත සංඛාර සංසිඳුවමින් ආශ්වාස කිරීම් වශයෙන් චිත්ත සංඛාර සංසිඳුවමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් පවත්නා විඤ්ඤාණය සිත නම්. යම් සිතක් යම් මනසක් යම් හෘදයෙහි වූවක් යම් පිරිසිඳු වූවක් මන නම්වූ මනායතනයක් මනින්ද්‍රියක් විඤ්ඤාණයක් විඤ්ඤාණස්කන්ධයක් ඊට අනුරූපවූ මනො විඤ්ඤාණ ධාතුවක් වෙයිද මෙය සිත නම්.

78. කෙසේ සිත දැනගන්නා ලද්දේ වෙයිද? දීර්ඝව ආශ්වාස කිරීම් වශයෙන් (ii) චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දැනගන්නාහට සතිය එළඹ සිටියා වෙයි. ඒ සතියෙන් ඒ ඥාණයෙන් ඒ සිත දැනගන්නා ලද්දේ වෙයි. ඒ සතියෙන් ඒ ඥාණයෙන් ඒ සිත දැනගන්නා ලද්දේ වෙයි. (iii) දීර්ඝව

ප්‍රශ්වාස කිරීම වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දැනගන්නාහට සතිය එළඹ සිටියා වෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් ඒ සිත දැනගන්නා ලද්දේ වෙයි. හ්‍රස්වව ආශ්වාස කිරීම් වශයෙන් මෙහි (iii) හ්‍රස්වව ප්‍රශ්වාස කිරීම් වහයෙන් මෙහි (iii) ප්‍රත්‍යක්ෂ කළයුත්ත ප්‍රත්‍යක්ෂ කරන්නාහට ඒ සිත දැනගන්නා ලද්දේ වෙයි. මෙසේ ඒ සිත දැනගන්නා ලද්දේ වෙයි.

සිත දැනගනිමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් පවත්නා විඤ්ඤාණය සිත නම්. සතිය උපට්ඨාන නම්. ඤාණය අනුපස්සනා නම්. සිත උපට්ඨානය වෙයි, සතිය නොවෙයි, සතිය උපට්ඨානයද වෙයි, සති වෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් ඒ සිත නැවත නැවත බලයි. එහෙයින් චිත්තයන්හි චිත්තානුපස්සනා සතිපට්ඨාන භාවනායි කියනු ලැබේ. නැවත නැවත බලයි යන මෙහි කෙසේ ඒ සිත නැවත නැවත බලයිද (35 ඡේදයේ අනිත්‍ය වශයෙන් බලයි යන තැන සිට ඡේදය අවසානය තෙක් යොදන්න) භාවනා යන මෙහි භාවනා සතරකි. (36 ඡේදයේ භාවනා යන තැන සිට යන මේ සතරයි යන තැනට යොදන්න) සේවනය කිරීම් අර්ථයෙන් භාවනානම්. සිත දැනගනිමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් පවත්නා සීලය සීල විසුද්ධි නම්. සිත දැනගනිමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දැනගන්නාහට සතිය එළඹ සිටියා වෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් ඒ සිත දැනගන්නේ ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයි. එහෙයින් සම බවද අර්ථයද ප්‍රතිවෙධ කෙරේයයි කියනු ලැබේ.

**79.** කෙසේ සිත සතුටු කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයිද සිත සතුටු කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද? චිත්තයාගේ සතුට නම් කුමක්ද? දීර්ඝව ආශ්වාස කිරීම් වශයෙන් (ii) චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දන්නහුට චිත්තයාගේ සතුට උපදියි. චිත්තයාගේ යම් ආමොදනයක් ප්‍රමොදනයක් තුටු බවක් පහටු බවක් ධනය ලැබීමට සමාන බවක් ඔද වැඩි බවක් සතුටු සිත් ඇති බවක් වෙයිද ඒ ස්වභාවය උපදියි. (iii)

දීර්ඝව ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දන්නහුට චිත්තයාගේ සතුට උපදියි. චිත්තයාගේ යම් ආමොදනයක් ප්‍රමොදනයක් තුටු බවක් පහටු බවක් ධනය ලැබීමට සමාන බවක් ඔදවැඩි බවක් සතුටු සිත් ඇති බවක් වෙයිද ඒ ස්වභාවය උපදියි. හ්‍රස්වව ආශ්වාස කිරීම් වශයෙන් (මෙහි (ii) හ්‍රස්වව ප්‍රශ්වාස කිරීම් වශයෙන් (ii) සිත දැනගනිමින් කරන්නාවූ ආශ්වාසයාගේ වශයෙන් සිත දැනගනිමින් කරන්නාවූ ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දන්නහුට චිත්තයාගේ සතුට උපදියි. චිත්තයාගේ යම් ආමොදනයක් ප්‍රමොදනයක් තුටු බවක් පහටු බවක් ධනය ලැබීමට සමාන බවක් ඔදවැඩි බවක් සතුටු සිත් ඇති බවක් වෙයිද ඒ ස්වභාවය උපදියි. මේ චිත්තයාගේ සතුටයි. සිත සතුටු කරමින් ආශ්වාස කිරීම වශයෙන් පවත්නා විඤ්ඤාණය චිත්ත නමි. සතිය උපට්ඨාන නමි. ඤාණය අනුපස්සනා නමි. සිත උපට්ඨානය වෙයි. සතිය නොවෙයි සතිය උපට්ඨානයද වෙයි. සතියද වෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් ඒ සිත නැවත නැවත බලයි. එහෙයින් සිතෙහි සිත අනුව බලන සතිපට්ඨාන භාවනායි කියනු ලැබේ.

80. නැවත නැවත බලයි යන මෙහි කෙසේ සිත නැවත නැවත බලයිද (35 ඡේදයේ අනිත්‍ය වශයෙන් බලයි යන තැන සිට ඡේදය අවසානය දක්වා යොදන්න) මෙසේ ඒ සිත නැවත නැවත බලයි. භාවනා යන මෙහි භාවනා සතරකි. (36 ඡේදයේ භාවනා යන තැන සිට යන මේ සතරයි යන තැනට යොදන්න) සේවනය කිරීම් අර්ථයෙන් භාවනා නමි. සිත සතුටු කරමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන්වූ සීලය සංවරාර්ථයෙන් සීල විසුද්ධිය නමි. සිත සතුටු කරමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දන්නාහට සිහිය එළඹ සිටියා වෙයි, ඒ සතියෙන් ඒ ඤාණයෙන් ඒ සුඛයෝ ප්‍රකටකොට දන්නේ ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයි. එහෙයින් සමබවද අර්ථයද ප්‍රතිවෙධ කෙරේයයි කියනු ලැබේ.

81. කෙසේ සිත අරමුණෙහි මනාව පිහිටුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයිද සිත අරමුණෙහි මනාව පිහිටුවමින්

ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද? (අරමුණෙහි සිත මනාව පිහිටුවීම සමාධියයි.) සමාධිය නම් කුමක්ද? දීර්ඝ ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම සමාධි නමි. (ii) චිත්තයාගේ යම් නිශ්චලව සිටීමක් සම්ප්‍රයුක්ත ධර්මයන් පිඩුකොට සිටීමක් බැසගෙන සිටීමක් ඔබමොබ නොදිවීමක් නොවිසිරයාමක් නොදුවන සිත් ඇති බවක් සමථයක් සමාධින්ද්‍රියක් සමාධි බලයක් සම්‍යක් සමාධියක් වෙයිද එය සමාධියයි (iii) දීර්ඝව ප්‍රශ්වාසයාගේ වශයෙන් (iv) චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම සමාධි නමි. (v) මෙහි (ii) යොදන්න) සිත අරමුණෙහි මනාව පිහිටුවමින් ආශ්වාස කිරීම වශයෙන් (මෙහි (iv) යොදන්න) සිත මනාව අරමුණෙහි පිහිටුවමින් ප්‍රශ්වාස කිරීම් වහයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම සමාධි නමි. චිත්තයාගේ යම් නිශ්චලව සිටීමක් සම්ප්‍රයුක්ත ධර්මයන් පිඩුකොට සිටීමක් බැසගෙන සිටීමක් ඔබමොබ නොදිවීමක් නොවිසිරයාමක් නුදුවන සිත් ඇති බවක් සමථයක් සමාධින්ද්‍රියක් සමාධි බලයක් සම්‍යක් සමාධියක් වෙයිද මෙය සමාධි නමි.

සිත අරමුණෙහි මනාව පිහිටුවමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් පවත්නා විඤ්ඤාණය චිත්ත නමි. (vi) සතිය උපට්ඨාන නමි. ඤාණය අනුපස්සනා නමි. සිත උපට්ඨානය වෙයි. සතිය නොවෙයි. සතිය උපට්ඨානයද වෙයි. සතියද වෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් ඒ සිත නැවත නැවත බලයි. එහෙයින් සිතෙහි සිත අනුව බලන සතිපට්ඨාන භාවනායි කියනු ලැබේ.

නැවත නැවත බලයි යන මෙහි කෙසේ ඒ සිත නැවත නැවත බලයිද (35 ඡේදයේ අනිත්‍යය වශයෙන් බලයි යන තැන සිට ඡේදය අවසානය දක්වා යොදන්න) මෙසේ ඒ සිත නැවත නැවත බලයි. භාවනා යන මෙහි භාවනා සතරකි. (36 ඡේදයේ භාවනා යන තැන සිට ‘යන මේ සතරයි’ යන තැනට යොදන්න) සෙවනය කිරීම් අර්ථයෙන් භාවනා නමි.

සිත මනාව අරමුණෙහි පිහිටුවමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන්වූ සීලය සීල විසුද්ධි නමි. සිත මනාව අරමුණෙහි

පිහිටුවමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දන්නහුට සිහිය එළඹ සිටියා වෙයි. ඒ සතියෙන් ඒ ඥාණයෙන් සුඛයෝ ප්‍රකටකොට දන්නේ ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයි. එහෙයින් සම බවද අර්ථයද ප්‍රතිවෙධ කෙරේයයි කියනු ලැබේ.

**82.** කෙසේ (නීවරණාදියකෙරෙන්) සිත මුදවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයිද, සිත මුදවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද, සිත මුදවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද? සිත රාගයෙන් (ii) මුදවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත රාගයෙන් (iii) මුදවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දොසයෙන් (මෙහි (ii) යොදන්න) සිත දොසයෙන් (මෙහි (iii) යොදන්න) සිත මොහයෙන් (මෙහි (ii) සිත මොහයෙන් (මෙහි (iii) සිත මානයෙන් (මෙහි (ii) සිත මානයෙන් (මෙහි (iii) සිත දිට්ඨියෙන් මෙහි (ii) සිත දිට්ඨියෙන් (මෙහි (iii) සිත විචිකිච්ඡාවෙන් (මෙහි (ii) සිත විචිකිච්ඡාවෙන් (මෙහි (iii) සිත ථිනයෙන් (මෙහි (ii) සිත ථිනයෙන් (මෙහි (iii) සිත උද්ධච්චයෙන් (මෙහි (ii) සිත උද්ධච්චයෙන් (මෙහි (iii) සිත අහිරිකයෙන් (මෙහි (ii) සිත අහිරිකයෙන් (මෙහි (iii) සිත අනොතත්ප්පයෙන් (මෙහි (ii) සිත අනොතත්ප්පයෙන් (මෙහි (iii) සිත මුදවමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් පවත්නා විඤ්ඤාණය සිත නමි. සතිය (81 ඡෙදයේ (vi) යොදන්න)

නැවත නැවත බලයි යන මෙහි කෙසේ සිත නැවත නැවත බලයිද? (35 ඡෙදයේ අනිත්‍ය වශයෙන් බලයි යන තැන සිට ඡෙදය අවසානය දක්වා යොදන්න) මෙසේ සිත නැවත නැවත බලයි. භාවනා යනු භාවනා සතරකි. (36 ඡෙදයේ භාවනායන තැන සිට 'යන මේ සතරයි' යන තැනට යොදන්න) සේවනය කිරීම් අර්ථයෙන් භාවනා නමි. සිත මුදවමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් වූ සීලය සීල විසුද්ධි නමි. සිත මුදවමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දන්නහුට සිහිය එළඹ සිටියා වෙයි. ඒ සතියෙන් ඒ ඥාණයෙන් සුඛයෝ ප්‍රකටකොට දැනගන්නේ ඉන්ද්‍රියයන් අරමුණෙහි

පිහිටුවයි. එහෙයින් සම බවද අර්ථයද ප්‍රතිවෙධ කෙරේයයි කියනු ලැබේ.

චිත්තයෙහි චිත්තානුපස්සනාවෙහි අනුපස්සනා ඤාණ අටද උපට්ඨානානුස්සති අටද සූත්‍රාන්තික වස්තු සතරද මෙසේ දතයුතු.

83. කෙසේ අනිත්‍යය බලමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයිද, අනිත්‍යය බලමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද? අනිත්‍යය යන මෙහි කුමක් අනිත්‍යද? පඤ්චස්කන්ධයෝ අනිත්‍යයහ. කිනම් අර්ථයකින් අනිත්‍ය වෙත්ද? ඉපද නැතිවන අර්ථයෙන් අනිත්‍යයහ. පඤ්චස්කන්ධයන්ගේ උදය (ඉපදීම) දක්නේ කෙතෙක් ලක්ෂණයන් දකියිද? වය (විනාශය) දක්නේ කෙතෙක් ලක්ෂණ දකියිද? උදය වය දෙක දක්නේ කෙතෙක් ලක්ෂණ දකියිද? පඤ්චස්කන්ධයන්ගේ උදය දක්නේ පස් විස්සක් ලක්ෂණ දකියි. වය දක්නේ පස් විස්සක් ලක්ෂණ දකියි. උදය වය දෙක දක්නේ මේ පනසක් ලක්ෂණ දකියි.

84. රූපයෙහි (ii) අනිත්‍යය බලමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. රූපයෙහි (iii) අනිත්‍ය බලමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. (iv) වේදනාවගේ (මෙහි (ii) යොදන්න) වේදනාගේ (මෙහි (iii) සඤ්ඤාවගේ (මෙහි (ii) සඤ්ඤාවගේ (මෙහි (iii) සංඛාරයන්හි (මෙහි (ii) සංඛාරයන්හි (මෙහි (iii) විඤ්ඤාණයෙහි (මෙහි (ii) විඤ්ඤාණයෙහි (මෙහි (iii) ඇසෙහි (මෙහි (ii) යොදන්න) ඇසෙහි (මෙහි (iii) කණෙහි (මෙහි (ii) කණෙහි (මෙහි (iii) නාසයෙහි (මෙහි (ii) නාසයෙහි මෙහි (iii) දිවෙහි (මෙහි (ii) දිවෙහි (මෙහි (iii) කයෙහි (මෙහි (ii) කයෙහි (මෙහි (iii) සිතෙහි (මෙහි (ii) සිතෙහි (මෙහි (iii) ජරා මරණයෙහි (මෙහි (ii) ජරා මරණයෙහි (මෙහි (iii) අනිත්‍යය බලමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් පවත්නා ධර්මයෝ ධම්ම නමි. සතිය උපට්ඨාන නමි. ඤාණය අනුපස්සනා නමි. ධර්මයෝ උපට්ඨාන නමි. සතිය නොවේ. සතිය උපට්ඨානයද වෙයි. සතියද වෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් ඒ ධර්මය නැවත නැවත බලයි. එහෙයින් ධර්මයන්හි ධම්මානු පස්සනා සතිපට්ඨාන භාවනායි කියනු ලැබේ. (vi)

නැවත නැවත බලයි යන මෙහි ඒ ධර්මයන් නැවත නැවත බලයිද? (35 ඡෙදයේ අනිත්‍ය වශයෙන් බලයි යන තැන සිට ඡෙදය අවසානය දක්වා යොදන්න) මෙසේ ඒ ධර්මයන් නැවත නැවත බලයි. භාවනා යන මෙහි භාවනා සතරකි. (36 ඡෙදයේ භාවනා යන තැන යන මේ සතරයි යන තැනට යොදන්න.) සේවනය කිරීම් අර්ථයෙන් භාවනා නමි. (vi) අනිත්‍යය බලමින් කරන ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ වශයෙන්වූ සීලය සංවර්ථයෙන් සීල විසුද්ධි නමි. අනිත්‍යය බලමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දන්නහුට සිහිය එළඹ සිටියා වෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් අනිත්‍යය දැනගන්නේ ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයි. එහෙයින් සම බවද අර්ථයද ප්‍රතිවෙධ කෙරේයයි කියනු ලැබේ.

85. කෙසේ විරාගය (ක්ෂණ භංගය හෝ නිර්වාණය) දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයිද, විරාගය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද, රූපයෙහි ආදීනව දැක රූපයෙහි නොඇල්මෙහි හටගත් ඡන්දය ඇත්තේ වෙයි. ශ්‍රද්ධාවෙන් ස්ථිර බවට පැමිණියේ වෙයි. ඔහුගේ සිතද මනාකොට පිහිටියේ වෙයි. (විදර්ශනා වශයෙන් හෝ මාර්ග වශයෙන්) රූපයෙහි (ii) නොඇල්ම දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. (iii) රූපයෙහි (iv) විරාගය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. (v) වේදනාවෙහි (මෙහි (ii) වේදනාවෙහි (මෙහි (iv) සඤ්ඤාවෙහි මෙහි (ii) සඤ්ඤාවෙහි (මෙහි (iv) සංඛාරයන්හි (මෙහි (ii) සංඛාරයෙහි (මෙහි (iv) විඤ්ඤාණයෙහි (මෙහි (ii) විඤ්ඤාණයෙහි (මෙහි (iv) ඇසෙහි (මෙහි (ii) ඇසෙහි (මෙහි (iv) කණෙහි (මෙහි (ii) කණෙහි (මෙහි (iv) නාසයෙහි (මෙහි (ii) නාසයෙහි (මෙහි (iv) දිවෙහි (මෙහි (ii) දිවෙහි (මෙහි (iv) කයෙහි (මෙහි (ii) කයෙහි (මෙහි (iv) සිතෙහි (මෙහි (ii) සිතෙහි (මෙහි (iv) ජරා මරණයෙහි ආදීනව දැක ජරා මරණයෙහි නොඇල්මෙහි හටගත් ඡන්දය ඇත්තේ වෙයි. ශ්‍රද්ධාවෙන් ස්ථිර බවට පැමිණියේ වෙයි. ඔහුගේ සිතද මනාව පිහිටියේ වෙයි. ජරා මරණයෙහි (මෙහි (ii) ජරා මරණයෙහි (මෙහි (iv) විරාගය දකිමින් කරන ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ වශයෙන්වූ සීලය

සංවරාර්ථයෙන් සීල විසුද්ධි නම්. විරාගය දකිමින් කරන ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දන්නහුට සිත එකඟවූවා වෙයි. ඒ සතියෙන් ඒ ඥාණයෙන් විරාගය දන්නේ ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයි. එයින් සම බවද අර්ථයද ප්‍රතිවෙධ කෙරේයයි කියනු ලැබේ.

**86.** කෙසේ නිරොධය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයිද, නිරොධය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද? රූපයෙහි ආදීනව දැක රූප නිරොධයෙහි හටගත් ඡන්දය ඇත්තේ වෙයි. ශ්‍රද්ධාවෙන් ස්ථිර බවට පැමිණියේ වෙයි. ඔහුගේ සිත මනාව පිහිටියේ වෙයි. රූපයෙහි (ii) නිරොධය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. (iii) රූපයෙහි (iv) නිරොධය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. (v) වේදනාවෙහි (මෙහි (ii) වේදනාවෙහි (මෙහි (iv) සඤ්ඤාවෙහි (මෙහි (ii) සඤ්ඤාවෙහි (මෙහි (iv) සංඛාරයන්හි (මෙහි (ii) සංඛාරයෙහි (මෙහි (iv) විඤ්ඤාණයෙහි (මෙහි (ii) විඤ්ඤාණයෙහි (මෙහි (iv) ඇසෙහි (මෙහි (ii) අසෙහි (මෙහි (iv) කණෙහි (මෙහි (ii) කණෙහි (මෙහි (iv) නාසයෙහි (මෙහි (ii) නාසයෙහි මෙහි (iv) දිවෙහි (මෙහි (ii) දිවෙහි (මෙහි (iv) කයෙහි (මෙහි (ii) කයෙහි (මෙහි (iv) සිතෙහි (මෙහි (ii) සිතෙහි (මෙහි (iv) ජරා මරණයෙහි ආදීනව දැක ජරා මරණ නිරොධයෙහි හටගත් ඡන්දය ඇත්තේ වෙයි. ශ්‍රද්ධාවෙන් ස්ථිර බවට පැමිණියේ වෙයි. ඔහුගේ සිතද මනාව පිහිටියේ වෙයි ජරා මරණ නිරොධයෙහි නිරොධය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ජරා මරණයෙහි නිරොධය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

**87.** (i) කෙතෙක් ආකාරයකින් අවිද්‍යාවගේ ආදීනව වෙයිද? කෙතෙක් ආකාරයකින් අවිද්‍යාව නිරුද්ධ වෙයිද? පස් ආකාරයකින් අවිද්‍යාවගේ ආදීනවය වෙයි, අට ආකාරයකින් අවිද්‍යාව නිරුද්ධ වෙයි. කවර පස් ආකාරයකින් අවිද්‍යාවගේ ආදීනවය වෙයිද? අනිත්‍ය ස්වභාවයෙන් අවිද්‍යාවගේ ආදීනවය වෙයි, දුක්ඛ ස්වභාවයෙන් අවිද්‍යාවගේ ආදීනවය වෙයි, අනාත්ම ස්වභාවයෙන් අවිද්‍යාවගේ ආදීනවය වෙයි, සන්තාප ස්වභාවයෙන් අවිද්‍යාවගේ ආදීනවය වෙයි, විපරිනාම

ස්වභාවයෙන් අවිද්‍යාවගේ ආදීනවය වෙයි. මෙ පස් ආකාරයෙන් අවිද්‍යාවගේ ආදීනවය වෙයි. (ii)

88. කවර අට ආකාරයකින් අවිද්‍යාව නිරුද්ධ වෙයිද? මුල් හෙතුව නිරුද්ධවීමෙන් අවිද්‍යාව නිරුද්ධවීමෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි, ආසන්න හෙතුව නිරුද්ධවීමෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි, මුල් හෙතුවගේ ඉපදීම නිරුද්ධවීමෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි, ආසන්න හෙතුවගේ ඉපදීම නිරුද්ධවීමෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි, ජනක හෙතුව නිරුද්ධවීමෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි. උපස්තමභක ප්‍රත්‍යය නිරුද්ධවීමෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි, ඤාණය පහළවීමෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි, නිර්වාණය ප්‍රත්‍යක්ෂවීමෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි. මේ අට ආකාරයෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි.

මේ පස් ආකාරයෙන් අවිද්‍යාවගේ ආදීනව දැන මේ අට ආකාරයෙන් අවිද්‍යාව නිරුද්ධ කිරීමෙන් කැමත්ත පහළවූයේ වෙයි. ශ්‍රද්ධාවෙන් ස්ථිර බවට පැමිණියේ වෙයි, ඔහුගේ සිත මනාව පිහිටියේ වෙයි, අවිද්‍යාවගේ නිරොධය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. අවිද්‍යාව දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

89. "කෙතෙක් ආකාරයෙන් සංඛාරයන්හි ආදීනව වේද, කෙතෙක් ආකාරයකින් සංඛාරයෝ නිරුද්ධ වෙත්ද, ('අවිද්‍යාවගේ' යන්න 'සංඛාරයන්හි' යයි වෙනස්කොට 87 ඡෙදයේ (i) යොදන්න) කෙතෙක් ආකාරයකින් විඤ්ඤාණයෙහි ආදීනව වේද, කෙතෙක් ආකාරයකින් විඤ්ඤාණය නිරුද්ධ වෙයිද? (අවිද්‍යාවගේ යන්න විඤ්ඤාණයි වෙනස්කොට 87 ඡෙදයේ (i) යොදන්න) කෙතෙක් ආකාරයකින් නාම රූපයෙහි ආදීනව වෙයිද, කෙතෙක් ආකාරයකින් නාම රූප නිරුද්ධ වෙයිද (අවිද්‍යාවගේ යන්න නාම රූපයෙහියයි වෙනස්කොට 87 ඡෙදයේ (i) යොදන්න) කෙතෙක් ආකාරයකින් සළායතනයෙහි ආදීනව වෙයිද, කෙතෙක් ආකාරයකින් සළායතනය නිරුද්ධ වෙයිද? (අවිද්‍යාවගේ යන්න සළායතනයයි වෙනස් කොට 87 ඡෙදයේ (i) යොදන්න) කෙතෙක් ආකාරයකින් ඵස්සය වෙයිද, කෙතෙක් ආකාරයකින් ඵස්සය නිරුද්ධ වෙයිද

(අවිද්‍යාවගේ යන්න ඵස්සයයි වෙනස්කොට 87 ඡේදයේ (i) යොදන්න) කෙතෙක් ආකාරයකින් වේදනාවෙහි ආදීනව වෙයිද, කෙතෙක් ආකාරයකින් වේදනාව නිරුද්ධ වෙයිද, කෙතෙක් ආකාරයකින් තෘෂ්ණාවගේ ආදීනව වෙයිද, කෙතෙක් ආකාරයකින් තෘෂ්ණාව නිරුද්ධවෙයිද, අවිද්‍යාවගේ යන්න තෘෂ්ණාවයයි වෙනස්කොට 87 (ඡේදයේ) (i) යොදන්න) කෙතෙක් ආකාරයකින් උපාදානයෙහි ආදීනව වෙයිද, කෙතෙක් ආකාරයකින් උපාදනය නිරුද්ධ වෙයිද, (අවිද්‍යාවගේ යන්න උපාදනයයි වෙනස්කොට 87 ඡේදයේ (i) යොදන්න) කෙතෙක් ආකාරයකින් භවයෙහි ආදීනව වෙයිද, කෙතෙක් ආකාරයකින් භවය නිරුද්ධ වෙයිද? කෙතෙක් ආකාරයකින් ජාතියෙහි ආදීනව වෙයිද, කෙතෙක් ආකාරයකින් ජාතිය නිරුද්ධ වෙයිද, (අවිද්‍යාවගේ යන්න ජාතියයි වෙනස්කොට 87 (ඡේදයේ (i) යොදන්න) කෙතෙක් ආකාරයකින් ජරා මරණයෙහි ආදීනව වෙයිද කෙතෙක් ආකාරයකින් ජරා මරණ නිරුද්ධ වෙයිද, පස් ආකාරයකින් ජරා මරණයෙහි ආදීනව වෙයි. අට ආකාරයකින් ජරා මරණ නිරුද්ධ වෙයි.

**90.** "කිනම් පස් ආකාරයකින් ජරා මරණයෙහි ආදීනව වෙයිද, අනිත්‍ය ස්වභාවයෙන් ජරා මරණයෙහි ආදීනව වෙයි. දුක්ඛ ස්වභාවයෙන්, අනාත්ම ස්වභාවයෙන්, සන්තාප ස්වභාවයෙන්, විපරිනාම ස්වභාවයෙන් ජරා මරණයෙහි ආදීනව වෙයි. මේ පස් ආකාරයෙන් ජරා මරණයෙහි ආදීනව වෙයි.

**91.** "කිනම් අට ආකාරයකින් ජරා මරණ නිරුද්ධ වෙයිද? නිදානය (මුල හෙතුව) නිරුද්ධ වීමෙන් ජරා මරණය නිරුද්ධ වෙයි. සමුදය (ආසන්න හෙතුව) නිරුද්ධවීමෙන් ජරා මරණ නිරුද්ධ වෙයි. ජාති නිරොධයෙන් (මූල හෙතුවගේ ඉපදීම නිරුද්ධවීමෙන්) ජරා මරණ නිරුද්ධ වෙයි. විභව නිරොධයෙන් (ආසන්න හෙතුවගේ ඉපදීම නිරුද්ධවීමෙන් ජරා මරණ නිරුද්ධ වෙයි. ජනක හෙතුව නිරුද්ධවීමෙන් ජරා මරණ නිරුද්ධ වෙයි. උපස්තම්භක ප්‍රත්‍ය නිරුද්ධවීමෙන් ජරා මරණ නිරුද්ධ වෙයි. ඥාණය ඉපදීමෙන් ජරා මරණ නිරුද්ධ වෙයි. නිර්වාණය ප්‍රත්‍යක්ෂවීමෙන් ජරා මරණ නිරුද්ධ වෙයි. මේ අට ආකාරයෙන්

ජරා මරණ නිරුද්ධ වෙයි. මේ පස් ආකාරයෙන් ජරා මරණයෙහි ආදීනව දැක මේ අට ආකාරයෙන් ජරාමරණ නිරොධයෙහි හටගත් කැමැත්ත ඇත්තේ වෙයි. ශ්‍රද්ධාවෙන් ස්ථිර බවට පැමිණියේ වෙයි. ඔහුගේ සිතද මනාව පිහිටියේ වෙයි. ජරා මරණ නිරොධය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. නිරොධය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි නිරොධය දකිමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් පවත්නා ධර්මයෝ ධර්ම නම් වෙත්. සතිය උපට්ඨාන නමි. ඤාණය අනුපස්සනා නමි. ධර්මයෝ උපට්ඨානය වෙයි. සතිය නොවෙයි. සතිය උපට්ඨානයද වෙයි. සතිය නොවෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් ඒ ධර්මයන් නැවත නැවත බලයි. එහෙයින් ධර්මයන්හි ධම්මානුපස්සනා සතිපට්ඨාන භාවනායි කියනු ලැබේ. නැවත නැවත බලයි යන මෙහි ඒ ධර්මයන් කෙසේ නැවත නැවත බලයිද (35 ඡේදයේ අනිත්‍ය වශයෙන් බලයි යන තැන සිට ඡේදය අවසානය දක්වා යොදන්න) මෙසේ ඒ ධර්මයන් නැවත නැවත බලයි. භාවනා යන මෙහි භාවනා සතරකි. (36 ඡේදයේ භාවනා යන තැන සිට යන මේ සතරයි යන තැනට යොදන්න) සේවනය කිරීම් අර්ථයෙන් භාවනා නමි.

**92.** නිරොධය දකිමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන්වූ සීලය සීල විසුද්ධි නමි. නිරොධය දකිමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන්වූ චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දන්නහුට සිත එකඟවූවා වෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් නිරොධය දන්නේ ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයි එහෙයින් සම බවද අර්ථයද ප්‍රතිවෙධ කෙරේයයි කියනු ලැබේ.

"කෙසේ පටිනිස්සග්ගය (දුරුකිරීම) බලමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයිද පටිනිස්සග්ගය බලමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද, පටිනිස්සග්ග යන මෙහි පටිනිස්සග්ග (දුරුකිරීම්) දෙකකි. පරිච්චාග පටිනිස්සග්ගය (දුරුකිරීම් වශයෙන් පවත්නා පටිනිස්සග්ගය) ද පක්ඛන්දන පටිනිස්සග්ගය (බැසගැනීම් වශයෙන් පවත්නා පටිනිස්සග්ගය) ද වෙයි. රූපය දුරුකෙරේනුයි පරිච්චාගපටිනිස්සග්ග නමි. රූපයන්ගේ

නිරොධයවූ නිර්වාණයෙහි සිත බැසගන්නා හෙයින් පක්ඛන්දන පටිනිස්සග්ග නම්.

**93.** "රූපයෙහි පටිනිස්සග්ගය බලමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. රූපයෙහි පටිනිස්සග්ගය බලමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. වේදනාව, සඤ්ඤාව සංඛාරයන් විඤ්ඤාණය, චක්ෂුසය, ජරා මරණය දුරුකෙරේනුයි පරිච්චාග පටිනිස්සග්ග නම් ජරා මරණය නිරොධයවූ නිර්වාණයෙහි සිත බැසගන්නා හෙයින් පක්ඛන්දන පටිනිස්සග්ග නම්. ජරා මරණයෙහි පටිනිස්සග්ගය බලමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ජරා මරණයෙහි පටිනිස්සග්ගය බලමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය බලමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන්වූ ධර්මයෝ ධර්ම නම් වෙත්. සතිය උපට්ඨාන නම්. ඤාණය අනුපස්සනා නම්. ධර්මයෝ උපට්ඨාන වෙයි. සතිය නොවෙයි, සතිය උපට්ඨානයද වෙයි, සතියද වෙයි. ඒ සතියෙන් ඒ ඤාණයෙන් ඒ ධර්මයන් නැවත නැවත බලයි එහෙයින් ධර්මයන්හි ධම්මානුපස්සනා සතිපට්ඨාන භාවනායි කියනු ලැබේ.

**94.** "නැවත නැවත බලයි යන මෙහි කෙසේ ඒ ධර්මයන් නැවත නැවත බලයිද? අනිත්‍ය වශයෙන් නැවත නැවත බලයි. නිත්‍ය වශයෙන් නොබලයි. දුක්ඛ වශයෙන් නැවත නැවත බලයි, සුඛ වශයෙන් නොබලයි. අනාත්ම වශයෙන් නැවත නැවත බලයි. ආත්ම වශයෙන් නොබලයි දුරුකරයි. අල්වා නොගනියි. අනිත්‍ය වශයෙන් නැවත නැවත බලන්නේ නිත්‍ය සංඥාව දුරුකරයි. දුරුකරන්නේ අල්වාගැනීම පහකරයි. මෙසේ ඒ ධර්මයන් නැවත නැවත බලයි. භාවනා යන මෙහි භාවනා සතරකි. එහි හටගත් ධර්මයන් නොඉක්මවීම් අර්ථයෙන් භාවනා නම්. (36 ඡේදයේ භාවනා යන තැන සිට යන මේ සතරයි යන තැනට යොදන්න.) සේවනය කිරීම් අර්ථයෙන් භාවනා නම්.

**95.** "පටිනිස්සග්ගය බලමින් ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ වශයෙන්වූ සීලය සංවර අර්ථයෙන් සීල විසුද්ධි නම්. සමාධිය නොවිසිරයාම් අර්ථයෙන් චිත්ත විසුද්ධි නම්. ප්‍රඥාව දැකීම්

අර්ථයෙන් දිට්ඨි විසුද්ධි නම්. එහි යම් සංවර ස්වභාවයක් වෙයිද, මෙය අධිශීල ශික්ෂා නම්. එහි යම් සිත නොවිසිරයාම් ස්වභාවයක් වෙයිද මෙය අධිචිත්ත ශික්ෂා නම්. එහි යම් දැකීම් ස්වභාවයක් වෙයිද මෙය අධි ප්‍රඥා ශික්ෂා නම්.

**96.** "මේ ත්‍රිවිධ ශික්ෂාවන් ආවර්ජනය කරමින් හික්මෙයි. දැනගනිමින් හික්මෙයි. ප්‍රත්‍යක්ෂ කළයුත්ත ප්‍රත්‍යක්ෂ කරමින් හික්මෙයි. පටිනිස්සග්ගය බලමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දන්නාහට ප්‍රකටවූ වේදනා උපදිත්. ප්‍රකටවූ වේදනා වැටහෙත්. ප්‍රකටවූ වේදනා අභාවයට යත්. පටිනිස්සග්ගය බලමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම දන්නේ ඉන්ද්‍රියයන් අරමුණෙහි මනාකොට පිහිටුවත්. අරමුණද දැනගනියි. සම බවද අර්ථයද ප්‍රතිවෙධ කරයි. බලයන් අරමුණෙහි පිහිටුවයි. බොධ්‍යංගයන් අරමුණෙහි පිහිටුවයි. මාර්ගය අරමුණෙහි පිහිටුවයි. ධර්මයන් අරමුණෙහි පිහිටුවයි. අරමුණද දැනගනියි. සම බවද අර්ථයද දැනගනියි.

ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයි යන මෙහි කෙසේ ඉන්ද්‍රියයන් අරමුණෙහි පිහිටුවයිද? ස්ථිරව බැසගැනීම් අර්ථයෙන් සද්ධින්ද්‍රිය අරමුණෙහි පිහිටුවයි. සතින්ද්‍රිය, විරියින්ද්‍රිය සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය අරමුණෙහි පිහිටුවයි. එහෙයින් සම බවද අර්ථයද ප්‍රතිවෙධ කෙරේයයි කියනු ලැබේ. ධර්මයන්හි ධම්මානුපස්සනාවෙහි අනුපස්සනා ඤාණ අටද උපට්ඨානානුස්සති අටද සූත්‍රාන්තික වස්තු සතරද මෙසේ දතයුතුය. මේ දෙතිස් වැදෑරුම් සිහියෙන් යුක්තව සම්පූර්ණ කළයුතු ඤාණයෝයි.

"සූවිස්සක් සමාධි වශයෙන්වූ ඤාණයෝ කවරහුද? දීර්ඝව ආශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිර යාම සමාධි නම්. දීර්ඝව ප්‍රශ්වාස කිරීම් වශයෙන් (ii) චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම සමාධි නම්. (iii) හ්‍රස්වව ආශ්වාස කිරීම් වශයෙන් (මෙහි (ii) හ්‍රස්වව ප්‍රශ්වාස කිරීම් වශයෙන් (මෙහි (ii) සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ආශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම

සමාධි නම්. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟ බව නොවිසිරයාම සමාධි නම්. මේ සූවිස්සක් සමාධි වශයෙන් පවත්නා ඤාණයෝයි.

**98.** "විදර්ශනා වශයෙන් පවත්නා දෙසැත්තෑවක් ඤාණයෝ කවරහුද? දීර්ඝ ආශ්වාසය අනිත්‍ය වශයෙන් දැකීම් අර්ථයෙන් විපස්සනා නම්. දුක් වශයෙන් දැකීම් අර්ථයෙන් විපස්සනා නම්. අනාත්ම වශයෙන් දැකීම් අර්ථයෙන් විපස්සනා නම්. දීර්ඝ ප්‍රශ්වාසය අනිත්‍ය වශයෙන් දැකීම් අර්ථයෙන් විපස්සනා නම්. දුක් වශයෙන් දැකීම් අර්ථයෙන් විපස්සනා නම්, අනාත්ම වශයෙන් දැකීම් අර්ථයෙන් විපස්සනා නම්. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ආශ්වාසය සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ප්‍රශ්වාසය අනිත්‍ය වශයෙන් දැකීම් අර්ථයෙන් විපස්සනා නම්. දුක් වශයෙන් දැකීම් අර්ථයෙන් විපස්සනා නම්. අනාත්ම වශයෙන් දැකීම් අර්ථයෙන් විපස්සනා නම්. මේ දෙසැත්තෑවක් විපස්සනා වශයෙන් පවත්නා ඤාණයෝයි.

**99.** "අටක්වූ නිබ්බිදා ඤාණයෝ කවරහුද? අනිත්‍යය බලමින් ආශ්වාස කරන්නේ තත්වාකාරය දනියි, දකිනුයි නිබ්බිදා ඤාණ නම්. අනිත්‍යය බලමින් ප්‍රශ්වාස කරන්නේ තත්වාකාරය දනියි දකිනුයි නිබ්බිදා ඤාණ නම්. පටිනිස්සග්ග බලමින් ආශ්වාස කරන්නේ තත්වාකාරය දනියි දකිනුයි නිබ්බිදා ඤාණ නම්. පටිනිස්සග්ගය බලමින් ප්‍රශ්වාස කරන්නේ තත්වාකාරය දනියි දකිනුයි නිබ්බිදා ඤාණ නම්. මේ අටක්වූ නිබ්බිදා ඤාණයෝයි.

**100.** "අටක්වූ නිබ්බිදානුලොමයෙහි ඤාණයෝ කවරහුද? අනිත්‍යය බලමින් ආශ්වාස කරන්නහුට භය වශයෙන් වැටහෙන ප්‍රඥාව නිබ්බිදානුලොමයෙහි ඤාණ නම්. අනිත්‍යවශයෙන් බලමින් ප්‍රශ්වාස කරන්නහුට භය වශයෙන් වැටහෙන ප්‍රඥාව නිබ්බිදානුලොමයෙහි ඤාණ නම්. පටිනිස්සග්ගය බලමින් ආශ්වාස කරන්නහුට භය වශයෙන් වැටහෙන ප්‍රඥාව නිබ්බිදානුලොමයෙහි ඤාණ නම්. පටිනිස්සග්ගය බලමින් ප්‍රශ්වාස කරන්නහුට භය වශයෙන් වැටහෙන ප්‍රඥාව නිබ්බිදානුලොමයෙහි ඤාණ නම්. මේ අට නිබ්බිදානුලොමයෙහි ඤාණ නම්.

"අටක්වූ නිබ්බිදා පටිප්පස්සද්ධි ඤාණයෝ කවරහුද? අනිත්‍යය බලමින් ආශ්වාස කරන්නහුගේ පටිසංඛාත සංඛාරුපෙක්ඛා ප්‍රඥාවෝ නිබ්බිදාපටිප්පස්සද්ධි ඤාණ නමි. අනිත්‍යය බලමින් ප්‍රශ්වාස කරන්නහුගේ පටිසංඛාන සංඛාරුපෙක්ඛා ප්‍රඥාවෝ නිබ්බිදා පටිප්පස්සද්ධි ඤාණ නමි. පටිනිස්සග්ගය බලමින් ආශ්වාස කරන්නහුගේ පටිසංඛාන සංඛාරුපෙක්ඛා ප්‍රඥාවෝ නිබ්බිදාපටිප්පස්සද්ධි ඤාණ නමි. පටිනිස්සග්ගය බලමින් ප්‍රශ්වාස කරන්නහුගේ පටිසංඛාන සංඛාරුපෙක්ඛා ප්‍රඥවෝ නිබ්බිදාපටිප්පස්සද්ධි ඤාණ නමි. මේ අට නිබ්බිදා පටිප්පස්සද්ධි ඤාණ නමි.

"එක්විස්සක් විමුක්තිසුඛයෙහි ඤාණයෝ කවරහුද? සෝවාන් මාර්ගයෙන් සක්කායදිට්ඨිය පහකළ හෙයින් සිඳදැමූ හෙයින් විමුත්තිසුඛයෙහි ඤාණය උපදියි. විචිකිච්ඡාව (ii) පහකළ හෙයින් සිඳදැමූ හෙයින් විමුත්තිසුඛයෙහි ඤාණය උපදියි. (iii) සීලබ්බත පරාමාසය (මෙහි (ii) යොදන්න.) දිට්ඨානුසය විචිකිච්ඡානුසය පහකළ හෙයින් සිඳදැමූ හෙයින් විමුත්තිසුඛයෙහි ඤාණය උපදියි.

**102.** "සකෘදාගාමි මාර්ගයෙන් ඖදාරික කාමරාගය පටිඝසංයෝජනය ඖදාරික කාමරාගානුසය පටිඝානුසය (මෙහි 101 (ii) ඡේදය යොදන්න පහකළ හෙයින් සිඳදැමූ හෙයින් විමුත්තිසුඛයෙහි ඤාණය උපදියි. අනාගාමි මාර්ගයෙන් තුනීවූ කාමරාග සංයොජනය පටිඝසංයෝජනය තුනීවූ කාමරාගානුසය පටිඝානුසය පහකළ හෙයින් සිඳදැමූ හෙයින් විමුත්තිසුඛයෙහි ඤාණය උපදියි. අර්හත් මාර්ගයෙන් රූපරාගය (මෙහි (ii) අරූපරාගය මානය උද්ධච්චය අවිද්‍යාව, මානානුසය, භවරාගානුසය, අවිජ්ජානුසය, පහකළ හෙයින් සිඳදැමූ හෙයින් විමුත්තිසුඛයෙහි ඤාණය උපදියි. මේ එක්විස්සක් විමුත්තිසුඛයෙහි ඤාණයෝයි.

සොළොස් වස්තුවක් ඇති ආනාපාන සති සමාධිය වඩන්නහුට දෙසියයකට අධිකවූ මේ ඤාණයෝ උපදිත්.

(ආනාපාන කථාව නිමි.)

---

## 4 ඉන්ද්‍රිය කථා

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඩු සිටුහුගේ ජේතවන නම් ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. ඒ භික්ෂූහු "පින්වතුන්වහන්සැයි" භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

2. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. "මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පසක් වෙත්. (ii) කවර පසක්ද? සද්ධින්ද්‍රියද විරියින්ද්‍රියද, සතින්ද්‍රියද, සමාධින්ද්‍රියද, පඤ්ඤින්ද්‍රියද වෙත්. මහණෙනි, මොහු වනාහි ඉන්ද්‍රිය පස වෙති. (iii) මේ ඉන්ද්‍රිය පස කෙතෙක් ආකාරයකින් පිරිසිදු වෙත්ද? මේ ඉන්ද්‍රිය පස පසළොස් ආකාරයකින් පිරිසිදු වෙත්.

3. "අශ්‍රද්ධාවත් පුද්ගලයන් දුරුකිරීමෙන්ද ශ්‍රද්ධාවත් පුද්ගලයන් (ii) සේවනය කිරීමෙන් භජනය කිරීමෙන් ඇසුරු කිරීමෙන්ද (iii) පැහැදීම උපදවන සූත්‍රයන් මෙනෙහි කිරීමෙන්ද යන තුන් ආකාරයෙන් සද්ධින්ද්‍රිය පිරිසිදු වෙයි. කුසීත පුද්ගලයන් දුරුකිරීමෙන්ද වීර්යවත් පුද්ගලයන් (මෙහි (ii) යොදන්න) සම්‍යක් ප්‍රධාන ධර්මයන් මෙනෙහි කිරීමෙන්ද යන තුන් ආකාරයෙන් විරියින්ද්‍රිය පිරිසිදු වෙයි. සිහි මුළාවූ පුද්ගලයන් දුරුකිරීමෙන්ද එළඹ සිටි සිහිය ඇති පුද්ගලයන් (මෙහි (ii) සතිපට්ඨාන ධර්මයන් මෙනෙහි කිරීමෙන්ද යන තුන් ආකාරයෙන් සතින්ද්‍රිය පිරිසිදු වෙයි. සමාධියක් නැති පුද්ගලයන් දුරුකිරීමෙන්ද සමාධිය ඇති පුද්ගලයන් (මෙහි ii) ධ්‍යාන විමොක්ෂ ධර්මයන් මෙනෙහි කිරීමෙන්ද යන මේ තුන් ආකාරයෙන් සමාධින්ද්‍රිය පිරිසිදු වෙයි. අඥාන පුද්ගලයන් දුරුකිරීමෙන්ද ඥානවන්ත පුද්ගලයන් (මෙහි (ii) ගැඹුරු ඥාණයෙන් බැසගතයුතු සූත්‍රාන්තයන් මෙනෙහි කිරීමෙන්ද යන මේ තුන් ආකාරයෙන් පඤ්ඤින්ද්‍රිය පිරිසිදු වෙයි. මෙසේ මේ පස්වැදෑරුම් පුද්ගලයන් දුරුකිරීමෙන්ද පස්වැදෑරුම් පුද්ගලයන් සේවනය කිරීමෙන් භජනය කිරීමෙන් ඇසුරු කිරීමෙන්ද පස්වැදෑරුම් සූත්‍රාන්ත කොටස් මෙනෙහි කිරීමෙන්ද යන මේ පසළොස් ආකාරයෙන් මේ ඉන්ද්‍රියයන් පස පිරිසිදු වෙත්.

4. "කෙතෙක් ආකාරයකින් පඤ්ච ඉන්ද්‍රියයන් වඩත්ද? කෙතෙක් ආකාරයකින් පඤ්ච ඉන්ද්‍රියයන්ගේ වැඩීම වේද? දශ ආකාරයකින් පඤ්ච ඉන්ද්‍රියයන් වඩත්. දශ ආකාරයකින් පඤ්ච ඉන්ද්‍රියයන්ගේ වැඩීම වේ.

"අශ්‍රද්ධාව දුරුකරන්නේ සද්ධින්ද්‍රිය වඩයි, සද්ධින්ද්‍රිය වඩන්නේ අශ්‍රද්ධාව දුරුකරයි, කුසීත බව දුරුකරන්නේ විරියින්ද්‍රිය වඩයි. විරියින්ද්‍රිය වඩන්නේ කුසීත බව දුරුකරයි. ප්‍රමාදය (සිහිමුළාව) දුරුකරන්නේ සතින්ද්‍රිය වඩයි. සතින්ද්‍රිය වඩන්නේ ප්‍රමාදය දුරුකරයි. උද්ධච්චය දුරුකරන්නේ සමාධින්ද්‍රිය වඩයි, සමාධින්ද්‍රිය වඩන්නේ උද්ධච්චය දුරු කරයි. අවිද්‍යාව දුරුකරන්නේ පඤ්ඤින්ද්‍රිය වඩයි. පඤ්ඤින්ද්‍රිය වඩන්නේ අවිද්‍යාව දුරු කරයි. මේ දශ ආකාරයෙන් පංච ඉන්ද්‍රියයන් වඩත්. මේ දශආකාරයෙන් පංච ඉන්ද්‍රියයන්ගේ වැඩීම වෙයි.

5. "කෙතෙක් ආකාරයෙන් පඤ්ච ඉන්ද්‍රියයෝ වඩන ලද්දාහු මනාකොට වඩනලද්දාහු වෙත්ද? දස ආකාරයකින් (ii) පඤ්ච ඉන්ද්‍රියයෝ වඩන ලද්දාහු මොනවට වඩන ලද්දාහු වෙත්. (iii) අශ්‍රද්ධාව පහකළ හෙයින් (මෙහි (ii) යොදන්න) සද්ධින්ද්‍රිය වඩන ලද හෙයින් මොනවට වඩන ලද හෙයින් අශ්‍රද්ධාව පහකරන ලද්දේ මනාකොට පහකරන ලද්දේ වෙයි. කුසීත බව පහකළ හෙයින් මනාකොට පහකළ හෙයින් විරියින්ද්‍රිය වඩන ලද්දේ වෙයි. මනාකොට වඩනලද්දේ වෙයි. විරියින්ද්‍රිය වඩන ලද හෙයින් මනාකොට වඩන ලද හෙයින් කුසීත බව පහකරන ලද්දේ මනාකොට පහකරන ලද්දේ වෙයි. ප්‍රමාදය පහකළ හෙයින් මනාකොට පහකළ හෙයින් සතින්ද්‍රිය වඩන ලද්දේ මනාකොට වඩන ලද්දේ වෙයි. සතින්ද්‍රිය වඩන ලද්දේ මනාකොට වඩන ලද්දේ ප්‍රමාදය පහකරන ලද්දේ මනාකොට පහකරන ලද්දේ වෙයි. උද්ධච්චය පහකළ හෙයින් මනාකොට පහකළ හෙයින් සමාධින්ද්‍රිය වඩනලද්දේ මනාකොට වඩනලද්දේ වෙයි. සමාධින්ද්‍රිය වඩනලද හෙයින් උද්ධච්චය පහකරන ලද්දේ මනාකොට පහකරන ලද්දේ වෙයි. අවිද්‍යාව පහකළ හෙයින් මනාකොට පහකළ හෙයින් පඤ්ඤින්ද්‍රිය වඩන

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ලද්දේ වෙයි. මනාකොට වඩන ලද්දේ වෙයි. පඤ්ඤින්ද්‍රිය වඩන ලද හෙයින් අවිද්‍යාව පහකරන ලද්දේ මනාකොට පහකරන ලද්දේ වෙයි. මේ දශ ආකාරයෙන් පඤ්ච ඉන්ද්‍රියයෝ වඩන ලද්දාහු මනාකොට වඩන ලද්දාහු වෙත්.

6. "කෙතෙක් ආකාරයෙන් පඤ්ච ඉන්ද්‍රියයෝ වඩනු ලැබෙත්ද කෙතෙක් ආකාරයෙන් පඤ්ච ඉන්ද්‍රියයෝ වඩන ලද්දාහු මනාකොට වඩන ලද්දාහු සංසිඳුවන ලද්දාහු මනාකොට සංසිඳුවන ලද්දාහු වෙත්ද? සතර ආකාරයකින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනු ලැබෙත්. සතර ආකාරයකින් (ii) පඤ්ච ඉන්ද්‍රියයෝ වඩන ලද්දාහුද මනාකොට වඩන ලද්දාහුද සංසිඳුවන ලද්දාහුද මනාකොට සංසිඳුවන ලද්දාහුද වෙත්. (iii) "සෝවාන් මාර්ගක්ෂණයෙහි පඤ්ච ඉන්ද්‍රියයෝ වඩනු ලැබෙත්, සෝවාන් ඵලක්ෂණයෙහි (මෙහි (ii) යොදන්න) සකෘදාගාමි මාර්ගක්ෂණයෙහි පංච ඉන්ද්‍රියයෝ වඩනු ලැබෙත්. සකෘදාගාමි ඵලක්ෂණයෙහි (මෙහි (ii) යොදන්න) අනාගාමි මාර්ගක්ෂණයෙහි පංච ඉන්ද්‍රියයෝ වඩනු ලැබෙත්. අනාගාමි ඵලක්ෂණයෙහි (මෙහි (ii) යොදන්න) අර්හත් මාර්ගක්ෂණයෙහි පංච ඉන්ද්‍රියයෝ වඩනු ලැබෙත්. අර්හත් ඵලක්ෂණයෙහි පංච ඉන්ද්‍රියයෝ සංසිඳුවන ලද්දාහුද මනාකොට සංසිඳුවන ලද්දාහුද වෙත්.

"මෙසේ මාර්ග විසුද්ධි සතරද ඵලවිසුද්ධි සතරද සමුච්ඡෙද විසුද්ධි සතරද පටිප්පස්සද්ධි විසුද්ධි සතරද දතයුතුය.

"මේ සතර ආකාරයෙන් පංච ඉන්ද්‍රියයෝ වඩනු ලැබෙත්. මේ සතර ආකාරයෙන් (මෙහි (ii) යොදන්න)

7. "කවර පුද්ගලයන්ගේ ඉන්ද්‍රිය වැඩීම වේද කෙතෙක් පුද්ගලයෝ වඩන ලද ඉන්ද්‍රිය ඇත්තාහුද? පුද්ගලයන් අටදෙනෙකුගේ ඉන්ද්‍රිය වැඩීමවෙයි. පුද්ගලයෝ තිදෙනෙක් වඩන ලද ඉන්ද්‍රිය ඇත්තාහුවෙත්. කවර පුද්ගලයන් අටදෙනෙකුගේ ඉන්ද්‍රිය වැඩීම වෙයිද? ශෛක්ෂ පුද්ගලයන් සත්දෙනාගේද, කල්‍යාණ පෘථග්ජනයාගේද, ඉන්ද්‍රිය වැඩීම වෙයි. මේ පුද්ගලයන් අටදෙනාගේ ඉන්ද්‍රිය වැඩීම වෙයි.

8. "කවර පුද්ගලයෝ තිදෙනෙක් වඩන ලද ඉන්ද්‍රිය ඇත්තාහුද? ශ්‍රවණයෙන් බුද්ධ (ඇසීමෙන් චතුස්සත්‍ය අවබොධ

කළාවූ) ක්ෂීණාශ්‍රව තථාගත ශ්‍රාවකතෙමේ වඩන ලද ඉන්ද්‍රිය ඇත්තේ වෙයි. තෙමේම පහළවීම් අර්ථයෙන් පච්චෙක සම්බුද්ධ (පසේ බුදුරජ) තෙම වඩන ලද ඉන්ද්‍රිය ඇත්තේය. නොමිනියහැකි අර්ථයෙන් තථාගත අර්හත් සම්‍යක් සම්බුදු රජතෙම වඩන ලද ඉන්ද්‍රිය ඇත්තේය. මේ පුද්ගලයෝ තිදෙන වඩන ලද ඉන්ද්‍රිය ඇත්තාහුය. මේ පුද්ගලයන් අටදෙනාගේ ඉන්ද්‍රිය වැඩීම වෙයි. මේ පුද්ගලයෝ තිදෙන වඩනලද ඉන්ද්‍රිය ඇත්තාහුය.”

11. “සැවැත්නුවර නිදානය වෙයි “මහණෙනි, ඉන්ද්‍රිය පසකි. (මෙහි 2 (ii) යොදන්න) කවර පසක්ද? සද්ධින්ද්‍රියද, විරියින්ද්‍රියද, සතින්ද්‍රියද, සමාධින්ද්‍රියද, පඤ්ඤින්ද්‍රියද වෙත්. (ii) මහණෙනි, යම් ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මේ පංච ඉන්ද්‍රියයන්ගේ ඉපදීමේ හෙතුවද අභාවයද ආනිශංසද ආදීනවද නික්මීමද තත්ත්වාකාරයෙන් නොදනිද්ද මහණෙනි, මා විසින් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණයයි සම්මත කරන ලද්දාහුද බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණයයි සම්මත කරන ලද්දාහුද (iii) නොවෙත්. ඒ ආයුෂ්මත්හු ශ්‍රමණ භාවයෙහි ඵලය හෝ බ්‍රාහ්මණ භාවයෙහි ඵලය හෝ මේ ආත්මයෙහි තෙමේ විශෙෂ ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය නොකරත්.

12. “මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ (මෙහි 11 (ii) යොදන්න) ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණභාවයෙහි ඵලයද බ්‍රාහ්මණ භාවයෙහි ඵලයද තෙමේ විශෙෂ ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරත්.

(මේ ඡෙදයේ වාක්‍යයන්ට මුලින් “කෙතෙක් ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ” යන වචන යෙදිය යුතුයි)

13. “කෙතෙක් ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ පහළවීමේ හෙතුව වෙයිද,- පහළවීමේ හෙතුව දැනගනියිද,- අභාවය වෙයිද,- අභාවය දැනගනියිද,- ආනිශංස වෙයිද,- ආනිශංස දැනගනියිද,- ආදීනව වෙයිද,- ආදීනව දැනගනියිද,- නික්මීම වෙයිද,- නික්මීම දැනගනියිද?

“සතලිස් ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ පහළවීමේ හෙතුව වෙයි. සතලිස් ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ

පහළවීමේ හේතුව දැනගනියි. සතලිස් ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ අභාවය වෙයි. සතලිස් ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ අභාවය දැනගනියි. පස්විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ ආනිශංසය වෙයි. පස්විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ ආනිශංසය දැනගනියි. පස්විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ ආදීනව වෙයි. පස්විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ ආදීනව දැනගනියි. එක්සිය අසූ ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ නික්මීම වෙයි. එක්සිය අසූ ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ නික්මීම දැනගනියි.

**14.** "කවර සතලිස් ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ ඇතිවීමේ හෙතුව වෙයිද? කවර සතලිස් ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ ඉපදීමේ හෙතුව දැනගනියිද? ශ්‍රද්ධාව පිණිස ආවර්ජන චිත්තයාගේ පහළවීම සද්ධින්ද්‍රියයාගේ පහළවීමට හෙතුව වෙයි. ඇදහීම් වශයෙන් (ශ්‍රද්ධාව හා යෙදුණ) ඡන්දයාගේ පහළවීම සද්ධින්ද්‍රියයාගේ පහළවීමට හෙතුව වෙයි. ඇදහීම් වශයෙන් මනසිකාර චෛතසිකය පහළවීම සද්ධින්ද්‍රිය ඉපදීමට හෙතුව වෙයි. සද්ධින්ද්‍රියයාගේ වශයෙන් එක් අරමුණෙහි දැඩිව පිහිටීම සද්ධින්ද්‍රියාගේ පහළවීමට හෙතුව වෙයි.

**15.** "සිත එසවීම පිණිස ආවර්ජන චිත්තයාගේ පහළවීම විරියින්ද්‍රියයාගේ පහළවීමට හෙතුව වෙයි. වීර්ය වශයෙන් (වීර්යය හා යෙදුණ) ඡන්දය පහළවීම විරියින්ද්‍රියයාගේ පහළ වීමට හෙතුව වෙයි. වීර්ය වශයෙන් මනසිකාර චෛතසිකය පහළවීම විරියින්ද්‍රිය පහළවීමට හෙතුව වෙයි. විරියින්ද්‍රිය වශයෙන් එක් අරමුණෙහි දැඩිව පිහිටීම විරියින්ද්‍රිය පහළවීමට හෙතුව වෙයි.

**16.** සිහි කිරීම පිණිස ආවර්ජන චිත්තයාගේ පහළවීම සතින්ද්‍රියගේ පහළවීමට හෙතුව වෙයි. සිහි කිරීම් වශයෙන් ඡන්දයාගේ පහළවීම සතින්ද්‍රිය පහළවීමට හෙතුව වෙයි. සිහි කිරීම් වශයෙන් මනසිකාර චෛතසිකයාගේ පහළවීම සතින්ද්‍රියට ප්‍රත්‍ය වෙයි. සතින්ද්‍රිය වශයෙන් එක් අරමුණෙහි දැඩිව පිහිටීම සතින්ද්‍රියට ප්‍රත්‍ය වෙයි.

**17.** "සමාධිය පිණිස ආවර්ජන චිත්තයාගේ පහළවීම සමාධින්ද්‍රියට ප්‍රත්‍ය වෙයි. සමාධි වශයෙන් ඡන්දයාගේ පහළවීම

සමාධින්ද්‍රියට ප්‍රත්‍යයවෙයි. සමාධි වශයෙන් මනසිකාරයාගේ පහළවීම සමාධින්ද්‍රියට ප්‍රත්‍ය වෙයි. සමාධින්ද්‍රිය වශයෙන් එක් අරමුණෙහි දැඩිව පිහිටීම සමාධින්ද්‍රියට ප්‍රත්‍ය වෙයි.

18. "නුවණින් දැකීම පිණිස ආවර්ජන චිත්තයාගේ පහළවීම පඤ්ඤින්ද්‍රියට ප්‍රත්‍යයවෙයි. දැකීම් වශයෙන් ඡන්දයාගේ පහළවීම පඤ්ඤින්ද්‍රියට ප්‍රත්‍ය වෙයි. දැකීම් වශයෙන් මනසිකාර චෛතසිකය පහළවීම පඤ්ඤින්ද්‍රියට ප්‍රත්‍ය වෙයි. පඤ්ඤින්ද්‍රිය වශයෙන් එක් අරමුණෙහි දැඩිව පිහිටීම පඤ්ඤින්ද්‍රියට ප්‍රත්‍ය වෙයි.

19. "ඇදහීම් පිණිස ආවර්ජන චිත්තයාගේ පහළවීම සද්ධින්ද්‍රියට ප්‍රත්‍යවේ. සිත එසවීම පිණිස ආවර්ජන චිත්තයාගේ පහළවීම විරියින්ද්‍රියයට ප්‍රත්‍ය වෙයි. සිහි කිරීම පිණිස ආවර්ජන චිත්තයාගේ පහළවීම සතින්ද්‍රියට ප්‍රත්‍යවේ. සමාධිය පිණිස ආවර්ජන චිත්තයාගේ පහළවීම සමාධින්ද්‍රියට ප්‍රත්‍ය වෙයි. දැකීම පිණිස ආවර්ජන චිත්තයාගේ පහළවීම පඤ්ඤින්ද්‍රියට ප්‍රත්‍යයවෙයි. ඇදහීම් වශයෙන් ඡන්දයාගේ පහළවීම සද්ධින්ද්‍රියට ප්‍රත්‍යයවෙයි. සිත එසවීම් වශයෙන් ඡන්දයාගේ පහළවීම විරියින්ද්‍රියට ප්‍රත්‍යයවෙයි. සිහි කිරීම් වශයෙන් ඡන්දයාගේ පහළවීම සතින්ද්‍රියට ප්‍රත්‍ය වෙයි. සමාධි වශයෙන් ඡන්දයාගේ පහළවීම සමාධින්ද්‍රියට ප්‍රත්‍යයවෙයි. දැකීම් වශයෙන් ඡන්දයාගේ පහළවීම පඤ්ඤින්ද්‍රියට ප්‍රත්‍ය වෙයි.

20. "ඇදහීම් වශයෙන් මනසිකාර චෛතසිකයාගේ පහළවීම සද්ධින්ද්‍රියට ප්‍රත්‍ය වෙයි. සිත එසවීම් වශයෙන් මනසිකාර චෛතසිකයාගේ පහළවීම විරියින්ද්‍රියට ප්‍රත්‍ය වෙයි. සිහිකිරීම් වශයෙන් මනසිකාර චෛතසිකයාගේ පහළවීම සතින්ද්‍රියට ප්‍රත්‍ය වෙයි. සමාධි වශයෙන් මනසිකාර චෛතසිකයාගේ පහළවීම සමාධින්ද්‍රියට ප්‍රත්‍යයවෙයි. දැකීම් වශයෙන් මනසිකාර චෛතසිකයාගේ පහළවීම පඤ්ඤින්ද්‍රියට ප්‍රත්‍ය වෙයි.

21. "සද්ධින්ද්‍රිය (ii) වශයෙන් එක් අරමුණෙහි දැඩිව පිහිටීම (iii) සද්ධින්ද්‍රියයට ප්‍රත්‍යයවෙයි. විරියින්ද්‍රිය (මෙහි (ii) විරියින්ද්‍රියට ප්‍රත්‍ය වෙයි. සතින්ද්‍රිය (මෙහි (ii) සතින්ද්‍රියට ප්‍රත්‍යයවෙයි.

සමාධින්ද්‍රිය මෙහි (ii) සමාධින්ද්‍රිය ප්‍රත්‍ය වෙයි. පඤ්ඤින්ද්‍රිය (මෙහි (ii) පඤ්ඤින්ද්‍රියට ප්‍රත්‍යවෙයි. (iv) මේ සතලිස්ආකාරයෙන් පංච ඉන්ද්‍රියයන්ගේ ඉපදීමට ප්‍රත්‍යවේ. (v) (මෙහි (iv) දැනගනියි.

22. (i) කවර සතලිස් ආකාරයකින් පංචඉන්ද්‍රියයන්ගේ අස්තංගමය (අභාවය) (ii) වෙයිද (මෙහි (i) දැනගනියිද? ඇදහීම පිණිස පවත්නා ආවර්ජන චිත්තයාගේ (iii) අභාවය සද්ධින්ද්‍රියාගේ අභාවය වෙයි. (iv) ඇදහීම් වශයෙන් පවත්නා ඡන්දයාගේ (මෙහි (iii) ඇදහීම් වශයෙන් පවත්නා මනසිකාර චෛතසිකයාගේ (මෙහි) (iii) සද්ධින්ද්‍රිය වශයෙන් එක් අරමුණෙක නොපිහිටීම සද්ධින්ද්‍රියයාගේ අභාවය වෙයි.

23. සිත එසවීම පිණිස ආවර්ජන චිත්තයාගේ (ii) අභාවය විරියින්ද්‍රියයාගේ අභාවය වෙයි. (iii) සිත එසවීම් වශයෙන් පවත්නා ඡන්දයාගේ (මෙහි (ii) සිත එසවීම් වශයෙන් පවත්නා මනසිකාරයාගේ (මෙහි (ii) විරියින්ද්‍රිය වශයෙන් එක් අරමුණෙක නොපිහිටීම විරියින්ද්‍රියයාගේ අභාවය වෙයි.

24. සිහි කිරීම පිණිස ආවර්ජන චිත්තයාගේ ආභාවය (ii) සතින්ද්‍රියයාගේ අභාවය වෙයි. (iii) සිහි කිරීම් වශයෙන් ඡන්දයාගේ නොපැවැත්ම (මෙහි (ii) සිහි කිරීම් වශයෙන් මනසිකාරයාගේ නොපැවැත්ම (මෙහි (ii) සතින්ද්‍රිය වශයෙන් එක් අරමුණෙක්හි නොපිහිටීම (මෙහි (ii)

25. "සමාධිය පිණිස පවත්නා ආවර්ජන චිත්තයාගේ අභාවය (ii) සමාධින්ද්‍රියගේ අභාවය වෙයි. (iii) සමාධි වශයෙන් ඡන්දයාගේ නොපැවැත්ම (මෙහි (ii) සමාධි වශයෙන් මනසිකාරයාගේ නොපැවැත්ම (මෙහි (ii) සමාධින්ද්‍රිය වශයෙන් එක් අරමුණෙහි නොපිහිටීම (මෙහි (ii)

26. දැකීම පිණිස ආවර්ජන චිත්තයාගේ නොපැවැත්ම (ii) පඤ්ඤින්ද්‍රියගේ අභාවය වෙයි. (iii) දැකීම් වශයෙන් ඡන්දයාගේ නොපැවැත්ම (මෙහි (ii) දැකීම් වශයෙන් මනසිකාරයාගේ නොපැවැත්ම (මෙහි (ii) පඤ්ඤින්ද්‍රිය වශයෙන් එක් අරමුණෙක නොපිහිටීම (මෙහි ii)

27. ඇදහීම පිණිස ආවර්ජන චිත්තයාගේ නොපැවැත්ම සද්ධින්ද්‍රියගේ අභාවය වෙයි. සිත එසවීම පිණිස ආවර්ජන

චිත්තයාගේ නොපැවැත්ම විරියින්ද්‍රියගේ අභාවය වෙයි. සිහිකිරීම පිණිස ආවර්ජන චිත්තයාගේ නොපැවැත්ම සතින්ද්‍රියගේ අභාවය වෙයි. සමාධිය පිණිස ආවර්ජන චිත්තයාගේ නොපැවැත්ම සමාධින්ද්‍රියගේ අභාවය වෙයි. දැකීම පිණිස ආවර්ජන චිත්තයාගේ නොපැවැත්ම පඤ්ඤින්ද්‍රියගේ අභාවයවෙයි.

28. ඇදහීම් වශයෙන් ඡන්දයාගේ නොපැවැත්ම සද්ධින්ද්‍රියගේ අභාවය වෙයි. සිත එසවීම් වශයෙන් ඡන්දයාගේ නොපැවැත්ම විරියින්ද්‍රියගේ අභාවය වෙයි. සිහි කිරීම් වශයෙන් ඡන්දයාගේ නොපැවැත්ම සතින්ද්‍රියගේ අභාවය වෙයි. සමාධි වශයෙන් ඡන්දයාගේ නොපැවැත්ම සමාධින්ද්‍රියගේ අභාවය වෙයි. දැකීම් වශයෙන් ඡන්දයාගේ නොපැවැත්ම පඤ්ඤින්ද්‍රියගේ අභාවය වෙයි.

29. ඇදහීම් වශයෙන් මනසිකාරයාගේ නොපැවැත්ම සද්ධින්ද්‍රියගේ අභාවය වෙයි. සිත එසවීම් වශයෙන් මනසිකාරයාගේ නොපැවැත්ම විරියින්ද්‍රියගේ අභාවය වෙයි. සිහිකිරීම් වශයෙන් මනසිකාරයාගේ නොපැවැත්ම සතින්ද්‍රියගේ අභාවය වෙයි. සමාධි වශයෙන් මනසිකාරයාගේ නොපැවැත්ම සමාධින්ද්‍රියගේ අභාවය වෙයි. දැකීම් වශයෙන් මනසිකාරයාගේ නොපැවැත්ම පඤ්ඤින්ද්‍රියගේ අභාවය වෙයි.

30. සද්ධින්ද්‍රිය වශයෙන් එක් අරමුණෙක්හි නොපිහිටීම සද්ධින්ද්‍රියගේ අභාවය වෙයි. විරියින්ද්‍රිය වශයෙන් එක් අරමුණෙක නොපිහිටීම විරියින්ද්‍රියගේ අභාවය වෙයි. සතින්ද්‍රිය වශයෙන් එක් අරමුණෙක්හි නොපිහිටීම සතින්ද්‍රියගේ අභාවය වෙයි. සමාධින්ද්‍රිය වශයෙන් එක් අරමුණෙක්හි නොපිහිටීම සමාධින්ද්‍රියගේ අභාවය වෙයි. පඤ්ඤින්ද්‍රිය වශයෙන් එක් අරමුණෙක්හි නොපිහිටීම පඤ්ඤින්ද්‍රියගේ අභාවය වෙයි. (i) මේ සතලිස් ආකාරයෙන් පංච ඉන්ද්‍රියයන්ගේ අභාවය වෙයි. (ii) (මෙහි (i) දැනගනියි.

31. (i) කවර පස්විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ ආස්වාදය (ආනිශංසය) (ii) වෙයිද? (මෙහි (i) දැනගනියිද? අශ්‍රද්ධාවගේ නොපහළවීම (ii) සද්ධින්ද්‍රියගේ ආස්වාදය (ආනිසංසය) වෙයි. (iv) අශ්‍රද්ධාවෙන් උපදනා දැවීම්

නොපහළවීම (මෙහි (iii) ශ්‍රද්ධාවගේ පැවැත්මෙහි විශාරද බව (මෙහි (iii) ශාන්තවූ සමථ විදර්ශනාවන්ට පැමිණීම (මෙහි (iii) සද්ධින්ද්‍රිය කරුණුකොට යම් සුඛයක් සොම්නසක් උපදියිද, මෙය (මෙහි (iii)

32. කුසීත බව නොපහළවීම (ii) විරියින්ද්‍රියයාගේ ආස්වාදය වෙයි. (iii) කුසීත බව නිසා උපදින දාහය නොපහළවීම (මෙහි (ii) වීර්යයාගේ පැවැත්මෙහි විසාරද බව (මෙහි (ii) ශාන්තවූ සමථ විදර්ශනාවන්ට පැමිණීම (මෙහි (ii) විරියින්ද්‍රිය කරුණු කොට යම් සුඛයක් සොම්නසක් උපදියිද මෙය (මෙහි (ii)

32. ප්‍රමාදය නොපහළවීම (ii) සතින්ද්‍රියගේ ආස්වාදය වෙයි. (iii) ප්‍රමාදය නිසා උපදනා දැවීම නොපහළවීම (මෙහි (ii) සතියගේ පැවැත්මෙහි විශාරද බව (මෙහි (ii) සතින්ද්‍රිය කරුණුකොට යම් සුඛයක් සොම්නසක් උපදියිද, මෙය (මෙහි (ii)

34. "උද්ධච්චයාගේ නොපහළවීම (ii) සමාධින්ද්‍රියගේ ආශ්වාදය වෙයි. (iii) උද්ධච්චය නිසා පවත්නා දැවීම නොපහළවීම (මෙහි (ii) සමාධියගේ පැවැත්මෙහි විශාරද බව මෙහි (iii) ශාන්තවූ සමථ විදර්ශනාවට පැමිණීම (මෙහි (ii) සමාධින්ද්‍රිය කරුණු කොට යම් සුඛයක් සොම්නසක් උපදියිද මෙය (මෙහි (iii)

35. අවිද්‍යාව පහළනොවීම (ii) පඤ්ඤින්ද්‍රියගේ ආශ්වාදය වෙයි. (ii) අවිද්‍යාව නිසා උපදින දැවීම පහළනොවීම (මෙහි (ii) නුවණින් දැක්ම පැවැත්මෙහි විශාරද බව (මෙහි (ii) ශාන්තවූ සමථ විදර්ශනාවන්ට පැමිණීම (මෙහි (ii) පඤ්ඤින්ද්‍රිය නිසා යම් සුඛයක් සොම්නසක් උපදියිද මෙය (මෙහි (ii) (iv) මේ පස්විසි ආකාරයෙන් පංචඉන්ද්‍රියයන්ගේ ආශ්වාදය වෙයි. (v) (මෙහි (iv) දැනගනියි.

36. (i) කවර පස්විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ ආදීනවය (ii) වෙයිද? (මෙහි (i) දැනගනීද?

37. අශ්‍රද්ධාව පහළවීම (ii) සද්ධින්ද්‍රියගේ ආදීනවය වෙයි. (iii) අශ්‍රද්ධාව නිසා උපදින දැවීම ඉපදීම (මෙහි (ii) අනිත්‍ය

ස්වභාවයෙන් (මෙහි (ii) දුක්ඛ ස්වභාවයෙන් (මෙහි (ii) අනාත්ම ස්වභාවයෙන් (මෙහි (ii)

38. කුසීත බව පහළවීම (ii) විරියින්ද්‍රියගේ ආදීනවය වෙයි. (ii) කුසීත බව නිසා පහළවන දැවීම පහළවීම (මෙහි (ii) අනිත්‍ය ස්වභාවයෙන් (මෙහි (ii) දුක්ඛ ස්වභාවයෙන් (මෙහි ii) අනාත්ම ස්වභාවයෙන් (මෙහි (ii)

39. ප්‍රමාදය පහළවීම (ii) සතින්ද්‍රියගේ ආදීනවය වෙයි. (iii) ප්‍රමාදය නිසා උපදින දැවීම පහළවීම (මෙහි (ii) අනිත්‍ය ස්වභාවයෙන් (මෙහි (ii) දුක්ඛ ස්වභාවයෙන් (මෙහි (ii) අනාත්ම ස්වභාවයෙන් (මෙහි (ii)

40. උද්ධච්චය පහළවීම (ii) සමාධින්ද්‍රියගේ ආදීනවය වෙයි. (iii) උද්ධච්චය නිසා පහළවන දැවීම පහළවීම (මෙහි (ii) අනිත්‍ය ස්වභාවයෙන් (මෙහි (ii) දුක්ඛ ස්වභාවයෙන් (මෙහි (ii) අනාත්ම ස්වභාවයෙන් (මෙහි (ii)

41. අවිද්‍යාව පහළවීම (ii) පඤ්ඤින්ද්‍රියගේ ආදීනවය වෙයි. (iii) අවිද්‍යාව නිසා පහළවන දැවීම ඉපදීම (මෙහි (ii) අනිත්‍ය ස්වභාවයෙන් (මෙහි (ii) දුක්ඛ ස්වභාවයෙන් (මෙහි (ii) අනාත්ම ස්වභාවයෙන් (මෙහි (ii) (iv) මේ පස්විසි ආකාරයෙන් පංච ඉන්ද්‍රියයන්ගේ ආදීනවය (v) වෙයි. (මෙහි (iv) දැනගනියි.

42. (i) කවර එක්සිය අසූආකාරයකින් පංචඉන්ද්‍රියයන්ගේ නිස්සරණය (නික්මීම) (ii) වෙයිද? (මෙහි (i) දැනගනියිද? ඇදහීම් ස්වභාවයෙන් සද්ධින්ද්‍රිය අශ්‍රද්ධාවෙන් නික්මුණේ වෙයි. අශ්‍රද්ධාව නිසා උපදනා දැවීමෙන් නික්මුණේ වෙයි. ඒ අනුව පවත්නා ක්ලේශයන්ගෙන්ද ස්කන්ධයන්ගෙන්ද නික්මුණේ වෙයි. බාහිර සියලු සංඛාර නිමිති කෙරෙන්ද නික්මුණේ වෙයි. ඊට වඩා ප්‍රණීත සද්ධින්ද්‍රිය ලැබීම හෙතුකොට ගෙන පූර්වභාග සද්ධින්ද්‍රිය කෙරෙන් නික්මුණේ වෙයි.

(43-45 දක්වා ඡෙදවල ඒ ඒ වාක්‍ය අගට "නික්මුණේ වෙයි" කියා යෙදිය යුතුයි)

43. උත්සාහ ස්වභාවයෙන් විරියින්ද්‍රිය කුසීත බවෙන් නික්මුණේ වෙයි. කුසීත බව නිසා උපදනා දැවීමෙන්- ඒ අනුව

පවත්නා ක්ලේශයන් කෙරෙන්ද ස්කන්ධයන් කෙරෙන්ද- බාහිර සියලු සංඛාර නිමිති කෙරෙන්ද- ඊට වඩා ප්‍රණීත විරියින්ද්‍රිය ලැබීම නිසා පූර්වභාග විරියින්ද්‍රියයෙන්- සිහිකිරීම් ස්වභාවයෙන් සතින්ද්‍රිය ප්‍රමාදයෙන්- ප්‍රමාදය නිසා උපදිනා දැවීමෙන්- ඒ අනුව පවත්නා ක්ලේශයන් කෙරෙන්ද ස්කන්ධයන් කෙරෙන්ද- බාහිර සියලු සංඛාර නිමිති කෙරෙන්ද ඊට වඩා ප්‍රණීතවූ සතින්ද්‍රිය ලැබූ හෙයින් පූර්වභාග සතින්ද්‍රිය කෙරෙන් නික්මුණේ වෙයි.

**44.** නොවිසිරයාම් ස්වභාවයෙන් සමාධින්ද්‍රිය උද්ධච්චයෙන්- උද්ධච්චය නිසා උපදනා දැවීමෙන්- ඒ අනුව පවත්නා ක්ලේශයන්ගෙන්ද ස්කන්ධයන්ගෙන්ද- බාහිර සියලු සංඛාර නිමිති කෙරෙන්ද මිදුණේ වෙයි. ඊටවඩා ප්‍රණීතවූ සමාධින්ද්‍රිය ලැබූ හෙයින් පූර්වභාග සමාධින්ද්‍රියෙන් නික්මුණේ වෙයි.

**45.** දැකීම් ස්වභාවයෙන් පඤ්ඤින්ද්‍රිය අවිද්‍යාව කෙරෙන්- අවිද්‍යාව නිසා උපදනා දැවීමෙන්- ඒ අනුව පවත්නා ක්ලේශයන් කෙරෙන්ද ස්කන්ධයන් කෙරෙන්ද- බාහිර සියලු නිමිති කෙරෙන්- ඊට වඩා ප්‍රණීත පඤ්ඤින්ද්‍රිය ලැබූ හෙයින් පූර්වභාග පඤ්ඤින්ද්‍රියෙන් නික්මුණේ වෙයි.

(46-47 මේ ඡේදවල ඒ ඒ වාක්‍ය අගට "පංච ඉන්ද්‍රියයෝ නික්මුණාහු වෙති" කියා යොදන්න)

**46.** පූර්වභාග අවස්ථාවෙහි පංච ඉන්ද්‍රියයන් කෙරෙන් ප්‍රථම ධ්‍යාන වශයෙන්වූ- ප්‍රථම ධ්‍යානයෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් ද්විතීය ධ්‍යාන වශයෙන්වූ- ද්විතීයධ්‍යානයෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් තෘතීය ධ්‍යාන වශයෙන්වූ- තෘතීය ධ්‍යානයෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් චතුර්ථධ්‍යාන වශයෙන්වූ- චතුර්ථධ්‍යානයෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් ආකාසානඤ්චායතන සමාපත්ති වශයෙන්වූ ආකාසානඤ්චායතන සමාපත්තියෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් විඤ්ඤාණඤ්චායතන සමාපත්ති වශයෙන්වූ- විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති වශයෙන්වූ- ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙහිවූ පංච ඉන්ද්‍රියයන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කෙරෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්ති වශයෙන්වූ පංච ඉන්ද්‍රියයෝ නික්මුණාහු වෙත්.

47. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙහිවූ පංචඉන්ද්‍රියයන් කෙරෙන් අනිච්චානුපස්සනා වශයෙන්වූ- අනිච්චානුපස්සනාවෙහිවූ පංච ඉන්ද්‍රියයෝ දුක්ඛානුපස්සනා වශයෙන්වූ- දුක්ඛානුපස්සනාවෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් අනාත්මානුපස්සනා වශයෙන්වූ- අනාත්මානුපස්සනාවෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් නිබ්බිදානුපස්සනා වශයෙන්වූ- නිබ්බිදානුපස්සනාවෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් විරාගානුපස්සනා වශයෙන්වූ- විරාගානුපස්සනාවෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් නිරොධානුපස්සනා වශයෙන්වූ- නිරොධානුපස්සනාවෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් පටිනිස්සග්ගානුපස්සනා වශයෙන්වූ- පටිනිස්සග්ගානුපස්සනාවෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් ඛයානුපස්සනාවෙහිවූ- ඛයානුපස්සනාවෙහිවූ පංචඉන්ද්‍රියයන් කෙරෙන් ඛයානුපස්සනා වශයෙන්වූ- ඛයානුපස්සනාවෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් විපරිණාමානුපස්සනා වශයෙන්වූ- විපරිණාමානුපස්සනාවෙහිවූ පංචඉන්ද්‍රියයන් කෙරෙන් අනිමිත්තානුපස්සනා වශයෙන්වූ- අනිමිත්තානුපස්සනාවෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් අප්පණිහිතානුපස්සනා වශයෙන්වූ- අප්පණිහිතානුපස්සනා වෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් සුඤ්ඤතානුපස්සනා වශයෙන්වූ- සුඤ්ඤතානුපස්සනාවෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් අධිපඤ්ඤා ධම්ම විපස්සනා වශයෙන්වූ- අධිපඤ්ඤා ධම්ම විපස්සනා වෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් යථාභූත ඥානදර්ශන වශයෙන්වූ- යථාභූත ඥානදර්ශනයෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් ආදීනවානුපස්සනා වශයෙන්වූ- ආදීනවානුපස්සනාවෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් පටිසංඛානුප්සනා වශයෙන්වූ- පටිසංඛානුපස්සනාවෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් විවට්ටානුපස්සනා වශයෙන්වූ- විවට්ටානුපස්සනාවෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් සෝවාන් මාර්ග වශයෙන්වූ- සෝවාන් මාර්ගයෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් සෝවාන්ඵල සමාපත්ති

වශයෙන්වූ- සෝවාන්ඵල සමාපත්තියෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් සකෘදාගාමි මාර්ග වශයෙන්වූ- සකෘදාගාමි මාර්ගයෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් සකෘදාගාමිඵල සමාපත්තියෙහිවූ- සකෘදාගාමි ඵල සමාපත්තියෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් අනාගාමි මාර්ග වශයෙන්වූ- අනාගාමි මාර්ගයෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් අනාගාමිඵල සමාපත්ති වශයෙන්වූ- අනාගාමි ඵල සමාපත්තියෙහිවූ පංචඉන්ද්‍රියයන් කෙරෙන් අර්හත් මාර්ග වශයෙන්වූ- අර්හත් මාර්ගයෙහිවූ පංච ඉන්ද්‍රියයන් කෙරෙන් අර්හත් ඵල සමාපත්ති වශයෙන්වූ පංච ඉන්ද්‍රියයෝ නික්මුණාහු වෙති.

(48-49 ඡේදවල ඒ ඒ වාක්‍ය අගට "නික්මුණාහු වෙත්" යොදන්න)

48. නෛෂ්ක්‍රම්‍යයෙහි පංච ඉන්ද්‍රියයෝ කාමච්ඡන්දය කෙරෙන්- අව්‍යාපාදයෙහි පංච ඉන්ද්‍රියයෝ ව්‍යාපාදය කෙරෙන්- ආලෝකසඤ්ඤාවෙහි පංච ඉන්ද්‍රියයෝ ථිනමිද්ධය කෙරෙන්- සමාධියෙහි පංච ඉන්ද්‍රියයෝ උද්ධච්චය කෙරෙන්- ධර්මයන් පිරිසිඳ දැනීමෙහි පංච ඉන්ද්‍රියයෝ විචිකිච්ඡාව කෙරෙන්- ඤාණයෙහි පංච ඉන්ද්‍රියයෝ අවිද්‍යාවෙන්- ප්‍රමොද්‍යයෙහි පංචඉන්ද්‍රියයෝ අරතියෙන් (ධර්මයෙහි නොඇල්මෙන්) වෙන්වූවාහු වෙත්. ප්‍රථම ධ්‍යානයෙහි පංචඉන්ද්‍රියයෝ නීවරණයන් කෙරෙන්- ද්විතීය ධ්‍යානයෙහි පංච ඉන්ද්‍රියයෝ විතර්ක විචාරයන් කෙරෙන්- තෘතීය ධ්‍යානයෙහි පංච ඉන්ද්‍රියයෝ ප්‍රීතියෙන්- චතුර්ථධ්‍යානයෙහි පංච ඉන්ද්‍රියයෝ සුඛ දුක්ඛයන් කෙරෙන් නික්මුණාහු වෙත්.

49. "ආකාසානඤ්චායතන සමාපත්තියෙහි පංච ඉන්ද්‍රියයෝ රූපසඤ්ඤාවෙන් පටිඝසඤ්ඤාවෙන් නානත්තසඤ්ඤාවෙන්- විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙහි පංච ඉන්ද්‍රියයෝ ආකාසානඤ්චායතන සඤ්ඤාවෙන්- ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙහි පංච ඉන්ද්‍රියයෝ විඤ්ඤාණඤ්චායතන සඤ්ඤාවෙන්- නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙහි පංච ඉන්ද්‍රියයෝ ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤාවෙන්- අනිච්චානු පස්සනාවෙහි

පංච ඉන්ද්‍රියයෝ නිත්‍ය සංඥාවෙන්- දුක්ඛානු පස්සනාවෙහි පංච ඉන්ද්‍රියයෝ සුඛසඤ්ඤාවෙන්- අනත්තානු පස්සනාවෙහි පංච ඉන්ද්‍රියයෝ ආත්ම සංඥාවෙන්- නිබ්බිදානු පස්සනාවෙහි පංච ඉන්ද්‍රියයෝ තෘෂ්ණා සතුටෙන්- විරාගානු පස්සනාවෙහි පංච ඉන්ද්‍රියයෝ රාගය කෙරෙන්- නිරොධානු පස්සනාවෙහි පංච ඉන්ද්‍රියයෝ සමුදය කෙරෙන්- පටිනිස්සග්ගානු-පස්සනාවෙහි පංච ඉන්ද්‍රියයෝ අල්වාගැනීමෙන්-ඛයානුපස්සනාවෙහි පංච ඉන්ද්‍රියයෝ ඝනසඤ්ඤාවෙන්-වයානුපස්සනාවෙහි පංච ඉන්ද්‍රියයෝ කර්ම රැස්කිරීමෙන්-විපරිණාමානුපස්සනාවෙහි පංච ඉන්ද්‍රියයෝ ධ්‍රුව (ස්ථිර) සංඥාවෙන්- අනිමිත්තානුපස්සනාවෙහි පංච ඉන්ද්‍රියයෝ සංඛාර නිමිත්ත කෙරෙන්- අප්පණිහිතානුපස්සනාවෙහි පංච ඉන්ද්‍රියයෝ ප්‍රණිධියෙන් (තෘෂ්ණාප්‍රාර්ථනයෙන්)- සුඤ්ඤතානු-පස්සනාවෙහි පංච ඉන්ද්‍රියයෝ මමයයි වරදවා ගැනීමෙන්-අධිපඤ්ඤා ධම්ම විපස්සනාවෙහි පංච ඉන්ද්‍රියයෝ සාරයයි ගැනීමෙන්- යථාභූත ඥානදර්ශනයෙහි පංච ඉන්ද්‍රියයෝ සම්මොහ වශයෙන් ගැනීමෙන්- ආදීනවානුපස්සනාවෙහි පංච ඉන්ද්‍රියයෝ ආලය වශයෙන් ගැනීමෙන්- පටිසංඛානු-පස්සනාවෙහි පංච ඉන්ද්‍රියයෝ නුවණින් නොබැලීමෙන්-විවට්ටානුපස්සනාවෙහි පංච ඉන්ද්‍රියයෝ සංයෝග වශයෙන් ගැනීමෙන්- සෝවාන් මාර්ගයෙහි පංච ඉන්ද්‍රියයෝ දෘෂ්ටිය හා එක්ව පැවැත්තාවූ ක්ලේශයන් කෙරෙන්- සකෘදාගාමි මාර්ගයෙහි පංච ඉන්ද්‍රියයෝ ඖදාරික ක්ලේශයන් කෙරෙන්- අනාගාමි මාර්ගයෙහි පංච ඉන්ද්‍රියයෝ තුනීවූ ක්ලේශයන් කෙරෙන්-අර්හත් මාර්ගයෙහි පංච ඉන්ද්‍රියයෝ සියලු ක්ලේශයන් කෙරෙන්- සියලු ක්ෂීණාශ්‍රවයන්ගේ ඒ ඒ තන්හිවූ පංච ඉන්ද්‍රියයෝ නික්මුණාහුද වෙත්. මනාකොට සංසිඳුණාහුද වෙත්.

මේ එක්සිය අසූ ආකාරයෙන් පංච ඉන්ද්‍රියයන්ගේ නිස්සරණය වෙයි. මේ එක්සිය අසූ ආකාරයෙන් පංචඉන්ද්‍රියයන්ගේ නිස්සරණය දැනගනියි.

(පළමුවැනි බණවරයි.)

---

**50.** සැවැත්නුවර නිදානය වෙයි.

"මහණෙනි, මේ ඉන්ද්‍රිය පසකි. කවර පසක්ද? සද්ධින්ද්‍රියද විරියින්ද්‍රියද සතින්ද්‍රියද සමාධින්ද්‍රියද පඤ්ඤින්ද්‍රියද වෙත්.

"මහණෙනි කොතැනෙක්හි සද්ධින්ද්‍රිය දතයුතුද? සතර සොතාපත්ති අංගයන්හි යන මෙහි සද්ධින්ද්‍රිය දතයුතුය. මහණෙනි, කොතැන්හි විරියින්ද්‍රිය දතයුතුද? සතර සම්‍යක් ප්‍රධානයන්හි යන මෙහි විරියින්ද්‍රිය දතයුතුය. මහණෙනි, කොතැන්හි සතින්ද්‍රිය දතයුතුද? සතර සතිපට්ඨානයන්හි යන මෙහි සතින්ද්‍රිය දතයුතුය. මහණෙනි, කොතැන්හි සමාධින්ද්‍රිය දතයුතුද? සතර ධ්‍යානයන්හි යන මෙහි සමාධි ඉන්ද්‍රිය දතයුතුය. මහණෙනි, කොතැන්හි පඤ්ඤින්ද්‍රිය දතයුතුද? සතර ආර්‍ය සත්‍යයන්හි යන මෙහි පඤ්ඤින්ද්‍රිය දතයුතුය.

**51.** "සතර සොතාපත්තිඅංගයන්හි සද්ධින්ද්‍රියයාගේ (ii) වශයෙන් කෙතෙක් ආකාරයකින් පංච ඉන්ද්‍රියයෝ දතයුත්තාහුද? (iii) සතර සම්‍යක් ප්‍රධානයන්හි විරියින්ද්‍රියාගේ (මෙහි (ii) සතර සතිපට්ඨානයන්හි සතින්ද්‍රියයාගේ (මෙහි (ii) සතර ධ්‍යානයන්හි සමාධින්ද්‍රියයාගේ (මෙහි (ii) සතර ආර්‍ය සත්‍යයන්හි පඤ්ඤින්ද්‍රියයාගේ (මෙහි (ii) සතර සොතාපත්ති අංගයන්හි සද්ධින්ද්‍රියයාගේ (iv) විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයෝ දතයුත්තාහ. (v) සතර සම්‍යක් ප්‍රධානයන්හි විරීයින්ද්‍රියයාගේ (මෙහි (iv) සතර සතිපට්ඨානයන්හි සතින්ද්‍රියයාගේ (මෙහි (iv) සතර ධ්‍යානයන්හි සමාධින්ද්‍රියයාගේ (මෙහි (iv) සතර ආර්‍ය සත්‍යයන්හි පඤ්ඤින්ද්‍රියයාගේ පංච ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

**52.** සතර සොතාපත්තිඅංගයන්හි සද්ධින්ද්‍රියයාගේ වශයෙන් කවර විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයෝ දත යුත්තාහුද? සත්පුරුෂ සේවනයයි කියන ලද සොතාපත්ති-අංගයෙහි- (ii) ස්ථිරව ඇදහීම් වශයෙන් අධිපතිභාවයෙන් සද්ධින්ද්‍රිය දතයුතුය. සද්ධින්ද්‍රියයාගේ වශයෙන් උත්සාහ කිරීම් ස්වභාවයෙන් විරියින්ද්‍රිය දතයුතුය. (iii) සිහිකිරීම් ස්වභාවයෙන් සතින්ද්‍රිය දතයුතුය. නොවිසිරයාම් ස්වභාවයෙන් සමාධින්ද්‍රිය දතයුතුය, දැකීම් ස්වභාවයෙන් පඤ්ඤින්ද්‍රිය දතයුතුය. (iv)

සද්ධර්මශ්‍රවණයයි කියන ලද සොතාපත්ති අංගයෙහි යොනිසොමනසිකාරයයි කියන ලද සොතාපත්ති අංගයෙහි ධර්මානුධර්ම ප්‍රතිපත්තියයි කියන ලද සොතාපත්තිඅංගයෙහි (මෙහි (ii) (iii) යොදන්න) සතර සොතාපත්තිඅංගයන්හි සද්ධින්ද්‍රියයාගේ වශයෙන් මෙ විසි ආකාරයෙන් පංච ඉන්ද්‍රියයෝ දතයුතුය.

**53.** සතර සම්‍යක් ප්‍රධානයන්හි විරියින්ද්‍රියයාගේ වශයෙන් කවර විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයෝ දතයුත්තාහුද? නූපන් අකුශල ධර්මයන්ගේ නොඉපදීම පිණිස පවත්නා (ii) සම්‍යක් ප්‍රධානයෙහි උත්සාහ වශයෙන් අධිපතිභාවයෙන් විරියින්ද්‍රිය දතයුතුය. විරියින්ද්‍රියයාගේ වශයෙන් (මෙහි 52 (ii) ඇදහීම් ස්වභාවයෙන් සද්ධින්ද්‍රය දතයුතුය. (iii) උපන් අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස පවත්නා (මෙහි (ii) නූපන් කුශල ධර්මයන්ගේ ඉපදීම පිණිස පවත්නා සම්‍යක් ප්‍රධානයෙහි උපන් කුශල ධර්මයන්ගේ පැවැත්ම පිණිස නුමුළාව පිණිස බොහෝ බව පිණිස මහත් බව පිණිස වැඩීම පිණිස පිරීම පිණිස පවත්නා (මෙහි (ii) සතර සම්‍යක් ප්‍රධානයන්හි විරියින්ද්‍රියයාගේ වශයෙන් මේ විසි ආකාරයෙන් පංච ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

**54.** සතර සතිපට්ඨානයන්හි සතින්ද්‍රියයාගේ වශයෙන් කවර විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයෝ දතයුත්තාහුද? කයෙහි කායානුපස්සනා සතිපට්ඨානයෙහි (ii) සිහි කිරීම් වහයෙන් අධිපති භාවයෙන් සතින්ද්‍රිය දතයුතුය. සතින්ද්‍රියයාගේ වශයෙන් නොවිසිරයාම් ස්වභාවයෙන් සමාධින්ද්‍රිය දතයුතුය, දැකීම් ස්වභාවයෙන් පඤ්ඤින්ද්‍රිය දතයුතුය, ඇදහීම් ස්වභාවයෙන් සද්ධින්ද්‍රියද දතයුතුය. උත්සාහ ස්වභාවයෙන් විරියින්ද්‍රිය දතයුතුය. (iii) වේදනාවන්හි වේදනා පස්සනා සතිපට්ඨානයෙහි චිත්තයෙහි චිත්තානුපස්සනා සතිපට්ඨානයෙහි ධර්මයන්හි ධම්මානුපස්සනා සතිපට්ඨානයෙහි (මෙහි (ii) සතර සතිපට්ඨානයන්හි සතින්ද්‍රියයාගේ වශයෙන් මේ විසි ආකාරයෙහි පංච ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

**55.** සතර ධ්‍යානයන්හි සමාධින්ද්‍රිය වශයෙන් කවර විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයෝ දතයුත්තාහුද?

ප්‍රථමධ්‍යානයෙහි (ii) නොවිසිරයාම වශයෙන් අධිපති භාවයෙන් සමාධින්ද්‍රියද දතයුතුය, සමාධින්ද්‍රියගේ වශයෙන් දැකීම් ස්වභාවයෙන් පඤ්ඤින්ද්‍රිය දතයුතුය. ඇදහීම් ස්වභාවයෙන් සද්ධින්ද්‍රිය දතයුතුය. උත්සාහ වශයෙන් විරියින්ද්‍රිය දතයුතුය. සිහිකිරීම් වශයෙන් සතින්ද්‍රිය දතයුතුය. (iii) ද්විතීය ධ්‍යානයෙහි (මෙහි (ii) තෘතීය ධ්‍යානයෙහි (මෙහි (ii) චතුර්ථධ්‍යානයෙහි (මෙහි (ii) සතර ධ්‍යානයන්හි සමාධින්ද්‍රියයගේ වශයෙන් මේ විසි ආකාරයෙන් පංච ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

**56.** සතර ආර්ය සත්‍යයන්හි පඤ්ඤින්ද්‍රියයාගේ වශයෙන් කවර විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයෝ දතයුත්තාහුද? දුක්ඛාර්ය සත්‍යයෙහි (ii) දැකීම් වශයෙන් අධිපති භාවයෙන් පඤ්ඤින්ද්‍රිය දතයුතුය. පඤ්ඤින්ද්‍රියගේ වශයෙන් ඇදහීම් ස්වභාවයෙන් සද්ධින්ද්‍රිය දතයුතුය. උත්සාහ ස්වභාවයෙන් විරියින්ද්‍රිය දතයුතුය. සිහිකිරීම් ස්වභාවයෙන් සතින්ද්‍රිය දතයුතුය. නොවිසිරයාම් ස්වභාවයෙන් සමාධින්ද්‍රිය දතයුතුය. (iii) දුක්ඛ සමුදය ආර්ය සත්‍යයෙහි (මෙහි (ii) දුක්ඛ නිරොධ ආර්ය සත්‍යයෙහි (මෙහි (ii) දුක්ඛ නිරොධගාමිනී පටිපදා ආර්ය සත්‍යයෙහි (මෙහි (ii) සතර ආර්ය සත්‍යයන්හි පඤ්ඤින්ද්‍රියයාගේ වශයෙන් මේ විසි ආකාරයෙන් පංච ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

**57.** සතර සොතාපත්තිඅංගයන්හි (ii) සද්ධින්ද්‍රියයාගේ වශයෙන් කෙතෙක් ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ චර්යාව (පැවැත්ම) දතයුතුද? (iii) සතර සම්‍යක් ප්‍රධානයන්හි (මෙහි (ii) සතර ධ්‍යානයන්හි (මෙහි (ii) සතර සතිපට්ඨානයන්හි (මෙහි (ii) සතර ධ්‍යානයන්හි සතර ආර්ය සත්‍යයන්හි පඤ්ඤින්ද්‍රිය වශයෙන් කෙතෙක් ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ පැවැත්ම දතයුතුද?

සතර සොතාපත්ති අංගයන්හි (iv) සතින්ද්‍රියයාගේ වශයෙන් විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ පැවැත්ම දතයුතුය. (v) සතර සම්‍යක් ප්‍රධානයන්හි (මෙහි (iv) සතර සතිපට්ඨානයන්හි (මෙහි (iv) සතර ධ්‍යානයන්හි (මෙහි (iv)

සතර ආර්ය සත්‍යයන්හි පඤ්ඤින්ද්‍රියයාගේ වශයෙන් විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ පැවැත්ම දතයුතුය.

**58.** සතර සොතාපත්තිඅංගයන්හි කවර විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ පැවැත්ම දතයුතුද? සත්පුරුෂ සංසෙවාසොතපත්ති අංගයෙහි (ii) ඇදහීම් වශයෙන් අධිපති ස්වභාවයෙන් සද්ධින්ද්‍රියයාගේ පැවැත්ම දතයුතුය. සද්ධින්ද්‍රියයාගේ වශයෙන් උත්සාහ ස්වභාවයෙන් විරියින්ද්‍රියයාගේ පැවැත්ම දතයුතුය. සිහි කිරීම් වශයෙන් සතින්ද්‍රියයාගේ පැවැත්ම දතයුතුය. නොවිසිරයාම් ස්වභාවයෙන් සමාධින්ද්‍රියාගේ පැවැත්ම දතයුතුය. දැකීම් ස්වභාවයෙන් සඤ්ඤින්ද්‍රියයාගේ පැවැත්ම දතයුතුය. (iii) සද්ධර්ම ශ්‍රවණ සොතාපත්ති අංගයෙහි (මෙහි (ii) යොනිසොමනසිකාර සොතාපත්ති අංගයෙහි (මෙහි (ii) ධර්මානුධර්ම ප්‍රතිපත්ති සොතාපත්ති අංගයෙහි (මෙහි (ii) සතර සොතාපත්ති අංගයෙහි සද්ධින්ද්‍රිය වශයෙන් මේ විසි ආකාරයෙන් පංච ඉන්ද්‍රියයන්ගේ පැවැත්ම දතයුතුය.

**59.** සතර සම්‍යක් ප්‍රධානයන්හි විරියින්ද්‍රියයාගේ වශයෙන් කවර විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ පැවැත්ම දතයුත්තේද? නූපන් අකුශල ධර්මයන්ගේ නොඉපදීම පිණිස පවත්නා සම්‍යක් ප්‍රධානයෙහි (ii) උත්සාහ වශයෙන් අධිපති ස්වභාවයෙන් විරියින්ද්‍රියයාගේ පැවැත්ම දතයුතුය. විරියින්ද්‍රියගේ වශයෙන් සිහිකිරීම් ස්වභාවයෙන් සතින්ද්‍රියගේ පැවැත්ම දතයුතුය. නොවිසිරයාම් ස්වභාවයෙන් සමාධින්ද්‍රියගේ පැවැත්ම දතයුතුය. දැකීම් ස්වභාවයෙන් පඤ්ඤින්ද්‍රියයාගේ පැවැත්ම දතයුතුය. ඇදහීම් ස්වභාවයෙන් සද්ධින්ද්‍රියගේ පැවැත්ම දතයුතුය. (iii)

උපන් ලාමක අකුශල ධර්මයන්ගේ පහකිරීම පිණිසවූ සම්‍යක් ප්‍රධානයෙහි (මෙහි (ii) නූපන් කුශල ධර්මයන්ගේ ඉපදීම පිණිසවූ සම්‍යක් ප්‍රධානයෙහි උපන් කුශල ධර්මයන්ගේ පැවැත්ම පිණිස නුමුළාව පිණිස බොහෝ බව පිණිස මහත් බව පිණිස වැඩීම පිණිස පිරීම පිණිසවූ සම්‍යක් ප්‍රධානයෙහි (මෙහි

(ii) සතර සම්‍යක් ප්‍රධානයන්හි විරියින්ද්‍රිය වශයෙන් මේ විසි ආකාරයෙන් පංච ඉන්ද්‍රියයන්ගේ පැවැත්ම දත යුතුය.

**60.** සතර සතිපට්ඨානයන්හි සතින්ද්‍රියයාගේ වශයෙන් කවර විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ පැවැත්ම දතයුත්තේද?

කායෙ කායානුපස්සනා සතිපට්ඨානයෙහි (ii) සිහිකිරීම් වශයෙන් අධිපති ස්වභාවයෙන් සතින්ද්‍රියගේ පැවැත්ම දත යුතුය. සතින්ද්‍රියයාගේ වශයෙන් නොවිසිරයාම් ස්වභාවයෙන් සමාධින්ද්‍රියගේ පැවැත්ම දතයුතුය. දැකීම් ස්වභාවයෙන් පඤ්ඤින්ද්‍රියයාගේ පැවැත්ම දතයුතුය. ඇදහීම් ස්වභාවයෙන් සද්ධින්ද්‍රියගේ පැවැත්ම දතයුතුය. උත්සාහ වශයෙන් විරියින්ද්‍රියයාගේ පැවැත්ම දතයුතුය. (iii) වේදනාවන්හි වෙදනානුපස්සනා සතිපට්ඨානයෙහි (මෙහි (ii) චිත්තයෙහි චිත්තානුපස්සනා සතිපට්ඨානහෙි (මෙහි (ii) ධර්මයන්හි ධර්මානුපස්සනා සතිපට්ඨානයෙහි (මෙහි (ii) සතර සතිපට්ඨානයන්හි සතින්ද්‍රියගේ වශයෙන් මේ විසි ආකාරයෙන් පංච ඉන්ද්‍රියයන්ගේ පැවැත්ම දතයුතුය.

**61.** සතර ධ්‍යානයන්හි සමාධින්ද්‍රියගේ වශයෙන් කවර විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියන්ගේ පැවැත්ම දතයුත්තේද? ප්‍රථම ධ්‍යානයෙහි (ii) නොවිසිරයාමගේ අධිපති ස්වභාවයෙන් සමාධින්ද්‍රියගේ පැවැත්ම දතයුතුය. සමාධින්ද්‍රියගේ වශයෙන් දැකීම් ස්වභාවයෙන් පඤ්ඤින්ද්‍රියගේ පැවැත්ම දතයුතුය. ඇදහීම් ස්වභාවයෙන් සද්ධින්ද්‍රියාගේ පැවැත්ම දතයුතුය. උත්සාහ ස්වභාවයෙන් විරියින්ද්‍රියයාගේ පැවැත්ම දත යුතුය. සිහිකිරීම් ස්වභාවයෙන් සතින්ද්‍රියගේ පැවැත්ම දත යුතුය. (iii) ද්විතීය ධ්‍යානයෙහි (මෙහි (ii) තෘතීය ධ්‍යානයෙහි (මෙහි (ii) චතුර්ථ ධ්‍යානයෙහි (මෙහි (ii) සතර ධ්‍යානයන්හි මේ විසි ආකාරයෙන් පංච ඉන්ද්‍රියයන්ගේ පැවැත්ම දතයුතුය.

**62.** සතර ආර්ය සත්‍යයන්හි පඤ්ඤින්ද්‍රියයාගේ වශයෙන් කවර විසි ආකාරයකින් පංච ඉන්ද්‍රියයන්ගේ පැවැත්ම දතයුත්තේද? දුක්ඛාර්ය සත්‍යයෙහි (ii) දර්ශනයාගේ අධිපතිභාවයෙන් පඤ්ඤින්ද්‍රියගේ පැවැත්ම දතයුතුය. පඤ්ඤින්ද්‍රියයාගේ වශයෙන් ඇදහීම් ස්වභාවයෙන්

සද්ධින්ද්‍රියගේ පැවැත්ම දතයුතුය. උත්සාහ ස්වභාවයෙන් විරියින්ද්‍රියයාගේ පැවැත්ම දතයුතුය. සිහි කිරීම් ස්වභාවයෙන් සතින්ද්‍රියගේ පැවැත්ම දතයුතුය. නොවිසිරයාම් ස්වභාවයෙන් සමාධින්ද්‍රියගේ පැවැත්ම දතයුතුය. (iii)

දුක්ඛසමුදයාර්ය සත්‍යයෙහි (මෙහි (ii) දුක්ඛ නිරොධාර්ය සත්‍යයෙහි (මෙහි (ii) දුක්ඛ නිරොධගාමිනී පටිපදාර්ය සත්‍යයෙහි (මෙහි (ii) සතර ආර්ය සත්‍යයන්හි මේ විසි ආකාරයෙන් පංච ඉන්ද්‍රියයන්ගේ පැවැත්ම දතයුතුය.

**63.** කවර පුද්ගලයෙක් චාර නම් වෙයිද, විහාර නම් වෙයිද යම්සේ හැසිරෙන්නෙකු යම්සේ වසන්නකු නුවණැති සබ්‍රහ්මචාරී භික්ෂූහු එකාන්තයෙන් මේ ආයුෂ්මත් තෙමේ මාර්ගයට පැමිණියේ හෝ වෙයි. පැමිණෙන්නේ හෝ වේයයි, ගැඹුරු තන්හිලා සලකන්නාහුද එසේ කවර පුද්ගලයෙක් අනුමාන බුද්ධියෙන් අවබොධ කෙළේද ප්‍රත්‍යක්ෂ බුද්ධියෙන් අවබොධ කෙළේද,

**64.** චරියා (හැසිරීම) යන මෙහි චරියා අටකි. ඉරියාපථ චරියා ආයතන චරියා සති චරියා සමාධිචරියා ඤාණචරියා මග්ගචරියා පත්තිචරියා ලොකත්ථචරියා යන මේ අටය.

ඉරියාපථ චරියා යනු සතර ඉරියව්වෙහි දතයුතුය. ආයතන චරියා යනු සවැදෑරුම් අධ්‍යාත්මික බාහිර ආයතනයන්හි දතයුතුය. සති චරියා යනු සතර සතිපට්ඨානයන්හි දතයුතුය. සමාධිචර්යා යනු සතර ධ්‍යානයන්හි දතයුතුය. ඤාණ චරියා යනු සතර ආර්ය සත්‍යයන්හි දතයුතුය. මග්ග චරියා යනු සතර ආර්ය මාර්ගයන්හි දතයුතුය. පත්ති චරියා යනු සතර ඵලයන්හි දතයුතුය. ලොකත්ථ චරියා යනු අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේලා කෙරෙහිද, එක දෙශ වශයෙන් පසේ බුදුවරයන් වහන්සේලා කෙරෙහිද එක දෙශ වශයෙන් ශ්‍රාවකයන් කෙරෙහිද දතයුතුය.

**65.** ඉරියාපථ චරියාව භික්ෂු භාවයට සුදුසුවූ ඉරියවු ඇතියන්ට වෙයි. ආයතන චරියාව ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇති පුද්ගලයන්ට වෙයි. සති චරියාව අප්‍රමාද විහාරී පුද්ගලයන්ට වෙයි. සමාධි චරියාව සමාධියෙන් යුත් පුද්ගලයන්ට වෙයි.

ඤාණ චරියාව විදර්ශනා ඥානයෙන් යුත් පුද්ගලයන්ට වෙයි. මාර්ග චරියාව මනාකොට පිළිපන්නවුන්ට (මාර්ග ක්ෂණයෙහි) වෙයි. පත්ති චරියාව ඵලයට පැමිණියවුන්ට වෙයි. ලොකත්ථචරියාව අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේලාටද එක දෙශ වශයෙන් පසේ බුදුවරයන් වහන්සේලාටද එක දෙශ වශයෙන් ශ්‍රාවකයන්ටද වෙයි. මේ චරියා අටය. තවද චරියා අටකි. ස්ථිර වශයෙන් අදහන්නේ ශ්‍රද්ධාවෙන් හැසිරෙයි. උත්සාහ කරන්නේ වීර්යයෙන් හැසිරෙයි. සිහිකරන්නේ සතියෙන් හැසිරෙයි. සිත්හි නොවිසිරයාම ඇතිකරන්නේ සමාධියෙන් හැසිරෙයි. ප්‍රකාරයෙන් දැනගන්නේ ප්‍රඥාවෙන් හැසිරෙයි. විශෙෂයෙන් දැනගන්නේ විඤ්ඤාණ චරියාවෙන් හැසිරෙයි. මෙසේ පිළිපන්නහුගේ කුශලධර්මයෝ දැඩිවෙත්යයි ආයතන චරියාවෙන් හැසිරෙයි. මෙසේ පිළිපන්නේ විශෙෂයට පැමිණේයයි විශෙෂ චරියාවෙන් හැසිරෙයි. මේ අට චරියා වෙත්.

**66.** තවද චරියා අටකි. සම්‍යක් දෘෂ්ටියගේ දැකීම් වශයෙන් පැවැත්ම සම්‍යක් සංකල්පයාගේ අරමුණට නැංවීම් වශයෙන් පැවැත්මද සම්‍යක් වාචාවගේ වාක් සුචරිතයන් වැළඳ ගැනීම් වශයෙන් පැවැත්මද සම්‍යක් කර්මාන්තයාගේ කාය සුචරිත පිහිටුවීම් වශයෙන් පැවැත්මද සම්‍යක් ආජීවයාගේ පිරිසිදු කිරීම් වශයෙන් පැවැත්මද සම්‍යක් ව්‍යායාමයාගේ උත්සාහ කිරීම් වශයෙන් පැවැත්මද සම්‍යක් සතියගේ සිහි කිරීම් වශයෙන් පැවැත්මද සම්‍යක් සමාධියගේ සිත නොවිසිරයාම් වශයෙන් පැවැත්මද වෙත්. මේ අට චරියාවෝ වෙත්.

**67.** විහාර (වාසය) යන මෙහි ස්ථිර වශයෙන් අදහන්නේ ශ්‍රද්ධාවෙන් වාසය කරයි. උත්සාහ කරන්නේ වීර්ය වශයෙන් වාසය කරයි. සිත අරමුණෙහි පිහිටුවන්නේ සිහියෙන් වාසය කරයි. සිත්හි නොවිසිරයාම ඇතිකරන්නේ සමාධියෙන් වාසය කරයි. ප්‍රකාරයෙන් දන්නේ ප්‍රඥාවෙන් වාසය කරයි.

**68.** අනුබොධ වශයෙන් අවබොධ කරන ලද්දේ යන මෙහි සද්ධින්ද්‍රියයාගේ ස්ථිරව ඇදහීම් (ii) ස්වභාවය අනුබොධ කරන ලද්දේ වෙයි. (iii) විරියින්ද්‍රියයාගේ එසවීම් (මෙහි (ii)

සතින්ද්‍රියයාගේ සිත අරමුණෙහි පිහිටුවීම් (මෙහි (ii) සමාධි ඉන්ද්‍රියයාගේ නොවිසිරයාම් (මෙහි (ii) පඤ්ඤින්ද්‍රියයාගේ දැකීම් (මෙහි (ii)

**69.** ප්‍රතිවෙධ කරන ලද්දේ යන මෙහි සද්ධින්ද්‍රියයාගේ ස්ථිර ඇදහීම් (ii) ස්වභාවය ප්‍රතිවෙධ කරන ලද්දේ වෙයි. (iii) විරියින්ද්‍රියයාගේ උත්සාහ කිරීම් (මෙහි (ii) සතින්ද්‍රියයාගේ අරමුණට එළඹ සිටීම් (මෙහි (ii) සමාධින්ද්‍රියගේ නොවිසිරයාම් (මෙහි (ii) පඤ්ඤින්ද්‍රියයාගේ දැකීම් අර්ථය ප්‍රතිවෙධ කරන ලද්දේ වෙයි.

යම්සේ හැසිරෙන්නකු යන මෙහි (iv) මෙසේ ශ්‍රද්ධාවෙන් හැසිරෙන්නහු මෙසේ වීර්යයෙන් හැසිරෙන්නහු මෙසේ සිහියෙන් හැසිරෙන්නහු මෙසේ සමාධියෙන් හැසිරෙන්නහු මෙසේ ප්‍රඥාවෙන් හැසිරෙන්නහු යන අර්ථයි. (v)

යම්සේ වසන්නෙකු යන මෙහි මෙසේ ශ්‍රද්ධාවෙන් වාසය කරන්නහු මෙසේ වීර්යයෙන් වාසය කරන්නහු මෙසේ සතියෙන් වාසය කරන්නහු මෙසේ සමාධියෙන් වාසය කරන්නහු මෙසේ ප්‍රඥාවෙන් වාසය කරන්නහු යන අර්ථයි.

**70.** ‘නුවණැති’ යන මෙහි යථාස්වභාවය දන්නාවූ යථා ස්වභාවය ප්‍රකට කරන්නාවූ කෙලෙස් නැති කරන ප්‍රඥාව ඇත්තාවූ පණ්ඩිතවූ බුද්ධියෙන් යුක්තවූ යන අර්ථයි.

‘සබ්‍රහ්මචාරීහු’ යන මෙහි එකට අප ලොකනාදි විනයකර්ම කරන්නාවූ එකට පාමොක් උදෙසන්නාවූ සමාන සීලය ඇති භික්ෂූහු යන අර්ථයි.

‘ගැඹුරු තන්හි’ යන මෙහි ධ්‍යානයෝද විමොක්ෂයෝද සමාධිද සමාපත්තීහුද මාර්ගයෝද ඵලයෝද අභිඥාද පටිසම්භිදාද යන ගැඹුරු කරුණු කියනු ලැබෙත්. ‘බැසගන්නාහුය’ යන මෙහි අදහන්නාහුය. ස්ථිර බවට පැමිණෙන්නාහුය යන අර්ථයි. අද්ධා යන මේ වචනය ඒකාන්ත වචනයි. නිසැක වචනයයි ස්ථිර වචනයයි, එකම වචනයයි. එසේද මෙසේද දෙහිතක් නැතිබව ප්‍රකාශවන වචනයයි. නියම වචනයයි. අවිරුද්ධ වචනයයි, නිශ්චය වචනයයි.

'ආයුෂ්මත්හු' යන මේ වචනය ප්‍රිය වචනයකි, ගරු වචනයකි, ගෞරවය යටත් බව ප්‍රකාශ වන වචනයකි.

'පැමිණියේ හෝ වෙයි' යනු අවබොධ කෙළේය යන තේරුමයි. පැමිණෙන්නේ හෝ වෙයි යන අවබොධ කරන්නේය යන තේරුමයි. කියනලද නිදානය මැයි.

**71.** "මහණෙනි මේ ඉන්ද්‍රිය පසකි. කවර පසක්ද? සද්ධින්ද්‍රියද විරියින්ද්‍රියද සතින්ද්‍රියද සමාධින්ද්‍රියද පඤ්ඤින්ද්‍රියද වෙත්. "මහණෙනි, මොහු පඤ්ච ඉන්ද්‍රියයෝ වෙත්. මේ පඤ්චඉන්ද්‍රියයෝ කෙතෙක් ආකාරයෙන් කිනම් අර්ථයෙන් දතයුත්තාහුද?

**72.** "මේ පඤ්ච ඉන්ද්‍රියයෝ සය ආකාරයකින් එම සය ආකාරයයි කියනලද අර්ථයෙන් දතයුත්තාහ. අධිපති අර්ථයෙන් මුල පිරිසිදු කිරීම් අර්ථයෙන් අධිකාර්ථයෙන් පිහිටීම් අර්ථයෙන් අධිකාර්ථයෙන් පිහිටීම් අර්ථයෙන් පිහිටුවීම් අර්ථයෙන් දතයුතුය.

**73.** කෙසේ අධිපති අර්ථයෙන් ඉන්ද්‍රියයෝ දත යුත්තාහුද? අශ්‍රද්ධාව දුරු කරන්නාහට (ii) ඇදහීමගේ අධිපති භාවයෙන් සද්ධින්ද්‍රිය දතයුතුය. (iii) සද්ධින්ද්‍රියගේ වශයෙන් උත්සාහ කිරීම් වශයෙන් විරියින්ද්‍රිය දත යුතුය. (iv) එළඹ සිටීම් ස්වභාවයෙන් සතින්ද්‍රිය දතයුතුය. (v) නොවිසිරයාම් ස්වභාවයෙන් සමාධින්ද්‍රිය දතයුතුය. (vi) දැකීම් ස්වභාවයෙන් පඤ්ඤින්ද්‍රිය දතයුතුය.

**74.** කුසීත බව දුරු කරන්නාහට උත්සාහයාගේ අධිපති භාවයෙන් විරියින්ද්‍රිය දතයුතුය. විරියින්ද්‍රිය වශයෙන් අරමුණට එළඹ සිටීම් ස්වභාවයෙන් සතින්ද්‍රිය දතයුතුය. (මෙහි 73 (v) (vi) - (ii) ඇදහීම් ස්වභාවයෙන් සද්ධින්ද්‍රිය දතයුතුය. (iii)

**75.** ප්‍රමාදය දුරුකරන්නහුට අරමුණ එළඹ සිටීමගේ අධිපති භාවයෙන් සතින්ද්‍රිය දතයුතුය. සතින්ද්‍රියයාගේ වශයෙන් (මෙහි 73 (v) (vi) 74 (ii) - (ii) උත්සාහ ස්වභාවයෙන් විරියින්ද්‍රිය දතයුතුය. (iii)

**76.** උද්ධච්චය දුරු කරන්නාහට නොවිසිරයාමගේ අධිපති භාවයෙන් සමාධින්ද්‍රිය දතයුතුය. සමාධින්ද්‍රියගේ වශයෙන් (මෙහි 73 (vi) 74 (ii) 75 (ii) 73 (iv) යොදන්න.)

**77.** අවිද්‍යාව දුරුකරන්නාහට දර්ශනයාගේ අධිපති භාවයෙන් පඤ්ඤින්ද්‍රිය දතයුතුය. පඤ්ඤින්ද්‍රියයාගේ වශයෙන් (මෙහි 74 (ii) 74 (ii) (iv) (v)

**78.** කාමච්ඡන්දය දුරුකරන්නාහට නෛෂ්ක්‍රම්‍ය වශයෙන් (ii) ඇදහීමගේ අධිපතිභාවයෙන් සද්ධින්ද්‍රිය දතයුතුය. සද්ධින්ද්‍රියයාගේ වශයෙන් (මෙහි 75 (ii) 73 (iv) (v) (vi) කාමච්ඡන්දය දුරුකරන්නාහට නෛෂ්ක්‍රම්‍ය වශයෙන් උත්සාහයාගේ අධිපතිභාවයෙන් විරියින්ද්‍රිය දතයුතුය. විරියින්ද්‍රියයාගේ වශයෙන් (මෙහි 73 (iv) (v) (vi) 74 (ii) යොදන්න.) කාමච්ඡන්දය දුරුකරන්නහුට නෛෂ්ක්‍රම්‍ය වශයෙන් අරමුණෙහි එළඹ සිටීමගේ අධිපති භාවයෙන් සතින්ද්‍රිය දතයුතුය. සතින්ද්‍රියයාගේ වශයෙන් (මෙහි 73 (v) (vi) 74 (ii) 75 (ii) කාමච්ඡන්දය දුරුකරන්නාහුට නෛෂ්ක්‍රම්‍ය වශයෙන් සිත්හි නොවිසිරයාම් ස්වභාවයාගේ අධිපති භාවයෙන් සමාධින්ද්‍රිය දතයුතුය. සමාධින්ද්‍රියයාගේ (මෙහි 73 (vi) 74 (ii) 75 (ii) 73 (iv) කාමච්ඡන්දය දුරුකරන්නහුට නෛෂ්ක්‍රම්‍ය වශයෙන් දර්ශනයාගේ අධිපති භාවයෙන් පඤ්ඤින්ද්‍රිය දතයුතුය. පඤ්ඤින්ද්‍රියයාගේ වශයෙන් (මෙහි 74 (ii) 75 (ii) 73 (iv) (v)

**79.** ව්‍යාපාදය දුරුකරන්නහුට අව්‍යාපාද වශයෙන් (ii) ඇදහීමගේ අධිපති භාවයෙන් සද්ධින්ද්‍රිය දතයුතුය. සද්ධින්ද්‍රියයාගේ වශයෙන් (මෙහි 75 (ii) 73 (iv) (v) (vi) යොදන්න) ව්‍යාපාදය දුරුකරන්නාහුට අව්‍යාපාදය වශයෙන් උත්සාහයාගේ අධිපති භාවයෙන් විරියින්ද්‍රිය දතයුතුය. විරියින්ද්‍රියයාගේ වශයෙන් (මෙහි 73 (iv) (v) (vi) 74 (ii) යොදන්න.) ව්‍යාපාදය දුරුකරන්නහුට අව්‍යාපාද වශයෙන් අරමුණෙහි එළඹ සිටීමගේ අධිපතිභාවයෙන් සතින්ද්‍රිය දතයුතුය. සතින්ද්‍රියයාගේ වශයෙන් (මෙහි 73 (v) (vi) 74 (ii) 75 (ii) යොදන්න.) ව්‍යාපාදය දුරුකරන්නහුට අව්‍යාපාදය වශයෙන් සිත්හි නොවිසිරයාම් ස්වභාවයාගේ අධිපති භාවයෙන් සමාධින්ද්‍රිය දතයුතුය. සමාධින්ද්‍රියයාගේ (මෙහි 73 (vi) 74 (ii) 75 (ii) 73 (iv) යෙදිය යුතුයි.) ව්‍යාපාදය දුරුකරන්නහුට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

අව්‍යාපාද වශයෙන් පඤ්ඤින්ද්‍රිය දතයුතුය. පඤ්ඤින්ද්‍රියගේ වශයෙන් (මෙහි 74 (ii) 75 (ii) 73 (iv) (v) යොදන්න.) (iii)

**80.** ථිනමිද්ධය දුරුකරන්නාහුට ආලොක සඤ්ඤා වශයෙන් (මෙහි 79 (ii) යෙදීමේදී ව්‍යාපාදය දුරුකරන්නහුට අව්‍යාපාද වශයෙන්" වෙනුවට "ථිනමිද්ධය දුරුකරන්නහුට ආලොක සඤ්ඤා වශයෙන්" යන්න ගතයුතුයි.)

**81.** සියලු කෙලෙසුන් දුරුකරන්නහුට අර්හත් මාර්ගයාගේ වශයෙන් 79 (ii) යෙදීමේදී "ව්‍යාපාදය දුරුකරන්නහුට ව්‍යාපාද වශයෙන්" වෙනුවට "සියලු කෙලෙසුන් දුරුකරන්නහුට අර්හත් මාර්ගයාගේ වශයෙන්" යන්න යොදා ගතයුතුයි.) සියලු කෙලෙසුන් පහ කරන්නහුට අර්හත් මාර්ගයාගේ වශයෙන් දර්ශනයාගේ අධිපති භාවයෙන් පඤ්ඤින්ද්‍රිය දතයුතුය. පඤ්ඤින්ද්‍රියයාගේ වශයෙන් ඇදහීම් ස්වභාවයෙන් සද්ධින්ද්‍රිය දතයුතුය. උත්සාහ ස්වභාවයෙන් විරියින්ද්‍රිය දතයුතුය. එළඹ සිටීම් ස්වභාවයෙන් සතින්ද්‍රිය දතයුතුය. නොවිසිරයාම් ස්වභාවයෙන් සමාධින්ද්‍රිය දතයුතුය. මෙසේ අධිපති අර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

**82.** කෙසේ මුල පිරිසිදු කිරීම් අර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහුද? ඇදහීම් ස්වභාවයෙන් සද්ධින්ද්‍රිය, අශ්‍රද්ධාව සංවර කිරීම් ස්වභාවයෙන් පවත්නා සීල විසුද්ධිය, සද්ධින්ද්‍රියයාගේ මුල පිරිසිදු කිරිම් නමි. උත්සාහ ස්වභාවයෙන් විරියින්ද්‍රිය කුසීත බව සංවර කිරීම් ස්වභාවයෙන්වූ සීල විසුද්ධිය විරියින්ද්‍රියයාගේ මුල පිරිසිදු කිරිම් නම් වේ. අරමුණට එළඹ සිටීම් ස්වභාවයෙන් සතින්ද්‍රිය ප්‍රමාදය සංවර කිරීම් ස්වභාවයෙන්වූ සීල විසුද්ධිය සතින්ද්‍රියයාගේ මුල පිරිසිදු කිරීම නම් වේ. නොවිසිරයාම් ස්වභාවයෙන් සමාධින්ද්‍රිය උද්ධච්චය සංවර කිරීම් ස්වභාවයෙන්වූ සීල විසුද්ධිය සමාධින්ද්‍රියගේ මුල පිරිසිදු කිරීම් නම් වේ. දැකීම් ස්වභාවයෙන් පඤ්ඤින්ද්‍රිය අවිද්‍යාව සංවර කිරීම් ස්වභාවයෙන්වූ සීල විසුද්ධිය පඤ්ඤින්ද්‍රියයාගේ මුල පිරිසිදු කිරීම නම් වේ.

**83.** නෛෂ්ක්‍රම්‍යයෙහි පංච ඉන්ද්‍රියයෝ කාමච්ඡන්දය (ii) සංවර කිරීම් ස්වභාවයෙන්වූ සීල විසුද්ධිය පංච ඉන්ද්‍රියයන්ගේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මුල පිරිසිඳු කිරීම නම් වේ. (iii) අව්‍යාපාදයෙහි පංච ඉන්ද්‍රියයෝ ව්‍යාපාදය (මෙහි (ii) ආලොක සඤ්ඤාවෙහි පංච ඉන්ද්‍රියයෝ ව්‍යාපාදය (මෙහි (ii) ආලොක සඤ්ඤාවෙහි පංච ඉන්ද්‍රියයෝ ථීනමිද්ධය (මෙහි (ii) අර්හත් මාර්ගයාගේ පංච ඉන්ද්‍රියයෝ සියලු කෙලෙසුන් (මෙහි (ii) මෙසේ මුල පිරිසිඳු කිරීම් ස්වභාවයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

84. කෙසේ අධිකාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහුද? සද්ධින්ද්‍රියයාගේ වැඩීමෙන් ඡන්දය උපදියි. ඡන්ද වශයෙන්ද (ii) ශ්‍රද්ධාවශයෙන්ද සද්ධින්ද්‍රිය අධික (බලවත් වෙයි) (iii) ඡන්දයාගේ වශයෙන් ප්‍රමොද්‍යය උපදියි. ප්‍රමොද්‍යයාගේ වශයෙන්ද (මෙහි (ii) ප්‍රමොද්‍යයාගේ වශයෙන් ප්‍රීතිය උපදියි. ප්‍රීති වශයෙන්ද (මෙහි (ii) ප්‍රීති වශයෙන් පස්සද්ධිය උපදියි. පස්සද්ධි වශයෙන්ද (මෙහි (ii) පස්සද්ධි වශයෙන් සුඛය උපදියි සුඛය වශයෙන් (මෙහි (ii) සුඛයාගේ වශයෙන් ආලොකය උපදියි. ආලොකයාගේ වශයෙන්ද (මෙහි (ii) ආලොකයාගේ වශයෙන් සංවෙගය උපදියි. සංවෙගයාගේ වශයෙන්ද (මෙහි (ii) සංවෙගයට පැමිණ සිත්හි සමාධිය උපදියි. සමාධි වශයෙන්ද (මෙහි (ii) එසේ සමාධියට පැමිණි සිත මනාව උත්සාහ කරයි. උත්සාහ වශයෙන් (මෙහි (ii) එසේ උත්සාහවත්වූ සිත මනාව සමව බලයි උපෙක්ෂා වශයෙන්ද (මෙහි (ii) උපෙක්ෂා වශයෙන් නොයෙක් ස්වභාව ඇති කෙලෙසුන් කෙරෙන් සිත මිදෙයි. මිදීම් වශයෙන්ද (මෙහි (ii) මිදුණු හෙයින් ඒ ධර්මයෝ සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. සමාන කෘත්‍ය ඇති ස්වභාවයෙන් වැඩීම් වශයෙන්ද (මෙහි (ii) වඩන ලද හෙයින් ඊට වඩා ප්‍රණීතවූ නිවනට හරවයි. නිවනට හැරවීම් වශයෙන් (මෙහි (ii) නිවනට හැරුණු හෙයින් ඒ සංඛාරාරම්මණයෙන් වෙන්වෙයි. වෙන්වීම් වශයෙන් (මෙහි (ii) අත්හළ (වෙන්වුණු) හෙයින් ක්ලේශයෝ නිරුද්ධ වෙත්. නිරොධයාගේ වශයෙන්ද ශ්‍රද්ධා වශයෙන්ද සද්ධින්ද්‍රිය බලවත් වෙයි.

85. නිරොධ වශයෙන් පවත්නාවූ වොස්සග්ග (දුරු කිරීම්) දෙකකි. පරිච්චාග වොස්සග්ග, පක්ඛන්දන වොස්සග්ග යන දෙකය. ක්ලේශයන්ද ස්කන්ධයන්ද දුරුකෙරේනුයි පරිච්චාග

වොස්සග්ග නම්. නිරොධයවූ නිර්වාණ ධාතුවට සිත යවන හෙයින් පක්ඛන්දන වොස්සග්ග නම්. නිරොධ වශයෙන් මේ දෙවැදෑරුම් වොස්සග්ගයෝ වෙති.

(86-89 මේ ඡේදවල ඒ ඒ වාක්‍ය අගට "පහකිරීම් පිණිස ඡන්දය උපදියි" යන්න යොදන්න)

**86.** අශ්‍රද්ධාව- (ii) ඡන්ද වශයෙන්ද ශ්‍රද්ධා වශයෙන්ද සද්ධින්ද්‍රිය බලවත් වෙයි. (iii) අශ්‍රද්ධාවෙන් උපදින දැවීම- (මෙහි (ii) දෘෂ්ටිය හා එක්ව පවත්නාවූ කෙලෙසුන්- (මෙහි (ii) ඖදාරික ක්ලේශයන්- (මෙහි (ii) තුනීවූ කෙලෙසුන්- (මෙහි (ii) සියලු කෙලෙස්- ඡන්ද වශයෙන් ශ්‍රද්ධා වශයෙන් සද්ධින්ද්‍රිය බලවත් වෙයි.

විරියින්ද්‍රිය වැඩීම පිණිස ඡන්දය උපදියි. (මෙහි (ii) කුසීත බව- කුසීත බවෙන් උපදනා දැවීම- දෘෂ්ටිය එක්ව පවත්නා ක්ලේශයන්- සියලු කෙලෙස්-

**87.** සතින්ද්‍රිය වැඩීම පිණිස ඡන්දය උපදියි. ප්‍රමාදය ප්‍රමාදයෙන් උපදින දැවීම- සියලු කෙලෙස්--

**88.** සමාධින්ද්‍රිය වැඩීම පිණිස ඡන්දය උපදියි. උද්ධච්චය- උද්ධච්චයෙන් උපදනා දැවීම- සියලු කෙලෙසුන්-

**89.** පඤ්ඤින්ද්‍රිය වැඩීම පිණිස ඡන්දය උපදියි. අවිද්‍යාව- අවිද්‍යාවෙන් උපදනා දැවීම- දෘෂ්ටිය හා එක්ව පවත්නා කෙලෙසුන්- ඖදාරික ක්ලේශයන්- තුනීවූ ක්ලේශයන්- සියලු කෙලෙසුන් පහකිරීම පිණිස ඡන්දය උපදියි.

**90.** ඡන්ද වශයෙන් (ii) ප්‍රඥා වශයෙන් පඤ්ඤින්ද්‍රිය බලවත් වෙයි. (iii) ඡන්දයාගේ වශයෙන් ප්‍රමොද්‍යය උපදියි. ප්‍රමොද්‍ය වශයෙන් (මෙහි (ii) ප්‍රමොද්‍යයාගේ වශයෙන් ප්‍රීතිය උපදියි. ප්‍රීතියගේ වශයෙන් (මෙහි (ii) ප්‍රීතියගේ වශයෙන් පස්සද්ධිය උපදියි. පස්සද්ධි වශයෙන් (මෙහි (ii) පස්සද්ධි වශයෙන් සුඛය උපදියි. සුඛවශයෙන් (මෙහි (ii) සුඛයාගේ වශයෙන් ප්‍රඥාලොකය උපදියි. ප්‍රඥාලොක වශයෙන් (මෙහි (ii) ප්‍රඥා ලොකයාගේ වශයෙන් ප්‍රඥාලොකය උපදියි. සංවේග වශයෙන් (මෙහි (ii) සංවෙගයට පැමිණ සිත සමාධියට පැමිණෙයි. සමාධි වශයෙන් (මෙහි (ii) එසේ සමාධියට පැමිණි සිත මනාව

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වීර්යයෙන් ඔසවයි එසවීම් වශයෙන් (මෙහි (ii) එසේ ඔසවන ලද සිත මනාව මැදහත් වෙයි. උපෙක්ඛා වශයෙන් (මෙහි (ii) උපෙක්ෂා වශයෙන් නොයෙක් ස්වභාව ඇති ක්ලේශයන් කෙරෙන් සිත මිදෙයි. මිදීම් වශයෙන් (මෙහි (ii) මිදුණු හෙයින් ඒ ධර්මයෝ සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. සමාන කෘත්‍ය ඇති හෙයින් භාවනා වශයෙන් (මෙහි (ii) වඩනලද හෙයින් ඊට වඩා ප්‍රණීතවූ නිවනට හැරෙත්. නිවනට හැරීම් වශයෙන් (මෙහි (ii) හැරුණු හෙයින් ඒ ක්ලේශයන් කෙරෙන්ද ස්කන්ධයන් කෙරෙන්ද දුරුකරයි. දුරුකිරීම් වශයෙන් (මෙහි (ii) දුරුකරනලද හෙයින් ස්කන්ධයන් නිරුද්ධ කරත්. නිරොධ වශයෙන් (මෙහි (ii) නිරොධයාගේ වශයෙන් වොස්සග්ග දෙකකි. පරිච්චාග වොස්සග්ගය පක්ඛන්දන වොස්සග්ගය යනුයි. ක්ලේශයන්ද ස්කන්ධයන්ද දුරු කෙරෙත්නුයි පරිච්චාග වොස්සග්ග නමි. නිරොධයවූ නිර්වාණයට සිත පැමිණේනුයි පක්ඛන්දන වොස්සග්ග නමි. නිරොධයාගේ වශයෙන් මේ මේ දෙවදෑරුම් වොස්සග්ගයෝ වෙත්. මෙසේ අධිකාර්ථයෙන් (බලවත්වීම් ස්වභාවයෙන්) ඉන්ද්‍රියයෝ දතයුතුය.

දෙවෙනි බණ වරයි.

---

**91.** කෙසේ පිහිටීම් අර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහුද? සද්ධින්ද්‍රිය වැඩීම පිණිස ඡන්දය උපදියි. ඡන්ද වශයෙන් (ii) ශ්‍රද්ධාව වශයෙන් සතින්ද්‍රිය පිහිටයි (iii) ඡන්දයාගේ වශයෙන් ප්‍රමොද්‍යය උපදියි. ප්‍රමොද්‍ය වශයෙන් (මෙහි (ii) මෙසේ පිහිටීම් වශයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

**92.** කෙසේ ක්ෂය කිරීම් අර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහුද? ඇදහීම් ස්වභාවයෙන් සද්ධින්ද්‍රිය අශ්‍රද්ධාව කෙළවරකරයි. අශ්‍රද්ධාවෙන් (ii) උපදින දැවීම ක්ෂය කරයි. (iii) උත්සාහ ස්වභාවයෙන් විරියින්ද්‍රිය කුසීත බව ක්ෂය කරයි. කුසීත බවෙන් දැවීම ක්ෂය කරයි. එළඹ සිටීම් ස්වභාවයෙන් සතින්ද්‍රිය ප්‍රමාදය ක්ෂය කරයි. ප්‍රමාදයෙන් (මෙහි (ii) නොවිසිරයාම් ස්වභාවයෙන් සමාධින්ද්‍රිය උද්ධච්චය ක්ෂය කරයි. උද්ධච්චයෙන්

දැවීම ක්ෂය කරයි. දැකීම් ස්වභාවයෙන් පඤ්ඤින්ද්‍රිය අවිද්‍යාව ක්ෂය කරයි. අවිද්‍යාවෙන් උපන් දැවීම ක්ෂය කරයි.

**93.** නෛෂ්ක්‍රම්‍යයෙහි (ii) පංචඉන්ද්‍රියයෝ (iii) කාමච්ඡන්දය ක්ෂය කරත්. අව්‍යාපාදයෙහි (මෙහි (ii) ව්‍යාපාදය ක්ෂයකරත්. ආලොකය සඤ්ඤාවෙහි (මෙහි (ii) ථිනමිද්ධයෝ ක්ෂය කරත්. නොවිසිරයාමෙහි (මෙහි (ii) උද්ධච්චය ක්ෂය කරත්. ධම්ම වවත්ථානයෙහි (මෙහි (ii) විචිකිච්ඡාව ක්ෂය කරත්. ප්‍රථමධ්‍යානයෙහි (මෙහි (ii) නීවරණයන් ක්ෂය කරත්. අර්හත් මාර්ගයෙහි (මෙහි (ii) සියලු කෙලෙස් ක්ෂය කරත්. මෙසේ ක්ෂය කිරීම් අර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

**94.** කෙසේ පිහිටුවීම් අර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහුද? ශ්‍රද්ධාවත් පුද්ගලතෙම (ii) සද්ධින්ද්‍රිය ඇදහීම් ස්වභාවයෙහි පිහිටුවයි (iii) ශ්‍රද්ධාවත් පුද්ගලයාගේ (මෙහි (ii) වීර්යවත් පුද්ගලතෙම (iv) විරියින්ද්‍රිය උත්සාහයෙහි පිහිටුවයි. (v) වීර්යවත්හුගේ (මෙහි (iv) සිහිය ඇති පුද්ගලතෙම (vi) සතින්ද්‍රියඑළඹ සිටීමෙහි පිහිටුවයි, (vii) සිහිය ඇති පුද්ගලයාගේ (මෙහි vi) සමාධියෙන් යුත් පුද්ගලතෙම (viii) සමාධින්ද්‍රිය නොවිසිරයාමෙහි පිහිටුවයි (ix) සමාධියෙන් යුත් පුද්ගලයාගේ (මෙහි (viii) ප්‍රඥාවත් පුද්ගලතෙම (x) පඤ්ඤින්ද්‍රිය දැකීමෙහි පිහිටුවයි (xi) ප්‍රඥාවත් පුද්ගලයාගේ (මෙහි (ix) යොගාවචර තෙම (xii) පංචඉන්ද්‍රියයන් නෛෂ්ක්‍රම්‍යයෙහි පිහිටුවයි. (xiii) යොගාවචරයාගේ (මෙහි (xii) යොගාවචරතෙම (xiv) පංච ඉන්ද්‍රියයන් අව්‍යාපාදයෙහි පිහිටුවයි. (xv) යොගාවචරයාගේ (මෙහි xiv) යොගාවචරතෙම (xvi) පංච ඉන්ද්‍රියයන් ආලොක සඤ්ඤාවෙහි පිහිටුවයි. (xvii) යොගාවචරයාගේ (මෙහි (xvi) යොගාවචරතෙම (xviii) පංච ඉන්ද්‍රියයන් නොවිසිරයාමෙහි පිහිටුවයි. (xix) යොගාවචරයාගේ (මෙහි (xix) (මෙහි (ii) ධම්ම වවත්ථානයෙහි පිහිටුවයි. (මෙහි (ii) ප්‍රථමධ්‍යානයෙහි පිහිටුවයි. යොගාවචරතෙම පංච ඉන්ද්‍රියයන් අර්හත් මාර්ගයෙහි පිහිටුවයි. යොගාවචරයාගේ ඉන්ද්‍රියයන් අර්හත් මාර්ගයෙහි පිහිටුවත්. මෙහි (xii) මෙසේ පිහිටුවීම් අර්ථයෙන් පංච ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

**95.** පෘථග්ජනතෙම (ii) සමාධිය වඩන්නේ කෙතෙක් ආකාරයකින් වැටහීමෙහි දක්ෂයෙක් වේද? (iii) ශෛක්ෂතෙම (මෙහි (ii) වීතරාගී අර්හත් පුද්ගලතෙම (මෙහි (ii) පෘථග්ජනතෙම සමාධිය වඩන්නේ සත් ආකාරයකින් (iv) වැටහීමෙහි දක්ෂයෙක් වෙයි. (v) ශෛක්ෂතෙම සමාධිය වඩන්නේ අට ආකාරයකින් (මෙහි (iv) වීතරාගී අර්හත් පුද්ගලතෙම සමාධිය වඩන්නේ දස ආකාරයකින් (මෙහි (iv)

**96.** පෘථග්ජනතෙම සමාධිය වඩන්නේ කවර සත් ආකාරයකින් වැටහීමෙහි දක්ෂයෙක් වේද? ආවර්ජනය කළ හෙයින් ආරම්මණය (ii) වැටහීමෙහි දක්ෂයෙක් වෙයි. (iii) (මේ වාක්‍ය අගට "වැටහීමෙහි දක්ෂයෙක් වෙයි" යොදන්න) සමථ නිමිත්ත- පග්ගහ නිමිත්ත- සමාධිය- ඥාණාලොකය- සංපහංසනය (පැහැදීම)- උපෙක්ෂාව- පෘථග්ජනතෙම සමාධිය වඩන්නේ මේ සත් ආකාරයෙන්

**97.** ශෛක්ෂතෙම සමාධිය වඩන්නේ කවර අට ආකාරයකින් වැටහීමෙහි දක්ෂ වේද? (ii) ආවර්ජනය කළ හෙයින් ආරම්මණය වැටහීමෙහි දක්ෂ වෙයි. (මේ වාක්‍ය අගට "වැටහීමෙහි දක්ෂවෙයි" යොදන්න) සමථ නිමිත්ත- පග්ගහ නිමිත්ත- සමාධිය- ඥාණාලොකය- සංපහංසනය- උපෙක්ෂාව නෛෂ්ක්‍රම්‍යාදීන්ගේ එකත්වය (iii) ශෛක්ෂතෙම සමාධිය වඩන්නේ මේ අට ආකාරයෙන් වැටහීමෙහි දක්ෂ වෙයි.

**98.** වීතරාගී අර්හත් පුද්ගලතෙම සමාධිය වඩන්නේ කවර දස ආකාරයෙන් වැටහීමෙහි දක්ෂ වේද? (මෙහි 97 (ii) යොදන්න) ඥාණය වැටහීමෙහි දක්ෂවෙයි. විමුක්තිය වැටහීමෙහි දක්ෂවෙයි. වීතරාගී පුද්ගලතෙම සමාධිය වඩන්නේ මේ දස ආකාරයෙන් වැටහීමෙහි දක්ෂවෙයි.

**99.** පෘථග්ජනතෙම (ii) විදර්ශනා වඩන්නේ කෙතෙක් ආකාරයකින් වැටහීමෙහි දක්ෂවේද, කෙතෙක් ආකාරයකින් නොවැටහීමෙහි දක්ෂ වේද? (iii) ශෛක්ෂතෙම (මෙහි (ii) වීතරාගී පුද්ගලතෙම (මෙහි (ii) පෘථග්ජනතෙම විදර්ශනා වඩන්නේ නව ආකාරයකින් වැටහීමෙහි දක්ෂවෙයි. නව ආකාරයකින් නොවැටහීමෙහි දක්ෂ වෙයි.

ශෛක්ෂතෙම විදර්ශනා වඩන්නේ දස ආකාරයකින් වැටහීමෙහි දක්ෂවෙයි. දස ආකාරයකින් නොවැටහීමෙහි දක්ෂවෙයි. වීතරාගී පුද්ගලතෙම විදර්ශනා වඩන්නේ දොළොස් ආකාරයකින් වැටහීමෙහි දක්ෂ වෙයි. දොළොස් ආකාරයකින් නොවැටහීමෙහි දක්ෂ වෙයි.

**100.** පෘථග්ජනතෙම විදර්ශනා වඩන්නේ කවර නව ආකාරයකින් වැටහීමෙහි දක්ෂ වෙයිද කවර නව ආකාරයකින් නොවැටහීමෙහි දක්ෂ වෙයිද? (ii) අනිත්‍ය වශයෙන් වැටහීමෙහි දක්ෂ වෙයි. (මේ වාක්‍ය අගට "වැටහීමෙහි දක්ෂවෙයි" යොදන්න) නිත්‍ය වශයෙන්- දුක්ඛ වශයෙන්- සුඛවශයෙන් අනාත්ම වශයෙන්- ආත්ම වශයෙන්- ක්ෂය වශයෙන්- ඝන වශයෙන් ම- ව්‍යය වශයෙන්- රැස්කිරීම් වශයෙන්ම විපරිණා වශයෙන්- ස්ථිර වශයෙන් ම- අනිමිත්ත වශයෙන්- නිමිත්ත වහයෙන් ම- අප්පණිහිත වශයෙන්- පණිධි වශයෙන් ම- සුඤ්ඤත වශයෙන්- ආත්මයයි ගැනීම් වශයෙන් ම- (iii) මේ නව ආකාරයෙන් වැටහීමෙහි දක්ෂ වෙයි. පෘථග්ජනතෙම විදර්ශනා වඩන්නේ මේ නව ආකාරයෙන් නොවැටහීමෙහි දක්ෂ වෙයි.

**101.** ශෛක්ෂතෙම විදර්ශනා වඩන්නේ කවර දස ආකාරයකින් වැටහීමෙහි දක්ෂ වේද කවර දශ ආකාරයකින් නොවැටහීමෙහි දක්ෂ වේද? (මෙහි 100 (ii) යොදන්න) ඤාණ වශයෙන් වැටහීමෙහි දක්ෂ වෙයි, අඤ්ඤාණ වශයෙන් නොවැටහීමෙහි දක්ෂ වෙයි. ශෛක්ෂතෙම විදර්ශනා වඩන්නේ මේ දශ ආකාරයෙන් වැටහීමෙහි දක්ෂ වෙයි. මේ දශ ආකාරයෙන් නොවැටහීමෙහි දක්ෂ වෙයි.

**102.** වීතරාගීතෙම විදර්ශනා වඩන්නේ කවර දොළොස් ආකාරයකින් වැටහීමෙහි දක්ෂවේද, කවර දොළොස් ආකාරයකින් නොවැටහීමෙහි දක්ෂ වේද? (මෙහි 100 (ii) යොදන්න.) (මෙහි 101 (ii) විසඤ්ඤොග වශයෙන් (ii) වැටහීමෙහි දක්ෂ වෙයි (iii) සඤ්ඤොග වශයෙන් නො (මෙහි 101 (ii) නිරොධ වශයෙන් (102 (ii) සංඛාර වශයෙන් නො (102 (ii) වීතරාගීතෙම විදර්ශනා වඩන්නේ මේ දොළොස්

ආකාරයෙන් (102 (ii) මේ දොළොස් ආකාරයෙන් නො (102 (ii)

**103.** (i) ආවර්ජනය කරන ලද හෙයින් ආරම්මණයාගේ වැටහීමෙහි දක්ෂතා වශයෙන් ඉන්ද්‍රියයන් පිහිටුවයි අරමුණද දැනගනියි. සම බවද අර්ථයද ප්‍රතිවෙධද කරයි. (ii) (මෙහි (i) ධර්මයන් පිහිටුවයි. අරමුණද දැනගනියි. සම බවද අර්ථයද ප්‍රතිවෙධ කරයි.

**104.** ඉන්ද්‍රියයන් පිහිටුවයි යන මෙහි කෙසේ ඉන්ද්‍රියයන් පිහිටුවයිද? ඇදහීම් වශයෙන් සද්ධින්ද්‍රිය පිහිටුවයි. සමථ නිමිත්ත වැටහීමෙහි දක්ෂතාවයාගේ වශයෙන් (මේ වාක්‍ය අගට "වැටහීමෙහි දක්ෂතාවයාගේ වශයෙන්" යොදන්න) පග්ගහ නිමිත්ත- අවික්ඛෙප නිමිත්ත- සංපහංසනය- උපෙක්ෂාව- සමාන බව- ඤාණය- විමුක්තිය- අනිත්‍ය වශයෙන්- නිත්‍ය වශයෙන්- දුක්ඛ වශයෙන්- සුඛ වශයෙන්ම- අනාත්ම වශයෙන්- ආත්ම වශයෙන් ම- බය වශයෙන් - ඝන වශයෙන් ම- වය වශයෙන්- රැස්කිරීම් වශයෙන් ම- විපරිණාම වශයෙන්- ස්ථිර වශයෙන් ම- අනිමිත්ත වශයෙන්- නිමිත්ත වශයෙන් ම- අප්පණිහිත වශයෙන්- පණිධි වශයෙන් ම- සුඤ්ඤත වශයෙන්- ආත්මයයි ගැනීම ම- ඥානය- අඤ්ඤාණය ම- විසඤ්ඤොගය- සඤ්ඤොගය ම- නිරොධය- සංඛාරය ම- ඉන්ද්‍රියන් පිහිටුවයි. අරමුණද දැනගනියි. සම බවද අර්ථයද ප්‍රතිවෙධ කරයි.

**105.** සූසැට ආකාරයකින් තුන්වැදෑරුම් ඉන්ද්‍රියයන් පුරුදු කිරීම් වශයෙන්වූ ප්‍රඥාව ආශ්‍රවයන් ක්ෂය කිරීමෙහි ඤාණය වෙයි. කවර තුන්වැදෑරුම් ඉන්ද්‍රියයන්ගේද? අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියගේද, අඤ්ඤින්ද්‍රියගේද, අඤ්ඤාතාවින්ද්‍රියගේද වෙයි. අනඤ්ඤාතඤ්ඤාස්සාමිතින්ද්‍රිය (ii) කෙතෙක් තැනකට පැමිණෙයිද? (iii) අඤ්ඤිතාවින්ද්‍රිය (මෙහි (ii) අඤ්ඤාතාවින්ද්‍රිය (මෙහි (ii) අනඤ්ඤාතඤ්ඤාස්සාවිතින්ද්‍රිය එක් තැනකට පැමිණෙයි එනම් සොතාපත්ති මාර්ගයයි අඤ්ඤින්ද්‍රිය සය තැනකට පැමිණෙයි. එනම් සොතාපත්ති ඵලයද සකෘදාගාමි මාර්ගයද සකෘදාගාමි ඵලයද අනාගාමි මාර්ගයද අනාගාමි ඵලයද අර්හත් මාර්ගයද

වෙයි. අඤ්ඤිතාවින්ද්‍රිය එක් තැනකට පැමිණෙයි එනම් අර්හත් ඵලයයි.

106. සොතාපත්ති මාර්ග ක්ෂණයෙහි අනඤ්ඤාතඤ්ඤාස්සා මිතින්ද්‍රියට (i) සද්ධින්ද්‍රිය ඇදහීම් (ii) වශයෙන් පිරිවර වෙයි. (iii) විරියින්ද්‍රිය උත්සාහ (මෙහි (ii) සතින්ද්‍රිය එළඹ සිටීම් (මෙහි (ii) සමාධින්ද්‍රිය නොවිසිරයාම් (මෙහි (ii) පඤ්ඤින්ද්‍රිය දැකීම් (මෙහි (ii) මනින්ද්‍රිය දැකීම් (මෙහි (ii) සොමනස්සින්ද්‍රිය නොවියලුණු ස්වභාවය (මෙහි (ii) ජීවිතින්ද්‍රිය පවත්නා සන්තතියට අධිපති (මෙහි (ii) සෝවාන් මාර්ගක්ෂණයෙහි (iv) හටගත් චිත්තජ රූප හැර සියලු ධර්මයෝ කුසල් වෙත්. සියලු ධර්මයෝ ආශ්‍රව රහිතවූවාහු වෙත්. සියලු ධර්මයෝ නිවනට පමුණුවන්නාහු වෙත්. සියලු ධර්මයෝ චුති ප්‍රතිසන්ධි දෙක සිඳිමින් යන්නාහු වෙත්. සියලු ධර්මයෝ ලොකොත්තර වෙත්. සියලු ධර්මයෝ නිවන් අරමුණු කොට ඇත්තාහු වෙත්.

107. සොවාන් මාර්ග ක්ෂණයෙහි (ii) අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියට මේ ඉන්ද්‍රියයන් අටදෙන එකට උපදින පිරිවර වෙත්. ඔවුනොවුන්ට පිරිවර වෙත්. නිශ්‍රය වන්නාවූ පිරිවර වෙත්. සම්ප්‍රයුක්ත පිරිවර වෙත්. එකට යෙදෙන්නාහු වෙත්. එකට උපදින්නාහු වෙත්. මිශ්‍රවූවාහු වෙත්. සම්ප්‍රයුක්ත වෙත්. ඒ ඉන්ද්‍රියයෝද ඒ මාර්ගයාගේ ආකාර ඇත්තාහුද පිරිවරවූවාහුද වෙත්. (iii)

108. සොතාපත්ති ඵලයෙහි (මෙහි 106 (ii) යොදන්න) සොතාපත්තිඵලයෙහි (මෙහි 106 (iv) යොදන්න) සොතාපත්ති ඵලයෙහි (මෙහි 107 (ii) අර්හත් ඵල ඤාණයෙහි අඤ්ඤාතාවින්ද්‍රියට (මෙහි 106 (ii) යොදන්න) ජීවිතින්ද්‍රිය පවත්නා සන්තතියට අධිපතිභාවයෙන් පිරිවර වෙයි. අර්හත් ඵල ක්ෂණයෙහි උපන් සියලු ධර්මයෝ අව්‍යාකෘත වෙත්. චිත්තජ රූප හැර සියලු ධර්මයෝ ආශ්‍රව රහිත වෙත්. සියලු ධර්මයෝ ලොකොත්තර වෙත්. සියලු ධර්මයෝ නිවන් අරමුණුකොට ඇත්තාහු වෙත්. අර්හත් ඵල ක්ෂණයෙහි අඤ්ඤාතාවින්ද්‍රියට මේ අට ඉන්ද්‍රියයෝ එකට උපදින පිරිවර වෙත්. ඒ ඉන්ද්‍රියයෝ

ඒ අර්හත් ඵලයාගේ ආකාර ඇත්තාහුද පිරිවරවූවාහුද වෙත්. මෙසේ මේ අෂ්ටක අටහැටහතරක් වෙත්.

**109.** ආසව යන මෙහි ඒ ආශ්‍රවයෝ කවරහුද? කාමාශ්‍රවය, භවාශ්‍රය, දෘෂ්ටි ආශ්‍රවය. අවිද්‍යා ආශ්‍රවය යන මොහුය. කොතැන්හි ඒ ආශ්‍රවයෝ ක්ෂය වෙත්ද? ශ්‍රොතාපත්ති මාර්ගයෙන් නිරවශෙෂ වශයෙන් දෘෂ්ටි ආශ්‍රවය ක්ෂය වෙයි. (මේ වාක්‍ය අගට "ආශ්‍රවය ක්ෂය වෙයි" යොදන්න) අපායෙහි හෙළන කාම- අපායෙහි හෙළන භව- අපායෙහි හෙළන අවිද්‍යා- මෙහි ඒ ආශ්‍රවයෝ ක්ෂය වෙත්.

සකෘදාගාමි මාර්ගයෙන් ඖදාරික කාම- ඊට සමානවූ භව- ඊට සමානවූ අවිද්‍යා- මෙහි ඒ ආශ්‍රවයෝ ක්ෂය වෙත්.

අනාගාමි මාර්ගයෙන් නිරවශෙෂ වශයෙන් කාම- ඊට සමානවූ භව- ඊට සමානවූ අවිද්‍යා- මෙහි මේ ආශ්‍රවයෝ ක්ෂය වෙත්.

අර්හත් මාර්ගයෙන් නිරවශෙෂ වශයෙන් භව- නිරවශෙෂ වශයෙන් අවිද්‍යා- මෙහි මේ ආශ්‍රවයෝ ක්ෂය වෙත්.

**110.** "උන්වහන්සේ විසින් වර්තමාන කාලයෙහිවූ (ii) නොදක්නා ලද කිසිවක් නැත. (iii) තවද අතීතයෙහිවූ (මෙහි (ii) අනාගතයෙහිවූ (මෙහි (ii) දතයුතුවූ යම්තාක් දේ වෙද්ද ඒ සියල්ල දැනගත්සේක. එහෙයින් තථාගතයන් වහන්සේ සමන්තචක්ඛු නම් වනසේක.

"සමන්ත චක්ඛු" යන මෙහි කිනම් අර්ථයකින් සමන්ත චක්ඛු නම් වෙයිද? බුද්ධඥාන තුදුසකි. දුක්ඛය (ii) දක්නා ඥානය බුද්ධ ඥානයකි. (iii) දුක්ඛ සමුදය (මෙහි (ii) (ඤාණ කථාවල 248 ඡේදය යොදන්න) සර්වඥතාඥානය බුද්ධ ඥානයකි. අනාවරණ ඥානය බුද්ධ ඥානයකි. මොව්හු තුදුස් බුද්ධ ඥානයෝ නම් වෙත්. මේ තුදුස් බුද්ධ ඥානයන් අතුරෙන් ඤාන අටක් ශ්‍රාවකයන්ට සාධාරණ වෙත්. ඤාණ සයක් ශ්‍රාවකයන්ට සාධාරණ නොවෙත්.

**111.** දුක්ඛයාගේ යම් පමණවූ දුක්ඛාර්ථ වෙයිද (ii) ඒ සියල්ල දක්නා ලදී. දන්නා ලදී. නොදැනගන්නා ලද දුක්ඛාර්ථයක් නැත. එහෙයින් සමන්ත චක්ඛු නම් වෙයි. යමක් සමන්ත

චක්ඛු වෙයිද එය පඤ්ඤින්ද්‍රිය නමි. පඤ්ඤින්ද්‍රියයාගේ වශයෙන් ඇදහීම් ස්වභාවයෙන් සද්ධින්ද්‍රිය වෙයි. උත්සාහ ස්වභාවයෙන් විරියින්ද්‍රිය වෙයි. එළඹ සිටීම් ස්වභාවයෙන් සතින්ද්‍රිය වෙයි. නොවිසිරයාම් ස්වභාවයෙන් සමාධින්ද්‍රිය වෙයි. (iii) දුක්ඛයාගේ යම්තාක් දුක්ඛාර්ථ ස්වභාවයක් වෙයිද (මෙහි (ii)

112. සමුදයාර්ථ යම්තාක් වෙයිද, (මෙහි 111 (ii) නිරොධයාගේ නිරොධාර්ථ යම්තාක්ද, (මේ වාක්‍ය අගට 'යම්තාක්ද' යොදන්න) මාර්ගයාගේ මාර්ගර්ථ- අර්ථ ප්‍රතිසම්භිදායෙහි අර්ථ ප්‍රතිසම්භිදාර්ථ- ධර්ම ප්‍රතිසම්භිදාවෙහි ධර්මප්‍රතිසම්භිදාර්ථ නිරුක්ති ප්‍රතිසම්භිදාවෙහි නිරුක්ති ප්‍රතිසම්භිදාර්ථ- ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවෙහි ප්‍රතිභාන ප්‍රතිසම්භිදාර්ථ- ඉන්ද්‍රිය පරොපර්යත්තයෙහි ඤාණ- සත්වයන්ගේ ආසය- අනුසයන්හි ඤාණ- යමක ප්‍රාතිහාර්යයෙහි ඤාණ- මහාකරුණා සමාපත්තියෙහි ඤාණ- දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයා විසින් මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාව විසින් ඇසින් දුටුවාවූද, කණින් ඇසුවාවූද, නැහැයෙන්, දිවෙන් කයින් දැනගන්නා ලද්දාවූද, සිතින් දැනගන්නා ලද්දාවූද පැමිණෙන ලද්දාවූද සොයන ලද්දාවූද සිතින් හැසිරෙන ලද්දාවූද, යම්තාක් දෙයක් වෙයිද, ඒ සියල්ල දැනගන්නා ලදී. දක්නා ලදී. ප්‍රත්‍යක්ෂකරන ලදී. නුවණින් ස්පර්ශ කරන ලදී. නුවණින් ස්පර්ශනොකරනලද්දක් නැත.

113. එහෙයින් සමන්ත චක්ඛු නමි. යමක් සමන්ත චක්ඛු නම් වේද එය පඤ්ඤින්ද්‍රිය නමි. පඤ්ඤින්ද්‍රියයාගේ වශයෙන් ඇදහීම් ස්වභාවයෙන් සධින්ද්‍රිය වෙයි. උත්සාහ ස්වභාවයෙන් විරියින්ද්‍රිය වෙයි. එළඹ සිටීම් ස්වභාවයෙන් සතින්ද්‍රිය වෙමියි. නොවිසිරයාම් ස්වභාවයෙන් සමාධින්ද්‍රිය වෙයි. අදහන්නේ උත්සාහ කරයි. උත්සාහ කරන්නේ අදහයි. අදහන්නේ සිහිය එළවයි. සිහිය එළවන්නේ අදහයි. අදහන්නේ සිත එකඟ කරයි. සිත එකඟ කරන්නේ අදහයි. අදහන්නේ ප්‍රකාරයෙන් දනියි. ප්‍රකාරයෙන් දන්නේ අදහයි. උත්සාහ කරන්නේ සිහිය එළවයි. සිහි එළවන්නේ උත්සාහ කරයි. උත්සාහ කරන්නේ සිත එකඟ කරයි. සිත එකඟ කරන්නේ උත්සාහ කරයි. උත්සාහ කරන්නේ

ප්‍රකාරයෙන් දනියි. ප්‍රකාරයෙන් දන්නේ උත්සාහ කරයි. උත්සාහ කරන්නේ අදහයි. අදහන්නේ උත්සාහ කරයි. සිහි එළවන්නේ සිත එකඟ කරයි. සිත එකඟ කරන්නේ සිහි එළවයි. සිහි එළවන්නේ ප්‍රකාරයෙන් දනියි. ප්‍රකාරයෙන් දන්නේ සිහි එළවයි. සිහි එළවන්නේ අදහයි. අදහන්නේ සිහි එළවයි. සිහි එළවන්නේ උත්සාහ කරයි. උත්සාහ කරන්නේ සිහි එළවයි. සිත එකඟ කරන්නේ ප්‍රකාරයෙන් දනියි. ප්‍රකාරයෙන් දන්නේ සිත එකඟ කරයි. සිත එකඟ කරන්නේ අදහයි. අදහන්නේ සිත එකඟ කරයි. සිත එකඟ කරන්නේ උත්සාහ කරයි. උත්සාහ කරන්නේ සිත එකඟ කරයි. ප්‍රකාරයෙන් දනියි. ප්‍රකාරයෙන් දන්නේ සිහි එළවයි. සිහි එළවන්නේ ප්‍රකාරයෙන් දනියි. ප්‍රකාරයෙන් දන්නේ සිත එකඟ කරයි. සිත එකඟ කරන්නේ ප්‍රකාරයෙන් දනියි.

**114.** අදහන ලද හෙයින් උත්සාහ කරන ලදී. උත්සාහ කරන ලද හෙයින් අදහන ලදී. අදහන ලද හෙයින් සිහි එළවන ලදී. සිහි එළවන ලද හෙයින් අදහන ලදී. අදහන ලද හෙයින් සිත එකඟ කරන ලදී. සිත එකඟ කරන ලද හෙයින් අදහන ලදී. අදහන ලද හෙයින් ප්‍රකාරයෙන් දැනගන්නා ලදී. ප්‍රකාරයෙන් දැනගන්නා ලද හෙයින් අදහන ලදී.

උත්සාහ කරන ලද හෙයින් සිහි එළවන ලදී. සිහි එළවන ලද හෙයින් උත්සාහ කරන ලදී. උත්සාහ කරන ලද හෙයින් සිත එකඟ කරන ලදී. සිත එකඟ කරන ලද හෙයින් උත්සාහ කරන ලදී. උත්සාහ කරන ලද හෙයින් දැනගන්නා ලදී. දැනගන්නා ලද හෙයින් උත්සාහ කරන ලදී. උත්සාහ කරන ලද හෙයින් අදහන ලදී. අදහන ලද හෙයින් උත්සාහ කරන ලදී. සිහි එළවන ලද හෙයින් සිත එකඟ කරන ලදී. සිත එකඟ කරන ලද හෙයින් සිහි එළවන ලදී. සිහි එළවන ලද හෙයින් දැනගන්නා ලදී. දැනගන්නා ලද හෙයින් සිහි එළවන ලදී. සිහි එළවන ලද හෙයින් අදහන ලදී. අදහන ලද හෙයින් සිහි එළවන ලදී. සිහි එළවන ලද හෙයින් උත්සාහ කරන ලදී. උත්සාහ කරන ලද හෙයින් සිහි එළවන ලදී.

සිත එකඟ කරන ලද හෙයින් දැනගන්නා ලදී. දැනගන්නා ලද හෙයින් සිත එකඟ කරන ලදී. සිත එකඟ කරන ලද

හෙයින් අදහන ලදී. අදහන ලද හෙයින් සිත එකඟ කරන ලදී. සිත එකඟ කරන ලද හෙයින් උත්සාහ කරන ලදී. උත්සාහ කරන ලද හෙයින් සිත එකඟ කරන ලදී. සිත එකඟ කරන ලද හෙයින් සිහි එළවන ලදී. සිහි එළවන ලද හෙයින් සිත එකඟ කරන ලදී.

දැනගන්නා ලද හෙයින් අදහන ලදී. අදහන ලද හෙයින් දැනගන්නා ලදී. දැනගන්නා ලද හෙයින් උත්සාහ කරන ලදී. උත්සාහ කරන ලද හෙයින් දැනගන්නා ලදී. දැනගන්නා ලද හෙයින් සිහි එළවන ලදී. සිහි එළවන ලද හෙයින් දැනගන්නා ලදී. දැනගන්නා ලද හෙයින් සිත එකඟ කරන ලදී. සිත එකඟ කරන ලද හෙයින් දැනගන්නා ලදී.

**115.** යමක් බුද්ධ චක්ඛු වෙයිද එය බුද්ධඥාන නමි. යමක් බුද්ධඥාන වෙයිද එය බුද්ධ චක්ඛු නමි. යම් චක්ෂුසකින් තථාගතයන් වහන්සේ විසින් අල්ප (ii) රජස් සහිත ඉන්ද්‍රියයන් (iii) ඇත්තාවූද, මහත් (මෙහි (ii) ඇත්තාවූද, තියුණු ඉන්ද්‍රිය ඇත්තාවූද, මෘදු ඉන්ද්‍රිය ඇත්තාවූද, යහපත් ආකාර ඇත්තාවූද, අයහපත් ආකාර ඇත්තාවූද, පහසුවෙන් අවබොධ කළ හැක්කාවූද, පහසුවෙන් අවබොධ කළ නොහැක්කාවූද සත්වයන් පරලොව භය දක්නාවූ ඇතැම් සත්වයන්ද, පරලොව භය නොදක්නාවූ ඇතැම් සත්වයන්ද, දකියිද එය බුද්ධ චක්ඛු නමි.

**116.** අල්ප (ii) ඇති මහත් (මෙහි 115 (ii) යන මෙහි ශ්‍රද්ධාවත් පුද්ගලතෙම අල්ප (මෙහි (ii) ඇත්තේ වෙයි. අශ්‍රද්ධාවත් පුද්ගලතෙම මහත් (මෙහි 115 (ii) ඇත්තේ වෙයි. එළඹ සිටි සිහිය ඇති පුද්ගලතෙම අප්පරජක්ඛ පුද්ගල නමි. පටන්ගත් වීර්ය ඇති පුද්ගලතෙම අප්පරජක්ඛ නමි. පටන්ගත් වීර්ය නැති පුද්ගලතෙම මහරජක්ඛ නමි. එළඹ සිටි සිහිය ඇති පුද්ගලතෙම අප්පරජක්ඛ නමි. මුළාවූ සිහිය ඇති පුද්ගල තෙම මහාරජක්ඛ නමි. සමාධිය ඇති පුද්ගලතෙම අප්පරජක්ඛ නමි. සමාධිය නැති පුද්ගලතෙම මහාරජක්ඛ නමි. ප්‍රඥාවත් පුද්ගලතෙම අප්පරජක්ඛ නමි. දුශ්ප්‍රාඥ පුද්ගලතෙම මහාරජක්ඛ නමි.

තියුණු ඉන්ද්‍රිය ඇති මෘදු ඉන්ද්‍රිය ඇති යන මෙහි ශ්‍රද්ධාවත් පුද්ගලතෙම තික්ඛින්ද්‍රිය (තියුණු ඉන්ද්‍රිය ඇත්තේ) නමි. ශ්‍රද්ධා

නැති පුද්ගලතෙම මුදින්ද්‍රිය (මෘදු ඉන්ද්‍රිය ඇත්තේ) නමි. එළඹ සිටි සිහිය ඇති පුද්ගලතෙම තික්ඛින්ද්‍රිය නමි. මුළාවූ සිහිය ඇති පුද්ගලතෙම මුදින්ද්‍රීය නමි. පටන්ගත් වීර්‍ය ඇති පුද්ගලතෙම තික්ඛින්ද්‍රිය නමි. සමාධිය ඇති පුද්ගල තෙම මුදින්ද්‍රිය නමි. ප්‍රඥාවත් පුද්ගලතෙම තික්ඛින්ද්‍රිය නමි. දුශ්ප්‍රාඥ පුද්ගලතෙම මුදින්ද්‍රිය නමි.

117. යහපත් ආකාර ඇති අයහපත් ආකාර ඇති යන මෙහි ශ්‍රද්ධාවත් පුද්ගලතෙම ස්වාකාර (යහපත් ආකාර ඇත්තේ) නමි. අශ්‍රද්ධාවත් පුද්ගලතෙම ද්වාකාර (අයහපත් ආකාර ඇත්තේ) නමි. ප්‍රඥාවත් පුද්ගලතෙම ස්වාකාර නමි. දුශ්ප්‍රාඥ පුද්ගලතෙම් ද්වාකාර නමි.

පහසුවෙන් අවබොධ කළ හැකි පහසුවෙන් අවබොධ නොකළ හැකි (සුවිඤ්ඤාපය දුවිඤ්ඤාපය) යන මෙහි ශ්‍රද්ධාවත් පුද්ගලතෙම සුවිඤ්ඤාපය නමි. ප්‍රඥාවත් පුද්ගලතෙම සුවිඤ්ඤාපය නමි. දුප්පඤ්ඤ පුද්ගලතෙම දුවිඤ්ඤාපය නමි.

118. පරලොව භය දක්නා ඇතැම් සත්වයන් පරලොව භය නොදක්නා ඇතැම් සත්වයන් යන මෙහි ශ්‍රද්ධාවත් පුද්ගල තෙම (ii) පරලොව භය දක්නේ වෙයි. (iii) අශ්‍රද්ධාවත් පුද්ගලතෙම (iv) පරලොව භය නොදක්නේ වෙයි. (v) පටන් ගත් වීර්‍ය ඇති පුද්ගලතෙම (මෙහි (ii) කුසීත පුද්ගලතෙම (මෙහි (iv) ප්‍රඥාවත් පුද්ගලතෙම (මෙහි (ii) දුප්පඤ්ඤ පුද්ගල තෙම (මෙහි (iv)

119. ලොක යන මෙහි ඛන්ධලොකය ධාතුලොකය ආයතනලොකය විපත්ති ලොකය විපත්තිසම්භව ලොකය සම්පත්තිලොකය සම්පත්ති සම්භව ලොකය එක් ලොකයකි. සියලු සත්වයෝ ආහාරය නිසා පවත්නාහුය. ලොක දෙකකි. නාමයද රූපයද වෙයි. ලොක තුනකි. ත්‍රිවිධ වේදනාවෝයි. ලොක සතරකි, සතර ආහාරයෝයි ලොක පසකි, පඤ්ච උපාදානස්කන්ධයෝයි. ලොක සයකි, අධ්‍යාත්මිකායතන සයය ලොක සතකි, විඥානස්ථිති සතය, ලොක අටකි, අෂ්ට ලොක ධර්මයෝයි. ලොක නවයකි, නව සත්වාවාසයෙයෝයි. ලොක දසයකි, දස ආයතනයෝයි. ලොක දොළසකි. දොළොස්

ආයතනයෝයි. ලොක අටළොසකි. අටළොස් ධාතූහුය, යන මොහු ලොක නම් වෙත්.

**120.** "වරද" යන මෙහි සියලු ක්ලේශයෝ වරද වෙත්. සියලු දුශ්චරිතද වරද වෙත්. සියලු කර්ම වරද වෙත්. සියලු භවගාමීකර්ම වරදවෙත්. මෙසේ මේ ලොකයෙහිද මේ වරදෙහිද තියුණුවූ භය සඤ්ඤාව ඔසවන ලද කඩුව ඇති වධකයෙකු කෙරෙහි යම්සේද එසේ තියුණුවූ භය සඤ්ඤාව වැටහෙන ලද්දී වෙයි.

මේ පනස් ආකාරයෙන් මේ පංච ඉන්ද්‍රියයන් දකියි, දනියි, ප්‍රතිවෙධ කරයි.

තුන්වැනි බණවරයි.
(ඉන්ද්‍රිය කථාව නිමි.)

---

## 5. විමොක්ඛ කථා.

**1.** සම්පූර්ණවූ (යට කියන ලද) නිදානය වෙයි.

"මහණෙනි, විමොක්ෂ තුනකි. කවර තුනක්ද? සුඤ්ඤත විමොක්ෂයද අනිමිත්ත විමොක්ෂයද අප්පණිහිත විමොක්ෂයද වෙත්. මහණෙනි, මොව්හු විමොක්ෂ තුන නම් වෙත්.

**2.** තවද විමොක්ෂ සත් සැට 67 කි. (මේ වචන අගට "විමොක්ෂය" යොදන්න) සුඤ්ඤත විමොක්ෂය අනිමිත්ත- අප්පණිහිත- අජ්ඣත්තවුට්ඨාන- බහිද්ධා වුට්ඨාන- දුභතො වුට්ඨාන- අජ්ඣත්ත වුට්ඨාන විමොක්ෂ සතර (මේ වාක්‍ය අගට "විමොක්ෂ සතර" යොදන්න) බහිද්ධා වුට්ඨාන- දුභතො වුට්ඨාන- අධ්‍යාත්ම සන්තානයෙන් නැගිටින්නාවූ යොගාවචරයන්ට අනුකූලවූ- බහිද්ධා සන්තානයෙන් නැගිටින්නාවූ යොගාවචරයන්ට අනුකූලවූ- එ දෙයාකාරයෙන් නැගිටින්නාවූ යොගාවචරයන්ට අනුකූලවූ- අධ්‍යාත්ම සන්තානයෙන් නැගිටීමෙන් සංසිඳෙන්නාවූ- බහිද්ධා සන්තානයෙන් නැගිටීමෙන් සංසිඳෙන්නාවූ- ඒ දෙයාකාරයෙන් නැගිටීමෙන් සංසිඳෙන්නාවූ- රූප ධ්‍යාන ඇත්තෙක්ව කසිණාදී රූප බලන්නේය යන අර්ථයෙන්වූ විමොක්ෂය අධ්‍යාත්මික

දෙයකින් උපදවන ලද රූප ධ්‍යාන නැත්තෙක්ව බාහිර රූප බලන්නේය (ii) යන අර්ථයෙන්වූ විමොක්ෂය සුභයයිම මෙනෙහි කරන්නේ වෙයි. යන අර්ථයෙන්වූ විමොක්ෂය (මේ වාක්‍ය අගට "විමොක්ෂය" යොදන්න) ආකාසානඤ්චායතන සමාපත්ති- විඤ්ඤාණඤ්චායතන සමාපත්ති- ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති- නෙවසඤ්ඤානාසඤ්ඤායතන- සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්ති- සමය- අසමය- සාමයික- අසාමයික- කුප්ප- අකුප්ප- ලොකිය- ලොකුත්තර- සාසව- අනාසව- සාමිස- නිරාමිස- නිරාමිසනිරාමිසතර- පණිහිත- අප්පණිහිත- පණිහිත පටිප්පසද්ධි- සඤ්ඤුත්ත- විසඤ්ඤුත්ත- සඤ්ඤා- ඤාණ- සීතිසියා- ඣාන- අනුප්පාදචිත්ත විමොක්ෂය යන මොහුය.

3. සුඤ්ඤත විමොක්ෂය කවරේද? (ii) මේ ශාසනයෙහි මහණතෙම අරණ්‍යයට පැමිණියේ හෝ වෘක්ෂ මූලයකට පැමිණියේ හෝ සූන්‍යාගාරයකට පැමිණියේ හෝ මේ ස්කන්ධ පංචකය මමයයි ගතයුත්තකින් හෝ මගේයයි ගතයුත්තකින් හෝ සූන්‍යයයි (iii) අනාත්ම වශයෙන් මෙනෙහි කරයි. හෙතෙම ඒ ස්කන්ධ පංචකයෙහි මමයයි ගැනීමක් නොකරයි. එහෙයින් සුඤ්ඤත විමොක්ෂ නම්. මෙය සුඤ්ඤත විමොක්ෂ නම් වෙයි.

4. අනිමිත්ත විමොක්ෂය කවරේද? (මෙහි 3 (ii) යොදන්න) අනිත්‍ය වශයෙන් මෙනෙහි කරයි. හෙතෙම එහි නිත්‍ය නිමිත්තක් නැතැයි නොකරන්නේනුයි අනිමිත්ත විමොක්ෂ නම්. මෙය අනිමිත්ත විමොක්ෂ නම් වෙයි.

5. අප්පණිහිත විමොක්ෂය කවරේද? (මෙහි 3 (ii) යොදන්න) සූන්‍යයයි දුක්ඛ වශයෙන් මෙනෙහි කරයි. හෙතෙම ඒ ස්කන්ධ පංචකයෙහි ආශා නොකෙරේනුයි අප්පණිහිත විමොක්ෂ නම්. මේ අප්පණිහිත විමොක්ෂ නම් වෙයි.

6. අජ්ඣත්ත වුට්ඨාන විමොක්ෂය කවරේද? සතර ධ්‍යානයෝයි. මේ අජ්ක්ධත්ත වුට්ඨාන විමොක්ෂ නම්. බහිද්ධා වුට්ඨාන විමොක්ෂය කවරේද? සතර අරූප සමාපත්තීහුය. මෙය බහිද්ධා වුට්ඨාන විමොක්ෂ නම්. දුභතො වුට්ඨාන විමොක්ෂය

කවරේද? සතර ආර්ය මාර්ගයෝයි. මේ දුහතො (අධ්‍යාත්ම බහිද්ධායන දෙයාකාරයෙන්) වුට්ඨාන විමොක්ෂ නමි.

7. අධ්‍යාත්ම සන්තානයෙන් නැගිටින්නාවූ සතර විමොක්ෂයෝ කවරහුද? ප්‍රථමධ්‍යානය නීවරණයන් කෙරෙන් නැගිටියි. ද්විතීයධ්‍යානය විතර්ක විචාරයන් කෙරෙන් නැගිටියි. තෘතීය ධ්‍යානය ප්‍රීතියෙන් නැගිටියි. චතුර්ථ ධ්‍යානය සුඛ දුක්ඛයන් කෙරෙන් නැගිටියි. මොව්හු අධ්‍යාත්මයෙන් නැගිටින්නාවූ සතර විමොක්ෂයෝයි.

8. බහිද්ධා සන්තානයෙන් නැගිටින්නාවූ සතර විමොක්ෂයෝ කවරහුද? ආකාසානඤ්චායතන සමාපත්තිය රූප සඤ්ඤාවෙන්ද පටිඝසඤ්ඤාවෙන්ද නානත්තසඤ්ඤාවෙන්ද නැගිටියි. විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය ආකාසානඤ්චායතන සමාපත්තියෙන් නැගිටියි. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය විඤ්ඤාණඤ්චායතන සඤ්ඤාවෙන් නැගිටියි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සඤ්ඤාව ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤාවෙන් නැගිටියි. මොව්හු බහිද්ධාසන්තානයෙන් නැගිටින්නාවූ සතර විමොක්ෂයෝයි.

9. දෙයාකාරයෙන් නැගිටින්නාවූ සතර විමොක්ෂයෝ කවරහුද? සොතාපත්ති මාර්ගය සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාසයන් කෙරෙන්ද, දිට්ඨි අනුසය කෙරෙන්ද, විචිකිච්ඡා අනුසය කෙරෙන්ද නැගිටියි. (මේ වාක්‍ය අගට "කෙරෙන්ද නැගිටියි" යොදන්න) ඒ අනුව පවත්නා ක්ලේශයන් කෙරෙන්ද ස්කන්ධයන්- බාහිර සියලු සංඛාර නිමිති- සකෘදාගාමි මාර්ගය ඖදාරික කාමරාගානුසය- පටිඝානුසය- ඒ අනුව පවත්නා ක්ලේශයන්- ස්කන්ධයන්- බාහිර සියලු සංඛාර නිමිති- අනාගාමි මාර්ගය තුනීවූ කාමරාග සංයෝජනය- පටිඝ සංයෝජනය- තුනීවූ කාමරාගානුසය- පටිඝානුසය- බාහිර සියලු සංඛාර නිමිති- අර්හත් මාර්ගය රූපරාගය- අරූපරාගය- මානයෙන්ද, උද්ධච්චයෙන්ද, අවිද්‍යාවෙන්ද, මානානුසය- භව රාගානුසය- අවිද්‍යානුසය- ඒ අනුව පවත්නා ක්ලේශයන්- ස්කන්ධයන්- බාහිර සියලු සංඛාර නිමිති- මොව්හු දෙයාකාරයෙන් නැගිටින්නාවූ සතර විමොක්ෂයෝයි.

10. අධ්‍යාත්මයෙන් නැගින්නවුන්ට අනුකූල සතර විමොක්ෂයෝ කවරහුද? ප්‍රථම ධ්‍යානය (ii) ලැබීම පිණිස පවත්නාවූ විතර්කයද විචාරයද ප්‍රීතියද සුඛයද ඒකාග්‍රතාවද (iii) ද්විතීය ධ්‍යානය (මෙහි (ii) තෘතීය ධ්‍යානය (මෙහි (ii) චතුර්ථධ්‍යානය (මෙහි (ii) වෙත්. මොව්හු අධ්‍යාත්මයෙන් නැගිටින්නාවුන්ට අනුකූලවූ සතර විමොක්ෂයෝයි.

11. බහිද්ධා සන්තානයෙන් නැගිගන්නවුන්ට අනුකූලවූ සතර විමොක්ෂයෝ කවරහුද? ආකාසානඤ්චායතන සමාපත්තිය (මෙහි 10 (ii) විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය (මෙහි10 (ii) ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය (මෙහි 10 (ii) නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය වෙත්. මොව්හු බහිද්ධාසන්තායෙන් නැගිටින්නහුට අනුකූලවූ සතර විමොක්ෂයෝයි.

12. දෙයාකාරයෙන් නැගිටින්නහුට අනුකූලවූ සතර විමොක්ෂයෝ කවරහුද? සොතාපත්ති මාර්ගය (ii) ලැබීම පිණිස පවත්නා අනිත්‍ය වශයෙන් ලැබීම, දුක් වශයෙන් බැලීම, අනාත්ම වශයෙන් බැලීමද (iii) සකෘදාගාමි මාර්ගය (මෙහි (ii) අනාගාමි මාර්ගය (මෙහි (ii) අර්හත් මාර්ගය (මෙහි (ii) වෙත්. මොව්හු දෙයාකාරයෙන් නැගිටින්නහුට අනුකූලවූ සතර විමොක්ෂයෝයි.

13. අධ්‍යාත්මයෙන් නැගිටීමෙන් සංසිඳෙන්නාවූ විමොක්ෂ සතර කවරහුද? ප්‍රථමධ්‍යානය (ii) ලැබීම හෝ විපාකය හෝ (iii) ද්විතීයධ්‍යානය (මෙහි (ii) තෘතීයධ්‍යානය (මෙහි (ii) චතුර්ථධ්‍යානය (මෙහි (ii) වෙත්. (iv) මොව්හු අධ්‍යාත්මයෙන් නැගිටීමෙන් සංසිඳෙන්නාවූ සතර විමොක්ෂයෝයි.

14. බහිද්ධා සන්තානයෙන් නැගිටීමෙන් සංසිඳෙන්නාවූ විමොක්ෂ සතර කවරහුද? (i) ආකාසානඤ්චායතන සමාපත්තිය (ii) ලැබීම හෝ විපාකය හෝ (iii) විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය (මෙහි (ii) ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය (මෙහි (ii) නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය (මෙහි (ii) වෙත්. (iv) මොව්හු බහිද්ධා සන්තානයෙන් නැගිටීමෙන් සංසිඳෙන්නාවූ සතර විමොක්ෂයෝයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

15. දෙයාකාරයෙන් නැගිටීමෙන් සංසිඳෙන්නාවූ විමොක්ෂ සතර කවරහුද? සොතාපත්ති මාර්ගයාගේ සොතාපත්තිඵලයද සකෘදාගාමි මාර්ගයාගේ සකෘදාගාමි ඵලයද අනාගාමි මාර්ගයාගේ අනාගාමි ඵලයද අර්හත් මාර්ගයාගේ අර්හත් ඵලයද වෙත්. මොව්හු දෙයාකාරයෙන් නැගිටීමෙන් සංසිඳෙන්නාවූ සතර විමොක්ෂයෝයි.

11. කෙසේ රූප ධ්‍යාන ඇත්තේ රූප බලන්නේනුයි විමොක්ෂ නම් වේද? (i) මේ ශාසනයෙහි මහණතෙම තමා කෙරෙහි වූ නීල නිමිත්තක් මෙනෙහි කරයි. නීල සංඥාව ලබයි. හෙතෙම ඒ නිමිත්ත (ii) මනාකොට ගන්නාලද්දක් කරයි. මනාකොට දරන ලද්දක් කරයි. මනාකොට විනිශ්චය කරන ලද්දක් කරයි. හෙතෙම ඒ නිමිත්ත මනාව ගන්නා ලද්දක් කොට මනාව දරන ලද්දක් කොට මනාව විනිශ්චය කරන ලද්දක් කොට (ii) පිටත්හිවූ නීල නිමිත්තක් කෙරෙහි සිත අභිමුඛකොට එළවයි. නීල සඤ්ඤාව ලබයි. හෙතෙම ඒ නිමිත්ත (මෙහි (ii) යොදන්න) සේවනය කරයි. වඩයි. බහුල කරයි. ඔහුට තමා කෙරෙහිද පිටත්හිද යන දෙකම රූප නම් වේ යයි අදහස් වෙයි. මෙසේ රූප සඤ්ඤා ඇත්තේ වෙයි.

17. (මෙහි 16 (i) (ii) (iii) යෙදීමේදී "නීල" වෙනුවට "පීත" ද "ලොහිත" ද "ඕදාත" ද පිළිවෙලට යෙදිය යුතුයි.) මෙසේ රූප ධ්‍යාන ඇත්තේ රූප බලන්නේනුයි විමොක්ෂ නමි.

18. කෙසේ තමා කෙරෙහිවූ නිමිත්තකින් ලැබූ රූප ධ්‍යාන නැත්තේ රූප බලන්නේනුයි විමොක්ෂ නම් වේද, (i) මේ ශාසනයෙහි ඇතමෙක් තමා කෙරෙහිවූ නීල නිමිත්තක් මෙනෙහි නොකරයි. නීල සඤ්ඤාව නොලබයි. පිටත්හිවූ නීල නිමිත්තක් කෙරෙහි සිත අභිමුඛ කොට එළවයි. නීල සඤ්ඤාව ලබයි හෙතෙම ඒ නිමිත්ත (ii) (මෙහි 16 (ii) යොදන්න) (iii) සෙවනය කරයි, වඩයි, බහුල කරයි. ඔහුට මෙය තමා කෙරෙහිවූ රූප නිමිත්තක් නොවේ. පිටත්හිවූ රූප නිමිත්තකැයි අදහස් වෙයි. මෙසේ රූප සඤ්ඤා ඇත්තේ වෙයි.

19. (මෙහි 16 (i) (ii) (iii) යෙදීමේදී "නීල" වෙනුවට "පීත" ද "ලොහිත" ද "ඕදාත" ද පිළිවෙලට යෙදිය යුතුයි.)

මෙසේ තමා කෙරෙහි අරූප සඤ්ඤා ඇත්තේ පිටත්හි රූප බලන්නේනුයි විමොක්ෂ නම් වෙයි.

20. කෙසේ නම් සුභයයි මෙනෙහි කරන්නේනුයි විමොක්ෂ නම් වේද? (i) මේ ශාසනයෙහි මහණතෙම මෛත්‍රී සහගත සිතින් (ii) එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙවන දිශාවද එසේ තුන්වැනි දිශාවද එසේ සතරවැනි දිශාවද පතුරුවා වාසය කරයි. මෙසේ උඩද යටද සරසද සියලු තන්හි සියලු සත්වයන් කෙරෙහි සමානව සියලු සත්වයන් සහිත ලොකය විපුලවූ මහත් බවට ගියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ව්‍යාපාද නැත්තාවූ මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසය කරයි. (iii) මෛත්‍රිය වඩන ලද හෙයින් සත්වයෝ පිළිකුල් නොකරන්නාහු වෙත්. (iii) (මෙහි මේ ඡෙදයේ (i) (ii) යෙදීමේදී "මෛත්‍රී" වෙනුවට "කරුණා" "මුදිතා" "උපෙක්ඛා" පිළිවෙලින් යෙදිය යුතුයි) මෙසේ සුභයම මෙනෙහි කරන්නේනුයි විමොක්ෂ නමි.

21. අකාසානඤ්චායතන සමාපත්ති විමොක්ෂය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සියලු ආකාරයෙන් රූප සඤ්ඤාවන්ගේ ඉක්මවීමෙන්ද පටිඝසඤ්ඤාවන් දුරු කිරීමෙන්ද නානත්ත සඤ්ඤාවන් නොමෙනෙහි කිරීමෙන් ආකාශය අනන්තයයි මෙනෙහි කොට ආකාසඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරයි. මෙය ආකාසානඤ්චායතන සමාපත්ති විමොක්ෂ නමි.

22. විඤ්ඤාණඤ්චායතන සමාපත්ති විමොක්ෂය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි මෙනෙහි කොට විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරයි. මේ විඤ්ඤානඤ්චායතන සමාපත්ති විමොක්ෂ නමි.

23. ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති විමොක්ෂය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි මෙනෙහි කොට ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයට පැමිණ වාසය කරයි. මෙය ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති විමොක්ෂ නමි.

**24.** නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්ති විමොක්ෂය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. මෙය නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්ති විමොක්ෂ නමි.

**25.** සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්ති විමොක්ෂය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම සියලු ආකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වාසය කරයි. මෙය සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්ති විමොක්ෂ නමි.

**26.** සමය විමොක්ෂය කවරේද? සතර ධ්‍යානයෝද සතර අරූප සමාපත්තීහුද වෙත්. මෙය සමය විමොක්ෂ නමි. අසමය විමොක්ෂය කවරේද? ආර්ය මාර්ග සතරද සාමඤ්ඤඵල සතරද නිර්වාණයද වෙත්. මෙය අසමය විමොක්ෂ නමි.

**27.** සාමයික විමොක්ෂය කවරේද? සතර ධ්‍යානයෝද අරූප සමාපත්ති සතරද වෙත්. මෙය සාමයික විමොක්ෂය නමි. අසාමයික විමොක්ෂය කවරේද? සතර ආර්ය මාර්ගයෝද සාමඤ්ඤ ඵල සතරද නිර්වාණයද වෙත්. මෙය අසාමයික විමොක්ෂ නමි.

**28.** කුප්ප (විනාශවන්නාවූ) විමොක්ෂය කවරේද? සතර ධ්‍යානයෝද අරූප ධ්‍යානයෝද අරූප සමාපත්ති සතරද වෙත්. මෙය කුප්ප විමොක්ෂ නමි. අකුප්ප (විනාශ නොවන) විමොක්ෂය කවරේද? සතර ආර්ය මාර්ගයෝද, සාමඤ්ඤ ඵල සතරද නිර්වාණයද වෙත්. මෙය අකුප්ප විමොක්ෂ නමි.

**29.** ලොකිය විමොක්ෂය කවරේද? සතර ධ්‍යානයෝද, සතර අරූප සමාපත්තීහුද වෙත්. මෙය ලොකිය විමොක්ෂ නමි. ලොකොත්තර විමොක්ෂය කවරේද? සතර ආර්ය මාර්ගයෝද සතර සාමඤ්ඤ ඵලද නිර්වාණයද වෙත්. මෙය ලොකොත්තර විමොක්ෂ නමි.

**30.** සාසව විමොක්ෂය කවරේද? සතර ධ්‍යානයෝද සතර අරූප සමාපත්තීහුද වෙත්. මෙය සාසව විමොක්ෂ නමි. අනාසව විමොක්ෂය කවරේද? සතර ආර්ය මාර්ගයෝද සතර සාමඤ්ඤ ඵලද නිර්වාණයද වෙත්. මෙය අනාසව විමොක්ෂ නමි.

31. සාමිස විමොක්ෂය කවරේද? රූපයන් පිළිබඳ විමොක්ෂය වෙයි. මෙය සාමිස විමොක්ෂ නමි. නිරාමිස විමොක්ෂය කවරේද? අරූපය පිළිබඳ විමොක්ෂයයි. මෙය නිරාමිස විමොක්ෂ නමි.

32. නිරාමිසානිරාමි සතර විමොක්ෂය කවරේද? සතර ආර්ය මාර්ගයෝද, සතර සාමඤ්ඤ ඵලද නිර්වාණයද වෙත්. මෙය නිරාමිසා නිරාමි සතර විමොක්ෂ නමි.

33. පණිහිත විමොක්ෂය කවරේද? සතර ධ්‍යානයෝද සතර අරූප සමාපත්තීහුද වෙත්. මෙය පණිහිත විමොක්ෂ නමි. අප්පණිහිත විමොක්ෂය කවරේද? සතර ආර්ය මාර්ගයෝද සතර සාමඤ්ඤ ඵලද නිර්වාණයද වෙත්. මෙය අප්පණිහිත විමොක්ෂ නමි.

34. පණිහිත පටිප්පස්සද්ධි විමොක්ෂය කවරේද? ප්‍රථම ධ්‍යානයාගේ (මෙහි 13 (ii) (iii) 14 (i) (ii) (iii) (iv) යොදන්න) මෙය පණිහිත පටිප්පස්සද්ධි විමොක්ෂ නමි. සඤ්ඤුත්ත විමොක්ෂය කවරේද? සතර ධ්‍යානයෝද අරූප සමාපත්ති සතරද වෙත්. මෙය සඤ්ඤුත්ත විමොක්ෂ නමි.

35. විසඤ්ඤුත්ත විමොක්ෂය කවරේද? (ii) සතර ආර්ය මාර්ගයෝද, සතර සාමඤ්ඤ ඵලයෝද නිර්වාණයද වෙත්. (iii) මෙය විසඤ්ඤුත විමොක්ෂ නමි. එකත්ත විමොක්ෂය කවරේද? (මෙහි (ii) මෙය එකත්ත විමොක්ෂ නමි. නානත්ත විමොක්ෂය කවරේද? සතර ධ්‍යානයෝද සතර අරූප සමාපත්තීහුද වෙත්. මෙය නානත්ත විමොක්ෂ නමි.

36. සඤ්ඤා විමොක්ෂය කවරේද? වස්තු වශයෙන්ද කරුණු වශයෙන්ද එක් සඤ්ඤා විමොක්ෂයක් සඤ්ඤා විමොක්ෂ දසයක් වෙත්. දස සඤ්ඤා විමොක්ෂය එක්සඤ්ඤා විමොක්ෂයක් වෙයි. යන ක්‍රමය වන්නේය. කෙසේ වන්නේද? (i) අනිත්‍ය වශයෙන් දක්නා ඤාණය නිත්‍ය (ii) සංඥාවෙන් මිදේනුයි, සඤ්ඤා විමොක්ෂ නමි (iii) දුක් වශයෙන් දක්නා ඤාණය සුඛ (මෙහි (ii) (iii) අනාත්ම වශයෙන් දක්නා ඥානය ආත්ම (මෙහි (ii) කලකිරීම් වශයෙන් දක්නා ඤාණය නන්දී (මෙහි (ii) විරාග වශයෙන් දක්නා ඤාණය රාග (මෙහි (ii)

නිරොධ වශයෙන් දක්නා ඥාණය සමුදය (මෙහි (ii) පටිනිස්සග්ග වශයෙන් දක්නා ඥාණය ආදාන (මෙහි (ii) අනිමිත්ත වශයෙන් දක්නා ඥාණය නිමිත්ත (මෙහි (ii) අප්පණිහිත වශයෙන් දක්නා ඥාණය පණිධි (මෙහි (ii) සුඤ්ඤතානුපස්සනා ඥාණය අභිනිවෙස (මෙහි (ii) මෙසේ වස්තු වශයෙන්ද කරුණු වශයෙන්ද එක් සඤ්ඤා විමොක්ෂයක් සඤ්ඤා විමොක්ෂ දශයක් වෙත්. දස සඤ්ඤා විමොක්ෂය එක් සඤ්ඤා විමොක්ෂයක් වෙයි. යන ක්‍රමය වන්නේය. (v) දස සඤ්ඤා විමොක්ෂය එක් සඤ්ඤා විමොක්ෂයක් වෙයි.

37. රූපයෙහි (මෙහි (i) (ii) (iii) (iv) යොදන්න.) (මේ වචන අගට 35 (i) (ii) (iii) (iv) යොදන්න) වෙදනාවෙහි- සඤ්ඤාවෙහි- සංඛාරයන්හි- විඤ්ඤාණයෙහි- ඇසෙහි- කණෙහි- නාසයෙහි- දිවෙහි- කයෙහි- සිතෙහි- ජරාමරණයෙහි”- මෙය සඤ්ඤා විමොක්ෂ නම්.

38. ඥාණ විමොක්ෂය කවරේද? (i) වස්තු වශයෙන්ද කරුණු වශයෙන්ද එක් ඥාණවිමොක්ෂයක් ඥාණ විමොක්ෂ දසයක් වෙත්. ඥාණවිමොක්ෂ දසයක් එක් ඥාණ විමොක්ෂයක් වෙයි. යන ක්‍රමය වන්නේය. (ii) කෙසේ වන්නේද? (iii) අනිත්‍ය වශයෙන් දක්නා යථාභූත ඥානය නිත්‍ය වශයෙන් සලකන්නාවූ (iv) මුළාවෙන් නුනුවණින් මිදේනුයි ඥාන විමොක්ෂ නම්. (v) දුක් වශයෙන් දක්නා යථාභූත ඥානය සැප වශයෙන් සලකන්නාවූ (මෙහි (iv) අනාත්ම වශයෙන් දක්නා යථාභූත ඥානය ආත්ම වශයෙන් සලකන්නාවූ (මෙහි (iv) කලකිරීම් වශයෙන් දක්නා යථාභූත ඥානය තෘෂ්ණා සහගත සතුටෙන් සතුටුවන්නාවූ (මෙහි (iv) විරාග වශයෙන් දක්නා යථාභූත ඥානය රාගයෙන් ඇලෙන්නාවූ (මෙහි (iv) නිරොධ වශයෙන් දක්නා යථාභූත ඥානය ඉපදීමේ හෙතුව නොදක්නා (මෙහි (iv) පටිනිස්සග්ග වශයෙන් දක්නා යථාභූත ඥානය අල්වා ගැනීම් වශයෙන් පවත්නා (මෙහි (iv) අනිමිත්තවශයෙන් දක්නා යථාභූත ඥානය නිමිත්ත වශයෙන් දක්නා (මෙහි (iv) අප්පණිහිත වශයෙන් දක්නා යථාභූත ඥානය පණිධි වශයෙන් දක්නා (මෙහි (iv) සුඤ්ඤත වශයෙන් දක්නා යථාභූත ඥානය

අභිනිවෙස වශයෙන් දක්නා (මෙහි (iv) වශයෙන්ද (මෙහි (i) යොදන්න)

**39.** රූපයෙහි (මෙහි 38 (iii) සිට අගට යොදන්න.) "වේදනාවෙහි" 'සඤ්ඤාවෙහි' 'සංඛාරයන්හි' 'විඤ්ඤාණයෙහි' 'ඇසෙහි' කණෙහි' 'නාසයෙහි' 'දිවෙහි' 'කයෙහි' 'සිතෙහි' 'ජරාමරණයෙහි' මෙය ඥාන විමොක්ෂ නමි.

**40.** සීතිසියා විමොක්ෂය (සිසිල් බව වන්නේ යයි පවත්නා විමොක්ෂය) කවරේද? (i) වස්තු වශයෙන් කරුණු වශයෙන් එක් සීතිසියා විමොක්ෂයක් සීතිසියා විමොක්ෂ දසයක් වෙත්. සීතිසියා විමොක්ෂ දසය එක් සීතිසියා විමොක්ෂයක් වෙයි. යන ක්‍රමය වන්නේය. (ii) කෙසේ වන්නේද? (iii) අනිත්‍ය වශයෙන් දක්නා උතුම් සීතිභාව (සිසිල් බව ඇති කරන්නාවූ) ඤාණය නිත්‍ය වශයෙන් ගැනීමෙන් (iv) පවත්නා තැවීම් දැවීම් දාහයන් කෙරෙන් මිදේනුයි සීතිසියා විමොක්ෂ නමි. (v) දුක් වශයෙන් දක්නා උතුම් සීතිභාව ඤාණය සුඛ වශයෙන් (මෙහි (iv) දැකීමෙන් අනාත්ම වශයෙන් දක්නා උතුම් සීතිභාව ඤාණය ආත්ම වශයෙන් ගැනීමෙන් (මෙහි (iv) කලකිරීම් වශයෙන් දක්නා උතුම් සීතිභාව ඥානය තෘෂ්ණා සහගත සතුටෙන් (මෙහි (iv) විරාග වශයෙන් දක්නා උතුම් සීතිභාව ඥානය රාගයෙන් (මෙහි (iv) නිරොධ වශයෙන් දක්නා උතුම් සීතිභාව ඥානය ඉපදීම් වශයෙන් (මෙහි (iv) පටිනිස්සග්ග වශයෙන් දක්නා උතුම් සීතිභාව ඥානය අල්වා ගැනීමෙන් (මෙහි (iv) අනිමිත්ත වශයෙන් දක්නා උතුම් සීතිභාව ඥානය නිමිති වශයෙන් ගැනීමෙන් (මෙහි (iv) අප්පණිහිත වශයෙන් දක්නා උතුම් සීතිභාව ඥානය ප්‍රණිධියෙන් (මෙහි (iv) සූන්‍ය වශයෙන් දක්නා උතුම් සීතිභාව ඥානය ආත්ම වශයෙන් ගැනීමෙන් (මෙහි (iv) (i)

**41.** රූපයෙහි (මෙහි 10 (iii) (i) යොදන්න) (මේ වාක්‍ය අගට 40 ඡේදයේ (iii) (i) යොදන්න) "වේදනාවෙහි, සඤ්ඤාවෙහි, සංඛාරයන්හි, විඤ්ඤාණයෙහි, ඇසෙහි, කණෙහි, නාසයෙහි, දිවෙහි, කයෙහි, සිතෙහි, ජරාමරණයෙහි" මිදේනුයි මෙය සීතිසියා විමොක්ෂ නමි.

**42.** ධ්‍යාන විමොක්ෂය කවරේද? දවයි යන අර්ථයෙන් නෛෂ්ක්‍රම්‍යය ඣාන නමි. කාමච්ඡන්දය දවනු ලබන හෙයින් ක්ධාන නමි. දවමින් මිදෙන හෙයින් ක්ධාන විමොක්ෂ නමි. දවනුලබමින් මිදෙන හෙයින් ක්ධාන විමොක්ඛ නමි. ධර්මයෙහි දවන්නෝයි ක්ලේශයෝ දවනු ලබන්නෝයි දවන ධර්මයන්ද දවනු ලබන ක්ලේශයන්ද ප්‍රකාරයෙන් දනීනුයි ක්ධාන විමොක්ඛ නමි. දවන හෙයින් ඣාන නමි. ව්‍යාපාදය දවනු ලබන හෙයින් ඣාන නමි. දවමින් (ii) මිදෙන හෙයින් ක්ධාන විමොක්ඛ නමි. (iii) දවනු ලබන (මෙහි (ii) දවත් යනු ධර්මයෝ දවනු ලබත් යනු ක්ලේශයෝයි. දවන්නන්ද දවනු ලබන්නන්ද දනිනුයි ක්ධාන විමොක්ඛ නමි. දවන හෙයින් ආලොක සංඥාව ක්ධාන නමි. ථීනමිද්ධය දවනු ලබන හෙයින් ඣාන නමි. සමාධිය (iv) දවන හෙයින් ඣාන නමි. (v) උද්ධච්චය (vi) දවනු ලබන හෙයින් ඣාන නමි. (vii) ධර්මයන් පිරිසිඳ දැකීම් (මෙහි (iv) විචිකිච්ඡාව (මෙහි (vi) ඥානය (මෙහි (iv) අවිද්‍යාව (මෙහි (vi) ප්‍රමොද්‍යය (මෙහි (iv) නොඇල්ම (මෙහි (vi) ප්‍රථම ධ්‍යානය (මෙහි (iv) නීවරණයන් (මෙහි (vi) අර්හත් මාර්ගය (මෙහි (iv) සියලු ක්ලේශයන් (මෙහි (vi) දවමින් මිදේනුයි ක්ධාන විමොක්ඛ නමි, දවනු ලබමින් මිදෙන හෙයින් ක්ධාන විමොක්ඛ නමි. දවන්නන්ද දවනු ලබන්නන්ද දනීනුයි ඣාන විමොක්ඛ නමි. මෙය ධ්‍යාන විමොක්ෂ නමි.

**43.** උපාදානයන් කෙරෙන් සිත මිදෙන්නාවූ විමොක්ෂය (අනුපාද චිත්ත විමොක්ෂය) කවරේද? (i) වස්තු වශයෙන් කරුණු වශයෙන් එක් අනුපාදා චිත්ත විමොක්ෂයක් අනුපාදා චිත්ත විමොක්ෂ දසයක් වෙත්. අනුපාදා චිත්ත විමොක්ෂ දසයක් එක් අනුපාදා චිත්ත විමොක්ෂයක් වෙයි. යන ක්‍රමය වන්නේය. (ii) කෙසේ වන්නේද? (iii) අනිත්‍ය වශයෙන් දක්නා ඤාණය නිත්‍ය වශයෙන් ගන්නා (iv) උපාදානයෙන් මිදේනුයි අනුපාදා චිත්ත විමොක්ෂ නමි. (v) දුක් වශයෙන් දක්නා ඤාණය සුඛ වශයෙන් ගන්නා (මෙහි (iv) අනාත්ම වශයෙන් දක්නා ඤාණය ආත්ම වශයෙන් ගන්නා (මෙහි (iv) කලකිරීම් වශයෙන් දක්නා

ඤාණය තෘෂ්ණා සහගත සතුට වශයෙන් පවත්නා (මෙහි (iv) විරාග වශයෙන් දක්නා ඤාණය රාග වශයෙන් පවත්නා (මෙහි (iv) නිරොධ වශයෙන් දක්නා ඤාණය ඉපදීම් වශයෙන් පවත්නා (මෙහි (iv) පටිනිස්සග්ග වශයෙන් පවත්නා ඤාණය අල්වා ගැනීම් වශයෙන් පවත්නා (මෙහි (iv) අනිමිත්ත වශයෙන් දක්නා ඤාණය නිමිත්ත වශයෙන් ගන්නා (මෙහි (iv) අප්පණිහිත වශයෙන් දක්නා ඤාණය ප්‍රණිධි වශයෙන් පවත්නා (මෙහි (iv) (i) යොදන්න) සුඤ්ඤත වශයෙන් පවත්නා ඤාණය ආත්මයයි ගන්නා මෙහි (iv)

**44.** රූපයෙහි (මෙහි 43 (iii) සිට ඡේදය අග දක්වා යොදන්න) (මේ වචන අගට 43 (iii) සිට අග දක්වා යොදන්න) වේදනාවෙහි, සඤ්ඤාවෙහි, සංඛාරයන්හි, විඤ්ඤාණයෙහි, ඇසෙහි, කණෙහි, නාසයෙහි, දිවෙහි, කයෙහි, සිතෙහි, ජරාමරණයෙහි

**45.** අනිත්‍ය වශයෙන් දක්නා ඤාණය කෙතෙක් උපාදානයන් කෙරෙන් මිදෙයිද? දුක් වශයෙන් දක්නා ඤාණය කෙතෙක් උපාදානයන් කෙරෙන් මිදෙයිද? අනාත්ම වශයෙන් දක්නා ඤාණය කෙතෙක් උපාදානයන් කෙරෙන් මිදෙයිද? කලකිරීම් වශයෙන් දක්නා ඤාණය, විරාග වශයෙන් දක්නා ඤාණය, නිරොධ වශයෙන් දක්නා ඤාණය, පටිනිස්සග්ග වශයෙන් දක්නා ඤාණය, නිමිත්ත වශයෙන් දක්නා ඤාණය අප්පණිහිත වශයෙන් දක්නා ඤාණය, සුඤ්ඤත වශයෙන් දක්නා ඤාණය කෙතෙතක් උපාදානයන් කෙරෙන් මිදෙයිද?

**46.** අනිත්‍ය වශයෙන් දක්නා ඤාණය උපාදාන තුනක් කෙරෙන් මිදෙයි. දුක් වශයෙන් දක්නා ඤාණය එක් උපාදනයකින් මිදෙයි, අනාත්ම වශයෙන් දක්නා ඤාණය උපාදාන තුනක් කෙරෙන් මිදෙයි, කලකිරීම් වශයෙන් දක්නා ඤාණය එක් උපාදානයකින් මිදෙයි, විරාග වශයෙන් දක්නා ඤාණය එක් උපාදානයකින් මිදෙයි. නිරොධ වශයෙන් දක්නා ඤාණය උපාදාන සතරකින් මිදෙයි. පටිනිස්සග්ග වශයෙන් දක්නා ඤාණය උපාදාන සතරකින් මිදෙයි. අනිමිත්ත වශයෙන්

දක්නා ඥාණය උපාදාන තුනකින් මිදෙයි. අප්පණිහිත වශයෙන් දක්නා ඥාණය එක් උපාදනයකින් මිදෙයි. සුඤ්ඤත වශයෙන් දක්නා ඥාණය උපාදාන තුනකින් මිදෙයි.

47. (i) අනිත්‍ය වශයෙන් දක්නා ඥාණය (ii) කවර උපාදාන තුනකින් මිදෙයිද? (iii) දිට්ඨි උපාදානයෙන්ද, සීලබ්බත උපාදනයෙන්ද, අත්තවාද උපාදානයෙන්ද වෙයි. (මෙහි (ii) මේ උපාදාන තුනෙන් මිදෙයි.

48. දුක් වශයෙන් දක්නා ඥාණය (ii) කවර එක් උපාදානයකින් මිදෙයිද? කාමූපාදානයෙන් මිදෙයි.

49. දුක් වශයෙන් දක්නා මේ එක් උපාදානයෙන් මිදෙයි.

50. (i) අනාත්ම වශයෙන් දක්නා ඥාණය (ii) කවර තුන් උපාදානයකින් මිදෙයිද? දිට්ඨි උපාදානයෙන්ද, සීලබ්බත උපාදානයෙන්ද, අපවාද උපාදානයෙන්ද මිදෙයි. (මෙහි (i) මේ තුන් උපාදානයන් කෙරෙන් මිදෙයි.

51. කලකිරීම් වශයෙන් දක්නා ඥාණය (ii) 47 (ii) කාමූපාදානයෙන් මිදෙයි.

52. (i) කලකිරීම් වශයෙන් දක්නා ඥාණය (ii) මේ එක් උපාදානයෙන් මිදෙයි.

53. (i) නිරොධ වශයෙන් දක්නා ඥාණය (ii) කවර උපාදාන සතරකින් මිදෙයිද? (iii) කාම උපාදානයෙන්ද, දිට්ඨි උපාදානයෙන්ද සීලබ්බත උපාදානය කෙරෙන්ද, අත්තවාද උපාදානය කෙරෙන්ද මිදෙයි. (මෙහි (i) මේ උපාදාන සතර කෙරෙන් මිදෙයි.

54. (i) පටිනිස්සග්ග වශයෙන් දක්නා ඥාණය (ii) (මෙහි 53 (ii) කාමූපාදානය කෙරෙන්ද දිට්ඨි උපාදානය කෙරෙන්ද, සීලබ්බත උපාදානය කෙරෙන්ද, අත්තවාද උපාදානය කෙරෙන්ද මිදෙයි. (මෙහි (i) මේ සතර උපාදානයන් කෙරෙන් මිදෙයි.

55. (i) අනිමිත්ත වශයෙන් දක්නා ඥාණය (ii) කවර කිනම් උපාදාන තුනකින් මිදෙයිද? දිට්ඨි උපාදානයෙන්ද සීලබ්බත උපාදානයෙන්ද, අත්තවාද උපාදානයෙන්ද මිදෙයි. මෙහි (i) මේ උපාදාන තුනෙන් මිදෙයි.

**56.** අප්පණිහිත වශයෙන් දක්නා ඥානය (ii) කවර එක් උපාදානයකින් මිදෙයිද? කාමූපාදානයෙන් මිදෙයි (මෙහි (i) මේ එක් උපාදානයෙන් මිදෙයි.

**57.** (i) සුඤ්ඤත වශයෙන් දක්නා ඤාණය (ii) (මෙහි 47 (ii) (iii) දිට්ඨි උපාදානයෙන්ද, සීලබ්බතපරාමාස උපාදානයෙන්ද, අත්තවාද උපාදානයෙන්ද මිදෙයි. (මෙහි (i) මේ තුන් උපාදානයෙන් මිදෙයි.

**58.** යම් අනිත්‍ය වශයෙන් දක්නා ඤාණයක් වේද, යම් අනාත්ම වශයෙන් දක්නා ඤාණයක් වේද, යම් අනිමිත්ත වශයෙන් දක්නා ඤාණයක් වේද, යම් සුඤ්ඤත වශයෙන් දක්නා ඤාණයක් වේද, මේ ඤාණ සතර දිට්ඨි උපාදාන සීලබ්බත උපාදාන අත්තවාද උපාදාන යන මේ උපාදාන තුනෙන් මිදෙත්.

**59.** දුක් වශයෙන් දක්නා යම් ඤාණයක් වේද කලකිරීම් වශයෙන් දක්නා යම් ඤාණයක් වේද, විරාග වශයෙන් දක්නා යම් ඤාණයක් වේද, අප්පණිහිත වශයෙන් දක්නා යම් ඤාණයක් වේද මේ ඥාණ සතර කාමූපාදානයවූ එක් උපාදානයකින් මිදෙයි.

**60.** යම් නිරොධානු වහයෙන් දක්නා ඤාණයක් වේද, යම් පටිනිස්සග්ග වශයෙන් දක්නා ඤාණයක් වේද, මේ ඤාණ දෙක කාමූපාදානයෙන්ද දිට්ඨි උපාදානයෙන්ද සීලබ්බත උපාදානයෙන්ද, අත්තවාද උපාදානයෙන්ද යන සතර උපාදානයන් කෙරෙන් මිදෙයි.

මෙය අනුප්පදා චිත්ත විමොක්ෂ නමි.

(විමොක්ෂ කථාවෙහි පළමුවැනි බණ වරයි)

**61.** මහණෙනි, මේ විමොක්ෂ මුඛ තුනක් ලොකයෙන් එතෙරවීම පිණිස පවතිත්, සියලු සංස්කාරයන් ඉපදීම් බිඳීම් දෙකින් පිරිසිඳී පවත්නේයයි දක්නා ස්වභාවයෙන්ද අනිමිත්ත ධාතුවට සිත යවන ස්වභාවයෙන්ද ලොකයෙන් එතර වෙයි. සියලු සංස්කාරයන් කෙරෙහි සංවේගය ඇතිකිරීම් වශයෙන්ද අප්පණිහිත ධාතුවට සිත යවන ස්වභාවයෙන්ද ලොකයෙන් එතෙරවෙයි සියලු ධර්මයන් තමා නොවන ආකාරයෙන් දැකීම් වශයෙන්ද සුඤ්ඤත ධාතුවට සිත යවන ස්වභාවයෙන්ද ලොකයෙන් එතර වෙයි.

**62.** අනිත්‍ය (ii) වශයෙන් මෙනෙහි කරන්නාහට සංස්කාරයෝ කෙසේ වැටහෙත්ද? (iii) දුක් (මෙහි (ii) අනාත්ම (මෙහි (ii) අනිත්‍ය (iv) වශයෙන් මෙනෙහි කරන්නාහට සංස්කාරයෝ (v) ක්ෂයවීම් වශයෙන් වැටහෙත්. දුක් (මෙහි (iv) භය වශයෙන් වැටහෙත්. අනාත්ම (මෙහි (iv) සූන්‍ය වශයෙන් වැටහෙත්.

**63.** අනිත්‍ය (ii) වශයෙන් මෙනෙහි කරන්නාහට කුමක් බහුල සිතක් පවත්නේද (iii) දුක් (මෙහි (ii) අනාත්ම (මෙහි (ii) අනිත්‍ය (iv) වශයෙන් මෙනෙහි කරන්නාහට (v) ශ්‍රද්ධාව බහුල සිත් වෙයි. දුක් (මෙහි (iv) පස්සද්ධිය බහුල සිත් වෙයි. අනාත්ම (මෙහි (iv) ප්‍රඥාව බහුල සිත්වෙයි.

**64.** අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාවූ ශ්‍රද්ධාව (ii) බහුලවූ පුද්ගලතෙම කිනම් ඉන්ද්‍රියයක් ලබයිද? (iii) දුක් වශයෙන් මෙනෙහි කරන්නාවූ පස්සද්ධිය (මෙහි (ii) අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාවවූ ප්‍රඥාව (මෙහි (ii) අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාවූ ශ්‍රද්ධාව බහුල පුද්ගලයා සද්ධින්ද්‍රිය ලබයි. දුක් වශයෙන් මෙනෙහි කරන්නාහු පස්සද්ධිය බහුල පුද්ගලයා සමාධින්ද්‍රිය ලබයි. අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාවූ ප්‍රඥාව බහුල පුද්ගලයා පඤ්ඤින්ද්‍රිය ලබයි.

**65.** අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාවූ ශ්‍රද්ධාව (ii) බහුල පුද්ලයාට කිනම් ඉන්ද්‍රියයක් අධිපති වෙයිද? (iii) දුක් වශයෙන් මෙනෙහි කරන්නාවූ පස්සද්ධිය (මෙහි (ii) අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාවූ පඤ්ඤින්ද්‍රිය (මෙහි (ii) යොදන්න) (iv) භාවනාවෙහි කෙතෙක් ඉන්ද්‍රියයෝ ඊට අනුගත වෙත්ද? සහජාත ප්‍රත්‍ය වෙත්ද, අඤ්ඤ මඤ්ඤ ප්‍රත්‍ය වෙත්ද, නිශ්‍රය ප්‍රත්‍ය වෙත්ද, සම්ප්‍රයුක්ත ප්‍රත්‍ය වෙත්ද, සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්ද, කිනම් ස්වභාවයෙක් භාවනා (වැඩීම) වෙයිද? කවරෙක් වඩයිද? (v)

**66.** දුක් වශයෙන් මෙනෙහි කරන්නාවූ පස්සද්ධි (මෙහි (ii) (iv) යොදන්න)

**67.** අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාවූ ප්‍රඥාව බහුල පුද්ගලයාහට කිනම් ඉන්ද්‍රියයක් අධිපති වෙයිද? (මෙහි 65 (iv) යොදන්න)

**68.** අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාවූ ශ්‍රද්ධා බහුල පුද්ගලයාහට සද්ධින්ද්‍රිය අධිපති වෙයි. (ii) භාවනාවෙහි ඉන්ද්‍රිය සතරක් ඊට අනුගත වෙත්. සහජාත ප්‍රත්‍ය වෙත්, අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය වෙත්. නිස්සය ප්‍රත්‍ය වෙත්. සම්ප්‍රයුක්ත ප්‍රත්‍ය වෙත්. සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. සමාන කෘත්‍ය ස්වභාවයෙන් වැඩීම වෙයි, යමෙක් මනාව පිළිපන්නේද හෙතෙම වඩයි. වරදවා පිළිපන් පුද්ගලයාට ඉන්ද්‍රිය භාවනාවක් නැත.

**69.** දුක් වශයෙන් මෙනෙහි කරන්නාවූ පස්සද්ධිය බහුල පුද්ගලයාහට සමාධින්ද්‍රිය අධිපති වෙයි. (මෙහි 68 (ii) යොදන්න)

**70.** අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාවූ ප්‍රඥාව බහුල පුද්ගලයාහට පඤ්ඤින්ද්‍රිය අධිපති වෙයි. (මෙහි 68 (ii) යොදන්න)

**71.** අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාවූ ශ්‍රද්ධාව (ii) බහුල පුද්ගලයාහට කිනම් ඉන්ද්‍රියයක් අධිපති වෙයිද භාවනාවෙහි කෙතෙක් ඉන්ද්‍රියයෝ ඊට අනුගත වෙත්ද? සහජාත ප්‍රත්‍ය වෙත්ද, අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය වෙත්ද, නිස්සය ප්‍රත්‍ය වෙත්ද, සම්ප්‍රයුක්ත ප්‍රත්‍ය වෙත්ද, (චතුස්සත්‍ය) ප්‍රතිවෙධ කාලයෙහි කිනම් ඉන්ද්‍රියයක් අධිපතිවෙයිද ප්‍රතිවෙධය පිණිස කෙතෙක් ඉන්ද්‍රියයෝ ඊට අනුගත වෙත්ද? සහජාත ප්‍රත්‍ය වෙත්ද, අඤ්ඤ මඤ්ඤ ප්‍රත්‍ය වෙත්ද, නිස්සය ප්‍රත්‍ය වෙත්ද, සම්ප්‍රයුක්ත ප්‍රත්‍ය වෙත්ද, සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්ද, කිනම් ස්වභාවයෙන් වැඩීම වෙයිද කිනම් ස්වභාවයෙන් ප්‍රතිවෙධය වෙයිද? (iii) දුක් වශයෙන් මෙනෙහි කරන්නාවූ පස්සද්ධිය (මෙහි 71 (ii) යොදන්න)

**72.** අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාවූ ශ්‍රද්ධාව බහුල පුද්ගලයාට සද්ධින්ද්‍රිය අධිපති වෙයි (ii) භාවනාවෙහි ඉන්ද්‍රිය සතරක් ඊට අනුගත වෙත්. සහජාත ප්‍රත්‍ය වෙත්, අඤ්ඤ මඤ්ඤ ප්‍රත්‍ය වෙත්. නිස්සය ප්‍රත්‍ය වෙත්. සම්ප්‍රයුක්ත ප්‍රත්‍ය වෙත්. ප්‍රතිවෙධ කාලයෙහි පඤ්ඤින්ද්‍රිය අධිපති වෙයි. ප්‍රතිවෙධය පිණිස ඉන්ද්‍රිය සතරක් ඊට අනුගත වෙත්, සහජාත ප්‍රත්‍ය වෙත්, (iii) සම්ප්‍රයුත්ත ප්‍රත්‍ය වෙත්, නිස්සය ප්‍රත්‍ය වෙත්, සම්ප්‍රයුත්ත ප්‍රත්‍ය වෙත්, සමාන කෘත්‍ය ස්වභාවයෙන් වැඩීම වෙයි,

චතුස්සත්‍ය දැකීම් ස්වභාවයෙන් ප්‍රතිවෙධය වෙයි. මෙසේ ප්‍රතිවෙධ කරන්නේද ඉන්ද්‍රියයන් වඩයි. ඉන්ද්‍රියයන් වඩන්නේද ප්‍රතිවෙධ කරයි.

**73.** දුක් වශයෙන් මෙනෙහි කරන්නාවූ පස්සද්ධි බහුල පුද්ගලයාහට සමාධින්ද්‍රිය අධිපති වෙයි. (මෙහි 72 (ii) යොදන්න) අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය වෙත්. නිස්සය ප්‍රත්‍ය වෙත්. සම්ප්‍රයුක්ත ප්‍රත්‍ය වෙත්. සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. සමාන කෘත්‍ය ස්වභාවයෙන් වැඩීම වෙයි. සත්‍ය දැකීම් ස්වභාවයෙන් ප්‍රතිවෙධය වෙයි. මෙසේ ප්‍රතිවෙධ කරන්නේද ඉන්ද්‍රියයන් වඩයි, ඉන්ද්‍රියයන් වඩන්නේද ප්‍රතිවෙධ කරයි.

**74.** අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාවූ ප්‍රඥාව බහුල පුද්ගලයාහට පඤ්ඤින්ද්‍රිය අධිපති වෙයි. (මෙහි 72 (ii) යොදන්න) අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය වෙත්, නිස්සය ප්‍රත්‍ය වෙත්. සම්ප්‍රයුත්ත ප්‍රත්‍ය වෙත්. සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. සමාන කෘත්‍ය ස්වභාවයෙන් වැඩීම වෙයි, සත්‍යය දැකීම් ස්වභාවයෙන් ප්‍රතිවෙධය වෙයි. මෙසේ ප්‍රතිවෙධ කරන්නේද ඉන්ද්‍රියයන් වඩයි. ඉන්ද්‍රියයන් වඩන්නේද ප්‍රතිවෙධ කරයි.

**75.** අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට කිනම් ඉන්ද්‍රියයක් අධික වෙයිද, කිනම් ඉන්ද්‍රියයක් අධිකවූ හෙයින් සද්ධා විමුක්ත නම් වේද, දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට කිනම් ඉන්ද්‍රියයක් අධික වෙයිද, කිනම් ඉන්ද්‍රියයක් අධිකවූ හෙයින් කාය සක්ඛී නම් වේද, අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට කිනම් ඉන්ද්‍රියයක් අධික වෙයිද? කිනම් ඉන්ද්‍රියයක් අධිකවූ හෙයින් දිට්ඨිප්පත්ත නම් වේද? අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට සද්ධින්ද්‍රිය අධික වෙයි. සද්ධින්ද්‍රිය අධිකවූ හෙයින් සද්ධාවිමුත්ත නම් වෙයි. දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට සමාධින්ද්‍රිය අධික වෙයි. සමාධින්ද්‍රිය අධිකවූ හෙයින් කායසක්ඛි නම් වෙයි. අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට පඤ්ඤින්ද්‍රිය අධික වෙයි, පඤ්ඤින්ද්‍රිය අධිකවූ හෙයින් දිට්ඨිප්පත්ත නම් වෙයි.

**76.** ශ්‍රද්ධාවෙන් ඇදහීමෙන් මිදුණේනුයි සද්ධාවිමුත්ත නම් නුවණින් ස්පර්ශ කරනලද හෙයින් ප්‍රත්‍යක්ෂ කරන ලද හෙයින්

කාය සක්ඛී නම්. දක්නා ලද හෙයින් පැමිණියේනුයි දිට්ඨිප්පත්ත නම්. අදහමින් මිදෙනුයි සද්ධාවිමුක්ත නම්. ධ්‍යාන ස්පර්ශය පළමුව ස්පර්ශ කරයි. පසුව නිරොධයවූ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කෙරේනුයි කාය සක්ඛී නම්. සංස්කාරයෝ දුක් සහ නිරොධය සැපයයි දැනගන්නා ලද්දේ වෙයි. දක්නා ලද්දේ වෙයි. දැනගන්නා ලද්දේ වෙයි. ප්‍රත්‍ය කරන ලද්දේ වෙයි, ප්‍රඥාවෙන් ස්පර්ශ කරන ලද්දේනුයි. දිට්ඨිප්පත්ත නම්. යම් පුද්ගලයෙක් සද්ධවිමුත්ත නම් වෙයිද, යම් පුද්ගලයෙක් කාය සක්ඛීනම් වෙයිද, යම් ඒ පුද්ගලයෙක් දිට්ඨිප්පත්ත නම් වෙයිද, යම් පුද්ගලයෝ තිදෙන වස්තු වශයෙන් පර්යාය වශයෙන් සද්ධාවිමුත්ත වූවාහුද, කායසක්ඛී වූවාහුද, දිට්ඨිප්පත්ත වූවාහුද වෙති. කෙසේ වන්නාහුද?

77. අනිත්‍ය වශයෙන් (ii) මෙනෙහි කරන්නාහට සද්ධින්ද්‍රිය අධික වේද, සද්ධින්ද්‍රිය අධිකවූ හෙයින් සද්ධාවිමුත්ත නම් වෙයි. (ii) දුක් වශයෙන් (මෙහි (ii) අනාත්ම වශයෙන් (මෙහි (ii) මෙසේ මේ පුද්ගලයෝ තිදෙන සද්ධින්ද්‍රියයාගේ වශයෙන් සද්ධා විමුත්ත නම් වෙත්.

78. දුක් වශයෙන් (ii) මෙනෙහි කරන්නාහට සමාධින්ද්‍රිය බලවත් වේද, සමාධින්ද්‍රිය අධිකවූ හෙයින් කාය සක්ඛී නම් වෙයි. (iii) අනාත්ම වශයෙන් (මෙහි (ii) අනිත්‍ය වශයෙන් (මෙහි (ii) මෙසේ මේ පුද්ගලයෝ තිදෙන සමාධින්ද්‍රියයාගේ වශයෙන් කාය සක්ඛී නම් වෙත්.

79. අනාත්ම වශයෙන් (ii) මෙනෙහි කරන්නාහට පඤ්ඤින්ද්‍රිය අධික වෙයි. පඤ්ඤින්ද්‍රිය අධිකවූ හෙයින් දිට්ඨිප්පත්ත නම් වෙයි. (iii) අනිත්‍ය වශයෙන් (මෙහි (ii) දුක් වශයෙන් (මෙහි (ii) මෙසේ පුද්ගලයෝ තිදෙන පඤ්ඤින්ද්‍රියයාගේ වශයෙන් දිට්ඨප්පත්ත නම් වෙත්.

80. (i) යම් පුද්ගලයෙක් සද්ධාවිමුත්ත නම් වෙයිද, යම් ඒ පුද්ගලයෙක් කාය සක්ඛී නම් වෙයිද, යම් ඒ පුද්ගලයෙක් දිට්ඨප්පත්ත නම් වෙයිද, මෙසේ මේ පුද්ගලයෝ තිදෙන වස්තු වශයෙන් කරුණු වශයෙන් සද්ධාවිමුත්ත වූවාහුද කාය සක්ඛී වූවාහුද දිට්ඨප්පත්ත වූවාහුද (ii) වෙත්. (මෙහි (i) යොදන්න)

(iii) අනිකෙක්ම සද්ධා විමුත්ත නම් වූවාහුද වෙයි. අනිකෙක්ම කාය සක්ඛී නම් වෙයි. අනිකෙක්ම දිට්ඨප්පත්ත නම් වෙයි.

81. කෙසේ වන්නේද? අනිත්‍ය වශයෙන් (ii) මෙනෙහි කරන්නාහට සද්ධින්ද්‍රිය අධික වෙයි. සද්ධින්ද්‍රිය අධිකවූ හෙයින් සද්ධා විමුත්ත නම් වෙයි. දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට සමාධින්ද්‍රිය අධික වෙයි. සමාධින්ද්‍රිය අධිකවූ හෙයින් කාය සක්ඛී නම් වෙයි. අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට පඤ්ඤින්ද්‍රිය අධික වෙයි. පඤ්ඤින්ද්‍රිය අධිකවූ හෙයින් දිට්ඨප්පත්ත නම් වෙයි. (මෙහි 80 (i) (iii) යොදන්න)

82. අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට සද්ධින්ද්‍රිය අධික වෙයි. සද්ධින්ද්‍රිය අධිකවූ හෙයින් සොතාපත්ති මාර්ගය ලබයිද, (i) එහෙයින් සද්ධානුසාරී පුද්ගලයායයි කියනු ලැබේ. (ii) අනෙක් ඉන්ද්‍රියයන් සතර ඊට අනුගත වෙත්. සහජාත ප්‍රත්‍ය වෙත්. අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය වෙත්. නිස්සය ප්‍රත්‍ය වෙත්. සම්ප්‍රයුක්ත ප්‍රත්‍ය වෙත්. සද්ධින්ද්‍රියයාගේ වශයෙන් ඉතිරි සතර ඉන්ද්‍රියයන්ගේ වැඩීම වෙයි. (iii) යම්කිසි කෙනෙක් සද්ධින්ද්‍රියයාගේ වශයෙන් සොතාපත්ති මාර්ගය ලබත් නම් ඒ සියල්ලෝ සද්ධානුසාරී නම් වෙත්.

83. (i) අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට සද්ධින්ද්‍රිය අධික වේද, සද්ධින්ද්‍රිය අධිකවූ හෙයින් (ii) සොතාපත්ති ඵලය ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ වෙයිද එහෙයින් සද්ධාවිමුත්ත යයි කියනු ලැබේ. (මෙහි 82 (ii) මනාව වඩන ලද්දාහු වෙත්. යම්කිසි කෙනෙකු විසින් සද්ධින්ද්‍රියයාගේ වශයෙන් සොතාපත්ති ඵලය ප්‍රත්‍ය කරන ලද්දේද ඒ සියල්ලෝ සද්ධාවිමුත්ත නම් වෙත්.

84. (මෙහි 82, 83 ඡේද යෙදීමේදී "සොතාපත්ති" වෙනුවට පිළිවෙලින් සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන වචන යෙදිය යුතුයි.)

85. දුක් වශයෙන් (i) මෙනෙහි කරන්නාහට සමාධින්ද්‍රිය අධික වෙයි. සමාධින්ද්‍රිය අධිකවූ හෙයින් සොතාපත්ති මාර්ග ලබයිද (ii) එහෙයින් කායසක්ඛීයයි කියනු ලැබේ. (iii) සතර ඉන්ද්‍රියයෝ අනුගත වෙත්, සහජාත ප්‍රත්‍ය වෙත්, අඤ්ඤමඤ්ඤ

ප්‍රත්‍ය වෙත්, නිස්සය ප්‍රත්‍ය වෙත්, සම්ප්‍රයුක්ත ප්‍රත්‍ය වෙත්. (iv) සමාධින්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයන්ගේ වැඩීම වෙයි. (iv) යම්කිසි කෙනෙක් සමාධින්ද්‍රියයාගේ වශයෙන් සොතාපත්ති මාර්ගය ලබත්ද ඒ සියල්ලෝ කායසක්ඛී නම් වෙත්.

**86.** දුක් වශයෙන් මෙනෙහි කිරීමෙන් සමාධින්ද්‍රිය අධික වෙයි. සමාධින්ද්‍රිය අධිකවූ හෙයින් සොතාපත්තිඵලය ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ වෙයිද, (ii) සකෘදාගාමි මාර්ගය ලබයිද, සකෘදාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ වේද අනාගාමි මාර්ගය ලබයිද අනාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ වෙයිද, අර්හත් මාර්ගය ලබයිද අර්හත් ඵලය ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ වෙයිද (iii) (මෙහි 85 (ii) (iii) යොදන්න) සම්ප්‍රයුත්ත ප්‍රත්‍ය වෙත්. සමාධින්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ වඩන ලද්දාහු මනාව වඩන ලද්දාහු වෙත්. යම්කිසිවෙකු විසින් සමාධින්ද්‍රියයාගේ වශයෙන් අර්හත් ඵලය ප්‍රත්‍යක්ෂ කරන ලද්දේද ඒ සියල්ලෝ කායසක්ඛී නම් වෙත්.

**87.** (i) අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට පඤ්ඤින්ද්‍රිය අධික වෙයි. පඤ්ඤින්ද්‍රිය අධිකවූ හෙයින් සොතාපත්ති මාර්ගය ලබයිද (iii) එහෙයින් ධම්මානුසාරීයයි කියනු ලැබේ. මෙහි (85) (ii) යොදන්න) (මෙහි 82 (iii)

**88.** (මෙහි 87 (i) ඵලය ප්‍රත්‍යක්ෂ කරන ලද්දේද එහෙයින් දිට්ඨපත්තයයි කියනු ලැබේ. (මෙහි 85 (iii) යොදන්න) පඤ්ඤින්ද්‍රියගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ වඩන ලද්දාහු මනාව වඩන ලද්දාහු වෙත්. යම්කිසිවෙකු විසින් පඤ්ඤින්ද්‍රියයාගේ වශයෙන් (iii) සොතාපත්ති ඵලය ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ ඒ සියල්ලෝ දිට්ඨප්පත්ත නම් වෙත්.

**89.** අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට පඤ්ඤින්ද්‍රිය අධික වෙයි. පඤ්ඤින්ද්‍රිය අධිකවූ හෙයින් (මෙහි 86 (ii) එහෙයින් දිට්ඨප්පත්තයයි කියනු ලැබේ. (මෙහි 85 (iii) මෙහි 86 (ii) යොදන්න) අර්හත් ඵලය ප්‍රත්‍යක්ෂ කරන ලද්දේද ඒ සියල්ලෝ දිට්ඨප්පත්ත නම් වෙත්.

**90.** යම්කිසි කෙනෙක් නෛෂ්ක්‍රම්‍යය (ii) වැඩුවාහුද වඩත්ද වඩන්නාහුද අවබොධ කළාහුද අවබොධ කරත්ද අවබොධ

කරන්නාහුද (iii) පැමිණියාහුද පැමිණෙත්ද පැමිණෙන්නාහුද ලැබුවාහුද ලබත්ද ලබන්නාහුද ප්‍රතිවෙධ කළාහුද ප්‍රතිවෙධ කරත්ද ප්‍රතිවෙධ කරන්නාහුද ප්‍රත්‍යක්ෂ කළාහුද ප්‍රත්‍යක්ෂ කරත්ද ප්‍රත්‍යක්ෂ කරන්නාහුද ස්පර්ශ කළාහුද ස්පර්ශ කරත්ද ස්පර්ශ කරන්නාහුද අධිපතිබවට (iv) පැමිණියාහුද පැමිණෙත්ද පැමිණෙන්නාහුද (v) කෙළවරට (මෙහි (iv) විසාරද බවට (මෙහි (iv) ඒ සියල්ලෝ සද්ධින්ද්‍රියයාගේ වශයෙන් සද්ධාවිමුත්ත නම් වෙත්. සමාධින්ද්‍රියයාගේ වශයෙන් කාය සක්ඛී නම් වෙත්. පඤ්ඤින්ද්‍රියයාගේ වශයෙන් දිට්ඨප්පත්ත නම් වෙත්.

**91.** (i) යම්කිසි කෙනෙක් අව්‍යාපාදය ආලොක සඤ්ඤාව (ii) අවික්ෂෙපය ධර්මයන් පිරිසිඳීම ඤාණය ප්‍රමොද්‍යය ප්‍රථම ධ්‍යානය ද්විතීයධ්‍යානය තෘතීයධ්‍යානය චතුර්ථධ්‍යානය ආකාසානඤ්චායතන සමාපත්තිය විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය අනිච්චානු පස්සනාව දුක්ඛානුපස්සනාව අනත්තානුපස්සනාව නිබ්බිදානුපස්සනාව විරාගානුපස්සනාව නිරොධානුපස්සනාව පටිනිස්සග්ගානු පස්සනාව ඛයානුපස්සනාව වයානුපස්සනාව විපරිණාමානුපස්සනාව අනිමිත්තානුපස්සනාව අප්පණිහිතානුපස්සනාව සුඤ්ඤතානුපස්සනාව අධිපඤ්ඤා ධම්ම විපස්සනාව යථාභූතඥාන දර්ශනය ආදීනවානුපස්සනාව පටිසංඛානුපස්සනාව විවට්ටානුපස්සනාව සොතාපත්ති මාර්ගය සකෘදාගාමි මාර්ගය අනාගාමි මාර්ගය අර්හත් මාර්ගය (මෙහි 90 (ii) (iii) යොදන්න)

**92.** යම්කිසි කෙනෙක් සතර සතිපට්ඨානයන් සතර සම්‍යක් ප්‍රධානයන් සතර ඍද්ධිපාදයන් පංච ඉන්ද්‍රියයන් පංච බලයන් සප්ත බොජ්ක්ධංගයන් ආර්ය අෂ්ටාංගික මාර්ගය (මෙහි 90 (ii) (iii) (iv) යොදන්න)

**93.** යම්කිසි කෙනෙක් අෂ්ට විමොක්ෂයන් (මෙහි 90 (ii) (iii) (iv) යොදන්න)

**94.** යම්කිසි කෙනෙක් ප්‍රතිසම්භිදාවන්ට (මෙහි 90 (iii) යොදන්න) යම්කිසි කෙනෙක් ත්‍රිවිද්‍යාවෝ අවබොධ කළාහුද

අවබොධ කරත්ද, අවබොධ කරන්නාහුද (මෙහි 90 (iii) යෙදීමේදී "සද්ධින්ද්‍රියයාගේ" වෙනුවට "පඤ්ඤින්ද්‍රියයාගේ" යොදන්න) යම්කිසි කෙනෙක් ත්‍රිශික්ෂාවන්හි (මෙහි 90 (ii) (iii) (iv) යොදන්න) යම්කිසි කෙනෙක් දුක පිරිසිඳ දනිත්ද සමුදය පහකරත්ද නිරොධය ප්‍රත්‍යක්ෂ කරත්ද මාර්ගය වඩත්ද, (මෙහි 90 (iv) යොදන්න)

**95.** (i) කෙතෙක් ආකාරයකින් සත්‍ය ප්‍රතිවෙධය (ii) වෙයිද? (මෙහි (i) කරයිද? (iii) සතර ආකාරයකින් සත්‍යප්‍රතිවෙධය (iv) වෙයි (මෙහි (iii) කරයි. දුක්ඛ සත්‍යය පිරිසිඳ දැනගන්නාවූ (v) ප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කරයි. (vi) සමුදය සත්‍යය පහකරන්නාවූ (මෙහි (v) නිරොධසත්‍යය ප්‍රත්‍යක්ෂ කරන්නාවූ (මෙහි (v) මාර්ග සත්‍යය වඩන්නාවූ (මෙහි (v) මේ සතර ආකාරයෙන් සත්‍ය ප්‍රතිවෙධය වෙයි. මේ සතර ආකාරයෙන් සත්‍යයන් ප්‍රතිවෙධ කරන්නේ (vii) (මෙහි 90 (iv) සද්ධාවිමුත්ත නම් වෙත්. සමාධින්ද්‍රියයාගේ වශයෙන් කාය සක්ඛි නම් වෙත්. පඤ්ඤින්ද්‍රියයාගේ වශයෙන් දිට්ඨප්පත්ත නම් වෙත්. (v)

**96.** (මෙහි 95 (i) වෙයිද, කරයිද? (i) නව ආකාරයකින් සත්‍ය ප්‍රතිවෙධය (ii) වෙයි. (මෙහි (i) කරයි. දුක්ඛ සත්‍යය පිරිසිඳ දන්නා (iii) ප්‍රතිවෙධයයන් ප්‍රතිවෙධ කරයි. (iii) සමුදය සත්‍යය පහකරන්නාවූ (මෙහි (iii) නිරොධ සත්‍යය ප්‍රත්‍යක්ෂ කරන්නාවූ (මෙහි (iii) මාර්ග සත්‍යය වඩන්නාවූ (මෙහි (iii) විශෙෂයෙන් දැනීම් වශයෙන් සියලු ධර්මයන්ගේ (iv) ප්‍රතිවෙධය වෙයි (v) පිරිසිඳ දැනීම් වශයෙන් සියලු සංස්කාරයන්ගේ (මෙහි (iv) පහකිරීම් වශයෙන් සියලු අකුසලයන්ගේ (මෙහි (iv) වැඩීම් වශයෙන් සියලු මාර්ගයන්ගේ (මෙහි (iv) ප්‍රත්‍යක්ෂ කිරීම් වශයෙන් නිරොධයාගේ (මෙහි (iv) මේ නව ආකාරයෙන් සත්‍ය (මෙහි (v) මේ නව ආකාරයෙන් සත්‍යයන් ප්‍රතිවෙධ කරන්නේ (මෙහි (90) (iv) යොදන්න)

(දෙවෙනි බණවර නිමි.)

**97.** අනිත්‍ය (ii) වශයෙන් මෙනෙහි කිරීමෙන් කෙසේ සංස්කාරයෝ වැටහෙත්ද? (iii) දුක් (මෙහි (ii) අනාත්ම (මෙහි

(ii) අනිත්‍ය (iv) වශයෙන් මෙනෙහි කිරීමෙන් සංස්කාරයෝ (v) ක්ෂය වශයෙන් වැටහෙත්. දුක් (මෙහි (iv) භය වශයෙන් වැටහෙත්. අනාත්ම (මෙහි (iv) සූන්‍ය වශයෙන් වැටහෙත්.

**98.** අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට කුමක් (ii) බහුල සිත් වෙයිද? (iii) දුක් (මෙහි (ii) අනාත්ම (මෙහි (ii) අනිත්‍ය (iv) වශයෙන් මෙනෙහි කරන්නාහට (v) ශ්‍රද්ධාව බහුල සිත් වෙයි. දුක් (මෙහි (iv) පස්සද්ධිය බහුල සිත් වෙයි. අනාත්ම (මෙහි (iv) ප්‍රඥාව බහුල සිත් වෙයි.

**99.** අනිත්‍ය (ii) වශයෙන් මෙනෙහි කරන්නාවූ ශ්‍රද්ධාව බහුල පුද්ගලයා කිනම් විමොක්ෂයක් ලබයිද (iii) දුක් වශයෙන් මෙනෙහි කිරීමෙන් පස්සද්ධිය (මෙහි (ii) අනාත්ම වශයෙන් මෙනෙහි කිරීමෙන් ප්‍රඥාව (මෙහි (ii) අනිත්‍ය (iv) වශයෙන් මෙනෙහි කිරීමෙන් ශ්‍රද්ධාව බහුල පුද්ගලතෙම අනිමිත්ත විමොක්ෂය ලබයි. දුක් (මෙහි (iv) පස්සද්ධිය බහුල පුද්ගලතෙම අප්පණිහිත විමොක්ෂය ලබයි. අනාත්ම (මෙහි (iv) ප්‍රඥාව බහුල පුද්ගලතෙම සුඤ්ඤත විමොක්ෂය ලබයි.

**100.** අනිත්‍ය වශයෙන් මෙනෙහි කිරීමෙන් ශ්‍රද්ධාව (ii) බහුල පුද්ගලයාහට කිනම් විමොක්ෂයක් අධිපති වේද? භාවනාවෙහි කෙතෙක් විමොක්ෂයෝ ඊට අනුගත වෙත්ද? සහජාත ප්‍රත්‍ය වෙත්ද, අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය වෙත්ද, නිස්සය ප්‍රත්‍ය වෙත්ද, සම්ප්‍රයුක්ත ප්‍රත්‍ය වෙත්ද, සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්ද? කිනම් අර්ථයකින් භාවනා නම් වෙයිද, කවරෙක් වඩයිද, දුක් වශයෙන් මෙනෙහි කිරීමෙන් පස්සද්ධිය බහුල (මෙහි (ii) අනාත්ම වශයෙන් මෙනෙහි කිරීමෙන් ප්‍රඥාව බහුල මෙහි (ii) අනිත්‍ය වශයෙන් මෙනෙහි කිරීමෙන් ශ්‍රද්ධාව බහුල පුද්ගලයාහට අනිමිත්ත විමොක්ෂය අපෙති වෙයි. (iv) භාවනාවෙහි විමොක්ෂ දෙකක් ඊට අනුගත වෙත්, සහජාත ප්‍රත්‍ය වෙත්, අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය වෙත්, නිස්සය ප්‍රත්‍ය වෙත්, සම්ප්‍රයුක්ත ප්‍රත්‍ය වෙත්. සමාන කෘත්‍ය ඇත්තාහුවෙත් සමාන කෘත්‍යාර්ථයෙන් භාවනා නම් වෙයි. යමෙක් මනාව පිළිපන්නේ වෙයිද හෙතෙම වඩයි. වරදවා පිළිපන්නහුට විමොක්ෂ භාවනාවක් නැත.

දුක් වශයෙන් මෙනෙහි කිරීමෙන් පස්සද්ධිය බහුල පුද්ගලයාහට අප්පණිහිත විමොක්ෂය අධිපති වෙයි. (මෙහි (iv) අනාත්ම වශයෙන් මෙනෙහි කිරීමෙන් ප්‍රඥාව බහුල පුද්ගලයා හට සුඤ්ඤත විමොක්ෂය අධිපති වෙයි මෙහි (iv)

**101.** අනිත්‍ය වශයෙන් මෙනෙහි කිරීමෙන් ශ්‍රද්ධා (මෙහි 100 (ii) 'කිනම් අර්ථයකින්' දක්වා යොදන්න) ප්‍රතිවෙධ කාලයෙහි 100 (ii) 'කිනම් විමොක්ෂයක්' යන තැන සිට යොදන්න) කිනම් අර්ථයකින් ප්‍රතිවෙධ නම් වෙයිද?

දුක් වශයෙන් මෙනෙහි කිරීමෙන් පස්සද්ධිය බහුල (මෙහි (ii) 'කිනම් අර්ථයකින්' දක්වා යොදන්න) ප්‍රතිවෙධ කාලයෙහි මෙහි 100 (ii) 'කෙතෙක් විමොක්ෂයෝ' සිට කිනම් අර්ථයකින් දක්වා යොදන්න) ප්‍රතිවෙධ නම් වෙයිද? අනාත්ම වශයෙන් මෙනෙහි කිරීමෙන් ප්‍රඥාව (මෙහි 100 (ii) 'කිනම් අර්ථයකින් දක්වා යොදන්න) ප්‍රතිවෙධ කාලයෙහි කිනම් විමොක්ෂයක් අධිපතිවෙයිද ප්‍රතිවෙධය පිණිස කෙතෙක් විමොක්ෂ ඊට අනුගත වෙත්ද, සහජාත ප්‍රත්‍ය වෙත්ද, අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය වෙත්ද සම්පයුත්ත ප්‍රත්‍ය වෙත්ද සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්ද (මෙහි (ii) නිස්සය ප්‍රත්‍ය වෙත්ද, සම්පයුත්ත ප්‍රත්‍ය වෙත්ද සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්ද, කිනම් අර්ථයෙන් භාවනා වෙයිද, කිනම් අර්ථයෙන් ප්‍රතිවෙධය වෙයිද?

**102.** අනිත්‍ය වශයෙන් මෙනෙහි කිරීමෙන් ශ්‍රද්ධාව බහුල පුද්ගලයාහට අනිමිත්ත විමොක්ෂය අධිපති වෙයි. භාවනාවෙහි (ii) විමොක්ෂ දෙකක් ඊට අනුගත වෙත්. සහජාත ප්‍රත්‍ය වෙත්, අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය වෙත්. නිස්සය ප්‍රත්‍ය වෙත්. සම්ප්‍රයුත්ත ප්‍රත්‍ය වෙත්. (iii) ප්‍රතිවෙධ කාලයෙහිද අනිමිත්ත විමොක්ෂය අධිපති වෙයි. (iv) ප්‍රතිවෙධය පිණිස (මෙහි (ii) (iii) සමාන කෘත්‍ය ඇත්තාහු වෙත්. සමාන කෘත්‍යාර්ථයෙන් භාවනා වෙයි, දැකීම් අර්ථයෙන් ප්‍රතිවෙධය වෙයි. මෙසේ ප්‍රතිවෙධ කරන්නේද වඩයි. වඩන්නේද ප්‍රතිවෙධ කරයි. (v)

**103.** දුක් වශයෙන් මෙනෙහි කිරීමෙන් පස්සද්ධිය බහුලවූ පුද්ගලයාහට අප්පණිහිත විමොක්ෂය අධිපති වෙයි. භාවනාවෙහි

(මෙහි 102 (ii) ප්‍රතිවෙධ කාලයෙහිද අප්පණිහිත විමොක්ෂය අධිපති වෙයි. (මෙහි 102 (ii) (iii) යොදන්න)

**104.** අනාත්ම වශයෙන් මෙනෙහි කිරීමෙන් ප්‍රඥාව බහුල පුද්ගලයා හට සුඤ්ඤත (මෙහි 102 (ii) ප්‍රතිවෙධ කාලයෙහිද සුඤ්ඤත විමොක්ෂය අධිපති වෙයි. ප්‍රතිවෙධය පිණිස (මෙහි 102 (ii) (v)

**105.** අනිත්‍ය (ii) වශයෙන් මෙනෙහි කරන්නාහට කිනම් විමොක්ෂයක් අධික වෙයිද? කවර විමොක්ෂයක් අධිකවූ හෙයින් (ii) සද්ධා විමුත්ත නම් වෙයිද, දුක් (මෙහි (ii) කාය සක්ඛී නම් වේද (මෙහි (ii) අනාත්ම දිට්ඨප්පත්ත නම් වේද?

**106.** අනිත්‍ය (ii) වශයෙන් මෙනෙහි කරන්නාහට (iii) අනිමිත්ත විමොක්ෂය අධික වෙයි. අනිමිත්ත විමොක්ෂය අධිකවූ හෙයින් සද්ධා විමුත්ත නම් වෙයි. දුක් (මෙහි (ii) අප්පණිහිත විමොක්ෂය අධික වෙයි. අප්පණිහිත විමොක්ෂය අධිකවූ හෙයින් කායසක්ඛී නම් වෙයි. අනාත්ම (මෙහි (ii) සුඤ්ඤත විමොක්ෂය අධිකවෙයි. සුඤ්ඤත විමොක්ෂය අධිකවූ හෙයින් දිට්ඨප්පත්ත නම් වෙයි.

**107.** (i) ශ්‍රද්ධාවෙන් මිදුණේනුයි සද්ධා විමුත්ත නමි. (ii) නුවණින් ස්පර්ශ කරන ලද හෙයින් (iii) ප්‍රත්‍යක්ෂ කෙළේනුයි කාය සක්ඛී නමි. (iv) දක්නා ලද හෙයින් පැමිණියේ නුයි දිට්ඨප්පත්ත නමි. (මෙහි (ii) පළමුව ධ්‍යාන ස්පර්ශය ස්පර්ශ කරයි. පසුව නිරොධයවූ නිර්වාණය (මෙහි (iii) සංස්කාරයෝ දුකයහ. නිරොධය සැපයයි දැනගන්නාලද්දේ වෙයි. දක්නා ලද්දේවෙයි. ප්‍රකට කරන ලද්දේ වෙයි. ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ වෙයි. (මෙහි (ii) එහෙයින් දිට්ඨප්පත්ත නම් වෙයි.

**108.** (මෙහි 90 (i) (ii) (iii) යොදන්න.) ඒ සියල්ලෝ (ii) අනිමිත්ත විමොක්ෂයාගේ වශයෙන් සද්ධා විමුත්ති නම් වෙත්. අප්පණිහිත විමොක්ෂයාගේ වශයෙන් කායසක්ඛී නම් වෙත්. සුඤ්ඤත විමොක්ෂයාගේ වශයෙන් දිට්ඨප්පත්ත නම් වෙත්. (iii)

**109.** යම්කිසි කෙනෙක් අව්‍යාපාදය (මෙහි 90 (ii) (iii) (iv) අලොක සඤ්ඤාව (මෙහි 91 (ii)

110. යම්කිසි කෙනෙක් දුක පිරිසිඳ දනිත්ද සමුදය පහකරත්ද නිරොධය ප්‍රත්‍යක්ෂ කරත්ද මාර්ගය වඩත්ද සියල්ලෝ (108 (ii) යොදන්න) (ii) සතර ආකාරයකින් සත්‍ය ප්‍රතිවෙධය වෙයි. (iii) සතර ආකාරයකින් සත්‍ය ප්‍රතිවෙධ කරයි.

111. දුක්ඛ සත්‍යය පිරිසිඳ දැනීම් (ii) ප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කරයි. (iii) සමුදය සත්‍යය පහකිරීම් (මෙහි (ii) නිරොධ සත්‍යය ප්‍රත්‍යක්ෂ කිරීම් (මෙහි (ii) මාර්ග සත්‍යය වැඩීම් මෙහි (ii) (මෙහි 110 (ii) මේ සතර ආකාරයෙන් සත්‍යයන් ප්‍රතිවෙධ කරන්නේ (මෙහි 108 (ii) යොදන්න.)

112. (i) තෙකෙක් ආකාරයෙන් සත්‍ය ප්‍රතිවෙධය (ii) වෙයිද? මෙහි (i) (iii) නව ආකාරයෙන් සත්‍ය ප්‍රතිවෙධය (iv) වෙයි (මෙහි (iii) කරයි. දුක්ඛ සත්‍යය (v) පිරිසිඳ දැනීම් ප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කරයි. (මෙහි 111 ඡෙදයේ මුල සිට මේ සතර යන තැනට යොදන්න) නිරොධ සත්‍යයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම් ප්‍රතිවෙධය වෙයි. මේ නව ආකාරයෙන් සත්‍ය ප්‍රතිවෙධය වෙයි. මේ නව ආකාරයෙන් සත්‍යයන් ප්‍රතිවෙධ කරන්නේ (මෙහි 108 (ii) යොදන්න)

113. අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නේ (ii) කිනම් ධර්මයන් තත්වාකාරයෙන් දනියිද දකියිද? කෙසේ මනාව දැකීම් වෙයිද කෙසේ ඊට අනුව සියලු සංස්කාරයෝ (iii) අනිත්‍ය වශයෙන් (iv) මනාකොට දක්නා ලද්දාහු වෙත්ද කොතැන්හි සැකය පහවෙයිද? (v) දුක් වශයෙන් මෙනෙහි කරන්නේ (මෙහි (ii) දුක් වශයෙන් (මෙහි (iv) අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නේ (මෙහි (ii) අනාත්මයයි (මෙහි (iv)

114. අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නේ නිමිත්ත (ii) තත්වාකාරයෙන් දනියි දකියි එයින් මනාව දැකීමයයි කියනු ලැබේ. මෙසේ ඊට අනුව (iii) සියලු සංස්කාරයෝ අනිත්‍ය වශයෙන් (iv) මනාව දක්නා ලද්දාහු වෙත්. මේ අනිත්‍ය ස්වභාවයෙහි සැකය පහවෙයි.

දුක් වශයෙන් මෙනෙහි කරන්නේ පැවැත්ම (මෙහි (ii) සංස්කාරයෝ දුක් වශයෙන් මනාව දක්නා ලද්දාහු වෙත්. මේ දුක්ඛ ස්වභාවයෙහි සැකය පහවෙයි. අනාත්ම වශයෙන්

මෙනෙහි කරන්නේ නිමිත්තද පැවැත්මද (මෙහි (ii) සියලු ධර්මයෝ අනාත්ම වශයෙන් මනාව දක්නාලද්දාහු වෙත්. මේ අනාත්ම ස්වභාවයෙහි සැකය පහවෙයි.

115. යථාභූතඥානය (ii) යන යමක් වෙයිද, (iii) සම්‍යක් දර්ශනය මෙහි (ii) කංඛාවිතරණය (මෙහි (ii) (iv) මේ ධර්මයෝ වෙත් වෙන්වූ අර්ථ ඇති වෙන් වෙන් අක්ෂර ඇති වචනයෝද නොහොත් සමාන අර්ථ ඇති අක්ෂරයෙන් පමණක් වෙන්වූ වචනයෝද (v) යථාභූතඥානය සම්‍යක් දර්ශනය සංඛාවිතරණය යන (vi) මේ ධර්මයෝ සමාන අර්ථ ඇත්තාහුය. (vi) අක්ෂරයෙන් පමණක් වෙනස්වූවෝය. (vii)

118. අනිත්‍ය (ii) වශයෙන් මෙනෙහි කරන්නාහට කුමක් භය වශයෙන් වැටහෙයිද? (iii) දුක් (මෙහි (ii) අනාත්ම (මෙහි (ii) අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට සංඛාර නිමිත්ත (iv) භය වශයෙන් වැටහෙයි (v) දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට පැවැත්ම (මෙහි (iv) අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට නිමිත්තද පැවැත්මද (මෙහි (iv)

117. භයතුපට්ඨාන භය වශයෙන් වැටහෙන්නාවූ යම් ඥානයක් වෙයිද ආදීනව ඤාණ ආදීනව දක්නා යම් ඤාණයක් වෙයිද නිබ්බිදා ඤාණ කලකිරෙන්නාවූ යම් ඤාණයක් වේද, (මෙහි 115 (iv) යම් භයතුපට්ඨාන ඤාණයක් වේද, යම් ආදීනව ඤාණයක් වේද, නිබ්බිදා ඤාණයක් වේද, (මෙහි 115 (vi)

118. යම් අනත්තානුපස්සනාවක් වෙයිද යම් සුඤ්ඤතානුපස්සනාවක් වෙයිද (මෙහි 115 (iv) යම් අනත්තානු පස්සනාවක් වෙයිද, යම් සුඤ්ඤතානුපස්සනාවක් වෙයිද, (මෙහි 115 (vi)

119. අනිත්‍ය (ii) වශයෙන් මෙනෙහි කරන්නාහට කිනම් පටිසංඛා ඤාණයක් උපදියිද? (iii) දුක් (මෙහි (ii) අනාත්ම (මෙහි (ii) සංඛාර නිමිත්ත අනිත්‍යයයි (iv) දක්නා පටිසංඛා ඤාණය උපදියි. (v) දුක් වශයෙන් මෙනෙහි කරන්නාහට පැවැත්ම දුකයයි (මෙහි (iv) අනාත්ම වහයෙන් මෙනෙහි කරන්නාහට නිමිත්තද පැවැත්ම අනාත්මයයි මෙහි (iv) යම් මුඤ්චිතුකම්‍යතා ඤාණයක් වෙයිද, යම් පටිසංඛානුපස්සනා

ඤාණයක් වෙයිද, යම් සංඛාරුපෙක්ඛා ඤාණයක් වෙයිද, (මෙහි 115 iv) (vi)

**120.** අනිත්‍ය (ii) වශයෙන් මෙනෙහි කරන්නහුගේ සිත කුමකින් නැගිටියිද, සිත කොතැන්හි බැසගනියිද (iii) දුක් (මෙහි (ii) අනාත්ම (මෙහි (ii) අනිත්‍ය (iv) වශයෙන් මෙනෙහි කරන්නහුගේ සිත (v) සංස්කාර නිමිත්ත කෙරෙන් නැගිටියි. අනිමිත්ත නිර්වාණයෙහි සිත බැසගනියි. දුක් (මෙහි (iv) පැවැත්මෙන් නැගිටියි. නොපැවැත්මවූ නිවණෙහි බැස ගනියි. අනාත්ම (මෙහි (iv) නිමිත්තෙන්ද පැවැත්මෙන්ද නැගිටියි. අනිමිත්තවූද අප්පවත්තවූද නිරොධ සංඛ්‍යාත නිර්වාණ ධාතුයෙහි සිත බැසගනියි.

**121.** යම් බහිද්ධා වුට්ඨාන විවට්ටනෙ ප්‍රඥාවත් වේද, යම් ගොත්‍රභූ ධර්ම කෙනෙක් වෙද්ද (මෙහි 115 (iv) යම් බහිද්ධා වුට්ඨාන විවට්ටනෙ ප්‍රඥාවක් වෙයිද යම් ගොත්‍රභූ ධර්මකෙනෙක් වෙත්ද (මෙහි 115 (vi)

**122.** අනිත්‍ය (ii) වශයෙන් මෙනෙහි කරන්නේ කිනම් විමොක්ෂයකින් මිදෙයිද (iii) දුක් (මෙහි (ii) අනාත්ම (මෙහි (ii) අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නේ අනිමිත්ත විමොක්ෂයෙන් මිදෙයි. දුක් වශයෙන් මෙනෙහි කරන්නේ අප්පණිහිත විමොක්ෂයෙන් මිදෙයි. අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නේ සුඤ්ඤත විමොක්ෂයෙන් මිදෙයි. යම් දුභතොවුට්ඨාන විවට්ටනෙ ප්‍රඥාවක් වෙයිද යම් මාර්ගයෙහි ඤාණයක් වෙයිද (මෙහි 115 (iv) යම් දුභතො වුට්ඨාන විවට්ටනෙ ප්‍රඥාවක් වෙයිද යම් මාර්ගයෙහි ඤාණයක් වෙයිද (මෙහි 115 (vi)

**123.** (i) කෙතෙක් ආකාරයෙන් ත්‍රිවිධ විමොක්ෂයෝ (ii) නානා ක්ෂණයෙහි වෙත්ද, (මෙහි (i) එක ක්ෂණයෙහි වෙත්ද සතර (iii) ආකාරයෙන් ත්‍රිවිධ විමොක්ෂයෝ (iv) නානා ක්ෂණයෙහි වෙත්. සත් (මෙහි (iii) එක ක්ෂණයෙහි වෙත්.

**124.** කවර සතර ආකාරයකින් (ii) ත්‍රිවිධ විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත්ද? (iii) අධිපති අර්ථයෙන්ද පිහිටීම් අර්ථයෙන්ද ඉදිරියට පැමිණවීම් අර්ථයෙන්ද එතරකිරීම්

අර්ථයෙන්ද වෙයි. කෙසේ අධිපති අර්ථයෙන් (මෙහි (ii) අනිත්‍ය (iv) වශයෙන් මෙනෙහි කරන්නාහට (v) අනිමිත්ත (vi) විමොක්ෂය අධිපති වෙයි. (vii) දුක් (මෙහි (iv) අප්පණිහිත මෙහි (vi) අනාත්ම (මෙහි (iv) සුඤ්ඤත (මෙහි (vi) මෙසේ අධිපති අර්ථයෙන් ත්‍රිවිධ විමොක්ෂයෝ නොයෙක් ක්ෂණයෙහි වෙත්.

**125.** කෙසේ පිහිටීම් අර්ථයෙන් (මෙහි 124 (ii) අනිත්‍ය (ii) වශයෙන් මෙනෙහි කරන්නේ (iii) අනිමිත්ත (iv) විමොක්ෂයාගේ වශයෙන් සිත පිහිටයි (v) දුක් (මෙහි (ii) අප්පණිහිත (මෙහි (iv) අනාත්ම (මෙහි (ii) සුඤ්ඤත (මෙහි (iv) මෙසේ පිහිටීම් (vi) අර්ථයෙන් ත්‍රිවිධ විමොක්ෂයෝ නොයෙක් ක්ෂණයෙහි වෙත්.

**126.** කෙසේ ඉදිරියට පැමිණවීම් අර්ථයෙන් (මෙහි 124 (ii) අනිත්‍ය මෙහි 125 (ii) අනිමිත්ත (ii) විමොක්ෂයාගේ වශයෙන් සිත ඉදිරියට පමුණුවයි. (iii) දුක් (මෙහි 125 (ii) අප්පණිහිත (මෙහි (ii) අනාත්ම (මෙහි 125 (ii) සුඤ්ඤත (මෙහි (ii) මෙසේ සිත ඉදිරියට පැමිණවීම් (මෙහි 125 (vi)

**127.** කෙසේ එතරකිරීම් අර්ථයෙන් මෙහි 124 (ii) අනිත්‍ය (ii) වශයෙන් මෙනෙහි කරන්නේ (iii) අනිමිත්ත (iv) විමොක්ෂයාගේ වශයෙන් නිරොධයවූ නිර්වාණයට පැමිණෙයි (v) දුක් (මෙහි (ii) අප්පණිහිත (මෙහි (iv) අනාත්ම (මෙහි (ii) සුඤ්ඤත හිත (මෙහි (iv) මෙසේ එතරවීම් අර්ථයෙන් ත්‍රිවිධ විමොක්ෂයෝ නොයෙක් ක්ෂණයෙහි වෙත්.

**128.** කවර සත් ආකාරයකින් (ii) ත්‍රිවිධ විමොක්ෂයෝ එක ක්ෂණයෙහි වෙත්ද, (iii) සමොධානාර්ථයෙන්ද අධිගමනාර්ථයෙන්ද, පටිලාභාර්ථයෙන්ද, පටිවෙධාර්ථයෙන්ද, සච්ඡිකිරියාර්ථයෙන්ද, ඵුසනාර්ථයෙන්ද, අභිසමයාර්ථයෙන් (iv) වෙත්.

**129.** කෙසේ (මෙහි 128 (iii) (ii) අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නේ නිමිත්ත කෙරෙන් මිදේනුයි අනිමිත්ත විමොක්ෂ නම් වේද? යම් නිමිත්තකින් මිදෙයිද එහි ආශා නොකෙරේනුයි අප්පණිහිත විමොක්ෂ නමි. යම් නිමිත්තක

ආශා නොකරයිද ඒ නිමිත්තෙන් සූන්‍යනුයි සුඤ්ඤත විමොක්ෂ නමි. යම් නිමිත්තකින් සූන්‍යයද (iii) ඒ නිමිත්තෙන් අනිමිත්තවූයේ නූයි අනිමිත්ත විමොක්ෂ නමි. (iii) මෙසේ (මෙහි 128 (iii) (iv) ත්‍රිවිධ විමොක්ෂයෝ එක ක්ෂණයෙහි වෙත්.

**130.** දුක් වශයෙන් මෙනෙහි කරන්නේ ආශාකිරීමෙන් මිදේනුයි අප්පණිහිත විමොක්ෂ නමි. යම් දුකෙක්හි ආශා නොකරයිද ඒ දුකින් සූන්‍යනුයි සුඤ්ඤත විමොක්ෂ නමි. යම් නිමිත්තකින් සූන්‍යද (මෙහි 129 (ii) යම් නිමිත්තකින් අනිමිත්තද එහි ආශා නොකෙරේනුයි අප්පණිහිත විමොක්ෂ නමි මෙසේ (මෙහි 128 (iii) ත්‍රිවිධ විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙත්.

**131.** අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නේ ආත්ම යයි ගැනීමෙන් මිදේනුයි සුඤ්ඤත විමොක්ෂ නමි. යම් නිමිත්තකින් සූන්‍යද (මෙහි 129 (ii) යම් නිමිත්තකින් අනිමිත්තද එහි ආශා නොකෙරේනුයි අප්පණිහිත විමොක්ෂ නමි. යම් නිමිත්තක ආශා නොකරයිද, ඒ නිමිත්තෙන් සූන්‍යනුයි සුඤ්ඤත විමොක්ෂ නමි. මෙසේ ත්‍රිවිධ විමොක්ෂයෝ එක ක්ෂණයෙහි වෙත්. මේ සත් ආකාරයෙන් ත්‍රිවිධ විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙත්. විමොක්ෂයක් ඇත්තේය. මුඛයක් ඇත්තේය. විමොක්ෂ මුඛයක් ඇත්තේය විමොක්ෂයට සතුරු ධර්මයක් ඇත්තේය. විමොක්ෂයට අනුකූල ධර්මයක් ඇත්තේය විමොක්ෂ මුඛයක් ඇත්තේය. විමොක්ෂ විවර්තයක් ඇත්තේය. විමොක්ෂ භාවනාවක් ඇත්තේය, විමොක්ෂ ප්‍රතිප්‍රශ්‍රබ්ධියක් ඇත්තේය.

විමොක්ෂය කවරේද? සුඤ්ඤත විමොක්ෂයද අනිමිත්ත විමොක්ෂයද අප්පණිහිත විමොක්ෂයද වෙත්. සුඤ්ඤත විමොක්ෂය නම් කවරේද?

**132.** අනිත්‍ය වශයෙන් දක්නා ඥානය නිත්‍ය (ii) වශයෙන් ගැනීමෙන් මිදේනුයි සුඤ්ඤත විමොක්ඛ නමි. (iii) දුක් වශයෙන් දක්නා ඤාණය සැප (මෙහි (ii) අනාත්ම වශයෙන් දක්නා ඤාණය ආත්ම (මෙහි (ii) කලකිරීම් වශයෙන් දක්නා ඤාණය සතුටුවීම් (මෙහි (ii) විරාග වශයෙන් දක්නා ඤාණය රාග (මෙහි (ii) නිරොධ වශයෙන් දක්නා ඤාණය ඉපදීම

(මෙහි (ii) දුරුකිරීම් වශයෙන් දක්නා ඥාණය අල්වා ගැනීම් (මෙහි (ii) අනිමිත්ත වශයෙන් දක්නා ඥාණය නිමිත්ත (මෙහි (ii) අප්පණිහිත වශයෙන් දක්නා ඥාණය ආශාකළ යුත්තක් (මෙහි (ii) සුඤ්ඤත වශයෙන් දක්නා ඥාණය සියලු වරදවා ගැනීම් වලින් මිදේනුයි සුඤ්ඤත විමොක්ඛ නම්.

133. (මෙහි 132 ඡේදය යෙදීමේදී 'අනිත්‍ය, දුක්, අනාත්ම, කලකිරීම්, විරාග, නිරොධ, දුරුකිරීම්, අනිමිත්ත, අප්පණිහිත, සුඤ්ඤත' යන වචන මුලට පිළිවෙලින් මේ වචන යොදාගත යුතුයි- 'රූපයෙහි, වේදනාවෙහි, සඤ්ඤාවෙහි, සංඛාරයන්හි, විඤ්ඤාණයෙහි, ඇසෙහි, කණෙහි, නාසයෙහි, දිවෙහි, කයෙහි, සිතෙහි, ජරාමරණයෙහි, මෙහි දුක් අනාත්ම කලකිරීම්, විරාග, නිරොධ, දුරුකිරීම්, අනිමිත්ත, අප්පණිහිත, සුඤ්ඤත යන වචන මුලට යොදා 132 ඡේදය යොදනු ජරාමරණයෙහි මේ සුඤ්ඤත විමොක්ෂයයි.

134. අනිමිත්ත විමොක්ෂය කවරේද? (i) අනිත්‍ය වශයෙන් දක්නා ඥාණය නිත්‍ය (ii) නිමිත්තෙන් මිදේනුයි අනිමිත්ත විමොක්ඛ නම්. (ii) දුක් වශයෙන් දක්නා ඥාණය සුඛ (මෙහි (ii) අනාත්ම වශයෙන් දක්නා ඥාණය ආත්ම (මෙහි (ii) කලකිරීම් වශයෙන් දක්නා ඥාණය නන්දි (මෙහි (ii) විරාගවශයෙන් දක්නා ඥාණය රාග (මෙහි (ii) නිරොධ වශයෙන් දක්නා ඥාණය සමුදය (මෙහි (ii) දුරුකිරීම් වහයෙන් දක්නා ඥාණය ආදාන (මෙහි (ii) අනිමිත්ත වශයෙන් දක්නා ඥාණය සියලු නිමිති කෙරෙන් මිදේනුයි අනිමිත්ත විමොක්ඛ නම්. අප්පණිහිත වශයෙන් දක්නා ඥාණය පණිධි (මෙහි (ii) සුඤ්ඤත වශයෙන් දක්නා ඥාණය (ii) අභිනිවෙස (මෙහි (ii)

135. (මෙහි 134 (i) ඡේදය යෙදීමේදී 133 ඡේදයේ වචන ආකාරයට යොදාගත යුතුයි)

136. අප්පණිහිත විමොක්ෂය කවරේද? (i) (මෙහි 134, 135 ඡේද යෙදීමේදී 'අනිමිත්ත' වෙනුවට 'අප්පණිහිතයයි' යොදාගත යුතුයි)

137. මුඛය කවරේද? ඒ විමොක්ෂයෙහි උපන් නිරවද්‍යාවූ කුසලවූ යම් බොධිපාක්ෂික ධර්ම කෙනෙක් වෙත්ද මෙය මුඛ

නමි. විමෝක්ෂ මුඛය කවරේද? ඒ ධර්මයන්ගේ ආරම්මණයවූ යම් නිරොධයවූ නිර්වාණයක් වේද මෙය විමොක්ෂ මුඛ නමි. විමොක්ෂය වනුයේත් මුඛය වනුයේත් විමොක්ෂ මුඛ නමි. මෙය විමොක්ෂ මුඛයයි.

138. විමොක්ෂයට සතුරු ධර්මය කවරේද? ත්‍රිවිධ අකුසල මූලයෝ (ii) විමොක්ෂයට සතුරු ධර්මයෝ වෙත්. (iii) ත්‍රිවිධ දුශ්චරිතයෝ (මෙහි (ii) සියලු අකුසල ධර්මයෝ (මෙහි (ii) මෙය විමොක්ෂයට සතුරු ධර්ම නම් වෙයි.

139. විමොක්ෂයට අනුකූල ධර්මය කවරේද? ත්‍රිවිධ කුශල මූලයෝ (ii) විමොක්ෂයට අනුකූල ධර්මයෝ වෙති. (iii) ත්‍රිවිධ සුචරිත ධර්මයෝ (මෙහි (ii) සියලු කුසල ධර්මයෝ (මෙහි (ii) මෙය විමොක්ෂයට අනුකූල ධර්ම නම් වෙයි.

140. විමොක්ෂ විවර්තය (විමොක්ෂයාගේ පරිවර්තනය-වෙන්වීම) කවරේද? සඤ්ඤා විවට්ටයද චෙතො විවට්ටයද චිත්ත විවට්ටයද විමොක්ඛ විවට්ටයද සච්ච විවට්ටයද වෙත්. මනාව දැනගනිමින් වෙන්වෙයිනුයි සඤ්ඤා විවට්ට නමි. සිත මෙහෙයවමින් වෙන්වෙයිනුයි චෙතොවිවට්ට නමි. විශෙෂයෙන් දකිමින් වෙන්වෙයිනුයි චිත්ත විවට්ට නමි. ඤාණය ඇතිකරමින් වෙන්වෙයිනුයි ඤාණ විවට්ට නමි. දුරුකරමින් වෙන්වෙයිනුයි විමොක්ඛ විවට්ට නමි. සත්‍යවූ ස්වභාවය කරණකොට වෙන්වෙයිනුයි සච්ච විවට්ට නමි. (ii) යම් අරමුණක සඤ්ඤා විවට්ටය වේද (iii) එහි චෙතො විවට්ටයද වෙයි. යම් අරමුණක චෙතො විවට්ටය වේද එහි සඤ්ඤා විවට්ටයද වෙයි. (මෙහි (ii) චෙතොවිවට්ටය වේද එහි චිත්ත විවට්ටයද වෙයි. යම් අරමුණක චිත්ත විවට්ටය වේද (iv) එහි සඤ්ඤා විවට්ටයද වෙයි. චෙතො විවට්ටයද වෙයි (v) (මෙහි (ii) චෙතො විවට්ටය වෙයිද චිත්ත විවට්ටය වෙයිද එහි ඤාණ විවට්ටයද වෙයි. යම් අරමුණක ඤාණ විවට්ටය වෙයිද (මෙහි (iv) චිත්ත විවට්ටයද වෙයි.

යම් අරමුණක (vi) සඤ්ඤා විවට්ටයද චෙතො විවට්ටයද චිත්ත විවට්ටයද ඤාණ විවට්ටයද (vii) වෙයිද එහි විමොක්ඛ විවට්ටයද වෙයි. යම් අරමුණක විමොක්ඛ විවට්ටය වේද එහි

(මෙහි (vi) වෙත්. යම් අරමුණක (මෙහි (vi) විමොක්ඛ විවට්ටයද වේද එහි සච්ච විවට්ටයද වෙයි. යම් අරමුණක සච්ච විවට්ටය වෙයිද එහි (මෙහි (vi) විමොක්ඛ විවට්ටයද වෙයි. මෙය විමොක්ඛ විවට්ට නමි.

141. විමොක්ඛ භාවනාව කවරේද? ප්‍රථම ධ්‍යානය (ii) නැවත නැවත සේවනය කිරීම වැඩීම බහුල කිරීමද (iii) ද්විතීය ධ්‍යානය (මෙහි (ii) තෘතීය ධ්‍යානය (මෙහි (ii) චතුර්ථ ධ්‍යානය (මෙහි (ii) ආකාසානඤ්චායතන සමාපත්තිය (මෙහි (ii) විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය (මෙහි (ii) නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය (මෙහි (ii) සොතාපත්ති මාර්ගය (iv) සේවනය කිරීම වැඩීම බහුල කිරීමද (v) සකෘදාගාමි මාර්ගය (මෙහි (iv) අනාගාමි මාර්ගය (මෙහි (iv) අර්හත් මාර්ගය (මෙහි (iv) වෙත්. මෙය විමොක්ෂ භාවනායි.

142. විමොක්ඛ පටිපස්සද්ධිය කවරේද? ප්‍රථම ධ්‍යානයාගේ (ii) ලැබීම හෝ එහි විපාකය හෝ (iii) ද්විතීයධ්‍යානයාගේ (මෙහි (ii) තෘතියධ්‍යානයාගේ (මෙහි (ii) චතුර්ථ ධ්‍යානයාගේ (මෙහි (ii) ආකාසානඤ්චායතන සමාපත්තියගේ (මෙහි (ii) විඤ්ඤානඤ්චායතන සමාපත්තියගේ (මෙහි (ii) ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියගේ (මෙහි (ii) නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියගේ ලැබීම හෝ විපාකය හෝ සොතාපත්ති මාර්ගයාගේ සොතාපත්ති ඵලයද සකෘදාගාමි මාර්ගයාගේ සකෘදාගාමි ඵලයද අනාගාමි මාර්ගයාගේ අනාගාමි ඵලයද අර්හත් මාර්ගයාගේ අර්හත් ඵලයද වෙත්. මෙය විමොක්ඛ පටිපස්සද්ධි නමි. (තුන්වැනි බණවරයි)

(විමොක්ඛ කථා නිමි)

---

## 6 ගති කථා

1. දිව්‍ය මනුෂ්‍ය යන ගති සම්පත්තියෙහි ඥාන සම්ප්‍රයුක්ත ප්‍රතිසන්ධික්ෂණයෙහි කවර (ii) හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් උත්පත්තිය වෙයිද (iii) මහාසාර ක්ෂත්‍රියයන්ගේද මහාසාර බ්‍රාහ්මණයන්ගේද මහාසාර ගෘහපතියන්ගේද කාමාවචර

දෙවියන්ගේද ඥානසම්ප්‍රයුක්ත ප්‍රතිසන්ධික්ෂණයෙහි (iv) කෙතෙක් (මෙහි (ii) රූපාවචර දෙවියන්ගේ (මෙහි (ii) අරූපාවචර දෙවියන්ගේ (මෙහි (ii) ගති සම්පත්තියෙහි ඥාන සම්ප්‍රයුක්ත ප්‍රතිසන්ධි ක්ෂණයෙහි හෙතු අටදෙනෙකුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපදීම වෙයි. (මෙහි (iii) - (v) හේතු අටදෙනෙකුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපදීමවෙයි. (vi) රූපාවචර දෙවියන්ගේ (මෙහි (v) ඉපදීම අරූපාවචර දෙවියන්ගේ (මෙහි (v)

2. ගති සම්පත්තියෙහි ඥාන සම්ප්‍රයුක්ත ප්‍රතිසන්ධික්ෂණයෙහි කිනම් අට හේතුවක්හුගේ ප්‍රත්‍යයෙන් ඉපදීම වෙයිද?

කුශල කර්මයාගේ ජවනක්ෂණයෙහි කුසල හෙතූහු තුනක් වෙත් (ii) ඔව්හු එම ක්ෂණයෙහි උපන් චෙතනාවට සහජාත ප්‍රත්‍ය වෙත්. (iii) ඒ හෙයින් කුශලමූලයන් ප්‍රත්‍ය කොට සංස්කාරයෝ වෙත්යයි කියනු ලැබේ. තිකන්තීක්ෂණයෙහි හෙතු දෙකක් අකුසල් වෙත්. (මෙහි (ii) එහෙයින් අකුසල මූලයන් ප්‍රත්‍යකොට සංඛාරයෝ වෙත්යයි කියනු ලැබේ. ප්‍රති සන්ධික්ෂණයෙහි හෙතු තුනක් අව්‍යාකෘත වෙත් (මෙහි (ii-iv) එහෙයින් කාමරූපයන් ප්‍රත්‍යකොට විඤ්ඤාණය වේයයි ද විඤ්ඤාණය ප්‍රත්‍යකොට නාමරූපය වේයයිද කියනු ලැබේ. (v) ප්‍රතිසන්ධික්ෂණයෙහි පඤ්චස්කන්ධයෝ (vi) සහජාත ප්‍රත්‍ය වෙත්. අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය වෙත්. නිස්සය ප්‍රත්‍ය වෙත්. විප්පයුත්ත ප්‍රත්‍ය වෙත්. (vi) ප්‍රතිසන්ධික්ෂණයෙහි සතරමහාභූතයෝ (මෙහි (vi) ප්‍රතිසන්ධික්ෂණයෙහි ආයු උස්මා විඤ්ඤාණයන ත්‍රිවිධ ජීවිත සංඛාරයෝ (මෙහි (vi) ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමයද රූපයද (මෙහි (vi) ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ තුදුස් ධර්මයෝ (මෙහි (vi) ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමස්කන්ධ සතර (viii) සහජාත ප්‍රත්‍ය වෙත්. අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය වෙත්. නිස්සය ප්‍රත්‍ය වෙත්. සම්ප්‍රයුක්ත ප්‍රත්‍ය වෙත්. (ix) ප්‍රතිසන්ධික්ෂණයෙහි පඤ්චඉන්ද්‍රියයෝ (මෙහි (viii) ප්‍රතිසන්ධික්ෂණ හෙතු තුනක් (මෙහි (viii) ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමයද විඤ්ඤාණයද (මෙහි

(viii) ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ තුදුස් ධර්මයෝ (මෙහි (viii) ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ විසි අටක් ධර්මයෝ (මෙහි (iv)

3. ගතිසම්පත්තියෙහි ඥානසම්ප්‍රයුක්ත ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ අට හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපදීම වෙයි. (මෙහි 1 (ii) කවර අට හේතුවක්හුගේ වශයෙන් ඉපදීම වේද? කුශල කර්මයාගේ ජවනක්ෂණයෙහි කුසල හෙතු තුනක්වෙත් (මෙහි 2 (ii) එහෙයින් කුශලමූලයන් ප්‍රත්‍යකොට ගෙනද සංස්කාරයෝ වෙත්යයි කියනු ලැබේ. නිකන්තික්ෂණයෙහි අකුශල හෙතු දෙකක් වෙත්. (මෙහි 2 (ii) එහෙයින් අකුශලමූලයෙන් ප්‍රත්‍යකොටගෙනද සංස්කාරයෝ කියනු ලැබෙත්යයි කියනු ලැබේ. ප්‍රතිසන්ධික්ෂණයෙහි හෙතු තුනක් අව්‍යාකෘත වෙත් (මෙහි 2 (ii) 2 (iv)

ප්‍රතිසන්ධික්ෂණයෙහි පඤ්චස්කන්ධයෝ (මෙහි 2 (vi) යොදන්න) ප්‍රතිසන්ධික්ෂණයෙහි සතරමහා භූතයෝ (ii) සහජාත ප්‍රත්‍ය වෙත්. අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය වෙත්. නිස්සය ප්‍රත්‍ය වෙත් (iii) ප්‍රතිසන්ධික්ෂණයෙහි ත්‍රිවිධ ජීවිත සංස්කාරයෝ (මෙහි 2 (vi) වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමයද රූපයද (මෙහි 2 (vi) වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි මේතුදුස් ධර්මයෝ (මෙහි 2 (vi) ප්‍රතිසන්ධික්ෂණයෙහි සතර නාමස්කන්ධයෝ (මෙහි (ii) ප්‍රතිසන්ධික්ෂණයෙහි පඤ්චඉන්ද්‍රියයෝ (මෙහි 2 (viii) ප්‍රතිසන්ධික්ෂණයෙහි හෙතු තුන (මෙහි 2 (viii) ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමයද විඤ්ඤාණයද (මෙහි 2 (viii) ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ තුදුස් ධර්මයෝ (මෙහි 2 (viii) වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ අට විසි ධර්මයෝ (මෙහි 2 (vi) (මෙහි 1 (ii) ඉපදීම මේ අට හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් වෙයි.

4. රූපාවචර දෙවියන්ගේ ඉපදීම කවර අට හේතුන්ගේ ප්‍රත්‍යයෙන් වේද? කුසල කර්මයාගේ ජවනක්ෂණයෙහි හෙතු තුනක් කුසල් වෙත්. (මෙහි 3 ඡෙදයේ කුශල හෙතු තුනක් වෙත්. යන තැන සිට ඒ ඡෙදය අග දක්වා යොදන්න.) රූපාවචර දෙවියන්ගේ ඉපදීම මේ අට හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් වෙයි. අරූපාවචර දෙවියන්ගේ ඉපදීම කවර අට හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් වේද? කුශල කර්මයාගේ ජවනක්ෂණයෙහි හෙතු

තුනක් කුසල් වෙත්. (මෙහි 2 (ii) එහෙයින් කුශල මූලයන් ප්‍රත්‍යකොට ගෙනද සංස්කාරයෝ වෙත්යයි කියනු ලැබේ. (ii) නිකන්තික්ෂණයෙහි හෙතු දෙකක් අකුසල් වෙත්. (මෙහි 2 (ii) එහෙයින් අකුශල මූලයන් ප්‍රත්‍යකොටගෙනද සංස්කාරයෝ වෙත්යයි කියනු ලැබේ. ප්‍රතිසන්ධික්ෂණයෙහි හෙතු තුනක් අව්‍යාකෘත වෙත් (මෙහි 2 (ii) එහෙයින් නාමය ප්‍රත්‍යකොට විඤ්ඤාණයද, විඤ්ඤාණය ප්‍රත්‍යකොට නාමයද වේයයි කියනු ලැබේ. ප්‍රතිසන්ධික්ෂණයෙහි සතර නාමස්කන්ධයෝ නාම ධර්මයන්ම (මෙහි 2 (viii) ප්‍රතිසන්ධික්ෂණයෙහි පඤ්ච ඉන්ද්‍රියයෝ (මෙහි 2 (viii) ප්‍රතිසන්ධික්ෂණයෙහි හෙතු තුන මෙහි (මෙහි 2 (viii) ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමයද විඤ්ඤාණයද (මෙහි 2 (viii) ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ තුදුස් ධර්මයෝ (iii) (මෙහි 2 (viii) අරූපාවචර දෙවියන්ගේ ඉපදීම මේ අට හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් වෙයි.

**5.** ගතිසම්පත්තියෙහි විඥාන විප්‍රයුක්ත ප්‍රතිසන්ධියෙහි කෙතෙක් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපදීම වෙයිද? (ii) මහාසාර ක්ෂත්‍රියයන්ගේ මහාසාර බ්‍රාහ්මණයන්ගේ මහාසාර ගෘහපතීන්ගේ කාමාවචර දෙවියන්ගේ ඥාන විප්‍රයුක්ත ප්‍රතිසන්ධියෙහි (iii) ඉපදීම කෙතෙක් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් වේද?

ගතිසම්පත්තියෙහි ඥාන විප්‍රයුක්ත ප්‍රතිසන්ධියෙහි හෙතු සයක්හුගේ ප්‍රත්‍යයෙන් ඉපදීම් වෙයි. (මෙහි 5 (ii) හෙතු සයක්හුගේ ප්‍රත්‍යයෙන් ඉපදීම වෙයි. කුශල කර්මයාගේ ජවනක්ෂණයෙහි කුශල හෙතු දෙකක් වෙත්. (මෙහි 2 (ii) - (iv) එහෙයින් කුශල මූලයන් ප්‍රත්‍යකොට ගෙන සංස්කාරයෝ වෙත්යයි කියනු ලැබේ. නිකන්ති ක්ෂණයෙහි අකුශල හෙතු දෙකක් වෙත්. (මෙහි 2 (ii) එහෙයින් අකුශල මූලයන් ප්‍රත්‍යකොට ගෙනද සංස්කාරයෝ වෙත්යයි කියනු ලැබේ. ප්‍රතිසන්ධික්ෂණයෙහි අව්‍යාකෘත හෙතු දෙකක් වෙත් (මෙහි 2 (ii) එහෙයින් නාමරූපය ප්‍රත්‍යකොට විඤ්ඤාණයද විඤ්ඤාණය ප්‍රත්‍යකොට නාමරූපයද වේයයි කියනු ලැබේ. (මේ වාක්‍ය ඉදිරියෙහි 'ප්‍රතිසන්ධික්ෂණයෙහි' යොදන්න)

පඤ්චස්කන්ධයෝ (මෙහි 2 (vi) සතරමහා භූතයෝ (මෙහි 3 (ii) - ත්‍රිවිධ ජීවිතසංස්කාරයෝ (මෙහි 2 (vi) - නාමයද රූපයද (මෙහි 2 (vi)- මේ තුදුස් ධර්මයෝ (මෙහි 2 (vi)- සතර නාමස්කන්ධයෝ (මෙහි 2 (viii)- සතර ඉන්ද්‍රියයෝ (මෙහි 2 (viii)- හෙතු දෙකක් (මෙහි 2 viii)- නාමයද විඤ්ඤාණයද (මෙහි 2 (viii)- මේ දොළොස් ධර්මයෝ (මෙහි 2 (viii)- මේ සවිසි ධර්මයෝ (මෙහි (vi) ගතිසම්පත්තියෙහි ඥාන විප්‍රයුක්ත මේ සය හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් ඉපදීම වෙයි.

**6.** මහාසාර ක්ෂත්‍රියයන්ගේ මහාසාර බ්‍රාහ්මණයන්ගේ මහාසාර ගෘහපතියන්ගේ කාමාවචර දෙවියන්ගේ ඥාන විප්‍රයුක්ත කවර හෙතු සයක්හුගේ ප්‍රත්‍යයෙන් ඉපදීම වෙයිද? කුශල කර්මයාගේ ජවනක්ෂණයෙහි කුශලහෙතු දෙකක් වෙත්. (මෙහි 2 (ii) එහෙයින් කුශල මූලයන් ප්‍රත්‍යකොට සංස්කාරයෝ වෙත්යයි කියනු ලැබේ. (මෙහි 4 (ii) යොදන්න) කාමාවචර දෙවියන්ගේ ඥාන විප්‍රයුක්ත ප්‍රතිසන්ධික්ෂණයෙහි හෙතු සයක්හුගේ ප්‍රත්‍යයෙන් ඉපදීම වෙයි.

(ගති කථාව නිමි.)

---

## 7 කම්ම කථා

**1.** (i) අතීතයෙහි කර්මය වී (ii) විපාකයවූ කර්මයකි (iii) (මෙහි (i)-(iv) විපාක නොවූ කර්මයකි. (v) - (මෙහි (i) වර්තමානයෙහි (vi) විපාක ඇත්තාවූ කර්මයකි. (vii) (මෙහි (i) වර්තමානයෙහි (viii) විපාක නැත්තාවූ කර්මයකි. (ix)- (මෙහි (i) අනාගතයෙහි විපාක වන්නාවූ කර්මයකි (මෙහි (i) අනාගතයෙහි විපාක නොවන්නාවූ කර්මයකි.

**2.** (i) වර්තමානයෙහි කර්මය ඇතිව (ii) වර්තමානයෙහි (මෙහි (1 (vi)- (iii) (මෙහි (i) වර්තමානයෙහි (මෙහි 1 (viii)- (iv) (මෙහි (i) අනාගතයෙහි (මෙහි 1 (vi) මෙහි (i) අනාගතයෙහි (මෙහි 1 viii)

**3.** (i) අනාගතයෙහි කර්මවන්නාවූ (ii) අනාගතයෙහි (මෙහි 1 (ii) (මෙහි (i) අනාගතයෙහි (මෙහි 1 (iv)

4. (i) කුශල කර්මය වී කුශල කර්මයාගේ (මෙහි 1 (ii) විපාකවූ කර්මයකි. (මෙහි (i) (මෙහි 1 (v) (මෙහි 1) (මෙහි) 1 (vi) විපාක ඇත්තාවූ කර්මයකි. (මෙහි (i) විපාක නැත්තාවූ කර්මයකි. (මෙහි 1 (viii) (මෙහි (i) (මෙහි 1 (ii) විපාක වන්නාවූ කර්මයකි. (මෙහි 1) විපාක නොවන්නාවූ කර්මයකි. (මෙහි 1 (iv)

5. (i) කුශල කර්මය ඇතිව කුශල කර්මයාගේ (ii) (මෙහි 1 (vi) (මෙහි 1 (මෙහි 1 (viii) (මෙහි 1 (මෙහි 1 (ii) (මෙහි 1) (මෙහි 1 (iv)

6. (i) කුශල කර්මය වන්නාවූ කුශල කර්මයාගේ (මෙහි 1 (iv) (මෙහි 1) (මෙහි 1 (iv)

7. (i) අකුශල කර්මය වී (ii) අකුශල කර්මයාගේ විපාකවූ කර්මයකි (iii) - (මෙහි 1- (iv) අකුශල කර්මයාගේ විපාක නොවූ කර්මයකි (vii) - (මෙහි 1 - (vi) අකුශල කර්මයාගේ විපාක ඇත්තාවූ කර්මයකි (vii)- (මෙහි 1- (viii) අකුශල කර්මයාගේ විපාක නැත්තාවූ කර්මයකි.- (ix) (මෙහි 1 - (x) අකුශල කර්මයාගේ විපාක වන්නාවූ කර්මයකි - (xi) (මෙහි 1- (xii) විපාක නොවන්නාවූ කර්මයකි.

8. (i) අකුශල කර්මය ඇතිව (ii)- (මෙහි 7 (vi) මෙහි 1 (මෙහි 7 (viii) මෙහි 1) (මෙහි 7 (ii) (මෙහි 1) (මෙහි 7 (iv)

9. (i) අකුශල කර්මය වන්නාවූ (මෙහි 7 (x) මෙහි 1 (මෙහි 7 (xii) (මෙහි 4, 5, 6 ඡේද යොදාගැනීමේදී "කුසල කර්මය" වෙනුවට මෙහි පහත දක්වන වාක්‍ය පිළිවෙළට යොදන්න) 'වරද සහිත කර්මය' 'නිවරද කර්මය' යහපත්කර්මය, අයහපත් කර්මය, "සැප වැඩෙන කර්මය" "දුකවැඩෙන කර්මය, "සැප විපාකගෙනදෙන කර්මය" "දුක්විපාක ගෙනදෙන කර්මය"

කම්ම කථා නිමි.

---

## 8 විපල්ලාස කථා

නිදාන පෙර මෙනි

1. මහණෙනි (i) සඤ්ඤා විපල්ලාසයෝද චිත්ත විපල්ලාසයෝද දිට්ඨි විපල්ලාසයෝද (ii) සතරක් වෙත්. කවර

සතරක්ද යත්? මහණෙනි. (i) අනිත්‍යයෙහි නිත්‍යයයි හඟින්නාවූ (iii) සඤ්ඤා විපල්ලාසයද සිතන්නාවූ චිත්ත විපල්ලාසයද දකින්නාවූ දිට්ඨි විපල්ලාසයද (iv) මහණෙනි, (2) දුකෙහි සැපයයි හඟින්නාවූ (මෙහි (iii) මහණෙනි (3) අනාත්මයෙහි) ආත්මයයි හඟින්නාවූ (මෙහි (iii) මහණෙනි, (4) අසුභය සුභයයි හඟින්නාවූ (මෙහි (iii) වෙත්. මහණෙනි, මේ සතර (මෙහි (i) වෙත්.

2. මහණෙනි, (මෙහි (i) සතරකි කවර සතරක්ද යත්? මහණෙනි, අනිත්‍යය නිත්‍යයයි නොහඟින්නාවූ (ii) සඤ්ඤා අවිපල්ලාසයද, නොසිතන්නාවූ චිත්ත අවිපල්ලාසයද, නොදකින්නාවූ දිට්ඨි අවිපල්ලාසයද (iii) මහණෙනි, දුකෙහි සැපයයි නොහඟින්නාවූ (මෙහි (ii) මහණෙනි, අනාත්මයෙහි ආත්මයයි නොහඟින්නාවූ (මෙහි (ii) මහණෙනි, අසුභයෙහි සුභයයි නොහඟින්නාවූ (මෙහි (ii) වෙත්. මහණෙනි, මේ සතර (මෙහි - (i) වෙත්.

5. අනිත්‍යයෙහි නිත්‍යයයි හඟින්නාවූ දුකෙහි සැපයයි හඟින්නාවූ අනාත්මයෙහි ආත්මයයි හඟින්නාහු වෙත්ද "මිථ්‍යාදෘෂ්ටියෙන් (දිට්ඨි විපල්ලාසයෙන්) මඩනා ලද බවට පැමිණි (චිත්ත විපල්ලාසයෙන් විසිර ගිය සිත් ඇති මුළාවූ ඔව්හු මාරයාගේ යොගයට (බැඳීමට) අසුවූවෝ නම් වෙත්. යොගයන් ක්ෂය නොකළාවූ සත්වයෝ ජාති මරණ දෙකට පැමිණෙමින් සසර ගමන් කරත්."

"යම් කලෙක ආලොකය ඇති කරන්නාවූ බුදුවරයෝ ලොකයේ පහළ වෙත්ද, ඒ බුදුවරයෝ දුක් නිවීමට පැමිණෙන්නාවූ මේ මාර්ගය ප්‍රකාශ කරත්."

"උන් වහන්සේලාගෙන් ඒ ධර්මය අසා නුවණැත්තෝ විපල්ලාසයන්ගෙන් තොරවූ ස්වකීය සිත ලැබ ඔව්හු අනිත්‍යය අනිත්‍ය වශයෙන් දැක්කාහුය, දුක දුක වශයෙන් දැක්කාහුය."

"අනාත්මයෙහි අනාත්මයයි දැක්කාහුය. අසුභය අසුභ වශයෙන් දැක්කාහුය. මනාව දැකීමට පැමිණීම හෙතුකොට ගෙන සියලු දුකින් එතර වූහ."

4. සොවාන් පුද්ගලයාගේ මේ සතර විපල්ලාසයෝ පහවූවාහුද නොවූවාහුද, ඇතැම් විපල්ලාසයක් පහවූහ. ඇතැම්

විපල්ලාසයක් පහනුවූහ. අනිත්‍යයෙහි, නිත්‍යයයි (ii) පවත්නා සඤ්ඤා විපල්ලාසයද චිත්ත විපල්ලාසයද දිට්ඨි විපල්ලාසයද පහවූහ. (iii) දුකෙහි සැපයයි (iv) පවත්නා සඤ්ඤාව උපදියි, සිත උපදියි. දිට්ඨි විපල්ලාසය පහවිය. (v) අනාත්මයෙහි අනාත්මයයි (මෙහි (ii) අසුභයෙහි සුභයයි (මෙහි (iv) අනිත්‍ය අනාත්ම යන වස්තු දෙකක පවත්නා විපල්ලාස සයක් ප්‍රහීන වූහ. දුක්ඛ අසුභ යන වස්තු දෙකක පවත්නා විපල්ලාස දෙකක් පහවූහ. විපල්ලාස සතරක් පහ නොවූහ. සතර වස්තූන්හි විපල්ලාස අටක් පහවූහ. විපල්ලාස සතරක් පහ නොවූහ.

(විපල්ලාස කථා නිමි)

---

## 9 මග්ග කථා

1. මාර්ගය යනු කිනම් අර්ථයෙන් මාර්ගය නම් වේද සොතාපත්ති මාර්ග ක්ෂණයෙහි දැකීම් අර්ථයෙන් සම්‍යක් දෘෂ්ටිය (ii) මිථ්‍යාදෘෂ්ටිය පහකිරීම පිණිස මාර්ගයද වෙයි. හෙතුවද වෙයි. (iii) (මේ වාක්‍ය අගට "පිණිස මාර්ගයද හෙතුවද වෙයි" යන වචන යොදන්න)

2. සහජාතවූ ධර්මයන්ට උපකාර - ක්ලේශයන් ක්ෂයකිරීම - ප්‍රතිවෙධාදිය පිරිසිදුවීම - සිත ස්වකීය කෘත්‍යයෙහි පිහිටීම - සිත පිරිසිදු කිරීම - ලෞකික අවබොධයට වඩා විශෙෂවූ අවබොධය - ලෞකික ප්‍රතිවෙධයට වඩා උසස් ප්‍රතිවෙධය - සත්‍ය අවබොධය - නිර්වාණයෙහි පිහිටීම පිණිස -

3. අරමුණට නැගීම ස්වභාවයෙන් සම්‍යක් සංකල්පය මිථ්‍යා සංකල්පය පහකිරීම (මෙහි 2 ඡෙදය යොදන්න)

4. වැළඳගැනීම් ස්වභාවයෙන් සම්‍යක් වචනය මිථ්‍යා වචනය පහකිරීම - (මෙහි 2 ඡෙදය යොදන්න.)

5. මනාකොට පිහිටුවීම් ස්වභාවයෙන් සම්‍යක් කර්මාන්තය මිථ්‍යා කර්මාන්තය පහකිරීම පිණිස මාර්ගයද හෙතුවද වෙයි. (මෙහි 2 ඡෙදය යොදන්න)

6. පිරිසිදුවීම් ස්වභාවයෙන් සම්‍යක් ආජීවය පහකිරීම - (මෙහි 2 ඡෙදය යොදන්න)

7. සිත එසවීම් ස්වභාවයෙන් සම්‍යක් ව්‍යායාමය මිථ්‍යා ව්‍යායාමය පහකිරීම - (මෙහි 2 (ඡෙදය යොදන්න.)

8. (i) අරමුණට එළඹසිටීම් ස්වභාවයෙන් සම්‍යක් සතිය මිථ්‍යාසතිය පහකිරීම - (මෙහි 2 ඡෙදය යොදන්න)

9. (ii) නොවිසිරයාම් ස්වභාවයෙන් සම්‍යක් සමාධිය (iii) මිථ්‍යා සමාධිය පහකිරීම පිණිස - (මෙහි 2 ඡෙදය යොදන්න)

10. සකෘදාගාමි මාර්ග ක්ෂණයෙහි දැකීම් ස්වභාවයෙන් සම්‍යක් දෘෂ්ටිය (මෙහි 1 (ii) 2 - 9 8 (ii) ඡෙද යොදන්න.) ඖදාරික කාමරාගානුසය ඖදාරික පටිඝානුසය පහකිරීම - (මෙහි 2 ඡෙදය යොදන්න)

11. අනාගාමි මාර්ග ක්ෂණයෙහි දැකීම් ස්වභාවයෙන් සම්‍යක් දෘෂ්ටිය - (මෙහි 1 (ii) 2 - 9, 8 (ii) යොදන්න.) තුනීවූ කාමරාග සංයොජනයද පටිඝ සංයොජනයද පහකිරීම - (මෙහි 2 ඡෙදය යොදන්න)

12. අර්හත් මාර්ග ක්ෂණයෙහි දැකීම් ස්වභාවයෙන් සම්‍යක් දෘෂ්ටිය (මෙහි 1 (ii) 2 - 9, යොදන්න.) නොවිසිර යාම් ස්වභාවයෙන් සම්‍යක් සමාධිය රූපරාගයද අරූපරාගයද මානයද උද්ධච්චයද අවිද්‍යාවද මානානුසයද භවරාගානුසයද අවිජ්ජානුසයද පහකිරීම - (මෙහි 2 ඡෙදය යොදන්න)

13. දක්නා මාර්ගය සම්මාදිට්ඨි නමි. අරමුණට නගින්නාවූ මාර්ගය සම්මා සංකප්ප නමි. වැළඳගන්නාවූ මාර්ගය සම්මාවාචා නමි. මනාව පිහිටුවන්නාවූ මාර්ගය සම්මා කම්මන්ත නමි. පිරිසිදු කරන්නාවූ මාර්ගය සම්මා ආජීව නමි. සිත ඔසවන්නාවූ මාර්ගය සම්මාවායාම නමි. අරමුණට එළඹසිටින්නාවූ මාර්ගය සම්මාසති නමි. සිත නොවිසිර යන්නාවූ මාර්ගය සම්මා සමාධි නමි.

14. සති සම්බොජ්ඣංගය අරමුණට එළඹ සිටින්නාවූ මාර්ගය නමි. (මේ වාක්‍ය අගට "මාර්ගය නමි" යොදන්න.) ධම්මවිචය සංබොජ්ඣංගය ධර්මයන් විමසන - විරිය සංබොජ්ඣංගය සිත ඔසවන - පීති සංබොජ්ඣංගය සිත පතුරුවන - පස්සද්ධි සංබොජ්ඣංගය සිත සංසිඳවන - සමාධි සම්බොජ්ඣංගය සිත නොවිසිර යන්නාවූ - උපෙක්ඛා සංබොජ්ඣංගය මැදහත්ව බලන්නාවූ සංබොජ්ඣංගය නමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**15.** ශ්‍රද්ධා බලය අශ්‍රද්ධාවෙන් (ii) කම්පා නොවන මාර්ගය නමි. (iii) විරියබලය කුසීත බවෙන් (මෙහි (ii) සති බලය ප්‍රමාදයෙන් (මෙහි (ii) සමාධිබලය උද්ධච්චයෙන් (මෙහි (ii) ප්‍රඥාබලය අවිද්‍යාවෙන් (මෙහි ii)

(මේ ඡෙදයේ වාක්‍ය අගට "මාර්ගය නමි" යොදන්න.)

**16.** සද්ධින්ද්‍රිය අදහන්නාවූ- විරියින්ද්‍රිය සිත ඔසවන්නාවූ - සතින්ද්‍රිය අරමුණට එළඹසිටින්නාවූ - සමාධින්ද්‍රිය සිත නොවිසිර යන්නාවූ - පඤ්ඤින්ද්‍රිය දක්නාවූ - ඉන්ද්‍රියයෝ අධිපති ස්වභාවයෙන් - බලයෝ කම්පා නොකළහැකි ස්වභාවයෙන් - බොධ්‍යංගයෝ එතරකිරීම් ස්වභාවයෙන් - මාර්ගාංගයෝ හෙතු ස්වභාවයෙන් - සතිපට්ඨානයෝ එළඹ සිටීම් ස්වභාවයෙන් - සම්‍යක් ප්‍රධානයෝ උත්සාහ ස්වභාවයෙන් - ඍද්ධිපාදයෝ සිද්ධකිරීම් ස්වභාවයෙන් - සත්‍යයෝ විද්‍යාමානාර්ථයෙන් - නොවිසිරයාම් ස්වභාවයෙන් සමථය - නැවත නැවත බැලීම් ස්වභාවයෙන් විදර්ශනාව - සමාන කෘත්‍ය ඇති ස්වභාවයෙන් සමථ විපස්සනා දෙක - නොඉක්මවීම් ස්වභාවයෙන් එක්ව පවත්නා සමථවිපස්සනා - සංවරාර්ථයෙන් සීල විසුද්ධිය - නොවිසිරයාම් ස්වභාවයෙන් චිත්ත විසුද්ධිය - දැකීම් ස්වභාවයෙන් දිට්ඨි විසුද්ධිය - මිදීම් ස්වභාවයෙන් විමොක්ෂය - ප්‍රතිවෙධ කිරීම් ස්වභාවයෙන් විද්‍යාව - දුරුකිරීම් ස්වභාවයෙන් විමුක්තිය - මුල් සිඳීම් ස්වභාවයෙන් අර්හත් මාර්ග ඥානය - ඡන්දය මුල්වීම් ස්වභාවයෙන් - මනසිකාරය පිහිටුවීම් ස්වභාවයෙන් - ඵස්සය එක්කිරීම් ස්වභාවයෙන් - වෙදනාව රැස්කිරීම් ස්වභාවයෙන් - සමාධිය ප්‍රධාන වීම ස්වභාවයෙන් - සතිය අධිපති ස්වභාවයෙන් - ප්‍රඥාව සියල්ලට උතුම් ස්වභාවයෙන් - විමුක්තිය (අර්හත්ඵලය) සාර ස්වභාවයෙන් - අමෘතයට අයත් නිර්වාණය අවසාන ස්වභාවයෙන් මාර්ග නමි.

(මග්ග කථාව නිමි.)

---

## 10 මණ්ඩපෙය්‍ය කථා

**1.** මහණෙනි, ශාස්තෘන්වහන්සේ සම්බුද්ධ වූයේයයි, (වීර්ය උපදවා) මේ බ්‍රහ්මචර්යාව නැමති මණ්ඩලය (පිරිසිදු පානය)

පානය කරවි ශාස්තෘන් වහන්සේ සම්මුඛවූ කල්හි පවත්නා මණ්ඩ (පිරිසිදු පාන) තුනකි. දෙසනා මණ්ඩයද පටිග්ගහ මණ්ඩයද බ්‍රහ්මචරිය මණ්ඩයද වෙත්.

2. දෙශනා මණ්ඩය කවරේද? සතර ආර්ය සත්‍යයන්ගේ (ii) කීම දෙශනා කිරීම දැන්වීම පැනවීම විවරණය කිරීම බෙදීම ප්‍රකට කිරීමද (iii) සතර සතිපට්ඨානයන්ගේ (මෙහි (ii) සතර සම්‍යක් ප්‍රධානයන්ගේ (මෙහි ii) සතර ඍද්ධිපාදයන්ගේ (මෙහි ii) පඤ්ච ඉන්ද්‍රියයන්ගේ (මෙහි ii) පඤ්ච බලයන්ගේ (මෙහි ii) සප්ත බොධ්‍යංගයන්ගේ (මෙහි ii) ආර්ය අෂ්ටාංගික මාර්ගයාගේ (මෙහි ii) යන මෙය දෙශනා මණ්ඩ නමි.

3. පටිග්ගහ මණ්ඩය කවරේද? භික්ෂූහුද භික්ෂුණීහුද උපාසකයෝද උපාසිකාවෝද දෙවියෝද මනුෂ්‍යයෝද අන්‍යවූ යම්කිසි දැන ගත්තෝ වෙත් නම් ඔව්හුද යන මොහු පටිග්ගහ මණ්ඩ නමි.

4. බ්‍රහ්මචරිය මණ්ඩය කවරේද? මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය මැයි. ඒ කවරේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මෙය බ්‍රහ්මචරිය මණ්ඩ නමි.

5. සද්ධින්ද්‍රිය අධිමොක්ඛ මණ්ඩ නමි (ii) අශ්‍රද්ධාව කසට නමි. අශ්‍රද්ධා කසටය හැර (iii) සද්ධින්ද්‍රියයාගේ වශයෙන් අධිමොක්ඛමණ්ඩය පානය කෙරේනුයි මණ්ඩපෙය්‍ය (පිය යුතු පිරිසිදු පානය) නමි (මේ වාක්‍ය අගට "මණ්ඩය පානය කෙරේනුයි මණ්ඩපෙය්‍ය නමි" යොදන්න) විරියින්ද්‍රිය පග්ගහ මණ්ඩ නමි (iv) කුසීත බව කසට නමි කුසීත බව නමැති කසටය හැර (v) පග්ගහ මණ්ඩය - සතින්ද්‍රිය උපට්ඨාන මණ්ඩ නමි (vi) ප්‍රමාදය කසට නමි ප්‍රමාද කසටය හැර (vii) සතින්ද්‍රියයාගේ වශයෙන් උපට්ඨාන මණ්ඩය - සමාධින්ද්‍රිය අවික්ඛෙප මණ්ඩ නමි. (viii) උද්ධච්චය කසට නමි උද්ධච්ච කසටය හැර (ix) සමාධින්ද්‍රියගේ වශයෙන් අවික්ඛෙප මණ්ඩය පඤ්ඤින්ද්‍රිය දස්සන මණ්ඩ නමි. (x) අවිද්‍යාව කසට නමි. අවිද්‍යා කසටය හැර (xi) පඤ්ඤින්ද්‍රියයාගේ වශයෙන් දස්සන මණ්ඩය-

**6.** ශ්‍රද්ධා බලය අශ්‍රද්ධාවෙන් (ii) කම්පා නොකළ හැකි මණ්ඩය නම් (iii) (මෙහි 5 (ii) ශ්‍රද්ධා බලයාගේ වශයෙන් අශ්‍රද්ධාවෙන් කම්පා නොකළ හැකි මණ්ඩය- වීර්ය බලය කුසීත බවෙන් (මෙහි (ii) 5 (vi) විරිය බලයාගේ වශයෙන් කුසීත බවෙන් කම්පා නොකළ හැකි මණ්ඩය-

**7.** සතිබලය ප්‍රමාදයෙන් (මෙහි (ii) 5 (vi) සතිබලයාගේ වශයෙන් ප්‍රමාදයෙන් කම්පා නොකළ හැකි මණ්ඩය-

**8.** සමාධි බලය උද්ධච්ච වශයෙන් (මෙහි 7 (ii) 5 (viii) සමාධි බලයාගේ වශයෙන් උද්ධච්චයෙන් කම්පා නොකළ හැකි මණ්ඩය-

**9.** පඤ්ඤා බලය අවිද්‍යාවෙන් (මෙහි 7 (ii) 5 (x) ප්‍රඥාබලයාගේ වශයෙන් අවිද්‍යාවෙන් කම්පා නොකළ හැකි මණ්ඩය.

**10.** සතිසම්බොජ්ඣංගය (ii) උපට්ඨාන මණ්ඩ නමි. (iii) (මෙහි 5 (vi) සතිසම්බොජ්ඣංගයාගේ වශයෙන් උපට්ඨාන මණ්ඩය- ධම්ම විචයසම්බොජ්ඣංගය පවිචය මණ්ඩ නමි. (මෙහි 5 (x) ධම්මවිචය සම්බොජ්ඣංගයාගේ වශයෙන් පවිචය මණ්ඩය- විරිය සම්බොජ්ඣංගය පග්ගහ මණ්ඩ නමි. (මෙහි 5 iv) විරිය සම්බොජ්ඣංගයාගේ වශයෙන් පග්ගය මණ්ඩය පීති සම්බොජ්ඣංගය ඵරණ මණ්ඩ නමි. පරිළාහය (ක්ලේශ සන්තාපය) කසට නමි. පරිළාහ කසටය හැර පිතිසම්බොජ්ඣංගයාගේ වශයෙන් ඵරණ මණ්ඩය - පස්සද්ධි සම්බොජ්ඣංගය උපසම මණ්ඩ නමි. දුට්ඨුල්ලය (ක්ලේශ වශයෙන් පවත්නා ඖදාරික බව) කසට නමි. දුට්ඨුල්ල කසටය හැර පස්සද්ධි සම්බොජ්ඣංගයාගේ වශයෙන් උපසම මණ්ඩය- සමාධි සම්බොජ්ඣංගය අවික්ඛෙප මණ්ඩ නමි. (මෙහි 5 (viii) සමාධි සම්බොජ්ඣංගයාගේ වශයෙන් අවික්ඛෙප මණ්ඩය- උපෙක්ඛා සම්බොජ්ඣංගය පටිසංඛා මණ්ඩ නමි. අප්පටිසංඛාව (ක්ලේශ වශයෙන් සමව නොපැවැත්ම කසටනමි. අප්පටිසංඛා කසටය හැර උපෙක්ඛා සම්බොජ්ඣංගයාගේ වශයෙන් පටිසංඛාන මණ්ඩය -

11. සම්මාදිට්ඨිය දස්සන මණ්ඩ නම්. මිථ්‍යාදෘෂ්ටිය කසට නම්. මිථ්‍යාදෘෂ්ටි කසටය හැර සම්‍යක් දෘෂ්ටියෙන් දස්සන මණ්ඩය - සම්‍යක් සංකල්පය අභිරොපන මණ්ඩ නම් මිථ්‍යා සංකල්පය කසට නම් මිථ්‍යා සංකල්ප කසටය හැර සම්‍යක් සංකල්පයාගේ වශයෙන් අභිරොපන මණ්ඩය - සම්‍යක් වචනය පරිග්ගහ මණ්ඩ නම්. මිථ්‍යා වචන කසටය හැර සම්‍යක් වචනයෙන් පරිග්ගහ මණ්ඩය - සම්‍යක් කර්මාන්තය සමුට්ඨාන මණ්ඩ නම්. මිථ්‍යා කර්මාන්තය කසට නම්. මිථ්‍යා කර්මාන්ත කසටය හැර සම්‍යක් කර්මාන්තයාගේ වශයෙන් සමුට්ඨාන මණ්ඩය - සම්‍යක් ආජීවය වොදාන මණ්ඩ නම්. මිථ්‍යා ආජීවය කසට නම්. මිථ්‍යා ආජීවය කසටය හැර සම්‍යක් ආජීවයාගේ වශයෙන් වොදාන මණ්ඩය - සම්‍යක් ව්‍යායාමය පග්ගහ මණ්ඩ නම්. මිථ්‍යා ව්‍යායාමය කසට නම්. මිථ්‍යා ව්‍යායාමය කසටය හැර සම්‍යක් ව්‍යායාමයාගේ වශයෙන් පග්ගහ මණ්ඩය- සම්‍යක් සතිය උපට්ඨාන මණ්ඩ නම්. මිථ්‍යා සතිය කසට නම් මිථ්‍යා සති කසටය හැර සම්‍යක් සතියෙන් උපට්ඨාන මණ්ඩය- සම්‍යක් සමාධිය අවික්ඛෙප මණ්ඩ නම්. මිථ්‍යා සමාධි කසට නම්. මිථ්‍යා සමාධි කසටය හැර සම්‍යක් සමාධියෙන් අවික්ඛෙපය මණ්ඩය.-

12. මණ්ඩයක් ඇත පිය යුත්තක් ඇත. කසටක් ඇත. සද්ධින්ද්‍රිය අධිමොක්ඛමණ්ඩ නම්. අශ්‍රද්ධාව කසට නම්. ඒ සද්ධින්ද්‍රියයෙහි යම් අර්ථ රසයක් ධර්ම රසයක් විමුක්ති රසයක් ඇත්තේද, මෙය පිය යුත්තාය.

(මේ ඡෙද අගට "යම් අර්ථ රසයක් ධර්ම රසයක් විමුක්තියක් ඇත්තේද, මෙය පිය යුත්ත නම්" යොදන්න)

13. විරියින්ද්‍රිය පග්ගහ මණ්ඩ නම්. කුසීත බව කසට නම්, ඒ විරියින්ද්‍රියයෙහි- සතින්ද්‍රිය උපට්ඨාන මණ්ඩ නම් ප්‍රමාදය කසට නම්. ඒ සතින්ද්‍රියයෙහි-

14. සමාධින්ද්‍රිය අධිමොක්ඛ මණ්ඩ නම්. උද්ධච්චය කසට නම්. ඒ සමාධින්ද්‍රියෙහි-

15. පඤ්ඤින්ද්‍රිය දස්සන මණ්ඩ නම්. අවිද්‍යාව කසට නම් ඒ පඤ්ඤින්ද්‍රියෙහි-

16. ශ්‍රද්ධා බලය අශ්‍රද්ධාවෙන් (ii) කම්පා නොකළ හැකි මණ්ඩය නම්. (iii) අශ්‍රද්ධාව කසට නම්. ඒ ශ්‍රද්ධා බලයෙහි-

17. විරියබලය කුසිත බවෙන් (මෙහි 16 (ii) කුසීත බව කසට නම්. ඒ වීර්‍ය බලයෙහි-

18. සති බලය ප්‍රමාදයෙන් (මෙහි 16 (ii) ප්‍රමාදය කසට නම්. ඒ සති බලයෙහි-

19. සමාධි බලය උද්ධච්චයෙන් (මෙහි 16 (ii) උද්ධච්චය කසට නම් ඒ සමාධි බලයෙහි-

20. ප්‍රඥා බලය අවිද්‍යාවෙන් (මෙහි 16 (ii) අවිද්‍යාව කසට නම් ඒ ප්‍රඥා බලයෙහි-

21. සති සම්බොජ්ඣංගය උපට්ඨාන මණ්ඩ නම් ප්‍රමාදය කසට නම්. ඒ සති සම්බොජ්ඣංගයෙහි-

22. ධම්මවිචය සම්බොජ්ඣංගය පවිචය මණ්ඩ නම්. අවිද්‍යාව කසට නම්. ඒ ධම්මවිචය සම්බොජ්ඣංගයෙහි-

23. විරිය සම්බොජ්ඣංගය පග්ගහමණ්ඩ නම්. කුසිත බව කසට නම්. ඒ විරිය සම්බොජ්ඣංගයෙහි-

24. පීති සම්බොජ්ඣංගය ඵරණ මණ්ඩ නම්. පරිළාහය කසට නම්. ඒ පීතිසම්බොජ්ඣංගයෙහි-

25. පස්සද්ධි සම්බොජ්ඣංගය උපසම මණ්ඩ නම්. දුට්ඨුල්ලය (ක්ලෙශ වශයෙන් පවත්නා ඔළාරික බව) කසට නම්. ඒ පස්සද්ධි සම්බොජ්ඣංගයෙහි-

26. සමාධි සම්බොජ්ඣංගය අවික්ඛෙප මණ්ඩ නම්. උද්ධච්චය කසට නම්. ඒ සමාධි සම්බොජ්ඣංගයෙහි-

27. උපෙක්ඛා සම්බොජ්ඣංගය පටිසංඛාන මණ්ඩ නම්. සමව නොඋසුලන බව කසට නම්. ඒ උපෙක්ඛා සම්බොජ්ඣංගයෙහි-

28. සම්‍යක් දෘෂ්ටිය දස්සනමණ්ඩ නම්. මිථ්‍යාදෘෂ්ටිය කසට නම්. ඒ සම්‍යක් දෘෂ්ටියෙහි- සම්‍යක් සංකල්පය අභිරොපණ මණ්ඩ නම්. ඒ සම්‍යක් සංකල්පයෙහි- සම්‍යක් වචනය පරිග්ගහ මණ්ඩ නම්. මිථ්‍යා වචනය කසට මණ්ඩ නම්. ඒ සම්‍යක් වචනයෙහි- සම්‍යක් කර්මාන්තය සමුට්ඨාන මණ්ඩ නම්. මිථ්‍යා කර්මාන්තය කසට නම්. ඒ සම්‍යක් කර්මාන්තයෙහි- සම්‍යක්

ආජීවය වොදාන මණ්ඩ නමි. මිථ්‍යා ආජීවය කසට නමි. ඒ සම්‍යක් ආජීවයෙහි- සම්‍යක් ව්‍යායාමය පග්ගහ මණ්ඩ නමි. මිථ්‍යා ව්‍යායාමය කසට නමි. ඒ සම්‍යක් ව්‍යායාමයෙහි- සම්‍යක් සතිය උපට්ඨාන මණ්ඩ නමි. මිථ්‍යා සතිය කසට නමි. ඒ සම්‍යක් සතියෙහි- සම්‍යක් සමාධිය අවික්ඛෙප මණ්ඩ නම් මිථ්‍යා සමාධිය කසට නමි. ඒ සම්‍යක් සමාධියෙහි-

**29.** සම්‍යක් දෘෂ්ටිය දස්සනමණ්ඩ නමි. සම්‍යක් සංකල්පය අභිරොපනමණ්ඩ නමි. (මේ වාක්‍ය අගට "මණ්ඩ නමි" යොදන්න.) සම්‍යක් වචනය පරිග්ගහ - සම්‍යක් කර්මාන්තය සමුට්ඨාන- සම්‍යක් ආජීවය වොදාන- සම්‍යක් ව්‍යායාමය පග්ගහ - සම්‍යක් සතිය උපට්ඨාන- සම්‍යක් සමාධිය අවික්ඛෙප-

**30.** සතිසම්බොජ්ඣංගය උපට්ඨාන- ධම්ම විචය සම්බොජ්ඣංගය පවිචය- විරිය සම්බොජ්ඣංගය පග්ගහ- පීති සම්බොජ්ඣංගය ඵරණ- පස්සද්ධි සම්බොජ්ඣංගය උපසම සමාධි සම්බොජ්ඣංගය අවික්ඛෙප- උපෙක්ඛා සම්බොජ්ඣංගය පටිසංඛාන-

**31.** සද්ධාබලය අශ්‍රද්ධාවෙන් කම්පානොකළ හැකි- විරිය බලය කුසීත බවෙන් කම්පා නොකළ හැකි- සතිබලය ප්‍රමාදයෙන් කම්පා නොකළ හැකි- සමාධි බලය උද්ධච්චයෙන් කම්පා නොකළ හැකි- ප්‍රඥා බලය අවිද්‍යාවෙන් කම්පා නොකළ හැකි- සද්ධින්ද්‍රිය අධිමොක්ඛ- විරියින්ද්‍රිය පග්ගහ- සතින්ද්‍රිය උපට්ඨාන- සමාධින්ද්‍රිය අවික්ඛෙප- පඤ්ඤින්ද්‍රිය දස්සන-

**32.** අධිපති ස්වභාවයෙන් ඉන්ද්‍රියයෝ- කම්පා නොකළ හැකි ස්වභාවයෙන් බලයෝ- එතර කිරීම් ස්වභාවයෙන් බොජ්ඣංගයෝ- හෙතු ස්වභාවයෙන් මාර්ගය-

**33.** එළඹ සිටීම් ස්වභාවයෙන් සතිපට්ඨානයෝ- වීර්ය කිරීම් ස්වභාවයෙන් සම්‍යක් ප්‍රධානයෝ- සමෘද්ධවීම් ස්වභාවයෙන් ඍද්ධිපාදයෝ- විද්‍යාමාන ස්වභාවයෙන් සත්‍යයෝ- නොවිසිර යාම් ස්වභාවයෙන් සමථය- නැවත නැවත බැලීම් ස්වභාවයෙන් විදර්ශනාව- සමාන කෘත්‍ය ස්වභාවයෙන් සමථ විදර්ශනාවෝ- ඔවුනොවුන් නොඉක්මවන ස්වභාවයෙන් යුගනන්ධ (එක්ව පවත්නා සමථ විදර්ශනා) ධර්මයෝ- සංවරාර්ථයෙන් සීල

විසුද්ධිය- නොවිසිර යාම් ස්වභාවයෙන් චිත්ත විසුද්ධිය- දැකීම් ස්වභාවයෙන් දිට්ඨි විසුද්ධි- මිදීම් ස්වභාවයෙන් විමොක්ෂය- ප්‍රතිවේධ ස්වභාවයෙන් විද්‍යාව- දුරුකිරීම් ස්වභාවයෙන් විමුක්තිය- මුල් සිඳීම් ස්වභාවයෙන් ඛයෙ ඤාණය (අර්හත් මාර්ග ඥානය)- සංසිඳීම් ස්වභාවයෙන් අනුප්පාදෙ ඤාණය (අර්හත් ඵල ඤාණය)- ඡන්දය මුල ස්වභාවයෙන්- මනසිකාරය පිහිටීම් ස්වභාවයෙන්- ඵස්සය එක්කිරීම් ස්වභාවයෙන්- වෙදනාව රැස්කිරීම් ස්වභාවයෙන්- සමාධිය ප්‍රධාන ස්වභාවයෙන්- සතිය අධිපති ස්වභාවයෙන්- ප්‍රඥාව ඊට වැඩි ධර්මයක් නැති ස්වභාවයෙන්- විමුක්තිය සාරාර්ථයෙන් අමෘතයට අයත් නිර්වාණය පරියොසනාර්ථයෙන් මණ්ඩ නම්.

(මණ්ඩපෙය්‍ය කථා නිමි)

පළමුවැනි මහා වර්ගයයි.

## 2 යුගනන්ධ වර්ගය.

### 11 යුගනන්ධ කථා

1. මා විසින් මෙසේ අසන ලදී. එක්සමයෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කොසඹෑ නුවර ඝොසිතාරාමයෙහි වැඩ වසන සේක. එහිදී ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ "ඇවැත්නි, මහණෙනි"යි භික්ෂූන් ඇමතූසේක. ඒ භික්ෂූහු "ඇවැත්නි"යි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට පිළිවදන් දුන්හ. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ මෙය වදාළසේක. ඇවැත්නි, යම්කිසි මහණෙක් හෝ මෙහෙණක් හෝ තමා රහත් බවට පැමිණීම මාගේ සමීපයෙහි ප්‍රකාශ කෙරේද, එය සර්වප්‍රකාරයෙන් මේ සිවු පිළිවෙත් මගින් හෝ එයින් එකකින් හෝ වේ. කවර ප්‍රතිපදා මාර්ග සතරකින්ද යත්.

2. "ඇවැත්නි, මෙහි මහණ තෙමේ කෙලෙස් සන්සිඳවීම පෙරදැරිකොට ඇති විදර්ශනාව වඩයි. කෙලෙස් සන්සිඳවීම මුල්කොට විදර්ශනා වඩන්නාවූ ඔහුට (සෝවාන්) මාර්ගය හටගනියි. හෙතෙමේ ඒ මාර්ගය සොතාපත්ති මාර්ග වශයෙන් සේවනය කරයි. සකෘදාගාමි මාර්ග වශයෙන් වඩයි. අනාගාමි

අරහන්ත මාර්ග වශයෙන් බහුල කරයි. ඒ මාර්ගය සෙවනය කරන්නාවූ වඩන්නාවූ බහුල කරන්නාවූ ඔහුගේ සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. අනුශයයෝ (සන්තාන ගත ක්ලේශයෝ අවසන් වෙත්.

3. "ඇවැත්නි, තවද භික්ෂුතෙමේ විදර්ශනාව පෙරදැරි කොට ඇති කෙලෙස් සන්සිඳවීම වඩයි 11 විදර්ශනා පෙරදැරිකොට ඇති කෙලෙස් සන්සිඳවීම වඩන්නාවූ ඔහුට මාර්ගය හටගනියි. හෙතෙමේ ඒ මාර්ගය සෙවනය කරයි, වඩයි. බහුල කරයි. ඒ මාර්ගය සේවනය කරන්නාවූ, වඩන්නාවූ බහුල කරන්නාවූ ඔහුගේ සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. අනුශයයෝ අවසන් වෙත්.

4. "ඇවැත්නි, තවද මහණතෙමේ සමථ (කෙලෙස් සන්සිඳවීම්) විදර්ශනා යුගනන්ධ (සම සමව) වශයෙන් වඩයි. සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩන්නාවූ ඔහුට මාර්ගය හටගණියි. හෙතෙමේ ඒ මාර්ගය සේවනය කරයි, වඩයි, බහුල කරයි. ඒ මාර්ගය සේවනය කරන්නාවූ වඩන්නාවූ බහුල කරන්නාවූ ඔහුගේ සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. අනුශයයෝ අවසන් වෙත්.

5. ඇවැත්නි, තවද මහණහුගේ සිත ආලොකය ආදී විදර්ශනොපක්ලේශයන් (විදර්ශනා කිලිටි කිරීම්) නිසා හටගත් මුලාවෙන් වරදවා ගැනීමට පමුණුවන ලද්දේ වේ. ඇවැත්නි, යම් අවස්ථාවෙක්හි ඒ සිත (විදර්ශනා වීථියට බැස) ආධ්‍යාත්මිකවූ අරමුණෙහිම පිහිටාද, මනාව තැන්පත් වේද, එකඟවේද, සමාධියට පැමිණේද, ඇවැත්නි, ඒ සුදුසු කාලයයි. ඔහුට මාර්ගය පහළවේ. හෙතෙමේ ඒ මාර්ගය සේවනය කරයි, වඩයි, බහුල කරයි. ඒ මාර්ගය සේවනය කරන්නාවූ, වඩන්නාවූ, බහුල කරන්නාවූ ඔහුගේ සංයෝජනයෝ (බැඳුම්) ප්‍රහීණ වෙත්. අනුශයයෝ (සන්තානගත කෙලෙස්) අවසන් වෙත්. ඇවැත්නි, යම්කිසි මහණෙක් හෝ මෙහෙණක් හෝ රහත් බවට පැමිණීම මාගේ සමීපයෙහි ප්‍රකාශ කෙරේද එය සර්වප්‍රකාරයෙන් මේ සිවු මගින් හෝ ඒ සිවු මගින් එක්තරා මඟකින් හෝ වේ.

**6.** "සමථ (කෙලෙස් සන්සිඳවීම) පෙරදැරි කොට ඇති විදර්ශනාව වඩන්නේ කෙසේද2 නෛෂ්ක්‍රම්‍ය වශයෙන් සිතේ එකඟ බව (නොවිසිරී පැවැත්ම) සමාධියයි. ඒ සමාධියෙහි උපන්නාවූ (චිත්ත චෛතසික) ධර්මයන් අනිත්‍ය වශයෙන් නැවත නැවත බැලීම විදර්ශනා නම් වේ. දුක් වශයෙන් නැවත නැවත බැලීම් අර්ථයෙන් විදර්ශනා නම් වේ. අනාත්ම වශයෙන් නැවත නැවත බැලීම් අර්ථයෙන් විදර්ශනා නම් වේ. මෙසේ පළමුව (සමථ) සමාධියද පසුව විදර්ශනාවද වේ. එහෙයින් සමථ පූර්වංගම (ඉදිරිපත් කොට ඇති) විදර්ශනාව වඩායයි' කියනු ලැබේ.

7. "වඩයි" යනු සිවු වැදෑරුම් වැඩීමය. (ii) ඒ විදර්ශනා වීථියෙහි හටගත් චිත්ත චෙතසික ධර්මයන්ගේ නොඉක්ම පැවතීම් වශයෙන් වැඩීමය. (ශ්‍රද්ධාදී) ඉන්ද්‍රියයන්ගේ එක කෘත්‍ය (කටයුත්ත) වශයෙන් වැඩීම ඒ (අනතිවත්තන- එකරස) ස්වභාවයන්ට සුදුසු වීර්යය දැරීම් වශයෙන් වැඩීමය. (ඒ අවස්ථාවෙහි පැවති) ආසේවනයාගේ වශයෙන් වැඩීමය යන සතරයි.

(iii) 'මාර්ගය පහළ වේ' යනු කෙසේ මාර්ගය පහළ වේද? දර්ශන වශයෙන් 'සම්මාදිට්ඨි' මාර්ගය පහළවේ. සිත අරමුණට නැඟීම් වශයෙන් 'සම්මාසංකප්ප' මාර්ගය පහළ වේ. පරිග්‍රහ (අයිතිය) වශයෙන් 'සම්මාවාචා' මාර්ගය පහළ වේ. හටගැනීම් වහයෙන් 'සම්මාකම්මන්ත' මාර්ගය පහළ වේ. පිරිසිදුවීම් වශයෙන් සම්මා ආජීව මාර්ගය පහළ වේ. උත්සාහ කිරීම් වශයෙන් 'සම්මාවායාම' මාර්ගය පහළ වේ. (එළඹ) සිටීම් වශයෙන් 'සම්මාසති' මාර්ගය පහළ වේ. (චිත්ත- චෛතසිකයන්ගේ) නොවිසිරීම් වශයෙන් 'සම්මාසමාධි' මාර්ගය පහළ වේ. මෙසේ මාර්ගය පහළ වේ.

හෙතෙමේ ඒ මාර්ගය සේවනය කරයි, වඩයි, බහුල කරයි.

8. සේවනය කරයි යනු කෙසේ සේවනය කෙරේද? යත්, (ii) ආවර්ජනා කරමින් සේවනයකරයි, දනිමින් සේවනය කරයි, දකිමින් සේවනය කරයි, නැවත නැවත සිහිකරමින් සේවනය කරයි, හිත වෙසෙසින් පිහිටුවමින් සේවනය කරයි, ශ්‍රද්ධාවෙන්

අදහමින් සේවනය කරයි, වීර්යය දැඩිකොට ගණිමින් සේවනය කරයි, සිහිය එළවමින් සේවනය කරයි, සිත මනාව පිහිටුවමින් සේවනය කරයි, ප්‍රඥාවෙන් වෙසෙසින් දනිමින් සේවනය කරයි, වෙසෙසින් දතයුතු දෙය වෙසෙසින් දනිමින් සේවනය කරයි. පිරිසිඳ දතයුතු දෙය පිරිසිඳ දනිමින් සේවනය කරයි, ප්‍රහීණ කළයුතු දෙය ප්‍රහීණ කරමින් සේවනය කරයි, වැඩිය යුතු දෙය වඩමින් සේවනය කරයි, (iii) ප්‍රත්‍යක්ෂ කටයුතු දෙය ප්‍රත්‍යක්ෂ කරමින් සේවනය කරයි, මෙසේ සේවනය කරයි.

**9.** 'වඩයි' යනු කෙසේ වඩාද? ආවර්ජනය කරමින් වඩයි, දනිමින් වඩයි, (ii) දකිමින් වඩයි, නැවත නැවත සිහි කරමින් වඩයි, සිත වෙසෙසින් පිහිටුවමින් වඩයි, ශ්‍රද්ධාව පිහිටුවමින් වඩයි, වීර්යය දැඩිකරමින් වඩයි, සිහිය පිහිටුවමින් වඩයි, සිත මනාව පිහිටුවමින් වඩයි, ප්‍රඥාවෙන් දනිමින් වඩයි, වෙසෙසින් දතයුතු දෙය වෙසෙසින් දනිමින් වඩයි, පිරිසිඳ දතයුතු දෙයය පිරිසිඳ දනිමින් වඩයි, ප්‍රහීණ කළයුතු දෙය ප්‍රහීණ කරමින් වඩයි, වැඩිය යුතු දෙය වඩමින් වඩයි, ප්‍රත්‍යක්ෂ කටයුතු දෙය ප්‍රත්‍යක්ෂ කරමින් වඩයි, මෙසේ වඩයි.

**10.** 'බහුල කෙරෙයි' යනු කෙසේ බහුල කෙරේද? (ii) ආවර්ජනා කරමින් බහුල කෙරෙයි. දනිමින් බහුල කෙරෙයි දකිමින් බහුල කෙරෙයි, නැවත නැවත සිහි කරමින් බහුල කෙරෙයි, සිත වෙසෙසින් පිහිටුවමින් බහුල කෙරෙයි, ශ්‍රද්ධාව පිහිටුවමින් බහුල කෙරෙයි, වීර්යය වඩමින් බහුල කෙරෙයි. සිහි එළවමින් බහුල කෙරෙයි, සිත මනාව පිහිටුවමින් බහුල කෙරෙයි, ප්‍රඥාවෙන් දනිමින් බහුල කෙරෙයි, වෙසෙසින් දතයුතු දෙය වෙසෙසින් දනිමින් බහුල කෙරෙයි, ප්‍රහීණ කළයුතු දෙය ප්‍රහීණ කරමින් බහුල කෙරෙයි, වැඩිය යුතු දෙය වඩමින් බහුල කෙරෙයි, ප්‍රත්‍යක්ෂ කළයුතු දෙය ප්‍රත්‍යක්ෂ කරමින් බහුල කෙරෙයි, මෙසේ බහුල කෙරෙයි.

**11.** ඒ මාර්ගය සේවනය කරන්නාවූ, වඩන්නාවූ, බහුල කරන්නාවූ ඔහුගේ සංයෝජන (බැඳුම්) ප්‍රහීණ වෙත්. අනුශයයෝ (සිත කෙලෙස්) අවසන් වෙත්. සංයෝජනයෝ (බැඳුම්) කෙසේ

ප්‍රහීණ වෙත්ද? අනුශයයෝ (සිත කෙලෙස්) කෙසේ අවසන් වෙද්ද?

"සොතාපත්ති" මාර්ගයෙන් සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන මේ සංයෝජනත්‍රය ප්‍රහීණවේ. දිට්ඨි අනුසය, විචිකිච්ඡා අනුසය, යන මේ අනුශයෝ (සන්තාන ගත කෙලෙස්) දෙදෙන අවසන් වෙත්.

'සකෘදාගාමි' මාර්ගයෙන් ඔළාරික (ඝනබහල) වූ කාමරාග සංයෝජන (බැඳුම) පටිඝ (ක්‍රොධ) සංයෝජන (බැඳුම) යන මේ බැඳුම් දෙක ප්‍රහීණ වේ. ඖළාරිකවූ කාමරාගානුසය. පටිඝානුසය යන මේ අනුශයෝ දෙදෙන අවසන් වෙත්.

'අනාගාමි' මාර්ගයෙන් සියුම් (තුනී) වූ කාම රාග සංයෝජන පටිඝ සංයෝජන යන මේ බැඳුම් දෙක ප්‍රහීණ වේ. සියුම් (තුනී) වූ කාමරාගානුසය, පටිඝානුසය යන මේ අනුශයෝ දෙදෙන අවසන් වෙත්.

රහත් මගින් රූප රාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන මේ බැඳුම් පස ප්‍රහීණ වේ. මානානුසය, භවරාගානුසය, අවිජ්ජානුසය යන මේ අනුශයෝ (සිත කෙලෙස්) තුන්දෙන අවසන් වෙත්.

අව්‍යාපාද (කොප නොවීම්) වශයෙන් සිත එකඟවූ නොකැලඹෙන සමාධියයි ආලොක සංඥා වශයෙන් සිත එකඟවූ නොකැළඹෙන සමාධියයි.

කෙලෙස් දුරු කිරීමෙන් නිවන් බලන්නහුගේ හුස්ම ගැනීම් වශයෙන්ද කෙලෙස් දුරුකිරීමෙන් නිවන් බලන්නහුගේ හුස්ම පිටකිරීම් වශයෙන් සිත එකඟවූ නොකැළඹෙන සමාධි යයි. ඒ විදර්ශනා වීථියෙහි උපන් (චිත්ත චෛතසික) ධර්මයන් අනිත්‍ය වශයෙන් නැවත නැවත බැලීම් අර්ථයෙන් විදර්ශනාවයි. දුක් වශයෙන් නැවත නැවත බැලීම් අර්ථයෙන් විදර්ශනාවයි. අනාත්ම වශයෙන් නැවත නැවත බැලීම් අර්ථයෙන් විදර්ශනාවයි, මෙසේ පළමුව සමථය (කෙලෙස් සන්සිඳවීම) ද පසුව විදර්ශනාව ද වේ. එහෙයින් කෙලෙස් සන්සිඳීම පෙරදැරි විදර්ශනාව වඩායයි කියනු ලැබේ.

12. 'වඩයි' යනු සිව්වැදෑරුම් වැඩීමය. ඒ විදර්ශනා විෂයයෙහි හටගත් (චිත්ත චෛතසික) ධර්මයන්ගේ නොඉක්ම පැවතීම් අර්ථයෙන් වැඩීමය. (ශ්‍රද්ධාදී) ඉන්ද්‍රියයන්ගේ එක කෘත්‍ය (එක කටයුත්ත) වශයෙන් වැඩීමය, ඒ (අනතිවත්තන එකරස) ස්වභාවයන්ට සුදුසු වීර්යය දැරීම් වශයෙන් වැඩීම (ඒ අවස්ථාවෙහි පැවති) සේවනයාගේ වශයෙන් වැඩීම යන සතරයි.

'මාර්ගය පහළවෙයි' යන්නෙහි කෙසේ මාර්ගය පහළ වේද? දර්ශනය කිරීම් අර්ථයෙන් සම්මාදිට්ඨි මාර්ගය පහළවේ. සිත අරමුණට නැංවීමේ අර්ථයෙන් සම්මාසම්කප්ප මාර්ගය පහළවේ. මෙහි 7 ඡේදයේ (iii) යෙදිය යුතුයි.

'සේවනය කරයි.' යනු කෙසේ සේවනය කෙරේද? යත් (මෙහි 8 ඡේදයේ (ii) යෙදිය යුතුයි.)

'භාවෙති' යනු කෙසේ වඩයිද? ආවර්ජනය කරමින් වඩයි, දනිමින් වඩයි, ප්‍රත්‍යක්ෂ කළයුතු දෙය ප්‍රත්‍යක්ෂ කරමින් වඩයි, මෙසේ වඩයි.

'බහුලීකරොති' (වැඩියෙන් කෙරෙයි) යනු කෙසේ බහුල කරයිද? සිහි කරමින් බහුල කරයි, දනිමින් බහුල කරයි, (මෙහි 10 ඡේදය (ii) යොදන්න) ප්‍රත්‍යක්ෂ කළයුතු දෙය ප්‍රත්‍යක්ෂ කරමින් බහුල කරයි, මෙසේ බහුල කරයි.

13. ඒ මාර්ගය සේවනය කරන්නාවූ, වඩන්නාවූ, බහුල කරන්නාවූ ඔහුගේ බැඳුම් ප්‍රහීණ වෙත්. අනුශයයෝ (සන්තානගත කෙලෙස්) අවසන් වෙත්. බැඳුම් කෙසේ ප්‍රහීණ වෙත්ද? අනුශයයෝ (සිත කෙලෙස්) කෙසේ අවසන් වෙත්ද?

'සොතාපත්ති' මාර්ගයෙන් සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන මේ සංයෝජනත්‍රයය ප්‍රහීණ වේ. දිට්ඨි අනුසය, විචිකිච්ඡා අනුසය යන මේ අනුශයයෝ (සිත කෙලෙස්) දෙදෙන අවසන් වෙත්.

'සකෘදාගාමි' මාර්ගයෙන් ඔළාරික (ඝන බහළ) වූ කාම රාග සංයෝජන, පටිඝ සංයෝජන යන මේ බැඳුම් දෙක ප්‍රහීණ වේ. ඔළාරිකවූ කාමරාගානුසය, පටිඝානුසය යන මේ අනුශයයෝ දෙදෙන අවසන් වෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

'අනාගාමි' මාර්ගයෙන් සියුම් (තුනී) වූ කාමරාග සංයෝජන පටිඝ සංයෝජන යන මේ බැඳුම් දෙක ප්‍රහීණ වේ. සියුම් (තුනී) වූ කාමරාගානුසය, පටිඝානුසය යන මේ අනුශයයෝ දෙදෙන අවසන් වෙත්.

'රහත්' මඟින් රූපරාග, අරූපරාග, මාන උද්ධච්ච, අවිජ්ජා යන මේ බැඳුම් පස ප්‍රහීණ වේ. මානානුසය, භව රාගානුසය, අවිජ්ජානුසය යන මේ අනුශයයෝ (සිතකෙලෙස්) තුන් දෙන දුරු වෙත්.

මෙසේ කෙලෙස් සන්සිඳවීම පෙරදැරි කොට ඇති විදර්ශනාව වඩයි.

**14.** විදර්ශනාව පෙරදැරිකොට ඇති කෙලෙස් සන්සිඳවීම වඩන්නේ කෙසේද? අනිත්‍ය වශයෙන් නැවත නැවත බැලීම් අර්ථයෙන් විදර්ශනාවයි, දුක් වශයෙන් නැවත නැවත බැලීම් අර්ථයෙන් විදර්ශනාවයි, අනනාත්ම වශයෙන් නැවත නැවත බැලීම් අර්ථයෙන් විදර්ශනාවයි, ඒ විදර්ශනා වීථියෙහි උපන් (චිත්ත චෛතසික) ධර්මයන්ගේද නිවන් අරමුණු බැවින් චිත්තයාගේ (එකග්‍රතා සංඛ්‍යාත උපචාර අර්පණා) නොකැලඹිල්ල (නිර්වෙධභාගිය) සමාධියයි. පළමුව විදර්ශනාවද, පසුව සමථයද මෙසේයි. එහෙයින් විදර්ශනාව පෙරදැරි කොට ඇති කෙලෙස් සන්සිඳවීම වඩායයි කියනු ලැබේ.

'වඩයි' යනු සතර ආකාර භාවනාවයි (මෙහි 7 ඡේදයේ (ii) යෙදිය යුතුයි.)

මාර්ගය පහළවන්නේ කෙසේද? මෙහි 7 ඡේදයේ (iii) යෙදිය යුතුයි. මෙසේ මාර්ගය පහළ වේ. මෙසේ බැඳුම් ප්‍රහීණ වෙත්. සිත කෙලෙස් අවසන් වෙත්.

රූපය අනිත්‍ය වශයෙන් නැවත බැලීම් අර්ථයෙන් විදර්ශනාවයි, රූපය දුක් වශයෙන් නැවත නැවත බැලීම් අර්ථයෙන් විදර්ශනාවයි, ඒ විදර්ශනා වීථියෙහි උපන් (චිත්ත චෛතසික) ධර්මයන්ගේද නිවන් අරමුණු බැවින් චිත්තයාගේ (එකාග්‍රතා සංඛ්‍යාත උපචාර අර්පණා) නොකැලඹිල්ල (නිර්වෙධභාගිය) සමාධියයි. පළමුව විදර්ශනාවද පසුව කෙලෙස්

සන්සිඳවීමද මෙසේයි. එහෙයින් විදර්ශනා (තුන් දැකීම) මුල්කොට ඇති කෙලෙස් සන්සිඳවීම වඩායි කියනු ලැබේ.

'භාවෙති' (වඩයි) යනු සතර ආකාර භාවනාවයි (මෙහි 7 ඡේදයේ (11 යෙදිය යුතුයි.) (මෙහි 3 ඡේදයේ (ii) යෙදිය යුතුයි) මෙසේ බැඳුම් ප්‍රහීණ වෙත්. සිත කෙලෙස් අවසන් වෙත්. වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ, චක්ඛු, සොත, ඝාන, ජිව්හා, කාය, මන ජරා මරණ අනිත්‍ය වශයෙන් නැවත නැවත බැලීම් අර්ථයෙන් විදර්ශනාවයි. ජරාමරණ දුක් වශයෙන් නැවත නැවත බැලීම් අර්ථයෙන් විදර්ශනාවයි.

අනාත්ම වශයෙන් නැවත නැවත බැලීම් අර්ථයෙන් විදර්ශනාවයි. ඒ විදර්ශනා වීථියෙහි උපන් (චිත්ත චෛතසික) ධර්මයන්ගේද නිවන් අරමුණු බැවින් චිත්තයාගේ (එකාග්‍රතා සංඛ්‍යාත උපචාර අර්පණාවෝද) නොකැලඹිලිල් (නිර්වෙධ භාගිය) සමාධි යයි. පළමුව විදර්ශනාවද පසුව කෙලෙස් සන්සිඳවීමද මෙසේයි. එහෙයින් විදර්ශනා පෙරදැරි කෙලෙස් සන්සිඳවීමද වඩායි කියනු ලැබේ.

'භාවෙති' වඩයි යනු සතර ආකාර භාවනාවයි. (මෙහි 7 ඡේදයේ (ii) යෙදිය යුතුයි.) (මෙහි 3 ඡේදයේ (ii) යෙදිය යුතුයි) මෙසේ බැඳුම් ප්‍රහීණ වෙත්. අනුශයයෝ (සිත කෙලෙස්) අවසන් වෙත්.

**15.** මෙසේ විදර්ශනා පෙරදැරිවූ කෙලෙස් සන්සිඳවීම වඩයි. මෙසේ කෙලෙස් සන්සිඳවීම හා තුන් දැක්ම (විදර්ශනා) යුගනන්ධ (සම) වශයෙන් වඩාද, සොළොස් ආකාරයකින් කෙලෙස් සන්සිඳවීම විදර්ශනා යුගනන්ධ වශයෙන් වඩයි. ආරම්මණ වශයෙන්, ගොචර වශයෙන්, ප්‍රහාණ වශයෙන් පරිත්‍යාග (හැරලීම්) වශයෙන්, වුට්ඨාන නැඟිටීම් වශයෙන්, විවට්ට (නිවීම්) වශයෙන්, ශාන්ත (සන්සිඳීම්) වශයෙන්, ප්‍රණීත (උසස් බවට යැවීම්) වශයෙන්. බන්ධනාපගත (බැඳුම් ලිහීම්) වශයෙන්, කෙලෙස් නැතිවීම් වශයෙන්, ඉක්මීම් වශයෙන්, දේවල නිමිති ගැනීම් නැත්ත වශයෙන්, නොපැතීම් වශයෙන්, නොඇලීම් වශයෙන්, එකරස වශයෙන්, එකින් එක නොඉක්මීම් වශයෙන් යුගනන්ධ සමාන වශයෙන්, වඩයි.

(මෙහි 17 ක් දක්වා ඇතත් අන්තයෙහි දක්වන ලද "යුගනන්ධ" පදය මූල පදය හා ඒකාර්ථවත් භාවයෙන් එය අත්හැර ගණන් ගනු ලැබේ.)

**16.** කෙසේ ආරම්මණ වශයෙන් සමථවිදර්ශනා (කෙලෙස් සන්සිඳවීම් හා තුන් දැක්ම) යුගනන්ධ (සමාන) කොට වඩාද, සිතේ නොසන්සුන්කම දුරුකරන්නහුගේ සිත එකඟකම නම් නොකැලඹිල්ලවූ සමාධිය නිවන් අරමුණයි. අවිජ්ජාව දුරු කරන්නහුගේ නැවත නැවත අනිත්‍යාදී වශයෙන් බැලීමෙන් ඇතිවන විදර්ශනාවවූ නිවන් අරමුණ මෙසේ අරමුණු කිරීම් වශයෙන් සමථ විදර්ශනාවෝ එක කටයුතු ඇත්තාහු වෙත්. යුගනන්ධ (සමාන) වූවෝ වෙත්. ඔවුනොවුන් නොඉක්ම පවතිත්. එහෙයින් අරමුණු වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට (සමාන) වඩායයි කියනු ලැබේ.

'භාවෙති' (වඩයි) යනු සතර ආකාර භාවනාවයි. (මෙහි 7 ඡේදයේ (ii) (iii) හා 3 ඡේදයේ (ii) යෙදිය යුතුයි.) මෙසේ බැඳුම් ප්‍රහීණ වෙත්. බලවත් පව් දුරු වෙත්.

මෙසේ අරමුණු වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩයි.

**17.** කෙසේ ගොචර වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩාද, සිතේ නොසන්සුන්කම දුරුකරන්නහුගේ සිත එකඟකමේ නොකැලඹීම නම් සමාධිය නිවන් ගෝචරය නොදැනීම දුරුකරන්නහුගේ නැවත නැවත අනිත්‍යාදී වශයෙන් බැලීමෙන් ඇතිවන තුන්දැකීම නිවන් ගොචරය. මෙසේ ගොදුරු වශයෙන් සමථ විදර්ශනාවෝ එක කටයුතු ඇත්තාහු වෙත්. යුගනන්ධ (සමාන) වූවෝ වෙත්. ඔවුනොවුන් නොඉක්ම පවතිත්. එහෙයින් ගොදුරු වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩායයි කියනු ලැබේ.

**18.** කෙසේ ප්‍රහාණ වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩාද, සිත නොසන්සුන් බව සහිත ක්ලේශයන්ද ස්කන්ධයන්ද දුරුකරන්නහුගේ සිත එකඟකම නම් නොකැලඹීමේ සමාධිය නිවන් ගොචරය. නොදැනීම් සහිත ක්ලේශයන්ද ස්කන්ධයන්ද දුරුකරන්නහුගේ නැවත නැවත

අනිත්‍යාදි වශයෙන් බැලීමෙන් ඇතිවන විදර්ශනාව නිවන් ගොචරය. මෙසේ ප්‍රහාණ වශයෙන් සමථ විදර්ශනාවෝ එක කටයුතු ඇත්තාහු වෙත්. යුගනන්ධ (සමාන) වූවෝ වෙත්. ඔවුනොවුන් නොඉක්ම පවතිත්. එහෙයින් ප්‍රහාණ වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධකොට වඩායයි කියනු ලැබේ.

**19.** කෙසේ පරිභොග වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩාද, සිතේ නොසන්සුන්බව සහිත පච්ද ස්කන්ධයන්ද දුරුකරන්නහුගේ සිත එකඟකමවූ නොකැලඹිල්ලනම් සමාධිය නිවන් ගෝචරය නොදැනීම සහිත ක්ලේශයන්ද ස්කන්ධයන්ද දුරුකරන්නහුගේ නැවත නැවත අනිත්‍යාදී වශයෙන් බැලීමෙන් ඇතිවන විදර්ශනාව නිවන් ගොචරය. මෙසේ පරිත්‍යාග වශයෙන් සමථ විදර්ශනාවෝ ඇත්තාහු වෙත්. යුගනන්ධ වූවෝ වෙත්. ඔවුනොවුන් නොයික්ම පවතිත්. එහෙයින් පරිත්‍යාග වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩායයි කියනු ලැබේ.

**20.** කෙසේ නැගිටීම් වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩාද? සිතේ නොසන්සුන්බව සහිත ක්ලේශයන්ගේද ස්කන්ධයන්ගේද නැගීම් වශයෙන් සිත එකඟකමවූ නොකැලඹිල්ල නම් සමාධිය නිවන් ගොචරය. නොදැනීම් සහිත ක්ලේශයන්ගේද ස්කන්ධයන්ගේද නැඟීම් වශයෙන් (අනිත්‍යාදී වශයෙන්) නැවත නැවත බැලීමෙන් ඇතිවන විදර්ශනාව නිවන් ගෝචරය. මෙසේ නැගිටීම් වශයෙන් සමථ විදර්ශනාවෝ එක කටයුතු ඇත්තාහු වෙත්. යුගනන්ධ වූවෝ වෙත්. ඔවුනොවුන් නොඉක්ම පවතිත්. එහෙයින් නැගිටීම් වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩායයි කියනු ලැබේ.

**21.** කෙසේ විවට්ට (නිවීම්) වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධකොට වඩාද, සිත නොසන්සුන් බව සහිත ක්ලේශයන්ගෙන්ද ස්කන්ධයන්ගෙන්ද විවට්ට (නිවීම්) වශයෙන් සිත එකඟකමවූ නොකැලඹිල්ලනම් සමාධිය නිවන් ගෝචරය. නොදැනීම සහිත ක්ලේශයන්ගෙන්ද ස්කන්ධන්ගෙන්ද විවට්ට (නිවීම්) වශයෙන් නැවත නැවත බැලීමෙන් ඇතිවන විදර්ශනාව

නිවන් ගොචරය. මෙසේ විවට්ට (නිවීම්) වශයෙන් සමථ විදර්ශනාවෝ එක කටයුතු ඇත්තාහු වෙත්. යුගනන්ධ වූවෝ වෙත්. ඔවුනොවුන් නොඉක්ම පවතිත්. එහෙයින් විවට්ට (නිවීම්) වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩායයි කියනු ලැබේ.

**22.** කෙසේ ශාන්ත වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩාද? සිත නොසන්සුන් බව දුරුකරන්නහුගේ සිත එකඟකමවූ නොකැලඹිල්ල නම් සමාධිය ශාන්තවූයේවෙයි. නිවන් ගොචරය. නොදැනීම දුරු කරන්නහුගේ (අනිත්‍යාදීන්) නැවත නැවත බැලීමෙන් ඇතිවන විදර්ශනාව ශාන්තවූයේ වෙයි. නිවන් ගොචරය. මෙසේ ශාන්ත වශයෙන් සමථ විදර්ශනාවෝ එක කටයුතු ඇත්තාහු වෙත්. යුගනන්ධ වූවෝ වෙත්. ඔවුනොවුන් නොඉක්ම පවතිත්. එහෙයින් ශාන්ත වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩායයි කියනු ලැබේ.

**23.** කෙසේ ප්‍රණීත වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධකොට වඩාද, සිතනොසන්සුන් බව දුරු කරන්නහුගේ සිත එකඟකමවූ නොකැලඹිල්ල නම් සමාධිය ප්‍රහීණ වූයේ වෙයි. නිවන් ගොචරය. නොදැනීම දුරු කරන්නහුගේ (අනිත්‍යාදීන්) නැවත නැවත බැලීමෙන් ඇතිවන විදර්ශනාව ප්‍රහීණවූයේ වෙයි, නිවන් ගොචරය. මෙසේ ප්‍රණීතවශයෙන් සමථ විදර්ශනාවෝ එකම කටයුතු දරන්නාහු වෙත්. එහෙයින් ප්‍රණීත වශයෙන් යුගනන්ධ කොට වඩායයි කියනු ලැබේ.

**24.** කෙසේ මිදීම් වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩාද, උඩඟුකම දුරු කරන්නහුගේ සිත එකඟකමවූ නොකැලඹීම නම් සමාධියෙන් සිත මිදුනේ වෙයි, නිවන් ගොචරය. නොදැනීම දුරුකරන්නහුගේ (අනිත්‍යාදීන්) නැවත නැවත බැලීමෙන් ඇතිවන විදර්ශනාවෙන් සිත මිදුණේ වෙයි, නිවන් ගොදුරුය. ඇල්ම දුරුකිරීමෙන් (ඇතිවන) මාර්ගය හා යෙදුණු නොදැනීම දුරුකිරීමෙන් සමාධිය (ඇතිවන) මාර්ගය හා යෙදුණු ප්‍රඥාව මෙසේයි. මෙසේ මිදීම් වශයෙන් සමථ විදර්ශනාවෝ එක කටයුතු ඇත්තාහුවෙත්. යුගනන්ධවූවෝ

වෙත්. ඔවුනොවුන් නොඉක්ම පවතිත්. එහෙයින් මිදීම් වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩායයි කියනු ලැබේ.

**25.** කෙසේ පව් නැතිවීම් (අනාශව) වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධකොට වඩාද, සිත නොසන්සුන් බව දුරුකරන්නහුගේ සිත එකඟකමවූ නොකැලඹිල්ල නම් සමාධිය කාමාශවයෙන් අනාසව වූයේ වෙයි. තිවන් ගොචරය. නොදැනීම දුරු කරන්නහුගේ (අනිත්‍යාදී වශයෙන්) නැවත නැවත බැලීමෙන් ඇතිවන විදර්ශනාව අවිද්‍යාසවයෙන් අනාසව වූයේ වෙයි, නිවන් ගෝචරය. මෙසේ අනාසව වශයෙන් සමථ විදර්ශනාවෝ එක කටයුතු ඇත්තාහු වෙත්. යුගනන්ධ වූවෝ වෙත්. ඔවුනොවුන් නොඉක්ම පවතිත්. එහෙයින් අනාසව වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩායයි කියනු ලැබේ.

**26.** කෙසේ තරණය කිරීම් වශයෙන් සමථවිදර්ශනා යුගනන්ධ කොට වඩාද, සිතනොසන්සුන් සහිත ක්ලේශයන්ගෙන්ද ස්කන්ධයන්ගෙන්ද තරණය කරන්නහුගේ සිත එකඟකමවූ නොකැලඹිල්ල නම් සමාධිය නිවන් ගොචරය. නොදැනීම් සහිත ක්ලේශයන්ගෙන්ද ස්කන්ධයන්ගෙන්ද තරණය කරන්නහුගේ (අනිත්‍යාදී වශයෙන්) නැවත නැවත බැලීමෙන් ඇතිවන විදර්ශනාව නිවන් ගොචරය. මෙසේ තරණය කිරීම් වශයෙන් සමථ විදර්ශනාවෝ එක කටයුතු ඇත්තාහු වෙත්. යුගනන්ධ වූවෝ වෙත්. ඔවුනොවුන් නොඉක්ම පවතිත්. එහෙයින් තරණය කිරීම් වශයෙන් සමථවිදර්ශනා යුගනන්ධ කොට වඩායයි කියනු ලැබේ.

**27.** කෙසේ දේවල නිමිති ගැනීම් නැත්ත වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩාද, සිත නොසන්සුන් බව දුරු කරන්නහුගේ සිත එකඟකමවූ නොකැලඹීම නම් සමාධි සියලු දේවල නිමිති ගැනීම් වලින් මිදුණේ වෙයි, නිවන් ගෝචරය, නොදැකීම දුරුකරන්නහුගේ (අනිත්‍යාදි වශයෙන්) නැවත නැවත බැලීමෙන් ඇතිවන විදර්ශනාව සියලු දේවල නිමිති ගැනීම්වලින් නිමිත්ත රහිතවේ. නිවන් ගොචරය. මෙසේ දේවල නිමිති නැත්ත වශයෙන් සමථ විදර්ශනාවෝ එක කටයුත්ත

ඇත්තාහු වෙත්. යුගනන්ධ වූවෝ වෙත්. ඔවුනොවුන් නොඉක්ම පවතිත්. එහෙයින් දේවල නිමිති නැත්ත වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩායයි කියනු ලැබේ.

**28.** නොපැතීම් අර්ථයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩන්නේ කෙසේද? සිතේ නොසන්සුන් බව දුරු කරන්නහුගේ සිත එකඟකමවූ නොකැලඹිල්ල නම් සමාධිය සියලු තෘෂ්ණාවන් කෙරෙන් තෘෂ්ණා රහිත වූයේ වෙයි (ii) නිර්වාණය අරමුණු කොට ඇත්තේ වෙයි. නොදැනීම දුරු කරන්නහුගේ අනිත්‍යාදි වශයෙන් නැවත නැවත බැලීම් අර්ථයෙන් ඇතිවන විදර්ශනාව සියලු තෘෂ්ණාවන් කෙරෙන් තෘෂ්ණා රහිත වූයේ වෙයි. නිර්වාණය අරමුණුකොට ඇත්තේ වෙයි. (iii) මෙසේ තෘෂ්ණා විරහිතාර්ථයෙන් සමථ විදර්ශනාවෝ එක කටයුතු ඇත්තාහු වෙත්. යුගනන්ධ වූවෝ වෙත්. ඔවුනොවුන් නොඉක්ම පවතිත්. එහෙයින් නොපැතීම් අර්ථයෙන් සමථවිදර්ශනා යුගනන්ධ කොට වඩායයි කියනු ලැබේ.

**29.** හිස් බව වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩන්නේ කෙසේද? සිතේ නොසන්සුන් බව දුරකරන්නහුගේ සිත එකඟකමවූ නොකැලඹිල්ල නම් සමාධිය ආත්ම දෘෂ්ටි ආදි සියලු ඇලීම් හිස් වූයේ වෙයි. මෙසේ හිස් බව වශයෙන් සමථ විදර්ශනාවෝ එකට කටයුතු ඇත්තාහු වෙත්. එහෙයින් හිස් බව වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩායයි කියනු ලැබේ.

**30.** 'භාවෙති' (වඩයි) යනු සතර ආකාර (වැඩීමය) භාවනාවය. (මෙහි 7 ඡේදයේ ii හා iii යොදන්න.) මෙසේ මාර්ගය පහළවේ. (මෙහි 3 ඡේදයේ (ii) යොදන්න) මෙසේ සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. අනුශයෝ (සිත පව්) අවසන් වෙත්. මෙසේ හිස් බව වශයෙන් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩයි. මේ සොළොස් අයුරින් සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩයි. මෙසේ සමථ විදර්ශනා යුගනන්ධ කොට වඩයි.

**31.** (ඔභාසාදී) ධර්මයන් නිසා ඇවිස්සීමෙන් නොසන්සුන් වීමෙන් රූප බවට පැමිණි සිත ඇතිවන්නේ කෙසේද? අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාට ආලොකය උපදී.

"ඔභාසො ධම්මො" (එළිය ධර්මයෙකි) යනු ආලෝකයට පැමිණේ. එයින් කැලඹිලි නම් (සිතේ) නොසන්සුන් බවය. ඒ නොසන්සුන් බැවින් වෙනස්වූ සිත අනිත්‍ය වශයෙන් වැටහීම ඇතිසැටියෙන් නොදනියි. දුක් වශයෙන් වැටහීම ඇති සැටියෙන් නොදනියි. අනාත්ම වශයෙන් වැටහීම ඇති සැටියෙන් නොදනියි. එහෙයින් ආලෝකය ආදී ධර්මයන්හි වෙනස් බවට පැමිණි සිත ඇත්තේයයි කියනු ලැබේ. (මාර්ගා මාර්ගයන් පරීක්ෂා කිරීමට) ඒ සුදුසු කාලයයි. යමකින් ඒ සිත සිත තුළ එල්බීම මනාව පිහිටාද මනාව තැන්පත් වේද, එකඟ වේද සමාධියට පැමිණේද, ඔහුට මාර්ගය පහළ වේ. කෙසේ මාර්ගය පහළවේද? (මෙහි 7 වන ඡේදයේ (iii) මෙසේ මාර්ගය පහළවේ. (මෙහි 3 ඡේදයේ (ii) යොදන්න) මෙසේ සංයෝජනයෝ ප්‍රහීණවෙත්. අනුශයෝ (සිත කෙලෙස්) අවසන් වෙත්.

**32.** අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නහුට (ii) විදර්ශනා ඥානය පහළවේ. (විදර්ශනා) ප්‍රීතිය පහළවේ. (ඇගේ සිතේ) සන්සිඳීම පහළවේ. සැපය පහළවේ. ශ්‍රද්ධාව පහළවේ. වීර්යය පහළවේ. සිහිය පහළවේ. (විදර්ශනා මෙන්ම සිහි කිරීම) තත්‍ර මජ්ක්ධතාව (එහි මැදහත් බව) පහළවේ. ආලෝක සහිත විදර්ශනාවෙහි ආශාව පහළවේ. (ඒ) ආශාව (මාර්ඵල) ධර්මය යයි ආශාවට පැමිණේ. එයින් චිත්ත චෛතසිකයන්ගේ විසිරී යෑම් නම්වූ නොසන්සුන් බවය. චිත්ත චෛතසිකයන්ගේ ඒ නොසන්සුන් බැවින් විරූප බවට පැමිණි සිත අනිත්‍ය වශයෙන් වැටහීම ඇතිසැටියෙන් නොදනියි. දුක් වශයෙන් වැටහීම ඇතිසැටියෙන් නොදනියි. අනාත්ම වශයෙන් වැටහීම ඇතිසැටියෙන් නොදනියි. එහෙයින් ආලෝකය ආදී ධර්මයන්හි විරූප බවට පැමිණි සිත ඇත්තේ යයි, කියනු ලැබේ. (යමකින්) ඒ සිත සිත තුළ එල්බ සිටීමෙහි මනාව පිහිටයි. මනාව තැන්පත් වෙයි. එකඟ වෙයි. සමාධියට පැමිණේ. ඔහුට මාර්ගය පහළවේ. කෙසේ මාර්ගය පහළවේද? (මෙහි 7 ඡේදයේ (iii) මෙසේ මාර්ගය පහළ වේ.

(මෙහි 3 ඡේදයේ (ii) යොදන්න) මෙසේ බැඳුම් ප්‍රහීණ වෙත්. අනුශයයෝ (සිත කෙලෙස්) අවසන් වෙත්. (iii) දුඃඛ වශයෙන් මෙනෙහි කරන්නාට (මෙහි (ii) යොදන්න) අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාට (විදර්ශනා) ඔභාසය එළිය පහළවේ. විදර්ශනා ඥානය පහළවේ. ප්‍රීතිය පහළවේ. අනාත්ම වශයෙන් අනිත්‍ය වශයෙන් දුඃඛ වශයෙන් වැටහීම ඇතිසැටියෙන් නොදනියි. එහෙයින් (ආලෝක ආදී) ධර්මයන්හි විරූප බවට පැමිණි සිත ඇත්තේ යයි කියනු ලැබේ. ඒ සිත සිත තුළ එල්බ සිටීමෙහි මනාව පිහිටයි. මනාව තැන්පත් වෙයි, එකඟවෙයි, සමාධියට පැමිණේ. ඔහුට මාර්ගය පහළවේ. කෙසේ මාර්ගය පහළවේද, (මෙහි 7 ඡේදයේ (iii) මෙසේ මාර්ගය පහළවේ. (මෙහි 3 ඡේදයේ (ii) යොදන්න) මෙසේ බැඳුම් ප්‍රහීණ වෙත්. අනුශයයෝ අවසන් වෙත්.

(v) රූපය අනිත්‍යය වශයෙන් මෙනෙහි කරන්නාට (මෙහි (ii) රූපය දුඃඛ වශයෙන් මෙනෙහි කරන්නාට (මෙහි (ii) රූපය අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාට වේදනාව අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාට (මෙහි (ii) සංඥාව අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාට (මෙහි (ii) සංස්කාරයන් අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාට (මෙහි (ii) විඥානය අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාට (මෙහි (ii) චක්ෂුව අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාට (මෙහි ii) ජරා මරණ අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාට ජරා මරණ දුඃඛ වශයෙන් මෙනෙහි කරන්නාට ජරා මරණ අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාට ආලෝකය පහළවේ. ඥානය පහළවේ. (මෙහි iv යොදන්න) ආශාව පහළවේ.

33. ඒ ආශාව (මාර්ගඵල) ධර්මයයි. ආශාවට පැමිණේ. එයින් චිත්ත චෛතසිකයන්ගේ විසිරීයෑම් නම් නොසන්සුන් බවය. චිත්ත චෛතසිකයන්ගේ ඒ නොසන්සුන් බැවින් විරූප බවට පැමිණි සිත ජරා මරණ අනාත්ම වශයෙන් එළඹ සිටීම

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ජරා මරණ අනිත්‍ය වශයෙන් එළඹ සිටීම, ජරා මරණ දුඃඛ වශයෙන් එළඹ සිටීම, ඇතිසැටියෙන් නොදනී. එහෙයින් ආලෝකය ආදී ධර්මයන්හි විරූප බවට පැමිණි සිත ඇත්තේයයි කියනු ලැබේ. ඒ සුදුසු කාලයයි. යමකින් ඒ සිත සිත තුළ එල්බීම මනාව පිහිටාද මනාව තැන්පත් වේද, එකඟවේද, සමාධියට පැමිණේද ඔහුට මාර්ගය පහළ වේ. කෙසේ මාර්ගය පහළවේද? (මෙහි 7 ඡේදයේ iii මෙසේ මාර්ගය පහළවේ. (මෙහි 3 ඡේදයේ ii යොදන්න) මෙසේ සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. අනුශයයෝ අවසන් වෙත්. මෙසේ ආලෝකය ආදී ධර්මයන්හි විරූප බවට පැමිණි සිත් ඇත්තේ යයි කියනු ලැබේ.

1. "ආලෝකයෙහිද ඥාණයෙහිද ප්‍රීතියෙහිද කම්පාවෙයි. සංසිඳීමෙහිද සැපයෙහිද යමකින් සිත කම්පාවේද,

2. "ශ්‍රද්ධාවෙහිද වීර්යයෙහිද සතියෙහිද කම්පාවෙයි සිහිකිරීමේ මැදහත් බවෙහිද තත්‍රමජ්ක්ධත්තතා (එහි මැදහත්) බවෙහිද ආශාවෙහිද කම්පාවෙයි.

3. "යමකුගේ ප්‍රඥාවෙන් මේ කරුණු දසය පුරුදු කරන ලදද (හෙතෙම ආලෝකය ආදි) ධර්මයන්හි නොසන්සුන් බව තත්වූ පරිද්දෙන් දැනීමෙහි දක්ෂයෙක්වේ. (හෙතෙම) මුළාවටද නොපැමිණේ.

4. "(මන්ද ප්‍රාඥයා) ආලෝක ආදීන්හිදී කැලඹිල්ලට පැමිණේ. ක්ලෙශයන්ගෙන්ද කෙලෙස් (විදර්ශනා) චිත්ත භාවනාද ගිලිහේ. (මධ්‍යම ප්‍රාඥයා) කැලඹිල්ලට පැමිණේ. නොකෙලෙස් භාවනාව පිරිහේ.

5. "(තීක්ෂණ ප්‍රාඥයා) කැලඹිල්ලට පැමිණේ. නොකෙලෙසේ, භාවනාව නොපිරිහේ. (අති තීක්ෂණ ප්‍රාඥයා) කැලඹිල්ලට නොපැමිණේ, නොකෙලෙසේ, භාවනාව නොපිරිහේ.

6. "මේ කරුණු සතරින් දස ස්ථානයෙහි සිතේ හැකිලීම කැලඹීමට පැමිණීම කැලඹිල්ලට නොපැමිණීම්, විරූප බවට පැමිණීම දැනගණියි."

(යුගනන්ධ කථා නිමි)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 12 සත්‍ය කථා

(11 හේ සම්පූර්ණ නිදාන කථාව සම්බන්ධ වියයුතුය.)

1. "මහණෙනි, (යථාස්වභාව වශයෙන්) සත්‍යවූ වෙනස් නොවන්නාවූ වෙන ස්වභාවයක් නැති මොව්හු සතර දෙනෙක් වෙත්. කවර සතරදෙනෙක්ද යත්?

"මහණෙනි, මේ දුඃඛය යන මෙය සත්‍යය. මෙය වෙනස් නොවන සුලුය. අන් අයුරකට පත්නොවන සුලුය. මේ සමුදය යන මෙය සත්‍යය. වෙනස් නොවනසුලුය. අන් අයුරකට පත් නොවනසුලුය. මේ දුක්ඛ නිරොධය (දුක නැතිකිරීම) යන මෙය සත්‍යය. වෙනස් නොවනසුලුය. අන් අයුරකට පත් නොවනසුලුය. මේ දුක්ඛ නිරොධගාමිනී (දුක නැතිකිරීමට යන) ප්‍රතිපදාවය යන මෙය සත්‍යය. වෙනස් නොවනසුලුය. අන් අයුරකට පත්නොවනසුලුය.

"මහණෙනි, මේ කරුණු සතර වනාහි සත්‍යවූයේ වෙනස් නොවන්නේ අන් අයුරකට පත්නොවන්නේ වෙයි.

2. "දුඃඛය යථා ස්වභාවාර්ථයෙන් සත්‍යවන්නේ කෙසේද? දුඃඛයාගේ සත්‍යවූ වෙනස් නොවන අන් අයුරකට පත් නොවන දුඃඛාර්ථයෝ සතරදෙනෙක් වෙත්. දුඃඛයාගේ පෙළීමේ අර්ථය සංඛත (හටගැනීම්) අර්ථය සන්තාප (තැවීම්) අර්ථය විපරිණාම (වෙනස්වීම්) අර්ථය (යන) මොව්හු සතර දෙන දුඃඛයාගේ සත්‍යවූ වෙනස් නොවන අන් අයුරකට පත්නොවන දුඃඛාර්ථයෝ වෙත්. මෙසේ දුඃඛය යථා ස්වභාවාර්ථයෙන් සත්‍යය.

3. "සමුදය යථාස්වභාවර්ථයෙන් සත්‍යවන්නේ කෙසේද? සමුදයාගේ සත්‍යවූ වෙනස් නොවන අන් අයුරකට පත් නොවන සමුදයාර්ථයෝ සතරදෙනෙක් වෙත්. සමුදයාගේ ආයුහන (රැස්කිරීම්) අර්ථය නිදාන (මුල්වීම්) අර්ථය සංයෝග (එක්වීම්) අර්ථය පළිබොධ (උවදුරු) අර්ථය (යන මොව්හු සතරදෙන සමුදයාගේ සත්‍යවූ වෙනස් නොවන අන් අයුරකට පත්නොවන සමුදයාර්ථයෝ වෙත්. මෙසේ සමුදය යථා ස්වභාවාර්ථයෙන් සත්‍යය.

4. "නිරොධය යථාස්වභාවාර්ථයෙන් සත්‍යවන්නේ කෙසේද? නිරොධයාගේ සත්‍යවූ වෙනස් නොවන අන් අයුරකට

පත් නොවන නිරොධාර්ථයෝ සතරදෙනෙක් වෙත්. නිරොධයාගේ නිශ්ශරණ (නිදහස්වීම්) අර්ථය විවෙකාර්ථය අසංස්කෘත (සකස් කිරීම් නොවන) අර්ථය අමෘතාර්ථය (යන) මොව්හු සතරදෙන නිරොධයාගේ සත්‍යවූ වෙනස් නොවන අන් අයුරකට පත්නොවන නිරොධාර්ථයෝ වෙත්. මෙසේ නිරොධය යථාස්වභාවාර්ථයෙන් සත්‍යය.

**5.** "මාර්ගය යථාස්වභාවාර්ථයෙන් සත්‍යවන්නේ කෙසේද? මාර්ගයාගේ සත්‍යවූ වෙනස් නොවන අන්අයුරකට පත්නොවන මාර්ගාර්ථයෝ සතරදෙනෙක් වෙත්. මාර්ගයාගේ නෛර්යානික (නිදහස් කරන) අර්ථය, දර්ශන (දැකීම්) අර්ථය, හෙත්වර්ථය අධිපති (මූලික) අර්ථය (යන) මොව්හු සතර දෙන මාර්ගයාගේ සත්‍යවූ වෙනස් නොවන අන් අයුරකට පත් නොවන මාර්ගාර්ථයෝ වෙත්.

මෙසේ මාර්ගය යථා ස්වභාවාර්ථයෙන් සත්‍යය.

**6.** "කී අයුරකින් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්ද? සිව් අයුරකින් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්. යථාස්වභාවාර්ථයෙන්, අනාත්මාර්ථයෙන්, සත්‍යාර්ථයෙන් ප්‍රතිවෙධාර්ථයෙන් (යන මේ සිව් අයුරෙහි) චතුර්විධ සත්‍යයෝ මේ සිව් අයුරෙන් එකට එක්වූවෝවෙත් යමක් එකට එක්වූවෝ නම් එය එක තේරුමක් ඇත්තේය. එක තේරුම එක් ඥානයකින් අවබොධකෙරේනුයි සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහුවෙත්.

**7.** "කෙසේ යථාස්වභාවාර්ථයෙන් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්ද? සිව් අයුරකින් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්. දුඃඛයාගේ දුඃඛාර්ථය යථා ස්වභාවාර්ථය සමුදයාගේ සමුදයාර්ථය යථාස්වභාවාර්ථය නිරොධයාගේ නිරොධාර්ථය යථා ස්වභාවාර්ථය මාර්ගයාගේ මාර්ගාර්ථය යථාස්වභාවාර්ථය (යන) මේ සිවු අයුරෙන් යථාස්වභාවාර්ථයෙන් සතර ආකාර සත්‍යයෝ එකට එකතු වෙත්. යමක් එකට එකතුවේ නම් එය එක තේරුමක් ඇත්තේය. එකම තේරුම එක් ඥානයකින් අවබොධ කෙරේනුයි. සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්.

8. (i) කෙසේ අනාත්මාර්ථයෙන් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්ද? සිවු අයුරකින් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්. දුඃඛයාගේ දුඃඛාර්ථය අනාත්මාර්ථය සමුදයාගේ සමුදයාර්ථය අනාත්මාර්ථය නිරොධයාගේ නිරොධාර්ථය අනාත්මාර්ථය මාර්ගයාගේ මාර්ගාර්ථය අනාත්මාර්ථය (යන) මේ සිව් අයුරෙන් අනාත්මාර්ථයෙන් සතර ආකාර සත්‍යයෝ එකට එකතුවෙත්. යමක් එකට එකතුවේ නම් එය එක තේරුමක් ඇත්තේය. එක තේරුම එක් ඥානයකින් අවබොධ කෙරේනුයි සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්.

9. "කෙසේ සත්‍යාර්ථයෙන් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්ද? මේ සිව් අයුරකින් සත්‍යාර්ථයෙන් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්. දුඃඛයාගේ දුඃඛාර්ථය සත්‍යාර්ථය සමුදයාගේ සමුදයාර්ථය සත්‍යාර්ථය නිරොධයාගේ නිරොධාර්ථය සත්‍යාර්ථය මාර්ගයාගේ මාර්ගාර්ථය සත්‍යාර්ථය (යන) මේ සිව් අයුරෙන් සත්‍යාර්ථයෙන් සතර ආකාර සත්‍යයෝ එකට එකතුවෙත්. යමක් එකට එකතුවේ නම් එය එක තේරුමක් ඇත්තේ එකාර්ථය එක් ඥානයකින් අවබොධ කෙරේනුයි සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්.

10. "කෙසේ අවබොධ අර්ථයෙන් සතර ආකාර සත්‍යායෝ එක්වර අවබොධය ඇත්තාහුවෙත්ද? සිව් අයුරකින් අවබොධ අර්ථයෙන් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහුවෙත්. දුඃඛයාගේ දුඃඛාර්ථය අවබොධ අර්ථය සමුදයාගේ සමුදාර්ථය අවබොධ අර්ථය නිරොධයාගේ නිරොධාර්ථය අවබොධාර්ථය මාර්ගයාගේ මාර්ගාර්ථය අවබොධ අර්ථය (යන) මේ සතර ආකාරයෙන් අවබොධ අර්ථයෙන් සතර ආකාර සත්‍යයෝ එකට එකතුවෙත්. යමක් එකට එකතුවේනම් එය එක තේරුමක් ඇත්තේය. එක තේරුම එක් ඥානයකින් අවබොධ කෙරේනුයි සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්.

11. "කෙසේ සතර ආකාර සත්‍යයෝ එක්වර අවබෝධය ඇත්තාහු වෙත්ද? යමක් අනිත්‍ය නම්, එය දුඃඛයකි. යමක් අනිත්‍යද දුඃඛද එය අනාත්මය. යමක් අනිත්‍යද දුඃඛද අනාත්මද එය (තථ) යථාස්වභාවයකි. යමක් අනිත්‍යද දුඃඛද අනාත්මද යථාස්වභාවද සත්‍යද එය සත්‍යයකි. යමක් අනිත්‍යද දුඃඛද අනාත්මද යථා ස්වභාවද සත්‍යද එය එකට එකතුය. යමක් එකට එකතු නම් එය එක තේරුමක් ඇත්තේය. එකාර්ථය එක් ඥානයකින් අවබොධ කෙරේනුයි සතර ආකාර සත්‍යයෝ එක්වර අවබෝධය ඇත්තාහු වෙත්.

12. "කී අයුරකින් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබෝධය ඇත්තාහු වෙත්ද? නවාකාරයකින් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබෝධය ඇත්තාහු වෙත්. යථාස්වභාවාර්ථයෙන් අනාත්මාර්ථයෙන් සත්‍යාර්ථයෙන් අවබොධ අර්ථයෙන් හැඳිනීම් අර්ථයෙන් තීන්දු කිරීම් අර්ථයෙන් ගෙවාදැමීම් (යන) මේ නවාකාරයෙන්සතර ආකාර සත්‍යයෝ එකට එකතුවූවෝ වෙත් යමක් එකට එකතුද එය එක් තේරුමක් ඇත්තේය. එක් අර්ථයක් එක් ඥානයකින් අවබොධ කෙරේනුයි සතර ආකාර සත්‍යයෝ එක්වර අවබෝධය ඇත්තාහු වෙත්.

13. "කෙසේ යථාස්වභාවාර්ථයෙන් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධ ඇත්තාහු වෙත්ද? නවාකාරයකින් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබෝධය ඇත්තාහුවෙත්. දුඃඛයාගේ දුඃඛාර්ථය යථාස්වභාවාර්ථය සමුදයාගේ සමුදයාර්ථය යථාස්වභාවාර්ථය නිරොධයාගේ නිරොධාර්ථය යථා ස්වභාවාර්ථය මාර්ගයාගේ මාර්ගාර්ථය යථා ස්වභාවාර්ථය හැඳිනීමගේ හැඳිනීම් අර්ථය යථා ස්වභාවාර්ථය තීන්දු කිරීමගේ තීන්දු කිරීම් අර්ථය යථා ස්වභාර්ථය ගෙවා දැමීමගේ ගෙවාදැමීම් අර්ථය යථාස්වභාවාර්ථය භාවනාවගේ භාවනාර්ථය යථා ස්වභාවාර්ථය ප්‍රත්‍යක්ෂ කිරීමගේ ප්‍රත්‍යක්ෂ කිරීමේ ඥානය යථා ස්වභාවාර්ථය (යන) මේ නවාකාරයෙන් සතර ආකාර සත්‍යයෝ එකට එකතුවෙත්. යමක් එකට එකතුවේද, එය එක තේරුමක් ඇත්තේය. එක තේරුමක් එක් ඥානයකින් අවබොධ කෙරේනුයි සතර ආකාර සත්‍යයෝ එක්වර අවබෝධය ඇත්තාහුවෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

14. "කෙසේ අනාත්මාර්ථයෙන් (මෙහි 8 ඡේදයේ (i) යෙදිය යුතුයි.) සත්‍යාර්ථයෙන් (මෙහි 9 ඡේදයේ (i) යෙදිය යුතුයි.) අවබොධ කිරීමේ අර්ථයෙන් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්ද? නවාකාරයකින් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්. දුඃඛයාගේ දුක්ඛාර්ථය අවබොධ කිරීමේ අර්ථය, සමුදයාගේ සමුදායාර්ථය අවබොධ කිරීම් අර්ථය, නිරොධයාගේ නිරොධාර්ථය අවබොධ කිරීම් අර්ථය මාර්ගයාගේ මාර්ගාර්ථය අවබොධ කිරීම් අර්ථය, හැඳිනීමගේ හැඳිනීම් අර්ථය, අවබොධ අර්ථය, තීන්දු කිරීමගේ තීන්දු කිරීම් අර්ථය, අවබොධ කිරීමේ අර්ථය, භාවනාවගේ භාවනාර්ථය අවබොධ කිරීමේ අර්ථය, ප්‍රත්‍යක්ෂ කිරීමගේ ප්‍රත්‍යක්ෂ කිරීම් අර්ථය, අවබොධ කිරීම් අර්ථය (යන) මේ නවාකාරයෙන් අවබොධ කිරීම් අර්ථයෙන් සතර ආකාර සත්‍යයෝ එකට එකතුවෙත්. යමක් එකට එකතු නම් එය එක තේරුමක් ඇත්තේය. එක අදහසක් එක් ඥානයකින් අවබොධ කෙරේනුයි සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහුවෙත්.

15. කී අයුරකින් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්ද? දොළොස් ආකාරයකින් සතර වැදෑරුම් සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහුවෙත්. යථා ස්වභාවාර්ථයෙන් අනාත්මාර්ථයෙන් සත්‍යාර්ථයෙන් අවබොධ කිරීම් අර්ථයෙන් හැඳිනීම් අර්ථයෙන් තීන්දු කිරීම් අර්ථයෙන් (ස්වභාව ධාරණාදී) ධර්මාර්ථයෙන් තථාර්ථයෙන් ඥානාර්ථයෙන් ප්‍රත්‍යක්ෂ කිරීම් අර්ථයෙන් ස්පර්ශ කිරීම් අර්ථයෙන් අභිසමයාර්ථයෙන් (යන) මේ දොළොස් ආකාරයෙන් සතර ආකාර සත්‍යයෝ එකට එකතු වූවෝ වෙත්. යමක් එකට එකතුවේ නම් එය එක තේරුමක් ඇත්තේය. එක තේරුම එක් ඥානයකින් අවබොධ කෙරේනුයි සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්.

16. "කෙසේ යථාස්වභාවාර්ථයෙන් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්ද? දුඃඛයාගේ පෙළීම අර්ථය හටගැනීම් අර්ථය තැවීම් අර්ථයි වෙනස්වීම් අර්ථය

යථාස්වභාවාර්ථය සමුදයාගේ රැස්කිරීම් අර්ථය මුල්වීම් අර්ථය එක්වීම් අර්ථය උවදුරුවීම් අර්ථය යථාස්වභාවාර්ථය නිරොධයාගේ නිදහස්වීම් අර්ථය වෙන්වීම් අර්ථය නොහටගැනීම් අර්ථය නොමැරීම් අර්ථය යථාස්වභාවාර්ථය මාර්ගයාගේ නික්මීම් අර්ථය හෙත්වාර්ථය දැකීම් අර්ථය ප්‍රධාන වීමේ අර්ථය යථාස්වාභාවාර්ථය (යන) මේ දහසය ආකාරයෙන් සතර ආකාර සත්‍යයෝ එකට එකතුවෙත්. යමක් එකට එකතු නම් එය එක් තේරුමක් ඇත්තේය. එක අදහසක් එක් ඥානයකින් අවබොධ කෙරේනුයි සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහුවෙත්.

17. "කෙසේ අනාත්මාර්ථයෙන් (මෙහි 8 ඡේදයේ (i) යෙදිය යුතුයි.) සත්‍යාර්ථයෙන් අවබොධ කිරීම් අර්ථයෙන් හැඳිනීම් අර්ථයෙන් තීන්දු කිරීමේ අර්ථයෙන් ධර්මාර්ථයෙන් තථාර්ථයෙන් ඥානාර්ථයෙන් ප්‍රත්‍යක්ෂ කිරීම් අර්ථයෙන් ස්පර්ශ කිරීම් අර්ථයෙන් අභිසමයාර්ථයෙන් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්ද? දහසය ආකාරයකින් අභිසමයාර්ථයෙන් සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්. දුඃඛයාගේ පෙළීම් අර්ථය හටගැනීම් අර්ථය තැවීම් අර්ථය වෙනස්වීම් අර්ථය අභිසමයාර්ථය සමුදයාගේ රැස්කිරීම් අර්ථය මුල්වීම් අර්ථය එකතුවීම් අර්ථය උවදුරුවීම් අර්ථය අභිසමයාර්ථ නිරොධයාගේ නිදහස්වීම් අර්ථය වෙන්වීම් අර්ථය නොහට ගැනීම් අර්ථය නොමැරීම් අර්ථය අභිසමයාර්ථය මාර්ගයාගේ නිදහස්වීමේ අර්ථය හෙත්වාර්ථය දැකීමේ අර්ථය මූලිකවීමේ අර්ථය අභිසමයාර්ථය (යන) මේ දහසයකාරයෙන් අභිසමයාර්ථයෙන් සතර ආකාර සත්‍යයෝ එකට එකතු වෙත්. යමක් එකට එකතුවේ නම් එය එක තේරුමක් ඇත්තේය. එක තේරුමක් එක් ඥානයකින් අවබොධ කෙරේනුයි. සතර ආකාර සත්‍යයෝ එක්වර අවබොධය ඇත්තාහු වෙත්.

18. "සත්‍යයන්ගේ ලක්ෂණ කෙතෙක්ද? සත්‍යයන්ගේ ලක්ෂණ දෙකෙකි. හටගැනීම් ලක්ෂණයද නොහටගැනීම් ලක්ෂණයද (යන මේ) සත්‍යයන්ගේ ලක්ෂණ දෙකයි. සත්‍යයන්ගේ ලක්ෂණ කෙතෙක්ද? සත්‍යයන්ගේ ලක්ෂණ සයකි.

හටගැනීමේ සත්‍යයන්ගේ ඇතිවීම පෙනේ. නැතිවීම පෙනේ පවත්නහුගේ අන් අයුරකට එක්වීම පෙනේ. නොහටගැනීමේ සත්‍යයාගේ ඇතිවීම නොපෙනේ. නැතිවීම නොපෙනේ පවත්නහුගේ අන් අයුරකට පත්වීම නොපෙනේ. සත්‍යයන්ගේ මේ ලක්ෂණ සය වේ.

**19.** "සත්‍යයන්ගේ ලක්ෂණ කෙතෙක්ද, සත්‍යයන්ගේ ලක්ෂණ දොළසකි. දුක්ඛසත්‍යයාගේ ඇතිවීම පෙනේ, නැතිවීම පෙනේ. පවත්නහුගේ අන් අයුරකට පත්වීම පෙනේ. සමුදය සත්‍යයාගේ ඇතිවීම පෙනේ. නැතිවීම පෙනේ. පවත්නහුගේ අන් අයුරකට පත්වීම පෙනේ. මාර්ගසත්‍යයාගේ ඇතිවීම පෙනේ. නැතිවීම පෙනේ. පවත්නහුගේ අන් අයුරකට පැමිණීම පෙනේ. නිරොධ සත්‍යයාගේ ඇතිවීම නොපෙනේ. නැතිවීම නොපෙනේ. පවත්නහුගේ අන් අයුරකට පත්වීම නොපෙනේ. සත්වයන්ගේ මේ දොළොස් ලක්ෂණය වේ.

**20.** "සතර ආකාර සත්‍යයන්ගේ කුශලයෝ කවරහුද? අකුශලයෝ කවරහුද? අව්‍යාකෘතයෝ කවරහුද? සමුදය සත්‍යය අකුශලය මාර්ග සත්‍යය කුශලය, නිරොධ සත්‍යය අව්‍යාකෘතය, දුක්ඛසත්‍යය කුසල්ද, අකුසල්ද, අව්‍යාකෘතද වන්නේය. පිළිවෙළින් සත්‍ය තුනක් ස්ථානය වශයෙන් එක් සත්‍යයෙක්හි ඇතුළත්ය. එක් සත්‍යයක් සත්‍ය තුනක ඇතුළත්ය.

"වන්නේ" යනු කෙසේ වන්නේද, යම් දුක්ඛසත්‍යයක් අකුශලද සමුදය සත්‍යය අකුශලද, මෙසේ අකුශල වශයෙන් සත්‍ය දෙකක් එක් සත්‍යයෙක්හි ඇතුළත්ය. එක් සත්‍යයක් සත්‍ය දෙකක ඇතුළත්ය. යම් දුක්ඛසත්‍යයන් කුශලද, මාර්ග සත්‍යය කුශලද මෙසේ කුශල වශයෙන් සත්‍ය දෙකක් එක් සත්‍යයෙක්හි ඇතුළත්ය. එක් සත්‍යයක් සත්‍ය දෙකක ඇතුළත්ය. යම් දුක්ඛසත්‍යයක් (අව්‍යාකෘත)ද නිරොධ සත්‍යය අව්‍යාකෘතද, මෙසේ අව්‍යාකෘත වශයෙන් සත්‍ය දෙකක් එක් සත්‍යයෙක්හි ඇතුළත්ය. එක් සත්‍යයක් සත්‍ය දෙකක ඇතුළත්ය. මෙසේ වන්නේය.

"පිළිවෙළින් ඇත්ත තුනක් ස්ථානය වශයෙන් එක් සත්‍යයෙක්හි ඇතුළත්ය.

21. "මහණෙනි, සම්‍යක් සම්බෝධියෙන් පූර්වයෙහි සියලු ධර්මයන් අවබොධ නොකළාවූ බොධිසත්වවූ (බෝධි පර්යංකයෙහි සිටි) මට මෙබඳු විතර්කයක් (අදහසක්) ඇතිවිය. රූපයාගේ ආශ්වාදය (රස ගැන්ම) වනාහි කවරේද? දොශය කවරේද, නිදහස්වීම කුමක්ද සංඥාවගේ ආශ්වාදය (රසගැන්ම) කවරේද, දොෂය කවරේද, නිදහස්වීම කුමක්ද, සංස්කාරයන්ගේ ආශ්වාදයද (රසගැන්ම) කවරේද, දොෂය කවරේද, නිදහස්වීම කුමක්ද, විඥානයාගේ ආශ්වාදය (රසගැන්ම) කවරේද, දොශය කවරේද, නිදහස්වීම කුමක්ද? මහණෙනි, ඒ මට මෙබඳු සිතෙක් විය. (ii) 'යම් රූපයක් ඇසුරුකොටගෙන (වනාහි) සැපයක් සොම්නසක් උපදීද, මෙය රූපයාගේ ආශ්වාදය (රසගැන්ම) යි. යම් රූපයක් අනිත්‍යද, දුක්බද වෙනස්වන සුළුද මේ රූපයාගේ දොෂයයි. රූපයාගේ යම් ඡන්දරාග සංවරණයක්, ඡන්දරාග ප්‍රහාණයක්වේද මෙය රූපයාගේ නිදහස්වීමයි (iii) යම් වේදනාවක් ඇසුරුකොට (මෙහි (ii) රූපයක් යනු වේදනාවක් යනුවෙන් වෙනස්කොට යොදන්න) යම් සංඥාවක් ඇසුරුකොට යම් සංස්කාරයක් ඇසුරුකොට යම් විඥානයක් ඇසුරුකොට සැපයක් සොම්නසක් උපදීද, මෙය විඥානයාගේ ආශ්වාදය (රසගැන්ම) යම් විඥානයක් අනිත්‍යයද, දුක්බද, වෙනස්වනසුළුද මේ විඥානයාගේ දොෂයයි. විඤ්ඤාණයෙහි යම් ඡන්දරාග සංවරණයක් ඡන්දරාග ප්‍රහාණයක් වේද, මෙය විඥානයාගේ නිදහස්වීමයි.

22. "මහණෙනි, මම යම්තාක් කල් මේ උපාදාන (-අල්ලාගත්) ස්කන්ධ පඤ්චකයාගේ ආශ්වාදය (රසවිඳීම) ආශ්වාදය වශයෙන්ද, දොෂය දොෂය වශයෙන්ද, නිදහස්වීම නිදහස්වීම වශයෙන්ද, මෙසේ ඇති සැටියෙන් උසස් නුවණින් අවබොධ නොකෙළෙම්ද, මහණෙනි, මම ඒතාක් දෙවියන් සහිත මාරයන් සහිත බ්‍රහ්මයන් සහිත සත්වලෝකයෙහිද, මහණ බමුණන් සහිත දෙවි මිනිසුන් සහිත ප්‍රජාව අතරෙහිද උතුම්වූ සම්‍යක් සම්බෝධිය ප්‍රත්‍යක්ෂ කෙළෙමියි ප්‍රතිඥා නොකෙළෙමි. මහණෙනි යම් කලෙක්හි වනාහි මට උපාදාන ස්කන්ධ පඤ්චකයාගේ (සිත කයේ) ආශ්වාදය (රස ගැනීම්) ආශ්වාදය වශයෙනුත් දොෂය

වශයෙනුත් නිදහස්වීම් නිදහස්වීම වශයෙනුත මෙසේ ඇතිසැටියෙන් උසස් නුවණින් අවබොධ කෙළෙම්ද, මහණෙනි, මට ඉන්පසුව දෙවියන් සහිත මරුන් සහිත බ්‍රහ්මයන් සහිත ලොකයෙහි මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාව අතරෙහි උතුම් සම්‍යක් සම්බෝධිය අවබොධ කෙළෙම්යි ප්‍රතිඥා කෙළෙමි. මට වනාහි ඥානදර්ශනය පහළවිය. මාගේ සිතේ මිදීම තැන්පත්ය මේ අන්තිම ජාතියයි. දැන් මට පුනරුත්පත්තියක් නැත.

23. "(i) රූපය ඇසුරුකොට යම් සැපයක් සොම්නසක් උපදීද, මේ රූපයාගේ ආශ්වාදයයි. ප්‍රහාණ ප්‍රතිවෙධ සමුදය සත්‍යයයි යම් රූපයක් අනිත්‍යයද, අනාත්මද වෙනස්වන සුළුද මේ රූපයාගේ දොෂයයි. පරිඥා ප්‍රතිවෙධ (තීන්දුකිරීමේ අවබොධ) දුක්ඛ සත්‍යයයි. රූපයෙහි යම් ඡන්ද රාග විනයක් ඡන්දරාග ප්‍රහාණයක් වේද, මෙය රූපයාගේ නිදහස්වීමයි. ප්‍රත්‍යක්ෂ කිරීමේ අවබොධය නිරොධ සත්‍යයයි. මේ තුන් තැන්හි යම් දිට්ඨි සංකප්ප, වාචා, කම්මන්ත, ආජීව, වායාම සති සමාධි යන මොව්හු (වෙත්ද ඔව්හු) වැඩීමේ- (භාවනා) අවබොධය මාර්ග සත්‍යයයි (ii) යම් වේදනාවක් ඇසුරුකොට (මෙහි (i) රූපය යනු වේදනාවක් යයි වෙනස්කොට යොදන්න) යම් සංඥාවක් ඇසුරුකොට යම් සංස්කාරයක් ඇසුරුකොට යම් විඥානයක් ඇසුරුකොට සැපයක් සොම්නසක් උපදීද, මෙය විඥානයාගේ ආශ්වාදයයි. ගෙවීමේ අවබොධය සමුදය සත්‍යයයි. යම් විඥානයක් අනිත්‍යයද, දුක්ඛද, වෙනස්වනසුළුද, මේ විඥානයාගේ දොෂයයි. තීන්දු කිරීමේ අවබෝධය දුක්ඛසත්‍යයයි. විඥානයෙහි යම් ඡන්දරාග සංවරණයක් ඡන්දරාග ප්‍රහාණයක්වේද, මේ විඥාණයාගේ නිදහස්වීමයි. ප්‍රත්‍යක්ෂ කිරීමේ අවබොධය නිරොධ සත්‍යයයි. මේ තුන් තැන්හි යම් දිට්ඨි සංකප්ප වාචා කම්මන්ත ආජීව වායාම සති සමාධි යන මොව්හු වෙත්ද, ඔව්හු වැඩීමේ (-භාවනා) අවබොධයවූ මාර්ග සත්‍යයයි.

24. "සත්‍යය" (ඇත්තය) යනු කී අයුරකින් සත්‍යවේද? තුන් අයුරකින් සත්‍යවේ. සෙවීමේ අර්ථයෙන් අයත් කිරීම් අර්ථයෙන් (හා) අවබොධ කිරීම් අර්ථයෙනි.

"කෙසේ සෙවීමේ අර්ථයෙන් සත්‍යවේද, ජරා මරණයෝ කුමක් ඥාන මූල හේතු කොට ඇත්තාහුද, කුමක් සමුදයකොට ඇත්තාහුද, කුමක් ජාතිකොට ඇත්තාහුද, කුමක් ප්‍රභවකොට ඇත්තාහුදැයි මෙසේ (සෙවීම් වශයෙන්) සෙවීම් අර්ථයෙන් සත්‍යය ජරා මරණයෝ ජාතිය (ඉපදීම) නිදාන කොට ඇත්තාහුය, ජාතිය සමුදයකොට ඇත්තාහුය. ජාතිය ජාතියකොට ඇත්තාහුය. ජාතිය ප්‍රභවකොට ඇත්තාහුය. මෙසේ අයත්වීම් අර්ථයෙන් සත්‍යය ජරා මරණද දකියි. ජරාමරණ සමුදය දනියි. ජරාමරණ නිරොධයද දනියි. ජරාමරණ නිරෝධගාමිනී ප්‍රතිපදාවද දනියි. මෙසේ අවබොධ වීම් අර්ථයෙන් සත්‍යය.

**25.** "ජාතිය කුමක් නිදාන (මුල්) කොට ඇත්තේද කුමක් සමුදයකොට ඇත්තේද, කුමක් ජාතියකොට ඇත්තේද, කුමක් ප්‍රභවකොට ඇත්තේදැයි මෙසේ සෙවීම් අර්ථයෙන් සත්‍යය ජාතිය (කර්ම) භවය නිදානකොට ඇත්තේය. භවය සමුදයකොට ඇත්තේය. භවය ජාතිකොට ඇත්තේය. භවය ප්‍රභවකොට ඇත්තේය. මෙසේ අයත්වීම් අර්ථයෙන් සත්‍යය.

"ජාතියද දනියි, ජාති සමුදයද දනියි, ජාති නිරොධයද දනියි. ජාති නිරොධගාමිනී ප්‍රතිපදාවද දනියි, මෙසේ අවබොධ වීම් අර්ථයෙන් සත්‍යයය. (කර්ම) භවය කුමක් නිදානකොට පවතීද. කුමක් සමුදයකොට පවතීද, කුමක් ජාතිකොට පවතීද, කුමක් ප්‍රභවකොට පවතීද, මෙසේ සෙවීම් අර්ථයෙන් සත්‍යය භවය උපාදානය (දැඩිකොට අල්ලාගැනීම) නිදානයකොට පවතී. උපාදානය සමුදයකොට පවතී, උපාදානය ජාතිකොට පවතී, උපාදානය ප්‍රභවකොට පවතීයයි මෙසේ අයත් වීම අර්ථයෙන් සත්‍යය භවයද දනියි. භව සමුදයද දනියි. භව නිරොධයද දනියි. භව නිරොධගාමිනී ප්‍රතිපදාවද දනියි, මෙසේ අවබොධ කිරීම් අර්ථයෙන් සත්‍යය.

**26.** "උපාදානය කුමක් නිදානකොට පවතීද, කුමක් සමුදයකොට පවතීද, කුමක් ජාතිකොට පවතීද, කුමක් ප්‍රභවකොට පවතීදැයි මෙසේ සෙවීම් අර්ථයෙන් සත්‍යයි. උපාදානය තෘෂ්ණාව නිදානකොට පවතී. තෘෂ්ණාව සමුදයකොට පවතී, තෘෂ්ණාව ජාතිකොට පවතී, තෘෂ්ණාව ප්‍රභවකොට පවතී

යයි මෙසේ අයත්වීම් අර්ථයෙන් සත්‍යය, උපාදානයද දනියි. උපාදන සමුදය දනියි. උපාදාන නිරොධයද දනියි. උපාදාන නිරොධ ගාමිනී ප්‍රතිපදාවද දනියි. මෙසේ අවබොධ කිරීම් අර්ථයෙන් සත්‍යය.

27. "තෘෂ්ණාව කුමක් නිදාන කොට පවතීද, කුමක් සමුදයකොට පවතීද, කුමක් ජාති කොට පවතීද, කුමක් ප්‍රභවකොට පවතීදැයි මෙසේ සෙවීම් අර්ථයෙන් සත්‍යය. උපාදානය තෘෂ්ණාව නිදාන කොට පවතී. තෘෂ්ණාව සමුදය කොට පවතී, තෘෂ්ණාව ජාතිකොට පවතී. තෘෂ්ණාව ප්‍රභව කොට පවතීයයි, මෙසේ අයත් කිරීම් අර්ථයෙන් සත්‍යය උපාදානයද දනියි. උපාදාන සමුදයද දනියි. උපාදාන නිරොධයද දනියි. උපාදාන නිරොධ ගාමිනී ප්‍රතිපදාවද දනියි. මෙසේ අවබොධ කිරීම් අර්ථයෙන් සත්‍යය.

28. "තෘෂ්ණාව කුමක් නිදානකොට පවතීද, කුමක් ප්‍රභව කොට පවතීද, මෙසේ සෙවීම් අර්ථයෙන් සත්‍යය, තෘෂ්ණාව වේදනාව නිදාන කොට පවතී, වේදනාව සමුදය කොට පවතී. වේදනාව ජාතිකොට පවතී. වේදනාව ප්‍රභව කොට පවතීයයි මෙසේ අයත් කිරීම් අර්ථයෙන් සත්‍යය. තෘෂ්ණාවද දනියි. තෘෂ්ණා සමුදයද දනියි. තෘෂ්ණා නිරොධයද දනියි. තෘෂ්ණා නිරොධ ගාමිනී ප්‍රතිපදාවද දනියි. මෙසේ අවබොධ කිරීම් අර්ථයෙන් සත්‍යය.

29. "වේදනාව කුමක් නිදානකොට පවතීද, කුමක් සමුදය කොට පවතීද, කුමක් ජාතිකොට පවතීද, කුමක් ප්‍රභවකොට පවතීද මෙසේ සෙවීම් අර්ථයෙන් සත්‍යය වේදනාව ස්පර්ශය නිදානකොට පවතී, ස්පර්ශය සමුදය කොට පවතී, ස්පර්ශය ජාතිකොට පවතී. ස්පර්ශය ස්පර්ශය ප්‍රභවකොට පවතීයයි මෙසේ අයත් කිරීම් අර්ථයෙන් සත්‍යය. වේදනාවද දනියි. වේදනා සමුදයද දනියි. වේදනා නිරොධයද දනියි. වේදනා නිරොධ ගාමිනී ප්‍රතිපදාවද දනියි. මෙසේ අවබොධ කිරීම් අර්ථයෙන් සත්‍යය.

30. "ස්පර්ශය කුමක් නිදානකොට පවතීද, කුමක් සමුදය කොට පවතීද, කුමක් ජාතිකොට පවතීද, කුමක් ප්‍රභවකොට

පවතීද මෙසේ සෙවීම් අර්ථයෙන් සත්‍යය. ස්පර්ශය (ඇස කන ආදී) සළායතන නිදානකොට පවතී. සළායතන සමුදය කොට පවතී සළායතන ජාතිකොට පවතී සළායතන ප්‍රභව කොට පවතීයයි මෙසේ ප්‍රතිග්‍රහාර්ථයෙන් සත්‍යය ස්පර්ශයද දනියි. ස්පර්ශ සමුදයද දනියි. ස්පර්ශ නිරොධයද දනියි. ස්පර්ශ නිරොධ ගාමිනී ප්‍රතිපදාවද දනියි. මෙසේ අවබොධ අර්ථයෙන් සත්‍යය.

31. "සළායතන කුමක් නිදාන කොට පවතීද, කුමක් සමුදය කොට පවතීද කුමක් ජාතිකොට පවතීද, කුමක් ප්‍රභවකොට පවතීදැයි මෙසේ සෙවීම් අර්ථයෙන් සත්‍යය සළායතනය නාම රූප නිදානකොට පවතී. නාම රූප සමුදය කොට පවතී. නාම රූප ජාතිකොට පවතී. නාම රූප ප්‍රභව කොට පවතීයයි මෙසේ අයත් කිරීම් අර්ථයෙන් සත්‍යය සළායතනය දනියි. සළායතන සමුදයද දනියි. සළායතන නිරෝධයද දනියි. සළායතන නිරොධ ගාමිනී ප්‍රතිපදාවද දනියි. මෙසේ අවබොධ කිරීම අර්ථයෙන් සත්‍යය.

32. "නාමරූප කුමක් නිදාන කොට පවතීද, කුමක් සමුදයකොට පවතීද, කුමක් ජාතිකොට පවතීද, කුමක් ප්‍රභව කොට පවතීදැයි මෙසේ සෙවීම් අර්ථයෙන් සත්‍යය නාමරූප විඥාන නිදානකොට පවතී. විඥානය සමුදය කොට පවතී. විඥානය ජාතිකොට පවතී. විඥානය ප්‍රභවකොට පවතීයයි මෙසේ අයත් කිරීම් අර්ථයෙන් සත්‍යය නාම රූපද දනියි. නාම රූප සමුදයද දනියි. නාමරූප නිරොධයද දනියි. නාම රූප නිරොධගාමිනී ප්‍රතිපදාවද දනියි. මෙසේ අයත් කිරීම් අර්ථයෙන් සත්‍යය.

33. "විඥානය කුමක් නිදාන කොට පවතීද කුමක් සමුදයකොට පවතීද කුමක් ජාතිකොට පවතීද කුමක් ප්‍රභව කොට පවතීදැයි මෙසේ සෙවීම් අර්ථයෙන් සත්‍යය විඥානය සංස්කාර නිදානකොට පවතී. සංස්කාර සමුදය කොට පවතී. සංස්කාර ජාතිකොට පවතී, සංස්කාර ප්‍රභව කොට පවතීයයි මෙසේ අයත් කිරීම් අර්ථයෙන් සත්‍යය, විඥානයද දනියි. විඥාන සමුදයද දනියි. විඥාන නිරොධයද දනියි. විඥාන නිරොධ ගාමිනී ප්‍රතිපදාවද දනියි. මෙසේ අවබොධ කිරීම් අර්ථයෙන් සත්‍යය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

34. "සංස්කාරයෝ කුමක් නිදානකොට ඇත්තාහුද කුමක් සමුදය කොට ඇත්තාහුද කුමක් ජාතිකොට ඇත්තාහුද කුමක් ප්‍රභවකොට ඇත්තාහුදැයි මෙසේ සෙවීම් අර්ථයෙන් සත්‍යය.

"සංස්කාරයෝ අවිද්‍යාව නිදාන කොට ඇත්තාහුය. අවිද්‍යාව සමුදය කොට ඇත්තාහුය. අවිද්‍යාව ජාතිකොට ඇත්තාහුය. අවිද්‍යාව ප්‍රභව කොට ඇත්තාහුයයි, මෙසේ අයත් කිරීම් අර්ථයෙන් සත්‍යය, සංස්කාරයන්ද දනියි. සංස්කාර සමුදයන්ද දනී. සංස්කාර නිරෝධයන්ද දනී. සංස්කාර නිරොධ ගාමිනී ප්‍රතිපදාවද දනියි. මෙසේ අවබොධ කිරීම් අර්ථයෙන් සත්‍යය.

"ජරාමරණ දුක්ඛ සත්‍යයයි ජාතිය සමුදය සත්‍යයයි (ඔවුන්) දෙදෙනාගේ පහවීම් නිරෝධ සත්‍යයයි. නිරොධය අවබොධ කරගැනීමේ ක්‍රමය මාර්ග සත්‍යයයි. ජාතිය දුක්ඛසත්‍යයයි. භවය සමුදය සත්‍යයයි දෙදෙනාගේම පහවීම නිරොධ සත්‍යයයි. නිරොධ අවබෝධ කර ගැනීමේ ක්‍රමය මාර්ග සත්‍යයයි. උපාදානය දුක්ඛ සත්‍යයයි තෘෂ්ණාව සමුදය සත්‍යයයි. දෙදෙනාගේම පහවීම් නිරොධ සත්‍යයයි. නිරොධය අවබොධ කර ගැනීමේ ක්‍රමය මාර්ග සත්‍යයයි. තෘෂ්ණාව දුක්ඛ සත්‍යයයි. වේදනාව සමුදය සත්‍යයයි. දෙදෙනාගේම පහවීම් නිරොධ සත්‍යයයි. නිරොධය අවබොධ කර ගැනීමේ ක්‍රමය මාර්ග සත්‍යයයි. වේදනාව දුක්ඛ සත්‍යයයි. ස්පර්ශය සමුදය සත්‍යයයි. දෙදෙනාගේම පහවීම් නිරොධ සත්‍යයයි. නිරොධය අවබොධ කර ගැනීමේ ක්‍රමය මාර්ග සත්‍යයයි. ස්පර්ශය දුක්ඛ සත්‍යයයි. ෂඩායතනය සමුදය සත්‍යයයි. දෙදෙනාගේම පහවීම නිරොධ සත්‍යයයි. නිරොධය අවබොධකර ගැනීමේ ක්‍රමය මාර්ග සත්‍යයයි නාම රූප දුක්ඛ සත්‍යයයි. විඤ්ඤාණය සමුදය සත්‍යයයි. දෙදෙනාගේම පහවීම් නිරොධ සත්‍යයයි. නිරොධය අවබොධකර ගැනීමේ ක්‍රමය මාර්ග සත්‍යයයි. (ii) විඥානය දුක්ඛ සත්‍යයයි. සංස්කාරයන් සමුදය සත්‍යයයි. දෙදෙනාගේම පහවීම නිරොධ සත්‍යයයි. නිරොධය අවබෝධ කර ගැනීමේ ක්‍රමය මාර්ග සත්‍යයයි. (iii) සංස්කාරයන් දුක්ඛ සත්‍යයයි. අවිද්‍යාව සමුදය සත්‍යයයි. දෙදෙනාගේම පහවීම නිරොධ සත්‍යයයි නිරොධය අවබොධ කර ගැනීමේ ක්‍රමය මාර්ග සත්‍යයයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**35.** "ජරාමරණ දුක්ඛ සත්‍යය. ජාතිය දුක්ඛ සත්‍යයද සමුදය සත්‍යයද වන්නේය. දෙදෙනාගේම පහවීම නිරොධ සත්‍යයයි. නිරොධය අවබොධ කරගැනීමේ ක්‍රමය මාර්ග සත්‍යයයි. ජාතිය දුක්ඛ සත්‍යයයි. භවය දුක්ඛ සත්‍යයද සමුදය සත්‍යයද වන්නේය. දෙදෙනාගේම පහවීම නිරොධ සත්‍යයයි, නිරොධය දැනගැනීමේ ක්‍රමය මාර්ග සත්‍යයයි. සංස්කාර දුක්ඛ සත්‍යයයි. අවිද්‍යාව දුක්ඛ සත්‍යයද සමුදය සත්‍යයද වන්නේය. දෙදෙනාගේම පහවීම නිරොධ සත්‍යය. නිරොධය අවබොධ කරගැනීමේ ක්‍රමය මාර්ග සත්‍යයයි.

(සත්‍ය කථා නිමි)

---

## 13. බොජ්ඣංග කථා.

## සාවත්ථි නිදානයයි.

**1.** "මහණෙනි, මේ බොජ්ඣංගයෝ සත්දෙනෙකි. කවර සත්දෙනෙක්ද යත්, සති සම්බොජ්ඣංගය, ධම්මවිචය සම්බොජ්ඣංගය, විරියසම්බොජ්ඣංගය, පීතිසම්බොජ්ඣංගය, පස්සද්ධි සම්බොජ්ඣංගය, සමාධි සම්බොජ්ඣංගය, උපෙක්ඛා සම්බොජ්ඣංගය, මහණෙනි, මේ සත වනාහි බොජ්ඣංගයෝයි.

**2.** "බොජ්ඣංග" යනු කුමන අර්ථයකින් බොජ්ඣංගයෝ නම් වෙත්ද? (මාර්ග ඵල හා) නිර්වාණ අවබොධය පිණිස පවතිනුයි බොජ්ඣංගයෝයි. ශ්‍රොතආපත්ති මාර්ගය අවබොධ කෙරෙත්නුයි බොජ්ඣංගයෝයි. සකෘදාගාමි මාර්ගය අවබොධ කෙරෙත්නුයි බොජ්ඣංගයෝයි. අනාගාමි මාර්ගය අවබොධ කෙරෙන්නුයි බොජ්ඣංගයෝයි. අර්හත් මාර්ගය අවබොධ කෙරෙත්නුයි බොජ්ඣංගයෝයි. ශ්‍රොත ආපත්ති මාර්ගය අවබොධ කිරීම අර්ථයෙන් බොජ්ඣංගයෝයි. සකෘදාගාමි මාර්ගය අවබොධ කිරීම් අර්ථයෙන් බොජ්ඣංගයෝයි. අනාගාමි මාර්ගය අවබොධකිරීම අර්ථයෙන් බොජ්ඣංගයෝයි. අර්හත් මාර්ගය අවබෝධ කිරීම අර්ථයෙන් බොජ්ඣංගයෝයි. ශ්‍රොත ආපත්ති මාර්ගය අවබෝධ කරවත්නුයි බොජ්ඣංගයෝයි.

සකෘධාගාමි මාර්ගය අවබොධ කරත්නුයි බොජ්ඣංගයෝයි. අනාගාමි මාර්ගය අවබොධ කරත්නුයි බොජ්ඣංගයෝයි. අර්හත් මාර්ගය අවබොධ කරත්නුයි බොජ්ඣංගයෝයි. ශ්‍රොතාපත්ති මාර්ගය අවබොධ කරවීම අර්ථයෙන් බොජ්ඣංගයෝයි. සකෘදාගාමි මාර්ගය අවබොධ කරවීම අර්ථයෙන් බොජ්ඣංගයෝයි. අනාගාමි මාර්ගය අවබොධ කරවීම අර්ථයෙන් බොජ්ඣංගයෝයි. අර්හත් මාර්ගය අවබොධ කරවීම අර්ථයෙන් බොජ්ඣංගයෝයි. ශ්‍රොත ආපත්ති මාර්ගය අවබොධ කරන්නහුගේ පක්ෂයෙහි වීම අර්ථයෙන් බොජ්ඣංගයෝයි. සකෘදාගාමි මාර්ගය අවබොධ කරන්නහුගේ පක්ෂයෙහි වීම් අර්ථයෙන් බොජ්ඣංගයෝයි. අනාගාමි මාර්ගය අවබොධ කරන්නහුගේ පක්ෂයෙහි වීම් අර්ථයෙන් බොජ්ඣංගයෝයි. අර්හත් මාර්ගය අවබොධ කරන්නහුගේ පක්ෂයෙහිවීම් අර්ථයෙන් බොජ්ඣංගයෝයි. බුද්ධිලාභාර්ථයෙන් බොජ්ඣංගයෝයි. බුද්ධි ප්‍රතිලාභාර්ථයෙන් බොජ්ඣංගයෝයි. බුද්ධි රොපනාර්ථයෙන් බොජ්ඣංගයෝයි. බුද්ධි අභිරෝපනාර්ථයෙන් බොජ්ඣංගයෝයි. පිහිටුවන ලද බුද්ධිහුගේ නිමවීම අර්ථයෙන් බොජ්ඣංගයෝයි. බුද්ධියට පැමිණීම අර්ථයෙන් බොජ්ඣංගයෝයි. මූලාර්ථයෙන් බොජ්ඣංගයෝයි. මුල්ව පැවතීම අර්ථයෙන් බොජ්ඣංගයෝයි. මූල පරිග්‍රහාර්ථයෙන් මුල් අයිතිය යන තේරුමින් බොජ්ඣංගයෝයි. මූල පරිපූරණාර්ථයෙන් මුල් පිරීම යන තේරුමින් මුල පරිපාකාර්ථයෙන් බොජ්ඣංගයෝයි. මූල ප්‍රතිසම්භිදාර්ථයෙන් බොජ්ඣංගයෝයි. මූල ප්‍රතිසම්භිදාවට පැමිණීම් අර්ථයෙන් බොජ්ඣංගයෝයි. මූල ප්‍රතිසම්භිදාවෙහි වශීභාවාර්ථයෙන් (වසඟ බව යන තේරුමින්) බොජ්ඣංගයෝයි. මූල ප්‍රතිසම්භිදාවෙහි වශීභාවයට පැමිණියවුන්ගේද බොජ්ඣංගයෝයි.

3. "හේත්වර්ථයෙන් බොජ්ඣංගයෝයි. හේතු ව්‍යර්යාර්ථයෙන් බොජ්ඣංගයෝයි. හේතු පරිග්‍රහාර්ථයෙන් බොජ්ඣංගයෝයි. හේතු පරිවාරාර්ථයෙන් බොජ්ඣංගයෝයි. හෙතු පරිපූරණාර්ථයෙන් බොජ්ඣංගයෝයි. හේතු

පරිපාකාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. හේතු ප්‍රතිසම්භිදාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. හේතු ප්‍රති සම්භිදාවට පැමිණීම් අර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. හේතු ප්‍රති සම්භිදාවෙහි වශී භාවයට පැමිණියවුන්ගේද බොජ්ක්ධංගයෝයි. (උපකාරක) ප්‍රත්‍යයයාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. ප්‍රත්‍යය චර්යාවර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. ප්‍රත්‍යය පරිග්‍රහාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. ප්‍රත්‍යය පරිවාරාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. ප්‍රත්‍යය පරිපූර්ණාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. ප්‍රත්‍යය පරිපාකාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. ප්‍රත්‍යය ප්‍රතිසම්භිදාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. ප්‍රත්‍යය ප්‍රතිසම්භිදාවට පැමිණීම් අර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. ප්‍රත්‍යය ප්‍රතිසම්භිදාවෙහි වශී භාවාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. ප්‍රත්‍යය ප්‍රතිසම්භිදාවෙහි වශී භාවයට පැමිණීම් අර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විසුද්ධාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විශුද්ධ චර්යාර්ථයෙන් (පිරිසිදු පිරිවැරීම් අර්ථයෙන්) බොජ්ක්ධංගයෝයි. විශුද්ධි පරිපූරණාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විසුද්ධි පරිපාකාර්ථයෙන් පිරිසිදු පැසවීමේ තේරුමින් බොජ්ක්ධංගයෝයි. විශුද්ධි ප්‍රතිසම්භිදාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විශුද්ධි ප්‍රතිසම්භිදාවට පැමිණීම අර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විශුද්ධි ප්‍රතිසම්භිදාවෙහි වශීභාවාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විශුද්ධි ප්‍රතිසම්භිදාවෙහි වශී භාව ප්‍රාප්තයන්ගේද බොජ්ක්ධංගයෝයි. අනවද්‍යාර්ථයෙන් (නිවැරදි තේරුමින්) බොජ්ක්ධංගයෝයි. අනවද්‍යාපරිග්‍රහාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. අනවද්‍ය පරිවාරාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. අනවද්‍ය පරිපූරණාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. අනවද්‍ය පරිපාකාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. අනවද්‍ය ප්‍රතිසම්භිදාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. අනවද්‍ය ප්‍රති සම්භිදාවට පැමිණීම් අර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. අනවද්‍ය ප්‍රතිසම්භිදාවගේ වශී භාවාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. අනවද්‍ය ප්‍රතිසම්භිදාවෙහි වශීභාවයට පැමිණීම් අර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. නෛෂ්ක්‍රම්‍යාර්ථයෙන් (නික්මීමේ තේරුමින්) බොජ්ක්ධංගයෝයි. නෛෂ්ක්‍රම්‍යචර්යාර්ථයෙන් (මහණකම් කිරීමේ තේරුමින්)

බොජ්ක්ධංගයෝයි. නෛෂ්ක්‍රම්‍ය පරිග්‍රහාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. නෛෂ්ක්‍රම්‍ය පරිවාරාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. නෛෂ්ක්‍රම්‍ය පරිපූරණාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. නෛෂ්ක්‍රම්‍ය පරිපාකාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිසම්භිදාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිසම්භිදාවට පැමිණීම් අර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිසම්භිදාවෙහි වශී භාවාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිසම්භිදාවෙහි වශීභාවයට පැමිණීම් අර්ථයෙන් බොජ්ක්ධංගයෝයි.

**4.** විමුක්තාර්ථයෙන් (මිදීමේ තේරුමින්) බොජ්ක්ධංගයෝයි. විමුක්ති චර්යාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විමුක්ති පරිග්‍රහාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විමුක්ති පරිවාරාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විමුක්ති පරිපූරණාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විමුක්ති පරිපාකාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විමුක්ති ප්‍රතිසම්භිදාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විමුක්ති ප්‍රතිසම්භිදාවට පැමිණීම අර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විමුක්ති ප්‍රතිසම්භිදාවෙහි වශී භාවාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විමුක්ති ප්‍රතිසම්භිදාවෙහි වශීභාව ප්‍රාප්තයන්ගේද බොජ්ක්ධංගයෝයි. අනාශ්‍රවාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. අනාශ්‍රවචර්යාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. අනාශ්‍රව පරිග්‍රහාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. අනාශ්‍රව පරිවාරාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. අනාශ්‍රව පරිපූරණාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. අනාශ්‍රව පරිපාකාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. අනාශ්‍රව ප්‍රතිසම්භිදාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. අනාශ්‍රව ප්‍රතිසම්භිදාවට පැමිණීම් අර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. අනාශ්‍රව ප්‍රතිසම්භිදාවෙහි වශී භාවාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. අනාශ්‍රව ප්‍රතිසම්භිදාවෙහි වශීභාවයට පැමිණීම් අර්ථයෙන් බොජ්ක්ධංගයෝයි.

**5.** විවේකාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විවේකචර්යාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විවේක පරිග්‍රහාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විවේක පරිවාරාර්ථයෙන්

බොජ්ක්ධංගයෝයි. විවේක පරිපූරණාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විවේක පරිපාකාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විවේක ප්‍රති සම්භිදාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විවේක ප්‍රතිසම්භිදාවට පැමිණීම් අර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විවේක ප්‍රතිසම්භිදාවෙහි භාවාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. විවේක ප්‍රති සම්භිදාවෙහි වශීභාවාර්ථයෙන්ද බොජ්ක්ධංගයෝයි. වොස්සග්ගාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. වොස්සග්ගචර්යාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. වොස්සග්ග පරිග්‍රහාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. වොස්සග්ග පරිපූර්ණර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. වොස්සග්ග පරිපාකාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. වොස්සග්ග ප්‍රතිසම්භිදාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. වොස්සග්ග ප්‍රතිඥාවෙහි වශී භාවාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. වොස්සග්ග ප්‍රතිසම්භිදාවෙහි වශීභාවයට පැමිණීම් අර්ථයෙන් බොජ්ක්ධංගයෝයි.

**6.** මූලාර්ථය අවබෝධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. (ii) හෙත්වර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ප්‍රත්‍යයාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. විසුද්ධාර්ථය අවබෝධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. අනවද්‍යාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. නෛෂ්ක්‍රම්‍යාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. විමුක්තාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. අනාශ්‍රවාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. විමුක්තාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. (iii) වොස්සග්ගාර්ථය අවබොධ කෙරෙත්නුයි. බොජ්ක්ධංගයෝයි. මූලචර්යාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ප්‍රත්‍යය චර්යාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. විසුද්ධි චර්යාර්ථය අවබොධ කෙරෙත්නුයි. බොජ්ක්ධංගයෝයි. අනවද්‍යර්යාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. නෛෂ්ක්‍රම්‍යාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. විමුක්තිචර්යාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. අනාශ්‍රව චර්යාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි.

විවේකචර්යාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. වොස්සග්ගචර්යාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. මූලපරිග්‍රහාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. (මෙහි (ii) ඡෙදයේ හෙත්වර්ථය අවබොධ කෙරෙත්නුයි යනාදිය හෙත්වර්ථ පරිග්‍රහාර්ථයෙන් යනාදීන් වෙනස්කොට එය යොදාගත යුතුයි.) වොස්සග්ග පරිග්‍රාහාර්ථයෙන් බොජ්ක්ධංගයෝයි. මූල පරිවාරාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. (මෙහි (ii) ඡෙදයේ හෙත්වර්ථය අවබොධ කෙරෙත්නුයි යනාදිය හෙත්වර්ථ පරිවාරාර්ථය යනාදීන් වෙනස් කොට එය යොදාගත යුතුයි) මූල පරීක්ෂකාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. (මෙහි (ii) ඡෙදයේ හෙත්වර්ථය අවබොධ කෙරෙත්නුයි යනාදිය හෙත්වර්ථ පරිපාකාර්ථය යනාදීන් වෙනස්කොට එය යොදාගත යුතුයි) මූල ප්‍රතිසම්භිදාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. (මෙහි (ii) ඡෙදයේ හෙත්වර්ථය අවබොධ කෙරෙත්නුයි යනාදිය හෙත්වර්ථ ප්‍රතිසම්භිදාර්ථය යනාදීන් වෙනස් කොට එය යොදාගත යුතුයි.) වොස්සග්ග ප්‍රතිසම්භිදාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. මූලප්‍රතිසම්භිදා ප්‍රාපනාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. (මෙහි (ii) ඡෙදයේ හෙත්වර්ථය අවබොධ කෙරෙත්නුයි යනාදිය හෙත්වර්ථ ප්‍රතිසම්භිදා ප්‍රාපනාර්ථයයි යනාදීන් වෙනස්කොට යොදාගත යුතුයි.) වොස්සග්ග ප්‍රතිසම්භිදා ප්‍රාපනාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. මූල ප්‍රතිසම්භිදාවෙහි වශීභාවාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. (මෙහි (ii) ඡෙදයේ හෙත්වර්ථය අවබොධ කෙරෙත්නුයි යනාදිය හෙත්වර්ථ ප්‍රතිසම්භිදාවෙහි වශීභාවර්ථය යනාදීන් වෙනස්කොට යොදාගත යුතුයි.) වොස්සග්ග ප්‍රතිසම්භිදාවෙහි වශී භාවාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි.

7. පරිග්‍රහාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, පරිවාරාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. පරිපූර්ණාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එකාග්‍රතාර්ථය (එකඟ බවෙහි තේරුම) අවබොධ කෙරෙත්නුයි

බොජ්ක්ධංගයෝයි. නොවිසිරීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ප්‍රග්‍රහාර්ථය (-තදින් අල්ලා ගැනීමේ අර්ථය) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, අවිප්‍රකීණාර්ථය (නොවිසිරීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. නොකැළඹීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. අකම්පයාර්ථය (නොසෙල්වන තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි පිහිටීම් වශයෙන් චිත්තයාගේ ස්ථිතාර්ථය (සිටීම් අර්ථය) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ආරම්මණාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ගෝචරාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ප්‍රහාණාර්ථය (ගෙවීමේ අර්ථය) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි.

8. පරිත්‍යාගාර්ථය (හැර දැමීම් අර්ථය) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, වුට්ඨානාර්ථය (නැඟිටීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. විවට්ටනාර්ථය (වට නොකිරීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ශාන්තාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ප්‍රකීර්ණාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. විමුක්තාර්ථය (මිදීමේ අදහස) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. අනාශ්‍රවාර්ථය (පව් නැති තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. තරණාර්ථය (එතර කිරීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, අනිමිත්තාර්ථය (නිමිත්ත නැති තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ඥානාර්ථය (දත් තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, එක කෘත්‍යාර්ථය (එක කටයුතු තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. නොඉක්ම පැවතීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, යුගනන්ධාර්ථය (සමාන තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. නෛයර්යාණිකාර්ථය (නිදහස් තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. හෙත්වර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. දර්ශනාර්ථය (පෙනීම් තේරුම) අවබොධ

කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, අධිපති අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි.

**9.** සමථයාගේ (කෙලෙස් සන්සිඳවීම) නොවිසිරීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. විදර්ශනාවගේ අනුපස්සනාර්ථය (නිතර දැකීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ශමථ විදර්ශනාවන්ගේ එක කටයුත්තේ තේරුම අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. යුගනන්ධයාගේ (සමානයා) නොඉක්ම පැවතීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, ශික්ෂාවගේ (හික්මීම) සමාධානාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, ආරම්මණයාගේ ගොචරාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, හැකුලුනු චිත්තයාගේ උත්සාහවත් කිරීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, කැළඹුණු චිත්තයාගේ සන්සුන් කිරීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, (අලස හා වේගවත් භාවයෙන් වලකා) දෙ අයුරින් පිරිසිදුවූ චිත්තයන්ගේ මධ්‍යස්ථානාර්ථය (මැදහත් තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, විශෙෂාධිගමාර්ථයන් (උසස් අවබොධයේ තේරුමින්) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, (ආර්ය මාර්ග පහළවීම් වශයෙන්) උත්තර ප්‍රතිවෙධාර්ථය (මත්තට අවබොධ කිරීම් තේරුමින්) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, සත්‍යාවබොධාර්ථය (ඇත්ත වැටහීමේ තේරුම) අවබොධ කෙරත්නුයි බොජ්ක්ධංගයෝයි, නිර්වාණ ප්‍රතිෂ්ඨාපනාර්ථය (නිවන්හි පිහිටුවීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි.

**10.** (i) ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ ස්ථිර ලෙස පිහිටීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. සතින්ද්‍රියයාගේ ස්ථිතාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. විරියින්ද්‍රියයාගේ වීර්යාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ප්‍රඥෙන්ද්‍රියයාගේ දර්ශනාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. (ii) ශ්‍රද්ධා බලයාගේ අශ්‍රද්ධාවෙන් අකම්පාර්ථය අවබොධ කෙරෙත්නුයි

බොජ්ක්ධංගයෝයි. සතිබලයාගේ විස්මරණයෙන් අකම්පාර්ථයෙන් අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, විරිය බලයාගේ කුසීතත්වයෙන් අකම්පාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ප්‍රඥා බලයාගේ අවිද්‍යාවෙන් අකම්පාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, (iii) සති සම්බොජ්ක්ධංගයාගේ වැටහීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ධම්මවිචය සම්බොජ්ක්ධංගයාගේ විරිය සම්බොජ්ක්ධංගයාගේ පීති සම්බොජ්ක්ධයාගේ පස්සද්ධි සම්බොජ්ක්ධංගයාගේ සමාධි සම්බොජ්ක්ධංගයාගේ උපෙක්ෂා සම්බොජ්ක්ධංගයාගේ ප්‍රත්‍යවෙක්ෂා කිරීම් (නැවත නැවත සලකා බැලීම්) අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, (iv) සම්‍යක් දෘෂ්ටියගේ දර්ශනාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, සම්‍යක් සංකල්පයගේ- සම්‍යක් වචනයාගේ- සම්‍යක් කර්මාන්තයාගේ- සම්‍යක් ආජීවයාගේ- සම්‍යක් ව්‍යායාමයාගේ- සම්‍යක් ස්මෘතියගේ- සම්‍යක් සමාධීහුගේ අවික්ෂෙපාර්ථය (නොකැලඹෙන තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි.

11. ඉන්ද්‍රියයන්ගේ අධිපති අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, බලයන්ගේ අකම්ප්‍යාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. බොජ්ක්ධංගයන්ගේ නෛයර්යාණිකාර්ථය (නිදහස්වීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. මාර්ගයාගේ හෙත්වර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, සතිපට්ඨානයන්ගේ වැටහීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, සම්‍යක් ප්‍රධානයන්ගේ උත්සාහ කිරීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, ඍද්ධි පාදයන්ගේ ඉටුවීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, (ii) සත්‍යයන්ගේ යථාස්වභාවාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, (චතුර්විධ ආර්ය මාර්ග ප්‍රයෝගයන්ගේ (ඵලක්ෂණයෙහි වන) යටපත්වීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, ඵලයන්ගේ ප්‍රත්‍යක්ෂ කරණාර්ථය

(අත්දැකීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ප්‍රඥාවගේ විශෙෂ ඥානාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, විතර්කයාගේ අභිනිරොපනාර්ථය (නැංවීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, විතර්කයාගේ හැසිරීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, ප්‍රීතිහුගේ පැතිරීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි සුඛයාගේ තෙමනාර්ථය (තෙමීම් තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි.

**12.** ආවර්ජනාර්ථය (සිහිපත් කිරීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, විජානනාර්ථය (උසස් දැනීම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, විශේෂ ඥානාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, සඤ්ජනනාර්ථය (හැඳිනීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, එකාග්‍රතාර්ථය (එකඟවීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, විශිෂ්ට ඥානයෙන් ඥානාර්ථය (දත් තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, හාත්පසින් දැනීමෙන් තරණාර්ථය (එතර කරවීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, ප්‍රහාණයාගේ පරිත්‍යාගාර්ථය (හැරලීම් තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, භාවනාවගේ එක කෘත්‍යාර්ථය (එක කටයුත්තේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, ප්‍රත්‍යක්ෂ කරණයාගේ (අත් දැකීම) ස්පර්ශ කිරීම අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ස්කන්ධයන්ගේ ස්කන්ධාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ධාතූන්ගේ ධාත්වර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ආයතනයන්ගේ ආයතනාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, සංඛතයන්ගේ (සකස් වූවන්) සකස්වීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, සංඛතයාගේ සකස් කිරීම් අවබොධ කෙරේනුයි බොජ්ක්ධංගයෝයි, චිත්තාර්ථය (සිතීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. චිත්තයන්ගේ ආනන්තර්යාර්ථය (අනතුරුව

පැවැත්මේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, චිත්තයාගේ නැගී සිටීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, චිත්තයාගේ විජානනාර්ථය (උසස්බව දැනීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, චිත්තයාගේ හෙත්වර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, චිත්තයාගේ ප්‍රත්‍යයාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, චිත්තයාගේ වස්තු අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. චිත්තයාගේ සමානාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, චිත්තයාගේ ආරම්මණාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, චිත්තයාගේ ගොචරාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, චිත්තයාගේ චර්යාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, චිත්තයාගේ ගතාර්ථය (ගමනේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, චිත්තයාගේ අභිනීහාරාර්ථය (පිහිටුවීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, චිත්තයාගේ නෛයර්යාණිකාර්ථය (නිදහස්වීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, චිත්තයාගේ නිඃශරණාර්ථය (නිදහස්වීමේ අර්ථය) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි.

13. එක් අරමුණෙක්හි ආවර්ජනාර්ථය (සිහි කිරීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, එක් අරමුණෙක්හි විජානනාර්ථය (දැනීම් අර්ථය) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, එක් අරමුණෙක්හි සඤ්ජානනාර්ථය (හැඳිනීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි එක් අරමුණෙක්හි එකාග්‍රතාර්ථය (එකඟවීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, එක් අරමුණෙක්හි ප්‍රස්කන්ධනාර්ථය අවබොධ කෙරෙත්නුයි එක් අරමුණෙක්හි ප්‍රසීදනාර්ථය (පැහැදීමේ අදහස) අවබොධ කෙරෙත්නුයි එක් අරමුණෙක්හි සන්තීරණාර්ථය (තීරණයේ අදහස) අවබොධ කෙරෙත්නුයි, එක් අරමුණෙක්හි විමුක්තාර්ථය (මිදීමේ අදහස) අවබොධ කෙරෙත්නුයි, එක් අරමුණෙක්හි මෙය ශාන්තයයි දර්ශනාර්ථය අවබොධ කෙරෙත්නුයි එක් අරමුණෙක්හි

යානීකෘතාර්ථය (පුහුණුවීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි.

14. එක් අරමුණෙක්හි වස්තුකෘතාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි එළඹ සිටීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි පරිචිතාර්ථය (පුරුදුවීම් අර්ථය) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, එක් අරමුණෙක්හි සුසමාරද්ධාර්ථය (හොඳට පටන්ගත් තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි පරිග්‍රාහාර්ථය (අල්ලා ගැනීමේ තේරුම්) අවබොධ කෙරේනුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි පරිවාරාර්ථය (පිරිවැරීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි පරිපූරාර්ථය (පිරීම් අර්ථය) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, එක් අරමුණෙක්හි සමවධානාර්ථය (එක් තැන්කිරීමේ තේරුම්) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංග නම්වේ. එක් අරමුණෙක්හි අධිෂ්ඨානාර්ථය (ඉටාගැනීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි ආසෙවනාර්ථය (නිතර ඇසුරුකිරීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි භාවනාර්ථය අවබොධකෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි බහුලී කර්මාර්ථය (වැඩිපුර කිරීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි, එක් අරමුණෙක්හි සුසමුද්ගතාර්ථය (මනාව පහළවූ අදහස) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි සුවිසුද්ධාර්ථය (ඉතා පිරිසිදු තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි භුඤ්ජනාර්ථය (අනුභව කිරීමේ අදහස) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි අනුභුඤ්ජනාර්ථය (නිතර අනුභව කිරීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි ප්‍රතිභුඤ්ජනාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි සම්භුඤ්ජනාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි අවබොධ කිරීම් අර්ථය

අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි අනුබොධනාර්ථය අවබොධකෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි ප්‍රතිබොධනාර්ථය අවබොධකෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි.

එක් අරමුණෙක්හි සම්බොධනාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි බොධිපාක්ෂිකාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි අනුබොධිපාක්ෂිකාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි ප්‍රතිබොධිපාක්ෂිකාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි සම්බොධිපාක්ෂිකාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි.

එක් අරමුණෙක්හි පර්යාතනාර්ථය අවබොධකෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි උජ්‍යොතනාර්ථය (උස්ව බබලන අදහස) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි අනුජ්‍යොතනාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි ප්‍රතිජ්‍යොතනාර්ථය අවබොධකෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. එක් අරමුණෙක්හි සඤ්ජොතනාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි.

15. ප්‍රහාණාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. නිරොධාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ප්‍රතාපනාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. විරොධාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ක්ලේශයන්ගේ සන්තාපනාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. මල රහිතාර්ථය අවබොධකෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. විමලාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. නිර්මලාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. සමාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. සමයාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. විවේකාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. විවේකචර්යාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. විරාගාර්ථය අවබොධ

කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝ්යි. නිරොධාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝ්යි. නිරොධචර්යාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝ්යි. වොස්සග්ගාර්ථය අවබොධ කෙරෙත්නනුයි බොජ්ක්ධංගයෝ්යි. වොස්සග්ගචර්යාර්ථය අවබොධ කෙරෙත්නුයි, විමුක්ත්‍යාර්ථය අවබොධ කෙරෙත්නුයි, බොජ්ක්ධංගයෝ්යි. විමුක්තිචර්යාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝ්යි. ඡන්දාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝ්යි. ඡන්දයාගේ මූලාර්ථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝ්යි. ආසන්න කාරණාර්ථය අවබොධ කෙරෙත්නුයි, ප්‍රධානාර්ථය අවබොධ කෙරෙත්නුයි, ඉටුවීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි, නිශ්චයාර්ථය අවබොධ කෙරෙත්නුයි, ඡන්දයාගේ ප්‍රග්‍ඥානාර්ථය අවබොධ කෙරෙත්නුයි වැටහීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි නොවිසිරීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි, දර්ශනාර්ථය අවබොධ කෙරෙත්නුයි, වීර්යාර්ථය අවබොධ කෙරෙත්නුයි චින්තාර්ථය අවබොධ කෙරෙත්නුයි, විමංසන අර්ථය අවබොධ කෙරෙත්නුයි, විමංසාවගේ මූලාර්ථය අවබොධ කෙරෙත්නුයි, විමංසාවගේ ආසන්න කාරණාර්ථය අවබොධ කෙරෙත්නුයි, විමංසාවගේ ප්‍රධානාර්ථය අවබොධ කෙරෙත්නුයි විමංසාවගේ ඉටුවීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි, විමංසාවගේ නිශ්චයාර්ථය අවබොධ කෙරෙත්නුයි. විමංසාවගේ ප්‍රග්‍රහාර්ථය අවබොධ කෙරෙත්නුයි, විමංසාවගේ වැටහීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි. විමංසාවගේ නොවිසිරීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි, විමංසාවගේ දර්ශනාර්ථය අවබොධ කෙරෙත්නුයි. දුඃඛයාගේ පෙළීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි, දුඃඛයාගේ හටගැනීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි. දුඃඛයාගේ තැවීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි දුඃඛයාගේ වෙනස්වීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි, සමුදයයාගේ රාශි කරණාර්ථය (රැස් කිරීම් අර්ථය) - නිදානාර්ථය - සංයොගාර්ථය (එක්වීම් අර්ථය) පළිබොධාර්ථය (උවදුරු අර්ථය) අවබොධ කෙරෙත්නුයි, නිරොධයාගේ නිඃශරණාර්ථය (නිදහස්වීම් අර්ථය) විවේකාර්ථය, සංඛත (-හටගැනීම්) අර්ථය අමෘත (නොමැරෙන) අර්ථය, අවබොධ

කෙරෙත්නුයි, මාර්ගයාගේ නෛයර්යාණික (නිදහස්වීම් අර්ථය) හෙත්වර්ථය, දර්ශනාර්ථය, අධිපති අර්ථය අවබොධ කෙරෙත්නුයි, යථා ස්වභාවාර්ථය අවබොධ කෙරෙත්නුයි, අනන්‍යතාර්ථය (අනෙකක් නොවීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි, අනාත්මාර්ථය අවබොධ කෙරෙත්නුයි සත්‍යාර්ථය අවබොධ කෙරෙත්නුයි, වැටහීමේ තේරුම අවබොධ කෙරෙත්නුයි, හැඳිනීම් අර්ථය අවබොධ කෙරෙත්නුයි, පරිජානනාර්ථය (තීරණය කිරීමේ අදහස) අවබොධ කෙරෙත්නුයි, ධර්මාර්ථය අවබොධ කෙරෙත්නුයි ධාත්වර්ථය අවබොධ කෙරෙත්නුයි ඥානාර්ථය (දත් තේරුම) අවබොධ කෙරෙත්නුයි, ප්‍රත්‍යක්ෂකරණාර්ථය (අත්දැකීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි, ස්පෘශනාර්ථය අවබොධ කෙරෙත්නුයි, අභිසමයාර්ථය අවබොධ කෙරෙත්නුයි නෛෂ්ක්‍රම්‍යාර්ථය (මහණවීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි අව්‍යාපාදාර්ථය (හිංසා නොකිරීමේ තේරුම) අවබොධ කෙරෙත්නුයි, ආලෝක සංඥාව අවබොධ කෙරෙත්නුයි අවක්ෂෙපය (නොකැලඹිල්ල) අවබොධ කෙරෙත්නුයි ධර්ම ව්‍යවස්ථානය (ධර්මය බෙදීම) අවබොධ කෙරෙත්නුයි, ඥානය අවබොධ කෙරෙත්නුයි, ප්‍රාමොද්‍යය (සතුටු) අවබොධ කෙරෙත්නුයි.

**16.** ප්‍රථමධ්‍යානය අවබොධ කෙරෙත්නුයි ද්විතියධ්‍යානය, තෘතීයධ්‍යානය, චතුර්ථධ්‍යානය, සෝවාන්මාර්ගය, සකෘදාගාමි මාර්ගය, අනාගාමි මාර්ගය, අවබොධ කෙරෙත්නුයි, බොජ්ක්ධංගයෝයි අර්හත් මාර්ගය අවබොධ කෙරෙත්නුයි නිශ්චයාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, (මෙහි 10 ඡෙදය (i) යොදන්න) දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රිය අවබොධ කෙරෙත්නුයි, අශ්‍රද්ධාවෙහි අකම්ප්‍යාර්ථයෙන් ශ්‍රද්ධාබලය අවබොධ කෙරෙත්නුයි (මෙහි 10 ඡෙදයේ (ii) යොදන්න) අවිද්‍යාවෙහි අකම්ප්‍යාර්ථයෙන් ප්‍රඥාබලය අවබොධ කෙරෙත්නුයි, වැටහීම් අර්ථයෙන් සතිසම්බොජ්ක්ධංගය අවබොධකෙරෙත්නුයි, (මෙහි 10 ඡෙදයේ (iii) යොදන්න) නුවණින් සලකාබැලීම් අර්ථයෙන් උපෙක්ඛා සම්බොජ්ක්ධංගය අවබොධ කෙරෙත්නුයි

බොජ්ක්ධංගයෝයි, දර්ශනාර්ථයෙන් සම්මාදිට්ඨිය අවබොධ කෙරෙත්නුයි, (මෙහි 10 ඡෙදයේ (iv) යොදන්න) නොවිසිරීම් අර්ථයෙන් සම්මාසමාධිය අවබොධ කෙරෙත්නුයි (මෙහි 11 ඡෙදයේ (ii) යොදන්න)

17. යථා ස්වභාවාර්ථයෙන් සත්‍යය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, නොවිසිරීම් අර්ථයෙන් සමථය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, අනුපස්සන (අනුව දැකීම්) අර්ථයෙන් විදර්ශනාව අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, එක කෘත්‍ය (එක් කටයුත්ත) අර්ථයෙන් සමථ විදර්ශනාව අවබොධ කෙරෙත්නුයි, බොජ්ක්ධංගයෝයි. නොඉක්ම පැවතීම් අර්ථයෙන් යුගනන්ධය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, සංවරාර්ථයෙන් ශීල විශුද්ධිය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, නොවිසිරීම් අර්ථයෙන් චිත්ත විශුද්ධිය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, දර්ශනාර්ථයෙන් දිට්ඨි විසුද්ධිය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, මුක්ත (මිදීම) අර්ථයෙන් විමොක්ෂය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, ප්‍රතිවෙධ වැටහීම් අර්ථයෙන් විද්‍යාව අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, පරිත්‍යාග (හැරලීම්) අර්ථයෙන් විමුක්තිය (මිදීම) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, සමුච්ඡෙදාර්ථයෙන් (සම්පූර්ණයෙන් සිඳීමේ තේරුමින්) ක්‍ෂයෙහි ඥානය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, සංසිඳීම් අර්ථයෙන් අනුත්පාදයෙහි (නො ඉපදීමෙහි) ඥානය අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. ඡන්දය (කැමැත්ත) මූලාර්ථයෙන් අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, මනසිකාරය (පටන් ගැනීමේ තේරුමින්) සමුට්ඨානාර්ථයෙන් අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, ස්පර්ශය එකතැන් කිරීම් අර්ථයෙන් අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, වේදනාව රැස්වීම් අර්ථයෙන් අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි. සමාධිය ප්‍රමුඛාර්ථයෙන් අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, සතිය අධිපති අර්ථයෙන් අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, ප්‍රඥාව එයින්

එතරවීම් අර්ථයෙන් අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, විමුක්තිය (මිදීම) සාරාර්ථයෙන් අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි, අමෘතයට ඇතුළත් නිර්වාණය පර්යාවසානාර්ථයෙන් (අන්තිම අර්ථයෙන්) අවබොධ කෙරෙත්නුයි බොජ්ක්ධංගයෝයි.

නිදානය සැවැත්නුවරදීය.

18. එහිදී වනාහි ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ "ඇවැත්නි" භික්ෂූන් ඇමතූසේක. ඒ භික්ෂූහු වනාහි "ඇවැත්නියි" ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය වදාළසේක. "ඇවැත්නි, මේ බොජ්ක්ධංගයෝ සත් දෙනෙක් වෙත්. කවර සත් දෙනෙක්දයත්? සතිසම්බොජ්ක්ධංගය ධම්ම විචය සම්බොජ්ක්ධංගය, විරිය සම්බොජ්ක්ධංගය පීති සම්බොජ්ක්ධංගය පස්සද්ධි සම්බොජ්ක්ධංගය සමාධි සම්බොජ්ක්ධංගය උපෙක්ඛාසම්බොජ්ක්ධංගය, ඇවැත්නි, මොවුහු වනාහි සත්ත බොජ්ක්ධංගයෝ වෙත්. ඇවැත්නි, ඒ මම සත්ත බොජ්ක්ධංගයන්ගෙන් යම් යම් බොජ්ක්ධංගයකින් යුක්තව පූර්වාහ්ණ සමයෙහි වාසය කරන්ට කැමැති වෙම්ද, ඒ ඒ බොජ්ක්ධංගයෙන් යුක්තව පූර්වාහ්ණ සමයෙහි වාසය කරමි. යම් යම් බොජ්ක්ධංගයකින් යුක්තව මධ්‍යාහ්ණ සමයෙහි වාසය කරන්නට කැමතිවෙම්ද, ඒ ඒ බොජ්ක්ධංගයෙන් යුක්තව මධ්‍යාහ්ණයෙහි වාසය කරමි. යම් යම් බොජ්ක්ධංගයකින් යුක්තව සායාහ්ණ සමයෙහි වාසය කරන්නට කැමති වෙම්ද, ඒ ඒ බොජ්ක්ධංගයෙන් යුක්තව සැන්දෑ කාලයෙහි වාසය කරමි. ඇවැත්නි, ඉදින් මට සති සම්බොජ්ක්ධංගයයි (ii) අදහස්වේද, අප්‍රමාණව වඩන ලද්දේයයි මට අදහස් වේ. මනාව සම්පූර්ණයයි මට අදහස් වේ. නිර්වාණරම්මණයෙහි සිටින්නේ සිටියයි වෙසෙසින් දනිමි. ඉදින් මාගේ (බොජ්ක්ධංග නිර්වාණරම්මණයෙන්) චුතවේනම් මේ හේතුවෙන් මාගේ බොජ්ක්ධංග චුත වේයයි වෙසෙසින් දනිමි. (iii) ධම්ම විචය සම්බොජ්ක්ධංගයයි (මෙහි ii යොදන්න) විරිය සම්බොජ්ක්ධංගයයි (මෙහි ii) පීති සම්බොජ්ක්ධංගයයි (මෙහි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ii) පස්සද්ධි සම්බොජ්ක්ධංගයයි (මෙහි ii) සමාධි සම්බොජ්ක්ධංගයයි (මෙහි ii) උක්ඛො සම්බොජ්ක්ධංගයයි. ඇවැත්නි, ඉදින් මට අදහස්වේද සිටින්නේ සිටීයයි. වෙසෙසින් දනිමි. ඉදින් මාගේ බොජ්ක්ධංග චුතවේද, මේ හේතුවෙන් මාගේ බොජ්ක්ධංග චුත වේයයි වෙසෙසින් දනිමි ඇවැත්නි, යම්සේ වනාහි රජෙකුගේ හෝ රාජමහාමාත්‍යයෙකුගේ වස්ත්‍ර මඤ්ජුසාව (රෙදි පෙට්ටිය) නානාවර්ණයෙන් රඳනාලද වස්ත්‍රයන්ගෙන් පිරුණේවේද හෙතෙම යම් යම් වස්ත්‍ර දෙකක් පෙරවරුවෙහි පොරවන්නට කැමති වන්නේ නම් ඒ ඒ වස්ත්‍ර දෙක පෙරවරුයෙහි පොරවන්නේය, යම් යම් වස්ත්‍ර යුග්මයක් මැද්දහණෙහි පොරවන්නට කැමති වන්නේ නම් ඒ ඒ වස්ත්‍ර දෙක මැද්දහණෙහි පොරවන්නේය. හැන්දෑවෙහි පොරවන්නට කැමති වන්නේ නම් ඒ ඒ වස්ත්‍ර දෙක හැන්දෑවෙහි පොරවන්නේය. ඇවැත්නි, මම වනාහි මෙසේම සත්ත බොජ්ක්ධංගයන් අතුරෙන් යම් යම් බොජ්ක්ධංගයකින් යුක්තව පෙරවරුව වාසය කරන්නට කැමති වෙම්ද, ඒ ඒ බොජ්ක්ධංගයෙන් යුක්තව පෙරවරුවේ වාසය කරමි. යම් යම් බොජ්ක්ධංගයකින් යුක්තව මැද්දහණ කාලය වාසය කරන්නට කැමතිවෙම්ද, ඒ ඒ බොජ්ක්ධංගයෙන් යුක්තව මැද්දහණ කාලයේ වාසය කරමි. හැන්දෑ කාලය වාසය කරන්නට කැමති වෙම්ද ඒ ඒ බොජ්ක්ධංගයෙන් යුක්තව හැන්දෑ කාලය වාසය කරමි. ඇවැත්නි, ඉදින් මට සතිසම්බොජ්ක්ධංගයයි (ii) (අදහස්) වේද අප්‍රමාණව වඩන ලද්දේයයි මට අදහස්වේ. මනාව සම්පූර්ණයයි මට අදහස් වේ. (නිර්වාණාරම්මණයෙහි) සිටීයයි වෙසෙසින් දනිමි. ඉදින් මාගේ බොජ්ක්ධංග නිර්වාණ රම්මණයෙන් චුතවේද, මේ හේතුවෙන් චුතවේයයි වෙසෙසින් දනිමි. (iii) ධම්ම විචය සම්බොජ්ක්ධංගයයි (මෙහි ii යොදන්න) විරිය සම්බොජ්ක්ධංගයයි (මෙහි ii) පීති සම්බොජ්ක්ධංගයයි (මෙහි ii) පස්සද්ධි සම්බොජ්ක්ධංගයයි (මෙහි ii) සමාධි සම්බොජ්ක්ධගයයි (මෙහි ii) උපෙක්ඛා සම්බොජ්ක්ධංගයයි ඉදින් ඇවැත්නි, මට අදහස් වේද, අප්‍රමාණව වඩන ලද්දේයයි මට අදහස්වේ. සිටින්නේ සිටීයයි වෙසෙසින් දනිමි. ඉදින් මාගේ

(බොජ්ක්ධංග) චුතවේද මේ හේතුවෙන් මාගේ බොජ්ක්ධංග චුතවේයයි වෙසෙසින් දනිමි.

**19.** කෙසේ බොජ්ක්ධංගය ඉදින් මාගේ සති සම්බොජ්ක්ධංග යනු වේද යම්තාක් නිරොධය එළඹ සිටීද ඒතාක් බොජ්ක්ධංගය සති සම්බොජ්ක්ධංගයයි යන මොවුහු මට පහළ විය යනුවේ. යම්සේ වනාහි දැල්වෙන තෙල් පහනෙක්හි දැල්ල යම්තාක්ද, වර්ණය ඒතාක්ය, වර්ණය යම්තාක්ද දැල්ල ඒතාක්ය, මෙසේම යම්තාක් නිරොධය එළඹ සිටීද ඒතාක් බොජ්ක්ධංගය සති සම්බොජ්ක්ධංග යැයි යන මොහු මට වේ. යනුවේ කෙසේ බොජ්ක්ධංගය "මට අප්‍රමාණය වේ." යනුවේද? සකල ක්ලේශයෝ ප්‍රමාණයෙන්ද, බන්ධයෝය, පුනර්භවය ඇති කරණ යම් සංස්කාර කෙනෙක් වෙත්ද, ඔවුහු නැගී සිටින්නෝය, අචේලාර්ථයෙන්ද, නොසෙල්වෙන තේරුමෙන් (අසංඛත) ප්‍රත්‍යයෙන් හටනොගත් අර්ථයෙන්ද, නිරොධය අප්‍රමාණ නම් වේ. යම්තාක් නිරොධය එළඹ සිටීද ඒතාක් බොජ්ක්ධංගය අප්‍රමාණයයි මට වේයැයි යනු වේ. කෙසේ බොජ්ක්ධංගය ("මනාව පටන්) ගත්තේයයි මට වේ" යනු වේද, සකල ක්ලේශයෝ විෂමයෝය, පුනර්භවය ඇති කරණ යම් සංස්කාර කෙනෙක් වෙත්ද (ඔවුහු) නැගී සිටින්නෝය, ශාන්තාර්ථයෙන්ද ප්‍රණීතාර්ථයෙන්ද නිරොධය සම ධර්මයකි. යම්තාක් නිරොධය එළඹ සිටීද, ඒතාක් බොජ්ක්ධංගය "මනාව පටන් ගත්තේයයි මට වේ." යනු වේ.

**20.** "සිටින්නාවූ වචනය සිටීයයි දනිමි. ඉදිනුත් මගෙන් ච්‍යුත වේද මෙහි කාරණයෙන් මාගෙන් ච්‍යුතවේ යයි දනිමි" යනු කෙසේ වේද? කී අයුරකින් සතිසම්බොජ්ක්ධංගය සිටීද? කී අයුරකින් සති සම්බොජ්ක්ධංගය ච්‍යුතවේද? අට අයුරකින් එය සිටී, අට අයුරකින් එය ච්‍යුතවේ, කවර අට අයුරකින් එය සිටීදයත්? අනුප්පාදය (නිවන) ආවර්ජනා කරණ ලද බැවින් එය සිටී, උත්පාදය ආවර්ජනා නොකරණ ලද බැවින් එය සිටී, නොපැවැත්ම (නිවන) ආවර්ජනා කරණ ලද බැවින් එය සිටී, පැවැත්ම ආවර්ජනා නොකරණ ලද බැවින් එය සිටී, අනිමිත්තය (නිවන) ආවර්ජනා කරණ ලද බැවින් එය සිටී, නිමිත්ත

ආවර්ජනා නොකරණ ලද බැවින් සති සම්බොජ්ක්ධංගය සිටී, නිරොධය ආවර්ජනා කරණ ලද බැවින් එය සිටී, සංස්කාරයන් ආවර්ජනා නොකරණ ලද බැවින් එය සිටී. මේ අට අයුරෙන් සති සම්බොජ්ක්ධංගය සිටී.

**21.** කවර අට අයුරකින් සති සම්බොජ්ක්ධංගය ච්‍යුතවේද යත්, (ii) උත්පාදය ආවර්ජනා කරණ ලද බැවින් සති සම්බොජ්ක්ධංගය ච්‍යුතවේ අනුත්පාදය ආවර්ජනා නොකරන ලද බැවින් සති සම්බොජ්ක්ධංගය ච්‍යුතවේ. පැවැත්ම ආවර්ජනා කරණ ලද බැවින් සති සම්බොජ්ක්ධංගය ච්‍යුතවේ. නොපැවැත්ම ආවර්ජනා නොකරණ ලද බැවින් සති සම්බොජ්ක්ධංගය ච්‍යුතවේ. නිමිත්ත ආවර්ජනා කරණ ලද බැවින් සති සම්බොජ්ක්ධංගය ච්‍යුත වේ. අනිමිත්ත ආවර්ජනා නොකරණ ලද බැවින් සති සම්බොජ්ක්ධංගය ච්‍යුතවේ සංස්කාරයන් ආවර්ජනා කරණ ලද බැවින් සති සම්බොජ්ක්ධංගය ච්‍යුතවේ. නිරොධය ආවර්ජනා නොකරණ ලද බැවින් සති සම්බොජ්ක්ධංගය ච්‍යුතවේ. සිටින වචනය සිටීයයි දනිමි. ඉදිනුදු ච්‍යුතවේ. වේ නම් මේ කාරණයෙන් ච්‍යුත වේයයි දනිමි. (iii) කවර අට ආකාරයකින් ධම්මවිචය සම්බොජ්ක්ධංගය ච්‍යුත වේද, (මෙහි (ii) යොදන්න) කවර අට ආකාරයකින් විරිය සම්බොජ්ක්ධංගය ච්‍යුත වේද? (මෙහි (ii) කවර අට ආකාරයකින් පීති සම්බොජ්ක්ධංගය ච්‍යුත වේද? (මෙහි (ii) කවර අට ආකාරයකින් පස්සද්ධි සම්බොජ්ක්ධංගය ච්‍යුතවේද, (මෙහි (ii) කවර අට ආකාරයකින් සමාධි සම්බොජ්ක්ධංගය (මෙහි (ii) කවර අට ආකාරයකින් උපෙක්ඛා සම්බොජ්ක්ධංගය (මෙහි (ii) යනු මෙසේ වේ,

**22.** බොජ්ක්ධංගය උපෙක්ඛා සම්බොජ්ක්ධංගයයි මට වේද යනු කෙසේවේද? බොජ්ක්ධංගය යම්තාක් නිරොධය එළඹ සිටීද ඒතාක් උපේක්ඛා සම්බොජ්ක්ධංගයයි මට සිතක්වේ, යනුවේ. යම්සේ දැල්වෙන්නාවූ තෙල් පහනෙහි දැල්ල යම් තාක්ද වර්ණය ඒතාක්ය. වර්ණය යම්තාක්ද දැල්ල ඒතාක්ය මෙසේම යම්තාක් නිරොධය එළඹ සිටීද, ඒතාක් බොජ්ක්ධංගය උපෙක්ඛා සම්බොජ්ක්ධංගයයි මට සිතක් වේද, යනු වේ. කෙසේ

බොජ්ක්ධංගය අප්පමාණයයි මට සිතක් වේද, යනු වේද, ක්ලේශයෝද ප්‍රමාණ බන්ධයෝය, පුනර්භවය ඇති කරණ යම් සංස්කාර කෙනෙක් වෙත්ද, (ඔවුහු) නැගී සිටින්නෝය අචල නොසෙල්වෙන අර්ථයෙන්ද ශාන්තාර්ථයෙන්ද නිරොධය අප්‍රමාණය යම්තාක් නිරොධය එළඹ සිටීද, ඒතාක් බොජ්ක්ධංගය අප්‍රමාණය කියා මට සිතක්වේ, යනු වේ. කෙසේ බොජ්ක්ධංගය මනාව පටන් ගත්තේයයි මට සිතක් වේද, යනු වේද, සකල ක්ලේශයෝද විෂමයෝය පුනර්භවය ඇති කරණ යම් සංස්කාර කෙනෙක් වෙත්ද, (ඔවුහු) නැගී සිටින්නෝය. ශාන්තාර්ථයෙන්ද ප්‍රණීතාර්ථයෙන්ද නිරොධය සම ධර්මයකි. යම්තාක් නිරොධය එළඹ සිටීද ඒතාක් බොජ්ක්ධංගය මනාව පටන් ගත්තේයයි මට සිතක් වේ, යනුවේ. සිටින වචනය සිටීයයි දනිමි. ඉදින් ච්‍යුත වේද, මේ කරුණින් ච්‍යුතවේ කෙසේ වේද, කී අයුරකින් උපෙක්ඛා සම්බොජ්ක්ධංගය සිටීද, කී අයුරකින් උපෙක්ඛා සම්බොජක්ධංගය චුතවේද, අට අයුරකින් උපෙක්ඛා සම්බොජ්ක්ධංගය සිටී අට අයුරකින් උපෙක්ඛා සම්බොජ්ක්ධංගය චුත වේ. කවර අට අයුරකින් උපෙක්ඛා සම්බොජ්ක්ධංගය සිටීදයත් අනුත්පාදය ආවර්ජනා කරණ ලද බැවින් උපේක්ඛා සම්බොජ්ක්ධංගය සිටී. උත්පාදය ආවර්ජනා නොකරණ ලද බැවින් උපේක්ඛා සම්බොජ්ක්ධංගය සිටී. නොපැවැත්ම ආවර්ජනා කරණ ලද බැවින් උපේක්ඛා සම්බොජ්ක්ධංගය සිටී. පැවැත්ම ආවර්ජනා නොකරණ ලද බැවින් උපේක්ඛා සම්බොජ්ක්ධංගය සිටී. අනිමිත්තය ආවර්ජනා කරණ ලද බැවින් උපේක්ඛා සම්බොජ්ක්ධංගය සිටී. නිරොධය ආවර්ජනා කරණ ලද බැවින් උපේක්ඛා සම්බොජ්ක්ධංගය සිටී. සංස්කාරයන් ආවර්ජනා නොකරණ ලද බැවින් උපෙක්ඛා සම්බොජ්ක්ධංගය සිටී. මේ අට අයුරෙන් උපෙක්ඛා සම්බොජ්ක්ධංගය සිටී. කවර අයුරකින් උපේක්ඛා සම්බොජ්ක්ධංගය චුත වේද යත්, උත්පාදය ආවර්ජනා කරණ ලද බැවින් උපෙක්ඛා සම්බොජ්ක්ධංගය චුත වේ. අනුත්පාදය (නොඉපදීම) ආවර්ජනා නොකරණ ලද බැවින් උපෙක්ඛා සම්බොජ්ක්ධංගය චුත වේ. පැවැත්ම ආවර්ජනා කරණ ලද

බැවින් උපෙක්ඛා සම්බොජ්ක්ධංගය චුතවේ. නොපැවැත්ම ආවර්ජනා නොකරණ ලද බැවින් උපෙක්ඛා සම්බොජ්ක්ධංගය චුතවේ. නිමිත්තය ආවර්ජනයා කරණ ලද බැවින් උපෙක්ඛා සම්බොජ්ක්ධංගය චුතවේ. අනිමිත්ත ආවර්ජනා නොකරණ ලද බැවින් උපෙක්ඛා සම්බොජ්ක්ධංග චුතවේ. සංස්කාරයන් ආවර්ජනයා කරණ ලද බැවින් උපෙක්ඛා සම්බොජ්ක්ධංගය චුත වේ. නිරොධය ආවර්ජනා නොකරණ ලද බැවින් උපෙක්ඛා සම්බොජ්ක්ධංගය චුත වේ. සිටින වචනය සිටීයයි දනිමි. ඉදිනුදු චුතවේ නම් මේ කාරණයෙන් චුතවේයයි යනු මෙසේය.

බොජ්ක්ධංග කථා නිමි.

---

## 14. මෛත්‍රී කථා

### සාවත්ථි නිදානයයි

1. "මහණෙනි, ආදරයෙන් සේවනය කරණ ලද වඩන ලද බහුල වශයෙන් කරණ ලද යානාවක් මෙන් කරණ ලද වස්තුවක් මෙන් කරණ ලද එළඹ සිටියාවූ (හැම අයුරෙන්ම) පුරුදු කරන ලද මොනවට පටන්ගන්නා ලද මෙත්තා චෙතොවිමුක්තිය (සිතේ මිදීම) පිළිබඳ ආනිශංස එකොළසක් කැමති විය යුත්තාහ. කවර එකොළසක්ද යත් :- සුවසේ නිදයි. සුවසේ පුබුදියි නපුරු සීන නොදකියි. මනුෂ්‍යයන්ට ප්‍රිය වෙයි. අමනුෂ්‍යයන්ට ප්‍රිය වෙයි. දෙවියෝ රකිත් මොහුගේ ශරීරයෙහි ගිනි හෝ විෂ සැත් හෝ නොපිවිසේ. වහා සිත එකඟ වෙයි. මුඛ වර්ණය වෙසෙසින් පැහැපත් වේ. නොමුළාව කළුරිය කෙරෙයි. (මෛත්‍රී සමාපත්තියෙන්) මත්තෙහි රහත් වන්නට නොහැකිවී නම් (මරණින් මතු) බඹලොව උපදින්නේ වේ.

"(ප්‍රදෙශ) සීමා රහිතව පතුරුවන මෛත්‍රී චිත්ත විමුක්තියෙක් ඇත. (ප්‍රදෙශ) සීමා සහිතව පතුරුවන මෛත්‍රී චිත්ත විමුක්තියෙක් ඇත. දිශාවන්හි පතුරුවන මෛත්‍රී චිත්ත විමුක්තියෙක් ඇත.

2. "සීමා රහිතව පතුරුවන මෛත්‍රී චිත්ත විමුක්තිය කී අයුරකින් වේද, දිශාවන්හි පතුරුවන මෛත්‍රී චිත්ත විමුක්තිය කී අයුරකින් වේද?

"සීමා රහිතව පතුරුවන මෛත්‍රී චිත්ත විමුක්තිය පස් අයුරකින් වේ. සීමා සහිතව පතුරුවන මෛත්‍රී චිත්ත විමුක්තිය අට අයුරකින් වේ. දිශාවන්හි පතුරුවන මෛත්‍රී චිත්ත විමුක්තිය දශ අයුරකින් වේ. (ප්‍රදෙශ) සීමා රහිතව පතුරුවන මෛත්‍රී චිත්ත විමුක්තිය කවර පස් අයුරකින් වේද, යත් :- සියලු සත්වයෝ (ii) වෛර රහිතවූවෝ ව්‍යාපාද (හිංසා) රහිතවූවෝ දුක් රහිතවූවෝ සුවපත්ව ආත්මභාව පරිහරණය කෙරෙත්වා, (iii) සියලු ප්‍රාණීහු (මෙහි (ii) යොදන්න) සියලු භූතයෝ සියලු පුද්ගලයෝ සියලු ආත්මභාවයට ඇතුළත්වූවෝ වෛර රහිතවූවෝ ව්‍යාපාද රහිත වූවෝ දුක් රහිත වූවෝ සුවපත්ව ආත්මභාව පරිහරණය කෙරෙත්වායි ප්‍රදෙශ සීමා රහිතව පතුරුවන මෛත්‍රී චිත්ත විමුක්තිය මේ පස් අයුරෙන් වේ.

3. (ප්‍රදෙශ) සීමා සහිතව පතුරුවන මෛත්‍රී චිත්ත විමුක්තිය කවර අට අයුරකින් වේදයත් :- සියලු ස්ත්‍රීහු (ii) වෛර රහිතවූවෝ ව්‍යාපාද (හිංසා) රහිතවූවෝ දුක් රහිතවූවෝ සුවපත්ව ආත්මභාවය පරිහරණය කෙරෙත්වා (iii) සියලු පුරුෂයෝ (මෙහි (ii) යොදන්න) සියලු ආර්යයෝ, සියලු අනාර්යයෝ, සියලු දෙවියෝ, සියලු මනුෂ්‍යයෝ, සියලු විනිපාතිකයෝ (අපායගතවූවෝ) වෛර රහිතවූවෝ ව්‍යාපාද (හිංසා) රහිතවූවෝ, දුක් රහිත වූවෝ සුවපත්ව ආත්ම පරිහරණය කෙරෙත්වායි (ප්‍රදෙශ) සීමා රහිතව පතුරුවන මෛත්‍රීචිත්ත විමුක්තිය මේ අට අයුරින් වේ.

4. "දිශාවන්හි පතුරුවන මෛත්‍රී චිත්ත විමුක්තිය කවර දශ අයුරකින් වේද? සියලු පූර්ව දිශාවෙහි සත්වයෝ (ii) වෛර රහිතවූවෝ ව්‍යාපාද රහිතවූවෝ, දුක් රහිතවූවෝ සුවපත්ව ආත්මභාව පරිහරණය කෙරෙත්වා, (iii) සියලු පශ්චිම දිශාවෙහි සත්වයෝ (මෙහි (ii) යොදන්න) සියලු උත්තර දිශාවෙහි සත්වයෝ සියලු දක්ෂිණ දිශාවෙහි සත්වයෝ සියලු පූර්ව අනුදිශාවෙහි සත්වයෝ සියලු පශ්චිම අනුදිශාවෙහි සත්වයෝ සියලු උත්තර අනුදිශාවෙහි සත්වයෝ සියලු දක්ෂිණ අනුදිශාවෙහි සත්වයෝ සියලු අට දිශාවෙහි සත්වයෝ සියලු මතු දිශාවෙහි සත්වයෝ (iv) වෛර රහිතවූවෝ ව්‍යාපාද (හිංසා)

රහිතවූවෝ දුක් රහිතවූවෝ සුවපත්ව ආත්මභාව පරිහරණය කෙරෙත්වා.

**5.** "සියලු පූර්ව දිශාවෙහි ප්‍රාණීහු (මෙහි 4 ඡේදයේ (iv) යොදන්න) භූතයෝ පුද්ගලයෝ ආත්මභාව පර්යාපන්නයෝ (ශරීර ඇත්තෝ) සියලු ස්ත්‍රීහු සියලු පුරුෂයෝ සියලු ආර්යයෝ සියලු අනාර්යයෝ සියලු දෙවියෝ සියලු මනුෂ්‍යයෝ සියලු විනිපාතිකයෝ වෛර රහිතවූවෝ ව්‍යාපාද (හිංසා) රහිතවූවෝ දුක් රහිත වූවෝ සුවපත්ව ආත්මභාව පරිහරණය කෙරෙත්වා. සියලු පශ්චිම දිශාවෙහි විනිපාතිකයෝ (අපායගතවූවෝ) සියලු උත්තර දිශාවෙහි විනිපාතිකයෝ සියලු දක්ෂිණ දිශාවෙහි විනිපාතිකයෝ සියලු පූර්ව අනුදිශාවෙහි විනිපාතිකයෝ සියලු පශ්චිම අනු දිශාවෙහි විනිපාතිකයෝ සියලු උත්තර අනුදිශාවෙහි විනිපාතිකයෝ සියලු දක්ෂිණ අනුදිශාවෙහි විනිපාතිකයෝ සියලු හෙට්ඨිම අනුදිශාවෙහි විනිපාතිකයෝ සියලු උපරිම අනුදිශාවෙහි විනිපාතිකයෝ වෛර රහිතවූවෝ ව්‍යාපාද රහිත වූවෝ දුක් රහිතවූවෝ සුවපත්ව ආත්මභාව පරිහරණය කෙරෙත්වා. දිශාවන්හි පතුරුවන මෛත්‍රී චිත්ත විමුක්තිය මේ දස අයුරෙන් වේ. සියලු ආත්මභාවයන්ගේ (අභ්‍යන්තර) පීඩාව දුරුකොට නොපෙළීමෙන් බාහිර හිංසාව දුරුකොට හිංසා නොකිරීමෙන් සන්තාපය දුරු කොට අසන්තාපයෙන් (ජීවිත) විනාශය දුරුකොට විනාශ නොකිරීමෙන් වෙහෙස කිරීම දුරුකොට නොවෙහෙසීමෙන් සියලු සත්වයෝ අවෛරීහු වෙත්වා. වෛරීහු නොවෙත්වා, සැප ඇත්තෝ වෙත්වා, දුක් ඇත්තෝ නොවෙත්වා, සියලු සත්වයෝ සුඛිතාත්මභාව ඇත්තෝ වෙත්වා දුක්වූ ආත්මභාවය ඇත්තෝ නොවෙත්වායි මේ අයුරෙන් මෙත් (ස්නෙහ) කෙරේනුයි 'මෙත්තා' නම් ඒ ධර්මය සිතානුයි 'චෙතො' නම්, නැඟී සිටින සියලු ව්‍යාපාදයන්ගෙන් වෙසෙසින් මිදෙනුයි. විමුක්ති මිදීම් නම්. "මෙත්තා" ද 'චෙතො' ද "මුක්ති" දැයි "මෙත්තා චෙතො විමුක්ති" යනු වේ.

**6.** "සියලු සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා, භය නැත්තෝ වෙත්වා, සුව ඇත්තෝ වෙත්වායි' ශ්‍රද්ධාවෙන් සිත පිහිටුවයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් ශ්‍රද්ධෙන්ද්‍රිය හාත්පසින් වඩන

ලද්දේ වෙයි. සියලු සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා, භය නැත්තෝ වෙත්වා, සැප ඇත්තෝ වෙත්වායි' සිහිය පිහිටුවයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සතින්ද්‍රිය භාත්පසින් වඩන ලද්දේ වෙයි. සියලු සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා, භය නැත්තෝ වෙත්වා, සියලු සත්වයෝ සැප ඇත්තෝ වෙත්වායි සිත මනාව තැන්පත් කරයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සමාධින්ද්‍රිය භාත්පසින් වඩන ලද්දේ වෙයි. සියලු සත්වයෝ අවෛර නැත්තෝ වෙත්වා, භය නැත්තෝ වෙත්වා සැප ඇත්තෝ වෙත්වායි ප්‍රඥාවෙන් දනියි. මෛත්‍රී චිත්ත විමුක්තිය විින් ප්‍රඥෙන්ද්‍රිය භාත්පසින් වඩන ලද්දේ වෙයි.

7. "මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ වෙත්. මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය ආසේවනය කරනු ලැබේ. මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ වඩන්නෝ වෙත්. මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය වඩනු ලැබේ. මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ බහුල වශයෙන් කරනු ලබන්නෝ වෙත්. මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය බහුල වශයෙන් කරනු ලැබේ. මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ අලංකාරයෝ වෙත්. මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය මොනවට අලංකෘත වූවාවෙයි. මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ පරිෂ්කාරයෝ වෙත්. මේ පඤ්චෙන්ද්‍රියන් විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය සුපරිෂ්කෘත (මනාව පිරිවැරුයේ) වෙයි. මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ පරිවාරයෝ වෙත්. මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය සුපරිවෘත වූවා වෙයි.

8. "මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ ආසේවනයෝ වෙත්. භාවනාවෝ වෙත්. බහුල වශයෙන් කරන්නෝ වෙත්. අලංකාරයෝ වෙත්. පරිෂ්කාරයෝ වෙත්. පරිවාරයෝ වෙත්. පරිපූරකයෝ වෙත්. යුක්ත වූවෝ වෙත්. සහජාතයෝ වෙත්. මිශ්‍රවූවෝ වෙත්. සම්ප්‍රයුක්තවූවෝ වෙත්. ප්‍රස්කන්ධනයෝ වෙත්. ප්‍රසීදනයෝ වෙත්. සන්තිෂ්ඨනයෝ (තීරණ) වෙත්. මිදෙන්නෝ වෙත්. මෙය ශාන්තයි' දක්නෝ

වෙත්. යානීකෘතයෝ (යානයක් මෙන් කළෝ) වෙත්. වස්තුකෘතයෝ වෙත්. හටගන්නෝ වෙත්. පුරුදු කරන ලද්දෝ වෙත්. මනාව පටන් ගන්නා ලද්දෝ වෙත්. මනාව වඩන ලද්දෝ වෙත්. මනාව පිහිටුවන ලද්දෝ වෙත්. මනාව ඔසවන ලද්දෝ වෙත්. සුවිමුක්තයෝ (මනාව මිදුණෝ) වෙත්. (මෛත්‍රීය) උපදවත්. ප්‍රකට කෙරෙත්, බබලවත්.

**9.** "සියලු සත්වයෝ අවෛරීහු වෙත්වා, භය නැත්තෝ වෙත්වා, සැප ඇත්තෝ වෙත්වායි අශ්‍රද්ධාවෙන් කම්පා නොවෙයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් ශ්‍රද්ධා බලය හාත්පසින් වඩන ලද්දේ වෙයි. සියලු සත්වයෝ අවෛරීහු වෙත්වා, භයනැත්තෝ වෙත්වා, සැප ඇත්තෝ වෙත්වායි කුසීත බැවින් කම්පා නොවෙයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් වීර්යබලය හාත්පසින් වඩන ලද්දේ වෙයි. සියලු සත්වයෝ අවෛරීහු වෙත්වා, භය නැත්තෝ වෙත්වා. සැප ඇත්තෝ වෙත්වායි, ප්‍රමාදයෙන් කම්පා නොවෙයි, මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සතී බලය හාත්පසින් වඩනලද්දේ වෙයි, සියලු සත්වයෝ අවෛරීහු වෙත්වා, භය නැත්තෝ වෙත්වා සැප ඇත්තෝ වෙත්වායි (සිතේ) නොසන්සුන් බැවින් කම්පා නොවෙයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සමාධි බලය හාත්පසින් වඩන ලද්දේවෙයි. සියලු සත්වයෝ අවෛරීහුවෙත්වා. භය නැත්තෝ වෙත්වා, සැප ඇත්තෝ වෙත්වායි, අවිද්‍යාවෙන් කම්පා නොවෙයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් ප්‍රඥාබලය හාත්පසින් වඩනලද්දේ වෙයි.

**10.** "මේ පඤ්චබලයෝ මෛත්‍රී චිත්ත විමුක්තියෙන් ආසේවනයෝවෙත්. මේ බලපස විසින් මෛත්‍රීචිත්ත විමුක්තිය ආසේවනය කරණු ලැබේ. මේ පඤ්චබලයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ වඩන්නෝ වෙත්. මේ බල පස විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය වඩනු ලබේ. මේ පඤ්ච බලයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ බහුල වශයෙන් කරන්නෝ වෙත්. මේ බල පස විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය බහුල වශයෙන් කරනු ලැබේ. මේ පඤ්චබලයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ අලංකාරයෝ වෙත්. මේ බල පස විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය අලංකෘතවූවා

(ඉතාම සැරසුණේ) වෙයි. මේ පඤ්චබලයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ පරිෂ්කාරයෝ වෙත්. මේ බල පස විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය සුපරිෂ්කෘතවූවා වෙයි. මේ පඤ්චබලයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ පරිවාරයෝ වෙයි. මේ බලපස විසින් මෛත්‍රී චිත්ත විමුක්තියගේ පරිෂ්කාරයෝ වෙත්. මේ බලපස විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය සුපරිෂ්කෘත වූවා වෙයි. මේ පඤ්චබලයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ පරිවාරයෝ වෙත්. මේ බල පස විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය සුපරිවෘතවූවා වෙයි.

11. "මේ පඤ්ච බලයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ ආසේවනයෝ වෙත්, භාවනාවෝ වෙත්, බහුල වශයෙන් කරන්නෝ වෙත්. අලංකාරයෝ වෙත්. පරිෂ්කාරයෝවෙත්. පරිවාරයෝ වෙත් පරිපූරකයෝ වෙත්. යුක්තවූවෝ වෙත්. සහජාතයෝ වෙත්. මිශ්‍රවූවෝ වෙත්. සම්ප්‍රයුක්තයෝ වෙත්. ප්‍රස්කන්ධනයෝ වෙත්. ප්‍රසීදනයෝ වෙත්. සන්තිෂ්ඨානයෝ (තීරණ) වෙත්. විමුච්චනයෝ (මිදීම) වෙත්. මෙය ශාන්තය දන්වන්නෝ වෙත්. යානීකෘතයෝ වෙත්. වස්තුකෘතයෝ වෙත්. හටගත්තෝ වෙත්. පුරුදුකරණ ලද්දෝ වෙත්. මනාව පටන් ගන්නා ලද්දෝ වෙත්. මනාව වඩන ලද්දෝ වෙත්. මනාව පිහිටුවන ලද්දෝ වෙත්. මනාව ඔසවනලද්දෝ වෙත්. සුවිමුක්තයෝ මනාව මිදුණෝ වෙත්. (මෛත්‍රිය) උපදවත්. ප්‍රකට කෙරෙත්. බබලවත්.

12. "සියලු සත්වයෝ (ii) අවෛරීහු වෙත්වා, භය නැත්තෝ වෙත්වා සැප ඇත්තෝ වෙත්වා'යි සිහිය පිහිටුවයි මෛත්‍රීචිත්ත විමුක්තිය වඩයි. (iii) සතිසම්බොජ්ක්ධංගය හාත්පසින් වඩනලද්දේ වෙයි. සියලු සත්වයෝ (මෙහි (ii) යොදන්න) ප්‍රඥාවෙන් හාත්පසින් විමසයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් ධම්මවිචය සම්බොජ්ක්ධංගය හාත්පසින් වඩන ලද්දේ වෙයි. සියලු සත්වයෝ (මෙහි (ii) යොදන්න) බලවත් සේ උත්සාහ කෙරෙයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් විරිය සම්බොජ්ක්ධංගය හාත්පසින් වඩනලද්දේවෙයි. සියලු සත්වයෝ (මෙහි (ii) යොදන්න) හාත්පසින් දැවීම සංසිඳුවයි මෛත්‍රී චිත්ත

විමුක්තිය විසින් පිතිසම්බොජ්ඣංගය හාත්පසින් වඩනලද්දේ වෙයි. සියලු සත්වයෝ (මෙහි (ii) යොදන්න) ආශාන්තභාවය සන්සිඳුවයි. මෛත්‍රී චිත්තවිමුක්තිය විසින් පස්සද්ධි සම්බොජ්ඣංගය හාත්පසින් වඩනලද්දේ වෙයි. සියලු සත්වයෝ (මෙහි (ii) යොදන්න) සිත තැන්පත්කරයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සමාධි සම්බොජ්ඣංගය හාත්පසින් වඩනලද්දේ වෙයි. සියලු සත්වයෝ (මෙහි (ii) යොදන්න) ඥානයෙන් ක්ලේශයන් නුවණින් සලකා බලයි. මෛත්‍රීචිත්ත විමුක්තිය විසින් උපෙක්ඛා සම්බොජ්ඣංගය හාත්පසින් වඩනලද්දේ වෙයි.

13. "මේ සත්තබොජ්ඣංගයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ ආසේවනයෝ වෙත්. මොවුන් විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය ආසේවනය කරනු ලැබේ. මොවුන් විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය වඩනු ලබන්නෝ වෙත්. මොවුන් විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය වඩනු ලැබේ. මොව්හු බහුල වශයෙන් කරනු ලබන්නෝ වෙත්. මොවුන් විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය බහුල වශයෙන් කරනු ලැබේ. මොව්හු මෛත්‍රී චිත්ත විමුක්තියගේ අලංකාරයෝ වෙත්. මොවුන් විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය මොනවට අලංකෘතවූයේ වෙයි. මොව්හු මෛත්‍රී චිත්ත විමුක්තියගේ පරිෂ්කාරයෝ වෙත්. මොවුන් විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය සුපරිෂ්කෘතවූවාවෙයි. මොව්හු මෛත්‍රී චිත්ත විමුක්තියගේ පිරිවරහුවෙත්. මොවුන් විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය සුපරිවෘතවූවා වෙයි.

14. "මේ සත්තබොජ්ඣංගයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ ආසේවනයෝ වෙත්. භාවනාවෝ වෙත්. බහුල වශයෙන් කරන්නෝ වෙත්. අලංකාරයෝ වෙත්. පරික්ෂාකාරයෝ වෙත් පරිවාරයෝවෙත්. පරිපූරකයෝ වෙත්. යුක්තවූවෝ වෙත්. සහජාතකයෝ වෙත්. මිශ්‍රවූවෝ වෙත්. සම්ප්‍රයුක්තයෝ වෙත්. ප්‍රස්කන්ධනයෝ වෙත්. ප්‍රසීදනයෝ (පහදින්නෝ) වෙත්. සන්තිෂ්ඨානයෝ (තීරණ) වෙත්. මිදෙන්නෝ වෙත්. "මෙය ශාන්ත"යි දන්නෝ වෙත්. යානීකෘතයෝ වෙත්. වස්තු කෘතයෝ වෙත්, හටගන්නෝ වෙත්. පුරුදුවූවෝ වෙත් මනාව පටන්ගන්නා ලද්දෝ වෙත්. මනාව වඩනලද්දෝ වෙත්. මනාව පිහිටුවන

ලද්දෝ වෙත්. මනාව ඔසවනලද්දෝ වෙත්. සුවිමුක්තයෝ (මනාව මිදුණෝ) වෙත්, නිපදවත් ප්‍රකට කෙරෙත්, බබලවත්.

15. "සියලු සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා භය නැත්තෝ වෙත්වා. සැප ඇත්තෝ වෙත්වා'යි මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සම්මා දිට්ඨිය හාත්පසින් වඩනලද්දේ වෙයි. (ii) සියලු සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා, භය නැත්තෝ වෙත්වා. සැප ඇත්තෝ වෙත්වා'යි මැනවින් නංවයි (iii) මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සම්මා සංකප්පයන් හාත්පසින් වඩන ලද්දේ වෙයි. සියලු සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා භය නැත්තෝ වෙත්වා. සැප ඇත්තෝ වෙත්වා'යි මැනවින් පරිග්‍රහණය කෙරෙයි, මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සම්මා වාචාව හාත්පසින් වඩන ලද්දේ වෙයි සියලු සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා. භය නැත්තෝ වෙත්වා. සැප ඇත්තෝ වෙත්වා'යි මැනවින් සමුට්ඨාපනය කෙරෙයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සම්මා කම්මන්තය හාත්පසින් වඩන ලද්දේවෙයි. සියලු සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා. භය නැත්තෝ වෙත්වා. සැප ඇත්තෝ වෙත්වා'යි මැනවින් පිරිසිදු කරවයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සම්මා ආජීවය හාත්පසින් වඩන ලද්දේ වෙයි. සියලු සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා. භය නැත්තෝ වෙත්වා සැප ඇත්තෝ වෙත්වා'යි මැනවින් අල්ලා ගනියි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සම්මා වායාමය හාත්පසින් වඩන ලද්දේ වෙයි. සියලු සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා භය නැත්තෝ වෙත්වා සැප ඇත්තෝ වෙත්වා'යි මැනවින් සිහි එලවයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සම්මා සතිය හාත්පසින් වඩන ලද්දේ වෙයි. සියලු සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා, භය නැත්තෝ වෙත්වා සැප ඇත්තෝ වෙත්වා'යි මැනවින් සිත පිහිටුවයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සම්මා සමාධිය හාත්පසින් වඩන ලද්දේ වෙයි.

16. "මේ මාර්ගංගයෝ අටදෙන මෛත්‍රී චිත්ත විමුක්තියගේ ආසෙවනයෝ වෙත්. මේ මාර්ගංගයන් අටදෙනා විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය ආසෙවනය කරණු ලැබේ. මේ මාර්ගංගයෝ අටදෙන මෛත්‍රී චිත්ත විමුක්තියගේ බහුල වශයෙන් කරණු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ලබන්නෝ වෙත්. මේ මාර්ගයන් අටදෙනා විසින් මෛත්‍රී චිත්ත වචිමුක්තිය බහුල වශයෙන් කරනු ලැබේ.

17. "මේ මාර්ගාංගයෝ අටදෙන මෛත්‍රී චිත්ත විමුක්තියගේ අලංකාරයෝ වෙත්, මේ මාර්ගංගයන් අටදෙනා විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය මොනවට අලංකෘත වූවාවෙයි. මේ මාර්ගාංගයෝ අටදෙන මෛත්‍රී චිත්ත විමුක්තියගේ පරිෂ්කාරයෝ වෙත්. මේ මාර්ගංගයන් අටදෙනා විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය සුපරිෂ්කෘත වූවාවෙයි. මේ මාර්ගංගයෝ අට දෙන මෛත්‍රී චිත්ත විමුක්තියගේ පරිවාරයෝ වෙත්. මේ මාර්ගාංගයන් අටදෙනා විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය සුපරිකෘත වූවාවෙයි.

"මේ මාර්ගංගයෝ අටදෙන මෛත්‍රී චිත්ත විමුක්තියගේ ආසෙවනයෝ වෙත්. භාවනාවෝ වෙත්. බහුල වශයෙන් කරන්නෝ වෙත්. අලංකාරයෝ වෙත්. පරිෂ්කාරයෝ වෙත්. පරිවාරයෝ වෙත්. පරිපූරකයෝ වෙත්. යුක්තවූවෝ වෙත් සහජාතයෝ වෙත්. (එකට පහළවුවෝ) මිශ්‍රවූවෝ වෙත්. සම්ප්‍රයුක්තයෝ වෙත්. ප්‍රස්කන්ධනයෝ වෙත්. ප්‍රසීදනයෝ වෙත්. සන්තිෂ්ඨනයෝ (තීරණ) වෙත්. මිදෙන්නෝ වෙත්. මෙය ශාන්තයි දක්නෝ වෙත්. යානීකෘතයෝ වෙත්. වස්තු කෘතයෝ වෙත්. හටගන්නෝ වෙත්. පුරුදු කරන ලද්දෝ වෙත්. මනාව පටන්ගන්නා ලද්දෝ වෙත්. මනාව වඩන ලද්දෝ වෙත්. මනාව පිහිටුවන ලද්දෝ වෙත්. මනාව ඔසවන ලද්දෝ වෙත්. සුවි මුක්තයෝ වෙත්. (මෛත්‍රිය) උපදවත්. ප්‍රකට කෙරෙත්. බබළවත්.

18. "සියලු ප්‍රාණීන්ගේ සියලු භූතයන්ගේ සියලු පුද්ගලයන්ගේ සියලු ආත්මභාව දරන්නන්ගේ සියලු ස්ත්‍රීන්ගේ, සියලු පුරුෂයන්ගේ, සියලු ආර්යයන්ගේ, සියලු අනාර්යයන්ගේ, සියලු දෙවියන්ගේ, සියලු මිනිසුන්ගේ, විනිපාතිකයන්ගේ, පීඩනය දුරුකොට නොපෙළීමෙන් (ii) (බාහිර) ශරීරොපඝාතය (-පීඩා) දුරුකොට අනුපඝාතයෙන් (චිත්ත) සන්තාපනය දුරුකොට අසන්තාපනයෙන් (ජීවිත) විනාශය දුරුකොට (ජීවිත) විනාශ නොකිරීමෙන් විහෙඨනය දුරුකොට අවිහෙඨනයයෙන් සියලු විනීපාතිකයෝ අවෛරී වෙත්වා. වෛරීහු නොවෙත්වා.

සුඛිතයෝ වෙත්වා. දුඃඛිතයෝ නොවෙත්වා. සුඛිතාත්ම ඇත්තෝ වෙත්වා. දුඃඛිතාත්ම ඇත්තෝ නොවෙත්වා. මේ අට අයුරෙන් සියලු විනිපාතිකයන් (කෙරෙහි) මෙත් කෙරේනුයි ‘මෙත්තා’ නම්. එම ධර්මය සිතානුයි” චෙතො නම්. සියලු ව්‍යාපාද (හිංසා) පරියුට්ඨානයන් (මැඩ ගැනීම්) කෙරෙන් මිදේනුයි. විමුත්තී නම් ‘මෙත්තා’ ද ‘චෙතො’ ද විමුක්තිදැයි, මෙත්තා චෙතො විමුක්ති නම් (iii) සියලු විනිපාතිකයෝ අවෛරීහු වෙත්වා භය නැත්තෝ වෙත්වා සැප ඇත්තෝ වෙත්වා’යි ශ්‍රද්ධාවෙන් සිත පිහිටුවයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් (iv) ශ්‍රද්ධා ඉන්ද්‍රිය භාත්පසින් වඩන ලද්දේ වෙයි. (මෙහි 15 ඡේදයේ (ii) යොදන්න.) මේ ඉන්ද්‍රියයෝ පස්දෙන (මෛත්‍රිය) උපදවත්. ප්‍රකට කෙරෙත්. බබළවත්.

**19.** “සියලු පූර්ව දිශාවෙහි සත්වයන්ගේ මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, ප්‍රඥෙන්ද්‍රිය භාත්පසින් වඩන ලද්දේ වෙයි. (මෙහි 15 ඡේදයේ (ii) යොදන්න.) සියලු පශ්චිම දිශාවෙහි සත්වයන්ගේ සියලු උත්තර දිශාවෙහි සත්වයන්ගේ, සියලු දක්ෂිණ දිශාවෙහි සත්වයන්ගේ, සියලු පූර්ව අනු දිශාවෙහි සත්වයන්ගේ, සියලු පශ්චිම අනුදිශාවෙහි සත්වයන්ගේ සියලු උත්තර අනුදිශාවෙහි සත්වයන්ගේ, සියලු දක්ෂිණ අනුදිශාවෙහි සත්වයන්ගේ සියලු යට අනු දිශාවෙහි සත්වයන්ගේ සියලු ඉහළ අනුදිශාවෙහි සත්වයන්ගේ පීඩනය දුරුකොට නොපෙළීමෙන් (මෙහි 18 ඡේදයේ (ii) යොදන්න) මෙත්තාද, “චෙතො” ද විමුක්තිදැයි මෙත්තා චෙතො විමුක්ති නම්.

**20.** “සියලු උපරිම දිශාවෙහි සත්වයෝ අවෛරීහු වෙත්වා. භය නැත්තෝ වෙත්වා. සැප ඇත්තෝ වෙත්වා’යි ශ්‍රද්ධාවෙන් සිත පිහිටුවයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් ශ්‍රද්ධා ඉන්ද්‍රිය භාත්පසින් වඩන ලද්දේ වෙයි. (මෙහි 15 (ii) යොදන්න) (මෛත්‍රී) උපදවත්, ප්‍රකට කෙරෙත්, බබළවත්.

**21.** “සියලු පූර්ව දිශාවෙහි ප්‍රාණීන්ගේ විනිපාතිකයන්ගේ, සියලු පශ්චිම දිශාවෙහි විනිපාතිකයන්ගේ සියලු උත්තර දිශාවෙහි විනිපාතිකයන්ගේ, සියලු දක්ෂිණ දිශාවෙහි

විනිපාතිකයන්ගේ සියලු පූර්ව අනුදිශාවෙහි, සියලු බටහිර අනුදිශාවෙහි විනිපාතිකයන්ගේ, සියලු උත්තර අනුදිශාවෙහි විනිපාතිකයන්ගේ සියලු දක්ෂිණ අනුදිශාවෙහි විනිපාතිකයන්ගේ සියලුම යට දිශාවෙහි විනිපාතිකයන්ගේ, සියලුම ඉහළ අනුදිශාවෙහි විනිපාතිකයන්ගේ පීඩනය දුරුකොට නොපෙළීමෙන් (මෙහි 18 ඡේදයේ (ii) යොදන්න.) මෙත්තාද, චෙතොද විමුක්ති දැයි මෙත්තා චෙතො විමුත්තියයි.

22. "සියලුම උපරිම දිශාවෙහි විනිපාතිකයෝ අවෛරීහු වෙත්වා, භය නැත්තෝ වෙත්වා, සැප ඇත්තෝ වෙත්වායි ශ්‍රද්ධාවෙන් සිත පිහිටුවයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් ශ්‍රද්ධා ඉන්ද්‍රිය හාත්පසින් මඩනා ලද්දේ වෙයි. (ii) සියලුම ඉහළ දිශාවෙහි විනිපාතිකයෝ අවෛරීහු වෙත්වා. භය නැත්තෝ වෙත්වා, සැප ඇත්තෝ වෙත්වායි බලවත්සේ උත්සාහ කෙරෙයි. (iii) මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් වීර්යයෙන්ද්‍රිය හාත්පසින් වඩන ලද්දේ වෙයි. මෙහි 15 (ii) යොදන්න.) සිහිය පිහිටුවයි. මෛත්‍රි චිත්ත විමුක්තිය විසින් සතිඉන්ද්‍රිය හාත්පසින් වඩන ලද්දේ වෙයි. (මෙහි 15 (ii) සිත තැන්පත් කරයි මෛත්‍රි චිත්ත විමුක්තිය විසින් සමාධින්ද්‍රිය හාත්පසින් වඩන ලද්දේ වෙයි. (15 (ii) ප්‍රඥාවෙන් වෙසෙසින් දැනගනියි. මෛත්‍රි චිත්ත විමුක්ති ප්‍රඥා ඉන්ද්‍රිය හාත්පසින් මඩන ලද්දේ වෙයි. මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රි චිත්ත විමුක්තියගේ ආසෙවනයෝ වෙත්. මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රි චිත්ත විමුක්තිය ආසෙවනය කරනු ලැබේ. මේ ඉන්ද්‍රිය පස (මෛත්‍රිය) උපදවත්, ප්‍රකට කෙරෙත්, බබළවත්.

23. සියලුම උපරිම දිශාවෙහි විනිපාතිකයෝ අවෛරීහු වෙත්වා. භය නැත්තෝ වෙත්වා, සැප ඇත්තෝ වෙත්වායි, අශ්‍රද්ධාවෙන් කම්පා නොවෙයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් ශ්‍රද්ධා බලය හාත්පසින් වඩන ලද්දේ වෙයි. (මෙහි 15 (ii) යොදන්න) කුසීත බැවින් කම්පා නොවෙයි. මෛත්‍රි චිත්ත විමුක්තිය විසින් වීර්ය බලය හාත්පසින් වඩන ලද්දේ වෙයි. (මෙහි 15 (ii) යොදන්න) ප්‍රමාදයෙන් කම්පා නොවෙයි. මෛත්‍රි චිත්ත විමුක්තිය විසින් සති බලය හාත්පසින් වඩන ලද්දේ

වෙයි. (මෙහි 15 (ii) යොදන්න)නොසන්සුන් බැවින් කම්පා නොවෙයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සමාධි බලය හාත්පසින් වඩන ලද්දේ වෙයි. (මෙහි 15 (ii) යොදන්න) අවිජ්ජාවෙන් කම්පා නොවෙයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් ප්‍රඥා බලය හාත්පසින් මඩන ලද්දේ වෙයි, මේ පඤ්ච බලයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ ආසෙවනයෝ වෙත්. මේ පඤ්චබලයන් විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය ආසෙවනය කරනු ලැබේ, මේ බලයෝ සත්දෙන මෛත්‍රිය උපදවත්, ප්‍රකට කෙරෙත්, බබළවත්.

24. "සියලු උපරිම දිශාවෙහි විනිපාතිකයෝ (අපායගත වූවෝ) අවෛරීහු වෙත්වා, භය නැත්තෝ වෙත්වා. සැප ඇත්තෝ වෙත්වායි සිහිය පිහිටුවයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සති සම්බොජ්ක්ධංගය හාත්පසින් වඩන ලද්දේ වෙයි. (මෙහි 15 ඡෙදයේ (ii) යොදන්න) ප්‍රඥාවෙන් හාත්පසින් විමසයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් ධම්මවිචය සම්බොජ්ක්ධංගය හාත්පසින් වඩන ලද්දේ වෙයි. (මෙහි 15 ඡෙදයේ (ii) යොදන්න) බලවත්සේ උත්සාහ කරයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් විරිය සම්බොජ්ක්ධංගය හාත්පසින් වඩන ලද්දේ වෙයි. (මෙහි 23 ඡෙදයේ (ii) යොදන්න) දැවීම සංසිඳුවයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් පීති සම්බොජ්ක්ධංගය හාත්පසින් වඩන ලද්දේ වෙයි. (මෙහි 23 (ii) යොදන්න) අශාන්තභාවය සංසිඳුවයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් පස්සද්ධි සම්බොජ්ක්ධංගය හාත්පසින් වඩන ලද්දේ වෙයි. (මෙහි 23 ඡෙදයේ (ii) යොදන්න) සිත තැන්පත් කරයි. මෛත්‍රී චිත්ත විමුක්තිය සමාධි සම්බොජ්ක්ධංගය හාත්පසින් වඩන ලද්දේ වෙයි. (මෙහි 23 ඡෙදයේ (ii) යොදන්න) ඥානයෙන් ක්ලේශයන් නුවණින් සලකා බලයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් උපෙක්ඛා සම්බොජ්ක්ධංගය හාත්පසින් වඩන ලද්දේ වෙයි. මේ සත්ත බොජ්ක්ධංගයෝ මෛත්‍රී චිත්ත විමුක්තියගේ ආසෙවනයෝ වෙත්. මේ සත්ත බොජ්ක්ධංගයන් විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය ආසෙවනය කරනු ලැබේ. මේ බොජ්ක්ධංගයෝ සත්දෙන මෛත්‍රිය උපදවත්. ප්‍රකට කෙරෙත් බබලවත්.

**25.** "සියලුම උපරිම දිශාවෙහි විනිපාතිකයෝ අවෛරීහු වෙත්වා, භය නැත්තෝ වෙත්වා, සැප ඇත්තෝ වෙත්වායි, මැනවින් දකියි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සම්මා දිට්ඨිය හාත්පසින් වඩන ලද්දේ වෙයි. (මෙහි 23 ඡේදයේ (ii) යොදන්න) මැනවින් නංවයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සම්මා සංකප්පය හාත්පසින් වඩන ලද්දේ වෙයි. (මෙහි 23 ඡේදයේ (ii) යොදන්න) මැනවින් පරිග්‍රහණය කෙරෙයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සම්මා වාචාව හාත්පසින් වඩන ලද්දේ වෙයි (මෙහි 23 ඡේදයේ (ii) යොදන්න) මැනවින් සමුට්ඨාපනය කෙරෙයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සම්මා කම්මන්තය හාත්පසින් වඩනලද්දේ වෙයි. (මෙහි 23 ඡේදයේ (ii) යොදන්න) මැනවින් පිරිසිදු කරවයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සම්මා ආජීවය හාත්පසින් වඩන ලද්දේ වෙයි. (මෙහි 23 ඡේදයේ (ii) යොදන්න) මැනවින් අල්වා ගනියි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සම්මා වායාමය හාත්පසින් වඩනලද්දේ වෙයි. (මෙහි 23 ii යොදන්න) මැනවින් සිහි එළවයි. මෛත්‍රී චිත්ත විමුක්තිය වඩත්ම සම්මාසතිය හාත්පසින් වඩනලද්දේ වෙයි. මැනවින් සිත පිහිටුවයි. මෛත්‍රී චිත්ත විමුක්තිය විසින් සම්මාසමාධිය හාත්පසින් වඩන ලද්දේ වෙයි.

**26.** මේ මාර්ගාංගයෝ අටදෙන මෛත්‍රී චිත්ත විමුක්තියගේ ආසේවනයෝ වෙත්. මේ මාර්ගයෝ අටදෙනා මෛත්‍රී චිත්ත විමුක්තියගේ පරිවාරයෝ වෙත්. මේ මාර්ගාංගයන් අටදෙනා විසින් මෛත්‍රී චිත්ත විමුක්තිය සුපරිවෘතවූවාවෙයි. මේ මාර්ගාංගයෝ අටදෙන මෛත්‍රී චිත්ත විමුක්තියගේ ආසෙවනයෝ වෙත්, භාවනාවෝ වෙත්, බහුල වශයෙන් කරන්නෝ වෙත්, අලංකාරයෝ වෙත් පරිෂ්කාරයෝ වෙත්, පරිවාරයෝ වෙත්, පරිපූරකයෝ වෙත්, යුක්තවූවෝ වෙත්, සහජාතයෝ වෙත්, මිශ්‍රවූවෝ වෙත්, සම්ප්‍රයුක්තයෝ වෙත්, ප්‍රස්කන්ධයෝ වෙත්, ප්‍රසීදනයෝ වෙත්, ශන්තීෂ්ඨනයෝ (තීරණ) වෙත්, මිදෙන්නෝ වෙත් 'මෙය ශාන්ත'යි දක්නෝ වෙත්, යානිකෘතයෝ වෙත්, වස්තුකෘතයෝ වෙත්, හටගන්නෝ වෙත්, පුරුදු කරන ලද්දෝ වෙත්, මනාව පටන්ගන්නා ලද්දෝ වෙත්,

මනාව වඩනලද්දෝ වෙත්, මනාව පිහිටුවන ලද්දෝ වෙත්, මනාව ඔසවන ලද්දෝ වෙත්, සුවිමුත්තයෝ වෙත්. (මෛත්‍රිය) උපදවත්, ප්‍රකට කෙරෙත්, බබලවත්.

## 15 විරාග කථා

1. විරාගය මාර්ගයයි, විමුක්තිය ඵලයයි, විරාගය මාර්ගය වන්නේ කෙසේද?

ශොතාපත්ති මාර්ගයෙහි දර්ශනාර්ථයෙන් සම්මා දිට්ඨිය මිච්ඡා දිට්ඨියෙන් විරත වෙයි, තදානුවර්ති ක්ලේශයන්ගෙන්ද, ස්කන්ධයන්ගෙන්ද, විරත වෙයි. බාහිර සියලු නිමිති කෙරෙන්ද විරත වෙයි

විරාගය නිර්වාණාලම්බනය නිර්වාණ ගොචරය, නිර්වාණ සමුත්පන්නය නිර්වාණයෙහි ස්ථිතය. නිර්වාණයෙහි ප්‍රතිෂ්ඨිතය.

'විරාගො' යනු විරාගද්වයයි;- නිර්වාණයද විරාගයයි. නිර්වාණලම්බනතාවෙන් හටගත් යම් ධර්ම කෙනෙක් වෙත්ද ඒ සියල්ලද විරාගයෝ වෙත්හුය. විරාගයෝයි. (එකට පහළවූ) සහජාත සප්තාංගයෝ විරාගයට යෙත්නුයි. විරාගය මාර්ගයයි. මේ මගින් බුදුවරුද, ශ්‍රාවකයෝද, අගත දිසා සංඛ්‍යාත නිර්වාණයට යෙත්නුයි. අෂ්ටාංගික මාර්ගයයි. යම් පමණ අන්‍ය ලබ්ධික බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ මාර්ගයෝ වෙත්ද (ඔවුනතුරෙන්) මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම අග්‍රද, ශ්‍රෙෂ්ඨද, ප්‍රමුඛද, උත්තමද, ප්‍රවරදැයි මාර්ගයන් අතුරෙන් අෂ්ටාංගික මාර්ගය ශ්‍රෙෂ්ඨය.

2. අභිරොපනාර්ථයෙන් (නැංවීමේ තේරුමින්) සම්මා සංකප්පය, මිච්ඡාසංකප්පයෙන් විරත වෙයි. පරිග්‍රහාර්ථයෙන් (අයත්කමේ තේරුමෙන්) සම්මාවාචාව මිච්ඡා වාචාවෙන් විරත වෙයි. සමුට්ඨානාර්ථයෙන් (තීරණයේ තේරුමින්) සම්මා කම්මන්තය මිච්ඡා කම්මන්තයෙන් විරතවෙයි. වොදානාර්ථයෙන් සම්මා ආජීවය මිච්ඡා ආජීවයෙන් විරත වෙයි, ප්‍රග්‍රහාර්ථයෙන් (අල්ලා ගැනීම් තේරුමින්) සම්මා වායාමය මිච්ඡා වායාමයෙන් විරත වෙයි. උපස්ථානාර්ථයෙන් සම්මාසතිය මිච්ඡාසතියෙන් විරත වෙයි. අවික්ෂෙපාර්ථයෙන්

නොකැලඹීම් අර්ථයෙන් සම්මාසමාධිය මිච්ඡා සමාධියෙන් විරත වෙයි. ඒ අනුව පැවති ක්ලේශයන්ගෙන්ද ස්කන්ධයන්ගෙන්ද විරත වෙයි. බාහිර සියලු නිමිති කෙරෙන්ද විරත වෙයි. විරාගය නිර්වාණාලම්බන නිර්වාණ ගොචරය නිර්වාණ සමුත්පන්නය නිර්වාණයෙහි සිටියේය, නිර්වාණයෙහි පිහිටියේය.

3. "විරාගො" යනු විරාග දෙකයි. නිර්වාණයද, විරාගයයි. නිර්වාණය අල්ලා ගැනීමෙන් හටගත් යම් ධර්ම කෙණෙක් වෙත්ද, ඒ සියල්ලද විරාගයෝ වෙත්නුයි විරාගයෝයි. (එකට උපන්) සහජාත සප්තාංගයෝ විරාගයට යෙත්නුයි. විරාගය මාර්ගයයි. මේ මගින් බුදුවරුද ශ්‍රාවකයෝද අගත දිසා (නොගිය දිශාව) නම්වූ නිර්වාණයට යෙත්නුයි අෂ්ටාංගික මාර්ගයයි. යම් පමණ අන්‍ය ලබ්ධික බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ මාර්ගයෝ වෙත්ද, (ඔවුනතුරෙන්) මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම අග්‍රද ශ්‍රෙෂ්ඨද, ප්‍රමුඛද උත්තමද ප්‍රවර දැයි මාර්ගයන් අතුරෙන් අෂ්ටාංගික මාර්ගය ශ්‍රෙෂ්ඨය.

4. සකෘදාගාමි මාර්ගක්ෂණයෙහි දර්ශන (දැකීම් අර්ථයෙන් සම්මාදිට්ඨිය අවික්ෂෙප (නොකැලඹීමේ) අර්ථයෙන් සම්මා සමාධිය ඕලාරික කාමරාග සංයෝජනය පටිඝ සංයෝජනය ඕලාරික කාමරාගානුසය පටිඝානුසය විරත වෙයි. තදනුවර්තී (අනුව පැවති) ක්ලේශයන්ගෙන් ද, ස්කන්ධයන්ගෙන්ද විරත වෙයි. බාහිර සියලු නිමිති කෙරෙන්ද, විරත වෙයි.

5. "විරාගය නිර්වාණ ලම්බනය නිර්වාණ ගොචරය නිර්වාණ සමුත්පන්නය (සම්පූර්ණයෙන් උපන්නේය) නිර්වාණයෙහි සිටියේය. නිර්වාණයෙහි පිහිටියේය. "විරාගො" යනු විරාගද්වයයි නිර්වාණයද විරාගයයි, නිර්වාණලම්බනතාවයෙන් හටගත් යම් ධර්ම කෙණෙක් වෙත්ද, ඒ සියල්ලද විරාගයෝ වෙත්නුයි, විරාගයෝයි, සහජාත (එකට උපන්) සප්තාංගයෝ විරාගයට යෙත්නුයි, විරාගය මාර්ගයයි මේ මගින් බුදුවරුද, ශ්‍රාවකයෝද අගත දිසා (නොගිය දිශාව) නම් නිර්වාණයට යෙත්නුයි, අෂ්ටාංගික මාර්ගයයි. යම් පමණ අන්‍ය ලබ්ධික බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ මාර්ගයෝ

වෙත්ද (ඔවුනතුරෙන්) මේ ආර්යඅෂ්ටාංගික මාර්ගයම අග්‍රද ශ්‍රෙෂ්ඨද ප්‍රමුඛද, උත්තමද, ප්‍රවරදැයි මාර්ගයන් අතුරෙන් අෂ්ටාංගික මාර්ගය ශ්‍රෙෂ්ඨයි.

**6.** අනාගාමි මාර්ග ක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්මා දිට්ඨිය, අභිරොපනාර්ථයෙන් සම්මාසංකප්පය, පරිග්‍රහාර්ථයෙන් සම්මා වාචාය, සමුට්ඨානාර්ථයෙන් සම්මාකම්මන්තය, වොදානාර්ථයෙන් සම්මා ආජීවය, ප්‍රග්‍රහණාර්ථයෙන් සම්මා වායාමය, උපස්ථානාර්ථයෙන් සම්මා සතිය, වික්ෂෙපාර්ථයෙන් නොකැලඹීමේ තේරුමෙන් සම්මා සමාධිය, තුනී බවට පත් කාම රාග සංයොජන පටිඝසංයෝජන තුනී බවට පත් කාම රාගානුසය පටිඝානුසය විරත වෙයි තදනුවර්තී (අනුව පැවති) ක්ලේශයන්ගෙන්ද ස්කන්ධයන්ගෙන්ද විරත වෙයි. බාහිර සියලු නිමිති කෙරෙන්ද විරත වෙයි.

විරාගය නිවීම අරමුණු කළේය. නිර්වාණයෙන් උපන්නේය. නිර්වාණයෙහි සිටියේය. නිර්වාණයෙහි පිහිටියේය.

"විරාගො" යනු විරාග දෙකයි. නිර්වාණයද විරාගයයි නිවීම අරමුණු කිරීමෙන් හටගත් යම් ධර්ම කෙනෙක් වෙත්ද ඒ සියල්ලද විරාගයෝ වෙත්නුයි විරාගයෝයි සහජාත (එකට උපන්) සප්තංගයෝ විරාගයට යෙත්නුයි විරාගය මාර්ගයයි. මේ මගින් බුදුවරුද, ශ්‍රාවකයෝද, නොගිය දිශාව නම් නිර්වාණයට යෙත්නුයි, අෂ්ටාංගික මාර්ගයයි. යම් පමණ අන්‍ය ලබ්ධික බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ මාර්ගයෝ වෙත්ද, (ඔවුනතුරෙන්) මේ ආර්යඅෂ්ටාංගික මාර්ගයම අග්‍රද, ශ්‍රෙෂ්ඨද, ප්‍රමුඛද, උත්තමද, ප්‍රවරදැයි මාර්ගයන් අතුරෙන් අෂ්ටාංගික මාර්ගය ශ්‍රෙෂ්ඨය. අභිරොපනාර්ථයන් සම්මා සංකල්පය පරිග්‍රහනාර්ථයෙන් සම්මාවාචාව සම්මා කම්මන්තය වොදානාර්ථයෙන් සම්මා ආජීවය සම්මාවායාමය උපසමනාර්ථයෙන් සම්මා සතිය.

**7.** අර්හත් මාර්ගක්ෂණයෙහි දර්ශන දැකීම් අර්ථයෙන් සම්මා දිට්ඨිය සමුට්ඨානාර්ථයෙන් ප්‍රහාණාර්ථයෙන් අවික්ෂෙප නොකැලඹීමේ අර්ථයෙන් සම්මා සමාධිය රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා මානානුසය, භව රාගානුසය,

අවිජ්ජානුසය, යන මොවුන් අතුරෙන් විරත වෙයි. තදනුවර්ති ක්ලේශයන් කෙරෙන්ද, ස්කන්ධයන් කෙරෙන්ද, විරත වෙයි, බාහිර සියලු නිමිති කෙරෙන්ද, විරත වෙයි.

විරාගය නිර්වාණාලම්බනය නිර්වාණ ගොචරය නිර්වාණ සමුත්පන්නය නිර්වාණයෙහි සිටියේය, නිර්වාණයෙහි පිහිටියේය.

'විරාගො' යනු විරාග දෙකයි. නිර්වාණයද විරාගයයි නිර්වාණය අල්ලා ගැනීමෙන් යම් ධර්ම කෙණෙක් වෙත්ද, ඒ සියල්ලද විරාගයෝ වෙත්නුයි විරාගයෝයි. සහජාත එකට උපන් සප්තාංගයෝ විරාගයට වෙත්නුයි විරාගයෝයි. මේ මගින් බුදුවරුද ශ්‍රාවකයෝද නොගිය දිග නම් නිර්වාණයට යෙත්නුයි අෂ්ටාංගික මාර්ගයයි. මේ පමණ අන්‍යලබ්ධික බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ මාර්ගයෝ වෙත්ද, (ඔවුනතුරෙන්) මේ ආර්යඅෂ්ටාංගික මාර්ගයම අග්‍රද ශ්‍රෙෂ්ඨද, ප්‍රමුඛද, උත්තමද, ප්‍රවරදැයි මාර්ගයන් අතුරෙන් අෂ්ටාංගික මාර්ගය ශ්‍රෙෂ්ඨය, දර්ශන විරාගය සම්මාදිට්ඨියයි අභිරොපණ විරාගය සම්මා සංකප්පයයි පරිග්‍රහ විරාගය සම්මාවාචායි, සමුට්ඨාන විරාගය සම්මාකම්මන්තයයි, වොදාන විරාගය සම්මා ආජීවයයි, ප්‍රග්‍රහ විරාගය සම්මා වායාමයයි උපට්ඨාන විරාගය සම්මා සතියයි, අවික්ෂෙප විරාගය සම්මාසමාධියයි උපට්ඨාන විරාගය සතිසම්බොජ්ක්ධංගයයි. පවිචය විරාගය ධම්ම විචය සම්බොජ්ක්ධංගයයි. ප්‍රග්‍රහ විරාගය විරිය සම්බොජ්ක්ධංගයයි. ඵරණ විරාගය ප්‍රිති සම්බොජ්ක්ධංගයයි. උපසම විරාගය පස්සද්ධි සම්බොජ්ක්ධංගයයි අවික්ෂෙප විරාගය සමාධි සම්බොජ්ක්ධංගයයි. පටිසංඛාන විරාගය උපෙක්ඛා සම්බොජ්ක්ධංගයයි.

8. ශ්‍රද්ධාවෙන් නොසැලෙන විරාගය ශ්‍රද්ධාබලයයි කුසීතයෙන් නොසැලෙන විරාගය වීර්ය බලයි. ප්‍රමාදයෙන් නොසැලෙන විරාගය සතිබලයයි. උඩගු කමින් නොසැලෙන විරාගය සමාධි බලයයි. අවිජ්ජාවෙන් නොසැලෙන විරාගය ප්‍රඥා බලයයි. අධිමොක්ෂ විරාගය ශ්‍රද්ධෙන්ද්‍රියයි. ප්‍රග්‍රහ විරාගය

විරියෙන්ද්‍රියයි. උපට්ඨාන විරාග සතින්ද්‍රියයි. අවික්ෂෙප විරාගය සමාධින්ද්‍රියයි. දර්ශන විරාගය ප්‍රඥෙන්ද්‍රියයි.

අධිපති අර්ථයෙන් ඉන්ද්‍රිය විරාගයයි, අකම්ප්‍යාර්ථයෙන් බල විරාගයයි නෛයර්යානිකාර්ථයෙන් බොජ්ක්ධංග විරාගයයි. හෙතු අර්ථයෙන් මාර්ගය විරාගයයි උපස්ථානාර්ථයෙන් සතිපට්ඨාන විරාගයයි. පදහනාර්ථයෙන් සම්මප්පධාන විරාගයයි. ඉටුවීම් අර්ථයෙන් ඉද්ධිපාද විරාගයයි. තථ අර්ථයෙන් සත්‍ය විරාගයයි අවික්ෂෙප (නොකැලඹෙන) අර්ථයෙන් සමථය විරාගයයි. අනුපස්සනාර්ථයෙන් විදර්ශනා විරාගයයි. එකම කටයුත්ත අර්ථයෙන් සමථ විදර්ශනා විරාගයයි. අනවර්තන නොඉක්ම පවතිනා අර්ථයෙන් යුගනන්ධය විරාගයයි.

**9.** සංවරාර්ථයෙන් ශීල විසුද්ධිය විරාගයයි, අවික්ෂෙප (නොකැළඹීම්) අර්ථයෙන් චිත්ත විසුද්ධිය විරාගයයි දර්ශනාර්ථයෙන් දිට්ඨි විසුද්ධිය විරාගයයි. විමුක්ත්‍යර්ථයෙන් විමොක්ෂය විරාගයයි, ප්‍රතිවෙධාර්ථයෙන් විමොක්ෂය විරාගයයි, ප්‍රතිවෙධාර්ථයෙන් විජ්ජා විරාගයයි, පරිත්‍යාගාර්ථයෙන් විමුක්ති විරාගයයි, නැති කිරීම් අර්ථයෙන් ගෙවා දැමීමේ නුවණ විරාගයයි.

ඡන්දය මූලාර්ථයෙන් විරාගයයි. මනසිකාරය හට ගැනීම් අර්ථයෙන් විරාගයයි, ඵස්සය ගැලපීම අර්ථයෙන් විරාගයයි, වේදනාව රැස්වීම් අර්ථයෙන් විරාගයයි සමාධිය ප්‍රමුඛාර්ථයෙන් විරාගයයි, සතිය අධිපති අර්ථයෙන් විරාගයයි, ප්‍රඥාව උසස් අර්ථයෙන් විරාගයයි, විමුක්තිය සාරාර්ථයෙන් විරාගයයි, සම්මා දිට්ඨිය දර්ශන මාර්ගයයි. සම්මා සංකප්පය නැංවීමේ මාර්ගයයි. අමෘතයට ඇතුළත් නිර්වාණය අන්තිම අර්ථයෙන් මාර්ගයයි. මෙසේ විරාගය මාර්ගයයි.

**10.** විමුක්තිය ඵලය වන්නේ කෙසේද? ශ්‍රොතාපත්ති ඵලක්ෂණයෙහි සම්මා දිට්ඨිය මිච්ඡාදිට්ඨියෙන් විමුක්තවූවා වෙයි. ඒ අනුව පවත්නා ක්ලේශයන්ගෙන්ද, ස්කන්ධයන්ගෙන්ද, විමුක්තවූවා වෙයි. බාහිර සියලු නිමිති කෙරෙන්ද විමුක්තවූවා වෙයි. මිදීම නිවීම අල්ලා සිටීම නිර්වාණ ගොචරය. නිර්වාණ සමුත්පන්නය, නිර්වාණයෙහි පිහිටියේය. මිදීම යනු මිදීම්

දෙකකි. නිර්වාණයද මිදීමයි. නිවීම අරමුණකොට හටගත් යම් ධර්ම කෙනෙක් වෙත්ද, ඒ සියල්ලද මිදීම වේනුයි. මිදීමේ ඵලයයි. නැංවීම් අර්ථයෙන් නිවැරැදි සිතිවිල්ල වැරදි සිතුවිල්ලෙන් මිදුණේ වෙයි. (ii) ඒ අනුව පවත්නා ක්ලේශයන්ගෙන්ද ස්කන්ධයන්ගෙන්ද මිදුණාවෙයි. බාහිර සියලු නිමිති කෙරෙන්ද මිදුණා වෙයි. (iii) මිදීම නිවීම අරමුණකොට තිබේ. නිර්වාණ ගොචරය නිර්වාණයෙන් හටගත්තේය. නිර්වාණයෙහි පිහිටියේය.

මිදීම යනු මිදීම් දෙකයි. මිදීම නිවන අරමුණු කිරීමෙන් හටගත් යම් ධර්මකෙනෙක් වෙත්ද, ඒ සියල්ලද මිදීමවේනුයි විමුක්ති ඵලයයි. අයත්කිරීමේ අර්ථයෙන් නිවැරදි වචනයෙන් වැරදි වචනය වෙන්වූවා වෙයි. සමුට්ඨානාර්ථයෙන් නිවැරදි කර්මාන්තය වැරදි කර්මාන්තයෙන් වෙන්වූවා වෙයි. පිරිසිදු කිරීමේ අර්ථයෙන් නිවැරදි ආජීවයෙන් වැරදි ආජීවය වෙන්වූවා වෙයි. දැඩි ගැනීම අර්ථයෙන් නිවැරැදි වෑයම වැරදි වෑයමින් වෙන්වූවා වෙයි. වැටහීම් අර්ථයෙන් නිවැරැදි සිහිය වැරැදි සිහියෙන් වෙන් වෙයි. නොකැළඹීමේ අර්ථයෙන් නිවැරැදි සමාධිය වැරැදි සමාධියෙන් වෙන්වූවාවෙයි. ඒ අනුව පවත්නා ක්ලේශයන්ගෙන්ද ස්කන්ධයන්ගෙන්ද වෙන්වූවා වෙයි. බාහිර සියලු නිමිති කෙරෙන්ද, වෙන්වූවා වෙයි.

11. "මිදීම නිවීම අරමුණකොට ඇත්තේය. නිර්වාණ ගොචරය නිර්වාණයෙන් හටගත්තේය. නිර්වාණයෙහි සිටියේය නිර්වාණයෙහි පිහිටියේය. මිදීම යනු මිදීම් දෙකයි. නිර්වාණයද මිදීමයි නිවන් අරමුණු කිරීමෙන් හටගත් යම් ධර්මකෙනෙක් වෙත්ද, ඒ සියල්ලද මිදීමවේනුයි මිදීමේ ඵලයයි.

සකෘදාගාමි මාර්ගක්ෂණයෙහි (ii) දර්ශනාර්ථයෙන් සම්මා දිට්ඨිය, අභිරොපනාර්ථයෙන් සම්මාසංකප්පය, සමුට්ඨානාර්ථයෙන් සම්මාවාචාය, පරිග්‍රහාර්ථයෙන් සම්මාකම්මන්තය, වොදානාර්ථයෙන් සම්මා ආජීවය, ප්‍රග්‍රහාර්ථයෙන් සම්මා වායාමය, උපස්ථානාර්ථයෙන් සම්මාසතිය, නොකැළඹීම් අර්ථයෙන් සම්මා සමාධිය (iii) ඉතා මහත් කාමරාගයේ බැම්ම ක්‍රොධයේ බැම්ම ඉතා මහත්

කාමරාගානුසය, පටිඝානුසය වෙන්වූවා වෙයි. ඒ අනුව පවත්නා ක්ලේශයන් කෙරෙන්ද සත්වයන් කෙරෙන්ද, වෙන්වූවාවෙයි. බාහිර සියලු නිමිතිකෙරෙන්ද වෙන්වුවාවෙයි.

මිදීම නිවීම අරමුණු කෙළේ වෙයි. නිර්වාණගොචරය, නිර්වාණයෙන් හට ගැනිණ, නිර්වාණයෙහි සිටියේය, නිර්වාණයෙහි පිහිටියේය.

මිදීම් යනු මිදීම් දෙකයි. නිර්වාණයද මිදීමයි නිවන් අරමුණු කිරීමෙන් හටගත් යම් ධර්ම කෙනෙක් වෙත්ද, ඒ සියල්ලද වෙන් වේනුයි. මිදීමේ ඵලයයි.

12. අනාගාමි ඵලක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්මා දිට්ඨිය (11 ඡෙදයේ (ii) යොදන්න.) නොකැලඹීම් අර්ථයෙන් සම්මා සමාධිය තුනී බවට පත් කාම රාගයේ බැම්ම ක්‍රොධයේ බැම්ම, තුනී බවට පත් කාමරාගානුසය පටිඝානුසය වෙන්වූවා වෙයි. ඒ අනුව පවත්නා ක්ලේශයන්ගෙන්ද ස්කන්ධයන්ගෙන්ද, වෙන්වූවා වෙයි. බාහිර සියලු නිමිති කෙරෙන්ද වෙන්වූවා වෙයි.

මිදීම නිවන් අරමුණු කෙළේය. නිර්වාණ ගොචරය. නිර්වාණයෙන් හටගත්තේ නිර්වාණයෙහි සිටියේය, නිර්වාණයෙහි පිහිටියේය.

මිදීම යන්නෙහි මිදීම් දෙකයි. නිර්වාණයද මිදීමයි, නිවන් අරමුණු කිරීමෙන් හටගත් යම් ධර්ම කෙනෙක් වෙත්ද ඒ සියල්ලද මිදීම වෙනුයි, මිදීමේ ඵලයයි.

13. අර්හත් ඵලක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්මා දිට්ඨිය (11 ඡෙදයේ (ii) යොදන්න.) නොකැලඹීම් අර්ථයෙන් සම්මා සමාධිය රූප රාග මාන උද්ධච්ච යන මොවුහු අවිද්‍යාවෙන්ද, මානානුසය, භවරාගානුසය, අවිද්‍යානුසයෙන්ද වෙන්වූවා වෙයි, ඒ අනුව පවත්නා ක්ලේශයන් ගෙන්ද, ස්කන්ධයන් ගෙන්ද, වෙන් වූවා වෙයි, බාහිරවූ සියලු නිමිති කෙරෙන්ද වෙන්වූවා වෙයි.

මිදීම නිර්වාණ ගොචරය නිර්වාණයෙන් උපන්නේය, නිර්වාණයෙහි සිටියේය. නිර්වාණයෙහි පිහිටියේය.

13. මිදීම යන්නෙහි මිදීම් දෙකයි. නිර්වාණයද මිදීමයි. නිවන් අරමුණු කිරීමෙන් හටගත් යම් ධර්ම කෙනෙක් වෙත්ද

ඒ සියල්ලද, මිදීම් වෙනුයි. මිදීමේ ඵලයයි, දර්ශනවිමුක්තිය නිවැරැදි දැකීමය, නැංවීමේ මිදීමයි, නිවැරැදි සිතිවිල්ලයි. අයත් කිරීමේ මිදීම නිවැරැදි වචනයයි. හටගැනීමෙන් මිදීම සම්මාකම්මන්තයයි. පිරිසිදුවීමෙන් මිදීම නිවැරැදි ආජීවයයි. දැඩිව ගැනීමෙන් මිදීම නිවැරැදි වෑයමයි. වැටහීමෙන් මිදීම නිවැරැදි සිහියයි. නොකැලඹීමෙන් මිදීම නිවැරැදි සමාධියයි. වැටහීමෙන් මිදීම සති සම්බොජ්ක්ධංගයයි. පවිචය විමුක්තිය (විමසීමෙන් මිදීම) ධර්ම විචය සම්බොජ්ක්ධංගයයි. ප්‍රග්‍රහ විමුක්තිය (දැඩිවගෙන මිදීම) විරිය සම්බොජ්ක්ධංගයයි. ඵරණ විමුක්තිය (පැතිරීමෙන්) මිදීම පීති සම්බොජ්ක්ධංගයයි. සන්සුන්කමින් මිදීම පස්සද්ධි සම්බොජ්ක්ධංගයයි. නොකැලඹීමෙන් මිදීම සමාධි සම්බොජ්ක්ධංගයයි, පටිසංඛාන විමුක්තිය (නුවණින් සලකා මිදීම) උපෙක්ෂා සම්බොජ්ක්ධංගයයි.

14. අශ්‍රද්ධාවෙන් අකම්පය්‍ය විමුක්තිය, ශ්‍රද්ධා බලයයි. කුසීතකමින් අකම්පය්‍ය විමුක්තිය විරිය බලයයි. ප්‍රමාදයෙන් අකම්පය්‍ය විමුක්තිය සති බලයයි. උද්ධච්චයෙන් අකම්පය්‍ය විමුක්තිය සමාධි බලයයි. අවිද්‍යාවෙන් අකම්පය්‍ය විමුක්තිය ප්‍රඥා බලයයි. අධිමොක්ෂ විමුක්තිය ශ්‍රද්ධෙන්ද්‍රියයි. දැඩිව ගෙන මිදීම විරියෙන්ද්‍රියයි. වැටහීමෙන් මිදීම සතින්ද්‍රියයි. නොකැලඹීමෙන් මිදීම සමාධින්ද්‍රියයි. දර්ශන විමුක්තිය ප්‍රඥෙන්ද්‍රියයි.

අධිපති අර්ථයෙන් ඉන්ද්‍රියයෝ විමුක්තිය. අකම්පාර්ථයෙන් ඵලයෝ විමුක්තිය නෛර්යාණිකාර්ථයෙන් බොජ්ක්ධංගයෝ විමුක්තියයි. හේතු අර්ථයෙන් මාර්ග විමුක්තියයි. වැටහීම් අර්ථයෙන් සතිපට්ඨාන විමුක්තියයි. උත්සාහ කිරීම් අර්ථයෙන් සම්මප්පධාන විමුක්තියයි. ඉජ්ක්ධන අර්ථයෙන් සත්‍ය විමුක්තියයි. නොකැලඹීම් අර්ථයෙන් සමථය විමුක්තියයි අනුව දැකීම් අර්ථයෙන් විදර්ශනා විමුක්තියයි, එක කටයුත්ත යන අර්ථයෙන් සමථ විදර්ශනා විමුක්තියයි, නොඉක්ම පැවතීම් අර්ථයෙන් යුගනන්ධ (සමාන) විමුක්තියයි.

16. සංවරාර්ථයෙන් සීල විසුද්ධිය මිදීමයි. නොකැලඹීමේ අර්ථයෙන් චිත්ත විසුද්ධිය මිදීමයි. දැකීමේ අර්ථයෙන් දිට්ඨි

විසුද්ධිය මිදීමයි. විමුක්ත්‍යර්ථයෙන් විමොක්ෂය මිදීමයි. ප්‍රතිවෙධාර්ථයෙන් විජ්ජාව මිදීමයි. පරිත්‍යාගාර්ථයෙන් මිදීම මිදීමයි. නැති කිරීමේ අර්ථයෙන් කෙලෙස් ගෙවීමේ ඥානය මිදීමයි. වැටහීම් ඡන්දය මූලාර්ථයෙන් මිදීමයි. මනසිකාරය වැටහීම් අර්ථයෙන් මිදීමයි. ඵස්සය ගැලපීම් අර්ථයෙන් මිදීමයි වෙදනාව එක්තැන්වීම් අර්ථයෙන් මිදීමයි. සමාධිය ප්‍රමුඛාර්ථයෙන් මිදීමයි. සතිය අධිපති අර්ථයෙන් මිදීමයි. ප්‍රඥාව ඉන් උඩත් අර්ථයෙන් මිදීමයි. විමුක්තිය සාරාර්ථයෙන් මිදීමයි.

**16.** දර්ශන මාර්ගය සම්මා දිට්ඨියයි. නැංවීමේ මාර්ගය නිවැරැදි සිතිවිල්ලයි. අමෘතයට අන්තර්ගත නිර්වාණයි අන්තිම අර්ථයෙන් මාර්ගයයි. විමුක්තිය ඵලය වන්නේ මෙසේයි. විරාගය මාර්ගය, විමුක්තිය ඵලය වන්නේ මෙසේය.

විරාග කථා නිමි.

---

## 16 ප්‍රතිසම්භිදා කථා

**1.** මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස් නුවර සමීපයෙහි මිගදාය නම්වූ ඉසිපතනාරාමයෙහි වැඩවසනසේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ පස්වග මහණුන් ඇමැතූසේක. "මහණෙනි පැවිද්දා වසින් නොසෙවියයුතු මේ අන්ත දෙකෙකි. කවර අන්ත දෙකක්ද යත් ලාමක වූ ග්‍රාම්‍යවූ පෘථග්ජනයන් විසින් පුරුදු කරනලද අනාර්යවූ අවැඩ ඇසුරු කරන යම් මේ (වස්තු කාමයන්හි (ක්ලේශ) කාම සැපයාගේ යෙදීමය. යම් ඒ දුක් ඇති කරන්නාවූ අනාර්යවූ අනර්ථ ඇසුරු කරන්නාවූ යම් මේ ආත්ම ක්ලමථයෙහි යෙදීමය යන මේ අන්ත දෙකයි.

**2.** "මහණෙනි, ඒ මේ අන්ත දෙකට නොපැමිණ තථාගතයන් වහන්සේ විසින් මධ්‍යම ප්‍රතිපදාවක් අවබොධ කරන ලද්දීය. ඒ මධ්‍යම ප්‍රතිපදාව ප්‍රඥා චක්ෂුස ඇති කරන්නීය. නුවණ ඇති කරන්නීය. (කෙලෙස්) සංසිඳවීම පිණිස විශිෂ්ට ඥානය පිණිස සංබොධිය පිණිස නිර්වාණය පිණිස පවත්නාවූ

ඒ මධ්‍යම ප්‍රතිපදා තොමෝ කවරීද යත්? මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය මැයි. හේ කවරේද යත්? සම්මා දිට්ඨි සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මාසති, සම්මා සමාධි යන මොවුහුයි. මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබොධ කරන ලද ඒ මේ මධ්‍යම ප්‍රතිපදා තොමෝ ප්‍රඥා චක්ෂුස ඇති කරන්නීය. නුවණ ඇති කරන්නීය. කෙලෙස් සංසිඳවීම පිණිස විශිෂ්ට ඥානය පිණිස නිර්වාණය පිණිස පවත්නීය.

3. "මහණනි, මේ වනාහි දුක්ඛාර්ය සත්‍යය වේ. ඉපදීමද දුකය. ජරාවද දුකය. ව්‍යාධියද දුකය. මරණයද දුකය. අප්‍රියයන් හා එක්වීමද දුකය. ප්‍රියවූවන් කෙරෙන් වෙන් වීමද දුකය. කැමැති යමක් නොලැබීමද දුකය. සැකෙවින් පඤ්චූපාදන ස්කන්ධයෝද දුක වන්නාහ.

4. "මහණෙනි, මේ වනාහි දුඃඛ සමුදයාර්ය සත්‍යය වේ. පුනර්භවය ඇති කරන නන්දිරාග සහගතවූ ඒ ඒ තැන විශෙෂයෙන් සතුට ඇති කරන යම් මේ තෘෂ්ණාවක්වේද, ඕ තොමෝ කවරීද? කාමතණ්හා භවතණ්හා විභව තණ්හා යන මේ ත්‍රිවිධ තෘෂ්ණාවයි.

5. "මහණෙනි, මේ වනාහි දුක්ඛ නිරොධාර්ය සත්‍යය වේ. යම් ඒ තෘෂ්ණාවගේම මුළුමනින්ම නොඇලීමක්, නැති කිරීමක් අත්හැරීමක් දුර ලෑමක්, මදි කමක්, නොඇල්මක් වේද මෙයයි.

6. "මහණෙනි, මේ වනාහි දුක්ඛ නිරොධගාමිනි පටිපදාර්ය සත්‍යයවේ. මෙයම ආර්ය අෂ්ටාංගික මාර්ගය වේ. ඒ කවරේද යත්- සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මේය.

7. "මහණෙනි, මට මේ දුඃඛාර්ය සත්‍යයයි (ii) පෙර නොඇසූවිරූ ධර්ම විෂයෙහි (චතුස්සත්‍ය ඥාන) චක්ෂුස පහළ විය. ඥානය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ඥානා ලොකය පහළවිය. (iii) මහණෙනි, මට ඒ මේ දුඃඛාර්ය සත්‍යය පිරිසිඳ දතයුතුයයි (මෙහි (ii) යොදන්න) මහණෙනි, පිරිසිඳ දන්නා ලදැයි මට නොඇසූවිරූ ධර්ම වෂයෙහි චක්ෂුස පහළවිය.

ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය, ආලොකය පහළවිය.

8. "මහණෙනි, මට මේ දුඃඛ සමුදයාර්ය සත්‍යයයි පෙර නොඇසූ විරූ ධර්ම විෂයෙහි චක්ෂුස පහළවිය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ඥාන ලොකය පහළ විය. මහණෙනි, මට ඒ මේ දුඃඛ සමුදයාර්ය සත්‍යය ප්‍රහීණ කළයුතුයයි (7 ඡේදයේ ii යොදන්න.) මහණෙනි, මේ ප්‍රහීන කරනලදැයි පෙර නොඇසූවිරූ ධර්ම විෂයෙහි චක්ෂුස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලොකය පහළ විය.

9. "මහණෙනි, මට මේ දුඃඛ නිරොධ ආර්ය සත්‍යයයැයි පෙර නොඇසූ විරූ ධර්ම විෂයෙහි ප්‍රඥා චක්ෂුස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලොකය පහළ විය. මහණෙනි, මට මේ දුක්ඛ නිරොධ ගාමිනී ප්‍රතිපදායාර්ය සත්‍යයයි පෙර නොඇසූවිරූ ධර්ම විෂයෙහි ප්‍රඥා චක්ෂුසය පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලෝකය පහළවිය. මහණෙනි, මට ඒ මේ දුක්ඛ නිරොධ ගාමනී ප්‍රතිපදාර්ය සත්‍යය වැඩිය යුතුයයි (7 ඡේදයේ ii යොදන්න) වඩනලදැයි මහණෙනි, මට පෙර නොඇසූවිරූ ධර්ම විෂයෙහි ප්‍රඥා චක්ෂුසය පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය, ආලොකය පහළවිය.

10. මහණෙනි, මට ඒ මේ දුඃඛ නිරොධ ආර්ය සත්‍යය ප්‍රත්‍යක්ෂ කළයුතුයයි (7 ඡේදයේ ii යොදන්න.) ප්‍රත්‍යක්ෂ කරනලදැයි මහණෙනි, මට පෙර නොඇසූවිරූ ධර්ම විෂයෙහි ප්‍රඥා චක්ෂුස පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය, ආලොකය පහළවිය.

11. "මහණෙනි, යම් අවස්ථාවක පටන් මේ චතුරාර්ය සත්‍යය විෂයෙහි මෙසේ (ත්‍රිපරිවෘත්තයක්) තුන්වටයක් හා දොළොස් ආකාරයක් ඇති යථාභූත ඥාන දර්ශනය පිරිසිදු නොවීද, මහණෙනි මට ඒතාක් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත (සත්ව) ලොකයෙහිද මහණ බමුණන් සහිත දෙව් මිනිසුන්

සහිත ප්‍රජාව අතුරෙහිද නිරුත්තර සම්‍යක් සම්බොධිය ප්‍රත්‍යක්ෂ කෙළෙමියි ප්‍රතිඥා නො කෙළෙමි.

12. "මහණෙනි, යම් අවස්ථාවක පටන් මට මේ චතුරාර්ය සත්‍ය ධර්ම විෂයෙහි මෙසේ (ත්‍රිපරි වෘත්තයක් තුන්වටයක් හා දොළොස් ආකාරයක් ඇති යථාභූත ඥාන දර්ශනය පිරිසුදුවීමද, මහණෙනි, ඉක්බිති මම දෙවියන් මරුන් බඹුන් සහිත සත්ව ලොකයෙහිද, මහණ බමුණන් හා දෙව් මිනිසුන් සහිත ප්‍රජාව අතරෙහි නිරුත්තර සම්‍යක් සම්බොධිය අවබොධ කෙළෙමියි, ප්‍රතිඥා කෙළෙමි, මට ඥාන දර්ශනය (වනාහි) පහළවිය, මගේ චිත්ත විමුක්තිය අකොප්‍යය, (-තැන්පත්ය) මෝ තොමෝ අන්තිම උත්පත්තිය වන්නීය දැන් මට පුනරුත්පත්තියක් නැත. යනුයි. "භාග්‍යවතුන් වහන්සේ මෙය (ධම්ම චක්කප්පවත්තන සූත්‍රාන්තයයි වදාළසේක. සතුටු සිත් ඇති පස්වග භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ.

13. "මේ ව්‍යාකරණය වදාළකල්හි ආයුෂ්මත් කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේට රාගාදී රජස් නැති පහවූ කෙලෙස් මල ඇති, ධර්ම චක්ෂුස පහළවිය. යම් කිසිවක් ඇතිවීම ස්වභාවකොට ඇත්තේද ඒ සියල්ල නැතිවීම ස්වභාවකොට ඇත්තේය යන නුවණයි. භාග්‍යවතුන් වහන්සේ විසින් දම්සක් පැවැත්වූ කල්හි භූමි නිශ්‍රිත දෙවියෝ (සාධුකාරදී) භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහ්මණයකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයකු විසින් හෝ ලෝකයේ අන් කිසිවකු විසින් හෝ නොපැවැත්විය හැකි මේ ධර්ම චක්‍රය පවත්වනලදැයි ශබ්ද පැවැත්වූහ. භූමිනිශ්‍රිත දෙවියන්ගේ සාධුකාර ශබ්දය අසා චාතුර්මහාරාජික දෙවියෝද, චාතුර්මහාරාජික දෙවියන්ගේ ශබ්දය අසා තාවතිංස දෙවියෝද, තාවතිංස දෙවියන්ගේ ශබ්දය අසා යාම දෙවියෝද, තුෂිත දෙවියෝද, නිර්මාණරතී දෙවියෝද, පරනිර්මිත වසවර්ති දෙවියෝද, බ්‍රහ්මකායික දෙවියෝද, "භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහ්මණයකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයකු විසින් හෝ ලොකයෙහි

කිසිවකු විසින් හෝ නොපැවැත්විය හැකි මේ, ධර්ම චක්‍රය පවත්වනලදැයි" (සාධුකාර) ශබ්ද පැවැත්වූහ.

**14.** මෙසේ එකෙණෙහි ඒ කාලයෙහි ඒ මොහොතෙහි (අකනිට්ඨ) බඹලොව දක්වා ශබ්දය ඉතා උස්ව පැන නැංගේය. මේ දශ සහශ්‍රී ලොක ධාතුව මැනවින් කම්පා විය. අතිශයින් කම්පාවිය. මැනවින් වෙව්ලන්නට විය. දෙවියන්ගේ දෙවානුභාවය ඉක්මවා, අප්‍රමාණවූ මහත්වූ ආලොකයක්ද ලෙව්හි පහළවිය. ඉක්බිත්තෙන් වනාහි භාග්‍යවතුන් වහන්සේ "පින්වත් කොණ්ඩඤ්ඤ තෙමේ එකාන්තයෙන් චතුස් සත්‍යාවබොධය කෙළේය. පින්වත් කොණ්ඩඤ්ඤ තෙමේ එකාන්තයෙන් චතුස්සත්‍යාවබොධය කෙළේයයි" ප්‍රීති වාක්‍යයක් පහළ කළසේක. මෙසේ මේ කාරණය නිමිතිකොට ගෙන ආයුෂ්මත් කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේට "අඤ්ඤා කොණ්ඩඤ්ඤයයිම (කියා) නමෙක්විය.

**15.** මේ දුඃඛාර්යය සත්‍යයයි (ii) පෙර නොඇසූවිරූ ධර්ම විෂයෙහි චතුස්සත්‍යඥාන චක්ෂුස පහළවිය, විද්‍යාව පහළවිය, ආලොකය පහළවිය. (iii) ඇස පහළවිය යනු කවර අර්ථයකින්ද? ඥානය පහළවිය යනු කවර අර්ථයකින්ද? ප්‍රඥාව පහළවිය යනු කවර අර්ථයකින්ද? විද්‍යාව පහළවිය යනු කවර අර්ථයකින්ද? ආලෝකය පහළවිය යනු කවර අර්ථයකින්ද? ඇස පහළවිය යනු දර්ශනාර්ථයෙනි. ඥානය පහළවිය යනු ඤාණාර්ථයෙනි. ප්‍රඥාව පහළවිය යනු විශිෂ්ට ඥාණාර්ථයෙනි. විද්‍යාව පහළවිය යනු ප්‍රතිවෙධාර්ථයෙනි. ආලොකය පහළවිය යනු අවභාෂාර්ථයෙනි.

**16.** (චතුස්සත්‍යඥාන) චක්ෂුස ධර්ම නම්. ඥානය ධර්ම නම්. ප්‍රඥාව ධර්ම නම්. විද්‍යාව ධර්ම නම්. ආලොකය ධර්ම නම් මේ පඤ්ච ධර්මයෝ ධම්මපටිසම්භිදාවගේ ආරම්මණයෝද විෂයයෝද වෙත්. යමෙක් ඒ ධර්ම ප්‍රතිසම්භිදාවගේ ආරම්මණයෝ වෙත්ද, ඔවුහු ඇයගේ විෂයෝ වෙත්. යමෙක් ඇයගේ විෂයෝ වෙත්ද ඔවුහු ඇයගේ ආරම්මණයෝ වෙත්. එහෙයින් ධර්මයන්හි ඥානය ධර්මපටිසම්භිදායයි කියනු ලැබේ. දර්ශනාර්ථය අර්ථ නම්. ඤාණාර්ථය අර්ථ නම්. ප්‍රජානනාර්ථය

අර්ථ නමි. ප්‍රතිවෙධාර්ථය අර්ථ නමි. අවභාෂාර්ථය අර්ථ නමි. මේ පඤ්චවිධ අර්ථයෝ අර්ථ පටිසම්භිදාවගේ ආරම්මණයෝද විෂයෝද වෙත්. යමෙක් ඇයගේ විෂයෝ වෙත්ද ඔවුහු ඇයගේ ආරම්මණයෝද වෙත්. එහෙයින් අර්ථයන්හි ඥානය අර්ථ පටිසම්භිදායයි කියනු ලැබේ.

17. ධර්මයන් දැක්වීමට ව්‍යඤ්ජන නිරුක්තාභිලාපයෝ පස් දෙනෙක් වෙත්. අර්ථයන් දැක්වීමට ව්‍යඤ්ජන නිරුක්තාභිලාපයෝ පස්දෙනෙක් වෙත්. මේ දස නිරුක්තීහු නිරුක්ති පටිසම්භිදාවගේ ආරම්මණයෝද විෂයෝද වෙත්. යමෙක් ඒ නිරුක්ති ප්‍රතිසම්භිදාවගේ ආරම්මණයෝ වෙත්ද, ඔවුහු ඇයගේ ආරම්මණයෝ වෙත්. එහෙයින් නිරුක්තීන්හි ඥානය නිරුක්ති පටිසම්භිදායයි කියනු ලැබේ.

පඤ්ච ධර්මයන්හි ඥානයෝ පඤ්ච අර්ථයන්හි ඥානයෝ දශ නිරුක්තින්හි ඥානයෝද යන මේ විසි වැදෑරුම් ඥානයෝ පටිභාන පටිසම්භිදාවගේ ආරම්මණයෝ වෙත්ද, ඔවුහු ඇයගේ විෂයෝ වෙත්. යමෙක් ඇයගේ විෂයෝ වෙත්ද, ඔවුහු ඇයගේ ආරම්මණයෝ වෙත්. එහෙයින් ප්‍රතිභානයන්හි ඥානය පටිභාන පටිසම්භිදායයි කියනු ලැබේ.

18. ඒ මේ දුඃඛාර්ය සත්‍යය වනාහි පිරිසිඳ දතයුතුයයි (7 ඡේදයේ ii) යොදන්න) පිරිසිඳ දන්නාලදැයි පෙර නොඇසූ විරූ ධර්ම විෂයෙහි ඇස පහළවිය. ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය විද්‍යාව පහළවිය, ආලොකය පහළවිය.

(ii) "ඇස පහළවිය" යනු කුමන අර්ථයකින්ද? "ඤාණය පහළවිය" යනු කුමන අර්ථයකින්ද? "ප්‍රඥාව පහළවිය" යනු කුමන අර්ථයකින්ද? "විද්‍යාව පහළවිය" යනු කුමන අර්ථයකින්ද? "ආලොකය පහළවිය" යනු කුමන අර්ථයකින්ද? "ඇස පහළවිය" යනු දර්ශනාර්ථයෙනි. "ඥානය පහළවිය" යනු ඥානාර්ථයෙනි. "ප්‍රඥාව පහළවිය" යනු ප්‍රජානාර්ථයෙනි. "විද්‍යාව පහළවිය" යනු ප්‍රතිවෙධාර්ථයෙනි. "ආලොකය පහළ විය" යනු අවභාෂාර්ථයෙනි.

19. (i) චක්ෂුස ධර්ම නමි. ඥාණය ධර්ම නමි. ප්‍රඥාව ධර්ම නමි. විද්‍යාව ධර්ම නමි. ආලොකය ධර්ම නමි. මේ

පඤ්ච විධ ධර්මයෝ ධම්මපටිසම්භිදාවගේ ආරම්මණයෝද විෂයෝද වෙත්. යමෙක් ඒ ධම්මපටිසම්භිදාවගේ ආරම්මණයෝ වෙද්ද, ඔවුහු ඇයගේ විෂයෝ වෙත්. යමෙක් ඇයගේ විෂයෝ වෙත්ද ඔවුහු ඇයගේ ආරම්මණයෝ වෙත්. එහෙයින් ධර්මයන්හි ඥානය ධම්මපටිසම්භිදායයි කියනු ලැබේ.

**(ii)** දර්ශනාර්ථය අර්ථ නමි. ඥානාර්ථය අර්ථ නමි, ප්‍රතිවෙධාර්ථය අර්ථ නමි. ඔභාෂාර්ථය ධර්ම නමි. ප්‍රජානනාර්ථය අර්ථ නමි. ප්‍රතිවෙධාර්ථය අර්ථ නමි. අවභාෂාර්ථය අර්ථ නමි. මේ පඤ්චවිධ අර්ථයෝ අත්ථපටිසම්භිදාවගේ ආරම්මණයෝද විෂයෝද වෙත්. යමෙක් ඒ අර්ථ පටිසම්භිදාවගේ ආරම්මණයෝ වෙත්ද, ඔවුහු ඇයගේ ආරම්මණයෝද වෙත්. එහෙයින් අර්ථයන්හි ඥානය අර්ථපටිසම්භිදායයි කියනු ලැබේ.

**20.** ධර්මයන් දක්වන්නට නිරුක්තාභිලාපයෝ පස්දෙනෙක් වෙත්. අර්ථයන් දැක්වීමට නිරුක්තාභිලාපයෝ පස්දෙනෙක් වෙත් මේ දශ නිරුක්ති නිරුත්ති පටිසම්භිදාවගේ ආරම්මණයෝද විෂයෝද වෙත්. යමෙක් ඒ නිරුක්ති පටිසම්භිදාවගේ ආරම්මණයෝ වෙත්ද, ඔව්හු ඇයගේ විෂයෝ වෙත්. යමෙක් ඇයගේ විෂයෝ වෙත්ද, ඔව්හු ඇයගේ ආරම්මණයෝ වෙත්. එහෙයින් නිරුක්තීන්හි ඥානය නිරුක්ති පටිසම්භිදායයි කියනු ලැබේ.

**21.** පඤ්චවිධ ධර්මයන්හි ඥානයෝ පඤ්චවිධ අර්ථයන්හි ඥානයෝ දශවිධ නිරුක්තීන්හි ඥානයෝද (යන) මේ විසිවැදෑරුම් ඥානයෝ පටිභාන පටිසම්භිදාවගේ ආරම්මණයෝද විෂයෝද වෙත්. යමෙක් පටිභාන පටිසම්භිදාවගේ ආරම්මණයෝ වෙත්ද, ඔව්හු ඇයගේ විෂයෝ වෙත්. යමෙක් ඇයගේ විෂයෝ වෙත්ද, ඔව්හු ඇයගේ ආරම්මණයෝ වෙත්. එහෙයින් පටිභානයන්හි ඥානය පටිභාන පටිසම්භිදා යයි කියනු ලැබේ.

**22.** මේ දුක්ඛ සමුදයාර්ය සත්‍යයයි පෙර නොඇසූ විරූ ධර්ම විෂයෙහි ඇස පහළවිය. (7 ඡේදයේ (ii) යොදන්න.) ආලෝකය පහළවිය. ඒ මේ දුක්ඛ සමුදයාර්ය සත්‍ය වනාහි ප්‍රහීණ කළයුතුයයි (7 ඡේදයේ (ii) යොදන්න.) ප්‍රහීණ කරනලදැයි

පෙර නොඇසූ විරූ ධර්ම විෂයෙහි ඇස පහළවිය. (7 ඡේදයේ (ii) යොදන්න) ආලෝකය පහළවිය. (7 ඡේදයේ (ii) යොදන්න.) දුක්ඛ සමුදයාර්ය සත්‍යයෙහි ධර්මයෝ පසළොස් දෙනෙක් වෙත්. අර්ථයෝ පසළොස් දෙනෙක් වෙත්. නිරුක්තීහු තිස් දෙනෙක් වෙත්. ඥානයෝ තිස්දෙනෙක් වෙත්.

**23.** මේ දුක්ඛ නිරොධාර්ය සත්‍යයයි පෙර නොඇසූ විරූ ධර්ම විෂයෙහි ඇස පහළවිය. (7 ඡේදයේ (ii) යොදන්න.) ආලෝකය පහළවිය. ඒ මේ දුක්ඛ නිරොධාර්ය සත්‍යය ප්‍රත්‍යක්ෂ කටයුතුයයි. (7 ඡේදයේ (ii) යොදන්න.) ප්‍රත්‍යක්ෂ කරන ලදැයි පෙර නොඇසූ විරූ ධර්ම විෂයෙහි ඇස පහළවිය. (7 ඡේදයේ (ii) යොදන්න.) දුක්ඛ නිරොධාර්ය සත්‍යයෙහි ධර්මයෝ පසළොස් දෙනෙක් වෙත්. අර්ථයෝ පසළොස් දෙනෙක් වෙත්. නිරුක්තීහු තිස් දෙනෙක් වෙත්, ඥානයෝ සැට දෙනෙක් වෙත්.

**24.** මේ දුක්ඛ නිරොධගාමිනී ප්‍රතිපදාර්ය සත්‍යයයි පෙර නොඇසූවිරූ ධර්ම විෂයෙහි ඇස පහළවිය. (7 ඡේදයේ (ii) යොදන්න) ආලෝකය පහළවිය. ඒ මේ දුක්ඛ නිරොධගාමිනී ප්‍රතිපදාර්ය සත්‍යය වැඩිය යුතු යයි (7 ඡේදයේ (ii) යොදන්න.) වඩන ලදැයි පෙර නොඇසූ විරූ ධර්ම විෂයෙහි ඇස පහළ විය. ආලෝකය පහළවිය. දුක්ඛ නිරොධගාමිනී ප්‍රතිපදාර්ය සත්‍යයෙහි ධර්මයෝ පසළොස් දෙනෙක් වෙත්. අර්ථයෝ පසළොස් දෙනෙක් වෙත්, නිරුක්තීහු තිස් දෙනෙක් වෙත්. ඥානයෝ සැටදෙනෙක් වෙත්.

චතුරාර්ය සත්‍යයන්හි ධර්මයෝ සැට දෙනෙක් වෙත්. අර්ථයෝ සැට දෙනෙක් වෙත්. නිරුක්තීහු එක්සිය විසිදෙනෙක් වෙත්. ඥානයෝ දෙසිය හතළිස් දෙනෙක් වෙත්.

**25.** මහණෙනි මට මේ කයෙහි කය අනුව බැලීමයයි (7 ඡේදයේ (ii) යොදන්න) ආලෝකය පහළවිය. මහණෙනි, මට ඒ මේ කයෙහි කය අනුව බැලීම වනාහි වැඩිය යුතුයයි (7 ඡේදයේ (ii) යොදන්න.) වඩන ලදැයි මහණෙනි, මට පෙර නොඇසූ ධර්ම විෂයෙහි (7 ඡේදයේ (ii) යොදන්න.) මේ වේදනාවන්හි වේදනාව අනුව බැලීමයයි පෙර නොඇසූවිරූ ධර්ම විෂයෙහි (7 ඡේදයේ (ii) සිතෙහි සිත අනුව බැලීමයයි

(මෙහි 7 (ii) ) ධර්මයෙහි ධර්මය අනුව බැලීමයයි (මෙහි 7 (ii) ) මේ චිත්තයෙහි සිත අනුව බැලීම යයි (මෙහි 7 (ii) ) මේ ධර්මයන්හි ධර්මයන් අනුව බැලීමයයි පෙර නොඇසූවිරූ ධර්ම විෂයෙහි (7 ඡේදයේ (ii) යොදන්න.) මහණෙනි, මට ඒ මේ කයෙහි වනාහි ධර්මය අනුව බැලීම වැඩිය යුතු යයි පෙර නොඇසූවිරූ ධර්ම විෂයෙහි (7 ඡේදයේ (ii) යොදන්න.) ආලෝකය පහළවිය.

**26.** මෙය කයෙහි කය අනුව බැලීමයයි පෙර නොඇසූ විරූ ධර්ම විෂයෙහි ඇස පහළවිය. (7 ඡේදයේ (ii) යොදන්න) ඒ මේ කයෙහි කය අනුව බැලීම වනාහි වැඩිය යුතුයයි පෙර නොඇසූවිරූ ධර්ම විෂයෙහි (7 ඡේදයේ (ii) යොදන්න) වඩන ලදැයි පෙර නොඇසූ විරූ ධර්ම විෂයෙහි ඇස පහළවිය. ඥානය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලෝකය පහළවිය.

**27.** (මෙහි 18 ඡේදයේ (ii) යොදන්න)

**28.** (මෙහි 19 ඡේදයේ (i) යොදන්න.)

**29.** දර්ශනාර්ථය අර්ථ නමි. ඥානාර්ථය අර්ථ නමි. ප්‍රජානාර්ථය අර්ථ නමි. ප්‍රතිවෙධාර්ථය අර්ථ නමි. ඔභාෂාර්ථය අර්ථ නමි. මේ පඤ්චවිධ අර්ථයෝ අර්ථ පටිසම්භිදාවගේ ආරම්මණයෝ වෙත්ද, ඔව්හු ඇයගේ විෂයෝද වෙත්. යමෙක් ඇයගේ විෂයෝ වෙත්ද, ඔව්හු ඇයගේ ආරම්මණයෝද වෙත්. එහෙයින් ධර්මයන්හි ඤාණය ධර්ම ප්‍රතිසම්භිදාවයයි කියනු ලැබේ.

**30.** ධර්මයන් දැක්වීමට ව්‍යඤ්ජන නිරුත්තාභිලාපයෝ පස් දෙනෙක් වෙත්. අර්ථයන් දැක්වීමට ව්‍යඤ්ජන නිරුත්තාභිලාපයෝ පස් දෙනෙක් වෙත්. මේ නිරුක්තීහු නිරුක්ති පටිසම්භිදාවගේ ආරම්මණයෝද විෂයෝද වෙත්. යමෙක් ඒ නිරුක්ති පටිසම්භිදාවගේ ආරම්මණයෝ වෙත්ද, ඔව්හු ඇයගේ විෂයෝද වෙත්, යමෙක් ඇයගේ විෂයෝ වෙත්ද, ඔව්හු ඇයගේ ආරම්මණයෝද වෙත්. එහෙයින් නිරුක්තීන්හි ඥානය නිරුක්ති පටිසම්භිදාවයයි කියනු ලැබේ.

31. පඤ්ච ධර්මයන්හි ඤාණයෝ පඤ්ච අර්ථයන්හි ඤාණයෝ දසනිරුක්තීන්හි ඤාණයෝ ද යන මේ විසිවැදෑරුම් ඤාණයෝ පටිභාන පටිසම්භිදාවගේ ආලම්බණයෝද විෂයෝද වෙත්. යමෙක් ඇයගේ ආලම්භණයෝ වෙත්ද, ඔව්හු ඇයගේ විෂයෝද වෙත්. යමෙක් ඇයගේ විෂයෝ වෙත්ද ඔව්හු ඇයගේ ආලම්බණයෝද වෙත්. එහෙයින් ප්‍රතිභානයන්හි ඤාණය පටිභාණ පටිසම්භිදාවයයි කියනු ලැබේ. (කයෙහි) කායානුපස්සනා සතිපට්ඨානයෙහි ධර්මයෝ පසළොස් දෙනෙක් වෙත්. අර්ථයෝ පසළොස් දෙනෙක් වෙත්. නිරුක්තීහු තිස් දෙනෙක් වෙත්. ඤාණයෝ සැටදෙනෙක් වෙත්. මේ වේදනාවන්හි වේදනානුපස්සනාව වැඩිය යුතුයයි (7 මෙහි (ii) යොදන්න) මේ චිත්තයෙහි චිත්තානුපස්සනාව වැඩිය යුතුයයි (මෙහි 7 (ii) යොදන්න) මේ ධර්මයන්හි ධර්මානුපස්සනාව වැඩිය යුතුයයි පෙර නොඇසූ ධර්මයන්හි නුවණැස පහළවිය. මෙහි (7 ඡෙදයේ (ii) යොදන්න) වඩනලදැයි පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළවිය. (මෙහි 7 ඡෙදයේ (ii) යොදන්න) ආලොකය පහළ විය. ධර්මයෙහි ධර්මානුපස්සනා සතිපට්ඨානයෙහි ධර්මයෝ පසළොස් දෙනෙක් වෙත්. අර්ථයෝ පසළොස් දෙනෙක් වෙත්. නිරුක්තීහු තිස්දෙනෙක් වෙත්. ඤාණයෝ සැට දෙනෙක් වෙත් සතර සතිපට්ඨානයන්හි ධර්මයෝ සැටදෙනෙක් වෙත්. අර්ථයෝ සැට දෙනෙක් වෙත්. නිරුක්තීහු එකසිය විසිදෙනෙක් වෙත්. ඤාණයෝ දෙසිය සතලිස් දෙනෙක් වෙත්.

32. මහණෙනි, මේ ඡන්ද සමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඍද්ධිපාදයයි පෙර නොඇසූවිරූ ධර්මයන්හි මාගේ නුවණැස පහළවිය. (මෙහි 7 ඡෙදයේ (ii) යොදන්න) ප්‍රඥාලොකය පහළවිය. මහණෙනි, ඒ මේ ඡන්දසමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඍද්ධිපාදය වනාහි වැඩිය යුතුයයි මාගේ නුවණැස පහළවිය. (මෙහි 7 ඡෙදයේ (ii) යොදන්න) මහණෙනි, වඩන ලදැයි පෙරනොඇසූ ධර්ම විෂයෙහි මාගේ නුවණැස පහළවිය. (මෙහි 7 ඡෙදයේ (ii) යොදන්න) ප්‍රඥාලොකය පහළවිය.

**33.** මේ විරිය සමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඎද්ධිපාදය වැඩිය යුතුයයි මාගේ නුවණැස පහළවිය. (මෙහි 7 ඡෙදයේ (ii) යොදන්න) මේ චිත්ත සමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ සමාධිය වැඩිය යුතුයයි මාගේ නුවණැස පහළ විය. (මෙහි 7 ඡෙදයේ (ii) යොදන්න) මේ විමංසා සමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඎද්ධිපාදයය, මහණෙනි, පෙර නොඇසූ විරූ ධර්ම විෂයෙහි මාගේ නුවණැස පහළවිය. (මෙහි 7 ඡෙදයේ (ii) යොදන්න.) ආලොකය පහළවිය. මහණෙනි, ඒ මේ විමංසා සමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඎද්ධිපාදයයි මාගේ (මෙහි 7 ඡෙදයේ (ii) යොදන්න.) මහණෙනි, වඩන ලදැයි පෙර නොඇසූ ධර්ම විෂයෙහි මාගේ නුවණැස පහළවිය. (මෙහි 7 ඡෙදයේ (ii) යොදන්න.) ප්‍රඥාලොකය පහළවිය.

**34.** මේ ඡන්ද සමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඎද්ධිපාදයයි පෙර නොඇසූ විරූ ධර්ම විෂයෙහි නුවණැස පහළවිය. (මෙහි 7 ඡෙදයේ (ii) යොදන්න) ප්‍රඥාලොකය පහළවිය. මහණෙනි, ඒ මේ ඡන්ද සමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඎද්ධිපාදය වැඩිය යුතුයයි මාගේ නුවණැස පහළවිය. (7 ඡෙදයේ (ii) යොදන්න) මහණෙනි, වඩනලදැයි පෙර නොඇසූ ධර්ම විෂයෙහි මාගේ නුවණැස පහළවිය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ප්‍රඥාලොකය පහළවිය.

**35.** (මෙහි 18 ඡෙදයේ (ii) හා 19 ඡෙදයේ ඔභාෂාර්ථය යන තැනට යොදන්න.)

**36.** දර්ශනාර්ථය අර්ථයයි ඥානාර්ථය අර්ථයයි ප්‍රජානනාර්ථය අර්ථයයි. ප්‍රතිවෙධාර්ථය අර්ථයයි. ඔභාෂාර්ථය අර්ථයයි. මේ පඤ්චාර්ථයෝ අත්ථපටිසම්භිදාවගේ ආලම්බණයෝද විෂයෝද වෙත්. යමෙක් ඇයගේ ආලම්බනයෝ වෙත්ද ඔවුහු ඇයගේ විෂයෝද වෙත්. යමෙක් ඇයගේ විෂයෝ වෙත්ද ඔවුහු ඇයගේ ආලම්බනයෝද වෙත්. එහෙයින් අර්ථයන්හි ඥානය අත්ථපටිසම්භිදායයි කියනු ලැබේ.

**37.** පඤ්ච ධර්මයන් දක්වන්නට බ්‍යඤ්ජන නිරුක්තාභිලාපයෝ පස්දෙනෙක් වෙත්. පඤ්ච අර්ථයන් දක්වන්නට බ්‍යඤ්ජන නිරුක්තාභිලාපයෝ පස්දෙනෙක් වෙත්.

මේ දසනිරුක්තීහු නිරුක්ති පටිසම්භිදාවගේ ආලම්බනයෝද විෂයෝද වෙත්. යමෙක් ඇයගේ ආලම්බනයෝ වෙත්ද, ඔවුහු ඇයගේ විෂයෝද වෙත්. යමෙක් ඇයගේ විෂයෝ වෙත්ද, ඔවුහු ඇයගේ ආලම්බනයෝද වෙත්. එහෙයින් නිරුක්තීන්හි ඤාණය නිරුක්ති පටිසම්භිදායයි කියනු ලැබේ.

38. පඤ්ච ධර්මයන්හි ඥානයෝද පඤ්ච අර්ථයන්හි ඤාණයෝද දස නිරුක්තීන්හි ඥානයෝද යන විංශති ඥානයේ පටිභාන පටිසම්භිදාවගේ ආලම්බනයෝද විෂයෝද වෙත්. යමෙක් ඇයගේ ආලම්බනයෝ වෙත්ද ඔවුහු ඇයගේ විෂයෝද වෙත්. යමෙක් ඇයගේ විෂයෝ වෙත්ද, ඔවුහු ඇයගේ ආලම්බනයෝද වෙත්. එහෙයින් පටිභානයන්හි ඥානය පටිභාන පටිසම්භිදායයි කියනු ලැබේ. ඡන්ද සමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඍද්ධිපාදයෙහි ධර්මයෝ පසළොස් දෙනෙක් වෙත්. අර්ථයෝ පසළොස් දෙනෙක් වෙත්. නිරුක්තීහු තිස් දෙනෙක් වෙත්. ඥානයෝ සැට දෙනෙක් වෙත්.

39. මේ විරිය සමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඍද්ධිපාදයයයි (7 ඡේදයේ (ii) යොදන්න) මේ චිත්තසමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඍද්ධි පාදයයි (7 ඡේදයේ (ii) යොදන්න) මේ විමංසා සමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඍද්ධිපාදයයි පෙර නොඇසූ විරූ ධර්ම විෂයෙහි නුවණැස පහළවිය. (7 ඡේදයේ (ii) යොදන්න) ප්‍රඥාලොකය පහළවිය. ඒ මේ විමංසා සමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඍද්ධිපාදය වැඩිය යුතුයයි පෙර නොඇසූ විරූ ධර්මයෙහි නුවණැස පහළවිය. (7 ඡේදයේ (ii) යොදන්න) වඩනලදැයි පෙර නොඇසූ විරූ ධර්ම විෂයෙහි නුවණැස පහළවිය. (7 ඡේදයේ (ii) යොදන්න) ප්‍රඥාලොකය පහළවිය. විමංසා සමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඍද්ධිපාදයෙහි ධර්මයෝ පසළොස් දෙනෙක් වෙත්. අර්ථයෝ පසළොස් දෙනෙක් වෙත්. නිරුක්තීහු තිස් දෙනෙක් වෙත් ඥානයෝ සැට දෙනෙක් වෙත්. ඍද්ධිපාද සතරෙහි ධර්මයෝ සැටදෙනෙක් වෙත්. අර්ථයෝ සැට දෙනෙක් වෙත්. නිරුක්තීහු එක්සිය විසිදෙනෙක් වෙත්. ඥානයෝ දෙසිය සතලිස් දෙනෙක් වෙත්.

**40.** මහණෙනි, සමුදය සමුදයයි පෙර නොඇසූ ධර්ම විෂයෙහි වනාහි විපස්සී බොධිසත්වයන්ගේ නුවණැස පහළ විය. (7 ඡෙදයේ (ii) යොදන්න) ආලොකය පහළවිය. මහණෙනි, නිරොධය නිරොධයයි පෙර නොඇසූ ධර්ම විෂයෙහි වනාහි විපස්සී බොධිසත්වයන්ගේ නුවණැස පහළවිය. (7 ඡෙදයේ (ii) යොදන්න) ආලොකය පහළවිය. විපස්සී බොධිසත්වයන්ගේ වෙය්‍යාකරණයෙහි ධර්මයෝ දස දෙනෙක් වෙත්. අර්ථයෝ දස දෙනෙක් වෙත් නිරුක්තිහු විසිදෙනෙක් වෙත්. ඥානයෝ සතලිස් දෙනෙක් වෙත්.

**41.** මහණෙනි, සමුදය සමුදයැයි සිඛීබොධිසත්වයන්ගේ නුවණැස පහළවිය. (7 ඡෙදයේ (ii) යොදන්න) වෙස්සභූ බොධිසත්වයන්ගේ නුවණැස පහළවිය. (7 ඡෙදයේ (ii) යොදන්න) කොනාගමන බොධිසත්වන්ගේ නුවණැස පහළවිය. (7 ඡෙදයේ (ii) යොදන්න) කාශ්‍යප බොධිසත්වයන්ගේ පෙර නොඇසූ විරූ ධර්ම විෂයෙහි නුවණැස පහළවිය. (7 ඡෙදයේ (ii) යොදන්න) ආලොකය පහළවිය. මහණෙනි, නිරොධය නිරොධයැයි. පෙර නොඇසූ ධර්ම විෂයෙහි වනාහී කාශ්‍යප බොධිසත්වයන්ගේ නුවණැස පහළ විය. (7 ඡෙදයේ (ii) යොදන්න) ආලොකය පහළවිය. කාශ්‍යප බොධිසත්වයන් වහන්සේගේ ව්‍යාකරණයෙහි ධර්මයෝ දසදෙනෙක් වෙත්. අර්ථයෝ දසදෙනෙක්වෙත්. නිරුක්තිහු විසිදෙනෙක් වෙත්. ඥානයෝ සතලිස් දෙනෙක් වෙත්.

**42.** මහණෙනි, සමුදය සමුදයැයි පෙර නොඇසූවිරූ ධර්ම විෂයෙහි වනාහි ගෞතම බොධිසත්වයන්ගේ නුවණැස පහළවිය. (7 ඡෙදයේ (ii) යොදන්න) ආලොකය පහළවිය. මහණෙනි නිරොධයයි පෙර නොඇසූ ධර්ම විෂයෙහි වනාහි නුවණැස පහළවිය. (7 (ii) ආලොකය පහළවිය. ගෞතම බොධිසත්වයන්ගේ වෙය්‍යාකරණයෙහි ධර්මයෝ දසදෙනෙක් වෙත්. අර්ථයෝ දසදෙනෙක් වෙත්. නිරුක්තිහු විසිදෙනෙක් වෙත්. ඥානයෝ සතලිස්දෙනෙක් වෙත්.

**43.** සප්ත බොධිසත්වයන්ගේ සප්ත ව්‍යාකරණයන්හි ධර්මයෝ සැත්තෑ දෙනෙක් වෙත්. අර්ථයෝ සැත්තෑ දෙනෙක්

වෙත්. නිරුක්තීහු එකසිය සතලිස් දෙනෙක් වෙත්. ඥානයෝ දෙසිය අසූ දෙනෙක් වෙත්.

**44.** යම්හෙයකින් අභිඥාවගේ අභිඥාර්ථය (ii) දන්නාලදද දක්නා ලදද වෙසෙසින් දන්නා ලදද ප්‍රත්‍යක්ෂ කරණ ලදද ප්‍රඥාවෙන් ස්පර්ශ කරණ ලදද, ප්‍රඥාවෙන් ස්පර්ශ නොකරණ ලද අභිඥාර්ථයක් නැත්ද (එහෙයින්) නුවණැස පහළවිය. ඥාණය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ප්‍රඥා ලොකය පහළවිය. (iii) අභිඥාවගේ අභිඥාර්ථයෙහි ධර්මයෝ විසිපස්දෙනෙක් වෙත්. අර්ථයෝ විසිඑක්දෙනෙක් වෙත්. නිරුක්තීහු පනස්දෙනෙක් වෙත්. ඥානයෝ සියදෙනෙක් වෙත්.

**45.** යම් හෙයකින් පරිඥාවගේ පරිඥාර්ථය (මෙහි 44 (ii) ඡෙදය යොදන්න.) ප්‍රහාණයාගේ ප්‍රහාණාර්ථය (මෙහි 44 (ii) යොදන්න.) යම් හෙයකින් භාවනාවගේ භාවනාර්ථය (මෙහි (44 (ii) යොදන්න) යම්හෙයකින් ප්‍රත්‍යක්ෂකරණයාගේ ප්‍රත්‍යක්ෂකරණාර්ථය (මෙහි 44 (ii) යොදන්න) ආලොකය පහළවිය. ප්‍රත්‍යක්ෂ කරණයාගේ ප්‍රත්‍යක්ෂ කරණාර්ථයෙහි ධර්මයෝ විසිපස්දෙනෙක් වෙත්. අර්ථයෝ විසිපස් දෙනෙක් වෙත්. නිරුක්තීහු පනස්දෙනෙක් වෙත්. ඥානයෝ සියදෙනෙක් වෙත්. අභිඥාවගේ අභිඥාර්ථයෙහි පරිඥාවගේ පරිඥාර්ථයෙහි ප්‍රහානයාගේ ප්‍රහානාර්ථයෙහි ප්‍රත්‍යක්ෂ කරණයාගේ ප්‍රත්‍යක්ෂකරණාර්ථයෙහි ධර්මයෝ එක්සිය විසිපස් දෙනෙක් වෙත්. අර්ථයෝ එක්සිය විසිපස් දෙනෙක් වෙත්. නිරුක්තීහු දෙසිය පනස්දෙනෙක් වෙත්. ඥානයෝ පන්සියදෙනෙක් වෙත්.

**46.** යම්හෙයකින් ස්කන්ධයන්ගේ ස්කන්ධාර්ථය දන්නා ලදද, දක්නා ලදද, වෙසෙසින් දන්නා ලදද, (44 ඡෙදයේ (ii) යොදන්න) ආලොකය පහළවිය. ස්කන්ධයන්ගේ ස්කන්ධාර්ථයෙහි ධර්මයෝ විසිපස්දෙනෙක් වෙත්. අර්ථයෝ විසිඑක් දෙකේ වෙත්. නිරුක්තීහු පනස් දෙනෙක්වෙත්. ඥානයෝ සියදෙනෙක් වෙත්. යම්හෙයකින් ධාතූන්ගේ ධාත්වර්ථය (44 ඡෙදයේ (ii) යොදන්න.) යම්හෙයකින් ආයතනයන්ගේ ආයතනාර්ථය (44 ඡෙදයේ (ii) යොදන්න.) යම්හෙයකින් සංස්කාරයන්ගේ සංස්කෘතාර්ථය (44 ඡෙදයේ

(ii) යොදන්න) යම්හෙයකින් අසංඛතයාගේ අසංස්කෘතාර්ථය දන්නා ලදද, දන්නා ලදද, වෙසෙසින් දන්නා ලදද (44 ඡේදයේ (ii) යොදන්න.) ආලෝකය පහළවිය.

47. අසංඛතයාගේ අසංස්කෘතාර්ථයෙහි ධර්මයෝ විසිපස්දෙනෙක් වෙත්. අර්ථයෝ විසිපස්දෙනෙක් වෙත්. නිරුක්තීහු පනස්දෙනෙක් වෙත්. ඥානයෝ සියදෙනෙක් වෙත්. ස්කන්ධයන්ගේ ස්කන්ධාර්ථයෙහි ධාතූන්ගේ ධාත්වර්ථයෙහි ආයතනයන්ගේ ආයතනාර්ථයෙහි සංඛතයන්ගේ සංස්කෘතාර්ථයෙහි අසංඛකයාගේ අසංස්කෘතාර්ථයෙහි ධර්මයෝ එක්සිය විසිපස්දෙනෙක් වෙත්. අර්ථයෝ එක්සිය විසිපස්දෙනෙක් වෙත්. නිරුක්තීහු දෙසිය පනස්දෙනෙක් වෙත්. ඥානයෝ පන්සියදෙනෙක් වෙත්.

48. යම්හෙයකින් දුඃඛයාගේ දුඃඛාර්ථය දන්නා ලදද, දක්නා ලදද, වෙසෙසින් දන්නා ලදද (44 ඡේදයේ (ii) යොදන්න) ආලෝකය පහළවිය, දුඃඛයාගේ දුඃඛාර්ථයෙහි ධර්මයෝ විසිපස්දෙනෙක් වෙත්. අර්ථයෝ විසිඑක්දෙනෙක් වෙත්. නිරුක්තීහු පනස් දෙනෙක් වෙත්, ඥානයෝ සියදෙනෙක් වෙත්. යම්හෙයකින් සමුදයාගේ සමුදයාර්ථය අර්ථයෝ විසිඑක් දෙනෙක් වෙත්. නිරුක්තීහු පනස් දෙනෙක් වෙත්. යම්හෙයකින් නිරෝධයාගේ නිරෝධාර්ථය අර්ථයෝ විසිඑක් දෙනෙක් වෙත්. නිරුක්තීහු පනස් දෙනෙක් වෙත්. යම්හෙයකින් මාර්ගයාගේ මාර්ගාර්ථය දන්නාලදද, දක්නා ලදද වෙසෙසින් දක්නා ලදද (44 ඡේදයේ (ii) යොදන්න.) ආලෝකය පහළවිය. මාර්ගයාගේ මාර්ගාර්ථයෙහි ධර්මයෝ විසිපස් දෙනෙක් වෙත්. අර්ථයෝ විසිපස් දෙනෙක් වෙත්. නිරුක්තීහු පනස් දෙනෙක් වෙත්. ඥානයෝ සිය දෙනෙක් වෙත්. චතුරාර්ය සත්‍යයන්හි ධර්මයෝ සියදෙනෙක් වෙත්. අර්ථයෝ සියදෙනෙක් වෙත්. නිරුක්තීහු දෙසිය දෙනෙක් වෙත්. ඥානයෝ හාරසිය දෙකේ වෙත්.

49. යම්හෙයකින් අර්ථ ප්‍රතිසම්භිදාර්ථය (44 ඡේදයේ (ii) යොදන්න.) ආලෝකය පහළවිය. අර්ථ පටිසම්භිදාවගේ අර්ථ ප්‍රතිසම්භිදාර්ථයෙහි ධර්මයෝ විසිපස් දෙනෙක් වෙත්. අර්ථයෝ විසිඑක් දෙනෙක් වෙත්. නිරුක්තීහු පනස් දෙනෙක් වෙත්. ඥානයෝ සිය දෙනෙක් වෙත්.

**50.** යම් හෙයකින් ධම්ම පටිසම්භිදාවගේ ධර්ම ප්‍රතිසම්භිදාර්ථය (44 ඡේදයේ (ii) යොදන්න) යම්හෙයකින් නිරුක්ති පටිසම්භිදාවගේ නිරුක්ති ප්‍රතිසම්භිදාර්ථය (44 ඡේදයේ (ii) යොදන්න.) යම්හෙයකින් පටිභාණ පටිසම්භිදාවගේ ප්‍රතිභාන ප්‍රතිසම්භිදාර්ථය (44 ඡේදයේ (ii) යොදන්න.) පටිභාණ පටිසම්භිදාවගේ ප්‍රතිභාණ ප්‍රතිසම්භිදාර්ථයෙහි ධර්මයෝ විසිපස් දෙනෙක් වෙත්. අර්ථයෝ විසිඑක් දෙනෙක් වෙත්. නිරුක්තීහු පනස් දෙනෙක් වෙත්. ඥානයෝ සිය දෙනෙක් වෙත්. සිවුපිළිසිඹියාවන්හි නිරුක්තීහු දෙසිය දෙනෙක් වෙත් ඥානයෝ හාරසිය දෙනෙක් වෙත්.

**51.** යම්සේ ඉන්ද්‍රිය පරොපරියාර්ථයෙහි ඥානය දන්නා ලදද දක්නා ලදද වෙසෙසින් දක්නා ලදද (44 ඡේදයේ (ii) යොදන්න.) ආලොකය පහළවිය. ඉන්ද්‍රිය පරොපර්යර්ථඥානයෙහි ධර්මයෝ විසිපස් දෙනෙක් වෙත්. අර්ථයෝ විසිඑක් දෙනෙක් වෙත්. නිරුක්තීහු පනස් දෙනෙක් වෙත්. ඥානයෝ සිය දෙනෙක් වෙත්. යම්හෙයකින් සත්වයන්ගේ ආශයානුශ ඥානය (44 ඡේදයේ (ii) යොදන්න) යම් හෙයකින් යමක ප්‍රාතිහාර්ය ඥානය (44 ඡේදයේ (ii) යොදන්න.) යම්හෙයකින් මහාකරුණා සමාපත්ති ඥානය (44 ඡේදයේ (ii) යොදන්න.) යම්හෙයකින් අනාවරණ ඥානය දන්නා ලදද, දක්නා ලදද, වෙසෙසින් දන්නා ලදද, (44 ඡේදයේ (ii) යොදන්න.) ආලොකය පහළවිය. අනාවරණ ඥානයෙහි ධර්මයෝ විසිපස් දෙනෙක් වෙත්. අර්ථයෝ විසිඑක්දෙනෙක් වෙත්. නිරුක්තීහු පනස්දෙකේ වෙත්. ඥානයෝ සියදෙනෙක් වෙත්. සිවු බුදු දහම්හි ධර්මයෝ එක්සිය පනස් දෙනෙක් වෙත්. නිරුක්තීහු තුන්සියදෙනෙක් වෙත්. ඥානයෝ හයසියදෙනෙක් වෙත්. පටිසම්භිදාධිකාරයෙහි ධර්මයෝ අටසිය පනස්දෙනෙක් වෙත්. අර්ථයෝ අටසිය පනස් දෙනෙක් වෙත්. නිරුක්තීහු එක්දහස් සත්සිය දෙනෙක් වෙති. ඥානයෝ තුන්දහස් හාරසිය දෙනෙක් වෙති.

**පටිසම්භිදා කථා නිමි.**

---

## 17 ධම්මචක්ක කථා

1. මා විසින් මෙසේ අසනලදී. නොහොත් මාගේ ඇසීම මෙසේය. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස් නුවර වැඩවසනසේක. (මෙහි ප්‍රතිසම්භිදා කථාහි 1-14 ඡෙද යොදන්න) මේ කරුණ නිමිතිකොටගෙන ආයුෂ්මත් කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේට අඤ්ඤාකොණ්ඩඤ්ඤයයි කියාම නාමයෙක් විය.

මේ දුඃඛ්‍යායාර්සත්‍යයයි පෙර නොඇසූවිරූ ධර්මවිෂයයෙහි නුවණැස පහළවිය. ඥාණය පහළවිය, ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ප්‍රඥාලෝකය පහළවිය. (මෙහි පටිසම්භිදා කථා 18 ඡෙදයේ (ii) යොදන්න.)

චක්ෂුස ධර්මයයි, දර්ශනාර්ථය අර්ථයයි, ඥාණය ධර්මයයි, ඥානාර්ථය අර්ථයයි, ප්‍රඥාව ධර්මයයි, ප්‍රජානනාර්ථය අර්ථයයි, විද්‍යාව ධර්මයයි, ප්‍රතිවේධාර්ථය අර්ථයයි, ආලෝකය ධර්මයයි, ඔභාෂාර්ථය අර්ථයයි, මේ පඤ්ච ධර්මයෝ (ද) පඤ්ච අර්ථයෝ (ද) (iv) දුඃඛවස්තුකයෝය, සත්‍ය වස්තුකයෝය, සත්‍යාලම්බකයෝය, සත්‍ය විෂයකයෝය, සත්‍යසංගෘහිතයෝය, සත්‍ය පර්යාපන්නයෝය. සත්‍යසමුත්පන්නයෝය, සත්‍යයෙහි සිටියෝය, සත්‍යයෙහි පිහිටියෝය.

2. (i) 'ධම්මචක්ක' යනු කවර අර්ථයකින් ධම්මචක්ක නම් වීද? ධර්මය ද පවත්වයි, චක්‍රයද පවත්වානුයි. ධම්මචක්කනම්, චක්‍රයද පවත්වානුයි ධර්මයද පවත්වානුයි ධම්මචක්කනම්, ධර්මයෙන් පවත්වානුයි ධම්මචක්ක නම්, ධම්මචර්යාවෙහි පවත්වානුයි ධම්මචක්ක නම්. ධර්මයෙහි සිටියේ පවත්වානුයි, ධර්මචක්ක නම්, ධර්මයෙහි පිහිටියේ පවත්වානුයි ධම්මචක්ක නම්, ධර්මයෙහි පිහිටුවමින් පවත්වානුයි ධම්මචක්ක නම්, ධර්මයෙහි වශීප්‍රාප්තවූයේ පවත්වානුයි ධම්මචක්ක නම්, ධර්මයෙහි ඉසුරු බවට පමුණුවමින් පවත්වානුයි ධම්මචක්ක නම්, ධර්මයෙහිකොටප්‍රාප්තව පවත්වානුයි ධම්මචක්ක නම්, ධර්මයෙහි කෙළවරට පමුණුවමින් පවත්වානුයි ධම්මචක්ක නම්, ධර්මයෙහි විශාරද බවට පැමිණ පවත්වානුයි ධම්මචක්ක නම්, ධර්මයෙහි විශාරද බවට පමුණුවමින්

පවත්වානුයි ධම්මචක්ක නම්, ධර්මයට සත්කාර කරමින් පවත්වානුයි ධම්මචක්ක නම්, ධර්මයට ගරු කරමින් පවත්වානුයි ධම්මචක්කනම්, ධර්මයට බුහුමන් කරමින් පවත්වානුයි ධම්මචක්කනම්, ධර්මයට පූජාකෙරෙමින් පවත්වානුයි ධම්මචක්ක නම්, ධර්මයට යටත් පැවතුම් දක්වමින් පවත්වානුයි ධම්මචක්කනම්, ධර්ම ද්වජය පවත්වානුයි, ධම්මචක්ක නම්, ධර්මකේතුව පවත්වානුයි ධම්මචක්ක නම්, ධර්මාධිපතිව පවත්වානුයි, ඒ ධර්මචක්‍රය ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයකු විසින් හෝ ලෙව්හි කිසිවකු විසින් නොපැවැත්විය හැකිනුයි ධම්මචක්ක නම්.

3. ශ්‍රද්ධෙන්ද්‍රිය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, ඒ වීර්යෙන්ද්‍රිය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, සතින්ද්‍රිය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, සමාධින්ද්‍රිය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, ප්‍රඥෙන්ද්‍රිය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි ශ්‍රද්ධාබලය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, වීර්යබලය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, සති බලය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි ධම්මචක්කනම්.

4. සමාධිබලය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි ධම්මචක්ක නම්, ප්‍රඥාබලය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, සතිසම්බොජ්ක්ධංගය ධර්මයයි ඒ ධර්මය පවත්වානුයි, ධම්මවිචය සම්බොජ්ක්ධංගය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, විරිය සම්බොජ්ක්ධංගය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, පීති සම්බොජ්ක්ධංගය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, පස්සද්ධි සම්බොජ්ක්ධංගය ධර්මයයි. ඒ ධර්මය පවත්වානුයි, සමාධි සම්බොජ්ක්ධංගය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, උපෙක්ඛා සම්බොජ්ක්ධංගය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, සම්මාදිට්ඨිය ධ්මයයි, ඒ ධර්මය පවත්වානුයි සම්මාසංකප්පය ධර්මයයි. ඒ ධර්මය පවත්වානුයි, සම්මාආජීවය ධර්මයයි. ඒ ධර්මය පවත්වානුයි සම්මාවායාමය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි සම්මාසතිය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි සම්මා සමාධිය ධර්මයයි ධර්මය පවත්වානුයි ධම්මචක්ක නම්.

**5.** අධිපති අර්ථයෙන් ඉන්ද්‍රිය ධර්මයයි. ඒ ධර්මය පවත්වානුයි ධම්මචක්ක නම්. අකම්පාර්ථයෙන් බල ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, නෛර්යාණිකාර්ථයෙන් බොජ්ක්ධංග ධර්මයයි ඒ ධර්මය පවත්වානුයි, හෙත්වර්ථයෙන් මාර්ගය ධර්මයයි ඒ ධර්මය පවත්වානුයි, උපස්ථානාර්ථයෙන් සතිපට්ඨාන ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, පදහනාර්ථයෙන් සම්මප්පධාන ධර්මයයි ඒ ධර්මය පවත්වානුයි ධම්මචක්ක නම්. ඉජ්ක්ධන අර්ථයෙන් ඉද්ධිපාද ධර්මයයි. ඒ ධර්මය පවත්වානුයි තථ අර්ථයෙන් සත්‍ය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, අවික්ෂෙපාර්ථයෙන් සමථය ධර්මයයි. ඒ ධර්මය පවත්වානුයි, අනුපසහන අර්ථයෙන් විදර්ශනා ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, එක කෘත්‍යාර්ථයෙන් සමථවිදර්ශනා ධර්මයයි ඒ ධර්මය පවත්වානුයි, නොඉක්ම පැවතීම අර්ථයෙන් යුගනන්ධය ධර්මයයි ඒ ධර්මය පවත්වානුයි, සංවරාර්ථයෙන් සීලවිසුද්ධිය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, අවික්ෂෙපාර්ථයෙන් චිත්ත විසුද්ධිය ධර්මයයි. ඒ ධර්මය පවත්වානුයි, දර්ශනාර්ථයෙන් දිට්ඨි විසුද්ධිය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, මුක්තාර්ථයෙන් විමොක්ෂය ධර්මයයි. ඒ ධර්මය පවත්වානුයි ප්‍රතිවෙධාර්ථයෙන් විද්‍යාව ධර්මයයි. ඒ ධර්මය පවත්වානුයි, පරිත්‍යාගාර්ථයෙන් විමුක්තිය ධර්මයයි. ඒ ධර්මය පවත්වානුයි, සමුච්ඡෙදාර්ථයෙන් ක්ෂයෙහි ඥානය ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි, පටිප්පස්සද්ධි අර්ථයෙන් අනුප්පාදයෙහි ඥානය ධර්මයයි. ඒ ධර්මය පවත්වානුයි ඡන්දය මූලාර්ථයෙන් ධර්මයයි.

**6.** ඒ ධර්මය පවත්වානුයි, මනසිකාරය සමුට්ඨානාර්ථයෙන් ධර්මයයි. ඒ ධර්මය පවත්වානුයි ස්පර්ශය සමොධානාර්ථයෙන් ධර්මයයි. ඒ ධර්මය පවත්වානුයි. වේදනාව සමොසරණාර්ථයෙන් ධර්මයයි ඒ ධර්මය පවත්වානුයි, සමාධිය ප්‍රමුඛාර්ථයෙන් ධර්මයයි. ඒ ධර්මය පවත්වනුයි. සතිය අධිපති අර්ථයෙන් ධර්මයයි. ඒ ධර්මය පවත්වානුයි ප්‍රඥාව විසින් එතරවීමේ අර්ථයෙන් ධර්මයයි ඒ ධර්මය පවත්වානුයි විමුක්තිය සාරාර්ථයෙන් ධර්මයයි. ඒ ධර්මය පවත්වානුයි (ii) අමෘතයට

අන්තර්ගතවූ නිර්වානය පර්යායාවසානාර්ථයෙන් ධර්මයයි, ඒ ධර්මය පවත්වානුයි ධම්මචක්කනමි.

7. ඒ මේ දුඃඛාාර්යසත්‍යය වනාහි පිරිසිඳ දතයුතුයයි (මෙහිප්‍රතිසම්භිදා කථාවල 7 ඡේදයේ (ii) යොදන්න) පිරිසිඳ දන්නාලදැයි පෙර නොඇසූවිරූ ධර්මය විෂයෙහි නුවණැස පහළ විය. (මෙහි ප්‍රතිසම්භිදා කථාවල 7 ඡේදයේ (ii) යොදන්න) ප්‍රඥාලෝකය පහළවිය. ඇස පහළවිය යනු කුමන අර්ථයකින්ද?

'ධර්මචක්‍රය' යනු කුමන අර්ථයෙන් ධම්මචක්ක නම් වේද? ධර්මයද පවත්වයි. චක්‍රයද පවත්වානුයි ධම්මචක්ක නමි. (මෙහි 2 ඡේදයේ (i) යොදන්න) අමෘතයෙහි අන්තර්ගතවූ නිර්වාණය පර්යායාවසානාර්ථයෙන් ධර්මයයි. ඒ ධර්මය පවත්වානුයි ධම්මචක්ක නමි.

8. මේ දුඃඛසමුදයාාර්යසත්‍යයයි. පෙර නොඇසූ ධර්ම විෂයෙහි නුවණැස පහළවිය. (මෙහි ප්‍රතිසම්භිදා කථාවල 7 ඡේදයේ (ii) යොදන්න) ආලෝකය පහළවිය. ඒ මේ දුඃඛසමුදයාාර්යසත්‍යය වනාහි ප්‍රහීණ කළ යුතුයයි (මෙහි ප්‍රතිසම්භිදා කථාවල 7 ඡේදයේ (ii) යොදන්න) ප්‍රහීණයයි පෙර නොඇසූ ධර්මවිෂයෙහි නුවණැස පහළවිය. (මෙහි ප්‍රතිසම්භිදා කථාවල 7 ඡේදයේ (ii) යොදන්න) ඇස පහළවිය යනු කුමන අර්ථයකින්ද? (ප්‍රතිසම්භිදා කථාවල 18 ඡේදයේ (ii) යොදන්න) මේ පඤ්ච ධර්මයෝ පඤ්ච අර්ථයෝ සමුදය වස්තුකයෝය. සත්‍ය වස්තුකයෝය, සත්‍යාලම්බකයෝය, නිරොධ වස්තුකයෝය, සත්‍යවස්තුකයෝය, සත්‍යාලම්බකයෝය, මාර්ග වස්තුකයෝය, සත්‍යවස්තුකයෝය, සත්‍යාලම්බකයෝය, සත්‍යවිෂයකයෝය, සත්‍යසංගෘහිතයෝය, සත්‍ය පර්යාපන්නයෝය, සත්‍යප්‍රතිෂ්ඨිතයෝය.

ධම්මචක්ක යනු කුමන අර්ථයකින් ධම්මචක්ක නම් වේද? ධර්මයද පවත්වයි. චක්‍රයද පවත්වානුයි ධම්මචක්කනමි. (මෙහි 2 (ii) යොදන්න) අමෘතයෙහි අන්තර්ගතවූ නිර්වාණය පර්යායාවසානාර්ථයෙන් ධම්ම නමි. ඒ ධර්මය පවත්වානුයි ධම්මචක්කනමි.

**9.** මහණෙනි, මේ (කයෙහි) කායානුපස්සනාවයයි පෙර නොඇසූ ධර්ම විෂයෙහි මාගේ නුවණැස පහළවිය. මෙහි (ප්‍රතිසම්භිදා කථාවල 7 ඡේදයේ (ii) යොදන්න) ප්‍රඥාලෝකය පහළවිය. මහණෙනි. ඒ මේ (කයෙහි) කායානුපස්සනාව වනාහි වැඩිය යුතුයි. (මෙහි පටිසම්භිදා කථාවල 7 ඡේදයේ (ii) යොදන්න) වඩනලදැයි මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්ම විෂයෙහි මාගේ නුවණැස පහළවිය. (පටිසම්භිදාකථාවල 7 ඡේදයේ (ii) යොදන්න) ආලෝකය පහළවිය. මේ වේදනාවන්හි වේදනාවයයි නොඇසූවිරූ ධර්මයන්හි (පටිසම්භිදා කථාවල 7 ඡේදයේ (ii) යොදන්න) මේ චිත්තයෙහි චිත්තයයි පෙර නොඇසූ විරූ ධර්මයන්හි (පටිසම්භිදා කථාවල 7 ඡේදයේ (ii) යොදන්න) මහණෙනි, ධර්මයන්හි ධම්මානුපස්සාවෙහි පෙර නොඇසූ ධර්ම විෂයෙහි නුවණැස පහළවිය. (පටිසම්භිදා කථාවල 7 ඡේදයේ (ii) යොදන්න) ප්‍රඥාලෝකය පහළවිය. මහණෙනි, ඒ මේ ධර්මයන්හි ධම්මානුපස්සනාව වනාහි වැඩිය යුතුයයි (පටිසම්භිදා කථාවල 7 ඡේදයේ (ii) යොදන්න) වඩනලදැයි මහණෙනි, පෙර නොඇසූ ධර්ම විෂයෙහි මාගේ නුවණැස පහළවිය (මෙහි පටිසම්භිදා කථාවල 7 ඡේදයේ (ii) යොදන්න) ආලෝකය පහළවිය.

**10.** මේ කයෙහි කායානුපස්සනාවයයි (පටිසම්භිදා කථාවල 7 ඡේදයේ (ii) යොදන්න) ආලෝකය පහළවිය. 'ඇස පහළවිය' යනු කුමන අර්ථයකින්ද? (මෙහි 1 ඡේදයේ (ii) (iii) යොදන්න) මේ පඤ්ච ධර්මයෝ පඤ්ච අර්ථයෝ කායවස්තුකයෝය. සතිපට්ඨාන වස්තුකයෝය. වේදනා වස්තුකයෝය. සතිපට්ඨාන වස්තුකයෝය. චිත්ත වස්තුකයෝය. සතිපට්ඨාන වස්තුකයෝය. ධර්ම වස්තුකයෝය. සතිපට්ඨාන ආලම්බනයෝය. සතිපට්ඨානයෙහි පිහිටියෝය.

'ධර්මචක්‍රය' යනු කුමන අර්ථයකින් 'ධම්මචක්ක' නම් වේද? ධර්මයද පවත්වයි. චක්‍රයද පවත්වානුයි ධම්මචක්ක නම්. (මෙහි 2 (i) යොදන්න) අමෘතයෙහි අන්තර්ගතවූ නිර්වාණය පර්යායාවසානාර්ථයෙන් ධර්මයයි ඒ ධර්මය පවත්වානුයි ධම්මචක්ක නම්.

11. මහණෙනි, මේ ඡන්දසමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඍද්ධිපාදයයි පෙර නොඇසූ ධර්ම විෂයෙහි මාගේ නුවණැස පහළවිය. (පටිසම්භිදා කථාවල 7 ඡේදයේ (ii) යොදන්න) ආලෝකය පහළවිය. මහණෙනි, ඒ මේ ඡන්දසමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඍද්ධිපාදය වනාහි වැඩිය යුතුයි. (පටිසම්භිදා කථා 7 ඡේදයේ (ii) යොදන්න) ආලෝකය පහළවිය. මේ විරියසමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඍද්ධි පාදයයි. (පටිසම්භිදා කථා 7 ඡේදයේ (ii) යොදන්න) මේ චිත්ත සමාධිය ප්‍රධාන සංස්කාර යුක්තවූ ඍද්ධිපාදයයි. මහණෙනි, මේ විමංසා සමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඍද්ධිපාදයයි (පටිසම්භිදා කථා 7 ඡේදයේ (ii) යොදන්න) ආලෝකය පහළවිය. මහණෙනි, ඒ මේ විමංසා සමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඍද්ධිපාදය වනාහි වැඩිය යුතුයයි (පටිසම්භිදා කථා 7 ඡේදයේ (ii) යොදන්න) ආලෝකය පහළවිය.

මේ ඡන්දසමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඍද්ධිපාදයයි (පටිසම්භිදා කථා 1 ඡේදයේ (ii) යොදන්න) ආලෝකය පහළවිය.

"චක්ඛුං උදපාදී' යනු කුමන අර්ථයකින්ද? (මෙහි 1 ඡේදයේ (ii) හා (iii) ද, 2 ඡේදයේ (i) යොදන්න)

12. මේ විරිය සමාධි ප්‍රධාන සංස්කාර යුක්තවූ ඍද්ධිපාද යයි (පටිසම්භිදා කථා 7 ඡේදයේ (ii) යොදන්න) ආලෝකය පහළවිය. ඇස පහළවිය. යනු කුමන අර්ථයකින්ද? (මෙහි 1 ඡේදයේ (i) සහ (ii) යොදන්න)

ධර්මයෝ පඤ්චඅර්ථයෝ වීර්ය වස්තුකයෝය. ඍද්ධිපාද වස්තුකයෝය. චිත්ත වස්තුකයෝය, ඍද්ධිපාද වස්තුකයෝය. විමංසා වස්තුකයෝය. ඍද්ධිපාද වස්තුකයෝය. ඍද්ධිපාද ලම්බණයෝය. ඍද්ධිපාද ප්‍රතිෂ්ඨිතයෝය. 'ධර්මචක්‍රය' යනු කුමන අර්ථයකින් 'ධම්මචක්ක' නම් වේද? (මෙහි 2 ඡේදයේ (i) යොදන්න)

**ධම්මචක්ක කථා නිමි.**

---

## 18 ලොකොත්තර කථා

1. ලොකොත්තර ධර්මයෝ කවරහුද?

සතර සතිපට්ඨාන සතර සම්‍යක් ප්‍රධාන සතර ඍද්ධිපාද, පඤ්චෙන්ද්‍රිය, පඤ්චබල සත්තබොජ්ඣංග, ආර්‍ය අෂ්ටාංගික මාර්ගය, චතුරාර්‍යසත්‍යය, සතර ශ්‍රාමාන්‍ය ඵල නිර්වාණයද යන මොව්හු ලොකොත්තර ධර්මයෝයි.

2. "ලොකොත්තර" යනු කුමන අර්ථයකින් ලොකොත්තරයෝ වෙත්ද?

ලොකය තරණය කෙරෙත්නුයි ලොකොත්තරයෝයි. ලොකයෙන් එතර කෙරෙත්නුයි ලොකොත්තරයෝයි. ලොකයා කෙරෙන් එතර කෙරෙත්නුයි ලොකොත්තරයෝයි. ලොකයාගෙන් එතර කෙරෙත්නුයි ලොකොත්තරයෝයි. ලෝකය අතික්‍රමණය කෙරෙත්නුයි ලොකොත්තරයෝයි. ලොකය සමතික්‍රමණය කෙරෙත්නුයි ලොකොත්තරයෝයි. ලෝකය සමතික්‍රාන්තනුයි ලොකොත්තරයෝයි. ලොකයෙහි අතිරෙකයෝ වෙත්නුයි ලොකොත්තරයෝයි. ලොකාන්තය තරණය කෙරෙත්නුයි ලොකොත්තරයෝයි. ලොකයෙන් නික්මයත්නුයි ලොකොත්තරයෝයි. ලොකය කෙරෙහි නික්මයත්නුයි ලොකොත්තරයෝයි. ලොකයාගෙන් නික්ම යත්නුයි ලොකොත්තරයෝයි. ලොකයෝ නිර්ගතනුයි ලොකොත්තරයෝයි. ලෝකය කරණකොටගෙන නිර්ගතනුයි ලොකොත්තරයෝයි. ලොකයාගෙන් නිර්ගතනුයි ලොකොත්තරයෝයි. ලෝකයෙහි නොසිටිත්නුයි ලොකොත්තරයෝයි. ලොකය කෙරෙහි නොසිටින්නුයි ලොකොත්තරයෝයි. ලොකයෙහි නොතැවරෙත්නුයි ලොකොත්තරයෝයි. ලොකයා කෙරෙහි නොතැවරෙත්නුයි ලොකොත්තරයෝයි. ලොකයෙහි නොඇලුනාහුනුයි ලොකොත්තරයෝයි. ලොකයෙන් අසංකිලිට්ඨනුයි ලොකොත්තරයෝයි. ලොකයෙහි අනුපලිප්තනුයි ලොකොත්තරයෝයි. ලොකයෙන් අනුපලිප්තනුයි ලොකොත්තරයෝයි. ලොකයෙහි විමුක්තනුයි ලොකොත්තරයෝයි ලොකයෙන් විමුත්තනුයි

ලොකොත්තරයෝයි. ලොකයෙන් විප්පමුත්තනුයි ලොකොත්තරයෝයි. ලොකයෙහි විසංයුක්තනුයි ලොකොත්තරයෝයි. ලොකයෙන් විසංයුක්තනුයි ලොකොත්තරයෝයි. ලොකය කෙරෙන් විසංයුක්තනුයි ලෝකොත්තරයෝයි.

3. ලෝකයෙන් පිරිසිදුවෙත්නුයි ලොකුත්තරයෝයි. ලොකය කෙරෙන් පිරිසිදුවත්නුයි ලොකුත්තරයෝයි. ලොකයෙන් විසුද්ධ වෙත්නුයි ලොකුත්තරයේයි. ලොකය කෙරෙන් විසුද්ධවෙත්නුයි ලොකුත්තරයෝයි ලොකයෙන් නැඟී සිටිත්නුයි ලොකුත්තරයෝයි. ලොකය කෙරෙන් නැඟී සිටිත්නුයි ලොකුත්තරයෝයි. ලොකයෙන් පෙරලෙත්නුයි ලොකුත්තරයෝයි. ලෝකය කෙරෙන් පෙරලෙත්නුයි ලොකුත්තරයෝයි. ලොකයෙහි නොඇලෙත්නුයි ලොකුත්තරයෝයි, ලොකයෙහි නොගනිත්නුයි ලොකුත්තරයෝයි. ලොකය සමුච්ඡෙදනය කෙරෙත්නුයි ලොකුත්තරයෝයි, ලොකය සමුච්ජින්න බැවින් ලොකුත්තරය. ලොකය සංසිඳවත්නුයි ලොකුත්තරයෝයි. ලොකය සංසිඳවූ බැවින් ලොකුත්තරයෝයි. ලොකය ඉක්මවූවාහුනුයි ලොකුත්තරයෝයි, ලෝකයාගේ (නොයාම) නොපැවැත්මනුයි ලොකුත්තරයෝය. ලෝකයාට අවිශයනුයි ලොකුත්තරයෝය. ලොකයාට අසමානනුයි ලොකුත්තරයෝයි. ලොකය උද්ගිරනය කෙරෙත්නුයි ලොකුත්තරයෝයි ලොකයට පෙරළා නොයෙත්නුයි ලොකුත්තරයෝයි. ලොකය දුරුකෙරෙත්නුයි ලොකුත්තරයෝයි. ලොකය දැඩිව අල්ලා නොගනිත් නුයි ලොකුත්තරයෝයි. ලොකය නොබඳිත්නුයි ලොකුත්තරයෝයි. ලොකය නොවිසුරුවත්නුයි ලොකුත්තරයෝයි. ලොකය නිවත්නුයි ලොකුත්තරයෝයි. ලොකය නොදල්වත්නුයි ලොකුත්තරයෝයි. ලොකය ඉක්මවා අභිභවනය කොට සිටිත්නුයි ලොකුත්තරයෝයි.

**ලෝකුත්තර කථා නිමි.**

---

## 19 බල කථා

### සාවත්ථි නිදානයයි

1. මහණෙනි, මේ බල පසෙක්වේ. කවර පසෙක්ද? සද්ධා බලය, විරිය බලය, සති බලය, සමාධි බලය, පඤ්ඤා බලය, මහණෙනි, මොව්හු වනාහි පඤ්ච බලයෝයි

තවද අට සැට බලයෙක් ඇත, සද්ධා බලය, විරිය බලය, සති බලය, සමාධි බලය, පඤ්ඤා බලය, හිරිබලය ඔත්තප්ප බලය, පටිසංඛා බලය, භාවනා බලය, අනවජ්ජ බලය, සංගහ බලය, ඛන්ති බලය, පඤ්ඤත්ති බලය, නිජ්ජන්ති බලය, ඉස්සරිය බලය, අධිට්ඨාන බලය, සමථ බලය, විපස්සනා බලය, දස සෙඛ බල, දස අසෙඛ බල, දස ඛීනාසව බල, දස ඉද්ධි බල, දස තථාගත බල, යන මොහුයි.

2. "සද්ධා බලය නම් කවරේද? අශ්‍රද්ධාවෙහි කම්පා නොවේනුයි සද්ධා බල නමි. (ii) සහජාත ධර්මයන්ට උපස්ථම්භකාර්ථයෙන් සද්ධා බල නමි. ක්ලේශයන්ගේ විනාශ කිරීම් අර්ථයෙන් සද්ධා බල නමි. ප්‍රතිවේධාදිය විශොධනාර්ථයෙන් සද්ධා බලය නමි. චිත්තයාගේ අධිෂ්ඨානාර්ථයෙන් සද්ධාබල නමි, චිත්තයාගේ චෝදනාර්ථයෙන් සද්ධාබල නමි, විශෙෂාධි ගමාර්ථයෙන් සද්ධා බල නමි ආර්යමාර්ග ප්‍රතිවේධාර්ථයෙන් සද්ධා බල නමි, සත්‍යාර්ථයෙන් සද්ධාබල නමි, නිරොධයෙහි පිහිටුවීම් අර්ථයෙන් සද්ධා බල නමි. (iii) මෙය සද්ධා බලයයි.

3. විරිය බලය කවරේද? කුසීත බැව්හි කම්පා නොවේනුයි විරිය බල නමි, සහජාත ධර්මයන්ට උපස්තම්භකාර්ථයෙන් විරිය බල නමි. ක්ලේශයන්ගේ විනාශ කිරීම් අර්ථයෙන් විරාග බල නමි, ප්‍රතිවේධාදිය විශොධනාර්ථයෙන් විරිය බල නමි. චිත්තයාගේ අධිෂ්ඨානාර්ථයෙන් විරිය බල නමි. චිත්තයාගේ ඡෙදනාර්ථයෙන් විරිය බල නමි. විශෙෂාධිගමාර්ථයෙන් විරිය බල නමි. ආර්යමාර්ග ප්‍රතිවේධාර්ථයෙන් විරිය බල නමි. සත්‍යාභිසමයාර්ථයෙන් විරිය බල නමි, නිරොධයෙහි පිටුවීම් අර්ථයෙන් විරිය බල නමි. මෙය විරිය බලයයි.

4. සති බලය කවරේද? ප්‍රමාදයෙන් කම්පා නොවේනුයි සති බල නම්. සහජාත ධර්මයන්ට උපස්ථම්භකාර්ථයෙන් සතිබල නම්. (මෙහි 2 (ii) ඡෙදයේ සද්ධා බල යනු සති බලයයි වෙනස් කොට යොදන්න) නිරොධයෙහි පිහිටුවීම් අර්ථයෙන් සතිබල නම්. මෙය සති බලයයි.

5. සමාධි බලය කවරේද? උද්ධච්චයෙහි කම්පා නොවේනුයි සමාධි බල නම්. සහජාත ධර්මයන්ට උපස්ථම්භකාර්ථයෙන් සමාධි බල නම්.

(මෙහි 2 ඡෙදයේ (ii) සද්ධාබලය යනු සමාධිබලය යයි වෙනස්කොට යොදන්න)

නිරෝධයෙහි පිහිටුවීම අර්ථයෙන් සමාධිබල නම්. මෙය සමාධිබලයයි.

6. පඤ්ඤාබලය කවරේද? අවිද්‍යාවෙන් කම්පා නොවේනුයි පඤ්ඤාබලනම්. සහජාත ධර්මයන්ට උපස්ථම්භකාර්ථයෙන් පඤ්ඤාබලනම්. (මෙහි 2 (ii) ඡෙදයේ සද්ධාබලය යනු පඤ්ඤා බලයයි වෙනස්කොට යොදන්න) නිරොධයෙහි පිහිටුවීම් අර්ථයෙන් පඤ්ඤාබල නම්. මෙය පඤ්ඤාබලයයි.

7. හිරිබලය කවරේද? නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දයෙහි ලජ්ජා උපදවානුයි හිරිබල නම්. අව්‍යාපාදයෙන් ව්‍යාපාදයෙහි ලජ්ජා උපදවානුයි හිරිබල නම්. ආලෝක සඤ්ඤාවෙන් ථීනමිද්ධයෙහි ලජ්ජා උපදවානුයි හිරිබල නම්. අවික්ෂෙපයෙන් උද්ධච්චයෙහි ලජ්ජා උපදවානුයි හිරිබල නම්. ධම්මවත්ථානයෙන් විචිකිච්ඡාවෙහි ලජ්ජා උපදවානුයි හිරිබල නම්. ඥානයෙන් අවිජ්ජාවෙහි ලජ්ජා උපදවානුයි හිරිබල නම්. පාමොජ්ජයෙන් අරතියෙහි ලජ්ජා උපදවානුයි හිරිබල නම්. පඨමජ්ක්ධානයෙන් නීවරණයන්හි ලජ්ජා උපදවානුයි හිරිබල නම්. අර්හත් මාර්ගයෙන් සකල ක්ලේශයන් කෙරෙහි ලජ්ජා උපදවානුයි හිරිබල නම්. මෙය හිරිබලයයි.

8. ඔත්තප්පබලය කවරේද? නෛෂ්ක්‍රම්‍ය වශයෙන් කාමච්ඡන්දයෙහි ඔතප් උපදවානුයි ඔත්තප්පබල නම්. අව්‍යාපාදයෙන් ව්‍යාපාදයෙහි ඔතප් උපදවානුයි ඔත්තප්පබල නම්. ආලෝක සංඥාවෙන් ථීනමිද්ධයෙහි ඔතප් උපදවානුයි

ඔත්තප්පබල නම්. අවික්ෂෙපයෙන් උද්ධච්චයෙහි ඔතප් උපදවානුයි ඔත්තප්පබල නම්. ධම්මවවත්ථායෙන් විචිකිච්ඡාවෙහි ඔතප් උපදවානුයි ඔත්තප්පබල නම්. ඥාණයෙන් අවිජ්ජාවෙහි ඔතප් උපදවානුයි ඔත්තප්පබල නම්. පාමොජ්ජයෙන් අරතියෙහි ඔතප් උපදවානුයි ඔත්තප්පබල නම්. පඨමජ්ක්ධානයෙන් නීවරණයන්හි ඔතප් උපදවානුයි ඔත්තප්පබල නම්. දුතියජ්ක්ධානයෙන්, තතියජ්ක්ධානයෙන්, චතුත්ථජ්ක්ධාණයෙන්, ඔත්තප්ප බල නම්. නීවරණයන්හි ඔත්තප්ප උපදවානුයි අර්හත් මාර්ගයෙන් සකල ක්ලේශයන් කෙරෙහි ඔතප් උපදවානුයි ඔත්තප්පයල නම්. මෙය ඔත්තප්ප බලයයි.

**9.** පටිසංඛාන බලය කවරේද? නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය නුවණින් සලකාබලානුයි පටිසංඛාන බලනම්. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය නුවණින් සලකා බලානුයි පටිසංඛාන බල නම්. ආලෝක සංඥාවෙන් ථිනමිද්ධය නුවණින් සලකාබලානුයි පටිසංඛාන බල නම්. අවික්ෂෙපයෙන් උද්ධච්චය නුවණින් සලකාබලානුයි, පටිසංඛානබල නම්. ධම්මවවත්ථානයෙන් විචිකිච්ඡාව නුවණින් සලකා බලානුයි පටිසංඛානබලනම්. ඥාණයෙන් අවිජ්ජාව නුවණින් සලකා බලානුයි පටිසංඛානබල නම්. පාමොජ්ජයෙන් අරතිය නුවණින් සලකාබලානුයි පටිසංඛාන බල නම්. පඨමජ්ක්ධානයෙන් නීවරණයන් නුවණින් සලකාබලානුයි පටිසංඛානබල නම්. දුතියජ්ක්ධානයෙන්, තතියජ්ක්ධානයෙන් චතුත්ථජ්ක්ධානයෙන්, නීවරණන් නුවණින් සලකාබලානුයි පටිසංඛානබල නම්. අර්හත් මාර්ගයෙන් සකල ක්ලේශයන් නුවණින් සලකාබලානුයි. පටිසංඛානබල නම්. මෙය පටිසංඛාන බලයයි.

**10.** භාවනා බලය කවරේද? කාමච්ඡන්දය දුරුකරමින් නෛෂ්ක්‍රම්‍යය වඩානුයි භාවනාබල නම්. ව්‍යාපාදය දුරුකරමින් අව්‍යාපාදය වඩානුයි භාවනාබල නම්. ථිනමිද්ධය දුරුකරමින් ආලෝක සඤ්ඤාව වඩානුයි භාවනාබලනම්. උද්ධච්චය දුරුකරමින් අවික්ෂෙපය වඩානුයි භාවනා බලනම්. විචිකිච්ඡාව දුරු කරමින් ධම්මවවත්ථානය වඩානුයි භාවනා බල නම්. අරතිය

දුරුකරමින් පාමොජ්ජය වඩානුයි භාවනාබල නම්. නීවරණයන් දුරුකරමින් පඨමජ්ක්ධානය වඩානුයි භාවනාබල නම්. නීවරණයන් දුරුකෙරෙමින් දුතියජ්ක්ධානය තතියජ්ක්ධානය, චතුත්ථජ්ක්ධානය වඩානුයි. භාවනාබල නම් සකලක්ලේශයන් දුරු කරමින් අර්හත් මාර්ගය වඩානුයි භාවනාබල නම්. මෙය භාවනා බලයයි.

11. අනවජ්ජබලය කවරේද? කාමච්ඡන්දය ප්‍රහීණබැවින් නෛෂ්ක්‍රම්‍යයෙහි කිසි වරදක් නැත්නුයි අනවජ්ජබල නම්. ව්‍යාපාදය ප්‍රහීණ බැවින් අව්‍යාපාදයෙහි කිසිවරදක් නැත්නුයි අනවජ්ජබල නම්. ථිනමිද්ධය ප්‍රහීණ බැවින් ආලෝක සඤ්ඤාවගේ කිසි වරදක් නැත්නුයි අනවජ්ජබල නම්. උද්ධච්චය ප්‍රහීන බැවින් අවික්ෂෙපයෙහි කිසි වරදක් නැත්නුයි අනවජ්ජබල නම්. විචිකිච්ඡාව ප්‍රහීන බැවින් ධම්මවවත්ථානයෙහි කිසි වරදක් නැත්නුයි අනවජ්ජ බල නම්. අවිජ්ජාව ප්‍රහීණ බැවින් ඥානයෙහි කිසි වරදක් නැත්නුයි අනවජ්ජ බල නම්. අරතිය ප්‍රහීණ බැවින් පාමොජ්ජයෙහි කිසි වරදක් නැත්නුයි අනවජ්ජබල නම්. නීවරණයන් ප්‍රහීන බැවින් ප්‍රථමධ්‍යානයෙහි කිසි වරදක් නැත්නුයි අනවජ්ජ බල නම්. නීවරණයන් ප්‍රහීන බැවින් දුතියජ්ක්ධානයෙහි, තතියජ්ක්ධානයෙහි, චතුත්ථජ්ක්ධානයෙහි කිසි වරදක් නැත්නුයි අනවජ්ජබල නම්. සකල ක්ලේශයන් ප්‍රහීන බැවින් අර්හත් මාර්ගයෙහි කිසි වරදක් නැත්නුයි අනවජ්ජබල නම්. මෙය අනවජ්ජ බලයයි.

12. සංගහ බලය කවරේද? කාමච්ඡන්දය දුරුකරමින් නෛෂ්ක්‍රම්‍ය වශයෙන් සිත බඳිනුයි සංගහබල නම්. ව්‍යාපාදය දුරුකරමින් අව්‍යාපාද වශයෙන් සිත බඳිනුයි සංගහබල නම් ථිනමිද්ධය දුරුකරමින් ආලෝක සඤ්ඤා වශයෙන් සිත බඳිනුයි සංගහබල නම්. නීවරණයන් දුරු කරමින් පඨමජ්ක්ධාන වශයෙන්, දුතියජ්ක්ධාන වශයෙන් තතියජ්ක්ධාන චතුත්ථජ්ක්ධාන වශයෙන් සිත බලානුයි සංගහබල නම්. සකල ක්ලේශයන් දුරුකරමින් අර්හත් මාර්ග වශයෙන් සිත බඳිනුයි සංගහ බල නම්. මෙය සංගහ බලයයි.

13. ඛන්ති බලය කවරේද? කාමච්ඡන්දය ප්‍රහීණ බැවින් නෛෂ්ක්‍රම්‍යය කැමතිවේනුයි ඛන්ති බල නම්. ව්‍යාපාදය ප්‍රහීන

බැවින් අව්‍යාපාදය කැමතිවේනුයි ඛන්තිබල නමි. ථීනමිද්ධය ප්‍රහීන බැවින් ආලෝක සඤ්ඤාව කැමතිවේනුයි ඛන්ති බල නමි. උද්ධච්චය ප්‍රහීණ බැවින් අවික්ෂෙපය කැමති වේනුයි ඛන්තිබල නමි. විචිකිච්ඡාව ප්‍රහීණ බැවින් ධම්මවවත්ථානය කැමතිවේනුයි ඛන්තිබල නමි. අවිද්‍යාව ප්‍රහීණ බැවින් ඥානය කැමතිවේනුයි ඛන්තිබල නමි. අරතිය ප්‍රහීණ බැවින් පාමොජ්ජය කැමතිවේනුයි ඛන්ති බල නමි. නීවරණයන් ප්‍රහීණ බැවින් ප්‍රථමධ්‍යානය කැමතිවේනුයි ඛන්ති බල නමි. නීවරණයන් දුරු කරමින් දුතියධ්‍යානය, තතියජ්ක්ධානය, චතුත්ථජ්ක්ධානය කැමතිවේනුයි සකල ක්ලේශයන් ප්‍රහීන බැවින් අර්හත් මාර්ගය කැමතිවේනුයි ඛන්තිබල නමි. මෙය ඛන්ති බලයයි.

14. පඤ්ඤත්තිබලය කවරේද? කාමච්ඡන්දය දුරු කරමින් නෛෂ්ක්‍රම්‍ය වශයෙන් සිත සතුටුකෙරේනුයි පඤ්ඤත්ති බලනමි. ව්‍යාපාදය දුරුකරමින් අව්‍යාපාද වශයෙන් සිත සතුටුකෙරේනුයි පඤ්ඤත්තිබල නමි. ථීනමිද්ධය දුරුකරමින් ආලෝකසඤ්ඤා වශයෙන් සිත සතුටු කෙරේනුයි පඤ්ඤත්තිබල නමි. (ii) උද්ධච්චය දුරුකරමින් අවික්ෂෙප වශයෙන් සතුටුකෙරේනුයි විචිකිච්ඡාව දුරුකරමින් නීවරණයන් දුරුකරමින් පඨමජ්ක්ධාන වශයෙන්, දුතියධ්‍යාන වශයෙන්, තෘතීයධ්‍යාන වශයෙන්, චතුර්ථධ්‍යාන වශයෙන් සිත සතුටු කෙරේනුයි පඤ්ඤත්තිබල නමි (iii) සකල ක්ලේශයන් දුරුකරමින් අර්හත් මාර්ග වශයෙන් සිත සතුටු කෙරේනුයි පඤ්ඤත්තිබල නමි. මෙය පඤ්ඤත්ති බලයයි.

15. නිජ්ක්ධන්තික බලය කවරේද? කාමච්ඡන්දය දුරුකරමින් නෛෂ්ක්‍රම්‍ය වශයෙන් සිත සතුටු කෙරේනුයි නිජ්ක්ධන්තික බල නමි. ව්‍යාපාදය දුරුකරමින් අව්‍යාපාද වශයෙන් සිත සතුටු කෙරේනුයි නිජ්ක්ධන්තික බල නමි. ථීනමිද්ධය දුරුකරමින් ආලොකසඤ්ඤා වශයෙන් සිත සතුටු කෙරේනුයි නිජ්ක්ධන්තික බල නමි. (14 ඡේදයේ (ii) පඤ්ඤත්ති බලය යනු නිජ්ක්ධන්තික බලය යයි වෙනස් කොට යොදන්න) සකල ක්ලේශයන් දුරු කරමින් අර්හත් මාර්ග සිත සතුටු කෙරේනුයි නිජ්ක්ධන්තික බල නමි. මෙය වශයෙන් නිජ්ක්ධන්තික බලයයි.

16. ඉස්සරිය බලය කවරේද? කාමච්ඡන්දය දුරුකරමින් නෛෂ්ක්‍රම්‍ය වශයෙන් සිත (තමා) වසඟයෙහි පවත්වානුයි ඉස්සරිය බල නම්. ව්‍යාපාදය දුරුකරමින් අව්‍යාපාද වශයෙන් සිත තමා වසඟයෙහි පවත්වානුයි ඉස්සරිය බල නම්. ථීන-මිද්ධය දුරුකරමින් ආලොකසඤ්ඤා වශයෙන් සිත (තමා) වසඟයෙහි පවත්වානුයි ඉස්සරිය බල නම්. (14 ඡේදයේ (ii) පඤ්ඤත්ති බල යනු ඉස්සරිය බලයයි වෙනස්කොට යොදන්න) සකල ක්ලේශයන් දුරු කරමින් අර්හත් මාර්ග වශයෙන් සිත (තමා) වසඟයෙහි පවත්වානුයි ඉස්සරිය බල නම්. මෙය ඉස්සරිය බලයයි.

17. අධිෂ්ඨාන බලය කවරේද? කාමච්ඡන්දය දුරු කරමින් නෛෂ්ක්‍රම්‍ය වශයෙන් සිත විධාන කෙරේනුයි අධිෂ්ඨාන බල නම්. ව්‍යාපාදය දුරු කරමින් අව්‍යාපාද වශයෙන් සිත විධාන කෙරේනුයි අධිෂ්ඨාන බල නම්. ථීනමිද්ධය දුරු කරමින් ආලොක සඤ්ඤා වශයෙන් සිත විධාන කෙරේනුයි අධිෂ්ඨාන බල නම්. (14 ඡේදයේ (ii) පඤ්ඤත්තිබල යනු අධිෂ්ඨාන බලයයි වෙනස්කොට යොදන්න) සකල ක්ලේශයන් දුරු කරමින් අර්හත් මාර්ග වශයෙන් සිත විධාන කෙරේනුයි අධිට්ඨාන බල නම්. මෙය අධිට්ඨාන බලයයි.

18. සමථ බලය කවරේද? නෛෂ්ක්‍රම්‍ය වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සංඛ්‍යාත අවික්ෂෙපය සමථ බල නම්. අව්‍යාපාද වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සංඛ්‍යාත අවික්ෂේපය සමථ බල නම්. ආලොක සඤ්ඤා වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සංඛ්‍යාත අවික්ෂේපය සමථ බල නම්. ධම්මවවත්ථාන වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සංඛ්‍යාත අවික්ෂේප සමථ බල නම්. පටිනිස්සග්ගානුපස්සී පස්සාය වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සංඛ්‍යාත අවික්ෂේපය සමථ බල නම්.

'සමථබලය' යනු කුමන අර්ථයකින් සමථබල නම් වේද?

19. පඨමජ්ක්ධානයෙන් නීවරණ කෙරෙහි කම්පා නොවේනුයි සමථ බල නම්. දුතියජ්ක්ධනයෙන් විතක්ක විචාර කෙරෙහි කම්පා නොවේනුයි සමථ බල නම්. තතියජ්ක්ධානයෙන් ප්‍රීතියෙහි කම්පා නොවේනුයි සමථ බල

නමි. චතුත්ථජ්ක්ධානයෙන් සුඛ-දුඃඛ කෙරෙහි කම්පා නොවේනුයි සමථ බල නමි. ආකාසානඤ්චායතන සමාපත්තියෙන් රූප සඤ්ඤා, පටිඝ සඤ්ඤා නානත්තසඤ්ඤාවන් කෙරෙහි කම්පා නොවේනුයි සමථ බල නමි. විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන් ආකාසානඤ්ඤායතන සමාපත්තිය කෙරෙහි කම්පා නොවේනුයි සමථ බල නමි. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය කෙරෙහි කම්පා නොවේනුයි සමථ බල නමි. උද්ධච්චයෙහිද උද්ධච්ච සහගත ක්ලේශයන් කෙරෙහිද ස්කන්ධයන් කෙරෙහිද කම්පානොවේනුයි චලනය නොවේනුයි වේධනය නොවේනුයි සමථබල නමි මෙය සමථ බලයයි.

**20.** විපස්සනා බලය කවරේද? අනිච්චානුපස්සනාව විපස්සනා බල නමි. දුක්ඛානුපස්සනාව විපස්සනා බල නමි. අනත්තානුපස්සනාව විපස්සනා බල නමි. රූපයෙහි අනිච්චානුපස්සනාව විපස්සනා බල නමි රූපයෙහි දුක්ඛානුපස්සනාව විපස්සනා බල නමි. රූපයෙහි අනත්තානුපස්සනාව විපස්සනා බල නමි. රූපයෙහි පටිනිස්සග්ගානු පස්සනාව විපස්සනා බල නමි. වේදනාවෙහි අනිච්චානුපස්සනාව විපස්සනා බල නමි. සඤ්ඤාවෙහි, සංඛාරයන්හි, විඤ්ඤාණයෙහි, චක්ඛුවෙහි අනිච්චානුපස්සනාව විපස්සනාබල නමි. ජරා මරණයන්හි අනිච්චානුපස්සනාව විපස්සනා බල නමි. ජරා මරණයන්හි පටිනිස්සග්ගානු පස්සනාව විපස්සනාබල නමි.

**21.** විපස්සනා බලය යනු කුමන අර්ථයකින් විපස්සනා බල නමි වේද? අනිච්චානුපස්සනාවෙන් නිච්ච සඤ්ඤාවෙහි කම්පා නොවේනුයි විපස්සනා බල නමි. දුක්ඛානුපස්සනාවෙන් සුඛ සඤ්ඤාවෙන් කම්පා නොවේනුයි විපස්සනා බල නමි. අනත්තානුපස්සනාවෙන් අත්ත සඤ්ඤාවෙහි කම්පානොවේනුයි විපස්සනා බල නමි. නිබ්බිදානුපස්සනාවෙන් තණ්හාවෙහි කම්පා නොවේනුයි විපස්සනා බල නමි. විරාගානුපස්සනාවෙන් රාගයෙහි කම්පා නොවේනුයි විපස්සනා

බල නම්. නිරෝධානුපස්සනාවෙන් සමුදයෙහි කම්පා නොවේනුයි විපස්සනා බල නම්. පටිනිස්සග්ගානු පස්සනාවෙන් ආදානයෙහි කම්පා නොවේනුයි විපස්සනා බල නම්. අවිද්‍යාවෙහිද, අවිද්‍යාසහගත ක්ලේශයන් කෙරෙහිද ස්කන්ධයන් කෙරෙහිද කම්පා නොවෙයි, චලනය නොවෙයි, වේධනය නොවේනුයි විපස්සනා බල නම්. මෙය විපස්සනා බලයයි.

22. දස සෙඛබල දස අසෙඛබල කවරහුද?

සම්මාදිට්ඨියෙහි හික්මේනුයි සෙඛබල නම්. එහි හික්මෙන ලද බැවින් අසෙඛ බල නම්. සම්මාසංකප්පයෙහි (ii) හික්මේනුයි සෙඛබල නම්. එහි හික්මෙන ලද බැවින් අසෙඛ බල නම්. (iii) සම්මා වාචාවෙහි (මෙහි (ii) යොදන්න. සම්මා කම්මන්තයෙහි, සම්මා ආජීවයෙහි, සම්මා වායාවෙහි, සම්මා සතියෙහි, සම්මා සමාධියෙහි, සම්මා ඤාණයෙහි (මෙහි (ii) යොදන්න) සම්මා විමුක්තියෙහි හික්මේනුයි සෙඛබල නම්. එහි හික්මෙන ලද බැවින් අසෙඛ බල නම්. මොව්හු දස සෙඛබලද දස අසෙඛ බලද වෙත්.

23. දස ඛීණාසව බල කවරහුද?

මෙහි ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් සියලු සංස්කාරයන් අනිත්‍ය වශයෙන් යථාස්වභාවයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් මනාව දක්නා ලද්දාහු වෙත්. යම්හෙයකින් ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් සියලු සංස්කාරයෝ අනිත්‍ය වශයෙන් යථාස්වභාවයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් මනාව දක්නා ලද්දාහු වෙත්ද, ක්ෂීණාශ්‍රව භික්ෂුව යම් බලයකට පැමිණ මාගේ ආශ්‍රවයෝ ක්ෂය වූවාහුයයි ආශ්‍රවයන්ගේ ක්ෂයවීම පිළිගනීද, මෙයද, ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ බලයක් වේ.

24. තවද ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් කාමයෝ ගිනි අඟුරුවලට උපමාකොට ඇතිහුයයි යථාස්වභාවයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් මනාව දක්නා ලද්දාහු වෙත්. යම්හෙයකින් ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් කාමයෝ ගිනි අඟුරුවලට උපමා කොට ඇත්තාහුයයි යථාස්වභාවයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් මනාව දක්නා ලද්දාහු වෙත්ද ක්ෂීණාශ්‍රව භික්ෂුව යම් බලයකට පැමිණ මාගේ

ආශ්‍රවයෝ ක්ෂය වූවාහුයයි ආශ්‍රවයන්ගේ ක්ෂයවීම් පිළිගනීද, මෙයද ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ බලයක්වේ.

**25.** තවද ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ උපධි විවේකනින්නවූ විවේකාවනතවූ, විවේකයට නැමුනු කෙලෙසුන් කෙරෙන් දුරුවූ, නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුනු සර්වප්‍රකාරයෙන් ආශ්‍රවයන්ට කරුණුවූ ක්ලේශ ධර්මයන්ගෙන් දුරුවූ සිත ඇත්තේ වේ. යම්හෙයකින් ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ විවේකනින්නවූ, විවේකාවනතවූ විවේකයට නැමුණු, කෙලෙසුන් කෙරෙන් දුරුවූ නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුනු, සර්වප්‍රකාරයෙන් ආශ්‍රවයන්ට කරුණු වූ ක්ලේශ ධර්මයන්ගෙන් දුරුවූ සිත ඇත්තේවේද, යම් බලයකට පැමිණි ක්ෂීණාශ්‍රව භික්ෂුව මාගේ ආශ්‍රවයෝ ක්ෂය වූවාහුයයි ආශ්‍රවයන්ගේ ක්ෂයවීම පිළිගනීද, මෙයද ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ බලයක් වේ.

**26.** තවද, ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් සතරසතිපට්ඨානයෝ වඩනලද්දාහු මැනවින් වඩනලද්දාහු වෙත්ද, (ii) යම් හෙයකින් ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් සතරසතිපට්ඨානයෝ වඩන ලද්දාහු මැනවින් වඩන ලද්දාහු වෙත්ද (iii) ක්ෂීණාශ්‍රව භික්ෂුව යම් බලයකට පැමිණ මාගේ ආශ්‍රවයෝ ක්ෂය වූවාහුයයි ආශ්‍රවයන්ගේ ක්ෂයවීම් පිළිගනීද, මෙයද ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ බලයක් වේ.

**27.** තවද ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් සතර සම්‍යක්ප්‍රධානයෝ වඩනලද්දාහු මැනවින් වඩන ලද්දාහුවෙත් (26 ඡේදයේ (ii) යොදන්න) සතර ඍද්ධිපාදයෝ වඩන ලද්දාහු මැනවින් වඩන ලද්දාහු වෙත්. පඤ්චෙන්ද්‍රියයෝ වඩන ලද්දාහු මැනවින් වඩන ලද්දාහු වෙත්. පඤ්චබලයෝ වඩන ලද්දාහු මැනවින් වඩන ලද්දාහු වෙත්. සත්තබොජ්ක්ධංගයෝ වඩන ලද්දාහු මැනවින් වඩන ලද්දාහු වෙත්. ආර්යඅෂ්ටාංගික මාර්ගය වඩන ලද්දේ මැනවින් වඩන ලද්දේ වේ. යම්හෙයකින් ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් ආර්යඅෂ්ටාගිංක මාර්ගය වඩන ලද්දේ මැනවින් වඩන ලද්දේවේද, ක්ෂීණාශ්‍රව භික්ෂුව යම් බලයකට පැමිණ මාගේ ආශ්‍රවයෝ ක්ෂය වූවාහුයයි ආශ්‍රවයන්ගේ ක්ෂයවීම පිළිගණීද, මෙයද ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ බලයක් වේ.

**28.** දශ ඍද්ධිබල කවරහුද?

අධිෂ්ඨාන ඍද්ධිය, විකුර්වණ ඍද්ධිය, මනෝමය ඍද්ධිය, ඥාණවිප්ඵාර ඍද්ධිය, සමාධි විප්ඵාර ඍද්ධිය, ආර්ය ඍද්ධිය, කර්ම විපාකජ ඍද්ධිය පුණ්‍යවන්තයාගේ ඍද්ධිය, විද්‍යාමය ඍද්ධිය, ඒ ඒ තැන සම්‍යක් ප්‍රයෝගයන්ගෙන් කාර්ය සිද්ධවන ඍද්ධිය, මොව්හු දස ඍද්ධි බලයෝය.

**29.** දශ තථාගත බල කවරහුද?

මෙහි තථාගත තෙමේ කාරණය කාරණය වශයෙනුත්, අකාරණය අකාරණය වශයෙනුත් යථාස්වභාවයෙන් දැනගනියි. යම් හෙයකින් තථාගත තෙමේ කාරණය කාරණය වශයෙනුත් අකාරණය අකාරණය වශයෙනුත් යථා ස්වභාවයෙන් දැන ගනීද, තථාගත තෙමේ යම් බලයකට ශ්‍රෙෂ්ඨ ස්ථානයට එළඹේද, පිරිස්හි සිංහ (ශ්‍රෙෂ්ඨ) නාද පවත්වාද, ශ්‍රෙෂ්ඨ (ධර්ම) චක්‍රය පවත්වාද, මෙයද තථාගතයන් වහන්සේගේ තථාගත බලයක් වේ.

**31.** තවද, තථාගත තෙමේ සර්වත්‍ර ගාමිනී ප්‍රතිපදාව යථා ස්වභාවයෙන් වෙසෙසින් දනියි. යම් හෙයකින් තථාගත තෙමේ සර්වත්‍රගාමිනී ප්‍රතිපදාව යථා ස්වභාවයෙන් වෙසෙසින් දනීද (ii) තථාගත තෙමේ යම් බලයකට පැමිණ ශ්‍රෙෂ්ඨ ස්ථානයට එළඹේද පිරිස්හි ශ්‍රෙෂ්ඨ (සිංහ) නාද පවත්වාද (iii) ශ්‍රෙෂ්ඨ (ධර්ම) චක්‍රය පවත්වාද මෙයද තථාගතයන් වහන්සේගේ තථාගත බලයක් වේ.

**32.** තවද තථාගත තෙමේ අනෙක ධාතු නානා ධාතු (ස්කන්ධායතන ධාතු) ලොකය යථා ස්වභාවයෙන් වෙසෙසින් දනී. යම් හෙයකින් තථාගත තෙමේ අනෙක ධාතු නා නා ධාතු ලොකය යථා ස්වභාවයෙන් වෙසෙසින් දනීද (31 ඡෙදයේ ii යොදන්න) ශ්‍රෙෂ්ඨ (ධර්ම) චක්‍රය පවත්වයි.

**33.** තවද තථාගත තෙමේ සත්වයන්ගේ නානා විමුක්තිකතාවය යථා ස්වභාවයෙන් වෙසෙසින් දනියි. යම් හෙයකින් තථාගත තෙමේ සත්වයන්ගේ නානාධිමුත්තිකතාවය වෙසෙසින් දනීද (31 ඡෙදයේ ii යොදන්න) ශ්‍රෙෂ්ඨ (ධර්ම) චක්‍රය පවත්වයි. මෙයද තථාගතයන් වහන්සේගේ තථාගත බලයක් වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**34.** තවද තථාගත තෙමේ ප්‍රධාන සත්වයන්ගේ හීන සත්වයන්ගේ (ශ්‍රද්ධාදී) ඉන්ද්‍රියයන්ගේ වෘද්ධිය හා හානිය යථා ස්වභාවයෙන් වෙසෙසින් දනියි. යම් හෙයකින් තථාගත තෙමේ ප්‍රධාන සත්වයන්ගේ හීන සත්වයන්ගේ ඉන්ද්‍රියයන්ගේ වෘද්ධිය හා හානිය යථා ස්වභාවයෙන් දනීද (31 ඡේදයේ ii යොදන්න) ශ්‍රෙෂ්ඨ (ධර්ම) චක්‍රය පවත්වයි මෙයද තථාගතයන් වහන්සේගේ තථාගත බලයක් වේ.

**35.** තවද, තථාගත තෙමේ ධ්‍යාන විමොක්ෂ සමාධි සමාපත්තීන්ගේ සංකිලෙස වොදානවුට්ඨානයන් යථා ස්වභාවයෙන් වෙසෙසින් දනියි. යම් හෙයකින් තථාගත තෙමේ ධ්‍යාන විමොක්ෂ සමාධි සමාපත්තීන්ගේ සංකිලෙස වොදාන වුට්ඨානයන් යථා ස්වභාවයෙන් වෙසෙසින් දනීද (31 ඡේදයේ ii යොදන්න) ශ්‍රෙෂ්ඨ (ධර්ම) චක්‍රය පවත්වයි. මෙයද තථාගතයන් වහන්සේගේ තථාගත බලයක් වේ.

**36.** තවද තථාගත තෙමේ නන් අයුරින් දන්නා ලද පෙර බව පරපුර සිහිකරයි. කෙසේද යත් එක් ජාතියක්ද ජාති දෙකක්ද (මෙහි ඥාන කථා කොටසේ 231 ඡේදයේ එක් ජාතියක්ද යන තැන සිට යොදන්න) ආකාර සහිතවූ උද්දෙස සහිතවූ නන් අයුරින් දන්නා ලද පෙර බව පරපුර සිහි කරයි. යම් හෙයකින් තථාගත තෙමේ නන් අයුරින් දන්නා ලද පෙර බව පරපුර සිහි කෙරේද කෙසේද යත්:- එක් ජාතියක් ජාති දෙකක් (මෙහි ඥාන කථා කොටසේ 213 ඡේදයේ එක් ජාතියක්ද යන තැන සිට යොදන්න) ශ්‍රෙෂ්ඨ (ධර්ම) චක්‍රය පවත්වාද, මෙයද තථාගතයන් වහන්සේගේ තථාගත බලයක් වේ.

**37.** තවද, තථාගත තෙමේ මනුෂ්‍යත්වය ඉක්මවූ විසුද්ධවූ දිවැසින් චුත වෙමින් සිටින්නාවූ උපදිමින් සිටින්නාවූද සත්වයන් බලයි. යම් හෙයකින් තථාගත තෙමේ මනුෂ්‍යත්වය ඉක්මවූ විසුද්ධවූ දිවැසින් (මෙහි ඥාන කථා කොටසේ 214 ඡේදයේ චුත වන්නාවූද යන තැන සිට යොදන්න) ශ්‍රෙෂ්ඨ (ධර්ම) චක්‍රය පවත්වයි මෙයද තථාගතයන් වහන්සේගේ තථාගත බලයක් වේ.

**38.** තවද තථාගත තෙමේ ක්ලේශයන්ගේ ක්ෂය වීමෙන් ක්ලේශ විරහිතවූ අර්හත්ඵල සම්ප්‍රයුක්ත සමාධිය, අර්හත්ඵල

සම්ප්‍රයුක්ත ප්‍රඥාව මෙලොවදීම තමා විසින් විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරයි. යම් හෙයකින් තථාගත තෙමේ ක්ලේශයන්ගේ ක්ෂය වීමෙන් ක්ලේශ විරහිතවූ අර්හත් ඵල සම්ප්‍රයුක්ත සමාධිය අර්හත් ඵල සම්ප්‍රයුක්ත ප්‍රඥාව මෙලොවදීම තමා විසින් විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට එළඹ වාසය කෙරේද, තථාගත තෙමේ බලයකට පැමිණ ශ්‍රෙෂ්ඨ ස්ථානයට පැමිණ පිරිස්හි ශ්‍රෙෂ්ඨ (සිංහ) නාද පවත්වාද, ශ්‍රෙෂ්ඨ (ධර්ම) චක්‍රය පවත්වාද, මෙයද තථාගතයන් වහන්සේගේ තථාගත බලයක් වේ. දස තථාගත බල මොව්හුය.

**39.** ‘සද්ධා බලය’ යනු කුමන අර්ථයකින්ද? විරිය බලය යනු කුමන අර්ථයකින්ද? සති බලය යනු කුමන අර්ථයකින්ද? සමාධි බලය යනු කුමන අර්ථයකින්ද? පඤ්ඤා බලය යනු කුමන අර්ථයකින්ද? හිරි බලය යනු කුමන අර්ථයකින්ද? ඔත්තප්ප බලය යනු කුමන අර්ථයකින්ද? පටිසංඛාන බලය යනු කුමන අර්ථයකින්ද? තථාගත බලය යනු කුමන අර්ථයකින්ද?

ශ්‍රද්ධාවෙන් අකම්ප්‍යාර්ථයෙන් සද්ධා බලනම්. කොසජ්ජයෙන් අකම්ප්‍යාර්ථයෙන් විරිය බල නම්. උද්ධච්චයෙන් අකම්ප්‍යාර්ථයෙන් සමාධි බල නම්. අවිද්‍යාවෙන් අකම්ප්‍යාර්ථයෙන් පඤ්ඤාබල නම්. ලාමකවූ අකුසල ධර්මයන්හි ලජ්ජා උපදවානුයි, හිරි බල නම්. ලාමකවූ අකුසල ධර්මයන්හි භය උපදවානුයි ඔත්තප්ප නම්. නුවණින් ක්ලේශයන් ප්‍රත්‍යවෙක්ෂා කෙරේනුයි පටිසංඛාන නම්. එහි (සමථයෙහි) උපන් ධර්මයෝ එක කෘත්‍ය ඇත්තෝ වෙත්නුයි භාවනා බල නම්. එහි කිසි දොෂයක් නැත්නුයි අනවජ්ජ බල නම්. එයින් හිත බන්ධනය කෙරේනුයි සංගහ බල නම්. එය ඔහුට රුචි කෙරේනුයි ඛන්තිබල නම්. එයින් සිත සතුටු කෙරේනුයි පඤ්ඤත්ති බල නම්. එයින් සිත නිජ්ක්ධාපනය කෙරේනුයි නිජ්ක්ධාන්ති බල නම්. එයින් සිත වසඟයෙහි පවත්වානුයි ඉස්සරිය බල නම්. එයින් සිත විධාන කෙරේනුයි අධිට්ඨාන බල නම්. එයින් සිත එකඟනුයි සමථබල නම්. එහි (විදර්ශනාවෙහි) උපන් ධර්මයන් නුවණින් සලකා බලානුයි

විපස්සනා බල නම්. එහි හික්මේනුයි සෙඛ බල නම්. එහි හික්මෙන ලද බැවින් අසෙඛ බල නම්. එයින් ආශ්‍රවයෝ ක්ෂය වූවාහුයයි ඛීණාසව බල නම්. ඔහුගේ එය ඉටුවේනුයි ඉද්ධිබල නම්. අප්‍රමෙයාර්ථයෙන් තථාගත බල නම්.

බල කථා නිමි.

---

## 20 සුඤ්ඤ කථා

1. මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඩු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වාසය කරණ සේක. ඉක්බිත්තෙන් වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතන්හි එළඹි සේක. එළඹ එකත්පසෙක වැඩහුන් සේක. එකත්පසෙක හුන්නාවූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ වනාහි භාග්‍යවතුන් වහන්සේට මෙය වදාළ සේක. "ස්වාමීනි, ලෝකය ශූන්‍යය, ලෝකය ශූන්‍ය යයි කියනු ලැබේ ස්වාමීනි, කොපමණකින් වනාහි ලෝකය ශූන්‍යයයි කියනු ලැබේද?

2. "ආනන්දය, යම් හෙයකින් ආත්මයෙන් හෝ ආත්මය සන්තක දෙයින් හෝ ශූන්‍යද, එහෙයින් ලෝකය ශූන්‍යයයි කියනු ලැබේ. ආනන්දය, ආත්මයෙන් හෝ ආත්මය සන්තක දෙයින් හෝ ශූන්‍ය කුමක්ද යත්:- ආනන්දය, චක්ෂුව වනාහි ආත්මයෙන්ද, ආත්ම සන්තක දෙයින්ද ශූන්‍යය, රූපයෝ ආත්මයෙන්ද ආත්ම සන්තක දෙයින්ද ශූන්‍යයෝයි. චක්ඛු විඤ්ඤාණය ආත්මයෙන්ද ආත්ම සන්තක දෙයින්ද ශූන්‍යය. චක්ඛු සම්ඵස්සය ආත්මයෙන්ද ආත්මසන්තක දෙයින්ද ශූන්‍යය චක්ඛු සම්ඵස්ස ප්‍රත්‍යයෙන් සුඛවූ හෝ දුඃඛවූ හෝ අදුක්ඛමසුඛ වූ හෝ යම් මේ විඳ ගැනීමක් ඇති වේද, එයත් ආත්මයෙන්ද ආත්ම සන්තක දෙයින්ද ශූන්‍යය. ශ්‍රොත්‍රය ශූන්‍යයි ශබ්දය ශූන්‍යයි. ඝ්‍රාණය ශූන්‍යයි ගන්ධය ශූන්‍යයි, ජිහ්වාව ශූන්‍යයි රස ශූන්‍යයි, කායය ශූන්‍යයි. ස්පර්ශය ශූන්‍යයි, මනස ශූන්‍යයි. ධර්මයෝ අනාත්මයෙන්ද ආත්ම සන්තක දෙයින්ද, ශූන්‍යය. මනෝවිඤ්ඤාණය ආත්මයෙන්ද ආත්ම සන්තක දෙයින්ද

ශූන්‍යය, මනෝසම්ඵස්සය ආත්මයෙන්ද ආත්ම සන්තක දෙයින්ද ශූන්‍යය, මනෝ සම්ඵස්ස ප්‍රත්‍යයෙන් සුඛවූ හෝ දුක්ඛවූ හෝ අදුක්ඛමසුඛවූ හෝ යම් විඳගැනීමක් ඇති වේද, එයත් ආත්මයෙන්ද ආත්ම සන්තක දෙයින්ද ශූන්‍යය. ආනන්දය, යම් හෙයකින් වනාහී ආත්මයෙන් හෝ ආත්ම සන්තක දෙයින් හෝ ශූන්‍යද එහෙයින් ලෝකය ශූන්‍යයයි කියනු ලැබේ.

3. "සුඤ්ඤ සුඤ්ඤය, සංඛාර සුඤ්ඤය, විපරිනාම සුඤ්ඤය අග්ගසුඤ්ඤය, ලක්ඛණ සුඤ්ඤය, වික්ඛම්භන සුඤ්ඤය, තදංග සුඤ්ඤය, සමුච්ඡෙද සුඤ්ඤය, පටිප්පස්සද්ධි සුඤ්ඤය, නිස්සරණ සුඤ්ඤඤය, අජ්ඣත්ත සුඤ්ඤය, බහිද්ධා සුඤ්ඤය, උභතො සුඤ්ඤය, සභාග සුඤ්ඤය, විසභාග සුඤ්ඤය, එසනා සුඤ්ඤය, පරිග්ගහ සුඤ්ඤය, පටිලාභ සුඤ්ඤය, පටිවෙධ සුඤ්ඤය, එකත්ත සුඤ්ඤය, නානත්ත සුඤ්ඤය, ඛන්ති සුඤ්ඤය, අධිට්ඨාන සුඤ්ඤය, පරියෝගාහන සුඤ්ඤය, සම්පජඤ්ඤයෙන් යුත් අනුපාද පරිනිර්වාණයවූ සකල සුඤ්ඤතාවන්ගේ පරමත්ථසුඤ්ඤය (යන මේ ශූන්‍යතාවෝ වෙත්.)

4. "සුඤ්ඤ සුඤ්ඤය නම් කවරේද?

පුඤ්ඤාභි සංඛාරය, අපුඤ්ඤාභි සංඛාරය, ආනෙඤ්ජාභි සංඛාරය'යි සංස්කාරයෝ තුන්දෙනෙක් වෙත් පුඤ්ඤාභි සංඛාරය, අපුඤ්ඤාභි සංඛාරයෙන්ද ආනෙඤ්ජාභි සංඛාරයෙන්ද ශූන්‍යය, අපුඤ්ඤාභී සංඛාරය පුඤ්ඤාභි සංඛාරයෙන්ද ආනෙඤ්ජාභි සංඛාරයෙන්ද ශූන්‍යය. ආනෙඤ්ජාභි සංඛාරය පුඤ්ඤාභි සංඛාරයෙන්ද අපුඤ්ඤාභි සංඛාරයෙන්ද ශූන්‍යය. සංස්කාරයෝ තුන්දෙන මොව්හු වෙත්.

5. "කාය සංඛාරය, වචී සංඛාරය, චිත්ත සංඛාරයයි අන්‍යවූද සංස්කාරයෝ තුන්දෙනෙක් වෙත්. කාය සංඛාරය වචී සංඛාරයෙන්ද චිත්ත සංඛාරයෙන්ද ශූන්‍යය. වචී සංඛාරය කාය සංඛාරයෙන්ද චිත්ත සංඛාරයෙන්ද ශූන්‍යය, චිත්ත සංඛාරය කාය සංඛාරයෙන්ද වචී සංඛාරයෙන්ද ශූන්‍යය, සංස්කාරයෝ තුන්දෙන මොව්හු වෙත්. මෙය සංඛාර සුඤ්ඤ නමි.

6. "අතීත සංස්කාරයෝය. අනාගත සංස්කාරයෝය පච්චුප්පන්න සංස්කාරයෝයයි අන්‍යවූද සංස්කාරයෝ

තුන්දෙනෙක් වෙත්. අතීත සංස්කාරයෝ අනාගත සංස්කාරයන්ගෙන්ද වර්තමාන සංස්කාරයන්ගෙන්ද ශූන්‍ය වෙත්. අනාගත සංස්කාරයෝ අතීත සංස්කාරයන්ගෙන්ද වර්තමාන සංස්කාරයන්ගෙන්ද ශූන්‍ය වෙත්. වර්තමාන සංස්කාරයෝ අතීත සංස්කාරයන්ගෙන්ද අනාගත සංස්කාරයන්ගෙන්ද ශූන්‍ය වෙත්. සංස්කාරයෝ තුන්දෙන මොව්හු වෙත්. මෙය සංඛාර සුඤ්ඤ නමි.

7. "විපරිනාම සුඤ්ඤය නම් කවරේද?

වර්තමාන රූපය (තමාගේ) ස්වභාවයෙන්ම ශූන්‍යය. පහවූ රූපය විපරීණ තද ශූන්‍යදවේ. වර්තමාන වේදනාව (ii) තමාගේ ස්වභාවයෙන්ම ශූන්‍යය. පහවූ වේදනාව විපරීතද ශූන්‍යද වේ. (iii) වර්තමාන සංස්කාරයෝ වර්තමාන විඤ්ඤාණය. වර්තමාන චක්ෂුව (මෙහි (ii) යොදන්න) වර්තමාන ස්වභාවය තමාගේ ස්වභාවයෙන්ම ශූන්‍යය. පහවූ ස්වභාවය විපරිතද ශූන්‍ය වේ මෙය විපරිණාම සුඤ්ඤ නමි.

8. "අග්ගසුඤ්ඤ- නම් කවරේද?

සකල සංස්කාර සමථයවූ සබ්බූපධිපටිනිස්සජනයවූ තෘෂ්ණාක්ෂයවූ විරාගයවූ නිරෝධයවූ යම් මේ නිවණක්ද මේ නිවණ අග්‍රය. මේ නිවණ ශ්‍රෙෂ්ඨය, මේ නිවණ විශිෂ්ටය මෙය අග්ගසුඤ්ඤ නමි.

9. "ලක්ඛන සුඤ්ඤය නම් කවරේද?

මේ ලක්ෂණ දෙකකි බාල ලක්ෂණයද පණ්ඩිත ලක්ෂණයද (යන මේ දෙකයි) බාල ලක්ෂණය පණ්ඩිත ලක්ෂණයෙන් ශූන්‍යය, පණ්ඩිත ලක්ෂණය බාල ලක්ෂණයෙන් ශූන්‍යය, ලක්ෂණයෝ තුන්දෙනෙක් වෙත්- උප්පාද ලක්ෂණ වය ලක්ෂණ ඨිතඤ්ඤතත්ත ලක්ෂණ (යන මේ තුනයි) උප්පාද ලක්ෂණය වය ලක්ෂණයෙන්ද ඨිතඤ්ඤතත්ත ලක්ෂණයෙන්ද ශූන්‍යය. වය ලක්ෂණය උප්පාද ලක්ෂණයෙන්ද ඨිතඤ්ඤතත්ත ලක්ෂණයෙන්ද ශූන්‍යය. ඨිතඤ්ඤතත්ත ලක්ෂණය උප්පාද ලක්ෂණයෙන්ද වය ලක්ෂණයෙන්ද ශූන්‍යය.

10. "රූපයාගේ (ii) උත්පාද ලක්ෂණය වය ලක්ෂණයෙන්ද ඨිතඤ්ඤතත්ත ලක්ෂණයෙන්ද ශූන්‍යය. රූපයාගේ වය ලක්ෂණය උත්පාද ලක්ෂණයෙන්ද ඨිතඤ්ඤතත්ත

ලක්ෂණයෙන්ද ශූන්‍යය. රූපයාගේ ඨිතඤ්ඤතත්ත ලක්ෂණය උත්පාද ලක්ෂණයෙන්ද වය ලක්ෂණයෙන්ද ශූන්‍යය. (iii) වේදනාවගේ, සඤ්ඤාවගේ, සංස්කාරයන්ගේ, විඤ්ඤාණයාගේ, චක්ෂුවගේ (මෙහි (ii) යොදන්න.) ජරා මරණයාගේ උත්පාද ලක්ෂණය වය ලක්ෂණයෙන්ද ඨිතඤ්ඤතත්ත ලක්ෂණයෙන්ද ශූන්‍යය ජරා මරණයාගේ වය ලක්ෂණය වය ලක්ෂණයෙන්ද ඨිතඤ්ඤතත්ත ලක්ෂණයෙන්ද ශූන්‍යය. ජරා මරණයන්ගේ ඨිතඤ්ඤතත්ත ලක්ෂණය උත්පාද ලක්ෂණයෙන්ද වය ලක්ෂණයෙන්ද ශූන්‍යය. මෙය ලක්ඛණ සුඤ්ඤ නමි.

11. "වික්ඛම්භන සුඤ්ඤය නම් කවරේද?

නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය යටපත් කරණ ලද්දේද ශූන්‍යද වේ. අව්‍යාපාදයෙන්ද ව්‍යාපාදය යටපත් කරණ ලද්දේද ශූන්‍යදවේ. ආලොක සංඥාවෙන් ථීනමිද්ධය යටපත් කරණ ලද්දේද ශූන්‍යද වේ, ධම්මවවත්ථානයෙන් විචිකිච්ඡාව යටපත් කරණ ලද්දේද ශූන්‍යද වේ. ඥානයෙන් අවිජ්ජාව යටපත් කරණ ලද්දේද ශූන්‍යද වේ. පඨමජ්ක්ධානයෙන් (ii) නීවරණයෝ යටපත් කරණලද්දාහුද ශූන්‍යද වෙත්. (iii) දුතියජ්ක්ධානයෙන් තතියජක්ධානයෙන් චතුත්ථජක්ධානයෙන් (මෙහි (ii) යොදන්න) අර්හත් මාර්ගයෝ සකල ක්ලේශයන් යටපත් කරණ ලද්දාහුද ශූන්‍යද වෙත්. මෙය වික්ඛම්භන සුඤ්ඤ නම් වේ.

12. "තදංග සුඤ්ඤ නම් කවරේද?

නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය තදංග ශූන්‍යය. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය තදංග ශූන්‍යය. ආලෝක සංඥාවෙන් ථීනමිද්ධය තදංග ශූන්‍යය. අවික්ෂෙපයෙන් උද්ධච්චය තදංග ශූන්‍යය ධම්මවවත්ථානයෙන් විචිකිච්ඡාව තදංග සුඤ්ඤය. ඥානයෙන් අවිජ්ජාව තදංග ශූන්‍යය පාමොජ්ජයෙන් අරතිය තදංග ශූන්‍යය. පඨමජ්ක්ධානයෙන් නීවරණයෝ තදංග ශූන්‍යයෝය. විවට්ටානු පස්සනාවෙන් සංයෝගාභිනිවේශය තදංග ශූන්‍යය මෙය තදංග ශූන්‍ය නමි.

13. "සමුච්ඡෙද සුඤ්ඤය නම් කවරේද?

නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය සමුච්ඡින්නද ශූන්‍යද වේ. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය සමුච්ඡින්නද ශූන්‍යද වේ. ආලොක

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සංඥාවෙන් ථිනමිද්ධය සමුච්ඡින්න ශූන්‍යද වේ. අවික්ෂෙපයෙන් උද්ධච්චය සමුච්ඡින්නද ශූන්‍යද වේ. ධම්මවවත්ථානයෙන් විචිකිච්ඡාව සමුච්ඡින්නද ශූන්‍යද වේ. පාමොජ්ජයෙන් අරතිය (ii) සමුච්ඡින්නද ශූන්‍යද වේ. පඨමජ්ක්ධානයෙන් නීවරණ සමුච්ඡින්නද ශූන්‍යද වේ. (11 ඡෙදයේ (iii) හා මෙහි (ii) යොදන්න.) අර්හත් මාර්ගයෙන් සකල ක්ලේශයෝ සමුච්ඡින්නද ශූන්‍යයෝද වෙත්. මෙය සමුච්ඡෙදසුඤ්ඤ නමි.

14. "පටිප්පස්සද්ධි සුඤ්ඤය නම් කවරේද?

නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය පටිප්පස්සද්ධද ශූන්‍යද වේ. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය පටිප්පස්සද්ධද ශූන්‍යද වේ. ආලොක සංඥාවෙන් ථිනමිද්ධය පටිප්පස්සධද ශූන්‍යද වේ. අවික්ෂෙපයෙන් උද්ධච්චය පටිප්පස්සසද්ධද ශූන්‍යද වේ. ධම්ම වවත්ථානයෙන් විචිකිච්ඡාව පටිප්පස්සද්ධද ශූන්‍යද වේ. ඥානයෙන් අවිජ්ජාව පටිප්පස්සද්ධද ශූන්‍යද වේ. පාමොජ්ජයෙන් අරතිය පටිප්පස්සද්ධද ශූන්‍යද වේ. පඨමජ්ක්ධානයෙන් නීවරණ (ii) පටිප්පස්සද්ධද ශූන්‍යද වේ. (11 ඡෙදයේ (iii) හා මෙහි (ii) යොදන්න.) අර්හත් මාර්ගයෙන් සකල ක්ලේශයෝ පටිප්පස්සද්ධයෝද ශූන්‍යයෝද වෙත්. මෙය පටිප්පස්සද්ධි සුඤ්ඤ නමි.

15. "නිස්සරණ සුඤ්ඤ නම් කවරේද?

නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය නිස්සටද (බැහැර වූයේද) ශූන්‍යද වේ. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය නිස්සටද (බැහැර වූයේද) ශූන්‍යද වේ. ආලොක සඥාවෙන් ථිනමිද්ධය නිස්සටද (බැහැර වූයේද) ශූන්‍යද වේ. අවික්ෂෙපයෙන් උද්ධච්චය නිස්සටද (බැහැර වූයේද) ශූන්‍ය ද වේ. ධම්මවවත්ථානයෙන් විචිකිච්ඡාව නිස්සටද (බැහැර වූයේද) ශූන්‍යද වේ. ඥානයෙන් අවිජ්ජාව නිස්සටද (බැහැර වූයේද) ශූන්‍යද වේ. පාමොජ්ජයෙන් අරතිය නිස්සටද (බැහැර වූයේද) ශූන්‍යද වේ. පඨමජ්ක්ධානයෙන් නීවරණ නිස්සටද (බැහැර වූයේද) ශූන්‍යද වේ. අර්හත් මාර්ගයෙන් සකල ක්ලේශයෝ නිස්සටද (බැහැර වූවෝද) ශූන්‍ය වූවෝද වෙත්. මෙය නිස්සරණ සුඤ්ඤ නමි.

16. "අජ්ක්ධත්ත සුඤ්ඤ නම් කවරේද?

අධ්‍යාත්මික චක්ෂුව (ii) ආත්මයෙන්ද ආත්ම සන්තක දෙයින්ද නිත්‍යයෙන්ද ස්ථිරත්වයෙන්ද ශාස්වතයෙන්ද අවිපරිනාම ධර්මයෙන්ද ශූන්‍යය. (iii) අධ්‍යාත්මික ශ්‍රොතස (මෙහි (ii) යොදන්න.) අධ්‍යාත්මික ඝ්‍රාණය ආත්මයෙන්ද ආත්ම සන්තක දෙයින්ද, නිත්‍යයෙන්ද, ස්ථිරත්වයෙන්ද, සාස්වතයෙන්ද ශූන්‍යය, අධ්‍යාත්මික ජිව්හාව ශූන්‍යය. අධ්‍යාත්මික කායය ශූන්‍යය. අධ්‍යාත්මික මනස ශූන්‍යය. මෙය අජ්ඣත්ත සුඤ්ඤ නමි.

17. "බහිද්ධා සුඤ්ඤ නම් කවරේද?

බාහිර රූපයෝ (මෙහි 16 (ii) යොදන්න.) ශූන්‍යයෝය. බාහිර ධර්මයෝ ආත්මයෙන්ද ආත්ම සන්තක දෙයින්ද, නිත්‍යයෙන්ද ස්ථිරත්වයෙන්ද, ශාස්වතයෙන්ද, අවිපරිනාම ධර්මයෙන්ද ශූන්‍යයෝය. මෙය බහිද්ධා සුඤ්ඤ නමි.

18. "උභතො සුඤ්ඤ නම් කවරේද?

යම් අධ්‍යාත්මික චක්ෂුවක් වේද? මේ බාහිර රූපයෝ වෙත්ද මේ දෙක (ii) ආත්මයෙන්ද ආත්ම සන්තක දෙයින්ද නිත්‍යයෙන්ද ස්ථිරත්වයෙන්ද, ශාස්වතයෙන්ද අවිපරිනාම ධර්මයෙන්ද ශූන්‍යය. (iii) යම් අධ්‍යාත්මික ශ්‍රොතයක් වේද, යම් බාහිර ශබ්දයෝ වෙත්ද (මෙහි (ii) යොදන්න.) යම් අධ්‍යාත්මික ඝ්‍රාණයක් වේද, යම් බාහිර ගන්ධයෝ වෙත්ද, යම් අධ්‍යාත්මික ජිව්හාවක් වේද, යම් බාහිර රසයෝ වෙත්ද, යම් අධ්‍යාත්මික කායයක් වේද, යම් බාහිර ස්පර්ශයෝ වෙත්ද, යම් අධ්‍යාත්මික මනසක් වේද, යම් බාහිර ධර්මයෝ වෙත්ද, මේ දෙක ආත්මයෙන්ද ආත්ම සන්තක දෙයින්ද නිත්‍යයෙන්ද, ස්ථිරත්වයෙන්ද, ශාස්වතයෙන්ද, අවිපරිණාම ධර්මයෙන්ද, ශූන්‍යය. මෙය උභතො සුඤ්ඤ නමි.

19. "සභාග සුඤ්ඤ නම් කවරේද?

සය වැදෑරුම් අධ්‍යාත්මිකායතනයෝ සභාගයෝද ශූන්‍යයෝද වෙත්. සය වැදෑරුම් බාහිරායතනයෝ සභාගයෝද ශූන්‍යයෝද වෙත්. සය වැදෑරුම් විඤ්ඤාණ කායයෝ සභාගයෝද ශූන්‍යයෝද වෙත්. සය වැදෑරුම් ඵස්ස කායයෝ සභාගයෝද ශූන්‍යයෝද වෙත්. සය වැදෑරුම් වේදනා කායයෝ

සභාගයෝද ශූන්‍යයෝද වෙත්. සය වැදෑරුම් සඤ්ඤා කායයෝ සභාගයෝද ශූන්‍යයෝද වෙත්. සය වැදෑරුම් චෙතනා කායයෝ සභාගයෝද ශූන්‍යයෝද වෙත්. මෙය සභාග සුඤ්ඤ නමි.

**20.** විසභාග සුඤ්ඤ නම් කවරේද?

සය වැදෑරුම් අධ්‍යාත්මකායතනයෝ සය වැදෑරුම් බාහිරායතනයන් හා අසමානවූවෝද ශූන්‍යවූවෝද වෙත්. සය වැදෑරුම් බාහිරායතනයෝ සය වැදෑරුම් විඤ්ඤාණකායයන් හා අසමානවූවෝද ශූන්‍ය වූවෝද වෙත්. සය වැදෑරුම් විඤ්ඤාණ කායයෝ සය වැදෑරුම් ඵස්සකායයන් හා අසමාන වූවෝද ශූන්‍යවූවෝද වෙත්. සය වැදෑරුම් ඵස්සකායයන් සය වැදෑරුම් වේදනාකායයන් හා අසමානවූවෝද ශූන්‍යවූවෝද වෙත් සය වැදෑරුම් වේදනා කායයෝ සය වැදෑරුම් විඤ්ඤාණ කායයන් හා අසමානවූවෝද ශූන්‍යවූවෝද වෙත්. සය වැදෑරුම් සඤ්ඤාකායයෝ සය වැදෑරුම් චෙතනාකායයන් හා අසමාන වූවෝද ශූන්‍යවූවෙෝද වෙත්. මෙය විසභාග සුඤ්ඤ නමි.

**21.** එසනා සුඤ්ඤ නම් කවරේද?

නෛෂ්ක්‍රම්‍ය සෙවීම කාමච්ඡන්දයෙන් ශූන්‍යය. අව්‍යාපාදය සෙවීම ව්‍යාපාදයෙන් ශූන්‍යය. ආලොක සංඥාව සෙවීම ථීන මිද්ධයෙන් ශූන්‍යය. අවික්ඛෙපය සෙවීම උද්ධච්චයෙන් ශූන්‍යය. ධම්මවවත්ථානය සෙවීම විචිකිච්ඡාවෙන් ශූන්‍යය, ඥානය සෙවීම අවිජ්ජාවෙන් ශූන්‍යය. පාමොජ්ජය සෙවීම අරතියෙන් ශූන්‍යය. පඨමජ්ක්ධානය සෙවීම නීවරණයන්ගෙන් ශූන්‍යය දුතියජක්ධානය තතියජ්ක්ධානය, චතුජ්ක්ධානය සෙවීම නීවරණයෙන් ශූන්‍යය, අර්හත් මාර්ගය සෙවීම සකල ක්ලේශයන්ගෙන් ශූන්‍යය. මෙය එසනා සුඤ්ඤ නමි.

**22.** පරිග්ගාහ සුඤ්ඤ නම් කවරේද?

නෛෂ්ක්‍රම්‍ය පරිග්‍රහණය (වටකොට ගැන්ම) කාමච්ඡන්දයෙන් ශූන්‍යය. අව්‍යාපාද පරිග්‍රහණය ව්‍යාපාදයෙන් ශූන්‍යය. ආලොකසංඥා පරිග්‍රහණය ථීනමිද්ධයෙන් ශූන්‍යය. අවික්ෂෙප පරිග්‍රහණය උද්ධච්චයෙන් ශූන්‍යය. ධම්මවවත්ථාන පරිග්‍රහණ විචිකිච්ඡාවෙන් ශූන්‍යය. ඥාණ පරිග්‍රහණය

අවිජ්ජාවෙන් ශූන්‍යය. පාමොජ්ජ පරිග්‍රහණය අරතියෙන් ශූන්‍යය. ප්‍රථමධ්‍යාන පරිග්‍රහණය ii නීවරණයන්ගෙන් ශූන්‍යය iii දුතියජ්ක්ධාන, තතියජ්ක්ධාන, චතුත්ථජ්ක්ධාන පරිග්‍රහණය මෙහි ii අර්හත්මාර්ග පරිග්‍රහණය සකල ක්ලේශයන්ගෙන් ශූන්‍යය. මෙය පරිග්ගහසුඤ්ඤ නමි.

23. "පටිලාභ සුඤ්ඤ නම් කවරේද?

නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිලාභය කාමච්ඡන්දයෙන් ශූන්‍යය, අව්‍යාපාද ප්‍රතිලාභය ව්‍යාපාදයෙන් ශූන්‍යය. ආලෝකසඤ්ඤා ප්‍රතිලාභය ථිනමිද්ධයෙන් ශූන්‍යය. අවික්ෂෙප ප්‍රතිලාභය උද්ධච්චයෙන් ශූන්‍යය. ධම්මවවත්ථාන ප්‍රතිලාභය විචිකිච්ඡාවෙන් ශූන්‍යය. ඥාන ප්‍රතිලාභය අවිජ්ජාවෙන් ශූන්‍යය. පාමොජ්ජ ප්‍රතිලාභය අරතියෙන් ශූන්‍යය. ප්‍රථමධ්‍යාන ප්‍රතිලාභය නීවරණයන්ගෙන් ශූන්‍යය. ද්විතීයධ්‍යාන, තෘතීය ධ්‍යාන, චතුර්ථධ්‍යාන, ප්‍රතිලාභය නීවරණයන්ගෙන් ශූන්‍යය. අර්හත්මාර්ග ප්‍රතිලාභය සකල ක්ලේශයන්ගෙන් ශූන්‍යය. මෙය පටිලාභසුඤ්ඤ නමි.

24. පටිවේධසුඤ්ඤ නම් කවරේද?

නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිවෙධය කාමච්ඡන්දයෙන් ශූන්‍යය. අව්‍යාපාද ප්‍රතිවෙධය ව්‍යාපාදයෙන් ශූන්‍යය. ආලොකසංඥා ප්‍රතිවේධය ථිනමිද්ධයෙන් ශූන්‍යය. අවික්ෂෙප ප්‍රතිවේධය, උද්ධච්චයෙන් ශූන්‍යය, ධම්මවවත්ථාන ප්‍රතිවේධය විචිකිච්ඡාවෙන් ශූන්‍යය, ඥාන ප්‍රතිවේධය අවිජ්ජාවෙන් ශූන්‍යය. පාමොජ්ජ ප්‍රතිවේධය අරතියෙන් ශූන්‍යය. ප්‍රථමධ්‍යාන ප්‍රතිවේධය නීවරණයන්ගෙන් ශූන්‍යය, ද්විතීයධ්‍යාන, තෘතීය ධ්‍යාන, චතුර්ථධ්‍යාන ප්‍රතිවේධය නීවරණයන්ගෙන් ශූන්‍යය. අර්හත්මාර්ග ප්‍රතිවේධය සකල ක්ලේශයන්ගෙන් ශූන්‍යය. මෙය පටිවේධසුඤ්ඤ නමි.

25. "එකත්තසුඤ්ඤ නානත්ත සුඤ්ඤ නම් කවරේද?

කාමච්ඡන්දය නානත්තය, නෛෂ්ක්‍රම්‍යය, එකත්තය, නෛෂ්ක්‍රම්‍යයෙහි එකත්වය සිතන්නහුගේ කාමච්ඡන්දයෙන් ශූන්‍යය, ව්‍යාපාදය, නානත්තය, අව්‍යාපාදය, එකත්තය

අව්‍යාපාදයෙහි එකත්වය සිතන්නහුගේ ව්‍යාපාදයෙන් ශූන්‍යය, ථිනමිද්ධය නානත්තය, ආලොක සඤ්ඤාව එකත්තය, ආලෝක සඤ්ඤාවෙහි එකත්වය සිතන්නහුගේ ථිනමිද්ධයෙන් ශූන්‍යය, උද්ධච්චය, නානත්තය, විචිකිච්ඡාව නානත්තය, අවිජ්ජාව, නානත්තය, අරතිය නානත්තය නීවරණානානත්තය, පඨමජ්ක්ධානය එකත්තය, පඨමජ්ක්ධානයෙහි එකත්තය සිතන්නහු නීවරණ ශූන්‍යය, දුතියජ්ක්ධාන, තතියජ්ක්ධාන, චතුත්ථජ්ක්ධානයෙහි එකත්වය සිතන්නහු නීවරණ ශූන්‍යය. සකල ක්ලේශ නානත්තය අර්හත් මාර්ගය ඒකාත්තය, අර්හත් මාර්ගයාගේ ඒකත්වය සිතන්නහුගේ සකල ක්ලේශයන්ගෙන් ශූන්‍යය, මෙය ඒකත්ත සුඤ්ඤ නානත්ත සුඤ්ඤ නමි.

**26.** ඛන්තිසුඤ්ඤ නම් කවරේද?

නෛෂ්ක්‍රම්‍ය ක්ෂාන්තිය, කාමච්ඡන්දයෙන් ශූන්‍යය අව්‍යාපාද ක්ෂාන්තිය, ව්‍යාපාදියෙන් ශූන්‍යය. ආලෝක සංඥා ක්ෂාන්තිය ථිනමිද්ධයෙන් ශූන්‍යය, අවික්ෂෙප ක්ෂාන්තිය, උද්ධච්චයෙන් ශූන්‍යය, ධම්මවවත්ථාන ක්ෂාන්තිය විචිකිච්ඡාවෙන් ශූන්‍යය, ඥානක්ෂාන්තිය අවිද්‍යාවෙන් ශූන්‍යය, පාමොජ්ජක්ෂාන්තිය අරතියෙන් ශූන්‍යය, ප්‍රථමධ්‍යාන ක්ෂාන්තිය ii නීවරණයන් ගෙන් ශූන්‍යය. iii දුතියධ්‍යාන, තතීයධ්‍යාන, චතුර්ථධ්‍යාන ක්ෂාන්තිය (මෙහි ii) අර්හත් මාර්ග ක්ෂාන්තිය සකල ක්ලේශයන්ගෙන් ශූන්‍යය. මෙය ඛන්තිසුඤ්ඤ නමි.

**27.** "අධිට්ඨාන සුඤ්ඤය නම් කවරේද?

නෛෂ්ක්‍රම්‍යාධිෂ්ඨානය කාමච්ඡන්දයෙන් ශූන්‍යය. අව්‍යාපාදාධිෂ්ඨානය ව්‍යාපාදයෙන් ශූන්‍යය. ආලෝක සඤ්ඤට්ඨානය ථිනමිද්ධයෙන් ශූන්‍යය. අවික්ෂෙපාධිෂ්ඨානය උද්ධච්චයෙන් ශූන්‍යය. ධම්මවවත්ථානාධිෂ්ඨානය විචිකිච්ඡාවෙන් ශූන්‍යය ඤාණාධිෂ්ඨානය අවිද්‍යාවෙන් ශූන්‍යය. ප්‍රාමොද්‍යාධිෂ්ඨානය අරතියෙන් ශූන්‍යය ප්‍රථමධ්‍යානාධිෂ්ඨානය නීවරණයන්ගෙන් ශූන්‍යය ද්විතීයධ්‍යානාධිෂ්ඨානය, තතියජ්ක්ධානාධිෂ්ඨානය, චතුත්ථජ්ක්ධානාධිෂ්ඨානය නීවරණයන්ගෙන් ශූන්‍යය. අර්හත්මාර්ගාධිෂ්ඨානය සකල ක්ලේශයන්ගෙන් ශූන්‍යය. මෙය අධිට්ඨානසුඤ්ඤ නමි.

28. පරියෝගාහනසුඤ්ඤය නම් කවරේද?

නෛෂ්ක්‍රම්‍යයට බැසගැනීම කාමච්ඡන්දයෙන් ශූන්‍යය. අව්‍යාපාදයට බැසගැනීම ව්‍යාපාදයෙන් ශූන්‍යය ආලෝක සඤ්ඤාවට බැසගැනීම ථීනමිද්ධයෙන් ශූන්‍යය. අවික්ෂෙපයට බැසගැනීම උද්ධච්චයෙන් ශූන්‍යය. ධම්මවවත්ථානයට බැසගැනීම විචිකිච්ඡාවෙන් ශූන්‍යය. ඤාණයට බැසගැනීම අවිද්‍යාවෙන් ශූන්‍යය. පාමොජ්ජයට බැසගැනීම අරතියෙන් ශූන්‍යය. පඨමජක්ධානයට බැසගැනීම නීවරණයන්ගෙන් ශූන්‍යය. දුතියජ්ක්ධානයට, තතියජ්ක්ධානයට, චතුත්ථජ්ක්ධානයට බැස ගැනීම නීවරණයන්ගෙන් ශූන්‍යය, අර්හත් මාර්ගයට බැස ගැනීම සකල ක්ලේශයන්ගෙන් ශූන්‍යය. මෙය පරියෝගාහන සුඤ්ඤ නමි.

29. "සම්පජඤ්ඤයෙන් යුත් අනුපාද පරිනිබ්බාණයවූ සකල සුඤ්ඤතාවන්ගේ පරමත්ථ සුඤ්ඤය කවරේද?

මෙහි සම්පජඤ්ඤයෙන් යුක්තවූයේ නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දයාගේ පැවැත්ම අවසන් කරයි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදයාගේ පැවැත්ම අවසන් කරයි. ආලෝක සංඥාවෙන් ථීනමිද්ධයාගේ පැවැත්ම අවසන් කරයි. අවික්ෂෙපයෙන් උද්ධච්චයාගේ පැවැත්ම අවසන් කරයි. ධම්මවවත්ථානයෙන් විචිකිච්ඡාවගේ පැවැත්ම අවසන් කරයි. ඥානයෙන් අවිජ්ජාවගේ පැවැත්ම අවසන් කරයි. පාමොජ්ජයෙන් අරතියගේ පැවැත්ම අවසන් කරයි. පඨමජ්ක්ධානයෙන් නීවරණයන්ගේ පැවැත්ම අවසන් කරයි. දුතියජ්ක්ධානයෙන් තතියජ්ක්ධානයෙන් චතුත්ථජ්ක්ධානයෙන් නීවරණයන්ගේ පැවැත්ම අවසන් කරයි. අර්හත් මාර්ගයෙන් සකල ක්ලේශයන්ගේ පැවැත්ම අවසන් කරයි.

30. "නොහොත් සම්පඤ්ඤයෙන් යුත් අනුපාද නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පාන්නහුගේ මේ චක්ෂුසයාගේ පැවැත්ම අවසන් වෙයි. චක්ෂුසයා පිළිබඳවූ ඥානයද නොඋපදී. ශ්‍රොතයාගේ පැවැත්මද අවසන්වෙයි. ශ්‍රොතයා පිළිබඳ ඥානයද නොඋපදී. ඝ්‍රාණයාගේ පැවැත්ම, ජිහ්වාවගේ පැවැත්ම නාමයාගේ පැවැත්ම අවසන් වෙයි. මනස පිළිබඳව පැවති

ඥානයද නො උපදී. මෙය සම්පජඤ්ඤයෙන් යුත් අනුපාද පරිනිබ්බාණයවූ සකල සුඤ්ඤතාවන්ගේ පරමත්ථ සුඤ්ඤතාව නමි.”

(සුඤ්ඤ කථා නිමි)

දෙවැනි යුගනන්ධ වර්ගයයි.

---

## 3. පඤ්ඤා වග්ග

### 1 පඤ්ඤා කථා

1. (i) භාවනා වශයෙන් වැඩූ නැවත නැවත වැඩූ අනිච්චානුපස්සනාව (පඤ්චස්කන්ධය අනිත්‍ය ලෙස බැලීම) කවර ප්‍රඥාවක් සම්පූර්ණ කරයිද?

(මෙහි පහත දක්වන වාක්‍ය ඉදිරියට “භාවනා වශයෙන් වැඩූ, නැවත නැවත වැඩූ” යන වචන යෙදිය යුතුයි.)

(2) - දුක්ඛානුපස්සනාව (පඤ්චස්කන්ධය දුක්වූ පරිදි බැලීම) කවර ප්‍රඥාවක් සම්පූර්ණ කරයිද?

(3) - අනත්තානුපස්සනාව (පඤ්චස්කන්ධය ආත්මයක් නොවේයයි බැලීම) කවර ප්‍රඥාවක් සම්පූර්ණ කරයිද?

(4) - නිබ්බිදානුපස්සනාව (සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීම අනුව බැලීම) කවර ප්‍රඥාවක් සම්පූර්ණ කරයිද?

(5) - විරාගානුපස්සනාව (සියලු සංස්කාරයන්හි නොඇලීම අනුව බැලීම) කවර ප්‍රඥාවක් සම්පූර්ණ කරයිද?

(6) - නිරෝධානුපස්සනාව (සියලු සංස්කාරයන් නැති කිරීම අනුව බැලීම) කවර ප්‍රඥාවක් සම්පූර්ණ කරයිද?

(7) - භාවනාව වශයෙන් වැඩූ පටිනිස්සග්ගානුපස්සනාව (සියලු සංස්කාරයන් දුරුකිරීම අනුව බැලීම) කවර ප්‍රඥාවක් සම්පූර්ණ කරයිද?

(1) භාවනා වශයෙන් වැඩූ නැවත නැවත වැඩූ අනිච්චානුපස්සනාව, ජවන ප්‍රඥාව (අනිත්‍ය වශයෙන් වහාදුවන ප්‍රඥාව) සම්පූර්ණ කරයි.

(මෙහි පහත දක්වන වාක්‍ය ඉදිරියට “භාවනා වශයෙන් වැඩූ, නැවත නැවත වැඩූ” යන වචන යෙදිය යුතුයි.)

(2) - දුක්ඛානුපස්සනාව නිබ්බෙධික (සංස්කාරයන් කෙරෙහි කලකිරීම ඇති කරවන) ප්‍රඥාව සම්පූර්ණ කරයි.

(3) - අනත්තානුපස්සනාව මහා ප්‍රඥාව සම්පූර්ණ කරයි.

(4) - නිබ්බිදානුපස්සනාව, (තියුණු නුවණ) සම්පූර්ණ කරයි.

(5) - විරාගානුපස්සනාව, විපුල ප්‍රඥාව (වැඩුණු නුවණ) සම්පූර්ණ කරයි.

(6) - නිරෝධානුපස්සනාව ගැඹුරු නුවණ සම්පූර්ණ කරයි.

(7) - පටිනිස්සග්ගානු පස්සනාව අසාමන්ත ප්‍රඥාව (සෙසු නුවණට සමීප නුවණ) සම්පූර්ණ කරයි.

(8) - ජවන ප්‍රඥාව ආදී මේ සත් ප්‍රඥාවෝ පණ්ඩිත බව සම්පූර්ණ කරයි.

(9) - මේ පාණ්ඩිත්‍යය සහිතවූ මේ ප්‍රඥාවෝ අටදෙන පෘථුප්‍රඥාව (ලෞකික නුවණ) ඉක්මවූ නුවණ සම්පූර්ණ කරයි.

(10) - පෘථුප්‍රඥාව ආදී මේ ප්‍රඥාවෝ නවදෙන (හාස ප්‍රඥාව) සන්තෝෂ සහිත නුවණ සම්පූර්ණ කරයි.

මේ හාස ප්‍රඥාව නම් පටිභාන පටිසම්භිදාවයි. ඒ ඒ ප්‍රඥාවෝ තත්වාකාරයෙන් අවබෝධ කරන්නාවූ ඥානයයි.

ඒ ආර්ය පුද්ගලයා විසින් හේතු ඵල ආදී අර්ථයන් නිශ්චය කිරීමෙන් අත්ථපටිසම්භිදාව (- අර්ථ දැනීමේ ඥානය) ලබන ලද්දීවෙයි. ප්‍රත්‍යක්ෂ කරන ලද්දීවෙයි. නුවණින් ස්පර්ශකරන ලද්දීවෙයි. ඵලය උපදවන හේතුව ආදී පඤ්ච ධර්මයන් නිශ්චය කිරීමෙන් ධර්ම පටිසම්භිදාව (ඒ ධර්මයන් පිළිබඳ දැනීම) ලබන ලද්දීවෙයි. ප්‍රත්‍යක්ෂ කරණ ලද්දීවෙයි. නුවණින් ස්පර්ශ කරන ලද්දීවෙයි. ඒ අර්ථ ධර්ම දෙදෙනාගේ නිරුක්තිය නිශ්චය කිරීමෙන් නිරුක්ති පටිසම්භිදාව (ශබ්ද අර්ථ දෙකේ තත්වූ පරිදි දැනීම) ලබන ලද්දීවෙයි. ප්‍රත්‍යක්ෂ කරන ලද්දීවෙයි නුවණින් ස්පර්ශ කරන ලද්දීවෙයි.

**2.** ප්‍රතිභානය මුලින් කී තුන් වැදෑරුම් පටිසම්භිදා ඥානයන් නිශ්චය කිරීමෙන් පටිභාන පටිසම්භිදාව ලබන ලද්දී වෙයි. ප්‍රත්‍යක්ෂ කරන ලද්දීවෙයි. නුවණින් ස්පර්ශ කරන ලද්දී වෙයි. මෙසේ ඒ ආර්ය පුද්ගලයා විසින් මේ සිව් වැදෑරුම් පටිසම්භිදාවෝ ලබන ලද්දාහුවෙත්. ප්‍රත්‍යක්ෂ කරන ලද්දාහු

වෙති. නුවණින් ස්පර්ශ කරන ලද්දාහුවෙති. රූපයෙහි අනිත්‍යය අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද, රූපයෙහි දුක අනුව බැලීමේ නුවණ වැඩීමෙන්, නැවත නැවත වැඩීමෙන්, කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද, රූපයෙහි අනාත්ම ලක්ෂණය අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද, රූපයෙහි නිබ්බිදාව (-කලකිරීම) අනුව බැලීමේ නුවණ වැඩීමෙන්, නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද,

රූපයෙහි විරාගය (-නොඇලීම) අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද,

3. රූපයෙහි නිරොධය (-නැති කිරීම) අනුව බැලීමේ නුවණ වැඩීමෙන්, නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද,

රූපයෙහි පටිනිස්සග්ගය (-අත්හැර දැමීම) අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන්, කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද,

රූපයෙහි අනිත්‍ය අනුව බැලීමේ නුවණ වැඩීමෙන්, නැවත නැවත වැඩීමෙන් ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි. රූපයෙහි දුක අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් නිබ්බේධික ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

4. රූපයෙහි අනාත්ම ලක්ෂණය අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් මහා ප්‍රඥාව සම්පූර්ණ වෙයි. රූපයෙහි නිබ්බිදාව (-කලකිරීම) අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් තීක්ෂණ (-තියුණු) ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

රූපයෙහි විරාගය අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් විපුල (-පළල්) ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

රූපයෙහි නිරොධය අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් ගම්භිර ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

රූපයෙහි පටිනිස්සග්ගය අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් අසාමන්ත (-යටත් නැති) ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

මේනුවණ හත වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් පණ්ඩිතකම සම්පූර්ණ වෙයි. ඒ පාණ්ඩිත්‍යය සහිත මේ නුවණ අට වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් පෘථු ප්‍රඥාව සම්පූර්ණවෙයි. පෘථු ප්‍රඥාව සහිත මේ නුවණ නවය වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් හාස ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

මේ හාස ප්‍රඥාව නම් පටිභාන පටිසම්භිදා ඥානයයි.

**5.** ආර්ය පුද්ගලයා විසින් අර්ථයන් නිශ්චය කිරීමෙන් අර්ථ දැනීමේ නුවණ ලබන ලද්දේවෙයි. ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ වෙයි. ඥානයෙන් ස්පර්ශ කරන ලද්දේ වෙයි ධර්මයන් නිශ්චය කිරීමෙන් ධම්ම පටිසම්භිදාවද නිරුක්ති නිශ්චය කිරීමෙන් නිරුක්ති පටිසම්භිදාවද ප්‍රතිභානය නිශ්චය කිරමෙන් පටිභාන පටිසම්භිදාවද ලබන ලද්දාහු වෙති. ප්‍රත්‍යක්ෂ කරන ලද්දාහු වෙති. ඥානයෙන් ස්පර්ශ කරන ලද්දාහු වෙති.

(මෙසේ) ඒ ආර්ය පුද්ගලයා විසින් මේ සිව්වැදෑරුම් පටිසම්භිදා ඥානයෝ ලබන ලද්දාහු වෙති. ප්‍රත්‍යක්ෂ කරන ලද්දාහු වෙති. ප්‍රඥාවෙන් ස්පර්හ කරන ලද්දාහු වෙති.

වේදනාවේ අනිත්‍යය අනුව බැලීමේ (ii) නුවණ වැඩීමෙන්, නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද (iii) වේදනාවෙහි දුක අනුව බැලීමේ (මෙහි (ii) යොදන්න.)

වේදනාවෙහි අනාත්ම ලක්ෂණය අනුව බැලීමේ (මෙහි (ii) යොදන්න.)

වේදනාවෙහි කළකිරීම අනුව බැලීමේ (මෙහි (ii) යොදන්න.)

වේදනාවෙහි නොඇලීම අනුව බැලීමේ (මෙහි (ii) යොදන්න.)

වේදනාවෙහි නිරුද්ධව කිරීම අනුව බැලීමේ (මෙහි (ii) යොදන්න.)

වේදනාවෙහි අත්හැර දැමීම අනුව බැලීමේ (මෙහි (ii) යොදන්න.)

වේදනාවෙහි අනිත්‍යය අනුව බැලීමේ නුවණ වැඩීමෙන්, නැවත නැවත වැඩීමෙන් ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

වේදනාවෙහි දුක අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් නිබ්බෙධික ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

වේදනාවෙහි අනාත්ම ලක්ෂණය අනුව බැලීමේ නුවණ වැඩීමෙන්, නැවත නැවත වැඩීමෙන් මහා ප්‍රඥාව සම්පූර්ණවේ.

වේදනාවෙහි කලකිරීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන්, තියුණු ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

වේදනාවෙහි නොඇලීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැත වැඩීමෙන් විපුල (පුළුල්) ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

වේදනාවෙහි නිරුද්ධ කිරීම, අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් ගම්භීර ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

වේදනාවෙහි අත්හැර දැමීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන්, අසාමන්ත ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

මේ ප්‍රඥා හත වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් පාණ්ඩිත්‍යය ඇතිවේ. පාණ්ඩිත්‍යය සහිත ප්‍රඥා අට වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් පෘථු ප්‍රඥාව ඇතිවේ. පෘථු ප්‍රඥාව සහිත මේ ප්‍රඥා නවය වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් හාස ප්‍රඥාව ඇතිවේ. මේ හාස ප්‍රඥාව නම් පටිභාන පටිසම්භිදා ඥානයයි.

ඒ ආර්ය පුද්ගලයා විසින්:

අර්ථ නිශ්චය කිරීමෙන් අර්ථ පටිසම්භිදා ඥානයද

ධම්ම නිශ්චය කිරීමෙන් ධර්ම සම්භිදා ඥානයද

නිරුක්ති නිශ්චය කිරීමෙන් නිරුක්ති පටිසම්භිදා ඥානයද

ප්‍රතිභාන නිශ්චය කිරීමෙන් ප්‍රතිභාන පටිසම්භිදා ඥානයද

ලබන ලද්දේ වෙයි. ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ වෙයි. නුවණින් ස්පර්ශ කරන ලද්දේ වෙයි. මෙසේ ඒ ආර්ය පුද්ගලයා විසින් මේ සිව් වැදෑරුම් පටිසම්භිදා ඥානයෝ ලබන ලද්දාහු වෙති. ප්‍රත්‍යක්ෂ කරන ලද්දාහු වෙති. නුවණින් ස්පර්ශ කරන ලද්දාහු වෙති. සංඥාවෙහි (මෙහි 5 (ii) සංස්කාරයන්හි (මෙහි 6 (ii)

විඥානයෙහි (මෙහි 6 (ii) ඇසෙහි (මෙහි 6 (ii) ජරාමරණයෙහි අනිත්‍ය අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද?

ජරාමරණයෙහි දුක අනුව බැලීමේ (මෙහි 6 (ii) යොදන්න.)

ජරාමරණයෙහි අනාත්ම ලක්ෂණය අනුව බැලීමේ (මෙහි 6 (ii) යොදන්න.)

ජරාමරණයෙහි කලකිරීම අනුව බැලීමේ (මෙහි 6 (ii) යොදන්න.)

ජරාමරණයෙහි නොඇලීම අනුව බැලීමේ (මෙහි 6 (ii) යොදන්න.)

ජරාමරණයෙහි නිරුද්ධකිරීම අනුව බැලීමේ (මෙහි 6 (ii) යොදන්න.)

ජරාමරණයෙහි අත්හැර දැමීම අනුව බැලීමේ (මෙහි 6 (ii) යොදන්න.)

ජරාමරණයෙහි අනිත්‍යය අනුව බැලීමේ නුවණ වැඩීමෙන් ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

ජරාමරණයෙහි 'දුක අනුව බැලීමේ නුවණ වැඩීමෙන් (iv) නැවත නැවත වැඩීමෙන් (v) නිබ්බේධික ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

ජරාමරණයෙහි අනාත්ම ලක්ෂණය අනුව බැලීමේ (මෙහි iv) මහා ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

ජරාමරණයෙහි කලකිරීම අනුව බැලීමේ (මෙහි vi) තියුණු ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

ජරා මරණයෙහි නොඇලීම අනුව බැලීමේ (මෙහි iv) විපුල ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

ජරා මරණයෙහි නිරුද්ධ කිරීම අනුව බැලීමේ (මෙහි iv) ගැඹුරු නුවණ සම්පූර්ණ වෙයි.

ජරා මරණයෙහි අත්හැර දැමීම අනුව බැලීමේ (මෙහි iv) අසාමන්ත ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

මේ ප්‍රඥා හත වැඩීමෙන්, නැවත නැවත වැඩීමෙන් පාණ්ඩිත්‍යය ඇතිවේ.

**6.** (පාණ්ඩිත්‍යය සහිත) මේ ප්‍රඥා අට වැඩීමෙන්, නැවත නැවත වැඩීමෙන් පෘථු ප්‍රඥාව ඇතිවේ.

(පෘථු ප්‍රඥාව සහිත) මේ ප්‍රඥා නමය වැඩීමෙන්, නැවත නැවත වැඩීමෙන් හාස ප්‍රඥාව ඇතිවේ.

මේ හාස ප්‍රඥාව පටිභාන පටිසම්භිදා ඥානයයි.

ඒ ආර්ය පුද්ගලයා විසින් අර්ථනිශ්චය කිරීමෙන් අර්ථ පටිසම්භිදා ඥානයත්, ධර්ම නිශ්චය කිරීමෙන් ධම්ම පටිසම්භිදා ඥානයත්, නිරුක්ති නිශ්චය කිරීමෙන් නිරුක්ති පටිසම්භිදා ඥානයත්, ප්‍රතිභානය නිශ්චය කිරීමෙන් පටිභාන පටිසම්භිදා ඥානයත් ලබන ලද්දේ වෙයි. ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ වෙයි. නුවණින් ස්පර්ශ කරන ලද්දේ වෙයි. මෙසේ ඔහු විසින් මේ පටිසම්භිදා නුවණ හතර ලබන ලද්දේ වෙයි. ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ වෙයි. නුවණින් ස්පර්ශ කරන ලද්දේ වෙයි.

රූපයෙහි අනිත්‍ය අනුව බැලීමේ නුවණ (ii) වැඩීමෙන්, නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද? (iii)

අතීත අනාගත, වර්තමාන රූපයෙහි අනිත්‍ය අනුව බැලීමේ නුවණ වැඩීමෙන් (මේ ඡේදයේ නුවණ වැඩීමෙන් යන්න තිබෙන සෑම තැනකටම මෙහි (ii) යොදන්න.)

රූපයෙහි දුක අනුව බැලීමේ නුවණ වැඩීමෙන්,

අතීත අනාගත වර්තමාන රූපයෙහි දුක අනුව බැලීමේ නුවණ වැඩීමෙන්,

රූපයෙහි අනාත්ම ලක්ෂණය අනුව බැලීමේ නුවණ වැඩීමෙන්,

අතීත අනාගත වර්තමාන රූපයෙහි අනාත්ම ලක්ෂණය අනුව බැලීමේ නුවණ වැඩීමෙන්,

රූපයෙහි කලකිරීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන්,

රූපයෙහි නොඇලීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන්, අතීත අනාගත වර්තමාන රූපයෙහි නොඇලීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන්,

රූපයෙහි නිරුද්ධකිරීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන්,

අතීතානාගත වර්තමාන රූපයෙහි නිරුද්ධ කිරීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන්,

රූපයෙහි හැර දැමීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන්,

අතීතානාගත වර්තමාන රූපයෙහි, හැර දැමීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන්,

**7.** රූපයෙහි අනිත්‍යය අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි. අතීතානාගත වර්තමාන රූපයෙහි අනිත්‍ය අනුව බැලීමේ (ii) නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් (iii) ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

රූපයෙහි දුක අනුව බැලීමේ (මෙහි (ii) නිබ්බේධික ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

අතීත අනාගත වර්තමාන රූපයෙහි, දුක අනුව බැලීමේ (මෙහි (ii) ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

**8.** රූපයෙහි, අනාත්ම ලක්ෂණය අනුව බැලීමේ (ii) නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් (iii) මහා ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

අතීත අනාගත වර්තමාන රූපයෙහි අනාත්ම ලක්ෂණය අනුව බැලීමේ (මෙහි ii) ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

රූපයෙහි කළකිරීම අනුව බැලීමේ (මෙහි ii) "තියුණු" ප්‍රඥාව සම්පූර්ණ වෙයි. අතීතානාගත වර්තමාන රූපයෙහි, කළකිරීම අනුව බැලීමේ (මෙහි ii) ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

රූපයෙහි, නොඇලීම අනුව බැලීමේ (මෙහි ii) විපුල ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

**9.** අතීතානාගත වර්තමාන රූපයෙහි, නොඇලීම අනුව බැලීමේ (මෙහි 8 ii) ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

රූපයෙහි නිරොධය අනුව බැලීමේ (මෙහි 8 ii) ගම්භිර ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

අතීතානාගත වර්තමාන රූපයෙහි, නිරොධය අනුව බැලීමේ (මෙහි 8 ii) ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

**10.** රූපයෙහි හැරදැමීම අනුව බැලීමේ (ii) නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් (iii) අසාමන්ත ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

අතීතානාගත වර්තමාන රූපයෙහි, හැරදැමීම අනුව බැලීමේ (මෙහි ii) ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

මේ ප්‍රඥා හත වැඩීමෙන් පාණ්ඩිත්‍යය සම්පූර්ණ වෙයි.

පාණ්ඩිත්‍යය සහිත මේ ප්‍රඥා අට වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් "පෘථු ප්‍රඥාව" සම්පූර්ණ වෙයි.

පෘථු ප්‍රඥාව සහිත මේ ප්‍රඥා නවය වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් හාස ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

මේ හාස ප්‍රඥාව නම් පටිභාන පටිසම්භිදා ඥානයයි.

11. ඒ ආර්ය පුද්ගලයා විසින් අර්ථ විනිශ්චය කිරීමෙන් අත්ථ පටිසම්භිදා ඥානයද, ධර්ම විනිශ්චය කිරීමෙන් ධම්ම පටිසම්භිදා ඥානයද, නිරුක්ති විනිශ්චය කිරීමෙන් නිරුක්ති පටිසම්භිදා ඥානයද, ප්‍රතිභාන විනිශ්චය කිරීමෙන් පටිභාන පටිසම්භිදා ඥානයද, ලබන ලද්දේ වෙයි, ප්‍රත්‍යක්ෂ කරන ලද්දේවෙයි මෙසේ ඒ ආර්ය පුද්ගලයා විසින් මේ පටිසම්භිදා ඥාන සතර ලබන ලද්දාහු වෙති ප්‍රත්‍යක්ෂ කරන ලද්දාහු වෙති. නුවණින් ස්පර්ශ කරන ලද්දාහු වෙති, වේදනාවෙහි, සංඥාවෙහි, සංස්කාරයන්හි, විඥානයෙහි, ඇසෙහි, කණෙහි, නාසයෙහි, දිවෙහි කයෙහි, ජරා මරණයෙහි, අනිත්‍ය අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණ වේද? අතීතානාගත වර්තමාන ජරාමරණයෙහි, අනිත්‍ය අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණ වේද?

12. "ජරා මරණයෙහි දුක අනුව බැලීමේ නුවණ වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද? අතීතානාගත වර්තමාන ජරා මරණයෙහි, දුක අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද? ජරා මරණයෙහි, අනාත්ම ලක්ෂණය අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද? අතීතානාගත වර්තමාන ජරාමරණයෙහි, අනාත්ම ලක්ෂණ අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද? ජරා මරණයෙහි, කලකිරීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද? අතීතානාගත වර්තමාන ජරා මරණයෙහි කලකිරීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද? ජරා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මරණයෙහි නොඇලීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද?

13. අතීතානාගත වර්තමාන ජරා මරණයෙහි, නොඇලීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද? ජරා මරණයෙහි නිරුද්ධ කිරීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද? අතීතානාගත වර්තමාන ජරා මරණයෙහි, නිරුද්ධ කිරිම අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද? ජරාමරණයෙහි හැර දැමීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද? අතීතානාගත වර්තමාන ජරාමරණයෙහි, හැර දැමීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් කවර ප්‍රඥාවක් සම්පූර්ණවේද?

14. ජරාමරණයෙහි අනිත්‍යය අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි. අතීතානාගත වර්තමාන ජරාමරණයෙහි අනිත්‍යය අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි. ජරාමරණයෙහි, දුක අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් නිබ්බේධික ප්‍රඥාව සම්පූර්ණ වෙයි. අතීතානාගත වර්තමාන ජරා මරණයෙහි දුක අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

15. ජරාමරණයෙහි අනාත්ම ලක්ෂණය අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් මහා ප්‍රඥාව සම්පූර්ණ වෙයි. අතීතානාගත වර්තමාන ජරාමරණයෙහි අනාත්ම ලක්ෂණය අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි. ජරාමරණයෙහි කලකිරීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් තියුණු ප්‍රඥාව සම්පූර්ණ වෙයි. අතීතානාගත වර්තමාන ජරාමරණයෙහි කලකිරිම අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**16.** රූපයෙහි නොඇලීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් විපුල ප්‍රඥාව සම්පූර්ණ වෙයි. අතීතානාගත වර්තමාන ජරාමරණයෙහි නොඇලීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන්, නැවත නැවත වැඩීමෙන් ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි. ජරාමරණයෙහි නිරුද්ධ කිරීම් අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් ගැඹුරු ප්‍රඥාව සම්පූර්ණ වෙයි. අතීත අනාගත වර්තමාන ජරාමරණයෙහි නිරුද්ධ කිරීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් ජවන ප්‍රඥාව සම්පූර්ණවෙයි ජරාමරණයෙහි හැර දැමීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් අසාමන්ත ප්‍රඥාව සම්පූර්ණවෙයි. අතීත අනාගත වර්තමාන ජරාමරණයෙහි හැර දැමීම අනුව බැලීමේ නුවණ වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් ජවන ප්‍රඥාව සම්පූර්ණ වෙයි. මේ ප්‍රඥා හත වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් පාණ්ඩිත්‍යය සම්පූර්ණවෙයි. පාණ්ඩිත්‍යය සහිත මේ ප්‍රඥා අට වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් පුථු ප්‍රඥාව සම්පූර්ණවෙයි. පුථු ප්‍රඥාව සහිත මේ ප්‍රඥා නවය වැඩීමෙන් නැවත නැවත වැඩීමෙන් හාස ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

**17.** මේ හාස ප්‍රඥාව නම් පටිභාන ප්‍රතිසම්භිදා ඥානයයි. ඒ ආර්ය පුද්ගලයා විසින් අර්ථ විනිශ්චය කිරීමෙන් අර්ථ පටිසම්භිදා ඥානයද, ධර්ම විනිශ්චය කිරීමෙන් ධර්ම පටිසම්භිදා ඥානයද නිරුක්ති විනිශ්චය කිරීමෙන් නිරුක්ති පටිසම්භිදා ඥානයද, ප්‍රතිභාන විනිශ්චය කිරීමෙන් ප්‍රතිභාන පටිසම්භිදා ඥානයද යන මේ සිව් වැදෑරුම් ප්‍රතිසම්භිදා ඥාන ලබන ලද්දාහුය. ප්‍රත්‍යක්ෂ කරන ලද්දාහුය. නුවණින් ස්පර්ශ කරන ලද්දාහුය.

**18.** මහණෙනි, භාවනා වශයෙන් වඩනලද නැවත නැවත වඩනලද මේ සිව් වැදෑරුම් ධර්මයෝ සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්. (ii) ඒ කවර ධර්ම සතරක්ද යත්, සත්පුරුෂයන් සේවනය කිරීම, සදහම් ඇසීම, නුවණින් මෙනෙහි කිරීම, ලොකොත්තර ධර්මයන් ලැබීමට සුදුසු ශීලාදී ප්‍රතිපදාවෙන් යුක්තවීම (iii) මහණෙනි, මේ සිව් වැදෑරුම්

ධර්මයෝ වඩන ලද්දාහු බහුල වශයෙන් වඩන ලද්දාහු සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්. මහණෙනි, භාවිත බහුලිකෘතවූ මේ ධර්මයෝ සතර දෙනෙක් සකෘදාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්. (මෙහි (ii) යොදන්න.)

**19.** මහණෙනි, මේ සිව් වැදෑරුම් ධර්මයෝ වඩනලද්දාහු නැවත නැවත වඩන ලද්දාහු සකෘදාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්. මහණෙනි, වැඩූ නැවත නැවත වැඩූ මේ ධර්මයෝ සතර දෙනෙක් අනාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්. (මෙහි 18 (ii) යොදන්න.) මහණෙනි, වඩනලද නැවත නැවත වඩනලද මේ සිව් වැදෑරුම් ධර්මයෝ අනාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්. මහණෙනි, වඩනලද නැවත නැවත වඩනලද මේ ධර්මයෝ සතර දෙනෙක් රහත් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්. (මෙහි 18 (ii) යොදන්න.)

**20.** මහණෙනි, භාවිත, බහුලීකෘතවූ මේ ධර්මයෝ සතර දෙනෙක් මාර්ඵල ඥාන ආදී ප්‍රඥාව ලැබීම පිණිස පවතිත්. ප්‍රඥාවගේ වැඩීම පිණිස පවතිත්. ප්‍රඥාවගේ විපුල බව මහත් බව පිණිස පවතිත්. මහා ප්‍රඥාව පිණිස පවතිත්. පෘථු ප්‍රඥාව පිණිස පවතී, විපුල ප්‍රඥාව පිණිස පවතී, ගම්භීර ප්‍රඥාව පිණිස පවතිත්. අසාමන්ත ප්‍රඥාව පිණිස පවතිත්. භූරි ප්‍රඥාව පිණිස පවතිත්. ප්‍රඥාවගේ බහුල බව පිණිස පවතිත්. සීඝ ප්‍රඥාව පිණිස පවතිත්. ලඝු ප්‍රඥාව පිණිස පවතිත්. හාස ප්‍රඥාව පිණිස පවතිත්. ජවන ප්‍රඥාව පිණිස පවතිත්. තීක්ෂණ ප්‍රඥාව පිණිස පවතිත්. නිබ්බේධික ප්‍රඥාව පිණිස පවතිත්. (මෙහි 18 (ii) යොදන්න.)

**21.** මහණෙනි, වඩනලද නැවත නැවත වඩනලද මේ ධර්මයෝ සතර දෙන,

(මෙතැන් සිට වචන අගට පිණිස පවතිත් යනු යොදන්න) ප්‍රඥා ප්‍රතිලාභය - ප්‍රඥාවගේ අභිවෘද්ධිය - ප්‍රඥාවගේ විපුල බව - මහා ප්‍රඥාව - පෘථු ප්‍රඥාව - විපුල ප්‍රඥාව - ගම්භිර ප්‍රඥාව - අසාමන්ත ප්‍රඥාව - කෙලෙස් අභිභාසනය - කරන ප්‍රඥාව - භූරී ප්‍රඥාව පිණිස පවතිත්. ප්‍රඥාවගේ බහුල බව පිණිස පවතිත්. සීඝ්‍ර ධර්මයන් දැනගන්නා නුවණ සීඝ්‍ර ප්‍රඥාව - වහාම ධර්මයන් දැනගන්නා නුවණ ලඝු ප්‍රඥාව - සන්තෝෂ සහගත ප්‍රඥාව -

හාස ප්‍රඥාව - ඒ ඒ අර්ථයන් හිදුවන ප්‍රඥාව - ජවන ප්‍රඥාව - තියුණු නුවණ තීක්ෂණ ප්‍රඥාව පිණිස පවතිත්.

22. කෙලෙස් සිඳ බිඳ දමන හෝ කෙලසුන් කෙරෙහි කලකිරෙන ප්‍රඥාව නිබ්බේධික ප්‍රඥාව පිණිස පවතිත්. ප්‍රඥාව ලැබීම පිණිස පවතිත්, යන මෙහි ප්‍රතිලාභය නම් කුමක්ද? මාර්ග ඥාන හතර ඵලඥාන හතර පටිසම්භිදා ඥාන හතර අභිඥ්ඥා හය තෙසැත්තෑ නුවණ, සත් සැත්තෑ නුවණ යන මොවුන්ගේ ලැබීම, පිළි ලැබීම, පැමිණීම, වහා පැමිණීම, නුවණින් ස්පර්ශ කිරීම, ප්‍රත්‍යක්ෂ කිරීම, වෙත පැමිණීම, ප්‍රඥා ප්‍රතිලාභයයි, ප්‍රඥාව ලැබීම පිණිස පවතිත්, යන මෙහි ප්‍රඥා ප්‍රතිලාභය නම් මෙයයි. ප්‍රඥාවගේ වැඩීම පිණිස පවතිත් යන මෙහි ප්‍රඥා වෘද්ධිය නම් කුමක්ද? ශෛක්ෂ පුද්ගලයන් හත්දෙනාගේත් පෘථග්ජන කළ්‍යාණයාගේත් ප්‍රඥාව වැඩෙමින් පවතියි. රහතන් වහන්සේගේ ප්‍රඥාව වඩනලද වැඩීම ඇත්තීය, ‘ප්‍රඥා වෘද්ධිය පිණිස පවතිත්.’ යන මෙහි ප්‍රඥා වෘද්ධිය නම් මෙයයි.

23. “ප්‍රඥාවගේ විපුල බව පිණිස පවතිත්.” යන මෙහි ප්‍රඥා විපුලත්වය නම් කුමක්ද? ශෛක්ෂ පුද්ගලයන් හත්දෙනාගේ හා පෘථග්ජන කළ්‍යාණයාගේද, ප්‍රඥාව විපුලත්වයට පැමිණෙයි. රහතන් වහන්සේගේ ප්‍රඥාව විපුලත්වයට ගියාය. “ප්‍රඥාවගේ විපුලත්වය පිණිස පවතිත්.” යන මෙහි ප්‍රඥා විපුලත්වයයි.

24. “මහා ප්‍රඥාව පිණිස පවතිත්.” යන මෙහි ප්‍රඥාව නම් කවරීද? මහත්වූ අර්ථයන් නිරවශෙෂයෙන් ගණිනුයි පිළිසිඹියාපත් ආර්ය ශ්‍රාවකයාගේ ප්‍රඥාව මහා ප්‍රඥා නම් වේ.

(මේ වචන මුලට “මහත්වූ කියාද අගට “පිළිසිඹියාපත් ආර්ය ශ්‍රාවකයාගේ ප්‍රඥාව” යන්නද යොදා ගතයුතුයි.) ධර්මයන් - නිරුක්තීන් - ප්‍රතිභානයන් - සීල රාශීන් - සමාධි රාශීන් - ප්‍රඥා රාශීන් - විමුක්ති රාශීන් - විමුක්ති ඥාණදර්ශන රාශීන් - ස්ථාන අස්ථානයන් - මහා විහාර සමාපත්තීන් ආර්ය සත්‍යයන් - සතිපට්ඨානයන් - සම්මප්පධානයන් - ඉද්ධිපාදයන් - ඉන්ද්‍රියයන් - බල - බොජ්ක්ධංග ධර්මයන් - ආර්යමාර්ගය - සාමඤ්ඤඵල - අභිඥාවන් - පරමාර්ථනිර්වාණය - “මහා ප්‍රඥාව පිණිස පවතිත්” යන මෙහි මේ මහා ප්‍රඥාවයි.

**25.** "පුථු ප්‍රඥා බව පිණිස පවතිත්" යනු මෙහි පෘථු ප්‍රඥාව නම් කවරීද?

නොයෙක් නොයෙක් ස්කන්ධයන්හි නුවණ පවතීනුයි පෘථුප්‍රඥා නම්. (මෙහි ඒ ඒ වචන අගට "නුවණ පවතීනුයි පෘථුප්‍රඥා නම්." යන්න යෙදිය යුතුය.) ධාතූන්හි - ආයතනයන්හි - පටිච්ච සමුප්පාදයන්හි - ශූන්‍යතා වශයෙන් නොගතයුතු ධර්මයන්හි - නුවණ පවතීනුයි - අර්ථයන්හි නුවණ පවතීනුයි පුථු පඤ්ඤා නම්. ධර්මයන්හි - නිරුක්තීන්හි - ප්‍රතිභානයන්හි - සීල රාශීන්හි - සමාධි රාශීන්හි - ප්‍රඥා රාශීන්හි - විමුක්ති රාශීන්හි - විමුක්ති ඥාන දර්ශන රාශීන්හි - ස්ථාන අස්ථානයන්හි - විහාර සමාපත්තීන්හි - ආර්ය සත්‍යයන්හි - සතිපට්ඨානයන්හි - සම්‍යක් ප්‍රධානයන්හි - ඉද්ධිපාදයන්හි - ඉන්ද්‍රියයන්හි - බලයන්හි - බොජ්ක්ධංගයන්හි - ආර්ය මාර්ගයන්හි - සාමඤ්ඤ ඵලයන්හි - අභිඥානයන්හි - සාධාරණ ධර්මයන් ඉක්මවා පරමාර්ථ නිර්වාණයෙහි - නුවණ පවතීනුයි පුථු පඤ්ඤා නම්. පුථු ප්‍රඥාව පිණිස පවතිත්. යන මෙහි මේ පුථු ප්‍රඥාවයි.

**26.** "විපුල ප්‍රඥා භාවය පිණිස පවතිත්" යන මෙහි විපුල ප්‍රඥාව නම් කවරීද?

විපුල අර්ථයන් නිරවශෙෂයෙන් ගණීනුයි විපුලප්‍රඥා නම් (මෙතැන් සිට ඒ ඒ වචන මුලට "විපුල" යන්නද, 'නිරවශෙෂයෙන් ගණීනුයි විපුල ප්‍රඥා නම්" යන්න අගටද යෙදිය යුතුයි.) ධර්මයන් - නිරුක්තීන් - ප්‍රතිභානයන් - සීල රාශීන් - සමාධි රාශීන් - ප්‍රඥා රාශීන් - විමුක්ති රාශීන් - විමුක්ති ඥාන දර්ශන රාශීන් - ස්ථාන අස්ථානයන් - විහාර සමාපත්තීන් - ආර්ය සත්‍යයන් - සතිපට්ඨානයන් - සම්‍යක් ප්‍රධාන - ඉද්ධි පාද - ඉන්ද්‍රියයන් - බල - බොජ්ක්ධංගයන් - ආර්ය මාර්ග - සාමඤ්ඤ ඵලයන් - අභිඥාවන් - පරමාර්ථ නිර්වාණය.

**27.** "ගම්භීර ප්‍රඥාභාවය පිණිස පවතිත්" යන මෙහි මෙහි ගම්භීර ප්‍රඥාව නම් කවරීද?

ගැඹුරුවූ ස්කන්ධයන්හි නුවණ පවතීනුයි ගම්භිර ප්‍රඥානම්.

(මේ වචන මුලට 'ගැඹුරුවූ' කියාද ඒ වචන අගට 'නුවණ පවතීනුයි ගම්භිර ප්‍රඥා නම්" කියාද යොදන්න.)

- ධාතූන්හි - ආයතනයන්හි - පටිච්චසමුප්පාදයන්හි - ශූන්‍ය වශයෙන් නොගතයුතු ධර්මයන්හි - අර්ථයන්හි - ධර්මයන්හි - නිරුක්තීන්හි - ප්‍රතිභානයන්හි - ශීල රාශීන්හි - සමාධිරාශීන්හි - ප්‍රඥාරාශීන්හි - විමුක්ති රාශීන්හි - විමුක්ති ඥානදර්ශන රාශීන්හි - ස්ථාන අස්ථානයන්හි - විහාර සමාපත්තීන්හි - ආර්යසත්‍යයන්හි - සතිපට්ඨානයන්හි - සම්‍යක් ප්‍රධානයන්හී - ඉද්ධිපාදයන්හි - ඉන්ද්‍රියයන්හි - බලයන්හි - බොජ්ක්ධංගයන්හි - ආර්ය මාර්ගයන්හි - සාමඤ්ඤ ඵලයන්හි - අභිඥාවන්හි - පරමාර්ථ නිර්වාණයෙහි-

28. "ගම්භිර ප්‍රඥාභාවය පිණිස පවතිත්" යන මෙහි අසාමන්ත ප්‍රඥාව නම් කවරීද?

යම් පුද්ගලයෙකු විසින් අර්ථ නිශ්චය කිරීමෙන් අර්ථපටිසම්භිදාව (ii) ලබනලද්දී වේද, ප්‍රත්‍යක්ෂකරන ලද්දීවේද, ප්‍රඥාවෙන් ස්පර්ශකරන ලද්දී වේද, (ii) ධර්මනිශ්චය කිරීමෙන් ධර්මපටිසම්භිදාව (මෙහි (ii) යොදන්න) නිරුක්ති නිශ්චය කිරීමෙන් නිරුක්ති පටිසම්භිදාව (මෙහි (ii) යොදන්න) ප්‍රතිභානය නිශ්චය කිරීමෙන් ප්‍රතිභාන පටිසම්භිදාව (මෙහි (ii) යොදන්න) ඔහු විසින් අර්ථඥාන විෂයෙහිද ධර්මඥාන විෂයෙහිද නිරුක්ති ඥානවිෂයෙහිද ප්‍රතිභාන ඥානවිෂයෙහිද අන්කිසිවෙක් මැඩළිය හැක්කේ වෙයි.

29. ඒ ආර්ය පුද්ගලතෙමේ වනාහි අන්‍යයන් විසින් (පෘථග්ජනයන් විසින්) මැඩලිය හැකි නොවේනුයි අසාමන්ත ප්‍රඥාවයි.

කළ්‍යාණ පෘථග්ජනයාගේ නුවණ අට්ඨමක පුද්ගලයාගේ සොවාන් මාර්ගස්ථ පුද්ගලයාගේ නුවණට දුරෙහිය. බොහෝ දුරෙහිය. අතිශයින්ම දුරෙහිය. ලඟ නොවේ. හාත්පස නොවේ.

කළ්‍යාණි ප්‍රථග්ජනයා ගෙණ සසඳන විට සෝවාන් මාර්ගස්ථ පුද්ගලතෙමේ අසාමන්ත ප්‍රාඥයෙකි. ඔහුට වඩා ඇත්වූ නුවණ ඇත්තෙකි.

සෝවාන් මාර්ගස්ථ පුද්ගලයාගේ ප්‍රඥාව සොතාපන්නයාගේ (සෝවාන් ඵලයට පැමිණි පුද්ගලයාගේ) ප්‍රඥාවට වඩා දුරෙහිය, බොහෝ දුරෙහිය, අතිශයින්ම දුරෙහිය, සමීපයෙහි නොවේ, හාත්පස නොවේ.

සෝවාන් මාර්ගයට පැමිණි පුද්ගලයා ගෙණ සසඳනවිට සොතාපන්නයා සෝවාන් පලයට පැමිණි පුද්ගල අසාමන්ත ප්‍රාඥ නම් වේ.

සෝවාන්ඵලස්ථ පුද්ගලයාගේ ප්‍රඥාව සකෘදාගාමි පුද්ගලයාගේ ප්‍රඥාවට වඩා දුරෙහිය, බොහෝ දුරෙහිය අතිශයින්ම දුරෙහිය, සමීපයෙහි නොවේ. හාත්පස නොවේ සකෘදාගාමි පුද්ගලයා ගෙණ සසඳනවිට අනාගාමි පුද්ගලයා අසාමාන්ත ප්‍රාඥා නම් වේ. අනාගාමි පුද්ගලයාගේ ප්‍රඥාව රහතන් වහන්සේගේ ප්‍රඥාවට වඩා දුරෙහිය, ඉතා දුරෙහිය, අතිශයින් දුරෙහිය, සමීපයෙහි නොවේ, හාත්පස නොවේ අනාගාමි පුද්ගලයා ගෙණ සසඳනවිට රහතන් වහන්සේ අසාමන්ත ප්‍රාඥ නම් වනසේක. රහතන් වහන්සේගේ ප්‍රඥාව පසේබුදුන් වහන්සේගේ ප්‍රඥාවට වඩා දුරෙහිය, ඉතා දුරෙහිය අතිශයින්ම දුරෙහිය. සමීපයෙහි නොවේ හාත්පස නොවේ රහතන් වහන්සේ ගෙණ සසඳනවිට පසේබුදුන් වහන්සේ අසාමන්ත ප්‍රාඥ නම් වනසේක.

**30.** පසේබුදුන්ද දෙවියන් සහිත ලෝකයද ගෙණ සසඳනවිට තථාගත අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ අග්‍රවූ අසාමන්ත ප්‍රාඥ නම් වනසේක. එසේම ප්‍රඥාවේ ප්‍රභෙදයන්හි දක්ෂයෙකි. අපමණ ප්‍රභෙද ඇති නුවණින් යුත් කෙනෙකි. පටිසම්භිදා නුවණ ලැබූකෙනෙකි. විශාරද දැනුම් හතරක් ඇති කෙනෙකි. ප්‍රඥාබල දශයක් ඇති කෙනෙකි. ඒ ප්‍රඥා ඇතිබැවින්ම පුරිසාසභය හෙවත් අභිමංගල සම්මතවූ පුරුෂයෙකි. පුරුෂ සිංහය හෙවත් තැති නොගන්නා පුරුෂයෙකි. පුරුෂනාගයෙකි. හෙවත් නිවැරදි මහා පුරුෂයෙකි. පුරුෂාජානීයය, හෙවත් හැම දෙයම දන්නා පුරුෂයෙකි. පුරුෂධුරය උසුලන්නෙකි. නියමම පුරුෂයාය, හෙවත් ලෝකයා උදෙසාම කරන කටයුතු ඇත්තෙකි. ගණන් වශයෙන් හෝ ප්‍රභාව වශයෙන් හෝ අන්තයක් නැත්තාවූ ඥාන ඇති කෙනෙකි. විනෝදයන්ගේ මොහ නැමැති අඳුර නසන බැවින් අපමණ ඥාන තේජස් ඇති කෙනෙකි. ප්‍රඥාව නිසා තුන් ලෝකයෙහිම පතළ ගුණ කථා ඇතියෙකි. ප්‍රඥා නමැති

ධනයෙන් ආඪ්‍ය කෙනෙකි. ප්‍රඥා නමැති මහා ධනයක් ඇති කෙනෙකි. පැසසියයුතුවූද, තැන්පත්වූද විශාලවූද, ප්‍රඥා ධනයක් ඇත්තෙකි. සත්වයන් සසර කතරින් නිවන් නැමැති අභයපුරයට පමුණුවන්නෙකි. සත්වයන් හික්මවන්නෙකි. දහම් දෙසා සැක දුරුකිරීමෙන් කරුණු අවබොධකර දෙන්නෙකි. පමුණුවන්නෙකි. නිශ්චය කරන්නෙකි. පැණවූ දෙය ප්‍රතිපත්තිවල යෙදීමෙන් පෙන්වන්නෙකි. ඒ ප්‍රතිපත්ති අනුව පිළිපදින්නන් විපත ලබාදීමෙහි පහදවන්නෙකි. එසේම ඒ භාග්‍යවතුන් වහන්සේ සිය සතන්හි නූපන් ආර්යමාර්ගය උපදවන්නාහ. බුදුන්ගේ සන්තානයන්හි පළ නොවූ මාර්ගය පහළකරන්නාහ. අනිකෙකු නොකී මාර්ගය කියන්නාහ. තමන් උපදවාගත් ආර්යමාර්ගය ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන් මාර්ගය දන්නාය. විනේය ජනයන්ගේ සන්තානයෙහි ඉපදවිය යුතු මාර්ගයෙහි දක්ෂයෙකි. බෝසත්වරුන්ට කිවයුතු මාර්ගයෙහි විචක්ෂණයෙකි.

31. මේ ශාසනයට පසුව පැමිණ ශීලාදී ගුණසම්පන්නවූ උන්වහන්සේගේ ශ්‍රාවකයෝ දැන් උන්වහන්සේ ගිය මග අනුව යෙත්. ඒ භාග්‍යවතුන් වහන්සේ දතයුත්තම දන්නාසේක. බැලියයුත්තම බලනසේක, උන්වහන්සේ ලෝකයාට ඇසක්ම වූසේක. ඥානයම වූසේක. ධර්මයම වූසේක. ශ්‍රෙෂ්ඨත්වයෙන් බ්‍රහ්මවූසේක. උන්වහන්සේ ධර්මය වදාරන්නාහ. විවිධාකාරයෙන් ධර්මයෙන් පවත්නාහ අර්ථය පමුණුවන්නාය. අමෘතය දෙන්නාය. ධර්මයට ස්වාමීය. පෙර බුදුවරුන් මෙන්ම බුද්ධත්වයට පැමිණිසේක.

32. ඒභාග්‍යවතුන් වහන්සේ විසින් නුවණින් නොදත් දෙයක් හෝ නොදුටු දෙයක් හෝ නොපැමිණි දෙයක් හෝ පසක් නොකළ දෙයක් හෝ ස්පර්ශ නොකළ දෙයක් හෝ නැත්තේය. අතීත, අනාගත, වර්තමාන කාලවලට අයිති දේ ඇතුළු සියලු ධර්මයෝ සර්වප්‍රකාරයෙන්ම බුදුරජාණන් වහන්සේගේ ඥානය ඉදිරියෙහි පෙනී සිටිත්.

33. ආත්මාර්ථය, පරාර්ථය උභයාර්ථය, මෙලොව අර්ථය, පරලොව අර්ථය, නොගැඹුරු අර්ථය, ගැඹුරු අර්ථය, සැඟවුණු අර්ථය, වැසුණු අර්ථය, පැමිණවියයුතු අර්ථය, පමුණුවනලද

අර්ථය නිවැරදි අර්ථය කෙළෙස් රහිත අර්ථය, පිරිසිදු අර්ථය නොවෙනස් වන අර්ථය හෙවත් නිර්වාණය යන යම්කිසි දතයුතු දෙයක් වේනම ඒ සියල්ල බුදු නැණ ඇතුළත පැතිර පවතිත්.

**34.** සියලු කාය කර්මය, බුදුන්ගේ නුවණ අනුව පවතී. සියලු මනඃ කර්මය (සිතින් සිතන දෙය) බුදුන්ගේ නුවණ අනුව පවතී. බුදුන්ගේ නුවණ අතීත කාලයෙහි ආවරණ රහිතය. නොපැකිලේ, බුදුන්ගේ නුවණ අනාගත කාලයෙහි ආවරණ රහිත වෙයි, හෙවත් නොපැකිලෙයි. බුදුන්ගේ නුවණ වර්තමාන කාලයෙහි ආවරණ රහිත වෙයි. හෙවත් නොපැකිළෙයි.

දතයුතුදෙය යම්තාක් පවතීනම් බුදුන්ගේ නුවණ ඒතාක් පවතී. බුදුන්ගේ නුවණ යම්තාක් පවතීනම් දතයුතු දෙය එපමණක්මය. බුදුන්ගේ නුවණ දතයුතුදෙය කෙළවර කොට පවතී. දතයුතු දෙය බුදුන්ගේ නුවණ කෙළවරකොට පවතී. දතයුතු දෙය ඉක්මවා ඥානය නොපවතී. ඥානය ඉක්මවා නෙය (දතයුත්තක්) ඥාන මාර්ගයක් නැත. ඒ ධර්මයෝ ධර්මයෝ හෙවත්නේය. ඥාන යන දෙක ඔවුනොවුන් කෙළවරකොට පවත්නා සුළුයහ.

**35.** යම්සේ මනාව ගටනලද කරඬු පියන් දෙකක් අතරින් යට කරඬු පියන උඩ කරඬු පියන නොඉක්මවයිද, උඩ කරඬු පියන යට කරඬු පියන නොඉක්මවයිද, ඒ පියන් දෙක එකිනෙක කෙළවරකොට පවතිත්ද,

එමෙන්ම භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ නේය ඥාන යන දෙක එකිනෙක කෙළවරකොට සිටිනසුළුය. නේය මණ්ඩලය යම්තාක් නම් ඥානය එපමණකි. ඥාණය යම්තාක් නම් නේය මණ්ඩලය එපමණය. ඥාණය නෙයමණ්ඩලය කෙළවරකොට පවතී. නේය මණ්ඩලය ඥානය කෙළවර කොට පවතී. නේය මණ්ඩලය ඉක්මවා ඥාණය නොපවතී. ඥාණය ඉක්මවා යන නේය මාර්ගයක් නැත. ඒ ධර්මයෝ ඔවුනොවුන් කෙළවරකොට පවත්නා සුළුයහ.

**36.** සියලු ධර්මයන් කෙරෙහි සම්බුදුන්ගේ ඥාණය පවතී, සියලු ධර්මයෝ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ආවර්ජනාව හා සම්බන්ධවෙත්. කැමැත්ත අනුව පවත්නේය. මෙනෙහිකිරීම

හා බැඳී පවත්නේය. සිත ඉපදීම හා බැඳී පවත්නේය. සියලු සත්වයන් කෙරෙහි බුදුන්ගේ නුවණ පවතී. බුදුරජාණන් වහන්සේ සියලු සත්වයන්ගේ ආසය (කුසලාකුශල චිත්ත සන්තානය) දන්නාසේක. අධිමුක්තිය චිත්තප්‍රවාහය දන්නාසේක.

37. කෙලෙස් අඩු, කෙලෙස් නැති කෙලෙස් වැඩි තියුණු ඉඳුරන් ඇති මොලොක් ඉඳුරන් ඇති යහපත් ආකාර ඇති අයහපත් ආකාර ඇති පහසුවෙන් අවබොධ කරවිය හැකි පහසුවෙන් අවබොධ නොකටහැකි නිවන් දැක්වීමට සුදුසු හා නුසුදුසු සත්වයන් දන්නා සේක. දෙවියන් මාරයන්, බ්‍රහ්මයන් මහණ බමුණන් සහිත දෙව් මිනිසුන්, සත්ව සමූහය, බුද්ධ ඥානයේ ඇතුළත්වෙයි.

38. යම්සේ තිමි තිමිංගල, මත්ස්‍යයන්ගේ පටන්, යම්තාක් මත්ස්‍යයන් හා කැස්බෑවෝ මහමුහුද ඇතුළත පරිවර්තනය වෙත්ද, එපරිද්දෙන්ම දෙවියන්, මාරයන්, බ්‍රහ්මයන්, මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් ප්‍රජාව බුද්ධ ඥානය ඇතුළත පරිවර්තනයවේ.

ගුරුළු රජ පටන් සියලුම පක්ෂීන් අහසේ එක් ප්‍රදේශයකම පරිවර්තනය වන්නාක් මෙන්, සැරියුත් මහ රහතන් වහන්සේ වැනි මහ නුවණ ඇත්තෝ පවා බුද්ධ ඥාණයෙහි එක් ප්‍රදේශයකම පරිවර්තනය වෙත්. බුදුන්ගේ නුවණ දෙව් මිනිසුන්ගේ නුවණට වඩා පැතිර එය ඉක්මවා සිටියි. දක්ෂවූ අනුන් හා වාදකොට පළපුරුදුවූ විදුළි එළියෙන් අඳුරෙහි අස්ලොම් විදින්නාක් මෙන්, ප්‍රඥාවෙන් අන්‍ය දර්ශනයන් බිඳිමින් හැසිරෙන යම් ඒ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති ශ්‍රමණ පණ්ඩිතයෝ, වෙත් නම් ඔව්හු සැඟවුණාවූද, වැසුණාවූද, ප්‍රශ්නයන් පිළියෙළකර කර බුදුන් වෙත එළඹ විචාරත්. බුදුරජාණන් වහන්සේ විසින් ඒ ප්‍රශ්නයෝ කියන ලදහ. විසඳන ලදහ, දක්වන ලද හේතු ඇතියහ. ඒ පණ්ඩිතයෝ බුදුරජාණන් වහන්සේගේ පා මුල වැඳ වැටුනෝ වෙත්. ශ්‍රාවක බවට පැමිණෙත් ඉන්පසු බුදුරජාණන් වහන්සේ ඔවුන් අතර ප්‍රඥාවෙන් අතිශයින් බබළනසේක්නුයි අග්‍රවූ අසාමන්ත ප්‍රාඥ නම් වනසේක.

**39.** "අසාමන්ත ප්‍රාඥබව පිණිස පවතිත්" යන මෙහි යන මේ අසාමන්ත ප්‍රඥාවයි.

"භූරිප්‍රාඥබව පිණිස පවතිත්" යනමෙහි භූරිපඤ්ඤ නම් කවරීද?

රාගය මැඩපවත්තාහුයි භූරිපඤ්ඤ නමි. රාගය මැඩපැවැත්වූ තැනැත්තා භූරිපඤ්ඤ නමි.

(මෙහි පහත දක්වන වචනවල පළමුවෙනි වචනය අගට "මැඩපවත්වානුයි භූරිපඤ්ඤා නමි" කියාද, එම දෙවෙනි වචනය අගට "මැඩපැවැත්වූ තැනැත්තා භූරිපඤ්ඤ නම් වේ" කියාද යෙදිය යුතුයි)

ද්වේෂය- ද්වේෂය- මොහය- මොහය- ක්‍රොධය- ක්‍රොධය- බද්ධ වෛරය- බද්ධ වෛරය- ගුණමකුකම- ගුණමකුකම- පළිගැනීම- පළිගැනීම- ඊර්ෂ්‍යාව- ඊර්ෂ්‍යාව- මසුරුකම- මසුරුකම- රැවටීම- රැවටීම- සටබව- සටබව- ඉදිමුණුගතිය- ඉදිමුණගතිය- එකට එක කිරීම- එකට එක කිරීම- මානය- මානය- අතිමානය- අතිමානය- යොවුන් මදාදිමදය- ඒ මදාදිය- ප්‍රමාදය- ප්‍රමාදය - සියලු කෙලෙස්- සියලු කෙලෙස්- සියලු දුසිරිත්- සියලු දුසිරිත්- සියලු සිතුවිලි- සියලු සිතුවිලි- සසරට පමුණුවනලද සියලු කර්ම- සසරට පමුණුවන සියලු කර්ම-

**40.** රාගය සතුරෙකි. ඒ සතුරා මඩනා සුලු ප්‍රඥාව භූරිපඤ්ඤ නමි. (මේ වචන අගට "ඒ සතුරා මඩනා සුලු ප්‍රඥාව භූරිපඤ්ඤ නමි'යි යොදන්න) ද්වෙෂය - මොහය- ක්‍රොධය- බද්ධවෛරය- ගුණමකුකම- පළිගැනීම- ඊර්ෂ්‍යාව- රැවටීම සටබව- ඉදිමුණ ගතිය- එකටඑක කිරීම- මානය - අතිමානය- මදය - ප්‍රමාදය- සියලු කෙලෙස්- සියලු දුසිරිත්- සියලු සිතුවිලි - සසරට පමුණුවන සියලු කර්ම.

**41.** භූරියයි කියනුයේ පොළොවටය. ඒ පොළොව හා සමානව පැතුරුනු පුළුල්වූ ප්‍රඥාවෙන් යුක්තවූ තැනැත්තා භූරිපඤ්ඤ නම් වේ. තවද භූරි යනු ප්‍රඥාවට නමකි. ඒ භූරි නම්වූ මේධාව හෙවත් නුවණ මේරීමෙන් ප්‍රධානවූ භූරි පඤ්ඤා නම් වේ. භූරි ප්‍රඥාව පිණිස පවතිත්, යන මෙහි ප්‍රඥා බහුල බව නම් කුමක්ද? මේ ශාසනයෙහි කල්‍යාණ පෘථග්ජනයෙක් හෝ

ආර්ය පුද්ගලයෙක් ප්‍රඥාව ගරුකොට වසයි. ප්‍රඥානුකූල පැවතුම් ඇත්තේ වෙයි. ප්‍රඥාවෙන් යුක්තවූ සිත් සතන් ඇත්තෙක් වෙයි. ප්‍රඥානුකූලව වරදින් මිදුනෙක් වෙයි. ප්‍රඥාව ධජයක්කොට ඇත්තේ වෙයි. ප්‍රඥාව හේතුවක්කොට ඇත්තේ වෙයි. ප්‍රඥාව අධිපතිකොට වෙසෙයි. විමසුම් බහුලකොට ඇත්තෙක් වෙයි. නන් වැදෑරුම් විමසුම් බහුලකොට ඇත්තෙක් වෙයි, ප්‍රකට කිරීම් බහුලකොට ඇත්තෙක් වෙයි. ඒ ඒ ධර්මයන් මනාකොට බැලීම් බහුලකොට ඇත්තෙක් වෙයි. ඒ ඒ ධර්මයන් මනා කොට බැලීම් ස්වභාවකොට ඇත්තේ වෙයි. ඒ ඒ ධර්මයන් ප්‍රකටකොට පැහැදිලිව දැන වසන්නෙක් වෙයි. ඒ ප්‍රඥාවම චරිතයකොට ඇත්තෙක් වෙයි. එයම ගරුකොට ඇත්තෙක් වෙයි. එයම බහුලකොට ඇත්තෙක් වෙයි. එයට නතුවෙයි. එයට නැඹුරුව වෙසෙයි. එයට බරව වෙසෙයි. එහි ඇලී වෙසෙයි. එයම අධිපතිකොට වෙසෙයි.

**42.** යම්සේ කට්ටි ගැසෙන තැනැත්තා ගණබාහුලිකයා යයි කියනු ලැබේද, සිවුරු ගරුකොට ගන්නා චීවරබාහුලික යයි කියනු ලැබේද, පාත්‍රගරුකයා පාත්‍රබාහුලිකයයි කියනු ලැබේද, සෙනසුන් ගරුකොට වසන්නා සේනාසන බාහුලික යායි කියනු ලැබේද, එසේම මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් ප්‍රඥා ගරුකයෙක් වෙයි. ප්‍රඥා චරිතයෙක් වෙයි. ප්‍රඥාවෙන් යුත් චිත්ත සන්තාන ඇත්තෙක් වෙයි. ප්‍රඥානුකූලව වරදින් මිදුනෙක් වෙයි. ප්‍රඥාව ධජකොට ඇත්තෙක් වෙයි. ප්‍රඥාව කෙතුවක්කොට ඇත්තෙක් වෙයි. ප්‍රඥාව අධිපතිකොට වසයි. විමසීම බහුල කොට ඇත්තෙක් වෙයි. විවිධ විමසුම් බහුලකොට ඇත්තෙක් වෙයි. ප්‍රකට කිරීම බහුලකොට ඇත්තේ වෙයි. මනාකොට බැලීම් බහුලකොට ඇත්තෙක් වෙයි. මනාකොට බැලීම ස්වභාවකොට ඇත්තෙක් වෙයි. පැහැදිලිව දැන වසන්නෙක් වෙයි. එයම චරිතකොට ඇත්තෙක් වෙයි. එය ගරුකොට ඇත්තේවෙයි එය බහුලකොට ඇත්තේ වෙයි. එයට නතුවූයේ වෙයි. එයට නැඹුරුවූයේ වෙයි. එහි ඇළුනෙක් වෙයි. එය අධිපති කොට ඇත්තෙක් වෙයි. ප්‍රඥා බහුල බව පිණිස පවතිත් යන මෙහි මේ ප්‍රඥා බහුල බවයි.

43. "සීඝ්‍ර ප්‍රඥා බව පිණිස පවතිත්" යන මෙහි සීඝ්‍ර ප්‍රඥාව නම් කුමක්ද? සීඝ්‍රව සිල් සම්පූර්ණ කෙරේනුයි සීඝ පඤ්ඤා නමි. (මේ වචන අගට "සම්පූර්ණ කෙරේනුයි සීඝ පඤ්ඤා නමි." කියා යොදාගත යුතුයි) සීඝ්‍ර ඉන්ද්‍රිය සංවරය සීඝ්‍ර වැළඳීම පමණ දැනීම - සීඝ්‍ර නිදි වැරීමෙහි යෙදීම - සීඝ්‍ර සිල් සමූහය - සීඝ්‍ර සමාධි සමූහය- සීඝ්‍ර ප්‍රඥා සමූහය- සීඝ්‍ර විමුක්ති සමූහය- සීඝ්‍ර විමුක්ති ඥාන දර්ශන සමූහයන්- සීඝ්‍ර තැන් නොතැන් පළවිදිනුයි සීඝ පඤ්ඤා නමි. සීඝ්‍ර විහාර සමාපත්තීන්- සීඝ්‍ර ආර්ය සත්‍යයන් - සීඝ්‍ර සතිපට්ඨානයන් වඩානුයි සීඝ පඤ්ඤා නමි. සීඝ්‍රව සම්‍යක් ප්‍රධාන වඩානුයි සීඝ පඤ්ඤා නමි. සීඝ්‍රව ඉද්ධිපාද (මේ වචන අගට 'වඩානුයි සීඝ පඤ්ඤා නමි' යනු යොදාගත යුතුයි) සීඝ්‍රව ඉන්ද්‍රියන් ශ්‍රාමණ්‍ය ඵල ප්‍රත්‍යක්ෂ සීඝ්‍රවබල- සීඝ්‍රව බොජ්ක්ධංජගය සීඝ්‍රව ආර්යමාර්ගය- සීඝ්‍රව කෙරේනුයි සීඝ පඤ්ඤා නමි. සීඝ්‍රව අභිඥාවන් අවබොධ කෙරේනුයි සීඝ්‍ර පඤ්ඤා නමි. සීඝ්‍රව පරමාර්ථ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කෙරේනුයි සීඝ පඤ්ඤා නමි. සීඝ්‍ර ප්‍රඥා බව පිණිස පවතිත් යන මෙහි මේ සීඝ්‍ර ප්‍රඥාවයි.

44. "ලඝු ප්‍රඥා බව පිණිස පවතිත්" යන මෙහි ලඝු ප්‍රඥාව නම් කුමක්ද?

ලඝු ලඝුව සිල් සම්පූර්ණ කෙරේනුයි ලහු පඤ්ඤා නමි. (මෙහි මේ වචන අගට "සම්පූර්ණ කෙරේනුයි ලහු පඤ්ඤානමි" යනුද ඒ වචන ඉදිරියට "ලඝු ලඝුව" කියාද යොදන්න) ඉන්ද්‍රියසංවරය- වැළඳීමෙහි පමණ දැනීම- නිදි වැරීමෙහියෙදීම- සිල් සමූහය- සමාධි සමූහය- ප්‍රඥා සමූහය- විමුක්ති සමූහය- විමුක්ති ඥානදර්ශන සමූහය- තැන් නොතැත් පිළිවිදීනුය ලහු පඤ්ඤා නමි. විහාර සමාපත්තීන්- ආර්ය සත්‍යයන් පිළිවිදිනුයි ලහු පඤ්ඤා නමි. සතිපට්ඨාන වඩානුයි ලහු පඤ්ඤා නමි. (මෙහි මේ වචන අගට "වඩානුයි ලහු පඤ්ඤා නමි." කියාද ඒ වචන මුලට "ලඝු ලඝුව" කියාද යොදන්න) සම්‍යක් ප්‍රධාන ඍද්ධි පාද - ඉන්ද්‍රිය - බල - බොජ්ක්ධංග - ආර්යමාර්ගය - ශ්‍රාමණ්‍ය පල ප්‍රත්‍යක්ෂ කෙරේනුයි ලහු පඤ්ඤා නමි. අභිඥාවෙන් අවබෝධ කෙරේනුයි ලහු පඤ්ඤා නමි. පරමාර්ථ

නිර්වාණය අවබොධ කෙරේනුයි ලහු පඤ්ඤා නම්. "ලඝු ප්‍රඥාව බව පිණිස පවතිත්." යන මෙහි මේ ලඝු ප්‍රඥාවයි.

**45.** "හාස ප්‍රඥාව බව පිණිස පවතිත්" යන මෙහි හාස ප්‍රඥාව නම් කුමක්ද?

මේ සාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් හාස බහුලව ප්‍රීති වෙදනා බහුලව සතුටු බහුලව ප්‍රමෝද බහුලව සිල් සපුරානුයි හාසපඤ්ඤා නම් හාසබහුලව ප්‍රීතිබහුලව සතුටු බහුලව ප්‍රමෝද බහුලව ඉන්ද්‍රිය සංවරය සපුරානුයි හාස පඤ්ඤා නම්. (මේ වාක්‍ය මුලට "හාස බහුලව ප්‍රීති බහුලව සතුටු බහුලව ප්‍රමොද බහුලව" කියාද අගට "සපුරානුයි හාස පඤ්ඤා නම්." කියාද යොදන්න) - නිදිමැරීමෙහි යෙදීම - සිල් සමූහය - ප්‍රඥා සමූහය විමුක්ති සමූහය- විහාර සමාපත්තීන් - ආර්යසත්‍යයන් ප්‍රතිවෙධ කෙරේනුයි හාස පඤ්ඤා නම් සීවටන් වඩානුයි - සම්‍යක් ප්‍රධාන - ඍද්ධිපාද - ඉන්ද්‍රිය - බල - බොජ්ක්ධංග - ආර්ය මාර්ගය- ශ්‍රාමණ්‍යපල - අභිඥාවන් පිළිවිදිනුයි හාසප්‍රඥානම්. පරමාර්ථයෙන් නිර්වාණය ප්‍රත්‍යක්ෂ කෙරේනුයි හාස පඤ්ඤා නම්. "හාස ප්‍රඥා බව පිණිස පවතිත්" යන මෙහි මේ හාස ප්‍රඥාවයි.

**46.** "ජවන ප්‍රඥාව පිණිස පවතිත්" යන මෙහි ජවන ප්‍රඥාව නම් කුමක්ද?

අතීතවූ හෝ අනාගතවූ හෝ වර්තමානවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ දැඩිවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළංවූ හෝ යම්කිසි වේදනාවක් යම්කිසි සංඥාවක්, යම්කිසි සංස්කාර කෙනෙක් යම්කිසි විඤ්ඤාණයක් ඇත්නම් ඒ සියල්ල අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් අනාත්ම වශයෙන් වහාදිවේනුයි' ජවන පඤ්ඤා නම්. අතීත අනාගත වර්තමාන චක්ෂුසත් අතීතානාගත වර්තමාන ජරාමරණත් අනිත්‍යය දුක්ඛ අනාත්ම වශයෙන් වහාදිවේනුයි ජවන පඤ්ඤා නම්.

අතීතානාගත වර්තමාන රූපය ගෙවීයන අර්ථයෙන් අනිත්‍යය, බිය එළවන අර්ථයෙන් දුකය, නිසරු අරුතින් අනාත්මයැයි තුළනයකොට තීරණයකොට ප්‍රකටකොට ව්‍යක්තකොට රූප නිරොධ නම් වූ නිර්වාණයෙහි වහාදිවේනුයි ජවන පඤ්ඤා නම්.

අතීතානාගත වර්තමාන වේදනා සංඥාසංස්කාර විඥානය චක්ෂුස ජරාමරණ යන මේවා ගෙවීයන අර්ථයෙන් අනිත්‍යයි. බිය එළවන අර්ථයෙන් දුක්ය. නිසරුයි යන අර්ථයෙන් අනාත්මයැයි තුළනයකොට තීරණයකොට ප්‍රකටකොට ව්‍යක්තකොට ඔවුන්ගේ නිරොධය නම්වූ නිර්වාණයෙහි වහා දිවේනුයි ජවන පඤ්ඤා නමි. අතීතානාගත වර්තමානවූ රූපය, වේදනාව, සංඥාව, සංස්කාර, විඥානය, ඇස, කණ, නාසය, දිව, කය, සිත ජරාමරණය, අනිත්‍යය සංස්කාරයන්ගෙන් උපන්නේය. හේතුඵලයන්ගෙන් උපන්නේය. ගෙවීයන සුළුයි. විනාශවන සුළුයි, නොඇලෙන සුළුයි තනිවන සුළුයි, තුලනයකොට තීරණයකොට ප්‍රකටකොට ව්‍යක්තකොට ජරාමරණ නිරොධ සංඛාතවූ නිර්වාණයෙහි වහාදිවේනුයි ජවන පඤ්ඤා නම් වේ.

"ජවන ප්‍රඥා බව පිණිස පවතිත්" යන මෙහි මේ ජවන පඤ්ඤා නමි.

"තීක්ෂණ ප්‍රඥා බව පිණිස පවතිත්" යන මෙහි තීක්ෂණ නම් කවරීද,

කෙලෙසුන් වහා සිඳීනුයි "තික්ඛ පඤ්ඤා නමි.

47. උපන් කාම (ii) විතර්කය නොඉවසයි, හැරදමයි, දුරලයි, නැත්තටම නැති කරයි. නූපදින බවට පමුණුවානුයි තික්ඛපඤ්ඤා නම් වේ. (iii) (මෙහි දක්වන වචන අගට (ii) යොදන්න.) උපන් ව්‍යාපාද - උපන් විහිංසා - උපනුපන් ලාමක අකුශල ධර්මයන් - උපන් රාගය - උපන් ද්වෙෂය - උපන් මොහය - උපන් ක්‍රොධය - උපන් බද්ධ වෛරය - උපන් ගුණමකුකම - උපන් පළිගැනීම - උපන් ඊර්ෂයාව - උපන් මසුරුකම - උපන් රැවටීම - උපන් සමබව උපන් සිත ඉදිමුණු ගතිය - උපන් එකට එක කිරීම - උපන් මානය - උපන් අතිමානය - උපන් මදය - උපන් ප්‍රමාදය - උපන් සියලු කෙලෙසුන් - උපන් සියලු දුසිරිත් - උපන් සියලු අභිසංස්කාරයන් - උපන් සසරට පමුණුවන සියලු කර්මයන් - එකම අසුනෙහි හිඳ සතර ආර්ය මාර්ගයද සතර ශ්‍රාමණ්‍ය ඵලයන්ද සිව්පිළිසිඹියාද ෂඩභිඥාවෝද නුවණින් අවබොධ කරන ලද්දාහු වෙත්. පසක්

කරන ලද්දාහු වෙත්. ස්පර්ශ කරන ලද්දාහු වෙත්නුයි. තික්ඛ පඤ්ඤා නම් වේ. "තීක්ෂණ ප්‍රඥාව පිණිස පවතිත්." යනු යන මෙහි මේ තික්ඛ පඤ්ඤා නම් වේ.

48. "නිර්වේධික ප්‍රඥාව පිණිස පවතිත්." යන මෙහි නිබ්බෙධක පඤ්ඤාව නම් කුමක්ද?

මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් සියලු සංස්කාරයන්හි උද්වේග බහුලව වෙසෙයි. තැති ගැනීම් බහුලව වෙසෙයි. උකටලී බහුල වෙයි. නොඇලීම බහුල වෙයි. අතිශයින් නොඇලීම බහුල වෙයි. සංස්කාරයන්ගෙන් බැහැරව (සියලු සංස්කාරයන්හි) නොඇලෙයි. සියලු සංස්කාරයන්හි නොවිදි විරූ නොපැලු විරූ ලෝභ රාශිය විදීනුයි පලානුයි නිබ්බෙධික පඤ්ඤා නම්. නොවිදි විරූ නොපැලු විරූ ද්වෙෂරාශිය විදීනුයි. පලානුයි. නිබ්බෙධික පඤ්ඤා නම්. මෝහරාශිය (මෙහි වචන මුලට "නොවිදි විරූ නොපැලු විරූ" කියාද ඒ වචන අගට "විදීනුයි පලානුයි නිබ්බෙධික පඤ්ඤා නම්" කියාද යොදන්න.) ක්‍රොධය - බද්ධ වෛරය - ගුණමකුගම - පළිගැනීම - ඊර්ෂ්‍යාව - මසුරුකම - රැවටීම - සටබව - සිත ඉදිමුණු ගතිය - එකට එක කිරීම - මානය - අතිමානය - මදය - ප්‍රමාදය - සියලු කෙලෙස් - සියලු දුසිරිත් - සියලු සිතුවිලි - භවගාමි සියලු කර්ම - නිර්වෙධික ප්‍රඥා බව පිණිස පවතිත් යන මෙහි නිර්වෙධික ප්‍රඥාවයි.

මේ සොළොස් ප්‍රඥාවෝය. මේ සොළොස් ප්‍රඥාවන්ගෙන් සම්පූර්ණවූ පුද්ගලතෙමේ පිළිසිඹියා පත් කෙනෙකි.

49. පිළිසිඹියාපත් පුද්ගලයෝ දෙදෙනෙකි. එක් කෙනෙක් පිළිසිඹියාවට පැමිණීමට හේතුභූතවූ පූර්වවාසනා සහිතයෙකි. එක්කෙනෙක් එබඳු පූර්ව වාසනා රහිතයෙකි. ඔවුන් දෙදෙනා අතුරින් යමෙක් පූර්වයෝග (පෙර වාසනා සම්පන්නවූයේ නම් (ii) හෙතෙම ඒ හේතුවෙන් වැඩි නුවණැත්තෙක් වෙයි. අධික වෙයි. විශිෂ්ට වෙයි. ඔහුගේ නුවණ පිළිසිඹියා ඥාන ප්‍රභේදයට පැමිණෙයි. (iii) පිළිසිඹියාපත් පුද්ගලයෝ දෙදෙනෙකි. දෙදෙනාම පූර්වයෝග සම්පන්නයෝය. එක්කෙනෙක් බහුශ්‍රැතයෙකි. කෙනෙක් බහුශ්‍රැත නොවේ. ඔවුන් අතුරෙන්

යමෙක් බහුශ්‍රැත නම් (මෙහි (ii) යොදන්න) හෙතෙම පිළිසිඹියාපත් පුද්ගලයෝ දෙදෙනෙකි. දෙදෙනම පූර්වයෝග (පෙර වාසනා) සම්පන්නයෝය. දෙදෙනම බහුශ්‍රැතයෝය. එක්කෙනෙක් දේශනා බහුලකොට ඇත්තෙකි. එක්කෙනෙක් දෙශනා නොවූවෙකි. යමෙක් දේශනා බහුල නම් (මෙහි (ii) යොදන්න) පිළිසිඹියාපත් පුද්ගලයෝ දෙදෙනෙකි. දෙදෙනම පූර්වයෝග සම්පන්නයෝය. දෙදෙනම බහුශ්‍රැතය. දෙදෙනම දේශනා බහුලය එකෙක් ගුරුන් ඇසුරුකළ කෙනෙකි එකෙක් ගුරුන් ඇසුරු නොකළ කෙනෙකි. යමෙක් ගුරුන් ඇසුරු කෙළේනම් (මෙහි (ii) යොදන්න) පිළිසිඹියාපත් පුද්ගලයෝ දෙදෙනෙකි. දෙදෙනම පූර්වයෝග සම්පන්නයි. දෙදෙනම බහුශ්‍රැතය. දෙදෙනම දේශනා බහුලය. දෙදෙනම ගුරුන් ඇසුරුකළාහුය. එකෙක් විදර්ශනා විහරණයෙන් හෝ පලසමාපත්ති විහරණයෙන් යුක්තයෙකි. එකෙක් එබඳු විහරණ නැත්තෙකි. යමෙක් විහරණ බහුල නම් (මෙහි (ii) යොදන්න)

පිළිසිඹියාපත් පුද්ගලයෝ දෙදෙනෙකි. දෙදෙනම පූර්වයෝග සම්පන්නය. දෙදෙනම බහුශ්‍රැතය. දෙදෙනම දේශනා බහුලයි. දෙදෙනම ගුරූපනිශ්‍රිතයහ. දෙදෙනම විදර්ශනා ඵල සමාපත්ති බහුලය. දෙදෙනම ප්‍රත්‍යවෙක්ෂා බහුලය. එකෙක් සෙඛ (හික්මෙන) පටිසම්භිදාවට පැමිණියෙකි. එකෙක් අසේඛ (හික්මී අවසන්) පටිසම්භිදාවට පැමිණියෙකි. යමෙක් අසේඛ පටිසම්භිදාවට පැමිණියෙකි යමෙක් අසෙඛ පටිසම්භිදාවට පැමිණියේ නම් (මෙහි (ii) යොදන්න.)

පිළිසිඹියාපත් පුද්ගලයෝ දෙදෙනෙකි. (iv) දෙදෙනම පූර්වයෝග සම්පන්නය. දෙදෙනම බහුශ්‍රැතය. දෙදෙනම දේශනා බහුලය. දෙදෙනම ගුරූපනිශ්‍රිතය. දෙදෙනම විහාර බහුලය. දෙදෙනම ප්‍රත්‍යවෙක්ෂා බහුලය. දෙදෙනම අසෙඛපටිසම්භිදාවට පැමිණියෝය. (v) එකෙක් ශ්‍රාවක පාරමිතා ඥානයට පැමිණියෙකි. එකෙක් ශ්‍රාවක පාරමිතා ඥානයට නොපැමිණියෙකි. යමෙක් ශ්‍රාවක පාරමිතා ඥානයට පැමිණියේ නම් (මෙහි (ii) යොදන්න)

පිළිසිඹියාපත් පුද්ගලයෝ දෙදෙනෙකි. දෙදෙනම පූර්වයෝග සම්පන්නය. (මෙහි (iv) යොදන්න.) දෙදෙනම අසෙඛ පටිසම්භිදාවට පැමිණියෝය. එක්කෙනෙක් ශ්‍රාවක පාරමිතා ඥානයට පැමිණියෙකි. එක්කෙනෙක් පසේබුදුය. යම් කෙනෙක් පසේ බුදු නම් (මෙහි (ii) යොදන්න.)

**50.** පසේ බුදුන්ද දෙවියන් සහිත ලොකයාද ගෙන සසඳනවිට තථාගත අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ අග්‍රවූ පිළිසිඹියා පත් කෙනෙක් වන සේක. ප්‍රඥා ප්‍රභෙදයන්හි දක්ෂ කෙනෙකි. ප්‍රභේදයට පැමිණි නුවණැති සේක. අවබොධ කළ පිළිසිඹියා ඇති සේක. විශාරද ඥාන සතරක් ඇති කෙනෙක් වන සේක. දශබලධාරීය පුරුෂ ශ්‍රෙෂ්ඨය, පුරුෂ සිංහය.

**56.** යම්සේ දක්ෂවූ අනුන් හා වාදකොට හුරුපුරුදුවූ විදුලි එළියෙන් අඳුරෙහි අස්ලොම් විදින්නාක් මෙන් ප්‍රඥාවෙන් අන්‍ය දර්ශනයන් බිඳිමින් හැසිරෙන යම් ඒ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති ශ්‍රමණ පණ්ඩිතයෝ වෙත් නම්, ඔව්හු සැගවුණාවූද වැසුණාවූද, ප්‍රශ්නයන් පිළියෙල කර කර බුදුන් වෙත එළඹ විචාරත්. බුදුරජාණන් වහන්සේ විසින් ඒ ප්‍රශ්නයෝ කියන ලදහ. විසඳන ලදහ, දක්වන ලද හේතු ඇතියහ. ඒ පණ්ඩිතයෝ බුදුරජාණන් වහන්සේගේ පාමුල වැඳ වැටුණෝ වෙත්. ඉන්පසු බුදුරජාණන් වහන්සේ ඔවුන් අතර ප්‍රඥාවෙන් අතිශයින් බබළන සේක්හුයි අග්‍රවූ පිළිසිඹියාපත් කෙනෙක් වන සේක.

(මහා පඤ්ඤා කථාව නිමි)

---

## 22 ඉද්ධි කථා

1. ඉද්ධිය නම් කුමක්ද? ඉද්ධි කීයද, ඉද්ධි භූමි කෙතෙක්ද, පාද කීයද? පද කීයද? මුල් කීයද?

ඉද්ධිය නම් කුමක්ද, යන මෙහි "සමෘද්ධවන අර්ථ ඉද්ධි නම් වේ." ඉද්ධි කීයද යන මෙහි "ඉද්ධි දසයකි." ඉද්ධියට භූමි කෙතෙක්ද, යන මෙහි "ඉද්ධියට භූමි සතරකි." පද කෙතෙක්ද? පද කීයද, යන මෙහි "පද අටකි" මුල් කීයද යන මෙහි "මුල් සොළසකි."

2. ඉද්ධි දහය මොනවාද? "අධිෂ්ඨාන ඉද්ධිය, විකුවර්ණ, මනෝමය, ඥාණ විප්ඵාර, සමාධි විප්ඵාර, ආර්ය, කර්ම විපාකජ, පින්වතුන්ගේ, විද්‍යාමය, ඒ ඒ තන්හි මනා ප්‍රයෝග ප්‍රත්‍යයෙන් සමෘද්ධ වන අර්ථයෙන් වන ඉද්ධිය, යන මේ දහයයි."

3. ඉද්ධියේ භූමි සතරः-

"විවේකයෙන් හටගත් භූමියයි. එනම් ප්‍රථම ධ්‍යානයයි. ප්‍රීතියෙන් හා සැපෙන් යුක්තවූ භූමියකි. එනම් ද්විතියධ්‍යානයයි. උපෙක්ෂාවෙන් හා සුවයෙන්යුත් භූමියයි. එනම් තෘතීය ධ්‍යානයයි. දුක්සැප නැති භූමියයි. එනම් චතුර්ථ ධ්‍යානයයි. ඉද්ධීන් පිළිබඳ මේ භූමි සතර ඉද්ධි ලැබීම පිණිස ඉද්ධි ප්‍රතිලාභ පිණිස ඉද්ධි විකුවර්ණය පිණිස ඉද්ධියේ විවිධ විශේෂයෙන් පැවැත්වීම පිණිස, ඉද්ධියට වසඟවීම පිණිස ඉද්ධි විශාරද බව පිණිස පවතිත්.

4. ඉද්ධි පාද සතර මොනවාද?

මේ සස්නෙහි භික්ෂුවක් ඡන්දය නිසා හටගත් සමාධිය හා ප්‍රධාන සංස්කාරය යන මෙයින් යුක්තවූ ඉද්ධි පාදය වඩයි. වීර්යය නිසා හටගත් සමාධිය හා ප්‍රධාන සංස්කාරය යන මෙයින් යුක්තවූ ඉද්ධි පාදය වඩයි. චිත්තය නිසා හටගත් සමාධිය හා ප්‍රධාන සංස්කාරය යන මෙයින් යුක්තවූ ඉද්ධිපාදය වඩයි. වීමංසාව නිසා හටගත් සමාධිය හා ප්‍රධාන සංස්කාරය වන මෙයින් යුක්තවූ ඉද්ධි පාදය වඩයි. ඉද්ධියේ මේ පාද සතර, ඉද්ධි ලැබීම පිණිස ඉද්ධි නැවත ලැබීම පිණිස ඉද්ධි විකුවර්ණය පිණිස නොයෙක් ඉද්ධි විශේෂයෙන් පැවැත්වීම පිණිස ඉද්ධි වසඟකොට ගැනීම පිණිස ඉද්ධි වෛශාරද්‍යය පිණිස පවතිත්.

5. ඉද්ධියේ පද අට මොනවාද?

ඉදින් භික්ෂුවක් ඡන්දය නිසා සමාධිය ලබයි නම් සිතේ එකඟ බව ලබයි නම් ඒ ඡන්දය සමාධිය නොවේ. සමාධිය ඡන්දය නොවේ ඡන්දය අනෙකෙකි. සමාධිය අනෙකකි.

ඉදින් භික්ෂුවක් වීර්යය නිසා සමාධිය ලබයි නම් සිතේ එකඟ බව ලබයි නම්, ඒ වීර්යය සමාධිය නොවේ. සමාධිය වීර්යය නොවේ. වීර්යය අනෙකකි. සමාධිය අනෙකකි. ඉදින් භික්ෂුවක් චිත්තය නිසා සමාධිය ලබයි නම්, සිතේ එකඟ බව

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ලබයි නම්, ඒ චිත්ත සමාධිය නොවේ සමාධිය චිත්තය නොවේ. චිත්තය අනිකෙකි. සමාධිය අනිකෙකි ඉදින් භික්ෂුවක් විමංසාව නිසා සමාධිය ලබයි නම්, සිතේ එකඟ බව ලබයි නම් ඒ විමංසාව සමාධිය නොවේ. සමාධිය විමංසාව නොවේ. විමංසාව අනිකෙකි. සමාධිය අනෙකකි.

ඉද්ධියේ මේ පද අට ඉද්ධිය ලැබීම පිණිස ඉද්ධි නැවත නැවත ලැබීම පිණිස ඉද්ධි විකුවර්ණය පිණිස ඉද්ධියේ විවිධ විශේෂ පැවැත්වීම පිණිස ඉද්ධි වසඟකර ගැනීම පිණිස ඉද්ධියේ විශාරද බව පිණිස පවතිත්.

6. ඉද්ධියේ සොළොස් මුල් මොනවාද?

නොසැඟවුනු සිත කුසීත බවෙහි (මෙහි වාක්‍ය අගට "නොසැලේනුයි ආනෙඤ්ජ නම්." කියා යොදාගත යුතුයි.) උඩඟුනොවූ සිත උඩඟුකමෙහි - රාගවශයෙන් නොඇලුනු සිත රාගයෙහි - ද්වේෂ වශයෙන් නොගැවුණු සිත ව්‍යාපාදයෙහි - ආත්ම වශයෙන් නොගත් සිත ආත්ම දෘෂ්ටියෙහි - නොබැඳුනු සිත ඡන්දරාගයෙහි - මිදුණු සිත කාමරාගයෙහි - වෙන්වූ සිත ක්ලේශයන්හි - කෙලෙස් සීමාව ඉක්මවූ සිත කෙලෙස් සීමාවේ - එකඟවූ සිත කෙලෙස්හි - ශ්‍රද්ධාවෙන් පරිගෘහිතවූ සිත අශ්‍රද්ධාවෙහි - වීර්යයෙන් පරිගෘහිතවූ සිත අලස බවෙහි - සිහියෙන් පරිගෘහිතවූ සිත ප්‍රමාදයෙහි - සමාධියෙන් පරිගෘහිතවූ සිත උඩඟු බවෙහි - ප්‍රඥාවෙන් පරිගෘහිතවූ සිත අවිද්‍යාවෙහි - ප්‍රඥාවෙන් අලොකවත්වූ සිත මොහඳුරෙහි - ඉද්ධියේ මේ මුල් සොළොස ඉද්ධිය ලැබීම පිණිස ඉද්ධිය නැවත ලැබීම පිණිස, ඉද්ධි විකුවර්ණය පිණිස, ඉද්ධියේ විවිධ විශේෂ පැවතුම පිණිස ඉද්ධි වශීභාවය පිණිස, ඉද්ධියේ විශාරද බව පිණිස පවතිත්.

7. අධිෂ්ඨාන ඉද්ධි නම් කුමක්ද?

මේ ශාසනයේ භික්ෂුවක් නන්වැදෑරුම් ඉද්ධි කොටස් ප්‍රත්‍යක්ෂ කෙරෙයි. ඒ කෙසේද යත්, එකෙක්ව බොහෝ වෙයි. බොහෝ දෙනෙක්ව එකෙක් වෙයි. ප්‍රකටවී යයි මුවාව යයි. අහසෙහි මෙන් බිත්තියෙන් පිට පවුරෙන් පිට පර්වතයෙන් පිට නොගැටී යයි. ජලයෙහි මෙන් පොළොවෙහිද, මතුවීම් ගිලීම් කරයි. පොළොවෙහි මෙන් ජලයෙහිද නොගිලී යයි. පියාපත්

ඇති කුරුල්ලන් මෙන් අහසෙයිද පළඟින් යයි මේසා මහත් ඉද්ධි ඇති මේසා මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙන පවා අත්ළෙන් පිරිමදියි. බඹලොව තෙක් කයින් වසඟයෙහි පවත්වයි. මේ ශාසනයෙහිය, මේ දර්ශනයෙහිය මේ ක්ෂාන්තියෙහිය, මේ කැමැත්තෙහිය, මේ ගැනීමෙහිය, මේ ධර්මයෙහිය, මේ විනයෙහිය, මේ ධර්ම විනයෙහිය, මේ පාවචනයෙහිය. මේ බඹසරයෙහිය, මේ ශාස්තෘශාසනයෙහිය. එහෙයින් "ඉධ" යයි කියනු ලැබේ. භික්ෂුවක් යනු නම් පෘථග්ජන කල්‍යාණ භික්ෂුවක් හෝ වෙයි. ශාසනයෙන් නොවෙනස් වන සුළු ශෛක්ෂ මාර්ග ඵලවල හික්මෙන භික්ෂුවක් හෝ රහත් භික්ෂුවක් හෝ වෙත්. නොයෙක් ආකාර ඉද්ධි කොටස් ප්‍රතික්ෂේප කෙරෙයි යනු නම් විවිධ ඉද්ධි කොටස් ප්‍රත්‍යක්ෂ කරයි.

**8.** "එකෙක්ව බොහෝ දෙනෙක් වෙයි." යනු නම් ප්‍රකෘතියෙන් එකෙක් වූයේ බොහෝ දෙනෙකු ආවර්ජනා කරයි. සියයක් හෝ දහසක් හෝ ලක්ෂයක් හෝ ආවර්ජනා කරයි. ආවර්ජනාකොට "බොහෝ වෙමියි" නුවණින් ඉටයි. එවිට බොහෝ වෙයි.

යම්සේ ආයුෂ්මත් චුල්ලපන්ථක ස්ථවිරයන් වහන්සේ එකෙක් වී බොහෝ වෙයිද, එසේම ඒ සිත වසඟකළ ඍද්ධි ඇත්තා එකෙක්ව බොහෝ වෙයි. බොහෝව එකෙක්විය. යනු නම් ප්‍රකෘතියෙන් බොහෝ වූයේ එකෙකු ආවර්ජනා කරයි. ආවර්ජනාකොට එකෙක් වෙමියි නුවණින් ඉටයි. (එවිට) එකෙක්වෙයි. යම්සේ ආයුෂ්මත් චුල්ලපන්ථක ස්ථවිරයන් වහන්සේ බොහෝව එකෙක් වෙයිද, එසේම සිත වසඟ කළ ඒ ඍද්ධිමත් තෙමේ බොහෝ වී එකෙක් වෙයි.

ප්‍රකටවීම යනු නම් කිසිවකින් ආවරණය නොවූයේ වෙයි. නොවැසුනේ වෙයි. විවෘතවූයේ වෙයි. නොවැසුනේ වෙයි. ප්‍රකට වූයේ වෙයි. "මුවහවීම යනු" නම් කිසිවකින් ආවරණය වූයේ වෙයි. වැසුනේ වෙයි. වසන ලද්දේ වෙයි. උඩින් වසන ලද්දේය.

**9.** "අහසෙහි මෙන් බිත්තියෙන් පිට, පවුරෙන් පිට පර්වතයෙන් පිට නොගැටී යයි" යනු නම්,

ප්‍රකෘතියෙන් පඨවි කසිණ සමාපත්ති ලාභියෙක් බිත්තියෙන් පිටත, පවුරෙන් පිටත, පර්වතයෙන් පිටත ආවර්ජනා කරයි. ආවර්ජනාකොට අහස වේවයි නුවණින් ඉටයි. අහස වෙයි (එවිට) බිත්තියෙන් පිටතට, පවුරෙන් පිටතට, පර්වතයෙන් පිටත නොගැටීයයි.

ප්‍රකෘතියෙන් ඍද්ධියක් නැති මිනිස්සු යම්සේ කිසිවකින් ආවරණ නුවූ වට නොකළ තැනක නොගැටී යත්ද, එසේම ඒ සිත වසඟ කළ ඍද්ධිමත් තෙමේ අහසෙහි මෙන් බිත්තියෙන් පිටතට පවුරෙන් පිටතට පර්වතයෙන් පිටතට නොගැටීයයි.

**10.** "ජලයෙහි මෙන් පොළොවෙහිද, මතුවීම් ගිලීම් කරයි" යනු නම්,

ප්‍රකෘතියෙන් ආපොකසිණ සමාපත්ති ලාභියෙක් වේ නම් හෙතෙම පෘථිවිය ආවර්ජනා කරයි. ආවර්ජනාකොට පොළව වේවයි නුවණින් ඉටයි. (එවිට) පොළොව වෙයි හෙතෙම නොබිඳනදියෙහි යයි යම්සේ ප්‍රකෘතියෙන් ඉද්ධියක් නැති මිනිස්සු ජලයෙහි මතුවීම් ගිලීම් කරත්ද, එසේම සිත වසඟ කළ ඉද්ධිමත් තෙමේ ජලයෙහි මෙන් පොළොවෙහිද මතුවීම් ගිලීම් කරයි.

**11.** "පොළොවෙහි මෙන් ජලයෙහිද, නොගිලීයයි" යනු නම්,

ප්‍රකෘතියෙන් පඨවිකසිණ ලාභියෙක් වේනම් හෙතෙම ජලය ආවර්ජනාකරයි. ආවර්ජනාකොට පොළොව වේවයි නුවණින් ඉටයි. එවිට පොළොව වෙයි. හෙතෙම නොබිඳෙන දියෙහි යයි. යම්සේ ප්‍රකෘතියෙන් ඉද්ධියක් නැති මිනිස්සු නොබිඳෙන පොළොවෙහි යත්ද, එසේම සිත වසඟකළ ඉද්ධිමත් තෙමේ පොළොවෙහි මෙන් නොබිඳෙන දියෙහි යයි.

**12.** "පියාපත් ඇති කුරුල්ලන් මෙන් අහසෙහිද පළඟින්යයි" යනු නම්,

ප්‍රකෘතියෙන් පඨවිකසිණ සමාපත්ති ලාභියෙක් වේනම් හෙතෙම අහස ආවර්ජනා කරයි. ආවර්ජනාකොට පොළොව වේවයි නුවණින් ඉටයි. එවිට පොළොවෙයි. (වැවෙයි) හෙතෙම අහස අතරතුර සක්මන්ද කරයි. සිටීමද කරයි සයනයද කරයි

ප්‍රකෘතියෙන් ඍද්ධියක් නැති මිනිස්සු යම්සේ පොළොවෙහි සක්මන් කරත්ද, සිටිත්ද, සයනය කරත්ද, එසේම සිත වසඟකළ ඒ ඉද්ධිමත් තෙමේ පියාපත් ඇති කුරුල්ලන් මෙන් අහස අතරතුර සක්මන්ද කරයි. සිටීමද කරයි. නිදීමද කරයි සයනයද කරයි. මේසා මහත් ඉද්ධි ඇති මේසාමහත් ආනුභාව ඇති මේ සඳ, හිරු දෙදෙන අතින් අල්ලයි අතගායි. පිරිමදියි, යනු නම්:-

මේ ශාසනයෙහි සිත වසඟකළ ඒ ඉද්ධිමත්තෙමේ හිඳගත්තේ හෝ සයනය කෙළේ හෝ සඳ, හිරු දෙදෙන ආවර්ජනය කරයි. ආවර්ජනාකොට අත්පස වේවයි නුවණින් ඉටයි. එවිට අත්පස වෙයි. හෙතෙම හිඳගත්තේ හෝ සයනය කළේ හෝ සඳ, හිරු දෙදෙන අතින් අල්ලයි. අතගායි. පිරිමදියි.

යම්සේ ප්‍රකෘතියෙන් ඉද්ධියක් නැති මිනිස්සු අත්පසෙහිවූ යම්කිසි රූපයක් අතින් අල්ලත්ද, අතගාද්ද, පිරිමදිද්ද, එසේම සිත වසඟ කළ ඒ ඉද්ධිමත් තෙමේ හුන්නේ හෝ සයනය කළේ හෝ සඳ හිරු දෙදෙන අතින් අල්ලයි අතගායි. පිරිමදියි.

13. "බඹලොව තෙක් කයින් වසඟයෙහි පවත්වයි" යන මෙහි,

ඉදින් සිත වසඟ කළ ඒ ඉද්ධිමත් තෙමේ බඹලොවට යනු කැමතිවේ නම් දුරුවූ දෙසද සමීපයෙහි වේවයි සමීපයෙහි වන ලෙස ඉටයි, එවිට සමීපයෙහි වෙයි. සමීපයෙහි වූ දෙයද දුරු වේවයි, දුරු වනලෙස ඉටයි. එවිට දුරුවෙයි. බොහෝ දෙයක් වුවද සුළු දෙයක් වේවයි සුළුකොට ඉටයි. එවිට සුළු දෙයක් වෙයි සුළු දෙයක් වුවද, ලොකුවේවයි ලොකුකොට සිතයි (එවිට) ලොකුවෙයි. දිවැසින් ඒ බ්‍රහ්මයාගේ රූපය බලයි. දිව කණින් ඒ බ්‍රහ්මයාගේ ශබ්ද අසයි. පරසිත් දන්නා නුවණින් ඒ බ්‍රහ්මයාගේ සිත දැනගනියි, හෙවත් හඳුනයි. ඉදින් සිත වසඟකළ ඒ ඉද්ධිමත්හු පෙනෙන කයින් බඹලොව යනු කැමතිවෙයි නම් කාය වශයෙන් සිත පමුණුවයි. කාය වශයෙන් ඉටයි. කාය වශයෙන් සිත පමුණුවා, කායවශයෙන් සිත ඉටා (සුව) යන හැඟීමටද ලුහු යන හැඟීමටද ඇස පෙණෙන කයින් බඹලොව යයි.

ඉදින් සිත වසඟකළ ඒ ඉද්ධිමත් තෙමේ නොපෙණෙන කයින් බඹලොව යනු කැමති වෙයි නම් සිත් වශයෙන් කය

පමුණුවයි. චිත්ත වශයෙන් කය ඉටයි. චිත්ත වශයෙන් කය පමුණුවා චිත්ත වශයෙන් කය ඉටා සුඛ සංඥාවටද, ලුහු සංඥාවටද බැස නොපෙනෙන කයින් බඹලොව යයි. හෙතෙම ඒ බඹු ඉදිරියෙහි මනොමයවූ සියලු අඟ පසඟ ඇති විකල නොවූ ඉන්ද්‍රිය ඇති රුවක් මවයි. ඉදින් ඒ ඍද්ධිමත් පුද්ගලයා සක්මන් කරයි නම් නිර්මිත රූපයද, එහි සක්මන් කරයි. ඉදින් ඒ ඉද්ධිමත් පුද්ගලයා සිටී නම් නිර්මිත රූපයද එහි සිටියි. ඉදින් ඒ ඉද්ධිමත් පුද්ගලයා නම් නිර්මිත රූපයද එහි හිඳියි.

ඉදින් ඒ ඉද්ධිමත් පුද්ගලයා සයනය කෙරේ නම් නිර්මිත රූපයද එහි සයනය කෙරේ.

ඉදින් ඒ ඉද්ධිමත් පුද්ගලයා දුවා නම් නිර්මිත රූපයද එහි දුවයි,

ඉදින් ඒ ඉද්ධිමත් පුද්ගලයා දිළිසෙයි නම් නිර්මිත රූපයද එහි දිළිසෙයි.

ඉදින් ඒ ඉද්ධිමත් පුද්ගලයා බණ කියා නම් නිර්මිත රූපයද එහි බණ කියයි.

ඒ ඉද්ධිමත් පුද්ගලයා ප්‍රශ්න අසයි නම් නිර්මිත රූපයද එහි ප්‍රශ්න අසයි.

ඉදින් ඒ ඍද්ධිමත් පුද්ගලයා ප්‍රශ්න අසනලදුව විසඳා නම්, නිර්මිත රූපයද එහි ප්‍රශ්න අසන ලදුව විසඳයි.

ඉදින් ඒ ඉද්ධිමත් පුද්ගලයා ඒ බ්‍රහ්මයා සමග එකට හිඳීනම් නිර්මිත රූපයද එහි ඒ බ්‍රහ්මයා සමග එකට හිඳියි, එකට කථා කරයි. සාකච්ඡාවට පැමිණෙයි, ඒ ඍද්ධිමත් පුද්ගලයා යම් යම් දෙයක් කෙරේනම් නිර්මිත රූපයද එහි ඒ ඒ දෙයම කෙරේනුයි මේ අධිෂ්ඨාන ඍද්ධියයි.

14. "විකුවර්ණ ඍද්ධිය නම් කුමක්ද?

සිඛී නම්වූ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේගේ අභිභූ නම් ශ්‍රාවකතෙමේ බඹලොව සිටියේ සහශ්‍රී ලොකධාතුව ස්වරයෙන් හැඟවීය. හෙතෙම පෙනෙන කයින්ද දහම් දෙසයි. පෙනෙන්නාවූ යට අඩ කයින් හා නොපෙනෙන්නාවූ මතු අඩ කයින්ද යුක්තව දහම් දෙසයි. පෙනෙන්නාවූ මතු අඩ කයින් හා නොපෙණෙන්නාවූ යට අඩ

කයින්ද යුක්තව දහම් දෙසයි. හෙතෙම ප්‍රකෘති ස්වරූපය හැර තරුණ රුවක් හෝ දක්වයි. නාග රූපයක් හෝ දක්වයි. ගුරුළු රුවක් හෝ දක්වයි. යක් රුවක් හෝ දක්වයි. අසුර රුවක් හෝ දක්වයි. ශක්‍ර රූපයක් හෝ දක්වයි. දෙව්රුවක් හෝ දක්වයි. බඹ රුවක් හෝ දක්වයි. මුහුදු සටහනක් හෝ දක්වයි. පර්වත ස්වරූපයක් හෝ දක්වයි. වන ස්වරූපයක් හෝ දක්වයි. සිංහ ස්වරූපයක් හෝ දක්වයි. ව්‍යාඝ්‍ර ස්වරූපයක් හෝ දක්වයි. දිවි රුවක් හෝ දක්වයි. ඇත් රුවක් හෝ දක්වයි. අස් රුවක් හෝ දක්වයි රියක්ද දක්වයි. පාබල සෙනඟක්ද දක්වයි. නන්වැදෑරුම් සෙනා සමූහයක් හෝ දක්වානුයි මේ විකුවර්ණ ඉද්ධියයි.

**15.** මනෝමය ඉද්ධි නම් කුමක්ද?

මේ ශාසනයෙහි භික්ෂුවක් තෙමේ මේ කයින් මනෝමයවූ සියලු අඟ පසඟ ඇති විකල නොවූ ඉඳුරන් ඇති රූපකායක් වෙයි. යම්සේ පුරුෂයෙක් තෙමේ මුදුතණ වලින් (මුදු තණ) බඩය අදීනම් මේ මුදු තණ ගසයි. මේ මුදු තණ බඩය. මේ මුදු තණ ගස අනිකකි. මුදු තණ බඩය අනිකකි. මුදු තණ ගසින්ම මුදු තණ බඩය ඇදගන්නා ලද්දේයයි ඔහුට සිතෙයි. යම්සේ වනාහි පුරුෂයෙක් කොපුවෙන් කඩුව අදී නම් මේ කඩුවය, මේ කොපුවය, කඩුව අනිකකි, කොපුව අනිකකි, කොපුවෙන්ම කඩුව ඇදගන්නා ලද්දේයයි ඔහුට සිතෙයි. යම්සේ වනාහි පුරුෂයෙක් නයි පෙට්ටියෙන් නයකු පිටතට ගනීනම් ඔහුට මෙසේ සිතෙයි. මේ නයාය. මේ පෙට්ටියයි. නයා අනෙකකි. පෙට්ටිය අනෙකකි. පෙට්ටියෙන්ම නයා උඩට ගන්නා ලද්දේය, කියායි. එසේම භික්ෂුතෙමේ මේ කයින් මනෝමයවූ සියලු අඟ පසඟ ඇති විකළ නොවූ ඉඳුරන් ඇති වෙතින් කයක් මවයි, මේ මනෝමය ඉද්ධියයි.

**16.** ඥාන විප්ඵාර ඉද්ධිය නම් කුමක්ද?

අනිත්‍යානුදර්ශනයෙන් නිත්‍ය සංඥාවෝ (දුරුවීම) ප්‍රහානාර්ථය සම්පූර්ණ වේනුයි ඥාන විප්ඵාර ඉද්ධි නම් වේ. දුක්ඛානු දර්ශනයෙන් සුඛ සංඥාවේ ප්‍රහානාර්ථය සම්පූර්ණ වේනුයි ඥාන විප්ඵාර ඉද්ධි නම් වේ. අනාත්මානු දර්ශනයෙන් ආත්ම සංඥාවේ ප්‍රහාණාර්ථය සම්පූර්ණ වේනුයි ඥාන විප්ඵාර

ඉද්ධි නම් වේ. නිර්වේධානු දර්ශනයෙන් තෘෂ්ණා වශයෙන් ඇලීමේ ප්‍රහානාර්ථය සම්පූර්ණ වේනුයි ඥාන විෂ්ඵාර ඉද්ධි නම් වේ. විරාගානු දර්ශනයෙන් රාගයේ ප්‍රහානාර්ථය සම්පූර්ණ වේනුයි, ඥාන විෂ්ඵාර ඉද්ධි නම් වේ. නිරොධානු දර්ශනයෙන් සමුදයාගේ ප්‍රහානාර්ථය සම්පූර්ණ වේනුයි ඥාන විෂ්ඵාර ඉද්ධි නම් වේ. දුරුකිරීම අනුව බැලීමෙන් දැඩිකොට ගැනීමේ ප්‍රහානාර්ථය සම්පූර්ණ වේනුයි ඤාණ විෂ්ඵාර ඉද්ධි නම් වේ. ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ඍද්ධිය ඥාන විෂ්ඵාර ඉද්ධියයි. ආයුෂ්මත් සංකිච්ච ස්ථවිරයන්ගේ ඉද්ධිය ඥාන විෂ්ඵාර ඍද්ධි යයි. ආයුෂ්මත් භූතපාල ස්ථවිරයන්ගේ ඉද්ධිය ඥාන විෂ්ඵාර ඉද්ධියයි. මේ ඤාණ විෂ්ඵාර ඉද්ධියයි.

17. සමාධි විෂ්ඵාර ඉද්ධිය නම් කුමක්ද?

ප්‍රථම ධ්‍යානයෙන් නීවරණයන්ගේ ප්‍රහාණය දුරුවීම සමෘද්ධ වේනුයි. සමෘධි විෂ්ඵාර ඉද්ධි නමි. ද්විතීයධ්‍යානයෙන් විතර්ක විචාරයන්ගේ ප්‍රහාණය සමෘද්ධ වේනුයි. සමාධි විෂ්ඵාර ඉද්ධි නමි. තෘතීය ධ්‍යානයෙන් ප්‍රීතියේ ප්‍රහාණය සමෘද්ධ වේනුයි සමාධි විෂ්ඵාර ඉද්ධි නමි. චතුර්ථධ්‍යානයෙන් සැප දුක් දෙකේ ප්‍රහාණය සමෘද්ධ වේනුයි සමාධි විෂ්ඵාර ඉද්ධි නමි. ආකාසානඤ්චායතන සමාපත්තියෙන් රූප සංඥාවන්ගේද, ප්‍රීතිය සංඥාවගේද, නානත්ව සංඥාවගේද, ප්‍රහානාර්ථය සමෘද්ධවේනුයි සමාධි විෂ්ඵාර ඉද්ධි නමි. විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන් ආකාසානඤ්චායතන සංඥාවගේ ප්‍රහාණාර්ථය සමෘද්ධ වේනුයි සමාධි විෂ්ඵාර ඉද්ධි නමි. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් විඤ්ඤාණඤ්චායතන සංඥාවගේ ප්‍රහානාර්ථය සමෘද්ධ වේනුයි සමාධි විෂ්ඵාර ඉද්ධි නමි. නෙවසඤ්ඤා නාසඤ්ඤා සමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතන සංඥාවගේ ප්‍රහාණාර්ථය සමෘද්ධවේනුයි සමාධි විෂ්ඵාර ඉද්ධි නමි. ආයුෂ්මත් සැරියුත් ස්ථවිරයන් වහන්සේගේ ඉද්ධිය සමාධි විෂ්ඵාර ඉද්ධි නමි. ආයුෂ්මත් සඤ්ජීව ස්ථවිරයන් වහන්සේගේ ඍද්ධියද සමාධි විෂ්ඵාර ඉද්ධි නමි. ආයුෂ්මත් ඛාණුකොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේගේ ඉද්ධිය සමාධි විෂ්ඵාර ඉද්ධි නමි උත්තරා නම් උපාසිකාවගේ ඍද්ධිය සමාධි විෂ්ඵාර ඍද්ධි නම් වේ. සාමාවතී

නම් උපාසිකාවගේ ඍද්ධිය සමාධි විප්ඵාර ඉද්ධි නමි. මේ සමාධි විප්ඵාර ඍද්ධියයි.

18. ආර්ය ඉද්ධිය නම් කුමක්ද?

ඉදින් මේ ශාසනයෙහි ක්ෂීණාශ්‍රව භික්ෂුවක් පිළිකුල් දෙයක නොපිළිකුල්ය, යන හැඟීම ඇතිව වසම්යි කැමති වේනම් හෙතෙම එහි නොපිළිකුල්ය යන හැඟීම ඇතිව වසමි යයි කැමති වේනම් පිළිකුල්ය යන හැඟීම ඇතිව වෙසෙයි. ඉදින් පිළිකුල් දෙයකද නොපිළිකුල් දෙයකද නොපිළිකුල් හැඟීම ඇතිව වෙසෙම්යි කැමතිවේනම් එහි නොපිළිකුල් යන හැඟීම ඇතිව වෙසෙයි. ඉදින් නොපිළිකුල් දෙයකද පිළිකුල් දෙයකද පිළිකුල් යන හැඟීම ඇතිව වසම්යි කැමති වේනම් එහි පිළිකුල්ය යන හැඟීම ඇතිව වෙසෙයි, ඉදින් පිළිකුල් දෙයකද නොපිළිකුල් දෙයකද ඒ හැඟීම් දෙකම දුරුකර සිහි ඇතිව මනාකොට දැනගෙන මධ්‍යස්ථව වසම්යි කැමතිවේනම් එහි සිහි ඇතිව මනාකොට දැනගෙන මධ්‍යස්ථව වාසය කරයි.

19. පිළිකුල් දෙයක නොපිළිකුල්ය යන හැඟීම ඇතුව කෙසේ වෙසේද,

සචේතනිකවූ හෝ අචේතනිකවූ අනිෂ්ට වස්තුවක් කෙරෙහි මෛත්‍රිය හෝ පතුරුවයි. පෘථිවි ආදී ධාතු වශයෙන් හෝ මෙනෙහි කරයි. මෙසේ පිළිකුල් දෙයක පිළිකුල්ය යන හැඟීම ඇතිව වෙසෙයි.

පිළිකුල් නොවූ දෙයක පිළිකුල්ය යන හැඟීම ඇතිව කෙසේ වෙසේද?

ප්‍රිය වස්තුවෙක්හි අශුභය පතුරුවයි. අනිත්‍ය වශයෙන් හෝ මෙනෙහි කරයි. මෙසේ පිළිකුල් නොවූ දෙයක පිළිකුල් කල්පනාව ඇතිව වාසය කරයි. පිළිකුල්වූ දෙයකද නොපිළිකුල්වූ දෙයකද කෙසේ නම් පිළිකුල් නොවූ හැඟීම් ඇතිව වෙසේද?

ඉටු අනිටු වස්තු විෂයෙහි මෛත්‍රිය හෝ පතුරුවයි. පෘථිවි ආදී ධාතු වශයෙන් හෝ මෙනෙහි කරයි. මෙසේ පිළිකුල් නොපිළිකුල් වස්තූන් විෂයෙහි නොපිළිකුල්ය, යන හැඟීම ඇතිව වාසය කරයි.

**20.** කෙසේ නම් නොපිළිකුල් හා පිළිකුල් වස්තූන් විෂයෙහි පිළිකුල් හැඟීම ඇතිව වාසය කෙරේද?

ඉටු අනිටු වස්තූන් විෂයෙහි අශුභ හැඟීම හෝ පතුරුවයි. අනිත්‍ය වශයෙන් හෝ මෙනෙහි කරයි. මෙසේ නොපිළිකුල් හා පිළිකුල් වස්තූන් විෂයෙහි පිළිකුල් හැඟීම් ඇතිව වෙසෙයි. කෙසේ නම් පිළිකුල් නොපිළිකුල් වස්තූන් විෂයෙහි ඒ පිළිකුල් නොපිළිකුල් හැඟීම් දෙක හැර සිහි ඇතිව මනා නුවණ ඇතිව මධ්‍යස්ථව වාසය කෙරේද?

මේ ශාසනයෙහි ක්ෂීණාශ්‍රව භික්ෂු තෙමේ ඇසින් රූපයක් දැක සොම්නස්ද නොවෙයි. දොම්නස්ද නොවෙයි සිහි ඇතිව මනා නුවණ ඇතිව මධ්‍යස්ථව වෙසෙයි. කණින් ශබ්දයක් අසා නැහැයෙන් ගඳ සුවඳ ආඝ්‍රාණය කොට දිවෙන් රස විඳ, කයින් පහසක් ස්පර්ශකොට සිතින් ධර්මයක් දැන සොම්නස්ද නොවෙයි. දොම්නස්ද නොවෙයි. සිහි ඇතිව මනා නුවණ ඇතිව උපෙක්ෂා සහිතව වාසය කරයි. මෙසේ පිළිකුල් නොපිළිකුල් වස්තූන් විෂයෙහි ඒ පිළිකුල් නොපිළිකුල් හැඟීම් දෙකම හැර සිහි ඇතිව මනා නුවණ ඇතිව, මධ්‍යස්ථව වාසය කරයි මේ ආර්ය ඉද්ධිය නම් වෙයි.

**21.** කර්ම විපාකජ ඍද්ධිය නම් කුමක්ද?

සියලු පක්ෂීන්ගේද සියලු දෙවියන්ගේද සමහර මිනිසුන්ගේද සමහර විමාන ප්‍රේතයන්ගේද යම් ඍද්ධියක් වේනම් එය කර්ම විපාකජ ඉද්ධියයි.

**22.** පිනැත්තවුන්ගේ ඉද්ධිය නම් කුමක්ද?

යටත් පිරිසෙයින් අසරුවන් පටන් කොට ඇති සිව්රඟ සෙනඟ සමග සක්විති රජ තෙමේ අහසින් යේ. ඒ පිනැත්තවුන්ගේ ඉද්ධියයි.

ජොතිය (ii) නම් ගැහැවියාගේ ඍද්ධිය පින්වතුන්ගේ ඉද්ධිය නමි. ජටිල (මෙහි (ii) මෙණ්ඩක (මෙහි ii) සොෂක (මෙහි (ii) යොදන්න.) මහ පිණැති මේ පස්දෙනාගේ යම් ඉද්ධියක් වේ නම්, ඒ ඉද්ධිය පිනැත්තවුන්ගේ ඉද්ධි නම් වේ.

**23.** විද්‍යාමය ඉද්ධිය නම් කුමක්ද?

විද්‍යාධරයෙක් මන්ත්‍ර ජපකොට අහසින් යත්. අහස අතරතුර ඇතෙකුත් දක්වත් අසෙකුත් දක්වත්. රියකුත් දක්වත්. පාබල

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සෙනගද දක්වත්. නන් වැදෑරුම් සේනා සමූහය දක්වත්. මේ විද්‍යාමය ඉද්ධියයි.

24. ඒ ඒ තන්හි මනාකොට යෙදීම් හේතුවෙන් සමෘද්ධ වන ඉද්ධිය නම් කුමක්ද?

නෙක්ඛම්මයෙන් (කාමයෙන් වෙන්වීම) කාමච්ඡන්දයාගේ ප්‍රහාණාර්ථය සමෘද්ධවේනුයි. ඒ ඒ තන්හි මනාකොට යෙදීම් හේතුවෙන් සමෘද්ධ වන ඉද්ධියයි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදයාගේ (ii) ප්‍රහාණාර්ථය සමෘද්ධවේනුයි ඒ ඒ තන්හි මනාකොට යෙදීම් හේතුවෙන් සමෘද්ධවන ඉද්ධියයි (iii) අලොකසඤ්ඤාවෙන් ථීනමිද්ධයාගේ (මෙහි ii) අවික්ෂේපයෙන් උද්ධච්චයාගේ (මෙහි ii) ධම්මවවත්ථානයෙන් විචිකිච්ඡාවගේ (මෙහි ii) රහත් මගින් සියලු කෙලෙසුන්ගේ ප්‍රහාණාර්ථය සමෘද්ධවේනුයි ඒ ඒ තන්හි මනාකොට යෙදීම හේතුවෙන් සමෘද්ධවන ඉද්ධියයි.

ඒ ඒ තන්හි මනාකොට යෙදීම් හේතුවෙන් සමෘද්ධ වන ඉද්ධිය මෙසේය.

මොව්හු දස වැදෑරුම් ඉද්ධිහුයි.

(ඉද්ධි කථාව නිමි.)

---

## 23 අභිසමය කථා

1. අභිසමය (සත්‍යාවබොධය කිරීම) යන මෙහි කුමකින් අවබොධ කෙරෙයිද? සිතින් අවබොධ කෙරෙයි."

"ඉදින් සිතින් අවබොධ කෙරෙයි නම්, එසේ ඇති කල්හි නුවණනැත්තෙක් අවබොධ කරයිද?

"නැත. නුවණ නැත්තෙක් අවබොධ නොකරයි. නුවණින් අවබොධ කරයි."

"ඉදින් නුවණින් අවබොධ කරයි නම් එසේ ඇති කල්හි නොසිතින් හා නුවණින් සිත් නැත්තෙක් අවබොධ කරයිද?"

"නැත. සිත නැත්තෙක් අචිත්තයෙන්ද ඥානයෙන්ද අවබොධ නොකරයි. සිතින් හා නුවණින් අවබොධ කරයි."

"ඉදින් සිතින් හා නුවණින් අවබොධ කරයි නම් එසේ ඇති කල්හි කාමාවචර සිතින් හා නුවණින් අවබොධ කරයිද?"

"නැත කාමාවචර සිතින් හා කාමාවචර නුවණින් අවබොධ නොකරයි."

"එසේ නම් රූපාවචර සිතින් හා නුවණින් අවබොධ කරයිද?"

"නැත. රූපාවචර සිතින් හා නුවණින් අවබොධ නොකරයි. එසේ නම් අරූපාවචර සිතින් හා නුවණින් අවබොධ කරයිද?"

"නැත, අරූපාවචර සිතින් හා නුවණින් අවබොධ නොකරයි."

"එසේ නම් කර්මය ස්වකීයකොට ඇති සිතින් හා නුවණින් අවබොධ කරයිද?"

"නැත, කර්මය ස්වකීයකොට ඇති සිතින් හා නුවණින් අවබොධ නොකරයි."

"එසේ නම් සත්‍යානු ලොමක සිතින් හා නුවණින් අවබොධ කරයිද?"

"නැත, සත්‍යාවබොධ අනුකූලවූ සිතින් හා නුවණින් අවබොධ කරයිද?"

"එසේනම් අතීතවූ සිතින් හා නුවණින් අවබොධ කරයිද?"

"නැත, ඉකුත්වූ අතීතවූ සිතින් හා නුවණින් අවබොධ නොකරයි."

"එසේනම් අනාගත සිතින් හා නුවණින් අවබොධ කරයිද?"

"නැත, අනාගත සිතින් හා නුවණින් අවබොධ නොකරයි."

"එසේ නම් වර්තමාන ලෞකික සිතින් හා නුවණින් අවබොධ කරයිද?"

"නැත, වර්තමානවූ ලෞකික සිතින් හා නුවණින් අවබොධ නොකරයි. ලොකොත්තර මාර්ග ක්ෂණයෙහිම වර්තමාන සිතින් හා නුවණින් අවබොධ කරයි."

**2.** "කෙසේ නම් ලොකොත්තර මාර්ගක්ෂණයෙහිම වර්තමානවූ සිතින් හා නුවණින් අවබොධ කරයිද? ලොකොත්තර මාර්ගක්ෂණයෙහි;

"මාර්ග ඥානය ඉපදවීමෙහි අධිපතිවූ සිත ඥානයට හේතුද ප්‍රත්‍යයද වෙයි. ඒ නුවණ හා යෙදුණු සිත නිවණ අරමුණු කොට පවතී. නිර්වාණ දර්ශනයෙහි අධිපතිවූ නුවණ සිතට හේතුද

ප්‍රත්‍යයද වෙයි. ඒ සිත හා යෙදුණු ඥානය නිවණ අරමුණුකොට පවතී.

"මෙසේ ලොකොත්තර මාර්ගක්ෂණයෙහි වර්තමානවූම සිතින් හා නුවණින් අවබොධ කරයි.

"කිම, අභිසමය නම් මෙතෙක්මද? නැත ලොකොත්තර මාර්ගක්ෂණයෙහි (ii) සම්මාදිට්ඨිය දර්ශනාභිසමයයි. සම්‍යක් කල්පනාව අභිනිරොපනාභිසමයයි. හෙවත් මිත්‍ථ්‍යා සංකල්පනාවෙන් තොරව මනාව නැංවීම නම් සත්‍යාවබොධයයි. සම්‍යක් වචනය පටිග්ගාහි සමයි. හෙවත් මිත්‍ථ්‍යාවචනයෙන් තොරව හාත්පසින් ගැනීම නම් සත්‍යාවබෝධයයි. සම්‍යක් කර්මාන්තය සමුට්ඨානාභිසමයයි හෙවත් මිත්‍ථ්‍යාකර්මාන්තයෙන් තොරව මනාසේ නගා සිටුවීම නම් සත්‍යාවබොධයයි. සම්‍යක් ආජීවය වොදානාභිසමයයි. මිත්‍ථ්‍යාආජීවයෙන් තොරව පිරිසුදු වීම නම් සත්‍යාවබොධයයි. සම්‍යක්ව්‍යායාමය පග්ගහාභිසමයයි. මිත්‍ථ්‍යාව්‍යායාමයෙන් තොරව දැඩිකොට ගැණීම නම් සත්‍යාවබොධයයි.

සම්‍යක් ස්මෘතිය උට්ඨානාභිසමයයි. මිත්‍ථ්‍යාස්මෘතියෙන් තොරව වැටහීම නම් සත්‍යාවබොධයයි සම්‍යක් සමාධිය අවික්ඛොපාභි සමයයි මිත්‍ථ්‍යාසමාධියෙන් තොරව නොවිසිරීම නම් සත්‍යාවබොධයයි. සතිසම්බොජ්ක්ධංගය උපට්ඨානාභිසමයයි. වැටහීම නම්වූ සත්‍යඥානයයි. ධර්මවිචය සම්බොජ්ක්ධංගය පච්චයාභිසමයයි. විමසීම නම් සත්‍ය ඥානයයි. විරියසම්බොජ්ක්ධංගය පග්ගහාභිසමයයි. දැඩිකොට ගැණීම නම් සත්‍ය ඥානයයි. පීතිසම්බොජ්ක්ධංගය, ඵරණාභිසමයයි. පැතිරීම නම් සත්‍ය ඥානයයි. පස්සද්ධි සම්බොජ්ක්ධංගය, උපසමාභිසමයයි. සන්සිඳීම නම් සත්‍ය ඥානයයි. සමෘධි සම්බොජ්ක්ධංගය, අවික්ඛෙපාභි සමයයි. නොවිසිරීම නම් සත්‍යඥානයයි. උපෙක්ඛාසම්බොජ්ක්ධංගය, පටිසංඛාරාභිසමයයි සත්ව සංස්කාරයන් විෂයෙහි මධ්‍යස්ථවීම නම් සත්‍ය ඥානයයි.

3. සද්ධාබලය අශ්‍රද්ධාවෙහි අකම්පියාභිසමයයි. නොසැලීම් නම් සත්‍ය ඥානයයි. විරිය බලය කුසීත කමෙහි

අකම්පියාභිසමයයි. නොසැලීම නම් සත්‍ය ඥානයයි. සතිබලය ප්‍රමාදයෙහි අකම්පියාභිසමයයි. නොසැලීම නම් සත්‍ය ඥානයයි. සමාධිබලය සිතේ විසුරුණු ස්වභාවයෙහි අකම්පියාභි සමයයි. නොසැලීම් නම් සත්‍ය ඥානයයි. පඤ්ඤා බලය අවිද්‍යාවෙහි අකම්පියාභි සමයයි. නොසැලීම නම් සත්‍ය ඥානයයි.

සද්ධින්ද්‍රිය අධිමොක්ඛාභිසමයයි. ආලම්බන නිශ්චයාකාරයෙන් උපදින අවබොධයයි.

විරියින්ද්‍රිය පග්ගාහාභිසමයයි. දැඩිකොට ගැනීම් නම් සත්‍ය ඥානයයි.

සතින්ද්‍රිය උපට්ඨානාභිසමයයි. සමීපකොට වටහාගැනීම නම් සත්‍ය ඥානයයි.

සමාධින්ද්‍රිය අවික්ඛොභිසමයයි. නොවිසිරීම් නම් සත්‍ය ඥානයයි.

පඤ්ඤින්ද්‍රිය දස්සනාභිසමයයි. යථාතත්ව දර්ශනය නම් සත්‍ය ඥානයයි.

**5.** අධිපති අර්ථයෙන් ඉන්ද්‍රියාභිසමයයි. ඉන්ද්‍රිය නම් තත්වාවබොධයයි. කම්පා නොවීම් අර්ථයෙන් බලාභි සමයයි. බල නම් තත්වාවබොධයයි. නෛයාර්නික (සසරින් නික්මීම් අර්ථයෙන් බොජ්ක්ධංගාභිසමයයි, බොජ්ක්ධංග නම් තත්වාවබොධයයි. හේතුය කාරණය යන අර්ථයෙන් මාර්ගාභි සමය නම්වේ. මාර්ග නම් තත්වාවබොධයයි. සමීපකොට වටහා ගැනීම් අර්ථයෙන් සතිපට්ඨානාභි සමය නම් වේ. සතිපට්ඨාන නම් තත්වාවබොධයයි. වෑයම් කිරීම් අර්ථයෙන් සම්මප්පධානාභි සමයයි. සම්මප්පධාන නම් තත්වාවබොධයයි.

**6.** සමෘද්ධවීම අර්ථයෙන් ඉද්ධිපාදාභිසමය නම්වේ. ඉද්ධිපාද නම් අභිසමයයි. තත්වාර්ථනේ එසේම වෙනස් නොවේ යන අර්ථයෙන් සත්‍යාභිසමයයි. සත්‍ය නම් අභිසමයයි. නොවිසිරීම් අර්ථයෙන් සමථාභිසමයයි. සමථ නම් අභිසමයයි. තිලකුණු අනුව බැලීම් අර්ථයෙන් විදර්ශනාභිසමයයි විදර්ශනානම්වූ අභිසමයයි. අසහාය රසාර්ථයෙන් සමථවිදර්ශනා අභිසමයයි විදර්ශනා නම් අභිසමයයි. නොඉක්මවීම් අර්ථයෙන් යුගනන්ධාභිසමයයි. යුගනන්ධ නම්

අභිසමයයි. සංවරණාර්ථයෙන් සීල විශුද්ධි අභිසමයයි. සීල විශුද්ධි නම් අභිසමයයි. නොසිරීම් අර්ථයෙන් චිත්ත විශුද්ධි අභිසමයයි චිත්ත විශුද්ධි නම් අභිසමයයි. යථාතත්ව දර්ශනාර්ථයෙන් දිට්ඨි විශුද්ධි අභිසමයයි. දිට්ඨි විශුද්ධි නම්වූ අභිසමයයි.

7. මිදීම අර්ථයෙන් අධිමොක්ඛාභිසමයයි. අධිමොක්ඛනම්වූ අභිසමයයි ප්‍රතිවේධාර්ථයෙන් විජ්ජාභිසමයයි. විද්‍යානම්වූ අභිසමයයි. පරිත්‍යාගාර්ථයෙන් විමුක්ති අභිසමයයි. විමුක්ති නම්වූ අභිසමයයි. මුළු සුන් කිරීම් අර්ථයෙන් ඛයේ ඤාණාභි සමයයි. ඛයේ ඤාණ නම් අභිසමයයි,

8. කුසල්කිරීමේ කැමැත්ත මුල්වීමේ අර්ථයෙන් අභිසමය නම් වේ.

(මේ වාක්‍ය අගට "අභිසමය නම් වේ" යෙදිය යුතුයි)

මෙනෙහිකිරීම නගාසිටුවීමේ අර්ථයෙන් - ස්පර්ශය එක අරමුණක එකතුකිරීම් - අර්ථයෙන් වේදනාව (සිතට) කාවැදීම් අර්ථයෙන් - සමාධිය ප්‍රමුඛාර්ථයෙන් - සතිය අධිපති අර්ථයෙන් - ප්‍රඥාව ඊට වඩා උසස්ය යන අර්ථයෙන් - විමුක්තිය සාරය යන අර්ථයෙන් - අමෘතයට ඇතුළත් (අමාමහ) නිවණ කෙළවරවීම අර්ථයෙන් - අභිසමය නම් වේ.

9. කිම, අභිසමය මෙතෙක්මද?

නැත. සෝවාන්පලයට පැමිණෙනකෙණෙහි (ii) දර්ශනාභි සමය සම්‍යක් දර්ශනයයි සන්සිඳවීම් අර්ථයෙන් නූපදවීමේ ඥානය අභිසමයයි. ඡන්දය මුල්වීම් අර්ථයෙන් අභිසමය නම් වේ. අමෘතයට ඇතුළත් නිවණ කෙළවරවීම අර්ථයෙන් අභිසමය නම් වේ. (iii)

10. කිම, අභිසමය මෙතෙක්මද?

නැත. සකෘදාගාමි මාර්ගක්ෂණහි, (මෙහි (ii) යොදන්න) සකෘදාගාමි ඵලක්ෂණයෙහි (මෙහි (ii) යොදන්න) අනාගාමි මාර්ගක්ෂණයෙහි (මෙහි (ii) යොදන්න) අනාගාමි ඵලක්ෂණයෙහි (මෙහි (ii) යොදන්න) අර්හත් මාර්ගක්ෂණයෙහි (මෙහි (ii) යොදන්න) අර්හත්පලක්ෂණයෙහි (මෙහි (ii) යොදන්න) සම්‍යක්දර්ශනය, දර්ශනාභිසමයයි. සම්‍යක් කල්පනාව අභිනිරොපනාභිසමයයි. මනාව නැංවීම් සංඛ්‍යාත

සත්‍යාවබොධයයි. සන්සිඳවීම් අර්ථයෙන් නූපදවීමේ ඥානය අභිසමයයි. ඡන්දය මුල්වීම් අර්ථයෙන් අභිසමය නම් වේ.

අමෘතයට ඇතුළත් නිවණ කෙළවරවීම් අර්ථයෙන් අභිසමය නම් වේ.

11. ඒ මේ ආර්ය පුද්ගලතෙමේ කෙලෙස් දුරුකරයි. අතීතයෙහිවූ කෙළෙස් දුරුකරයි, අනාගතයෙහි වන කෙලෙස් දුරුකරයි. වර්තමාන කෙලෙස් දුරුකරයි.

"අතීත කෙලෙස් දුරුකරයි යනු ඉදින් අතීතකාලයේ කෙලෙස් දුරුකෙරේ නම්, ක්ෂය කළ කෙලෙස් ක්ෂයකරයිද?

නිරුද්ධවූ කෙළෙස් නිරුද්ධ කරයිද, පහවූ කෙලෙස් පහ කරයිද, අස්තංගතවූ කෙලෙස්ම අස්තයට පමුණුවාද, අතීතවූ යම් ක්ලේශයක් නැත්නම් ඒ නැති කෙළෙස් දුරුකෙරේය යන කීම අනුව නම් අතීත කෙලෙස් දුරුකිරීමක් නැත.

"අනාගත කෙළෙස් දුරුකෙරේය" යන මෙහි ඉදින් අනාගත කෙලෙස් දුරුකරයි නම් නොහටගත් කෙළෙස් දුරු කරයිද?

12. නොනිපන් කෙළෙස් දුරුකරයිද, නූපන් දෙයක් දුරුකරයිද, පහළ නොවූවක් දුරුකරයිද?

නූපන් යමක් නැත්නම් ඒ නූපන්දෙය දුරුකරයි යන කීම අනුව නම් අනාගත කෙළෙස් දුරුකිරීමක් නැත.

"වර්තමාන කෙළෙස් දුරුකෙරෙයි" යන මෙහි ඉදින් පවතින්නාවූම කෙළෙස් දුරුකෙරෙයි නම් රාගයෙන් රත්වූ තැනැත්තා රාගය දුරුකරයිද, ද්වේෂයෙන් දුෂ්ටවූ තැනැත්තා ද්වේෂය දුරුකරයිද, මෝහයෙන් මුළාවූ තැනැත්තා මෝහය දුරුකරයිද, මානයෙන් බැඳුණු තැනැත්තා මානය දුරුකරයිද, මිථ්‍යාදෘෂ්ටියෙන් පරාමර්ශනය කළ තැනැත්තා මිථ්‍යාදෘෂ්ටිය දුරුකෙරේද, විසිරුණු සිත් ඇත්තා (උද්ධච්චය) සිතේ විසිරුණු බව දුරුකෙරේද, තීරණයට නොපැමිණි තැනැත්තා (විචිකිච්ඡාව) සැකය දුරු කරයිද, ස්ථිරභාවයට පැමිණි කෙළෙස් ඇත්තා සිතේ තැන්පත් කෙළෙස් දුරුකරයිද, කුශලාකුශල ධර්මයෝ එකට බැඳී එකටම පවතිත් නම් එවිට මාර්ග භාවනාව කිලිටිවන්නේ නොවේද, අතීත කෙළෙස් දුරුනොකරයි, අනාගත කෙළෙස් දුරු නොකරයි. වර්තමාන කෙළෙස් දුරුනොකරයි.

ඉදින් අතීත කෙළෙස් දුරුකරයි නම් අනාගත කෙළෙස් දුරු නොකරයි නම් වර්තමාන කෙළෙස් දුරු නොකරයි නම් මාර්ගභාවනාවක් නැත, පල ප්‍රත්‍යක්ෂකිරීමක් නැත. එය එසේ නොවේ මාර්ග භාවනාව ඇත. පල ප්‍රත්‍යක්ෂ කිරීම ඇත. කෙළෙස් දුරුකිරීම ඇත. නිර්වාණ ධර්මාවබොධය ඇත.

ඒ කෙසේදයත්? යම්සේ පලනොගත් රුකක් වේනම් මිනිසෙක් ඒ ගස මුලින් සිඳියිද, එවිට ඒ රුකෙහි හටනොගත් පලයෝ හටනොගත්තාහුම වෙත්. නොනිපන් පලයෝම නොමනිපදිත්. නූපන්නාහුම නූපදිත්. පහළ නොවූවෝම පහළ නොවෙත්.

එසේ නිෂ්පත්තිය පිණිස ඉපැත්ම හේතුවය. ඉපැත්ම අනායයයි (දැක ඉපැත්මේ ආදීනව දැක නොඉපදීම කෙරෙහි හිත වහා දුවයි. අනුත්පාදය කෙරෙහි හිත දැඩිව බැසගත් හෙයින් ඉපදීම නිසා මේ ක්ලේශ කෙනෙක් හටගනිත් නම් ඔව්හු නොහටගත්තාහුම නොහටගනිත්, නොනිපන්නාහුම නොනිපදිත්, නූපන්නාහුම නූපදිත්, පහළනොවූවාහුම පහළ නොවෙත්.

14. මෙසේ හේතුව නිරුද්ධවීමෙන් දුක් නිරුද්ධ වෙත්. (ii) කෙළෙසුන්ගේ නිපදීම පිණිස (iii) පැවැත්ම හේතුය. මෙහි (ii) යොදන්න) නිමිත්ත හේතුය (මෙහි (ii) යොදන්න) කර්ම රැස්කිරීම හේතුය. කර්ම රැස්කිරීම ප්‍රත්‍යයයි කර්ම රැස්කිරීමෙහි ආදීනව දැක කර්ම රැස්නොකිරීමෙහි සිත වහා දුවයි. කර්ම රැස්නොකිරීමෙහි සිත දිවූ බැවින් කර්ම රැස්කිරීම නිසා යම් ක්ලේශ කෙනෙක් උපදින්නාහු වෙත්. ඔව්හු නොහටගත්තාහුම නොහටගනිත්. නොනිපන්නාහුම නොනිපදෙත්. නූපන්නාහුම නූපදිත් පහළනොවූවාහුම පහළනොවෙත්. එසේ හේතුව නැතිවීමෙන් දුක් නැතිවේ.

මේ හේතු යුක්ති අනුව මාර්ග භාවනාව ඇත. පල ප්‍රත්‍යක්ෂ කිරීම ඇත. කෙළෙස් ප්‍රහාණය ඇත. නිර්වාණ ධර්මාවබොධය ඇත.

**(අභිසමය කථා නිමි)**

---

## 24 විවේක කථා.

1. "මහණෙනි, යම්සේ බාහු බලයෙන් කළයුතුවූ යම්කිසි කර්මාන්තයෝ කරනු ලැබෙත්ද, ඒ සියලු බල කරණීය කර්මාන්තයෝ පොළොව ඇසුරු කොටම පොළොවෙහි සිටම කරනු ලැබෙත්. එමෙන්ම මේ සස්නෙහි මහණතෙමේ ශීලය ඇසුරුකොට සීලයෙහි පිහිටාම ආර්ය අෂ්ටාංගික මර්ගය වඩයි. ආර්ය අෂ්ටාංගික මාර්ගය බහුල වශයෙන් වඩයි.

2. "මහණෙනි, භික්ෂුතෙමේ සීලය ඇසුරුකොට සීලයෙහි පිහිටා කෙසේනම් ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩාද, බහුල වශයෙන් වඩයිද?

"මහණෙනි, මේ සස්නෙහි භික්ෂුතෙමේ (ii) විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ කෙළෙස් හැර දැමීමේ මුහුකළ (iii) සම්‍යක් දර්ශනයා සම්මාදිට්ඨිය වඩයි. (මෙහි (ii) යොදන්න.) සම්‍යක් සංකල්පය (සිතට අරමුණු නැංවීම) (මෙහි (ii) සම්‍යක් වචනය වඩයි. (මෙහි (ii) ) සම්‍යක් කර්මාන්තය වඩයි. (මෙහි (ii) සම්‍යක් ආජීවය වඩයි. (මෙහි (ii) ) සම්‍යක් ව්‍යායාමය වඩයි. (මෙහි (ii) සම්‍යක් ස්මෘතිය වඩයි. විවේකය ඇසුරුකළ නොඇලීම ඇසුරුකළ නිරුද්ධ කිරීම ඇසුරුකළ කෙළෙස් හැරදැමීමෙන් මුහුකළ සම්‍යක් සමාධිය මනාසේ සිත එකඟ කිරීම වඩයි.

3. "මහණෙනි මෙසේ භික්ෂුතෙමේ ශීලය ඇසුරුකොට ශීලයෙහි පිහිටා ආර්ය අෂ්ටාංගිකමාර්ගය වඩයි. බහුල වශයෙන් වඩයි. මහණෙනි, කිසියම් පැළවෙන බීජ සමූහයක් හා පැළෑටි සමූහයක් වැඩෙත්ද, විශේෂයෙන් වැඩෙත්ද, විපුල බවට පැමිණෙත්ද, ඒ සියල්ල යම්සේ පොළොව නිසා පොළොවේ පිහිටා වැඩෙත්ද, විශේෂයෙන් වැඩෙත්ද, මහත් බවට පැමිණෙද්ද, මහණෙනි, එසේම භික්ෂු තෙමේ ශීලයම නිසා ශීලයෙහි පිහිටා ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩමින් ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩිදියුණු කරමින් නොවූ ධර්මයන්හි වැඩීමට වැඩිදියුණුවීමට මහත් බවට පැමිණෙයි.

4. "මහණෙනි, භික්ෂුතෙමේ සීලය නිසා ශීලයෙහි පිහිටා ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩමින් වැඩිදියුණු කරමින්

කෙසේනම් නුවූවිරූ දහම් විෂයෙහි වැඩීමට වැඩිදියුණුවීමට මහත් බවට පැමිණේද? (මෙහි 2 ඡේදය යොදන්න)

5. "සම්‍යක් දර්ශනයාගේ (ii) විවේක පසකි. විරාග පසකි. නිරොධ පසකි. කෙලෙස් හැරදැමීම් පසකි. ඡන්දාදී නිශ්‍රය ධර්ම දොළොසකි. (iii) සම්‍යක් සංකල්පනාවේ (මෙහි (ii) යොදන්න.) සම්‍යක් වචනයේ (මෙහි (ii) සම්‍යක් කර්මාන්තයන් (මෙහි (ii) සම්‍යක් ආජීවයේ (මෙහි (ii) ) සම්‍යක් ව්‍යායාමයේ (මෙහි (ii) සම්‍යක් ස්මෘතියේ (මෙහි (ii)) සම්‍යක් සමාධියේ (මෙහි (ii) යොදන්න.)

"සම්‍යක් දර්ශනයේ පංච විවේකයෝ කවරහුද? (ii) වික්ඛම්භන විවේකය, තදංග විවේකය, සමුච්ඡෙද විවේකය, පටිප්පස්සද්ධි විවේකය, නිස්සරණ විවේකය, යනු මේ පසයි.

6. (1) ප්‍රථම ධ්‍යානය වඩන්නහුගේ පංච නීවරණයන් යටපත් කිරීම වශයෙන් දුරුකිරීම නම්වූ වික්ඛම්භන විවේකයද,

2. විදර්ශනාව හා යෙදුණු සමාධිය වඩන්නහුගේ නානා දෘෂ්ටීන් ඒ ඒ කරුණුවලින් දුරුකිරීම නම් තදංග විවේකයද,

3. ක්ලේශ ක්ෂය නම් නිර්වාණගාමී ලොකොත්තර මාර්ගය වඩන්නහුගේ සමුච්ඡෙද විවේකයද,

4. සිව් මග පිළිබඳ ඵල ලාභයෙහි පටිප්පස්සද්ධි විවේකයද,

5. සියලු කෙලෙස් නිරුද්ධ කිරීම හා නිවීම නම්වූ නිස්සරණ විවේකයද යන මේ විවේක පස සම්‍යක් දෘෂ්ටිය පිළිබඳ වෙත්.

(ii) මේ පස් වැදෑරුම් විවේකයන්හි පූර්වභාගයෙහිම ධර්මච්ඡන්දය හටගත්තේ වෙයි. ශ්‍රද්ධාව අධිකවීමෙන් නිවණෙහි යෙදුනේ වෙයි. ඔහුගේ සිතද නිවණෙහි මනාකොට පිහිටියේ වෙයි.

7. "සම්‍යක් දෘෂ්ටිය පිළිබඳ විරාග පස කවරහුදයත්? විෂ්කම්භන විරාගය, තදංග විරාගය, සමුච්ඡෙද විරාගය පටිප්පස්සද්ධි විරාගය, නිස්සරණ විරාගය යන මේ පසයි. ප්‍රථම ධ්‍යානය වඩන්නහුගේ පංච නීවරණයන්ගේ විෂ්කම්භන විරාගයද විදර්ශනාව හා යෙදුනු සමාධිය වඩන්නහුගේ නානා දෘෂ්ටීන් පිළිබඳ තදංග විරාගයද, ක්ලේෂ ක්ෂය නම් නිර්වාණගාමී ලොකොත්තර මාර්ගය වඩන්නහුගේ සමුච්ඡෙද විරාගයද, සිව් මග ඵල ලාභයෙහි පටිප්පස්සද්ධි විරාගයද, කෙලෙසුන්ගේ

නිරුද්ධිය කිරීම හා නිවීම නම්වූ නිස්සරණ විරාගයද යන මේ පස සම්මාදිට්ඨියේ පංච විරාගයෝය. මේ පස් වැදෑරුම් විරාගයන්හි පූර්වභාගයෙහිම ධර්මච්ඡන්දය හටගත්තේ වෙයි. ශ්‍රද්ධාව අධිකවීමෙන් විරාගයෙහි යෙදුනේ වෙයි. ඔහුගේ සිතද නිවණෙහි මනාව පිහිටියේ වෙයි.

8. "සම්‍යක් දෘෂ්ටිය පිළිබඳ පස් වැදෑරුම් නිරොධයෝ කවරහුද යත්?

1. ප්‍රථම ධ්‍යානය වඩන්නහුගේ පංච නීවරණයන්ගේ විෂ්කම්භන නිරොධයද,

2. විදර්ශනාව හා යෙදුනු සමාධිය වඩන්නහුගේ නානා දෘෂ්ටීන් පිළිබඳ තදංග නිරොධයද,

3. ක්ලේශ ක්ෂය සංඛ්‍යාත නිර්වාණගාමී ලොකොත්තර මාර්ගය වඩන්නහුගේ සමුච්ඡෙද නිරොධයද,

4. සිව් වැදෑරුම් ඵල ලාභයෙහි පටිප්පස්සද්ධි නිරොධයද,

5. අමෘත ධාතු නම්වූ නිස්සරණ නිරොධයද යන මේ පස සම්‍යක් දෘෂ්ටිය පිළිබඳ පස් වැදෑරුම් නිරොධයෝයි. මේ පස් වැදෑරුම් නිරොධයන්හි පූර්වභාගයෙහිම ධර්මච්ඡන්දය හටගත්තේ වෙයි. ශ්‍රද්ධාව අධිකවීමෙන් නිවණෙහි යෙදුනේ වෙයි. ඔහුගේ සිතද නිවණෙහි මනාව පිහිටියේ වෙයි.

9. "සම්‍යක් දෘෂ්ටිය පිළිබඳ පස්වැදෑරුම් වොස්සග්ගයෝ (කෙලෙස් සම්පූර්ණයෙන් හැරදැමීම්) කවරහුද යත්? විෂ්කම්භන, තදංග, සමුච්ඡෙද, පටිප්පස්සද්ධි, නිස්සරණ යන පසයි.

1. ප්‍රථම ධ්‍යානය වඩන්නහුගේ නීවරණයන්ගේ විෂ්කම්භන වොස්සග්ගයද,

2. විදර්ශනාව හා යෙදුනු සමාධිය වඩන්නහුගේ නානා දෘෂ්ටීන් පිළිබඳ තදංග වොස්සග්ගයද,

3. ක්ලේශ ක්ෂය සංඛ්‍යාත නිර්වාණගාමී ලොකොත්තර මාර්ගය වඩන්නහුගේ සමුච්ඡෙද වොස්සග්ගයද,

4. සිව්මග ඵලලාභයෙහි පටිප්පස්සද්ධි වොස්සග්ගයද,

5. කෙලෙස් නිරුද්ධවීම හා නිවීම යන නිස්සරණ වොස්සග්ගයද යන මේ පස සම්‍යක් දෘෂ්ටිය පිළිබඳ පස්වැදෑරුම් වොස්සග්ගයෝයි.

"මේ පස්වැදෑරුම් වොස්සග්ගයන්හි පූර්ව භාගයන්හි ධර්මච්ඡන්දය හට ගත්තේ වෙයි. ශ්‍රද්ධාව අධික වීමෙන් නිවණෙහි යෙදුනේ වෙයි. ඔහුගේ සිතද නිවණෙහි මනාව පිහිටියේ වෙයි.

10. "සම්‍යක් දෘෂ්ටිය පිළිබඳ මොව්හු (ii) පස් වැදෑරුම් විවේකයෝයි. පස් වැදෑරුම් විරාගයෝයි. පස් වැදෑරුම් නිරෝධයෝයි. පස් වැදෑරුම් වොස්සග්ගයෝයි. දොළොස් වැදෑරුම් නිස්සයයෝයි. (iii)

"සම්‍යක් සංකල්පයේ (මෙහි (ii) වචනයේ (මෙහි (ii) යොදන්න. සම්‍යක් කර්මාන්තයේ (මෙහි (ii) යොදන්න.) සම්‍යක් ආජීවයේ (මෙහි (ii) යොදන්න.) සම්‍යක් ව්‍යායාමයේ (මෙහි (ii) යොදන්න.) සම්‍යක් ස්මෘතියේ (මෙහි (ii) යොදන්න.) සම්‍යක් සමාධියේ (මෙහි (ii) යොදන්න.) සම්‍යක් සමාධියේ පස් වැදෑරුම් විවේකයෝ කවරහුද?

1. වික්ඛම්භන විවේකය 2 තදංග විවේකය 3 සමුච්ඡේද විවේකය 4 පටිප්පස්සද්ධි විවේකය 5 නිස්සරණ විවේකය යන මේ පසයි.

1. ප්‍රථම ධ්‍යානය වඩන්නහුගේ පංච නීවරණයන්ගේ විෂ්කම්භන විවේකයද,

2. විදර්ශනාව හා යෙදුනු සමාධිය වඩන්නහුගේ නානා දෘෂ්ටීන් පිළිබඳ තදංග නිරොධයද,

3. ක්ලේශ ක්ෂය සංඛ්‍යාත නිර්වාණගාමී ලොකොත්තර මාර්ගය වඩන්නහුගේ සමුච්ඡේද විවේකයද,

4. සිව්මග ඵලලාභයෙහි පටිප්පස්සද්ධි විවේකයද,

5. කෙලෙස් නිරුද්ධවීම හා නිවීම යන නිස්සරණ විවේකයද යන මේ පස සම්‍යක් සමාධිය පිළිබඳ පස්වැදෑරුම් විවේකයෝයි. පස් වැදෑරුම් විවේකයන්හි පූර්ව භාගයෙහිම ධර්මච්ඡන්ද හට ගත්තේ වෙයි. ශ්‍රද්ධා අධික වීමෙන් නිවණෙහි යෙදුනේ වෙයි. ඔහුගේ සිතද මනාව නිවණෙහි පිහිටියේ වෙයි.

11. "සම්‍යක් සමාධියේ පස් වැදෑරුම් විරාගයෝ කවරහුද,

වික්ඛම්භන විරාගය 2 තදංග විරාගය 3 සමුච්ඡේද විරාගය පටිප්පස්සද්ධි විරාගය නිස්සරණ විරාගය යන මේ පසයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

1. ප්‍රථම ධ්‍යානය වඩන්නහුගේ පංච නීවරණයන්ගේ වික්ඛම්භන විරාගයද,

2. විදර්ශනාව හා යෙදුනු සමාධිය වඩන්නහුගේ නානා දෘෂ්ටීන් පිළිබඳ තදංග විරාගයද,

3. ක්ලේශ ක්ෂය සංඛ්‍යාත නිර්වාණගාමී ලොකොත්තර මාර්ගය වඩන්නහුගේ සමුච්ඡෙද විරාගයද,

4. සිව්මග පිළිබඳ ඵලලාභයෙහි පටිප්පස්සද්ධි විරාගයද,

5. කෙලෙස් නිරුද්ධවීම හා නිවීම යන නිස්සරණ විරාගයද යන මොව්හු සම්‍යක් සමාධිය පිළිබඳ පස් වැදෑරුම් විරාගයෝයි.

"මේ පස්වැදෑරුම් විරාගයන්හි පූර්ව භාගයෙහිම ධර්මච්ඡන්දය හට ගත්තේ වෙයි. ශ්‍රද්ධාව අධික වීමෙන් නිවණෙහි යෙදුනේ වෙයි. ඔහුගේ සිතද නිවණෙහි මනාව පිහිටියේ වෙයි.

12. "සම්‍යක් සමාධියේ පස්වැදෑරුම් නිරොධයෝ කවරහුද යත්,

1. වික්ඛම්භන නිරොධය 2 තදංග නිරොධය 3 සමුච්ඡෙද නිරොධය 4 පටිප්පස්සද්ධි නිරොධය 5 නිස්සරණ නිරොධය යන මේ පසයි.

1. ප්‍රථම ධ්‍යානය වඩන්නහුගේ නීවරණයන්ගේ වික්ඛම්භන නිරොධයද,

විදර්ශනාව හා යෙදුනු සමාධිය වඩන්නහුගේ නා නා දෘෂ්ටීන් පිළිබඳ තදංග නිරොධයද,

3. ක්ලේශ ක්ෂය සංඛ්‍යාත නිර්වාණගාමී ලොකොත්තර මාර්ගය වඩන්නහුගේ සමුච්ඡෙද නිරොධයද,

4. (සිව්මග පිළිබඳ) ඵල ලාභයෙහි පටිප්පස්සද්ධි නිරොධයද,

5. කෙලෙස් නිරුද්ධවීම හා නිවීම යන නිස්සරණ නිරොධයද යන මොව්හු සම්‍යක් සමාධිය පිළිබඳ පස් වැදෑරුම් නිරොධයෝය.

"මේ පස්වැදෑරුම් නිරොධයන්හි පූර්වභාගයෙහිම ධර්මච්ඡන්දය හටගත්තේ වෙයි. ශ්‍රද්ධාව අධික වීමෙන් නිවණෙහි යෙදුනේ වෙයි. ඔහුගේ සිතද නිවණෙහි මනාව පිහිටියේ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

13. "සම්‍යක් සමාධියේ පස්වැදෑරුම් වොස්සග්ගයෝ කවරහුද යත්?

1. වික්ඛම්භන වොස්සග්ගය 2 තදංග වොස්සග්ගය 3 සමුච්ඡේද වොස්සග්ගය 4 පටිප්පස්සද්ධි වොස්සග්ගය 5 නිස්සරණ වොස්සග්ගය යන මේ පසයි.

2. ප්‍රථම ධ්‍යානය වඩන්නහුගේ නීවරණයන්ගේ වික්ඛම්භන වොස්සග්ගයද,

විදර්ශනාව හා යෙදුනු සමාධිය වඩන්නහුගේ නා නා දෘෂ්ටීන් පිළිබඳ තදංග වොස්සග්ගයද,

3. ක්ලෙශ ක්ෂය නම්වූ නිර්වාණගාමී ලොකොත්තර මාර්ගය වඩන්නහුගේ සමුච්ඡේදය වොස්සග්ගයද,

4. සිව් මග පිළිබඳ ඵල ලාභයෙහි පටිප්පස්සද්ධියද

5. කෙලෙස් නිරුද්ධවීම හා නිවීම් යන නිස්සරණ වොස්සග්ගයද,

"යන මොව්හු සම්‍යක් සමාධිය පිළිබඳ පස් වැදෑරුම් වොස්සග්ගයෝයි. මේ පස් වැදෑරුම් වොස්සග්ගයන්හි පූර්ව භාගයෙහිම ධර්මච්ඡන්දය හටගත්තේ වෙයි. ශ්‍රද්ධාව අධික වීමෙන් නිවණෙහි යෙදුනේ වෙයි. ඔහුගේ සිතද නිවණෙහි මනාව පිහිටියේ වෙයි. සම්‍යක් සමාධිය පිළිබඳ මොව්හු පස් වැදෑරුම් විවේකයෝයි. පස්වැදෑරුම් විරාගයෝයි. පස්වැදෑරුම් නිරොධයෝයි. දොළොස් වැදෑරුම් නිස්සයෝයි.

14. "මහණෙනි, යම්සේ බාහු බලයෙන් කළයුතු යම්කිසි කර්මාන්තයෝ කරනු ලැබෙද්ද, ඒ සියලු බල කරණීය කර්මාන්තයෝ පොළොව ඇසුරු කොටම පොළොවේ සිටම කරනු ලැබෙත්. එමෙන්ම මේ සස්නේ මහණතෙමේ ශීලය ඇසුරු කොට ශීලයෙහි පිහිටාම බොධ්‍යංග ධර්ම සත වඩයි. බහුල වශයෙන් වඩයි. බොජ්ක්ධංග ධර්ම සත වඩමින් බහුල වශයෙන් වඩමින් පෙර නොවූවිරූ ධර්මයන්හි වැඩීමට වැඩිදියුණු වීමට මහත් බවට පැමිණේ (ii) මහණෙනි, මේ සස්නෙහි මහණ තෙමේ ශීලය නිසා ශීලයෙහි පිහිටා බොජ්ක්ධංග ධර්ම සත වඩමින් වැඩිදියුණු කරමින් කෙසේ නම් පෙර නොවූ විරූ ධර්මයන්හි වැඩීමට වැඩිදියුණුවීමට මහත් බවට පැමිණේද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

**15.** "ශ්‍රද්ධාදී බල පස වඩයි. බහුල වශයෙන් වඩයි. බලපස වඩමින් වැඩිදියුණු කරමින් පෙර නොවූවිරූ ධර්මයන්හි වැඩීමට වැඩිදියුණුවීමට මහත් බවට පැමිණේ. ('බොජ්ක්ධංග ධර්ම සත' යන්න 'බලපස වඩමින්' කියා වෙනස්කොට මෙහි 14 (ii) යොදන්න) ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය පස වඩයි. බහුල වශයෙන් වඩයි. ඉන්ද්‍රිය පස වඩමින් වැඩිදියුණු කරමින් පෙර නොවූවිරූ ධර්මයන්හි වැඩීමට වැඩිදියුණුවීමට මහත් බවට පැමිණෙයි. ('බොජ්ක්ධංගය ධර්ම සත' යන්න 'ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයි' වෙනස්කොට මෙහි 14 (ii) යොදන්න.) මහණෙනි, යම් කිසි පැලවෙන බීජ සමූහය හා පැලෑටි සමූහයෝ වැඩෙත්ද, විශේෂයෙන් වැඩෙත්ද, විපුල බවට පැමිණෙද්ද ඒ සියල්ල යම්සේ පොළොව නිසාම පොළොවේ පිහිටාම වැඩෙද්ද, විශේෂයෙන් වැඩෙද්ද මහත් බවට පැමිණෙද්ද,

**16.** "මහණෙනි, එසේම භික්ෂු තෙමේ ශීලය නිසාම ශීලයෙහි පිහිටාම ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය පස වඩමින් වැඩිදියුණු කරමින් පෙරනොවූ විරූ ධර්මයන්හි වැඩීමට වැඩිදියුණුවීමට මහත්වීමට පැමිණෙයි.

"මහණෙනි, මේ සස්නෙහි මහණ තෙමේ ශීලය නිසා ශීලයෙහි පිහිටා ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය පස වඩමින් වැඩිදියුණු කරමින් කෙසේ නම් පෙර නුවූ විරූ ධර්මයන්හි වැඩීමට වැඩිදියුණුවීමට මහත් බවට පැමිණේද?

"විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරොධය ඇසුරුකළ කෙළෙස් හැරදැමීමෙන් මුහුකළ ශ්‍රද්ධා ඉන්ද්‍රිය විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය හා ප්‍රඥා ඉන්ද්‍රිය වඩයි.

**17.** "ශ්‍රද්ධා ඉන්ද්‍රියගේ (ii) විවේක පසකි. නිරොධ පසකි. වොස්සග්ග පසකි නිස්සය දොළොසකි (iii) විරියින්ද්‍රියේ (මෙහි (ii) යොදන්න) සතින්ද්‍රියේ (මෙහි (ii) යොදන්න.) සමාධින්ද්‍රියේ (මෙහි (ii) යොදන්න.) පඤ්ඤින්ද්‍රියේ විවේක පසකි. විරාග පසකි. නිරොධ පසකි වොස්සග්ග පසකි නිස්සය දොළසකි.

"ශ්‍රද්ධෙන්ද්‍රියයේ විවේක පස කවරහුද?

(iv) වික්ඛම්භන විවේකය තදංග විවේකය, සමුච්ඡෙද විවේකය, පටිප්පස්සද්ධි විවේකය, නිස්සරණ විවේකය යන මේ පසයි.

"ප්‍රථම ධ්‍යානය වඩන්නහුගේ පංචනීවරණයන් දුරුකිරීම නම්වූ වික්ඛම්භන විවේකයද විදර්ශනාව හා යෙදුණු සමාධිය වඩන්නහුගේ නානා දෘෂ්ටීන් ඒ ඒ කරුණුවලින් දුරුකිරීම නම්වූ තදංග විවේකයද ක්ලේශ ක්ෂය නම් නිර්වාණගාමී ලොකොත්තර මාර්ගය වඩන්නහුගේ සමුච්ඡෙද විවේකයද (සිව්මග පිළිබඳ) ඵල ලාභයෙහි පටිප්පස්සද්ධි විවේකයද සියලු කෙලෙස් නිරුද්ධ කිරීම හා නිවීම නම්වූ නිස්සරණ විවේකයද යන මේ විවේක පස ශ්‍රද්ධෙන්ද්‍රිය පිළිබඳවේ.

"මේ පස්වැදෑරුම් විවේකයන්හි පූර්වභාගයෙහිම ධර්මච්ඡන්දය හටගත්තේ වෙයි. ශ්‍රද්ධාව අධිකවීමෙන් නිවණෙහි යෙදුනේ වෙයි. ඔහුගේ සිතද මනාව පිහිටියේ වෙයි. ශ්‍රද්ධෙන්ද්‍රියගේ විරාග පස කවරහුද? වික්ඛම්භන, තදංග සමුච්ඡෙද, පටිප්පස්සද්ධි, නිස්සරණ යන විරාග පසයි. ශ්‍රද්ධෙන්ද්‍රියගේ නිරොධ පස කවරහුද? වික්ඛම්භන, තදංග, සමුච්ඡෙද, පටිප්පස්සද්ධි, නිස්සරණ යන නිරොධ පසයි. ශ්‍රද්ධෙන්ද්‍රියයේ පස්වැදෑරුම් වොස්සග්ගයෝ කවරහුද? වික්ඛම්භන, තදංග, සමුච්ඡෙද, පටිප්පස්සද්ධි, නිස්සරණ යන පසයි. මොව්හු ශ්‍රද්ධා ඉන්ද්‍රිය පිළිබඳවූ පස්වැදෑරුම් විවේකයෝයි. පස්වැදෑරුම් විරාගයෝයි, පස්වැදෑරුම් නිරොධයෝයි. පස්වැදෑරුම් වොස්සග්ගයෝයි. දොළොස් වැදෑරුම් නිශ්‍රයයෝයි.

18. "විරියින්ද්‍රියගේ (මෙහි 17 ඡෙදයේ (ii) සතින්ද්‍රියගේ 17 ඡෙදයේ (ii) සමාධින්ද්‍රියගේ (17 ඡෙදයේ (ii) ප්‍රඥෙන්ද්‍රියගේ (මෙහි 17 ඡෙදයේ (ii) ප්‍රඥෙන්ද්‍රියගේ විවේකපස කවරහුද යත්?

"1 විෂ්කම්භන විවේකය, 2 තදංග විවේකය, 3 සමුච්ඡෙද විවේකය, 4 පටිප්පස්සධි විවේකය, 5 නිස්සරණ විවේකය යනුයි. 'ශ්‍රද්ධෙන්ද්‍රියේ' යනු 'ප්‍රඥෙන්ද්‍රියේ'යි වෙනස්කොට (මෙහි 17 ඡෙදයේ (iv) යොදන්න.)

"ප්‍රඥෙන්ද්‍රියගේ මොව්හු පස්වැදෑරුම් විවේකයෝයි. පස්වැදෑරුම් විරාගයෝයි. පස්වැදෑරුම් නිරොධයෝයි. පස්වැදෑරුම් වොස්සග්ගයෝයි. දොළොස් වැදෑරුම් නිශ්‍රයෝයි යනුයි."

**(විවේක කථාව නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 25 චර්යා කථා

1. "චර්යා" යන මෙහි චරියා (හැසිරීම්) අටකි.

ඉරියාපථ චරියාව, ආයතන චරියාව, සති චරියාව, සමාධි චරියාව, ඤාණ චරියාව, මග්ග චරියාව, පත්ති චරියාව, ලොකත්ථ චරියාව, යන අටයි,

2. එහි ඉරියා පථ චරියාව නම් ඉරියව සතරෙහි හැසිරීමයි. ආයතන චරියා නම් අධ්‍යාත්මිකවූද බාහිරවූද චක්ෂුරාදී ආයතන සයෙහි සිහිනුවණින් හැසිරීමයි. සති චරියා නම් සිව්වැදෑරුම්වූ සතිපට්ඨානයන්හි හැසිරීමයි. සමාධි චරියා නම් සිව් වැදෑරුම් ධ්‍යානයන්හි හැසිරීමයි. ඥාන චරියා නම් චතුරාර්ය සත්‍යයන්හි හැසිරීමයි. මග්ග චරියා නම් සිව් වැදෑරුම් ආර්ය මාර්ගයන්හි හැසිරීමයි. පත්තිචරියා නම් ශ්‍රමණයන් පිළිබඳ ඵල හතරෙහි හැසිරීමයි. ලොකත්ථචරියා නම් තථාගත අර්හත් සම්බුදුරජාණන් වහන්සේලා විෂයෙහි පමණක් පවත්නා ලෝවැසියන්ගේ හිත වැඩ පිණිස හැසිරීමයි. පසේබුදුවරයන් වහන්සේලාගේ හා ශ්‍රාවකයන්ගේ ලෝවැඩ පිණිස හැසිරීම ප්‍රදේශයක පවතී.

3. ඉරියා පථචරියාවද සන්සුන් ඉරියව් පැවතුම් ඇති භික්ෂූන් පිළිබඳ වේ. ආයතනචරියාවද ඉන්ද්‍රිය සංවරය ඇති භික්ෂූන් පිළිබඳ වේ. සතිචරියාවද ශීලාදියෙහි අප්‍රමාදව විහරණය ඇත්තවුන් පිළිබඳ වේ. සමාධිචරියාවද අධිචිත්ත නම් සමාධියෙහි යෙදුනවුන් පිළිබඳ වේ. ඥාන චරියාවද පඤ්චස්කන්ධයන් වෙන් කිරීමේ පටන් ගොත්‍රභූ ඥානය තෙක් පවත්නා නුවණැතියන් පිළිබඳවේ. මග්ගචරියාවද සිව්මග මනාවපිළිපන්නවුන් පිළිබඳවේ. පත්තිචරියාවද ඵලාවබොධය ලැබුවන් පිළිබඳවේ. ලොකත්ථචරියාවද තථාගත අර්හත් සම්බුදුරජාණන් වහන්සේලා පිළිබඳ වේ. පසේ බුදුවරුන් පිළිබඳ හා ශ්‍රාවකයන් පිළිබඳව ලොකාර්ථ චරියාව එක් දේශයෙක්හි පවතී. මොව්හු අට වැදෑරුම් චර්යාවෝයි.

4. අන්‍යවූද චර්යා අටක් වෙත්:- එනම්:

නිවන් අරමුණුකොට කෙලෙසුන් කෙරෙන් මිදෙමින් ශ්‍රද්ධාවෙන් හැසිරෙයි. දැඩිකොට ගණිමින් වීර්යයෙන් හැසිරෙයි.

වෙත පමුණුවා සිහිකරමින් සිහියෙන්, හැසිරෙයි. නොවිසිරී කරමින් සමාධියෙන් ප්‍රඥප්තියේ සිට දනිමින් ප්‍රඥාවෙන් හැසිරෙයි. විශේෂයෙන් දනිමින් විඥානයෙන් හැසිරෙයි. මෙසේ ජවන් සමග ඉන්ද්‍රියචර්යාවෙන් පිළිපන් තැනැත්තේ විෂ්කම්භනාදි ක්ලේශ ප්‍රහාණ විශේෂය ලබාතුයි. විශේෂ චර්යාවෙන් හැසිරෙයි. මෙසේ පිළිපන්නහුගේ සමථවිදර්ශනා වශයෙන් පවත්නා කුශලධර්මයෝ දැඩිව පවතිත්නුයි. ආයතන චරියාවෙන් හැසිරෙයි, මොව්හු අටවැදෑරුම් චර්යාවෝයි.

5. අනායවූද චරියා අටක් වෙත්.

සම්‍යක් දෘෂ්ටිය පිළිබඳව සම්‍යක් දර්ශන චර්යාවද සම්‍යක් සංකල්පනාව පිළිබඳව අරමුණට සිත ආරොපණය කිරීමේ චර්යාවද, සම්‍යක් වචනය පිළිබඳව හාත්පසින් ගැනීමේ චර්යාවද, සම්‍යක් කර්මාන්තය පිළිබඳව නගාසිටුවීමේ චර්යාවද සම්‍යක් ආජීවය පිළිබඳව ජීවිතයේ පිරිසිදු චර්යාවද, සම්‍යක් ව්‍යායාමය පිළිබඳව දැඩිකොට ගැනීමේ චර්යාවද, සම්‍යක් ස්මෘතිය පිළිබඳව වෙත පමුණුවා සිහිකිරීමේ චර්යාවද, සම්‍යක් සමාධිය පිළිබඳව නොවිසුරුවා එකඟ කිරීමේ චර්යාවද, යන මොව්හුය. මොව්හු අටවැදෑරුම් චර්යාවෝයි.

**(චර්යා කථා නිමි.)**

---

## 26 ප්‍රාතිහාර්ය කථා.

1. "මහණෙනි, මේ පෙළහැර තුනක් වෙත්. ඒ කවර පෙළහැර තුනක්ද යත්. ඍද්ධි ප්‍රාතිහාර්යය ආදේශනා ප්‍රාතිහාර්යය අනුසාසනී ප්‍රතිහාර්යය, යන මේ තුනයි.

2. "මහණෙනි, ඍද්ධි ප්‍රාතිහාර්ය නම් කුමක්ද?

"මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් නන්වැදෑරුම් ඍද්ධි බලයෙන් දක්වන පෙළහර සිදු කරත්. එකෙක්වූයේම බොහෝ වෙයි. බොහෝව එකෙක් වෙයි. ප්‍රකට භාවයටද වැඩීම් බවටද පැමිණෙයි. (මෙහි ඉද්ධි කථාවල 7 ඡේදයේ 'බොහෝ දෙනෙක්ව' යන තැන සිට 'වසයෙහි පවත්වයි' යන තැනට යොදන්න.) බඹලොව තෙක් සිය කයින් තමා වසගයෙහි පවත්වයි.

"මහණෙනි, මෙය ඍද්ධි ප්‍රාතිහාර්යයයි කියනු ලැබේ.

3. "මහණෙනි, ආදේශනා පෙළහර නම් කුමක්ද?

මේ ලෝකයෙහි ඇතැමෙක් තොපගේ සිත සොම්නස් දොම්නස් ආදී වශයෙන් මෙසේද වෙයි. තොපගේ සිත මේ ආකාරයෙන්ද වේ. තොපගේ සිත මේ මේ අයුරු සිතමින් පවත්නේයි (ආගිය සිටි) සලකුණෙන් දක්වයි. හෙතෙම බොහෝ දෙය කියයි. ඒ කියූ දෙය එසේම වෙයි. අන් පරිද්දකින් නොවේ.

4. "මහණෙනි, මේ ලෝකයෙහි ඇතමෙක් නිමිත්තෙහි යමක් නොම දක්වයි. එසේ නමුදු මනුෂ්‍යයන්ගේ හෝ අමනුෂ්‍යයන්ගේ හෝ දෙවියන්ගේ හෝ හඬක් අසා 'තොපගේ සිත මෙසේද වෙයි. තොපගේ සිත මේ ආකාරයෙන්ද වේ. තොපගේ සිත මේ මේ අයුරු පවතීයයි' කියායි. හෙතෙම බොහෝ දෙයක්ද කියයි. ඒ කී දෙය එසේම වෙයි. අන් අයුරකින් නොවේ. මේ ලෝකයෙහි ඇතැමෙක් සලකුණෙන් නොම දක්වයි. මනුෂ්‍යයන්ගේ හෝ අමනුෂ්‍යයන්ගේ හෝ දෙවියන්ගේ හෝ හඬක් අසා නොම දක්වයි එසේ නමුදු යමක් විතර්ක කරන්නාගේ හා විමසන්නාගේ විතර්ක වේගයෙන් පැතුරුණු හඬ අසා 'තොපගේ සිත මෙසේද වෙයි. තොපගේ සිත මේ ආකරයෙන්ද වෙයි. තොපගේ සිත මේ මේ අයුරු පවතීයයි' කියයි. හෙතෙම බොහෝ දැයක්ද දක්වයි. ඒ කී දෙය එසේම වෙයි. අන් අයුරකින් නොවෙයි.

5. "මහණෙනි, මේ ලෝකයෙහි ඇතැමෙක් සලකුණින් නොම දක්වයි. මනුෂ්‍යයන්ගේ හෝ අමනුෂ්‍යයන්ගේ හෝ දෙවියන්ගේ හෝ ශබ්දයක් නොම දක්වයි. විතර්ක විචාර කරන්නහුගේ විතර්කයාගේ පැතිරීම් හඬ අසා නොම දක්වයි. එසේ නමුදු විතර්ක විචාර රහිතවූ සමාධියට සමවන්නහුගේ සිත තමන්ගේ සිතින් පිරිසිඳ දනියි. කෙසේද යත්? 'මේ පින්වතාගේ සිතුවිලි යම්සේ පිහිටියාහුද ඒ පිහිටි පරිද්දෙන් මේ සිතට අනතුරුව අසවල් විතර්කය කරන්නේය කියායි. හෙතෙම බොහෝ දැයක්ද කියයි. ඒ කී දැය එසේම වෙයි. අන් අයුරකින් නොවේ. මහණෙනි, මේ ආදේශනා ප්‍රතිහාර්යයයි කියනු ලැබේ.

6. "මහණෙනි, අනුශාසනී ප්‍රාතිහාර්යය නම් කවරේද?

"මහණෙනි, මේ ලෝකයේ ඇතැමෙක් අනුශාසනා කරයි. (කෙසේද) 'මෙසේ විතර්ක කරව්. මෙසේ විතර්ක නොකරව්. මෙසේ මෙනෙහි කරව්. මෙසේ මෙනෙහි නොකරව්. මේ අකුසල් දුරුකව්. මේ කුසල්වල පැමිණ වාසය කරව්' කියායි.

"මහණෙනි, මේ අනුශාසනි ප්‍රාතිහාර්යයයි කියනු ලැබේ.

"මහණෙනි, මේ ප්‍රාතිහාර්ය තුනයි.

7. "පස්කම් සුවයෙන් වෙන්වීම සමෘද්ධ වේනුයි ඍද්ධි නම්වේ. ප්‍රතිවිරුද්ධවූ කාමච්ඡන්දය බලවත්ව දුරු කෙරේනුයි පාටිහාරිය නම් වේ. යම් කෙනෙක් පඤ්චකාම විරාගයෙන් යුක්තවූවාහුද ඒ සියල්ලෝ සුපිරිසුදු සිත් ඇත්තෝය. නොකැළඹුනාවූ යහපත් කල්පනා ඇත්තෝය යනු (දේශනා කිරීම) ආදේශනා ප්‍රාතිහාර්යයයි ඒ පඤ්චකාම විරාග නම්වූ නෙක්ඛම්මය මෙසේ සේවනය කටයුතුයි. මෙසේ වැඩිය යුතුයි. මෙසේ නැවත වැඩිය යුතුයි. මෙසේ ඒ නෙක්ඛම්මයට අනුකූලවූ සිහිය අතිශයින් පිහිටුවිය යුතුයි. යන මෙය අනුශාසනී ප්‍රාතිහාර්යයයි.

8. "මෛත්‍රිය සමෘද්ධවේනුයි ඍද්ධි නම් වේ. ප්‍රතිවිරුද්ධවූ ව්‍යාපාදය බලවත්ව දුරුකෙරේනුයි ප්‍රතිහාර්ය නම් වේ. යමෙක් තුමූ ඒ අව්‍යාපාදයෙන් යුක්තවූවාහුද ඒ සියල්ලම පිරිසුදු සිතැත්තෝය, නොකැළඹුණු යහපත් කල්පනා ඇත්තෝය, යනු ආදේශනා ප්‍රාතිහාර්ය නම් වේ. ඒ අව්‍යාපාදය (මෛත්‍රිය) වනාහි මෙසේ සෙවිය යුතුයි. මෙසේ වැඩිය යුතුයි, මෙසේ නැවත නැවත වැඩිය යුතුයි. මෙසේ අව්‍යාපාදයට අනුකූලවූ සිහිය වෙත පමුණුවා ගතයුතුය යනු අනුශාසනී ප්‍රාතිහාර්යයයි.

9. 'ආලෝක සංඥාව සමෘද්ධ වේනුයි ඍද්ධි නම්වේ. ථිනමිද්ධය (සිතෙහි කයෙහි මැලිබව) බලවත්ව දුරුකෙරේනුයි ප්‍රාතිහාර්ය නම් වේ. යමෙක් තුමූ ඒ ආලෝක සංඥාවෙන් යුක්තවූවාහුද, ඒ සියල්ලෝ සුපිරිසිදු සිත් ඇත්තෝය. නොකැළඹුණු යහපත් කල්පනා ඇත්තෝය යනු ආදේශනා ප්‍රාතිහාර්යයයි.

"ඒ ආලෝක සංඥාව මෙසේ සෙවිය යුතුයි. මෙසේ වැඩිය යුතුයි. මෙසේ නැවත නැවත වැඩිය යුතුයි. මෙසේ ඒ ආලෝක

සංඥාවට අනුකූලවූ සිහිය වෙත පමුණුවා ගතයුතුයි යනු අනුශාසනී ප්‍රාතිහාර්යයයි.

10. "සිත නොවිසිරී පැවැත්ම සමෘද්ධවේනුයි ඍද්ධි නම් වේ. ඖද්ධත්‍යය (සිත විසිර පැවැත්ම) බලවත්ව දුරුකෙරේනුයි ප්‍රාතිහාර්ය නම් වේ. යමෙක් තුමූ ඒ අවික්ෂෙපයෙන් යුක්තවූවාහුද ඒ සියල්ලෝම පිරිසිදු සිතැත්තෝය. නොකැළඹුණු යහපත් කල්පනා ඇත්තෝය. යනු ආදේශනා ප්‍රාතිහාර්යයයි. ඒ අවික්ෂෙපය (සිත නොවිසිර පැවැත්ම මෙසේ සේවනය කටයුතුයි. මෙසේ වැඩිය යුතුයි. මෙසේ නැවත නැවත වැඩිය යුතුයි. මෙසේ ඒ අවික්ෂෙපයට අනුකූල වූ සිහිය එලවා තැබිය යුතුයි යනු අනුශාසනී ප්‍රාතිහාර්යයයි. විචිකිච්ඡාවට ප්‍රතිවිරුද්ධවූ ඥානය සමෘද්ධවේනුයි ඍද්ධි නමි. විචිකිච්ඡාව බලවත්ව දුරුකෙරේනුයි ප්‍රාතිහාර්ය නම් වේ. යමෙක් තුමූ ඒ ධම්මවවත්ථානයෙන් (විචිකිච්ඡාවට විරුද්ධවූ ඥානය) යුක්තවූවාහුද ඒ සියල්ලෝ සුපිරිසිදු සිතැත්තෝය. නොකැළඹුණු යහපත් කල්පනා ඇත්තෝය යනු ආදෙශනා ප්‍රාතිහාර්යයයි. ඒ ධම්මවවත්ථානය මෙසේ සෙවිය යුතුයි. මෙසේ වැඩිය යුතුයි. මෙසේ නැවත නැවත වැඩිය යුතුයි. මෙසේ ඒ ධම්මවවත්ථානයට අනුකූලවූ සිහිය එලවාගත යුතුය. යනු අනුශාසනී ප්‍රාතිහාර්යයයි.

11. "ඥානය සමෘද්ධවේනුයි ඍද්ධි නම් වේ. අවිද්‍යාව බලවත්ව දුරුකරයිනුයි ප්‍රාතිහාර්ය නම් වේ. (ii) යමෙක් තුමූ ඒ නුවණින් යුක්තවූවාහුද ඒ සියල්ලෝ සුපිරිසුදු සිතැත්තෝය. නොකැළඹුණු යහපත් කල්පනා ඇත්තෝය යනු ආදේශනා ප්‍රාතිහාර්යයයි. ඒ නුවණ මෙසේ සෙවිය යුතුයි. මෙසේ වැඩිය යුතුයි. මෙසේ නැවත නැවත වැඩිය යුතුයි. මෙසේ ඒ ඥානානුකූලව සිහිය එළවා තැබිය යුතුයි, යනු අනුශාසනී ප්‍රාතිහාර්යයයි.

12. "ප්‍රමෝද භාවය සමෘද්ධවේනුයි ඍද්ධි නම්වේ. අකුසල්හි නොඇල්ම බලවත්ව දුරුකෙරේනුයි ප්‍රාතිහාර්ය නම්වේ. (11 ඡේදයේ (ii) යොදන්න.) ප්‍රථමධ්‍යානය සමෘද්ධවේනුයි ඍද්ධි නම් වේ. නීවරණයන් බලවත්ව දුරුකෙරේනුයි ප්‍රාතිහාර්ය නම් වේ. (11 ඡේදයේ (ii) යොදන්න) රහත්මග සමෘද්ධවේනුයි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ඍද්ධිනම්වේ. සියලු කෙලෙසුන් බලවත්ව දුරුකෙරේනුයි ප්‍රාතිහාර්ය නම්වේ. (මෙහි 11 ඡේදයේ (ii) කාමයන්ගෙන් නික්මීම සමෘද්ධවේනුයි ඍද්ධිබල නම් වේ. කාමච්ඡන්දය බලවත්ව දුරුකෙරේනුයි ප්‍රාතිහාර්ය නම්වේ. යම් ඍද්ධියක්වේද, යම් ප්‍රාතිහාර්යයක් වේද, මෙය ප්‍රාතිහාර්යයයි කියනු ලැබේ.

"අව්‍යාපාද (මෛත්‍රිය) සමෘද්ධවේනුයි ඍද්ධි නම්වේ. ව්‍යාපාදය බලවත්ව දුරුකෙරේනුයි ප්‍රාතිහාර්ය නම්වේ. (මෙහි 11 ඡේදයේ (ii) යොදන්න)

13. "ආලෝක සංඥාව සමෘද්ධවේනුයි ඍද්ධි නම් වේ. ථීනමිද්ධය බලවත්ව දුරුකෙරේනුයි ප්‍රාතිහාර්ය නම් වේ. (මෙහි 11 ඡේදයේ (ii) යොදන්න) අවික්ෂෙපය සමෘද්ධවේනුයි ඍද්ධිනම්වේ. ඖද්ධත්‍යය බලවත්ව දුරුකෙරේනුයි ප්‍රාතිහාර්ය නම්වේ. (මෙහි 11 ඡේදයේ (ii) ධම්මවවත්ථානය සමෘද්ධ වේනුයි ඍද්ධි නම්වේ. විචිකිච්ඡාව බලවත්ව දුරුකෙරේනුයි ප්‍රාතිහාර්ය නම්වේ. (මෙහි 11 ඡේදයේ (ii) යොදන්න) රහත් මග සමෘද්ධවේනුයි ඍද්ධි නම්වේ. සියලු කෙලෙසුන් බලවත්ව දුරුකෙරේනුයි ප්‍රාතිහාර්ය නම් වේ. මෙහි 11 ඡේදයේ (ii) යොදන්න)

**(ප්‍රාතිහාර්ය කථාව නිමි.)**

---

## 27 සමසීස කථා.

1. සියලු ත්‍රෛභූමික ධර්මයන්ගේ මනාකොට මුළුසුන් කිරීමෙහිද මුළුසුන් කිරීමෙහිද නිරුද්ධ කිරීමෙහිද නූපදින බැවින් ප්‍රඥා තොමෝ සමසීස අර්ථයෙන් ඥාන නම්වේ.

2. "සියලු ධර්මයෝ යනු" පඤ්චස්කන්ධයෝය දොළොස් ආයතනයෝය, අටළොස් ධාතූහුය. කුශල ධර්මයෝය. අකුශල ධර්මයෝය. අව්‍යාකෘත ධර්මයෝය. කාමාවචර ධර්මයෝය රූපාවචර ධර්මයෝය, අරූපාවචර ධර්මයෝය, අරූපාවචර ධර්මයෝය, අපයර්යාපන්න ධර්මයෝය, යන මොහුයි.

3. "මනාකොට මුළුසුන් කිරීමෙහි" යනු

නිෂ්කාමයෙන් (ගිහිගෙන් නික්මීමෙන්) කාමච්ඡන්දය මනාකොට මුලුසුන් කරයි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය මනාකොට

මුළුසුන් කරයි. (ඉදිරි වාක්‍ය අගට "මනාකොට මුලුසුන් කරයි" යෙදිය යුතුයි.) ආලොක සංඥාවෙන් ථීනමිද්ධය - අවික්ඛෙපයෙන් ඖද්ධත්‍යය - ධර්මව්‍යවස්ථාපනයෙන් විචිකිච්ඡාව - ඥානයෙන් අවිද්‍යාව - ප්‍රමෝදභාවයෙන් අරතිය (නොඇලීම) - ප්‍රථම ධ්‍යානයෙන් නීවරණයන් - අර්හත් මාර්ගයෙන් සියලු කෙලෙසුන් මනාකොට මුළුසුන් කරයි.

4. "නිරුද්ධ කිරීමෙහි" යනු

(මේ වාක්‍ය අගට "නිරුද්ධ කරයි" යෙදිය යුතුයි.) නෙක්ඛම්මයෙන් කාමච්ඡන්දය නිරුද්ධ කරයි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය - ආලොක සංඥාවෙන් ථීනමිද්ධය - අවික්ඛෙපයෙන් ඖද්ධත්‍යය - ධර්ම ව්‍යවස්ථාපනයෙන් විචිකිච්ඡාව - ඥානයෙන් අවිද්‍යාව - ප්‍රමෝදභාවයෙන් අරතිය - ප්‍රථම ධ්‍යානයෙන් නීවරණයන් - අර්හත්මාර්ගයෙන් සියලු කෙලෙසුන් -

5. "නූපදින බැවින්" යනු

නෙක්ඛම්මය ලැබුවහුට කාමච්ඡන්දය නූපදියි, අව්‍යාපාදය ලැබුවහුට ව්‍යාපාදය නූපදියි, ආලොක සංඥාව ලැබුවහුට ථීනමිද්ධය නූපදියි, අවික්ඛෙපය ලැබුවහුට ඖද්ධත්‍යය නූපදියි, ධර්ම ව්‍යවස්ථාපනය ලැබුවහුට විචිකිච්ඡාව නූපදියි, ඥානය ලැබුවහුට අවිද්‍යාව නූපදියි, ප්‍රමෝදභාවය ලැබුවහුට, අරතිය නූපදියි, ප්‍රථම ධ්‍යානය ලැබුවහුට නීවරණ නූපදියි, අර්හත් මාර්ගය ලැබුවහුට සියලු කෙලෙස් නූපදියි.

6. "සම" නම්.

කාමච්ඡන්දය (ii) ප්‍රහීණවූ බැවින් (iii) නෙක්ඛම්මය (iv) සම නම්වේ. ව්‍යාපාදය (මෙහි ii) අව්‍යාපාදය (මෙහි iv) ථීනමිද්ධය (මෙහි ii) ආලොක සංඥාව (මෙහි iv) ඖද්ධත්‍යය (මෙහි ii) අවික්ෂෙපය (මෙහි iv) විචිකිච්ඡාව (මෙහි ii) ධර්ම ව්‍යවස්ථාපනය (මෙහි iv) අවිද්‍යාව (මෙහි ii) ඥානය (මෙහි iv) අරතිය (මෙහි ii) ප්‍රමෝදභාවය (මෙහි iv) නීවරණ (මෙහි ii) ප්‍රථමධ්‍යානයද (මෙහි iv) සියලු කෙලෙස් (මෙහි ii) අර්හත් මාර්ගය (මෙහි iv)

7. "සීස" නම්

තෘෂ්ණා නම්වූ පළිබොධ සීසයද, මාන නම්වූ විනිබන්ධ සීසයද, දෘෂ්ටි නම්වූ පරාමර්ශ සීසයද ඖද්ධත්‍යය නම්වූ වික්ෂෙප

සීසයද, අවිද්‍යා නම්වූ ක්ලේශ සීසයද, ශ්‍රද්ධා නම්වූ අධිමොක්ෂ සීසයද, වීර්ය නම්වූ ප්‍රග්‍රහ සීසයද, ස්මෘති නම්වූ උපට්ඨාන සීසයද, සමාධි නම්වූ අවික්ෂෙප සීසයද, ප්‍රඥා නම්වූ දර්ශන සීසයද, ජීවිතෙන්ද්‍රිය නම්වූ ප්‍රවර්තන සීසයද, විමොක්ෂ නම්වූ ගෝචර සීසයද නිරොධ නම්වූ සංස්කාර සීසයද, යන තෙළෙස් ශීර්ෂයෝයි.

**(සමසීස කථාව නිමි.)**

---

## 28 සතිපට්ඨාන කථා.

1. මෙහි නිදානය සැවැත් නුවරය

"මහණෙනි, මේ සතිපට්ඨාන සතරකි. ඒ කවර සතරක්ද? මහණෙනි, (ii) මේ සස්නෙහි භික්ෂුතෙමේ කෙලෙස් තවන වීර්ය ඇතිව මනාවූ ප්‍රඥාවෙන් යුක්තව සිහි ඇතිව ලොක නම්වූ මේ ශරීරයෙහි දැඩි ලෝභය හා දොම්නස සංසිඳුවාගෙණ (iii) මේ ශරීරයෙහි කාය ගතා සති භාවනානුයෝගිව වාසය කරයි.

"සුඛ, දුක්ඛ, උපෙක්ඛා, වේදනාවන්හි (වේදනාවන්ගේ ස්වභාව ආදීනව සිහි කරන) වේදනානුපස්සනා භාවනානුයෝගිව වසයි. මෙහි (ii) යොදන්න.) සිතෙහි සිත අනුව බලමින් වාසය කරයි. මේ සස්නෙහි භික්ෂුතෙමේ කෙලෙස් තවන වීර්ය ඇතිව මනා නුවණ ඇතිව සිහි ඇතිව ලොක නම්වූ මේ ශරීරයෙහි දැඩි ලොභය හා දොම්නස දුරුකොට පංච නීවරණාදී ධර්මයන්හි (ස්වභාව ආදීනව සිහි කරන) ධර්මානුස්මෘති භාවනානුයෝගීව වාසය කරයි.

"මහණෙනි, මේ සතර සතිපට්ඨානයෝය.

2. කයෙහි කය අනුව බලමින් වාසය කරන්නේ කෙසේද? මේ සස්නෙහි ඇතැම් කෙනෙක් පෘථිවිකාය නිත්‍ය වශයෙන් නොව අනිත්‍ය වශයෙන් නුවණින් ලබයි. සැප වශයෙන් නොව දුක් වශයෙන් නුවණින් බලයි. ආත්ම වශයෙන් නොව අනාත්ම වශයෙන් නුවණින් බලයි. (ii) කලකිරෙයි. සතුටු නොවෙයි, වෙන් වෙයි, නොඇලෙයි, නිරුද්ධ කරයි, නූපදවයි, දුරුකරයි, නොගණියි. (iii)

(iv) අනිත්‍ය වශයෙන් බලන්නේ නිත්‍යය යන හැඟීම දුරුකරයි, දුක් වශයෙන් බලන්නේ සැපය යන හැඟීම දුරු කරයි, අනාත්ම වශයෙන් බලන්නේ ආත්මය යන හැඟීම දුරුකරයි, කලකිරෙන්නේ නන්දිරාගය දුරුකරයි, නොඇලෙන්නේ රාගය දුරුකරයි, නිරුද්ධ කරන්නේ හටගැණීම දුරුකරයි, හැර දමන්නේ දැඩිව ගැණීම දුරුකරයි. (v)

3. මේ සත් ආකාරයෙන් කය, නුවණින් බලයි. කය වැටහෙන්නකි, සිහිය නොවේ. සිහිය වැටහෙන්නක් ද සිහිකිරීමක්ද වේ. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ කය මනාකොට බලයි. එහෙයින් කයේ කය අනුව බලන සතිපට්ඨාන භාවනාවයයි කියනු ලැබේ.

4. "භාවනා යන" මෙහි භාවනා සතරකි.

එහි උපන් ධර්මයන්ගේ නොඉක්මවීම අර්ථයෙන් වන භාවනාව, ඉන්ද්‍රියයන්ගේ ඒක කෘත්‍යයයන අර්ථයෙන් වන භාවනාව, එය අනුව යන වීර්යය උසුලන අර්ථයෙන් වන භාවනාව ආසේවනාර්ථයෙන් වන භාවනාව යන මොව්හුයි. මේ සස්නෙහි ඇතැම් කෙනෙක් (මේ ශරීරයෙහි දිය කොටස්ද උෂ්ණ කොටස්ද, වායු කොටස්ද, කෙස් සමූහයද ලොම් සමූහයද, සිවි කොටස්ද සම කොටස්ද, මස්සමූහයද, ලේ සමූහයද, නහර සමූහයද, ඇට සමූහයද, ඇට මිදුලු සමූහයද නිත්‍ය වශයෙන් නොව අනිත්‍ය වශයෙන් බලයි. සුඛ වශයෙන් නොව දුක් වශයෙන් බලයි. ආත්ම වශයෙන් නොව අනාත්ම වශයෙන් බලයි කලකිරෙයි. සතුටු නොවෙයි, වෙන්වෙයි, නොඇලෙයි, නිරුද්ධ කරයි, නූපදවයි, හැර දමයි, නොගණියි, අනිත්‍ය වශයෙන් බලන්නේ නිත්‍ය සංඥාව දුරුකරයි, දුක් වශයෙන් බලන්නේ සුඛ සංඥාව දුරුකරයි, අනාත්ම වශයෙන් බලන්නේ ආත්ම සංඥාව දුරුකරයි. කලකිරෙන්නේ නන්දිරාගය දුරුකරයි, නොඇලෙන්නේ රාගය දුරුකරයි. නිරුද්ධ කරන්නේ හටගැණීම දුරුකරයි, හැර දමන්නේ දැඩිව ගැණීම දුරුකරයි. මේ සත් ආකාරයෙන් කය නුවණින් බලයි. කය වැටහීමයි සිහිය නොවේ. සිහිය වැටහීමක්ද සිහිකිරීමක්ද වේ. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ කය මනාකොට නුවණින් බලයි. එහෙයින් කයේ කය අනුව බලන සතිපට්ඨාන භාවනාව යයි කියනු ලැබේ.

**5.** "භාවනාව" යන මෙහි භාවනා සතරකි.

(ii) එහි: උපන් ධර්මයන්ගේ නොඉක්මවීම් අර්ථයෙන් වන භාවනාව, ඉන්ද්‍රියයන්ගේ ඒකකෘත්‍යය යන අර්ථයෙන් වන භාවනාව, එය අනුව යන වීර්යය උසුලන යන අර්ථයෙන් වන භාවනාව, අසේවනාර්ථයෙන් වන භාවනාව යන සතරයි. (iii) මෙසේ කයේ කය අනුව බලයි.

**6.** "වේදනාවෙහි වේදනාව අනුව බලන්නේ කෙසේද? මේ ශාසනයෙහි ඇතැම් පැවිදි කෙනෙක් සුඛ වේදනාව නිත්‍ය වශයෙන් නොව අනිත්‍ය වශයෙන් නුවණින් බලයි. (මෙහි 2 ඡේදයේ (ii) යොදන්න.) හැරදමයි. නොගණියි. අනිත්‍ය වශයෙන් නුවණින් බලන්නේ නිත්‍යය යන හැඟීම දුරුකරයි. අනාත්ම වශයෙන් නුවණින් බලන්නේ ආත්මය යන හැඟීම දුරුකරයි. කලකිරෙන්නේ නන්දිරාගය දුරුකරයි. නොඇලෙන්නේ රාගය දුරුකරයි. නිරුද්ධ කරන්නේ හටගැණීම දුරු කරයි. හැර දමන්නේ දැඩිකොට ගැණීම දුරු කරයි. මේ සත් අයුරින් වේදනාව නුවණින් බලයි. වේදනාව වැටහීමකි. සිහිය නොවේ. සිහිය වැටහීමද සිහියද වේ. ඒ සිහියෙන් ඒ ඥානයෙන් ඒ වේදනාව නුවණින් බලයි. එහෙයින් වේදනාව අනුව බැලීමේ සතිපට්ඨාන භාවනායයි කියනු ලැබේ.

**7.** "භාවනා යන මෙහි භාවනා සතරකි. (මෙහි 5 (ii) යොදන්න.) මේ ශාසනයෙහි එක් කෙනෙක් දුක වේදනාව (2 ඡේදයේ (ii) යොදන්න.) උපෙක්ෂා වේදනාව (2 ඡේදයේ (ii) යොදන්න.) අරමුණ පිළිබඳ සුඛ වේදනාව (2 ඡේදයේ (ii) යොදන්න.) නිරාමිස සුඛ වේදනාව (2 ඡේදයේ (ii) යොදන්න.) සාමිස දුක් වේදනාව (2 ඡේදයේ (ii) යොදන්න.) නිරාමිස දුක් වේදනාව (2 ඡේදයේ (ii) යොදන්න.) සාමිස උපෙක්ෂා වේදනාව (2 ඡේදයේ (ii) යොදන්න.) ඇස රූපය හා ගැටීමෙන් හටගන්නා වේදනාව (2 ඡේදයේ (ii) යොදන්න.) කණ ශබ්දය හා ගැටීමෙන් හටගන්නා වේදනාව (2 ඡේදයේ (ii) යොදන්න) නාසය සුවඳ හා ගැටීමෙන් හටගන්නා වේදනාව (2 ඡේදයේ (ii) යොදන්න.) දිව රස හා ගැටීමෙන් ඇතිවන වේදනාව (2 ඡේදයේ (ii) යොදන්න.) කය ඕලාරිකරූප හා ගැටීමෙන් ඇතිවන වේදනාව

(2 ඡේදයේ (ii) යොදන්න.) හිත ධර්මයන් හා ගැටීමෙන් ඇතිවන වේදනාව නිත්‍ය වශයෙන් නොව අනිත්‍ය වශයෙන් නුවණින් බලයි. (2 ඡේදයේ (ii) යොදන්න.) හැර දමයි ගැණීම නොකරයි. අනිත්‍ය වශයෙන් නුවණින් බලන්නේ නිත්‍යය යන හැඟීම දුරුකරයි. (2 ඡේදයේ (ii) යොදන්න.) හැරදමන්නේ ගැණීම දුරුකරයි.

"මේ සත් අයුරින් වේදනාව නුවණින් බලයි. වේදනාව වැටහීමයි. සිහිය නොවේ, සිහිය වැටහීමද, සිහියදවේ. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ වේදනාව නුවණින් බලයි. එහෙයින් වේදනාවන්හි වේදනාව අනුව බලන සතිපට්ඨාන භාවනායයි කියනු ලැබේ. භාවනා යන මෙහි භාවනා සතරකි. (මෙහි 5 (ii) යොදන්න) මෙසේ වේදනාවන්හි වේදනාව අනුව නුවණින් බලයි.

8. "සිතෙහි සිත අනුව බලමින් වාසය කරන්නේ කෙසේද? මේ ශාසනයෙහි එක් කෙනෙක් රාග සහිත සිත නිත්‍ය වශයෙන් නොව අනිත්‍ය වශයෙන් නුවණින් බලයි. (මෙහි 2 ඡේදයේ (iv) යොදන්න) හැරදමයි, ගැණීම නොකරයි, අනිත්‍ය වශයෙන් බලන්නේ නිත්‍යය යන හැඟීම දුරු කරයි. (මෙහි 2 ඡේදයේ (iv) යොදන්න) හැරදමන්නේ ගැණීම දුරු කරයි. මේ සත් අයුරින් සිත අනුව බලයි. සිත වැටහීමයි, සිහිය නොවේ. සිහිය වැටහීමද සිහියදවේ. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ සිත අනුව බලයි. එහෙයින් සිතෙහි සිත අනුව බලන සතිපට්ඨාන භාවනාවයයි කියනු ලැබේ. භාවනා යන මෙහි භාවනා සතරකි. (මෙහි 5 (ii) යොදන්න.)

**9.** "මේ සස්නෙහි ඇතැම් කෙනෙක් රාග සහිත සිත, රාග රහිත සිත, ද්වෙෂ සහිත සිත ද්වෙෂ රහිත සිත, මොහ සහිත සිත, මෝහ රහිත සිත, විසිරුණු සිත, නොවිසිරුණු සිත, මහත්ගත සිත, මහත්ගත නොවන සිත, ලොකොත්තර සිත, ලොකොත්තර නොවූ සිත, එකඟවූ සිත, එකඟ නොවූ සිත, කෙළෙසුන්ගෙන් මිදුණු සිත, නොමිදුණු සිත, චක්ෂුර් විඥානය, සොත විඥානය ඝාණ විඥාණය, ජිව්හා විඥානය, කාය විඥානය, මනො විඥානය, නිත්‍ය වශයෙන් නොව අනිත්‍ය වශයෙන් බලයි (මෙහි 2 ඡේදයේ (ii) යොදන්න) හැරදමයි,

ගැණීම නොකරයි. අනිත්‍ය වශයෙන් බලන්නේ නිත්‍යය යන හැඟීම් දුරු කරයි (මෙහි 2 ඡේදයේ (iv) යොදන්න) හැර දමන්නේ ගැණීම දුරු කරයි. මේ සත් අයුරින් සිත අනුව බලයි. සිත වැටහීමයි. සිහිය නොවෙයි, සිහිය වැටහීමද සිහියද වේ. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ සිත නුවණින් බලයි. එබැවින් සිතේ සිත අනුව බැලීමේ සතිපට්ඨාන භාවනාවයයි කියනු ලැබේ. "භාවනා" යන මෙහි භාවනා සතරකි. මෙහි 5 (ii) යොදන්න) ආසේවනාර්ථයෙන් භාවනා නම්වේ. මෙසේ සිතේ සිත අනුව බලමින් වෙසේ.

10. "ධර්මයන්හි ධර්මය අනුව බලමින් වාසය කරන්නේ කෙසේද?

මේ "සස්නෙහි ඇතැම් කෙනෙක් කය හැර වේදනා හැර සිත හැර තදවශේෂ (ඉන් ඉතිරිවූ) ධර්මයන් නිත්‍ය වශයෙන් නොවේ. අනිත්‍ය වශයෙන් බලයි. සුව වශයෙන් නොව 'දුක් වශයෙන් බලයි. ආත්ම වශයෙන් නොව අනාත්ම වශයෙන් බලයි. කළකිරෙයි. සතුටු නොවෙයි. වෙන් වෙයි. නොඇලෙයි. නිරුද්ධ කරයි නූපදවයි. හැරදමයි. නොගනියි.

අනිත්‍ය වශයෙන් බලන්නේ නිත්‍ය යන හැඟීමද දුරු කරයි. දුක් වශයෙන් බලන්නේ සැපයයි හැඟීම දුරුකරයි. අනාත්ම වශයෙන් බලන්නේ ආත්මයයි හැඟීම දුරු කරයි. කලකිරෙන්නේ නන්දිරාගය දුරුකරයි. නොඇලෙන්නේ රාගය දුරුකරයි. නිරුද්ධ කරන්නේ සමුදය (හටගැනීම) දුරු කරයි. හැරදමන්නේ ගැණීම දුරු කරයි. මේ සත් අයුරින් ධර්මය අනුව බලයි. ධර්ම වැටහීමයි. සිහිය නොවේ. සිහිය වැටහීමද සිහියදවේ. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ ධර්මයන් අනුව බලයි. එහෙයින් ධර්මයන්හි ධර්මයන් අනුව බලන සතිපට්ඨාන භාවනාවයයි කියනු ලැබේ.

"භාවනා යන" මෙහි භාවනා සතරකි. (මෙහි 5 (ii) යොදන්න) ආසේවනාර්ථයෙන් භාවනා නමි. මෙසේ ධර්මයන්හි ධර්මය අනුව බලමින් වාසය කරයි.

**(සතිපට්ඨාන කථා නිමි.)**

---

## 29 විදර්ශනා කථා

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" භික්ෂූන් ඇමතූ සේක. "පින්වතුන් වහන්සැයි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම් භික්ෂුවක් කිසියම් සංස්කාර ධර්මයක් නිත්‍ය වශයෙන් බලන්නේ නම් (ii) ඒ භික්ෂුව ලොව්තුරු මගට අනුලොමවූ විදසුන් නැණින් යුතු වන්නේය, යන මේ කාරණය සිදු නොවන්නකි. අනුලොම විදසුන් නැණින් යුක්ත නොවූයේ සම්මත්ත නියාමයට බැසගන්නේය. (යථා ස්වභාවය පිළිබඳ නිශ්චයට පැමිණෙන්නේය. (iii) යන මේ කරුණ සිදුනොවන්නකි. සම්මත්ත නියාමයට නොබැස ගන්නේ සෝවාන්ඵලය හෝ සකෘදාගාමි ඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත් ඵලය හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේ යන මේ කාරණය නොසිදුවන්නකි.

3. "මහණෙනි, යම් භික්ෂුවක් සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය වශයෙන් බලන්නේ නම් (ii) ඒ භික්ෂුව අනුලොම නුවණින් යුක්තවූයේ වන්නේය. යන මේ කාරණය සිදුවන්නකි. අනුලොම නුවණින් යුක්තවූයේ සම්මත්ත නියාමයට බැසගන්නේය. යන මේ කරුණු සිදුවන්නකි. සම්මත්ත නියාමයට බැසගන්නේ සෝවාන්ඵලය හෝ සකෘදාගාමි ඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත් ඵලය හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේය යන (iii) මෙය සිදුවන්නකි.

4. "මහණෙනි, යම් භික්ෂුවක් කිසියම් සංස්කාර ධර්මයක් සැප වශයෙන් බලන්නේ නම් ඒ භික්ෂුව අනුලොම නුවණින් යුක්තවූයේ වෙයි. යන මේ කරුණ සිදුනොවන්නකි. අනුලොම නුවණින් යුක්ත නොවූයේ සම්මත්ත නියාමයට බැසගන්නේය යන මේ කරුණ සිදු නොවේ. සම්මතික නියාමයට නොබැසගන්නේ සෝවාන් ඵලය හෝ සකෘදාගාමි ඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත් ඵලය හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේය යන මේ කරුණු සිදුවිය නොහැක්කකි.

5. "මහණෙනි, යම් භික්ෂුවක් සියලු සංස්කාර ධර්මයන් දුක් වශයෙන් බලන්නේ නම් (මෙහි 3 (ii) යොදන්න) මේ කරුණ සිදුවෙයි. මහණෙනි, යම් භික්ෂුවක් කිසි ධර්මයක් ආත්ම වශයෙන් බලන්නේ නම් (මෙහි 2 (ii) යොදන්න) මේ කරුණු සිදු නොවේ. මහණෙනි, යම් භික්ෂුවක් කිසි ධර්මයක් අනාත්ම වශයෙන් බලන්නේ නම් (මෙහි 3 (ii) යොදන්න) මේ කරුණ සිදු වෙයි. මහණෙනි, යම් භික්ෂුවක් නිර්වාණය දුක් වශයෙන් බලන්නේ නම් (මෙහි 2 (ii) යොදන්න) මේ කරුණු සිදුනොවෙයි මහණෙනි, යම් භික්ෂුවක් නිර්වාණය සැප වශයෙන් බලන්නේ නම් (මෙහි 3 (ii) යොදන්න) මේ කරුණු සිදුවන්නකි.

6. "කී විධියකින් අනුලොම නුවණ ලබයිද? කීවිධියකින් සම්මත්ත නියාමයට බැසගනීද? සතළිස් ආකාරයකින් අනුලොම නුවණ ලබයි. සතළිස් ආකාරයකින් සම්මත්ත නියාමයට බැසගනියි.

"කවර සතළිස් විධියකින් අනුලොම නුවණ ලබයිද?

"කවර සතළිස් විධියකින් සම්මත්ත නියාමයට බැසගනීද? පඤ්චස්කන්ධයන් අනිත්‍ය වශයෙන් (මේ වචන අගට "වශයෙන්" යොදාගත යුතුයි.) දුක් - රොග - ගඩු - උල් - අඝ - (අවැඩ ගෙණදීම) - ආබාධ - තමාට අයත් නොවීම - පලුදුවීම් - විපත්ති - උවදුරු - භය - ඇලීම් - චපල - බිඳීම් - අස්ථිර - ආරක්ෂා රහිත - නිර්භය ස්ථානයන් නොවීම් - අසරණ - හිස් ලාමක - ශූන්‍ය - අනාත්ම - ආදීනව - විපරිණාම ධර්ම - අසාර - අඝමුල - වධක විභාව - ආශ්‍රව සහගත - සංඛත (සකස්වන) - මාරයාගේ ආහාරයක් - ඉපදීම ස්වභාව කොට ඇත්තක් - දිරීම් ගතිය ඇත්තක් - රොග ස්වභාවය ඇත්තක් - මරණ ස්වභාවය ඇත්තක් - ශොක ස්වභාවය ඇත්තක් - කිලිටිවීම් ස්වභාවය ඇත්තක් - සතළිස් ආකාරයෙනි යන මේ පස් කඳෙහි අනිත්‍ය වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි.

7. "පඤ්චස්කන්ධයන්ගේ නිරුද්ධ කිරීම නිත්‍යවූ නිර්වාණයයයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී. පඤ්චස්කන්ධයන් දුක්ඛ වශයෙන් නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි.

(මේ වගන්ති මුලට "පඤ්චස්කන්ධයන්" යෙදිය යුතුයි.)

- ගේ නිරොධය සුඛවූ නිවණයයි නුවණින් බලන්නේ සම්මත්ත නියාමයට බැස ගණියි.

- ගේ රෝග වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි.

- ගේ නිරොධය නිරෝගවූ නිර්වාණය යයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණියි.

- ගඩු වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි.

- ගේ නිරොධය ගඩු රහිත නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණියි.

- උල් වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි.

- ගේ නිරොධය උල් රහිතවූ නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණියි

- අඝ වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි

- ගේ නිරොධය පීඩා නැත්තාවූ අනඝවූ නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගනියි.

- ආබාධ වශයෙන් නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි

- ගේ නිරොධය ආබාධ රහිත නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණියි.

- පර ප්‍රත්‍යය වශයෙන් නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි.

- ගේ නිරොධය පරප්‍රත්‍ය රහිත නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී.

- පලුදුවීම වශයෙන් නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි.

- ගේ නිරොධය පලුදු රහිත නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණියි.

- විපත්ති වශයෙන් නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි.

- ගේ නිරොධය විපත්ති රහිත නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී.

- උවදුරු වශයෙන් නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි.

- ගේ නිරොධය උවදුරු රහිත නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී.

- භය වශයෙන් නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය නිර්භයවූ නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී. - ඇලීම වශයෙන් බලන්නේ නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය ඇලීම නැති නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී - චපල වශයෙන් නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය අචපලවූ නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී. - බිඳීම් වශයෙන් නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය නොබිඳෙන සුළු නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී. අස්ථිර වශයෙන් නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය සදාකාලිකවූ නිර්වාණයයි. බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී - ආරක්ෂා රහිත වශයෙන් නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි - ගේ නිරොධය ආරක්ෂා සහිත නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී. - නිර්භය ස්ථානයක් නොවීම් වශයෙන් නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය නිර්භය ස්ථානයක්වූ නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී. - අසරණ වශයෙන් නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය අසරණවූ නිර්වාණය බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී. - හිස් වශයෙන් නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි - ගේ නිරොධය නොසිස්වූ නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණියි. - ලාමක වශයෙන් නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි - ගේ නිරොධය (අලාමක) තුච්ඡනොවූ නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණියි - ශුන්‍ය වශයෙන් නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි - ගේ නිරොධය පරම ශුන්‍ය නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැස ගණියි. - අනාත්ම වශයෙන් නුවණින් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය පරමාර්ථවූ නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී. - ආදීනව

වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය නිරාදීනව නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණියි. - විපරිනාම ස්වභාව වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය විපරිනාම ස්වභාව නැති නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණියි. - අසාර වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි - ගේ නිරොධය සාරවූ නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණියි - අඝ මුල වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි - ගේ නිරොධය අඝ මුල නොවූ නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී. - වධක වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය වධකනුවූ නුවණ වශයෙන් බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී - විභව වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය විභව රහිත නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී. - ආශ්‍රව සහිත වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය ආශ්‍රව රහිත නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණියි. - සංඛත වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය අසංඛත නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණියි. - මාරයාගේ ආහාරය වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය නිරාමිසවූ නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී - ඉපදීම ස්වභාව වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය ඉපදීම නැති නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණියි. - දිරීම් සහිත වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරෝධය දිරීම් නැති නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණියි. රෝග ස්වභාවය ඇති දෙයක් ලෙස බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය රොග රහිත නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී - මරණ ස්වභාව ඇත්තක්ලෙස බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය මරණ රහිත නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී. - ශෝක ස්වභාවය ඇත්තක ලෙස බලන්නේ අනුලොම නුවණ ලබයි. -

ගේ නිරොධය ශෝක රහිත නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී. - පරිදේව ඇත්තක් වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි. - ගේ නිරොධය පරිදේව රහිත නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී. - දැඩිශෝක ඇත්තක් වශයෙන් බලන්නේ අනුලොම නුවණ ලබයි - ගේ නිරොධය දැඩිශෝක රහිත නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී. - කිලිටි ස්වභාව ඇත්තක් ලෙස බලන්නේ අනුලොම නුවණින් ලබයි. - ගේ නිරොධය කිලිටි ස්වභාව නැති නිර්වාණයයි බලන්නේ සම්මත්ත නියාමයට බැසගණී.

8. "අනිත්‍ය වශයෙන් යනු නම්

අනිත්‍ය වශයෙන් බැලීමයි. දුක් වශයෙන් යනු නම් දුක් වශයෙන් බැලීමයි. රෝග වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. ගඩු වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. හුල් වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. අඝ වශයෙන් බැලීම යනු නම් දුක් අනුව බැලීමයි.

"ආබාධ වශයෙන් යනු නම්, දුක් අනුව බැලීමයි. පරප්‍රත්‍යය වශයෙන් යනු නම් අනාත්ම වශයෙන් බැලීමයි. පලුදුවීම් වශයෙන් යනු නම් අනිත්‍ය අනුව බැලීමයි. විපත්ති වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. උවදුරු වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. භව වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. ඇලීම් වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. චපල වශයෙන් යනු නම් අනිත්‍යය අනුව බැලීමයි. බිඳීම් වශයෙන් යනු නම් අනිත්‍ය අනුව බැලීමයි. සදාකාලික නොවන්නක් වශයෙන් යනු නම් අනිත්‍යය අනුව බැලීමයි. ආරක්ෂා රහිත වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. නිර්භය ස්ථානයක් නොවීම් වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. අසරණ වශයෙන් යනු නම් අනිත්‍යය අනුව බැලීමයි. හිස් වශයෙන් යනු නම් අනාත්මය අනුව බැලීමයි. තුච්ඡ වශයෙන් යනු නම් අනාත්මය අනුව බැලීමයි. ශුන්‍ය වශයෙන් යනු නම් අනාත්මය අනුව බැලීමයි. ආදීනව වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. විපරිණාම ස්වභාව වශයෙන් යනු නම් අනිත්‍ය අනුව බැලීමයි. නිසරු

වශයෙන් යනු නම් අනාත්මය අනුව බැලීමයි. අඝ මූල වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. වධක වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. විභව වශයෙන් යනු නම් අනිත්‍ය අනුව බැලීමයි. ආශ්‍රව සහිත වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. සංඛත වශයෙන් යනු නම් අනිත්‍යය අනුව බැලීමයි. මාරයාගේ ආහාරයක් වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. ඉපැදීම් ස්වභාව වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. දිරීම් ස්වභාව ඇත්තක් වශයෙන් යනු නම් දුක අනුව බැලීමයි. රොග ස්වභාව වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. මරණ ස්වභාව වශයෙන් යනු නම් අනිත්‍ය අනුව බැලීමයි. ශෝක ස්වභාව වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. පරිදේව ස්වභාව වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. දැඩිශෝක ඇත්තක් වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි. කිළිටි ස්වභාව ඇත්තක් වශයෙන් යනු නම් දුක් අනුව බැලීමයි.

**9.** "මේ සතළිස් අයුරින් අනුලොම නුවණ ලබයි. මේ හතළිස් අයුරින් සම්මත්ත නියාමයට බැසගණියි. මේ සතළිස් අයුරින් අනුලොම නුවණ ලබන්නහුට මේ සතළිස් අයුරින් සම්මත්තනියාමයට බැසගන්නහුට අනිත්‍යය අනුව බැලීම් කෙතෙක්ද? දුක් අනුව බැලීම් කෙතෙක්ද? අනාත්මය අනුව බැලීම් කෙතෙක්ද?

අනාත්මය අනුව බැලීම් විසිපහකි. අනිත්‍යය අනුව බැලීම් පණහකි. දුක් අනුව බැලීම් එකසියවිසිපහකි.

**(විදර්ශනා කථා නිමි.)**

---

## 30 මාතිකා කථා

**1.** "නොමැළවුනේ මිදුනේනුයි" විමොක්ෂ නම්.

විද්‍යා විමුක්තිය, අධිශීලය, අධිචිත්තය, අධිප්‍රඥාව, පස්සද්ධිය ඥානය, දර්ශනය, විශුද්ධිය, නෙක්ඛම්මය, නිස්සරණය, පවිවෙකය, වොස්සග්ගය, චරියා, ධ්‍යාන විමොක්ෂ, භාවනා අධිෂ්ඨානය, ජීවිතය.

නොමැලවුනේ යනු නම්:

නිෂ්කාම්‍යය කරණකොටගෙණ කාමච්ඡන්දයෙන් නොමැලවීමයි.

අව්‍යාපාදය කරණකොටගෙණ ව්‍යාපාදයෙන් (ii) නොමැලවීමයි. (iii) ආලොක සඤ්ඤාව කරණකොටගෙන ථිනමිද්ධයෙන් (මෙහි ii) අවික්ෂෙපය කරණකොටගෙන ඖද්ධත්‍යයෙන් (මෙහි ii) ධර්ම ව්‍යවස්ථාපනය කරණකොටගෙන විචිකිච්ඡාවෙන් (මෙහි ii)

ප්‍රථමධ්‍යානය කරණකොටගෙන නීවරණ කෙරෙන් නොමැලවීමයි.

අර්හත් මාර්ගය කරණකොටගෙන සියලු කෙලෙසුන් කෙරෙන් නොමැලවීමයි.

2. "මිදේනුයි විමොක්ඛ නම්වේ" යන මෙහිඃ

නිෂ්කාම්‍යය හේතුකොට ගෙණ, කාමච්ඡන්දයෙන් මිදේනුයි විමොක්ඛ නම් වේ.

අව්‍යාපාදය හේතුකොටගෙන ව්‍යාපාදයෙන් (ii) මිදේණුයි විමොක්ඛ නම් වේ. (iii) ආලොකසඤ්ඤාව හේතුකොටගෙන ථිනමිද්ධයෙන් (මෙහි ii) අවික්ෂෙපය හේතුකොටගෙන ඖද්ධත්‍යයෙන් (මෙහි ii) ධර්මව්‍යවස්ථාපනය කරණකොටගෙන විචිකිච්ඡාවෙන් (මෙහි ii)

ප්‍රථමධ්‍යානය හෙතුකොටගෙන නීවරණ කෙරෙන් විදේනුයි විමොක්ඛ නම් වේ.

අර්හත් මාර්ගය හේතුකොටගෙන සියලු කෙලෙසුන් කෙරෙන් මිදේනුයි විමොක්ඛ නම් වේ.

3. "විද්‍යා විමුක්තිය යන" මෙහි

නිෂ්කාමය විද්‍යාමානවේනුයි විද්‍යානම් වේ.

කාමච්ඡන්දයෙන් මිදේනුයි විමුක්ති නම් වේඃ දැනගනිමින් (කාමච්ඡන්දයෙන්) මිදෙයි. මිදෙමින් දැනගණීනුයි විද්‍යාමුක්ති නම් වේ.

අව්‍යාපාදය විද්‍යාමානවේනුයි විද්‍යානමි. ව්‍යාපාදයෙන් මිදේනුයි "විමුක්ති නම් වේ"

දැනගණිමින් (ව්‍යාපාදයෙන්) මිදෙයි. මිදෙමින් දැනගණීනුයි විද්‍යාවිමුක්ති නම් වේ. දැනගනිමින් (ථිනමිද්ධයෙන්) මිදෙයි

මිදෙමින් දැනගනීනුයි විද්‍යාවිමුක්ති නම් වේ. ආලෝක සඤ්ඤාව විද්‍යාමාන වේනුයි විද්‍යානම්. ථීනමිද්ධයෙන් මිදේනුයි විමුක්තිනම්. දැනගනිමින් (උද්ධච්චයෙන්) මිදෙයි. මිදෙමින් දැනගනීනුයි විද්‍යාවිමුක්ති නම් වේ. අවික්ෂෙපය විද්‍යාමාන වේනුයි විද්‍යමාන නම්. උද්ධච්චයෙන් මිදේනුයි විමුක්ති නම් දැනගනිමින් (විචිකිච්ඡාවෙන්) මිදෙයි. මිදෙමින් දැනගනීනුයි විද්‍යාවිමුක්ති නම්. ධම්මවවත්ථානය විද්‍යමානවේනුයි විද්‍යා නම්. විචිකිච්ඡාවෙන් මිදේනුයි විමුක්ති නම්. දැනගනිමින් (නීවරණයන්ගෙන්) මිදෙයි මිදෙමින් දැනගනීනුයි විද්‍යාවිමුක්ති නම්. පඨමජ්ක්ධානය විද්‍යමානවේනුයි විද්‍යානම්. නීවරණයන්ගෙන් මිදේනුයි විමුක්තිනම්. දැනගනිමින් (සියලු කෙලෙසුන්ගෙන්) මිදෙයි. මිදෙමින් දැනගනීනුයි විද්‍යාවිමුක්ති නම්. අර්හත් මාර්ගය විද්‍යාමානවේනුයි විද්‍යානම් වේ.

සියලු කෙලෙසුන් කෙරෙන් මිදේනුයි විමුක්ති නම් වේ. දැනගනිමින් මිදෙයි මිදෙමින් දැනගනීනුයි, විද්‍යාවිමුක්ති නම් වේ.

4. අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥා යනු නම්

නිෂ්කාමයයෙන් කාමච්ඡන්දය සංවරණය කිරීම අර්ථයෙන් "ශීලවිශුද්ධි" නම්.

නොවිසිරීම් අර්ථයෙන් "චිත්තවිශුද්ධි" නම් වේ.

දර්ශනාර්ථයෙන් "දිට්ඨිවිශුද්ධි" නම් වේ.

එහි යම් සංවරණාර්ථයක් වේ නම් එය අධිශීල ශික්ෂා නම්. එහි යම් නොවිසිරීම් අර්ථයක් වේ නම් එය අධිචිත්ත ශික්ෂානම් එහි යම් දර්ශනාර්ථයක් වේ නම් එය අධිප්‍රඥා ශික්ෂා නම් වේ.

5. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය සංවරණය කිරීම් අර්ථයෙන් ශීලවිශුද්ධි නම් වේ. (ii) ආලෝකසඤ්ඤාවෙන් ථීනමිද්ධය, අවික්ෂෙපයෙන් උද්ධච්චය, ධම්මවවත්ථානයෙන් විචිකිච්ඡාව පඨමජ්ක්ධානයෙන් නීවරණයන්, (iii) අර්හත් මාර්ගයෙන් සියලු කෙලෙසුන් සංවරණය කිරීම් අර්ථයෙන් ශීල විශුද්ධි නම් වේ.

නොවිසිරීම් අර්ථයෙන් චිත්ත විශුද්ධි නම් වේ.

දර්ශනාර්ථයෙන් දිට්ඨිවිශුද්ධි නම් වේ.

එහි යම් සංවරණාර්ථයක් වේනම් එය අධිශීලශික්ෂා නමි. එහි යම් අවික්ෂෙපාර්ථයෙන් වේ නම් එය අධිචිත්තශික්ෂානමි. එහි යම් දර්ශනාර්ථයක් වේනම් එය ශික්ෂා නමි.

**6.** පස්සද්ධිනම්:

නිෂ්කාම්‍යයෙන් කාමච්ඡන්දය සන්සිඳවයි.

අව්‍යාපාදයෙන් ව්‍යාපාදය සන්සිඳවයි. (මෙහි 5 (ii) යොදන්න)

අර්හත් මාර්ගයෙන් සියලු කෙලෙසුන් සන්සිඳවයි.

**7.** ඥානය නම්:

කාමච්ඡන්ද ප්‍රහීනවූ බැවින් දැනගත්තේය යන අර්ථයෙන් (නිෂ්කාම්‍යයි) "නෙක්ඛම්මය" ඥාන නමි

ව්‍යාපාදය (ii) ප්‍රහීණවූ බැවින් දැනගත්තේය. යන අර්ථයෙන් (iii) අව්‍යාපාදය ඥානනම් ථිනමිද්ධය (මෙහි ii) ආලෝක සඤ්ඤාව ඥානනමි. උද්ධච්චය (මෙහි (ii) සඤ්ඤාව නමි. විචිකිච්ඡාව (මෙහි (ii) ධම්මවවත්ථාන සඤ්ඤාව අවික්ෂෙප නමි. නීවරණයන් (මෙහි (ii) පඨමජ්ක්ධාන සඤ්ඤාව ඥාන නමි.

සියලු කෙලෙස් ප්‍රහීණවූ බැවින් දැනත්තේය යනු අර්ථයෙන් අර්හත් මාර්ගය ඥාන නමි.

**8.** දර්ශන නම්:

කාමච්ඡන්ද ප්‍රහීණවූ බැවින් නුවණින් දක්නාලදය යන අර්ථයෙන් නිෂ්කාම්‍යය දර්ශන නමි.

ව්‍යාපාදය ප්‍රහීණවූ බැවින් නුවණින් දක්නාලදය යන අර්ථයෙන් අව්‍යාපාදය දර්ශන නමි. ඥාන නමි යන්න දර්ශන නම් කියා වෙනස්කොට (මෙහි 7 - (ii) යොදන්න)

සියලු කෙලෙස් ප්‍රහීණවූ බැවින් නුවණින් දක්නාලද යන අර්ථයෙන් අර්හත් මාර්ගය දර්ශන නමි.

**9.** විසුද්ධි නම්

කාමච්ඡන්දය දුරුකරන්නේ නිෂ්කාම්‍යයෙන් පිරිසිදු වෙයි. ව්‍යාපාදය දුරුකරන්නේ අව්‍යාපාදයෙන් පිරිසිදු වෙයි. ථිනමිද්ධය දුරුකරන්නේ ආලෝක සඤ්ඤාවෙන් උද්ධච්චය දුරුකරන්නේ අවික්ෂෙපයෙන් විචිකිච්ඡාව දුරුකරන්නේ

ධම්මවවත්ථානයෙන්, නීවරණයන් දුරුකරන්නේ පඨමජ්ක්ධානයෙන් සියලු කෙලෙසුන් දුරුකරන්නේ අර්හත් මාර්ගයෙන් පිරිසිදුවෙයි.

10. නෙක්කම්ම නම්:

කාමයන්ගෙන් වෙන්වීමයි.

"ආරූප්‍යය" නම් රූපයන්ගෙන් නික්මීමයි. යම්කිසිවක් වූයේ නම් සංස්කෘත (සකස්වූයේ) නම් හේතුප්‍රත්‍යයෙන් හටගත්තේ නම් නිරොධය එහි නෙක්ඛම්මනම්. අව්‍යාපාදය ව්‍යාපාදය ii පිළිබඳ "නෙක්ඛම්මයයි" (iii) ආලෝක සංඥාව ථිනමිද්ධය පිළිබඳ "නෙක්ඛම්ම"යයි අවික්ෂෙපය උද්ධච්චය (මෙහි ii) ධම්මවවත්ථානය විචිකිච්ඡාව (මෙහි ii) පඨමජ්ක්ධානය නීවරණයන් (මෙහි ii) අර්හත් මාර්ගය සියලු කෙලෙස් පිළිබඳ නෙක්ඛම්මයයි.

11. නිස්සරණ නම්:

කාමයන් හැරදැමීමයි:

ආරූප්‍ය නම් රූපයන්ගේ හැරදැමීමයි. යම්කිසිවක් වූයේ නම්, සංස්කෘත (සකස්වූයේ) නම් හේතුප්‍රත්‍යයෙන් හටගත්තේ නම් නිරොධය එහි (ii) නිස්සරණයයි (iii) අව්‍යාපාදය ව්‍යාපාදය පිළිබඳ (මෙහි ii) ආලොක සංඥාව ථිනමිද්ධය පිළිබඳ (මෙහි ii) අවික්ෂෙපය උද්ධච්චය පිළිබඳ (මෙහි ii) ධම්මවවත්ථානයන් විචිකිච්ඡාව පිළිබඳ (මෙහි ii) පඨමජ්ක්ධානය නීවරණයන් පිළිබඳ (මෙහි ii) අර්හත්මාර්ගය සියලු කෙලෙසුන් පිළිබඳ නිස්සරණයයි.

12. "විවේකය යන" මෙහි

කාමච්ඡන්දයාගේ නිෂ්කාම්‍යය පවිවේක නමි. ව්‍යාපාදයගේ අව්‍යාපාදය, ථිනමිද්ධයාගේ ආලෝක සඤ්ඤාව උද්ධච්චයාගේ අවික්ෂෙපය, විචිකිච්ඡාවගේ ධම්මවවත්ථානය නීවරණයාගේ පඨමජ්ක්ධානය සියලු කෙලෙසුන් පිළිබඳව අර්හත් මාර්ගය පවිවේක නමි.

13. "වොස්සග්ග යන" මෙහි

නිෂ්කාම්‍යයෙන් කාමච්ඡන්දය හැරදමානුයි වොස්සග්ග නමි" අව්‍යාපාදයෙන් ව්‍යාපාදය හැරදමානුයි වොස්සග්ග නමි.

ආලෝක සඤ්ඤාවෙන් ථීනමිද්ධය අවික්ෂෙපයෙන් උද්ධච්චය. විචිකිච්ඡාවෙන් ධම්මවවත්ථානය නීවරණයෙන් පඨමජ්ක්ධානය අර්හත් මාර්ගයෙන් සියලු කෙලෙස් හැරදමානුයි වොස්සග්ග නමි.

14. "චරියා" යන මෙහි

කාමච්ඡන්දය හැරදමන්නේ නිෂ්කාම්‍යයෙන් හැසිරෙයි. ව්‍යාපාදය හැරදමන්නේ අව්‍යාපාදයෙන් හැසිරෙයි.

ථීනමිද්ධය හැරදමන්නේ ආලොක සඤ්ඤාවෙන් හැසිරෙයි. උද්ධච්චය හැරදමන්නේ අවික්ෂෙපයෙන් හැසිරෙයි. විචිකිච්ඡාව හැරදමන්නේ ධම්මවවත්ථානයෙන් හැසිරෙයි. නීවරණයන් හැරදමන්නේ පඨමජ්ක්ධානයෙන් හැසිරෙයි. සියලු කෙලෙස් හැරදමන්නේ අර්හත් මාර්ගයෙන් හැසිරෙයි.

15. ධ්‍යාන විමොක්ෂ යන මෙහි

නිෂ්කාම්‍ය සිතානුයි ධ්‍යාන නමි. කාමච්ඡන්දය දවානුයි ධ්‍යාන නමි.

සිතමින් මිදේනුයි ධ්‍යානවිමොක්ෂ නමි. දවමින් මිදේනුයි ධ්‍යානවිමොක්ෂ නමි.

16. සිතන දේ නම් ධර්මයි. දවනදේ නම් කෙලෙස්ය. සිතූ දේ දැවූදේත් දනීනුයි ක්ධාන ක්ධායී නම් වේ. අව්‍යාපාදය සිතානුයි ක්ධාන නම්වේ. ව්‍යාපාදය දවානුයි ක්ධාන නම්වේ. ආලෝක සංඥාව සිතානුයි ක්ධාන නමි. ථීනමිද්ධය දවානුයි ක්ධාන නමි. අවික්ෂෙපය සිතානුයි ක්ධාන නමි. උද්ධච්චය දවානුයි ක්ධාන නමි. ධම්මවවත්ථානය සිතානුයි ක්ධාන නමි. විචිකිච්ඡාව දවානුයි ක්ධාන නමි. පඨමජ්ක්ධානය සිතානුයි ක්ධාන නමි. නීවරණයන් දවානුයි ක්ධාන නමි. අර්හත් මාර්ගය සිතානුයි ක්ධාන නමි. සියලු කෙලෙස් දවානුයි ක්ධාන නමි සිතමින් මිදේනුයි ක්ධාන විමොක්ෂ නමි. දවමින් විදේනුයි ක්ධාන විමොක්ෂ නමි සිතන දෙය නම් ධර්මයි. දවන දෙය නම් කෙළෙස්ය. සිතූ දේ, දැවූදේත් දනීනුයි "ක්ධාන, ක්ධායී නම් වේ.

17. භාවනාව, අධිෂ්ඨානය, ජීවිතය යන මෙහි

කාමච්ඡන්දය දුරුකරමින් නෙක්ඛම්මය වඩානුයි "භාවනා සම්පන්න" නමි.

නිෂ්කාම්‍ය වශයෙන් සිත ඉටානුයි "අධිෂ්ඨාන" සම්පන්න නම්. ඒ මේ භික්ෂුතෙමේ මෙසේ භාවනා සම්පන්නවූයේ විෂමව නොව ජීවත්වෙයි වැරදිලෙස නොව නිවැරදිව ජීවත් වෙයි. කිළිටිනොව පිරිසිදුව ජීවත්වේනුයයි ආජීව සම්පන්න නම් වේ.

ඒ මේ භික්ෂුතෙමේ මෙසේ භාවනා සම්පන්නවූයේ මෙසේ අධිෂ්ඨාන සම්පන්නවූයේ ආජීවසම්පන්නවූයේ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ, ගෘහපති, ශ්‍රමණ යන යම් යම් පිරිසකට පැමිණේ නම් නොහැකිළී නිර්භීතව පැමිණෙයි.

ඊට හේතු කවරේදයත්? ඒ ආර්ය පුද්ගලතෙමේ එසේ පැමිණිය හැකි පරිදි භාවනාවෙන් යුක්තය. (ආජීවයෙන්) මනා දිවි පැවැත්වීමෙන් යුක්තය.

**18.** ව්‍යාපාදය දුරුකරමින් අව්‍යාපාදය වඩානුයි භාවනා සම්පන්න නම් වේ. ථීනමිද්ධය දුරුකරමින් ආලෝක සංඥාව වඩානුයි භාවනා සම්පන්න නම් වේ. උද්ධච්චය දුරුකරමින් නොවිසුරුනු සිත වඩානුයි භාවනා සම්පන්න නම් වේ.

විචිකිච්ඡාව දුරුකරමින් ඒ ඒ කරුණු නිශ්චයකිරීම වඩානුයි භාවනා සම්පන්න නම් වේ. අවිද්‍යාව දුරුකරමින් විද්‍යාව වඩානුයි භාවනාසම්පන්න නම් වේ. නොඇල්ම දුරුකරමින් ප්‍රමෝදබව වඩානුයි භාවනාසම්පන්න නම් වේ. නීවරණයන් දුරුකරමින් ප්‍රථමධ්‍යානය වඩානුයි භාවනාසම්පන්න නම් වේ. සියලු කෙලෙස් දුරුකරමින් අර්හත් මාර්ගය වඩානුයි භාවනාසම්පන්න නම් වේ.

**19.** අර්හත් මාර්ග වශයෙන් සිත ඉටානුයි අධිෂ්ඨාන සම්පන්න නම් වේ. ඒ මේ භික්ෂුතෙමේ මෙසේ භාවනා සම්පන්නවූයේ මෙසේ අධිෂ්ඨානවූයේ විෂමව නොව සමව ජීවත් වෙයි. වැරදිලෙස නොව නිවැරදිව ජීවත්වෙයි. කිළිටිව නොව පිරිසිදුව ජීවත්වේනුයි ආජීවසම්පන්න නම් වේ.

**20.** මෙසේ භාවනාවෙන් යුක්තවූ අධිෂ්ඨානයෙන් යුක්තවූ මනා ජීවත්වීමෙන් යුක්තවූ ඒ භික්ෂුතෙමේ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ, ගෘහපති, ශ්‍රමණ යන යම් යම් පිරිසකට පැමිණියේ නම් නොහැකිළී, නිර්භීතව පැමිණෙයි. එසේ පැමිණෙනුයේ කවර හේතුන් නිසාදයත්, ඒ පුද්ගලතෙමේ එසේ පැමිණිය හැකි පරිදි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

භාවනාවෙන් යුක්තය. අධිෂ්ඨානයෙන් යුක්තය. මනා දිවිපැවැත්මෙන් යුක්තය.

(මාතිකා කථාව නිමි.)

පටිසම්භිදා ප්‍රකරණය සමාප්තයි.

---

# 13. අපදාන පාළිය.

## 1. ථෙරාපදානය.

### 1. බුද්ධ වග්ගය.

#### බුද්ධාපදානය.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

1. වේදේහි පුත්‍ර ආනන්ද ස්ථවිරතෙම දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන්නාවූ බුදුරජාණන් වහන්සේගෙන් "වීරයන් වහන්ස, (ii) කිනම් හේතුවකින් සර්වඥ බුදුවරයෝ වෙත්දැයි" නමස්කාර පෙරටුව විචාළසේක.

2-3 (i) එකල්හි මහර්ෂිවූ සර්වඥ බුදුරජාණන්වහන්සේ සුන්දරවූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට "පෙර බුදුවරයන් විෂයෙහි කරණ ලද පුණ්‍ය සම්භාර ඇති සර්වඥ ශාසන විෂයෙහි නොලබන ලද මොක්ෂය ඇති අතිසියුම් නුවණින් යුත් (ii) එම ප්‍රාඥයෝ එහි සම්‍යක් සම්බොධියම අරමුණු කොට මහත්වූ ධෛර්යයෙන් කළ පැතුමින්ද වඩන ලද ප්‍රඥාවෙහි බලයෙන්ද, සර්වඥභාවයට පැමිණෙත්යයි" මධුර ස්වරයෙන් වදාළ සේක.

4. "අසංඛ්‍ය ගණන් බුදුවරයෝ වෙති. මමද එකී පෙර බුදුවරයන් ඉදිරියෙහි සිතින්ම (එම උතුමන්) වෙන් වී බුදුබව පැතීමි.

5. "තවද බුද්ධාපදානයන් පිරිසිදු සිතින් යුතුව අසව් සමතිස් පෙරුම්පිරූ අසංඛ්‍ය ගණන් බුදුවරයෝ වෙති.

6. "ශ්‍රේෂ්ඨ බුදුවරයන් වහන්සේලාගේ සර්වඥතාඥානයටද ශ්‍රාවක සංඝයා සහිත බුදුවරයන් වහන්සේලාටද දොහොත් එක්කොට නැවතත් හිස නමා වැඳීම කෙළෙමි.

7. "ඇතිතාක් බුද්ධ ක්ෂෙත්‍රයන්හි අහසෙහිවූද පොළොවෙහිවූද අනන්තවූ රත්නයන් සිතින් (ඉටා) (මාගේ ප්‍රාසාදය හාත්පස) රැස් කෙළෙමි.

8. "එහි රිදියෙන් කරන ලද්දාවූද සත්රුවනින් කරණ ලද්දාවූද නොයෙක් මහල් (තට්ටු) ඇති අහසට උස්ව නැගී බබළන ප්‍රාසාදයක් මැවීමි.

9. "එම ප්‍රාසාදය දිගුපුළුලට සරිලනසේ මැනවින් කළ බෙදුම් ඇති වටිනා තොරණවලින් හා (සුදු) කුඩවලින් බබළන රුවනින් මුවා දැව වළලු ඇති විසිතුරු කණුවලින් යුක්තවීය.

10. "එහි පළමුවෙනි මාලය (තට්ටුව) පිරිසිදු වළාකුලක් සේ මනොඥ වෙරළු මිණියෙන් කරණ ලද පොළොව ඇත්තේ විය. ජලයෙහි හටගන්නා පියුම්වලින් ගැවසීගත් උතුම් ස්වර්ණමය භූමීන්ගෙන්ද යුක්ත විය.

11. "ඇතැම් භූමීහු මනහර ලෙස පබළුයෙන් කළ පැති ඇති පබළුවන් වූවාහුද අනිකක් රත් පැහැ ඇත්තාහුද තවෙකක් රතිඳු ගොච්චන්ගේ පැහැයට බඳු පැහැයෙන් යුක්තවූවාහුද දසදිගුන් බබුළුවති.

12. "මැනවින් ගෘහද්වාරද පිටතට නෙරාගිය ප්‍රමුඛ ශාලාවන් (ගෙවල් ඉදිරියේ බැඳි ශාලා) ද සීමැදුරුද මනහර මුතුලැල්වලින් හා සුවඳ දුමින් ගැවසීගත් වේදිකා සතරක්ද (එහි) විය.

13. "(එම ප්‍රාසාදය) සත්රුවනින් ශෝභාවත් කළ නිල් කහ, රතු, සුදු හා අමිශ්‍ර කාලවර්ණයද ඇති උතුම් කුළු ගෙවලින්ද, සමන්විත විය.

14. "උඩුකුරුව පිපුණු (අයුරින් කළ) පියුම්න්ද විශාල මෘගයන්ගේ හා පක්ෂීන්ගේ රූ සටහන්වලින්ද බබළන (ඉතා උස් බැවින් පිළිබිඹුවූ) නැකැත් තරුවලින් ගැවසී ගත් චන්ද්‍ර සූර්යයන්ගෙන්ද අලංකාර විය.

15. "රන් කිකිණියෙන් යුත් රුවන් දැලින් ගැවසුනු මනහර රන්මල්දම්හු වායුවේගයෙන් ශබ්ද පවත්වති.

16. "මදටිය රතු, කහ දඹරන් යන නන් වැදෑරුම් සායමින් පොවනලද ඔසවන ලද්දාවූ ධජ මාලාවෝ වෙති.

17. "(එහි) රිදීයෙන් කළ පුවරුද (නිල්) මිණියෙන් දැරගු මිණියෙන් හා කබරවන් මිණි ආදියෙන් කළ පුවරු ඇති සියුම් කසීසළු අතුල නා නා සයනයන්ගෙන් විසිතුරු විය.

18. "කම්බිලිද දුහුල් පටද චීන පටද පත්තුණ්ණ දෙශයෙහි කළ පටද පඬුවන් පටද යන මෙයින් කළ ප්‍රාවරණයන්ගෙන් විවිධ ඇතිරි ඇති සියලු (අසුන්) මම සිතින් (ඉටා) පැනවීමි.

19. "ඒ ඒ භූමීන්හි රත්නමය කර්ණිකාවන්ගෙන් ශොභාවත් රන්මිණියෙන් කළ දඬුවැට පහන් දරණ (නොයෙක්) සියගණන් ජනයෝ සිටිති.

20. "(එහි) නුවර දොර හොබවනු වස් සිටවූ යකඩ කණුද ස්වර්ණමයවූ ජාම්බෝජනද ස්වර්ණමයවූ (කිහිරි) ඛදිරදාරුමවූ (රිදී) රජතමයවූ තොරන්හුද බබළති.

21. "(එම) පහය මැනවින් බෙදූ බොහෝ ජනෙල් හා අගුලුවලින් විසිතුරු විය. නොයෙක් පියුම් උපුල්වලින් යුත් පෙදෙස තැබූ පූර්ණඝටයෝද එහි වෙති.

22. "අතීතයෙහිවූ ශ්‍රාවක සංඝයා සහිත ලොකනායක සම්‍යක් සම්බුදුවරයන්ද එසේම ශ්‍රාවක සමූහය සහිත පසේ බුදුවරයන්ද පියවි සටහනින් මවා.

23. "ශ්‍රාවකයන් සහිත එම බුදුවරු එකී දොරටුවෙන් (ප්‍රාසාදයට) ඇතුලුව ආර්ය සමූහව ස්වර්ණමය පීඨයෙහි වැඩහුන්හ.

24. "මෙකල ලෝකයෙහි අනුත්තරවූ යම් බුදු කෙනෙක් වෙත්ද, එසේම අතීතයෙහිවූවාහුද ඒ සියලු බුදුවරයෝම මේ ප්‍රාසාදයට වැඩමවූහ.

25. "තමන් විසින්ම ගුරුපදෙශ විරහිතව ධර්මය අවබොධ කරගත් පස්මරුන් දිනූ අතීතයෙහි හා වර්තමානයෙහිවූ නොයෙක් සියගණන් පසේබුදුවරුද මෙම පහයට වැඩම කළහ.

26. "දිව්‍යමයවූද මනුෂ්‍යමයවූද කප්රුක් බොහෝ වෙති. (ඒවායින්) සියලු වස්ත්‍ර ගෙනවුත් තුන් සිව්රින් (උන්වහන්සේලා) (හඳවමි)

27. "කෑයුතුවූද බුදියයුතුවූද රස විඳ ගතයුතුවූද සමෘද්ධවූ ආහාරපානයෙන් මනොඥවූ මිණිමුවා පාත්‍රයන් පුරවා මම උන්වහන්සේලාට දුනිමි.

28-29. "ඒ දිව්‍ය වස්ත්‍ර වැනි මටසිලුටු සිව්රු දැරුවාවූ මීසකුරු තලතෙල් හා මීපැණියෙන්ද යන (මෙකී) උතුම් ආහාර පානයන්ගෙන් තෘප්තවූ ඒ සියලු ආර්ය සමූහයා ගුහාවන්හි සයනය කරන කෙසර සිංහයන් මෙන් රත්න ගර්භයට පිවිස,

30. "මාහැඟි සයනයෙහි සිහියෙන් යුතුව සීහ සෙය්‍යාවෙන් සැතපුනාහ. ඉන් නැගිට සයනයෙහිම පලක් බැඳ වැඩහිඳ සියලු බුදුවරයන්ට අරමුණුවූ ධ්‍යානයට සමවන්හ.

31. "එසේ බුදුවරයන් අතුරෙන් ඇතමෙක් දහම් දෙසත්. කෙනෙක් ධ්‍යානයෙන් උපදවා ගත් ඍද්ධීන් දක්වත්. අයෙක් පඤ්චවසීන්ගේ වශයෙන් වසඟ කළ අභිඥාවන්ට සමවදිති. අනෙක ශතසහශ්‍ර සංඛ්‍යාත නොයෙක් ඍද්ධි කරත්.

32. "ඒ පසේ බුදුවරු සර්වඥතාඥානයට ගෝචරවූ ප්‍රශ්න අනික් බුදුවරුන්ගෙන් විචාරත්. ගැඹුරුවූද කරුණු ප්‍රඥාවෙන් අවබොධ කෙරෙත්.

33. "ශ්‍රාවකයෝ බුදුවරුන්ගෙන් විචාරත්. බුදුවරු ශ්‍රාවකයන්ගෙන් විචාරත්. ඔවුනොවුහු විචාරත්. ඔවුනොවුන්ට පිළිතුරු දෙත්.

34. "සම්‍යක් සම්බුදුවරුද පසේ බුදුවරුද ශ්‍රාවකයෝද, පිරිවර ජනයාද මෙසේ ස්වකීය කැමැත්ත පරිදි එම වෛජයන්ත ප්‍රාසාදයෙහි ඇලී වෙසෙති.

35. "රන් දැල් පේලි ඇති සප්ත රත්නමය ඡත්‍ර එල්බ සිටිත්වා. මුතු දැලින් එල්බුනු සියලු ඡත්‍ර මාගේ මුදුනෙහි (හිසට) දරත්වායි සිතූ කෙණෙහි එසේ පහළවිය.

36. "රුවන් තරුයෙන් විසිතුරු රෙදි වියන්ද එසේම විසිතුරු මල් වියන්ද යන මේ සියල්ල මාගේ මුදුනෙහි දරත්වා!

37. "මාලාදාමයන්ගෙන් ගැවසී ගත් සුගන්ධ දාමයන්ගෙන් ශෝභිතවූ රෙද්දෙන් කළ මාලාවන්ගෙන් ආකූලවූ රත්න මාලාවන්ගෙන් අලංකෘත,

38. "විසිතුරු මලින් ගැවසීගත් සුවඳ දුම් ගැන්වූ සුවඳ පසඟුල් කළ රන් වියනින් වැසූ,

39. "පියුම් උපුල්මලින් ගැවසීගත් සිව් දිගෙහිවූ පොකුණු පියුම් රොණින් හා රජසින් ස්වර්ණ වර්ණව වැටහෙත්වා.

**40.** "මාගේ (වෛජයන්ත) ප්‍රාසාදය හාත්පස සියළු ගස්වල මල් පිබිදෙත්වා. ඒ මල් තෙමේම ගිලිහී පහය මතුවෙහි විසිරෙත්වා.

**41.** "එහි මොණරු නටත්වා. දිව්‍ය හංසයෝ ශබ්ද කරත්වා. කුරවි කෙවිල්ලෝද හාත්පස වෙසෙන සෙසු පක්ෂි සමූහයාද නාද කෙරෙත්වා.

**42.** "පහය හාත්පස සියලු බෙර වැයෙත්වා. සියලු වීණා ගැයෙත්වා. හැම සංගීතයක්ම පවතිත්වා.

**43-44.** "සියලු බුද්ධ ක්ෂෙත්‍රයෙහිද ඉන් පිටත් සක්වලෙහිද මහත්වූ පළුදු නොවූ ප්‍රභාවත් රන්වන් වර්ණයෝ වෙත්වා. ප්‍රදීප වෘක්ෂයෝ දැල්වෙත්වා, දස සහශ්‍රී ලොකධාතුන්ගේ සමූහයම එකාලොක වෙත්වා.

**45.** "නිලියෝද මුවින් ශබ්ද පවත්වන්නෝද නෘත්‍ය කෙරෙත්වා. නොයෙක් වර්ණවත් දිව්‍යප්සරා සමූහයා ප්‍රකටව පෙණෙත්වා.

**46.** "ගස් මුදුනෙහිද, පර්වත මුදුනෙහිද, සිනෙරු පර්වත මුදුනෙහිද පඤ්ච වර්ණයෙන් විසිතුරුවූ සියලු ධජ ඔසවමි.

**47.** "(දිව්‍ය මනුෂ්‍යාදි) සංඥී සත්වයෝද (අසඤ්ඤ සත්තයෙහිවූ) අසංඥී සත්වයෝද යම්තාක් වෙත්නම්, ඒ සියල්ලෝ මා විසින් කරණ ලද එකී පුණ්‍යඵලය අනුමෝදන් වෙත්වා.

**48.** "මා විසින් කරණලද පින යම් දිව්‍ය මනුෂ්‍ය නාගාදී කෙනෙකුන් විසින් මැනවින් දැනගන්නා ලදද ඔවුන්ට මා විසින් පින දෙනලදී. මා විසින් ඒ කරණලද පින දුන් බව යම් කෙනෙක් නොදනිත් නම් දෙවිවරු ගොස් ඔවුන්ට එය දැන්වූහ.

**49.** "ආහාර හේතුවෙන් ජීවත්වන සියලුම ලෝකවාසි සත්වයෝ මනහර බොජුන් මාගේ පුණ්‍යර්ධියෙන් ලබත්වා.

**50.** "පිරිසිදු සිතින් යම් දානයක් මා විසින් දෙනලද නම්, එහි අනන්ත චේතනාවන්ගෙන් සතුට ඉපදවීමි. සියලු සම්බුදුවරයෝද පසේ බුදුවරයෝද බුදු සව්වෝද මා විසින් පුදන ලදහ.

**51.** "මැනවින් කළ ඒ පිනින්ද ප්‍රාර්ථනාවන්ගෙන්ද මම මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට ගියෙමි.

52. "දෙව් මිනිස් දෙගතිය දනිමි. ඉන් පිටත් අනික් ගතියක් ගැන නොදනිමි. (එය) සිතින් කළ පැතුමෙහි පලයයි.

53. "(දෙව්ලොව උපන් කල්හි) දෙවියන්ට ශ්‍රේෂ්ඨ වෙයි. (ඉදින් මිනිස් ලොව උපන් කල්හි) මනුෂ්‍යයින්ට ශ්‍රේෂ්ඨවූ රජ වෙමි. රූප ලක්ෂණයෙන් සමන්විතවූයේ අසමවූ ප්‍රඥාව ඇත්තේද වෙයි.

54. "ශ්‍රේෂ්ඨවූ නානා ප්‍රකාර භෝජනද බොහෝවූ සත්රුවන්ද නානා ප්‍රකාර පට්ට කොසෙයාදී වස්ත්‍රද මා වෙතට අහසින් වහා පැමිණෙයි.

55. "පෘථිවිය පර්වතය ආකාශය ජලය වනය යන මේ යම් යම් තැනකට අත පොවම් නම්, (ඒ හැමතැනකින්ම) මා වෙත දිව බොජුන් පහළවේ.

56-65. "එසේ ඒ පෘථිව්‍යාදී අත පෙවූ හැමතැනකින්ම රුවන්ද, සියලු සුගන්ධ වර්ගද, යානා මාලා අලංකාරයන්ද, සියලු කන්‍යාවන් හා මී සකුරුද, කෑමද මා වෙත පහළවෙති.

66. "ශ්‍රේෂ්ඨවූ සම්‍යක් සම්බොධියට පැමිණීම පිණිස දුගී මගී යාචකාදීන්ට මම උතුම් දන් දෙමි.

67. "ඝන බහල ශෛල පර්වත ගර්ජනය කරවමින් දෙවියන් සහිත ලෝකයා සොම්නස් කරවමින් මම ලෙව්හි බුදුවෙමි.

68. "ලෙව්හි දස දිගට යන්නහුට කෙළවරක් නැත. ඒ ඒ දිශාවෙහිද බුද්ධ ක්ෂේත්‍රයෝ අනන්ත වෙති.

69. "ඒ සක්විති රජවූ කල්හි චක්‍රරත්නාදීන්ගේ ආලෝකය රැස් විහිදුවමින් ප්‍රකට විය. මේ දස දහසක් සක්වල අතුරෙහි රැස් සමූහය අධික විය.

70. "මෙපමණවූ ලොක ධාතුන්හි සියලුදෙනා මා දකිත්වා. සියලුදෙනා සතුටු වෙත්වා. එසේම සියලුදෙන මා අනුගමනය කෙරෙති. බඹලොව දක්වාවූ හැමදෙනම මා අනුගමනය කෙරෙත්වා.

71. "විශිෂ්ඨවූ මධුර නාදයෙන් දෙව්බෙර ගැසීමි" මේ දසදහසක් සක්වල ඇතුළත සියලු ජනයෝ මිහිරි නාදය අසත්වා.

72. "දහම් වැසි වස්නා කල්හි සියල්ලෝ ආශ්‍රව රහිතයෝ (රහත්හු) වෙත්වා! මේ ජනයා අතුරෙහි යමෙක් පච්ඡිමක (අඩු) ගුණ ඇත්තෝ වෙත් නම් ඔව්හු සෝවාන් වෙත්වා.

73. "දියයුතු දන්දී නිරවශෙෂයෙන් සිල් පුරා ගෘහාභිනිෂ්ක්‍රමණය කොට සම්‍යක් සම්බොජ්ක්ධංගයට පැමිණියෙමි.

74. "නැණවතුන් විචාරා උතුම් වීර්යකොට ක්ෂාන්ති පාරමිතාව පුරා බුදු බවට පැමිණියෙමි.

75. "ශ්‍රෙෂ්ඨ අධිෂ්ඨානය කොට සත්‍ය පාරමිතාව හා මෛත්‍රී පාරමිතාව පුරා සම්‍යක් සම්බොධියට පැමිණියෙමි.

76. "ලාභය අලාභය සැපය දුකය. සම්මානය අවමානය යන මේ සියලු තන්හි සමසේ උපෙක්ෂා පාරමිතාව පුරා බුදු බවට පැමිණියෙමි.

77. "කුසීත බව භය වශයෙන්ද වීර්යයක්ෂෙම (ආරක්ෂා ස්ථානය) වශයෙන්ද දැක පටන්ගත් වීර්යය ඇත්තෝ වේ. මෙය බුද්ධානුශාසනයයි.

78. "විවාදය භය වශයෙන්ද අවිවාදය ක්ෂෙම වශයෙන්ද දැක සමගිව සිලිටි මෘදු ගුණ ඇත්තෝ වව්. මෙය බුද්ධානුශාසනයයි.

79. "ප්‍රමාදය භය වශයෙන්ද ක්ෂෙම වශයෙන්ද දැක ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩව්. මෙය බුද්ධානුශාසනයයි.

80. "නොයෙක් සිය දහස් ගණන් පසේ බුදුවරුද රහත්හුද රැස්වූහ. ඒ බුදුවරයන්ද රහතුන්ද වඳිමින් නමස්කාර කරව්.

81. "මෙසේ බුදුවරයෝ චිත්ත විෂයාතික්‍රාන්තයහ. බුද්ධ දෙශිත ධර්මය චිත්ත විෂයාතික්‍රාන්තයහ. චිත්ත විෂයාතික්‍රාන්තවූ බුදුන් කෙරෙහි හා ධර්මය කෙරෙහි පැහැදුනවුන්ට ලැබෙන විපාකයද චිත්ත විෂයාතික්‍රාන්ත වේ. හෙවත් සිතා අවසන් කළ නොහැකි වේ."

මෙසේ බුදුරජාණන් වහන්සේ තමන්වහන්සේගේ බුද්ධ චරිතය පවසන සේක් බුද්ධාපදානය නම්වූ බුද්ධපරියායය වදාළ සේක.

(බුද්ධාපදානය නිමි.)

---

## පච්චෙක බුද්ධාපදානය

අනතුරුව ප්‍රත්‍යෙක බුද්ධාපදානය අසව්.

**82.** (මෙහි 1. (i) යොදන්න) කිනම් හේතුවකින් ප්‍රත්‍යෙක බුදුවරයෝ වෙත්දැයි" නැමදුම් පෙරටුව විචාළේය.

83-84 (මෙහි 2-3 (i) යොදන්න) එම ප්‍රාඥයෝ එම සංවේගයම මුල්කොට බුදුවරුන්ගේ අවවාදානු ශාසනාවන් රහිතව ස්වල්පමාත්‍රවූද අරමුණක් හේතුකොටගෙන පසේ බුදුබවට පැමිණෙත්ය"යි මධුර ස්වරයෙන් වදාළසේක.

**85.** "සකල ලෝකයෙහි (සර්වඥ බුද්ධවූ) මා හැර පසේ බුදුවරයන් සමග සමානවූ අනිකෙක් නැත. ඒ පසේ බුදුවරයන්ගේ ගුණයන් පිළිබඳ ලේශමාත්‍රයක් මම (දැන් තොපට) මැනවින් දේශනා කරමි.

**86.** "පරොපදෙශ රහිතව තෙමේම අවබොධ කර ගත් පසේ බුදුවරයන්ගේ මිහිරිවූ උදාන වාක්‍යයෝ කුඩා මී වදයක් මෙන් (මිහිරි) වෙති. අනුත්තරවූ නිර්වාණ සංඛ්‍යාත ඖෂධය පතන (තෙපි) සියල්ලෝම මනාකොට පහන්වූ සිත් ඇත්තෝව (එය) අසව්.

**87.** "එහි රැස්වූ පසේ බුදුබවට පත් උතුමන්ගේ පිළිවෙළින් කළ යම් යම් ප්‍රකාශයෝ වෙත් නම් හේ මෙසේයි. කාමයන් පිළිබඳ යම් ආදීනවයක් වෙත් නම් එයද නොඇලීමට කරුණුවූ යමක් වී නම්, එය (දැක) උන්වහන්සේලා ප්‍රත්‍යෙක සම්බොධියට පත්වූහ.

**88.** "තෘෂ්ණාවෙන් රැඳිය යුතු වස්තුකාම ක්ලේශකාමයන්හි නොරැවටුනු පැණවතුන් වූවාහු, ඇලෙන ස්වභාවය ඇති ලෝකයෙහි නොඇලෙන සිත් ඇත්තාහු කෙලෙස් දුරුකොට දෙසැට මිසදිටු ජයගෙන (මේ උතුමෝ) එම හේතුවෙන් ප්‍රත්‍යෙක සම්බොධියට පැමිණියාහුය.

**89.** "සියලු සත්වයන් විෂයෙහි හරනාලද දඬුවම් ඇති එම සත්වයන් අතුරෙන් කිසිදු කෙනෙකුට හිංසාද නොකරන්නේ මෙත් සිතින් පතුරුවාලු හිතානුකම්පා ඇත්තේ (එම පසේබුදුරජතෙම) (ii) කඟවේනෙකු මෙන් හුදකළාවම හැසිරෙන්නේයි.

**90.** "සියලු සත්වයන් විෂයෙහි හරනාලද දඬුවම් ඇති එම සත්වයන් අතුරෙන් කිසිදු කෙනෙකුට හිංසාද නොකරන්නේ

පුත්‍රයා ගැන පවා බලාපොරොත්තුවක් නොතබන්නේය. සහායයන් ගැන කියනුම කවරේද? කඟවේණෙකු මෙන් හුදකලාවම හැසිරෙන්නේය.

(91-97 ඡේද අගට "කඟවේණෙකුමෙන් හුදකලාවම හැසිරෙන්නේය" යන්න යොදන්න.)

**91.** "හටගත් සංසර්ග ඇත්තහුට (ඒ හේතුවෙන්) ස්නේහය උපදී. ඒ ස්නේහය අනුව යන්නහුට මේ දුක ඇතිවේ. ස්නේහයෙන් හටගත්තාවූ ආදීනව දකින්නේ-

**92.** "සුහෘදවූ මිත්‍රයන්ට අනුකම්පා කරන්නේ මිත්‍රයා හා පිළිබඳ සිත් ඇති බව හේතුකොටගෙන තමාගේ දෙලෝ අභිවෘද්ධිය පිරිහෙලාගනී. සන්ථවයෙහි ඇති මේ භය දක්නේ-

**93.** "යම්සේ එකට ගෙතුනාවූ විශාල හුණ පඳුරක් මෙන් පුත්‍රදාරාවන් කෙරෙහි යම් ස්නෙහයක් වී නම් හුණකිලිලක් මෙන් නොඇලෙන්නේ-

**94.** "යම්සේ පසද මෘගයා උයනෙහි රැහැන් ආදියකින් නොබඳනා ලද්දේ යම් කැමති තැනකට ගොදුරු පිණිසයේද නුවණැති මනුෂ්‍ය තෙමේ සෛවරී බවද එසේම දක්නේ-

**95.** "මිතුරන් මැද සිටින විටද දිවාසයනයෙහිද මහා උපට්ඨාන සංඛ්‍යාත සිටීමෙහිද උද්‍යාන ගමනෙහිද ජනපද චාරිකාවෙහිද යන මේ අවස්ථාවන්හිදී ඇමතීම් ඇතිවේ. අපරාධීනවූ සෛවරී බැව්හි අනුසස් දක්නේ-

**96.** "සහායයන් මැද සිටින විට (කායික වාචසික) ක්‍රීඩාවෝද පංචකාම ගුණික රාගයෝද වෙති. එසේම පුත්‍රයන් කෙරෙහි ප්‍රේමයද අධිකවේ. එහි ඇතිවන ප්‍රිය විප්‍රයෝගය පිළිකුල් කරනුයේ-

**97.** "යථාලාභ වශයෙන් සන්තෝෂ වන්නන් සමග සිව්දිගෙහිවූ සත්වයන් හා සංස්කාරන් සමග භය වශයෙන් නොගැටෙන්නේවේ. කාය චිත්ත දරථයන් (වෙහෙසීම) ඉවසනසුළුව ලොමු දැහැගැනීම් නැත්තේය.

**98.** "ඇතැම් පැවිද්දෝද යලි ගිහිගෙයි වසන ගෘහස්ථයෝද සංග්‍රහ කිරීමෙහි දුෂ්කරවූහ. අන්‍ය පුත්‍රයන් කෙරෙහි කලකිරුනේව කඟවේනෙකු මෙන් හුදෙකලාව හැසිරෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**99.** "දෙකට පළා දැමූ කොවිලාර (කොබෝලීල) පත්‍රයක් මෙන් මාර්ග වීර්යයෙන් යුත් වීරතෙමේ ගිහි සලකුණු (ව්‍යඤ්ජන) හැරදමා ගිහිබැඳුම් සිඳ කඟවේණෙකුමෙන් හුදෙකළාව හැසිරෙයි.

**100.** "(1) ධෛර්යවත්වූ (අර්පණා උපචාර සමාධීන්හි යෙදීම් වශයෙන්) යහපත් විහරණ ඇති සමග හැසිරෙන්නාවූ ප්‍රාඥ මිත්‍රයෙකු මෙන් (ii) ඉදින් ලැබෙන්නේ නම්, සියලු කරදර මැඩගෙන සිහියෙන් යුතුවූයේ ඔහු සමග සතුටුව හැසිරෙන්නේය,

**101.** "(මෙහි 100 (i) යොදන්න) ඉදින් නොලැබෙන්නේ නම් යම්සේ රජ තෙමේ ජයගත් රට (උවදුරු සහිතයයි සිතා) හරනේද එසේම මහ අරණෙහි ඇත්රජකුමෙන් හුදකළාව හැසිරෙන්නේය.

**102.** "ඒකාන්තයෙන් මිත්‍ර සම්පත්තිය ප්‍රශංසා කරමු තමාට වඩා ගුණ ධර්මයන්ගෙන් ශ්‍රෙෂ්ඨවූවෝද සමවූවෝද සේවනය කටයුතු මිත්‍රයෝ වෙති. මෙබඳු මිතුරන් නොලබන වැරදි දිවි පෙවතින් උපදවාගත් ආහාරයෙන් නොයැපෙන බැවින් නිවැරදි භොජනය ඇති හෙතෙම කඟවෙණෙකු මෙන් හුදකලාවම හැසිරෙන්නේය.

(103 - 112 ඡෙදවල අගට "කඟවේණෙකු මෙන් හුදකලාව හැසිරෙන්නේය" යොදන්න)

**103.** "රන්කරුවකු විසින් මැනවින් නිමා කළ දීප්තිමත් රන්වළලු (එක්තැන්වූ කළ) දැතෙහි ගැටෙන අයුරුද එසේ එක්තැන්නොවී වෙනම පවත්නාකළ නොගැටී ශබ්ද විරහිතව ඇති අයුරුද) දැක-

**104.** "මෙසේ දෙවැන්නෙකු සමග සල්ලාපයෙහි යෙදීමද ඇලීමද යන මේ දෙකම (මතු ඇතිවන අධිගමයට අන්තරාය කරයි) මෙය භය වශයෙන් දක්නේ-

**105.** "වස්තුකාම ක්ලේශ කාමයෝ විචිත්‍රයහ. මධුරයහ. සිත් අලවන සුළුද වෙති. විවිධ රූපයන් කරණ කොටගෙන සිත් කළඹත්. කාමගුණයන්හි ඇති මේ ආදීනව දැක-

**106.** "පඤ්චකාම ගුණය (නොයෙක් ව්‍යසනයට හේතු වන බැවින්) උවදුරකි. (ක්ලෙශාශුචි වැගිරෙන බැවින්) ගෙඩියකි. (අවැඩ සිදුකරන බැවින්) උවදුරකි (නිරොගී බව පැහැරගන්නා

බැවින්) රෝගයකි. (හදවත විදින බැවින්) උලකි (දෙලොව භය එළවන බැවින්) බියකි. කාම ගුණයන්හි ඇති මේ භය දැක-

107. "සීතලයද උෂ්ණයද (බඩගින්නද) පිපාසාවද අවු සුළංද ඩැහැලෙහෙ බොන මැස්සන් හා සර්පයන්ද යන මේ සියල්ල මැඩ පවත්වා-

108. "මැනවින් හටගත් ග්‍රීවා ඇති (පියුමක් මෙන් මනහර සිරුරු ඇති බැවින් හෝ පදුමකුලයෙහි උපන් බැවින්) පදුමී නම්වූ උදාරවූ ඇත් රජතෙම හස්ති සමූහයා හැරදමා කැමතිතාක් කල් අරණෙහි වසන්නාක් මෙන්-

109. "යමක් හේතුකොටගෙන ලෞකික සමාපත්තියට පැමිණේ නම් සමූහය සමග එක්වීමෙහි ඇළුණහුට ඒ සාමයික විමුක්ති නම්වූ ලෞකික සමාපත්තිය සිදු නොවේ. පසේ බුදුන් වහන්සේගේ මේ වචනය නිසා-

110. "මාර්ග සම්‍යක් දෘෂ්ටියට ප්‍රතිවිරුද්ධවූ දෙසැට මිසදිටු උපුටාහරිනලදී. සෝවාන් මගට පත් බැවින් අවිනිපාත ධර්මයෙන් හෙවත් අපායගාමී නොවන ස්වභාවයෙන් නියත බවට පැමිණියේ ලබනලද සෙසු මාර්ගඵලද ඇත්තේ අන්‍යයන් විසින් මෙය සත්‍යයයි පෙන්වා නො මෙහෙයවිය හැකි හෙවත් අනිකෙකුගේ මාර්ගොපදේශකත්වයක් නොමැතිව උපන්නාවූ ප්‍රත්‍යෙක බොධි ඥානය ඇත්තේ-

111. "ලොල් නොවූයේ කුහක බැවින් තොරවූයේ රස තෘෂ්ණාවෙන් අනුභව කරනු කැමති බව නම් වූ පිපාසාවද අනුන්ගේ ගුණ මකන ස්වභාවයද නැත්තේ සිත, කය වචනයන් පිළිබඳ කසට හා මොහයද හරණ ලද්දේ භවත්‍රය පිළිබඳව ඇති තෘෂ්ණා විරහිතවූයේ-

112. "පව්ටු මිතුරන් දුරුකරන්නේය. අනර්ථයක් දක්නාසුළු කාය දුශ්චරිතාදී පව්වලින් යුතුව වෙසෙන දෘෂ්ටි වශයෙන් ඒ ඒ තන්හි ඇළුනාවූ ප්‍රමාදයෙන් යුත් එබඳුවූ මිතුරන් තෙමේ නොසෙව්නේය.

113. "පර්යාප්ති බහුශ්‍රැතත්වයෙන් හා ප්‍රතිවෙධ බහුශ්‍රැතත්වයෙන් යුත් එම පර්යාාප්තීන් හා අධිගමයන් පිළිබඳ වැටහීම ඇති මිත්‍රයෙකු භජනය කරන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

114-130. (මේ ඡේදවල අගට "කඟවේණෙකු මෙන් හුදකලාවම හැසිරෙන්නේය" යන්න යොදන්න) ලෙව්හි ක්‍රීඩාවද, රතියද, කාමසුඛයද අනපෙක්ෂිතවූයේ නුසුදුසුයයි නොකොට සැරසීමට කරුණුවූ දෙයින්ද වෙන්වූයේ සත්‍යවාදීව-

115. "පුත්‍රදාරාවන්ද දෙමාපියන්ද ධන ධාන්‍යද බන්ධූන්ද යන මේ කාමවස්තූන් පිළිබඳ ස්වකීය ස්වකීය සීමාවෙහි (ඇල්ම) තුබූ තුබූ අයුරින් අතහැරදමා-

116. "මේ පඤ්චකාම වස්තූන් නිසා ඇතිවන්නේ ඇල්මකි එහි ඇති සැපතද ආශ්වාදයද, ස්වල්පය, එහිවූ දුකම වැඩිය. නුවණැත්තේ මේ පස්කම් සුවය (මත්ස්‍යයන් බඳින්නාවූ) ඇමක් මෙන් සළකා-

117. "දැල පළාගෙණ ගිය මත්ස්‍යයකු මෙන් සංයෝජනයන් සිඳ දැවීගිය තැනට ආපසු නොඑන්නාවූ ගින්න යම් සේ ද, එසේ-

118. "යටට හෙළනලද බැඳුම් ඇත්තෝ සමූහය සමග ඇලීම සඳහා පිරිස් මැදට යාමෙහි ලොල්බව නැත්තේ රක්නාලද පසිඳුරන් ඇත්තේ රැකගත් සිතද ඇත්තේ අරමුණු විෂයෙහි කෙලෙස් වැගිරෙන ගතියෙන් තොරවූයේ කෙළෙස් ගින්නෙන් නොදැවෙන්නේ-

119. සිඳිනලද පත් ඇති පරසතු රුකක් මෙන් ගිහිව්‍යඤ්ජන ලකුණු හැරදමා කසාවත් හැඳගත්තේ ගිහිගෙන් නික්ම-

120. "ලොල්නොවූයේ රසයෙහි ගිජුබවක් නැත්තේ පොෂණය කළයුතු අනිකෙක් නැත්තේ ගෙපිළිවෙළින් පිඬු සිඟා වඩනේ ක්ෂත්‍රිය කලාදී යම් කිසි තැනක කෙලෙස් වශයෙන් නොඇලුණු සිත් ඇත්තේ-

121. "පඤ්චනීවරණයන් සිතින්ම හැරදමා සියලු උපක්ලේශයන්ද දුරුකොට තෘෂ්ණා නොවූයේ කාමරාග නම් තෘෂ්ණා දොෂය සිඳ-

122. "ප්‍රථමධ්‍යාන උපචාරයෙහිදීම සොම්නසද තෘතීයධ්‍යානු පචාර යෙහිදීම සුඛයද (හරනා බැවින්) පළමුකොටම සැපද දුකද ගැන නොබලා එසේම සොම්නස් දොම්නස් දෙකද හැර (පඤ්චනීවරණයන්ගෙන් හා විතර්ක විචාර ප්‍රීති සුඛයන්ගෙන්) පිරිසිදුවූ උපෙක්ෂාවෙන් යුත් (චතුර්ථධ්‍යාන සමථය ලබා-

123. "නිවණට පැමිණීම සඳහා ඇරඹූ වීර්ය ඇත්තේ නොපසුබට සිත් ඇති කුසීත පැවැත්මෙන් තොරවූ වීර්යයෙන් ප්‍රතිපක්ෂ කෙලෙසුන් කෙරෙන් ඉවත්වූ (මාර්ගක්ෂණයෙහි ස්ථිර ඥාන බලයට පැමිණියේ-

124. "පටිසල්ලාන නම් කාය විවෙකයද, ධ්‍යාන නම් චිත්ත විවේකයද නොසිස් කරනුයේ විදර්ශනාවට එළඹියයුතු ධර්මයන් විෂයෙහි නිරතුරුව එම ධර්මයන්ට අනුව හැසිරෙන්නේ ත්‍රිවිධ භවයෙහි ආදීනව මෙනෙහි කරන්නේ-

125. "අප්‍රමාදව නිවණ පතනුයේ කෙළතොළු නොවූයේ බහුශ්‍රැතව සිහි ඇතිව දහම් විමසීමෙන් ඇති කරගත් අවබොධය ඇත්තේ (ආර්යමාර්ගයෙන්) නියත බවට පැමිණියේ සම්‍යක් ප්‍රධාන වීර්යයෙන් යුක්තව-

126. "ශබ්දයන් විෂයෙහි තැතිගැනීමකට පත්නොවන සිංහයෙකු මෙන්ද, දැලක නොබැඳුන වාතය මෙන්ද-

127. "දාඨාබලය ඇති වේගයෙන් හා මැඩපවත්වා හැසිරෙන සුළු, මෘගරාජවූ සිංහයෙකු මෙන් දුර සෙනසුන් සෙව්නේ-

128. "විරුද්ධවූ ක්ලේශයන්ගෙන් මිදුනාවූ මෛත්‍රියද උපෙක්ෂාවද, කරුණාවද, මුදිතාවද ආසේවනයට පහසු කල්හි සෙව්නේ සකල ලෝකවාසී සත්වයන් සමග විරුද්ධ නොවන්නේ-

129. "රාග ද්වේෂ මොහයන් හැර (මාර්ගයෙන්) දශ සංයෝජනයන් සිඳ ජීවිතය සැකයට පත් කල්හි හෙවත් මරණාසන්නයෙහි තැතිනොගන්නේ-

130. "මිත්‍රයන් කිසියම් ලාභයක් සඳහාම භජනයද සේවනයද කෙරෙත්. එසේ ලාභාපෙක්ෂාවක් නැතිව භජනය කරන මිත්‍රයෝ මෙකල දුර්ලභ වෙත්. මිනිස්සු ආත්මාර්ථකාමී කල්පනාවන්ගෙන් හා අපිරිසිදු කාය වචී මනෝ කර්මයන්ගෙන් යුක්තවූවාහුම. (එබැවින්)-

131. "වෙසෙසින් පිරිසිදු සිල් ඇති එසේම අතිපරිශුද්ධ ප්‍රඥාද, ඇති එකග සිත් ඇති නිදිමැරීමෙහි යෙදුනාවූ විදර්ශකවූ (දශකුශල චතුස්සත්‍යය නවලොකොත්තර) ධර්මයන් වෙසෙසින්

දක්නාසුළුවූ මාර්ගාංග බොජ්ක්ධංගයන් හා එක්ව යෙදුනාවූ ආර්ය ධර්මයන් විශෙෂයෙන් දැනගත්

132. "සුඤ්ඤත අප්පණිහිත අනිමිත්ත නම් විමොක්ෂයන් වඩා ඒ ප්‍රාඥයෝ සර්වඥ ශාසනයෙහි ශ්‍රාවකබවට නොපැමිණෙත්. ඔව්හු පරොපදෙශ රහිතව තෙමේම අවබොධ කරගත් පසේබුදුවරයෝ වෙත්.

133. "පුරණලද මහත් පුණ්‍ය සම්භාර ධර්ම ඇති බොහෝ වූ ධර්මකාය සම්පත් ඇති

සිතේ එකගකමින්යුත් සකල සංසාර සැඩවතුර තරණය කළාවූ සොම්නස් සිත් ඇති පරමාර්ථය දක්නාසුළුවූ සිංහයෙකු වැනි වූයේද කඟවේණෙකු වැනි වූයේද වේ.

134. "සන්සුන් ඉඳුරන් ඇති ශාන්තවූ හා එකඟවූ සිත් ඇති ප්‍රත්‍යක්ෂ ජනපද වැසි සත්වයන් විෂයෙහි පතුරුවන ලද මෛත්‍රී කරුණා ආදී ගුණ ඇති මෙලොව පරලොව යන දෙලොව් බබුළුවන ප්‍රදීපයක් වැනි වූ, මේ පසේ බුදුවරයෝ හැමකල්හිම නිරොධ සමාපත්ති පල සමාපත්ති වශයෙන් සම්පූර්ණවූවාහුය.

135. "ජනොත්තමවූ ඒ පසේ බුදුවරයෝ ප්‍රහීණ කරන ලද සියලු නීවරණ ඇත්තාහු ඝන ස්වර්ණ ප්‍රභා සදෘෂවූවාහු ලෝකයේ අසහාය ප්‍රදීපයෝද වෙති. නිසැකවම ලෝකයෙහි ශ්‍රෙෂ්ඨ දක්ෂිණාර්හයන්වූ මුන්වහන්සේලා හැමකල්හිම අර්පිත නිරොධ සමාපත්ති හා ඵල සමාපත්ති ඇත්තාහුය.

136. "පසේ බුදුවරුන්ගේ සුභාෂිත වචනයෝ දෙවියන් සහිත ලෝකයෙහි පවතිත්. යමෙක් තුමූ එම ධර්මය අසා ඒ පරිදි නොකරන්නේ නම්, ඔව්හු සංසාර දුක්ඛයෙහි නැවත නැවත හැසිරෙති.

137. "පසේබුදුවරුන්ගේ සුභාෂිත වචනයෝ පැණි වැගිරෙන්නාවූ කුඩා මීවද වැනිය. එය අසා යමෙක් තුමූ ඒ වූ පරිදි ප්‍රතිපත්තියෙහි යෙදුනාහු නම් ඔවුහු තුමූ චතුස්සත්‍යය දක්නාවූ ප්‍රාඥයෝ වෙති.

138. "කෙලෙසුන් ජයගත් පසේ බුදුවරයන් විසින් දෙසනලද උදාරවූ ගාථා ගෘහාභිනිෂ්ක්‍රමණයකොට බුද්ධත්වයට පත්

නරොත්තමවූ ශාක්‍යසිංහ ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් (ලෝකයාගේ) ධර්මාවබොධය පිණිස දේශනා කරණ ලදී.”

**139.** එම පසේබුදුවරයන් විසින් දෙශනා කරණලද මෙම ගාථාවෝ (නුවණැත්තන්ගේ) සංවේගය හා නොඇලීම වැඩෙනු පිණිස තෙමේම චතුස්සත්‍යාවබොධය කරගත් ශ්‍රෙෂ්ඨ සම්‍යක් සම්බුදු රදුන් විසින් වදාරණ ලදහ.

**(පච්චෙක බුද්ධාපදාන නිමි)**

---

## 1 සාරීපුත්‍රථෙරාපදානය

ඉක්බිති ස්ථවිරාපදානය අසව්.

**140.** “හිමවතට නුදුරෙහි “ලම්බක” නම් පර්වතයකි. එහි මට අසපුවක් කරන ලදී. පන්සලක් මැනවින් මවන ලදී.

**141.** “මනාවූ (කුඩා) තොටුපලවල් ඇති මනොඥවූ සුදෝ සුදු වැලිතලාවන්ගෙන් ගැවසීගත් කුඩා ගඟ මාගේ අසපුව අවට නුදුරෙහි විය.

**142.** “බොරළු රහිත ගැඹුරු ඉවුරු නැති මනාජලයෙන් යුත් දුර්ගන්ධ විරහිතවූ (එම) කුඩා ගංගා තොම එහි මාගේ අසපුව හොබවමින් ගලා බසින්නීය.

**143.** “කිඹුල්ලුද මෝරුද මුබයෙන් සූ සූ නදින් (දියබුබුළු උඩට නගන සුංසුමාර නම්වූ) චණ්ඩ මත්ස්‍යයෝද කැසුබුවෝද එහිවූ මාගේ අසපුව හොබවමින් ගඟෙහි හැසිරෙත්.

**144.** “පෙටියෝද පාවුස නම් (ලූල්ලු) මත්ස්‍යයෝද විජල නම් (වලයෝ) මුඤ්ජ නම් (මොද්දු) මත්ස්‍යයෝද රොහිත (රෙහෙරු) මත්ස්‍යයෝද වග්ගුල නම් මත්ස්‍යයෝද පෙරළෙමින් මාගේ අසපුව හොබවත්.

**145.** “එම ගඟ දෙපසෙහි (හැමකල්හි) පිපුණු මල් ඇත්තාවූද, හටගත්ගෙඩි ඇත්තාවූද වෘක්ෂයෝ දෙතෙරෙහි පහළට නැමුණාහු මාගේ අසපුව හොබවත්.

**146.** “අඹ සල් මදට පළොල් තික යන මේ වෘක්ෂයෝ පිපීගිය මල් ඇත්තාහු මාගේ අසපුවෙහි හාත්පස දිව සුවඳ හමත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

147. "සපු සලල කොළොම් නා දොඹ වැටකේ යන වෘක්ෂයෝද පිපීගිය මල් ඇත්තාහු මාගේ අසපුවෙහි හාත්පස දිව සුවඳ හමත්.

148. "මාගේ අසපුවෙහි යොහොඹු හෝපළු හගිනි මාලා යන වෘක්ෂයෝ මල් පිපී ගියාහුය. එසේම රුකඟුණ රත්කරවූ යන වෘක්ෂයෝද සුපුෂ්පිත වූවාහුය.

149. "වැටකේ කඳල ගොවුක බොලිද්ද යන වෘක්ෂයෝ මාගේ අසපුව හොබවමින් දිවසුවඳ හමත්.

150. "කිණිහිරිය සිහින් මිදිය පියාය කුඹුක්ය යන බොහෝ වෘක්ෂයෝ මාගේ අසපුව හොබවමින් දිවසුවඳ හමත්

151. "දොඹය ගිරි දොඹය, (ගිරිපුන්නාග) කොබෝලීලය යන වෘක්ෂයෝ සුපුෂ්පිතවූවාහු මාගේ අසපුව හොබවමින් දිවසුවඳ හමත්.

152. "ඇසළය කෙළිඳය කොළොම්ය මුහුන මල්ය යන බොහෝ වෘක්ෂයෝ මාගේ අසපුව හොබවමින් දිවසුවඳ හමත්.

153. "ආලකය ඉසිමුග්ගය. (වනමුං) කෙසෙල්ය ලප්නාරන්ය යන මේ වෘක්ෂයෝ සුවඳ දියෙන් වැඩුනාහු ඵල දරත්.

154. ("අසපුව අසළවූ) තඩාගයෙහි හැමකල්හි ඇතැම් පද්මයෝ පිපෙත්. ඇතැම් කෙසර පද්මයෝ හටගනිත්. ඇතැම් පිපුනු පද්මයෝ ගිලිහුනු පත් හා කෙසුරු ඇත්තෝ වෙත්.

155. "පද්මයෝ කැකුළුව හටගනිත්. නෙළුම්බු අල (මඩ අතුරින් ඇත් දළමෙන්) වැඩීමෙන් මහවිල් කටු (කටු දෙලු) පත්වලින් ගැවසීගත්තාහු හැමකල්හි (එම) විලෙහි බබළත්.

156. "විල අසල පිපීගිය නයිතය අම්බ (පුෂ්ප) ගන්ධිය උත්තාලීය බඳුවද යන මේ ගස්හු හැමකල්හි දිවසුවඳ හමත්.

157. "පෙටියෝද, පාවුසයෝද, වලජ්ජය, මුඤ්ජය, රොහිතය, සංගුලය, මංගුරය යන මත්ස්‍යයෝද එකල්හි තඩාගයෙහි වසත්.

158. "කිඹුල්ලුද තන්තිගාහ රකුසෝය, මගුහය අජකාර යන මොව්හු එකල්හි මෙම තඩාගයෙහි වසත්.

159. "පරෙවිය රවිහංසය, සක්වා ලිහිණිය (නදීචරයාද) කොකිලය, ගිරාය, සාලිකය, යන මේ පක්ෂීහු ඒ විල ඇසුරෙන් ජීවත් වෙති.

160. "කුකුත්ථකය, කුලීරකය, වෙනෙහි වෙසෙන පොක්ඛරසාතකය, දින්දිභය සුවපොතය (මලිත්තා) යන මේ පක්ෂීහු එම විල ඇසුරෙන් ජීවත් වෙති.

161. "හංසයෝය, කොස්වා ලිහිණියෝය, මොණරු කොව්ලෝය, කුකුළෝය, හුන පුපුළෝය, ජීවඤ්ජීවයෝය යන මේ පක්ෂීහු එම විල ඇසුරුකොට ජීවත් වෙති.

162. "බකමුහුණෝය, පොඨසීස නම් පක්ෂීහුය, කබරුස්සෝය, උකුස්සෝය, මහා කාල නම් පක්ෂීහුය යන බොහෝ පක්ෂීහු එම විල ඇසුරුකොට ජීවත් වෙති.

163. "පසදමෘගයෝය, ඌරෝය වෘකයෝය, කැනහිල්ලුය. රොහිච්ච නම් මෘගයෝය සුග්ගදී පොතයෝය යන බොහෝ මෘගයෝ එම විල ඇසුරුකොට ජීවත් වෙති.

164. "සිංහයෝය, ව්‍යාඝ්‍රයෝය, දිවියෝය, වලස්සුය, කරබානා වලස්සුය. තෙතැනකින් මද බිඳෙන (ත්‍රිමද ගලිත) ඇත්තුය ඒ විල ඇසුරුකොට වෙසෙත්.

165. "කිඳුරෝද, වඳුරෝද යලිදු වනයෙහි කර්මාන්තයන්හි යෙදුනෝද (මුවසේවටු ආදීහුද) දාසයෝද වැද්දෝද, එම විල ඇසුරුකොට වෙසෙත්.

166. "තලිසිරිය, පිය, වැල්මීය (කාසුචාරියා) යන මේ වෘක්ෂයෝ මාගේ අසපුවට නුදුරෙහි නිරතුරුවම පල දරත්.

167. "මනාව හටගත් පලයන්ගෙන් යුත් කොසුම්භය සලලය කොළොම්ය යන මේ වෘක්ෂයෝ මාගේ අසපුවට නුදුරු තන්හි නිරතුරුවම පල දරත්

168. "අරළුය, නෙල්ලිය, අඹය, ජම්බුය, බුළුය, ඩෙබරය බදුලුය, බෙලිය යන මෙකී වෘක්ෂයෝද පල දරත්.

169. "ආළුය, කලම්බය, බිලාලීය, තක්කලය, ජීවකය, සුතකය, යන බොහෝ අල වර්ගයෝ මාගේ අසපුවෙහි වෙති.

170. "අසපුවට නුදුරෙහි මැනවින් වැවූ පිරිසිදු සිසිල් දිය ඇති මනා තොටුපලවලින් යුත් මනරම්වූ තඩාගයෝවූහ.

171. "පුණ්ඩරික (සුදු නෙළුම්) සහිත පියුම් (රතුනෙළුම් උපුල්වලින් ආකුලවූ තඩාගයන්ගෙන් ගැවසීගත්තාහුය. දිව සුවඳද හමයි. මදාරා ගස්වලින් යුත්තය.

172. "මෙසේ සුපුෂ්පිතව පල දැරුවාවූ සර්වාංග සම්පූර්ණ වනයෙහි මැනවින් කරණ ලද රම්‍යවූ ආශ්‍රමයෙහි මම හැම කල්හි වෙසෙමි.

173. "සිල්වත්ව ව්‍රතසම්පන්නව ධ්‍යාන කරන සුළු වූයේ හැමකල්හි ධ්‍යානයෙහි ඇළුනේ පඤ්චාභිඥා බලයම පැමිණියේ 'සුරුචි' නම් තවුසෙක් වීමි.

174. "සූවිසි දහසක් ශිෂ්‍යයෝ මට උවැටන් කළාහුය. මේ සියලු ශිෂ්‍යයෝ ජාතිමත් කීර්තිමත් බ්‍රාහ්මණයෝ වූහ.

175. "(ඔව්හු අංගලක්ෂණ ශාස්ත්‍රයෙහිද ඉතිහාසයෙහිද වේදත්‍රයෙහිද ස්වකීය බ්‍රාහ්මණ ධර්මයෙහිද පරතෙරට ගියාහු නාම පදාදියෙහි දක්ෂවූහ. එසේම ව්‍යාකරණයෙහිද දක්ෂයෝ වූහ.

176. "උල්කාපාත භූමිචලනාදිය පිළිබඳ වැඩ අවැඩ දැනගන්නා උත්පාත ශාස්ත්‍රයෙහිද ශුභා ශුභ නිමිති දැනගන්නා ශාස්ත්‍රයෙහිද ස්ත්‍රී පුරුෂයන්ගේ හා මහාපුරුෂයන්ගේ ලක්ෂණ දන්නා ශාස්ත්‍රයෙහිද දක්ෂවූවාහු පෘථිවිය පිළිබඳවූද අහස පිළිබඳවූද ශාස්ත්‍රයන්හි මාගේ ශිෂ්‍යයෝ දක්ෂවූහ.

177. "අල්පෙච්ඡවූ අල්පාහාරවූ ලොල්බව නොමැති ප්‍රාඥවූ මොව්හු ලාභ අලාභ දෙකින්ම එකසේ සතුටුවූවාහු හැමකල්හි මා පිරිවරත්.

178. "ධ්‍යාන කරනසුළුවූ ධ්‍යානයෙහි ඇළුනු ධෛර්යවත්වූ ශාන්තවූ එකඟවූ සිත් ඇති පළිබොධ විරහිත බව කැමතිවන්නාවූ එම තව්සෝ හැමකල්හි මා පිරිවරත්.

179. "පඤ්චාභිඥාවන්හි පරතෙරට පත් අනුන්හට වචනයෙන් කියා (විඥ්ඥත්තියෙන්) පිළියෙලකර නොගත් බුදුන් වහන්සේ විසින් අනුදන්නා ලද ආහාරයෙහි ඇළුනාහු අහසින් යාම් ඊම් කරන්නාවූ වීරගති ඇති එම තවුසෝ හැම කල්හි මා පිරිවරත්.

180. "සදොර සංවරණය කරගත් තෘෂ්ණාවෙන් තොර සුරැකි ඉඳුරන් ඇති ගිහියන් සමග නොගැටෙන ලංවිය නොහැක්කාවූ ඒ ධෛර්යවත් මාගේ ශිෂ්‍යයෝ

181. "ගැටීමට නුසුදුසුවූ මොහු පළඟ බැඳීමෙන් හිඳීමෙන් සිටීමෙන් හා සක්මන් කිරීමෙන්ද රාත්‍රිය ගෙවත්.

182. "ලංවිය නොහැක්කාවූ මාගේ (ඒ) ශිෂ්‍යයෝ ඇලිය යුතු දෙයෙහි නොඇලෙත්. ගැටියයුතු දෙයෙහි නොගැටෙත්, මුළාවියයුතු දෙයෙහි මුළා නොවෙත්.

183. "යුගග්‍රාහයෙන් හෙවත් කලහ කිරීමෙන් ගැටීමට නුසුදුසුවූ ඒ මාගේ ශිෂ්‍යයෝ ප්‍රාතිහාර්ය සම්පන්නය කරත්. නිරතුරුවම විකුර්වණ ඍද්ධි විමසමින් පවතිත්.

184. "එම ශිෂ්‍යයෝ ඉදින් ක්‍රීඩාකරන්නාහු නම් ධ්‍යාන ක්‍රීඩාවම කරත්. ළංවිය නොහැකි තෙදින් යුත් ඔව්හු (දඹදිව ප්‍රසිද්ධ) දඹරුකින් ගෙඩි ගෙනෙත්.

185. "ලංවිය නොහැක්කාවූ ඔවුනතුරෙන් ඇතැමෙක් ප්‍රත්‍ය සෙවීම පිණිස අපරගොයානයට යෙත් ඇතැමෙක් පූර්ව විදෙහයටද, ඇතැමෙක් උතුරුකුරු දිවයිනටද යෙත්.

186. "අහසින් යන්නාවූ මාගේ ශිෂ්‍යයෝ තවුස් පිරිකර කද යවති. ඔව්හු පසුවයෙත්. සූවිසි දහසක්වූ ඔවුන් විසින් අහස්තලය වසන ලද්දේවේ.

187. "ඔවුනතුරෙන් ඇතැමෙක් (පලාඵලපත්‍රාදිය) ගින්නෙන් පිස කති. ඇතැමෙක් නොපිස අමුවෙන්ම කති. ඇතැමෙක් දත්වලින් පොතු ගලවා කති. කිසිවෙක් වනෙහිලා කොටාගෙන කති. (එසේම) ඇතැමෙක් ගලින් කොටා කති. ඇතමෙක් ස්වයං පතිත ඵලාහාරයෙන් ජීවත් වෙති.

188. "ලංවිය නොහැක්කාවූ මාගේ ශිෂ්‍යයෝ ශුද්ධිය කැමති වන්නාහු දියෙන් තමා තෙමීම කරන්නාහු උදැහැනද සවසද දියෙහි ගිලෙති.

189. "දුරාසදවූ මාගේ ශිෂ්‍යයෝ කැයි (කිසිලි) නිය ලොම් ඇත්තාහු මලබැඳුනු දත් ඇත්තාහු දූවිලි වැකුණු හිස් ඇත්තාවූ සීල සුගන්ධයෙන් සුගන්ධවත්වූහ.

190. "එකල්හි උග්‍ර තපස් ඇති ජටාධරවූ මෙම තවුසෝ උදෑසනම (තමාවෙත) රැස්ව (ඔවුනට ලැබුණු) කුඩා මහත් ලාභයන් කියා අහසෙහි යෙති.

191. "(එසේ) යන්නාවූ මොවුන්ගේ වැහැරි සිව්රුැවලින් හටගත් මහා ශබ්ද පවතී. අලුත් දිවිසම් හඬින් දෙවියෝ සොම්නස්වූවාහු වෙති.

**192.** "අහසෙහි හැසිරෙන්නාවූ එම ඍෂීහු දිසානුදිසාවනට ගමන් කෙරෙති. ස්වකීය ශරීර බලයෙන් හා ධ්‍යාන බලයෙන් යුත් ඔව්හු යම් යම් තැනකට යනු කැමැත්තාහු නම් ඒ ඒ තැනටම යෙත්.

**193.** "මේ සියලුතන්හි කැමතිසේ හැසිරෙන මොව්හු හැමදෙනම පෘථිවි කම්පනයෙහි සමත් වූවෝද අහසෙහි හැසිරීමෙහි දක්ෂවූවෝද උග්‍රතේජස් ඇත්තාහුද අභිභවනය කළනොහැක්කාවූද සයුර මෙන් අනුන් විසින් නොකැළඹිය හැක්කෝ වෙයි.

**194.** "ගුණයන් කරණකොට ගෙන ලංවිය නොහැක්කාවූ මාගේ ශිෂ්‍යයන්ගෙන් ඇතැමෙක් සිටීමය සක්මන් කිරීමය යන ඉරියව් දෙකින් යුක්තයෝය. ඇතැමෙක් හිඳීම් ඉරියව් පමණක් ඇති ඍෂිවරයෝය. (එසේම ඇතැමෙක් ස්වයං පතිත ඵල අනුභව කරන්නෝ වෙති.

**195.** "මොව්හු සව්සතනට හිතවත් වූවාහු මෛත්‍රී විහරණ ඇත්තාහුය සියල්ලෝම තමා උසස්කොට නොදක්වන්නේය. කිසිවෙකු හෙළා දකින්නෝද නොවෙති.

**196.** "සිහ රජුන් මෙන් නිර්භීතව ඇත් රජුන් මෙන් බලවත්ව ව්‍යාඝ්‍රයන් මෙන් ලංවිය නොහැක්කක්ව (එමඍෂීහු) මාගේ සමීපයට පැමිණෙත්.

**197.** "විද්‍යාධරයෝද දේවතාවෝද නාග ගාන්ධර්ව රාක්ෂය කුම්භාණ්ඩ අසුර ගුරුළු යන මොව්හුද ඒ විල ඇසුරෙන් වෙසෙත්,

**198.** "ජටාවන්හි හා තවුස් පිරිකර කදවල බර උසුලන්නාවූ අඳුන්දිවිසම උත්තරාසංගයන් ඇති ආකාශචාරීහු හා සියලුම ඍෂීහු එම විල ඇසුරෙන් වෙසෙති.

**199.** "හැම කල්හි මනාපැවතුම් ඇති මෙම ඍෂීහු ඔවුනොවුන්ට ගෞරව සහිතවූවාහු සුවිසි දහසක්වූ මොවුන්ගේ කිඹිසිලි ශබ්දයකුදු නැත.

**200.** "පියෙහි පිය නොතබන්නාහු නිශ්ශබ්දව මනා සංවරයෙන් යුත්ව සියල්ලෝම මා වෙත එළඹ හිස නමා වඳිත්.

**201.** "ශාන්තවූ තපො ගුණ ඇති එම සිසුන් විසින් පිරිවරණ ලදුයේ මම එම අසපුවෙහි ධ්‍යාන කරන සුළුව ධ්‍යානයෙහි ඇළුනේ වෙසෙමි.

202. "සෘෂීන්ගේ සිල්සුවඳින්ද (මල්වල) සුවඳින්ද යන මේ උභය සුගන්ධයෝ හා ගෙඩිවල ගෙඩිසුවඳින්ද අසපුව සුවඳවත්වේ.

203. "රෑ දාවල් නොදනිමි මාගේ සිත්හි කුසල් දහම්හි නොඇලීමක් නැත. මම සියලු සිසුනට අවවාද කරන්නේ වැඩියක්ම ප්‍රීතිය ලබමි.

204. "පිපෙන්නාවූ මල්වලද පැසෙන්නාවූ ගෙඩිවලද දිව්‍යමයවූ සුගන්ධයෝ මාගේ අසපුව හොබවමින් හමත්.

205. "එකල්හි මම සමාධියෙන් නැගිට කෙළෙස් තවන වීර්ය ඇත්තේ සප්‍රාඥවූයේ තවුස් පිරිකර කදෙහි බරද ගෙන වනයට පිවිසෙමි.

206. "(උල්කාපාත භූමි චලනාදී භූත විකෘතීන් පිළිබඳ වැඩ අවැඩ දැනගන්නා) උත්පාත ශාස්ත්‍රයෙහිද සිහිනයන් පිළිබඳ ශුභා ශුභ දැනගන්නා සුපින ශාස්ත්‍රයෙහිද අංග ලක්ෂණ බලා ජීවිතය පිළිබඳ තොරතුරු පවසන ලක්ෂණ ශාස්ත්‍රයෙහිද මැනවින් හික්මුනේ මුළු දඹදිවම පවත්නා මන්ත්‍ර පදද දරමි.

207. "ලොකයෙහි ජ්‍යෙෂ්ඨවූද නරශ්‍රෙෂ්ඨවූද සියල්ල දත්තාවූ අනවමදර්ශී භාග්‍යවතුන් වහන්සේ විවේක සැප කැමතිසේක් හිමවතට එළඹිසේක.

208. "පුරුෂොත්තමවූ අග්‍ර කාරුණිකවූ බුදුරජාණන් වහන්සේ හිමවතට පිවිස පළඟ බැඳ වැඩ හුන්සේක.

209. "මහනෙල් මලක්මෙන් ප්‍රභාවසහිතවූ මනරම්වූද යාග ද්‍රව්‍ය අනුභවකරන්නාවූ දිලිසෙන ගින්නක් වැනිවූ බුදුරජාණන් වහන්සේ එහිදී දුටුවෙමු.

210. "පහන් රුකක් මෙන් දිලිසෙන්නාවූද අහසෙහි විදුලියක් වැනිවූද මනාව පිපීගිය සල්රුකක් වැනිවූද බුදුරජාණන් වහන්සේ දුටුවෙමි.

211. "මේ අග නම්වූ පව් නැති මහා වීරවූ දුක් කෙළවර කරන්නාවූ බුදුරජාණන් වහන්සේය. මේ දර්ශනය නිසා (සත්වයෝද) සියලු දුකින් මිදෙත්.

212. "දෙවියන්ට දෙවිවූ උන්වහන්සේ දැක මම බුදුකෙනෙක් දෝයි ලක්ෂණ පරීක්ෂා කෙළෙමි. ඒකාන්තයෙන් පසැස් ඇති උතුමෙකැයි දකිමි.

213. "උතුම්වූ ශ්‍රීපාදයන්හි දහසක් ඇති චක්‍ර ලක්ෂණයෝ පෙනෙත්. උන්වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණ දැක තථාගත බැව්හි නිශ්චයට පැමිණියෙමි.

214. "එකල්හි මුස්නගෙන හැමද මල් ගෙනවුත් බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ පිදීමි.

215. "චතුරොඝයන් තරණය කළාවූ ආශ්‍රව රහිත වූ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ පුදා අඳුන් දිවි සම සකස් කොට ලෝකනායකවූ තථාගතයන් වහන්සේට නමස්කාර කෙළෙමි.

216. "ආශ්‍රව රහිතවූ බුදුරජාණන් වහන්සේ යම් කාරණයකින් යුක්තව වැඩ විසූ සේක් නම්, යම් කාරණයකින් ඒ ඥානය කියන්නෙමි. කියන්නාවූ මාගේ ඒ වචනය අසව්.

217. "අමිතොදය හෙවත් අපමණවූ දියුණුව ඇති බුදුරජාණන් වහන්ස, මේ ලෝකවාසී සත්වයා නසාලනු මැනවි ඔබ වහන්සේගේ දර්ශනය නිසා සැකය නැමැති සැඩ පහර තරණය කෙරෙත්.

218. "ඔබ වහන්සේ සත්වයන්ගේ ශාස්තෲ වනසේක. (උසස් බැවින්) ජයකොඩියද (ලෙව්හි ප්‍රකට බැවින් ධවජය ද (තිලොවෙහිම උඩට නැගී පෙනෙන බැවින් ඔසවා බිම සිටුවනලදී.) යාගස්තම්භයද වනසේක. ඔබ වහන්සේම දෙපා ඇතියනට උතුම් වනසේක. (මොහඳුර නසන බැවින්) ප්‍රදීපයද (සව්සත්නට) උතුම් පිහිටද පිහිටන තැනද වන සේක.

219. "සමුදුරෙහි ජලය නැළියකින් මිණුමට හැකිවුවද ඔබ වහන්සේගේ සර්වඥතාඥානය මිණුමට නොහැක්කේමය.

220. "මහපොළොව තරාදිතට්ටුවෙහි තබා කිරා බැලීමට හැකිවුවද, ඔබවහන්සේ හෝ සර්වඥතාඥානය කිරා බැලීමට නොහැක්කේමැයි.

221. "අහස රැහැනෙන් හෝ අගුලෙන් හෝ මිණිය හැකිවුවද ඔබවහන්සේගේ සර්වඥතාඥානය මිණුමට නොහැක්කේමය.

222. "බුද්ධඥානයතෙම මහා සමුද්‍රයෙහි අපමණවූ ජලයද අප්‍රමාණවූ මහපොළොවද ඉක්මවා යයි. බුදු නැණ නිසා උපමා වශයෙන් කිසි වස්තු කෙනෙක් නොයෙදෙත්මැයි.

223. "පසැස් ඇතියාණන් වහන්ස, දෙවියන් සහිත සත්වලෝකයෙහි යම් පමණ සත්වකෙනෙක් පිළිබඳව සිත පවති නම්, එපමණවූ මේ සත්වසමූහයා ඔබවහන්සේගේ නුවණ නැමැති දැලෙහි ඇතුළට පිවිසියාහු වෙති.

224. "සර්වඥයන් වහන්ස, ඔබවහන්සේ යම් නුවණක් කරණකොට ගෙන හුදු උතුම්වූ සම්‍යක් සම්බොධියට පැමිණියෙහිද එම ඥානය කරණකොටගෙන අන්‍යතීර්ථකයන් මඩිනෙහිය.

225. "ඒ සුරුචි නම් තවුස්තෙමේ (සෙසු අටුවාවන්හි සරද තවුස්යයි දක්වා ඇත) මෙම ගාථාවන්ගෙන් (උන්වහන්සේට) ස්තුතිකොට පොළවෙහි අඳුන් දිවිසම් එලා හිඳගත්තේය.

226. "මහමේරු පර්වතරාජයා මහ සමුදුරෙහි යොදුන් අසූහාරදහසක් ඇතුළට බැසගත්තේ එපමණට (යොදුන් අසූහාරදහසක් (සමුදුරෙන්) උඩට ඇත්තේ යයි කියනු ලැබේ.

227. "දිගුපුළුලිනුදු එපමණම උස්ව නැගුනු මේරු පර්වතය කෙළ ලක්ෂගණන්වූ අණුභෙදයෙන් සුණු කරන ලද්දේ,

228. "(එම අණු නම් සියුම් කොටස්) අලගු බවට තැබුයේ නමුදු ඔබවහන්සේගේ සර්වඥතාඥානය ප්‍රමාණ කරන්නට නොහැක්කේමය.

229. "යමෙක් සියුම් ඇස් සිදුරු ඇති දැලක් දියෙහි දමාද එවිට ජලයෙන් යම්කිසි ප්‍රාණිකෙනෙක් වෙත්නම් (ඔව්හු) එම දැළ තුළට වදින්නාහුය.

230. "මහා වීරයන්වහන්ස, එසේම යම්කිසි පෘථග්ජන තීර්ථක කෙනෙක් දෙසැට මිසදිටු නැමැති (ගෙතුනුවන) ගහනයට පිවිසියාහු එම මිසදිටු දැඩිකොට ගැනීම වශයෙන් මුලාවූවාහු වෙත්.

231. "නිරාවරණවූ දක්නා සුළුවූ ඔබවහන්සේගේ පිරිසිදු ඥානය කරණකොටගෙන තමන්වහන්සේගේ නැණ ඇතුළට පිවිසියාවූ මේ තීර්ථකයෝ ඔබවහන්සේගේ නුවණ නොඉක්මවත්.

232. "පස්මරුන් දිනූ මහා යසස්කවූ අනවමදර්ශී නම් භාග්‍යවතුන් වහන්සේ එසමයෙහි සමාධියෙන් නැගිට සියලු දිශාවලෝකනය කළසේක.

**233-234.** "අනවමදර්ශී නම් බුදුරජාණන් වහන්සේගේ නිසභ නම් ශ්‍රාවකතෙමේ සන්සිඳුනු සිත් ඇති (අටලෝ දහම්හි නොසැලෙන) තාදීගුණයුත් ශුද්ධවූ ෂඩභිඥා ඇති ධ්‍යාන කරණසුළුවූ ලක්ෂගණන් රහතුන් විසින් පිරිවරණ ලදුයේ බුදුරජාණන් වහන්සේගේ සිත දැන (ඒ) ලෝක නායකයන් වහන්සේ වෙත එළඹියේය.

**235.** "එහි අහසෙහි සිටියාවූ එම පිරිස (බුදුරජාණන් වහන්සේ) ප්‍රදක්ෂිණාකළාහුය. බැඳැදිලි ඇතිව නමදිමින් සර්වඥයන් වහන්සේ වෙතට බැස්සාහුය.

**236.** "ලෝකජ්‍යෙෂ්ඨවූ පස්මරුන් දිනුවාවූ අනවමදර්ශී භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා ඉදිරියෙහි වැඩහිඳ සිනා පහළ කළසේක.

**237.** "මහර්ෂිවූ සර්වඥයන් වහන්සේගේ 'වරුණ' නම් උපස්ථායක තෙමේ සිව්ර එකස්කොටගෙන ලෝක නායකවූ බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ විචාළේය.

**238.** "භාග්‍යවතුන් වහන්ස, ශාස්තෘවූ ඔබවහන්සේගේ සිනා පහළකිරීමට හේතුව කුමක්ද? ඒ සර්වඥ බුදුවරයෝ අකාරණයෙන් සිනා පහළ නොකරති."

**239.** "ලොකජ්‍යෙෂ්ඨවූ නරශ්‍රේෂ්ඨවූ අනවමදර්ශී භාග්‍යවතුන් වහන්සේ සංඝයා මැද හිඳ මෙම ගාථාව වදාළසේක.

**240.** "යම් තව්සෙක් තෙම මා මලින් පිදීද, මාගේ (සර්වඥතා) ඥානයට නැවත නැවත ස්තුති කෙළේද, ඒ තවුසා (කවරෙක්දැයි) මම තොපට පැහැදිලි කරන්නෙමි. එය පවසන්නාවූ මාගේ වචනය අසව්.

**241.** "බුදුරජාණන් වහන්සේගේ වචනය දැන සියලු දෙවියෝ එක්වූහ. සද්ධර්මය අසනු කැමැත්තාවූ ඔව්හු බුදුරජාණන් වහන්සේ වෙත එළඹියාහුය.

**242.** "සියලු ලෝකධාතුන්හිවූ මහර්ධි ඇති ඒ දේව සමූහයා සද්ධර්මය අසනු කැමැත්තාහු බුදුරජාණන් වහන්සේ වෙත එළඹියාහුය.

**243.** "ඇත්, අස්, රිය, පාබල යන සිව්රඟ සෙනග නිතර මා පිරිවරන්නාහුය. බුද්ධපූජාවෙහි මේ ඵලයයි.

**244.** "සැටදහසක් තූර්යයෝද, අලංකාර කළ බෙරීහුද මට නිතර (වැඩීමෙන්) උවටැන් කරන්නාහුය. මෙය බුද්ධ පූජාවෙහි පලයයි.

**245 - 246.** "මැනවින් අලංකාර කරණලද සොළොස් දහසක් ස්ත්‍රීහු විසිතුරු අභරණ ඇත්තාහු එල්බනලද මිණි කොඩොල් ඇත්තාහු දිග ඇති පිහාටු ඇත්තාහු සිනා සහිත වූවාහු මැනවයි හැඳින්විය. යුතු ශරීරාවයව ඇත්තාහු නිරතුරුවම මොහු පිරිවරන්නාහුය. බුද්ධපූජාවෙහි මේ බලයයි.

**247.** "කල්ප වෘක්ෂයක් මුළුල්ලෙහි දෙව්ලොවෙහි සිත් අලවා වසන්නේය. දහස් වරක් රටෙහි සක්විති රජ වන්නේය.

**248.** "ශක්‍රදෙවේන්ද්‍රව දහස් වරක් දිව්‍ය රාජ්‍යය කරන්නේය. (කරන්නාවූ) උදාරවූ ප්‍රදෙශ රාජ්‍යයන් ගණන් වශයෙන් අප්‍රමාණය.

**249.** "අන්තිම (රහත්වන) භවය පැමිණිකල්හි මිනිසත් බවට පැමිණෙන්නේය. 'සාරී' නම් බැමිණිය හෝ කුසින් දරන්නීය.

**250.** "මේ තැනැත්තේ මවගේ නාම ගෝත්‍රයෙන් ප්‍රකටවන්නේය. නාමයෙන් ශාරීපුත්‍ර නම් වූ තීක්ෂණ ප්‍රඥා ඇත්තෙක් වන්නේය.

**251.** "අසූකෙළක් ධනය හැරදමා අකිඤ්චනව (ධනය නැත්තෙක්ව) පැවිදිවන්නේය. මොක්ෂ පදය සොයමින් මේ පෘථිවියෙහි හැසිරෙන්නේය.

**252.** "මෙයින් අපරිමෙය කල්පයෙහි එකාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් මතුයෙහි) ඔක්කාක කුලයෙහි උපදින ගෝත්‍රයෙන් ගෞතම නම්වූ ශාස්තෘන් වහන්සේ ලෝකයෙහි පහළවන්නේය.

**253.** "උන්වහන්සේගේ ධර්මය දායාදකොට ඇති ඖරස බුද්ධපුත්‍රවූ ධර්මයෙන්ම මවාලූවාක් වැනි නමින් ශාරිපුත්‍ර නම් වූ අග්‍රශ්‍රාවකයෙක් වන්නේය.

**254.** "හිමවතින් පටන්ගත් භාගීරථී ගංගාතොමෝ ජලස්කන්ධය බස්වමින් සාගරයට පැමිණෙන්නීය.

**255.** "එසේම මේ ශාරීපුත්‍රතෙමෙ ස්වකීය (කුලපරම්පරාවෙහි) පවත්නාවූ ත්‍රිවේදයෙහි විශාරදවූයේ

ප්‍රඥාවෙන් ශ්‍රාවකපාරමී ඥානයෙහි තෙරට ගොස් (සියලු) සත්වයන් සන්තර්පණය කරන්නේය.

**256.** "හිමාලය පර්වතයෙහි පටන් මහාජලස්කන්ධය දරන්නාවූ සයුර දක්වා මේ අතරෙහි යම් පමණ වැලිකැට රැසක් ඇත්ද, එය ගණින් වශයෙන් අසංඛ්‍යවේ.

**257.** "ඒ වැලිරැසද නිරවශෙෂයෙන් (සම්පූර්ණයෙන්) ගණන මෙපමණයයි ප්‍රමාණ කරන්නට හැකිවන්නේ නමුදු ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ ප්‍රඥාවෙහි කෙළවරක් නොවන්නේය.

**258.** "අලගු තබන කල්හිද ගංගානම් නදියෙහි වැලි අවසන් වන්නේය. ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ ප්‍රඥාවෙහි කෙළවරත් නොවන්නේමැයි.

**259.** "මහ සයුරෙහි රළ ගණින් වශයෙන් මෙපමණයයි සංඛ්‍යා කළ හැකි නොවේ. එසේම ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ ප්‍රඥාවෙහි කෙළවරක් නොවන්නේමැයි.

**260.** "ශාක්‍යකුල ශ්‍රෙෂ්ඨවූ ගෞතම සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ සතුටුකොට ප්‍රඥාවෙන් ශ්‍රාවක පාරමී ඥානයෙහි තෙරට ගොස් අග්‍රශ්‍රාවකයෙක් වන්නේය.

**261.** "තාදී ගුණ ඇති (අටලෝ දහම්හි නොසැලෙන) (සර්වඥවූ) ශාක්‍ය පුත්‍රයන් වහන්සේ විසින් පවත්වන ලද ධර්මචක්‍රය (සද්ධර්මය) මැනවින් දහම් වැසි වස්වමින් ඒ අනුවම පවත්වන්නේය.

**262.** "ශාක්‍යකුල ශ්‍රෙෂ්ඨවූ ගෞතම බුදුරජාණන් වහන්සේ මේ සියල්ල (වෙසෙසින්) නුවණින් දැන භික්ෂු සංඝයා මධ්‍යයෙහි හිඳ අග්‍රස්ථානයෙහි තබන්නේය."

**263.** "අනවමදර්ශී බුදුරජාණන් වහන්සේගේ සමීපයෙහි මා විසින් පුණ්‍යකර්මයක් මැනවින් කරණලදී. යම් ඒ අනවමදර්ශී නම් බුදුවරයෙක්වීද උන්වහන්සේ විෂයෙහි එකී පුණ්‍යසම්භාරයකොට සියලු ගුණ සමූහයෙහි පරතෙරට ගියේ වෙමි. ආශ්චර්යයෙකි.

**264.** "අපමණ කලක් මුළුල්ලෙහි මා විසින් කරණලද කුශලකර්ම පලය මේ පශ්චිමාත්ම භාවයෙහිදී දැක්වීය.

(දුනුදියෙන්) මැනවින් මිදීගිය හී වේගය මෙන් මම කෙලෙස් දැවීමි.

**265.** "හේතුප්‍රත්‍යය බලයෙන් සංස්කරණය නොවන බැවින් අසංස්කෘතවූ නිශ්චලවූ නිර්වාණ පදය සොයන්නේ සියලු තීර්ථකයන් පරීක්ෂා කරන්නේ එකල්හි මම භවයෙහි සැරිසැරුවෙමි.

**266.** "ලෙඩකින් පෙළෙන්නාවූ පුරුෂයෙක් තෙම ලෙඩින් මිදීම පිණිස යම්සේ ඖෂධයක් සොයන්නේද, සියලු වනය (ඖෂධ පිණිස) පරීක්ෂා කරන්නේද,

**267.** "අසංස්කෘත (හේතුප්‍රත්‍යය බලයෙන් සකස් නොවන) අමෘත පදයවූ නිර්වාණය සොයන්නේ අවිච්ඡින්නව (නොකඩවා පිළිවෙළින්) පන්සියයක් ජාතීන්හි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවීමි.

**268.** "මම තවුස් දළමඬුළු බරින් බරවූයේ අඳුන් දිවි සමින් කළ උතුරුසළු පොරවන්නේ අභිඥා වරුන්ගේ පරතෙරට පැමිණ බඹලොව ගියෙමි.

**269.** "බුදුසසුන හැර ඉන් පිටත්හිවූ සසුනක ශුද්ධියක් නැත. බුද්ධිමත්වූ කිසියම් සත්ව කෙනෙක් වෙත්නම් සර්වඥ සාසනයෙහි ශුද්ධිය ලබත්.

**270.** "මෙය තමා විසින් කරණ ලද පුණ්‍යකර්ම බලයෙන් ජනිතවූවකි මෙය මෙසේ වීයයි කියන ප්‍රළාපයක් නොවේ. මම නිවණ සොයන්නේ වැරදි තීර්ථයන්හි හැසුරුනෙමි.

**271.** "යම්සේ හර කැමැත්තාවූ පුරුෂයෙක්තෙම කෙසෙල් ගසක් කපා පලන්නේද (හෙතෙම) එහි හරයක් නොලබන්නේයි එය හරයෙන් තොර ගසකි.

**272.** "එසේම ලෝකයෙහි තීර්ථකයෝද නා නා දෘෂ්ටි ගත් බොහෝ දෙනාද නිවණින් හිස්වූවෝම වෙති. හරයෙන් හිස්වූ කෙසෙල්ගස් මෙනි.

**273.** "අන්තිම භවය පැමිණිකල්හි මම බ්‍රහ්මබන්ධු හෙවත් බ්‍රාහ්මණ කුලයෙහි උපන්නෙක් වීමි. මහත්වූ භොගස්කන්ධය හැර අනගාරිය නම් සාසනයෙහි පැවිදිවීමි.

**(පළමුවෙනි බණවර නිමි.)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

274. "වේද හදාරන්නාවූ මන්ත්‍රධරවූ ත්‍රී වේදයෙහි පරතෙරට ගිය සඤ්ජය නම් බමුණෙක් විය. මම ඔවුන්ගේ සමීපයෙහි වසමි.

275. "මහා වීරයන් වහන්ස, අස්සජි නම් බ්‍රාහ්මණතෙම ඔබවහන්සේගේ ශ්‍රාවකයෙක් විය. එකල්හි ලංවිය නොහැක්කාවූ උග්‍රවූ තේජස් ඇති උන්වහන්සේ පිඬු පිණිස හැසිරෙනසේක.

276. "මැනවින් පිපි පියුමක් වැනිවූ අති ශ්‍රෙෂ්ඨවූ ශාන්ත සිත් ඇති සප්‍රාඥවූ මොන නම්වූ ඥානයෙහි එකඟ සිත් ඇති ඒ ස්ථවිරයන් වහන්සේ දුටුවෙමි.

277. "දැක මැනවින් දමනයවූ පිරිසිදු සිත් ඇති ශ්‍රෙෂ්ඨවූද උත්තමවූද වීරවූද මුන්වහන්සේ රහත් කෙනෙක් වන්නේ යයි මා තුළ අදහසක් ඇතිවිය.

278. "දුටුවන් පහදවන සුළුවූයේ ඉරියව් පවත්වයි. මනා රූ ඇත්තේය. සංවරණය කළ ඉඳුරන් ඇත්තේය. උතුම් දමනයෙන් දැමුනු අමෘත (නිවණ) දක්නා සුළුකෙනෙක් වන්නේය.

279. "මම සතුටු සිත් ඇති උන්වහන්සේගෙන් (තමන් වහන්සේ පැමිණ සිටින) උතුම් ඵලය ගැන විචාරන්නෙම් නම් ඉතා යෙහෙකි. මා විසින් විචාරණලද හෙතෙම (එය) කියන්නේය. එකල්හි මම නැවත විචාරමි.

280. "මම අමෘත පදය ගැන විචාරන්නට අවසරයක් බලමින් පිඬු පිණිස හැසිරෙන්නාවූ උන්වහන්සේගේ පසුපසින් ගියෙමි.

281. "මම වීථිය තුළට පැමිණි උන්වහන්සේ වෙත එළඹ 'වීරයන් වහන්ස' ඔබ කිනම් ගෝත්‍ර ඇත්තේවෙහිද නිදුකාණන් වහන්ස, කවරෙකුගේ ශිෂ්‍යයෙක් වෙයිද?"

282. "මා විසින් විචාරණ ලද උන්වහන්සේ කේශර සිංහයෙකු මෙන් නිර්භීතව මෙසේ ප්‍රකාශ කළසේක. 'බුදුරජාණන් වහන්සේ ලොව පහළවූසේක. ඇවැත්නි, මම උන්වහන්සේගේ ශිෂ්‍යයෙක් වෙමියි' කියායි.

283. "අනුජාත බුද්ධපුත්‍රයාණෙනි, මනස් ඇත්තාණෙනි මහා වීරයාණෙනි, ඔබගේ ඒ බුදුරජාණන් වහන්සේගේ ශාසන

ධර්මය කෙබඳුද? පින්වත මට ඒ යහපත්වූ ශාසනය පවසනු මැනව.'

284. "මා විසින් විචාරණ ලද හෙතෙමේ ගැඹුරුවූ සියුම්වූ තෘෂ්ණා නැමැති හුල නැතිකරන්නාවූ සියලු දුක් නැතිකරන්නාවූ අමෘත පද නම් ධර්මය මෙසේ පැවසීය.

285. "හේතු ප්‍රභවවූ හෙවත් හේතූන් නිසා ඇතිවන්නාවූ යම් ධර්ම කෙනෙක් ඇත්නම් එම (ඵල) ධර්මද එකී ඵල ධර්මයන්ගේ ඇතිවීම වන්නාවූ හේතු ධර්මද තථාගතයන් වහන්සේ වදාළසේක. (එසේම උන්වහන්සේ) මෙකී හේතු ධර්මයන්ගේ වැළැක්ම (නිරොධයද) හේතු නිරොධයෙන් ඇතිවන්නාවූ ඵල නිරොධයද වදාළසේක. මහා ශ්‍රමණවූ බුදුරජාණන් වහන්සේ මෙබඳු කථා ඇතිසේක යනුයි'

286. "ඒ මම ප්‍රශ්නය (මෙසේ) විසඳූ කල්හි ප්‍රථම ඵලයට හෙවත් සෝවාන් ඵලයට පත්වීමි (එම) බුද්ධානුශාසනය අසා කෙලෙස් රජස් රහිතවූ නිර්මල කෙනෙක් වීමි.

287. "(අස්සජි) තෙරුන්ගේ වචනය අසා උත්තමවූ ධර්මය (ආර්ය මාර්ගයෙන්) දැක බැසගන්නා ලද බුදුසසුන් ඇත්තෝ මම මෙම ගාථාව කීමි.

288. "ධර්මය මෙයය ඉදින් මෙයට වඩා උසස් ධර්මයක් නැත. නිර්වාණ පදය (ඔබ) ප්‍රතිවෙධ කෙළෙහිය. බොහෝවූ කල්ප නහුත ගණනක් ඉක්මවන ලද නමුදු නොදක්නාලදී.

289. "ඒ මම ධර්මය සොයන්නේ දහම් නැති තැන්වල හැසුරුනෙමි. බෙදයකි. මාගේ ඒ අර්ථය සම්පූර්ණවිය. මට පමා නොවන්නට කාලයයි.'

290. "අස්සජි තෙරුන් විසින් සතුටු කරනලද මම නිශ්චලවූ අමෘත පදයට (සෝවාන් ඵලයට) පැමිණ මිත්‍රයා (කොලිත) සොයමින් අසපුවට ගියෙමි.

291. "මාගේ මනාව හික්මුනාවූ මිත්‍රතෙමේ දුරදීම සන්හුන් ඉරියව්වලින් සතුටුවූ මා දැක මෙම වචනය කීය.

292. "(ඔබ) පහන්වූ මුහුණ හා නෙත් ඇත්තෙහිය. භික්ෂුවකගේ ස්වභාවය මෙන් පෙනේ. කිම අමෘතය (නිවණ)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

අවබොධ කෙළෙහිද? අච්‍යුත නම් නිර්වාණ පදය අධිගම කෙළෙහිද?

293. "(ඔබ) පහන් පැහැයට සුදුසුව පැමිණෙන්නෙහිය. (හෙණ්ඩු) ආදියෙන් නිශ්චල බවට පත්කළ ඇතකු මෙනි. මනාව හික්මුණු කෙනෙකු මෙනි. බ්‍රාහ්මණය, (ඔබ) ශික්ෂිත ශික්ෂා ඇත්තේ සන්සිඳුනේ වෙහිද?"

294. "ශොකය නැමැති හුල දුරුකරන්නාවූ (ඇද දවන්නාවූ) අමෘතය (නිර්වාණය) මා විසින් අවබොධ කරගන්නා ලදී. ඔබද එය අවබෝධ කරගනුව. (අපි) බුදුරජාණන් වහන්සේගේ සමීයට යමු."

295. "මාගේ හික්මුනාවූ ඒ යහළුතෙමේ මැනවයි පිළිවදන් දී අතින් අත ගෙන ඔබවහන්සේගේ සමීපයට පැමිණියෙමි.

296. "ශාක්‍ය පුත්‍රයාණන් වහන්ස, ඔබවහන්සේගේ සමීපයෙහි දෙදෙනම පැවිදි වන්නෙමු. ඔබවහන්සේගේ සසුන නිසා ආශ්‍රව රහිතව වසමු.

297. "කොලිත තෙමේ ඍද්ධි දැක්වීමෙන් ශ්‍රෙෂ්ඨය. මම ප්‍රඥාවගේ පරතෙරට ගියෙමි. දෙදෙනම එක්ව සසුන හොබවමි.

298. "අවසන් නොවූ බලාපොරොත්තු ඇත්තේ නොයායුතු මගෙහි හැසුරුනෙමි. ඔබවහන්සේගේ දැකීම නිසා මාගේ බලාපොරොත්තුව සම්පූර්ණ විය.

299. "පොළොවෙහි පිහිටි වෘක්ෂයෝ (හෙමන්ත) කාලයෙහි පිපෙත්. සියලු ප්‍රාණීන් සතුටු කරත්. දිව සුවඳ හමත්.

300. "මහා වීරයන් වහන්ස, ශාක්‍ය පුත්‍රයන් වහන්ස මහ යසස් ඇත්තාණන් වහන්ස, (එසේම) ඔබවහන්සේගේ සසුනෙහි පිහිටා (රහත් මග නුවණින්) පිපෙන්නට (සුදුසු) කාලය සොයමි.

301. "සංසාරයෙන් මුදවන්නාවූ විමුක්තිය නමැති පුෂ්පය සොයන්නේ (දැන්) එම විමුක්ති පුෂ්ප ලාභයෙන් සියලු සත්වයන් සතුටු කරමි.

302. "පසැස් ඇතියාණන් වහන්ස, බුද්ධ ක්ෂෙත්‍රය යම් පමණ වේනම් ඒ සියලු තන්හි (කෝටි ලක්ෂයක් සක්වළ) සම්‍යක්සම්බුදු රජාණන් වහන්සේ හැර ප්‍රඥාවෙන් ඔබ වහන්සේගේ පුත්‍රයාට (ශාරිපුත්‍රයන්ට) සමානකෙනෙක් නැත.

303. "ඔහුගේ ශිෂ්‍යයෝද සුවිනීතයෝය. පිරිසිඳ මැනවින් හික්මුනේය උතුම් ශික්ෂාවෙහි දමනයවූවෝ හැමකල්හි හේ (ඒ ශාරිපුත්‍ර) පිරිවරත්.

304. "ධ්‍යාන කරණ සුළුවූ ධ්‍යානයෙහි ඇළුනාවූ ධෛර්‍ය්‍යවත්වූ ශාන්ත සිත් ඇති සන්සුන්වූ නැණවත් (මොන නම්වූ) නුවණින්) යුත් භික්ෂුහු හැමකල්හි හේ පිරිවරත්,

305. "අල්පෙච්ඡවූ ප්‍රාඥවූ ධෛර්‍ය්‍යවත්වූ ස්වල්පාහාර ගන්නාවූ ලොල් නොවූ ලාභ අලාභ දෙකෙහි සමව සතුටු වන්නාවූ (භික්ෂූහු) හේ පිරිවරත්.

306. "අරණ්‍යෙහි වසන්නාවූ (ආරණ්‍යක ධූතාංගධාරීවූ ධ්‍යාන කරන්නාවූ රූක්ෂ චීවරධාරි (ගොරෝසු සිවුරු දරන්නාවූ) විවේකයෙහි ඇළුනාවූ ධෛර්‍ය්‍යවත්වූ (භික්ෂූහු) හැම කල්හි හේ පිරිවරත්,

307. "පිළිපන් සිව්මග ඇති සතර පලයෙහි පිහිටියාවූ සෙසු ඵල තුනින්ද යුත් මේ සීමිත ශෛක්ෂයෝ නිවණ බලාපොරොත්තුවන්නාවූ හේ හැමකල්හි පිරිවරත්,

308. "යම් පිරිසිදුවූ සෝතාපන්න මාර්ග පලයනට පැමිණියේද සකෘදාගාමීහුද අනාගාමීහුද රහත්හුද වෙත්නම් ඔව්හු හැමකල්හි හේ පිරිවරත්,

309. "(සතර) සතිපට්ඨානයන්හි දක්ෂවූවෝද (සප්ත) බොජ්ඣංගය භාවනාවෙහි ඇළුනෝද බොහෝවූ ඒ සියලු ශ්‍රාවකයෝ හැමකල්හි හේ පිරිවරත්,

310. "(සතර වැදෑරුම්වූ) ඍද්ධිපාදයන්හි දක්‍ෂවූවෝද සමාධි භාවනාවෙහි ඇළුනෝද (සතර) සම්‍යක් ප්‍රධානයෙහි යෙදුනෝද හේ හැමකල්හි පිරිවරත්,

311. "ත්‍රිවිද්‍යා ඇත්තෝද ෂඩ්භිඥා ඇත්තෝද ඍද්ධියෙන් හා ප්‍රඥාවෙන් පරතෙරට ගියෝද හේ හැමකල්හි පිරිවරත්,

312. "මහා වීරවූ බුදුරජාණන් වහන්ස, මැනවින් හික්මුනාවූ, ලංවිය නොහැක්කාවූ උග්‍රවූ තේජස් ඇති ඒ මෙබඳුවූ ඔබවහන්සේගේ ශිෂ්‍යයෝ හේ හැමකල්හි පිරිවරත්,

313. "සංයතවූ කෙලෙස් තවන ගුණ ඇති සම ශිෂ්‍යයන් විසින් පිරිවරණ ලදුයේ සිංහයෙකු මෙන් නිර්භීත වෙහිය. චන්ද්‍රයා මෙන් බැබලෙහිය.

314. "වෘක්ෂයෝ පොළොවෙහි පිහිටා උඩට නැගෙත්. (වැඩෙත්) මහත් බවටද පැමිණෙත්. ඒ වෘක්ෂයෝ පලද දක්වත් (පල දරත්)

315. "(එසේම) ශාක්‍ය පුත්‍රයන් වහන්ස, මහා යසස් ඇත්තාණන් වහන්ස, ඔබ පොළොව මෙන් වෙහිය. ඔබ වහන්සේගේ සසුනෙහි පිහිටා ඒ උතුමෝ අමෘත ඵලය හෙවත් නිවණ ලබත්.

316-317. "සින්ධුය සරස්වතිය චන්ද්‍රභාගීය ගංගාය, යමුනාය සරභූය මහීය යන මේ ගංගාවෝ වෙත්ද ගලා බස්නාවූ මේ ගංගාවන් සාගරය පිළිගනී (සයුරට වැටීමෙන් පසු) එම ගංගාවෝ පළමු නම් අත්හරිත්. සාගරයම ලෙස ප්‍රකටවේ.

318. "එසේම චතුර් වර්ණයටම අයත්වූවෝ (ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ක්ෂුද්‍රයෝ) ඔබවහන්සේගේ සමීපයෙහි පැවිදිව පළමු නම හරිත්. බුද්ධපුත්‍රයෝ යයි ප්‍රකට වෙත්.

319. "යම්සේ අහසෙහි ගමන් කරන්නාවූ නිර්මලවූ චන්ද්‍රයා සියලු තාරකා සමූහය (ස්වකීය) ප්‍රභාවෙන් මැඩ ලෝකයෙහි අතිශයින් බබළාද,

320. "එසේම මහා වීරයන් වහන්ස, ඔබවහන්සේ දෙව් මිනිසුන් පිරිවරණ ලදුයේ මේ සියලු දෙන ඉක්මවා හැමකල්හි ඔබවහන්සේම බබලන්නෙහිය.

321. "ගැඹුරු දියෙහි නැගුනු රැළහු වෙරළ නොඉක්මවත්. ඒ සියලුම රළයෝ වෙරළෙහි හැපෙත්. කැඩීගිය ඒ රළහු විසිරී යත්.

322. "එසේම ලොකයෙහි නොයෙක් ලබ්ධි ඇති ඒ තීර්ථකවූ බොහෝදෙනා ධර්මය අසනු කැමැත්තාවූ ඒ බුදුරජාණන් වහන්සේ නොඉක්මවත්.

323. "පසැස් ඇතියාණන් වහන්ස, ඉදින් ඔව්හු ඒ ලබ්ධි ගෙණ විරුද්ධ වාදයෙන් (වාද කිරීමට) පැමිණෙත්ද, ඔව්හු ඔබ වහන්සේගේ සමීපයට පැමිණ සුණුවිසුණු වෙත්.

324. "මහමඩ කරණ කොටගෙන දියෙහි හටගත් කුමුදුද මන්දුලක නම් පියුම්ද අනිකුත් බොහෝ ජලජ පුෂ්පයෝද යම්සේ දිය සමග තැවරී සිටිත් නම්.

325. "එසේම ලෝකයෙහි උපන්නාවූ බොහෝ සත්වයෝ මඩෙහි කුමුදු මෙන් රාගද්වෙෂයින්ගෙන් හටගත් පිළිකුල් ඇත්තාහු උඩට නැගෙත්. (වැඩෙත්)

326. "යම්සේ ජලයෙහි හටගන්නාවූ පියුම් දිය මැද වැඩේද, ඒ පියුම් පිරිසිදු දිය සමග නොගැටේ,

327. "එසේම ලොව පහළවූ මහා වීරවූ බුදුරජාණන් වහන්ස, ඔබ පියුමක් මෙන් ලෝකය නැමති ජලයෙන් නොතැවරෙන්නෙහිය.

328. "යම්සේ ජලජ පුෂ්පයෝ ඉල් මාසයෙහි බෙහෙවින් පිපෙත්ද, ඒ මාසය නොයික්මවත්ද, (එම) මල්පිපීමට ඒ (සුදුසු) කාලය වේද,

329. "එසේම ශාක්‍ය පුත්‍රයන් වහන්ස, ඔබ පුබුදුවූ යෙහිය. ඔබවහන්සේගේ ශිෂ්‍යයෝ (අර්හත්ඵල ඥානයෙන් පුබුදු වූවාහුය. යම්සේ ජලජවූ පියුම් පිපෙන කාලය නොඉක්මවත්ද, (එසේම ඔව්හු) අවවාදානුශාසනය නොඉක්මවත්.

330. "මැනවින් පිපුනාවූ ශාල වෘක්ෂරාජයා දිවසුවඳ හමාද අනික් සල්රුක් විසින් පිරිවරණලද ශාලවෘක්ෂරාජයාම හොබනේ වේද,

331. "එසේම මහා වීරයන් වහන්ස, ඔබ (වහන්සේ) බුදු නැණින් පුබුදු වූයෙහිය. භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලදුයේ ශාල වෘක්ෂ රාජයෙක් මෙන් හොබනෙහිය.

332. "යම්සේ හිමවත් පර්වතය හැම සතුනට (අවශ්‍ය) ඖෂධ ඇත්තේවේද නාගයනටද අසුරයනටද දේවතාවනටද වාසස්ථාන වේද,

333. "එසේ මහාවීරයන් වහන්ස, ඔබ ප්‍රාණීන්ගේ සසර ලෙඩ නැසීමට (අවශ්‍ය) ඖෂධ ඇත්තේවෙහිය. ත්‍රිවිද්‍යා ඇත්තෝද ෂඩභිඥා ඇත්තෝද ඍද්ධියෙන් පරතෙරට ගියෝද (ඔබ වහන්සේ ඇසුරු කරන්නේ)

334. "මහා වීරයන් වහන්ස, කාරුණිකවූ ඔබ වහන්සේ විසින් අනුශාසනා කරණ ලද ඔව්හු ධර්මරතියෙන් (එසේ ඇලී) ඔබ වහන්සේගේ සසුනෙහි වෙසෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

335. "යම්සේ කේශර සිංහයෙක් ගුහාවෙන් නික්ම සිව් දෙස බලා තෙවරක් සිංහනාද කෙරේද,

336. "කේසර සිංහයාගේ ගර්ජනයෙන් සියලු සිව්පාවෝ තැති ගනිත්. ඒ එසේමය. ජාතිමත්වූ සිංහ තෙමේ හැමකල්හි සිව්පාවුන් තැතිගන්වයි.

337. "මහා වීරයන් වහන්ස ගර්ජනා කරන්නාවූ ඔබ වහන්සේගේ නාදය පෘථිවිය කම්පා කරයි. (ඉන්) අවබොධයට සුදුස්සෝ (ධර්මය අවබෝධ කෙරෙත්. මාර පාක්ෂිකයෝ බියවෙත්.

338. "මහා මුනීන් වහන්ස, නාදකරන්නාවූ (දහම් දෙසන) ඔබ වහන්සේගේ (නාදයෙන්) සියලු තීර්ථකයෝ බිය වෙත්. (ඒ තීර්ථකයෝ) කවුඩු රැළක්මෙන් බයවූවාහු කේශර සිංහයා කෙරෙන් පළායන සිව්පාවුන් මෙන් වෙත්.

339. "ගණ ප්‍රධාන කෙනෙක් ලෙව්හි (කිසිවෙකුට) ශාස්තෘයයි කියත්ද, ඔව්හු පිරිසට (ඒ ශාස්තෘවරයාගෙන් පිළිවෙළින් ආ) පරම්පරාගතවූ ධර්මය දේශනා කරත්.

340. "මහා වීරයන් වහන්ස, ඔබ සත්වයනට එසේ ධර්ම දෙශනා නොකෙරෙහිය. හුදෙක් බොධිපාක්ෂිකවූ සත්‍යයන් තෙමේම අවබෝධ කොටගෙන,

341. ("සත්වයන්ගේ) අජ්ක්ධාසය හෙවත් චරියාවන්ද ථාවරගතවූත් මහත් බවට ගිය කෙලෙස් දැයි යන මේ ආසයානුසයන්ද (ශ්‍රද්ධාදි) ඉන්ද්‍රියයන්ගේ බල දුබල බවද (ධර්මාවබොධයට) (සමත් අසමත්) පුගුලන්ද දැන (සර්වඥයන් වහන්ස, ඔබවහන්සේ) චාතුර්ද්වීපික මහා මේඝයක් (සිව් දිගටම වසින්නාවූ මහ වැහි වළාවක්) මෙන් (ධර්ම දේශනා නැමැති සිංහ නාදයෙන්) ගර්ජනා කෙරෙහිය.

342 - 343 "සක්වල ගැබ කෙළවරකොට නා නා ලබ්ධීන්ට ගැතිව සිතන්නාවූ (පිරී) හුන් පිරිස් වන්නීය. සැක දුරු කිරීම පිණිස ඒ සියලු දෙනාගේ සිත් (මේ මේයයි) දැන (සුදුසු) උපමා කීමෙහි සමත් බුදුරජාණන් වහන්ස, (ඔබ වහන්සේ) එකම ප්‍රශ්වායක් (විසදා) කියමින්ම (සක්වල ගැබ පුරා සිටි) ප්‍රාණීන්ගේ සැක දුරු කෙරෙහිය.

344. "දියවසා ඒ මතුපිට පැතිරී සිටි) සෙවෙල් මෙන්වූ (පොළොව මතුපිට පැතිර සිටි) මිනිසුන්ගෙන් පෘථිවි තොමෝ පිරීගියා වන්නීය. ඒ සියල්ලෝ බැදැඳිලි ඇත්තාහු ලෝක නායකවූ ඒ බුදුරදුන් ගුණ කීවාහුය,

345. "ඒ සියලු දිව්‍ය මනුෂ්‍යයෝ කපක් මුළුල්ලෙහිද නා නා ප්‍රකාර ලෙස ගුණ කියන්නාහු නමුදු (එම ගුණ) පමණ කරන්ට නොහැක්කාහුය. තථාගතවරයෝ අපමණ ගුණ ඇත්තෝය.

346. "ස්වකීය ශක්තිය පරිදි මා විසින් බුදුරජාණන් වහන්සේ වර්ණනා කරන ලදී. ලක්ෂ කොටි සංඛ්‍යාත කාලයක් මුළුල්ලෙහි (එසේම) ගුණ කීර්තනය කළාහුය.

347. "ඉදින් මනාව හික්මුනාවූ කිසියම් දෙවියෙක් හෝ මිනිසෙක් හෝ (එමගුණ) (මහ සමුදුරෙහි පිරුණ ජලය අවසන් කිරීමට මනින්ට සිතන්නේ නම් හෙතෙම වෙහෙසටම පැමිණෙන්නේය.

348. "මහා යසස් ඇත්තාණන් වහන්ස, ශාක්‍යපුත්‍රයන් වහන්ස, (මම) ඔබ වහන්සේගේ සසුනෙහි පිහිටා ප්‍රඥාවෙන් පරතෙරට ගොස් ආශ්‍රවරහිතව වෙසෙමි.

349. "තීර්ථකයන් මඩිමි. බුදු සසුන පවත්වමි. අද ශාක්‍යපුත්‍රවූ බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි ධර්ම සේනාපති වෙමි,

350. "මා විසින් අපමණ කලක් මුළුල්ලෙහි කරණ ලද කර්ම පලය මෙහිදී දැක්වීය. මැනවින් විද හරණා ලද ඊ පහරක් මෙන් මම කෙලෙස් දැවීමි.

351. "යම්කිසි මිනිසෙක් තෙම හැමකල්හි හිසින් බරක් දරන්නේ නම් (එම) බර කරණකොටගෙන දුකින් පෙළුනෙක් වන්නේය. (එසේම) බරින් බරට පත්වූවෙක්ද වෙයි.

352. "මම ත්‍රිවිධාග්නියෙන් (රාග, දොෂ, මෝහ) දැවෙමින් සසරෙහි හැසුරුනෙමි. මහමෙර (හිසමත) ඔසවා තබනලද කල්හි මෙන් භව බරින් බරවූයේ වෙමි.

353. "මා විසින් මාගේ (ඒ භව) බර තබන ලදී. සියලු (නව) භවයෝ විධ්වංසනය කරන ලදහ. ශාක්‍යපුත්‍රවූ බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි සියලු කටයුතු කරණ ලදී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

354. "සම්පූර්ණ බුද්ධක්ෂෙත්‍රයෙහි බුදුරජාණන් වහන්සේ හැර මම ප්‍රඥාවෙන් අග්‍රවෙමි. මට සමාන කෙනෙක් නොපෙනේ.

355. "සමාධියෙහි අතිශයින් දක්ෂවෙමි. ඍද්ධියෙහි පරතෙරට ගියේ වෙමි. මම අද කැමති වන්නේ නම් දහසක් මවන්නෙමි.

356. "අනුපූර්ව විහාරයට වසඟවූ සර්වඥයෝ මට සසුන වදාළහ. මාගේ සැතපීම (නම්) නිරොධය (නිරොධ සමාපත්තියට සමවැදීම) යි.

357. "මාගේ දිවැස පිරිසිදුය. මම සමාධියෙහි දක්ෂ වෙමි. සමාධි ප්‍රධානයෙහි යෙදුනේ බොධ්‍යංග භාවනාවෙහි ඇළුනේද වෙමි.

358. "ශ්‍රාවකයෙකු විසින් කළයුතු සියල්ලක් මා විසින් කරණ ලදී. බුදුරජාණන් වහන්සේ හැර මට සමාන (අනික්) කෙනෙක් විද්‍යාමාන නොවේ.

359. "සමාපත්ති ක්‍රමයන්හි දක්ෂවූයේ (ලෞකික) ධ්‍යානයන්ටද (ලොකොත්තරවූ) විමොක්ෂයන්ටද ශීඝ්‍රව සම වදින්නේ බොධ්‍යංග භාවනාවෙහි ඇළුනේ ශ්‍රාවක ගුණයන්ගේ පරතෙරට ගියේ වෙමි.

360. "පහස්නා (ලබන) ලද ශ්‍රාවක ගුණයෙන්ද (පරිසුත්තමභාරවාද) බුද්ධියෙන්ද ශ්‍රද්ධාවෙන්ද යුත් සිත හැම කල්හිම බ්‍රහ්මචාරීන් කෙරෙහි ඇත්තේ වෙමි.

361. "උදුරා හළ විෂ (දළ) ඇති සර්පයෙක් මෙන්ද කැඩුණු අං ඇති ගවයෙකු මෙන්ද බැහැරකළ (ගෝත්‍රමදාදි) මානදර්ප ඇත්තේ සංඝයා වෙත ආදර බහුමානයෙන් එළඹෙමි.

362. "ඉදින් මාගේ ප්‍රඥතොමෝ මූර්තිමත් වන්නී නම් මහපොළොව සම නොවන්නීය. අනවමදර්ශී බුදුජාණන් වහන්සේගේ නුවණට පැසසීමේ මේ පලයයි.

363. "තාදී ගුණ ඇති ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් පවත්වන ලද ධර්මචක්‍රය මම මැනවින් ඒ අනුව පවත්වමි. (අනවම දර්ශී බුදුරජාණන්ගේ) නුවණ පැසසීමේ මේ පලයයි.

364. "කිසිකලෙකත් පවිටු බවක් කුසීත බවක් පසුබට වීර්ය ඇති බවක් අල්ප ශ්‍රැත බවක් ආචාර විරහිත බවක් මා සමග එක් නොවීය.

365. "බහුශ්‍රැත බවද නුවණැති බවද සිව් පිරිසිදු සිල්හි මැනවින් හික්මුණු බවද චිත්ත සමථයෙහි යෙදුනු බවද (මාගේ) මස්තකයෙහි (මුදුනෙහි) සිටීවා.

366. "මෙහි රැස්වූ පින්වත්නි, තෙපි අල්පෙච්ඡවූවෝද ලද දෙයින් සතුටු වන්නෝද, ධ්‍යාන ඇත්තෝද ධ්‍යානයෙහි ඇළුනේද වව් යන (ඒ වචනය) තොපට කියමි.

367. "යමෙක් මම පළමුකොට දැන කෙලෙස් රජස් නැති නිර්මල කෙනෙක්වීම්ද ඒ ධෛර්යවත්වූ මාගේ ආචාර්ය තෙමේ අස්සජි නම් ශ්‍රාවකයන් වහන්සේය.

368. "මම උන්වහන්සේගේ බලයෙන් අද ධර්ම සේනාපතිවීමි. සියලු ගුණයන්හි පරතෙරට පැමිණියේ ආශ්‍රව රහිතව වෙසෙමි.

369. "යම් අස්සජි නම් ශ්‍රාවකයෙක් තෙම මාගේ ආචාර්ය වීද උන්වහන්සේ යම් දිසාවක වෙසේ නම් මම එම දෙසට හිස (දමා විසීම) කරමි.

370. "ශාක්‍ය සිංහවූ ගෞතම බුදුරජාණන් වහන්සේ මාගේ (කුශල) කර්මය සිහිකොට භික්ෂු සංඝයා මැද හිඳ මා අග්‍ර ශ්‍රාවක ස්ථානයෙහි තැබීය.

371. "මාගේ ක්ලේශයෝ දවන ලද්දාහුය. සියලු භවයෝ සමූහනනය (විනාශ) කරන ලද්දාහුය. හස්තිරාජයෙකුමෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වෙසෙමි.

372. "බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේගේ සමීපයට මාගේ යහපත් පැමිණීමක් විය. ත්‍රිවිද්‍යාවෝ පමුණුවන ලද්දාහු බුදුරජාණන් වහන්සේගේ සසුනද කරන ලදී.

373. "මේ සිව් පිළිසිඹියාවෝද අෂ්ට විමොක්ෂයෝද ෂඩභිඥාවෝද සාක්ෂාත් කරන ලදී. බුදුරජාණන් වහන්සේගේ සසුනද කරණ ලදී"

මෙහි මේ අයුරින් ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් දේශනා කළසේක.

(ශාරිපුත්‍ර ථෙරාපදානය නිමි.)

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 2 මහාමොග්ගල්ලාන ථෙරාපදානය

374. "ලෝක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ අනොමදස්සි භාග්‍යවතුන් වහන්සේ දිව්‍ය සමූහයා විසින් පිරිවරණ ලදුව හිමවතෙහි විසීය.

375. "එකල්හි මම නමින් වරුණ නම්වූ නාග රාජයෙක්වීමි. කැමති රූපයන් මවන සුළුවූයේ ඍද්ධි විකුවර්ණය කරමි. මම සයුරෙහි විසීමි.

376. "නිතර සිය පිරිවරවූ ස්වකීය නාග සමූහයා පිරිවරා මම තූර්යයන් වාදනය කරවීමි. එකල්හි නා මෙනෙවියෝ (අනොමදස්සි) බුදුරජාණන් වහන්සේ පිරිවරා වාදනය කළාහුය.

377. "(මනුෂ්‍ය-නාග) තූර්යන් වාදනය කරනු ලබන කල්හි (චාතුර්මහාරාජික) දෙවියෝද (දිව්‍ය) තූර්යන් වාදනය කළාහුය. මේ දෙපිරිස (දෙව්මිනිසුන්ගේ (තූර්ය) ශබ්දය අසා බුදුරජාණන් වහන්සේද එය දැනගත් සේක.

378. "බුදුරජාණන් වහන්සේට ආරාධනාකොට ස්වකීය නාගභවනයට එළඹියෙමි. මම අසුන් පනවා (දානයට සුදුසු) කාලය සැළ කෙළෙමි.

379. "රහතුන් දහසක් විසින් පිරිවරණලද බුදුරජාණන් වහන්සේ සියළු දිසාවන් බබුළුවනසේක් මාගේ භවනයට එළඹිසේක.

380. "එකල්හි මම (එසේ) එළඹියාවූ භික්ෂු සංඝයා සහිතවූ මහාවීරවූ දේවාති දෙවවූ නරශ්‍රෙෂ්ඨවූ බුදුරජාණන් වහන්සේ ආහාරපානයෙන් සන්තර්පනය කෙළෙමි.

381. "(සියල්ල) තෙමේම අවබොධ කළාවූ මහාවීරවූ අග්‍ර පුද්ගලවූ බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා මැද හිඳ අනුමෝදනාව කළසේක. මෙම ගාථාවෝද වදාරණලදහ."

382. "යමෙක් තෙම ලෝකනායකවූ බුදුරජාණන් වහන්සේද සංඝයාද පිදී නම් හෙතෙම එම සිත පැහැදවීම කරණකොට ගෙන දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) යන්නේය.

383. "සත් සත්තෑවරක් දිව්‍යරාජ්‍යයද කරන්නේය. අටසියක් වරෙක පාථිවි රාජ්‍යයද කරමින් පොළොවෙහි වෙසෙන්නේය.

384. "පස් පණස්වරක් සක්විති රජ වන්නේය. එකෙණෙහි ඔහුට අපමණ භෝගයෝ උපදින්නාහුය.

385. "මෙයින් අපරිමෙය්‍ය කල්පයෙහි (එකාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් මතුයෙහි) ඔක්කාකනම් කුලයෙහි උපදින්නාවූ ගෞතම නම්වූ ශාස්තෲන් වහන්සේ ලෝකයෙහි පහළ වන්නේය.

386. "හෙතෙම (වරුණ නාග රාජතෙම) නිරයෙන් චුතව මිනිසත් බවට (උත්පත්ති වශයෙන්) යන්නේය. කෝලිත නම්වූ බ්‍රාහ්මණයෙක් වන්නේය.

387. "හෙතෙම පසුව පැවිදිව කුශල මූලයන් විසින් මෙහෙයන ලදුයේ ගෞතම බුදුරජාණන් වහන්සේගේ ද්විතීය ශ්‍රාවක වන්නේය.

388. "පටන් ගන්නාලද වීර්ය ඇත්තේ නිවණට මෙහෙයූ සිත් ඇත්තේ ඍද්ධියෙහි කෙළ පැමිණියේ සියලු ආශ්‍රව ධර්මයන් දැන (දුරුකොට) ආශ්‍රව රහිතව (ක්ලේශ පරිනිර්වාණයෙන්) පිරිනිවන් පාන්නේය."

389. "පාප මිත්‍රයන් ඇසුරෙන් කාමරාගයෙහි වසඟයට ගියේ දුෂ්ට සිත් ඇත්තේ මව්පියන්ද නැසීමි.

390. "මම නිරයෙහි හෝ නැතහොත් මිනිසුන් අතරෙහි හෝ යම් යම් යෝනියක උපදිම් නම් (එකී) පාපකර්මය හා එක්වීමෙන් බිඳීගිය හිස් ඇත්තේ මැරෙමි.

391. "මෙය මාගේ (සසරෙහි) අවසානයයි. අන්තිම ආත්ම භාවයවේ. මේ ආත්ම භාවයවේ. මේ ආත්ම භාවයෙහිදීද මට මැරෙන කල්හි මෙබන්දක් වන්නේය.

392. "ප්‍රකර්ෂ විවේකයෙහි යෙදුනේ සමාධි භාවනාවෙහි ඇළුනේ සියලු ආශ්‍රවයන් දැන (දුරුකොට) ආශ්‍රව රහිතව වෙසෙමි.

393. "පෘථිවියද ඉතා ගැඹුරුය. ඝනය නොසෙලවිය හැක. (එහෙත්) ඍද්ධියෙහි කෙළපැමිණියේ (එය) වම්පය මහපටැඟිල්ලෙන් සොළවමි.

394. "අස්මිමානය (සීල සමාධි ප්‍රඥාදිය ඇත්තේ මටමය යන ඇඟීම) නොදකිමි මට මානය නැත. මම සාමණේරයන් පටන්කොට සියලු භික්ෂු සංඝයා කෙරෙහි ගෞරව සිත (ඇති) කරමි.

**395.** "මින් (එකා සංඛ්‍ය කල්ප ලක්ෂයකට) අපරිමෙය කල්පයකට පෙර (අගසව් බව පිණිස) යම් කර්මයක් රැස් කෙළෙම්ද මම ඒ ශ්‍රාවක භූමියට පත්වීමි. ආශ්‍රව ක්ෂය නම්වූ නිවණට පැමිණියෙමි.

**396. - 398** "මාගේ ක්ලේශයෝ දවන ලද්දාහුය. (මෙහි 311, 372, 373 යන ගාථාවන් යොදන්න)

මෙහි මේ අයුරින් ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් දේශනා කළසේක.

**(මහාමොග්ගල්ලාන තෙරුන් වහන්සේගේ අපදානය නිමි)**

---

### 3 මහාකාශ්‍යප ථේරාපදානය

**399.** "තාදී ගුණ (අටලෝ දහම්හි නොසැලෙන ගුණ) ඇති ලෝක ජ්‍යෙෂ්ඨවූ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ (ශාසනයෙහි) ලෝකනාථවූ (ඒ පදුමුත්තර) බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි (දිව්‍ය මනුෂ්‍යයෝ) ශාස්තෲන් වහන්සේට පූජා කෙරෙත්.

**400.** "ජන සමූහයා ඔද වැඩි සිත් ඇත්තාහු අතිශයින් ප්‍රමුදිතවූහ. ඒ බොහෝ සංවේගයන් පවත්නා අතරෙහි මට ප්‍රීතියක් ඇතිවිය.

**401.** "නෑ මිතුරන් කැඳවා 'මහාවීරවූ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑසේක. ඒකාන්තයෙන් පූජාවක් කරමුය" යන මේ වචනය කීමි.

**402.** "ලෝකනාථ බුදුරජාණන් වහන්සේ විෂයෙහි පින් රැස් කිරීම කරන්නෙමුයි" ඔව්හු පිළිවදන්දී මාගේ සතුට වැඩියක්ම ඇති කළාහුය.

**403.** "රියන් සියයක් උස්ව තැනූ තොරණක් මැනවින් කොට රියන් එක්සිය පණසක් පමණ පැතුරුනු විමානයක් ගොඩනංවන ලදී.

**404.** "එම ප්‍රාසාදයෙහි සිත්තම් කරණලද තාලවචරයන් (හේවිසිකරුවන්) කරණකොට ගෙන (විසිතුරු) කොට සිය සිත පහදවා උත්තම චෛත්‍යය පිදීය.

405. "ඇවිලගත් ගිනි කඳක් මෙන්ද පිපියාවූ ශ්‍රෙෂ්ඨ සල්රුකක් මෙන්ද අහසෙහි විදුලිය මෙන්ද සිව්දිග බබුළුවමි.

406. "මම එහි සිත පහදවා බොහෝ කුශල්කොට පෙර කරනලද කුශල කර්මය සිහිකොට තව්තිසා දෙව්ලොව උපනිමි.

407. "යෙදූ දහසක් අශ්වයන් විසින් උසුලන ලද දිව්‍ය යානයට නැගුනේ (වෙමි) මාගේ උස්වූ භවනය උඩට නැංගේය.

408. "දහස් ගණන් කුළු ගෙවල් තනි රනින් කරන ලදහ. (එම කුළු ගෙවල්) ස්වකීය දීප්තියෙන් සියළු දිගුන් බබුළුවමින් දිලිසෙත්.

409. "පද්ම රාග මාණික්‍යමයවූ අන්‍යවූ දොරටුද ඇත්තාහ. එකල්හි එම දොරටුද ශොභාවෙන් හාත්පස සිව් දිගම බබුළුවත්.

410. "පුණ්‍යකර්ම බලයෙන් හටගත් මැනවින් නිර්මිත මණිමුවා කුළුගෙවල් හාත්පස දස දිගුන් බබුළුවත්.

411. "බබළන්නාවූ මොවුන්ගේ ආලෝකය අධිකවිය. සියලු දෙවියන් ඉක්මවීමි. මේ පුණ්‍යකර්මයාගේ පලයයි.

412. "කල්ප සැටදහසක් මුළුල්ලෙහි උබ්බිද්ධ නම්වූ ක්ෂත්‍රියයෙක් සිව්මග සයුර හා සිව්මග දිවයින කෙළවර කොට ඇති පෘථිවියට අධිපතිවූයේ සතුරු රජුන් ජයගන්නා සුළුව මම විසීමි.

413. "එසේම භද්‍රකල්පයෙහි තිස්වරක්ම මහත් බල ඇති සක්විති රජවීමි ස්වකීය පුණ්‍යකර්මයන්හි ඇළුනේමවීමි.

414. "එහිද මා හට දිගින් සූවිසි රියන්වූ පුළුලින් දොළොස් රියන්වූ විදුලියක් වැනිවූ භවනයක් උස්ව පැනනැංගේය.

415. "විශාල පවුරු හා තොරන් ඇති දිගින් (යොදුන්ද) පන්සියයක්වූද පුළුලින් ඉන් අඩක්වූද තව්තිසා වාසීන්ගේ දෙව්පුරය වැනි ජනසමූහයාගෙන් ගැවසීගත් රම්මකනම් නගරයක් විය.

416. "යම්සේ හිදිගුලාවෙහි බහනලද පස් විස්සක් හිදිකටු ඔවුනොවුන් ගැවෙත්. එය එකල්හි ගැවසී ගත්තේවේ.

417. "එසේම මාගේ උතුම්වූ රම්මක නගරයද හස්ති අශ්ව රථයන්ගෙන් පිරීගියේ නොයෙක් මිනිසුන්ගෙන් හැම කල්හි ගැවසී ගත්තේ විය.

**418.** "එහි (සම්පත්) අනුභවකොට (මිහිරිරසද) බී යලි දේවත්වයට ගියේ මාගේ අන්තිම භවයෙහිද කුලවත්බව ඇති විය.

**419.** "මහත්වූ රුවන් සමූහ ඇති බමුණු කුලයෙහි උපන්නේ අසූ කෝටියක් හිරන්‍ය (සම්පත්) හැරදමා පැවිදිවීමි.

**420.** "421 422" මාගේ ක්ලේශයෝ දවන ලද්දාහුය. (මෙහි 271, 272, 273 යොදන්න.) බුදුරජාණන් වහන්සේගේ සසුනද කරණලදී."

මෙහි මේ අයුරින් ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් දේශනා කළසේක.

**මහාකාශ්‍යප තෙරුන් වහන්සේගේ අපදානය නිමි.**

---

## 4. අනුරුද්ධ ථෙරාපදානය

**423.** "මම ලෝක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ විවේකීව වාසය කරන්නාවූ ලෝකනායකවූ සුමේධ නම් භාග්‍යවතුන් වහන්සේ දුටුවෙමි.

**424.** "මම ලෝකනායකවූ සුමේධ සම්බුදුන් වහන්සේ වෙත එළඹ ඇදිළි බැඳගෙන බුද්ධ ශ්‍රෙෂ්ඨයන් (මෙසේ) මෙසේ අයැදීමි.

**425.** "මහාවීරයන් වහන්ස ලෝක ජ්‍යෙෂ්ඨයන් වහන්ස, නරශ්‍රෙෂ්ඨයන් වහන්ස, අනුකම්පාකොට වදාළ මැනව. රුක්මුල්හි ධ්‍යාන කරන්නාවූ ඔබ වහන්සේට පහනක් දෙමි."

**426.** "සියල්ල තෙමේම දන්නාවූ කථා කරන්නවුනට ශ්‍රෙෂ්ඨවූ ඒ ප්‍රාඥවූ බුදුරජතෙම එය ඉවසීය, එකල්හි මම ශස්විද යතුරක් යොදා,

**427.** "දහසක් වැටි දුනිමි. (යෙදීමි) මාගේ පහන්හු ත්‍රිලෝක බන්ධුවූ බුදුරජාණන් වහන්සේට සතියක් දැල්වී නිවී ගියහ.

**428.** "එම චිත්ත ප්‍රසාදයෙන්ද සිත්හිවූ ප්‍රාර්ථනයන්ගෙන්ද මම මිනිස් සිරුර හැර දෙව්විමනක ඉපදුනිමි.

**429.** "දෙව් අත්බැව්හි උපන් මට මැනවින් නිර්මිත විමානයක් විය. (එය) හාත්පසින් ඇවිලේ. මෙය පහන් පූජාවෙහි විපාකයයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

430. "එකල්හි මම හාත්පස යොදුන් සියයක් බැබලීමි. සියළු දෙවියන් අභිභවමි. මෙය පහන් පූජාවෙහි විපාකයි.

431. "ශක්‍රව තිස් කපක් මුළුල්ලෙහි දිව්‍ය රාජ්‍යය කරවීමි. කිසිවෙක් මා ඉක්මවා නොසිතත් (අවමන් නොකෙරෙත්) මෙය පහන් පූජාවෙහි විපාකයයි.

432. "මම අට විසිවරක් චක්‍රවර්ති රාජවීමි. එකල්හි හාත්පස යොදුනක් තැන් දිවා රෑ දෙක්හිම (එකසේ) දකිමි.

433. "(ප්‍රඥා) චක්ෂුසින් දහසක් සක්වල (ලෝක) දකිමි. සර්වඥ සාසනයෙහි (පැවිදිව) දිවැස ලැබූයේද වෙමි. මෙය පහන් පූජාවෙහි විපාකයයි.

434. "මෙයින් කල්ප තිස් දහසකට පෙර සුමේධ නම් සම්බුදු රජතෙම විය. මා විසින් උන්වහන්සේට පැහැදුනු සිතින් පහන් දෙනලදී

435 436, 437. "ක්ලේශයෝ දවන ලද්දාහුය. (මෙහි 371, 372, 373 යොදන්න) බුදුරජාණන් වහන්සේගේ සසුනද කරන ලදී."

මෙහි මේ අයුරින් ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් දේශනා කළසේක.

(අනුරුද්ධ තෙරුන් වහන්සේගේ අපදානය සතර වැනියි)

---

## 5 පුණ්ණථේරාපදානය

438. "වේද හදාරවන්නාවූ මන්ත්‍රධරවූ වේදත්‍රයෙහි පරතෙරට ගිය (මම) ශිෂ්‍යයන් විසින් පිරිවරණ ලදුයේද වෙමි. මනුෂ්‍යාත්තමවූ බුදුරජාණන් වහන්සේ වෙත එළඹියෙමි.

439. "පූජා සත්කාරන් පිළිගැනීමට සුදුසුවූ තුන්ලෝ දත් මහා මුනිවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ සංක්ෂිප්ත වශයෙන් මාගේ කර්මය ප්‍රකාශ කළසේක.

440. "මම ඒ ධර්මය අසා බුදුරජාණන් වහන්සේට අභිවාදනය කොට ඇඳිලි බැඳගන දක්ෂිණාභිමුඛව ගියෙමි.

441. "සංක්ෂිපත්ව අසා විස්තර වශයෙන් දෙසීමි. එසේ කියන්නාවූ මට සියලු ශිල්පයෝ අසා සතුටුවූවාහු.

442. "ස්වකීය දෘෂ්ටිය අත්හැර දමා බුදුන් කෙරෙහි සිත පැහැදවූහ. මම සංක්ෂිප්තවද දෙසමි. එසේම විස්තර වශයෙන්ද දෙසමි.

443. "අභිධර්ම ක්‍රම දන්නාවූ මම කථා වත්ථුප්පකරණ විශුද්ධියෙන් සියල්ලනට අවබෝධ කරවා ආශ්‍රව රහිතව වෙසෙමි.

444. "මින් කප් පන්සියයක් පෙර අතිප්‍රකටවූ සත් රුවනින් යුත් සතර මහාද්වීපයෙහි සක්විති රජවරු සතර දෙනෙක්වූහ.

445. "සිව් පිළිසිඹියාවෝද අෂ්ටවිමොක්ෂයෝද ෂඩභිඥාවෝද (මා විසින්) සාක්ෂාත් කරණලදී. බුදුරජාණන් වහන්සේ ශාසනයද කරනලදී.

446. "මෙහි මේ අයුරින් ආයුෂ්මත් පුණ්ණ මන්තානි පුත්ත ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් දේශනා කළ සේක.

**(පුණ්ණ මන්තානි පුත්ත ථෙරපදානය පස්වැනියි.)**

---

## 6. උපාළි ස්ථවිරාපදානය.

447. "හංසවතී නගරයෙහි රැස්කොට තැබූ අසූකෙළක් ධනය ඇති සමෘද්ධවූ ධන ධාන්‍ය ඇති වේද හදාරවන්නාවූ මන්ත්‍රධරවූ වෙදත්‍රයෙහි පරතෙරට ගියාවූ (අත් පා ආදියෙහි ලකුණු බලා අනාගතය පවසන) ලක්ෂණ ශාස්ත්‍රයෙහිද, ඉතිහාසයෙහිද, ස්වකීය බ්‍රාහ්මණ ධර්මයෙහිද පරතෙරට ගියාවූ සුජාත නම් බමුණෙක් විය.

448. "එකසිඛ (හිසැ එක් සිළුවක් ඇති) පරිබ්‍රාජකයෝද (මතුලොව පහළවන) ගෞතම බුදුරජාණන් වහන්සේගේ (අනාගත) ශ්‍රාවකයෝද, තැනින් තැන හැසිරෙන්නාවූ) චරක තවුසෝද එකල්හි පොළොවෙහි හැසිරෙත්

449. "ඔව්හු ද ප්‍රසිද්ධ බ්‍රාහ්මණයෙකැයි කියා මා පිරිවරත්, බොහෝදෙනා මා අදහත්. මම කිසිවෙකුට නොපුදමි.

450. "යම්තාක් කල් තථාගතයන් වහන්සේ ලොව පහළ නොවනසේක්ද ඒතාක් කල් බුද්ධ යන වචනය පවා (ලෙව්හි) නැත. එකල්හි මම මානයෙන් තදවූයේ පිදිය යුත්තෙක් නොදකිමි.

451. "ඊ දාවල් (බොහෝ හවුරුදු) ගෙවීයාමෙන් (පසු) පසැස් ඇති පදුමුත්තර නම් ලෝකනායක බුදුරජතෙම සියලු අඳුරු දුරුකොට ලොව පහළවිය.

452. "පැතුරුණු බොහෝදෙනා විසින් මැනවැයි සම්මත යෙන්වූ (බුදු) සසුනෙහි (ආදිකර්තෘවූ) බුදුරජතෙම එකල්හි හංසවති නගරයට එළඹියේය.

453. "පසැස් ඇත්තාවූ ඒ බුදුරජාණන් වහන්සේ පියාණන්ටත් වැඩ පිණිස ධර්මදේශනා කළසේක. එකල්හි පිරිසඳ හාත්පස යොදුනක් (තන්හි පැතුරුනේ) විය.

454. "මිනිසුන් අතර සුනන්ද නමින් සම්මතවූයේ ඒ තවුස්තෙමේ එකල්හි යම්තාක් බුදු පිරිසද (ඒතාක් තැන) මල්වලින් වැසීය.

455. "පුෂ්ප මණ්ඩපයෙහි සිට බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ චතුස්සත්‍ය දේශනා කරන කල්හි කෙළ ලක්ෂයක (ප්‍රාණීන්) ට ධර්මාභිසමය විය.

456. "බුදුරජතෙම දිවරෑ සතක් (සතිසක්) උතුම් දහම් වැසි වස්වා අටවෙනි දිනය පැමිණි කල්හි බුදුරජතෙම සුනන්දට මෙසේ පැවසීය.

457. "මෙතෙම සසරෙහි දෙව්ලොවෙහිද මනුෂ්‍යයන් අතරෙහිද හැසිරන්නේ භවයන්හිදී සියල්ලන්ට උතුම්ව සැරිසරයි.

458. "කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි ජනිතවන ගෝත්‍රයෙන් ගෞතම නම්වූ ශාක්‍යයන් වහන්සේ ලොව පහළ වන සේක.

459. "ඒ ගෞතම බුදුරජාණන් වහන්සේගේ ධර්මයට දායාද (ධර්මයට කොටස් කරුවෙක්) වූ ඖරස පුත්‍රවූ (දහම් අසා සෝවාන් ආදී මාර්පල පිළිවෙලින් රහත්වූයේ බුදු රජුන්ගේ ඖරස පුත්‍රයායි) ධර්මයෙන්ම මවාලුවාක් වැනිවූ පුණ්ණ මන්තානි පුත්ත නම් ශ්‍රාවකයෙක් වන්නේය."

460. "එකල්හි සම්බුදු රජතෙම සියලුදෙනා සතුටු කරමින් ස්වකීය බලයද දක්වමින් සුනන්ද තවුසාට මෙසේ පැවසීය.

**461.** "ජනයෝ බුදුරජාණන් වහන්සේ කෙරෙහි පුණ්‍ය කර්මකොට තමාගේ ගතිය පිරිසිදු කෙළේයයි සුනන්ද තවුසාට කරනලද ඇඳිලි ඇත්තාහු නමස්කාර කෙරෙත්.

**462.** "බුදුරජාණන් වහන්සේගේ වචනය අසා එහි මාගේද අදහස විය. ගෞතම බුදුරජාණන් වහන්සේ යම් පින්කමක් කිරීමෙන් දැකිය හැකි වෙම් නම් මමද (එබඳු) පින්කමක් කරන්නෙමි.

**463.** "මම මෙසේ සිතා මාගේ (ඒ සඳහා) කටයුතු (පින්කම්) ගැනද සිතීමි. නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍රයෙහි (රත්නත්‍රයෙහි) මම කවර පින්කමක හැසිරෙම්ද?

**464.** "(සරභඤ්ඤ වශයෙන් ග්‍රන්ථයන් කියවන හෙයින්) පාඨික නම්වූ මේ භික්ෂුතෙමේ බුද්ධ ශාසනයෙහි සියලු මධුර ස්වර පාඨකයන් අතුරෙහිද විනයෙහිද අග්‍රස්ථානය තබන ලදී. මම ඒ තනතුර පතමි.

**465.** "මෙය මාගේ සයුර මෙන් නොකැළඹෙන අප්‍රමාණවූ භෝගයයි. මම ඒ ධනයෙන් බුදුරජාණන් වහන්සේට ආරාමයක් කරවන්නෙමි.

**466.** "නගරයාගේ නැගෙණහිර දිගෙහි සෝභන නම්වූ අරමකි. (එය) ලක්ෂයකින් මිළට ගෙණ සංඝාරාමයක් කරවීමි.

**467.** "කුළුගෙවල්ද, ප්‍රාසාදයන්ද, මණ්ඩපයන්ද, සඳළු පන්නා කළ ගෙවල්ද දොර නොලු ගුහාවන්ද, සක්මන් මළුද, මැනවින් කොට සංඝාරාමයක් කරවීමි.

**468.** "ඩහගන්වන ගෙයද ගිනිහලද යලි පැන්හළද නහන ගෙයද කොට මම භික්ෂු සංඝයාට දුනිමි.

**469.** "දික්හගලා පුටුද (කුඩා) පුටුද, පරිභෝග භාජනද ආරාමිකයන්ට දෙන බෙහෙත්ද යන මේ සියල්ල මම දුනිමි.

**470.** "සන්සුන් සිත් ඇති තාදීගුණ ඇත්තාවුන්ගේ ඒ ගුණයනට කිසිවෙක් පීඩා නොකෙරේවායි ආරක්ෂා තබවා දැඩිකොට පවුරක් කරවීම.

**471.** "ලක්ෂයක් (ධන) විසදමින් සංඝාරාමයෙහි ආවාසයක් කරවීමි. එය උසස් බවට පමුණුවා බුදුරජාණන් වහන්සේට පිරිනැමීමි.

472. "මා විසින් ආරාමය කොට නිමවන ලදී. තථාගතයාණන් වහන්ස, ඔබවහන්සේ මෙය පිළිගත මැනවි. වීරයාණන් වහන්ස, (මෙය) ඔබවහන්සේට දෙන්නෙමි. පසැස් ඇත්තාණන් වහන්ස, (මෙය) පිළිගත මැනවි.

473. "පූජාසත්කාරයන් පිළිගැනීමට සුදුසුවූ ලෝක නායකවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ මාගේ අදහස දැන (එය) ඉවසූසේක.

474. "මහර්ෂිවූ සර්වඥයන් වහන්සේ (ආරාධනය) ඉවසීම දැන මම භොජනය පිළියෙල කරවා (සුදුසු කාලයයි) කාලය ආරොචනය කෙළෙමි.

475. "කාලය දැන්වූ කල්හි පදුමුත්තර ලෝක නායකයන් වහන්සේ රහතුන් දහසක් විසින් පිරිවරණලදුයේ තමාගේ ආරාමයට වැඩිසේක.

476. "සුදුසු කාලය දැන වැඩහුන්නාවූ උන්වහන්සේ ආහාරපානයෙන් තෘප්ත කෙළෙමි. සුදුසු කලැයි දැන වළදා අවසන්වූ උන්වහන්සේට මෙය වචනය කීමි.

477. "ලක්ෂයක් මිලදී ගන්නාලද එපමණම මුදලකින් (සෙසු කටයුතු) කරවනලද සෝභන නම්වූ ආරාමය බුදුරජාණන් වහන්ස, ඔබවහන්ස් පිළිගන්නා සේක්වා.

478. "මෙම ආරාම දානයෙන් (ඇතිකරගත්) චිත්ත ප්‍රණිධිය කරණකොටගෙන භවයෙහි උපදින්නාවූ මම මා විසින් පතනලද්ද ලබම්වා."

479. "බුදුරජතෙම මැනවින් කොට නිමවනලද සංඝාරාමය පිළිගෙන බික්සඟනමැද හිඳ මෙම වචනය වදාළේය.

480. "ඒ යමෙක්තෙම මැනවින් කොට නිමවනලද සංඝාරාමය බුදුරජාණන් වහන්සේට පූජාකෙළේ ද මම ඔහු පිළිබඳ තොරතුරු කියන්නෙමි. එය කියන්නාවූ මාගේ වචනය අසව්.

481. "ඇත් සේනාවද අස් සේනාවද, රථ සේනාවද, පාබල සේනාවද, (යන මේ) සිව්රඟ සෙනඟ නිරතුරුවම මොහු පිරිවරන්නාහුය. මෙය සංඝාරාම දානයෙහි විපාකයයි.

**482.** "සැට දහසක් තූර්යද, මැනවින් අලංකාර කළ බෙරද මා නිරතුරුවම පිරිවරන්නාහුය. මෙය සංඝාරාම දානයෙහි විපාකයයි.

**483-484.** "මැනවින් අලංකාර කරනලද සයාසූ දහසක් ස්ත්‍රීහු විසිතුරු වස්ත්‍රාභරණ ඇත්තාහු එල්බනලද මිණිකොඬොල් ඇත්තාහු දිග ඇසි පිහාටු ඇත්තාහු සිනා සහිත වූවාහු මැනවැයි හැඳින්විය හැකි ශරීර අවයව ඇත්තාහු සිහින් කටී ප්‍රදේශ ඇත්තාහු නිරතුරුවම මොහු පිරිවරන්නාහුය.

**485.** "කල්ප තිස් දහසක් මුළුල්ලෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේය. ශක්‍රව දහස්වරක් දිව්‍යරාජ්‍යය කරන්නේය.

**486.** "දිව්‍යරාජ (ශක්‍ර) යෙකු විසින් පැමිණිය (ලැබිය) යුතු සියල්ල ලබන්නේය. සම්පූර්ණ භොග ඇත්තේම දිව්‍ය රාජ්‍යය කරන්නේය.

**487.** "දහස් වරක් රටෙහි සක්විතිරාජ වන්නේය. මහත් වූ පෘථිවි රාජ්‍යය (ලබන වාර) ගණින් වශයෙන් ප්‍රමාණ කළ නොහැක්කේය.

**488.** "කල්ප ලක්ෂයකින් මත්තෙහි ඔක්කාක කුල සම්භවවූ ගෝත්‍රයෙන් ගෞතම නම්වූ ශාස්තෘන් වහන්සේ ලොව පහළවන්නේය.

**489.** "උන්වහන්සේගේ ධර්මයෙහි දායාද (කොටස් කරුවෙක්) වූයේ ධර්මයෙන් නිමකළාක් වැනිවූ නමින් උපාලි නම් වූ බුද්ධශ්‍රාවකයෙක් වන්නේය.

**490.** "විනයෙහි කෙළ පැමිණි කුදු මහත් කරුණෙහි දක්ෂවූයේ බුදුසසුන (ත්‍රිපිටක ධර්මය) දරන්නේ ආශ්‍රව රහිතව වාසය කරන්නේය.

**491.** "ශාක්‍යකුල ශ්‍රෙෂ්ඨවූ ගෞතම බුදුරජතෙමේ මේ සියල්ල දැන භික්සඟන මැද හිඳ මොහු අග්‍රස්ථානයෙහි තබන්නේය.

**492.** "අපමණ කලක පටන් ඔබවහන්සේගේ සසුන පතමි. සියලු සංයෝජනයන් ක්ෂය කෙළේ මා විසින් එම අර්ථයට පැමිණෙනලදී.

493. "යම්සේ රාජ දණ්ඩනයෙන් තැතිගත් පුරුෂතෙම හුලෙහි ඇමිනුනේ (එම) හුලෙහි සැපයක් නොවිඳුනේ (ඉන්) මිදීමේ කැමති වෙයිද?

494. "මහා වීරයන්වහන්ස, මමද එසේම භවදණ්ඩනයෙන් තැතිගන්නේ කර්මය නැමැති හුලෙහි ඇමිනුනේව පිපාසාවෙන් හා වේදනාවෙන් මඩනා ලද්දේ,

495. "ත්‍රිවිධ අග්නියෙන් (රාග-ද්වේෂ මොහ) දැවෙන්නේ භවයෙහි සැපතක් නොවිඳිමි. රාජදණ්ඩනයෙන් තැතිගත්තෙකු මෙන් මිදීම සොයමි.

496. "යම්සේ (සර්පවිෂයෙන්) දුකට පත් පුරුෂයෙක් තෙම විෂයෙන් පෙළෙනලද්දුයේ හෙතෙම විෂ නැසීමේ උපාය වූ බෙහෙතක් සොයන්නේය.

497. "සොයන්නේ විෂ නසන්නාවූ බෙහෙතක්ද කියන්නේය. විෂයෙන් මිදීම පිණිස එය බී සැප ඇත්තේ වන්නේය.

498. "එසේම මහාවීරයන් වහන්ස, මම විෂයෙන් නටුවාවූ පුරුෂයෙකු මෙන් අවිද්‍යාවෙන් පෙළුනේ සදහම් බෙහෙත සෙවීමි.

499. "දහම් බෙහෙත සොයන්නේ සියළු ඖෂධයනට අග්‍රවූ සියලු (රාගාදී) හුල් දුරුකරන්නාවූ ඒ බුද්ධශාසනය දුටුවෙමි.

500. "මම දහම් ඔසුව බී සියළු (සසර) විෂ දුරුකෙළෙමි. අජරාමරවූ සිසිල්වූ නිවණ ස්පර්ශ කෙළෙමි.

501. "යම්සේ භූතයෙකු විසින් පෙළනලද පුරුෂයෙක් තෙම භූතග්‍රහණයෙන් පීඩිතවූයේ භූතයාගෙන් මිදීම පිණිස භූත වෛද්‍යයෙකු සොයන්නේද?

502. "සොයන්නේ භූතවිද්‍යාවන්හි දක්ෂයෙකු දකින්නේය. හෙතෙම ඔහුගේ භූතයා නසන්නේය. සහමුලින්ම වනසන්නේය.

503. "මහාවීරයන් වහන්ස, එසේම මම ක්ලේශාන්ධකාරයෙන් පෙළුනේ (එම) අඳුරින් මිදීම පිණිස ඥානාලෝකය (ප්‍රඥාව) සොයමි.

504. " ඉක්බිති කෙලෙස් අඳුර දුරුකරන්නාවූ ශාක්‍ය මුනීන්වහන්සේ දුටුවෙමි. උන්වහන්සේ භූත වෛද්‍යයෙක්

භූතාවේශයන් (දුරුකරන්නාක් මෙන්) මේ මාගේ ක්ලේශාන්ධකාරය දුරුකළ සේක.

505. "සසර සැඩපහර සින්දෙමි. තෘෂ්ණාශ්‍රොතය වැළැක්වීම් භූතවෛද්‍යයෙකු මෙන් සියළු භවය මුලින්ම නැසීමි.

506. "යම්සේ ගුරුලෙක් තෙම තමාගේ ගොදුරවූ නාගයා වෙත වේගයෙන් බසීද, මහසමුදුර හාත්පස යොදුන් සියයක් කළඹාද?

507. "හෙතෙම යටිකුරුකොට නාගයා ගෙන පෙළන්නේ ඒ ගුරුළුතෙම කැමති තැනකට ගෙනයේද,

508. "මහාවීරයන් වහන්ස, එසේම එම ගුරුලා නාගයා බිලිකොට ගන්නාක් මෙන් අසංස්කෘත සංඛ්‍යාත නීවරණ සොයන්නේ මම (ක්ලේශ) දොස් (සමුච්ඡෙද වශයෙන්) සෝදා හැරීමි.

509. "නිරුත්තර ශාන්තිපදයවූ උතුම් නිර්වාණ ධර්මය දක්නා ලද මම ගුරුළා නාගයෙකු මෙන් මෙය (ධර්මය) ගෙන වෙසෙමි.

510. "චිත්‍රලතා වනයෙහි හටගන්නාවූ ආසාවතී නම් වැල ඒ වැලේ (වයසින්) හවුරුදු දහසකින් එක ගෙඩියක් හටගනී.

511. "එතෙක් දිගු කලක් ගොස් පල ඇතිවූ කල්හි ඒ පලය දෙවියෝ ඇසුරුකරත්. මෙසේ ඒ ආසාවතී නම් උතුම් ලතාව දෙවියන්ට ප්‍රියවන්නේය.

512. "කල්ප ලක්ෂයක පටන් මම ඒ බුදු රජාණන් වහන්සේ ඇසුරුකරමි. උදේ හවස නමදිමි. දෙවියෝ ආසාවතී ලතාව ඇසුරු කරන්නාක් මෙනි.

513. "(බුදුරජාණන් වහන්සේට කරන) පාරිචරියාව වත්පිළිවෙත් කිරීම) නොවඳය, නමස්කාරය නොසිස්ය. සසර බොහෝ දුර සිට ආවාවූ මම ඇතිවූ මේ බුද්ධොත්පාදක්ෂණය මා ඉක්මවා නොගියේය.

514. "මම පරීක්ෂාකොට බලන්නේ භවයෙහි ප්‍රතිසන්ධියක් නොදකිමි. (එසේම) මම (ස්කන්ධ කිලෙස) උපධි රහිතවූයේ සියලු කෙලෙසුන්ගෙන් මිදුනේ සන්සිඳුනේ හැසිරෙමි.

515. "පියුම් වනාහි යම්සේ හිරුරැස් කරණකොටගෙන පිපේද, එසේම මහා වීරයන් වහන්ස, මමද බුදුරැසින් පිපෙන ලදුයේ වෙමි.

**516.** "යම්සේ බලාකායෝනියෙහි (කොක් ජාතියෙහි) හැමකල්හි පිරිමි සත්තු විද්‍යමාන නොවෙද්ද. ඒ කෙකින්නියෝ හැමවිටම මේඝගර්ජනා කරන කල්හි ගැබ් ගනිත්.

**517.** "යම්තාක් කල් වැඩිකොටස්ද (ඒතාක්) දීර්ඝ කාලයක් නමුදු (කෙකින්නියෝ) ගැබ් දරත්. යම් කලෙක්හි වැසිවසීද, එකල්හි (ගැබ්) බරින් මිදෙත්.

**518.** "ධර්මය නැමැති මේඝයෙන් ගර්ජනය කරන්නාවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ ධර්ම මේඝයගේ ශබ්දය කරණකොටගෙන මම දහම් ගැබ්ගනිමි.

**519.** "කල්ප ලක්ෂයක පටන්ම මම (රැස්කළ) පින් නැමැති ගැබ් දරමි. ධර්ම නැමැති මේඝය ගර්ජනා නොකෙරෙන කල්හි (එම ගැබ්) බරින් නොමිදෙමි.

**520.** "ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්ස, යම් කලෙක්හි ඔබ වහන්සේ රම්‍යවූ කපිලවත්පු නගරයෙහි ධර්ම මේඝයන් ගර්ජනය කෙරෙහි නම් මම (මෙම පින් ගැබ්) බරින් මිදුනේ.

**521.** ("ආත්මදෘෂ්ටි විරහිත බැවින්) ශුන්‍යතවූ (ක්ලේශ නිමිත්ත රහිත බැවින්) අනිමිත්තවූ (තෘෂ්ණා ප්‍රණිධි රහිත බැවින්) අප්පණිහිතවූ විමොක්ෂ ධර්මයන්ද, චතුර්විධ ශ්‍රමණ පලයිද, යන මේ සියලු ධර්මයන් (ඉපදවීමි) මම මෙසේ සියලු ධර්මයන් පිළිබඳ අවුල් සමූහය නිරවුල් කෙළෙමි.

**(දෙවෙනි බණවර නිමි.)**

**522** "පමණ නොකළ හැකි කාලයක පටන් ඔබ වහන්සේගේ මේ සසුන පතමි. මා පැමිණෙන ලද එම (ප්‍රාර්ථනා සංඛ්‍යාත) අර්ථ ඇත්තේ පැමිණෙන ලද ශාන්ති පදයවූ නිවණද ඇත්තේ වෙමි.

**523.** "(පදුමුත්තර බුදු සසුනෙහි) පාඨික භික්ෂුව මෙන් විනයෙහි තෙරපතුයේ මට සමාන අනිකෙකුදු නැත. මම සසුන (ඔවාදශාසනය) දරමි.

**524.** "විනයෙහිද භික්ෂු භික්ෂුණී සංඛ්‍යාත උභතොවිභංගයෙහි) ඛන්ධකයෙහිද (චුල්ලවග්ග මහාවග්ග) දෙක්හි තික සංඝාදිසෙස තික පාචිත්තයාදියෙහිද පස්වැනිවූ

පරිවාරයෙහිද යන මෙහි (විනය පිටකයෙහි) අකුරක හෝ ව්‍යඤ්ජනයක හෝ මාගේ සැකයක් නැත.

**525.** "(පාප භික්ෂූන්ට) නිග්‍රහ කිරීමෙහිද (සාපත්තික භික්ෂූන්ට පරිවාස දානාදියෙන්) ප්‍රතිකර්ම කිරීමෙහිද කරුණෙහි නොකරුණෙහි දක්ෂවූයේ (තර්ජනීයාදි කර්මයන්ගේ පටිප්පස්සද්ධි වශයෙන් සසුනට ඇතුළු කරගන්නා) ඔසාරණයෙහිද ඇවතින් නැගුටුවාලන වුඨාපනයෙහිද යන මේ සියල්ලෙහි පරතෙරට පැමිණියේ වෙමි.

**526.** "(උභතො විභංග නම්) විනයෙහිද (චුල්ල වග්ග මහා වග්ග නම්) ඛන්ධකයෙහිද මම සුදුසු පදය බහා (විභංග ඛන්ධක) දෙකින් නිරවුල් කොට (ක්‍රම දක්වා) කෘත්‍යවශයෙන් (සුදුසු අදහස) ඇතුළත් කරමි.

**527.** "නිරුත්තියෙහි (ව්‍යවහාර වචනයන්හි නියම අර්ථ කීමේ ක්‍රමය) ඉතා දක්ෂවූයේ අභිවෘද්ධිය පරිහානිය යන මේ දෙක්හිද ඡේකවූයේ (ත්‍රිපිටකයෙහි) මා විසින් දැනනොගන්නා ලද්දක් නැත. බුද්ධ ශාසනයෙහි (මමම) අසහායවූ අග්‍රවිනය ධරයා වෙමි.

**528.** "මම අද ශාක්‍ය පුත්‍රවූ බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි (විනය විනිශ්චය, විදර්ශනා නම්) රූප දර්ශනයෙහි සියලු සැක දුරුකරමි. සියලු කුකුස් සිඳිමි.

**529.** "පෙර පසු පදද (එක එක) අකුරුද (සිථිල ධනිතාදි) දශවිධ ව්‍යඤ්ජන විධානයද (තෙන සමයෙන) යනාදි නිදානයද නිගමනයද යන මේ සියල්ලෙහි මම දක්ෂ වීමි.)

**530.** "යම්සේ බලවත් රජෙක්තෙම සතුරු රජහට නිග්‍රහකොට තවන්නේද, සංග්‍රාමය ජයගෙන එහි නුවරක් ඉදිකරන්නේද (වේනම්)

**531.** "තාප්පයද දිග අගලද ඉන්ද්‍රඛීලයද දොරටුවද විවිධ අටළුද යන බොහෝ දෙය (මේ) නගරයෙහිද කරවන්නේය.

**532.** "සිව්මං ඇතුළු වීථිද මැනවින් බෙදන ආපනශාලාවන්ද (එසේම) එහි වරද නිවරද විනිශ්චය කරන අධිකරණ ශාලාවද කරවන්නේය.

533. "හෙතෙම පස මිතුරන් නැසීම පිණිස දොස් නිදොස් දැනගැනීම පිණිසද භට (සේනා) සමූහය රැකීම පිණිසද සෙන්පතියෙකු තබයි.

534. "හෙතෙම මාගේ භාණ්ඩයන් විනාශ නොවේවායයි රාජ භාණ්ඩයන්ගේ ආරක්ෂාව පිණිස (ධනය) තැන්පත් කිරීමෙහි දක්ෂවූ පුරුෂයෙකු භාණ්ඩාගාර ආරක්ෂකයා කොට තබයි.

535. "යමෙක් රජුට මමත්වය ඇත්තේවේද, යමෙක් ඒ රජුගේ අභිවෘද්ධිය කැමති වේද, ඒ මිත්‍රයාහට (ධර්මානුකූලව පිළිපැදීමට අධිකරණය (විනිශ්චයකාර පදවිය) දෙමි.

536. "හෙතෙම (උල්කාපාත දික්දාහාදිභූත විකෘතීන් පිළිබඳ වැඩ අවැඩ දැනගන්නා) උත්පාත ශාස්ත්‍රයෙහිද මූසිකච්ඡින්න (මීයන් කැපීම) ආදියෙහි වැඩ අවැඩ දැනගන්නා නිමිති ශාස්ත්‍රයෙහිද (ස්ත්‍රී පුරුෂයන්ගේ අංග ලක්ෂණ බලා ජීවිතය පිළිබඳ තොරතුරු පවසන) ලක්ෂණ ශාස්ත්‍රයෙහිද දක්ෂවූ (බොහෝ ශිෂ්‍යයන්ද) වේදහදාරවන්නාවූ වේදත්‍රය සංඛ්‍යාත) මන්ත්‍ර දරන්නාවූ පුරුෂයෙකු පුරෝහිත තනතුරෙහි තබයි.

537. "මේ අංගයන්ගෙන් යුක්තවූයේ ක්ෂත්‍රියයායයි කියනු ලැබේ. (ඒ සේනාවෝ) ස්වකීය ඤාතීන්වූ) දුඃඛිතියන් රකිනා සක්වා ලිහිණියා මෙන් හැමකල්හි රජතුමා රකිත්.

538. "මහා වීරයන් වහන්ස, එසේම ඔබ නසන ලද සතුරන් ඇති රජෙකු මෙන් දෙවියන් සහිත ලෝකයෙහි ධර්ම රාජ (දහම්රජ) යයි කියනු ලැබේ.

539. "තීර්ථකයන්ද, සේනා සහිතවූ මාරයාද නසා ඝන මොහාන්ධකාරය දුරුකොට ධර්ම නගරය මැවීය.

540. "ප්‍රාඥයන් වහන්ස, ඒ ධර්ම නගරයෙහි ප්‍රාකාරය ශීලයයි. දොරටු කොටුව ඔබ වහන්සේගේ ඥානයයි. ඉන්ද්‍රඛීලය ඔබවහන්සේගේ ශ්‍රද්ධාවයි. ද්වාරපාලයා නම් සංවරය වෙයි.

541. "අටල්ල සතිපට්ඨානයයි, සර්වඥයන් වහන්ස ඇතුළු වීථිය ඔබවහන්සේගේ ප්‍රඥාවය. සිව්මංසල ඍද්ධිපාදයයි (මේ ධර්ම නගරය) සත්තිස් බෝධිපාක්ෂික ධර්ම නැමැති වීථීන්ගෙන් මැනවින් නිර්මිත කරන ලදී.

**542.** "සූත්‍රය අභිධර්මය විනය යන සම්පූර්ණ නවාංග බුද්ධ වචනය ඔබගේ (නගරයෙහි) අධිකරණ සභාවයි.

**543.** "අනත්තානු පස්සනාවෙන් ලබන ලද) සුඤ්ඤත විහාරයද (අනිච්චානුපස්සනාවෙන් ලබන ලද) අනිමිත්ත විහාරයද (දුක්ඛානුපස්සනාවෙන් ලබන ලද) අප්පණිහිත විහාරයද (නිශ්චලවූ සතර ශ්‍රාමණ්‍ය පල සංඛ්‍යාත) අනෙජ විහාරයද (සියලු දුක් වැළැක්වීම නම්වූ) නිර්වාණයද යන මේවා ඔබවහන්සේගේ ධර්ම කුටීහු වෙති.

**544.** "ප්‍රඥාවෙන් අග්‍රස්ථානයෙහි තබන ලද වැටහීමෙහි දක්ෂවූ නමින් ශාරිපුත්‍ර (නම් ශ්‍රාවක) තෙමේ ඔබවහන්සේගේ ධර්ම සේනාපතියා වෙයි.

**545.** "සර්වඥයන් වහන්ස, චුතුපපාත ඥාණයෙහි දක්ෂවූ ඍද්ධියෙහි පරතෙරට පැමිණි නමින් කොලිත (නම් ශ්‍රාවක) තෙමේ ඔබවහන්සේගේ පෙරෙවියා (පුරෝහිතයා) වෙයි.

**546.** "මුනීන්ද්‍රයන් වහන්ස, පෞරාණික වංශය දරන්නාවූ උග්‍රවූ තේජස් ඇති (ගුණධර්මයන්ගෙන්) ලංවිය නොහැක්කාවූ ධුතවාදීවූ ආශ්‍රිත ගුණයෙන් අග්‍රවූ මහාකාශ්‍ය ස්ථවිරයන් වහන්සේ ඔබ වහන්සේගේ අක්ඛදස්ස (හෙවත් ව්‍යවහාර කරණයෙහි ප්‍රධානය)

**547.** "බුදුරජාණන් වහන්ස, ශාසනයෙහි බහුශ්‍රැත ධර්මධරවූ සියලු අධ්‍යයනය කරන්නාවූ භික්ෂූන්ට අග්‍රවූ නමින් ආනන්ද (නම් ශ්‍රාවක තෙමේ ඔබ වහන්සේගේ ධර්ම (භාණ්ඩාගාර) ආරක්ෂකයා වෙයි.

**548.** "භාග්‍යවතුන් වහන්සේ මේ සියලු ශ්‍රාවකයන් ඉක්මවා මා පමණ කළසේක. විනයෙහි විනය දත් නැණවතුන් විසින් ප්‍රකාශ කරණ ලද දොෂ විචාරණය මටම පැවරූසේක.

**549.** "යම්කිසි බුද්ධ ශ්‍රාවකයෙක් තෙම විනය ධර්ම විෂයෙහි ප්‍රශ්නයක් විචාරාද එහි මාගේ විමතියක් නැත. මම එම අදහසම කියමි.

**550.** "බුද්ධ ක්ෂෙත්‍රය (ආණ ක්ෂෙත්‍රය) යම් පමණ තන්හි පැතිරේනම්, එපමණ තන්හි ඒ බුදුරජාණන් වහන්සේ හැර විනය පිටකයෙහි (දක්ෂවූ) මා වැනි කෙනෙක් නැත. මට වැඩි කෙනෙක් කොයින් වන්නේද?

551. "ගෞතම බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා මැද හිඳ (උභතො විභංග නම්) විනයයෙහිද (චුල්ල වග්ග මහා වග්ග නම්) ඛන්ධකයෙහිද උපාලි (භික්ෂුව) හා සම කෙනෙක් නැතැයි මෙසේ සිංහනාද කරන සේක.

552. "බුදුරජාණන් වහන්සේ විසින් දේශනාකරන ලද නවාංග ශාස්තෘශාසනය යම්තාක් නම් ඒ සියල්ල විනයෙහි ඇතුළත්ය, විනය මුල්කොට ඇත්තේයයි දකින්නාහට

553. "ගෞතම නම්වූ ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ මාගේ (පූර්ව) කර්මය සිහිකොට භික්ෂු සංඝයා මැද වැඩහිඳ මා එතදග්‍රස්ථානයෙහි තැබූ සේක.

554. "කල්පලක්ෂයක (පමණ කාලයක) පටන් මෙම තනතුරු පැතීමි. මා විසින් පැමිණෙන ලද එම අර්ථ ඇත්තේ විනයයෙහි පරතෙරට පත්වීමි.

555. "මම පෙර ශාක්‍යයනට සොම්නස ඇතිකරන්නාවූ කපුවෙකු වීමි. ඒ කුළය හැර මහර්ෂිවූ බුදුරජාණන් වහන්සේගේ පුත්‍රයෙක් (බුද්ධ පුත්‍රයෙක්) වීමි.

556. "මෙයින් (මේ මහාභද්‍ර කල්පයෙන් දෙවැනි කල්පයෙහි අපමණ තෙද ඇති අනන්තවූ පිරිවර ඇති මහා ධනවත් පෘථිවිපාලකවූ 'අඤ්ජස' නම් රජෙක් වීමි.

557. "පරිවාර මදයෙන්ද භොග මදයෙන්ද ජාති මදයෙන්ද මත්වූ මම එම රජුගේ පුත්‍රවූ 'චන්දන' නම් ක්ෂත්‍රියයා වීමි.

558. "සියළු (ඇත්) අබරණින් අලංකාර කරන ලද්දාවූ ත්‍රිමද ගලිතවූ හස්ති කුලයෙහි උපන් ලක්ෂයක් (පමණ) ඇත්තු නිතර මා පිරිවරත්.

559. "ස්වකීය භටසේනාවන් විසින් පිරිවරණ ලද මම උයනට යනු කැමැත්තේ එකල්හි 'සිරික' නම් ඇතුපිට නැගී නුවරින් නික්මුනෙමි.

560. "පසළොස් චරණ ධර්මයන්ගෙන් යුත් වසන ලද (චක්ෂුරාදි) දොරටු ඇති මැනවින් රැකි කාය චිත්ත ඇති 'දෙවල' නම් පසේ බුදුරජාණන් වහන්සේ මාගේ ඉදිරිපසින් පැමිණි සේක.

561. "එකල්හි 'සිරික' හස්තියා යවා පසේබුදුරජාණන් වහන්සේට කරදර කළෙමි. ඉන් හටගත් කෝප ඇති එම ඇත් තෙමේ පියනුගුළුවයි (නිශ්චලව සිටියි.)

**562.** "මම දූශ්‍ය සිත් ඇති ඇතු දැක බුදුන් කෙරෙහි කෝප කෙළෙමි. පසේ බුදුරජාණන් වහන්සේට පීඩාකොට මම උයනට ගියෙමි.

**563.** "එහි (ඒ නිමිත්තෙන්) හිස ඇවිලගත්තෙකු මෙන් සුවයක් නොවිඳීමි. බිලිය ගිලි මසෙකු මෙන් පසුතැවිලි දැවිල්ලෙන් දැවෙමි.

**564.** "මම සයුර කෙළවරකොට ඇති පෘථිවිය ඇවිල ගත් තාක් මෙන් විය. (මම) පියාගේ සමීපයට එළඹ මේ වචන කීමි.

**565.** "කිපුණු සර්පයකු මෙන්ද පැමිණි ගිනි කඳක් ද දළ ඇති මතැතෙකු මෙන්ද යම් පසේ බුදුවරයන් වහන්සේ කෙනෙකුට ගැටීමද,

**566.** ("අනිකෙකු විසින් නොගැටිය හැකි බැවින්) ඝොරවූ උග්‍රතපස් ඇති පස් මරුන් දිනූ පසේ බුදුරජතෙම මාවිසින් ගටන ලදී. (ඉන්) සියලු දෙනම වැනසෙමු (ඊට) පළමු ඒ පසේ බුදුරජාණන් වහන්සේ ක්ෂමා කොට ගනිමි.

**567.** "ඉදින් චිත්ත දමනය කළ එකඟ සිත් ඇති ඒ පසේ බුදුරජාණන් වහන්සේ ක්ෂමා නොකරන්නෙමු නම් සත් දිනකින් මෙපිට මගේ රට විනාශ වන්නේය.

**568.** "සුමෙඛලය, කොසියය, සිග්ගවය, සත්තුකය යන මේ (සිව්) රජවරු ඍෂිනට ගටා (අනදර) කොට ඔව්හු ස්වකීය රටවල් සමග දුකට පත්වූහ.

**569.** "කාය සංයමයෙන් යුත් බ්‍රහ්මචාරීවූ ඍෂීහු යම් කලෙක්හි කිපෙත්ද, (එකල) සයුරු පර්වත සහිතවූ දෙවියන් සහිත ලෝකය වැනසෙත්.

**570.** "තුන් දහසක් යොදුන් තන්හි පුරුෂයන් රැස් කරවීමි. වරද පැවසීම (ඇවැත් දෙසීම) සඳහා පසේ බුදුරජාණන් වහන්සේ වෙත එළඹියෙමි.

**571.** "තෙත්වූ වස්ත්‍ර ඇත්තාවූ තෙත්වූ කෙස් ඇත්තාවූ සියල්ලෝම බඳින ලද ඇඳිලි ඇත්තාහු බුදුරජාණන් වහන්සේගේ පාමුල වැටී මේ වචන කීවාහුය.

**572.** "මහාවීරයානෙනි, ඔබ සමාවනු මැනවි. ජන සමූහයා එය විශේෂයෙන් ආයාචනය කරයි. පරිලාහය (දැවිල්ල) දුරුකරනු මැනවි. අප නොනසනු මැනවි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

573. "දෙව්මිනිසුන් සහිතවූ අසුරයන් හා රාක්ෂයන් සහිතවූද සියල්ලෝ හැමකල්හි යකුලින් මාගේ හිස පළන්නාහුය.

574. "දියෙහි ගිනි නොසිටී. ගලෙහි බිජුවට පැළ නොවේ. බෙහෙතෙහි කෘමි තෙමේ නොසිටී. (එසේම) බුදුරජුන් කෙරෙහි කෝපය හට නොගනී.

575. "යම්සේ පොළොව නොසෙල්විය හැකිද, මහ සයුර පමණ කළ නොහැකිද, අහස කෙළවරක් නැත්තේද, එසේම බුදුවරයෝ නොකැළඹිය හැක්කේය.

576. "මහාවීරවූ බුදුවරයෝ හැමකල්හි ඉවසීම ඇත්තෝය (අනුන්ගේ වැරදි) ඉවසන්නාහු තපස්වීහුය. ඉවසීමෙන් යුත් වූවන්ගේද, ඉවසන්නවුන්ගේද (ඡන්දාදීන්වූ) එබඳු (අගති) ගමනක් නොවේ.

577. "ප්‍රත්‍යෙක සම්බුද්ධ තෙමේ (ඔවුන්ගේ) සන්තාපය දුරුකරමින් මෙය වදාරා එකල්හි මහජනයාගේ ඉදිරියෙහි අහසට නැංගේය.

578. "ප්‍රාඥයන් වහන්ස, මම එම කර්මය කරණකොට ගෙන පහත් (කපු) බවට එළඹියේ ඒ (පහත්) කුලය හැර දමා අභය පුරය (නිවනට) පැමිණියෙමි.

579. "මහාවීරයන් වහන්ස, එකල්හි දැවෙන්නාවූ (වරද වරද ලෙස පිළිගෙන) මැනවින් සිටියාවූ මා (දැක) සන්තාපය දුරු කෙළේය. (එම) බුදුරජාණන් වහන්සේද ක්ෂමා කරවීය.

580. "මහාවීරයන් වහන්ස, (රාග-ද්වේෂ-මොහ) ත්‍රිවිධාග්නීන්ගෙන් දැවෙන්නාවූ මා අදද නිවීය. (එම) ත්‍රිවිධාග්නිය සිසිල් බවටද පැමිණවීය.

581. "යම් කෙනෙකුගේ කන්යොමු කිරීමක් ඇත් නම් කියන්නාවූ මාගේ (වචනය) අසව්, නිර්වාණ පදය මා දක්නා ලද පරිදි (එම නිර්වාණ සංඛ්‍යාත) අර්ථය තොපටද කියමි.

582. "ශාන්ත සිත් ඇති එකඟවූ ඒ පසේ බුදුරජාණන් වහන්සේට අවමන්කොට මම ඒ කර්මය හේතුකොට ගෙන පහත් (කපු) කුලයෙහි උපන්නෙමි.

583. "තෙපි (මේ බුද්ධොත්පාදය) ක්ෂණය නිෂ්පල නොකරව්. ඒ එසේ මැයි. (බුද්ධොත්පාද) ක්ෂණය ඉක්ම වූවෝ

ශෝක කෙරෙත්. ස්වකීයාභිවෘද්ධියෙහි වැයම් කරව්. තොප විසින් පැමිණෙනලද බුද්ධොත්පාද ක්ෂණ ඇත්තෝය.

584. "ඇතැම් අයට වමනයද සමහරුනට විරෙචනයද එසේම ඇතැමුන් හට හළාහල විෂයද ඖෂධවේ.

585-586 "(එසේම) මාර්ග සමංගී පුද්ගලයනට සංසාරය මිදීමද ඵලස්ථයනට සංසාරය විශෙෂයෙන් අත් හැරීමද ඵල ලබා සිටිනවුනට නිර්වාණයද (දිව්‍ය මනුෂ්‍ය නිර්වාණ සම්පත් සොයන්නවුනට පුණ්‍ය ක්ෂෙත්‍රවූ සංඝයාද සසුන හා විරුද්ධ) වූවනට විෂවූ කුතුහලය හෙවත් පවට පෙළඹුනු ගතියද ඖෂධයයි. ආසී විස සර්පයාද දිට්ඨ විස සර්පයාද යම්සේ නම් එසේම ඒ (ශාසනවිරොධී) මනුෂ්‍යයා (පවට පෙළඹුනු ගතිය නැමැති (විෂයෙන්) දවයි.

587. "වරක් පානය කළ හළාහල විෂය ජීවිතය විනාශ කෙරෙයි (එසේම) සසුන හා විරුද්ධවූ (ඒ පව්ටු මිනිසා) කප් කෙළ ගණනක් දැවේ.

588. "ක්ෂාන්තියෙන්ද අවිහිංසාවෙන්ද මෙත් සිත් ඇති බැවින්ද ඒ බුදුරජාණන් වහන්සේ දෙවියන් සහිත ලෝකයා (සසර සයුරෙන්) එතෙර කරන සේක. එහෙයින් (උන්වහන්සේට) තොප විසින් විරුද්ධ නොවිය යුතුයි.

589. "බුදුවරයෝ මහා පොළව වැනියහ. ලාභ අලාභ දෙක්හිද සම්මානන අවමානන දෙක්හිද නොලැහෙත්. එහෙයින් උන්වහන්සේලා තොප විසින් විරුද්ධ නොවිය යුත්තෝය.

590. "බුදුරජාණන් වහන්සේ වධකවූ දේවදත්ත කෙරෙහිද චෞරවූ අංගුලිමාල කෙරෙහිද (මත්වී ඉදිරියට ආ) ධනපාල හස්තියා කෙරෙහිද (ඖරස පුත්‍රවූ) රාහුල කෙරෙහිද යන මේ සියලු දෙනාහට සම මෙත් ඇතිසේක.

591. "මොවුන්හට පටිඝය (තරහ) ක් නැත. එසේම මොවුනට රාගය (ඇලීමක්) නැත. සර්වඥ තෙමේ (මැරීමට ආ) වධකයාටද (තමාගේම) ඖරස පුත්‍රයාටද සම මෙත් ඇත්තේය.

592. "මග අතහැර දැමූ අසූචි වැකුණු කසාවත (සිවුර) දැක ඍෂිධ්වජයයි මුදුනෙහි ඇඳිලි බැඳ වැඳිය යුතුය.

593. "අතීතයෙහිවූද වර්තමානයෙහිවූද අනාගතයෙහිවූද යම් බුදු කෙනෙක් වෙත්නම් මේ ඍෂිධජයෙන් (සිවුරෙන්) පිරිසිදුවෙත්. එහෙයින් මේ බුදුවරයෝ වැඳිය යුත්තාහුය.

594. "බුදුරජාණන් වහන්සේ මෙන්ම මනා විනය මම සිතින් දරමි. හැමකල්හි විනය පිටකයට නමස්කාර කරමින් වසන්නෙමි.

595. "මාගේ ගෘහය විනයයි. සිටින තැනද සක්මන් කරන තැනද විනයයි. විනයයෙහි (දැරීම්, පැවැත්වීම්) වශයෙන් වාසය කරමි. විනය පිටකය මාගේ ගොචරයයි.

596. "විනයයෙහි පරතෙරට පැමිණියාවූ අධිකරණ සමථයෙහිද දක්ෂවූ උපාලි තෙමේ මහාවීරයන් වහන්ස, ශාස්තෘවූ ඔබ වහන්සේගේ දෙපා වඳියි.

597. "ඒ (උපාලිවූ) මම ධර්මය පිළිබඳ සුන්දර බව දැන එම ධර්මයටද සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේටද වඳිමින් ගමින් ගමටද නගරයෙන් නගරයටද (යමි) මා විසින් කෙලෙස් දවනලදී. සියලු භව සමූලඝාතනය කරනලදී. සියලු ආශ්‍රවයෝ ක්ෂය කරන ලදහ.

598. "මා විසින් ක්ලේශයෝ දවන ලදහ (නව) භවයෝ සමූලඝාතනය කරන ලදහ. සියළු ආශ්‍රවයෝ ක්ෂය කරන ලදහ. දැන් නැවත ඉපදීමක් නැත.

599-600. (මෙහි 372-373 ගාථා යොදන්න)

මෙහි මේ අයුරින් ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේ මෙම ගාථාවන් දේශනා කළසේක.

**(උපාලි ථෙරාපදානය සවැනියි)**

---

### 7. අඤ්ඤාත කොණ්ඩඤ්ඤ ථෙරාපදානය

601. "(සකළ සත්ව) ලෝකයෙහි ජ්‍යෙෂ්ඨවූ (විශේෂයෙන් විනෙය්‍ය සත්වයන් සසර සයුරින් එතෙරට පමුණුවන බැවින්) විනායකවූ බුදු පදවියට පත් පදුමුත්තර සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ මම පළමුකොට දුටිමි.

602. "බෝමුලෙහි යම් පමණ සත්වයෝ රැස්වූවාහුද ඒ සියල්ලෝ බැඳැඳිලි ඇත්තාහු බුදුරජුන් පිරිවරා වඳිත්.

**603.** "මෙතෙම ලබනලද බුදුබව ඇත්තේ මොහාන්ධකාරය දුරුකෙරේයයි සතුටු සිත් ඇති ඒ සියලු දෙවියෝ අහසෙහි හැසිරෙත්.

**604.** "සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේගේ සසුනෙහි කෙළෙස් දවමුයයි සතුටින් යුත් මහා නාදය පවතී.

**605.** "වචනය සමගම කියනලද දෙවියන්ගේ ශබ්දය අසා මම සතුටුවූයේ සතුටු සිතින් ප්‍රථම භික්ෂාව දුනිමි.

**606.** "මාගේ අදහස දැන ලෝකයෙහි අනුත්තරවූ ශාස්තෘන් වහන්සේ දිව්‍ය සමූහයා මැද හිඳ මෙම ගාථාවන් වදාළසේක.

**607.** "අභිනිෂ්ක්‍රමණය කොට සතියකින් මම සම්‍යක් සම්බොධියට පැමිණියෙමි. බ්‍රහ්මචාරීව මාගේ (සිරුර) යැපෙන මෙය පළමුදානයයි.

**608.** "යමෙක් තුසිත දෙව්ලොව සිට මෙහි අවුත් මට භික්ෂාව පිළිගැන්වීද මම ඔහු ගැන කියන්නෙමි. එසේ කියන්නාවූ මාගේ වචනය අසව්.

**609.** "කල්ප තිස්දහසක් දිව්‍ය රාජ්‍යය කරන්නේය. සියළු දෙවියන් අභිභවනය කොට දෙව්ලොව වසන්නේය.

**610.** "දෙව්ලොවින් චුතව මිනිසත් බවට යන්නේය. එහි දහස් වරක් රාජ්‍යය කරන්නේය.

**611.** "(මින්) කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ ගෝත්‍රයෙන් ගෞතම නම්වූ ශාස්තෘන් වහන්සේ ලොව පහළවනසේක.

**612.** "මෙතෙම දෙව්ලොවින් චුතව මිනිසත් බවට යන්නේය. ගිහිගෙන් නික්ම පැවිදිව සවසක් (දුෂ්කර ක්‍රියා කරමින්) වසන්නේය.

**613.** "ඒ අභිනිෂ්ක්‍රමණයෙන් සත්වැනි වර්ෂයෙහි බුදුරජ තෙම සත්‍ය (ධර්මය) දේශනා කරන්නේය. නමින් කොණ්ඩඤ්ඤ නම් තැනැත්තේ පළමුකොට (ධර්මය) ප්‍රත්‍යක්ෂ (අවබෝධය) කරන්නේය"

**614.** (ගෘහාභිනිෂ්ක්‍රමණය කළ) බෝසතුන් හා (නික්ම) ඒ අනුව පැවිදිවීමි. මා විසින් වීර්යය මැනවින් කරණලදී. කෙලෙස් දැවීම පිණිස (අනගාරිය නම්) සසුනෙහි පැවිදිවීමි.

**615.** "දෙවියන් සහිත ලෝකයෙහි (සියළු දතයුතු ධර්මයන් අවබොධ කොට) සර්වඥවූ බුදුරජ මිගදාය නම් ඉසිපතනයට එළඹ (එහිදී) අමාබෙරය ගැසීය.

**616.** "ඒ මම දැන් ශාන්තවූ නිරුත්තර පදයවූ නිවණට පැමිණියේ සියලු ආශ්‍රවයන් (පහාණ පරිඥ්ඥාවෙන්) ප්‍රහාණය කොට ආශ්‍රව රහිතව වෙසෙමි.

**617, 618, 619.** කෙලෙස් දවනලදී. (මෙහි 371, 372, 373 යොදන්න) බුදුරජාණන් වහන්සේගේ ශාසනය කරනලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් අඤ්ඤාත කොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේ මේ ගාථාවන් දේශනා කළසේක.

**(අඤ්ඤාත කොණ්ඩඤ්ඤ ථෙරාපදානය සත්වැනියි.)**

**8. පිණ්ඩොල භාරද්වාජ ථෙරාපදානය**

**620.** "අග්‍රපුද්ගලවූ තෙමේම සියල්ල අවබොධ කළාවූ පදුමුත්තර නම් බුදුරජාණන් වහන්සේ එකල්හි හිමවතට ඉදිරිපසවූ චිත්‍රකුට පර්වතයෙහි විසීය.

**621.** "බොහෝ ජනයා යමෙකුගේ ශබ්දය අසා විශේෂයෙන් කැළඹෙත්ද එහි (මම එබඳු) නිර්භය ස්වභාව ඇති සිව් දිගින් යාමට සමත් සිංහයෙක් වීමි.

**622.** "මනාව පිපුණු පියුමක් ඩැහැගෙන නරශ්‍රෙෂ්ඨවූ බුදුරජාණන් වහන්සේ වෙත එළඹියෙමි. සමාධියෙන් නැගී සිටියාවූ තථාගතයන් වහන්සේට (එය) පිදීමි.

**623.** "මම සිව් දිගෙහි සිට මනුෂ්‍යොත්තමවූ බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට නමස්කාරකොට සිය සිත පහදවා සිංහනාද කෙළෙමි.

**624.** "පූජා සත්කාර පිළිගන්නාවූ හෙවත් පූජාසත්කාරයනට ගෙයක් වැනිවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ සිය අසුනෙහි හිඳ මෙ ගාථාවන් වදාළසේක.

**625.** "(අපි බුදුන් වෙමුයි) කියන්නවුනට ශ්‍රෙෂ්ඨවූ බුදුරජතෙම පැමිණියේය. අපි (උන් වහන්සේගේ) එම ධර්මය අසමුයයි සියලු දෙවියෝ සර්වඥයන් වහන්සේගේ වචනය දැන රැස්වූහ.

**626.** "ලෝකනායකවූ දීර්ඝ දර්ශීවූ බුදුරජාණන් වහන්සේ ඒ ප්‍රීතියෙන් යුක්තවූ ඔවුන් ඉදිරියෙහි මාගේ ශ්‍රද්ධාව ප්‍රකාශ කළ සේක.

**627.** "යමෙකු විසින් මේ පියුම් දෙන ලදද සිංහ නාදය කරන ලදද මම ඔහු පිළිබඳ තොරතුරු කියන්නෙමි. (එසේ) කියන්නාවූ මාගේ වචනය අසව්.

**628.** "මෙයින් අටවෙනි කල්පයෙහි සත්රුවන් සහිතවූ සතරමහා දිවයිනෙහි අධිපතිවූ සක්විති රජෙක් වන්නේය.

**629.** "සූසැට ජාතියෙක පෘථිවියෙහි අධිපතිවූ (රජ) බව කරන්නේය. මහා බල ඇති තමන් පදුම නම්වූ සක්විති රජවන්නේය.

**630.** "කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ ගොත්‍රයෙන් ගෞතම නම් වන්නාවූ ශාස්තෘන් වහන්සේ ලොව පහළවන සේක.

**631.** "(එකල්හි හෙතෙම) බ්‍රාහ්මණයෙක් වන්නේය. (ගෞතම) බුදුරජාණන් වහන්සේ දහම් දෙසූ කල්හි බ්‍රාහ්මණ කුලයෙන් නික්ම එකෙණෙහි පැවිදි වන්නේය.

**632.** "වීර්ය කිරීම පිණිස මෙහෙයන ලද සිත් ඇත්තේ උපශාන්තවූ (ක්ලේශ රහිත බැවින්) නිරුපධිවූ හෙතෙම සියලු ආශ්‍රවයන් ප්‍රහීණකොට ආශ්‍රව රහිතවූයේ පිරිනිවන් පාන්නේය.

**633.** "චණ්ඩ මෘගයන්ගෙන් ගැවසීගත් ජන සම්බාධ රහිත දුර අරන් සෙනසුන්හි (වැස) සියළු ආශ්‍රවයන් ප්‍රහීණ කොට ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය.

**634, 635, 636.** කෙලෙස් දවන ලදී (මෙහි 371, 372, 373 යොදන්න) බුදුරජාණන් වහන්සේගේ ශාසනය කරන ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජ තෙරුන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක.

**(පිණ්ඩොලභාරද්වාජ ථෙරාපාදානය අටවැනියි)**

---

## 9. ඛදිරවනිය රෙවත ථෙරාපදානය

**637** "හිමවතින් හටගත් භාගීරථී නම් ගංගාවක් තොමෝ වූවාය. මම (එහි) (සැඩ රළවේගයෙන් යුත්) විෂම තීර්ථයක (කෙවුල් කුලයෙහි උපන්නාවූ) නැවියෙක් වීමි.

**638.** "පදුමුත්තර බුදුරජතෙම රහතුන් දහසක් සමග ගංගාවෙහි සැඩපහර තරණය කරන්නේයයි පෙර මාගේ ඇසීම විය.

**639.** "බොහෝ නැව් එකතට පමුණුවා (නැව් දෙක දෙක එක්කොට තැනූ) නැවෙහි වඩුවන් ලවා මැනවින් පියසි කොට බුදුරජාණන් වහන්සේ පිදීමි.

**640.** "බුදුරදතෙම පැමිණි එම උතුම් නැවට නැංගේය. (නැව් නැගි) දිය මැද සිටියාවූ බුදුරජාණන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක.

**641.** "යමෙක් තෙම සම්‍යක් සම්බුදු රජද ආශ්‍රව රහිතවූ රහත්) සංඝයාද තරණය කරවී නම් හෙතෙම එම චිත්ත ප්‍රසාදය කරණ කොටගෙන දෙව්ලොවෙහි සිත් අලවා වාසය කරන්නේය.

**642.** "ඔබහට මැනවින් කළ නැවෙහි සටහන් ඇති විමානයක් (දෙව්ලොව) පහළ වන්නේය. හැමකල්හි අහසෙහි මල්වියනක්ද දරන්නේය.

**643.** "(මින් අට පණස් කපකින් මත්තෙහි සතර මහා දිවයිනට අධිපතිවූ දිනනසුළුවූ තාරක නම් සක්විති රජෙක් වන්නේය.

**644.** "(මින්) සත් පණස්වන කපෙහි මහ බල ඇති චම්පක නම් ක්ෂත්‍රිය තෙමේ උදාවන්නාවූ හිරු මෙන් බබළන්නේය.

**645.** "කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ ගොත්‍රයෙන් ගෞතම නම් වන්නාවූ ශාස්තෲන් වහන්සේ ලොව පහළ වන සේක.

**646.** "හෙතෙම (එකල) දෙව්ලොවින් චුතව මිනිසත් බවට යන්නේය. නමින් රේවතවූ බමුණෙක්ද වන්නේය.

**647.** "කුශල මූලයන්ගෙන් මෙහෙයන ලදුයේ ගිහිගෙන් නික්ම ගෞතම බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි පැවිදි වන්නේය.

**648.** "පැවිදිව පසුව හෙතෙම භාවනායෝගයන්හි යෙදුනේ විදර්ශනා කරන්නේ සියලු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥාවෙන්) දැන ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය.

**649.** "නිර්වාණ සංඛ්‍යාතයොග ක්ෂෙමයට පමුණුවන ධුර වාහකයා (ගැල්බර උසුලන ගවයා මෙන් මාගේ වීර්යය වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

(මම මේ) සර්වඥ ශාසනයෙහි අන්තිම ශරීරය දරමි. (අන්තිම ආත්මයයි)

**650.** "මා විසින් කල්ප ලක්ෂයකට පෙර කරණ ලද කර්මය මෙහිදී විපාක දැක්විය. දුනුදියෙහි මැනවින් මිදුනු හී වේගය මෙන් (එම කර්මය) මාගේ කෙලෙස් දැවීය.

**651.** "ඉක්බිති ලොකාන්තයට ගිය මහ නුවණැති බුදුරජාණන් වහන්සේ වන සෙනසුනෙහි ඇළුනාවූ මා දැක වනවාසී භික්ෂූන් අතුරෙන් අගතන්හි තබා වදාළ සේක.

**652.** "සිව් පිළි සිඹියාවෝද (මෙහි 371-372-373 යොදන්න) බුදුරජාණන් වහන්සේගේ සසුන කරන ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් ඛදිර වනිය රෙවත තෙරුන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

**(ඛදිරවනිය රෙවත ථෙරාපදානය නවවැනියි.)**

---

## 10 ආනන්ද ථෙරාපදානය

**653.** "පදුමුත්තර බුදුරජතෙම අරම් දොරින් නික්ම අමාවැසි වස්වන්නේ මහාජනයා සන්සිඳවිය. (නිවණට පැමිණ විය.)

**654.** "ෂඩභිඥා ඇත්තාවූද මහා ඍද්ධි ඇත්තාවූද ලක්ෂයක් පමණවූ ඒ ක්ෂීණාශ්‍රවයෝ සෙවනැල්ල මෙන් සර්වඥයන් වහන්සේ පිරිවරත්.

**655.** "උතුම් සේසත (මාගේ මස්තකයෙහි දරන්නේ) ඇතුපිට හුන්නේ වෙමි. මනොඥවූ රූප ඇති බුදුරජාණන් වහන්සේ දැක මට ප්‍රීතිය උපන්නේය.

**656.** "ඇතුපිටින් බැස නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත එළඹියෙමි. මාගේ රුවන් මුවා ඡත්‍රය බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට දැරීමි.

**657.** "පදුමුත්තර මහර්ෂි (බුදුරජ) තෙම මාගේ අදහස දැන එම (තමන් වහන්සේගේ දේශනා) කථාව හැර මෙම ගාථාවන් වදාළෝය.

**658.** "ඒ යමෙක් ස්වර්ණාලංකාරයන්ගෙන් සරසන ලද ඡත්‍රයක් දැරීද, ඔහු (පිළිබඳව) ප්‍රකාශ කරන්නෙමි. (එසේ) පවසන්නාවූ මාගේ (වචනය) අසව්.

**659.** "මේ පුරුෂ තෙම මින් (චුතව) ගොස් තුසිතයෙහි වසන්නේය. දිව්‍යප්සරාවන් විසින් පිරිවරණ ලදුයේ සම්පත් අනුභව කරන්නේය.

**660.** "සූතිස් වරක් දිව්‍ය රාජ්‍යය කරන්නේය. (ඉන් චුතව) සිව්රඟ සෙනඟට අධිපතිව එකසිය අටවරක් (පෘථිවි ස්වරව) පොළොවෙහි වාසය කරන්නේය.

**661.** "අටපණස් වරක් සක්විති රජ වන්නේය. පෘථිවියෙහි මහත්වූ ප්‍රදේශ රාජ්‍යය කරවන්නේය.

**662.** "කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ ගෝත්‍රයෙන් ගෞතම නම්වූ ශාස්තෲන්වහන්සේ ලොව පහළ වන සේක.

**663.** "ශාක්‍යකුලයට ධජයක් වැනිවූ බුදුරජාණන් වහන්සේගේ ඥාතිවූ මහර්ෂින් (බුදුන්) වහන්සේගේ උපස්ථායකවූ නමින් ආනන්ද නම් වන්නේය.

**664.** "කෙළෙස් තවන වීර්ය ඇති ප්‍රඥාවත්වූ බහුශ්‍රැත භාවයෙහි දක්ෂවූ නිහතමානී පැවතුම් ඇති තදගති නැති සියල්ලන් හදාරවන (ත්‍රිපිටකධර) කෙනෙක් වන්නේය.

**665.** "වීර්ය කිරීමෙහි මෙහෙයන ලද සිතැති හෙතෙම උපශාන්තවූයේ උපධි රහිතවූයේ සියලු ආශ්‍රවයන් (ප්‍රහාණපරිඥාවෙන්) දැන ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය.

**666.** "(යම්සේ) අරණෙහි උපතින් සැටවසක් ඉක්ම ගිය ත්‍රිමදගලිත මාතංග හස්ති කුලයෙහි ජාතවූ මහත් දළ ඇති රාජවාහනවූ ඇත්තු වෙද්ද,

**667.** "එසේම නොයෙක් ලක්ෂණයන් පණ්ඩිතවූද මහා ඍද්ධිමත්වූද රහත් නාගයෝ වෙත්. සියල්ලෝ බුද්ධ නාගයන් වහන්සේගේ ලක්ෂණය ගත් අය නොවෙති.

**668.** "මුල්යම්හිද මැදියම්හිද පැසුළුයම්හිද නමස්කාර කරන්නෙමි. පහන් සිත් ඇත්තෝ සතුටුවූයේ බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට උවැටන් කෙළෙමි.

**669.** "කෙළෙස් තවන වීර්යයෙන් යුක්තවූයේ ප්‍රඥාවත් වූයේ නො දැනුම් ඇත්තේ සිහියෙන් යුක්තවූයේ ශෛක්ෂ්‍ය භූමියෙහි දක්ෂවූයේ සෝවාන් පලයට පැමිණියේ වෙමි.

**670.** "මෙයින් කල්ප ලක්ෂයකට පෙර යම් කර්මයක් කොට (යමක්) ප්‍රාර්ථනා කෙළෙම් නම් මම ඒ පදවියට පැමිණියේ සසුනෙහි නිශ්චලව සිටියේ වෙමි.

**671, 672.** (මෙහි 371, 372 යොදන්න)

**673.** "මේ සිව් පිළිසිඹියාවෝද අෂ්ටවිමොක්ෂයෝද ෂඩභිඥාවෝද සාක්ෂාත් කරන ලදී. බුදුරජාණන් වහන්සේගේ සසුනද කරනලදී මෙහි මේ අයුරින් ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ මෙම ගාථාවන් වදාළසේක.

**(ආනන්ද ස්ථවිරාපදානය දසවැනියි)**

(මින්පසු සියලු අපදාන අගට 673 නේ සිට ඒ ඒ අපදානවල අග දක්වා යොදාගැනීමේදී අපදාන වදාළ තෙරුන් වහන්සේලාගේ නම්ද යොදාගත යුතුයි.)

---

## 2. සිංහාසන දායක වග්ග.

### 11. සිංහාසනදායක ථේරාපදානය

**674.** "ලොකනාථවූ සිද්ධාර්ථ බුදුරදුන් පිරිනිවි කල්හි ත්‍රිපිටක ධර්මය පැතිරගිය කල්හි බොහෝ ජනයා විසින් දන්නාලද සසුනෙහි,

**675.** "මම පහන් සිතින් සතුටුවූයේ සිහසුනක් කෙළෙමි. (එසේම) මම එම සිත පැහැදවීම කරණකොට ගෙන තුසිත භවනයෙහි උපනිමි.

**676.** "මම සිංහාසනය තෙමෙන කල්හි එහි ගෘහයක්ද කෙළෙමි. (එසේම) මම සිත පැහැදවීම කරණකොටගෙන තුසිත භවනයෙහි උපනිමි.

**677.** "එකෙණෙහි දිගින් සූවිසි යොදුන්වූ පුළුලින් තුදුස් යොදුන්වූ මැනවින් කරණ ලද විමානයක් පහළ විය.

**678.** "දිව්‍යකන්‍යාවන් ලක්ෂයක් හැමකල්හි මා පිරිවරත්. විමානයෙහි මැනවින් නිර්මිත කළ ස්වර්ණමය පර්යංකයක් විය.

**679.** "හස්ති වාහනද, අශ්ව වාහනද, දිව්‍යවාහනද එළඹ සිටියේය. කැමතිපරිදි ප්‍රාසාදයෝද සිවිකාවෝද (දෝලා) පහළ වෙත්.

**680.** "මිණිමුවා පර්යංකයෝද, අනිකුත් රම්‍යවූ බොහෝ පර්යංකයෝද යන සියල්ල මට පහළවෙත්. සිංහාසන දානයාගේ මේ විපාකයයි.

**681.** "රුවන් මුවාවූද, රිදීමුවාවූද, පළිඟුවූවාවූද, වීදුරු මුවාවූද, පාදුකා (පාවහන්) නගිමි. (පළඳිමි) පාදපීඨ (පා පුටු) දානයාගේ මේ විපාකයි.

**682.** "එකල්හි (එනම්) මෙයින් සිව් අනූවන කපෙහි යම් කර්මය කෙළෙම්ද (ඒ කර්ම බලයෙන්) අගතියක් නොදනිමි. මේ පුණ්‍යකර්මයාගේ විපාකයයි.

**683.** "මින් (පෙර) තෙ සැත්තෑවෙනි කපෙහි ඒ ඉන්දු නම් වූ (සක්විති රජවූ) තිදෙනෙක්වූහ. (එසේම) මින් තෙසැත්තෑවෙනි කපෙහි සුමන නම් ඇත්තෝව තෙවරක්ද

**684.** "මින් සම සැත්තෑවන කපෙහි වරුණ නම් ඇත්තෝව තෙවරක්ද, සක්විති රජවූහ (ඔව්හු) සත්රුවනින් යුත් සතර මහ දිවයින්හි අධිපතියෝ වූහ. 685

---

## 12. එකත්ථම්භක ථෙරාපදානය

**686.** "සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේගේ මහත්වූ උපාසක සමූහයා විය. ඔව්හු බුදුරජුන් සරණගියාහු තථාගතයන් වහන්සේ අදහත්.

**687.** "(ඒ) සියල්ලෝ එකතුව මන්ත්‍රණයකොට බුදුරජාණන් වහන්සේට උපස්ථානශාලාවක් කෙරෙත්. (ඒ සඳහා) එක් ටැඹක් නොලබන්නාහු මහවෙනෙහි සොයත්.

**688.** "මම ඒ උවසු සමූහයා වනයෙහිදී දැක (එම) සමූහයා වෙත එළඹ ඇඳිලිබැඳගෙන උවසු සමූහයාගෙන් (මෙසේ) විචාළෙමි.

**689.** "මා විසින් විචාරණලද ඒ සිල්වත් උවසුවෝ මෙසේ පැවසූහ. අපි උපස්ථාන ශාලාවක් කරනු කැමැත්තෙමු. (ඒ සඳහා) එක් ටැඹක් නොලබාය කියායි.

**690.** "එක්ටැඹ මම දෙමි. මම ශාස්තෲන් වහන්සේට දෙන්නෙමි. මට ටැඹ ගෙනඑන්නෙමි. තෙපි (ඒ සඳහා) උත්සාහ නැත්තෝ වෙත්වා.

**691.** "පැහැදුනාවූ සතුටු සිත් ඇති ඔව්හු මට වැඩ පැවරූහ. එම වනයෙන් පෙරළාගොස් ස්වකීය ගෘහයනට පැමිණියාහුය.

**692.** "(උවසු) සමූහයා ගිය නොබෝ වේලාවකින් මම ටැඹක් දුනිමි එකල්හි සතුටුවූ මම සතුටු සිතින් (එය) පළමු කොටම එසවීමි.

**693.** "එය චිත්ත ප්‍රසාදය හේතුකොටගෙන පැනනැගුනා වූ උස්වූ මහල් සියයක් ඇති මාගේ විමානයට මම උත්පත්ති වශයෙන්) ගියෙමි.

**694.** "එකල්හි බෙර වයද්දී මම (දෙව් පිරිස) පිරිවරමි (ඉන්) පස් පනස් වන කපෙහි යසෝධර නම් රජෙක් වීමි.

**695.** "එහිද මට මහල් සියයක් ඇති උඩට නැගුනු උතුම් කුළුගෙවලින්යුත් එක්ටැම් ඇති මනහරවූ භවනයක් විය.

**696.** "එක් විසි වන කල්පයෙහි උදෙන නම් ක්ෂත්‍රියයෙක් විය, එහිදී මට සියයක් මහල් ඇති උස්ව පැනනැංගාවූ භවනයක් විය.

**697.** "යම් යම් දිව්‍ය හෝ මනුෂ්‍යවූ යෝනියක ඉපිද සියලු සුව අනුභව කරමි. මෙය එක්ටැඹ පිදීමේ විපාකයයි.

**698.** "මින් සිව් අනූ වන කපෙහි එකල යම් ටැඹෙක් දුනිම්ද (එහෙයින්) දුගතියක් නොදනිමි. එක්ටැඹ මිදීමේ මේ විපාකයයි. 699

---

## 13. නන්ද ථෙරාපදානය

700. "ලෝක ජ්‍යෙෂ්ඨවූ තාදීගුණ ඇති සියල්ල තෙමේම අවබොධ කරගත්තාවූ මහර්ෂිවූ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේට මා විසින් කොමු වස්ත්‍රයක් පුදනලදී.

**701.** "ඒ (වස්ත්‍රදායකවූ) මට පදුමුත්තර නම් බුදුරජාණන් වහන්සේ මෙසේ ප්‍රකාශකළසේක. 'ඔබ මේ වස්ත්‍ර දානය කරණකොටගෙන ස්වර්ණ වර්ණ වන්නෙහිය.

**702.** "(දිව්‍ය මනුෂ්‍ය නම්වූ) ද්විවිධ සම්පත් අනුභවකොට කුශලමූලයන් විසින් මෙහෙයන ලදුයේ ඔබ ගෞතම බුදුරජාණන් වහන්සේගේ බාල සොහොයුරු වන්නේය.

**703.** "ක්ලේශ කාමයෙන් ඇළුනේ (කාය-චිත්ත සුඛයන් අනුභවකරන ස්වභාවය ඇත්තේ වස්තුකාමයෙහි ගිජුවීමෙහි

යෙදුනේ බුදුරජාණන් වහන්සේ විසින් මෙහෙයන ලදුයේ ශාන්තවූයේ ඔබ එකල්හි පැවිදිවන්නෙහිය.

**704.** "ඔබ එහි පැවිදිව කුශලමූලයන් විසින් මෙහෙයන ලදුයේ සියළු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥාවෙන් දැන හැරදැමූ ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නෙහිය." (කියායි)

**705.** "(මින්) කල්ප ලක්ෂයකට පෙර එක්දහස් සත්වන කපෙහි චෙල නම් වූ සක්විති රජවරු සිව්දෙනෙක් වූහ. එක් දහස් සැට වන කල්පයෙහි (සිව් ජාතියක) උපචෙල නම් වූ සක්විති රජවරු සිව්දෙනෙක් වූහ.

**706.** "එක්දහස් පස්වන කපෙහි චෙල නමින්ම (සක්විති) රජවරු සිව්දෙනෙක් වූහ. (ඔව්හු) සත්රුවනින් යුක්ත වූවාහු සතර මහ දිවයිනෙහි අධිපතියෝවූහ. - 707

---

## 14. චුල්ලපන්ථක ථෙරාපදානය

**708.** "එකල්හි පූජාවන් පිළිගන්නාවූ හෙවත් පූජාවනට ගෙයක් බඳුවූ ඒ පදුමුත්තර නම් බුදුරජාණන් වහන්සේ ගණ (සමූහ) යා කෙරෙන් වෙන්වූයේ හිමවතෙහි විසූසේක.

**709.** "එකල්හි මම හිමවතෙහි අසපුවක වෙසෙමි. පැමිණි නොබෝ කල් ඇති ලෝකනායකවූ මහා වීරයන් (බුදුරජාණන්) වහන්සේ වෙත එළඹියෙමි.

**710.** "මල් කුඩයක් ගෙන නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත එළඹියෙමි. මම සමාධියට සමවන් උන්වහන්සේගේ සමාධියට අනතුරක් නොකෙළෙමි.

**711.** "මම දෑතින් ගෙන මල් සැත දුනිමි. උන්වහන්සේ (එය) පිළිගත්සේක.

**712.** "සතුටුවූ ඒ සියලු දෙව්වරු හිමවතට එළඹෙත්. පසැස් ඇති බුදුරජතෙම අනුමෝදනා කරන්නේයයි සාධුකාර පැවැත්වූහ.

**713.** "ඒ දෙව්වරු මෙය කියා අහසෙහි දරන්නාවූ උතුම්වූ සියුම් සැක ඇති නරශ්‍රෙෂ්ඨයන් (බුදුන්) වහන්සේ වෙත එළඹියාහුය.

714. "(මේ තවුස්තෙමේ සියුම් සැතක් ගෙන මට දුන්නේය. ඔහු පිළිබඳව මම (කරුණු) ප්‍රකාශ කරමි. (එසේ) කියන්නාවූ මාගේ වචනය අසව්.

715. "(මෙතෙම) පස්විසි වරක් දිව්‍ය රාජ්‍යය කරන්නේය. සූතිස් වරක් සක්විති රජද වන්නේය.

716. "(මෙතෙම) දිව්‍යය වූ හෝ මනුෂ්‍යයවූ හෝ යම් යම් යොනියක සැරිසරාද අභ්‍යවකාශයෙහි (එලිමහනෙහි) හුන්නේ පියුමක් (කුඩයක් මෙන්) දරන්නේය.

717. "කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක නම් කුලයෙහි උපදින්නාවූ නමින් ගෞතම නම් වූ ශාස්තෘන් වහන්සේ ලොව පහළවන සේක.

718. "(උන්වහන්සේ) පිටකත්‍රය ධර්මය දෙසූ කල්හි මෙතෙම මිනිසත් බව ලබන්නේය. මනොමය වූ ශරීර නිර්මාණයෙහි අග්‍ර ද වන්නේය.

719. "සොහොයුරන් දෙදෙනෙක් වන්නාහුය. දෙදෙනම පන්ථක නම් වන්නාහුය. උත්තමාර්ථයවූ නිවණ ප්‍රතිවෙධ කොට සසුන බබුළුවන්නාහුය."

720. "ඒ මම අටළොස් වියැත්තේ අනගාරිය නම් ශාසනයෙහි පැවිදිවීමි. මම ශාක්‍ය පුත්‍රවූ බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි විශේෂයක් (ධර්මාවබොධය) නොවිඳිමි.

721. "මාගේ ගතිය (ස්වභාවය) අන්ධ (මෝඩ) විය. පෙර දුකින් මඩනාලද්දේ විය. දැන් ස්වකීය ගෘහයට යවයි කියා මාගේ සොහොයුරාද මා පන්නා දැමීය.

722. "පන්නා හරිනලද ඒ මම සඟරම් දොරටුවෙහි (නැවතී) දොම්නස්වූයේ පැවිදි බැව්හි බලාපොරොත්තු සහිත වූයේ එහි සිටියෙමි.

723. "ඉක්බිති ශාස්තෘතෙම එහි පැමිණියේය. මාගේ හිස පිරිමැද්දේය. මාගේ අතින් අල්ලාගෙන සංඝාරාමයට ඇතුලු කරවිය.

724. "මෙසේ පිරිසිදු (මෙය ගැන) එකත්පසෙක හිඳ මනකොට ඉටුවයි (සිහි කරවයි) කියා මට අනුකම්පාවෙන් ශාස්තෘතෙම රෙදි කඩක් දුන්නේය.

725. "මම එය අතින් ගෙන පියුම සිහි කෙළෙමි එහි (පියුමෙහි) මාගේ සිත (නැවතී රහත් බැවින්) මිදුනේය. රහත් බවට පැමිණියෙමි.

726. "සියලු තන්හි මනෝමය ශරීරයෙන් නිර්මිත කිරීමෙහි පරතෙරට පැමිණියේ සියලු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥා වශයෙන් දැන දුරුකළේ ආශ්‍රව රහිතව (රහත්ව) වෙසෙමි 727

---

## 15. පිළින්දවච්ඡ ථෙරාපදානය.

728. "ලෝකනාථවූ අග්‍ර පුද්ගලවූ සුමෙධ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි පහන් සිත් ඇති සොම්නස්වූ මම ස්ථූප පූජාවක් කෙළෙමි.

729. "යම් ෂඩභිඥාවූ මහා ඍද්ධි ඇති ක්ෂිණාශ්‍රව කෙනෙක් එහි (වූවාහුද) මම උන්වහන්සේලා එහි රැස්කරවා සංඝදානයක් කෙළෙමි. (දුනිමි)

730. "එකල්හි සුමෙධ භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායකයෙක් විය. නමින් සුමෙධ නම්වූ හෙතෙම එකල්හි අනුමෝදනා කෙළේය.

731. "එම (ථූප පූජාකිරීම වශයෙන් ඇතිවූ) චිත්ත ප්‍රසාදය කරණකොටගෙන මම දිව්‍යවිමානයක උපනිමි. අසූහය දහසක් දෙවඟනෝ මාගේ (සිත එහි) ඇලවූහ.

732. "එම අප්සරාවෝ සියලු කාමයන් කරණකොට ගෙන මා අනුවම පවතිත්. අනික් දෙවියන් (සම්පත්තියෙන්) ඉක්මවමි. මේ (ස්ථූප පූජා) පුණ්‍යකර්මයාගේ විපාකයයි.

733. "මම එකල්හි පස්විසි වන කපෙහි පිරිසිදු බොජුන් ඇති වරුණ නම් සක්විති රජෙක්වීමි.

734. "ඒ මනුෂ්‍යයෝ බිජුවට නොවපුරත්. නඟුල් (සී සෑම වශයෙන්) නොපමුණුවත්. අරණ්‍යයෙහි අකෘෂ්ට භූමිභාගයන්හි තෙමේම හටගත් හැල් අනුභව කෙරෙත්.

735. "මම එහි රාජ්‍යයකොට නැවත දිව්‍යාත්මභාවයට පැමිණියෙමි. එකල්හිද මට මෙබඳුමවූ භොගසම්පත්ති තොමෝ උපන්නීය.

736. "මිතුරුවූ හෝ පසමිතුරුවූ හෝ සියලු ප්‍රාණීහු මට හිංසා නොකෙරෙත්. සියලුදෙනාම ප්‍රිය වෙමි. මෙය (ස්ථූප පූජා පුණ්‍යකර්මයාගේ විපාකයයි.

737. "මින් එක්දහස් තිස්වන කල්පයෙහිවූ එකල මම යම් දනක් දුනිම්ද (ඉන්) දුගතියක් නොදනිමි. (ස්ථූපයෙහි) සුගන්ධාලේපයාගේ (සුවඳ ගැල්වීමෙහි) මේ පලයයි.

738. "මේ භද්‍රකල්පයෙහි මම ජනාධිපතිවූ මහානුභාව ඇති මහත්බල ඇති එක් සක්විති රජෙක් වීමි.

739. "ඒ මම බොහෝ ජනයා පන්සිල්හි පිහිටුවා සුගති යටම පමුණුවා දෙවියනට ප්‍රියවීමි. 740

---

## 16. රාහුල ථෙරාපදානය

741. "මම ලොක ජ්‍යෙෂ්ඨවූ තාදී ගුණ ඇති පදුමුත්තර බුදුරජාණන් වහන්සේට සත්බුමු පහයක කැඩපතක් මෙන් පැහැපත් ඇතිරියක් අතුළෙමි.

742. "දෙපා ඇතියනට අග්‍රවූ මහාමුනිවූ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ රහතුන් දහසක් විසින් පරිවරණලදුයේ ගඳකිළියට එළඹිසේක.

743. "දෙවියනට දෙවිවූ නරශ්‍රෙෂ්ඨවූ ශාස්තෘතෙම ගඳකිළිය බබුළුවන්නේ භික්සඟන මැද සිටියේ මෙම ගාථාවන් වදාළේය.

744. "යමෙකු විසින් මේ සෙනසුන බබුළුවන ලදද. කැඩපතක් මෙන් පැහැපත් ඇතිරියක් මැනවින් අතුරන ලදද මම හේ (කවරෙක් දැයි) ප්‍රකාශ කරන්නෙමි. (එසේ) ප්‍රකාශකරන්නාවූ මාගේ වචනය අසව්.

745. "ස්වර්ණමයවූද රජතමයවූද, යලි වෙරළුමිණි මුවාවූද යම්කිසි සිතට ප්‍රිය ආදාසයෝ වෙත් නම් (ඒවා) පහළ වන්නාහුය.

746. "සූසැට වරක් ශක්‍රව දිව්‍ය රාජ්‍යය කරන්නේය, අනතුරුව දහස් වරක් සක්විති රජ වන්නේය.

747. "එක්විසිවන කපෙහි සිව්මහ සයුර හා සිව්මහ දිවයින කෙළවර කොට ඇති පෘථිවියට අධිපතිවූයේ සතුරු රජුන් ජයගන්නා සුලුවූ විමල නම් සක්විති රජෙක් වන්නේය.

748. "ගඩොලුවලින් නිර්මිත කරනලද නගරය රේනුවතී නම් වේ. (එය) දිගින් තුන්සියයක් (යොදුන්) වේ. හතරැස් හැඩයෙන් යුක්ත වෙයි.

749. "(එහි) උතුම්වූ කුලුගෙවලින් යුත් සත්රුවනින් අලංකාර කරණලද විශ්වකර්මයා විසින් නිර්මිත කරනලද සුදර්ශන නම් ප්‍රාසාදයක් විය.

750. "(එය) දශවිධ ශබ්දයෙන් වෙන්නොවූ විද්‍යාධරයන්ගෙන් ගැවසීගත් දෙවියන්ගේ සුදර්ශන නගරය මෙන් වන්නේය.

751. "එම ප්‍රාසාදයාගේ ප්‍රභාව හිරු උදාවන කල්හි විහිදේ. එය නිරතුරුවම හාත්පස අටයොදුනක් (තන්හි) බබළන්නේය.

752. "කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ නමින් ගෞතම නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළ වන්නේය.

753. "හෙතෙම කුශලමූලයෙන් මෙහෙයන ලදුයේ තුෂිත පුරයෙන් චුතව ගෞතමයන් වහන්සේගේ ඒ ඖරස පුත්‍රයා වන්නේය.

754. "හෙතෙම ඉදින් ගිහිගෙයි වසන්නේ නම් සක්විති රජ වන්නේයි. තාදි ගුණ ඇතියෙක් ගිහිගෙයි ඇලීමට පැමිණෙයි යන මේ කරුණ සිදුනොවන්නකි. (හෙවත් සිදුවීමට කරුණ නැත්තකි.)

755. "සුශික්ෂිතවූ (හෙතෙම) ගිහිගෙන් නික්ම නමින් ඒ රාහුල නම්වූ රහත්තෙම වන්නේයයි වදාළසේක.)

756. "මහාමුනිවූ ගෞතම බුදුරජාණන් වහන්ස, කිරල්ධෙනුව බිජුවට රකින්නාක්මෙන්ද, සෙමරමුවා වලිගය රකින්නාක් මෙන්ද සීලය රකින්නේය. ශීලයෙන් යුක්තවූ මම (මැනවින් ශීලය) ආරක්ෂා කෙළෙමි.

757. "මම ඒ බුදුරජාණන් වහන්සේගේ ධර්මය දැන සසුනෙහි ඇළුනේ වෙසෙමි. සියලු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥා වශයෙන් දැන හැරදමා ආශ්‍රව රහිතව වෙසෙමි. - 758

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 17. උපසෙන ථෙරාපදානය

759 "පර්වත පබ්භාරයක වැඩ හුන්නාවූ මනුෂ්‍යෝත්තමවූ ලොක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ (මම) ඒ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ වෙත එළඹීමි.

760. "එකල්හි මම මැනවින් පිපුණු කිණිහිරි මලක් දැක නටුවෙන් කඩාගෙන ඒ මලින් ඡත්‍රය අලංකාරකොට බුදුරජාණන් වහන්සේට (ඒ ඡත්‍රය) නැගීමි.

761. "සුන්දර භෝජන නම්වූ උතුම් ආහාරයවූ පිණ්ඩපාතයද දුනිමි. එහි බුදුරජාණන් වහන්සේ නවවෙනි කොට ඇති ශ්‍රමණයන් අටනමක් වැළඳවීමි.

762-763 "සියල්ල තෙමේම අවබෝධකළාවූ අග්‍ර පුද්ගලවූ මහා වීරවූ (පදුමුත්තර) බුදුරජතෙම අනුමෝදනාව කෙළේය. මෙම ඡත්‍ර දානයද උතුම් ආහාර දානයද හේතු කොට ගෙන (ඇතිවූ) එම චිත්ත ප්‍රසාදයෙන් සම්පත් අනුභව කරන්නේය. සතිස් වරක් ශක්‍රව දිව්‍ය රාජ්‍යය කරන්නේය.

764. "එක් විසිවරක් සක්විති රජවන්නේය. මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය කරන (වාරගණන) සංඛ්‍යා පථාතික්‍රාන්තයි.

765. "මින් කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ ගොත්‍රයෙන් ගෞතම නම්වූ ශාස්තෲන් වහන්සේ ලොව පහළ වන්නේය.

766. "(උන් වහන්සේගේ) සසුන බබළන කල්හි මිනිසත් බවට පැමිණෙන්නේය. උන්වහන්සේගේ ධර්මයෙහි දායාදවූයේ ඖරස බුද්ධපුත්‍රවූයේ ධර්මයෙන්ම නිර්මිත කළාක් වැනිවූ නමින් උපසේන නම්වූ බුද්ධ ශ්‍රාවකයෙක් වන්නේ යයි වදාළසේක.)

767. "(මෙය) මාගේ අන්තිම ආත්මය වන්නේය. සියළු භවයෝ සමූහනනය කරන ලදහ. සේනා සහිතවූ මාරයා ජයගෙන අන්තිම ශරීරය දරමි - 768

**(තෙවැනි බණවරයි.)**

---

## 18. රට්ඨපාල ථෙරාපදානය

769-770 "ලොක ජ්‍යෙෂ්ඨවූ තාදීගුණ ඇති පදුමුත්තර බුදුරජාණන් වහන්සේට (නගුළිස් පමණවූ) විශාල දළ ඇති

රාජාරහ (රජුට සුදුසුවූ) ඇත්කඳෙහි ඔසවනලද) ශ්වෙතච්ඡත්‍රයෙන් ශෝභමානවූ හස්ත්‍යාලංකර සහිතවූ ඇත්ගොව්වෙකු සහිතවූ උතුම් හස්තියෙක් තෙම මා විසින් දෙන ලදී.

771. "මම සූපණ්‍ණස් දහසක් ප්‍රාසාදයන්ද කරවීමි. මහ දනක් (පිළියෙලකොට) මහර්ෂිවූ බුදුරජාණන් වහන්සේට පිළිගැන්වීමි.

772. "මහාවීරවූ සියල්ල තෙමේම දැන වදාළාවූ අග්‍ර පුද්ගලවූ බුදුරජාණන් වහන්සේ සියළු ජනයන් සතුටු කරවමින් අමෘතපදය (නිර්වාණ ධර්මය) දෙසූසේක.

773. "පදුමුත්තර නම් බුදුරජාණන් වහන්සේ මාගේ ඒ පින්කම (ගැන මෙසේ) පැවසූසේක. භික්ෂු සංඝයා මැද හිඳ මෙම ගාථාවන්ද දේශනා කළසේක.

774. "මෙතෙම සිව්පණ්‍ණස් දහසක් ප්‍රාසාදයන් කරවීය. (එහි) විපාකය කියන්නෙමි. (එසේ) කියන්නාවූ මාගේ වචනය අසව්.

775. "අටළොස් දහසක් කූටාගාරයෝ වන්නාහුය. උතුම් විමනෙහි පහළවූ ඒ (කූටාගාරයෝ සර්ව ස්වර්ණමය හා

776. "ශක්‍ර දෙවෙන්ද්‍රව පණ්‍ණස්වරක් දිව්‍ය රාජ්‍යය කරන්නේය. අට පණ්‍ණස්වරක් සක්විති රජ වන්නේය.

777. "මින් කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ ගෝත්‍රයෙන් ගෞතම නම්වූ ශාස්තෘන් වහන්සේ ලොව පහළ වන්නේය.

778. "කුශලමූලයෙන් මෙහෙයන ලදුයේ දෙව්ලොවින් චුතව එකෙණෙහි ආඪ්‍යවූ මහත් භෝග ඇති කුලයක උපදින්නේය.

779. "කුශල මූලයෙන් මෙහෙයන ලදුයේ හෙතෙම පසුව පැවිදිව නමින් රට්ඨපාලයයි ප්‍රසිද්ධ ශ්‍රාවකයෙක් වන්නේය.

780. "වීර්යයෙහි යොදනලද සිත් ඇත්තේ උපශාන්තවූ උපධි රහිතවූ හෙතෙම සියලු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥා වශයෙන් දැන දුරුකොට ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේයයි වදාළසේක.)

781. "උත්ථාන වීර්යයෙන් නැගිට අභිනිෂ්ක්‍රමණය කොට, කෙළපිඩු මෙන් භෝග සම්පත් තොමෝ හරනාලද්දී මාගේ (ඒ) භෝග සම්පත්තියෙහි ඇලීමක් නැත.

782. "යොගක්ෂෙම නම් නිවණට පමුණුවන ධුර වාහකයා (ගැල්බර උසුලන ගවයා) මාගේ වීර්යයයි. (මම මේ) සර්වඥ සාසනයෙහි අන්තිම ශරීරය දරමි. - 783

---

## 19. සොපාක ථෙරාපදානය

784. "වනයෙහි උතුම් පර්වතයෙක්හි (වූ) පර්වත ගුහාවක් පිරිසිදු කරන්නාවූ මා වෙත සිද්ධාර්ථ නම් භාග්‍යවතුන් වහන්සේ පැමිණිසේක.

785. "මම එළඹ සිටියාවූ බුදුරජාණන් වහන්සේ දැක තාදී ගුණ ඇති ලොක ජ්‍යෙෂ්ඨවූ ශාස්තෘන් වහන්සේට ඇතිරියක් අතුරා පුෂ්පාසනයක් (මලසුනක්) දුනිමි.

786. "සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේ පුෂ්පාසනයෙහි වැඩහිඳ මාගේ මතු උත්පත්තිස්ථානයද දැන අනිත්‍ය භාවය වදාළසේක.

787. "ඒකාන්තයෙන් සංස්කාරයෝ අනිත්‍යයහ ඉපදීම හා විනාශය ස්වභාවය කොට ඇත්තාහ ඉපදී නැතිවෙත්. ඔවුන්ගේ සන්සිඳීම සැපයයි."

788. "ලොකජෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ ප්‍රාඥවූ සර්වඥයන් වහන්සේ මෙය වදාරා අහසෙහි (යන) හංස රාජයෙකු මෙන් අහසට පැන නැංගේය.

789. "මම ස්වකීය ලබ්ධිය හැර අනිත්‍ය සංඥාව වැඩීමි එක් දිනක් භාවනාකොට මම එහි කළුරිය කෙළෙමි.

790. "කුශල මූලයන් මෙහෙයන ලදුයේ (දිව්‍ය - මනුෂ්‍ය) සංඛ්‍යාත) විවිධ සම්පත් අනුභවකොට අන්තිම භවය පැමිණි කල්හි (ස්වකීය බත අනුන් අනුභව නොකරන බැවින් සපාක නම්වූ) සැඩොල් කුලයට උත්පත්ති වශයෙන් එළඹුනිමි.

791. "අගාර නම් ගිහිගෙන් නික්ම අනගාර්ය නම් සාසනයෙහි පැවිදිවීමි. උත්පත්තියෙන් සත්වස්වූ මම රහත් බවට පැමිණියෙමි.

792. "ඇරඹූ වීර්ය ඇති (නිවණ කෙරෙහි) මෙහෙයන ලද සිත් ඇත්තේ ශීලයන්හි මැනවින් නික්මුනේ බුදුරජාණන් වහන්සේ සතුටුකොට උපසම්පදාව ලැබීමි.

**793.** "මෙයින් සිව්අනූ වන කපෙහි (වූ) එම කාලයෙහි යම් කර්මයක් කෙළෙම්ද (ඉන්) දුගතියක් නොදනිමි. මෙය පුෂ්පදානයාගේ විපාකයයි.

**794.** "මෙයින් සිව්අනූ වන කපෙහි (වූ) එම කාලයෙහි යම් අනිත්‍ය සංඥාවක් වැඩුයෙම් නම් එම සංඥාව වඩන්නාවූ මාගේ ආශ්‍රව ක්ෂය විය. - 795

---

## 20. සුමංගල ථේරාපදානය

**796** "යාගයක් කරනු කැමති (දානයක් දෙනු කැමති) මම බොජුන් පිළියෙල කරවා (ප්‍රතිග්‍රාහකවූ ශුද්ධ පැවිදි) බමුණෙක් සොයමින් විශාල මාලකයක සිටියෙමි.

**797-798.** "ඉක්බිති මහත් යසස් ඇති සියලු ලොකයා (නිවණට) පමුණුවන්නාවූ තෙමේම සියල්ල අවබොධ කළාවූ අග්‍රපුද්ගලවූ භාග්‍යවත්වූ ප්‍රභාසම්පන්නවූ ශ්‍රාවකයන් විසින් පිරිවරණලද සූර්යයා මෙන් බබළනලද වීථියට පිළිපන් පියදස්සී බුදුරජාණන් වහන්සේ දුටුවෙමි.

**799.** "ඇඳිලි බැඳ ස්වකීය චිත්තය පැහැදවීමි. මහා මුනිවූ බුදුරජාණන් වහන්සේ (මාගේ නිවසට) වඩිනසේක්වායි සිතින් ආරාධනා කෙළෙමි.

**800.** "ලෝකයෙහි අනුත්තරවූ ශාස්තෘන් වහන්සේ මාගේ අදහස් දැන රහතුන් දහසක් සමග මාගේ ගෙදොරට පැමිණිසේක.

**801.** "පුරුෂ ශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඔබ වහන්සේට නමස්කාර වේවා. පුරුෂොත්තමයන් වහන්ස, ඔබ වහන්සේට නමස්කාර වේවා. ඔබ පහයට නැගී සිහසුනෙහි වැඩ හිඳිනු මැනව.

**802.** "දමිතවූයේ දමිතවූ පිරිවර (සසරින්) එතෙර කර වූයේ එතෙර කරන්නවුන් අතුරෙන් උතුම්වූ බුදුරජාණෝ පහයට නැගී උතුම් අසුනෙහි වැඩහුන්සේක.

**803.** "ස්වකීය ගෘහයෙහි මට සම්පාදනය කරනලද යම් ආහාරයක්වීද පහන්සිත් ඇති මම සියතින්ම බුදුරජාණන් වහන්සේට එම ආහාර (දානය) දුනිමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

804. "පහන් සිත් ඇත්තේ සතුටුවූයේ හටගත් සොම්නස් ඇත්තේ කරනලද ඇඳිලි ඇත්තේ බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට නමස්කාර කරන්නෙමි. බුදුරජාණන් වහන්සේගේ උදාරබව ආශ්චර්යයි.

805. "(එහි) වළඳන්නාවූ පයිරුපාසනය කරන අෂ්ට ආර්ය පුද්ගලයන් අතුරෙන් රහත්හුම බොහෝවූහ. මෙය ඔබ වහන්සේගේම ආනුභාවයයි මම (ඔබ වහන්සේ)සරණකොට යමි.

806. "ලොක ජ්‍යෙෂ්ඨවූ නර ශ්‍රෙෂ්ඨවූ පියදස්සී භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා මැද හිඳ මෙම ගාථාවන් වදාළසේක.

807. "ඍජු ප්‍රතිපන්න තාදී ගුණයුත් සන්සුන් සංඝයාද තථාගතවූ බුදුරජාණන් වහන්සේද ඒ යමෙක් වැළඳවීද (ඔහු පිළිබඳව) කියන්නාවූ මාගේ වචනය අසව්.

808. "හෙතෙම සත්විසිවරක් දිව්‍ය රාජ්‍යය කරන්නේයි. පටන්ගත් ස්වකීය කටයුතු ඇති හෙතෙම දිව්‍ය ලෝකයෙහි සිත් අලවා වෙසෙයි.

809. "හෙතෙම අටළොස්වරක් සක්විති රජ වන්නේය. පන්සිය වරක් පෘථිවියෙහි රාජ්‍යය ගෙන පොළවෙහි වාසය කරන්නේය.

810. "ව්‍යාඝ්‍රයන් විසින් සෙව්නාලද මහා වනයට පිවිස වීර්යකොට මා විසින් කෙලෙස් දවන ලදී.

811. "එක්සිය අටළොස්වන කපෙහි (වූ) එකල්හි යම් දානයක් දුනිම්ද (එබැවින්) අගතියක් නොදනිමි. ආහාර දානයාගේ මේ විපාකයයි. 812

---

## 3. සුභූති වග්ග

### 21 සුභූති ථෙරාපදානය

813. "හිමවතට නුදුරෙහි නිසභ නම් පර්වතයකි (එහි) මට අසපුවක් කරන ලදී. පන්සලක්ද මැනවින් නිර්මිත කරන ලදී.

814. "(මම එහි) උග්‍රවූ තපස් ඇති 'කොසිය' නම් ජටිලයෙක් (ජටාධරයෙක්) වීමි. එකල්හි මම නිසභ පර්වතයෙහි එකලාව දෙවැන්නෙක් නොමැතිව වසමි.

815. "එකල්හි මම පලමුල් කොළ (ගස්වලින් නෙලා ගත) අනුභව නොකරමි. එකෙණෙහි ස්වයංපතිත පඬුවන් පත් (අනුභව කොට) ජීවත් වෙමි.

816. "මම ජීවිතය හැරදමන්නේ නමුදු (සම්‍යක්) ආජීවය (පලමුල් ආදී ආහාර සෙවීමෙන්) කොප්‍ය නොකරමි. ස්වකීය සිත (අල්පෙච්ඡ සන්තුෂ්ටතාවන්ගෙන්) පහදවමි. (වෛද්‍යකර්ම දූතකර්ම ආදී එක්විසි) අනේසනයන් දුරු කරමි.

817. "යම් කලෙක්හි රාගයෙන් යුක්තවූ සිතක් මට උපදී නම් (එකල්හි) තෙමේම ප්‍රත්‍යවෙක්ෂා කරමි. එකඟවූ සිත් ඇත්තේ මම එම (රාගී අදහස මෙසේ අවවාදකර ගනිමින් දමනය කරමි. කෙසේද යත්?

818. "තෝ ඇලුම් කටයුතු දෙයෙහි ඇලෙහිද, ද්වෙෂ කටයුතු දැයෙහි ද්වෙෂ කෙරෙහිද මුළාවිය යුතු දැයෙහි මුළා වෙහිද (එසේ නම්) වනයෙන් නික්ම යව.

819. "මේ (අරණ්‍ය) වාසය පිරිසිදුවූ නිර්මල තපොගුණ ඇතියනටය. තෝ මේ පිරිසිදු (වාසය) දූෂ්‍ය (අපිරිසිදු) නොකරව. (එසේ නම්) වනයෙන් නික්ම යව.

820. "ගිහිව හැමකල්හි (ඒ තමාට) සුදුසු දෑ ලබන්නෙහිය. (ගිහිබව හා පැවිදිබව යන දෙකම වරද්දා නොගනුව වනයෙන් නික්ම යව.

821. "සොහොන් පෙනෙල්ල යම්සේ කිසි කටයුත්තකට නොයොදාද, ගමෙහි හෝ අරණෙහි හෝ කාෂ්ට (දර) යයි සම්මත නොවේද (එසේම)

822. "තෝ සොහොන් පෙනෙල්ලක් වැනි වෙහිය. ගිහියෙක් නොවේ. පැවිද්දෙක්ද නොවේ ගිහිපැවිදි දෙපසින්ම මිදුනේ වෙහිය. අදම වනයෙන් නික්ම යව.

823. "තාගේ මෙබඳු ගතියක් වෙහිනම් මෙය කවරෙක් දනීද, මාගේ ශ්‍රද්ධා ධුරය දුරුකෙරෙහි නම් (එය) කුසීත බව වැඩිවීම පිණිසද පවතී.

824. "නුවර වැසියන් අසුචි පිළිකුල් කරන්නාක්මෙන් නුවණැත්තෝ තා පිළිකුල් කරන්නාහුයි ඍෂිහු තා ඇදදමා හැමකල්හි චෝදනා කරන්නාහුය.

825. "නුවණැත්තෝ තා ඉක්මවූ සසුන ඇත්තෙකැයි (චෝදනා වශයෙන්) කියන්නාහුය. නුවණැත්තන්ගේ සහ වාසය නොලබන්නාවූ තෝ කෙසේ ජීවත් වන්නෙහිද?

826. "බලවත් ඇත් රජෙක් තෙම ත්‍රිමද ගලිතවූ මාතංග හස්ති කුලයෙහි ජාතවූ උපන් සැට වස් ඉක්ම ගිය මහ ඇතෙකු එළඹ ඇත් රැළෙන් බැහැර කෙරෙයි නම්,

827. "ඇත් රැළෙන් බැහැරවූ එම ඇතා ලොකු සුවයක් නොවිඳී. දුක්ඛිතව දොම්නස් වේ. ලතවෙමින් වෙව්ලයි.

828. "එසේම ජටාධර තවුසෝ අඥානවූ ඔහු (තවුස් පිරිසෙන්) බැහැර කෙරෙත්. ඔවුන් විසින් බැහැර කරනලද තෝ (සිතකය දෙකින්ම) සුවයක් නොලබන්නෙහිය.

829. "දිවා කල්හිද යලි රාත්‍රියෙහිද හැමදා ශෝක නැමැති හුල ඇත්තේය. ඇත්රැළෙන් බැහැර කළ ඇතෙකු මෙන් (තෝ) පරිළාහයෙන් දැවෙහිය.

830. "යම්සේ ස්වර්ණය කිසිතැනෙක්හි යකුළ නොදවාද එසේම සීලයෙන් තොරවූ තෝ කිසිතැනෙක්හි ධ්‍යාන නොකරන්නෙහිය.

831. "තෝ ගිහිගෙයි වසන්නේ නමුදු කෙසේ ජීවත් වන්නෙහිද තට මව සතුවූ හෝ පියා සතුවූ තැන්පත්කොට තබන ලද ධනයක් නැත.

832. "සිරුරෙහි ඩහවගුරුවමින් තෙමේම කර්මාන්ත කොට ගිහිගෙයි මෙසේ ජීවත් වන්නෙහිය. තට එය රිසි නොවේ නම් මැනවි.

833. "මෙසේ මම එහිදී කිලිටි බවට ගිය සිත වලක්වමි. නොයෙක් ධර්ම කථා කියා පවින් සිත වැළකීමි.

834. "නොපමාව වෙසෙන සුළුවූ මෙසේ වනයෙහි වසනා මට හවුරුදු තිස් දහසක් ඉක්ම ගියහ.

835. "උත්තමාර්ථයවූ (නිවණ) සොයන අප්‍රමාදයෙහි ඇළුනු මා දැක පදුමුත්තර බුදුරජාණන් වහන්සේ මාගේ සමීපයට එළඹී සේක.

836. "(රන්) තිඹිරි ගෙඩියක වර්ණයට බඳු පැහැඇති පමණ කළ නොහැකි ගුණ ඇති උපමා විෂයාතීක්‍රාන්තවූ රූපයෙන්

අසදෘශවූ බුදුරජාණන් වහන්සේ එකල්හි අහසෙහි සක්මන් කළ සේක.

837. "මැනවින් පිපුණු මහ සල් රුකක් මෙන්ද වැසි වළාකුලු අතරෙහිවූ විදුලියක් මෙන්ද නුවණින් අසදෘශවූ බුදුරජාණන් වහන්සේ එකල්හි අහසෙහි සක්මන් කළ සේක.

838. "අභීතවූ සිංහරාජයෙකු මෙන්ද දර්පිතවූ ඇත් රජෙකු මෙන්ද ලංවිය නොහැකි ව්‍යාඝ්‍රරාජයෙකු මෙන්ද (බුදුරජාණන් වහන්සේ) එකල්හි අහසෙහි සක්මන් කළ සේක.

839. "(දිව්‍ය ස්වර්ණයනටද වඩා ශ්‍රෙෂ්ඨ) සිංගී නම් ස්වර්ණ නිෂ්කයේ (කළන් විස්ස හෝ විසිපහ නිෂ්කයයි) පැහැයට බඳු පැහැ ඇති කිහිරඟුරු මෙන් (දිලිසෙන්නාවූ) ජොති රස නම් මැණික මෙන්වූ බුදුරජාණන් වහන්සේ එකල්හි අහසෙහි සක්මන් කළ සේක.

840. "නිර්මල කෛලාශය වැනිවූ පූර්ණ චන්ද්‍රයා වැනිවූ මධ්‍යාහ්නයෙහි සූර්යයා වැනිවූ (බුදුරජාණන් වහන්සේ එකල්හි අහසෙහි සක්මන් කළ සේක.

841. "(මම එකල්හි අහසෙහි සක්මන් කරන්නාවූ උන්වහන්සේ දැක මෙසේ සිතීමි. මේ සත්වතෙම දෙවියෙක්ද, නැතහොත් මේ තෙමේ මනුෂ්‍යයෙක්ද?

842. "මා විසින් පොළවෙහි (වසන) මෙබඳු මනුෂ්‍යයෙක් (තෙම) නොඅසන ලදී. (එසේම) නොදක්නා ලදී. මන්ත්‍ර පදයකුදු ඇත. මේ ශාස්තෘ තෙමේ වන්නේය (කියායි.)

843. "එකල්හි මම මෙසේ සිතා ස්වකීය සිත පැහැදවීමි. මම නොයෙක් මල්ද සුවඳ ද රැස්කොට.

844. "මල් අසුනක් පණවා යහපත් සිත් ඇති මනොඥවූ පුරුෂයන් දමනය කිරීමෙහි රියසැරි (සාරථි) යෙකු වැනියනට අග්‍රවූ බුදුරජාණන් වහන්සේට මෙම වචනය කීමි.

845. "වීරයන් වහන්ස, මා විසින් මේ අසුන ඔබ වහන්සේට සුදුසු කොට පණවන ලදී. මාගේ සිත සතුටු කරමින් මල් අසුනෙහි වැඩහිඳිනු මැනව. (කියායි.)

846. "භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේ රෑ දාවල් සතක් (සතියක්) මුළුල්ලෙහි අභීත කේශරසිංහ රාජයෙකු මෙන් එම මල් අසුනෙහි වැඩහුන් සේක.

847. "මමද සතියක් මුළුල්ලෙහි නමස්කාර කරමින් සිටියෙමි. ලෝකයෙහි (තමන් වහන්සේට වැඩිකෙනෙකුන් නැති හෙයින්) අනුත්තර වූ ශාස්තෲන්වහන්සේ සමාධියෙන් නැගිට,

848. "මාගේ කර්මය ප්‍රකාශ කරන සේක් මෙම වචනය වදාළ සේක. භාවනාවන් අතුරෙන් ශ්‍රෙෂ්ඨවූ බුද්ධානුස්සති භාවනාව වඩයි.

849. "මෙම බුද්ධානුස්සතිය වඩා අධ්‍යාශය සම්පූර්ණ කරන්නෙහිය. කල්ප තිස්දහසක් මුළුල්ලෙහි දිව්‍යලෝකයෙහි සිත් අලවා වාසය කරන්නෙහිය.

850. "ශක්‍රදෙවෙන්ද්‍රව අසූවරක් දිව්‍ය රාජ්‍යය කරන්නේය. දහස් වරක් සක්විති රජ වන්නේය.

851. "(තමා ලබන) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය (මෙපමණ යයි) ගණින් වශයෙන් ගිනිය නොහැකිය. එම සියල්ල ඔබ අනුභව කරන්නෙහිය (මෙයි) බුද්ධානුස්මෘතියෙහි පලයයි.

852. "කුදුමහත් භවයෙහි හැසිරෙන්නේ මහත්වූ භෝග සම්පත් ලබන්නෙහිය. ඔබගේ (ඒ) භෝග සම්පත්තියෙහි අඩුවක් (නම්) නැත. මේ බුද්ධානුස්මෘතියෙහි පලයයි.

853. "කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක වංශයෙන් උපන්නාවූ තමන් ගෞතම නම්වූ ශාස්තෲන් වහන්සේ ලොව පහළවනසේක.

854. "අසූ කෙළක් (ධනයද) බොහෝ දස්කම් කරුවන්ද හැරදමා ගෞතම බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි පැවිදි වන්නෙහිය.

855. "ශාක්‍යකුල ශ්‍රෙෂ්ඨවූ ගෞතම බුදුරජාණන් වහන්සේ සතුටුකොට නමින් සුභූති නම්වූ බුද්ධ ශ්‍රාවකයෙක් වන්නේය.

856. "(ඒ ගෞතම බුදුරජාණන් වහන්සේ) භික්ෂු සංඝයා මැද වැඩහිඳ ඒ සුභූති තෙරුන් දක්ෂිණෙය්‍ය ගුණයෙහිද අරණ්‍ය විහාරයෙහිද යන අග්‍රසභා දෙකෙහි තංවන්නේය.

857. "ප්‍රාඥවූ දීපංකර නමැති බුදුරජාණන් වහන්සේ මෙම වචනය වදාරා අහසෙහි (යන) හංස රාජයෙකු මෙන් අහසට පැනනැංගාහ.

858. "ලෝකනාථයන් වහන්සේ විසින් අනුශාසනා කරන ලද මම තථාගතයන් වහන්සේට වැඳ හැමකල්හි සතුටුවූයේ උතුම්වූ බුද්ධානුස්මෘති භාවනාව වැඩීමි.

859. "මැනවින් කරනලද එම කර්මයන් හා චිත්තප්‍රණිධින්ද කරණකොට ගෙන මම මනුෂ්‍ය ශරීරය හැරදමා තව්තිසා දෙව්ලොවට (උත්පත්තියෙන්) ගියෙමි.

860. "මම ශක්‍රදෙවේන්ද්‍රව අසූවරක් දිව්‍යරාජ්‍යය කරවීමි. දහස් වරක් සක්විති රජ වීමි.

861. "මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය (ලැබූ වාර ගණන මෙතෙකැයි) ගණිනින් ගිනිය නොහැකිය. උතුම් සැපත අනුභව කරමි. මේ බුද්ධානුස්මෘති භාවනාවෙහි විපාකයයි.

862. "මම කුදුමහත් භවයෙහි සැරිසරන්නේ මහත් වූ භොග සම්පත් ලබමි. මාගේ භොග සම්පත්තියෙහි අඩුවෙක් නම් නැත. මේ බුද්ධානුස්මෘති භාවනාවෙහි විපාකයි.

863. "මින් කල්පලක්ෂයකින් පෙරවූ එම කාලයෙහි යම් කර්මයක් කෙළෙම්ද (එබැවින්) දුගතියක් නොදනිමි. බුද්ධානුස්මෘති භාවනාවෙහි විපාකයයි - 864

## 22. උපවාන ථෙරාපදානය

865. "සියළු පරතෙරට ගියාවූ පස්මරුන් දිනූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ගිනිකඳක් මෙන් බබළා පිරිනිවන් පෑසේක.

866. "මහජනයා එක්රැස්ව තථාගතයන් වහන්සේ පුදා මැනවින් සෑයක්කොට සර්වඥ දේහය (එයට) නැගූහ.

867. "එහි ශරීරය පිළිබඳ ආදාහණ කෘත්‍යයකොට ධාතු ගෙනාවාහුය. ඒ සියලු දිව්‍ය මනුෂ්‍යයෝ (එම ධාතු නිදන් කොට) බුද්ධ ස්ථූපයක් කළාහුය.

868. "(එම ස්ථූපයෙහි) පළමු නිම් වළල්ල රන්මුවාය. දෙවැන්න මිණිමුවාය. තෙවැන්න රිදී මුවාය. සිව්වැන්න පළිඟුමුවාය.

869. "එසේම පස්වෙනි නිම්වලල්ල පියුම් රාමිණිමුවායි. සවැන්න මැසිරිගල් මුවායි. (මේ සියල්ලට) මතුයෙහි (කොටස) සර්වරත්නමයය.

870. "ජඝනය (යට කොටස) මිණිමුවාය. වේදිකාව රුවන් මුවාය (මෙසේ) සෑය ස්වර්ණමයයි. යොදුනක් උසට පැනනැංගේය.

871. "එකල්හි එහි දෙවියෝ රැස්ව එකතුව මන්ත්‍රණය කළාහුය (කෙසේදයත්?) තාදී ගුණ ඇති ලෝකනාථයන් වහන්සේට අපිදු සෑයක් කරමු.

872. "(ඒ පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ) ධාතුවෙන් වෙන් වෙන්ව නැත. මුළු සිරුරම එකට කැටිව තිබේ. (එබැවින්) අපි මේ සෑයෙහිම වැසීමට සැට්ටයක් (වැස්මක්) කරන්නෙමුය කියායි.

873. "දෙවියෝ (එම සෑය) සත්රුවනින් තවත් යොදුනක් වැඩිකළාහුය. (ඉක්බිති) එම සෑය දෙ යොදුනක් උසය (එහි ආලෝකයෙන්) අඳුරද දුරුකෙරෙයි.

874. "එකල්හි නාගයෝ එහි රැස්ව එකතුව මන්ත්‍රණය කළාහුය. (කෙසේදයත්) ඒ මනුෂ්‍යයෝද දෙවියෝද බුදුරජාණන් වහන්සේට සෑය කළාහුය.

875. "අපිදු පමා නොවෙමු. දෙවියන් සහිත ලෝ වැස්සෝද පමා නොවෙති. තාදී ගුණ ඇති ලෝකනාථයන් වහන්සේට අපිදු සෑයක් කරන්නෙමුය" කියායි.

876. "ඉඳුනිල්ද, මහනිල්ද යලි ජෝති රස නම් මැණික්ද එක්කොට බුදුරජාණන් වහන්සේගේ සෑය වැසූහ.

877. "එකල්හි (එය) එපමණකින් සියල්ල මිණියෙන් කරන ලද එළියකරන්නාවූ තුන් යොදුන් උස බුද්ධස්ථූපයක්විය.

878. "එකල්හි ගුරුළෝද රැස්ව එකතුව මන්තණය කළාහුය. (කෙසේදයත්) ඒ මනුෂ්‍යයෝද දෙවියෝද නාගයෝද බුද්ධස්ථූපයක් කළාහුය.

879. "අපිදු පමා නොවෙමු දෙවියන් සහිත ලෝ වැස්සෝ පමානොවූවෝ වෙති. තාදීගුණ ඇති ලෝකනාථයන් වහන්සේට අපිදු සෑයක් කරන්නෙමු.

880. "ගුරුළෝ ස්ථූපයෙහි සර්වමිණිමය පිට සැට්ටයක් (වැස්මක්) කළාහුය. ඔව්හුද බුද්ධ ස්ථූපයෙහි උස යොදුනකින් වැඩිකළාහුය.

881. "සිව්යොදුන් උස (මෙම) බුද්ධ ස්ථූපය බබළයි. උඩටනැගුනු සූර්යයා මෙන් සියලු දිශාවන් ආලෝකකෙරෙයි.

882-883. "එකල්හි කුම්භාණ්ඩයෝද (දිව්‍ය විශෙෂයෙකි) එහි රැස්ව එකතුව මන්ත්‍රණය කළාහුය. (කෙසේදයත්) මනුෂ්‍යයෝද, දෙවියෝද නාගයෝද, එසේම ගුරුළෝද, වෙන වෙනම බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේට උතුම් සෑයක් කළාහුය. අපි පමාවූවෝ නොවෙමු. දෙවියන් සහිත ලෝවැස්සෝද පමානොවූවෝ වෙති.

884. "තාදී ගුණ ඇති බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේට අපිදු සෑය කරවන්නෙමු. බුද්ධ ස්ථූපය මතුයෙහි අපිදු රත්නයන්ගෙන් වසන්නෙමුය කියායි.

885. "ඔව්හුද බුද්ධ ස්ථූපය යළි යොදුනක් (උස) වැඩි කළාහුය. එකල්හි පස් යොදුන් උස සෑය බබළයි.

886-887. "එකල්හි යක්ෂයෝද එහි රැස්ව එකතුව මන්ත්‍රණය කළාහුය. (කෙසේදයත්) මනුෂ්‍යයෝද දෙවියෝද නාගයෝද, ගුරුළෝද, කුම්භාණ්ඩයෝද වෙන වෙනම බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේට උතුම් සෑයක් කළාහුය. අපි ප්‍රමාද නොවෙමු. දෙවියන් සහිත ලෝ වැස්සෝද පමා නොවූවෝ වෙති.

888. "තාදී ගුණ ඇති ලෝක නාථයන් වහන්සේට අපිදු සෑයක් කරවන්නෙමු. බුද්ධස්ථූපය මතුයෙහි පළිගුයෙන් වසන්නෙමුය කියායි.

889. "ඔව්හුද බුද්ධ ස්ථූපය මතුයෙහි යොදුනක් වැඩිකළාහුය. එකල්හි (එම) සෑය සයොදුනක් උස්වේ.

890-891. "එකල්හි ගන්ධර්වයෝද රැස්ව එකතුව මන්ත්‍රණය කළාහුය (කෙසේදයත්) මනුෂ්‍යයෝද, දෙවියෝද, නාගයෝද, ගුරුළෝද, කුම්භාණ්ඩයෝද, යක්ෂයෝද යන සියල්ලෝ බුද්ධස්ථූපය කළාහුය. මෙහි අපි (කිසිවක්) නොකළාහු වෙමු. තාදී ගුණ ඇති ලෝකනාථයන් වහන්සේට අපිදු සෑය කරවන්නෙමුය කියායි.

892. "ඔව්හු (එහි) වේදිකා සකස්කොට ඡත්‍රයක්ද නැගූහ. එකල්හි ගන්ධර්වයන් සෑය සර්ව ස්වර්ණමයව කරවූහ.

893. "එකල්හි සත් යොදුනක් උස සෑය බබළයි. රෑ දාවල්හු නොදැනෙත්. හැමකල්හි ආලෝකයවේ.

**894.** "තාරකා සහිතවූ චන්ද්‍ර සූර්යයෝ එම චෛත්‍යයාගේ ප්‍රභාව නොඉක්මවත්. හාත්පස යොදුන් සියයක් තන්හි පහනකුදු නොදැල්විය.

**895.** "එකල්හි යම්කිසි මනුෂ්‍ය කෙනෙක් සෑයට (කිසිවක්) පූජා කෙරෙත් නම් ඔව්හු සෑයට නොගනිත්. (ඔව්හු) අහසට උඩ දමත්.

**896.** "දෙවියන් විසින් තබන ලද 'අභිසම්මත' නම් යක්ෂයෙක් විය. (හෙතෙම උඩට දැමූ) ධජ හෝ මල්දම් සෑ මුදුනෙහි නගා තබයි.

**897.** "ඔව්හු එම යක්ෂයා නොදකිත්. එය ගෙණ යන යක්ෂයාගේ මල්දම් පමණක් දකිත් යන සියල්ලෝ මෙසේ දැක සුගතියට යෙත්.

**898.** "ත්‍රිපිටක බුද්ධ වචන සංඛ්‍යාත ධර්මයෙහි සැදැහැ නැති යමෙක් වෙත් නම් ඔව්හුද සසුනෙහි පහන්වූ යමෙක් වෙත් නම් ඔව්හුද (යන සියළු) මනුෂ්‍යයෝ ප්‍රාතිහාර්යය දකිනු කැමැත්තාහු ස්ථූපය (මල්දම් ආදියෙන්) පුදත්.

**899.** "එකල්හි මම හංසවතී නගරයෙහි බාලයෙක්වීමි. එකල්හි සතුටුවූ ජනයා දැක මම මෙසේ සිතමි.

**900.** "යම් (බුදු) කෙනෙකුගේ දාගෙය මෙබඳු (ගරු සත්කාර) ලබා නම් (එම ධාතු අයත්) ඒ භාග්‍යවත් තෙමේ උදාර කෙනෙකි. මේ ජන සමූහයාද සතුටුවූවාහු බොහෝ වූ සත්කාර කෙරෙත්.

**901.** "මමද තාදී ගුණ ඇති (පදුමුත්තර) ලොකනාථයන් වහන්සේගේ (චෛත්‍යයට) සත්කාරයක් කරන්නෙමි. අනාගතයෙහි උන්වහන්සේගේ ධර්මයෙහි කොටස්කරුවෙක් වන්නෙමියි (සිතීය)

**902.** "රජකයෙකු විසින් මැනවින් සෝධා පිරිසිදු කරනලද මාගේ උතුරු සලුව උණ දඬුවක අග එල්වා ධජයක් කොට අහසෙහි (උඩට) ඔසවා තැබීමි.

**903.** "අභිසම්මතක යක්ෂතෙමේ මාගේ ධජය ගෙන අහසෙහි එල්වා තැබීය. වාතයෙන් සෙලවෙන්නාවූ ධජය දැක මම බොහෝ සතුට ඉපදවීමි.

**904.** "එහි සිත පහදවා ශ්‍රමණයෙකු වෙත එළඹුනෙමි. මම ඒ භික්ෂුවට වැඳ ධජයෙහි විපාක විමසීමි.

**905.** "හෙතෙම මාගේ මහත් ප්‍රීතිය ඇතිකරණ (අනුසස්) මට මෙසේ කීය. (කෙසේද යත්?) හැමකල්හි එම ධජයාගේ විපාකය අනුභව කරන්නෙහිය.

**906.** "ඇත් අස් රිය පාබළ යන සිව්රඟ සේනාවෝ නිරතුරුවම ඔබ පිරිවරන්නාහුය. මෙය ධජ දානයාගේ විපාකයයි.

**907.** "සැට දහසක් තූර්යයෝද මැනවින් අලංකාර කරනලද භෙරීහුද ඔබ නිරතුරුව (වැයීමෙන්) පිරිවරන්නාහුය. මෙය ධජ දානයාගේ විපාකයයි.

**908-909** "සැරසුන අසූ දහසක් (පමණ) ස්ත්‍රීහු විසිතුරු අබරණ ඇත්තාහු එල්බන ලද මණිකොඩොල් ඇත්තාහු දිග ඇසි පිහාටු ඇත්තාහු සිනා සහිතවූවාහු මැනවැයි හැඳින්විය යුතු ශරීරාවයව ඇත්තාහ. සිහින් කටී ප්‍රදේශ ඇත්තාහු නිරතුරුවම පිරිවරන්නාහුය. මෙසේ ධජ දානයාගේ විපාක යයි.

**910.** "කල්ප තිස් දහසක් මුළුල්ලෙහි දෙව්ලොවෙහි සිත් අලවා වසන්නෙහිය. ශක්‍ර දෙවෙන්ද්‍රව අසූ වරක් දිව්‍ය රාජ්‍යය කරන්නෙහිය.

**911.** "දහස් වරක් සක්විති රජ වන්නෙහිය. මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය ලැබූ වාර ගණන මෙතෙකැයි ගණන් වශයෙන් ගිණිය නොහැක.

**912.** "මින් කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ ගොත්‍රයෙන් ගෞතම නම්වූ ශාස්තෘන් වහන්සේ ලොව පහළවන්නේය.

**913.** "කුශල මූලයෙන් මෙහෙයන ලදුව දෙව්ලොවින් චුතව පුණ්‍ය කර්මය හා එක්වූයේ බ්‍රාහ්මණයෙක් වන්නෙහිය.

**914.** "අසූ කෙළක් ධනයද බොහෝවූ දස්කම් කරුවන් ද හැර ගෞතම බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි පැවිදි වන්නෙහිය.

**915.** "ශාක්‍ය කුල ශ්‍රෙෂ්ඨවූ ගෞතම බුදුරජාණන් වහන්සේ සතුටුකොට නමින් උපවානයයි බුද්ධ ශ්‍රාවකයෙක් වන්නේය"යි වදාළ සේක.

**916.** "කල්ප ලක්ෂයකට පෙර මා විසින් කරනලද කර්මය මෙහිදී විපාක දැක්වීය. (දුනු දියෙන්) මැනවින් මිදී ගිය හී සැරය මෙන් මාගේ කෙලෙස් දැවීය.

**917.** "සතර මහා දිවයිනට අධිපතිවූ සක්විති රජවූ මට හැමකල්හි හාත්පස තුන් යොදුනක් ධජයෝ ඔසවනු ලබත්.

**918.** "මින් කල්ප ලක්ෂයකින් පෙරවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ධජ දානයාගේ මේ විපාකයයි - 919

---

### 23. සරණාගමනීය ථේරාපදානය.

**920** "මම චන්ද්‍රවතී නගරයෙහි දෙමාපියනට උවටැන් කරන්නෙක් වීමි. එකල මාගේ ඒ අඳ දෙමාපියන් පොෂණය කරමි.

**921.** "එකල්හි මම රහසිගතව හිඳ මෙසේ සිතීමි. (කෙසේද යත්) මම දෙමාපියන් පොෂණය කරන්නේ පැවිද්ද නොලබමි.

**922.** "මහත්වූ මොහඳුරින් වසනලදී. (රාග, ද්වෙෂ, මොහ යන) ත්‍රිවිධාග්නියෙන් දැවෙත් මෙබඳු බිය ඇතිවූ කල්හි කිසියම් මාර්ග දෙශකයෙක් නැත.

**923.** "බුදු රජතෙම ලොව පහළවිය. සර්වඥ සාසනය බබළයි. පින් කැමති සත්වයා (ස්වකීය) ආත්මය ගොඩනගා තබන්නට සමර්ථ වන්නේය.

**924.** "තුන් සරණය ඉගෙණ සම්පූර්ණ ලෙස රැකීමි. මැනවින් කරනලද එම කර්මය කරණකොටගෙන දුගතියෙන් මිදෙමි.

**925.** "බුදුරජාණන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවකවූ "නිසභ" නම් භික්ෂුවක් විය. මම උන්වහන්සේ වෙත එළඹ සරණාගමනය ගතිමි. (සරණාගත වීමි.)

**926.** "එකල්හි හවුරුදු ලක්ෂයක් ආයුෂ විද්‍යමානවේ. එපමණ කලක් සරණාගමනය සම්පූර්ණ ලෙස රැකීමි.

**927.** "අන්තිම අවස්ථාව පවත්නා කල්හි (මරණ සමයෙහි) එම සරණය සිහි කෙළෙමි. මම එම කර්මය කරණකොටගෙන තව්තිසාවට ගියෙමි.

**928.** "දෙව්ලොවට ගියේ පින්කම සහයෝගිවූයේ මම යම් දෙයකට යෙම්නම් අට හේතුවක් (ආනිසංසයක්) ලබමි.

**929.** "(සියළු) දිගුන්හි පුදන ලදුයේ වෙමි. මම තියුණු නුවණැත්තේ වෙමි. සියලු දෙවියෝ (තමාට) අනුව පවතිත්. මම අපමණවූ භෝග සම්පත් ලබමි.

**930.** "මම ස්වර්ණවර්ණවූයේ හැමතන්හිදී (දකින්නවුන්) කැමති වන කෙනෙක් වෙමි. මිතුරන් අතුරෙහි නිශ්චල වෙමි. මාගේ යසස ඉතා උස්ව පැන නැංගේය.

**931.** "ශක්‍ර දෙවෙන්ද්‍රව අසූ වරක් දිව්‍ය රාජ්‍යය කරවීමි. අප්සරාවන් විසින් පිරිවරණ ලදුයේ දිව සුව අනුභව කරමි.

**932.** "මම පන් සැත්තෑ වරක් සක්විති රජ වීමි. (ලබන ලද) මහත්වූ ප්‍රදේශ රාජ්‍ය ගණන් වශයෙන් ගිණිය නොහැකිය (අපමණය.)

**933-934** "අන්තිම භවය පැමිණි කල්හි පුණ්‍යකර්මය හා එක්වූයේ සැවැත් නගරයෙහි අතිශයින් ආඪ්‍යවූ මහාසාර කුලයෙහි උපන්නේ සතුටෙන් හා කෙළිසෙල්ලමෙන් යුතුවූ මම සංඝාරාමයට එළඹීමි.

**935.** "එහිදී කෙලෙසුන් කෙරෙන් මිදුනාවූ උපධි රහිත වූ භික්ෂුවක් දුටුවෙමි. හෙතෙම මට දහම් දෙසීය. (මම) සරණද දුන්නේය.

**936.** "ඒ මම සරණ අසා මාගේ සරණය සිහි කෙළෙමි. එම අසුනෙහිම හිඳ රහත් බවට පැමිණියෙමි.

**937.** "උත්පත්තියෙන් සත් සැවිරිදි කල්හි රහත් බවට පැමිණියෙමි. පසැස් ඇති බුදුරජාණන් වහන්සේ (මාගේ) ගුණ දැන උපසම්පදා කරවීය.

**938.** "මම මින් අපරිමෙය්‍ය කල්පයකට පෙර සරණ ගතවීමි. ඉක්බිති මා විසින් මැනවින් කරන ලද (ඒ මාගේ) කර්ම පලය මෙහිදී දැක්වීය.

**939.** "මා විසින් සරණය මැනවින් රක්නා ලදී. සිත මනාව පිහිටුවා ගන්නාලදී. සියලු යසස් අනුභව කොට නිශ්චලවූ නිර්වාණ පදයට පැමිණියේවෙමි.

**940.** "යමෙකුට ඇසීමෙහි එකඟකම ඇත්තේ නම් කියන්නාවූ මාගේ වචනය අසව්. මා විසින් (භික්ෂුවගේ මාර්ග

දෙශකත්වයෙන්) තෙමේම දක්නාලද ශාන්ත පදය මම තොපට කියන්නෙමි. (කෙසේද යත්?)

**941.** "බුදුරජාණන් වහන්සේ ලොව පහළවූසේක. සර්වඥ ශාසනය පවතී. සෝ හුල් දුරුකරන්නාවූ අමා බෙරය වයන ලදී.

**942.** "ස්වකීය ශක්ති පමණින් නිරුත්තරවූ පුණ්‍යක්ෂෙත්‍රයෙහි කුසල් කරන්නහු නම් නිවණ පහස්නහුය. (ලබන්නාහුය.)

**943.** "තිසරණ ගෙන පන්සිල් රැක බුදුන් වහන්සේ කෙරෙහි සිත පහදවා දුක් කෙළවර කරන්නහුය.

**944.** "මා උපමා කොටගෙන සිල් රැක තෙපි සියල්ලෝ නොබෝ කලකින්ම රහත් බවට පැමිණෙන්නාහුයයි කීය.

**945.** "ත්‍රිවිද්‍යා ඇත්තේ පරසිත් දන්නා නුවණෙහි දක්ෂ වූයේ ඍද්ධියට පත්වූයේද වෙමි. මහා වීරයන් වහන්ස, ඔබ වහන්සේගේ (ඒ) ශ්‍රාවකතෙම ශාස්තෘන් වහන්සේගේ සිරිපා වඳියි.

**946.** "මම මින් අපරිමෙය්‍ය කල්පයෙහි බුදුරජාණන් වහන්සේ සරණකොට ගියෙමි. දුගතියක් නොදනිමි. (මෙය) සරණාගමනයෙහි පලයයි. - 947

---

## 24. පඤ්චසීල සමාදානිය ථෙරාපදානය.

**948.** "එකල්හි මම චන්ද්‍රවතී නගරයෙහි බැලයෙක් (බැලයට මෙහෙ කරන්නෙක්) වීමි. අනුන්ගේ කටයුතු කිරීමෙහි යෙදුනාවූ පැවිද්ද නොලබමි.

**949.** "මහත්වූ මොහාන්ධකාරයෙන් වසනලදී. (රාග, ද්වෙෂ, මොහ යන) ත්‍රිවිධාග්නියෙන් දැවෙත්. මම කවර නම් උපායකින් භව දුකින් වෙන්වූයෙක් වන්නෙම්ද?

**950.** "මා ළඟ දියයුතු දැයක් (දෙය්‍ය ධර්මයක්ද) නැත. මම දුක්ඛිතවූ බැලයෙක්මි. මම සම්පූර්ණවූ පඤ්චශීලය රකින්නෙමි නම් ඉතා යෙහෙකි.

**951.** "අනවමදර්ශී බුදුරජාණන් වහන්සේගේ නිසභ නම් ශ්‍රාවකයෙක් විය. මම උන්වහන්සේ වෙත එළඹ පඤ්ච ශික්ෂාපද (පන්සිල්) ගතිමි.

**952.** "එකල්හි හවුරුදු ලක්ෂයක් ආයුෂ විද්‍යමානවේ. එපමණ කලක් සම්පූර්ණකොට පන්සිල් රැකීමි.

**953.** "මැරෙන කල පැමිණි කල්හිද දෙවියෝ මා අස්වසත්. (කෙසේද යත්?) 'නිදුකාණෙනි, ඔබට මේ දහසක් අසුන් යෙදූ රථය එළඹ සිටියේය' කියායි.

**954.** "අන්තිමක (චුති චිත්තය) පවත්නා කල්හි මාගේ (පඤ්ච) ශීලය සිහි කෙළෙමි. මැනවින් කරනලද (ඒ කුශල) කර්මය හේතුකොටගෙන මම තව්තිසා දෙව්ලොව ඉපදුනෙමි.

**955.** "ශක්‍රදෙවෙන්ද්‍රව තිස් වරක් දිව්‍ය රාජ්‍යය කරවීමි. අප්සරාවන් විසින් පිරිවරනා ලදුව දිව සුව අනුභව කෙළෙමි.

**956.** "මම පන් සැත්තෑ වරක් සක්විති රජවීමි. (ලබන ලද) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය ගණන් වශයෙන් (මෙපමණ යයි) ගිණිය නොහැක.

**957.** "කුශල මූලයෙන් මෙහෙයන ලදුයේ දෙව්ලොවින් චුතව වෙශාලි නගරයෙහි අතිශයින් ආඪ්‍යවූ මහාසාර කුලයෙහි උපන්නේ

**958.** "බුදු සසන බබලද්දී වස් එළඹෙන කාලයෙහි මගේ මව්තොමෝද පිය තෙමේද පංච ශික්ෂාපද (පන්සිල්) ගත්තාහුය.

**959.** "(එය) ඇසීම හා සමගම මගේ ශීලයද මම මෙනෙහි කෙළෙමි. එම අසුනෙහිම ඉඳ රහත් බවටද පැමිණියෙමි.

**960.** "උත්පත්තියෙන් පස් හැවිරිදි කල්හි රහත් බවට පැමිණියෙමි. පසැස් ඇති බුදුරජ තෙම මාගේ ගුණ දැන (මා) උපසපන් කරවිය.

**961.** "මම සම්පූර්ණ සිල් රැක මින් අපරිමෙය්‍ය කල්පයෙහි (සිට) දුගතියකට නොගියෙමි.

**962.** "එම පන්සිල්වල අනුහසින් ඒ මම යසස් අනුභව කෙළෙමි (එම යසස) කල්ප කොටියක් මුළුල්ලෙහි කියන්නේ නමුදු ස්වල්පමාත්‍රයක්ම කියන්නේය.

**963.** "මම පන්සිල් රැක අනුසස් තුනක් ලබමි. (කවර නම් අනුසස් තුනක්ද යත්) මම දීර්ඝායු ඇත්තේ වෙමි. මහත්වූ භෝග සම්පත් ඇත්තේ වෙමි. තීක්ෂණ ප්‍රඥා ඇත්තේද වෙමි.

**964.** "සියලු දෙනාහට (තමාගේ) අධික මාත්‍රවූ ශූරබව ප්‍රකාශ කරන්නාක් මෙන් කුදුමහත් භවයෙහි (සසරෙහි) හැසිරෙමියි මෙම තනතුර ලබමි.

**965.** "අප්‍රමාණවූ ශීලයන්හි (රැකීම් වශයෙන්) පවත්නා බුද්ධ ශ්‍රාවකතෙමේ ඉදින් භවයන්හි රැඳෙන්නේ නම් විපාකය කෙබඳු වන්නේද,

**966.** "විශේෂ දැකුම් ඇති බැලයෙකුවූ මා විසින් පන්සිල් මැනවින් රැස් කරන ලදී. මම එම ශීලය කරණකොටගෙන අද සියළු භව බන්ධනයෙන් මිදුනෙමි.

**967.** "මින් අපරිමෙය්‍ය කල්පයෙහි පන්සිල් රැක්කෙමි. (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මේ පන්සිල් (රැකීමේ) විපාකයයි - 968

---

## 25. අත්ත සංසාවක ථෙරපදානය

**969-970.** "(අවන්හල් සිහිත) ඇතුළු වීථියෙහි වඩින්නාවූ ස්වර්ණ වර්ණවූ රන් තොරණක් මෙන් බබළන දෙතිස් මහ පුරිස් ලකුණු ඇති ලොව බබුළුවන්නාවූ අපමණ ගුණ ඇති අනුපමවූ (උපමා රහිත) දැමුනාවූ දීප්තිය දරන්නාවූ සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේ දැක උතුම්වූ ප්‍රීතියක් ලැබීමි.

**971.** "(මම) බුදුරජාණන් වහන්සේ වැඳ ඒ මහාමුනීන් වහන්සේ වැළඳ වීමි. එකල්හි මා කාරුණික වූ බුදුරජාණන් වහන්සේ මට අනුමෝදනා (ධර්මය දෙශනා) කළසේක.

**972.** "(සත්වයාට) උතුම්වූ අස් වැසිලි කරන ඒ මහා කාරුණිකවූ බුදුරජාණන් වහන්සේ කෙරෙහි සිත පහදවා මම කල්පයක් ස්වර්ගයෙහි සතුටු වීමි.

**973.** "මින් සිව් අනූවන කල්පයෙහි එකල්හි යම් දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. භික්ෂා දානයාගේ මේ විපාකයි. - 974

---

## 26 ධූපදායක ථෙරාපදානය

**975** "ලොක ජ්‍යෙෂ්ඨවූ තාදී ගුණ ඇති සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේගේ (ගන්ධ කුටියට) පැහැදුනු සිතින් මා විසින් කුටිධූපයක් (ගඳකිළියට සුවඳ දුමක්) දෙන ලදී.

**976.** "යම් පින්කමක් කරණකොටගෙණ දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යම් භවයක උපදිම් නම් සියළු දෙනාටම ප්‍රිය වෙමි. සුගන්ධ ධූපදානයාගේ මේ විපාකයයි.

**977.** "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් සුවඳ (දුම් දනක් දුනිම්ද) (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. සුගන්ධ ධූපදානයාගේ මේ විපාකයයි. - 978

---

## 27 පුලින පූජක ථෙරපදානය

**979.** "විපස්සී බුදුරජාණන් වහන්සේගේ උතුම්වූ බොධිද්‍රෘම මූලයෙහි පරණ වැලි අස්කොට පිරිසිදු (අළුත්) වැලි විසිරවීමි.

**980.** "මින් එක් අනූවන කපෙහි මම යම් වැලි (විසිර වීමේ) දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මෙය වාලුකා (වැලි) දානයාගේ විපාකයයි.

**981.** "මින් තෙපණස් වන කපෙහි ජනයා අභිභවනය කරන්නාවූ මහත් බල ඇති "මහා පුලින" නම්වූ සක්විති රජෙක් වීමි, - 982

---

## 28. උත්තරිය ථෙරාපදානය

983. "මම එකල්හි චන්ද්‍රභාගා නදී තීරයෙහි (සූ සූ හඬ නගමින් ජලයෙන් උඩට දිය බුබුළු මතු කරන බැවින් නොහොත් කුඩා මත්ස්‍ය සමූහයා කඩ කඩ කොට මරා දමන බැවින්) සුංසුමාර නම්වූ චණ්ඩමත්ස්‍යයෙක් (කිඹුලෙක්) වීමි. ගොදුරු සෙවීමෙහි නිරතවූ මම නදී තීර්ථයකට පැමිණියෙමි.

**984.** "එසමයෙහි තෙමේම සියල්ල අවබොධ කළාවූ අග්‍ර පුද්ගලවූ ඒ සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේ ගඟ තරණය කරනු කැමැත්තෝ නදීතීර්ථයට පැමිණිසේක.

**985.** "බුදුරජාණන් වහන්සේ එළඹි කල්හි මමද එහි ගියෙමි. එළඹ තථාගතයන් වහන්සේට මෙම වචනය කීමි. කෙබඳු වචනයක්ද යත්?

**986.** "මහා වීරයන් වහන්ස, නගිනු මැනව මම ඔබ (ගහින්) එතර කරන්නෙමි (මේ ජලය) මාගේ පරම්පරාවෙහිවූ ගෝචරයයි."

**987.** "මාගේ ගිගුම් හඬ (ආරාධනය) අසා බුදුරජාණන් වහන්සේ (මාගේ පිටෙහි) නැඟුනේය. සතුටුසිතින් පිනාගියේ ලෝකනායකයන් වහන්සේ එතෙර කෙළෙමි.

**988.** "ගඟ පරතෙරෙහිවූ සිද්ධාර්ථ බුදුරජතෙම එහිදී මා අස්වැසීය" (කෙසේද යත්?) නිවණට පැමිණෙන්නෙහිය. (කියායි)

**989.** "මම එම කයින් චුතව දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි. දිව්‍යප්සරාවන් විසින් පිරිවරණ ලදුයේ දිවසුව අනුභව කෙළෙමි.

**990.** "මම ශක්‍රදෙවෙන්ද්‍රව සත්වරක් දිව්‍ය රාජ්‍යය කෙළෙමි. තෙවරක් පෘථිවීශ්වරවූ සක්විති රජවීමි.

**991.** "මම විවේකයෙහි යෙදුනේ ප්‍රඥා ඇත්තේ මැනවින් සංවරවූ ඉඳුරන් ඇත්තේ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි මේ අන්තිම ශරීරය දරමි.

**992.** "මින් සිව් අනූවන කපෙහි යම් බුදුවරයෙක් (ගඟින්) එතර කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. (එම) එතෙර කිරීමෙහි මේ විපාකයයි. - 993

---

## 29 එකඤ්ජලික ථෙරපදානය

**994-995** "(අවන්හල් සහිත) ඇතුළු වීථියෙහි වඩින්නාවූ (සසරකතරින් සත්වයා එතෙර කරන බැවින්) ශ්‍රෙෂ්ඨ සාර්ථ වාහකයෙකුවූ මනුෂ්‍ය වීරයෙකුවූ (සත්වයා නිවන් පුරයට පමුණුවන බැවින්) විනායකවූ නොදැමුනු අය දමනය කරන්නාවූ තාදීගුණ ඇති මහා වාදීවූ මහා ප්‍රාඥවූ ස්වර්ණවර්ණවූ විපස්සී බුදුරජාණන් වහන්සේ දැක මම පැහැදුනේ සොම්නස් සිත් ඇත්තේ දෑත් එක්කොට ඇඳිලි කෙළෙමි.

**996.** "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි (විපස්සී බුදුරජුන්ට) යම් ඇඳිලි බැඳීමක් (වැඳීමක්) කෙළෙම්ද (ඒ හේතුවෙන්) අගතියක් නොදනිමි. අඤ්ජලී කර්මයාගේ මේ විපාකයයි. - 997

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 30 බොමදායක ථෙරාපදානය

998. "එකල්හි මම බන්ධුමතී නගරයෙහි වෙළෙඳෙක්වීමි. එම වණික් කර්මයෙන්ම භාර්යාව පොෂණය කරමි. (දාන ශීලාදි පුණ්‍ය) බීජ සම්පත්ද රොපණය කරමි.

999. "වීර්‍යයට පිළිපන් ශාස්තෲවූ විපස්සී බුදුරජාණන් වහන්සේට පින් පිණිස කොමු පිළියක් මා විසින් දෙනලදී.

1000. "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි (මම) යම් කොමු පිළිදනක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. කොමු පිළිදානයාගේ මේ විපාකයයි.

1001. "මින් සත් විසිවන කපෙහි සිව්මහ දිවයිනෙහි අධිපතිවූ සප්ත රත්නයන්ගෙන් යුක්තවූ 'සින්ධවසන්දන' නම් එක් සක්විති රජෙක්වීමි - 1002

**(සතරවෙනි බණ වරයි)**

---

## 4. කුණ්ඩධාන වග්ග

## 31 කුණ්ඩධාන ථෙරාපදානය

1003 "සතියක් (නිරොධ සමාපත්තියට සමවැදී) විවේකයෙන් සිටි සියල්ල තෙමේම අවබෝධ කළාවූ අග්‍ර පුද්ගලවූ (පදුමුත්තර) බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත එළඹීමි.

1004. "මම (නිරොධ සමාපත්තියෙන්) නැඟී සිටි මහා මුනිවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේට (දානය පිළිගැන්වීමට) සුදුසු කළැයි දැන මහත්වූ කෙසෙල් කැණක් ගෙන එළඹියෙමි.

1005. "ලෝකනායකවූ මහාමුනිවූ භාග්‍යවතුන් වහන්සේ එම පලය (කෙසෙල් කැණ) පිළිගෙන මාගේ සිත පහදවන සේක් වැළඳූ සේක.

1006. "(තමාට වැඩ කෙනෙකුන් නැති බැවින්) සත්වයන් සසර සතරින් එතෙර කරන බැවින් සාර්ථවාහකයෙකු වැනිවූ බුදුරජාණන් වහන්සේ වළඳා ස්වකීය අසුනෙහි වැඩහිඳ මෙම ගාථාවන් වදාළසේක.

1007. "මෙම පර්වතයෙහි රැස්වූ යම් යක්ෂ කෙනෙක් වෙසෙත් නම් (ඔව්හුද) අරණෙහි (මෙම ධර්මයට සුදුසු අනිකුත්) භූතයෝද මාගේ වචනය අසත්වා!

1008. "ඒ යමෙක් කේශර සිංහයෙකු මෙන් සර්වඥවූ මා වෙත එළඹියේද, මම ඔහු (කවරෙක්දැයි) ප්‍රකාශ කරන්නෙමි. (එය) කියන්නාවූ මාගේ වචනය අසව්.

1009. "ඒ මේ තැනැත්තේ එකොළොස් වරක් ශක්‍රදෙවේන්ද්‍ර වන්නේය. සූතිස් වරක් සක්විති රජ වන්නේය.

1010. "කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ ගොත්‍රයෙන් ගෞතම නම් ශාස්තෘ තෙම ලොව පහළ වන්නේය.

1011. "සිල්වත් රහත් භික්ෂූන්ට ආක්‍රොශ කොට එම පාපකර්මයාගේ විපාකයෙන් (කුණ්ඩධාන යන) නමක්ද ලබන්නේය.

1012. "හෙතෙම ඒ (ගෞතම) බුදුරජාණන් වහන්සේගේ ධර්මයට දායාදවූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනිවූ නමින් කුණ්ඩධාන නම් ඖරස (බුද්ධ) පුත්‍රවූ ශ්‍රාවකයෙක් වන්නේය." (කියායි)"

1013. "මම ප්‍රකර්ෂ විවේකයෙහි යෙදුනේ ධ්‍යාන කරන සුළුවූයේ ධ්‍යානයෙහි ඇළුනේ ශාස්තෘන් වහන්සේ සතුටු කොට ආශ්‍රව රහිතව වෙසෙමි.

1014. "අග්‍ර ශ්‍රාවකයන් විසින් පිරිවරණලද භික්ෂු සංඝයා විසින් පෙරටුකරන ලද සර්වඥතෙම බික් සඟන මැද හිඳ සලාක ගැන්වීය.

1015. "සිවුරු සකස්කොට ලොකනායකවූ බුදුරජාණන් වහන්නසේට වැඳ තථාගතයන් වහන්සේ ඉදිරියෙහිදීම පළමුකොටම (සලාක) ගතිමි.

1016. "එම කර්මය කරණකොටගෙන දසදහසක් සක්වල කම්පනය කරන්නාවූ භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා මැද හිඳ අග්‍රස්ථානයෙහි තැබීය.

1017. "නිර්වාණ සංඛ්‍යාත යෝගක්ෂෙමයට පමුණුවන ධුරවාහකයා (ගැල්බර උසුලන ගවයා) මාගේ වීර්යයයි. (මම මේ) සර්වඥ සාසනයෙහි අන්තිම ශරීරය දරමි. (අන්තිම ආත්මයයි) 1018

---

## 32 සාගත ථෙරාපදානය

1019 "එකල්හි මම නමින් සෝභිතයයි (ප්‍රකට) බමුණෙක්වීමි. ස්වකීය ශිෂ්‍යයන් විසින් පිරිවරණ ලදුයේ ආරාමයට ගියෙමි.

1020. "එකල්හි පුරුෂෝත්තමවූ (පදුමුත්තර) භාග්‍යවත් තෙමේ භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලදුයේ අරම් දොරටුවෙන් නික්ම සිටියේය.

1021. "දමනයවූ දමනයවූවන් විසින් පිරිවරණ ලද්දාවූ ඒ ලෝකනායකයන් වහන්සේ දුටුවෙමි. (දැක) ස්වකීය චිත්තය පහදවා සතුටු සාමීචි කථා කෙළෙමි. (කෙසේදයත්?)

1022. "යම්කිසි වෘක්ෂ කෙනෙක් වෙත් නම් ඒ සිලු වෘක්ෂයෝ පොළොවෙහි වැඩෙත්. එසේම බුද්ධිමත් සත්වයෝ සර්වඥ ශාසනයෙහි වැඩෙත්.

1023. "සප්‍රාඥවූ මහර්ෂිවූ බුදුරජාණන් වහන්ස! (ඔබ වහන්සේ) බොහෝ ජනයා විෂයෙහි (සසර කතරින් සත්වයා එතෙර කරන බැවින්) සාර්ථ වාහකයෙක් වෙහිය. ඔබ නොමගින් නගා (සත්වයාට) මග කියන්නෙහිය.

1024. "(එසේම ඔබ තෙමේ) දැමුනේ දමනය වූවන් විසින් පිරිවරණලද්දෙහිය. ධ්‍යාන කරන සුළුවූයේ ධ්‍යානයෙහි ඇළුනවුන් විසින්ද කෙලෙස්තවන වීර්යයෙන් යුක්තවූයේ නිවණකරා මෙහෙයූ සිත් ඇත්තවුන් විසින්ද උපශාන්ත වූවන් විසින් හා තාදීගුණ යුක්තවූවන් විසින්ද (පිරිවරණ ලද්දෙහිය)

1025. "පිණින් හා නුවණින් යුත් පිරිස කරණකොට ගෙන අලංකාරවූයේ හොබනෙහිය හිරු උදාවන කල්හි මෙන් ඔබගේ ප්‍රභාව පැතිරේ (ය කියායි)

1026. "මහර්ෂිවූ පදුමුත්තර බුදුරජතෙම පහන් සිත් ඇති (මා) දැක භික්සඟන මැද හිඳ මෙම ගාථාවන් වදාළසේක (කෙසේදයත්)

1027. "යම් බමුණෙක් තෙම සතුටු සිත් උපදවා මා වර්ණනා කෙළේද, හෙතෙම කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේය.

1028. "කුශල මූලයෙන් මෙහෙයන ලදුයේ තුෂිත දිව්‍ය ලෝකයෙන් චුතව ගෞතම බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි පැවිදි වන්නේය.

1029. "මැනවින් කරණලද එම පුණ්‍යකර්මය කරණ කොටගෙන රහත්බව ලබන්නේය. (නමින්) සාගත නම්වූ බුද්ධ ශ්‍රාවකයෙක් වන්නේය." (කියායි)

1030. "සසුනෙහි පැවිදිව කයින් පව්කම් දුරුකළෙමි. වාග් දුශ්චරිතය හැර දිවි පැවැත්ම පිරිසිදු කළෙමි.

1031. "මෙසේ වසන්නාවූ මම තෙජොධාතුන්හි දක්ෂවූයේ (සියළු ආශ්‍රවයන්) ප්‍රහාණ පරිඥා වශයෙන් දැන (දුරුකොට) ආශ්‍රවරහිතව වෙසෙමි - 1032

---

### 34 මහාකච්චායන ථෙරාපදානය

1033. "පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ පදුම නම් චෛත්‍යයක් විය. (එහි) ගල්අසුනක් කරවා ස්වර්ණාලේප කරවීය.

1034. "ස්වර්ණමය ඡත්‍රයක්ද වල්විදුනාවක්ද ගෙන ලොකබන්ධුවූ තාදී ගුණ ඇති බුදුරජාණන් වහන්සේට නගා තැබීය.

1035-1036 "එකල්හි භූමිය ඇසුරුකළාවූ යම්තාක් දෙවියෝ වෙත් ම් සියල්ලෝම රැස්වූහ. (කුමකටදයත්? ස්වර්ණමය ඡත්‍රයාගේ විපාකය වදාරන්නේය. එසේ වදාරන්නාවූ බුදුරජාණන් වහන්සේගේ ඒ සියලු කථාව අසන්නෙමු. සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේගේ ශාසනයෙහි වැඩියක් සතුට උපදවන්නෙමුය කියායි.

1037. "සියළු දතයුතුදෑ තෙමේම දන්නාවූ අග්‍ර පුද්ගලවූ බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලද සේක් ස්වර්ණාසනයෙහි හිඳ මෙම ගාථාවන් වදාළසේක.

1038. "යමෙකු විසින් ස්වර්ණ රත්නමයවූ (සත්රුවනින් කරණලද) මෙම අසුන පුදන ලදද ඔහු (කවරෙක්දැයි) මම ප්‍රකාශකරන්නෙමි (එය) පවසන්නාවූ මාගේ වචනය අසව්.

1039. "තිස් කපක් මුළුල්ලෙහි ශක්‍ර දෙවෙන්ද්‍රව දිව්‍ය රාජ්‍ය කරන්නේය. හාත්පස යොදුන් සියයක් ප්‍රභාවෙන් යටපත් කරන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

1040-1041. "මිනිස් ලොව අවුත් උග්‍රතේජස්ඇති තමන් ප්‍රභාස්වර නම් වූ සක්විති රජෙක් වන්නේය. (මෙම) ක්ෂත්‍රිය තෙමේ උදාවූ සූර්යයා මෙන් දිවා රෑ දෙක්හිම හාත්පස අට රියනක් (තැන්) බබුලුවන්නේය.

1042. "(මින්) කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ නමින් ගෞතම නම්වූ ශාස්තෘතෙමේ ලොව හළවන්නේය.

1043. "කුශලමූලයෙන් මෙහෙයන ලද්දාවූ මම තුසී පුරයෙන් චුතව නමින් කච්චායන නම් වූ බමුණෙක් වන්නේය.

1044. "හෙතෙම පසුව පැවිදිව ආශ්‍රව රහිතවූ රහත් කෙනෙක් වන්නේය. ලොව බබුළුවන්නාවූ ගෞතම බුදුරජ තෙමේ (හේ) අග්‍රස්ථානයෙහි තබන්නේය. (කෙසේදයත්)

1045. "මෙතෙම) සංක්ෂිප්ත ලෙස විචාරණ ලද ප්‍රශ්න විස්තර වශයෙන් කියන්නේය. ඒ ප්‍රශ්නය (විස්තර කොට) කියන්නේද, (අසන්නාගේ) අදහස සම්පූර්ණ කරන්නේය" (කියායි)

1046. "ආඪ්‍ය කුලයෙහි උපන්නාවූ මන්ත්‍ර විෂයයෙහි පරතෙරට ගියාවූ බ්‍රාහ්මණයෙකුවූ (මම) ධන ධාන්‍යයන් අතහැරදමා අනගාර්ය නම් සසුනෙහි පැවිදිවීමි.

1047. "මම සංක්ෂිප්ත ලෙස විචාරණ කල්හිඳු විස්තර වශයෙන් කියමි (විචාරන්නාවූ) ඔවුන්ගේ අදහස් සම්පූර්ණ කරමි ද්විපදොත්තමවූ බුදුරජාණන් වහන්සේ සතුටු කරමි.

1048. "මා විසින් තුටු කරන ලද්දාවූ මහා වීරවූ සියල්ල තෙමේම දක්නාවූ අග්‍ර පුද්ගලවූ (ජ්‍යෙෂ්ඨ බුදුරජතෙම) බික්සඟන මැද හිඳ මා එතදග්‍රස්ථානයෙහි තැබීය. 1049

---

## 34 කාළුදායි ථෙරාපදානය

1050-1051 "මම එකල්හි ලොක ජ්‍යෙෂ්ඨවූ තාදීගුණ ඇති මහමගට පිළිපන් චාරිකාවෙහි හැසිරෙන්නාවූ ශාස්තෘවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේට මැනවින් පිපුණු පියුම්ද උපුල්ද, බෝලිද්ද ද ආහාර (දානය) ද ගෙන (එහි) ගියෙමි.

**1052.** "මහාවීරතෙම උතුම් ආහාරය වූ මනා භෝජනය වළඳයි. ඒ මල්ද ගෙන මහජනයාට දැක්විය (කෙසේදයත්?)

**1053.** "(මේවා) ලොකයෙහි ඉෂ්ටවූ මනවඩන්නාවූ ප්‍රියවූ උතුම් ජලජ (ජලයෙහි හටගන්නාවූ) පුෂ්පයෝ වෙති. යමෙක්තෙම මට මේ මල් දුන්නේද ඔහු විසින් ඉතා දුෂ්කර පින්කමක් කරනලදී.

**1054.** "යමෙක් මට මල් නගා දුන්නේද උතුම් වූ ආහාරය දුන්නේද ඔහු (කවරෙක්දැයි) මම කියන්නෙමි. කියන්නාවූ මාගේ වචනය අසව් (කෙසේදයත්?)

**1054-1055.** "හෙතෙම අටළොස් වරක් දිව්‍ය රාජ්‍යය කරන්නේය. එකෙණෙහි ඔහුගේ පුණ්‍ය විපාකයෙන් උපුල්ද පියුම්ද, බෝලිද්දද එයටද වැඩි දිව්‍යමය සුගන්ධයෙන් යුතුව අහසෙහි වියනක් කොට දරන්නේය.

**1057.** "පස්විසි වරක් සක්විති රජ වන්නේය. පන්සිය වරක් පෘථිවි රාජ්‍යය ලබා පොළොවෙහි වසන්නේය.

**1058.** "(මින්) කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ නමින් ගෞතම නම් වූ ශාස්තෘතෙම ලොව පහළවන්නේය.

**1059.** "කුශල මූලයෙන් මෙහෙයන ලද ස්වකීය කටයුතු පටන්ගත් හෙතෙම ශාක්‍යයින්ගේ සතුට ඇතිකරන්නාවූ නෑ සබඳකම් ඇත්තෙක් වන්නේය.

**1060.** "කුශලමූලයෙන් මෙහෙයන ලද හෙතෙම පසුව පැවිදිව සියලු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥා වශයෙන් දැන (දුරුකොට) ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය.

**1061.** "ලොක බන්ධුවූ ගෞතම බුදුරජාණන් වහන්සේ පැමිණි (සිව්) පිළිසිඹියාවන් ඇතිකරණලද කටයුතු ඇති ආශ්‍රව රහිතවූ හේ අග්‍රපදවියෙහි තබන්නේය. (කෙසේදයත්?)

**1062.** "වීර්ය වැඩූ නිවණ කෙරෙහි මෙහෙයූ සිත් ඇති උපශාන්තවූ උපධි රහිතවූ අහතෙම නමින් උදායී නම් වූ බුද්ධශ්‍රාවකයෙක් වන්නේය කියායි.

**1063.** "රාගයද, ද්වෙෂයද, මොහයද මක්ඛය (ගුණමකු බව) ද විනාශ කරන ලදුයේ සියලු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥා වශයෙන් දැන (දුරුකොට) ආශ්‍රව රහිතව වෙසෙමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

1064. "කෙලෙස් තවන වීර්යයෙන් යුක්තවූ ප්‍රඥාවත්වූ මම බුදුරජාණන් වහන්සේ සතුටු කෙළෙමි. ප්‍රමුදිතවූ බුදුරජ තෙම මා අග්‍රපදවියෙහි තැබීය - 1065

---

## 35 මොඝරාජ ථෙරාපදානය

1066 "සියල්ල තෙමේම දැනගත්තාවූ අපරාජිතවූ (පස්මරුන් දිනූ) අත්ථදස්සී භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා විසින් පිරිවරණලද්දුයේ වීථියට පිළිපන්සේක.

1067 "මම ශිෂ්‍යයන් විසින් පිරිවරණ ලදුයේ ශාසනයෙන් නික්මුණෙමි. නික්ම එහි ලෝකනාථයන් වහන්සේ දුටුවෙමි.

1068 "සිරසෙහි ඇඳිලිබැඳ බුදුරජුන් වැඳ සිය සිත පහදවා ලෝකනායකයන් වහන්සේ (හා) පිළිසඳර කථා කෙළෙමි. (කෙසේදයත්?)

1069 "යම් පමණ රූපාවචර බ්‍රහ්මලෝක වාසී සත්වයෝ වෙත්ද, එසේම අරූපාවචර බ්‍රහ්මලෝකවාසී සත්වයෝද අසංඥතල සත්වයෝ වෙත්ද ඒ සියල්ලෝ ඔබවහන්සේගේ ඥානයෙහි ඇතුළත් වෙත්. (ඔබවහන්සේගේ නුවණට ඔවුන් පෙණෙත්.)

1070 "යමෙක් කුඩා සිදුරු ඇති දැලක් දියෙහි දමන්නේ නම් (එවිට) දියෙහි කිසියම් ප්‍රාණී කෙනෙක් වෙත්ද? (ඔව්හු) ඇතුළෙහි වෙත්.

1071 "රූපී සත්වයන් පිළිබඳවූ හෝ අරූපී සත්වයන් පිළිබඳවූ යමෙකුගේ චේතනාවක් ඇත්නම් ඒ සියළු චේතනාවෝ ඔබවහන්සේගේ නුවණෙහි ඇතුළත් වෙත්.

1072 "අඳුරෙන් ගැවසීගත් මේ ලෝකයා (ඔබ) නගාසිටුවූයෙහිය ඔව්හු ඔබවහන්සේගේ ධර්මය අසා සැකය නැමැති සැඩපහර තරණය කෙරෙත්.

1073 "ලෝකවාසී සත්වතෙමේ අවිද්‍යාව විසින් වසාගන්නාලදී. (මොහ) අන්ධකාරය විසින් වෙළාගන්නාලදී. ඔබ වහන්සේගේ නුවණ බබළන කල්හි (ලෝවැස්සෝ) නසනලද මොහාන්ධකාර ඇත්තෝ වෙත්.

1074 "ඔබ සියළුදෙනාගේ මහා මොහාන්ධකාරය දුරුකරන්නාවූ ඇසක් වෙහිය. බොහෝ ජන තෙමේ ඔබවහන්සේගේ ධර්මය අසා (කෙළෙස් ගින්න) නිවාගනී.

1075 "නිදොස්වූ බුද්දක මධු සැලියක් පුරවා දොහොතින් ගෙනගොස් බුදුරජාණන් වහන්සේට පිළිගැන්වීමි.

1076 "මහර්ෂිවූ මහාවීරවූ (අත්ථදස්සී) බුදුරජතෙම ඒ මී අනුභව කොට අහසට නැංගේය.

1077 "අහසෙහි සිටියාවූ නරශ්‍රෙෂ්ඨවූ අත්ථදස්සී ශාස්තෘතෙම මාගේ සිත පහදවමින් මෙම ගාථාවන් දෙසීය.

1078 "මේ (බුද්ධ) ඥානය යමෙකු විසින් පසසන ලදද බුද්ධශ්‍රෙෂ්ඨතෙමේද (යමෙකු විසින්) තුති කරන ලදද, හෙතෙම එම චිත්තප්‍රසාදය කරණකොටගෙන දුගතියකට නොයයි.

1079 "හෙතෙම තුදුස් වරක් දිව්‍යරාජ්‍යය කරන්නේය. අටසිය වරක් පෘථිවි රාජ්‍යය (කොට) පොළොවෙහි වාසය කරන්නේය.

1080 "ඉක්බිති පන්සිය වරක් සක්විති රජ වන්නේය. පෘථිවියෙහි අසංඛ්‍ය වාර ගණනක් ප්‍රදේශ රාජ්‍යය කරවන්නේය.

1081 "වේද හදාරන්නාවූ මන්ත්‍රධරවූ වේදත්‍රයෙහි පරතෙරට ගියාවූ (හෙතෙම) ගෞතම බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි පැවිදි වන්නේය.

1082 "ගැඹුරුවූ සියුම්වූ අර්ථ නුවණින් දැනගන්නේය. (හෙතෙම) නමින් මොඝරාජ යයි බුද්ධශ්‍රාවකයෙක් වන්නේය.

1083 "(සසර කතරින් සත්වයන් එතරකරන බැවින්) අග්‍රසාර්ථවාහකයෙකු වැනිවූ ගෞතම බුදුරජතෙමේ ත්‍රි විද්‍යාවන් ගෙන් යුක්තවූ කොට නිමවන ලද කටයුතු ඇති ආශ්‍රව රහිතවූ (හේ) අග්‍රපදවියෙහි තබන්නේය" කියායි.

1084 "මිනිස් යෙදුම් හැර භවබැඳුම් සිඳ සියළු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥා වශයෙන් දැන (හැරදමා) ආශ්‍රව රහිතව වෙසෙමි.
- 1085

---

## 36. අධිමුත්තක ථේරාපදානය.

1086 "මනුෂ්‍යෝත්තමවූ අත්ථදස්සී බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑකල්හි (මම) පැහැදුනු සිතින් යුතුව භික්ෂු සංඝයාට උපස්ථාන කෙළෙමි.

1087 "ඍජු ගුණයෙන් යුත් එකඟ සිත් ඇති සංඝරත්නය පවරා උක්වලින් මඩුවක් කරවා උතුම් සංඝයා වැළඳවීමි.

1088 "දිව්‍යයවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යම් යොනියක උපදිම් නම් සියළු සත්වයන් අභිභවනය කරමි. මේ (එම) පුණ්‍ය කර්මයාගේ ඵලයයි.

1089 "කල්ප එක් දහස් අට සියයකට පෙරවූ එකල්හි යම් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. උක්දනෙහි මේ විපාකයයි 1090

---

## 37 ලසුනදායක ථේරාපදානය.

1091 "මම එකල්හි හිමවතට නුදුරු තන්හි තවුසෙක් වීමි. (රතු) ළුහුණු (ආහාර කොටගෙන) ජීවත්වෙමි. මාගේ භෝජනය ළුහුණුය.

1092 "මම (ළුහුණු) කදක් පුරවාගෙන සංඝාරාමයට ගියෙමි. සතුටුවූයේ සතුටු සිතින්ම සංඝයාට ළුහුණු දුනිමි.

1093 "මම විපස්සී නරශ්‍රෙෂ්ඨයන් (බුදුරජාණන්) වහන්සේගේ සසුනෙහි නිරතවූ සංඝයාට ළුහුණු දී කල්පයක් මුළුල්ලෙහි ස්වර්ගයෙහි සතුටුවීමි.

1094 "(මින්) එකානූවන කල්පයෙහිවූ එකල්හි (මම) යම් ළුහුණු දනක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ළුහුණු දානයාගේ මේ විපාකයි. 1095

---

## 38 ආයාගදායක ථේරාපදානය.

1096 "කථා කරන්නවුන් අතුරෙහි උතුම්වූ සිඛී බුදුරජාණන් වහන්සේ පිරිනිව් කල්හි (මම) සතුටුවූයේ සතුටු සිතින් ශ්‍රෙෂ්ඨ චෛත්‍යය වැන්දෙමි.

1097 "මම එක්ලහි වඩුවන් සමග කථාකොට මුදල් දී සතුටුවූයේ සතුටු සිතින් දීර්ඝ භෝජන ශාලාවක් කරවීමි.

1098 "(ඒ හේතුවෙන්) මම අට කපක් නොකඩකොට දෙව්ලොව විසිමි. සෙසු කල්පයන්හි (දිව්‍ය මනුෂ්‍ය දෙගතියෙහි) මිශ්‍ර ලෙස සැරි සැරීමි.

1099 "මාගේ කයෙහි විෂ ඇතුළු නොවේ. ආයුධ මා නොනසත්. දියෙහි මම නොමැරෙමි. ආයාග (දීර්ඝශාලා) දානයාගේ මේ විපාකයයි.

1100 "ඉදින් මම වැස්ස කැමතිවෙම් නම් මහ වැසි වසින්නේය. දෙවියෝද මාගේ වසඟයට පැමිණෙත් (ආයාග දානමය) පුණ්‍යකර්මයාගේ මේ විපාකයයි.

1101 "මම තිස් වරක් සත් රුවනින් යුක්තවූ සක්විති රජවීමි. මට කිසිවෙක් නින්දා නොකෙරෙත්. පුණ්‍යකර්මයාගේ මේ විපාකයයි.

1102 "මින් එක් තිස්වන කල්පයෙහි (මම) යම් දීර්ඝ ශාලාවක් කරවීම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි දීර්ඝ ශාලා දානයාගේ මේ විපාකයයි 1103

---

## 39 ධම්මචක්කික ථෙරාපදානය.

1104. "සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මාසනය ඉදරියෙහි මා විසින් මැනවින් කරණලද නුවණැත්තවුන් විසින් වර්ණනා කරන ලද ධර්ම චක්‍රයක් තබනලදී.

1105. "මනොඥවූ (ස්වර්ණ) වර්ණවූයේ (ස්වර්ණ සිවිකාවි) යානද (සේනාපති - මහාමාත්‍යාදී) සේවා භටයන්ද (හස්ති අශ්ව - රථ නම්) වාහනද ඇත්තේ බබළමි. මා අනුව පවතින්නාවූ බොහෝදෙනා නිරතුරුවම මා පිරිවරත්.

1106. "මම හැමකල්හි සැටදහසක් තූර්යයන්ගෙන් පරිවරණය කරමි. පිරිවර කරණකොටගෙන බබළමි. පුණ්‍යකර්මයාගේ මේ පලයයි.

1107. "(මින්) සිව් අනූවන කල්පයෙහි මම යම් (ධර්ම) චක්‍රයක් තැබූයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ධර්ම චක්‍රදානයාගේ මේ විපාකයයි.

1108. "මින් එකොළොස්වන කල්පයෙහි නමින් සහස්ස රාජ නම්වූ ජනාධිපතිවූ මහත් බල ඇති සක්විති රජවරු අටදෙනෙක් (අට වරකට) වූවාහුය. 1109

---

## 40 කප්පරුක්ඛිය ථෙරාපදානය.

1110. "මම සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රෙෂ්ඨ ස්ථූපය ඉදිරියෙහි විසිතුරු දුහුල් එල්වා කප් රුකක් තැබීමි.

1111. "දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යම් යෝනියක උපදිම්ද (ඒ හැම අත්බැව් හිදීම) මාගේ දොරටුව හොබවමින් කප් රුකක් එහි පිහිටයි.

1112. "මමද මා ඇසුරු කළ යම්කිසි පිරිසක් වෙත්නම් ඔව්හුද යන අපි හැමකල්හි එම කප්රුකින් දුහුල් ගෙන හැදීමු.

1113. "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් කප් රුකක් තැබීමද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි.) කල්ප වෘක්ෂ දානයාගේ මේ විපාකයයි.

1114. "මෙයින් සත්වෙනි කල්පයෙහි සත් රුවනින් යුත් මහත් බල ඇති සූබේල නම්වූ සක්විති රජවරු අටදෙනෙක් වූහ. 1115

---

# 5 උපාලි වග්ග.

## 41. දුතිය උපාලි ථෙරාපදානය.

1116. "දහසක් රහතුන් විසින් පිරිවරණලද ලෝකනායකවූ ඒ බුදුරජාණන් වහන්සේ විවේකයෙහි යෙදුනේ එකලාව වසන්නට යනසේක.

1117. "(එකල්හි) ත්‍රි දණ්ඩය දරන්නාවූ අඳුන් දිවිසම් සඳින්නාවූ මම ලෝකනායකයන් වහන්සේ (තථාගතයන්) දුටිමි.

1118. "අඳුන් දිවිසම් එකස්කොට සිරසෙහි ඇඳිලි බැඳ ලොකනායක බුදුරජාණන් වහන්සේ වැඳ (උන්වහන්සේ සමග) පිළිසඳර කථා කෙළෙමි. (කෙසේද යත්?)

1119-1120. "යම්බඳු අණ්ඩජවූ කාකාදි පක්ෂීහුද (එසේම) සංසේදජවූද සියල්ලෝ හා හැමකල්හි අහසෙහි හැසිරෙන්නෝද

යන සංඥීවූ හෝ අසංඥීවූ යම්කිසි සප්‍රාණික භූත කෙනෙක් වෙත් නම් ඒ සියල්ලෝ ඔබවහන්සේගේ නුවණෙහි ඇතුළත් වෙත්.

1121. "උතුම්වූ පව්වෙහි පර්වතයන්හි හටගන්නා ලද (මලයජ) සඳුන් (ආදී) යම් ගන්ධයෝ වෙත් නම් ඒ සියලු සුගන්ධයෝ ඔබවහන්සේගේ සීල (සුගන්ධ) යෙහි කලාවකටද නොයෙදෙත්.

1122. "මේ දෙවියන් සහිත ලෝකයා මොහඳුරු පසට වැටුනේවෙයි. ඔබවහන්සේගේ ඥාණය බබළන කල්හි (ඔව්හු) වසනලද අඳුරු ඇත්තෝ වෙත්.

1123. "යම්සේ සූර්යයා අස්තගතවූ කල්හි සත්වයෝ අඳුරට වැටුනාහුවෙත්ද එසේම බුදුරජාණන් වහන්සේ නූපන් කල්හි ලෝකයා අඳුරට වැටුනේ වේ.

1124. "යම්සේ උදාවන්නාවූ සූර්යයා හැම කල්හි අඳුරු දුරු කෙරේද? එසේම බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඔබවහන්සේ හැමකල්හි අඳුර නසහුය.

1125. "දෙවියන් සහිත ලෝකයෙහි සර්වඥවූ ඔබ වහන්සේ වීර්යයෙහි මෙහෙයූ සිත් ඇත්තේ වෙහිය. ඔබ වහන්සේ තමාගේ ඇරඹූ කටයුතු වලින් බොහෝ ජන සමූහයා සතුටු කෙරෙහිය කියායි.

1125. "ප්‍රාඥවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ඒ සියළු දෙනාට අනුමෝදනාකොට අහසෙහි (යන) හංසරාජයෙකු මෙන් ආකාශයට පැන නැගුනු සේක.

1127. "අහසට පැනනැගී ශාස්තෘවූ මහර්ෂීවූ පදුමුත්තර බුදුරජතෙම අහසෙහි සිටියේ මෙම (ගාථාව) වදාළේය.

1128. "යමෙකු විසින් උපමාවන්ගෙන් යුක්තව මාගේ මෙනුවණ පසසන ලදද ඔබ ඔහු (කවරෙක්දැයි) කියන්නෙමි. (එසේ) කියන්නාවූ මාගේ වචනය අසව්.

1129. "හෙතෙම අටළොස් වරක් ශක්‍ර දිව්‍ය රාජයා වන්නේය. තුන්සියවරක් පෘථිවිරාජ්‍යය කරමින් පොළොවෙහි වාසය කරන්නේය.

1130. "පස්විසි වරක් සක්විති රජ වන්නේය, ලබන ලද මහත්වූ ප්‍රදේශ රාජ්‍යය ගණන් වශයෙන් ගිණිය නොහැකිය.

1131. "(මින්) කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ නමින් ගෞතම නම්වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේය.

1132. "කුශල මූලයෙන් මෙහෙයන ලදුයේ තුෂිත දිව්‍ය ලොකයෙන් චුතව ජාතියෙන් හීනවූයේ උපාලි නම් වන්නේය.

1133. "හෙතෙම පසුව පැවිදිව පවට නොඇලී සියලු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥා වශයෙන් දැන (දුරුකොට) ආශ්‍රව රහිතවූයේ පිරිනිවන් පාන්නේය.

1134. "මහා යසස් ඇති ශාක්‍ය පුත්‍රවූ ගෞතම බුදුරජතෙමේ සතුටුවූයේ (විනය ප්‍රශ්න විෂයයෙහි තියුණු ප්‍රඥා ඇති භික්ෂූන් අතුරෙන්) විනයධරවූද හේ උසස් පදවියෙහි තබන්නේය.

1135. "මම ශ්‍රද්ධාවෙන් පැවිදිවූයේ කොට නිමවන ලද කටයුතු ඇත්තේ ආශ්‍රව රහිතවූයේ සියලු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥා වශයෙන් දැන (දුරුකොට) ආශ්‍රව රහිතව වෙසෙමි.

1136. "භාග්‍යවත් තෙමේ මට අනුකම්පා කළේය. මම විනයයෙහි විශාරද වෙමි. ඇරඹූ සිය කටයුතු ඇත්තේ ආශ්‍රව රහිතව වෙසෙමි.

1137. "ප්‍රාතිමොක්ෂ (ශීල) යෙහිද පසිඳුරන් විෂයෙහිද මැනවින් සංවරවූයේ හුදු මැණික් ආකරයක් වැනිවූ සියළු විනය (ධර්මය) දරමි.

1138. "ලෝකයෙහි නිරුත්තරවූ ශාස්තෘ තෙමේ මාගේ ගුණ දැන භික්ෂු සංඝයා මැදහිඳ මා උසස් පදවියෙහි තැබීය. 1139

---

## 42 සෝණකෝළිය වෙස්ස ථෙරාපදානය

1140. "මම තාදීගුණ ඇති ලොකජ්‍යෙෂ්ඨවූ අනොමදස්සී බුදුරජාණන් වහන්සේට සුණින් ආලේපකොට සක්මණක් කරවීමි.

1141. "මම නා නා වර්ණ පුෂ්පයන්ගෙන් සක්මණ ඇතිරවීමි. අහසෙහි වියනක්ද කොට (බඳවා) උතුම්වූ බුදුරජාණන් වහන්සේ වැළඳ වීමි.

1142. "මනාවූත ඇති බුදුරජාණන් ඇඳිලිබැඳ මම එකල්හී භාග්‍යවතුන් වහන්සේට දීර්ඝ ශාලාවක් පිළිගැන්වීමි.

1143. "ලොකයෙහි අනුත්තරවූ භාග්‍යවත්වූ පසැස් ඇත්තාවූ ශාස්තෲ තෙමේ මාගේ අදහස දැන අනුකම්පාවෙන් පිළිගත්තේයි.

1144. "දෙවියන් සහිත ලෝකයෙහි දක්ෂිණෙය්‍යවූ සර්වඥයන් වහන්සේ (එය) පිළිගෙන භික්ෂු සංඝයා මැද හිඳ මෙම ගාථාවන් වදාළ සේක. (කෙසේද යත්?)

1145. "ඒ යමෙක් සතුටු සිතින් මට දීර්ඝ ශාලාවක් කරවීද මම ඔහු කවරෙක්දැයි ප්‍රකාශ කරන්නෙමි. (එය) ප්‍රකාශ කරන්නාවූ මාගේ වචනය අසව්.

1146. "මැරෙණ අවස්ථාවෙහි පුණ්‍යකර්මයන්ගෙන් යුක්තවූ මෝහට එකෙණෙහි දහසක් අසුන් යෙදූ අශ්ව රථයක් එළෙඹන්නේය.

1147. "මේ පුරුෂතෙමේ ඒ යානයෙන් දෙව්ලොවට යන්නේය. කුශල විපාකය එළඹ සිටි කල්හි දෙවියෝ සතුටු වෙත්.

1148. "රන් සුනු අලෙව්දුන් උතුම් කුළුගෙවලින් යුක්තවූ මාහැඟිවූ ශ්‍රෙෂ්ඨ සඳළු සහිත විමනක වසන්නේය.

1149. "කල්පතිස් දහසක් දිව්‍ය ලොකයෙහි සිත් අලවා වසන්නේය. පස් විසි කපක් ශක්‍රදෙවෙන්ද්‍රයා වන්නේය.

1150. "සත්සැත්තෑ වරක් සක්විති රජ වන්නේය. ඒ සියල්ලෝ යසොධරය යන සමානවූ එකම නම ඇත්තෝය.

1151. "(දිව්‍ය-මනුෂ්‍යයන) විවිධ සම්පත් අනුභවකොට පින්රැස් වඩා අටවිසිවන කපෙහි සක්විති රජ වන්නේය.

1152. "එහි විශ්වකර්මයා විසින් මවනලද උතුම් විමනකි. දශවිධ ශබ්දයන්ගෙන් වෙන්නොවූ එම නගරයෙහි අධිපතිව වසන්නේය.

1153. "මින් අපරිමෙය්‍ය කල්පයෙහි පෘථිවිය පාලනය කරන්නාවූ මහර්ධි ඇති නමින් ඔක්කාක නම්වූ රජෙක් රටෙහි වන්නේය.

1154. "ඒ සියලු සොළොස් දහසක් ස්ත්‍රීන්ට උතුම්වූ විශිෂ්ට ජන්ම ඇති කැත්දූ තොමෝ පුතුන් නවදෙනෙකු වදන්නීය.

1155. "කැත්දූ තොමෝ පුතුන් නවදෙනෙකු වදා මැරෙන්නීය. (ඉක්බිති) ප්‍රියවූ තරුණ කන්‍යාවක් තොමෝ මෙහෙසි බැව්හි (තැබීම්) කරන්නේය.

1156. "එම කන්‍යාතොමෝ ඔක්කාකරජ සතුටුකොට වරයක් ලබන්නීය. වරය ලැබූ ඒ කන්‍යා තොමෝ පුතුන් රටින් පිටුවහල් කරවන්නීය.

1157. "පිටුවහල්වූ ඒ සියල්ලෝ උතුම් පර්වතයකට යන්නාහුය. සියල්ලෝ ජාති භේදය වන බියෙන් සොහොයුරියන් සමග සංවාස කරන්නාහ.

1158. "(ඉන්) එක් (ප්‍රියා නම්) කන්‍යාවක් තොමෝ ව්‍යාධිය (කුෂ්ඨ රෝගය) කින් වැළඳ ගන්නා ලද්දී වන්නීය. ක්ෂත්‍රිය කුමාරවරු "ජාති සමභේදය නොකරාවායි (ඇය) වළක් හාරා එම වළෙහි දමා වසත්.

1159. "(රාම නම්) රජෙක් තෙම (ඇය එම වළින්) ගොඩටගෙන ඇය සමග (අඹු සැමියන් ලෙස) වසන්නේය. එකල්හි ඔක්කාක කුලයෙහි ඇතිවූ ජාතිසම්භෙදය වන්නේය.

1160. "ඔවුන්ගේ ප්‍රජාතොමෝ (දරු මුණුබුරු පරපුර) ජාති වශයෙන් 'කොළිය' නම් වන්නීය, එහි (ඔව්හු) මිනිසුන් සතු අනල්පවූ භෝග සම්පත් අනුභව කරන්නාහුය.

1161. "එම සිරුරින් (ආත්මයෙන්) චුතව දෙව්ලොවට උත්පත්ති වශයෙන් යන්නේය. එහිද මනහරවූ උතුම් විමානයෙක්හි (සැප) විඳින්නේය.

1162. "කුශලමූලයෙන් මෙහෙයන ලදුයේ දෙව්ලොවින් චුතව මිනිසත් බවට පැමිණ 'සොණ' නම් වන්නේය.

1163. "බුදු සසුනෙහි පටන් ගන්නා ලද වීර්ය ඇත්තේ නිවණ කෙරෙහි මෙහෙයන ලද සිත් ඇත්තේ වීර්ය කරමින් සියළු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥා වශයෙන් දැන (ඇසුරු කොට) ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය.

1164. "අනන්ත (දැය) දක්නා සුළුවූ ශාක්‍යකුල ශ්‍රෙෂ්ඨවූ (දතයුතු සියල්ල) විශේෂ ඥානයෙන් දත්තාවූ ගෞතම බුදුරජතෙම (මොහු) අග්‍රස්ථානයෙහි තබන්නේය කියායි.

**1165.** "උතුම් දැමුමෙහි දැමුනේ මා විසින් සිත මැනවින් පිහිටුවා ගන්නා ලදී. (එසේම) මා විසින් සියලු බර බහාතබන ලදී. ආශ්‍රව රහිතව (ක්ලේශ පරිනිර්වාණයෙන්) පිරිනිවුනේ වෙමි.

**1166.** "(සිරුරෙන් රැස් විහිදෙන බැවින්) අංගී රස නම්වූ සතර අගතියට හෝ සතර අපායට නොයන බැවින් මහා නාගවූ ශ්‍රෙෂ්ඨ ජන්ම ඇත්තෝ කේශර සිංහයෙකු වැනිවූ සර්වඥ තෙම භික්ෂු සංඝයා මැද හිඳ මා උතුම් පදවියෙහි තබන්නේය. 1167

---

**43 භද්දිය ථෙරාපදානය.**

**1168** "සියලු ලෝකයෙහි අසහාය නායකවූ මෙත්සිත් ඇති මහා මුනිවූ පදුමුත්තර බුදුරජුන් වෙත සියළු ජන සමූහයා එළඹෙයි.

**1169.** "සියල්ලෝ නිරුත්තරවූ පුණ්‍ය ක්ෂෙත්‍රයෙහි (භික්ෂු සංඝයාටද) ශාස්තෘන් වහන්සේට වස්ත්‍රද සෙනසුන්ද පාන හා භෝජනද (යන) ආමිෂය දෙත්.

**1170.** "මමද දෙවියනට දෙවිවූ තාදී ගුණ ඇති බුදුරජාණන් වහන්සේට දනක් දෙමැයි බුදුරජාණන් වහන්සේද අනුත්තරවූ සංඝයාද පවරා

**1171.** "මා විසින් මෙහෙයන ලද්දාවූ ඒ මනුෂ්‍යයෝද තථාගතයන් වහන්සේද නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍රවූ හුදු භික්ෂු සංඝයාද පැවරූහ.

**1172.** "කොඳු පලස් අතුරන ලද්දාවූද පුළුන් ඇතිරි හා සනපුප් එළුලොම් ඇතිරි අතුරණ ලද්දාවූද කොමු ඇතිරියෙන් හා කපු ඇතිරියෙන් අතුරණ ලද්දාවූද ස්වර්ණ වර්ණවූ පාදයන්හි ව්‍යාළරූප තබා කළ සියක් දහස් මා හැඟීන් අසුන් බුදුරජාණන් වහන්සේ සහිත මහා සංඝයාට පැණ වීමි.

**1173.** "දෙවියනටද දෙවිවූ නරශ්‍රෙෂ්ඨවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලදුයේ මාගේ ගෙ) දොරට එළඹී සේක.

**1174.** "ලොකනාථවූ යසස් ඇති සම්බුදු රජාණන් වහන්සේට පෙර ගමන්කොට පහන් සිත් ඇත්තෝ සතුටුව ස්වකීය ගෘහය (තුළ)ට වැඩම කෙළෙමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

1175. "පහන් සිත් ඇති සොම්නස්වූ (මම) සියක් දහසක් භික්ෂූන්ද ලොක නායකවූ බුදුරජුන්ද උතුම්වූ ආහාර දානයෙන් සන්තර්පණය කළෙමි.

1176. "පූජාවන් පිළිගන්නාවූ නොහොත් පූජාවනට ගෙයක් බඳුවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා මැදහිඳ මෙම ගාථාවෙන් වදාළ සේක (කෙසේද යත්)

1177. "යමෙකු විසින් කොඳු පළස් අතුරණ ලද ස්වර්ණ වර්ණවූ මෙම අසුන දෙන ලදද ඔහු (කවරෙක්දැයි) මම කියන්නෙමි. (එසේ) කියන්නාවූ මාගේ (වචනය) අසව්.

1178. "මෙතෙම සූසැත්තෑ වරක් දිව්‍ය රාජ්‍යය කරන්නේය. දිව්‍යප්සරාවන් විසින් පිරිවරණ ලදුයේ (දිව්‍ය) සම්පත් අනුභව කරන්නේය.

1179. "දහස් වරක් ප්‍රදේශ රාජ්‍යය (ලැබ) පොළොවෙහි වසන්නේය. එක් පණස් වරක් සක්විති රජද වන්නේය.

1180. "සියළු භව යෝනීන්හිදී උසස් කුල ඇත්තේ වන්නේය. කුශල මූලයන් විසින් මෙහෙයන ලද මෙතෙම පසුව පැවිදිව තමන් "භද්දිය නම්වූ බුද්ධ ශ්‍රාවකයෙක් වන්නේය කියායි.

1181. "මම විවේකයෙහි යෙදුනේ වෙමි. අරණ්‍යෙහි දුර සෙනසුන්හි වසන්නේ වෙමි. (මා විසින්) ශ්‍රාමාණ්‍යඵලද) ලබනලදී. අද මම හරණලද ක්ලේශ ඇත්තේ වෙමි.

1182. "ලෝකනායකවූ සර්වඥතෙම මා පිළිබඳ සියල්ල දැන භික්ෂු සංඝයා මැදහිඳ මා උතුම් පදවියෙහි තැබීය. 1183

---

## 44 සන්නිධාපක ථෙරාපදානය

1184 "(මම) ලාභ අලාභ දෙකින්ද යසස අයස දෙකින්ද (යම්සේ) සතුටුවූයේ කඳු අතුරෙහිවූ අරණ්‍යෙහි කුටියක් කොට (ගෙන) වෙසෙමි.

1185. "පූජාවන් පිළිගන්නාවූ නොහොත් පූජාවනට ගෘහයක් වැනිවූ පදුමුත්තර බුදුරජතෙම සියක් දහසක් භික්ෂූන් විසින් පිරිවරණ ලදුයේ මාගේ සමීපයට පැමිණියේය.

1186. "එළඹ සිටි පදුමුත්තර නම්වූ මහා වීරයන් වහන්සේ (දැක) ශාස්තෘන් වහන්සේට තෘණ ඇතිරියක් පණවා දුනිමි.

1187. "පැහැදුනු සිත් ඇති සොම්නස්වූ මම ඍජු ගුණ ඇති බුදුරජාණන් වහන්සේට පහන් සිතින් නෙල්ලිද පැන්ද දුනිමි.

1188. "මින් කල්ප ලක්ෂයකින් පෙරවූ එකල්හි (මම) යම් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. නෙල්ලි දානයාගේ මේ ඵලයයි.

1189. "එක්සාළිස් වන කපෙහි සත්රුවනින් යුක්තවූ මහත් බල ඇති අරින්දම නම් සක්විති රජෙක් වීමි. 1190

---

## 45 පඤ්චහත්ථිය ථෙරාපදානය.

1191 "යටට හෙළනලද ඇස් ඇති ප්‍රමාණවත් වචන ඇති සිහියෙන් යුත් සංවරණය කරන ලද ඉඳුරන් ඇති සුමෙධ නම් බුදුරජතෙම ඇතුළු වීථියෙහි වඩනා කල්හි,

1192 "මුදුන් මල්කඩ පිණිස මා විසින් පසක් (පමණවූ) උත්පල මුෂ්ටීහු ගෙන එන ලද්දාහුය. මම පහන්වූයේ ඉන් (එම මල්වලින්) සියතින්ම බුදුන් පිදීමි.

1193 "උඩට නැගුනු ඒ මල් බුදුරජාණන් වහන්සේට වියනක් විය. (එම) සියලු පුෂ්පයෝ ශිෂ්‍යයෝ ගුරුවරයෙකුට මෙන් බුදුරජාණන් (වහන්සේ) සමගම ගියාහුය.

1194 "මින් දහස්වන කපෙහි යම් (මල් රැසකින් බුදුරජුන්හට) උඩට දැමුයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි විපාකයයි.

1195 "මින් දෙදහස් වන කපෙහි නමින් හත්ථියා නම්වූ මහත් බල ඇති සක්විති රජවරු පස්දෙනෙක් වූහ. 1196

---

## 46 පදුමච්ඡදනීය ථෙරාපදානය.

1197 "එකල්හි අග්‍ර පුද්ගලවූ විපස්සී බුදුරජාණන් වහන්සේ පිරිනිවි කල්හි (මම) මැනවින් පිපුනු පියුම් ගෙන චිතකයට නැඟීමි.

1198 "චිතකයට නැගු කල්හි (එම පියුම්) අහසට නැගුනේය. (එය) අහසෙහි වියනක් කොට චිතකයෙහි දැරීය.

1199 "මින් එක් අනූවන කපෙහි යම් මල් පූජාවක් උඩට දැමීම වශයෙන් කෙළෙහිද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි.

1200 "මින් සත්සාළිස් වන කපෙහි සිව්වන දිවයින් හා සිව් සයුරු කෙළවර කොට ඇති පෘථිවිශ්වරවූ සතුරු රජුන් ජයගන්නා සුළුවූ මහත් බල ඇති 'පදුමිස්සර' නම් සක්විති රජෙක් වීමි. 1201

---

### 47 සයනදායක ථෙරාපදානය.

1202 "තාදී ගුණ ඇති මෛත්‍රී සිත් ඇති සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේට ඇතිරි ආදීවූ දුස්ස භාණ්ඩයන්ගෙන් අතුරනලද උතුම් සයනයක් මා විසින් දෙන ලදී.

1203 "භාග්‍යවතුන් වහන්සේ (එම) කැප සයනාසනය පිළිගත්සේක පස්මරුන් දිනූ බුදුරජතෙම එම අසුනින් නැගිට අහසට නැගුනේය.

1204 "මම මින් සිව් අනූවන කපෙහි යම් සයනයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. සයන දානයාගේ මේ විපාකයයි.

1205 "මින් එක් පණස්වන කපෙහි සත්රුවනින් යුත් මහා බල ඇති වරුණදේව නම් සක්විති රජෙක් වීමි. - 1206

---

### 48 චංකමදායක ථෙරාපදානය.

1207 "මම ලොකජ්‍යෙෂ්ඨවූ තාදීගුණ ඇති අත්ථදස්සී බුදුරජාණන් වහන්සේට ගඩොලින් බැඳ සක්මණක් කරවීමි.

1208 "(එය) මැනවින් කටයුතු නිමකරන ලද්දකි. උසින් පස් රියනකි. දිගින් රියන් සියයකි සුදුසුය, මනොඥයි.

1209 "නරශ්‍රෙෂ්ඨවූ අත්ථදස්සී භාග්‍යවත්තෙම (එම සක්මණ) පිළිගත්තේය. අතින් (එහි) වැලි (ටිකක්) ගෙන මෙම ගාථාවන් වදාළේය. (කෙසේදයත්?)

1210 "මෙම වැලි (දමා) දීම් හේතුවෙන්ද සක්මණ මැණවින් කරනලද හේතුවෙන්ද සත්රුවණින් යුත් වැළි (පරිභොගයට) ලබන්නේය.

1211 "තුන් කපක් මුළුල්ලෙහි දෙවියන් අතර දිව්‍ය රාජ්‍යය කරන්නේය. දිව්‍යප්සරාවන් විසින් පිරිවරණ ලදුයේ (දිව්‍ය) සම්පත් අනුභව කරන්නේය.

1212-1213 "මිනිස් ලොවට පැමිණ රටෙහි රජවන්නේය. හෙතෙම තෙවරක් පෘථිවියෙහි සක්විති රජ වන්නේයයි" කියායි.

1214 "එක් දහස් අටසියවන කල්පයෙහි වූ එකල්හි (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. චංක්‍රමණ දානයාගේ මේ විපාකයයි.-1215

---

## 49 සුභද්ද ථෙරාපදානය.

1216 "පූජාවන් පිළිගන්නාවූ නොහොත් පූජාවන් (රැස්වන) ගෙයක් වැනිවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ මහා යසස් ඇත්තේ ජන සමූහයා (සසරින්) නගාසිටුවා පිරිනිවන් පානාසේක.

1217 "(එම) බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පානා කල්හි දසදහසක් සක්වල කම්පාවිය. (රැස්වූ) විශාල ජන සමූහයාද විය. එකල්හි දෙවියෝද රැස්වූහ.

1218 "තුවරලා, බෝලිද්දමලින් පුරවා සතුටුවූයේ සතුටු සිතින්ම (පරිනිර්වාන මඤ්චකයෙහි වැඩසිටි තථාගතයන් වහන්සේගේ) බුදු සිරුර සඳුන් ආලේප කරවීමි.

1219 "ලෝකයෙහි නිරුත්තරවූ ශාස්තෘවූ සම්බුදුරජ තෙම (පරිනිර්වාණ මඤ්චකයෙහි) හෝනේම මාගේ අදහස් දැන මෙම ගාථාවන් වදාළේය. (කෙසේද? යත්)

1220 "යමෙක් මාගේ අන්තිම කාලයෙහි (මා) ගඳ මල්වලින් වැසීද ඔහු (කවරෙක්දැයි) මම කියන්නෙමි. (එසේ) කියන්නාවූ මාගේ වචනය අසව්.

1221 "මේ පුරුෂ තෙමේ මින් චුතව තුෂිත දෙව්ලොවට යන්නේය. හෙතෙම එහි රාජ්‍ය කොට නිර්මාණරති දෙව්ලොවට යන්නේය.

1122 "මේ ක්‍රමයෙන් අති උතුම් මල් පුදා පටන්ගත් සිය කටයුතු ඇති හෙතෙම සම්පත් අනුභව කරන්නේය.

1223 "මේ මිනිස්තෙම නැවත තුෂිත දෙව්ලොව උපදින්නේය. එම ආත්ම භාවයෙන් චුතව මිනිසත් බවට පැමිණෙන්නේය.

1224 "ශාක්‍ය පුත්‍රවූ මහොත්තමවූ දෙවියන් සහිත ලෝකයෙහි අග්‍ර පුද්ගලවූ පසැස් ඇති ගෞතම බුදුරජ තෙම බොහෝ සත්වයනට ධර්මාවබෝධය කරවා පිරිනිවන් පාන්නේය.

1225 "එකල්හි කුශල මූලයන්ගෙන් මෙහෙයන ලදුයේ (අකුශලයන්ගෙන්) වෙන්වූයේ (පරිනිර්වාණ මඤ්චකයෙහි වැඩහුන්) බුදුරජාණන් වහන්සේ වෙත එළඹ ප්‍රශ්න විචාරන්නේය.

1226 "ලොකනායකවූ සර්වඥවූ (ගෞතම) බුදුරජතෙම (ජනයා) සතුටුකොට (පෙරකළ) පුණ්‍යකර්මයන් පිරිසිඳ දැන සත්වයන්ට ප්‍රකට කරන්නේය.

1227 "(විචාරීමට) පටන්ගන්නා ලද ප්‍රශ්න ඇති මෙතෙම සතුටුවූයේ එකඟ සිත් ඇත්තේ ශාස්තෘන් වහන්සේ වැඳ පැවිද්ද ඉල්ලන්නේය.

1228 "අග්‍රවූ (චතුරාර්ය සත්‍යය) ධර්මයෙහි දක්ෂවූ ඒ සම්‍යක් සම්බුද්ධ තෙමේ ස්වකීය කර්මයෙන් සතුටුවූ පහන් සිත් ඇති (හේ) දැක පැවිදි කරන්නේය.

1229 "මේ පුරුෂතෙම බුදු සසුන්හි වීර්ය වඩා සියළු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥා වශයෙන් දැන (දුරුකොට) ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය." (කියායි)

**(පස්වෙනි බණවරයි.)**

1230 "(මම) පෙර (කළ කුශල) කර්මයෙන් යුක්තවූයේ එකඟ සිත් ඇත්තේ සන්සිඳුනේ (බුදුන් වහන්සේගේ හෘදයෙන් උපන් අවවාදානුශාසනා අසා රහත්වූ බැවින්) ඖරස පුත්‍රවූයේ (කර්මස්ථාන) ධර්මයෙන් හටගත් ආර්ය ජාතියෙන් උපන් කෙනෙක්වෙමි.

1231 "බුදුන්වහන්සේ වෙත එළඹ උතුම් ප්‍රශ්න විචාළෙමි. මම ප්‍රශ්න (විසඳා) වදාරන්නේ (මා) නිර්වාණ නම් ධර්ම ප්‍රවාහයට පිවිසියේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

1232 "මම මෙසේ උන්වහන්සේගේ ධර්මය දැන සසුනෙහි ඇළුනේ විසීමි. සියලු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥා වශයෙන් (දුරුකොට) ආශ්‍රව රහිතව වෙසෙමි.

1233 "මින් කල්ප ලක්ෂයකට පෙර පදුමුත්තර නම් බුදුරජාණන් වහන්සේ තෙල් අඩුවීමෙන් (නිවෙන) පහනක් මෙන් (පඤ්චස්කන්ධ නම්) උපාදාන රහිතව පිරිනිවන් පෑසේක.

1234 "(උන්වහන්සේගේ) යොදුන්වූ ස්වර්ණමය ස්ථූපයක් විය. එහි සියල්ලෙන් යහපත්වූ මනහර ධජයක් පිදීමි.

1235 "සර්වඥ සාශනයෙහි දායාදීවූ කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ තිස්ස නම් අග්‍ර ශ්‍රාවක තෙමේ මාගේ ඖරස පුත්‍රයා විය.

1236 "ඒ මාගේ පුත්‍ර තිස්ස නම් අග්‍රශ්‍රාවකයන් වහන්සේට ලාමක සිතින් අසුන්දරවූ වචනයක් කීමි. එම කර්ම විපාකයෙන් අවසානයෙහි (පරිනිර්වාණ කාලයෙහි) බුදුරජ දුටිමි.

1237 "මහාවීරවූ සත්ව ලොකයට හිතවූ කාරුණිකවූ පස්මරුන් දිනුවාවූ (ගෞතම) බුදුරජාණන් වහන්සේ උපවර්තන ශාලවනයෙහි පිරිනිර්වාණ මඤ්චකයෙහිදී (හේ පැවිදි කරවූසේක.)

1238 "බුදුරජාණන් වහන්සේ ඉදිරියෙහි දැන් අදම (මාගේ) පැවිද්දවිය. අදම උපසම්පදාව විය. අදම (ක්ලෙශ) පරිනිර්වාණය විය.-1239

---

## 50 චුන්ද ථෙරාපදානය

1240. "ලොක ජ්‍යෙෂ්ඨවූ තාදීගුණ ඇති සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේට තොරණක් කරවා දෑසමන් මලින් වැසීමි.

1241. "ඒ මල් (වඩා) නිමවා බුදුරජාණන් වහන්සේට පිළිගැන්වීමි. ඉතිරි මල්ගෙන බුදුරජාණන් වහන්සේගේ මතුයෙහි විසුරුවා හැරීමි.

1242. "පහන් සිතින් යුත් සොම්නස්වූ (මම) රන් ඇගෑවක්සේ බබළන බුදුරජුන්ට මල් ඇගෑව පිළිගැන්වීමි.

1243. "ඉක්මවූ සැක ඇති බුදුරජාණන් වහන්සේ ඉක්මවූ සැක ඇත්තාවුන් (රහතුන්) විසින් පිරිවරණ ලදුයේ මෙම ගාථාවන් වදාළසේක. (කෙසේද? යත්)

1244. "යමෙක් මට දිවසුවඳ වහනය වන්නාවූ මල් ඇගෑවක් දුන්නේද හේතු කවරෙක්දැයි මම කියන්නෙමි. එසේ කියන්නාවූ මාගේ වචනය අසව්.

1245. "මේ පුරුෂ තෙමේ මින් චුතවූයේ දිව්‍ය සමූහයා විසින් පිරිවරණ ලදුයේ සමන් මල්වලින් ගැවසී ගත්තේ දෙව්ලොවට යන්නේය.

1246. "ඕහට පුණ්‍ය කර්මයෙන් හටගත්තාවූ ස්වර්ණමය වූද මණිමයවූද පැන නැගුනු සඳළු සහිත විමානයක් පහළ වන්නේය.

1247. "හෙතෙම සූසැත්තෑ වරක් දිව්‍ය රාජ්‍යය කරන්නේය. දිව්‍යප්සරාවන් විසින් පිරිවරණ ලදුයේ සම්පත් අනුභව කරන්නේය.

1248. "තෙසිය වරක් පෘථිවි රාජ්‍යය ලැබ පොළොවෙහි වාසය කරන්නේය. පන් සැත්තෑ වරක් සක්විති රජ වන්නේය.

1249. "(සතුරන් විසින්) නොදක්නා ලද නමින් දුජ්ජය නම් රජෙක් වන්නේය. ස්වකීය කර්මයවූ එම පුණ්‍ය (විපාකය) අනුභව කොට

1250 - 1251 "දුගතියකට නොගොස් මිනිසත් බවට යන්නේය. රැස්කරන ලද බොහෝවූ රන්කෙළ සිය ගණන් පහළ වන්නේය. හෙතෙම බ්‍රාහ්මණ කුලයෙහි උපදින්නේය. වඩ්ඪගන්ත බ්‍රාහ්මණයාගේද ශාරී බැමිණියගේද ප්‍රියවූ ප්‍රාඥවූ ඖරස පුත්‍රයෙක් වන්නේය.

1252. "හෙතෙමේද පසුව සම්බුදු සසුනෙහි පැවිදිව නමින් චූලවුන්ද නම්වූ බුද්ධ ශ්‍රාවකයෙක් වන්නේය.

1253. "හෙතෙම සාමණේර වූයේම රහත් වන්නේය. සියලු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥා වශයෙන් දැන (දුරුකොට) ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය." (කියායි)

1254. "මහාවීරවූ බුදුරජාණන් වහන්සේටද අනික් පෙශලවූ බොහෝ සංඝයාටද උපස්ථාන කෙළෙමි. උත්තමාර්ථයට (රහත්

බවට) පැමිණීම පිණිස මාගේ සොහොයුරු (සාරීපුත්‍ර) හට උවැටැන් කෙළෙමි.

1255. "මාගේ සොහොයුරාට උවැටැන් (වත් පිළිවෙත්) කොට (උන් වහන්සේ පිරිනිවි කල්හි) ධාතූන් පාත්‍රයෙහි බහාගෙන ලොක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ බුදුරජාණන් වහන්සේට පිළිගැන්වීමි.

1256. "දෙවියන් සහිත ලොකයෙහි සර්වඥවූ (බුදුරජතෙම) එය දොහොතින් පිළිගෙන දක්වමින් එය අග්‍රශ්‍රාවක ධාතුයයි පැවසීය.

1257. "මාගේ ශ්‍රද්ධාතොමෝ මැනවින් පිහිටුවන ලද්දීය. මාගේ සිත (කෙලෙසුන්ගෙන්) මැනවින් මිදුනේය. සියළු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥා වශයෙන් දැන (දුරුකොට) ආශ්‍රව රහිතව වෙසෙමි.

1258. "(මා විසින්) පැමිණෙන ලද ප්‍රතිසම්භිදා ඇත්තෝය. පහස්නාලද විමොක්ෂ ඇත්තෝය. සාක්ෂාත් කරන ලද ෂඩභිඥා ඇත්තෝය, බුදුරජාණන් වහන්සේගේ සසුනද කරනලදී.

## 6 වීජනි වග්ග.

### 51 විධූපනදායක ථෙරාපදානය.

1259. "තාදී ගුණ ඇති ලොක ජ්‍යෙෂ්ඨවූ ද්විපදොත්තමවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේට මා විසින් වටාපතක් දෙන ලදී.

1260. "සිය සිත පහදවා ඇඳිලි බැඳ සම්බුදුන් වැඳ උතුරුදිගට මුහුණ ලා ගියෙමි.

1261. "ලෝකයෙහි අසහාය ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා මැදහිඳ විජනිය ගෙන මෙම ගාථාවන් වදාළසේක. (කෙසේද යත්?)

1262. "මෙම විජනි දානය කරණකොටගෙනද චිත්ත ප්‍රණිධීන් කරණකොටගෙනද කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියකට නොයයි (යනුවෙනි.)

1263. "පටන් ගන්නා ලද වීර්ය ඇති (නිවණ) කෙරෙහි මෙහෙයන ලද සිත් ඇති සමාධි ගුණයෙන් යුත් උත්පත්තියෙන් සත් හැවිරිදිවූ මම රහත් බවට පැමිණියෙමි.

1264. "සැටදහස්වන කපෙහි 'විජමාන'යන සමානවූ නම් ඇති මහා බලවත් සක්විති රජවරු සොළොස් දෙනෙක් වූහ. 1265

## 52 සතරංසි ථෙරාපදානය.

1266. "පුරුෂොත්තමවූ පදුමුත්තර බුදුරජතෙම උඩට පැන නැංගාවූ ගලකට නැගී වැඩහුන්නේය. එම පර්වතයට නුදුරෙහි හුන් වේද මන්ත්‍ර විෂයෙහි පරතෙරට ගිය බමුණෙක්වූ (මම)

1267. "(එසේ) වැඩහුන්නාවූ මහා වීරවූ දෙවාති දෙවවූ නරශ්‍රෙෂ්ඨවූ ලොකනායකයන් වහන්සේට ඇඳිලි බැඳගෙන (උන්වහන්සේ හා) පිළිසඳර කථා කෙළෙමි. (කෙසේද යත්?)

1268. "මේ තෙම උතුම් ධර්මය ප්‍රකාශ කරන්නාවූ මහා වීරවූ සර්වඥතෙමේය භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලදුයේ ගිනි කඳක් මෙන් බබළයි.

1269. "මහ සමුදුර මෙන් නොකැළඹිය හැකිය සයුර මෙන් තරණය කළ නොහැකිය. සිංහරජකු මෙන් නිර්භීතය (එසේවූ) පසැස් ඇත්තා බුදුරජාණන් වහන්සේ ධර්මදේශනා කරන සේක. (යනුවෙනි.)

1270. "ශාස්තෘවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ මාගේ අදහස් දැන භික්ෂු සංඝයා මැද වැඩසිටි සේක් මෙම ගාථාවන් වදාළ සේක. (කෙසේද යත්?)

1271. "යමෙකු විසින් (සර්වඥයන් හට) ඇඳිලි බඳින ලදද, එසේම යමෙකු විසින් බුද්ධ ශ්‍රෙෂ්ඨතෙම පසසන ලදද එසේ කරණ ලද මේ තෙමේ කල්ප තිස්දහසක් දිව්‍ය රාජ්‍යය කරන්නේය.

1272. "(මින්) කල්ප ලක්ෂයක් ඉක්මගිය කල්හි අංගීරස නම්වූ බැහැර කළ කෙළෙස් සෙවෙනි ඇති (ගෞතම) බුදුරජතෙම උපදින්නේය.

1273. "හෙතෙම ඒ බුදුරජාණන් වහන්සේගේ ධර්මයට දායාදවූ ඖරස (බුද්ධ) පුත්‍රවූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනිවූ නමින් සතරංසිවූ රහත් කෙනෙක් වන්නේය. (කියායි.)

1274. "උත්පත්තියෙන් සත් හැවිරිදිවූ මම අනගාර්ය නම්වූ සසුනෙහි පැවිදි වීමි. නමින් සතරංග වෙමි. මාගේ සිරුරින් පැහැය විහිදේ.

1275. "මණ්ඩපයක හෝ වෘක්ෂ මූලයක හෝ ධ්‍යාන කරන සුළුවූ ධ්‍යානයෙහි ඇළුනාවූ මම සර්වඥ ශාසනයෙහි අන්තිම ශරීරය දරමි. මේ අන්තිම භවයයි.

1276. "සැටදහස්වන කපෙහි සත්රුවනින් යුත් මහත්බල ඇති රාම නම්වූ සක්විති රජවරු සිව්දෙනෙක්ම (ඉපදුනෙමි.) 1277

## 53 සයනදායක ථෙරාපදානය.

1278. "සියලු ලොවැසියනට අනුකම්පා කරන සුළුවූ ඒ පදුමුත්තර බුදුරජාණන් වහන්සේට පැහැදි සිතින් සයනයක් පිදීමි.

1279. "එම සයන දානය කරනකොටගෙන මැනවින් සරුකෙතක හටගත් සශ්‍ය සම්පත් මෙන් ඕහට භෝගයෝ උපදිත්. සයන දානයාගේ මේ විපාකයයි.

1280. "අහසෙහි සයනය කරමි. මෙම පෘථිවිය (ඊශ්වරත්වයෙන්) දරමි. සත්වයන් විෂයයෙහි මාගේ අධිපතිත්වය පවතී. සයන දානයාගේ මේ විපාකයයි.

1281. "පන්දහස්වන කපෙහි මහාවර නමින් අටරජ කෙනෙක් වූහ. තුන් දහස් සිව්වන කපෙහි මහත් බල ඇති රජවරු) සිව් දෙනෙක් වූහ. 1282

## ගන්ධොදකිය ථෙරපදානය.

1283 "පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ මහාබොධි නම් මහ පූජාවක් විය. විසිතුරු කළයක් ගෙන මම එහි සුවඳ පැන් වත්කෙළෙමි.

1284 "බොධිය නාවන කල්හි මහවැසි වැස්සේය. හෙන පුපුරන කල්හි මහත් ශබ්දද විය.

1285 "එම අසනි වේගයෙන් (හෙන පහරින්) එහිම කළුරිය කෙළෙමි. (මම එකෙණෙහි) දෙව්ලොව උපන්නේ මෙම ගාථාවන් කීමි)

1286 "සර්වඥ තෙම ආශ්චර්යයකි. ධර්මය ආශ්චර්යකි. අපගේ ශාස්තෘෘ සම්පත්තිය ආශ්චර්යයකි. මාගේ සිරුර (හෙනපහරින් ඇදවැටුනි.) (ඉන්චුතවූ) මම දෙව්ලොව සිත් අලවා වසමි.

1287. "පැන නැගුනාවූ මාගේ සත්බුමු විමන උස්ව නැගුනේය. හැමකල්හි සියක් දහසක් කන්‍යාවෝ මා පිරිවරත්.

1288. "මට ආබාධයෝ නොවෙත්. මට ශෝකයත් නැත. පරිළාහයන් (තැවීමක්) නොදකිමි. පුණ්‍ය කර්මයාගේ මේ විපාකයයි.

1289. "දෙදහස් අසූවන කපෙහි සත්රුවනින් යුක්තවූ මහත් බල ඇති සංවසිත නම් සක්විතිරජෙක් වීමි. 1290

55 ඔපවුය්හ ථෙරාපදානය.

1291. "මම පදුමුත්තර බුදුරජාණන් වහන්සේට ආජානීය අශ්වයෙක් දුනිමි. බුදුරජාණන් වහන්සේට (එම අශ්වයා) භාරකොටදී ස්වකීය ගෘහයට ගියෙමි.

1292. "උතුම් ධර්මයට දායාදීවූ (පදුමුත්තර) ශාස්තෘන් වහන්සේගේ නමින් දෙවල නම්වූ අග්‍රශ්‍රාවක තෙමේ මාගේ සමීපයට පැමිණියේය. (පැමිණ මෙසේ කීය.)

1293. "භාග්‍යවත් තෙමේ සපත්තභාරය. (හෙවත් පාත්‍රය සහිත අටපිරිකර බර උසුලන්නේය.) උන් වහන්සේට ආජානීය අශ්වතෙමේ කැප නොවේ. පසැස් ඇත්තාවූ බුදුරජ තෙම ඔබගේ අදහස දැන (එය) පිළිගත්තේය. (කියායි)

1294. "ඉක්බිති මම වාතවේගය ඇති ශීඝ්‍රව ගමන් යන වාහනයක්වූ සෛන්ධවයා මිළකොට (විකුණා) පදුමුත්තර බුදුරජාණන් වහන්සේට රිසිවූ (යෝග්‍ය පිරිකරක්) දුනිමි.

1295. "දෙව්ලොව හෝ මිනිස්ලොව යම් යම් භවයක උපදීම නම් මට රිසිවූ වාත වේගය ඇති චිත්තයෝ උපදිත්.

1296. "යමෙක් උපසම්පදාව ලබත්ද (ඔවුනට) එය ලාභයකි. මනා ලාභයකි. ඉදින් බුදු කෙනෙක් ලෙව්හි (පහළ) වන්නේ නම් නැවත පයිරුපාසනය කරන්නෙමි.

1297. "මම අට විසිවරක් මහත් බල ඇති සතර මහා දිවයින් හා සිව්මහ සයුර කෙළවරකොට ඇති පෘථිවියෙහි අධිපතිවූ සතුරු රජුන් ජයගන්නා සුළුවූ ජම්බුසණ්ඩයට අධිපතිවූ සක්විති රජ වීමි.

1298. "මේ මාගේ පශ්චිම උත්පත්තියයි අන්තිම ආත්මභාවයයි ජය-පරාජය දෙකම හැර නිශ්චලස්ථානය (නිවණට) පැමිණියේ වෙමි.

1299. "සූතිස් දහස්වන කපෙහි මහත් බල ඇති සත් රුවනින්යුත් මහත් තේජස් ඇති සක්විති රජෙක්විය. 1300.

## 56 සපරිවාරාසන ථෙරාපදානය.

1301. "මම පදුමුත්තර බුදුරජාණන් වහන්සේට පිණ්ඩපාත දානයක් දුනිමි. ගොස් වළඳන ස්ථානය බෝලිද්ද මල්වලින් වට කෙළෙමි. (සැරසීමි.)

1302. "ලොකයෙහි අග්‍ර නායකවූ වැඩහුන්නේ ඍජු ගුණ ඇති සත්හුන්වූ බුදුරජතෙම එම අසුනෙහි වැඩහුන්නේ එම පිණ්ඩපාතය (පිළිබඳ තොරතුරු) ප්‍රකාශ කෙළේය. (කෙසේද යත්?)

1303. "යම්සේ මනා කෙතක රොපනය කරනලද ස්වල්ප වූද බීජය මැනවින් වැසි වස්නා කල්හි (ඇතිවන සශ්‍ය) ඵල ගොවියා සතුටුකරයි.

1304. "එසේම පිණ්ඩපාතය තා විසින් මනා කෙතක රොපනය කරනලදී. භවයෙහි උපදින්නාවූ හේ (එම කර්මයාගේ) ඵල වශයෙන් සතුටු වන්නේය.

1305. "පදුමුත්තර නම්වූ බුදුරජතෙම මෙය වදාරා පිණ්ඩපාතයට පසසා උතුරු දෙසට මුහුණ ලා වැඩියේය.

1306. "ප්‍රාතිමොක්ෂයෙහිද පසිඳුරන් විෂයෙහිද සංවෘත වූයේ ප්‍රකර්ෂ විවේකයෙහි යෙදුනේ ආශ්‍රව රහිතව වෙසෙමි 1307

## 57 පංචදීපක ථෙරාපදානය.

1308 "මම සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පිතවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ සද්ධර්මයෙහි මනාව පිහිටා ඍජුවූ දෘෂ්ටි ඇත්තේ වීමි.

1309. "බොධිය වටකොට ප්‍රදීප දානයක් දුනිමි. (පහන් පූජාවක් කෙළෙමි.) කර්ම ඵල අදහසින් පහන් (දැල්වීම්) කෙළෙමි.

1310. "(මම) දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යම් යෝනියක උපදී ද (එවිට එම පුණ්‍යකර්ම හේතුවෙන්) අහසෙහි උල්කා දරත්. ප්‍රදීප දානයාගේ මේ විපාකයයි.

1311. "පර්වතද ඉක්මවා බිත්තියෙන් (තාප්පයෙන්) පිටද ගල් තලාවකින් පිටතද ඇති හාත්පස යොදුන් සියයක් තැනවූ සියල්ල දර්ශනය කරමි. (බලමි.)

1312. "එම කර්මයාගේ අවශේෂ විපාකයෙන් ආශ්‍රවක්ෂයට පැමිණියේ වෙමි. සර්වඥ ශාසනයෙහි අන්තිම ශරීරය දරමි. (අන්තිම ආත්මයයි.)

1313. "තුන්දහස් සිව්වන කපෙහි සතචක්ඛු" යන සමාන නම් ඇති මහාතේජස් ඇති මහත්බල ඇති රජවරුවූහ. 1314

## 58 ධජදායක ථෙරාපදානය.

1315. "මම පදුමුත්තර බුදුරාජණන් වහන්සේගේ උතුම් බෝරුකෙහි සතුටුවූයේ සතුටු සිතින්ම ධජයක් නැඟීමි.

1316. "(බෝධියෙන්) වැටුණු කොළ ගෙන පිටතට බැහැර කරවීමි. ඇතුළත පිරිසිදු පිටතද පිරිසිදු විශේෂයෙන් (කෙලෙසුන්ගෙන්) මිදුණු ආශ්‍රව රහිතවූ බුදුරජාණන් වහන්සේ ඉදිරියෙහි මෙන් උතුම් බෝධිය වැන්දෙමි.

1317. "පූජාවන් පිළිගන්නාවූ නොහොත් ලෝවැස්සන්ගේ පූජාවනට ගෙයක් වැනිවූ ශාස්තෘවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා මැද වැඩහිඳ මේ ගාථා වදාළසේක.

1318. "මෙම ධජ දානයෙන්ද (බෝපත් බැහැර කිරීම් වශයෙන් කළ) උපස්ථානයෝද යන මේ දෙකින් හෙතෙම කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියට නොයයි.

1319. "දෙවියන් අතර බොහෝවූ දිව්‍ය සෞභාග්‍ය (සම්පත්) අනුභව කරන්නේය. නොයෙක් සිය ගණන් වාරයන්හි රටෙහි රජ වන්නේය. නමින් 'උග්ගත' නම්වූ සක්විති රජෙක්ද වන්නේය.

1320. "කුශල මූලයන් මෙහෙයන ලදුයේ සම්පත් අනුභව කොට ගෞතම බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි සිත් අලවා වාසය කරන්නේය. (කියායි)

1321. "උපශාන්තවූයේ උපධි රහිතවූයේ වඩනාලද වීර්ය ඇත්තේ වෙමි. සර්වඥ ශාසනයෙහි අන්තිම ශරීරය දරමි.

1322. "පන්දහස් එක්වන කපෙහි උග්ගත නම් රජෙක්වීමි. (එසේම) පන්දහස් වන කපෙහි 'මෙඝ' නම් රජෙක්වීමි. 1323

## 59 පදුම ථෙරාපදානය.

1324. "උත්තම ධර්ම ප්‍රකාශකවූ (පදුමුත්තර බුදුරජතෙම) චතුස්සත්‍ය දෙසමින් මහජනයාගේ (කෙලෙස් ගිනි) නිවමින් අමාවැසි වස්වයි.

1325. "නටුව සහිත පියුමක් ගෙන දෙකම ඔසවා සිටි මම සතුටුවූයේ පදුමුත්තර බුදුරජාණන් වහන්සේට අහසෙහි (උඩට) දැමීමි.

1326. "එකෙණෙහි පියුම පහළට වැටෙන කල්හි ආශ්චර්යයක් විය. කථා කරන්නවුන් අතුරෙන් ශ්‍රෙෂ්ඨවූ බුදුරජ තෙම මාගේ අදහස දැන (එය) පිළිගත්තේය.

1327. "ජලයෙහි හටගත් උතුම් පියුම් ශ්‍රෙෂ්ඨ අතින් ගෙන ශාස්තෘ තෙමේ භික්සඟන මැද හිඳ මෙම ගාථාවන් දෙසීය.

1328. "විනායක (නිවණට පමුණුවන) වූ සර්වඥයන් වහන්සේ කෙරෙහි යමෙකු විසින් මෙම පියුම් (උඩට) දමන ලදද ඔහු (කවරෙක් දැයි) මම කියමි. (එසේ) කියන්නාවූ මාගේ වචනය අසව්.

1329. "තිස් කපක් මුළුල්ලෙහි ශක්‍රදෙවේන්ද්‍රව දිව්‍ය රාජ්‍යය කරන්නේය. සත්සිය වරක් පෘථිවි රාජ්‍යය (කොට) පොළොවෙහි වාසය කරන්නේය.

1330. "එහි (පියුම්) පත් ගෙන (එම ගණනින්) සක්විති රජ වන්නේය. එකල අහසින් මල් වැසි වසින්නේය.

1331. "(මින් කල්ප ලක්ෂයක් ඉක්ම ගියකල ඔක්කාක කුලයෙහි උපදින්නාවූ නමින් ගෞතම නම්වූ ශාස්තෘතෙම ලොව පහළ වන්නේය.

1332. "උන්වහන්සේගේ ධර්මයෙහි දායාදීවූයේ ඖරස (බුද්ධ) පුත්‍රවූයේ ධර්මයෙන් නිර්මිත කළාක් වැනිවූයේ සියළු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥා වශයෙන් (දැන) දුරුකොට ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය. (කියායි)

1333. "සිහි නුවණින් යෙදී මව්කුසින් බිහිව උත්පත්තියෙහි පස් හැවිරිදි කල්හි මම රහත් බවට පැමිණියෙමි. 1334

60 අසනබෝධිය ථෙරාපදානය.

1335. "උත්පත්තියෙන් සත් හැවිරිදිවූ මම (තිස්ස) බුදුරජාණන් වහන්සේ දිටිමි. පහන් සිත් ඇත්තේ සොම්නස්වූ මම තථාගතයන් වහන්සේ වෙත එළඹුනෙමි.

1336. "ලොක ජ්‍යෙෂ්ඨවූ තාදීගුණ ඇති තිස්ස බුදුරජාණන් වහන්සේට සතුටු වූයේ සතුටු සිතින් (උන්වහන්සේගේ පියා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

බෝරුකින් ඵලයක්ගෙන) උතුම් බොධියක් රොපනය කෙළෙමි.

1337. "(එය) නමින් අසන (පියා) නම්වූ බොධි වෘක්ෂයයි එම උතුම් බෝරුක පස්වසක් පිරිවරනය කෙළෙමි. (පිදීමි)

1338. "ආශ්චර්යවූ ලොමු දැහැ ගන්වන්නාවූ පිපුනු පියා බෝරුක දැක ස්වකීය කර්මය ප්‍රකාශ කරන්නේ බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත එළඹුනෙමි.

1339. "එකල්හි සියල්ල තෙමේම දැන ගත්තාවූ අග්‍ර පුද්ගලවූ ඒ තිස්ස සර්වඥ තෙමේ භික්ෂු සංඝයා මැද වැඩහිඳ මෙම ගාථාවන් වදාළ සේක.

1340. "යමෙකු විසින් මෙම බොධිය රොපනය කරණ ලදද බුද්ධ පූජාව මැනවින් කරන ලදද මම ඔහු (කවරෙක් දැයි) ප්‍රකාශ කරන්නෙමි. (එය) ප්‍රකාශ කරන්නාවූ මාගේ වචනය අසව්.

1341. "(හෙතෙම) තිස් කපක් දෙවියන් අතුරෙහි දිව්‍ය රාජ්‍යය කරන්නේය. සූ සැට වරක් සක්විති රජ වන්නේය.

1342. "කුශල මූලයෙන් මෙහෙයන ලද්දේ තුෂිත දෙව් ලොවින් චුතව දිව්‍ය මනුෂ්‍ය සම්පත් දෙක අනුභව කොට මිනිසත් බැව්හි සිත් අලවා වසන්නේය.

1343. "වීර්යයෙන් මෙහෙයන ලද සිත් ඇති උපශාන්තවූ උපධි රහිතවූ හෙතෙම සියලු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥා වශයෙන් දැන දුරුකොට ආශ්‍රවරහිතව පිරිනිවන් පාන්නේය. කියායි.

1344. "විවේකයෙහි යෙදුනේ උපශාන්තවූ උපධි රහිතවූ මම හස්ති රාජයෙකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වෙසෙමි.

1345. "මින් දෙඅනූවන කපෙහිවූ එකල්හි මම (එම) පියා බොධිය රොපණය කෙළෙමි. (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බොධිරොපනයෙහි මේ විපාකයයි.

1346. "මෙයින් සූ සැත්තෑ වන කපෙහිවූ එකල්හි සත් රුවනින් යුත් දණ්ඩ සේන නම් සක්විති රජෙක් වීමි.

1347. "මින් තෙසැත්තෑවන කපෙහිවූ පෘථිවිශ්වරවූ සමන්තනෙමි නම්වූ සක්විති රජවරු සත් දෙනෙක් වූහ.

1348. "මින් පස්විසි වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති පුණ්ණක නම් සක්විති රජෙක් වීමි. 1349

## 7 සකචින්තනිය වග්ග.

### 61 සකචින්තනිය ථෙරාපදානය.

1350-1351. "ඍෂීන් විසින් සෙව්නාලද අල්ප ශබ්ද ඇති කැළඹිලි රහිත වනයක් දැක දෙව් මිනිසුන්ගේ පූජාවන් පිළිගන්නාවූ බුදුරජාණන් වහන්සේ උදෙසා වැලි (වලින්) සෑයක් කොට නොයෙක් මල් විසිර වීමි. නිර්මිත බුදුරජුන් ඉදිරියෙහි මෙන් මම (එම සෑයට) වැන්දෙමි.

1352. "(එම පිණින්) සිය කටයුතුවල යෙදුන මම සත් රුවනින් යුත් රටෙහි අධිපති රජ වීමි. ස්ථූප පූජාවෙහි මේ විපාකයයි.

1353. "මින් එකානූවන කපෙහි (සෑයට) යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි, ස්තූප පූජාවෙහි මේ විපාකයයි.

1354. "මම අසූවන කපෙහි සත් රුවනින් යුත් සිව්මහ දිවයින්හහි අධිපතිවූ අනන්ත යස නම් සක්විති රජෙක්වීමි. 1355

### 62 අවොපුප්පිය ථෙරාපදානය.

1356. "(සිඛී බුදුරජතෙම) විහාරයෙන් නික්ම සක්මනෙහි සිට චතුස්සත්‍ය ප්‍රකාශ කරන්නේ අමෘත පදය (නිර්වාණ ධර්මය) දේශනා කරයි.

1357. "තාදී ගුණ ඇති බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ හඬ අසා නොයෙක් මල් ගෙනවුත් අහසෙහි විසිරවීමි.

1358. "ද්විපදොත්තමයන් වහන්ස, ලොක ජ්‍යෙෂ්ඨයන් වහන්ස, නරශ්‍රෙෂ්ඨයන් වහන්ස, එම කර්මය හේතුකොටගෙන ජය පරාජය දෙක හැර නිශ්චලස්ථානයට (නිවනට) පැමිණියේ වෙමි.

1359. "මින් එක්තිස්වන කපෙහි යම් මල් පූජාවක් කෙළෙම්ද (ඒ හේතුකොටගෙන) දුගතියක් නොදනිමි. මල් පූජාවේ මේ විපාකයයි.

1360. "මින් විසිවන කපෙහි සත්රුවනින්යුත් මහත්බල ඇති සුමේධ නම් සක්විති රජෙක් වීමි. 1361

## 63 පච්චාගමනීය ථෙරාපදානය.

1362. "මම එකල්හි සුගන්ධ නදීතීරයෙහි පිරිසිදු සෙවෙල් අනුභව කරන්නාවූ පාපයන් (කිරීමෙහි) සංසුන්වූ සක්වාලිහිණියෙක් වීමි.

1363. "(එකල්හි) කෙලෙස් මල නැත්තාවූ අහස් මගෙහි ගමන් කරන්නාවූ බුදුරජුන් දුටිමි. (දැක) හොටින් සල්මලක් ගෙනවුත් (එම) විපස්සී බුදුරජාණන් වහන්සේට පිදීමි.

1364. "යමෙකුගේ ශ්‍රද්ධාතොමෝ තථාගතයන් වහන්සේ විෂයෙහි නිශ්චලව පිහිටියාද එම චිත්ත ප්‍රසාදය හේතුකොටගෙන හෙතෙම දුගතියකට නොයෙයි. (විපස්සී බුදුරජතෙම වදාළේය.)

1365. "ඒකාන්තයෙන් බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ සමීපයට මාගේ මනා පැමිණීමක් විය. (සක්වා) ලිහිණියෙකුවූ මා විසින් මනා කුශල) බීජයක් රෝපණය කරන ලදී.

1366. "මින් එක් අනූවන කපෙහි යම් මලක් පිදුයෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුෂ්ප පූජාවෙහි මේ විපාකයයි.

1367. "සතළොස්වන කපෙහි සුවාරුස්සන නම් මෙඑකී නම් ඇති මහාබලවත්වූ සක්විතිරජවරු අටදෙනෙක් වූහ. 1368

## 64 පරප්පසාදන ථෙරාපදානය

1369. "ශ්‍රෙෂ්ඨවූ උතුම්වූ වීරවූ මහර්ෂිවූ කෙලෙස් සතුරන් ජයගන්නා සුළුවූ ස්වර්ණවර්ණවූ බුදුරජුන් දැක කවරෙක් (නම්) නොපහදීද?

1370. "ප්‍රමාණකළ නොහැකි හිමවත් පව්ව යම්සේද තරණයකළ නොහැකි සාගරය යම්සේද බුදුරජාණන් වහන්සේගේ ධ්‍යානයද එසේමය (උන්වහන්සේ) දැක කවරෙක් නම් නොපහදීද?

1371. "ප්‍රමාණ කළ නොහැකි පෘථිවිය යම්සේද බුදුරජාණන් වහන්සේගේ ශීලයද එසේමය, (උන්වහන්සේ) දැක කවරෙක් නම් නොපහදීද?

1372. "නොකැළඹිය හැකි සයුර යම්සේද පමණ කළ නොහැකි අහස යම්සේද, බුදුරජාණන් වහන්සේගේ කාරණයද එසේමය. (උන්වහන්සේ) දැක කවරෙක් නොපහදීද?

1373. "සෙන නම්වූ බ්‍රාහ්මණතෙමේ මේ සිව්ගයින් සිද්ධාර්ථ නම් පස්මරුන් දිනූ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට ස්තුතිකොට,

1374. "සිව් අනූ කපක් මුළුල්ලෙහි දුගතියක නූපන්නේය සුගතීන්හි බොහෝවූ මනා සම්පත් අනුභව කෙළේය.

1375. "මෙයින් සිව් අනූවන කපෙහි ලෝකනායකවූ බුදුරජාණන් වහන්සේට පසසා (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි පැසසීමෙහි මේ විපාකයයි.

1376. "තුදුස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති 'උග්ගත' නම් වූ සක්විතිරජවරු සිව්දෙනෙක් වූහ. 1377

## 65 හිසදායක ථෙරාපදානය.

1378. "නමින් වෙස්සභූ නම් වූ බුදුවරයන් අතුරෙහි තෙවැන්නෙක් (1 විපස්සී - 2 සිඛී - 2 වෙස්සභූ) විය. පුරුෂොත්තමවූ ඒ බුදුරජතෙම මහවනයට පිවිස (එහි) විසීය.

1379. "නෙළුම්ද, නෙළුම් දඬුද ගෙන බුදුරජාණන් වහන්සේගේ සමීපයට ගියෙමි. පහන්වූයේ සියතින් එය බුදුරජාණන් වහන්සේට පිදීමි.

1380. "උතුම් නුවණැති වෙස්සභූ බුදුරජාණන් වහන්සේ විසින් තමන් වහන්සේගේ ශ්‍රී හස්තයෙන් පරාමර්ශනය කරන (පිරිමදින) ලද්දාවූ මම ඒ හා සමාන සැපයක් නොදනිමි. එයට වැඩි සැපයෙක් නම් කොයින්ද?

1381. "සියලු භවයෝ නසනලදහ. මාගේ අන්තිමභවය වේ. (එකල) හස්තිරාජයෙකු වූ මා විසින් කුසල් බිජුවටක් රෝපණය කරණලදී.

1382. "මින් එක්තිස්වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) අගතියක් නොදනිමි. නෙලුඹල දානයාගේ මේ විපාකයි.

1383. "තෙළෙස්වන කපෙහි මහත් බලඇති සමොධාන නමින් මනුෂ්‍යාධිපතිවූ සොළොස් සක්විති රජ කෙනෙක් වූහ. 1384

## 66 සුචින්තිත ථෙරාපදානය.

1385. "(මම) විශිෂ්ඨ ජන්ම ඇති කේශර සිංහරාජයෙකු වැනි ගිරිදුර්ගයන්හි හැසිරෙන නෙසාදයෙක් වීමි. මෘග සමූහයා මරාගෙන කඳු තෙරෙහි ජීවත්වෙමි.

1386. "සර්වඥවූ කථාකරන්නවුනට ශ්‍රෙෂ්ඨවූ ඒ අත්ථදස්සී භාග්‍යවත්තෙම මා (පවින්) නගාසිටුවනු කැමැත්තේ උතුම් පර්වතයට වැඩියේය.

1387. "පසද මෘගයෙකු මරා අනුභවකිරීමට එළඹියෙමි. එසමයෙහි භාග්‍යවත්තෙමේ පිඬු සිඟමින් (එතැනට) වැඩියේය.

1388. "(එහි) උතුම් මස් ගෙන එම ශාස්තෲනුවහන්සේට දුනිමි. මහාවීරවූ බුදුරජාණන් වහන්සේ එකල්හි මාගේ (සිත) නිවමින් අනුමෝදනා කළසේක.

1389. "මම එම චිත්තප්‍රසාදයෙන් (යුතුව) ගිරිදුර්ගයට පිවිසියෙමි. ප්‍රීතිය උපදවා (මම) එහි කළුරිය කෙළෙමි)

1390. "මෙම මස් දන කරණකොට ගෙනද චිත්ත ප්‍රණිධීන් (ප්‍රාර්ථනාවන්) කරණකොට ගෙනද එක් දහස් පන්සිය වන කපෙහි දෙව්ලොවෙහි සිත්අල්වා විසීමි.

1391-1392 "අවශෙෂ කල්පයන්හිද මා විසින් කුසල් රැස්කරනලදී මම මාගේ දානයෙන්ද බුදුගුණ සිහිකිරීමෙන්ද අවතිස්වන කපෙහි දීඝායු නම් වූ රජවරු අටදෙනෙක් වූහ. මින් කල්ප සදහසකින් පෙර වරුණ නමින් දෙව්රජකෙනෙක් වූහ. 1393

## 67 වත්ථදායක ථෙරාපදානය.

1394. "(මම) පක්ෂියෝනියෙහි උපන්නේ ගුරුළනට අධිපතිවූ ගුරුළු රජෙක් වීමි. එකල්හි බැහැරකළ කෙළෙස් රජස් ඇති ගන්ධමාදන පර්වතයට වඩින්නාවූ බුදුරජාණන් වහන්සේ දුටිමි.

1395. "(දැක) ගුරුළු වෙස් හැර මානවක වෙසක් දැරීමි. තාදී ගුණ ඇති ද්විපදොත්තමවූ බුදුරජාණන් වහන්සේට මා විසින් එක් වස්ත්‍රයක් දෙනලදී.

1396. "ලෝකයෙහි අසහාය නායකවූ බුදුරජතෙම ඒ වස්ත්‍රය පිළිගෙන අහසෙහි සිටියේ මෙම ගාථාවන් දෙසීය.

1397. "මේ වස්ත්‍ර දානය කරණකොටගෙනද චිත්ත ප්‍රණිධීන් කරණකොටගෙනද ගුරුළු අත්බව හැර දෙව්ලොව සිත් අලවා වසන්නේය.

1398. "ලෝකජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ අත්ථදස්සී භාග්‍යවත්තෙමේ වස්ත්‍රදානයට පසසා උතුරුදිගට මුහුණලා වැඩියේය.

1399. "භවයෙහි උපදින කල්හි මට වස්ත්‍රසම්පත් (ඇති) වේ අහසෙහි වියනක් ඇතිවේ. වස්ත්‍රදානයාගේ මේ විපාකයයි.

1400. "සතිස්වන කපෙහි මනුෂ්‍යාධිපතිවූ මහත් බල ඇති 'අරුණක' නම් ඇති සක්විති රජවරු සත්දෙනෙක් වූහ. 1401

68 අම්බදායක ථෙරාපදානය.

1402. "(හිමවත්) පර්වතාන්තරයෙහි වැඩහුන් අනෝමදස්සි බුදුරජතෙම අප්‍රමාණවූ (සත්ව) ලෝකයෙහි උපධි විරහිත කොට මෛත්‍රිය පැතිරවිය.

1403. "එකල්හි මම උතුම් හිමවත් පව්වෙහි වඳුරෙක් වීමි. අලාමකවූ අපමණ ගුණ ඇති (උන්වහන්සේ) දැක (ඒ) බුදුරජුන් කෙරෙහි සිත පැහැදවීමි.

1404. "එකල්හි හිමවතට නුදුරු තන්හි පලගත් ආමු එලයෝ (අඹ) වූහ. ඉන් අඹ ගෙඩියක් මීවදයක් සහිතව ගෙන බුදුරජාණන් වහන්සේට දුනිමි.

1405-1406. "අනොමදස්සී බුදුරජාණන් වහන්සේ මට ඒ (මේ අදහස) ප්‍රකාශකළසේක. (කෙබඳු අදහසක්දයත්?)

"මේ මීවද දානයෙන්ද අඹ දානයෙන්ද යන දෙකින් (මේතෙම) සත් පණස් කපක් මුළුල්ලෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේය. සෙසු කල්පයන්හි (දිව්‍ය - මනුෂ්‍ය දෙගතියෙහි) මිශ්‍ර වශයෙන් සැරිසරන්නේය.

1407. "පිරිසිදු නුවණින් පව්කම් ගෙවා දුගතියකට නොගොස් කෙළෙස් දවන්නේය" කියායි.

1408. "මහර්ෂීන් වහන්සේ විසින් මම උත්තමවූ දමනයෙන් (රහත් බැවින්) දමනය කරනලදුයේ වෙමි. ජය පරාජය දෙකහැර නිශ්චලස්ථානයට (නිවනට) පැමිණියේ වෙමි.

1409. "සත්දහස් සත්සියවන කපෙහි මහත්බල ඇති අම්බට්ඨ නම් වූ ඒ තුදුස් සක්විති රජවරු වූහ. 1410

## 69 සුමන ථේරාපදානය.

1411. "මම එකල්හි නමින් සුමන නම් මල්කරුවෙක් වීමි. (ඒ මම) කෙලෙස් රජස් රහිත ලෝකයාගේ පූජාවන් පිළිගන්නාවූ නොහොත් පූජාවනට ගෙයක් වැනිවූ 'සිඛී' නම් බුදුරජාණන් වහන්සේ දුටිමි.

1412. "දෝතින් උතුම් සමන් මල් (මිටක්) ගෙන සිඛී බුදුරජාණන් වහන්සේට පිදීමි.

1413-1414 "මෙම මල් පූජාව කරණකොටගෙනද චිත්තප්‍රණිධින් (ප්‍රාර්ථනාවන්) කරණකොටගෙනද දුගතියක් නොදනිමි. පුෂ්ප පූජාවෙහි මේ විපාකයයි.

1415. "විසිවන කපෙහි මහත් යසස් ඇති සත්රුවනින් යුත් සක්විති රජවරු සිව්දෙනෙක් වූහ. 1416

## 70 පුප්ඵචංගොටිය ථේරාපදානය.

1417. "උත්තම ජන්මවත් අභීත ස්වභාවය ඇති කේශර සිංහරාජයෙකු මෙන්ද, පක්ෂීන් අතුරෙහි ශ්‍රෙෂ්ඨවූ ගුරුළෙකු මෙන්ද, උතුම් ව්‍යාඝ්‍රයෙකු මෙන්ද

1418-1419. "කෙළෙස් රහිතවූ පස්මරුන් දිනුවාවූ ශ්‍රමණයනට අග්‍රවූ භික්ෂුසංඝයා පිරිවරාහුන් තිලොවට පිළිසරණවූ සිඛී බුදුරජාණන් වහන්සේට උතුම් කටුකරඬුමල් ගොටුවක තබා ගොටුවද සමග පිදීමි.

1420. "ද්විපදොත්තමවූ නරශ්‍රෙෂ්ඨ බුදුරජාණන් වහන්සේ කෙරෙහි එම චිත්ත ප්‍රසාදය කරණකොටගෙන ජය-පරාජය දෙකම හැර නිශ්චල ස්ථානයට (නිවණට) පැමිණියේ වෙමි.

1421. "මින් තිස්වන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

1422. "තිස් කපක් සම්පූර්ණවූ කල්හි සත්රුවනින් යුත් දේවභූති නම් සක්විති රජවරු පස්දෙනෙක්වූහ. 1423

## 8 නාගසමාල වග්ග.

### 71 නාගසමාල ථෙරාපදානය.

1424. "මම (සියලු නගර වාසීන්ගේ වැඳුම් පිදුම් සඳහා නගර මැද වීථියෙහි සුණු ගඩොල් ආදියෙන් නිමවන ලද සිඛී බුදුරජුන්ගේ ස්තූපයෙහි ආදර සහිතව පළොල් මලක්ගෙන තැබීමි.

1425. "මින් එක් තිස්වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ස්තූප පූජාවෙහි මේ විපාකයයි.

1426. "මින් පසළොස් වන කපෙහි සත්රුවනින් යුත් මහත්බල ඇති 'භූමිය' නම් සක්විති රජෙක් විය. 1427

### 72 පදසඤ්ඤක ථෙරාපදානය.

1428. "තිස්ස බුදුරජාණන් වහන්සේගේ තබන්නාවූ ශ්‍රී පාදය දැක සතුටුවූයේ සතුටු සිතින් ශ්‍රීපාදයෙහි සිත පැහැදවීමි.

1429. "මින් දෙඅනූවන කපෙහිවූ යම් (ශ්‍රීපාද පිළිබඳ) සංඥාවක් ලැබීම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පද සංඥාවෙහි (සිරිපා සටහන්ගෙන එය පිදීමෙහි) මේ විපාකයි.

1430. "මින් සත්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සුමේධ නම් සක්විති රජෙක් විය. 1431

### 73 බුද්ධසඤ්ඤක ථෙරාපදානය.

1432. "ගසක් මුදුනෙහි එල්වන ලද බුදුරජාණන් වහන්සේගේ පංශුකූල සිවර දැක ඉක්බිති එයට ඇඳිලි බැඳ මම (එම) පාංශුකූල සිවුර වැන්දෙමි.

1433. "මින් අනූවන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ සංඥාවෙහි මේ විපාකයයි.

1434. "මින් සිව්වැනි කපෙහි සිව් මහ දිවයින හා සිව් මහ සසර කෙළවරකොට ඇති පෘථිවිශ්වර වූ සතුරු රජුන් ජය ගන්නා සුළුවූ මහත් බල ඇති දුම්සාර නම් සක්විති රජෙක් විය. 1435

## 74 භිසාලුවදායක ථේරාපදානය.

1436. "මම මහ වනයට පිවිස (එම) වනයෙහි වසමි ලෝවැසියන්ගේ පූජාවන් පිළිගත්තාවූ නොහොත් පූජාවනට ගෙයක් වැනි වූ විපස්සී බුදුරජාණන් වහන්සේ දුටුවෙමි.

1437. "(උන්වහන්සේට) අත දෝනා දියෙහිවූ නෙළුඹලද පිදිමි. (ඉක්බිති) හිසනමා (උන් වහන්සේගේ) ශ්‍රීපාදයන් වැඳ උතුරුදිගට මුහුණලා ගියෙමි.

1438. "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි නෙළුම් අල දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදකිමි. (එම) පුණ්‍යකර්මයාගේ මේ විපාකයයි.

1439. "මින් තෙවන කපෙහි සත් රුවනින් යුත් මහත් බල ඇති භිස නම් සක්විති රජෙක් විය. 1440

## 75 එක සඤ්ඤක ථේරාපදානය.

1441. "විපස්සී බුදුරජාණන් වහන්සේගේ නමින් චණ්ඩ නම්වූ අග්‍ර ශ්‍රාවකයෙක් විය. ලෝකයාගේ පූජාවන් පිළිගැනීමට සුදුසුවූ (දක්ෂිණාර්හ) වූ උන්වහන්සේ කෙරෙහි මා විසින් එක් භික්ෂාවක් දෙන ලදී.

1442. "ද්විපදොත්තමයාණන් වහන්ස, නරශ්‍රෙෂ්ඨයන් වහන්ස, එම චිත්ත ප්‍රසාදය හේතුකොටගෙන දුගතියක් නොදනිමි. එක භික්ෂාවෙහි මේ විපාකයයි.

1443. "මින් සතළිස් වන කපෙහි සත්රුවනින් යුත්වූ මහත් බල ඇති වරුණ නම් සක්විති රජෙක් විය. 1444

## 76 තිණසත්ථරදායක ථේරාපදානය

1445. "හිම වතට නුදුරු තන්හි පියුම් වලින් ගැවසීගත් නා නා පක්ෂීන්හට වාසස්ථානවූ මහා ජාතස්සරයක් (ඉබේ හටගත් මහ විලක්) විය.

1446. "මම එම විලෙහි පැන් බී (විලට) නුදුරුතන්හි වසමි (එහිදී) අහස් මගෙහි යන (ශ්‍රමණයනට අග්‍රවූ බුදුරජාණන් වහන්සේ දුටිමි.

1447. "ලෝකයෙහි (ඊට වඩා වැඩි කෙනෙකුන් නැති බැවින්) අනුත්තරවූ ශාස්තෘන් වහන්සේ මාගේ අදහස දැන අහසින් බැස එකෙණෙහි භූමියෙහි වැඩ සිටිසේක.

**1448.** "මම අගින් තෘණගෙන නිසිදනයක් (කොට) දුනිමි. තිස්ස බුදුරජාණන් වහන්සේ එහි වැඩහුන්සේක.

**1449.** "නැමුනාවූ ගුණ (මෙනෙහි කරන්නාවූ (මම) විවේකීව වැඩසිටි ලොකනායකවූ මහා මුනිවූ බුදුරජාණන් වහන්සේට සියසිත පහදවා වැන්දෙමි.

**1450.** "එම චිත්ත ප්‍රසාදය කරනකොටගෙන මම නිර්මාණරති දෙව්ලොව උපනිමි. දුගතියක් නොදනිමි. මෙය ඇතිරිය (පිදීමේ) විපාකයයි.

**1451.** "මින් දෙවෙනි කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති මහ නම් සක්විති රජෙක් විය. 1452

### 77 සූචිදායක ථෙරාපදාන.

**1453** "තිස් දහස්වන කපෙහි උතුම් දෙතිස් මහ පුරිස් ලකුණු ඇති නමින් සුමෙධ නම් වූ ලෝක නායකවූ බුදුරජාණන් වහන්සේ ලොව පහළවූසේක.

**1454.** "තාදීගුණ ඇති ස්වර්ණ වර්ණවූ ද්විපදොත්තමවූ ඒ බුදුරජාණන් වහන්සේට සිව්රු මසනු පිණිස මා විසින් හිඳි (කටු) පසක් දෙනලදී.

**1455.** "එම හිඳි දන කරණකොටගෙනම දක්ෂලෙස අදහස් දක්නා සුළුවූ තියුණුවූ සියුම්වූ පහසුවූ නුවණක් මට උපදින්නේය.

**1456.** "මාගේ කෙලෙස් දවනලදී. සියලු භවයෝ නසන ලදහ. සම්බුදු සසුනෙහි පශ්චිම ශරීරය දරමි.

**1457.** "සත්රුවනින් යුත් මහත් බළ ඇති දිපදාධිපති නම් වූ සිව්රජකෙනෙක් වූහ. 1458

### 78 පාටලීපුප්ඵිය ථෙරාපදානය.

**1459.** "එකල්හි මම සියුමැලිවූ සුවසේ වැඩුණු සිටු පුත්‍රයෙක් වීමි. පළොල් මල් රෙදි පටෙහි (එක්කොට) එය ගෙන ගියෙමි.

**1460-1461.** "(එකල්හි) ඇතුළු වීථියෙහි වඩින්නාවූ ස්වර්ණ වර්ණවූ රන් ඇගෑවක් මෙන් බබළන දෙතිස් මහ පුරිස් ලකුණු ඇති නරශ්‍රෙෂ්ඨවූ (අනාථ) නාථවූ සියල්ල අවබොධකළ තිස්ස බුදුරජාණන් වහන්සේට මම සතුටුවූයේ සතුටු සිතින් (එම) මල්වලින් පිදිමි (උන්වහන්සේට) නමස්කාරද කෙළෙමි.

1462. "එකල්හි මින් දෙයානූවන කපෙහි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුෂ්ප පූජාවෙහි මේ විපාකයයි.

1463. "මෙයින් දෙඅනූවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති අභිසම්මත නම් සක්විති රජෙක් විය. 1464

## 79 ඨිතඤ්ජලීය ථෙරපදානය.

1465. "මම පෙර මහ වනයෙහි මුව වැද්දෙක් වීමි. එහිදී උතුම් ලකුණු ඇති තිස්ස බුදුරජාණන් වහන්සේ දුටුවෙමි.

1466. "නුදුරුතන්හි නියමිත පත් ඇතිරියෙහි වැඩහුන් උන්වහන්සේට මම ඇඳිලිබැඳ පෙරදිගට මුහුණලා ගියෙමි.

1467. "එකල්හි මාගේ හිසමත අකුනක් (සෙනයක්) වැටුනි ඉක්බිති මැරෙනකල්හිද ඒ මම නැවත ඇඳිලි කෙළෙමි.

1468. "මින් දෙයානූවන කපෙහිවූ එකල්හි (යම්) ඇඳිලි (බැඳීමක්) කෙළෙහම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. අඤ්ජලිකර්මයාගේ මේ විපාකයයි.

1469. "සූපණ්ණස්වන කපෙහි සත්රුවණින් යුත් මහත් පල ඇති මිගකේතු නම් සක්විති රජෙක් විය. 1470

## 80 තිපදුමිය ථෙරාපදානය.

1471. "සියලු ධර්මයන්ගේ පරතෙරට ගිය දමනයවූ දමනය වූවන් විසින් පිරිවරණලද පස්මරුන් දිනූ පදුමුත්තර නම් බුදුරජාණන් වහන්සේ නුවරින් නික්මුණු සේක.

1472. "එකල්හි මම හංසවතී නගරයෙහි මල්කරුවෙක් වීමි. එහි (ඔහු ගෙනයන මල් රැසෙහි) යම් උතුම් මල්වීද ඒ මල්වලින් (ඉතා ශොභාවත්) මල් තුනක් හැරගතිමි.

1473. "ඇතුළු වීථියෙහි පෙරමගට එන කෙලෙස් රජස් විරහිත බුදුරජාණන් වහන්සේ දුටිමි. එකල්හි ඒ මම බුදුරජාණන් වහන්සේ දැක මෙසේ සිතීමි. (කෙසේදයත්)?

1474. "රජුට පිරිනමනලද මේ මල්වලින් මට කවර ප්‍රයෝජනද, (ඉදින් ප්‍රයෝජනයක් වෙතොත්) මම ගමක් හෝ ග්‍රාමක්ෂෙත්‍රයක් හෝ දහසක් හෝ ලබන්නෙමි.

1475. "නොදැමුනවුන් දමනය කරන්නාවූ ප්‍රාඥවූ සියළු සතුන්ට සැප එලවන්නාවූ බුදුරජාණන් වහන්සේ (මේ මලින්) පුදා අමෘත ධනය (නිවන) ලබන්නෙමියි කියායි.

1476. "මම මෙසේ සිතා සිය සිත පැහැදවීමි. එකල්හි ලෙහෙවන් මල් තුනක් ගෙන අහසෙහි දැමීමි.

1477. "මා විසින් උඩට දමනලද කෙණෙහි එම මල් අහසෙහි පැතුරුනාහුය. (තථාගතයන් වහන්සේගේ හිස) මතුයෙහි වූ එහි නැටි උඩුකුරුව මල් යටිකුරුව (අහසෙහි) දැරුවාහුය.

1478. "යම්කිසි මිනිස් කෙනෙක් (එය) දැක මහා නාද පැවැත්වූවාහුද (එසේම) අහසෙහි දෙවියෝද සාධු නාද පැවැත්වූහ. (කෙසේදයත්)?

1479. "බුදුරජාණන් වහන්සේ නිසා ලෝකයෙහි ආශ්චර්ය දැය පහළවිය. අපි සියල්ලෝ උන්වහන්සේට මල් පිදීම හේතුකොට ධර්මය අසන්නෙමුය කියායි.

1480. "ලෝකයාගේ පූජාවන් පිළිගන්නාවූ නොහොත් පූජාවන් (රැස්වීමට) ගෙයක් වැනිවූ වීථියෙහි වැඩසිටි ශාස්තෘවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක.

1481. "යම් ඒ මානවකයෙක් තෙම රත් පියුම්වලින් බුදුරජාණන් වහන්සේ පිදීද මම හේ කවරෙක්දැයි ප්‍රකාශ කරන්නෙමි. (එසේ) පවසන්නාවූ මාගේ වචනය අසව්.)

1482. "(මෙතෙම කප්තිස් දහසක් දෙව්ලොව සිත් අලවා වසන්නේය. තිස් කපක් මුළුල්ලෙහි ශක්‍රදේවේන්ද්‍රව දිව්‍යරාජ්‍යය කරන්නේය.

1483. "එකල්හි තුන්සියයක් යොදුන් උස ඇති එක්සිය පණස් යොදුන් පුළුල ඇති මහා විත්ථාරක නම් (සඳළු සහිත) විමනක් (පහළ) වන්නේය.

1484. "එහි සුනිර්මිත ද්වාරයෝ හාරලක්ෂයක් වෙති. කුළුගෙවලින් යුක්තයහ. මහාසයනයන්ගෙන් නිමවන ලදහ.

1485. "නෘත්‍යගීතයන්හි දක්ෂ වාදනයෙහිද හුරුපුරුදු කෙළලක්ෂයක් අප්සරාවෝ පිරිවරන්නාහුය.

1486. "දිව්‍යප්සරා සමූහයා විසින් ගැවසීගත් මෙබඳු උතුම් විමනෙහි හැමකල්හි දිව්‍යමයවූ ලෙහෙවන් මල්වැසිවසී.

1487. "එකල්හි තොරන්හිඳ උළුවසුවලදවූ බිත්තියෙහිවූ ඇණවලදී ද එබඳුමවූ කොකුවලද, චක්‍ර ප්‍රමාණවූ ලෙහෙවන් පුෂ්පයෝ එල්බෙන්නාහුය.

1488. "එකල්හි මේ මල් පෙත්තෙන් පෙත්ත වැසෙන සේවූ විමානය තුළ (එම මලින්ම කළ ඇතිරි) අතුරාද (පොරෝනා) පොරොවාද හෝනාහුය.

1489. "භවනය වටා හාත්පස යොදුන් සියයක් ඒ පිරිසිදු ලෙහෙවන් පුෂ්පයෙන් දිව සුවඳ පතුරුවත්.

1490. "පන්සැත්තෑවරක් සක්විති රජ වන්නේය. මහත්වූ ප්‍රදේශ රාජ්‍යය ගණන් වශයෙන් (මෙතෙකැයි) ගිනිය නොහැකියි.

1491. "(දිව්‍ය-මනුෂ්‍ය) ද්විධසම්පත් අනුභවකොට උවදුරු රහිතවූයේ පශ්චිම භාවය පැමිණි කල්හි නිවණ පහස්නේය. (අවබෝධ කරන්නේය. කියායි.)

1492. "මා විසින් බුදුරජාණන් වහන්සේ මැනවින් දක්නා ලදී. වණික් කර්මය මැනවින් යොදන ලදී. තුන් පියුමක් පුදා (දිව්‍යමනුෂ්‍ය නිර්වාණ යන) ත්‍රිවිධ සම්පත්තිය අනුභව කෙළෙමි.

1493. "අද නිර්වාණ ධර්මයට (සාක්ෂාත් කිරීම් වශයෙන්) පැමිණියාවූ සර්වාකාරයෙන් (කෙලෙසුන්ගෙන්) මිදුනාවූ මාගේ හිසමතුයෙහි මැනවින් පිපුනු ලෙහෙවන් වියුමක් දරන්නේය.

1494. "පදුමුත්තර බුදුරජතෙම මාගේ කර්මය ප්‍රකාශ කරන කල්හි සත්දහසක් ප්‍රාණීන්හට ධර්මාභිසමය විය.

1495. "මින් සියක් දහස්වන කපෙහි බුදුරජාණන් හට යම් පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පියුම් තුන පිදීමේ ප්‍රතිඵලයයි.

1496. "මාගේ ක්ලෙශයෝ දවන ලදහ. සියළු භවයෝ නසන ලදහ. සියළු ආශ්‍රවයෝ ක්ෂය කරන ලදහ. දැන් නැවත ඉපදීක් නැත. 1497

## 9 තිමිරපුප්ඵිය වග්ග.

### 81 තිමිරපුප්ඵිය ථෙරාපදානය.

1498 "මම චන්ද්‍රභාගා ගංගාතීරයෙහි අනුසොතයට ගඟ බැසයන අතට තැන් තැන්වල ලැගුම් ගනිමින් යමි. (එකල්හි)

වැඩහුන් සන්සිඳුවන ලද පව් ඇති පැහැදුනු නොකැළඹුනු සිත් ඇති බුදුරජුන් දැක,

1499. "එකල්හි මම එහි සිත පහදවා මෙසේ සිතීමි. මේ (සර්වඥතෙම) දමනයවූයේ (සෙස්සන්ද) දමනයකරවූයේය.

1500. "එසේම තෙමේ (සන්සිඳුනේ) සෙස්සන්ද සන්සිදුවන්නේය. (තෙමේ) ශාන්තවූයේ (සෙස්සන්ද) ශාන්ත කරවන්නේය. තෙමේ මිදුනේ (සෙස්සන්ද) මුදවන්නේය. (තෙමේ) නිවුනේ (සෙස්සන්ද) නිවණට පමුණුවන්නේය කියායි.

1501. "මම මෙසේ සිතා සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේ තිමිර මල් (නිල් රැස් විහිදි වනය අඳුරු වූවාක් මෙන් කරන මල් වර්ගයක්) (බුදුරජාණන් වහන්සේගේ මත්තෙහි (උඩ) විසිරවීමි.

1502. "ඇඳිලි බැඳ පැදකුණුකොට බුදුරජාණන් වහන්සේගේ ශ්‍රීපාදයන් වැඳ බටහිර දිගට ගියෙමි.

1503. "ගිය නොබෝ වේලාවකින් සිංහයෙක් මා පෙළීය ප්‍රපාතයකට අනුව යන්නේ මම එහිම වැටුනෙමි.

1504. "මින් සිව් අනූවන කපෙහි යම් මල් පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනියි බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

1505. "සපණස් වන කපෙහි මහත් යසස් ඇති සත්රුවනින්යුත් මහත් බල ඇති සක්විති රජවරු සත්දෙනෙක් වූහ. 1506

## 82 ගත සඤ්ඤක ථෙරාපදානය.

1507. "උත්පත්තියෙන් සත් හැවිරිදිවූ මම අනගාරිය නම්වූ ශාසනයෙහි පැවිදිවීමි. පැහැදුනු සිතින් (යුතුව) ශාස්තෘන් වහන්සේගේ ශ්‍රීපාදයන් වැඳීමි.

1508. "මම අනන්ත ගුණ සාගරයක්වූ තිස්ස බුදුරජාණන් වහන්සේ උදෙසා (නගුලෙන් සෑ බිමෙහි) හටගත් නංගලිකී පුෂ්ප සතක් අහසෙහි දැමීමි.

1509. "සතුටු සිත් ඇත්තේ බුදුරජුන් වැඩිය මාර්ගයට සියතින්ම පහන් සිත් ඇත්තේ පුදා එකල්හි ඇඳිලි (බැඳීමද) කෙළෙමි.

1510. "මින් දෙයානු කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි.

1511. "මින් අටවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති අග්නිසිඛ නම් සක්විති රජවරු තිදෙනෙක් වූහ. 1512

## 83 නිපන්නඤ්ජලිය ථෙරාපදානය.

1512 "මම (රුක්ඛ මූලිකාංගය සමාදන්ව) රුක්මුල්හි හුන්නේ තදින් රෝගීවූයේ මම මහවෙනෙහි අතිශය දුක්ඛිත බවට පත්වූයේ වෙමි.

1514. "තිස්ස බුදුරජාණන් වහන්සේ අනුකම්පා උපදවා ඒ මම වැඳ හොත්තේම සිරසෙහි ඇඳිලිකොට (බැඳ)

1515. "පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ සියලු සතුනට උතුම්වූ බුදුරජාණන් වහන්සේ වැඳ මම එහි කළුරිය කෙළේ වෙමි.

1516. "මින් දෙයානූවන කපෙහි යම් පුරුෂොත්තමවූ සර්වඥ කෙනෙකුට වැන්දෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි (බුද්ධ) වන්දනාවෙහි මේ විපාකයයි.

1517. "මින් පස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති මහා සිව නම්වූ සක්විති රජවරු පස්දෙනෙක් වූහ. 1518

## 84 අධොපුප්ඵිය ථෙරාපදානය.

1519. "සිඛී නම් බුදුරජාණන් වහන්සේගේ අග්‍රශ්‍රාවකවූ මහානුභාව ඇති ත්‍රිවිද්‍යාවෙන් යුත් අභිභූ නම් ඒ භික්ෂුතෙමේ හිමවතට එළඹියේය.

1520. "එකල්හි මම අප්‍රමාණ ආරම්මණයන්හිද ඍද්ධීන් හිද වශයට පත් ඍෂියෙක්වූයේ රමණීය අසපුවක වසමි.

1521. "මම (උන්වහන්සේ විසූ) කඳු පහළින් මල්ගෙන පැමිණියෙමි. (පැමිණ) අහසෙහි පක්ෂියෙකු මෙන් පර්වතයට නැංගෙමි.

1522. "මල් සතක් ගෙන මම (උන්වහන්සේගේ) මස්තකයෙහි විසිරවීමි. වීරවූ අභිභූ ශ්‍රාවකයන් වහන්සේ විසින් ඒ (දෙස) බලන ලද කල්හි (මම) පෙරදිගට මුහුණලා ගියෙමි.

1523. "(ගොස් මාගේ) ආවාසයට පැමිණියෙමි. ආශ්‍රමයට පැමිණ මම පිරිකර බරගෙන කඳු අතරට ගියෙමි.

1524. "(එහිදී) ඝොර ස්වරූපවූ මහත් බල ඇති පිඹුරෙක් මා පෙළීය. පෙර කළ (ඒ පුෂ්ප පූජා) පුණ්‍ය කර්මය සිහි කොට (මම) එහිම කළුරිය කෙළෙමි.

1525. "මින් එක්තිස් වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුෂ්ප පූජාවෙහි මේ විපාකයයි 1526

## 85 රංසි සඤ්ඤක ථෙරාපදානය.

1527. "මම පෙර හිමවත් පව්වෙහි වාසය කෙළෙමි. අඳුන් දිවිසම් උතුරු සළුකොට ඇති මම කඳු අතරෙහි වෙසෙමි.

1528. "සියක් රැස් ඇති හිරු වැනිවූද සුපුෂ්පිත සල් රුකක් වැනිවූද වනගතවූ ස්වර්ණ වර්ණ බුදුරජාණන් වහන්සේ දැක,

1529. "විපස්සී බුදුරජාණන් වහන්සේගේ රශ්මියෙන් සිත පහදවා මම ඇඳිලි බැඳ උක්කුටිකව හිස නමා වැන්දෙමි.

1530. "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් (පුණ්‍ය) කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. රශ්මි සංඥාවෙහි (පැහැදීමේ) මේ විපාකයයි. 1531

## 86 දුතිය රංසි සඤ්ඤක ථෙරාපදානය.

1532 "වැහැරි සිව්රු දරන්නාවූ මම හිමවත් පව්වෙහි සක්මනට නැගුනේ නැගෙණහිර දිගට මුහුණලා හුනිමි.

1533. "එකල්හි හිමවත් පව්වෙහිදී ධ්‍යානයෙහි ඇළුනාවූ ඵුස්ස බුදුරජාණන් වහන්සේ දැක ඇඳිලි බැඳගන (බුදු) රැස් කරණකොටගෙන සිත පැහැදවීමි.

1534. "මින් දෙයානූවන කපෙහිවූ එකල්හි (බුද්ධ රශ්මිය) පිළිබඳ යම් සංඥාවක් ලැබූයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. (බුද්ධ) රශ්මි සංඥාවෙහි (පැහැද පිදීමේ) මේ විපාකයයි. 1535

## 87 ඵලදායක ථෙරාපදානය.

1536. "කුර සහිත අඳුන් දිවිසම් දරන්නාවූ මම පලතුරු ගත් අත් ඇත්තේ හිමවත් පව්වෙහිදී ඵුස්ස බුදුරජාණන් වහන්සේ දැක (එම) පලතුරු දුනිමි.

1537. "මම පැහැදි සිතින් මේ පලතුරු දනක් දුනිම්ද, ඒ හේතුවෙන් භවයෙහි උපදින කල්හි මට පලතුරු ලැබේ.

1538. "මින් දෙයානූවන කපෙහි මම යම් පලතුරු දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පලතුරු දානයාගේ මේ විපාකයයි. 1539

88 සද්ද සඤ්ඤක ථෙරාපදානය.

1540. "(මම) හිමවතෙහි පන් ඇතිරියක වසමි (එකල්හි) දහම් දෙසන්නාවූ ඵුස්ස බුදුරජාණන් වහන්සේගේ (මධුර) ස්වරයෙහි සිත පැහැදවීමි.

1541. "මින් දෙයානූවන කපෙහි යම් කර්මයක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. (ඒ) පුණ්‍ය කර්මයාගේ මේ විපාකයයි 1542

89 බොධිසිඤ්චක ථෙරාපදානය.

1543. "මම මල් හා (සුවඳ) පැන් ගෙන (ඒ කිණිහිරි) බොධියට ඉස්සෙමි. (ඉස මෙසේ සිතීමි) (සර්වඥතෙම) (සසර දුකින්) මිදුනේ අපද (ඉන්) මුදවන්නේය. (කෙලෙස් ගින්නෙන්) නිවුනේ (අපද ඉන්) නිවීමට පමුණුවන්නේය. කියායි.

1544. "විපස්සී බුදුරජාණන් වහන්සේගේ මහාබොධි පූජාවක් විය. (එකල) පැවිදිව සිටි මම (එම) පූජාවට එළඹියෙමි.

1545. "මින් එක් අනූවන කපෙහි (කිණිහිරි) බොධියට යම් (සුවඳ පැන්) ඉසීමක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බොධියට පැන් ඉසීමේ මේ විපාකයයි.

1546. "තෙතිස්වන කප පවත්නා කල්හි උදක සෙචන නම් ජනාධිපතිවූ ඒ අට සක්විති රජවරු වූහ. 1547

90 පදුමපුප්ඵිය ථෙරාපදානය.

1548. "මම නෙළුම් වනයට (පොකුණකට) පිවිසියේ මල් බිඳින්නේ (ගලවන්නේ) දෙතිස් මහ පුරිස් ලකුණෙන් යුත් ඵුස්ස බුදුරජාණන් වහන්සේ දුටිමි.

1549. "මම නෙළුම් මල් ගෙන (එම බුදුරදුන් උදෙසා) අහසට දැමීමි (හෙතෙම එම) ප්‍රසන්න කර්මය (පින්කම) කොට අනාගාර්ය නම්වූ ශාසනයෙහි පැවිදිවීමි.

1550. "පැවිදිව සංවරණය කළාවූ කයින්ද සිතින්ද යුතුව වාග් දුශ්චරිතය හැර ආජීවය පිරිසිදු කෙළෙමි.

**1551.** "මින් දෙයානූවක කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**1552.** "කල්ප අටළොසක පදුමාභාස නම්වූ අටළොස් රජ කෙනෙක් වූහ. (එසේම) අටසාළිස් රජ කෙනෙක්ද වූහ. 1553

## 10 සුධාපිණ්ඩිය වග්ග.

### 91 සුධාපිණ්ඩිය ථෙරාපදානය.

**1554-1555** "පිදීමට සුදුසුවූ කෙලෙස් (පමා දොස්) ඉක්මවූ තරණය කළ (තුනී කළ) ශොක පරිදේව (දුක්) ඇති බුදුරජුන් කෙරෙහි හෝ සව්වන් කෙරෙහි හෝ පුදන්නහුට (හෙවත්) (කෙලෙස් පිරිනිවතින්) පිරිනිවී බිය නැති එබඳු උතුමන් කෙරෙහි පුදන්නාවූ ඔවුනට (ලැබෙන) පින මෙපමණයි කිසිවකින් පමණ කිරීමට (මැණීමට) නොහැකිය.

**1556.** "යමෙක් (මේ ලෙව්හි) සිව්මහ දිවයිනට ඉසුරු රජය කරවන්නේද (එය) මෙබඳු එක පියුමක් සොළොස් වෙනි කලාවකටද නොඅගී.

**1557.** "සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේගේ සෑයෙහි පැළුම් අතර මා විසින් පැහැදිලි සිතින් සුණු පිඩක් දෙනලදී. (පැළුම් අතරෙහි සුණු ගසා කවනලදී)

**1558.** "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් (පින්) කමක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පිළි සකරයෙහි (ප්‍රතිසංස්කරණයෙහි) මේ විපාකයයි.

**1559.** "මින් තිස්වන කපෙහි සත්රුවනින් යුත් පටිසංඛාර නම්වූ තෙළෙස් සක්විති රජකෙනෙක් වූහ. 1560

### 92 සුචින්තික ථෙරාපදානය.

**1561.** "මම සියල්ල දත් තිස්ස බුදුරජුන්හට තුටුවූයේ තුටු සිතින්ම (සිලිටි දැව මුවා අනගි) පිරිසිදු පුටුවක් පිදීමි.

**1562.** "මින් අටතිස්වන කපෙහි මහා රුචි නම් රජෙක් වීමි. (ඔහුට) බොහෝවූ සයනාසනද මහත්වූ භෝගද ඇත්තේ විය.

1563. "පිරිසිදු සිතින් බුදුරජාණන් වහන්සේට පුටුවක් දී තමා විසින් පෙර මැනවින් කළ (ඒ) ස්වකීය (පුණ්‍ය) කර්මය අනුභව කරමි.

1564. "මින් දෙඅනූවන කපෙහිවූ එකල්හි යම් පුටුවක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පීඨ දානයාගේ මේ විපාකයයි.

1565. "මින් අටතිස්වන කපෙහි රුචිය, උපරුචිය, මහා රුචිය යයි සක්විති රජවරු තිදෙනෙක් වූහ. 1566

## 93 අඩ්ඪචෙලක ථෙරාපදානය.

1567. "මම තිස්ස බුදුරජාණන් වහන්සේට (සිව්රු පිණිස) රෙදි කැබැල්ලක් දුනිමි. දුගඳින් යුත් මම අතිශය දුකට පත්වූයේ වෙමි.

1568. "මම (සිව්රු පිණිස මෙම) රෙදි කැබැල්ල පුදා කල්පයක් මුළුල්ලෙහි ස්වර්ගයෙහි සතුටුවීමි. සෙසු කල්පයන්හි මා විසින් කුශල් කරනලදී.

1569. "මින් දෙයානූවන කපෙහිවූ එකල්හි යම් වස්ත්‍රයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. වස්ත්‍ර දානයාගේ මේ විපාකයයි.

1570. "එකුන් පණස්වන කපෙහි ජනාධිපතිවූ සමන්ත ඡදන නම් දොළොස් සක්විති රජ කෙනෙක් වූහ. 1571

## 94 සූචිදායක ථෙරාපදානය.

1572. "මම පෙර බන්ධුමා නම් උතුම් පුරයෙහි කුඹුරෙක් වීමි. මා විසින් විපස්සී බුදුරජාණන් වහන්සේට හිදි (ඉදිකටු) දනක් දෙනලදී.

1573. "එම හිදි දන කරණකොට එවැනිමවූ විදුරග වැනි නුවණ වේ. පහවූ රාගය ඇත්තේවෙමි (කෙලෙසුන්ගෙන්) මිදුනේ වෙමි. ආශ්‍රවක්ෂයට පැමිණියේ වෙමි.

1574. "අතීත භවයෙහිද වර්තමාන භවයෙහිද අනාගත භවයෙහිද සියල්ල නුවණින් සොයාගතිමි. හිදි දනෙහි මේ විපාකයයි.

1575. "මින් එකානූවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති වජිර නම්වූ සක්විති රජ කෙනෙක්වූහ. 1576

## 95 ගන්ධමාලිය ථේරාපදානය.

1577. "මම සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේට (සඳුන් අගිල් කපුරු කස්තුරි ආදිය වඩා) සුගන්ධ ස්ථූපයක් කෙළෙමි. බුදුරජාණන් වහන්සේට සුදුසු සේ කරන ලද එය සමන් මල් වලින් වසනලදී.

1578-1579 "රන් අගෑවක් මෙන් බබළන ලෝකයෙහි අසහාය නායකවූ සර්වඥවූ උපුල් මලක් මෙන් බබළන ඇවිලෙන ගින්නක් වැනි ශ්‍රෙෂ්ඨ ව්‍යාඝ්‍රයෙකු මෙන් උතුම් වූ විශිෂ්ට ජන්ම ඇති කේශර සිංහයකු වැනි භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලද ශ්‍රමණයනට අග්‍රවූ බුදුරජාණන් වහන්සේද (එම) බුදුරජාණන් වහන්සේගේ ශ්‍රීපාද යුග්මයද වැඳ උතුරුදිගට මුහුණලා ගියෙමි.

1580. "යම් හෙයකින් මින් සිව් අනූවන කපෙහි මේ ගඳමල් පූජාවක් කරනලදද බුදුරජුන් විෂයෙහි කරන (ලද) පුණ්‍යකර්මයාගේ විපාක කරණකොටගෙන මම විශෙෂයෙන් දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

1581. "එකුන් සතළිස්වන කපෙහි දෙවගන්ධ නම් වූ ඒ සොළොස් සක්විති රජකෙනෙක් වූහ. - 1582

## 96 තිපුප්ඵිය ථේරාපදානය.

1583. "මම පෙර මහ වෙනෙහි වැද්දෙක් වීමි. (විපස්සී බුදුරජුන්ගේ) නිල්වන්වූ පළොල් බොධිය දැක (එයට) මල් තුනක් විසිරවීමි (පිදීමි)

1584-1585 "මම එකල්හි (බෝ) කොළ සතක් (අවුලා) ගෙන පිටත දැමීමි. ඇතුළත පිරිසිදු වූ පිටත (ද) පිරිසිදුවූ (කෙලෙසුන්ගෙන්) මැනවින් මිදුණු ආශ්‍රව රහිතවූ ලෝක නායකවූ විපස්සී බුදුරජුන් ඉදිරියෙහිදී මෙන් පළොල් බොධිය වැඳ මම එහි කළුරිය කෙළෙමි.

1586. "මින් එක් අනූවන කපෙහි යම් බෝධි පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

1587. "මින් තෙතිස් වන කපෙහි මහත් බල ඇති සමන්ත පාසාදිකා නම් වූ සක්විති රජවරු තෙළෙස් දෙනෙක් වූහ. - 1588

## 97 මධුපිණ්ඩික ථෙරාපදානය.

1589-1590 අල්ප ශබ්දඇති නිරාකූලවූ මහවනයෙහිදී සෘෂීනට ශ්‍රෙෂ්ඨවූ ලෝකයාගේ පූජාවන් පිළිගන්නාවූ නොහොත් පූජාවනට ගෙයක් වැනි වූ නිවීගිය ආත්මභාව ඇති අති ශ්‍රෙෂ්ඨවූ උත්තම ආජානීයත්වය ඇති ඔසධී තරුව මෙන් බබළන්නාවූ දිව්‍යසමූහයා විසින් නමස්කාර කරණලද සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේ දැක එකෙණෙහි මට සොම්නස් සහගතවූ (සතට) අමුතුවූ නුවණක් උපන්නේය.

1591. "සමාධියෙන් නැගීසිටි (ඒ) බුදුරජාණන් වහන්සේට මිදී එම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රීපාද යුග්මයද වැඳ නැගෙණහිර දෙසට මුහුණලා ගියෙමි.

1592. "සූතිස්වන කපෙහි සුදස්සන නම් රජෙක්වීමි. එකල්හි (අනුභව කරන) භොජනයෙහිද නෙළුම් පැනි වැගිරේ. මිහි වැසිද වැස්සේය. පූර්ව කර්මයාගේ මේ විපාකයයි.

1593. "මින් සිව් අනූවන කපෙහි වූ එකල්හි යම් මී වදයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මධු දානයාගේ මේ විපාකයයි.

1594. "මින් සූතිස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති ඒ සුදස්සන නම් සිව් සක්විති රජකෙනෙක් වූහ. - 1595

## 98 සේනාසනදායක ථෙරාපදානය.

1596. "(මම) සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේට පත් ඇතිරියක් දුනිමි හාත්පස අසෙනිය කුසුම්ද විසිරවීය.

1597. "මෙසේ පහයෙහි (මෙලොක්) ගුණ ඇති මනරම් අගනා (ඇතිරි) පරිහරණය කරමි. මාගේ සයනයෙහි මාහැඟි මල් ද වැටේ.

1598. "මම විසිතුරුවූ මල් අතුළ සයනයෙහි එකෙණෙහි හොවීමි. එකෙණෙහි සයනයෙහි මල් වැසිද වසින්නේය.

1599. "මින් සිව් අනූවන කපෙහි පත් ඇතිරියක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඇතිරි දනෙහි මේ විපාකයි.

1600. "මින් පස්වෙනි කපෙහි ජනාධිපතිවූ තිණසන්ථරක නම් මේ සත් සක්විති රජ කෙනෙක්වූහ. - 1601

## 99 වෙය්‍යාවච්චක ථෙරාපදානය.

**1602.** "විපස්සී බුදුරජාණන් වහන්සේගේ (භක්තිමත්) මහා ජන සමූහයා විය. මම (එකල්හි) සියළු කටයුතුවල යෙදුනු වාතාවත් කරන්නෙක් වීමි.

**1603.** "මහර්ෂිවූ බුදුරජාණන් වහන්සේට පිදියයුතු දෙයක්ද මට නැත. පිරිසිදු සිතින් බුදුරජාණන් වහන්සේගේ සිරිපා වැන්දෙමි.

**1604.** "මම මින් එක් අනූවන කපෙහි (බුදුරජුන්ට) වතාවත් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) වතාවත් කිරීමෙහි මේ ප්‍රතිඵලයයි.

**1605.** "මින් අටවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සුචින්තිත නම් සක්විති රජෙක් වීමි. - 1606

## 100 බුද්ධුපට්ඨාන ථෙරාපදානය.

**1607.** "(මම) විපස්සී බුදුරජුන්ගේ (කාලයෙහි) සක් පිඹින්නෙක් වීමි. මහර්ෂිවූ සුගතයන් වහන්සේට නිතර (සක්පිඹීමෙන්) උවැටනෙහි යෙදුනේ වීමි.

**1608.** "තාදී ගුණ ඇති ලෝකනාථයන් වහන්සේට උවටැන් කිරීමෙහි විපාකය බලව්. හැමකල්හි සැටදහසක් තූර්යයෝ මා පිරිවරත්.

**1609.** "මින් එක් අනූවන කපෙහි මහර්ෂිවූ බුදුරදුන්ට (සක්පිඹීමෙන් යම්) උවටැනක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. උවැටැනක් කිරීමෙහි මේ විපාකයයි.

**1610.** "මින් සූවිසිවන කපෙහි මහත් බල ඇති මහා නිග්ඝොෂ නම්වූ සොළොස් සක්විති රජකෙනෙක් වූහ.-1611

**(ප්‍රථම ශතකය සමාප්තයි)**

## 11 භික්ඛාදායි වග්ග.

## 101 භික්ඛාදායි ථෙරාපදානය.

**1612.** "මම ස්වර්ණවූ ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ

**1613** (නොහොත් පූජාවනට ගෙයක් බඳුවූ) උතුම්වූ විහාරයෙන් (පිඬු පිණිස) නික්මුණාවූ තෘෂ්ණාවෙන් නික්ම නිවණට පැමිණියාවූ ප්‍රඥාවෙන් උපශාන්තවූ තාදි ගුණ ඇති මහා වීරවූ සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේට සැන්දක් පමණවූ භික්ෂා දානයක් දුනිමි.

**1614.** "පියවරින් පියවර වඩිමින් මහා ජනයා නිවණට පමුණුවන කල්හි මට (ඒ) ආදිච්ච බන්ධුවූ (හිරුගොත්හි) බුදුරජුන් කෙරෙහි මහත්වූ සොම්නසක් ඇතිවිය.

**1615.** "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. භික්ෂා දානයාගේ මේ විපාකයයි.

**1616.** "මින් සත්අසූවන කපෙහි සත්රුවනින් යුත් මහා රේණු නම් සත් සක්විති රජ කෙණෙක් වූහ. 1617

## 102 ඤාණ සඤ්ඤක ථෙරාපදානය.

**1518-1619** "මම ස්වර්ණ වර්ණවූ උතුම් ආජානීයයෙකු මෙන් ශ්‍රේෂ්ඨ වූ ත්‍රිමද ගලිත මාතංග හස්ති කුලයෙහි වූ ඇත්රජෙකු වැනි මහර්ෂිවූ පුන්සඳුමෙන් සියළු දිගුන් බබුළුවන්නාවූ විථියට පිළිපන් ලොකශ්‍රෙෂ්ඨවූ (සිද්ධාර්ථ) බුදුරජාණන් වහන්සේ දුටිමි.

**1620.** "(උන්වහන්සේගේ) නුවණෙහි සිත පහදවා ඇඳිලි බැඳගත සොම්නස්වූයේ පහන් සිත් ඇත්තේ සිද්ධාර්ථ බුදුරජුන් හට අභිවාදනය කෙළෙමි.

**1621.** "මින් සිව්අනූවන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධඥානය පැහැදි සිතින් සිත්හිලා සැළකීමේ විපාකයයි.

**1622.** "මින් තෙසැත්තෑවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති නරශ්‍රෙෂ්ඨවූ සක්විති රජවරු සොළොස් දෙනෙක් වූහ. 1623

## 103 උපාලි ථෙරාපදානය.

**1624.** "තීවරා නගරයෙහි වෙසෙන සුළුවූ මම එකල්හි මල් කරුවෙක් වීමි. (එහිදී) පහළවූ කෙළෙස් රජස් ඇති ලෝකනායකවූ සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේ දුටුවෙමි.

**1625.** "මම පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ (උන්වහන්සේට (උපුල්) මල් මිටක් දුනිමි. එම කර්මයාගේ විපාකයෙන් යම් යම් භවයක උපදීද.

**1626.** "මනාවූ මල්ලයන් විසින් පිරිවරණ ලදුයේ පෙර තමා කල පින්කම්හි ඉෂ්ට විපාක අනුභව කරමි. පුෂ්පදානයාගේ මේ විපාකයයි.

1627. "මින් සිව් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

1628. "මෙම භවය හැර සිව් අනූවන කපෙහි පටන්ම එහි නජ්ජුපම නම් පන්සියයක් රජවරු වූහ. 1629

104 පදපූජක ථෙරාපදානය.

1630. "මම සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේට සමන් මල් පිදීමි. (උන්වහන්සේ) ශ්‍රීපාදයෙහි මේ මල් සතක් සතුටින් විසිරවීමි.

1631. "එම පුණ්‍ය කර්මය කරණකොටගෙන අද දෙව් මිනිසුන් අතරෙහි අතිශයින් බබළමි. සම්බුදු සසුනෙහි අන්තිම ශරීරය දරමි.

1632. "මින් සිව් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුෂ්ප පූජාවෙහි මේ විපාකයයි.

1633. "මින් පස්වෙනි කපෙහි සිව්මහ දිවයින හා සිව් සයුර කෙළවරකොට ඇති පෘථිවියෙහි අධිපතිවූ ජනාධිපතිවූ සමන්තගන්ධ නම්වූ තෙළෙස් සක්විති රජකෙනෙක් වූහ. 1634

105 මුට්ඨිපුප්ඵිය ථෙරාපදානය.

1635. "එකල්හි මම නමින් සුදස්සන නම්වූ මල් කරුවෙක් වීමි. ලොක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ පහවූ කෙලෙස් මල ඇති බුදුරජාණන් වහන්සේ දුටිමි.

1636. "(මම) දෑසමන් මල්ගෙන පදුමුත්තර බුදුරජාණන් වහන්සේට පිදීමි (ඒ හේතුවෙන්) පිරිසිදු ඇස් ඇත්තේ සොම්නස්වූයේ දිවැසද ලැබීමි.

1637. "මම මේ පුෂ්ප පූජාව කරණකොට ගෙනද චිත්ත ප්‍රණිධීන් කරණකොට ගෙනද කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියක නිපදුනිමි.

1638. "මින් සතිස්වන කපෙහි මහත් බල ඇති දෙවුත්තර නම්වූ සොළොස් සක්විති රජ කෙනෙක්වූහ 1639

106 උදක පූජක ථෙරාපදානය.

1640-1641 "මම අහස් මගෙහි වඩින්නාවූ රන්වන්වූ ගිනිමෙන් දිලිසෙන ඇවිලගත් අග්නිය වැනි බුදුරජාණන්

වහන්සේට අතින් දිය ගෙන අහසෙහි උඩට දැමීමි. මහාවීරවූ කාරුණික ඍෂිවූ බුදුරජතෙම (එය) පිළිගත්තේය.

**1642.** "අහසෙහි වැඩසිටියාවූ පදුමුත්තර නම් ශාස්තෘ තෙම මෙම ගාථාව වදාළෝය.

**1643.** "මෙම ජල දානයෙන්ද ප්‍රීතිය ඉපදවීමෙන්ද (මෙතෙම) කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියක නූපදී. (කියායි)

**1644.** "ද්විපදොත්තමයන් වහන්ස, ලෝක ජ්‍යෙෂ්ඨයන් වහන්ස නරශ්‍රෙෂ්ඨයන් වහන්ස, එම කර්මය කරණකොට ගෙන ජය-පරාජය (දෙක) හැර නිශ්චල ස්ථානය (නිවනට) පැමිණියේ වෙමි.

**1645.** "සදහස් පන්සියවන කපෙහි සිව්මහ දිවයින හා සිව්මහ සමුදුරු කෙළවරකොට ඇති පොළොවට අධිපතිවූ ජනශ්‍රෙෂ්ඨවූ ඒ සහස්ස රාජනම් සක්විති රජවරු තිදෙනෙක්ද වූහ. 1646

107 නලමාලිය ථෙරාපදානය.

**1647-1648** "තාදිගුණ ඇති ද්විපදොත්තමවූ ලොකජ්‍යෙෂ්ඨවූ තණ ඇතිරියක වැඩහුන්නාවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේට බටමලක් ගෙන විජනියක් (වටාපතක්) බැඳ පිළිගැන්වීමි.

**1649.** "ලෝකනායකවූ බුදුරජාණන් වහන්සේ විජනිය පිළිගෙන මාගේ අදහස දැන මෙම ගාථාව වදාළ සේක.

**1650.** "යම්සේ මාගේ සිරුර නිවේද, පරිළාහයක් නොවේද? එසේම ඔබගේ සිත (රාග-ද්වෙෂ-මොහ) යන ත්‍රිවිධාග්නියෙන් (නිවේවා) කෙලෙසුන්ගෙන්ද මිදේවා කියායි.

**1651.** "වනය ඇසුරුකළාවූ යම්කිසි දෙවි කෙනෙක් වූවාහුද ඒ සියලු දෙව්වරු දායකයා හට දේශනා කරන්නාවූ බුද්ධ වචනය අසමු යයි රැස්වූවාහුය.

**1652.** "එහි දිව්‍ය සමූහයා විසින් පිරිවරණලදුව වැඩහුන්නාවූ භාග්‍යවතුන් වහන්සේ දායකයා සතුටු කරවමින් මෙම ගාථාවන් වදාළසේක. (කෙසේද යත්)

**1653.** "මේ විජිනි දානය කරණකොට ගෙනද චිත්ත ප්‍රනිධිය කරණකොට ගෙනද නමින් සුබ්බත නම්වූ සක්විති රජෙක් වන්නේය.

**1654.** "කුශල මූලයෙන් මෙහෙයන ලදුයේ එම කර්මයාගේ ඉතිරි විපාකය වශයෙන් නමින් මාළුත නම්වූ සක්විති රජෙක් වන්නේය.

**1655.** "මෙම විජිනි දානය කරණකොටගෙනද මහත්වූ සත්කාරය කරණකොටගෙනද කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියක නූපදින්නේය. කියායි.

**1656.** "තිස් දහස්වන කපෙහි ඒ සුබ්බත නමත් අටතිස් රජකෙනෙක් වූහ, එකුන්සිස් දහස්වන කපෙහි මාළුත නමින් අට රජකෙනෙක් වූහ. 1657

## 108 ආසනු පාට්ඨාන ථෙරාපදානය.

1658. "(මම) අල්ප ශබ්ද ඇති නිශ්චලවූ මහ වනයට පිවිස තාදීගුණ ඇති අත්ථදස්සී බුදුරජාණන් වහන්සේට මා විසින් සිහසුනක් පුදනලදී.

**1659.** "මල් මිටක් ගෙන ඒ ශාස්තෘන් වහන්සේ පැදකුණු කොට ඇසුරුද කොට උතුරුදිගට මුහුණලා ගියෙමි.

**1660.** "ද්විපදොත්තමයන් වහන්ස, ලොක ජ්‍යෙෂ්ඨයන් වහන්ස, නරශ්‍රෙෂ්ඨයන් වහන්ස, එම (පුණ්‍ය) කර්මය හේතුකොටගෙන තමා නිවණට පත් කරමි. සියලු භවයෝ නසන ලදහ.

**1661.** "එක්දහස් අටසියවන කපෙහිවූ එකල්හි යම් දනක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. සිහසුන් දනෙහි මේ විපාකයයි.

**1662.** "මින් සත්සියවෙනි කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සන්නිබ්බාපක නම් සක්විති රජෙක්විය. 1663

## 109 බිලාලිදායක ථෙරාපදානය.

**1664.** "මම හිමවතට නුදුරු තන්හි පන් ඇතිරියක වසමි. එකල්හි අහරෙහි ගිජු බවට පැමිණියේ (නිරතුරු) සයනය කරන ස්වභාවයද ඇත්තේ වෙමි.

**1665.** "කලම්බ බිලාලී තක්කල යන අලවර්ග සාරාගෙන ඩෙබර බදුළු බෙලි යන ගෙඩි කඩා ගෙනවුත් (ආහාර මෙන්) පිළියෙල කරනලදී.

1666. "පූජාවන් පිළිගන්නාවූ නොහොත් පූජාවනට ගෙයක් වැනිවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ මාගේ අදහස් දැන මා සමීපයට වැඩිසේක.

1667. එසේ සමීපයට එළඹ සිටියාවූ මහොත්තමවූ දෙවියන්ට දෙවිවූ නරශ්‍රෙෂ්ඨවූ බුදුරජාණන් වහන්සේ (දැක) බිලාලී අල ගෙන පාත්‍රයෙහි බැහීමි.

1668. "එකල්හි මහාවීරවූ බුදුරජාණන් වහන්සේ මා සතුටු කරමින් වැළඳූසේක. සර්වඥයන් වහන්සේ වළඳා ඉක්බිති මෙම ගාථාව වදාළසේක.

1669. "ඔබ සිය සිත පහදවා මට බිලාලි (අල) දුන්නෙහිද, (ඒ හේතුවෙන්) කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියකට නොපැමිණෙන්නෙහිය."

1670. "(මේ) මාගේ අන්තිම භවය වේ. සියළු භවයෝ නසන ලදහ. සම්බුදු සසුනෙහි අන්තිම දේහය දරමි.

1671. "මින් සූපණ්ණස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සුමෙඛලිය නම්වූ සක්විති රජෙක්විය. 1672

110 රේණුපූජක ථෙරාපදානය.

1673-1674 "රන්වන්වූ සියක් රැස් ඇති හිරුමෙන්වූද සියලු දිගුන් බබුළුවන පුන්සඳ මෙන්වූද සයුරුවලින් පිරිවැරූ පොළොව මෙන් සව්වන් විසින් පිරිවරණලද විපස්සී බුදුරජාණන් වහන්සේ (දුටිමි) (දැක) නාමල් ගෙන (එහි) රේණු වලින් විපස්සී බුදුරජාණන් වහන්සේට පිදීමි.

1675. "මින් එක් අනූවන කපෙහි (යම්) (නාමල්) රොන් පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

1676. "මින් පන්සාළිස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති රෙණු නම් සක්විති රජෙක් විය. 1677

## 12 මහා පරිවාර වග්ග.

### 111 මහා පරිවාර ථෙරාපදානය.

1678. "ලොක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ විපස්සී නම් බුදුරජාණන් වහන්සේ එකල්හි අටසැට දහසක් භික්ෂූන් සමග බන්ධුම නගරයට පිවිසිසේක.

1679. "නුවරින් නික්ම දිවයිනෙහිවූ චෛත්‍ය ස්ථානයට ගියෙමි. (එහිදී) කෙලෙස් රජස් විරහිත ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ නොහොත් පූජාවනට ගෙයක් බඳුවූ බුදුරජාණන් වහන්සේ දුටිමි.

1680. "අසූ දහසක් අවශේෂ යක්ෂයෝ මා සමීපයෙහි තව්තිසා වැසි දිව්‍ය සමූහයා ශක්‍රයාට මෙන් (මට) සකසා උවටැන් කරත්.

1681. "මම එකල්හි භවනයෙන් නික්ම වස්ත්‍රයක්ද ගෙන බුදුරජුන් හට හිස නමා වැන්දෙමි. එම වස්ත්‍රද දුනිමි.

1682. "බුදුරජතෙම ආශ්චර්යකි. ධර්මයෝද ආශ්චර්යය. අපගේ ශාස්තෘ සම්පත්තියද ආශ්චර්යකි. බුදුරජාණන් වහන්සේගේ ආනුභාවයෙන් මේ පෘථිවියද කම්පාවිය.

1683. "ආශ්චර්යවූ ලොමු දැහැ ගන්වන්නාවූ එම විෂ්මය දැක තාදී ගුණ ඇති ද්විපදොත්තමවූ බුදුරජාණන් වහන්සේ කෙරෙහි සිත පැහැදවීමි.

1684. "ඒ මම සිත පහදවා ශාස්තෘන් වහන්සේට වස්ත්‍රය පුදා ඇමතියන් සහිතවූ පිරිවර ජනයා සමග සරණ ගතදවීමි.

1685. "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් පුණ්‍ය කර්මයක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

1686. "මින් පසළොස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සූවාහනම් සොළොස් සක්විති රජකෙනෙක්වූහ. 1687

## 112 සුමංගල ථෙරාපදානය.

1688. "ලොක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ අත්ථදස්සී බුදුරජාණන් වහන්සේ විහාරයෙන් නික්ම තඩාගය වෙත එළඹිසේක.

1689. "භාග්‍යවත් සර්වඥ තෙම (එහි) නා (පැන්) බී (ඉන්) එතරව (හඳනය පමණක්) එක සිව්ර ඇත්තේ දිශානුදිශාවන් බලමින් එහි වැඩසිටියේය.

1690-1691 "(රුක්දෙවිවූ) මම භවනයෙහි හුන්නේ එකල්හි සූර්යයා මෙන් බබළන ස්වර්ණයක් මෙන් දිලිසෙන ලෝක නායකයන් වහන්සේ දුටිමි. (දැක) සතුටුවූයේ සතුටු සිතින්

අත්පොලසන් දුනිමි. (ඒ හේතුවෙන්) නෘත්‍යයෙහිද, ගීතයෙහිද පඤ්චාංගික තූර්යයෙහිද යෙදුනාවූ වෙමි.

**1692.** "දිව්‍යවූ හෝ යලි මනුෂ්‍යවූ හෝ යම් යම් යෝනියක උපදිම් නම් (යසසින්) සියළු සත්වයන් ඉක්වමි. මාගේ යසස විශාල වේ.

**1693.** "පුරුෂ ශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාරවේවා. පුරුෂොත්තමයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාරවේවා සර්වඥයන් වහන්ස, ඔබ (වහන්සේ) තමා තුටුකොට අනුනුදු තුටුකෙරෙහිය.

**1694.** "මනාවෘත ඇත්තේ (මෙසේ තථාගතයන්) පිරිවරාගෙන හිඳ (උන්වහන්සේද) සතුටුකොට මම බුදුරජාණන් වහන්සේට උවැටැන්කොට තුසිත භවනයෙහි උපදිමි.

**1695.** "මින් එක්දහස් සසියවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති එකචින්තික නම් එකොළොස් සක්විති රජකෙනෙක් වූහ.-1696

**113 දුතිය සරණාගමනිය ථෙරාපදානය.**

**1697.** "දිව්‍යරාජ්‍යයන් දෙදෙනෙකුන්ගේ සංග්‍රාමයක් එළඹ සිටියේය, (පෙරමුණට පැමිණ) රැස්ව සිටියේ විය. මහත් ඝෝෂාවද පැවැත්තේය.

**1698.** "ලෝකයාගේ පූජාවන් පිළිගන්නාවූ නොහොත් පූජාවනට ගෙයක්බඳුවූ ලෝකය දත් ශාස්තෘවූ පදුමුත්තර බුදු රජතෙම අහසෙහි වැඩ සිටියේ මහජනයා සංවේගයට පත්කෙළෝය.

**1699.** "එකෙණෙහි සියලු දෙවිවරු සතුටුවූවාහු බැහැර කරනලද යුද ඇඳුම් හා ආයුධ ඇත්තාහු බුදුරජාණන් වහන්සේට වැඳ එකඟව සිටියාහුය.

**1700.** "බුදුරජාණන් වහන්සේ අපගේ අදහස් දැන ශ්‍රෙෂ්ඨ වචන ප්‍රකාශ කළසේක. (හටගත්) අනුකම්පා ඇත්තේ මහජනයා (දුක් ගිනි හැර) නිවූසේක. (කෙසේදයත්)?

**1701.** "එක ප්‍රාණියෙක් නසන්නාවූ ප්‍රදුෂ්‍ය සිත් ඇති මනුෂ්‍යතෙමේ එම ප්‍රදූෂ්‍ය චිත්තය කරණකොටගෙන අපායෙහි උපදී.

1702. "බොහෝ ප්‍රාණීන් නසන්නාවූ යුද පෙරමුණෙහි ඇතෙකු මෙන් සිය සිත නිවව්. නැවත නැවත නොනසව්යි" (කියායි)

1703. "යක්රජුන් දෙනොගේම සේනාවෝ විෂ්මයට පත්වූහ. තාදී ගුණ ඇති ලෝකනායකයන් වහන්සේ සරණ කොට ගියහ.

1704. "පසැස් ඇති බුදුරජතෙම ජනසමූහයාට කරුණු අවබොධකරවා (පවින් ගොඩගත්තේය.) දෙවියන් විසින් බලනු ලබන්නේම උතුරුදිගට මුහුණලා වැඩියේය.

1705. "පළමුකොට දීපදොත්තමවූ තාදීගුණ ඇති බුදුරජාණන් වහන්සේගේ සරණ ගියෙමි (ඒ හේතුවෙන්) මම කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියෙහි නූපනිමි.

1706. "තිස්දහස්වන කපෙහි රාජ්‍යධුර වහනයෙහි ශ්‍රෙෂ්ඨවූ මහා ආනභි නම් සොළොස් සක්විතිරජ කෙනෙක් වූහ.-1707

## 114 එකාසනීය ථෙරාපදානය.

1708 "එකල්හි නමින් වරුණනම්වූ දිව්‍යරාජයෙක්ව මම සමර්ථවූ බලවාගන සහිතව බුදුරජුන්හට උවැටැන් කෙළෙමි.

1709. "අත්ථදස්සී නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ පිරිනිවි කල්හි සියලු තූර්යයන් ගෙන උතුම් බෝරුක වෙත එළඹියෙමි.

1710. "වාදිතයෙන්ද නෘත්‍යයෙන්ද කුළුතාලම් ආදියෙන්ද යුක්තවූයේ බුදුරජාණන් වහන්සේ ඉදිරියට මෙන් උතුම් බොධිය ඉදිරියට එළඹියෙමි.

1711. "මම ඒ බෝධියට උවැටැන්කොට පර්යංකයක් බැඳගන (එරමිනිය ගොතාගෙන) එහි කළුරිය කෙළෙමි.

1712. "ස්වකීය පින්කම්වලින් පැහැදුනු මම උතුම් බොධිය කෙරෙහිද පැහැදුනේ එම පහන් සිතින් නිර්මානරති දෙව්ලොව ඉපදුනෙමි.

1713. "හැමකල්හි තූර්යයෝ හැට දහසක් මිනිසුන් අතුරෙහිද, දෙවියන් අතුරෙහිද යන කුදුමහත් භවයෙහි ඉපද සිටින්නාවූ මා පිරිවරත්.

1714. "මා විසින් ත්‍රිවිධාග්නීහු නිවනලදහ. සියලු භවයෝ නසන ලදහ. සම්බුදු සසුනෙහි අන්තිම ශරීරය දරමි.

1715. "මින් පන්සියවන කපෙහි සත්රුවනින් යුත් නමින් සබාහු නම් සූතිස් රජකෙනෙක් වූහ. 1716

### 115 සුවණ්ණපුප්ඵිය ථෙරාපදානය.

1717. "ලෝකජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ විපස්සී භාග්‍යවත් තෙමේ ජනසමූහයාට අමෘත පදය (නිර්වාණ ධර්මය) දේශනා කරයි.

1718. "මම තාදීගුණ ඇති ද්විපදොත්තමවූ උන්වහන්සේගේ ධර්මය අසා රන් මල් සතරක් බුදුරජාණන් වහන්සේට පිදීමි.

1719. "එකල්හි යම්තාක් පිරිසවීද, ඒතාක් (පැතුරුනු) රන් පියස්සක් විය බුද්ධරශ්මියද, ස්වර්ණ රශ්මියද (මිශ්‍රව) ආලෝකය මහත්විය.

1720-1721 "ඔදවැඩි සිත් ඇති සොම්නස්වූ හටගත් සතුට අති ප්‍රීතිය උපදවන්නාවූ ඔවුනට මෙලොව සුව ගෙන දෙන්නාවූ මම බුදුරජාණන් වහන්සේට අයැද මනාව්‍රත ඇති උන්වහන්සේට වැඳ සතුට උපදවා ස්වකීය භවනයට ගියෙමි.

1722. "භවනයෙහි හුන් මම බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහිකෙළෙමි. මම එම චිත්ත ප්‍රසාදය හේතුකොට ගෙන තුසිත භවනහි උපනිමි.

1723. "මින් එක් අනූවන කපෙහි යම් මල් පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

1724. "මින් තෙසාළිස්වන කපෙහි මහත් බල ඇති නෙමිසම්මත නම් සොළොස් සක්විති රජකෙනෙක්වූහ.-1725

### 116 චිතකපූජක ථෙරාපදානය.

1726-1727 "මම ඇමතියන් සහිතවූයේ පිරිවර ජනයා සමග භාග්‍යවතුන් වහන්සේ පිරිනිවිකල්හි පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ ඒ සිඛී බුදුරජාණන් වහන්සේගේ චිතකය වෙත ගියෙමි. එහි තූර්යවාදනය කරවා සුවඳ මල් ඉස්සෙමි.

1728. "මම සෑයෙහි පූජාවකොට චිතකයද වැඳ පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ ස්වකීය භවනයට එළඹියෙමි.

1729. "භවනයෙහි හුන්නාවූ මම චිතක පූජාව සිහිකෙළෙමි. ද්වීපදොත්තමයන් වහන්ස, ලොකජ්‍යෙෂ්ඨයන් වහන්ස නරශ්‍රෙෂ්ඨයන්වහන්ස, එම කර්මය කරණකොට ගෙණ

1730. "දිව්‍ය මනුෂ්‍ය දෙගතියෙහි සම්පත් අනුභවකොට ජය පරාජය දෙක හැර නිශ්චල ස්ථානයට (නිවණට) පැමිණියේ වෙමි.

1731. "මින් එක්තිස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. චිතක පූජාවෙහි මේ විපාකයයි.

1732. "මින් එක්තිස්වන කපෙහි නමින් උග්ගත නම්වූ මහත්බල ඇති සොළොස් සක්විති රජකෙනෙක්වූහ. 1733

117 බුද්ධසඤ්ඤක ථෙරාපදානය.

1734. "යම් කලෙක් විපස්සී බුදුරජතෙම ආයු සංස්කාරය අත් හළේද (එකල්හි) සයුරු මෙවුල්කොට ඇති (සයුරෙන් වටවූ) පෘථිවිය කම්පාවිය.

1735. "දිගු විසල් විසිතුරු මලින්සැරසූ මාගේ භවනයද තථාගතයන් වහන්සේගේ ආයුසංස්කාරය හරනා කල්හි කම්පනය විය.

1736. "මාගේ භවනය කම්පාවන කල්හි තැතිගැනීමද ඇතිවිය. (කෙසේද යත්) භූතවිකෘතියක්දෝ විශාල ආලොකයක් කුමක් නිසා ඇතිවීදෝ කියායි.

1737. "වෛශ්‍රවණ තෙම මෙහි පැමිණ ප්‍රාණීන්හට බියක් නැත. ශාන්තව එකඟ සිත් ඇත්තෝ වේයයි මහජනයා සන්සිඳ විය. (කෙසේදයත්?)

1738. "යම් බුදු කෙනෙක් උපදනා කල්හි මහා පෘථිවිය කම්පා විය. ඒ බුදුරජතෙම ආශ්චර්යයකි. ධර්මයෝද ආශ්චර්යයහ. අපගේ ශාස්තෘ සම්පත්තියද ආශ්චර්යයකි. කියායි.

1739. "මම බුදුගුණ පවසා කපක් ස්වර්ගයෙහි සතුටුවීමි. සෙසු කල්පයන්හි මා විසින් කුසල් කරන ලදී.

1740. "මින් එක් අනූවන කපෙහි වූ එකල්හි යම් සම්බුද්ධ සංඥාවක් ලැබුයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ සංඥාවෙහි (බුදුරජාණන් වහන්සේගේ ගුණ සිහිකිරීම වශයෙන් සිත්හි ඇදගැනීමෙහි) මේ විපාකයයි.

1741. "(මින් තුදුස්වන කපෙහි මහත් බලඇති නමින් සමිත නම්වූ ප්‍රතාපවත් රජෙක් වීමි. 1742

118 මග්ග සඤ්ඤක ථෙරාපදානය.

1743-1744 "පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ වචනයයෙහි හැසිරෙන ශ්‍රාවකයෝ මහවනයෙහි මංමුළාවූවාහු අන්ධවූවෝ මෙන් ඒ මේ අත හැසිරෙත්.

1744. "පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ ඒ මහ වෙනෙහිවූ මංමුළාවූ ශ්‍රාවකයන්ද සිහිකොට

1745. "භවනයෙන් බැස එම භික්ෂූන් වෙතට පැමිණියෙමි. මම උන්වහන්සේලාට මාර්ගයද කීමි. බොජුන්ද දුනිමි.

1746. "ද්විපදොත්තමන් වහන්ස, ලොකජෙ‍්‍යෂ්ඨයන් වහන්ස, නරශ්‍රෙෂ්ඨයන් වහන්ස, එම පුණ්‍ය කර්මය කරණකොටගෙණ උත්පත්තියෙන් සත්හැවිරිදිවූ මම රහත් බවටද පැමිණියෙමි.

1747. "මින් පන්සියවන කපෙහි සත්රුවනින් යුත් නමින් සචක්ඛු නම්වූ දොළොස් සක්විතිරජකෙනෙක්වූහ 1748

110 පච්චුපට්ඨාන සඤ්ඤක ථෙරාපදානය.

1749. "අත්ථදස්සී බුදුරජුන් පිරිනිවීමට අනතුරුව යසසටපත් මම යක්ෂයෝනියෙහි ඉපදුනිමි. එකල්හි (මම මෙසේ සිතිමි.)

1750. "මාගේ සම්පත් පවත්නා කල්හි යම් හෙයකින් බුදුරජාණන් වහන්සේ පිරිනිවී සේක්ද? එය මට අයහපත් ලැබුමක් විය. අයහපත් උදෑසනක් විය. අයහපත් හිරු උදාවක් විය. කියායි.

1751. "(මෙසේ සිතන්නාවූ) මාගේ අදහස සාගරනම් ශ්‍රාවකයෙක් තෙම දැනගෙන හෙතෙමේ මා (දුකින්) ගොඩගනු කැමැත්තේ මාගේ සමීපයට පැමිණියේය.

1752. "නුවණැත්ත (ඔබ) කීම ශෝක කරහිද බිය නොවනු මැනව. ධර්මයෙහි හැසිරෙන්නා බුදුරජුන් විසින් සියලු දෙනාගේ කුශල බීජ සම්පත්තිය මනාසේ දෙන ලදී.

1753. "යමෙක් ජීවමානවූ ලොකනායක බුදුරජුන් පුදන්නේ නම් (එසේම) පිරිනිවි බුදුරජුන්ගේ අබැටක් පමණවූ ධාතූන් වහන්සේ නමකුදු පුදන්නේය.

1754. "චිත්ත ප්‍රසාදය සමවූ කල්හි පිනද සමානය. මහත් බවට ගියේද වේ. එහෙයින් සෑයක් කොට සර්වඥ ධාතූන් පුදනු මැනව. කියායි.

1755. "සාගර ශ්‍රාවකයන් වහන්සේගේ වචනය අසා මම සර්වඥ (ධාතු නිදන්කොට) සෑයක් කෙළෙමි. (ඒ) බුදුරජුන්ගේ උතුම් සෑය පස්වසක්ම පරිවරණය කෙළෙමි.

1756. "ද්විපදෝත්තමයන් වහන්ස ලොක ජ්‍යෙෂ්ඨයන් වහන්ස, නරශ්‍රෙෂ්ඨයන් වහන්ස, එම පුණ්‍ය කර්මය කරණකොටගෙන සම්පත් අනුභව කොට රහත් බවට පැමිණියෙමි.

1757. "මින් සත්සිය වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති භුරිපඤ්ඤ නම් සිව් සක්විති රජ කෙනෙක් වූහ. 1758

## 120 ජාති පූජක ථෙරාපදානය.

1759. "විපස්සී බුදුරජාණන් වහන්සේ ලොව පහළවූ කල්හි සාගර පර්වත සහිතවූ පෘථිවිය කම්පනය විය.

1760. "නිමිත්ත පාඨකයෝ මෙසේ පැවසූහ. (කෙසේද යත්?) සියළු සත්වයන් අතුරෙන් ශ්‍රෙෂ්ඨවූ සර්වඥතෙම ලොව පහළවන්නේය. ජන සමූහය සසර සයුරින් නගාසිටුවන්නේය."

1761. "මම නිමිත්ත පාඨකයන්ගේ වචනය අසා (උත්පත්තිය නිමිතිකොට පැවැත්වූ) ජාති පූජාව කෙළෙමි. (බුදුරජුනගේ උපත පිළිබඳව පවත්වන ලද) ජාති පූජාව යම්බඳු නම් එබඳු උතුම් පූජාවක් (ලෙව්හි) නැත.

1762. "කුසල් කොට සිත පැහැදවීම එහිදී (එම) ජාති පූජාව කොට කළුරිය කෙළේවෙමි.

1763. "දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යම් යොනියක උපදීමද (සම්පත්තියෙන්) සියළු සත්වයන් ඉක්මවමි. ජාති පූජාවෙහි මේ විපාකයයි.

1764. "මාගේ චිත්ත චාරයට අනුව පවතින්නාවූ කිරිමව්වරු මට උවැටැන් කෙරෙත්. (ඒ ස්ත්‍රීහු) මා කෝප කිරීමට නොහැක්කෝ වෙත්. ජාති පූජාවෙහි මේ විපාකයයි.

1765. "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් පින්කමක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ජාති පූජාවෙහි මේ විපාකයයි.

1766. "මින් තෙවන කපෙහි මහත් බල ඇති ජනාධිපතිවූ සුපාරිචරිය නම්වූ සූතිස් සක්විති රජ කෙනෙක් වූහ. 1767

## 13 සෙරෙය්‍ය වග්ග.

### 121 සෙරෙය්‍යක ථෙරාපදානය.

1768-1769 "වේද හදාරන්නාවූ මන්ත්‍ර දරන්නාවූ වේදත්‍රයෙහි පරතෙරට ගිය (මම) එළිමහන් තන්හි සිටියේ වනයෙහි හැසිරෙන්නාවූ සිංහයෙකු වැනිවූද තැති නොගන්නාවූද ව්‍යාඝ්‍රයෙකු වැනිවූද ත්‍රිමදගලිත මාතංග කුලයෙහිවූ හස්තිරාජයෙකු වැනිවූද මහර්ෂිවූ ලෝකනායක බුදුරජුන් දුටිමි.

1770. "මම කටුකරඬු මල් ගෙන අහසෙහි දැමීමි. බුදුරජුන්ගේ ආනුභාවයෙන් (එම මල්) හැම අතින් පිරිවරත්.

1771. "මහාවීරවූ ලොකනායක සර්වඥයන් වහන්සේ අදිටන් කළසේක. (එම අදිටන් බලසෙන් නරශ්‍රෙෂ්ඨයන් වහන්සේට හාත්පස මල් වියනක්සේ විසිරුනාහ.

1772. "ඉක්බිති නැටි උඩුකුරුවූ ඒ පුෂ්ප කඤ්චුකය (මල් වියන) සතියක් මුළුල්ලෙහි සෙවෙනියක් කොට යලි අතුරුදන් විය.

1773. "විස්මය ජනකවූ ලොමු දැහැගන්වන්නාවූ එම ආශ්චර්ය දැක සුගතවූ ලෝක නායකවූ බුදුරජුන් කෙරෙහි සිත පැහැදවීමි.

1774. "එම චිත්ත ප්‍රසාදය කරණකොටගෙන කුශල මූලයෙන් මෙහෙයන ලද්දේ මම කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියක නොඉපදුනෙමි.

1775. "එක්දහස් පන්සියවන කපෙහි මහත් බල ඇති චිත්කමාල නම් පස්විසි සක්විති රජකෙනෙක් වූහ. 1776

### 122 පුප්ඵථූපිය ථෙරාපදානය.

1777. "හිමවතට නුදුරුතන්හි කුක්කුට නම් පර්වතයක් විය. එම පර්වතය අතුරෙහි මන්ත්‍රයන්හි පරතෙරට ගිය බ්‍රාහ්මණයෙක් විය.

1778. "හැමකල්හි මා පන්දහසක් ශිෂ්‍යයෝ පිරිවරත්. ඔව්හු හැමට පළමු උදෑසන නැගිටින සුළුවූ මන්ත්‍රයන්හි විශාරදයෝද වූහ.

1779. "එම ශිෂ්‍යයෝ මෙසේ කීහ. බුදුරජතෙම ලොව පහළවිය. උන්වහන්සේ අසූවක් ව්‍යාඤ්ජන ඇතිසේක.

දෙතිස්මහා පුරුෂ ලක්ෂණයක් ඇතිසේක. එම ජිනෙන්ද්‍රයන් වහන්සේ හිරු මෙන් බබළනසේක. පින්වතුන් වහන්ස, අපගේ ඒ වචනය දැනගනු මැනව කියායි.

1780. "මන්ත්‍රයන්හි පරතෙරට ගිය බමුණුතෙමේ ශිෂ්‍යයන්ගේ වචනය අසා අසපුවෙන් නික්ම ලොකනායකවූ මහා වීරයන් වහන්සේ යම් දිශාවක වැඩ වෙසෙනසේක් නම් ශිෂ්‍යයන්ගෙන් එම දිශාව විචාරයි (කුමක් පිණිසද යත්?)

1781. "මම එම දිශාවටද අප්‍රති පුද්ගලවූ පස්මරුන් දිනුවාවූ උන්වහන්සේටද නමස්කාර කරන්නෙමියි කියායි. (ඉක්බිති ඔධ වැඩි සිත් ඇත්තේ සොම්නස්වූයේ ඒ තථාගතයන් පිදීමි. (එසේ කොට ශිෂ්‍යනට මෙසේ කීවෙමි.)

1782. "ශිෂ්‍යවරුනි, එව් යන්නෙමු ඒ තථාගතයන් දකින්නෙමු. ශාස්තෲන් වහන්සේගේ සිරිපා වැඳ බුද්ධ ධර්මය අසන්නෙමුය කියායි.

1783. "නික්ම එක් දිනකින් මම රෝගීවීමි. රෝගයෙන් පෙළුනේ විසීම සඳහා ශාලාවකට ගියෙමි.

1784. "සියළු ශිෂ්‍යයින් රැස්කරවා තථාගතයන් කෙබඳුද? පරම බුද්ධිමත් ලොකනාථයන් වහන්සේගේ ගුණ කෙබඳු දැයි ඔවුන්ගෙන් විචාළෙමි.

1785. "මා විසින් විචාරණ ලද ඔව්හු බුදුරජුන් දක්නා ලද අයුරින්ම විස්තර කළාහුය. මාගේ හමුයෙහි ඒ බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ මැනවින් (විස්තර) කොට දැක්වූහ.

1786. "මම ඔවුන්ගේ එම වචනය අසා සිත පැහැදවීමි. මම එහි මල්වලින් සෑයක් කොට කළුරිය කෙළේවෙමි.

1787. "ඔව්හු මාගේ සිරුර දවා බුදුරජුන් සමීපයට ගියාහුය. ඇඳිලි බැඳ ශාස්තෲන් වහන්සේට අභිවාදනය කළාහුය.

1788. "මම සුගතවූ මහර්ෂිවූ බුදුරජාණන් වහන්සේට මල්වලින් සෑයක් කොට කල්ප ලක්ෂයක් මුලුල්ලෙහි දුගතියක නොඉඳුනෙමි.

1789. "සතළිස් දහස්වන කපෙහි නමින් අග්ගි සමනම් මහත් බල ඇති සොළොස් සක්විති රජ කෙනෙක් වූහ.

1790. "විසිදහස්වන කපෙහි සතාසන නම්වූ පෘථිවීශ්වර අටතිස් සක්විති රජ කෙනෙක් වූහ.- 1791

123 පායාසදායක ථෙරාපදානය.

1792-1793 "මහ ලොහොතලියක කිරිබතක් සාදාගෙන දනක් දෙනු කැමැත්තාවූ මම එම පූජාව දෙතිස් මහ පුරිස් ලකුණින් යුත් ස්වර්ණ වර්ණවූ භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලද අරණින් නික්මුණාවූ (විපස්සී බුදුරජුන්වෙත පැමිණවීමි.

1794. "ලොකජේ‍යෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ භාග්‍යවත් තෙමේ එකල්හි සුදුවතක් වැනිවූ අහසෙහි (මවන ලද) සක්මනට නැගුනේ වේ.

1795. "විෂ්මය ජනකවූ ලොමු දැහැගන්වන එම ආශ්චර්ය දැක එම ලොහොතලිය (පසෙක) තබා විපස්සි බුදුරජුන්හට අභිවාදනය කෙළෙමි.

1796. "දෙවියන් සහිත ලෝකයෙහි ඔබ සර්වඥ දෙව්වෙහිය මහාමුනිවූ බුදුරජාණන් වහන්ස, අනුකම්පා උපදවා මෙය පිළිගනු මැනව (කියායි)

1797. "ලෝකයෙහි ශාස්තෘවූ මහාමුනිවූ ලොකනායකවූ භාග්‍යවත් සර්වඥතෙමෙ මාගේ අදහස දැන (එය) පිළිගත්තේය.

1798. "මින් එකානූවන කපෙහිවූ එකල්හි මම යම්දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. කිරිබත් දනෙහි මේ විපාකයයි.

1799. "මින් එක්සාළිස් වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති (බුද්ධ) නම් සක්විති රජෙක් විය. 1800

124 ගන්ධොදකිය ථෙරපදානය.

1801. "පුෂ්ප ඵල පල්ලවයන්ගෙන් බබළන කුඹුක් ගසක් වැනි මොහඳුරු දුරුකරන්නාවූ පස්මරුන් දිනූ විපස්සී බුදුරජාණන් වහන්සේ උතුම් පහයෙහි හිඳ දුටිමි.

1802. "පහයට නුදුරෙහි බුදුරජාණන් වහන්සේ වැඩම වන කල්හි සූර්යයාගේ (ප්‍රභාව) මෙන් උන්වහන්සේගේ ප්‍රභාව විහිදෙයි.

1803. "සුවඳ පැන්ද ගෙන බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට ඉස්සෙමි. මම එම චිත්ත ප්‍රසාදයෙන් යුතුව කළුරිය කෙළෙමි.

1804. "මින් එක් අනූවන කපෙහි යම් සුවඳ පැනක් ඉස්සෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

1805. "මින් එක්තිස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සුගන්ධ නම් සක්විති රජෙක් විය. 1806

125 සම්මුඛාත්වික ථෙරාපදානය.

1807. "මම විපස්සී බුදුරජුන් ලොවපහළවන කල්හි (ඇතිවූ) නිමිති (බලා) මෙසේ පැවසීමි. (කෙසේදයත්) ජන සමූහයා (කෙලෙස් ගින්නෙන්) නිවමින් බුදුරජතෙම ලොව පහළ වන්නේය.

1808. "යම් උතුමෙක උපදින කල්හි දශ දහසක් ලෝදා කම්පාවේද (ii) දැන් ශාස්තෘවූ පසැස් ඇති භාග්‍යවත්තෙමේ දහම් දෙසයි.

1809. "යම් උතුමෙකු උපදින කල්හි මහත් ආලොකය වීද (මෙහි 1808 (ii) යොදන්න)

1810. "යම් උතුමෙක උපදින කල්හි ගංගාවෝ නොගැලුවාහුද (මෙහි 1808 (ii)

1811. "යම් උතුමෙක උපදින කල්හි අවීචියෙහි ගිනි නොඇවිලනේද (මෙහි 1808 (ii)

1812. "යම් උතුමෙකු උපදින කල්හි පක්ෂි සමූහයා (ඒ මේ අත) නොහැසිරුනේද (මෙහි 1808 (ii)

1813. "යම් උතුමෙකු උපදින කල්හි වාතස්කන්ධය නොහමාද (මෙහි 1808 (ii)

1814. "යම් උතුමෙකු උපදින කල්හි සියලු රත්නයෝ බැබලුනාහුද (මෙහි 1801 (ii)

1815. "උපන් කෙණෙහිවූ සර්වඥ තෙමේ සියලු දිගුන් බැලීය. අභීත වචන පැවසීය. මෝ බුදුවරයන්ගේ ධර්මතායි.

1816. "යම් උතුමෙකු උපදින කල්හි සප්තපද වික්‍රමයෝ වූවාහුද (මෙහි (1809 (ii)

1817. "(මෙසේ ජනතාව සංවේගයට පමුණුවා ලෝක නායකයන් වහන්සේට ස්තුතිකොට සර්වඥයන් වහන්සේට වැඳ නැගෙණහිරට මුහුණලා ගියෙමි.

1818. "මින් එක්අනූවන කපෙහි යම් බුද්ධ ස්තුතියක් කෙළෙම්ද (ඒ හේවෙන්) දුගතියක් නොදනිමි බුද්ධ ස්තුතියෙහි මේ විපාකයයි.

1819. "මින් අනූවන කපෙහි (ii) සත්රුවනින් යුත් මහත් බල ඇති (iii) සම්මුඛ එවික (iv) නම් සක්විති රජෙක් විය.

1820-1829. "ඡෙද අගට "සක්විති රජෙක් විය" යෙදිය යුතුයි.

1820. "මින් එකුන් අනුවන කපෙහි (මෙහි 1819 (ii) පඨවිදුන්දුභි නම්.

1821. "මින් අටාසූවන කපෙහි (මෙහි 1819 (ii) ඔභාස නම්.

1822. "මින් සතාසූවන කපෙහි (මෙහි 1819 (ii) සරිතච්ඡෙද නම්.

1823. "මින් සාසූවන කපෙහි (මෙහි 1819 (ii) අග්ගි නිබ්බාපණ නම්

1824. "මින් පස්අසූවන කපෙහි (මෙහි 1819 (ii) ගතිපච්ඡෙදන නම්.

1825. "මින් සූ අසූවන කපෙහි (මෙහි 1819 (ii) වාත්‍යම නම්

1826. "මින් තෙයාසූ වන කපෙහි (මෙහි 1819 (ii) රතන පජ්ජල නම්

1827. "මින් දෙයාසූ වන කපෙහි (මෙහි 1819 (ii) පදවික්කමන නම්

1828. "මින් එක්අසූවන කපෙහි (මෙහි 1819 (ii) විලොකන නම්

1829. "අසූවන කපෙහි (මෙහි 1819 (ii) නමින් ගිරිසාර නම් 1830

### 126 කුසුමාසනිය ථෙරාපදානය.

1831-1832 "මම එකල්හි නිඝණ්ඩු ශාස්ත්‍රය හා (කවිනවහිතවූ) කෙටුභය යන මේවා සහිත ලක්ෂණ ශාස්ත්‍රයෙහි ඉතිහාසයෙහිද දක්ෂවූ බමුණෙක් වීමි. වේදත්‍රයෙහි පරතෙරට ගියේ ශිෂ්‍යයනට මන්ත්‍ර කියවීමි.

1833. "එක තැනකට පමුණුවා මම ඔවුනට පුදනු කැමැත්තේ වීමි. (ඒ සඳහා) මා විසින් උපුල් මිටි සතක් පුටුවක තබන ලදී.

1834. "එකල්හි නරශ්‍රෙෂ්ඨවූ විපස්සී බුදුරජතෙම භික්ෂු සංඝයා විසින් පිරිවරණලදුයේ සියලු දිගුන් බබුළුවමින් වඩියි.

1835. "අසුනක් පණවා ඒ මල් අතුරා බුදුරජුන් පවරා සිය ගෙදොරට වැඩම වීමි.

1836. "ස්වකීය ගෘහයෙහි මා විසින් පිළියෙල කරන ලද යම් ආහාරයක් ඇද්ද පහන් සිතැත්තේ එය මම සියතින්ම බුදුරජුන්හට දුනිමි.

1837. "මම වළඳා අවසන්වූ උන්වහන්සේට සුදුසු කළායි දැන මල්මිටක්ද දුනිමි. සර්වඥ තෙම අනුමෝදනා කොට උත්තරාභිමුඛව වැඩියේය.

1838. "මින් සත් අනූවන කපෙහිවූ එකල්හි යම් පුෂ්ප දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුෂ්පදානයෙහි මේ විපාකයයි.

1839. "මින් අනතුරු කපෙහි (අනූවන) සත්රුවනින් යුත් මහත් බලඇති වරදස්සන නම් සක්විති රජෙක්විය. 1840

127 ඵලදායක ථෙරාපදානය.

1841. "වේදහදාරන්නාවූ මන්ත්‍ර ධරවූ වේදත්‍රයෙහි පරතෙරට ගිය මම හිමවතට නුදුරෙහි අසපුවක වසමි.

1842. "මාගේ අග්නි පූජාවක් ඇත. මා විසින් පියුම් ගෙඩි මුළක් බැඳ ගසක් මුදුනෙහි එල්ලන ලදී.

1843. "ලෝකයාගේ පූජාවන් පිළිගන්නාවූ නොහොත් පූජාවනට ගෙයක් බඳුවූ ඒ පදුමුත්තර බුදුරජතෙම (මා සසරින් ගොඩනගනු කැමැත්තේ පිඬු පිණිස හැසිරෙමින් මා වෙත එළඹියේය.

1844-1845 "මම පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ බුදුරජුන්හට එම ඵල දුනිමි. මාගේ ප්‍රීතිය ඇති කරන්නාවූ මෙලොවම සුව ඵල වන්නාවූ ස්වර්ණ වර්ණවූ ලෝවැස්සාගේ පූජාවනු පිළිගන්නාවූ නොහොත් පූජාවනට ගෙයක් බඳුවූ ශාස්තෘතෙමේ අහසෙහි වැඩසිටියේ මෙම ගාථාව වදාළේය.

1846. "මෙම ඵල දානය කරණකොටගෙනද චිත්ත ප්‍රණිධින් කරණකොටගෙනද කල්ප ලක්ෂයක් මුළුල්លෙහි දුගතියක නූපදී" කියායි.

1847. "එම කුශල මූලය කරනකොටගෙන සම්පත් අනුභවකොට ජය-පරාජය හැර අචලස්ථානය (නිවණට) පැමිණියේ වෙමි.

1848. "මින් එක්සිය වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සුමංගල නම් සක්විති රජෙක් වීමි. 1849

128 ඤාණ සඤ්ඤක ථෙරාපදානය.

1850. "හිමවත් පව්වෙහි කඳු අතරක වෙසෙමි. ශොභනවූ වැලිතලාවක් දැක බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහිකළෙමි.

1851. "නුවණෙහි (සැසඳීමට) උපමාවක් නැත. ශාස්තෘන් වහන්සේට සංග්‍රාමයකුදු නැත. සියලු ධර්මයන් නුවණින් දැන (දුකින්) මිදේ.

1852. "පුරුෂශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාරවේවා පුරුෂොත්තමයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාරවේවා උතුම් නුවණ යම්තාක්ද (එතෙක්වූ) ඔබවහන්සේගේ නුවණ හා සම කෙනෙක් නැත.

1853. "බුද්ධඤාණයෙහි (සිත) පහදවා කපක්මුළුල්ලෙහි මම ස්වර්ගයෙහි සතුටුවීමි. සෙසු කල්පයන්හි මා විසින් කුශල් කරනලදී.

1854. "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් ඤාණ සංඥාවක් ලැබුයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ ඥාන සංඥාවෙහි මේ ප්‍රතිඵලයයි.

1855. "මින් තෙසැත්තෑවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති පලිත පුෂ්පීය නම් සක්විති රජෙක්විය.- 1856

129 ගණ්ඨිපුප්පිය ථෙරාපදානය.

1857. "දක්ෂිණාර්හවූ ස්වර්ණ වර්ණවූ විපස්සී බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයන් විසින් පිරිවරණලදුයේ ආරාමයෙන් නික්මුණුසේක.

1858. "මම මොහඳුරු දුරුකරන්නාවූ සර්වඥවූ බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ දැක පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ ලද පස් මල් පිදීමි.

1859. "ද්විපදොත්තමවූ තාදීගුණ ඇති බුදුරජුන්හට (ඇතිකරගත්) ඒ චිත්තප්‍රසාදය කරණකොටගෙන සතුටු වූයේ සතුටු සිතින් නැවත තථාගතයන් වැන්දෙමි.

1860. "මින් එක් අනූවන කපෙහි යම් මල් පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

1861. "මින් එක්සාළිස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති චරණ නම් සක්විති රජෙක් විය.-1862

130 පදුම පූජක ථෙරාපදානය.

1863. "හිමවතට නුදුරු නා නා වෘක්ෂයන්ගෙන් ගැවසී ගත් මහා භූත සමූහයාට වාසස්ථානවූ ගොතම නම් පර්වතයක් විය.

1864. "ඒ මධ්‍යයෙහි නිර්මිත කරනලද ආශ්‍රමයක් විය. මම ස්වකීය ශිෂ්‍යයන් විසින් පිරිවරණලදුයේ අසපුවෙහි වෙසෙමි.

1865. "මාගේ ශිෂ්‍ය සමූහයෝ පැමිණෙත්වා මට පියුම් ගෙන එත්වා. ද්විපදොත්තමවූ තාදීගුණ ඇති බුදුරජාණන් වහන්සේට පූජාකරන්නෙමු.

1866. "ඔව්හු 'එසේ' යයි මට පිළිවදන් දී පියුම් ගෙනාවාහුය. එසේම මම (බුදුරජාණන් වහන්සේ) නිමිතිකොට ඒ සර්වඥයන් වහන්සේට පිදීමි.

1867. "එකල්හි ශිෂ්‍යයන් රැස්කරවා මම මනාකොට අනුශාසනා කෙළෙමි (කෙසේදයත්) 'තෙපි පමානොවෙව්. අප්‍රමාදව සුව එලවන්නේ වෙයි." (යනුවෙනි)

1868. "වනක්ෂමවූ එම ශිෂ්‍යයනට මෙසේ අනුශාසනා කොට එකල්හි මම අප්‍රමාදී ගුණයෙහි යෙදුනේ කළුරිය කළේ වෙමි.

1869. "මින් එක් අනූවනු කපෙහි යම් මල් පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) අගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

1870. "එක් පණස්වන කපෙපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති ජලුත්තම, නම්, සක්විති රජකෙනෙක්වීමි.

## 14 සොභිත වග්ග.

### 131. සොභිත ථෙරාපදානය.

1871. "ලෝක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ මහත්වූ ජනසමූහයාට අමෘතපදය (නිර්වාණය) දේශනා කරනසේක.

1872. "මම උන්වහන්සේ විසින් වදාරණලද උතුම් වචන අසා එකල්හි ඇඳිලිබැඳගෙන එකග සිත් ඇත්තේවීමි. (බුදු නුවණද මෙසේ පැසසීමි. කෙසේදයත්)

1873. "යම්සේ මහසයුර ජලාශයනට අග්‍රවේද සිනෙරු පර්වතය පර්වතයනට අග්‍රවේද, එසේම යමෙක් චිත්ත (ඥාණ) වශයෙන් පවතිත් නම් ඔව්හු බුදු නුවණින් කලාවකටද නොපැමිණෙත්. (හැම නුවණට වඩා බුදු නුවණ අග්‍රය. (කියායි)

(එකල්හි) කාරුණික සෘෂීවූ බුදුරජාණන් වහන්සේ ධර්මයෙහි ක්‍රමය (දහම් දෙසුම) තබා භික්ෂු සංඝයා මැද වැඩහිඳ මෙම ගාථාවන් වදාළසේක.

1874. "ලෝකනායක බුදුරජුන් කෙරෙහිවූ නුවණ යමෙක් (ප්‍රශංසා මුඛයෙන්) පැවසීද (ඒ හේතුවෙන්) හෙතෙම කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියකට නොයන්නේය.

1875. "එකඟව සන්සුන්ව කෙලෙස් දවා නමින් සෝභිත නම් වූ ශ්‍රාවකයෙක් වන්නේය (කියායි)

1876. "මා විසින් කෙලෙස් දවනලදී. සියලු භවයෝ වනසන ලදහ. පමුණුවනලද ත්‍රිවිද්‍යාවෝ ඇත්තාහ. (මේ අයුරින්) බුදුසසුන කරනලදී.

1877. "මින් පණස් දහස්වන කපෙහි සත්රුවනින් යුත් මහත්බල ඇති යසුග්ගත නම් සත් සක්විති රජ කෙනෙක් වූහ.- 1878

132 සුදස්සන ථෙරාපදානය.

1879. "චින්තා නදීතීරයෙහි පුලිල ගසක් පලගත්තේ විය. මම එම ගස සොයන්නේ ලෝකනායකවූ බුදුරජාණන් වහන්සේ දුටිමි.

1880. "එකල්හි මම පිපුණු වැටකේ ගසක් දැක (එම මල්) නටුවෙන් කඩා ලොකබන්ධුවූ සිඛී බුදුරජාණන් වහන්සේට පිදීමි. (කෙසේදයත්)

1881. "මහා මුනීන් වහන්ස, බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්ස, (ඔබ) අච්‍යුත නම්වූ අමෘතපද නම් නිවණට යම් නුවණක් කරණකොටගෙන පැමිණියේවෙහිද එම නුවණට පුදමි" (කියායි)

1882. "මම බුදුරජාණන් වහන්සේගේ සර්වඥතාඥානයට පුදා (ඉක්බිති) පළොල්ගස දුටිමි. (ඒ පූජා හේතුවෙන්) එම ප්‍රඥාව ලැබූයේ වෙමි. ඤාණ පූජාවෙහි මේ විපාකයයි.

1884. "මින් එක්තිස්වන කපෙහි යම් මලක් පිදුයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඤාණ පූජාවෙහි මේ විපාකයයි.

1884. "මින් තෙළෙස්වන කපෙහි සත්රුවණින් යුත් මහත් බල ඇති පලුග්ගත නම් දොළොස් සක්විති රජ කෙනෙක් විය.- 1885

133 චන්දපූජක ථේරාපදානය.

1886. "එකල්හි මම චන්ද්‍රභාගා නදීතීරයෙහි කිඳුරෙක් වීමි. මම මල් අනුභව කරන්නේද එසේම මල් හැඳින්නේද වෙමි.

1887. "නරශ්‍රෙෂ්ඨවූ ලොකජ්‍යෙෂ්ඨවූ අත්ථදස්සී භාග්‍යවතුන් වහන්සේද අහසෙහි හංසරාජයෙකු මෙන් වනය කෙළවරින් නික්මුණු සේක. (එය දුටු මම මෙසේ කීමි.)

1888. "පුරුෂ ශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාරවේවා ඔබ ප්‍රසන්නවූ මුඛය හා නෙත් ඇත්තේ වෙහිය. අතිශයින් පසන්වූ මුහුණ හා ඉන්ද්‍රියයන් ඇත්තේ වෙහිය.

1889. "(ඉක්බිති) මනා නුවණැති මහාප්‍රඥාවත් සර්වඥ තෙම අහසින් බැස සඟල සිවුර අතුරා පර්යංකයෙන් (එරමිණිය ගොතාගෙන) වැඩහුන්නේය.

1890. "දියවගිය සඳුන් ගෙන බුදුරජුන් වෙත ගියෙමි. පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ සර්වඥයන් වහන්සේට පිදීමි.

1891. "ලෝකජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ බුදුරජාණන් වහන්සේට අභිවාදනයකොට සතුට උපදවා උත්තරදිශාභිමුඛව ගියෙමි.

1892. "එක්දහස් අටසියවන කපෙහි යම් සඳුන් පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

1893. "මින් එක්දහස් හාරසියවන කපෙහි නමින් රොහිත නම්වූ මහත් බල ඇති ඒ සක්විති රජවරු තිදෙනෙක් වූහ.- 1894

පළමුවෙනි බණවරයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

### 134 පුප්ඵඡදනිය ථෙරාපදානය.

1895. "මන්ත්‍රයන්හි පරතෙරට ගිය වේද හදාරන්නාවූ යාග කිරීමෙහි යෙදුන නමින් සුනන්ද නම් බමුණු තෙමේ මහායාගයක් කෙළේය.

1896. "අග්‍ර කාරුණිකවූ ඍෂිවූ පදුමුත්තර සර්වඥතෙම ජනසමූහයාට අනුකම්පාකරන්නේ එකල්හි අහසෙහි සක්මන් කළසේක.

1897. "උපධිවිරහිත ලොකනායකවූ සර්වඥ බුදුරජතෙම (අහසෙහි) සක්මන්කොට අප්‍රමාණ සත්වයා කෙරෙහි මෛත්‍රිය පැතිරවිය.

1898. "මන්ත්‍රයන්හි පරතෙරට ගිය එම බමුණුතෙම මල් නටුවෙන් කඩා සියළු ශිෂ්‍යයන් රැස්කරවා අහසෙහි දැමවීය.

1899. "එකල්හි නගරය යම්තාක් වීනම් ඒතාක් මල් වියනක් මෙන් (අහසෙහි) විය. (එය) බුද්ධානුභාවයෙන් සතියක් මුළුල්ලෙහි (ඉවත්ව) නොගියේය.

1900. "එම කුශල මූලය කරණකොටගෙන සම්පත් අනුභව කොට සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන ලෝකයෙහි විසත්තිකා නම්වූ තෘෂ්ණාව තරණය කරනලදී.

1901. "එක්දහස් එක්වන කපෙහි මහත් බල ඇති 'අම්බරංස' නම්වූ ඒ පස් සක්විති රජකෙනෙක් වූහ.

### 135 රහොසඤ්ඤක ථෙරාපදානය.

1902 "හිමවතට නුදුරු වසභ නම් පර්වතයක් විය. එම පර්වත පාදයෙහි අසපුවක් මවන ලදුයේ විය.

1903. "එකල්හි තුන් දහසක් බමුණු සිසුනට ඉගැන්වීමි. ඒ සිසුන් රැස්කරවා (තෙමේ) විවේක ස්ථානයක හුන්නේය.

1904. "මන්ත්‍රයන්හි පරතෙරට ගිය එම බමුණුතෙමේ එකත්පසෙක හිඳ බුද්ධ ධර්මය සොයන්නේ (මෙනෙහි කරන්නේ) බුද්ධ ඥානයෙහි සිත පැහැදවිය.

1905. "ඒ මම එහි සිත පහදවාගෙන පන් ඇතිරියක හුනිමි. එහි පළක් බැඳගනම කළුරිය කෙළේද වෙමි.

1906. "මින් එක්තිස් වන කපෙහිවූ එකල්හි යම් බුද්ධ ඥානය පිළිබඳ සංඥාවක් ලැබූයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඥාන සංඥාවෙහි මේ විපාකයයි.

1907. "සත්විසි වෙනි කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සිරිධර නම් සක්විති රජෙක් විය. 1908

136 චම්පක පුප්ඵිය ථෙරාපදානය.

1909. "(සුපිපි) කිණිහිරි රුකක් මෙන් කඳු අතරෙහි හුන්නාවූ ඔසධී තාරකාවක් මෙන් සියලු දිගුන් ආලොකවත් කරන (බුදුරජුන් දිටිමි)

1910. "ස්වකීය (බ්‍රාහ්මණ ධර්ම) යෙහි මැනවින් හික්මුණු මානවකයෝ තිදෙනෙක් වූහ. (ඔව්හු) පිරිකර බර ගෙන මා පසුපසින් එත්.

1911. "තවුසෙකු විසින් ගොටුවක තබනලද මල් සතක් ගෙන වෙස්සභූ බුදුරජුන්ගේ සර්වඥතාඥානයට පිදීමි.

1912. "මින් එක්තිස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඥාණ පූජාවෙහි මේ විපාකයයි.

1913. "එකුන්තිස් වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති විපුලාභ නම් සක්විති රජෙක් විය. 1914.

137 අත්ථ සන්දස්සක ථෙරාපදානය.

1915. "විශාල ලෙස පිපී පැතිරීගිය මල් ඇති වෙනෙහි හුන්නේ ලොකනායකවූ ක්ෂීණාශ්‍රවවූ බල ප්‍රාප්තවූ භික්ෂු සංඝයා විසින් පිරිවරණලද බුදුරජාණන් වහන්සේ දිටිමි.

1916. "ත්‍රිවිද්‍යාවෙන් යුත් ෂඩභිඥා ඇති මහා ඍද්ධිමත්වූ සියක් දහසක් රහත්හු සර්වඥයන් වහන්සේ පිරිවරත්. (එය) දැක කවරෙක් නොපහදීද?

1917. "ඒ බුදුරජාණන් වහන්සේගේ වනෙහි (දැක්වීමට) උපමාවක් දෙවියන් සහිත ලොකයෙහි නොමැත. අනන්තවූ ඥාණයක් ඇති සර්වඥයන් වහන්සේට කවරෙක් නොපහදීද?

1918. "හුදු රත්නාකරයක් වැනිවූ දීප්තිවූ ධර්ම කායයද, විකොපනය කරන්ට නොහැකිය. එබඳු උන්වහන්සේ කවරෙක් දැක නොපහදීද?

1919. "නාරද සරගච්ජිත තෙමේ මෙම තුන් ශයින් පස්මරුන් දිනූ පදුමුත්තර බුදුරජුන්හට ස්තුති කොට,

**1920.** "එම චිත්තප්‍රසාදය කරණකොට ගෙනද බුදුරජාණන්වහන්සේට ස්තුති කිරීම් කරණකොටගෙනද කල්ප ලක්ෂයක් මුළුල්ලේ දුගතියක නොඉපදුනේය.

**1921.** "මින් තුන්දහස් තුන්සිය වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සුමිත්ත නම් සක්විති රජෙක් විය. 1922

**138 එකපසාදනිය ථෙරාපදානය.**

1925. "නාරද යනු මාගේ (කුලයෙන්ආ) නාමයයි. කෙසව යන (ගොත්‍ර නාමයෙනුදු) මා දැනගනිත්. කුසල් අකුසල් මොනවාදැයි සොයමින් බුදුරජුන් සමීපයට පැමිණුනෙමි.

**1924.** "මෛත්‍රී චිත්තයෙන් යුත් කාරුණිකවූ පසැස් ඇති මහාමුනිවූ ඒ අත්ථදස්සී සර්වඥතෙම සත්වයන් අස්වසමින් දහම් දෙසයි.

**1925.** "සිය සිත පහදවා මුදුනෙහි ඇඳිලි බැඳ ශාස්තෲන් වහන්සේට අභිවාදනයකොට නැගෙනහිර දෙසට ගියෙමි.

**1926.** "සතළොස්වන කපෙහි මහත් බල ඇති මිහිපතිවූ අමිත්ත තාපන නම් සක්විති රජෙක් විය. 1927

**139 සාලපුප්ඵදායක ථෙරාපදානය.**

**1928.** "එකල්හි විශිෂ්ට ජන්ම ඇති මනා කෙසුරු ඇති සිංහ රජෙක් වීමි. ගිරි දුර්ගයක් සොයන්නේ බුදුරජාණන් වහන්සේ දුටිමි. (දැක මෙසේ සිතීමි)

**1929.** "මේ මහා වීරතෙම මහජනයා (කෙලෙස් ගින්නෙන්) නිවාදෝ මම දෙවාති දේවවූ නරශ්‍රෙෂ්ඨයන් වෙත එළඹෙන්නේ නම් ඉතා "යෙහෙකැයි කියායි.

**1930.** "සල් අත්තක් බිඳ (සල්) මලක් තමා වෙතට ගෙන ආමි. සම්බුදුන් වහන්සේ වෙත එළඹී එම උතුම් පුෂ්පය පිදීමි.

**1931.** "මින් එක් අනූවන කපෙහි යම් මල් පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුෂ්ප දානයාගේ මේ විපාකයි.

**1932.** "මින් නවවන කපෙහි මහත් බල ඇති විරොචන නම්වූ තුන් සක්විති රජ කෙනෙක් වූහ. 1933

**140 පියාල ඵලදායක ථෙරාපදානය.**

**1934.** "එකල්හි (මම) අනුන්ගේ ජීවිතයනට අවහිර කරන වැද්දෙක් වීමි. සිඛී බුදුරජාණන් වහන්සේට නුදුරෙහි ගිරි ගුහාවක සයනය කරමි.

1935. "ලොකයෙහි අසහාය නායකවූ බුදුරජුන් සවස හා උදෑසනද දකිමි. ද්විපදොත්තමවූ තාදී ගුණ ඇති උන්වහන්සේට දෙයාා ධර්මයකුදු (දියයුතු දෙයක්) මට නැත.

1936. "පියල් ගෙඩියක් ගෙන (මම) බුදුරජුන් වෙතට ගියෙමි. ඉක්බිති (එය) පිළිගැනීම සඳහා බුදුරජුන් හට ආරාධනා කෙළෙමි.

1937. "ලොක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ භාග්‍යවත්තෙමේ එය පිළිගත්තේය. මම එම චිත්ත ප්‍රසාදයෙන් යුතුව එහිම කළුරිය කෙළේ (වෙමි.)

1938. "මින් එක්තිස් වන කපෙහිවූ එකල්හි යම් පල දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පල දානයාගේ මේ විපාකයයි.

1939. "මින් පසළොස් වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති පියාලී නම් තුන් සක්විති රජ කෙනෙක් වූහ. 1940

## 15 ඡත්ත වග්ග.

### 141 අධිඡත්තිය ථෙරාපදානය.

1941. "භාග්‍යවත්වූ අත්ථදස්සී බුදුරජාණන් පිරිනිවි කල්හි (උන්වහන්සේගේ) ධාතු චෛත්‍යයෙහි ඡත්‍රය මතුයෙහි ඡත්‍රයක් කරවා පිදීමි.

1942. "කලින් කල අවුත් සාස්තෘන් වහන්සේගේ චෛත්‍යයට නමස්කාර කෙළෙමි. මල් වියනක්ද කොට ඡත්‍රයෙහි (මත) නගා තැබීමි.

1943. "(ඒ හේතුවෙන්) එක්දහස් එක්සිය වන කපෙහි දිව්‍ය රාජ්‍යය කරවීමි. මිනිසත් බවට නොයමි. ස්තූප පූජාවෙහි මේ විපාකයයි. 1944

### 142 ථම්භාරොපක ථෙරාපදානය.

1945. "ධම්මදස්සී බුදුරජුන් පිරිනිවි කල්හි (එම) බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ චෛත්‍යයෙහි ධජස්තම්භයක් (කොඩියක්) නැංවීමි.

1945. "ඉණිමගක් සාදවා උතුම් සෑයට නැගුනෙමි. දෑසමන් මල් ගෙන සෑයට පිදීමි.

1947. "සර්වඥ තෙම ආශ්චර්යයකි. ධර්මය ආශ්චර්යයකි. අපගේ ශාස්තෘ සම්පත්තියද ආශ්චර්යයකි. (එකී පුණ්‍ය හේතුවෙන්) දුගතියක් නොදනිමි. ථූපපූජාවෙහි මේ විපාකයි.

**1948.** "මින් සිව් අනූවන කපෙහි මහත් බල ඇති ථූප සිඛර නම්වූ සොළොස් සක්විති රජ කෙනෙක් වූහ.-1949

**143 වේදිකාරක ථෙරාපදානය.**

**1950.** "ලොකනායකවූ පියදස්සි බුදු රජුන් පිරිනිවි කල්හි මම පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ මුතු වේදිකාවක් කෙළෙමි.

**1951.** "මැණික්වලින් පිරිවරකොට උතුම් වේදිකාව කෙළෙමි මම එම වේදිකාව පිදීමේ උත්සවය කොට එහි කළුරිය කෙළෙමි.

**1952.** "(ඒ හේතුවෙන්) දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යෝනියක, උපදිම්ද අහසෙහි මිණිදරත්. පුණ්‍ය කර්මයාගේ මේ විපාකයයි.

**1953.** "මින් එක්දහස් හසිය වන කපෙහි මහත් බල ඇති මනිප්පභාසනම් දෙතිස් සක්විති රජකෙනෙක් වූහ. 1954

**144 සපරි වාරිය ථෙරාපදානය.**

1955. "පස්මරුන් දිනූ ලොක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ පදුමුත්තර බුදුරජතෙම ගිනි කඳක් මෙන් දිලිසී පිරිනිවන් පානා ලදුයේ විය.

**1956.** "මහා වීරවූ බුදුරජාණන් වහන්සේ පිරිනිවි කල්හි (උන්වහන්සේගේ ධාතු නිධන් කළ) මහත් සෑයක් විය. අතිඋතුම් ධාතු ගෘහයෙහි දිවරැ දෙක්හි උවටැන් කෙරෙත්.

**1957.** "පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ (එහි) සඳුන් වේදිකාවක් (චෛතිය සරයක්) කෙළෙමි. එකල්හි (එය) සෑයට සුදුසුවූයේ දුම්කදක් මෙන් පෙනේ.

**1958.** "දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ භවයෙහි උපදනා කල්හි මාගේ පහත් බවක් නොදකිමි. පූර්ව කර්මයාගේ මේ විපාකයයි.

**1959.** "මින් එක්දහස් පන්සිය වන කපෙහි මහත් බල ඇති සමත්ත නම්වූ ඒ සියලු සක්විති රජවරු අටදෙනෙක් වූහ.-1960

**145 උම්මා පුප්ඵිය ථෙරාපදානය.**

**1961.** "ලොවාසීන්ගේ පූජාවන් පිළිගත්තාවූ නොහොත් පූජාවනට ගෙයක් වැනිවූ ලොකනාථවූ සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවී කල්හි මහා සෑ පූජාවක් විය.

**1962.** "සිදුහත් බුදුරජුන්ගේ පූජාව පවත්නාකල්හි දියබෙරලිය මල්ගෙන සෑයට පිදීමි.

**1963.** "මින් සිව් අනූවන කපෙහි යම් මල් පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ස්තූප පූජාවෙහි මේ විපාකයයි.

**1964.** "මින් නවවන කපෙහි මහත් බල ඇති සෝම දෙව නම්වූ පස් අසූ සක්විති රජකෙනෙක් වූහ.- 1965

**146 අනුලේපදායක ථෙරාපදානය.**

**1966.** "මම අනොමදස්සී බුදුරජාණන් වහන්සේගේ බොධියට (පරිමණ්ඩලවූ) වේදිකාවක් කරවීමි. (එසේම) මම සුණු පිඬුදී පිළිසකරද කෙළෙමි.

**1967.** "ශාස්තෘවූ අනොමදස්සී නරශ්‍රෙෂ්ඨ තෙම මැනවින් කරන ලද එම කර්මය දැක භික්ෂු සංඝයා මැද හිඳ මෙම ගාථාවන් වදාළේය.

**1968.** "මෙම සුණුකම කරණකොටගෙනද චිත්ත ප්‍රණිධිය කරණකොටද සම්පත් අනුභවකොට දුක් කෙළවර කරන්නේය. කියායි.

**1969.** "පහන්වූ මුහුණු පැහැ ඇත්තේවීමි. එකඟවූයේ සන්සුන් වූයේ සම්බුදු සසුනෙහි අන්තිම ශරීර දරමි.

**1970.** "මින් නොඅඩුව කප් සියයක් සම්පූර්ණවූ කල්හි මහත් බල ඇති සබ්බ ඝන නම් සක්විති රජෙක් වීමි.-1971

**147 මග්ගදායක ථෙරාපදානය.**

**1972.** "පසැස් ඇති බුදුරජතෙම ගඟකින් එතෙරව වනයට යයි. මම උතුම් ලකුණු ඇති එම සිද්ධාර්ථ සම්බුදු රජුන් දිටිමි.

**1973.** "උදැල්ල හා කූඩයද ගෙන ඒ මග සමකොට ශාස්තෲන් වහන්සේ වැඳ සිය සිත පැහැදවීමි.

**1974.** "මින් සිව්අනූවන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මාර්ග ඥානයාගේ මේ විපාකයයි.

**1975.** "සත් පණස්වන කපෙහි ජනාධිපතිවූ නමින් සුප්ප බුද්ධ නම්වූ නරශ්‍රෙෂ්ඨ එක් සක්විති රජෙක් වීමි.-1976

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

### 148 ඵලදායක ථෙරාපදානය.

1977. "පෙර වඩු කමෙහි මැනවින් හික්මුණු රිය සදන්නෙකු වීමි. (මම) සඳුන් ලෑලිකොට ලොකබන්ධවූ බුදුරජාණන් වහන්සේට දුනිමි.

1978. "රනින් නිමවන ලද මේ විමන බබළයි. හස්ති යානද අශ්ව යානද දිව්‍යමය යානද එළඹ සිටියේ වෙයි.

1979. "ප්‍රාසාදයෝද සිවිකාවෝ (දෝලාවෝ) යන යමක් කැමැති වේනම් (ඒවා) උපදිත්. මාගේ රුවන් නිශ්චලය (නැති නොවේ) (සඳුන්) පවුරු දීමෙහි මේ විපාකයයි.

1980. "මම මින් එක් අනූවන කපෙහි යම් පුවරු දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුවරු දනෙහි මේ විපාකයයි.

1981. "සත්පණස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති නිම්මිත නම් සිව් සක්විති රජකෙනෙක් වූහ.-1982

### 149 වටං සකිය ථෙරාපදානය.

1983. "සියල්ල තෙමේම දත්තාවූ පස්මරුන් දිනූ නමින් සුමේධ නම්වූ (සර්වඥ තෙම) විවේක සුව වඩනුයේ මහවනයට පිවිසියේය.

1984. "පිපුනු සල්ගසක් දැක හිසේ පළඳින මාලාවක්සේ ගොතා ලෝක නායකයන් වහන්සේ ඉදිරියෙහි (එම බුදුරජාණන් වහන්සේටම) පිදීමි.

1985. "තිස් දහසක් වන කපෙහි යම් මලක් පිදුයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

1986. "එක්දහස් නවසිය වන කපෙහි සත්රුවනින් යුත් මහත්බල ඇති නිම්මිත නම්වූ සොළොස් සක්විතිරජෙක් වූහ.-1987

### 150 පල්ලංකදායක ථෙරාපදානය.

1988. "ලොක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ තාදීගුණ ඇති සුමෙධ භාග්‍යවතුන් වහන්සේට උඩුවියන් (රේන්දය) සහිත ඇතිරිළි සහිත පළඟක් (පුටුවක්) මා විසින් දෙන ලදී.

1989. "එකල්හි එය සත්රුවනින් යුත් පළඟක් විය. මාගේ අදහස දැන (ඒ අනුව) හැමකල්හි මට එබඳු (පර්යංක) උපදියි.

**1990.** "තිස් දහස්වන කපෙහිවූ එකල්හි (යම්) පළඟක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**1991.** "විසි දහස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සුවණ්ණ නාහ නම් තුන්සක්විති රජකෙනෙක් වූහ.-1992

## 16 බන්ධු ජීවක වග්ග.

### 151 බන්ධු ජීවක ථෙරාපදානය.

**1993-1994** "(උපක්ලේශ විරහිත) චන්ද්‍රයා මෙන් නිර්මලවූ (කෙලෙස් කිලිටි නොමැති බැවින්) පිරිසිදුවූ පැහැදුනාවූ (කෙලෙස් මල වලින්) නොකැළඹුනාවූ (නන්දිභව නම්වූ) තෘෂ්ණාව හා භවය (පලවිශේෂයෙන් හාත්පසින්ම) ක්ෂය කරන ලද්දාවූ ත්‍රිවිධ ලෝකයෙහි ඇල්ම නැතිකළ ජනසමූහයා කෙලෙස් ගිනා නිවන්නාවූ සසර සයුරින් එතෙරවූ එසේ එතෙරවූවන් අතුරෙන් උතුම්වූ වනයෙහි ධ්‍යාන කරන්නාවූ ඒ එකලාවූ සන්සුන්වූ (සිඛි බුදුරජුන් දුටිමි.)

**1995.** "මම බඳුවද මල් තූලක එල්වා සිඛී බුදුරජාණන් වහන්සේට පිදීමි.

**1996.** "මින් එක්තිස්වන කපෙහිවූ එකල්හි යම්කර්මයක් කරන ලදද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**1997.** "මින් සත්වන කපෙහි මනුජේන්ද්‍රවූ වැඩිදියුණුවූ යසස ඇති මහා බලවත් සමන්ත චක්ඛු නම් සක්විති රජෙක් වීමි.-1998

### 152 තම්බ පුප්ඵික ථෙරාපදානය.

**1999.** "අනුනට බැලමෙහෙ කිරීමෙහි යෙදුනේ මම අපරාධයක් කෙළෙමි. (ඒ හේතුවෙන්) භයජනක අරමුණු වලින් තැති ගත්තේ වනයට පලාගියෙමි.

**2000.** "පොකුරු බැඳි මනාව නිර්මිතව පිපුණු ගසක් දැක මම (එහි) තඹවන් මල්ගෙන බෝධියට ඉසීමි.

**2001.** "ඒ උතුම් පලොල් බෝ නැමද එම බෝ මුලෙහි පළඟ බැඳ (එරමිනියා ගොතාගෙන) (වාඩිවී) හුනිමි.

**2002.** "(අපරාධකොට) පලාගිය මග සොයා යන්නෝ මාගේ සමීපයට පැමිණියාහුය. මම ඔවුන් දැක උතුම් බොධියම සිහිපත් කෙළෙමි.

**2003.** "මම පිරිසිදු සිතින් බෝධිය වැඳ (නැවත පහව යන්නෝ) බොහෝ තල්රුක් පමණින් ගිනිය යුතුවූ (ගැඹුරු) භයානක ගිරි දුර්ගයෙක්හි වැටුනෙමි.

**2004.** "මින් එක් අනූවන කපෙහි යම් මල් පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බොධි පූජාවෙහි මේ විපාකයයි.

**2005.** "මින් තෙවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සම්ඵුසිත නම් සක්විති රජෙක් වීමි.- 2006

153 **විථිසම්මජ්ජක ථෙරාපදානය.**

**2007.** "උදාවන්නාවූ සූර්යයා මෙන්ද (උදාවූ) අතිශයින් දීප්ති රැස් ඇති හිරු මෙන්ද පුණු රැස් සඳ මෙන්ද නික්මෙන්නාවූ බුදුරජුන් දුටිමි.

**2008.** "අට සැටදහසක්වූ සියල්ලෝ ක්ෂිණාශ්‍රවයෝවූහ. (ඔව්හු) ද්විපදොත්තමවූ නරශ්‍රෙෂ්ඨවූ බුදුරජුන් පිරිවැරූහ.

**2009.** "බුදුරජුන් නික්මෙන කල්හි (මම) එම වීථිය හැමද එහි පිරිසිදු ධජයක් එසවීමි.

**2010.** "මින් එක් අනූවන කපෙහි යම් ධජයක් පිදුයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ධජදානයාගේ මේ විපාකයයි.

**2011.** "මින් සිව්වන කපෙහි සර්වාකාරයෙන් සම්පූර්ණවූ සුධජයයි ප්‍රසිද්ධ රජෙක් වීමි.-2012

154 **කක්කාරු පූජක ථෙරාපදානය.**

**2013** "දිව්‍යපුත්‍රයෙකුවූ මම සිඛී බුදුරජුන් පිදීමි. කැකිරි මලක්ද ගෙන (එම) බුදුරජුන් හට පිදීමි.

**2014.** "මින් එක් තිස්වන කපෙහි යම් මලක් පිදුයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

**2015.** "මින් නවවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සත්තුත්තම නම් සක්විති රජෙක්වීමි.-2016

## 155 මන්දාරව පූජක ථෙරාපදානය.

**2017.** "දිව්‍යපුත්‍රයෙක්වූ මම සිඛී බුදුරජුන් පිදීමි. මදාරා මලින්ද (එම) බුදුරජුන් හට පිදීමි.

**2018.** "සත් දිනක් මුළුල්ලෙහිම තථාගතයන් කෙරෙහි (එය) දිව්‍යමය මල් වියනක් විය. සියලු ජනයෝ එක්ව තථාගතයන් වහන්සේට නමස්කාර කළාහුය.

**2019.** "මින් එක්තිස්වන කපෙහි යම් මල් පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**2020.** "මින් දසවෙනි කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති ජුතින්ධර නම් සක්විති රජෙක් වීමි.-2021

## 156 කදම්බ පුප්ඵිය ථෙරාපදානය

**2022.** "හිමවතට නුදුරෙහි කුක්කුට නම් පර්වතයක් විය. එම පර්වත පාදයෙහි (පසේ) බුදුවරු සත්නමක් වෙසෙත්

**2023.** "උඩට නැංගාවූ සඳු වැනිව (බබළන) පිපුනු කොළොම් ගසක් දැක (මල්) දොහොතින් ගෙන සත් පසේබුදුවරයන් කෙරෙහි පිදීමි.

**2024.** "මින් සිව් අනූවන කපෙහි යම් මල් පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**2025.** "මින් දෙඅනූවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති පුප්ඵ නම්වූ සත් සක්විති රජකෙනෙක්වූහ. 2026

## 157 තිණසූලක ථෙරාපදානය.

**2027.** "හිමවතට නුදුරෙහි භූතගණ නම් පර්වතයක් විය. එහි සියල්ල තෙමේම දැන ගත් ලොව හා නොගැටුණු එක් (සිඛී නම්) සර්වඥවරයෙක් වැඩවෙසෙයි.

**2028.** "බෝලිද්ද මල් ගෙණ (එම) බුදුරජුන්හට පිදීමි. (ඒ හේතුවෙන්) එකුන් සියක් දහස් කපක් මුලුල්ලෙහි දුගතියකට නොගියේ වෙමි.

**2029.** "මින් එකොළොස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති ධරණිරුහ නම් එක් සක්විති රජෙක් වීමි.- 2030

### 158 නාගපුප්ඵිය ථෙරාපදානය.

**2031.** "මන්ත්‍රයන්හි පරතෙරට ගිය නමින් සවච්ඡ නම් වූ බමුණෙක් ස්වකීය ශිෂ්‍යයන් සමග පර්වතාන්තරයෙහි වෙසෙයි.

**2032.** "ලෝකයාගේ පූජාවන් පිළිගන්නාවූ පදුමුත්තර නම් ඒ සර්වඥ තෙමේ මා (සසර සයුරින්) ගොඩනගනු කැමැත්තේ මා සමීපයට පැමිණියේය.

**2033.** "(පැමිණ) සක්මන් කරයි. දුවයි එසේම ඇවිලෙයි. (එසේකොට) මාගේ සතුට දැන ප්‍රාචීන දේශාභිමුඛව වැඩියේය.

**2034.** "විස්මය ජනක ලොමුදැහැගන්වන්නාවූ එම ආශ්චර්ය දැක නාමල් ගෙන,

**2035.** "මින් සියක් දහස්වන කපෙහි මම යම්මල් විසිරවීමක් කෙළෙම්ද එම චිත්ත ප්‍රසාදය කරණකොටගෙන මම දුගතියක නොඉපදුනිමි.

**2036.** "තුන් දහස් සත්සියවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති මහාරථ නම් සක්විති රජෙක්වීමි.- 2037

### 159 පුන්නාගපුප්ඵිය ථෙරාපදානය.

**2038.** "වැද්දෙකුවූ මම මහා වනයට පිවිස වෙසෙමි. පිපුනු දොඹ ගසක් දැක බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහි කෙළෙමි.

**2039.** "එම සුවඳ මල් නෙලා සුභවූ සුවඳ වත්වූ මල් වැල්ලෙහි සෑයක්කොට බුදුරදුන්ට පිදීමි.

**2040.** "මින් දෙයානූවන කපෙහි මල්පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

**2041.** "එක් අනූවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති තමොනුද නම් එක් සක්විති රජෙක්වීමි.- 2042

### 160 කුමුදදායක ථෙරාපදානය.

**2043.** "හිමවතට නුදුරෙහි හෙල පියුම් හා උපුල්මලින් ගැවසීගත් රත් පියුමින් සම්පූර්ණවූ මහත්වූ ස්වයංජාත විලක් විය.

**2044.** "එකල්හි සිල්වත්වූ බුද්ධිමත්වූ කුසල් අකුසල් මේ මේ යයි දැනගැනීමෙහි දක්ෂවූ මම එහි කුකුත්ථක පක්ෂියෙක් වීමි.

**2045.** "ලෝකයාගේ පූජාවන් පිළිගැනීමට සුදුසුවූ නොහොත් පූජාවන් (රැස්වන) ගෙයක් වැනිවූ මහාමුනිවූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ (එම) ස්වයංජාත විලට නුදුරෙහි සක්මනෙහි යෙදුනුසේක.

**2046.** "ජලයෙහි හටගන්නාවූ කුමුදු මලක් කඩා බුදු රජුන් වෙත ගෙන ගියෙමි. මහාමුනිවූ සර්වඥතෙමේ මාගේ අදහස දැන එය පිළිගත්තේය.

**2047.** "එම දන දී කුශලමූලයෙන් මෙහෙයනලද මම කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියක නොඉපදුනිමි.

**2048.** "මින් එක්දහස් හයසියවන කපෙහි එහි මහත් බල ඇති වරුණ නම් අටසක්විති රජකෙනෙක් වූහ.-2049

**161 සුපාරිචරිය ථෙරාපදානය.**

**2050.** "ද්විපදොත්තමවූ පසැස් ඇති නමින් පදුම නම් (පදුමුත්තර) සර්වඥ තෙමේ වැඩවෙසෙන වෙහෙරින් නික්ම (අවුත්) දහම් දෙසීය.

**2051.** "බුදුරජුන් (සිටි තැනට) නුදුරෙහි දෙවසමාගමක් විය. එකෙණෙහි යම් කරුණකින් එහි පැමිණියෝ (බුදුරජුන්) දකිනු කැමැත්තෝ වූහ.

**2052.** "අමෘත දෙශකවූ බුදුරජුන්ගේ දෙසුම් හඬ දැන පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ අත්පොළසන් දී එළඹියෙමි.

**2053.** "ශාස්තෘන් වහන්සේ වෙත එළඹීම් වශයෙන් රැස්කළ පුණ්‍යකර්මයාගේ විපාකය බලනු මැනව. මම තිස් දහස් කපක් මුළුල්ලෙහි දුගතියක නොඉපදුනිමි.

**2054.** "දෙදහස් විසිනව වන කපෙහි සත්රුවනින් යුත් වසත් බල ඇති සමලංකත නම් සක්විති රජෙක් වීමි.-2055

**162 කණවෙර පුප්ඵිය ථෙරාපදානය.**

**2056.** "ලොකජෙ‍්‍යෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ සිද්ධාර්ථ නම් භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන් විසින් පිරිවරණ ලදුයේ නගරයට පිළිපන්සේක.

**2057.** "මම එකල්හි රජුගේ සම්මතවූ අන්තඃපුර පාලකයා වීමි. පහයෙහි හුන් මේ (එම) ලෝකනායකයන් වහන්සේ දුටිමි.

**2058.** "කණවෙර මල් ගෙන භික්ෂුසංඝයා කෙරෙහි ඉස්සෙමි. බුදුරජුන් හට වෙන්කොට ඉන් වඩාත් (එම මල්) විසිරවීමි.

**2059.** "මින් සිව් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කරන ලදද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුෂ්ප පූජාවෙහි මේ විපාකයයි.

**2060.** "මින් සත් අසූවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති මහිද්ධික නම් සිව් සක්විති රජකෙනෙක්වූහ.-2061

### 163 ඛජ්ජදායක ථෙරාපදානය.

**2062.** "මම පෙර තිස්ස බුදුරජාණන් වහන්සේට පොල් ද (ඛාද්‍යසම්මත කැවුම් ආදී) කැවිලිද දුනිමි.

**2063.** "මම මහර්ෂිවූ තිස්ස බුදුරජාණන් වහන්සේට එය දී කැමති දෙයක් කරන සුළුවූයේ (එසේම) අභිමත යමක් ලබන්නේ සතුටු වෙමි.

**2064.** "මින් දෙඅනූවන කපෙහිවූ එකල්හි යම් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. (නාලිකෙර) පල දානයාගේ මේ විපාකයයි.

**2065.** "මින් තෙළෙස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති ඉන්ද සමනම් සක්විති රජෙක් විය.-2066

### 164 දෙසපූජක ථෙරාපදානය.

**2067.** "ලෝකජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ අත්ථදස්සී භාග්‍යවතුන් වහන්සේ අහසට නැගී අහස්මගෙහි වඩිනසේක.

**2068.** "මහා මුනිවූ ශාස්තෘන් වහන්සේ යම් දෙසක සිට අහසට නැගුනසේක්ද, මම පහන් සිත් ඇත්තේ සියතින් එදෙසට වඳිමි.

**2069.** "එක්දහස් අටසිය වන කපෙහි යම් බුදුවරයන් වහන්සේ නමක් දුටුයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. දිශා පූජාවෙහි මේ විපාකයි.

**2070.** "එක්දහස් එක්සියවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති ගොසුජාත නම් සක්විති රජෙක් වීමි.-2071

### 160 කණිකාර ඡදනීය ථෙරාපදානය.

**2072.** "ලොකජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ සියල්ල මැනවින් දත් වෙස්සභූ සර්වඥ තෙමේ දිවා විහරණය පිණිස මහාවනයට පිවිසියේය.

**2073.** "එකල්හි මම කිණිහිරි (මල්) නෙලා ඡත්‍රයක් කොට මල් සෙවනියක් කොට බුදුන්හට පිදීමි.

**2074.** "මින් එක්තිස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**2075.** "මින් විසිවෙනි කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සොණ්ණාභා- 2076

**166 සප්පිදායක ථෙරාපදානය.**

**2077.** "ලෝවැස්සන්ගේ පූජාවන් පිළිගැනීමට සුදුසුවූ මහාවීරවූ ඵුස්ස නම් භාග්‍යවත්තෙමේ මහජනයා (කෙලෙස් ගින්නෙන්) නිවමින් වීථියෙහි වඩියි.

**2078.** "පිළිවෙලින් භාග්‍යවත්තෙමේ මා වෙතට පැමිණියේය. ඉක්බිති මම පාත්‍රය පිළිගෙන ගිතෙල් (පුරවා) දුනිමි.

**2079.** "මින් දෙඅනූවන කපෙහිවූ එකල්හි යම් ගිතෙල් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි, ගිතෙල් දනෙහි මේ විපාකයයි.

**2080.** "මින් සපණස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සමොදක නම් සක්විති රජෙක් වීමි.-2081

**167 යූථිකා පුප්ඵිය ථෙරාපදානය.**

**2082.** "මම චන්ද්‍රභාගා ගංතෙර පහළ ගමන්කරමි. එහිදී පිපුණු සල් රුකක් වැනි බුදුරදුන් දිටිමි.

**2083.** "මම සීනිද්ද මලක් ගෙන මහා මුනිවූ බුදුරජුන් වෙත එළඹියෙමි. පහන් සිත් ඇත්තෝ සොම්නස් වූයේ (එය) බුදුරජුන්හට පිදීමි.

**2084.** "මින් සිව් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

**2085.** "මින් සත් සැටවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති එක් සමුධර නම් සක්විති රජෙක් වීමි.-2086

**168 දුස්සදායක ථෙරාපදානය.**

**2087.** "මම එකල්හි රම්‍යවූ තිවරා නගරයෙහි රාජ පුත්‍රයෙක්වීමි. පඬුරක් ලැබ මම උපශාන්තවූ බුදුරජුන්ට පිදීමි.

2088. "භාග්‍යවත්තෙම එම පඬුර (වස්ත්‍රය) ඉවසීය. වස්ත්‍රය අතින් පිරිමැද්දේය. සිද්ධාර්ථ භාග්‍යවත්තෙම එය ඉවසා අහසට නැගුනේය.

2089. "බුදුරජුන් (අහසෙහි) වඩින කල්හි වස්ත්‍රය පසුපසින් දුවයි. එහිදී බුදුරජතෙම අපගේ අග්‍ර පුද්ගලයන් වහන්සේයයි සිත පැහැදවීමි.

2090. "මින් සිව්අනූ වන කපෙහිවූ එකල්හි යම් වස්ත්‍රයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. වස්ත්‍රදානයාගේ මේ විපාකයයි.

2091. "මින් සත්සැටවන කපෙහිවූ එකල්හි මහත් බල ඇති මනුජේන්ද්‍රවූ පරිශුද්ධ නම් සක්විති රජෙක් වීමි.-2094

169 සමාදපක ථෙරාපදානය.

2093. "මන්ධුමතී නගරයෙහි මහත් උවසු සමූහයක් වූහ. ඔව්හු මාගේ අනුගාමිකයෝ වූහ. මම ඔවුනට ප්‍රධානවීමි.

2094. "ඒ සියල්ලන් රැස්කරවා නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍රවූ සංඝයාට (විසුමට) මාලයක් කරවන්නෙමු යයි පින්කමෙහි සමාදන් කරවීමි.

2095. "මාගේ අදහස අනුව ගියාවූ ඔව්හු මැනවැයි පිළිවදන්දී එම මාලකය නිමවා විපස්සී බුදුරජුන්හට පිදීමි.

2096. "මින් එක්අනූවන කපෙහිවූ එකල්හි යම් මාලකයක් (වාස ගෘහයක්) දුනිම්ද (ඒ හේතුවෙන්) අගතියක් නොදනිමි. මාලක දානයාගේ මේ විපාකයයි.

2097. "එකුන්සැටවන කපෙහි මහත් බල ඇති ජනාධිපතිවූ ආදෙය්‍ය නම් වූ සක්විති රජෙක් වීමි.-2098

170 පඤ්චංගුලිය ථෙරාපදානය.

2099. "ලොකජෙය්‍ෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ තිස්ස නම් භාග්‍යවත්තෙමේ විය. ශ්‍රෙෂ්ඨ විහරණයෙහි දක්ෂවූ ගඳකිළියට පිවිසෙන සර්වඥයන් වහන්සේ දුටුවෙමි.

2100. "සුවඳ මල් ගෙන බුදුරජාණන් වහන්සේ වෙතට ගියෙමි. නිශ්ශබ්දවම බුදුරජුන් කෙරෙහි පසඟුල් දුනිමි.

2101. "මින් දෙඅනූවන කපෙහි යම් සුගන්ධ පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පසඟුල් දීමෙහි මේ විපාකයයි.

**2102.** "මින් දෙසැත්තෑවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සයම්බ නම් සක්විති රජෙක් වීමි. 2103

## 171 කුමුදුමාලිය ථෙරාපදානය.

**2104** "හිමවත් පව්වෙහි මහත්වූ ස්වයංජාත විලක්විය (මම) එහි හටගත් ඝොර ස්වරූප ඇති මහා බලවත් රකුසෙක් වීමි.

**2105.** "එම විලෙහි කුමුදු මල් පිපේ (ඒවා) රියසක් පමණව හටගනී. එම මල් නෙලමි. එකල්හි බලවත්වූ බුදුරජුන්ගේ එක්වීමවිය.

**2106.** "ද්විපදොත්තමවූ නරශ්‍රෙෂ්ඨවූ අත්ථදස්සී භාග්‍යවත් තෙමේ හැකිලුනු, කුමුදු මලක් දැක මාගේ සමීපයට පැමිණියේය.

**2107.** "දෙවියනට දෙව්වූ නරශ්‍රෙෂ්ඨවූ එළඹ සිටියාවූ බුදුරජුන් (දුටිමි.) සියලු මල් ගෙන බුදුරජුන්ට පිදීමි.

**2108.** "එකල්හි (එහි රැස්වූ) එම පිරිස හිමවත කෙළවරකොට වූහ. එපමණ තන්හි පැතිරී සෙවෙනි සහිත විය. තථාගතයන් වහන්සේ (එතනින්) වැඩියසේක.

**2109.** "එක්දහස් අටසියවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

**2110.** "මින් පසළොස්වන කපෙහි මහත් බල ඇති ජනාධිපතිවූ සහස්ස රථ නම් ඒ සත් සක්විති රජ කෙනෙක් වූහ. 2111

## 172 නිස්සෙනිදායක ථෙරාපදානය.

**2114.** "ලොවට දෙටුවූ තාදී ගුණ ඇති කොණ්ඩඤ්ඤ භාග්‍යවතුන් වහන්සේට ප්‍රාසාදයට නැගීම් සඳහා මා විසින් හිණිමගක් කරණලදී.

**2113.** "එම චිත්තප්‍රසාදය කරණකොටගෙන සමාක් ආනුභාව කොට සම්බුදු සසුනෙහි අන්තිම සිරුර දරමි.

**2114.** "එක්තිස් දහස්වන කපෙහි මහත් බල ඇති සම්බහුල නම් තුන් සක්විති රජ කෙනෙක් වූහ. 2115

173 රත්තිපුප්පිය ථෙරාපදානය.

**2116.** "මම පෙර මහවෙනෙහි (හැසිරෙන) මුව වැද්දෙක් වීමි. (එකල්හි) දෙවියන්ට දෙව්වූ නරශ්‍රෙෂ්ඨවූ විපස්සී බුදු රජුන් දිටිමි.

**2117.** "පිපුණු රත්තික ගසක්ද කෙලින්ද ගසක්ද දැක (එම මල්) නටු සහිතවම (කඩා) ගෙන බුදුරජුන්හට පිදීමි.

**2118.** "මින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුෂ්ප පූජාවෙහි මේ විපාකයයි.

**2119.** "මින් අටවන කපෙහි සත්රුවනින් මහත් බල ඇති සුප්පසන්න නම් සක්විති රජෙක් වීමි. 2120

174 උදපානදායක ථෙරාපදානය.

**2121.** "මා විසින් විපස්සී බුදුරජාණන් වහන්සේට ලිඳක් කරනලදී. මම එකල්හි පිණ්ඩපාතයද දී (මෙම ලිඳද) පිදීමි.

**2122.** "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් (කූප දාන නම්වූ) කර්මයක් කරන ලදද ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. ලිඳක් පිදීමෙහි මේ විපාකයයි. 2123

175 සීහාසනදායක ථෙරාපදානය.

**2124.** "පදුමුත්තර බුදුරජාණන් වහන්සේ පිරිනිවී කල්හි මම පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ සිහසුනක් (බෝරුකට) දුනිමි.

**2125.** "මේ ලොව සුව එලවන බොහෝ ගඳින් මලින් එහි පූජා පවත්වා බොහෝ ජනයා කෙලෙස් ගින්නෙන් නිවෙයි.

**2126.** "මම පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ උතුම් බොධිය වැඳ (ඒ හේතුවෙන්) කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියක නොඉපදුනිමි.

**2127.** "පසළොස් දහස්වන කපෙහි සිළුච්චය නම්වූ ඒ අට සක්විති රජකෙනෙක් වූහ.-2128

176 මග්ග දත්තික ථෙරාපදානය.

**2129.** "ද්විපදොත්තමවූ නරශ්‍රෙෂ්ඨවූ අනොම දස්සී භාග්‍යවත් තෙමේ මෙම අත්බැව්හිම සිරුර සුවය ලබනු පිණිස එළිමහනෙහි සක්මන් කළේය.

2130. "(සක්මන් කිරීම සඳහා එම බුදුරජතෙම) පා එසවූ කල්හි (පියුම් උපුල් ආදී මල්) (විසිරී) උන්වහන්සේගේ හිසේ මුදුනෙහි බබලමින් සිටියි. පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ වැඳ මම මල් ටිකක් විසුරුවා ලීමි.

2131. "මින් විසිදහස් වනු කපෙහි පුප්ඵච්ඡදනිය නම් මහත් බල ඇති පස් සක්විති රජකෙනෙක් වූහ.-2132

177 එකදීපිය ථෙරාපදානය.

2133. "පදුමුත්තර බුදුරජුන්ගේ සළල බෝරුකෙහි පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ මම එක්පහනක් පත්තු කළෙමි.

2134. "භවයෙහි උපදනා කල්හි නිපදවූ පින් රැසෙහි විපාක වශයෙන් දුගතියක් නොදනිමි. ප්‍රදීප දානයාගේ මේ විපාකයයි.

2135. "මින් සොළොස් දහස් වන කපෙහි චන්ද්‍රභ නම් මහත් බල ඇති සිව් සක්විති රජකෙනෙක් වූහ.-2136

178 මණි පූජක ථෙරාපදානය.

2137. "හිමවත මෑත පෙදෙසෙහි (එක්) නදියෙක් (ගලාබසිමින්) පැවතුනේය. එකල්හි එම ගංඉවුර සමීපයෙහි (පදුමුත්තර) බුදුරජාණන් වහන්සේ වැඩවසන සේක.

2138. "මැනවන් විසිතුරු කරන ලද මනරම්වූ මිණි පළඟක්ගෙන පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ බුදුරජුන් හට පිදීමි.

2139. "මින් සිව් අනූවන කපෙහි යම් මිණි පළඟක් පිදුයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙක මේ විපාකයයි.

2140. "මින් දොළොස් වන කපෙහි මහත් බල ඇති සතරංසි නම්වූ අටසක්විති රජකෙනෙක් වූහ.-2141

179 තිකිච්ඡක ථෙරාපදානය.

2142. "මම බන්ධුවතී නගරයෙහි රෝගීවූ දුඃඛිත මහ ජනයාට සුවගෙන දෙන්නාවූ (වෛද්‍ය ශාස්ත්‍රයෙහි) මැනවින් හික්මුණු වෛද්‍යවරයෙක් වීමි.

2143. "එකල්හි සිල්වත්වූ මහත් බල ඇති රෝගීවූ ශ්‍රමණයන් වහන්සේ නමක් දැක පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ බෙහෙතක් දුනිමි.

**2144.** "විපස්සී බුදුරජාණන්ගේ උපස්ථායකවූ අසොක නම්වූ සන්හුන් ඉඳුරන් ඇති ඒ ශ්‍රමණයන් වහන්සේ එම බෙහෙතින්ම නිරෝගී විය.

**2145.** "මම මින් එක් අනූවන කපෙහි යම් ඖෂධයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බෙහෙත් දනෙහි මේ විපාකයයි.

**2146.** "මින් එක් අටවෙනි කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සබ්බොසධ නම්වූ සක්විති රජෙක් වීමි.-2147

## 180 සංඝුපට්ඨාක ථෙරාපදානය.

**2148.** "වෙස්සභූ බුදුරජුන්ගේ කාලයෙහි මම (අරමෙහි උවටැන් කරන්නෙක්) ආරාමිකයෙක් වීමි. පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ උතුම් සංඝයාට උවටැන් කෙළෙමි.

**2149.** "මින් එක් තිස්වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. (සඟනට) උවටැන් කිරීමේ මේ විපාකයයි.

**2150.** "මින් සත්වැනි කපෙහි සත්රුවනින් යුත් මහත්බල ඇති සම්බොදක නම් සක්විති රජෙක් වීමි.- 2151

# 19 කුටජපුප්ඵිය වග්ග.

## 181 කුටජපුප්ඵිය ථෙරාපදානය.

**2152.** "උදාවූ හිරුමෙන් අහසෙහි වඩින්නාවූ දිශාවි ලොකනය කරන්නාවූ ස්වර්ණ වර්ණවූ බුදුරජාණන් වහන්සේ (දුටිමි)

**2153.** "දිගු පුළුල්ලෙහි පැතිරීගිය පිපුනු කෙලින්ද ගසක් දැක (ඒ මල්) ගසින් නෙලා ඵුස්ස බුදුරජාණන් වහන්සේට පිදීමි.

**2154.** "මින් දෙඅනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**2155.** "මින් සතළොස් වන කපෙහි සත් රුවනින් යුත් මහත් බල ඇති පුප්ඵිත නම් තුන් සක්විති රජකෙනෙක් වූහ. 2156

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

## 182 බන්ධුජීවක ථෙරාපදානය.

**2157.** "සියල්ල තෙමේම අවබොධ කළාවූ සත් පුරුෂයන් විසින් වර්ණනා කරණ ලද සිද්ධාර්ථ නම් ඒ බුදු රජ තෙම සමාධියට සමවැදුනේ පර්වත අතුරෙහි වැඩහුන්නේය.

**2158.** "ස්වයංජාත විලෙක්හි ජලයෙහි හටගත්තාවූ උතුම් මල් සොයන්නේ (ඒවා නොදැක) ඉක්බිතිව

**2159.** "(එම මල්) දෝතින්ගෙන මහාමුනිවූ බුදුරජුන් වෙත එළඹියෙමි. පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ සිද්ධාර්ථ බුදුරජුන්ට එය පිදීමි.

**2160.** "මින් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුෂ්ප පූජාවෙහි මේ විපාකයයි.

**2161.** "මින් තුදුස් වනු කපෙහි ජනාධිපතිවූ සමුද්ද කප්ප නම් මහත්බල ඇති එක් සක්විති රජෙක් වීමි.-2162

## 183 කොටුම්බරිය ථෙරාපදානය.

**2163-2164** "පර්වතයන් අතුරෙන් (පිපුනු) කිණිහිරි රුකක් මෙන් බබලන වැඩහුන්නාහු පමණ කළ නොහැකි (ජලය ඇති) සයුර මෙන් (අපමණ ගුණ ඇති) පැතරුණාවූ පොළොව මෙන් (ගුණ ඇති) අති ශ්‍රෙෂ්ඨ ආජානීයයකු මෙන් නිශ්චල දිව්‍ය සමූහයා විසින් පිරිවරන ලද (සිඛී බුදුරජුන්) දිටිමි. (දැක) සතුටු වූයේ සතුටු සිතින් නරොත්තමවූ උන්වහන්සේ වෙත එළඹියෙමි.

**2165.** "කොටුම්බර නම් වස්ත්‍ර වර්ගයෙහි ගැවසී තුබුනු මල් සතක් ලොක බන්ධුවූ සිඛී බුදුරජාණන් වහන්සේට පූජා කෙළෙමි.

**2166.** "මින් එක් තිස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**2167.** "මින් විසිවන කපෙහි මහත් බල ඇති මහානෙල නම් මහා තෙජස් ඇති එක් සක්විති රජෙක් වීමි.-2168

## 184 පඤ්චහත්ථිය ථෙරාපදානය.

**2169.** "ලොවට දෙටුවූ නරශ්‍රෙෂ්ඨවූ භාග්‍යවත්වූ තිස්ස නම් බුදුවරයෙක් විය. (උන්වහන්සේ) සව්වන් විසින් පිරිවරන ලදුයේ වීථියට පිළිපන් සේක.

**2170.** "මා විසින් උපුල්මල්මිටි පසක්ද හතරක්ද හෙවත් උපුල් මිටි නවයක් තබන ලදී. මම (ඒවා) ව්‍රත සිද්ධිය සඳහා බුදුරජුන්ට දෙනු කැමැත්තේ (තුබූ තැනින්) ගතිමි.

**2171.** "ඇතුලු වීථියෙහි ගමන් කරන්නාවූ ස්වර්ණ වර්ණවූ බුදුරජුන් (දිටිමි) (මම) බුදු රැසින් මැනවින් පසස්නා ලද්දේ වෙමි. ද්විපදොත්තමවූ මෙම බුදුරජුන් හට පිදීමි.

**2172.** "මින් දෙඅනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**2173.** "මින් තෙළෙස්වන කපෙහි සත්රුවනින් යුත් මහ බල ඇති උසභ නම්වූ පස් සක්විති රජෙක් වූහ.-2174

## 185 ඉසිමුග්ගදායක ථෙරාපදානය.

**2175.** "උදාවන්නාවූ සූර්යයා මෙන්ද (උදාවූ) අතිශයින් දීප්ති රැස් ඇති හිරු මෙන්ද පුණු රැසි සඳු මෙන්ද මල්ගෙඩි දම්වැලින් හොබනා කුඹුක් ගසක් මෙන්ද බබළන්නාවූ (පදුමුත්තර) බුදුරජුන් දුටිමි.

**2176.** "ඍෂි මුද්ග (ඍෂීන් පරිභොග කරන මුං) අඹරා මැස්සන් නැති ඛුද්දක මධු (කණමී) ද (ගෙන) පහයෙහි සිටියේම ලොක බන්ධුවූ බුදුරජුන් හට දුනිමි.

**2177.** "(එහි) අටලක්ෂයක් බුද්ධ ශ්‍රාවකයෝවූහ. (ඒ මුං හා මී) හැමදෙනා වහන්සේට පාත්‍ර පුරවා එයිනුදු ඉතා වැඩි තරම් විය.

**2178.** "කුශල මූලයෙන් මෙහෙයන ලදුයේ එම චිත්ත ප්‍රසාදය කරණකොටගෙන කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි (මම) දුගතියක නොඉපදුනිමි.

**2179.** "සතළිස් දහස් වන කපෙහි මහත් බල ඇති ඉසි මුග්ග නම් වූ ඒ අටතිස් සක්විති රජ කෙනෙක් වූහ.- 2180

### 186 බොධි උපට්ඨාන ථෙරාපදානය.

**2181.** "(මම) අමරවතී නගරයෙහි මිහිඟු බෙර වයන්නෙක් වීමි. මම උතුම් බොධිය වෙතට ගියේ නිතර උවටැනෙහි යෙදුනේ වෙමි.

**2182.** "උදය සවස එළඹ (උවටැන්කොට) එම කුශල මූලයෙන් මෙහෙයන ලදුයේ එක්දහස් අටසිය කපක් මම දුගතියකට නොපැමිණියෙමි.

**2183.** "මින් එක් දහස් පන්සිය කපෙහි ජනාධිපතිවූ මහත් බල ඇති මුරජ නම් සක්විති රජෙක් වීමි.- 2184

### 187 එකචින්තික ථෙරාපදානය.

**2185.** "යම් කලෙක්හි ආයු පිරිහී යෑමෙන් දෙව්ලොවින් චුතවූයේද එකල්හි අනුමෝදනය කරන්නාවූ දෙවියන්ගේ ත්‍රිවිධ ශබ්ද කෙනෙක් පිටවයෙත්. (කෙසේද යත්)

**2186.** "පින්වත, මින් චුතව මනුෂ්‍යයන්ගේ සහ භාවයවූ සුගතියට එනු මැනව. මිනිස්වූයේ සසුනෙහි උතුම්වූ ශ්‍රද්ධාව ලබව.

**2187-2188-2189** "ඒ ශ්‍රද්ධා තොමෝ බැස ගන්නා ලද්දී එහි හටගත් මුල් ඇත්තී මැනවින් බිහිවෙන ලද්දී වියයුතු වන්නීය. මනාකොට අවබොධ කරන ලද ධර්මයෙහි දිවිඇති තාක් නොපසුබටව කයින්ද වචනයෙන්ද සිතින්ද බොහෝ කුසල්කොට නිදුක්වූ (ක්ලෙශොපධි රහිත බැවින්) පිරිසිදුවූ (අත් බැව් සම්පත් හා භවභොග සම්පත් උපදනා) ඖපධිකවූ ඒ බොහෝ කුසල්ද කොට පරිත්‍යාගයෙන් යුතුව අනික් මිනිසුන්ද බ්‍රහ්මචරිය නම්වූ සද්ධර්මයෙහි පිහිටුවනු මැනව කියායි."

**2190.** "නුවණැති දෙවිවරු චුතවන්නාවූ දෙවියනට දෙව්පුරයට නැවත එනු මැනවැයි කියා මෙම අනුකම්පා වෙනුදු අනුමොදනය කෙරෙත්.

**2191.** "දිව්‍ය සමූහයා රැස්වූ එකල්හි මට සංවේගයක් ඇති විය. කෙසේද යත්) 'මම මින් චුතව කිනම් යොනියකට (උත්පත්ති වශයෙන්) යන්නෙම්ද? කියායි.

**2192-2193** "වඩන ලද ඉඳුරන් ඇති ශ්‍රමණයෙක් තෙම මාගේ දුක දැන මා ඒ දුකින් ගොඩ නගනු කැමැත්තේ මාගේ

සමීපයට පැමිණියේය. එකල්හි සුමන නම්වූ ඒ පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක තෙම අර්ථයෙන් හා ධර්මයෙන් අනුශාසනා කොට මා සංවේගයට පත්කෙළේය.

**2194.** "මම උන්වහන්සේගේ වචනය අසා බුදුරජුන් කෙරෙහි සිත පැහැද වීමි. ඒ ප්‍රාඥයන් වහන්සේට අභිවාදනයකොට මම එහි කළුරිය කෙළේ වෙමි.

**2195.** "එකී කුශල මූලයෙන් වෙහෙසෙන ලද මම එම දෙව්ලොවෙහි උපදින්නෙමි කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියක නොඉපදුනෙමි.- 2196

**188 තිකණ්ණිපුප්ඵිය ථෙරාපදානය.**

**2197.** "දෙවියෙකුවූ මම අප්සරාවන් විසින් පිරිවරන ලදුයේ පෙර කරණ ලද කර්මය සිහිකොට බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහිපත් කෙළෙමි.

**2198.** "සිහින් මිදි මල් තුණක් ගෙන සිය සිත පහදවා නරශ්‍රෙෂ්ඨවූ විපස්සී බුදුරජුන් කෙරෙහි පිදීමි.

**2199.** "මින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

**2200.** "මින් තෙසැත්තෑවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති රමුත්තම නම් සිධි සක්විති රජකෙනෙක්වූහ. 2201

**189 එකචාරිය ථෙරාපදානය.**

**2202.** "එකල්හි තව්තිසා වැසි දෙවියන් අතර මහත් ඝෝෂාවක් විය. (කෙසේදයත්?) බුදුරජාණන් වහන්සේ ලොකයෙහි පිරිනිවන්පානා සේක. අපිදු (මේ තාක්ම) රාග සහගතයෝ වෙමුය කියායි.

**2203.** "ඒ සංවේගයට පත් ශෝක නමැති උල් ඇණුනු එම දෙවියන් අතුරෙන් මම) බල සහිත බැවින් (දුර්වල නොවී බුදුරජුන් සමීපයට ගියෙමි.

**2204.** "මවන ලද සියුම්වූ මදාරා (මල්) ගෙන පිරිනිවන් පානා වේලෙහි බුදුරජුන් හට පිදීමි.

**2205.** "එකල්හි සියළු දෙවියෝද අප්සරාවෝද මාගේ (පිණ) අනුමෝදන් වූහ. (ඒ හේතුවෙන්) මම කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියක් නොදනිමි.

**2206.** "මින් සැටදහස්වන කපෙහි මහත්බල ඇති මහා මල්ලජන නම් සොළොස් සක්විති රජෙක් වූහ.- 2207

### 190 තිවණ්ටිපුප්ඵිය ථෙරාපදානය.

**2208** "ඒ සියල්ලෝ මා වෙත රැස්ව දුකින් පීඩිත වූවාහු ලතැවෙමින් සිතත්. එසේ සිතන්නාහු ඔවුන් හට දාහයද ඇති විය.

**2209.** "එකල්හි ධම්ම දස්සී බුදුරජාණන් වහන්සේගේ 'සුනන්ද' නම් ශ්‍රාවක තෙමේ මාගේ සමීපයට පැමිණියේය.

**2210.** "එකල්හි යම් කෙනෙක් මාගේ සහචරයෝ වූවාහුද ඔව්හු මට මල්දුන්නාහුය. මම ඒ මල්ගෙන (එම සුනන්දනම්) ශ්‍රාවකයන් වහන්සේට පිදීමි.

**2211.** "(ඉක්බිති) කළුරිය කළාවූ (මම) එම දෙව්ලොවෙහිම උපනිමි. මම එක් දහස් අටසිය වන කපෙහිද දුගතියකට නොගියෙමි.

**2212.** "මින් එක්දහස් තෙසියවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති ධූමකෙතු නම් අටසක්විති රජකෙනෙක් වූහ. 2213

## 20 තමාල පුප්ඵිය වග්ග.

### 191 තමාල පුප්ඵිය ථෙරාපදානය.

**2214.** "මට කප්රුකක් (දිව්‍යවෘක්ෂයක්) වැනි විමනක් මවන ලදී. එහි ස්වර්ණමයවූ අසූභාර දහසක් ස්තම්භයෝ (කණු) වූහ.

**2215.** "තමලු මලක් ගෙන පැහැදි සිතින් ලොක බන්ධුවූ සිඛී බුදුරජුන් හට පිදීමි.

**2216.** "මින් එක් තිස්වන කපෙහිවූ එකල්හි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**2217.** "මින් විසිවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති 'චන්ද තිත්ත නම් සක්විතිරජෙක් වීමි.- 2218

192 තිණසන්ථදායක ථෙරාපදානය.

**2219.** "වනවැසි තවුසෙක්තෙම බුදුරජාණන් වහන්සේට තණ කපයි. ප්‍රදක්ෂිණාවර්තවූ (දකුණට කැරකුණු) ඒ සියල්ලෝ බිම (පොළොවෙහි) වැටුනාහුය.

**2220.** "මම ඒ තෘණ ගෙණ බිම ඇතිරීමි. එකල්හි මම තල්පත් තුනක්ද ගෙන,

**2221.** "තෘණයෙන් සෙවෙණියක් කොට සිද්ධාර්ථ බුදුරජුන් හට දුනිමි. (එය) දෙව් මිනිසුනට ශාස්තෘවූ උන්වහන්සේ සතියක් දැරුවාහුය.

**2222.** "මින් සිව් අනූවන කපෙහිවූ එක්හි යම් තණ (සෙවෙනියක්) දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. තණ (සෙවෙනි) දනෙහි විපාකයයි.

**2223.** "මින් පන්සැටවන කපෙහි සත්රුවනින් යුත් මහත් ඵල ඇති මහධන නම් සක්විති රජකෙනෙක් වූහ. 2224

193 ඛණ්ඩඵුල්ලිය ථෙරාපදානය.

**2225.** "මහවනයෙහි ඵුස්ස භාග්‍යවතුන් වහන්සේගේ ස්තූපයක් විය. එකල්හි ඇතුන් විසින් බඳිනලද එහි වැඩී ගිය ගස් ඇත්තේද විය.

**2226.** "තිලෝගුරු එම බුදුරජාණන් වහන්සේගේ ගුණයෙන් සතුටුවූ මම විසම තැන් සමකොට සුණු පිඬු දුනිමි. (සුණු පිරියම් කෙළෙමි)

**2227.** "මින් දෙඅනූවන කපෙහිවූ ඒ එකල්හි යම් (පිලිසකර) කමක් කෙළෙම්ද, ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. සුණු පිඬු දීමෙහි මේ විපාකයයි.

**2228.** "සත් සැත්තෑවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති "ජිනසෙන" නම් සොළොස් සක්විති රජ කෙනෙක් වූහ. 2229

194 අසොකපූජක ථෙරාපදානය.

**2230.** "එකල්හි රම්‍යවූ තිවරා පුරයෙහි රාජොද්‍යානයක් විය. මම එහි රජුගේ සහචරවූ උයන්පල්ලෙක් වීමි.

**2231.** "සියල්ල තෙමේම අවබොධ කළාවූ පදුම නම් බුදුරජෙක් විය. පියුම් සෙවනැල්ල නොහැර සිටියාවූ ඒ මුනින්ද්‍රයන් වහන්සේ (දුටිමි.)

**2232.** "පිපුනු දැකුම්කලු අසෝක ගසක් දැක (ඉන්) මල් පොකුරක් පදුමුත්තර නම්වූ ඒ බුදුරජාණන් වහන්සේට පිදීමි.

**2233.** "මින් සිව් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද,(ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

**2234.** "මින් සිව් සැත්තෑවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති අරුණඤ්ජන නම් සොළොස් සක්විති රජ කෙනෙක් වූහ. 2235

**195 අද්ධොකාලක ථෙරාපදානය.**

**2236.** "පිපුනාවූ රුකඟුන ගසක් දැක (එහි) උතුම් මල් කොෂ සහිතවම නෙලාගෙන එම මල් ගෙන (සිද්ධාර්ථ) බුදුරජුන් සමීපයට ගියෙමි.

**2237.** "එසමයෙහි මහාමුනිවූ සිද්ධාර්ථ බුදුරජතෙම විවේක සුවයෙන් හුන්නේය. (මම උන්වහන්සේට) මොහොතක් බුහුමන් දක්වා (එම) මල් ගුහාවෙහි විසිර වීමි.

**2238.** "මින් සිව් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**2239.** "මින් සතිස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති දෙවගජ්ජිත නම් එක් සක්විති රජෙක්වීමි. 2240

**196 කිසලයපූජක ථෙරාපදානය.**

**2241.** "ද්වාරවතී නගරයෙහි මාගේ පුෂ්පොද්‍යානයෙක් විය. එහිම ගස්වල වැඩීමට ජලය සපයන ලිඳක් වේ.

**2242.** "බුද්ධ බලයෙන් තහවුරු බවට පත් පස්මරුන් දිනූ ඒ සිද්ධාර්ථ බුදුරජතෙම මට අනුකම්පා කරනුයේ අහස් මගෙහි වඩිනා කල්හි.

**2243.** "මහර්ෂීන් වහන්සේට පිදීමට සුදුසු අන් කිසිවක් නොදකිමි. මම හෝපළු (දළු) දැක (එය ගෙන) අහසෙහි දැමීමි.

**2244.** "ඒ අසෝක පල්ලවයෝ වඩින්නාවූ බුදුරජුන් පසුපසින් යෙත්. මම එම විෂ්මය දැක "බුදුරජාණන් වහන්සේගේ උදාර බව ආශ්චර්යයි (සිතීමි)

2245. "මින් සිව් අනූවන කපෙහි (යම්) හෝපළු පිදීමක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

2246. "මින් සත් විසිවෙනි කපෙහි සත්රුවනින් යුත් මහත් බලඇති 'එකස්සර' නම් එක් සක්විති රජෙක්වීමි. 2247

197 තින්දුකදායක ථෙරාපදානය.

2248. "(මම) බල වේගයෙන් යුත් ගිරි දුර්ගයන් හා හැසිරෙන වඳුරෙක් වීමි. (එකල්හි) ගෙඩි හටගත් තිඹිරි ගසක් දැක බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහිපත් කෙළෙමි.

2249. "පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ කිහිප දිනක්ම භවත්‍රයෙහි අන්තයට ගියාවූ සිද්ධාර්ථ බුදුරජුන් සෙවීමි.

2250. "ලොකයෙහි නිරුත්තර ශාස්තෘවූ (එම බුදු රජතෙම) මාගේ අදහස දැන රහතුන් දහසක් සමග මාගේ සමීපයට පැමිණියේය.

2251. "සතුට උපදවා එම තිඹිරිගෙඩි ගත් අතැතිව (බුදුරජුන් වෙත) එළඹියෙමි. කථා කරන්නවුන් අතුරෙහි ශ්‍රෙෂ්ඨවූ සර්වඥවූ භාග්‍යවත් තෙමේ (එය) පිළිගත්තේය.

2252. "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් ඵල දානයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි.

2253. "සත් පණස්වන කපෙහි සත් රුවනින් යුත් මහත් බල ඇති උපනන්ද නම් සක්විති රජෙක් වීමි. 2254

198 මුට්ඨිපූජක ථෙරාපදානය.

2255. "පස්මරුන් දිනූ ලොක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ සුමේධ නම් භගවත් තෙමේ පච්ඡිම ජනානුකම්පාවෙන් වීර්ය වැඩීය.

2256. "ද්විපදොත්තමවූ තාදී ගුණ ඇති සක්මන් කරන්නාවූ ඒ බුදුරජුන්ගේ පර්වත ගුහාවට මල් මිටක් පිදීමි.

2257. "එම චිත්ත ප්‍රසාදය කරණකොටගෙන කුශල මූලයෙන් මෙහෙයන ලදුයේ මම කප් තිස් දහසක් මුළුල්ලෙහි දුගතියක නොඉපදුනිමි.

2258. "දෙදහස් තුන්සිය වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති එක් සුනෙල නම් සක්විති රජෙක් වීමි. 2259.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

### 199 කිංකණිපුප්ඵිය ථෙරාපදානය.

**2260.** "සියල්ල තෙමේම අවබෝධ කළාවූ පස්මරුන් දිනූ අපරාජිතවූ සුමංගල බුදුරජතෙමේ විහාරයෙන් නික්ම නුවරට පිවිසියේය.

**2261.** "කරනලද සියළු බුදුකිස ඇති ඒ සර්වඥ මුනිතෙමේ පිඬු පිණිස හැසිර නුවරින් නික්ම වනය අතුරෙහි විසීය.

**2262.** "පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ කිංකිණි පුෂ්පයන් ගෙන සියල්ල තෙමේම දතුවාවූ මහර්ෂිවූ බුදුරජුන් හට පිදීමි.

**2263.** "මින් සිව් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**2264.** "මින් සයාසූවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති 'අපිලාපිස' නම් සක්වති රජෙක් වීමි.- 2265

### 200 යූථිකාපුප්ඵිය ථෙරාපදානය.

**2266.** "ලෝකයාගේ පූජාවන් පිළිගන්නාවූ මරුන් ජය ගත් පසැස් ඇති පදුමුත්තර බුදුරජතෙමේ වනයෙන් නික්ම විහාරයට වඩියි.

**2267.** "උතුම් සීනිද්ද මල් දෝතින් ගෙන මෙත් සිත් ඇති තාදී ගුණ යුත් බුදුරජුන් හට පිදීමි.

**2268.** "එම චිත්තප්‍රසාදයෙන් සම්පත් අනුභවකොට මම කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියක් නොදනිමි.

**2269.** "මින් පණස්වෙනි කපෙහි මහත් බල ඇති ජනාධිපතිවූ සවිත්තනන්දන නම් එක් සක්විති රජෙක්වීමි.- 2270

**ද්විතීය ශතකය සමාප්තයි.**

## 21 කණිකාරපුප්ඵිය වග්ග

### 201 කණිකාරපුප්ඵිය ථෙරාපදානය.

**2271.** "මම එකල්හි පිපුණු කිණිහිරි රුකක් දැක චතුරොඝයන් තරණය කළාවූ තාදී ගුණ ඇති තිස්ස බුදුරජාණන් වහන්සේට (එම මල් නෙලා) දුනිමි.

2272. "මින් දෙඅනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

2273. "මින් පන්තිස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති 'අරුණපාණි' යයි ප්‍රකටවූ සක්විති රජෙක්වීමි. 2274

202 මිනෙලපුප්ඵිය ථෙරාපදානය.

2275. "හිරු මෙන් ප්‍රතාපවත්වූ ස්වර්ණ වර්ණවූ භාග්‍යවත් වූ මෙත් සිත් ඇති සිඛී බුදුරජතෙම සක්මණට නැගුනේමය.

2276. "පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ ශ්‍රෙෂ්ඨ ඥාන ඇති බුදුරජුන් හට වැඳ මිනෙල පුෂ්පයන් ගෙන (එම) බුදුරජුන් හට පිදීමි.

2277. "මින් එක්තිස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

2278. "එකුන් තිස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති "සුමෙධයස" නම්වූ සක්විති රජෙක්වීමි. 2279

203 කිංකිණිකපුප්ඵිය ථෙරාපදානය.

2280. "රන් ඇගෑවක් මෙන් බබලන සර්වඥවූ ලෝක නායක බුදුරජතෙමේ සිසිල් දිය සහිත විලකට බැස ජල ස්නානය කළේය.

2281. "මම කිකිණි මල් ගෙන ඔදවැඩී සිත් ඇත්තේ සොම්නස්වූයේ ද්විපදොත්තමවූ තාදීගුණ ඇති විපස්සී බුදුරජුන් හට පිදීමි.

2282. "මින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

2283. "සත් විසිවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති භීමරථ නම් සක්විති රජෙක් වීමි.- 2284

204 තරණිය ථෙරාපදානය.

2285. "ද්විපදොත්තමවූ නරශ්‍රෙෂ්ඨවූ භාග්‍යවත් අත්ථදස්සී බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයන් විසින් පිරිවරනලදුයේ ගංතෙරට එළඹිසේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**2286.** "(මම) සමව මුවවිට දක්වා පිරුණු කපුටුවනට පවා ඉවුරෙහි සිට පැන් පානය කළහැකිසේ දියෙන් පිරීගිය එම ගඟින් තරණයකොට එතරටයාම දුෂ්කරවූ ද්විපදොත්තම වූ බුදුරජුන්ද භික්ෂුසංඝයාද එතර කරවීමි.

**2287.** "එක් දහස් අටසිය වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. (ගඟින්) තරණය කරවීමෙහි මේ විපාකයයි.

**2288.** "මින් එක්දහස් තෙසියවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති 'සම්භාගව' නම් පස් සක්විති රජ කෙනෙක් වූහ.

**2289.** "මම මේ පශ්චිම භවයෙහි බමුණු කුලයෙහි උපනිමි. යහළුවන් තිදෙනෙකු සමග ශාස්තෘ ශාසනයෙහි පැවිදිවීමි.

**205 නිග්ගුණ්ඩිපුප්ඵිය ථෙරාපදානය.**

**2290.** "(මම) විපස්සී බුදුරජාණන් වහන්සේගේ ආරාමිකයෙක් වීමි. (ඒ මම) නිකමල් ගෙන බුදුරජාණන් වහන්සේට පිදීමි.

**2291.** "මින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

**2292.** "මින් පන්තිස්වන කපෙහි මහත් බල ඇති ජනාධිපතිවූ මහාපතාප නම් සක්විති රජෙක්වීමි. 2293

**206 උදකදායක ථෙරාපදානය.**

**2294.** "මම පැහැදුනු ඉඳුරන් ඇති කෙලෙස් කැළඹිලි නැති වළඳන්නාවූ ශ්‍රමණයන් වහන්සේ කෙනෙක් දැක එම සිද්ධාර්ථ බුදුරජුන්හට කලයෙන් දිය ගෙනවුත් දුනිමි.

**2295.** "මම අද පහවූ සැක ඇති පිරිසිදුවූ නිර්මල කෙනෙක් වෙමි. (ඒ හේතුවෙන්) භවයෙහි උපදනා කල්හි යහපත් විපාක ඇතිවේ.

**2296.** "මින් සිව් අනූවන කපෙහි වූ එකල්හි යම් ජල දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. උදක දානයාගේ මේ විපාකයයි.

**2297.** "මින් සැටවනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති "විමල" නම් සක්විති රජෙක් වීමි.- 2298

**207 සලලමාලිය ථෙරාපදානය.**

**2299.** "පර්වතයන් අතුරෙන් කිණිහිරි රුකක් මෙන් බබළමින් හුන් සියළු දිගුන් හෙලිකරන්නාවූ සිද්ධාර්ථ බුදුරජුන් දුටිමි.

**2300.** "එකල්හි මම දුන්න නිසැකකොට හීය යොදා (විද) නටු සහිත මලක් කඩා බුදුරජුන් හට පිදීමි.

**2301.** "මින් එක් සිව් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

**2302.** "මින් එක් පණසවන කපෙහි සත් රුවනින් යුත් මහත් බල ඇති ජුතින්ධර නම් සක්විති රජෙක් වීමි. - 2303

**208 කොරණ්ඩපුප්ඵිය ථෙරාපදානය.**

**2304.** "සක් ලකුණින් බබලන තබන ලද ශ්‍රීපාද සටහන් දැක (මම ඒ) විපස්සී බුදුරජුන්ගේ පියවර සටහන් අනුව යන්නේ

**2305.** "පිපුණු කොරණ්ඩ වෘක්ෂයක් දැක මුල සිටම ඇති ඒ සියළු මල් මා විසින් (බුදුරජුන් හට) පුදනලදී. සතුටුවූයේ සතුටු සිතින්ම උතුම් පා වැන්දෙමි.

**2306.** "මින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පියවර සටහන් පිදීමෙහි මේ විපාකයයි.

**2307.** "සත් පණසවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති 'වීතමල' නම් එක් සක්විති රජෙක්වීමි. 2308

**209 ආධාරදායක ථෙරාපදානය**

**2309.** "ලොකබන්ධුවූ සිඛී බුදුරජුන් හට මා විසින් ආධාරකයක් (පාත්‍රාධාරයක්) පුදනලදී. මම (ඒ හේතුවෙන් ධනය සහිත මේ පොළොවම දරමි.

**2310.** "මාගේ සියළු කෙලෙස් දවනලදී. සියළු භවයෝ වනසන ලදහ. සම්බුදු සසුනෙහි අන්තිම ශරීරයද දරමි.

**2311.** "මින් සත් විසිවන කපෙහි මහත්බල ඇති "සමන්තචරණ" නම් සව් සක්විති රජකෙනෙක්වූහ - 2312

### 210 වාතාතපනිවාරිය ථෙරාපදානය.

**2213-2214** "දෙවියනට දෙව්වූ තාදීගුණ ඇති තිස්ස බුදුරජුන්හට පැහැදුනු සිතින් එක් කුඩයක් මා විසින් පුදනලදී (ඒ හේතුවෙන්) මාගේ පව් වැලැක්කේවිය. (තමා වෙත කුශලයන්ගේ පැමිණීම විය. අහසෙහි කුඩ දරත්. පූර්ව ඡත්‍රදානමය) කර්මයාගේ මේ විපාකයයි.

**2315.** "(මා විසින්) සියළු භවයෝ නසන ලදහ. (මෙය) මාගේ අන්තිම භවයයි. සම්බුදු සසුනෙහි අන්තිම ශරීරයද දරමි.

**2316.** "මින් දෙයානූවන කපෙහි වූ එකල්හි යම් ඡත්‍ර දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඡත්‍ර දානයාගේ මේ විපාකයයි.

**2317.** "මින් දෙසැත්තෑවන කපෙහි ජනාධිපතිවූ මහානිදාන නම් අට සක්විතිරජ කෙනෙක් වූහ.- 2318

**(කණිකාරපුප්ඵිය වර්ගය නිමි.)**

---